# බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා : 15

සූත්‍රාන්ත පිටකයෙහි

06 වන ග්‍රන්ථය

# මජ්ඣිම නිකාය

තෘතීය භාගය

## උපරි පණ්ණාසකය

**ලඞ්කාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙනි**


පාඨශෝධනය :

මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය,

**පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද**

කෝට්ටේ ශ්‍රීකල්‍යාණීසාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි
අනුනායක ස්ථවිරයන් වහන්සේ

සිංහලානුවාදය :

හිඟුල, මාකඩවර විහාරාධිවාසී

**පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර**

ස්ථවිරයන් වහන්සේගේ

සහාය ඇති ව

**පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද**

අනුනායක ස්ථවිරයන් වහන්සේ



බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 15

The Sixth Book in the

**Suttanta-Pitaka**

**6**

# MAJJHIMANIKĀYA (III)

# UPARI PANNĀSAKA

Edited by

**The Venerable Pandita**

**Labugama Lankānanda Thera**

Anunāyaka of the Kōtte Sri Kalyāni Sāmaggrīdharma Mahāsangha Sabha,

Vice Principal, Pravacanōdaya Pirivena, Molligoda, Wādduwa

With the Sinhala translation by

**The Venerable Pandita**

**Labugama Lankānanda Anunāyaka Thera**

with

**The Venerable Pandita**

**Karahampitigoda Sumanasāra Thera**

Mākadawara Vihāra, Hingula

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමග කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

*තෙරුවන් සරණයි.*

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557
———
2013

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක

වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි

තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ සද්ධානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# මජ්ඣිමනිකායො

## උපරිපණ්ණාසකො

සූත්‍රාන්තපිටකයෙහි

# මජ්ඣිමනිකාය

## උපරි පණ්ණාසකය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | xxi–xxii |
| ත්‍රිපිටකසම්පාදකමණ්ඩලය ... ... ... | xxiii |
| සංකේත නිරූපණය – ABBREVIATIONS ... ... | xxv |
| පාළි හෝඩිය – PALI ALPHABET ... ... | xxvi |
| විෂය සූචි ... ... ... ... | xxvii |
| පෙළ හා පරිවර්තනය ... ... ... ... | 1–625 |
| ගාථාදිපාදනුක්කමණිකා ... ... ... | 629–630 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 631–634 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 635–640 |

# සංස්කාරක - නිවේදනය

පරවාදමර්දනය විශේෂ ලක්ෂණ කොට ඇති මජ්ඣිමාගමයට අයත් උපරිපණ්ණාසකපාළියෙහි මේ සිංහල පරිවර්තනය එහි තෙවන කාණ්ඩය වේ. පිටකග්‍රන්ථ - සංඛ්‍යාවශයෙන් සූත්‍රාන්තපිටකයෙහි සවැනි වූ ද, මුද්‍රිත කාණ්ඩසංඛ්‍යාවශයෙන් බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි දෙළොස් වැනි වූ ග්‍රන්ථය ද වේ. පුස්කොළපොත් හා මුද්‍රිත සියම් බුරුම ආදි පොත් හා වහල් කොට ගෙනැ මෙහි පාඨශෝධනය අප විසින් කරන ලදි. ත්‍රිපිටකමණ්ඩලයෙහි සාමාජික වූ රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ සහාය කොට ගෙනැ මේ පරිවර්තනකාර්යය අප මැ කළබව මෙහිලා සඳහන් කරම්හ. අව්‍යක්තභාෂාව තබා ව්‍යක්තභාෂායෙන් පරිවර්තනකාර්යය කරන ලදි. දේශනායෙහි ගෞරවය හා සිංහල සාහිත්‍යයෙහි අභිවෘද්ධිය පිණිසැ මුලැ සිට මැ ව්‍යක්තභාෂාව උපයෝග කොටගත්බව මෙහි කියයුතු යැ. ත්‍රිපිටක පරිවර්තන සම්පාදකමණ්ඩලයෙහි සභාපති වූ අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය කෝදාගොඩ ශ්‍රී ඥානාලංකාරාභිධාන දක්ෂිණලංකායෙහි ප්‍රධානසංඝනායක ස්ථවිරයන් වහන්සේ ද මෙහි ලා වහල් වැ සිටිබව සඳහන් කරම්හ. මැඳුම්සඟිය පිළිබඳ වැ කියයුතු හැම ප්‍රථමභාගයෙහි ලා ලියූ සංඥාපනයෙහි පළ වැ ඇතියෙන් මෙහි පුනපුනා සඳහන් කළයුතු නොවේ.

ත්‍රිපිටක පරිවර්තන සම්පාදක මණ්ඩලයෙහි සාමාජිකයන් වූ ද, කොළඹ විද්‍යෝදය පිරිවෙන්හි ආචාර්යවරයන් වූ ද, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දූල්ලේ සිරි පඤ්ඤාලංකාරාභිධාන අනුනායකස්ථවිරයන්වහන්සේ ද, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනෝමදස්සී නායක ස්ථවිරයන් වහන්සේ ද මුද්‍රණාවස්ථායෙහි සංශෝධනකාර්යය පිණිසැ බෙහෙවින් වෙහෙස දැරූබව සඳහන් කරම්හ.

මුද්‍රණය වහවහා නිමකරවාලීම පිණිසැ සංස්කෘතික අධ්‍යක්ෂ ඩොනල්ඩ් අබේසිංහ මහතාණන් ප්‍රමුඛ ශ්‍රී ලංකා සංස්කෘතිකමණ්ඩලයෙහි අධිකාරීන් දැරූ සැලකිල්ල ද පැසැසියයුතුබව සඳහන් කළයුතු වෙයි. රජයෙහි මුද්‍රණදෙපාර්තමේන්තුවෙහි මුද්‍රණාලයාධිපති ඇල්. ඩබ්ලිව්. පී. පීරිස් මහතා හා ත්‍රිපිටක මුද්‍රණකාර්යයෙහි නියුක්ත සේවකමහතුන් ඉතා සැලැකිල්ලෙන්මෙහි ලා ක්‍රියා කළබව විශේෂයෙන් සඳහන් කළ යුතු ද වේ. මේ පින්වතුන්ගේ කාර්යශූරභාවය ත්‍රිපිටක මණ්ඩලයෙහි සිටූනා හැමගේ චිත්තාරාධනයට සමත් ද වියැ. ත්‍රිපිටකකාර්යාලය පිහිටි මහානායක වාරිකාරාමයෙහි භාරකාර වන ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතා ඇතුළු සේවක පිරිස ඉතා හිතවත් වැ උපස්ථානාදියෙන් වහල්වැ සිටිබව ද මෙහිලා කියයුතු වෙයි.

තවද ශ්‍රීලඞ්කා ජනරජයෙහි අග්‍රාමාත්‍යවරිය වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ පරිවර්තන කාර්‍යයෙහි ලා දක්වන බලවත් ප්‍රසාදය හා තදනු වැ සංස්කෘතික අමාත්‍ය ඇස්. ඇස්. කුලතිලක මැතිතුමාණන් හා අමාත්‍යාංශයෙහි ලේකම් ක්ෂේමසිරි ප්‍රේමවර්ධන මහතාණන් වෙතින් ලැබුණු වහල ද තිබූ පෙරටු කොට සඳහන් කළයුතු ද වේ.

ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයෙහි ලේඛකාධිකාරී වන පණ්ඩිත දෙරගමුවේ සිරි ධම්මපාලාභිධාන කොළඹදිශායෙහි ප්‍රධානසඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ ද මෙහි ඉවහල් වැ ක්‍රියා කළබව අවසාන වශයෙන් සඳහන් කරම්හ.

'බුද්ධජයන්ති'ය නිමිති කොට ආරම්භ කළ ත්‍රිපිටකපරිවර්තන-කාර්‍යයෙහි දවරය වෙහෙස ධරමින් ක්‍රියා කළ, ශ්‍රීලඞ්කාවිද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි උපකුලපති වැ වැඩසිටි අතිගෞරවාර්හ ත්‍රිපිටක-වාගීශ්වරාචාර්‍ය්‍ය, දර්ශනවිශාරද පරවාහැර සිරිවජිරඤාණාභිධාන කොළඹ නවකෝරළයෙහි ප්‍රධානසඞ්ඝනායක මහාස්ථවිරයන් වහන්සේ ඇතුළු කොට, අපවත් වූ සංස්කාරක ස්ථවිරයන් වහන්සේ හැම හා මේ කාර්‍යයෙහි නියුක්ත හැම සුධීහු ද, ආධාර උපකාර කළ සියලු භවත්හු ද, මේ ධර්මදානමය කුශලයෙන් භවනිස්සරණය කෙරෙත්වයි ආශංසනය කරම්හ.

මෙයට
ශාසනස්ථිතිය පතන,

ලබුගම ලඞ්කානන්ද
ත්‍රිපිටකපරිවර්තන සම්පාදක
මණ්ඩලයෙහි ප්‍රධාන සංස්කාරක.
රාජ්‍යවර්ෂ : 1974. 6. 10

ත්‍රිපිටකකාර්‍යාලය,
මහානායකචාරිකාරාමය,
අංක : 115,
විජේරාම මාවත,
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදකමණ්ඩලය

**උපදේශක :**

එක්සත් අමරපුරමහානිකායෙහි සභාපති, අග්‍රමහාපණ්ඩිත, බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවේණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, කෝදාගොඩ ශ්‍රීඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය, ත්‍රිපිටක වාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද – ශ්‍රී කල්‍යාණිසාමග්‍රිධර්මමහාසඞ්ඝසභායෙහි අනුනායකස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

දෙමටගොඩ ධර්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති, පණ්ඩිත, පරවාහැර සිරි පඤ්ඤානන්ද (බී. ඒ. ලණ්ඩන්) කොළඹ නවකෝරළයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

කිරුළපන පූර්වාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක කෝට්ටේ ශ්‍රී කල්‍යාණිසාමග්‍රිධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායකස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී නායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ – මාකඩවර විහාරාධිවාසී, පණ්ඩිත, කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝකවිහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරිධම්මපාල – කොළඹදිශායෙහි ප්‍රධානසඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

# සඞ්කෙත නිරූපණය

## ABBREVIATIONS

සීමු — සීහළක්ඛර මුද්දිත, මජ්ඣිමනිකායො

ස්‍යා — ස්‍යාමක්ඛර මුද්දිත පොත්ථකං.

මජසං — මරම්මඡට්ඨසඞ්ගීති පොත්ථකං.

PTS — PALI TEXT SOCIETY MAJJHIMANIKAYA

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

### VOWELS

අ a　ආ ā　ඉ i　ඊ ī　උ u　ඌ ū　එ e　ඔ ō

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya　ර ra　ල la　ව va　ස sa　හ ha　ළ ḷa　අං aṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ඤ්‍ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඤ්‍ජ ñja | ද්ව, ද්‍ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්‍ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර grạ | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā　ි i　ී ī　ු ූ u　ූ ū　ෙ e　ො ō

# මජ්ඣිමනිකායෙ උපරිපණ්ණාසකො

## විසයසූචි


| සුත්තඞ්කො | | | | | පිට්ඨඞ්කො |
|---|---|---|---|---|---|

### 1. දෙවදහවග්ගො

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | දෙවදහ | සුත්තං | ... | ... | 2 – 28 |
| 2. | පඤ්චත්තය | ,, | ... | ... | 30 – 42 |
| 3. | කින්ති | ,, | ... | ... | 44 – 50 |
| 4. | සාමගාම | ,, | ... | ... | 52 – 64 |
| 5. | සුනක්ඛත්ත | ,, | ... | ... | 66 – 80 |
| 6. | ආනෙඤ්ජසප්පාය | ,, | ... | ... | 82 – 88 |
| 7. | ගණකමොග්ගල්ලාන | ,, | ... | ... | 90 – 98 |
| 8. | ගොපකමොග්ගල්ලාන | ,, | ... | ... | 100 – 114 |
| 9. | මහාපුණ්ණම | ,, | ... | ... | 116 – 124 |
| 10 | චූළපුණ්ණම | ,, | ... | ... | 126 – 132 |

දෙවදහවග්ගො පඨමො

### 2. අනුපදවග්ගො

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අනුපද | සුත්තං | ... | ... | 134 – 140 |
| 2. | ඡබ්බිසොධන | ,, | ... | ... | 142 – 152 |
| 3. | සප්පුරිස | ,, | ... | ... | 154 – 164 |
| 4. | සෙවිතබ්බාසෙවිතබ්බ | ,, | ... | ... | 166 – 192 |
| 5. | බහුධාතුක | ,, | ... | ... | 194 – 204 |
| 6. | ඉසිගිලි | ,, | ... | ... | 206 – 210 |
| 7. | මහාචත්තාරීසක | ,, | ... | ... | 212 – 222 |
| 8. | ආනාපානසති | ,, | ... | ... | 224 – 236 |
| 9. | කායගතාසති | ,, | ... | ... | 238 – 254 |
| 10. | සඞ්ඛාරුපපත්ති | ,, | ... | ... | 256 – 262 |

අනුපදවග්ගො දුතියො

### 3. සුඤ්ඤතවග්ගො

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | චූළසුඤ්ඤත | සුත්තං | ... | ... | 264 – 270 |
| 2. | මහාසුඤ්ඤත | ,, | ... | ... | 272 – 284 |
| 3. | අච්ඡරියඅබ්භුත | ,, | ... | ... | 286 – 294 |
| 4. | බාකුල | ,, | ... | ... | 296 – 302 |
| 5. | දන්තභූමි | ,, | ... | ... | 304 – 318 |
| 6. | භූමිජ | ,, | ... | ... | 320 – 330 |
| 7. | අනුරුද්ධ | ,, | ... | ... | 332 – 342 |
| 8. | උපක්කිලෙස | ,, | ... | ... | 344 – 358 |
| 9. | බාලපණ්ඩිත | ,, | ... | ... | 360 – 382 |
| 10. | දෙවදූත | ,, | ... | ... | 384 – 396 |

සුඤ්ඤතවග්ගො තතියො

## 4. විභඞ්ගවග්ගො


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | භද්දෙකරත්ත | සුත්තං | ... | ... | 398 – 402 |
| 2. | ආනන්දභද්දෙකරත්ත | ,, | ... | ... | 404 – 408 |
| 3. | මහාකච්චානභද්දෙකරත්ත | ,, | ... | ... | 410 – 422 |
| 4. | ලොමසකඞ්ගිය භද්දෙකරත්ත | ,, | ... | ... | 424 – 430 |
| 5. | චූළකම්මවිභඞ්ග | ,, | ... | ... | 432 – 442 |
| 6. | මහාකම්මවිභඞ්ග | ,, | ... | ... | 444 – 456 |
| 7. | සළායතනවිභඞ්ග | ,, | ... | ... | 458 – 468 |
| 8. | උද්දෙසවිභඞ්ග | ,, | ... | ... | 470 – 482 |
| 9. | අරණවිභඞ්ග | ,, | ... | ... | 484 – 494 |
| 10. | ධාතුවිභඞ්ග | ,, | ... | ... | 496 – 510 |
| 11. | සච්චවිභඞ්ග | ,, | ... | ... | 512 – 518 |
| 12. | දක්ඛිණාවිභඞ්ග | ,, | ... | ... | 520 – 526 |


විභඞ්ගවග්ගො චතුත්ථො

## 5. සළායතනවග්ගො


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අනාථපිණ්ඩිකොවාද | සුත්තං | ... | ... | 528 – 536 |
| 2. | ඡන්නොවාද | ,, | ... | ... | 538 – 544 |
| 3. | පුණ්ණොවාද | ,, | ... | ... | 546 – 550 |
| 4. | නන්දකොවාද | ,, | ... | ... | 552 – 572 |
| 5. | චූළරාහුලොවාද | ,, | ... | ... | 574 – 580 |
| 6. | ඡ ඡක්ක | ,, | ... | ... | 582 – 592 |
| 7. | මහාසළායතනික | ,, | ... | ... | 594 – 600 |
| 8. | නගරවින්දෙය්‍ය | ,, | ... | ... | 602 – 606 |
| 9. | පිණ්ඩපාතපාරිසුද්ධි | ,, | ... | ... | 608 – 614 |
| 10. | ඉන්ද්‍රියභාවනා | ,, | ... | ... | 616 – 624 |


සළායතනවග්ගො පඤ්චමො

## උපරිපණ්ණාසකං නිට්ඨිතං.

සුත්තන්තපිටකෙ

# මජ්ඣිමනිකායො

## උපරිපණ්ණාසකො

2—ඊ 00502 (8/73)

සුත්තන්තපිටකෙ

# මජ්ඣිමනිකායො

# උපරිපණ්ණාසකො

## 1 දෙවදහවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### 3. 1. 1.

### දෙවදහ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති දෙවදහං නාම සක්‍යානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සන්ති භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: 'යඞ්කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා[1] නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. එවංවාදිනො භික්ඛවෙ නිගණ්ඨා[2].

එවං වාදාහං භික්ඛවෙ, නිගණ්ඨෙ උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආවුසො නිගණ්ඨා එවංවාදිනො එවංදිට්ඨිනො: 'යඞ්කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා[1] නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති.

තෙ චෙ මෙ භික්ඛවෙ, නිගණ්ඨා එවං පුට්ඨා ආමාති පටිජානන්ති: ත්‍යාහං එවං වදාමි: 'කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානාථ. අහුවම්හෙව මයං පුබ්බෙ, න නාහුවම්හා'ති.

නො හිදං ආවුසො.

---

1. {බ්‍යන්තීභාවා – මජ්ඣං. / බ්‍යන්තිභාවා – ස්‍යා.}
2. නිගන්ථා – ස්‍යා.

සූත්‍රාන්තපිටකයෙහි

# මැදුම් සඟිය

# උපරිපණ්ණාසකය

# 1 දෙවදහවග්ගය

**ඒ භගවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

## 3. 1. 1

## දෙවදහ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි සැහැකුල රජදරුවන් ගේ දෙවදහ නම් නියම්ගම ඇසිරි කොටගෙන (ලුම්බිනී උයන්හි) වැඩවාස කරන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි මහණුන් ඇමතූසේක. 'වහන්සැ'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතෙල වදළසේක :

මහණෙනි, මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති කිසි මහණබමුණු කෙනෙක් ඇත. ''මේ පුරුෂපුද්ගල සුව වේව'යි දුක් වේව'යි නොදුක් නොසුව වේව'යි යම් මැ වේදයිතයක් විඳුනේ වේ ද එ හැම පෙර කළ කම්පසින් වෙයි. මෙසෙයින් පුරාණ කර්මයන් තැවීමෙන් විගතාන්තභාව කිරීමෙන්, නවකර්මයන් නො කිරීමෙන් මතුයෙහි අනවස්‍රව (කර්මායුහණ නො වනු) වෙයි. මතුයෙහි කර්ම රැස් නො කිරීමෙන් කර්මක්ෂය (කර්ම ගෙවීයනු) වෙයි. කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි. දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි. වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීර්ණ වන්නේය''යි. මහණෙනි, නුවටහු මෙවන් වාද ඇතියහ.

මහණෙනි, මෙසේ වාද ඇති නුවටුන් කරා එළැඹ මෙසේ කියමි : ''ඇවැත්නි නිගණ්ඨයෙනි, මේ පුරුෂපුද්ගල සුව වේව'යි දුක් වේව'යි නො දුක් නොසුව වේව'යි යම් මැ වේදයිතයක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කම්පසින් වෙයි. මෙසෙයින් පුරාණ කර්මයන් තැවීමෙන් විගතාන්තභාව කිරීමෙන් නවකර්මයන් නො කිරීමෙන් මතුයෙහි අනවස්‍රව වෙයි. මතුයෙහි කර්ම රැස් නො කිරීමෙන් කර්මක්ෂය වෙයි. කර්මක්ෂය හේතුයෙන් දුඃඛක්ෂය වෙයි. දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි. වේදනාක්ෂය හේතුයෙන් හැම දුක් නිර්ජීර්ණ වන්නේ, ය''යි. තෙපි මෙවන් වාද ඇතියහු ල, මෙවන් දෘෂ්ටි ඇතියහු ල, යනු සැබෑ වේ ද ? යි පුළුවුස්මි.

මහණෙනි, ඉදින් මා විසින් මෙසෙයින් පුළුවුස්නාලද ඒ නුවටහු 'එසේ යැ'යි පිළිත කෙරෙද්ද, මම උනට මෙසේ කියමි : ''ඇවැත්නි, නිගණ්ඨයෙනි, කිම තෙපි 'ඇපි පෙර වූමෝ මැ යැ, නොවූමෝ නො වම්හ''යි දන්නාව ?

ඇවැත්නි, මෙය නො දනුම්හ.

කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානාථ: අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං න නාකරම්හා'ති.

නො හිදං ආවුසො.

කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානාථ එවරූපං වා පාපං කම්මං අකරම්හා'ති.

නො හිදං ආවුසො.

කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානාථ: එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං, එත්තකං වා දුක්ඛං නිජ්ජීරෙතබ්බං[1] එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති.

නො හිදං ආවුසො.

කිං පන තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං, කුසලානං ධම්මානං උපසම්පද'න්ති.

නො හිදං ආවුසො.

ඉති කිර තුම්හෙ ආවුසො නිගණ්ඨා, න ජානාථ: 'අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හා'ති. න ජානාථ 'අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං න නාකරම්හා'ති. න ජානාථ, 'එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හා'ති. න ජානාථ 'එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං, එත්තකං වා දුක්ඛං නිජ්ජීරෙතබ්බං,[1] එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. න ජානාථ: දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං, කුසලානං ධම්මානං උපසම්පදං. එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං න කල්ලමස්ස වෙය්‍යාකරණාය: "යංකිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති, සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙ කතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා, නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී"ති.

සචෙ[2] තුම්හෙ ආවුසො නිගණ්ඨා, ජානෙය්‍යාථ අහුවම්හෙව මයං පුබ්බෙ න නාහුවම්හා'ති. ජානෙය්‍යාථ අකරම්හෙව මයං පුබ්බෙ පාපං කම්මං න නාකරම්හා'ති. ජානෙය්‍යාථ 'එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හා'ති, ජානෙය්‍යාථ 'එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං එත්තකං වා දුක්ඛං නිජ්ජීරෙතබ්බං,[1] එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. ජානෙය්‍යාථ 'දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං කුසලානං ධම්මානං උපසම්පදං, එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං කල්ලමස්ස වෙය්‍යාකරණාය: "යංකිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං පුබ්බෙකතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො, ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී"ති.

---

1. නිජ්ජීරෙතබ්බං - මජසං.
2. සචෙ පන - සිමු, මජසං, ස්‍යා.

ඇවැත්නි නිගණ්ඨයෙනි, කිම තෙපි "ඇපි පෙර පාපකර්ම කළමෝ මැ යැ, නොකළ මෝ නො වම්හ"යි දන්නාව ?

ඇවැත්නි, මෙය නො දනුම්හ.

ඇවැත්නි නිගණ්ඨයෙනි, කිම තෙපි " මෙවත් මෙවත් හෝ පාපකර්ම කළම්හ"යි දන්නාව ?

ඇවැත්නි, මෙය නො දනුම්හ.

ඇවැත්නි නිගණ්ඨයෙනි, කිම තෙපි 'මෙතෙක් දුක් දිරිණ හෝ මෙතෙක් දුක් දිරවිය යුතු යැ හෝ මෙතෙක් දුක් දිරුණු කලැ හැම දුක් නිර්ජීණ වෙති' හෝ දන්නාව ?

ඇවැත්නි, මෙය නො දනුම්හ.

ඇවැත්නි, නිගණ්ඨයෙනි, කිම තෙපි "දුටුදැම්යෙහි මැ අකුශල ධර්මයන් ගේ ප්‍රහාණ හා කුශලධර්මයන් ගේ උපසම්පත් (රැස් කිරීම) වෙති'යි දන්නාව ?

ඇවැත්නි, මෙය නො දනුම්හ.

ඇවැත් නිගණ්ඨයෙනි, මෙසේ වත් මැ තෙපි "ඇපි පෙර වූමෝ මැ යැ නොවූමෝ නො වම්හ" යනුදු නො දන්නහු යැ. "ඇපි පෙර පාපකර්ම කළමෝ මැ යැ නො කළමෝ නො වම්හ" යනුදු නො දන්නහු යැ. " මෙවත් මෙවත් හෝ පාපකර්ම කළම්හ" යනුදු නො දන්නහු යැ, මෙතෙක් හෝ දුක් දිරිණ මෙතෙක් හෝ දුක් දිරවියැ යුතු වැ ඇත. මෙතෙක් හෝ දුක් දිරුණු කලැ හැම දුක් නිර්ජීණ වෙති"යි මෙ ද නො දන්නහු යැ. "ඉහාත්මයෙහි මැ අකුශලධර්මයන් ගේ ප්‍රහාණ හා කුශලධර්මයන් ගේ උපසම්පත් වෙති"යි මෙ ද නො දන්නහු යැ. මෙසේ මෙතෙක් කරුණු නො දන්නා කලැ ආයුෂ්මත් නිගණ්ඨයනට "මේ පුරුෂපුද්ගල සුව වේව'යි දුක් වේව'යි නොදුක් නොසුව වේව'යි යම් මැ වේදයිතයක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කර්මප්‍රත්‍යයෙන් වෙයි. මෙසේ වන හෙයින් පුරාණ කර්මයන් තපසින් විගතාන්ත කිරීමෙන්, නවකර්මයන් නො කිරීමෙන් මතුයෙහි කර්ම රැස්කිරීමෙක් නො වෙයි. මතුයෙහි කර්ම රැස් නො කිරීම් හෙතුයෙන් කර්මක්ෂය වෙයි. කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි. දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි. වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීණ වෙති" ප්‍රකාශ කරන්නට යුතු නො වේ.

ඇවැත් නිගණ්ඨයෙනි, ඉදින් තෙපි "පෙර ඇපි වූමෝ මැ'යැ, නොවූමෝ නො වම්හ" යි දන්නවු නම්, 'ඇපි පෙර පව් කම් කළමෝ මැ යැ, නො කළමෝ නොවම්හ'යි දන්නවු නම් මෙවත් මෙවත් හෝ පව්කම් කළම්හ'යි දන්නවු නම් ; මෙතෙක් හෝ දුක් දිරිණ, මෙතෙක් හෝ දුක් දිරවියැ යුතු වැ ඇත, මෙතෙක් හෝ දුක් දිරුණු කල හැම දුක් නිර්ජීණ වෙති' දන්නවු නම්, ඉහාත්මයෙහි මැ අකුශල ධර්මයන් ගේ ප්‍රහාණය හා කුශල ධර්මයන් ගේ උපසම්පත් දන්නවු නම්, මෙසේ වත් මැ ආයුෂ්මත් නිගණ්ඨයනට " මේ පුරුෂ පුද්ගල සුව වේව'යි දුක් වේව'යි නොදුක් නොසුව වේව'යි යම් මැ වෙදයිතයක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කර්මප්‍රත්‍යයෙනැ, මෙසේ වන හෙයින් පුරාණ කර්මයන් තැවීමෙන් විගතාන්ත කිරීමෙනුදු නවකර්මයන් නො කිරීමෙනුදු මතුයෙහි කර්ම රැස් නො කරනු වෙයි, මතුයෙහි අනාවස්‍රවයෙන් (කර්ම රැස් නො කිරීමෙන්) කර්මක්ෂය වෙයි, කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි, දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි, වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීණ වෙති" පවසන්නට යුතු වන්නේ ය.

සෙය්‍යථාපි ආවුසො නිගණ්ඨා, පුරිසො සල්ලෙන විද්ධො අස්ස සවිසෙන ගාළ්හූපලෙපනෙන, සො සල්ලස්සපි වෙදනාහෙතු[1] දුක්ඛා තිප්පා[2] කටුකා වෙදනා වෙදියෙය්‍ය. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං. තස්ස සො භිසක්කො සල්ලකත්තො සත්ථෙන වණමුඛං පරිකන්තෙය්‍ය. සො සත්ථෙනපි වණමුඛස්ස පරිකන්තනහෙතු දුක්ඛා තිප්පා[2] කටුකා වෙදනා වෙදියෙය්‍ය. තස්ස සො භිසක්කො සල්ලකත්තො එසනියා සල්ලං එසෙය්‍ය. සො එසනියාපි සල්ලස්ස එසනා හෙතු[3] දුක්ඛා තිප්පා[2] කටුකා වෙදනා වෙදියෙය්‍ය, තස්ස සො භිසක්කො සල්ලකත්තො සල්ලං අබ්බහෙය්‍ය[4]. සො සල්ලස්සපි අබ්බහන-හෙතු[5] දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙය්‍ය. තස්ස සො භිසක්කො සල්ලකත්තො අගදඞ්ගාරං වණමුඛෙ ඔදහෙය්‍ය. සො අගදඞ්ගාරස්සපි වණමුඛෙ ඔදහනහෙතු දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙය්‍ය. සො අපරෙන සමයෙන රූළ්හෙන වණෙන සඤ්ඡවිනා අරොගො අස්ස සුඛී සෙරී සයංවසී යෙන කාමඞ්ගමො. තස්ස එවමස්ස : ‘අහං ඛො පුබ්බෙ සල්ලෙන විද්ධො අහොසිං සවිසෙන ගාළ්හූපලෙපනෙන. සො’හං සල්ලස්සපි වෙදනාහෙතු දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිං. තස්ස මෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨා-පෙසුං[6]. තස්ස මෙ සො භිසක්කො සල්ලකත්තො සත්ථෙන වණමුඛං පරිකන්ති. සො’හං සත්ථෙනපි[7] වණමුඛස්ස පරිකන්තනහෙතු දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිං. තස්ස මෙ සො භිසක්කො සල්ලකත්තො එසනියා සල්ලං එසි. සො’හං එසනියාපි සල්ලස්ස එසනාහෙතු[3] දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිං. තස්ස මෙ සො භිසක්කො සල්ලකත්තො සල්ලං අබ්බහි[8] සො’හං සල්ලස්සාපි අබ්බහනහෙතු[5] දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිං තස්ස මෙ සො භිසක්කො සල්ලකත්තො අගදඞ්ගාරං වණමුඛෙ ඔදහි. සො’හං අගදඞ්ගාරස්සපි වණමුඛෙ ඔදහනහෙතු දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියිං. සො’මහි එතරහි රූළ්හෙන වණෙන සඤ්ඡවිනා අරොගො සුඛී සෙරී සයංවසී යෙන කාමඞ්ගමො’ති.

එවමෙව ඛො ආවුසො නිගණ්ඨා, සචෙ තුම්හෙ ජානෙය්‍යාථ අහුවමෙහව මයං පුබ්බෙ, න නාහුවම්හා’ති. ජානෙය්‍යාථ ‘අකරමෙහව මයං පුබ්බෙ පාපං කම්මං, න නාකරම්හා’ති. ජානෙය්‍යාථ එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හා’ති. ජානෙය්‍යාථ එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං, එත්තකං වා දුක්ඛං නිජ්ජීරෙතබ්බං. එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී’ති. ජානෙය්‍යාථ ‘දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං, කුසලානං ධම්මානං උපසම්පදං. එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං කල්ලමස්ස වෙය්‍යාකරණාය: ‘යඞ්කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා, දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං පුබ්බෙකතහෙතු : ඉතී පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී’ති.

---

1. වෙදනහෙතු - ස්‍යා.
2. තිබ්බා - මජ්සං.
3. එසනහෙතු - ස්‍යා. / එසණාහෙතු - සීමු.
4. අබ්බුණ්හෙය්‍ය - ස්‍යා. / අබ්බ්‍යහෙය්‍ය - PTS
5. අබ්බුණ්හනහෙතු - ස්‍යා. / අබ්බ්‍යහනහෙතු - PTS
6. උපට්ඨපෙසුං - මජ්සං, ස්‍යා.
7. සල්ලෙනපි - PTS.
8. අබ්බ්‍යහි - PTS. / අබ්බුණ්හි - ස්‍යා.

ඇවැත්නි නිගණ්ඨයෙනි, යම් පරිදි පුරුෂයෙක් විෂසහිත ගාඪොපලෙපන (පුනපුනා විෂ ගැල්වීම්) ඇති ශල්‍යයෙන් විදුනා ලද වේ ද, හේ ශල්‍යවෙදනාහෙතුයෙනුදු දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා විඳුනේ වේ ද, ඔහුගේ මිත්‍රාමාත්‍යයෝ නෑ සහලේනෑයෝ ශල්‍යවෛද්‍යවරයකු එළවන්නාහු ද, ඒ ශල්‍යවෛද්‍යයා ශස්ත්‍රයෙන් ඔහුගේ ව්‍රණමුඛ සිඳුනේ වේ ද, හේ ශස්ත්‍රයෙන් ව්‍රණමුඛ ඡෙදනාහෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳුනේ වේ ද, ඒ ශල්‍යවෛද්‍යවරයා ඔහුගේ ශල්‍යය එෂණියෙන් (විමසුම් සලාකායෙන්) සොයන්නේ වේ ද, හේ එෂණියෙන් ශල්‍යෙෂණ හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳුනේ වේ ද, ඒ ශල්‍යවෛද්‍යවරයා ඔහුගේ ශල්‍යය උදුරන්නේ වේ ද, හේ ශල්‍යොද්ධරණ හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳුනේ වේ ද, ඒ ශල්‍යවෛද්‍යවරයා ඔහුගේ ව්‍රණමුඛයෙහි අගදඞ්ගාර (දූවූ අරළු හෝ ඇඹුල හෝ සුනු) බහාලන්නේ වේ ද, හේ ව්‍රණමුඛයෙහි අගදඞ්ගාර බහාලන හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳුනේ වේ ද, හේ පසු කලෙක රුඪව්‍රණයෙන් යුක්ත වැ නැඟුණු සිවි ඇති වැ අරොග වූයේ සුඛිත ස්වෛරී ස්වයංවශී වූයේ රිසි තැන රිසිසේ යනුයෙක් වේ ද, ඔහුට මෙබඳු සිතෙක් වෙයි : ''මම් පෙර සවිෂ ගාඪොපලෙපන ඇති විත් කැයෙම් වෙමි. එ මම් ශල්‍යවේදනා හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳියෙමි. ඒ මාගේ මිත්‍රාමාත්‍යයෝ නෑ සහලේනෑයෝ ශල්‍යවෛද්‍යවරයකු එළවාදුන්හ. ඒ ශල්‍යවෛද්‍යවරයා ශස්ත්‍රයෙන් මාගේ ව්‍රණමුඛ සිඳපී යැ, එ මම් ශස්ත්‍රයෙනුදු ව්‍රණමුඛ සිඳීම් හෙතුයෙන් දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳියෙමි. ඒ ශල්‍යවෛද්‍යවරයා එෂණියෙන් මාගේ ශල්‍යය සෙවියැ, එ මම් එෂණියෙන් ශල්‍ය එෂණහෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳියෙමි. ඒ ශල්‍යවෛද්‍යවරයා මාගේ ශල්‍යය උපුළාපී යැ, එ මම් ශල්‍යොද්ධරණ හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳියෙමි. ඒ ශල්‍යවෛද්‍යවරයා මාගේ ව්‍රණමුඛයෙහි අගදඞ්ගාර බහාලී යැ, එ මම් ව්‍රණමුඛයෙහි අගදඞ්ගාර බහාලනු හෙතුයෙනුදු දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳියෙමි. දැන් එ මම රුඪව්‍රණ ඇති වැ, වැඩුණු සිවියෙන් යුතු වැ, අරොග වූයෙම් සුඛිත ස්වෛරී ස්වයංවශී වූයෙම් රිසි තැනැ රිසිසේ යනුයෙම් වෙමි'' සිතයි.

ඇවැත් නිගණ්ඨයෙනි, එපරිදි මැ තෙපි ඉදින් (මෙසේ) දන්නවූ නම් : ''ඇපි පෙර වූම්හු මැ යැ, නො වූමෝ නො වම්හ'යි. 'ඇපි පෙර පව්කම් කළමෝ මැ යැ, නො කළමෝ නොවම්හ'යි දන්නවූ නම්, 'මෙවන් හෝ මෙවන් හෝ පව්කම් කළම්හ'යි දන්නවූ නම්, 'මෙතෙක් දුක් දිරිණැ හෝ, මෙතෙක් දුක් දිරැවියැ යුතු වැ ඇතැ හෝ, මෙතෙක් දුක් දිරුණු කල හැම දුක් නිර්ජීර්ණ වෙති හෝ දන්නවූ නම්. ඉහාත්මයෙහි මැ අකුශලධර්මයන් ගේ ප්‍රහාණ හා කුශල ධර්මයන් ගේ උපසම්පත් හා වෙති'' දන්නවූ නම්, මෙසේ කරුණු දන්නා කල ආයුෂ්මත් නිගණ්ඨයනට '' මේ පුරුෂපුද්ගල සුව වෙව'යි දුක් වෙව'යි නොදුක් නොසුව වෙව'යි යම් මැ වේදයිතයක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කර්මප්‍රත්‍යයෙනැ, මෙසේ පුරාණ කර්මයන් තැවීමෙන් විගතාන්ත කිරීමෙනුදු, නව කර්මයන් රැස් නො කිරීමෙනුදු, මතුයෙහි කර්ම රැස්කරනු නො වෙයි, මතුයෙහි කර්ම රැස්නොකිරීමෙන් කර්මක්ෂය වෙයි, කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි, දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි, වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීර්ණ වෙති'' පවසන්නට නිසි වෙයි.

යස්මා ච ඛො තුම්හෙ ආවුසො නිගණ්ඨා, න ජානාථ 'අහුවමෙහව මයං පුබ්බෙ න නාහුවම්හා'ති. න ජානාථ 'අකරමෙහව මයං පුබ්බෙ පාපං කම්මං, න නාකරම්හා'ති. න ජානාථ 'එවරූපං වා එවරූපං වා පාපං කම්මං අකරම්හා'ති. න ජානාථ එත්තකං වා දුක්ඛං නිජ්ජිණ්ණං එත්තකං වා දුක්ඛං නිජ්ජීරෙතබ්බං, එත්තකම්හි වා දුක්ඛෙ නිජ්ජිණ්ණෙ සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. න ජානාථ දිට්ඨෙව ධම්මෙ අකුසලානං ධම්මානං පහානං කුසලානං ධම්මානං උපසම්පදං. තස්මා ආයස්මන්තානං නිගණ්ඨානං න කල්ලමස්ස වෙය්‍යාකරණාය: 'යඞ්කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං පුබ්බෙකතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො. ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං[1] නිජ්ජිණ්ණං භවිස්සතීති.

එවං වුත්තෙ භික්ඛවෙ, තෙ නිගණ්ඨා මං එතදවොචුං: 'නිගණ්ඨො[2] ආවුසො, නාතපුත්තො[3] සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: 'චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිත'න්ති. සො එවමාහ: 'අත්ථි ඛො වො ආවුසො නිගණ්ඨා, පුබ්බෙව පාපං කම්මං කතං, තං ඉමාය කටුකාය දුක්කරකාරිකාය නිජ්ජරෙථ.[4] යම්පනෙත්ථ එතරහි කායෙන සංවුතා වාචාය සංවුතා මනසා සංවුතා, තං ආයතිං පාපස්ස කම්මස්ස[5] අකරණං, ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො, ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. තඤ්ච පනම්හාකං රුච්චති චෙව ඛමති ච, තෙන චම්හා අත්තමනා'ති

එවං වුත්තෙ අහං භික්ඛවෙ, තෙ නිගණ්ඨෙ එතදවොචං: 'පඤ්ච ඛො ඉමෙ ආවුසො නිගණ්ඨා, ධම්මා දිට්ඨෙවධම්මෙ ද්විධා විපාකා. කතමෙ පඤ්ච: සද්ධා රුචි අනුස්සවො ආකාරපරිවිතක්කො දිට්ඨිනිජ්ඣානක්ඛන්ති. ඉමෙ ඛො ආවුසො නිගණ්ඨා, පඤ්ච ධම්මා දිට්ඨෙව ධම්මෙ ද්විධා විපාකා. තත්‍රායස්මන්තානං නිගණ්ඨානං කා අතීතංසෙ සත්ථරි සද්ධා, කා රුචි, කො අනුස්සවො, කො ආකාරපරිවිතක්කො, කා දිට්ඨිනිජ්ඣානක්ඛන්තී'ති. එවංවාදී ඛො අහං භික්ඛවෙ, නිගණ්ඨෙසු න කිඤ්චි සහධම්මිකං වාදපටිහාරං[6] සමනුපස්සාමි

පුනචපරාහං භික්ඛවෙ, තෙ නිගණ්ඨෙ එවං වදාමි: 'තං කිම්මඤ්ඤථාවුසො නිගණ්ඨා, යස්මිං හි වො සමයෙ තිබ්බො උපක්කමො හොති තිබ්බං පධානං, තිබ්බා[7] තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. යස්මිං පන වො සමයෙ න තිබ්බො උපක්කමො හොති න තිබ්බං පධානං, න තිබ්බා තස්මිං[8] සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථා'ති.

---

1. සබ්බං තං දුක්ඛං - PTS.
2. නිගණ්ඨො - සගා.
3. නාටපුත්තො - මජසං, සගා.
4 නිජ්ජීරෙථ - සීමු, මජසං
5. පාපකම්මස්ස - මජසං.
6. පරිහාරං - මජසං, සීමු, සගා.
7. තිප්පං, තිප්පා - PTS.
8. තමහි - PTS

තවද ඇවැත් නිගණ්ඨයෙනි, යම් හෙයෙකින් තෙපි ''පෙර ඇපි වූමෝ මැ යැ, නොවූමෝ නො වම්හ'යි නො දන්නවු ද, පෙර ඇපි පව්කම් කළමෝ මැ යැ, නො කළමෝ නො වම්හ'යි නො දන්නවු ද, මෙවන් හෝ මෙවන් හෝ පව්කම් කළම්හ'යි නො දන්නවු ද, මෙතෙක් දුක් දිරිණු හෝ, මෙතෙක් දුක් දිර වියැ යුතු වැ ඇතැ හෝ, මෙතෙක් දුක් නිර්ජීණ් කල්හි හැම දුක් නිර්ජීණ් වෙති, හෝ නො දන්නවු ද, ඉහාත්මයෙහි මැ අකුශල ධර්මයන් ගේ ප්‍රහාණ හා කුශලධර්මයන්ගේ උපසම්පත් හා නො දන්නවු ද, එහෙයින් ආයුෂ්මත් නිගණ්ඨයනට '' මේ පුරුෂපුද්ගල සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වේදයිතයක් විඳී ද එ හැම පූර්වකෘත කර්මප්‍රත්‍යයෙන් වේ යයි ද මෙසේ පුරාණකර්මයන් ගේ තැවීමෙන් විගතාන්තභාවයෙනුදු නවකර්මයන් ගේ රැස් නො කිරීමෙනුදු මතුයෙහි කර්මයන් ගේ රැස් වීමෙක් නො වෙයි. මතුයෙහි කර්ම රැස් නො වීමෙන් කර්මක්ෂය වෙයි. කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි. දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි. වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීණ් වෙති'යි ප්‍රකාශ කිරීමට නො නිසි වේ යයි.

මහණෙනි, මෙසේ කී කල්හි ඒ නිගණ්ඨයෝ මට තෙල කීහු : ''ඇවැත්නි, නිගණ්ඨනාතපුත්‍ර සර්‍වඥ යැ සර්‍වදර්ශී යැ නිරවශෙෂ කොට ඥානදර්ශනය ප්‍රතිඥ කෙරෙයි : ඇවිදිනා වූ ද සිටුනා වූ ද නිදන්නා වූ ද නිදි වරන්නා වූ ද මට නිරතුරු ඥානදර්ශනය එළැඹසිටියේ වනැ''යි. හෙ මෙසේ කියයි : ''ඇවැත්නි, නිගණ්ඨයෙනි, තොප විසින් පෙර මැ කරන ලද පව්කම් ඇත් මැ යැ. එය මේ කටුක වූ දුෂ්කරක්‍රියා හෙතුයෙන්, නිර්ජීණ් කරවු. තවද දැන් මෙහි යම් හෙයෙකින් කයින් සංවෘත වූවාහු වචනයෙන් සංවෘත වූවාහු මනසින් සංවෘත වූවාහු ද එය මතුයෙහි පාපකර්මයා ගේ නො කිරීම වෙයි. මෙසේ පුරාණකර්මයන් තැවීමෙන් විගතාන්තභාවයෙනුදු නවකර්මයන් ගේ මතුයෙහි රැස් නො කිරීම වෙයි. මතුයෙහි රැස් නො කිරීම් හෙතුයෙන් කර්මක්ෂය වෙයි. කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි. දුඃඛක්ෂය හෙතුයෙන් වේදනාක්ෂය වෙයි. වේදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිර්ජීණ් වෙති''යි. එ ද වැළිත් අපට රුස්නේත් සහනේත් වෙයි. එයින් සතුටුසිත් ඇතියම්හ'යි.

මෙසේ කී කල්හි මහණෙනි, මම් ඒ නුවටුනට තෙල කීම් : ''ඇවැත්නි, නිගණ්ඨයෙනි, ඉහාත්මයෙහි මැ දෙපරිද්දෙකින් විපාක දෙන මේ පඤ්චධර්ම කෙනෙක් වෙති : කවර පසෙක යත් : ශ්‍රද්ධා යැ රුචි යැ අනුශ්‍රව යැ කාරණ පරිවිතර්ක යැ රුචි කොට ගත් දෘෂ්ටි යැ යි. ඇවැත්නි, නිගණ්ඨයෙනි, මේ පඤ්චධර්මයෝ ඉහාත්මයෙහි මැ දෙපරිදි විපාක ඇත්තාහු යැ. ඒ පඤ්චධර්මයන් කෙරෙහි ආයුෂ්මත් නිගණ්ඨයනට අතීතාංශවාදී ශාස්තෘහු කෙරෙහි ශ්‍රද්ධා කවර යැ ? රුචිය කවර යැ ? අනුශ්‍රවය කවරෙ යැ ? ආකාර පරිවිතර්කය කවරෙ යැ ? රුචි කොට ගත් දෘෂ්ටිය කවර යැ ?''යි. මහණෙනි, මෙසේ කියන මම් නුවටුන් කෙරෙහි සකාරණ වූ වාදප්‍රතිහාරයක් නො දක්මි.

යළිදු මහණෙනි, මම් ඒ නුවටුන්ට මෙසේ කියම් : ''ඇවැත්නි, නිගණ්ඨයෙනි, ඒ කිමෙකැයි සිතවු ද ? යම් කලෙකැ තොප ගේ තියුණු වූ උපක්‍රමය තියුණු වූ වියර්‍යය වේ ද, එකල්හි තිව්‍ර වූ උපක්‍රම ඇති දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා විඳින්නවු ද, යළි යම් කලෙකැ තොප ගේ තීව්‍ර උපක්‍රම නො වේ ද, තීව්‍ර වියර්‍යය නො වේ ද, එකල්හි තීව්‍ර නො වූ ඖපක්‍රමික වූ දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා විඳින්නවු ද'යි.

යස්මිං නො ආවුසො ගොතම, සමයෙ තිබ්බො උපක්කමො හොති තිබ්බං පධානං, තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියාම. යස්මිං පන නො සමයෙ න තිබ්බො උපක්කමො හොති, න තිබ්බං පධානං, න තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියාමා'ති.

ඉති කිරාවුසො[1] නිගණ්ඨා, යස්මිං වො[2] සමයෙ තිබ්බො උපක්කමො හොති තිබ්බං පධානං, තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. යස්මිං පන වො සමයෙ න තිබ්බො උපක්කමො හොති, න තිබ්බං පධානං, න තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං න කල්ලමස්ස වෙය්‍යාකරණාය: 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙ කතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති.

සචෙ ආවුසො නිගණ්ඨා, යස්මිං වො සමයෙ තිබ්බො උපක්කමො හොති තිබ්බං පධානං, න තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. යස්මිං පන වො සමයෙ න තිබ්බො උපක්කමො හොති න තිබ්බං පධානං, තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං කල්ලමස්ස වෙය්‍යාකරණාය: 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකත-හෙතු. ඉති පුරාණානං කම්මානං -පෙ- සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති.

යස්මා ච ඛො ආවුසො නිගණ්ඨා, යස්මිං වො සමයෙ තිබ්බො උපක්කමො හොති තිබ්බං පධානං, තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. යස්මිං පන වො සමයෙ න තිබ්බො උපක්කමො හොති න තිබ්බං පධානං, න තිබ්බා තස්මිං සමයෙ ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියෙථ. තෙ තුම්හෙ සාමංයෙව ඔපක්කමිකා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියමානා අවිජ්ජා අඤ්ඤාණා සම්මොහා විපච්චෙථ: 'යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙ-කතහෙතු. ඉති පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවා නවානං කම්මානං අකරණා ආයතිං අනවස්සවො. ආයතිං අනවස්සවා කම්මක්ඛයො කම්මක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සතී'ති. එවං වාදීපි ඛො අහං භික්ඛවෙ, නිගණ්ඨෙසු න කඤ්චි[3] සහධම්මිකං වාදපටිහාරං සමනුපස්සාමි.

පුනචපරාහං[4] භික්ඛවෙ, තෙ නිගණ්ඨෙ එවං වදාමි: 'තං කිං මඤ්ඤථා-වුසො නිගණ්ඨා, 'යමිදං කම්මං දිට්ඨධම්මවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා, සම්පරායවෙදනීයං හොතූ'ති ලබ්භමෙත'න්ති.

නො හිදං ආවුසො.

---

1. කිර ආවුසො - සිමු, මජසං.
2. යස්මිං වො පන - සිමු.
3. කිඤ්චි - සිමු, PTS
4. පුනචපනාහං - PTS.

ඇවැත්නි, ගෞතමයෙනි, යම් කලෙකැ අප ගේ තීව්‍ර උපක්‍රම තීව්‍ර ව්‍යායාම වේ ද, එකල්හි තීව්‍ර උපක්‍රම ඇති දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා විඳිම්හ. යළි යම් කලෙකැ අප ගේ තීව්‍ර උපක්‍රම නො වේ ද, තීව්‍ර ව්‍යායාම නො වේ ද, එකල්හි තීව්‍ර වූ උපක්‍රම ඇති දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා නො විඳුම්හ''යි.

මෙසේ නම් ඇවත්නි නිගණ්ඨයෙනි, යම් කලෙකැ තොපගේ තියුණු උපක්‍රම තියුණු ව්‍යායාම වේ ද, එ සමයෙහි තියුණු වූ උපක්‍රමයෙන් හටගත් දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා විඳින්නවු ය. තවද යම් කලෙකැ තොපගේ තියුණු වූ උපක්‍රමය නො වේ ද, තියුණු වූ ව්‍යායාම නො වේ ද, එ සමයෙහි තියුණු වූ උපක්‍රමයෙන් හටගත් දුක් වූ තියුණු වූ කටුක වූ වේදනා නො විඳින්නවු ය. මෙසේ ඇති කල්හි ආයුෂ්මත් නිගණ්ඨයනට : ''මේ පුරුෂ පුද්ගල සුව වේවයි දුක් වේව'යි නොදුක් නොසුව වේව'යි යම් මැ වේදනාවක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කර්ම හෙයිනැ, මෙසේ පුරාණ කර්මයන් තැවීමෙන් විගතාන්ත කිරීමෙන් නවකර්මයන් නො කිරීමෙන් මතුයෙහි කර්මායුහණයෙක් නො වෙයි. මතුයෙහි අනායුහනයෙන් කර්මක්ෂය වෙයි, කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි, දුඃඛක්ෂය හෙතුයෙන් වෙදනාක්ෂය වෙයි, වෙදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිඃශෙෂයෙන් ජීර්ණ වෙති ප්‍රකාශ කිරීමට යුතු නො වේ.

ඉදින් ඇවැත්නි නිගණ්ඨයෙනි, යම් කලෙකැ තොපට තීව්‍ර උපක්‍රම වේ ද, තීව්‍ර ප්‍රධන් ව්‍යායා වේ ද, එ කල තීව්‍ර ඖපක්‍රමික වූ දුඃඛ වූ තීව්‍ර කටුක වෙදනා විඳින්නහු නම්, තවද යම් කලෙක තොපට තීව්‍ර උපක්‍රම නො වේ ද, තීව්‍ර ප්‍රධන් ව්‍යායා නො වේ ද එ කල තීව්‍ර ඖපක්‍රමික වූ දුක් වූ තියුණු වූ කටුක වෙදනා විඳින්නහු ය. මෙසේ වත් මැ ආයුෂ්මත් නිගණ්ඨයනට '' මේ පුරුෂ පුද්ගල සුව වේවයි, දුක් වේව යි, නො දුක් නොසුව වේව යි, යම් මැ වෙදයිතයක් විඳුනේ වේ ද එ හැම පෙර කළ කර්ම හෙයිනැ, මෙසේ පුරාණ කර්මයන් . . . හැම දුක් නිඃශෙෂයෙන් ජීර්ණ වෙති'යි කියන්නට නිසි වෙයි.

තවද ඇවැත්නි නිගණ්ඨයෙනි, යම්හෙයෙකින් තොපට යම් කලෙක තීව්‍ර උපක්‍රම වේ ද, තීව්‍ර ප්‍රධන් ව්‍යායා වේ ද, එ කල තීව්‍ර උපක්‍රම සම්භූත වූ දුක් වූ තියුණු වූ කටුක වෙදනා විඳින්නහු ය. තොපට යම් කලෙකැ තීව්‍ර උපක්‍රම නො වේ ද, තීව්‍ර ප්‍රධන් ව්‍යායා නො වේ ද, එ කලැ තීව්‍ර උපක්‍රම සම්භූත වූ දුක් වූ තියුණු වූ කටුක වෙදනා නො විඳින්නහු ය. එ තෙපි තුමූ මැ උපක්‍රම සම්භූත වූ දුක් වූ තියුණු වූ කටුක වෙදනා විඳුනාහු අවිද්‍යායෙන් අඥානයෙන් සම්මොහයෙන් ''මේ පුරුෂ පුද්ගල සුව වේව'යි දුක් වේව'යි නොදුක් නොසුව වේව'යි යම් මැ වෙදයිතයක් විඳුනේ වේ ද, එ හැම පෙර කළ කර්ම හෙයිනැ, මෙසේ පුරාණ කර්ම යන් තැවීමෙන් විගතාන්ත කිරීමෙන් නවකර්මයන්, නො කිරීමෙන් මතුයෙහි කර්මායුහණ නො වෙයි, මතුයෙහි අනායුහනයෙන් කර්මක්ෂය වෙයි, කර්මක්ෂය හෙතුයෙන් දුඃඛක්ෂය වෙයි, දුඃඛක්ෂය හෙතුයෙන් වෙදනාක්ෂය වෙයි, වෙදනාක්ෂය හෙතුයෙන් හැම දුක් නිඃශෙෂයෙන් ජීර්ණ වෙති'' වෙසෙසින් පිළිගන්නහු ය. මෙබඳු වාද ඇත්තාහු නමුදු මහණෙනි, මම නුවටුන් කෙරෙහි සකාරණ වූ කිසි වාදපරිහාරයක් නො දක්මි.

යළිදු අනෙකක් කියමි : ''මහණෙනි, මම ඒ නුවටුනට මෙසේ කියමි : ඇවැත්නි නිගණ්ඨයෙනි ඒ කෙසේ හඟිවූ ද ? ඉහාත්මයෙහි විඳුනට නිසි යම් මේ කර්මයෙක් ඇද්ද එය උපක්‍රමයෙන් හෝ ප්‍රධන් ව්‍යායාමයෙන් හෝ පරලොව විඳුනට නිසි වේවා'' යනු තෙල ලැබියැ හේ ද ?

ඇවැත්නි, තෙල නො වේ මැ යැ.

යං පනිදං කම්මං සම්පරායවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා, දිට්ඨධම්මවේදනීයං හෝතූති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

තං කිං මඤ්ඤථාවුසෝ නිගණ්ඨා, යමිදං කම්මං සුඛවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා දුක්ඛවේදනීයං හෝතූති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

යං පනිදං කම්මං දුක්ඛවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා සුඛවේදනීයං හෝතූති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

තං කිං මඤ්ඤථාවුසෝ නිගණ්ඨා, යමිදං කම්මං පරිපක්කවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා අපරිපක්කවේදනීයං හෝතූ'ති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

යං පනිදං කම්මං අපරිපක්කවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා, පරිපක්කවේදනීයං හෝතූති ලබ්භමේත'න්ති

නෝ හිදං ආවුසෝ.

තං කිං මඤ්ඤථාවුසෝ නිගණ්ඨා, 'යමිදං කම්මං බහුවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා 'අප්පවේදනීයං හෝතූ'ති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

යං පනිදං කම්මං අප්පවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා 'බහුවේදනීයං හෝතූ'ති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

තං කිං මඤ්ඤථාවුසෝ නිගණ්ඨා, 'යමිදං කම්මං වේදනීයං තං උපක්කමේන වා පධානේන වා 'අවේදනීයං හෝතූ'ති ලබ්භමේත'න්ති.

නෝ හිදං ආවුසෝ.

යං පනිදං කම්මං අවේදනීයං, තං උපක්කමේන වා පධානේන වා වේදනීයං හෝතූ'ති ලබ්භමේතන්ති.

නෝ හිදං ආවුසෝ.

යම් මේ කර්මයෙක් පරලොවැ විඳුනට නිසි වේ ද, එය උපක්‍රමයෙන් හෝ ප්‍රධන් වියඖයෙන් හෝ ඉහාත්මයෙහි විඳුනට නිසි වේවා' යන තෙල ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මෙ ද නො වේ මැ යැ.

ඇවැත්නි නිගණ්ඨයෙනි, එ කිමැයි සිතවු ද ? සුඛ වෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් වේව'යි ප්‍රධන් වියඖයෙන් වේව'යි දුඃඛ වේදනීයවේවා' යන තෙල ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ යැ.

තවද දුඃඛවේදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, උපක්‍රමයෙන් හෝ ප්‍රධන් වියඖයෙන් හෝ ඒ කර්මය 'සුඛවෙදනීය වේවා' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ යැ.

ඇවැත් නිගණ්ඨයෙනි, ඒ කිමැයි සිතවු ද ? ඉහාත්මයෙහි විපාකවිඳනායට නිසි වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් වේවයි ප්‍රධන්වියඖයෙන් වේවයි ''සම්පරාය වෙදනීය කර්මයෙක් වේවා'' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නොවේ මැ යැ.

තවද, යම් කර්මයක් අපරිපක්ව ආත්මභාවයෙහි හෙවත් සම්පරායෙහි වෙදනීය වේ ද, ඒ කර්මය උපක්‍රමයෙන් වේවයි ප්‍රධන්වියඖයෙන් වේවයි ''පරිපක්වවෙදනීය වේවා'' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ යැ.

ඇවැත්නි, නිගණ්ඨයෙනි, එ කිමැ'යි සිතවු ද ? බහුවෙදනීය හෙවත් සංඥභාවයට පමුණුවන යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ ප්‍රධන් වියඖයෙන් හෝ ''අල්පවෙදනීය හෙවත් අසංඥභාවයට පමුණුවන්නක් වේවා'' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ යැ.

තවද අල්පවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ ප්‍රධන් වියඖයෙන් හෝ ''බහුවෙදනීය වේවා'' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ ය .

ඇවැත්නි, නිගණ්ඨයෙනි, එ කිමැ'යි සිතවු ද ? වෙදනීය හෙවත් සවිපාක වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වියඖයෙන් හෝ ''අවෙදනීය හෙවත් විපාක රහිත කර්මයෙක් වේවා'' යන තෙල කරුණ වේ දැ ? යි.

ඇවැත්නි, මේ නො වේ මැ යැ.

තවද අවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වියඖයෙන් හෝ ''වෙදනීය (සවිපාක) වේවා'' යන තෙල කරුණ ලැබියැ හේ දැ ? යි.

ඇවැත්නි, මේ නොවේ මැ යැ.

ඉති කිරාවුසො නිගණ්ඨා, යමිදං කම්මං දිට්ඨධම්මවෙදනීයං තං උපක්කමෙන වා පධානෙන වා 'සම්පරායවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං[1] කම්මං සම්පරායවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා 'දිට්ඨධම්මවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං කම්මං සුඛවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා 'දුක්ඛවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං කම්මං දුක්ඛවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා සුඛවෙදනීයං හොතූති අලබ්භමෙතං. යමිදං කම්මං පරිපක්කවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා 'අපරිපක්කවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං, යමිදං කම්මං අපරිපක්කවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා 'පරිකම්ම වෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං කම්මං බහුවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා අප්පවෙදනීයං හොතූති අලබ්භමෙතං. යමිදං කම්මං අප්පවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා බහුවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං කම්මං වෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා අවෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. යමිදං කම්මං අවෙදනීයං, තං උපක්කමෙන වා පධානෙන වා වෙදනීයං හොතූ'ති අලබ්භමෙතං. එවං සන්තෙ ආයස්මන්තානං නිගණ්ඨානං අඵලො උපක්කමො හොති අඵලං පධානං. එවංවාදී භික්ඛවෙ, නිගණ්ඨා එවංවාදීනං භික්ඛවෙ නිගණ්ඨානං දස සහධම්මිකා වාදනුවාද ගාරය්හං ඨානං[2] ආගච්ඡන්ති.

සචෙ භික්ඛවෙ සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, නිගණ්ඨා පුබ්බෙ දුක්කතකම්මකාරිනො, යං එතරහි එවරූපා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. සචෙ භික්ඛවෙ, සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, නිගණ්ඨා පාපකෙන ඉස්සරෙන නිම්මිතා, යං එතරහි එවරූපා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. සචෙ භික්ඛවෙ සත්තා සඞ්ගතිභාව-හෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ නිගණ්ඨා පාපසඞ්ගතිකා, යං එතරහි එවරූපා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. සචෙ භික්ඛවෙ, සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං සටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, නිගණ්ඨා පාපාභිජාතිකා, යං එතරහි එවරූපා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති. සචෙ භික්ඛවෙ, සත්තා දිට්ඨධම්මූපක්කම-හෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, නිගණ්ඨා පාප-දිට්ඨධම්මූපක්කමා[3]. යං එතරහි එවරූපා දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදියන්ති.

---

1. යං පනිදං - සීමු. මජසං.
2. ගාරය්හට්ඨානං - ස්‍යා.
3. එවරූපා දිට්ඨධම්මූපක්කමා - සීමු, මජසං.

ඇවැත්නි, නිගණ්ඨයෙනි, මෙසේ නම් ඉහාත්මයෙහි විපාක විඳුමට නිසි වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "සම්පරායවෙදනීය වේවා" යන තෙල නො ලැබියැ හෙයි. සම්පරාය වෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "ඉහාත්මයෙහි විපාක විඳුමට නිසි වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. යම් කර්මයෙක් සුඛවෙදනීය වේ ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "දුඃඛවෙදනීය වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. දුඃඛවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "සුඛවෙදනීය වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. පරිපක්ව වෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, ඒ කර්මය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "අපරිපක්ව වෙදනීය වේවා" යන තෙල කරුණ නො ලැබිය හෙයි. අපරිපක්වවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, එය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "පරිපක්වවෙදනීය වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. බහුවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, එය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "අල්පවෙදනීය වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. අල්පවෙදනීය වූ යම් කර්මයෙක් ඇද්ද, එය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "බහුවෙදනීය වේවා" යන මෙ කරුණ නො ලැබියැ හෙයි. සවිපාක වූ යම් කර්මයෙක් ඇද්ද, එය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "අවිපාක වේවා" යන තෙල නො ලැබියැ හෙයි. අවිපාක වූ යම් කර්මයෙක් ඇද්ද, එය උපක්‍රමයෙන් හෝ වීර්‍ය්‍යයෙන් හෝ "සවිපාක වේවා" යන තෙල කරුණ නො ලැබියැ හෙයි. මෙසේ වත් මැ ආයුෂ්මත් නුවටුන් ගේ උපක්‍රමය නිෂ්ඵල වෙයි. ප්‍රධන්වීර්‍ය්‍යය නිෂ්ඵල වෙයි. මහණෙනි, නිගණ්ඨයෝ මෙ බඳු වාද ඇත්තාහු යැ. මහණෙනි, මෙ බඳු වාද ඇති නුවටුන් ගේ දසවාදනුවාදයෝ සකාරණ වැ විඥයන් විසින් ගැරුහියැයුතු තැනට පැමිණෙත්.

මහණෙනි, ඉදින් සත්ත්වයෝ පූර්වකෘතහෙතුවින් සුවදුක් විඳිත් නම්, මහණෙනි, ඒකාන්තයෙන් නිගණ්ඨයෝ පෙර දුෂ්කෘතකර්ම කළාහු වෙති. යම් හෙයෙකින් මෙ කල්හි මෙ බඳු දුක් වූ තියුණු වූ කටුක වෙදනා විඳිත් ද එහෙයිනි. මහණෙනි, ඉදින් සත්ත්වයෝ ඊශ්වරනිර්මාණහෙතුවින් සුවදුක් විඳිත් නම්, මහණෙනි, ඒකාන්තයෙන් නිගණ්ඨයෝ පාපී ඊශ්වරයකු විසින් නිර්මාණය කරන ලදහ. යම් හෙයෙකින් මෙ කල්හි මෙ බඳු දුක් වූ තියුණු වූ කටුක වෙදනා විඳිත් ද එහෙයිනි. මහණෙනි, ඉදින් සත්ත්වයෝ නියතිභාවහෙතුවින් සුවදුක් විඳිත් නම්, මහණෙනි, ඒකාන්තයෙන් නිගණ්ඨයෝ පාපනියති ඇත්තාහු වෙති. යම් හෙයෙකින් මෙකල්හි මෙ බඳු දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳිත් ද එහෙයිනි. මහණෙනි, ඉදින් සත්ත්වයෝ අභිජාතිහෙතුවින් සුවදුක් විඳිත් නම්, මහණෙනි, ඒකාන්තයෙන් නිගණ්ඨයෝ පාප අභිජාති ඇත්තාහු වෙති. යම් හෙයෙකින් මෙ කල්හි මෙ බඳු දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳිත් ද එහෙයිනි. මහණෙනි, ඉදින් සත්ත්වයෝ ඉහාත්මයෙහි උපක්‍රමහෙතුවින් සුවදුක් විඳිත් නම්, මහණෙනි, ඒකාන්තයෙන් නිගණ්ඨයෝ ලාමක වූ දෘෂ්ටධර්ම උපක්‍රම ඇත්තාහු වෙති. යම් හෙයෙකින් මෙකල්හි මෙ බඳු දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳිත් ද එහෙයිනි.

සචෙ භික්ඛවෙ, සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති ගාරය්හා නිගණ්ඨා. නො චෙ සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. සචෙ භික්ඛවෙ, සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. නො චෙ සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. සචෙ භික්ඛවෙ, සත්තා සඞ්ගතිභාවහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. නො චෙ සත්තා සඞ්ගතිභාවහෙතු සුඛදුක්ඛං සපිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. සචෙ භික්ඛවෙ සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා නො චෙ සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. සචෙ භික්ඛවෙ සත්තා දිට්ඨධම්මූපක්කමහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. නො චෙ සත්තා දිට්ඨධම්මූපක්කමහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, ගාරය්හා නිගණ්ඨා. එවංවාදී භික්ඛවෙ නිගණ්ඨා. එවංවාදීනං භික්ඛවෙ, නිගණ්ඨානං ඉමෙ දස සහධම්මිකා වාදානුවාදා ගාරය්හං ඨානං ආගච්ඡන්ති. එවං ඛො භික්ඛවෙ, අඵලො උපක්කමො හොති අඵලං පධානං.

කථඤ්ච භික්ඛවෙ සඵලො උපක්කමො හොති සඵලං පධානං. ඉධ භික්ඛවෙ, භික්ඛු න හෙව අනද්ධභූතං අත්තානං දුක්ඛෙන අද්ධභාවෙති ධම්මිකඤ්ච සුඛං න පරිච්චජති. තස්මිඤ්ච සුඛෙ අනධිමුච්ඡිතො[1] හොති සො එවං පජානාති: ඉමස්ස ඛො මෙ දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. ඉමස්ස පන මෙ දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං[2] භාවයතො විරාගො හොතීති. සො යස්ස හි ඛ්වාස්ස[3] දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. සඞ්ඛාරං තත්ථ පදහති. යස්ස පනස්ස[4] දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං භාවයතො විරාගො හොති. උපෙක්ඛං තත්ථ භාවෙති. තස්ස තස්ස දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. එවම්පිස්ස තං දුක්ඛං නිජ්ජිණ්ණං හොති. තස්ස තස්ස දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං භාවයතො විරාගො හොති. එවම්පිස්ස තං දුක්ඛං නිජ්ජිණ්ණං හොති

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඉත්ථියා සාරත්තො පටිබද්ධචිත්තො තිබ්බච්ඡන්දො තිබ්බාපෙක්ඛො[5]. සො තං ඉත්ථිං පස්සෙය්‍ය අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු තස්ස පුරිසස්ස අමුං ඉත්ථිං දිස්වා අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති.

එවං භන්තෙ, තං කිස්ස හෙතු: අසු හි[6] භන්තෙ, පුරිසො අමුස්සා ඉත්ථියා සාරත්තො පටිබද්ධචිත්තො තිබ්බච්ඡන්දො තිබ්බාපෙක්ඛො[5]. තස්මා තං ඉත්ථිං දිස්වා අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසාති.

---

1. අනධිමුච්ඡිතෙ - PTS.
2. උපෙඛං - PTS.
3. { යස්ස හි ඛොපනස්ස - සීමු / යස්ස ඛ්වාස්ස - PTS.
4. යස්ස හි ඛ්වාස්ස - සීමු.
5. තිබ්බාපෙඛො - PTS.
6. අමුහි - PTS.

මහණෙනි, ඉදින් සත්ත්වයෝ පෙර කළ කම් හෙයින් සුවදුක් විඳිත් නම් නිගණ්ඨයෝ ගැරහියයුතුවහ. ඉදින් සත්ත්වයෝ පෙර කළ කම් හෙයින් සුවදුක් නො විඳිත් නම්, නිගණ්ඨයෝ ගැරහියැ යුතුවහ. මහණෙනි, ඉදින් සත්ත්වයෝ ඊශ්වරනිර්මාණහෙතුවින් සුවදුක් විඳිත් ද නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. ඉදින් සත්ත්වයෝ ඊශ්වරනිර්මාණ හෙතුවින් සුවදුක් නො විඳිත් ද නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. මහණෙනි, ඉදින් සත්ත්වයෝ නියතිභාවහෙතුවින් සුවදුක් විඳිත් ද, නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. ඉදින් සත්ත්වයෝ නියතිභාවහෙතුවින් සුවදුක් නො විඳිත් ද, නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. මහණෙනි, ඉදින් සත්ත්වයෝ අභිජාතිහෙතුවින් සුවදුක් විඳිත් ද නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. ඉදින් සත්ත්වයෝ අභිජාතිහෙතුවින් සුවදුක් නො විඳිත් ද, නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. මහණෙනි, ඉදින් සත්ත්වයෝ දෘෂ්ටධර්මඋපක්‍රමහෙතුවින් සුවදුක් විඳිත් ද නිගණ්ඨයෝ ගැරහියයුතුවහ. ඉදින් සත්ත්වයෝ දෘෂ්ටධර්මඋපක්‍රමහෙතුවින් සුවදුක් නො විඳිත් ද නිගණ්ඨයෝ ගැරහියැයුතුවහ. මහණෙනි, නිගණ්ඨයෝ මෙ බඳු වාද ඇතියහ. මහණෙනි, මෙ බඳු වාද ඇති නුවටුනට මේ දසවාදනුවාදයෝ සකාරණ වැ ගැරහියැයුතු තැනට එති. මහණෙනි, මෙසෙයින් උපක්‍රම ඵල රහිත වෙයි. වීර්‍ය්‍ය ඵල රහිත වේ.

මහණෙනි, කිසෙයින් උපක්‍රම සඵල වේ ද, වීර්‍ය්‍ය සඵල වේ ද යත් : මහණෙනි, මෙ සස්නෙහි මහණ (දුකින්) නො මැඩුණු ආත්මය දුකින් නො මැඩලයි. (සඟින් හෝ ගෙණෙන් උපන්) දැහැමි (සිවුපස) සුවයත් නො හරියි. එ සුවයෙහි ද (තෘෂ්ණායෙන්) මුසපත් නො වූයේ වෙයි. හෙ මෙසේ දනගනියි : '' සප්‍රයොග වැ වීර්‍ය්‍ය කරන මා ගේ සප්‍රයොගවීර්‍ය්‍යහෙතුවින් මේ දුඃඛනිදන (පඤ්චස්කන්ධමූල) සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ගේ විරාගය වෙයි. (සප්‍රයොගවීර්‍ය්‍යයෙහි) උපෙක්ෂා කරන, උපෙක්ෂාව වඩන මා ගේ මේ දුඃඛනිදනයා (තෘෂ්ණාව) ගේ විරාගය වේ'' යයි. ඒ පුද්ගල සප්‍රයොග වැ වීර්‍ය්‍ය කරන ඔහු ගේ සප්‍රයොගවීර්‍ය්‍යහෙතුවින් යම් දුඃඛනිදනයක්හු ගේ විරාගය වේ ද, එහි සප්‍රයොග වැ මැ වීර්‍ය්‍ය කෙරෙයි. සප්‍රයොග වීර්‍ය්‍යයෙහි උපේක්ෂා කරන උපෙක්ෂාව වඩන ඔහට වැළිත් යම් දුඃඛනිදනයක්හු ගේ විරාගය වේ ද එහි උපෙක්ෂාව වඩයි. සප්‍රයොග වැ වීර්‍ය්‍ය කරන ඒ පුහුල්හට සප්‍රයොගවීර්‍ය්‍යහෙතුවින් ඒ දුඃඛනිදනයා ගේ විරාගය වෙයි. මෙසේත් ඔහට එ දුක් නිර්ජීර්ණ වෙයි. සඞ්ඛාරප්පධානයෙහි උපෙක්ෂා කරන උපෙක්ෂාව වඩන ඒ පුහුල්හට ඒ දුඃඛනිදනයා ගේ විරාගය වෙයි. මෙසේත් ඔහට එ දුක නිර්ජීර්ණ වෙයි.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් ස්ත්‍රියක කෙරෙහි ඇලුණේ (ඡන්දරාගයෙන්) පිළිබැඳි සිතැතියේ බහල වූ ඡන්‍ද ඇතියේ බහල වූ ප්‍රාර්ථනා ඇතියේ වේ ද, හේ ඒ ස්ත්‍රිය අන් පිරිමියක්හු සමග එක් වැ සිටින්නිය බණන්නිය සිනා මහසිනා සෙන්නිය දක්නේ නම්, මහණෙනි, එ කිමැයි සිතවු ද, ඒ පුරුෂ හට අන් පිරිමියක්හු සමග එක්වැ සිටින සල්ලාප කරන මහසිනායෙන් සෙන සිනහ කරන එ ස්ත්‍රිය දක ශෝක පරිදෙව දුක් දෙම්නස් උපායාසයෝ උපදනාහු නො වෙත් ද'යි.

එසේ යැ වහන්ස, එ කවර හෙයින ? වහන්සැ, ඒ පුරුෂ යම්හෙයෙකින් එ ස්ත්‍රිය කෙරෙහි ඇලුණේ (ඡන්දරාගයෙන්) පිළිබැඳි සිත් ඇතියේ බහලච්ඡන්‍ද ඇතියේ බහල වූ ප්‍රාර්ථනා ඇතියේ වේ ද, එහෙයින් අන් පුරුෂයක්හු සමග එක්වැ සිටින සල්ලාප කරන සිනා මහසිනා සෙන එ ස්ත්‍රිය දක ශෝක පරිදෙව දුක් දෙම්නස් උපායාසයෝ උපදනාහ'යි.

අථ ඛො භික්ඛවෙ, තස්ස පුරිසස්ස එවමස්ස: අහං ඛො අමුස්සා ඉත්ථියා සාරත්තො පටිබද්ධචිත්තො තිබ්බච්ඡන්දො තිබ්බාපෙක්ඛො. තස්ස මෙ අමුං ඉත්ථිං දිස්වා අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. යන්නූනාහං යො මෙ අමුස්සා ඉත්ථියා ඡන්දරාගො තං පජහෙය්‍ය'න්ති. සො යො අමුස්සා ඉත්ථියා ඡන්දරාගො තං පජහෙය්‍ය, සො තං ඉත්ථිං පස්සෙය්‍ය අපරෙන සමයෙන අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තස්ස පුරිසස්ස අමුං ඉත්ථිං දිස්වා අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති.

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: අසු හි භන්තෙ, පුරිසො අමුස්සා ඉත්ථියා වීතරාගො, තස්මා තං ඉත්ථිං දිස්වා අඤ්ඤෙන පුරිසෙන සද්ධිං සන්තිට්ඨන්තිං සල්ලපන්තිං සඤ්ජග්ඝන්තිං සංහසන්තිං න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති.

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු න හෙව[1] අනද්ධභූතං අත්තානං දුක්ඛෙන අද්ධභාවෙති, ධම්මිකඤ්ච සුඛං න පරිච්චජති, තස්මිඤ්ච සුඛෙ අනධිමුච්ඡිතො හොති. සො එවං පජානාති: 'ඉමස්ස ඛො මෙ දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. ඉමස්ස පන මෙ දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං භාවයතො විරාගො හොතී'ති. සො යස්ස ඛ්වාස්ස දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. සඞ්ඛාරං තත්ථ පදහති. යස්ස පනස්ස දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං භාවයතො විරාගො හොති. උපෙක්ඛං තත්ථ භාවෙති. තස්ස තස්ස දුක්ඛනිදානස්ස සඞ්ඛාරං පදහතො සඞ්ඛාරප්පධානා විරාගො හොති. එවම්පිස්ස තං දුක්ඛං නිජ්ජිණ්ණං හොති. තස්ස තස්ස දුක්ඛනිදානස්ස අජ්ඣුපෙක්ඛතො උපෙක්ඛං භාවයතො විරාගො හොති. එවම්පිස්ස තං දුක්ඛං[2] නිජ්ජිණ්ණං හොති. එවම්පි භික්ඛවෙ සඵලො උපක්කමො හොති, සඵලං පධානං.

පුන ච පරං භික්ඛවෙ භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: 'යථාසුඛං ඛො මෙ විහරතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. දුක්ඛාය පන මෙ අත්තානං පදහතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති යන්නූනාහං දුක්ඛාය අත්තානං පදහෙය්‍ය'න්ති. සො දුක්ඛාය අත්තානං පදහති. තස්ස දුක්ඛාය අත්තානං පදහතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. සො න අපරෙන සමයෙන දුක්ඛාය අත්තානං පදහති. තං කිස්ස හෙතු: යස්ස හි සො, භික්ඛවෙ, භික්ඛු අත්ථාය දුක්ඛාය අත්තානං පදහෙය්‍ය, ස්වාස්ස අත්ථො අභිනිප්ඵන්නො හොති. තස්මා න අපරෙන සමයෙන දුක්ඛාය අත්තානං පදහති.

සෙය්‍යථාපි භික්ඛවෙ, උසුකාරො තෙජනං ද්වීසු අලාතෙසු ආතාපෙති පරිතාපෙති උජුං කරොති කම්මනියං. යතො ඛො භික්ඛවෙ, උසුකාරස්ස තෙජනං ද්වීසු අලාතෙසු ආතාපිතං හොති පරිතාපිතං හොති උජුං කතං හොති කම්මනියං. න සො තං අපරෙන සමයෙන උසුකාරො තෙජනං ද්වීසු අලාතෙසු ආතාපෙති පරිතාපෙති උජුං කරොති කම්මනියං. තං කිස්ස හෙතු: යස්ස හි සො, භික්ඛවෙ, අත්ථාය උසුකාරො තෙජනං ද්වීසු අලාතෙසු ආතාපෙය්‍ය පරිතාපෙය්‍ය උජුං කරෙය්‍ය කම්මනියං. ස්වාස්ස අත්ථො අභිනිප්ඵන්නො හොති. තස්මා න අපරෙන සමයෙන උසුකාරො තෙජනං ද්වීසු අලාතෙසු ආතාපෙති පරිතාපෙති උජුං කරොති කම්මනියං.

---

1. භික්ඛවෙ නහෙව - PTS. 2. එවම්පිස්ස දුක්ඛං - PTS.

ඉක්බිත්තෙන් මහණෙනි, එ පුරුෂ හට මෙබඳු සිතෙක් වෙයි : මම් කලි අසු ස්ත්‍රිය කෙරෙහි ඇලුණෙම් පිළිබැඳි සිත් ඇත්තෙම් බහලච්ඡන්‍ද ඇතියෙම් බහල ප්‍රාර්ථනා ඇතියෙම් වෙමි. එ මට අන් පිරිමිනියක්හු සමග එක්වැ සිටිනා සල්ලාප කරන මහසිනා මදසිනා සෙන ඒ ස්ත්‍රිය දක සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසයෝ උපදනාහ. මම් එ ස්ත්‍රිය කෙරෙහි මාගේ යම් ඡන්දරාගයෙක් ඇද්ද එය හැරපියම් නම් යෙහෙකැ'යි. හේ අසු ස්ත්‍රිය කෙරෙහි යම් ඡන්‍දරාගයෙක් ඇද්ද එය හැරපියන්නේය, හේ පසු කලෙක අන් පිරිමිනියක්හු සමග එක්වැ සිටිනා සල්ලාපකරන සිනා මහසිනා සෙන ඒ ස්ත්‍රිය දක්නේ නම්, මහණෙනි, එ කිමැයි සිතවු ද ? අන් පුරුෂයක්හු සමග එක්වැ සිටිනා සල්ලාප කරන සිනා මහසිනා සෙන අසු ස්ත්‍රිය දක ඒ පුරුෂ හට සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසයෝ කිම උපදනාහු දැ'යි.

වහන්සැ, තෙල නො වේ මැය, ඒ කවර හෙයින ? වහන්සැ, යම් හෙයෙකින් එ පුරුෂ අසු ස්ත්‍රිය කෙරෙහි විගත වූ කාමරාග ඇත්තේ ද, එහෙයින් අන්‍ය පුරුෂයක්හු සමග එක්වැ සිටිනා කථා කරන සිනා මහසිනා සෙන ඒ ස්ත්‍රිය දක සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාස යෝ නූපදනාහ'යි.

එසෙයින් මැ මහණෙනි, මහණ (දුකින්) නො මැඩුණු ආත්මභාවය නො මැ දුකින් මැඩලයි. දැහැමි (සිව්පස) සුවයත් නො හැරපියයි. එ සුවයෙහිදු (තෘෂ්ණායෙන්) මුසපත් නො වූයේ වෙයි. හෙ මෙසේ දනගනී : ''සප්‍රයොග ව වීර්‍ය්‍ය වඩනා මාගේ සප්‍රයොග වීර්‍ය්‍යහෙතුයෙන් මේ ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධ දුඃඛමූලයා ගේ (තෘෂ්ණාව ගේ) විරාගය වෙයි. යළි (සප්‍රයොග වීර්‍ය්‍යයෙහි) උපෙක්ෂා කරන උපෙක්ෂාව වඩනා මා ගේ මේ පඤ්චස්කන්ධදුඃඛමූලයා ගේ (තෘෂ්ණාව ගේ) විරාගය වේ'' යයි. හේ සප්‍රයොග ව වීර්‍ය්‍යය වඩනා ඔහු ගේ සප්‍රයොග වීර්‍ය්‍යහෙතුවින් යම් දුඃඛමූලයක්හු ගේ විරාගය වේ ද, සප්‍රයොග ව එහි වීර්‍ය්‍ය කෙරෙයි. යළි සප්‍රයොග වීර්‍ය්‍යයෙහි උපෙක්ෂා කරන උපෙක්ෂා වඩනා ඔහට යම් දුඃඛනිදනයක් හු ගේ විරාගය වේ ද, එහි (මාර්ගභාවනායෙන්) උපෙක්ෂාව වඩයි. සප්‍රයොග ව වීර්‍ය්‍ය වඩනා ඔහට සප්‍රයොග වීර්‍ය්‍ය හෙතුයෙන් ඒ දුඃඛනිදනයා ගේ විරාගය වේ. මෙසේත් ඔහට එ දුක නිර්ජීර්ණ වෙයි. සප්‍රයොග වීර්‍ය්‍යයෙහි උපෙක්ෂා කරන උපෙක්ෂා වඩනා ඔහට ඒ දුඃඛනිදනයා ගේ විරාගය වෙයි. මෙසේත් ඔහට ඒ දුක නිර්ජීර්ණ වේ. මහණෙනි, මෙසේත් උපක්‍රම සඵල වෙයි. වීර්‍ය්‍ය සඵල වේ.

යළිදු මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : සුවසේ වෙසෙනා මට අකුශල ධර්මයෝ වැඩෙති, කුශල ධර්මයෝ පිරිහෙත්, යළි දුකට ආත්මය මෙහෙයනා මට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශල ධර්මයෝ වැඩෙත්. මම් දුකට ආත්මය මෙහෙයම් නම් යෙහෙකැ'යි හේ දුකට ආත්මය මෙහෙයයි, දුකට ආත්මය මෙහෙයනා ඔහට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශල ධර්මයෝ වැඩෙත්, හේ පසු කලෙක දුකට ආත්මය නො මෙහෙයයි. එ කවර හෙයින යත් : යම් හෙයකින් මහණෙනි, එ මහණ යම් කරුණක් සඳහා දුකට ආත්මය මෙහෙයා නම්, ඔහුට ඒ අර්ථය අභිනිෂ්පන්න වේ ද, එහෙයින් පසු කාලයෙහි දුකට ආත්මය නො මෙහෙයා.

මහණෙනි, යම් පරිදි හීවඩුවෙක් හීතලයක් දෙ පෙනෙහෙල්ලෙක ලා තවා ද, හාත්පසින් තවා ද, සෘජු කර්මක්ෂම කෙරේ ද, යම් කලෙක මහණෙනි, හීවඩුවා ගේ හීදඬ දෙ පෙනෙහෙල්ලෙහි ලා තැවුණේ වේ ද, හාත්පසින් තැවුණේ වේ ද, සෘජු කර්මක්ෂම කරනලද වේ ද, පසු කාලයෙහි ඒ හීවඩු ඒ හීදඬ දෙ පෙනෙහෙල්ලෙහි ලා නො තවයි, හාත්පසින් නො තවයි, සෘජු කර්මක්ෂම නො කෙරෙයි. ඒ කවර හෙයින යත් : යම් හෙයෙකින් මහණෙනි, ඒ හීවඩු යම් කරුණක් සඳහා හීදඬ දෙ පෙනෙහෙල්ලෙක ලා තවා නම් හාත්පසින් තවා නම් සෘජු කර්මක්ෂම කෙරේ නම් ඔහට ඒ අර්ථය අභිනිෂ්පන්න වේ ද, එහෙයින් හීවඩු පසු කාලයෙහි හීදඬ දෙ පෙනෙහෙල්ලෙහි ලා නො තවයි, හාත්පසින් නො තවයි, සෘජු කර්මක්ෂම නො කෙරේ.

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: 'යථාසුඛං ඛො මෙ විහරතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති. දුක්ඛාය පන මෙ අත්තානං පදහතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති යන්නූනාහං දුක්ඛාය අත්තානං පදහෙය්‍යන්ති. සො දුක්ඛාය අත්තානං පදහති. තස්ස දුක්ඛාය අත්තානං පදහතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති සො න අපරෙන සමයෙන දුක්ඛාය අත්තානං පදහති. තං කිස්ස හෙතු: යස්ස හි සො භික්ඛවෙ, භික්ඛු අත්ථාය දුක්ඛාය අත්තානං පදහෙය්‍ය. ස්වාස්ස අත්ථො අභිනිප්ඵන්නො හොති. තස්මා න අපරෙන සමයෙන දුක්ඛාය අත්තානං පදහති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

පුනචපරං භික්ඛවෙ, ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරෙ පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො, සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජාපථො අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති, ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

එසෙයින් මැ මහණෙනි, මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : සුවසේ වෙසෙන මට අකුශල ධර්මයෝ වැඩෙති, කුශල ධර්මයෝ පිරිහෙති, යළි දුකට ආත්මය මෙහෙයන මට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්. මම් දුකට ආත්මය මෙහෙයම් නම් යෙහෙකැ'යි හේ දුකට ආත්මය මෙහෙයයි. දුකට ආත්මය මෙහෙයන ඔහට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශල ධර්මයෝ වැඩෙත්. හේ පසු කාලයෙහි දුකට ආත්මය නො මෙහෙයයි. ඒ කවර හෙයින යත් : මහණෙනි, යම් හෙයෙකින් එ මහණ යම් කරුණක් සඳහා දුකට ආත්මය මෙහෙයා නම්, ඔහට ඒ අර්ථය අභිනිෂ්පන්න වේ ද, එහෙයින් පසු කාලයෙහි දුකට ආත්මය නො මෙහෙයයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වූයේ වෙයි, වීර්‍ය්‍ය සඵල වේ.

යළිදු මහණෙනි, මෙ ලොවැ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලොකවිද් අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙවමනුෂ්‍යයනට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් තථාගතයෝ උපදනාහ. ඒ තථාගතයෝ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ඇති මේ ලොකය තුමූ විශිෂ්ටඥනයෙන් දන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙති. ඒ තථාගතයෝ ආදියෙහි කලණ වූ මැද කලණ වූ අවසනැ කලණ වූ සාර්ථසව්‍යඤ්ජන වූ සියල්ලෙන් පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙති. ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ අන්‍යතර කුලයෙක උපන්නෙක් හෝ එ දහම් අසයි. හේ එදහම් අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාප්‍රතිලාභය කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධා ප්‍රතිලාභයෙන් සමන්විත වූයේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි. '' ගෘහවාසය සම්බාධ යැ. කෙලෙස් රජ උපදිනා තැනෙක, පැවිද්ද අභ්‍යවකාශ යැ. ගිහිගෙයි වසනුවහු විසින් එකාන්ත පරිපූර්ණ වූ එකාන්ත පරිශුද්ධ වූ දෙවූ සකක් බඳු මේ බඹසර හැසිරෙන්නට සුකර නො වෙයි. මම් කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙම් නම් යෙහෙකැ ''යි. හෙ පසු කලෙක අල්ප වූ හෝ භොගස්කන්ධය හැරපියා මහත් වූ හෝ භොගස්කන්ධය හැරපියා අල්ප වූ හෝ නෑපිරිස් හැරපියා මහත් වූ හෝ නෑපිරිස් හැරපියා කෙස්මස් බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙයි.

හෙ මෙසේ පැවිදි වූයේ භික්ෂූන්ගේ ශික්ෂා සංඛ්‍යාත සාජීවයට පැමිණියේ ප්‍රාණවධ හැරපියා ප්‍රාණවධයෙන් වැළකුණේ වෙයි. බහාතැබූ දඬු ඇතියේ බහාතැබූ අවි ඇතියේ පාපයෙහි ලජ්ජා ඇතියේ දයාවට පැමිණියේ සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතයෙන් අනුකම්පා ඇතියේ වෙසෙයි. අයිනාදන් හැරපියා අයිනාදනින් වැළකුණේ වෙයි. දුන් දය මැ ගන්නේ දුන්දය මැ කැමැති වනුයේ නො සොර වූ පිවිතුරු වූ සිත් ඇති වැ වෙසෙයි. අබ්‍රම්සර හැරපියා අබ්‍රම්සරින් දුරු වූයේ මෛථුන සංඛ්‍යාත ග්‍රාම්‍යධර්මයෙන් වෙන් වූයේ බඹසර සෙරෙයි. මුසවා හැරපියා මුසවායෙන් වෙන් වූයේ වෙයි. සත්‍යවාදී වූයේ සත්‍යයෙන් සත්‍යය ගළපනුයේ ස්ථිරකථා ඇතියේ හැදහියයුතු වචන ඇතියේ ලොවට විසංවාද නො වූයේ (ලොව නො රවටනුයේ) වෙයි. පිසුනු බස් හැරපියා පිසුනු බසින් වෙන් වූයේ වෙයි. මෙතැන අසා මුන් බිඳුමට එතැන නො කියනුයේ එතැන හෝ අසා උන් බිඳුමට මුනට නො කියනුයේ වෙයි. මෙසේ බිඳුණාවුන් හෝ ගළපනුයේ සහිතයන් හෝ දැඩි කරනුයේ සමගියෙහි සිත් අලවනුයේ සමග බැවිහි ඇලුණේ සමග බැවිහි සතුටු වූයේ සමගි කරණී බස් බණනුයේ වෙයි. පරොස්බස් හැරපියා පරොස්බසින් වෙන් වූයේ වෙයි. යම් වචනයක් නිර්දෝෂ, කර්ණසුඛ, ප්‍රෙමණීය, හෘදයංගම, පෞර, බහුජනකාන්ත, බහුජනමනාප වේ ද, එබඳු බස් බණනුයේ වෙයි. හිස්බස් හැරපියා හිස්බසින් වෙන් වූයේ වෙයි. නිසි කල්හි කියනුයේ තථ්‍ය දයක් මැ කියනුයේ අර්ථසන්නිශ්‍රිතය මැ කියනුයේ ධර්මනිඃශ්‍රිතය මැ කියනුයේ (සංවරාදි) විනය නිශ්‍රිතය මැ කියනුයේ හදවත්හි නිධන් කොට තැබියයුතු, පරිච්ඡෙද ඇති අර්ථසංහිත වූ වචනය නිසිකල්හි කරුණු සහිත කොට කියනුයේ වෙයි.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඒකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකා[1] පටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවා[2] පටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති.

සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති සෙය්‍යථාපි නාම පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති. එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ[3] පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

---

1. ඉත්ථිකුමාරික - සීමු, මජසං.
2. ගවාස්සවළව - සීමු, මජසං.
3. සම්මිඤ්ජිතෙ - මජසං.

හේ බීජගාමභූතගාමවිකොපනයෙන් වෙන් වූයේ වෙයි. රාත්‍රිභොජනයෙන් වැළකුණේ විකල්බොජුනෙන් වෙන් වූයේ එක්වේලේ වළඳනුයේ වෙයි. නටනු ගයනු වයනු විසුළු දස්නෙන් වෙන් වූයේ වෙයි. මණ්ඩන විභූෂණයට කරුණු වූ මල් ගඳ විලෙවුන් දැරීමෙන් වෙන් වූයේ වෙයි. උසසුන් මහඅස්නෙන් වෙන්වූයේ වෙයි. රන් රිදී පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. ස්ත්‍රීන් කුමරියන් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. දස් දස්සන් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. එළු තිරෙළුවන් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. ඇත් ගව අස් වෙළඹුන් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. කෙත් වත් පිළිගැන්මෙන් වෙන් වූයේ වෙයි. දූතකර්මයෙහි ප්‍රහෙණකගමනෙහි යෙදීමෙන් වැළැකුණේ වෙයි. ක්‍රය වික්‍රයයෙන් වෙන් වූයේ වෙයි. තුලාකූට කංසකූට මානකූටයෙන් වැළැකුණේ වෙයි. උක්කොටන (අල්ලස් ගැනීම) යැ වඤ්චන (උපායෙන් රැවැටීම) යැ නිකති (ප්‍රතිරූපයෙන් රැවැටීම) යැ යන සාචි (කුටිල) යොගයෙන් වැළැකුණේ වෙයි. (හස්තාදි) ඡෙදන යැ වධ යැ (රජ්ජු ආදියෙන්) බන්ධන යැ සැඟැවී සිට පැහැරගැන්ම යැ වොලොගැන්ම යැ සැහැසිකම් යැ යන මෙයින් වැළැකුණේ වේ.

හේ කය පරිහරණයට නිසි වූ සිවුරින් කුස පරිහරණයට නිසි වූ පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි. හේ යම් යම් තැනෙක්හි මැ යේ ද, අටපිරිකර මතු මැ ගෙන යෙයි. යම්සේ පියාපත් ඇති ලිහිණියෙක් යම් යම් තැනෙක්හි මැ පියාසර කෙරේ නම් පත්බර සහිතව මැ පියාසර කෙරේ ද, එසෙයින් මැ මහණ කය පරිහරණයට නිසි වූ සිවුරින් කුස පරිහරණයට නිසි වූ පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි. හේ යම් යම් තැනෙක්හි මැ යේ ද, අටපිරිකර මතු මැ ගෙන යෙයි. හෙතෙම මේ ආර්‍ය්‍ය (නිර්දොෂ) වූ ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ සිය අත්බැව්හි අනවද්‍යසුඛය විඳී.

හේ චක්ෂුර්විඥානයෙන් රූපයක් දැක (ක්ලෙශවස්තු වූ) ස්ත්‍රීපුරුෂාදි නිමිති නො ගනී. (හස්තපාදදීන්ගේ) ආකාර නො ගනී, යම් අසංවරයක් හෙතු කොට ගෙන චක්ෂුරින්ද්‍රිය අසංවර වැ වෙසෙන තෙල පුහුල් අභිධ්‍යාදෞර්මනස්ස සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු ද ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. චක්ෂුරින්ද්‍රිය රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්දයක් අසා . . . ඝ්‍රාණ විඥානයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට . . . ජිහ්වාවිඥානයෙන් රසයක් විඳ කායවිඥාන යෙන් ස්ප්‍රෂ්ටව්‍යයක්, ස්පර්ශ කොට . . . මනොවිඥානයෙන් ධර්මාලම්බනය දැන නිමිත්ත ග්‍රහණය නො කෙරෙයි. අනුව්‍යඤ්ජන වශයෙන් නො ගනී. යම් අසංවරයක් හේතු කොට ගෙන මනින්ද්‍රිය අසංවර ව වෙසෙන තෙල පුහුල්හු අභිධ්‍යාදොමනස්ස සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරයට පිළිපදී. මනින්ද්‍රියය රකී. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හේ මේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අව්‍යාසෙක (කෙලෙසුන් විසින් නො තෙත්) වූ සුවය විඳී.

හේ ඉදිරියට යැමෙහි පෙරළා නැවැත්මෙහි සම්‍යග්ඥානයෙන් සියලු කිස කෙරෙයි. ඉදිරිය බැලීමෙහි අවට බැලීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි. (අත්පා) හැකිළීමෙහි දිගහැරීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි. සඟළපාසිවුරු දැරීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි. පිණ්ඩපාත භොජනයෙහි (කැඳආදිය) පීමෙහි (පිටිකැවුම් ආදිය) කෑමෙහි (මීපැණි ආදිය) රසවිඳීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි. මලමූ කිසෙහි නුවණින් දැන කරන්නේ වෙයි. ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි සයනයෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි නුවණින් දැන කරන්නේ වෙයි. ඒ මේ ආර්‍ය්‍යශීලස්කන්ධයෙන් ද සමන්විත වූයේ මේ ආර්‍ය්‍ය සන්තොෂයෙන් ද සමන්විත වූයේ මේ ආර්‍ය්‍යඉන්ද්‍රියසංවර යෙන් ද සමන්විත වූයේ මේ ආර්‍ය්‍යස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් ද සමන්විත වූයේ අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කඳුර යැ ගිරිගුහා යැ ශ්මසාන යැ වනප්‍රස්ථ යැ අභ්‍යවකාශ යැ පලාල පුඤ්ජ යැ යන විවෙක සෙනස්න භජනය කෙරෙයි.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති. අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථඞ්කථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

පුනචපරං භික්ඛවෙ, භික්ඛු විතක්කවිචාරානං වූපසමා, අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

පුනචපරං භික්ඛවෙ, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. එවම්පි භික්ඛවෙ සඵලො උපක්කමො හොති සඵලං පධානං.

පුනචපරං භික්ඛවෙ, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට-විවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො, එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

හේ පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවතුණේ පලක් බැඳ කය සෘජු කොට තබා කමට හනට අභිමුඛ කොට සිහි එළවා හිඳී. හේ පඤ්චස්කන්ධලොකයෙහි රාගය දුරු කොට (විෂ්කම්භණ විසින්) ප්‍රහීණ කළ රාග ඇති සිතින් යුතු වැ වෙසෙයි. අභිධ්‍යාසංඛ්‍යාත රාගයෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාදප්‍රදෙෂය දුරු කොට ව්‍යාපාද රහිත වූ සිත් ඇතියේ සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතයෙන් අනුකම්පා කරනසුලු වූයේ වාසය කෙරෙයි. ව්‍යාපාද සංඛ්‍යාත ප්‍රද්වෙෂයෙන් සිත පිරිසිදු කෙරෙයි. ථිනමිද්ධය දුරු කොට පහවූ ථිනමිද්ධ ඇතියේ ආලොකසංඥ ඇති වැ ස්මෘතියෙන් හා ඥනයෙන් යුක්ත වැ වෙසෙයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය දුරු කොට උද්ධත නො වූයේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වෙසෙයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව දුරු කොට විචිකිච්ඡාව ඉක්මවූයේ කුශලධර්මයන්හි කථංකථා රහිත වූයේ වෙසෙයි. විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරෙයි.

හේ සිතට උපක්ලෙශ වූ ලොවිලොවුතුරා ප්‍රඥව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් දුරු කොට කාමච්ඡන්දයෙන් වෙන් වැ (ශෙෂනීවරණ සංඛ්‍යාත) අකුශලධර්මයෙන් වෙන් වැ සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වූයේ වෙයි. වීයර්‍ය සඵල වේ.

යළිදු මහණෙනි, මහණ, විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදන ශ්‍රද්ධා ඇති චිත්තයා ගේ එකඟ බව ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධිජ ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි, වීයර්‍ය සඵල වේ.

යළිදු මහණෙනි, මහණ ප්‍රීතිය ගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇතියේ ස්මෘති ඇතියේ සම්‍යග්ඥන ඇතියේ වෙසෙයි. නාමකයින් සුවය ද විඳී. යම් ධ්‍යානයක් හෙතුකොට ගෙන (තෘතීයධ්‍යාන සමඞ්ගී පුද්ගල) ' උපෙක්ෂා ඇත්තේ යැ ස්මෘති ඇතතේ යැ. සුඛවිහාර ඇත්තේ යැ ' යි බුද්ධාදි ආයර්‍යයෝ පවසත් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි. වීයර්‍ය සඵල වේ.

යළිදු මහණෙනි, මහණ කායික සුවය ද, කායික දුක ද දුරු කිරීමෙන් පෙර මැ සොම් නස් දොම්නසුන් ප්‍රහීණ කිරීමෙන් නොදුක් නොසුව වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි, වීයර්‍ය සඵල වේ.

හේ මෙසේ සිත චතුර්ථධ්‍යානසමාධීන් සමාහිත කල්හි පරිශුද්ධ කල්හි (පිරිසිදු හෙයින් මැ) ප්‍රභාස්වර කල්හි අනඞගණ (නිකෙලෙස්) කල්හි (අනඞගණ හෙයින්) විගත උපක්ලෙශ ඇති කල්හි (සුභාවිත හෙයින්) මෘදු වූ කල්හි (මෘදු හෙයින් ම) කර්මක්ෂම කල්හි (පරිශුද්ධභාවාදියෙහි) සිටි කල්හි (එහෙයින් ම) නිසල බවට පත් කල්හි පූර්වනිවාස ස්මෘතිඥන පිණිස සිත එළවයි. හේ අනෙකවිධ වූ පෙර විසූ ස්කන්ධසන්තානය සිහි කෙරෙයි. එ මෙසේ යැ : එක් ජාතියකුදු දෙ ජාතියකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සියදහසකුදු නොයෙක් නැසෙන කල්පයනුදු නොයෙක් වැඩෙන කල්පයනුදු නොයෙක් නැසෙන වැඩෙන කල්පයනුදු අසුවල් තැනැ මෙ නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු වර්ණ ඇතියෙම් මෙබඳු ආහාර ඇතියෙම් මෙසේ සුවදුක් වින්දෙම් මෙසේ ආයු කෙළවර කෙළෙම් වීමි. ඒ මම එයින් ච්‍යුත වූයෙම් අසුවල් තැනැ උපන්මි. ඒ තැන්හිදු මෙ නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු වර්ණ ඇතියෙම් මෙබඳු ආහාර ඇතියෙම් මෙසේ සුවදුක් වින්දෙම් මෙසේ ආයු කෙළවර කෙළෙම් වීමි. ඒ මම එ තැනින් ච්‍යුත වූයෙම් මෙහි උපන්මි මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ වූ පෙර විසූ ස්කන්ධසන්තතිය සිහි කෙරෙයි. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි. වීයර්‍ය සඵල වේ.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ අනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. එවම්පි භික්ඛවෙ, සඵලො උපක්කමො හොති සඵලං පධානං.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. එවම්පි ඛො[1] භික්ඛවෙ සඵලො උපක්කමො හොති සඵලං පධානං.

එවංවාදී භික්ඛවෙ, තථාගතො.[2] එවංවාදිං[3] භික්ඛවෙ තථාගතං[4] දස සහධම්මිකා පාසංසට්ඨානා ආගච්ඡන්ති: සචෙ භික්ඛවෙ, සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ තථාගතො පුබ්බෙ සුකතකම්මකාරී, යං එතරහි එවරූපා අනාසවා සුඛා වෙදනා වෙදෙති. සචෙ භික්ඛවෙ, සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, තථාගතො භද්දකෙන ඉස්සරෙන නිම්මිතො, යං එතරහි එවරූපා අනාසවා සුඛා වෙදනා වෙදෙති. සචෙ භික්ඛවෙ, සත්තා සඞ්ගතිභාවහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, තථාගතො කල්‍යාණසඞ්ගතිකො, යං එතරහි එවරූපා අනාසවා සුඛා වෙදනා වෙදෙති. සචෙ භික්ඛවෙ, සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, තථාගතො කල්‍යාණාභිජාතිකො, යං එතරහි එවරූපා අනාසවා සුඛා වෙදනා වෙදෙති. සචෙ භික්ඛවෙ, සත්තා දිට්ඨධම්මූපක්කමහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, අද්ධා භික්ඛවෙ, තථාගතො කල්‍යාණදිට්ඨධම්මූපක්කමො, යං එතරහි එවරූපා අනාසවා සුඛා වෙදනා වෙදෙති.

---

1. එවං ඛො - PTS.
2. තථාගතා - සීමු, මජසං.
3. එවං වාදීනං - සීමු, මජසං.
4. තථාගතානං - සීමු, මජසං.

හේ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ ප්‍රභාස්වර අනඞ්ගණ කල්හි විගත උප ක්ලෙශ ඇති කල්හි මෘදු ව කර්මක්ෂම ව සිටි කල්හි නිසල බවට පත් කල්හි සත්ත්වයන් ගේ ච්‍යුති උත්පත්තිඥානය පිණිස සිත යොමු කෙරෙයි. හේ පරිශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවඇසින් ච්‍යුත වන උපදනා හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතිගත වූ දුර්ගතිගත වූ සත්ත්වයන් බලයි. කම්වූ පරිදි පරලොව ගිය සත්ත්වයන් දනගනී : එකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහ, වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහ, මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහ, බුද්ධාදි ආර්‍ය්‍යයනට උපවාද කළාහ, විපරීත දෘෂ්ටි ඇතියවූහ, මිථ්‍යාදෘෂ්ටි වශයෙන් ගන්නා ලද නානාවිධ කර්ම ඇතියවූහ. ඔහු කාබුන් මරණින් මතුයෙහි අපාය වූ දුකට ගති වූ විවස ව පතිත වන (ආස්වාද සංඛ්‍යාත අය රහිත වූ) නිරයට පැමිණියාහ. යළි මේ භවත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහ, වාක්සුචරිතයෙන් යුක්ත වූවාහ, මනස්සුචරිතයෙන් යුක්ත වූවාහ, ආර්‍ය්‍යොපවාද නො කළාහ, සම්‍යග්දෘෂ්ටි ඇතියවූහ, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන කළාහ. ඔහු කාබුන් මරණින් මතුයෙහි සුන්දර ගති ඇති ස්වර්ගලොකයට පැමිණියාහ'යි. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැසිටි දිවැසින් සැවයන උපදනා හීනප්‍රණීත වූ සුවර්ණදුර්වර්ණ වූ සුගතිගත දුගතිගත වූ සත්ත්‍වයන් බලයි. කම්වූ පරිදි පරලොව ගිය සත්ත්වයන් දනගනී. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි, වීර්‍ය්‍යය සඵල වේ.

හේ මෙසේ සිත සමාහිත කල්හි පරිශුද්ධ පර්‍ය්‍යවදත කල්හි අනඞ්ගණ කල්හි අපගත උපක්ලෙශ ඇති කල්හි මෘදු ව කර්මක්ෂම ව සිටි කල්හි ආශ්‍රවක්ෂයඥානය පිණිස සිත යොමුකෙරෙයි. හේ ' මේ දුකැ 'යි තතුසෙයින් දනගනී, ' මේ දුක්ඛ සමුදය 'යි තතු සෙයින් දනගනී, ' මේ දුක්ඛනිරොධ යැ 'යි තතුසෙයින් දනගනී, ' මේ දුක්ඛනිරොධ ගාමිනීපටිපද ' යී තතුසෙයින් දනගනී. 'මොහු ආශ්‍රවයෝ 'යි තතුසෙයින් දනගනී, ' මේ ආශ්‍රවසමුදය 'යි තතුසෙයින් දනගනී, ' මේ ආශ්‍රවනිරොධයැ 'යි තතුසෙයින් දනගනී, ' මේ ආශ්‍රවනිරොධගාමිනීප්‍රතිපද ' යයි තතුසෙයින් දනගනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙනුදු මිදෙයි, භවාශ්‍රවයෙනුදු සිත මිදෙයි, අවිද්‍යාශ්‍රවයෙනුදු සිත මිදෙයි. විමුක්ත කල්හි (සිත) මිදිණැයි පස්විකුම් නුවණ වෙයි : ' ජාති ක්ෂය වූ යැ, බඹසර වෙසෙන ලද, කරණී කරන ලද, ඉත්ථම්භාවය පිණිස අනෙක් (මාර්ග භාවනා) කිසයෙක් නැතැ 'යි දනගනී. මෙසේත් මහණෙනි, උපක්‍රම සඵල වෙයි, වීර්‍ය්‍යය සඵල වේ.

මහණෙනි, තථාගතයෝ මෙබඳු වාද ඇත්තාහ, මහණෙනි, මෙබඳු වාද ඇති තථාගත යන් කරා සකාරණ වූ දසවැදෑරුම් ප්‍රශස්‍ය කාරණ කෙනෙක් පැමිණෙති : ඉදින් මහණෙනි, සත්ත්වයෝ පූර්වකෘත කර්මහෙතුවින් සුවදුක් විඳිනාහු නම්, මහණෙනි, එකැතින් තථාගත යෝ පෙර සුකෘතකර්මකාරීහ. යම්හෙයෙකින් මෙ කල්හි මෙවන් අනාශ්‍රව සුඛවෙදනා විඳිනාහු ද එහෙයිනි. ඉදින් මහණෙනි, සත්ත්වයෝ ඊශ්වරනිර්මාණ හෙතුවින් සුවදුක් විඳුනාහු නම්, මහණෙනි, එකැතින් තථාගතයෝ සොඳුරු ඉසුරක්හු විසින් මවන ලදහ. යම් හෙයෙකින් මෙකල්හි මෙබඳු වූ අනාශ්‍රව වූ සුඛවේදනා විඳුනාහු ද එහෙයිනි. ඉදින් මහණෙනි, සත්ත්වයෝ නියතිස්වභාව හෙතුවින් සුවදුක් විඳිනාහු නම්, එකැතින් මහණෙනි, තථාගතයෝ කල්‍යාණ වූ නියතිස්වභාව ඇතියවූහ. යම්හෙයෙකින් මෙකල්හි මෙවන් අනාශ්‍රව වූ සුඛවේදනා විඳුනාහු ද එහෙයිනි, ඉදින් මහණෙනි, සත්ත්‍වයෝ අභිජාති හෙතුවින් සුවදුක් විඳිනාහු නම්, එකැතින් මහණෙනි, තථාගතයෝ කල්‍යාණ වූ අභිජාති ඇතියහ. යම්හෙයෙකින් මෙකල්හි මෙවන් අනාශ්‍රව වූ සුඛවෙදනා විඳුනාහුද එහෙයිනි. ඉදින් මහණෙනි සත්ත්වයෝ ඉහාත්මයෙහි උපක්‍රම හෙතුවින් සුවදුක් විඳිනාහු නම්, එකැතින් මහණෙනි, තථාගතයෝ කල්‍යාණ වූ දෘෂ්ටධර්මෝපක්‍රම ඇතියවූහ. යම් හෙයෙකින් මෙකල්හි මෙවන් අනාශ්‍රව සුඛවෙදනා විඳුනාහු ද එහෙයිනි.

සචෙ භික්ඛවෙ, සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. නො චෙ සත්තා පුබ්බෙකතහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. සචෙ භික්ඛවෙ, සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. නො චෙ සත්තා ඉස්සරනිම්මාණහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. සචෙ භික්ඛවෙ, සත්තා සඞ්ගතිභාවහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. නො චෙ සත්තා සඞ්ගතිභාවහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. සචෙ භික්ඛවෙ. සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො, නො චෙ සත්තා අභිජාතිහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. සචෙ භික්ඛවෙ, සත්තා දිට්ඨධම්මූපක්කමහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො. නො චෙ සත්තා දිට්ඨධම්මූපක්කමහෙතු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති, පාසංසො තථාගතො එවංවාදී භික්ඛවෙ තථාගතො[1]. එවංවාදිං[2] භික්ඛවෙ, තථාගතං[3] ඉමෙ දස සහධම්මිකා පාසංසට්ඨානා ආගච්ඡන්තීති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

දෙවදහසුත්තං පඨමං.

---

1. තථාගතා - සීමු, මජසං.
2. එවං වාදීනං – සීමු, මජසං.
3. තථාගතානං – සීමු, මජසං

ඉදින් මහණෙනි, සත්ත්වයෝ පූර්වකෘතකර්ම හේතුවින් සුවදුක් විඳුනාහු නම්, තථාගත යෝ පැසැස්ස යුත්තාහ. ඉදින් සත්ත්වයෝ පූර්වකෘතකර්ම හෙතුවින් සුවදුක් නොවිඳුනාහු ද, තථාගතයෝ පැසැස්ස යුත්තාහ. ඉදින් මහණෙනි, සත්ත්වයෝ ඊශ්වරනිර්මාණ හේතුවින් සුවදුක් විඳුනාහු නම්, තථාගතයෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් සත්ත්වයෝ ඊශ්වරනිර්මාණ හෙතුවින් සුවදුක් නො විඳුනාහු නම්, තථාගතයෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් මහණෙනි, සත්ත්වයෝ නියතිස්වභාව හෙතුවින් සුවදුක් විඳුනාහු නම්, තථාගතයෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් සත්ත්වයෝ නියති ස්වභාව හෙතුවින් සුවදුක් නො විඳිනාහු නම්, තථාගතයෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් මහණෙනි, සත්ත්වයෝ අභිජාති හෙතුවින් සුවදුක් විඳිනාහු නම්, තථාගතයෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් සත්ත්වයෝ අභිජාති හෙතුවින් සුවදුක් නොවිඳිනාහු නම්, තථාගත යෝ ප්‍රශස්‍ය වෙති. ඉදින් මහණෙනි, සත්ත්වයෝ දෘෂ්ටධර්මෝපක්‍රම හෙතුවින් සුවදුක් විඳිනාහු නම්, තථාගතයෝ පැසැසිය යුත්තාහ, ඉදින් සත්ත්වයෝ දෘෂ්ටධර්මෝපක්‍රම හෙතුවින් සුවදුක් නො විඳුනාහු නම් තථාගතයෝ පැසැසිය යුත්තාහ. මහණෙනි, තථාගත යෝ මෙබඳු වාද ඇත්තාහ. මහණෙනි, මෙබඳු වාද ඇති තථාගතයන් කරා සකාරණ වූ මේ දස ප්‍රශස්‍යකාරණයෝ පැමිණෙන්නාහ'යි.

භාග්‍යවත්හු මේ වදළහ. සතුටු සිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටුව පිළිගත්තාහු යයි.

පළමුවැනි දෙවදහ සූත්‍ර යි.

---

# 3. 1. 2
## පඤ්චත්තය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

සන්ති භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තා-නුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි[1] අභිවදන්ති 'සඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණා'ති ඉත්ථෙකෙ අභිවදන්ති. 'අසඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණා'ති ඉත්ථෙකෙ අභිවදන්ති. 'නෙවසඤ්ඤී නාසඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණා'ති ඉත්ථෙකෙ අභිවදන්ති. සතො වා පන සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති. දිට්ඨධම්මනිබ්බානං වා පනෙකෙ අභිවදන්ති ඉති සන්තං වා අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. සතො වා පන සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති. දිට්ඨධම්මනිබ්බානං වා පනෙකෙ අභිවදන්ති. ඉති ඉමානි පඤ්ච හුත්වා තීණි හොන්ති තීණි හුත්වා පඤ්ච හොන්ති. අයමුද්දෙසො පඤ්චත්තයස්ස.

තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං[2] පඤ්ඤ-පෙන්ති[3] අරොගං පරම්මරණා. රූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. එකත්තසඤ්ඤිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නානත්තසඤ්ඤිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. පරිත්තසඤ්ඤිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අප්පමාණසඤ්ඤිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. එතං වා පනෙකෙසං උපාතිවත්තතං විඤ්ඤාණකසිණං එකෙ අභිවදන්ති අප්පමාණං ආනෙඤ්ජං. තයිදං භික්ඛවෙ, තථාගතො පජානාති.

---

1. අධිමුත්තිපදානි - ස්‍යා.
2. සඤ්ඤීමත්තානං - සීමු.
3. පඤ්ඤපෙන්ති - මජ්සං.

# 3. 1. 2

# පඤ්චත්තය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ශොදුරුගම් කොට අනේවඩු මහසිටුහු ගේ දෙව්රම් නම් අරම්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් ඇමතූ සේක. ' වහන්ස ' යි එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල වදළ සේක:

මහණෙනි, (අපරාන්ත සංඛ්‍යාත අනාගත ස්කන්ධභාග විකල්පනා කොට ගනුයෙන්) අපරාන්තකල්පික වූ (අපරාන්තානුගත දෘෂ්ටි ඇතියෙන්) අපරාන්තානුදෘෂ්ටික වූ අපරාන්තය අරභයා අනෙකප්‍රකාර වූ (යථාර්ථය නො ගෙන වැටෙනුයෙන් අධිවෘත්ති යයි කියන ලද) දෘෂ්ටිදීපක වචනයන් මතු කොට පවසත් ද, එබඳු වූ (ලොකයා විසින්) ශ්‍රමණයහ'යි ද බ්‍රාහ්මණයහ'යි ද සම්මත වූ කිසි වාදී කෙනෙක් ඇත. ' ආත්මය සංඥ සමන්විත වෙයි, මරණින් මතු නිත්‍ය වෙති ' මෙසේ කෙනෙක් පවසති. ' ආත්මය සංඥ සමන්විත නො වෙයි, මරණින් මතු නිත්‍ය වෙති ' මෙසේ කෙනෙක් පවසති. ' ආත්මය නෙවසංඥ නාසංඥ වෙයි, මරණින් මතු නිත්‍ය වෙති ' මෙසේ කෙනෙක් පවසති, විද්‍යමාන වූ මැ සත්ත්වයා ගේ උපච්ඡෙදය අදර්ශනය භවවිගමය පනවති. කිසි වාදී කෙනෙක් (මෙ ලොව්හි ම දුඃඛව්‍යපශම වෙති ගත්) දෘෂ්ටධර්මනිර්වාණය පවසත්. මෙසේ (සංඥ ආදී විසින් තුන් අයුරෙකින්) විද්‍යමාන වූ ආත්මයක් මරණින් මතු නිත්‍ය කොට පනවත්. විද්‍යමාන වූ සත්ත්වයා ගේ උපච්ඡෙද අදර්ශන භවවිගම පනවත්. කිසි කෙනෙක් දෘෂ්ට ධර්මනිර්වාණ හෝ පවසත්. මෙසේ මොහු පසක් ව තිදෙනෙක් වෙති. තුනක් ව පස් දෙනෙක් වෙති. මේ පඤ්චත්‍රිකයා ගේ උද්දෙස යි.

මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ සංඥවත් ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ (කරජරූපයෙන් හෝ කසිණ රූපයෙන් හෝ) රූපී වූ සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ (අරූපසමාපත්තිනිමිත්ත වූ හෝ සංඥස්කන්ධය තබා සෙසු අරූපධර්ම සංඛ්‍යාත වූ හෝ) අරූපී වූ ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපී වූත් අරූපී වූත් සංඥවත් වූ ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නො මැ රූපී වූ අරූපී නො වූ සංඥවත් වූ ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ එකත්වසංඥ වූ සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නානාත්වසංඥ වූ සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ (කිසුණුපිරියම් විසින්) අල්පමාත්‍ර සංඥ ඇති සංඥවත් වූ ආත්මය හෝ පනවති. ඒ භවත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍ය වූ (විපුල කසිණ විසින්) අප්‍රමාණ සංඥ ඇති සංඥවත් වූ ආත්මය හෝ පනවති. යළි මෙල සංඥසප්තකය (කිසිවෙක් අෂ්ටකය) හෝ ඉක්මවා ගිය කිසි කෙනෙකුන් අතුරෙන් ඇතැම් කෙනෙක් විඥනකසිණය අප්‍රමාණ ය අචල ය යි කියති. මහණෙනි, තථාගතයෝ ඒ (දිට්ඨිගත දිට්ඨිපච්චය දිට්ඨාරම්මණ) ද විශිෂ්ටඥනයෙන් දන්නාහ.

යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, රූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. එකත්තසඤ්ඤිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නානත්තසඤ්ඤිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. පරිත්තසඤ්ඤිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අප්පමාණසඤ්ඤිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. යා වා පනෙතාසං සඤ්ඤානං පරිසුද්ධා පරමා අග්ගා අනුත්තරියා අක්ඛායති. යදි රූපසඤ්ඤානං යදි අරූපසඤ්ඤානං යදි එකත්තසඤ්ඤානං යදි නානත්තසඤ්ඤානං නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං එකෙ අභිවදන්ති අප්පමාණං ආනෙඤ්ජං. තයිදං සඞ්ඛතං ඔළාරිකං. අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො

තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, රූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, තෙසං එකෙ පටික්කොසන්ති. තං කිස්ස හෙතු: සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලං එතං සන්තං එතං පණීතං යදිදං අසඤ්ඤන්ති. තයිදං භික්ඛවෙ, තථාගතො අභිජානාති.

යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, රූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. යො හි කොචි භික්ඛවෙ, සමණො වා බ්‍රාහ්මණො වා එවං වදෙය්‍ය: 'අහමඤ්ඤත්‍ර රූපා අඤ්ඤත්‍ර වෙදනාය අඤ්ඤත්‍ර සඤ්ඤාය අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි විඤ්ඤාණස්ස[1] ආගතිං වා ගතිං වා චුතිං වා උපපත්තිං[2] වා වුද්ධිං වා විරූළ්හිං වා වෙපුල්ලං වා පඤ්ඤපෙස්සාමී'ති, නෙතං ඨානං විජ්ජති. තයිදං සඞ්ඛතං ඔළාරිකං. අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

---

1. {අඤ්ඤත්‍ර විඤ්ඤාණා - සයා. / අඤ්ඤත්‍ර විඤ්ඤාණස්ස - PTS.
2. උපපත්තිං - සීමු, PTS.

යම් භවත් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ සංඥ ඇති ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ (කරජරූපයෙන් හෝ කසිණ රූපයෙන්) රූපී වූ සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අරූපී වූ සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපී වූත් අරූපී වූත් සංඥවත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ රූපී වූ අරූපී නො වූ සංඥයෙන් යුත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ එකත්වසංඥී වූ සංඥයෙන් යුත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍ය වූ නානාත්වසංඥී වූ සංඥ යෙන් යුත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අල්පමාත්‍ර සංඥ ඇති සංඥයෙන් යුත් ආත්මය හෝ පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අප්‍රමාණ සංඥ ඇති සංඥයෙන් යුත් ආත්මය හෝ පනවති. යළි මෙසේ කියන ලද තෙල සංඥවන් අතුරෙන් යම් සංඥවක් පරිශුද්ධ (නිරුපක්ලෙශ) යැ උත්තම යැ අග්‍ර යැ අසදෘශ යැයි කියනු ලැබේ ද, ඉදින් රූපසංඥවන් කෙරෙන් වේව'යි ඉදින් අරූපසංඥවන් කෙරෙන් වේව'යි ඉදින් ඒකත්වසංඥවන් කෙරෙන් වේව'යි ඉදින් නානාත්වසංඥවන් කෙරෙන් වේව'යි ඇතැම් කෙනෙක් කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනය අප්‍රමාණ යැ අචල යැයි කියති. එ හැම (සංඥගතය) ප්‍රත්‍යයසමවායෙන් කරන ලද, ඖදරික යැ, තෙල (සංඛත යයි කියන ලද) සංස්කාරයන් ගේ නිරොධය ඇත් මැ ය. 'තෙල නිවන ඇතැ'යි මෙසේ දැන එ සංඛතයා ගේ නිස්සරණය දක්නා තථාගතයෝ ඒ සංඛතය ඉක්මවූවාහ.

මහණෙනි, එහි (ඒ අටවැදෑරුම් අසංඥවාදයන් කෙරෙහි) යම් මහණ බමුණුකෙනෙක් මරණින් මතු නිත්‍ය වූ අසංඥී වූ ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපවත් හෝ අසංඥී වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අරූපවත් හෝ අසංඥී වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපීත් අරූපීත් හෝ අසංඥී වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ රූපී වූ අරූපී නො වූ හෝ අසංඥී වූ ආත්මය පනවති. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ සංඥී වූ ආත්මය පනවත් ද, ඇතැම් කෙනෙක් ඔවුන් ගේ දෘෂ්ටිය ප්‍රතිබාහන කෙරෙත්. ඒ කුමක් හෙයින යත් : සංඥව (ආබාධ අර්ථයෙන්) රොගයෙකැ, සංඥව (සදොෂ අර්ථයෙන්) ගණ්ඩයෙකැ, සංඥව (ඇතුළතැ පිවිසෙන අර්ථයෙන්) ශල්‍යයෙකැ, යම් සංඥඅභාවයෙක් ඇද්ද තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ එහෙයිනි. මහණෙනි, එ (දෘෂ්ටිගත ආදිය) ද තථාගතයෝ විශිෂ්ටඥන යෙන් දන්නාහ.

යම් ඒ භවත් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ අසංඥ ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපවත් හෝ අසංඥී ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අරූපී වූ හෝ අසංඥී ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපීත් අරූපීත් හෝ අසංඥී ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ රූපී වූ අරූපී නො වූ හෝ අසංඥී ආත්මය පනවති. මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි බමුණෙක් වේවයි මෙසේ කියා නම් මම රූපය හැර වේදනාව හැර සංඥව හැර සංස්කාරයන් හැර විඥනයා ගේ ප්‍රතිසන්ධිය හෝ ගතිය හෝ ච්‍යුතිය හෝ උපප්‍රාප්තිය හෝ වෘද්ධිය හෝ විරූළ්හ බව හෝ විපුල බව හෝ පනවන්නෙමි'යි. තෙල කරුණ නො වෙයි. ඒ හැම සංඥගත යැ, ප්‍රත්‍යයන් විසින් සකස් කරනලද, එහෙයින් මැ ඖදරික වෙයි. යළි සංස්කාරයන් ගේ නිරොධය ඇත් මැ යැ, 'තෙල නිවන ඇතැ 'යි මෙසේ දැන එ සංඛතයාගේ නිස්සරණය දක්නා තථාගතයෝ එ සංඛතය ඉක්මවූහ.

තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං[1] අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, රූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණ-බ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, තෙසං එතෙ පටික්කොසන්ති, යෙපි තෙ හොන්තා සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. තෙසං එතෙ පටික්කොසන්ති. තං කිස්ස හෙතු: සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො, සඤ්ඤා සල්ලං, අසඤ්ඤා සම්මොහො. එතං සන්තං එතං පණීතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤන්ති, තයිදං භික්ඛවෙ, තථාගතො අභිජානාති.

යෙ ඛො තෙ හොන්තා, සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, රූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. අරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. රූපිඤ්ච අරූපිඤ්ච වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. නෙවරූපිං නාරූපිං වා තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බස්ස සඞ්ඛාරමත්තෙන[2] එතස්ස ආයතනස්ස උපසම්පදං පඤ්ඤපෙන්ති. බ්‍යසනං හෙතං භික්ඛවෙ, අක්ඛායති එතස්ස ආයතනස්ස උපසම්පදාය. න හෙතං භික්ඛවෙ, ආයතනං සසඞ්ඛාරසමාපත්ති[3] පත්තබ්බමක්ඛායති. සඞ්ඛාරාවසෙස[4] සමාපත්ති-පත්තබ්බමෙතං භික්ඛවෙ ආයතනං අක්ඛායති. තයිදං සඞ්ඛතං ඔළාරිකං. අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, තෙසමෙතෙ පටික්කොසන්ති. යෙපි තෙ හොන්තා සමණබ්‍රාහ්මණා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා තෙසමෙතෙ පටික්කොසන්ති. යෙපි තෙ හොන්තා සමණබ්‍රාහ්මණා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං[5] පඤ්ඤපෙන්ති අරොගං පරම්මරණා, තෙසමෙතෙ පටික්කොසන්ති. තං කිස්ස හෙතු: සබ්බෙපිමෙ හොන්තා සමණබ්‍රාහ්මණා උද්ධංසරං[6] ආසත්තිං යෙව අභිවදන්ති. ඉති පෙච්ච භවිස්සාම ඉති පෙච්ච භවිස්සාමා'ති. සෙය්‍යථාපි නාම වාණිජස්ස වාණිජ්ජාය ගච්ඡතො එවං හොති: ඉතො මෙ ඉදං භවිස්සති, ඉමිනා ඉදං ලච්ඡාමී'ති. එවමෙව ඉමෙ[7] හොන්තා සමණබ්‍රාහ්මණා වාණිජූපමා මඤ්ඤෙ පටිභන්ති ඉති පෙච්ච භවිස්සාම, ඉති පෙච්ච භවිස්සාමා'ති. තයිදං භික්ඛවෙ, තථාගතො අභිජානාති.

---

1. නෙවසඤ්ඤිනාසඤ්ඤිං - මජසං.
2. දිට්ඨසුතමුත විඤ්ඤාතබ්බසඞ්ඛාරමත්තෙන - සීමු, මජසං.
3. සඞ්ඛාරසමාපත්ති - මජසං.
4. සසඞ්ඛාරාවසෙස - සීමු.
5. නෙවසඤ්ඤිං නසඤ්ඤිං අත්තානං - මජසං.
6. උද්ධං සරං - සීමු, මජසං; උද්ධං පරමසන්ති - ස්‍යා.
7. එවමෙවිමෙ - මජසං; එවමෙව ඛොමෙ - ස්‍යා.

මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ නෛවසංඥීනාසංඥී වූ ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ සංඥ ඇති අසංඥ නො වූ රූපී වූ හෝ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ සංඥ ඇති අසංඥ නො වූ අරූපී වූ හෝ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ සංඥ ඇති අසංඥ නො වූ රූපී වූත් අරූපී වූත් හෝ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නෛවසංඥී වූ අසංඥ නො වූ නො මැ රූපී වූ අරූපී නො වූ හෝ ආත්මය පනවති. මහණෙනි, ඒ අටවැදෑරුම් නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදයන් අතුරෙහි යම් මහණබමුණු කෙනෙක් මරණින් මත්තෙහි නිත්‍ය වූ සංඥවත් ආත්මය පනවත් ද, ඔවුන්ගේ ලබ්ධිය ඇතැම් කෙනෙක් ප්‍රතිබාහන කෙරෙත්. යම් භවත් මහණබමුණු කෙනෙකුන් මරණින් මතු නිත්‍ය වූ අසංඥී ආත්මය පනවත් ද, ඇතැම් කෙනෙක් ඔවුන්ගේ ලබ්ධිය පිළිකෙව් කෙරෙති. ඒ කවර හෙයින යත් : සංඥව රොගයෙකැ, සංඥව ගණ්ඩයෙකැ, සංඥව ශල්‍යයෙකැ, අසංඥ භාවය සම්මොහයට කරුණු යැ, යම් නෛවසංඥ නාසංඥ බවෙක් ඇද්ද, තෙල ශාන්ත යැ තෙල ප්‍රණීත යැ, එහෙයින්, මහණෙනි, එ (දෘෂ්ටිගත ආදිය) ද තථාගතයෝ විශිෂ්ට ඥනයෙන් දන්නාහ.

යම් භවත් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍යවූ නෛවසංඥී වූ නාසංඥී වූ ආත්මය පනවත් ද, ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපවත් හෝ නො මැ සංඥ ඇති අසංඥ නො වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ අරූපී වූ හෝ නො මැ සංඥී වූ අසංඥී නො වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ රූපී වූත් අරූපී වූත් හෝ නෛවසංඥීනාසංඥී වූ ආත්මය පනවති. ඒ භවත් මහණබමුණෝ මරණින් මතු නිත්‍ය වූ නො මැ රූපී වූ අරූපී නො වූ හෝ නෛව සංඥීනාසංඥී වූ ආත්මය පනවති. මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දිට්ඨ (රූප) සුත (ශබ්ද) මුත (ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය) සංඥමාත්‍ර (පඤ්ච ද්වාරික සංඥ) ඇති තෙල නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ඖදරිකසංස්කාරප්‍රවෘත්ති යෙන් ප්‍රතිලාභය පනවත් ද, මහණෙනි, තෙල ආයතනයාගේ ප්‍රතිලාභයට මෙය ව්‍යසනයෙකැ'යි කියනු ලැබේ. මහණෙනි, තෙල ආයතනය ඖදරික සංස්කාර සහිත වූ සමාපත්තියෙන් පැමිණිය යුතු යයි නො මැ කියනු ලැබෙයි. මහණෙනි, තෙල ආයතනය (භාවනා විසින් සුඛුම බවට පමුණුවන ලද බැවින්) අවශෙෂසංස්කාරයන්ගේ ප්‍රවෘත්තියෙන් පැමිණිය යුතු යයි කියනු ලැබේ. ඒ (සියුම් වූ ද) සංඛතය (ප්‍රත්‍යයොත්පන්න වන බැවින්) ඖදරික වෙයි. සංස්කාරයන්ගේ නිරොධය ඇත් මැ යැ. තෙල නිරොධය ඇතැ'යි මෙසේ දන ඒ සංඛතයාගේ නිස්සරණය දක්නා වූ තථාගතයෝ ඒ සංඛතය ඉක්මවූහ.

මහණෙනි, ඒ සත්වැදෑරුම් උච්ඡෙදවාදයන් කෙරෙහි යම් මහණබමුණු කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ සිඳීම නො දක්ම භවවිගමය පනවත් ද, මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ සංඥී වූ ආත්මය පනවත් ද, ඇතැම් කෙනෙක් ඔවුන්ගේ දෘෂ්ටිය ප්‍රතිබාහන කෙරෙති. යම් භවත් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ අසංඥී වූ ආත්මය පනවත් ද ඇතැම් කෙනෙක් ඔවුන්ගේ දෘෂ්ටිය ප්‍රතිෂෙධ කෙරෙති. යම් භවත් මහණබමුණු කෙනෙක් මරණින් මතු නිත්‍ය වූ නෛවසංඥීනාසංඥී වූ ආත්මය පනවත් ද, ඇතැම් කෙනෙක් ඔවුන්ගේ දෘෂ්ටිය ප්‍රතික්ෂෙප කෙරෙති. ඊට කරුණු කිම යත් : මෙ හැම භවත් මහණබමුණෝ උද්ධංසර (අනාගතයෙහි සංසාරයෙන් ශුද්ධිය වේ යයි) වාද ඇත්තාහු 'පරලොවැ මෙසේ වම්හ' 'පරලොව මෙසේ වම්හ'යි ඇලීම මැ ප්‍රකාශ කෙරෙති. යම් පරිදි වෙළෙඳහම් සඳහා යන වෙළෙඳහුට මෙබඳු සිතෙක් වේ ද : තිලින් මට මේ ලාභය වෙයි. මෙයින් මෙ වත් ලබමි'යි. එසෙයින් මැ මේ භවත් මහණබමුණෝ 'මෙසේ පරලොවැ (ක්ෂත්‍රිය) වෙමි. මෙසේ පරලොවැ (බමුණු) වෙමි'යි වෙළෙඳුන් මෙන් වූවාහු (මට) වටහති. මහණෙනි, ඒ උච්ඡෙද දෘෂ්ටිය තථාගතයෝ විශිෂ්ටඥනයෙන් දන්නාහ.

යෙ ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති, තෙ සක්කායභයා සක්කායපරිජෙගුච්ඡා සක්කායඤ්ඤෙව අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති. සෙය්‍යථාපි නාම සා ගද්දුලබද්ධො[1] දළ්හෙ ථම්භෙ වා ඛීලෙ වා උපනිබද්ධො[2]. තමෙව ථම්භං වා ඛීලං වා අනුපරිධාවති අනුපරිවත්තති. එවමෙවිමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සක්කායභයා සක්කායපරිජෙගුච්ඡා සක්කායඤ්ඤෙව අනුපරිධාවන්ති, අනුපරිවත්තන්ති. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො අත්ථෙතන්ති. ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො, අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති. සබ්බෙ තෙ ඉමානෙව පඤ්චායතනානි අභිවදන්ති එතෙසං වා අඤ්ඤතරං.

සන්ති භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති. සස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. ඉත්ථෙකෙ අභිවදන්ති. අසස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. සස්සතො ච අසස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති අන්තවා අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. අනන්තවා අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. අන්තවා ච අනන්තවා ච අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. නෙවන්තවා නානන්තවා අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. එකත්තසඤ්ඤී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. නානත්තසඤ්ඤී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. පරිත්තසඤ්ඤී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. අප්පමාණසඤ්ඤී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. එකන්තසුඛී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. එකන්තදුක්ඛී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. සුඛදුක්ඛී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති. අදුක්ඛමසුඛී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉත්ථෙකෙ අභිවදන්ති.

---

1. ගද්දුලබන්ධො - ස්‍යා.
2. උපනිබන්ධො - ස්‍යා

යම් භවත් මහණබමුණු කෙනෙක් විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය භවවිගමය පනවත් ද, ඔහු (ත්‍රෛභූමකධර්ම සංඛ්‍යාත) සත්කායට බියෙන් සත්කාය ජුගුප්සා කිරීමෙන් සත්කාය මැ අනුධාවනය කෙරෙති. අනුපරිවර්තන කෙරෙති. යම්සේ බලුබැඳුමෙන් බැඳුණු ශුනකයෙක් දඩි වූ වැඹෙක හෝ කණුවෙක හෝ බඳනා ලදුයේ එ මැ වැඹ හෝ කණුව හෝ අනුපරිධාවන අනුපරිවර්තන කෙරේ ද, එසෙයින් මැ මේ භවත් මහණබමුණෝ සත්කායභීතිය හේතු කොට ගෙන සත්කාය ජුගුප්සාව හේතු කොට ගෙන සත්කාය මැ අනුධාවන අනුපරිවර්තන කෙරෙත්. එ සත්කාය ප්‍රත්‍යයෙහි පන්නයෙක. (එහෙයින් මැ) ඖදරික යැ. සංස්කාරයන්ගේ නිරෝධය ඇත් මැ යැ. තෙල ' නිරෝධය ඇතැ 'යි මෙසේ දැන ඒ සංඛතයාගේ නිස්සරණය දක්නා වූ තථාගතයෝ ඒ සංඛතය ඉක්මවූහ.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් වේවයි බ්‍රාහ්මණ කෙනෙක් වේවයි අපරාන්තය විකල්පනා කොට ගත් අපරාන්තදෘෂ්ටි ඇත්තාහු අපරාන්තය අරභයා අනේකප්‍රකාර වූ දෘෂ්ටිදීපකවචනයන් ප්‍රකාශ කෙරෙත් ද, ඔහු සියල්ලෝ මේ පඤ්චකාරණයන් මැ ප්‍රකාශ කෙරෙති. මොවුනතුරෙන් අන්‍යතරයක් හෝ ප්‍රකාශ කෙරෙත්.

මහණෙනි, ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ඔහු පූර්වාන්තය විකල්පන කොට ගත්තාහු පූර්වාන්තදෘෂ්ටි ඇතියාහු පූර්වාන්තය අරභයා අනේකවිධ දෘෂ්ටිදීපකවචනයන් ප්‍රකාශ කෙරෙත් : ' ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත්, ලෝකයත් අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් ශාශ්වත ද අශාශ්වත ද වෙයි, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් නො මැ ශාශ්වත වූයේ නො ද අශාශ්වත වෙයි, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් අන්ත ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් අන්ත ඇත්තේ නො වෙයි, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් අන්ත ඇත්තේත් අන්ත නැත්තේත් වෙයි, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් නො මැ අන්තවත් වූයේ අනන්තවත් නො වෙයි, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් එකත්වසංඥ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් නානාත්වසංඥ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් පරිත්ත (අල්ප) සංඥ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් අප්‍රමාණසංඥ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලොකයත් ඒකාන්තසුඛ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ', යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් ඒකාන්ත දුඃඛ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලොකයත් සුඛදුඃඛ ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙති. ' ආත්මයත් ලෝකයත් නොදුක් නොසුව ඇත්තේ යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි මෙසේ ඇතැම් කෙනෙක් ප්‍රකාශ කෙරෙත්,

තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො: සස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. තෙසං වත අඤ්ඤත්‍රෙව සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා පච්චත්තංයෙව ඤාණං භවිස්සති පරිසුද්ධං පරියොදාතන්ති. නෙතං ඨානං විජ්ජති. පච්චත්තං ඛො පන භික්ඛවෙ, ඤාණෙ අසති පරිසුද්ධෙ පරියොදාතෙ, යදපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා තත්ථ ඤාණභාගමත්තමෙව පරියොදපෙන්ති, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං උපාදානමක්ඛායති. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

තත්‍ර භික්ඛවෙ, යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො : අසස්සතො අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති -පෙ- සස්සතො ච අසස්සතො ච අත්තා ච ලොකො ච -පෙ- නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො ච -පෙ- අන්තවා අත්තා ච ලොකො ච -පෙ- අනන්තවා අත්තා ච ලොකො ච -පෙ- අන්තවා ච අනන්තවා ච අත්තා ච ලොකො ච -පෙ- නෙවන්තවා නානන්තවා අත්තා ච ලොකො ච -පෙ- එකත්තසඤ්ඤී අත්තා ච ලොකො ච -පෙ- නානත්තසඤ්ඤී අත්තා ච ලොකො ච -පෙ- පරිත්තසඤ්ඤී අත්තා ච ලොකො ච -පෙ- අප්පමාණසඤ්ඤී අත්තා ච ලොකො ච -පෙ- එකන්තසුඛී අත්තා ච ලොකො ච -පෙ- එකන්තදුක්ඛී අත්තා ච ලොකො ච -පෙ- සුඛදුක්ඛී අත්තා ච ලොකො ච -පෙ- අදුක්ඛමසුඛී අත්තා ච ලොකො ච, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. තෙසං වත අඤ්ඤත්‍රෙව සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා පච්චත්තංයෙව ඤාණං භවිස්සති පරිසුද්ධං පරියොදාතන්ති නෙතං ඨානං විජ්ජති. පච්චත්තං ඛො පන භික්ඛවෙ, ඤාණෙ අසති පරිසුද්ධෙ පරියොදාතෙ, යදපි තෙ භොන්තො සමණබ්‍රාහ්මණා තත්ථ ඤාණභාගමත්තමෙව පරියොදපෙන්ති. තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං උපාදානමක්ඛායති. තයිදං සඞ්ඛතං ඔළාරිකං. අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

ඉධ භික්ඛවෙ, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති: 'එතං සන්තං එතං පණීතං, යදිදං පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරාමී'ති. තස්ස සා පවිවෙකා පීති නිරුජ්ඣති, පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති දොමනස්සං. දොමනස්සස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති. සෙය්‍යථාපි භික්ඛවෙ, යං ඡායා ජහති තං ආතපො ඵරති, යං ආතපො ජහති, තං ඡායා ඵරති. එවමෙව ඛො භික්ඛවෙ, පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති දොමනස්සං, දොමනස්සස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති. තයිදං භික්ඛවෙ, තථාගතො අභිජානාති : 'අයං ඛො භවං සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො

මහණෙනි, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් ' ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය සිස් යැ යන මෙවන් වාද ඇත්තාහු මෙවන් දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ඔවුනට ඒකාන්තයෙන් ශ්‍රද්ධාව මිස රුචිය මිස අනුශ්‍රවය මිස ආකාරපරිවිතර්කය මිස දෘෂ්ටියෙන් සිතා රුස්වාගැනීම මිස ' පරිශුද්ධ (නිරුපක්ලෙශ) පර්‍ය්‍යවදාත (ප්‍රභාස්වර) ප්‍රත්‍යක්ෂඥානයෙක් වන්නේ යැ' යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි. මහණෙනි, වැලිත් ' පරිශුද්ධ පර්‍ය්‍යවදාත ප්‍රත්‍යක්ෂඥානය නැති කල්හි ඒ භවත් මහණබමුණෝ එහි යම් මැ ඥානභාගයක් පිරිසිඳු කෙරෙත් ද, එ ද ඒ භවත් ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ (දෘෂ්ටි) උපාදානයෙකැ ' යි කියනු ලැබේ. ඒ දෘෂ්ටිගතය ප්‍රත්‍යයොත්පන්න යැ, (එහෙයින් මැ) ඖදරික වෙයි. සංස්කාරයන්ගේ නිරෝධය ඇත් මැ යැ, ' තෙල නිවන ඇතැ ' යි මෙසේ දැක ඒ සඞ්ඛතයාගේ නිස්සරණය (නිවන) දක්නා තථාගතයෝ ඒ සඞ්ඛතය ඉක්මවූහ.

මහණෙනි, ඔවුනතුරෙහි යම් මහණබමුණු කෙනෙක් මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් ද, ' ආත්මයත් ලෝකයත් අශාශ්වත යැ, මේ මැ සත්‍ය යැ, තදන්‍යය තුච්ඡ යැ ' යි . . . ' ආත්මයත් ලෝකයත් ශාශ්වත ද අශාශ්වත ද වෙයි . . . ආත්මයත් ලෝකයත් නො මැ ශාශ්වත යැ, අශාශ්වත නො වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් අන්තවත් යැ ' . . . ' ආත්මයත් ලෝකයත් අනන්තවත් වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් අන්තවත් ද අනන්තවත් ද වෙයි . . . ආත්මයත් ලෝකයත් නො මැ අන්තවත් යැ, අනන්තවත් නො වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් එකත්වසංඥී වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් නානාත්වසංඥ වෙයි ' . . . ' ආත්ම යත් ලෝකයත් පරිත්තසංඥ වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් අප්‍රමාණසංඥී වෙයි ' . . . ' ආත්මයත් ලොකයත් ඒකාන්තසුව ඇති වෙයි ' . . . ' ආත්මයත් ලෝක යත් ඒකාන්ත දුක් ඇති වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් සුවදුක් ඇති වෙයි ' . . . ' ආත්මයත් ලෝකයත් නොදුක්නොසුව ඇති වෙයි ' මේ මැ සැබව, තදන්‍යය තුච්ඡ යැ' යි ඔවුනට ඒකාන්තයෙන් ශ්‍රද්ධාව තබා රුචිය තබා අනුශ්‍රවය තබා ආකාරපරිවිතර්කය තබා දෘෂ්ටියෙන් සිතා රුස්වාගැනීම තබා ' පරිශුද්ධ ප්‍රභාස්වර ප්‍රත්‍යක්ෂඥානයෙක් වන්නේ යැ ' යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, මහණෙනි, වැලිත් පරිශුද්ධ ප්‍රභාස්වර ප්‍රත්‍යක්ෂඥානය නැති කල්හි ඒ භවත් මහණබමුණෝ එහි යම් මැ ඥානභාගයකට බැසගනිත් ද, එ ද ඒ භවත් මහණබමුණන්ගේ (දෘෂ්ටි) ' උපාදානයෙකැ ' යි කියනු ලැබේ. ඒ දෘෂ්ටිගතය ප්‍රත්‍යයෝත්පන්න යැ, (එහෙයින් මැ) ඖදරික වෙයි, සංස්කාරයන්ගේ නිරොධය ඇත් මැ යැ, ' තෙල නිවන ඇතැ ' යි මෙසේ දැන ඒ සඞ්ඛතයාගේ නිස්සරණය දක්නා තථාගතයෝ ඒ දෘෂ්ටිය ඉක්මවූහ.

මහණෙනි, මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ පූර්‍වාන්තානුදෘෂ්ටීන් ගේ දුරැලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන්ගේ ද දුරැලීමෙන් සර්‍වප්‍රකාරයෙන් පඤ්චකාමගුණික සංයොජනයන්ගේ බැහැර කිරීමෙන් (සප්‍රීතිකධ්‍යානද්වය, සඞ්ඛ්‍යාත) ප්‍රවිවේකප්‍රීතියට පැමිණ වෙසෙයි. යම් ප්‍රවිවේක ප්‍රීතියකට පැමිණ වෙසෙම් ද ' තෙල ප්‍රීතිය ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුගේ ඒ ප්‍රවිවේක ප්‍රීතිය (ධ්‍යාන නිරොධයෙන්) නිරුද්ධ වෙයි. ප්‍රවිවේක ප්‍රීතිය නිරුද්ධ වීමෙන් දෙම්නස උපදී. දෙම්නස්හුගේ නිරොධයෙන් ප්‍රවිවෙක ප්‍රීතිය උපදී. මහණෙනි, යම්සේ සෙවණ යම් තැනක් හැරපියා ද ආතපය එතැන පැතිරෙයි. ආතපය යම් තැනක් හැරපියා ද සෙවණ එතැන පැතිරෙයි. එසෙයින් මැ මහණෙනි, ප්‍රවිවෙක ප්‍රීතිය නිරුද්ධ වීමෙන් දොම්නස උපදී. දොම්නස නිරුද්ධ වීමෙන් ප්‍රවිවෙක ප්‍රීතිය උපදී. මහණෙනි ඒ ධ්‍යානද්වය ප්‍රීතිය තථාගතයෝ විශිෂ්ටඥානයෙන් දන්නාහ : " මේ භවත් මහණ හෝ බමුණු හෝ පූර්‍වාන්තානුදෘෂ්ටිය ද දුරැලීමෙන් අපරාන්තානුදෘෂ්ටිය ද දුරැලීමෙන් සර්‍වප්‍රකාරයෙන් කාමසංයෝජනයන් බැහැර කිරීමෙන්

කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා, පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරති: 'එතං සන්තං එතං පණීතං, යදිදං පවිවෙකං පීතිං උපසම්පජ්ජ විහරාමී'ති. තස්ස සා පවිවෙකා පීති නිරුජ්ඣති, පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති දොමනස්සං. දොමනස්සස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙත'න්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා, පවිවෙකාය පීතියා සමතික්කමා, නිරාමිසං සුඛං උපසම්පජ්ජ විහරති: 'එතං සන්තං එතං පණීතං යදිදං නිරාමිසං සුඛං උපසම්පජ්ජ විහරාමී'ති. තස්ස තං නිරාමිසං සුඛං නිරුජ්ඣති, නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති. පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං. සෙය්‍යථාපි භික්ඛවෙ, යං ඡායා ජහති, තං ආතපො ඵරති. යං ආතපො ජහති, තං ඡායා ඵරති. එවමෙව ඛො භික්ඛවෙ, නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති. පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං. තයිදං භික්ඛවෙ තථාගතො අභිජානාති: 'අයං ඛො භවං සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා පවිවෙකාය පීතියා සමතික්කමා, නිරාමිසං සුඛං උපසම්පජ්ජ විහරති: එතං සන්තං එතං පණීතං, යදිදං නිරාමිසං සුඛං උපසම්පජ්ජ විහරාමීති. තස්ස තං නිරාමිසං සුඛං නිරුජ්ඣති, නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති පවිවෙකා පීති, පවිවෙකාය පීතියා නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

ඉධ භික්ඛවෙ, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා පවිවෙකාය පීතියා සමතික්කමා නිරාමිසස්ස සුඛස්ස සමතික්කමා අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරති: 'එතං සන්තං එතං පණීතං-යදිදං අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරාමී'ති තස්ස සා අදුක්ඛමසුඛා වෙදනා නිරුජ්ඣති. අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං. නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. සෙය්‍යථාපි භික්ඛවෙ, යං ඡායා ජහති, තං ආතපො ඵරති. යං ආතපො ජහති, තං ඡායා ඵරති. එවමෙව ඛො භික්ඛවෙ, අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං, නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. තයිදං භික්ඛවෙ, තථාගතො පජානාති: 'අයං ඛො භවං සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසඤ්ඤොජනානං අනධිට්ඨානා පවිවෙකාය පීතියා සමතික්කමා නිරාමිසස්ස සුඛස්ස සමතික්කමා අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරති: 'එතං සන්තං එතං පණීතං යදිදං අදුක්ඛමසුඛං වෙදනං උපසම්පජ්ජ විහරාමී'ති. තස්ස සා අදුක්ඛමසුඛා වෙදනා නිරුජ්ඣති. අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා උප්පජ්ජති නිරාමිසං සුඛං. නිරාමිසස්ස සුඛස්ස නිරොධා උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

'යම් ප්‍රවිවෙක ප්‍රීතියකට පැමිණ වෙසෙම් නම් තෙල ප්‍රීතිය ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ' යි ප්‍රවිවේක ප්‍රීතියට පැමිණ වෙසෙයි. '' ඔහුගේ ඒ ප්‍රවිවෙක ප්‍රීතිය නිරුද්ධ වෙයි. ප්‍රවිවෙක ප්‍රීතිය නිරුද්ධ වීමෙන් දෙම්නස උපදී. දෙම්නස නිරුද්ධ වීමෙන් ප්‍රවිවෙක ප්‍රීතිය උපදී. ඒ ධ්‍යානද්වය ප්‍රීතිය ප්‍රත්‍යයොත්පන්න යැ, (එහෙයින් මැ) ඖදරික යැ, සංස්කාරයන්ගේ නිරොධය ඇත් මැ යැ, තෙල ඇතැ ' යි මෙසේ දැන ඒ සඞ්ඛතයා ගේ නිස්සරණය දක්නා වූ තථාගතයෝ ඒ සඞ්ඛතය ඉක්මවූහ.

තවද මහණෙනි, මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ පූර්වාන්තානුදෘෂ්ටිය ද දුරුලීමෙන් අපරාන්තානුදෘෂ්ටිය ද දුරුලීමෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවෙකප්‍රීතිය ඉක්මවීමෙන් (තෘතියධ්‍යාන සඞ්ඛ්‍යාත) නිරාමිෂසුඛයට පැමිණ වෙසෙයි : ' යම් නිරාමිෂසුඛයකට පැමිණ වෙසෙම් නම් තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුගේ ඒ නිරාමිෂසුඛය නිරුද්ධ වෙයි, නිරාමිෂසුඛයාගේ නිරොධයෙන් ප්‍රවිවෙකප්‍රීතිය උපදී. ප්‍රවිවෙකප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂසුඛය උපදී. මහණෙනි, යම්සේ සෙවණ යම් තැනක් හැරපියා ද ආතපය එතැන පැතිරෙයි, ආතපය යම් තැනක් හැරපියා ද සෙවණ එතැන පැතිරෙයි, එසෙයින් මැ මහණෙනි, නිරාමිෂ සුඛයාගේ නිරොධයෙන් ප්‍රවිවෙකප්‍රීතිය උපදී. ප්‍රවිවෙකප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂ සුඛය උපදී. මහණෙනි, තථාගතයෝ එකරුණ විශිෂ්ටඥානයෙන් දන්නාහ : ' මේ භවත් ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ පූර්වාන්තානුදෘෂ්ටීන් දුරුලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන් ද දුරුලී මෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවෙකප්‍රීතිය ඉක්මවීමෙන් යම් නිරාමිෂසුඛයකට පැමිණ වෙසෙම් නම් ' තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි නිරාමිෂ (තෘතියධ්‍යාන) සුඛයට පැමිණ වෙසෙයි. ඔහුගේ ඒ නිරාමිෂසුඛය නිරුද්ධ වෙයි. නිරාමිෂසුඛයාගේ නිරොධයෙන් ප්‍රවිවෙකප්‍රීතිය උපදී. ප්‍රවිවෙකප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂසුඛය උපදී. ඒ සුඛය ප්‍රත්‍යයොත්පන්න යැ (එහෙයින් මැ) ඖදරික යි. සංස්කාරයන්ගේ නිරොධය ඇත් මැ යැ. ' තෙල නිරොධය ඇතැ ' යි මෙසේ දැන ඒ සඞ්ඛතයාගේ නිස්සරණය දක්නා තථාගතයෝ ඒ සඞ්ඛතය ඉක්මසිටියහ.

මහණෙනි, මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ පූර්වාන්තානුදෘෂ්ටීන් ද දුරුලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන් ද දුරුලීමෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවෙකප්‍රීතිය ඉක්මැවීමෙන් නිරාමිෂසුඛය ඉක්මැවීමෙන් නොදුක්නොසුව වෙදනා උපයා වෙසෙයි ; ' යම් මේ නොදුක්නොසුව වෙදනාවක් උපයා වෙසෙම් නම් තෙල චතුර්ථධ්‍යාන වෙදනා ශාන්ත යැ තෙල ප්‍රණීත යැ කියා යි. ඔහුගේ ඒ නොදුක් නොසුව වෙදනා නිරුද්ධ වෙයි. නොදුක්නොසුව වෙදනා නිරෝධයෙන් නිරාමිෂසුඛය උපදී. නිරාමිෂසුඛයා ගේ නිරෝධයෙන් නොදුක්නොසුව වෙදනා උපදී. මහණෙනි, යම්සේ ඡායාව යම් තැනක් හැරපියා ද ආතපය එතැන පැතිරෙයි. ආතපය යම් තැනක් හැරපියා ද සෙවණ එතැන පැතිරෙයි. එසෙයින් මැ මහණෙනි, අදුක්ඛමසුඛවෙදනාවගේ නිරොධයෙන් නිරාමිෂසුඛය උපදී. නිරාමිෂසුඛයාගේ නිරොධයෙන් අදුක්ඛමසුඛ වෙදනාව උපදී. මහණෙනි, ඒ මේ චතුර්ථධ්‍යානවෙදනාව තථාගතයෝ දනිති : මේ භවත් මහණ හෝ බමුණු හෝ පූර්වාන්තානුදෘෂ්ටීන් ද දුරුලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන් ද දුරුලීමෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවෙකප්‍රීතිය ඉක්මැවීමෙන් නිරාමිෂසුඛය ඉක්මැවීමෙන් ' යම් මේ අදුක්ඛමසුඛවෙදනාවක් උපයා වෙසෙම් ද, තෙල චතුර්ථධ්‍යානවෙදනාව ශාන්ත යැ තෙල ප්‍රණීත යැ ' යි අදුක්ඛමසුඛවෙදනාව උපයා වෙසෙයි. ඔහුගේ ඒ අදුක්ඛමසුඛවෙදනාව නිරුද්ධ වෙයි. අදුක්ඛමසුඛවෙදනාවගේ නිරොධයෙන් නිරාමිෂසුඛය උපදී. නිරාමිෂසුඛයාගේ නිරෝධයෙන් අදුක්ඛමසුඛවේදනාව උපදී. ඒ මේ චතුර්ථධ්‍යානවෙදනාව ප්‍රත්‍යයොත්පන්න යැ, (එහෙයින් මැ) ඖදරික යි. සංස්කාර යන්ගේ නිරොධය ඇත් මැ යැ. ' තෙල නිරොධය ඇතැ ' යි මෙසේ දැන ඒ සඞ්ඛතයාගේ නිස්සරණය දක්නා තථාගතයෝ ඒ සඞ්ඛතය ඉක්මසිටියහ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසංයොජනානං අනධිට්ඨානා පවිවෙකාය පීතියා සමතික්කමා නිරාමිසස්ස සුඛස්ස සමතික්කමා අදුක්ඛමසුඛාය වෙදනාය සමතික්කමා සන්තොහමස්මි නිබ්බුතොහමස්මි අනුපාදානොහමස්මී'ති සමනුපස්සති. තයිදං භික්ඛවෙ, තථාගතො පජානාති : 'අයං ඛො භවං සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා අපරන්තානුදිට්ඨීනඤ්ච පටිනිස්සග්ගා සබ්බසො කාමසංයොජනානං අනධිට්ඨානා පවිවෙකාය පීතියා සමතික්කමා නිරාමිසස්ස සුඛස්ස සමතික්කමා අදුක්ඛමසුඛාය වෙදනාය සමතික්කමා සන්තොහමස්මි නිබ්බුතොහමස්මි අනුපාදානොහමස්මී'ති සමනුපස්සති. අද්ධා අයමායස්මා නිබ්බානසප්පායංයෙව පටිපදං අභිවදති. අථ ච පනායං භවං සමණො වා බ්‍රාහ්මණො වා පුබ්බන්තානුදිට්ඨිං වා උපාදියමානො උපාදියති. අපරන්තානුදිට්ඨිං වා උපාදියමානො උපාදියති. කාමසංයොජනං වා උපාදියමානො උපාදියති. පවිවෙකං වා පීතිං උපාදියමානො උපාදියති. නිරාමිසං වා සුඛං උපාදියමානො උපාදියති. අදුක්ඛමසුඛං වා වෙදනං උපාදියමානො උපාදියති. යඤ්ච ඛො අයමායස්මා 'සන්තොහමස්මි, නිබ්බුතොහමස්මි අනුපාදානොහමස්මී'ති සමනුපස්සති. තදපි ඉමස්ස භොතො සමණස්ස බ්‍රාහ්මණස්ස උපාදානමක්ඛායති. තයිදං සඞ්ඛතං ඔළාරිකං, අත්ථි ඛො පන සඞ්ඛාරානං නිරොධො, අත්ථෙතන්ති ඉති විදිත්වා තස්ස නිස්සරණදස්සාවී තථාගතො තදුපාතිවත්තො.

ඉදං ඛො පන භික්ඛවෙ, තථාගතෙන අනුත්තරං සන්තිවරපදං[1] අභිසම්බුද්ධං 'යදිදං ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමොක්ඛො'ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

පඤ්චත්තයසුත්තං දුතියං.

---

1. සන්තං වරපදං - ස්‍යා.

මහණෙනි, මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ පූර්වාන්තානුදෘෂ්ටීන් ද දුරලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන් ද දුරලීමෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවේකප්‍රීතිය ඉක්මවීමෙන් නිරාමිෂසුඛය ඉක්මවීමෙන් අදුක්ඛමසුඛ වෙදනාව ඉක්මවීමෙන් ' මම ශාන්තයෙමි, මම නිවියෙමි, මම උපාදාන නැතියෙමි ' නුවණින් දකී. මහණෙනි, මෙය තථාගතයෝ දනිති : '' මේ භවත් මහණ හෝ බමුණු හෝ පූර්වාන්තානුදෘෂ්ටීන්ද දුරලීමෙන් අපරාන්තානුදෘෂ්ටීන් ද දුරලීමෙන් සර්වප්‍රකාරයෙන් කාමසංයොජනයන් බැහැර කිරීමෙන් ප්‍රවිවෙකප්‍රීතිය ඉක්මවීමෙන් නිරාමිෂසුඛය ඉක්මවී මෙන් අදුක්ඛමසුඛවෙදනාව ඉක්මවීමෙන් ' මම ශාන්තයෙමි, මම නිවියෙමි, මම උපාදාන නැතියෙමි ' නුවණින් දකී, එකාන්තයෙන් මේ ආයුෂ්මත් නිවනට සත්ප්‍රාය වූ මැ ප්‍රතිපදාව කියයි, එතෙකුදු වත් මේ භවත් මහණ හෝ බමුණු හෝ දැඩි කොට ගන්නේ පූර්වාන්තානු දෘෂ්ටිය හෝ දැඩි කොට ගනියි. දැඩි කොට ගන්නේ අපරාන්තානුදෘෂ්ටිය හෝ දැඩි කොට ගනියි, දැඩි කොට ගන්නේ කාමසංයොජනය හෝ දැඩි කොට ගනියි, දැඩි කොට ගන්නේ ප්‍රවිවෙකප්‍රීතිය හෝ දැඩි කොට ගනියි, දැඩි කොට ගන්නේ නිරාමිෂසුඛය හෝ දැඩි කොට ගනියි, දැඩි කොට ගන්නේ අදුක්ඛමසුඛවේදනාව හෝ දැඩි කොට ගනියි, මෙ ආයුෂ්මත් යමක් ගෙන ' මම සන්හුන්මි, මම නිවියෙමි, මම උපාදාන නැතියෙමි ' සමනුපස්සනා කෙරේ ද, එ ද මෙ භවත් මහණහුගේ බමුණුගේ ' උපාදානයෙකැ ' යි කියනු ලැබේ. ඒ මෙය ප්‍රත්‍යයොත්පන්න යැ, (එහෙයින් මැ,) ඖදරික යි, සංස්කාරයන්ගේ නිරොධය ඇත් මැ යැ. ' තෙල නිරොධය ඇතැ ' යි මෙසේ දැන ඒ සඞ්ඛතයාගේ නිස්සරණය දක්නා තථාගතයෝ ඒ සඞ්ඛතය ඉක්මවූහ.

මහණෙනි, සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ සමුදය ද අස්තඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තතුසේ දැන යම් අනුපාදවිමොක්ෂ සඞ්ඛ්‍යාත අර්හත්ඵලසමාපත්ති යෙක් ඇද්ද, තථාගතයන් විසින් අනුත්තර වූ මේ ශාන්ත වූ උත්තමපදය අවබොධ කරන ලද්දේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රදෙශනාව වදළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවත්හු ගේ භාෂිතය අභිනන්දන කළාහ'යි.

දෙවැනි පඤ්චත්‍රය සූත්‍ර යි.

# 3. 1. 3

## කින්ති සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කුසිණාරායං[1] විහරති බලිහරණෙ වනසණ්ඩෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච :

කින්ති වො භික්ඛවෙ, මයි හොති : 'චීවරහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, පිණ්ඩපාතහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, සෙනාසනහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, ඉති භවාභවහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙතී'ති.

න ඛො නො භන්තෙ, භගවති එවං හොති : 'චීවරහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, පිණ්ඩපාතහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, සෙනාසනහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, ඉති භවාභවහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙතී'ති.

න ච කිර වො භික්ඛවෙ, මයි එවං හොති : 'චීවරහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, පිණ්ඩපාතහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, සෙනාසනහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙති, ඉති භවාභවහෙතු වා සමණො ගොතමො ධම්මං දෙසෙතී'ති. අථ කින්ති චරහි වො භික්ඛවෙ මයි හොතී'ති.

එවං ඛො නො භන්තෙ, භගවති හොති : 'අනුකම්පකො භගවා හිතෙසී, අනුකම්පං උපාදාය ධම්මං දෙසෙතී'ති.

එවඤ්ච කිර වො භික්ඛවෙ මයි හොති : 'අනුකම්පකො භගවා හිතෙසී, අනුකම්පං උපාදාය ධම්මං දෙසෙතී'ති. තස්මාතිහ භික්ඛවෙ, යෙ වො මයා ධම්මා අභිඤ්ඤා දෙසිතා, සෙය්‍යථීදං : 'චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. තත්‍ර සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බං.

---

1. පිසිනාරායං – මජසං.

# 3. 1. 3
# කිංතිසූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නම් ජනවියෙහි (භූතයනට බිලි එළවනුයෙන්) බලිහරණ නම් වනළැව්හි වැඩ වසනසේක. එතන්හි දී භාග්‍යවත්හු ' මහණෙනි ' යි භික්ෂූන් ඇමැතූහ. ' වහන්සැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙ සූත වදළහ.

මහණෙනි, තොපට මා කෙරෙහි කුමන සිතෙක් වේ ද : ' ශ්‍රමණ ගෞතමයෝ චීවරහෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ පිණ්ඩපාත හේතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ සෙනාසන හෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ (දෙශනාමය පින්කිරියවත් නිසා) ඒ ඒ භවයෙහි ' සුව විඳිමි ' යන හේතුයෙන් හෝ දහම් දෙසති ' යි කියා යි.

වහන්ස, අපට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙවන් සිතෙක් නො වෙයි : ' ශ්‍රමණ ගෞතමයෝ චීවරහෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ පිණ්ඩපාත හෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ සෙනාසන හෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ ' ඒ ඒ භවයෙහි සුව විඳිමි ' යන හෙතුයෙන් හෝ දහම් දෙසති ' කියා යි.

මහණෙනි, තොපට මා කෙරෙහි මෙවන් සිතෙක් නො වේ ල : ' ශ්‍රමණ ගෞතමයෝ චීවරහෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ පිණ්ඩපාතහෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ සෙනාසනහෙතුයෙන් හෝ දහම් දෙසති. ශ්‍රමණ ගෞතමයෝ ' ඒ ඒ භවයෙහි සුව විඳිමි ' යන හේතුයෙන් හෝ දහම් දෙසති ' යි, සිතෙක් නො වේ ල. එසේ වී නම් මහණෙනි, තොපට මා කෙරෙහි කිනම් සිතෙක් වේ ද ? යි.

වහන්ස, අපට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු සිතෙක් වෙයි : ' භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා ඇතියහ, හිතෛෂීහ, අනුකම්පා පිණිස දහම් දෙසනසේකැ ' යි.

මහණෙනි, තොපට මා කෙරෙහි මෙබඳු සිතෙක් වේ නම් : ' බුදුහු අනුකම්පා ඇතියහ, හිතෛෂීහ, අනුකම්පා පිණිස දහම් දෙසති ' යි. එහෙයින් මහණෙනි, මෙහිලා තොපට මා විසින් යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කොට දෙසනලද්දහු ද, ඒ මෙසේ යැ : ' සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්චබලයෝ යැ සප්තබොධ්‍යඞ්ගයෝ යැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යි. ඒ සත්තිස් බොධිපාක්ෂිකධර්මයන්හි සියල්ලන් විසින් මැ සමග්‍රවූවන් සතුටු වූවන් විවාද නො කරනුවන් විසින් හික්මියයුතු යැ.

තෙසඤ්ච වො භික්ඛවෙ, සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛතං, තත්ථ සියුං[1] ද්වෙ භික්ඛූ අභිධම්මෙ නානාවාදා. තත්‍ර චෙ තුම්හාකං එවමස්ස : 'ඉමෙසං ඛො ආයස්මන්තානං අත්ථතො චෙව නානං බ්‍යඤ්ජනතො ච නානන්'ති. තත්ථ යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො : 'ආයස්මන්තානං ඛො අත්ථතො චෙව නානං. බ්‍යඤ්ජනතො ච නානං. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ යථා අත්ථතො චෙව නානං බ්‍යඤ්ජනතො ච නානං මා ආයස්මන්තො විවාදං ආපජ්ජිත්ථා'ති. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො : 'ආයස්මන්තානං ඛො අත්ථතො චෙව නානං බ්‍යඤ්ජනතො ච නානං. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ යථා අත්ථතො චෙව නානං බ්‍යඤ්ජනතො ච නානං මා ආයස්මන්තො විවාදං ආපජ්ජිත්ථා'ති. ඉති දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙතබ්බං සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙතබ්බං දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙත්වා සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙත්වා යො ධම්මො යො විනයො සො භාසිතබ්බො.

තත්‍ර චෙ තුම්හාකං එවමස්ස. 'ඉමෙසං ඛො ආයස්මන්තානං අත්ථතො, හි ඛො නානං, බ්‍යඤ්ජනතො සමෙති'ති. තත්ථ යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො : 'ආයස්මන්තානං අත්ථතො හි ඛො නානං, බ්‍යඤ්ජනතො සමෙති. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ යථා අත්ථතො හි ඛො නානං, බ්‍යඤ්ජනතො සමෙති. මා ආයස්මන්තො විවාදං ආපජ්ජිත්ථා'ති. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො, උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'ආයස්මන්තානං ඛො අත්ථතො හි ඛො, නානං, බ්‍යඤ්ජනතො සමෙති. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ 'යථා අත්ථතො හි ඛො නානං, බ්‍යඤ්ජනතො සමෙති. මා ආයස්මන්තො, විවාදං ආපජ්ජිත්ථා'ති. ඉති දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙතබ්බං සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙතබ්බං. දුග්ගහිතං දුග්ගහිතො ධාරෙත්වා සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙත්වා යො ධම්මො යො විනයො සො භාසිතබ්බො.

තත්‍ර චෙ තුම්හාකං එවමස්ස : 'ඉමෙසං ඛො ආයස්මන්තානං අත්ථතො, හි ඛො සමෙති. බ්‍යඤ්ජනතො නානන්'ති. තත්ථ යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො : 'ආයස්මන්තානං ඛො අත්ථතො හි සමෙති. බ්‍යඤ්ජනතො නානං. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ 'යථා අත්ථතො හි ඛො සමෙති. බ්‍යඤ්ජනතො නානං. අප්පමත්තකං ඛො පනෙතං යදිදං බ්‍යඤ්ජනං මා ආයස්මන්තො, අප්පමත්තකෙ විවාදං ආපජ්ජිත්ථා'ති. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ආයස්මන්තානං ඛො අත්ථතො හි ඛො සමෙති. බ්‍යඤ්ජනතො නානං. තදිමිනාපෙතං ආයස්මන්තො ජානාථ 'යථා අත්ථතො හි ඛො සමෙති බ්‍යඤ්ජනතො නානං. අප්පමත්තකං ඛො පනෙතං යදිදං බ්‍යඤ්ජනං. මා ආයස්මන්තො අප්පමත්තකෙ විවාදං ආපජ්ජිත්ථා'ති. ඉති සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙතබ්බං දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙතබ්බං. සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙත්වා දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙත්වා යො ධම්මො යො විනයො සො භාසිතබ්බො.

---

1. සියංසු - මජ්ඣං, සිමු.

තවද මහණෙනි, සමග්‍ර ව සතුටු වෙමින් විවාද නො කෙරෙමින් හික්මෙන එ තොප අතුරෙන් භික්ෂූහු දෙදෙනෙක් ඒ (සත්තිස් බොධිපාක්ෂිකධර්ම සඞ්ඛ්‍යාත) අභිධර්මයෙහි නානාවාද ඇත්තාහු වෙති. ඉදින් තොපට එහි ලා ' මේ ආයුෂ්මතුන් ගේ (වාදයෙහි) අර්ථ හෙයින් ද නානාත්වය ඇත. ව්‍යඤ්ජන හෙයින් ද නානාත්වය ඇතැ 'යි මෙබඳු සිතෙක් වී නම්, ඔවුනතුරෙහි යම් මහණෙක්හු ඉතා සුවච යයි හඟනවු ද, (ඔහු කරා) එළැඹ හේ මෙසේ කියයුතු වන්නේ ය : 'ආයුෂ්මතුන් ගේ (වාදය) අර්ථ හෙයින් ද විවිධ යැ, ව්‍යඤ්ජන හෙයින් ද විවිධ යැ, යම් පරිදි අර්ථ හෙයිනුදු නානාත්වය ඇද්ද ව්‍යඤ්ජන හෙයිනුදු නානාත්වය ඇද්ද, මෙ කරුණෙනුදු ආයුෂ්මත්හු තෙල දනගන්නහුය. නහමක් ආයුෂ්මත්හු විවාදයට පැමිණෙව ' යි. යළි සමාන පක්ෂ ඇති අන්‍ය භික්ෂූන් අතුරෙන් යම් මහණකු ' ඉතා සුවච ' යයි හඟනවු ද, (ඔහු වෙත) එළඹ හේ මෙසේ කියයුතු වන්නේ ය : ආයුෂ්මතුන්ගේ වාදය අර් හෙයිනුදු වෙනසි, ව්‍යඤ්ජන හෙයිනුදු වෙනසි, යම් පරිදි අර් හෙයිනුදු නානාත්වය ඇද්ද, ව්‍යඤ්ජන හෙයිනුදු නානාත්වය ඇද්ද, මෙ කරුණෙනුදු ආයුෂ්මත්නි, තෙපි තෙල දනගන්නහු ය. නහමක් ආයුෂ්මත්හු විවාදයට පැමිණෙත්ව ' යි. මෙසේ නපුරු කොට ගන්නා ලද්ද නපුරු කොට ගන්නා ලද හෙයින් ධැරියයුතු ය. මනාකොට ගන්නාලද්ද මනාකොට ගන්නාලද හෙයින් ධැරියයුතු ය. දුග්ගහීතය දුග්ගහීත හෙයින් ධරා සුග්ගහීතය සුග්ගහීත හෙයින් ධරා යම් ධර්මයෙක් යම් විනයෙක් වේ ද, ඒ (ධර්මවිනය) කියයුත්තේ යි.

ඉදින් තොපට එහි ලා මෙබඳු සිතෙක් වේ නම් : මේ ආයුෂ්මතුන් ගේ වැලිත් අර්ථ හෙයින් ම නානාත්වය ඇත, ව්‍යඤ්ජන හෙයින් සම වේ ය ' යි. ඔවුනතුරෙහි යම් මහණක්හු සුවචතර යයි හඟනවු නම්, (ඔහු) කරා එළඹැ ඒ මහණ මෙසේ කියයුතු වන්නේ ය. ආයුෂ්මතුන් ගේ (වාදයෙහි) අර්ථ හෙයින් මැ නානාත්වය ඇත, ව්‍යඤ්ජන හෙයින් සම වෙයි. යම් පරිදි අර්ථ හෙයින් ම නානාත්වය ඇද්ද, ව්‍යඤ්ජන හෙයින් සම වේ ද, එහෙයින් මෙ කරුණෙනුදු ආයුෂ්මත්නි, තෙපි තෙල දනැගන්නහු යැ. නහමක් ආයුෂ්මත්හු විවාදයට පැමිණෙත්ව යි. යලි සමාන පක්ෂ ඇති අන්‍ය භික්ෂූන් අතුරෙන් යම් මහණක්හු සුවචතර යයි හඟනවු ද, (ඔහු කරා) එළැඹ හේ මෙසේ කිය යුතු වන්නේය : ආයුෂ්මතුන් ගේ (වාදය) අර්ථ හෙයින් ම නානාත්වය ඇත, ව්‍යඤ්ජන හෙයින් සම වෙයි. යම් පරිදි අර්ථ හෙයින් ම නානාත්වය ඇද්ද ව්‍යඤ්ජන හෙයින් සම වේ ද, එහෙයින් මෙ කරුණෙනුදු ආයුෂ්මත් වූ තෙපි තෙල දනගන්නහු ය. නහමක් ආයුෂ්මත්හු විවාදයට පැමිණෙත්වයි, මෙසෙයින් දුග්ගහීතය දුග්ගහීත හෙයින් ධැරිය යුතු යැ. සුග්ගහීතය සුග්ගහීත හෙයින් ධැරිය යුතු යැ. දුග්ගහීතය දුග්ගහීත හෙයින් ධරා සුග්ගහීතය සුග්ගහීත හෙයින් ධරා යම් ධර්මයෙක් යම් විනයෙක් වේ ද, ඒ (ධර්මවිනය) කියයුත්තේ යි.

ඉදින් තොපට එහි ලා මෙබඳු සිතෙක් වේ නම් : මේ ආයුෂ්මතුන් ගේ (වාදය) වැලිත් අර්ථ හෙයින් ම සම සම වෙයි. ව්‍යඤ්ජන හෙයින් නානාත්වය ඇතැ ' යි. ඔවුනතුරෙහි යම් මහණකු ඉතා සුවච යයි හඟනවු නම්, (ඔහු කරා) එළැඹ හේ මෙසේ කියයුතු වන්නේ ය : ආයුෂ්මතුන් ගේ (වාදය) වැලිත් අර්ථ හෙයින් මැ සම වෙයි. ව්‍යඤ්ජන හෙයින් නානාත්වය ඇත. යම් පරිදි අර්ථ හෙයින් මැ සම වේ ද, ව්‍යඤ්ජන හෙයින් නානාත්වය ඇද්ද, එහෙයින් මෙ කරුණෙනුදු ආයුෂ්මත්නි, තෙපි දනගන්නහු ය : ' යම් මේ ව්‍යඤ්ජනයෙක් ඇද්ද, තෙල අල්පමාත්‍ර මැ ය. ආයුෂ්මත්හු අල්පමාත්‍ර කරුණෙහි නහමක් විවාදයට පැමිණෙත්ව ' යි. ඉක්බිති සපක්ෂ වූ අන්‍ය භික්ෂූන් අතුරින් යම් මහණකු සුවචතර කොට හඟනවු ද, වෙත එළැඹ හේ මෙසේ කියයුතු වෙයි : ආයුෂ්මතුන් ගේ වාදය වැලිත් අර්ථ හෙයින් සම වෙයි. බ්‍යඤ්ජන හෙයින් භින්න වෙයි. යම් පරිදි අර්ථ හෙයින් සම වේ ද බ්‍යඤ්ජන හෙයින් භින්න වේ ද තෙල බ්‍යඤ්ජනය අල්පමාත්‍ර වෙයි. ආයුෂ්මත් වූ තෙපි අල්පමාත්‍ර බ්‍යඤ්ජනයෙහි විවාදයට නහමක් වදුව යන තෙල කරුණ ආයුෂ්මත් වූ තෙපි මෙයිනුදු දන්නෝ මැනැව. මෙසෙයින් මොනොවට ගත් දය මොනොවට ගත් සෙයින් ධැරිය යුතු ය. වරදවා ගත් දය වරදවා ගත් සෙයින් ධැරිය යුතු ය. මොනොවට ගත් දය මොනොවට ගත් සෙයින් ධරා, වරදවා ගත් දය වරදවා ගත් සෙයින් ධරා, යම් ධර්මයෙක් යම් විනයෙක් ඇද්ද ඒ දෙසිය යුතු ය.

තත්‍ර චෙ තුම්හාකං එවමස්ස: ‘ඉමෙසං ඛො ආයස්මන්තානං අත්ථතො චෙව සමෙති. බ්‍යඤ්ජනතො ච සමෙතී’ති. තත්ථ යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘ආයස්මන්තානං ඛො අත්ථතො චෙව සමෙති. බ්‍යඤ්ජනතො ච සමෙති. තදමිනාපෙතං ආයස්මන්තො ජානාථ ‘යථා අත්ථතො චෙව සමෙති, බ්‍යඤ්ජනතො ච සමෙති. මා ආයස්මන්තො විවාදං ආපජ්ජිත්ථා’ති. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘ආයස්මන්තානං ඛො අත්ථතො චෙව සමෙති, බ්‍යඤ්ජනතො ච සමෙති. තදමිනාපෙතං ආයස්මන්තො ජානාථ ‘යථා අත්ථතො චෙව සමෙති, බ්‍යඤ්ජනතො ච සමෙති. මා ආයස්මන්තො විවාදං ආපජ්ජිත්ථා’ති. ඉති සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙතබ්බං සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙත්වා යො ධම්මො යො විනයො සො භාසිතබ්බො.

තෙසඤ්ච වො භික්ඛවෙ, සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛතං, සියා අඤ්ඤතරස්ස භික්ඛුනො ආපත්ති සියා වීතික්කමො තත්‍ර භික්ඛවෙ, න චොදනාය තරිතබ්බං, පුග්ගලො උපපරික්ඛිතබ්බො, ඉති මය්හඤ්ච අවිහෙසා භවිස්සති. පරස්ස ච පුග්ගලස්ස අනුපඝාතො, පරො හි පුග්ගලො අක්කොධනො අනුපනාහී අදළ්හදිට්ඨී සුප්පටිනිස්සග්ගී, සක්කොමි චා’හං එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතු’න්ති. සචෙ භික්ඛවෙ, එවමස්ස කල්ලං වචනාය.

සචෙ පන භික්ඛවෙ, එවමස්ස: ‘මය්හං ඛො අවිහෙසා භවිස්සති. පරස්ස ච පුග්ගලස්ස උපඝාතො, පරො හි පුග්ගලො කොධනො උපනාහී අදළ්හදිට්ඨී සුප්පටිනිස්සග්ගී, සක්කොමි චාහං එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතුං. අප්පමත්තකං ඛො පනෙතං යදිදං පරස්ස පුග්ගලස්ස උපඝාතො. අථ ඛො එතදෙව බහුතරං, ‘සොහං[1] සක්කොමි එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතු’න්ති. සචෙ භික්ඛවෙ, එවමස්ස කල්ලං වචනාය.

සචෙ පන භික්ඛවෙ, එවමස්ස: ‘මය්හං ඛො විහෙසා භවිස්සති, පරස්ස ච පුග්ගලස්ස අනුපඝාතො, පරො හි පුග්ගලො අක්කොධනො අනුපනාහී අදළ්හදිට්ඨී දුප්පටිනිස්සග්ගී. සක්කොමි චාහං එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතුං. අප්පමත්තකං ඛො පනෙතං ‘යදිදං මය්හං විහෙසා. අථ ඛො එතදෙව බහුතරං, සොහං සක්කොමි එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතු’න්ති. සචෙ භික්ඛවෙ, එවමස්ස කල්ලං වචනාය.

සචෙ පන භික්ඛවෙ, එවමස්ස: මය්හඤ්ච ඛො විහෙසා භවිස්සති. පරස්ස ච පුග්ගලස්ස උපඝාතො. පරො හි පුග්ගලො කොධනො උපනාහී අදළ්හදිට්ඨී දුප්පටිනිස්සග්ගී. සක්කොමි චාහං එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතුං. අප්පමත්තකං ඛො පනෙතං ‘යදිදං මය්හඤ්ච විහෙසා පරස්ස ච පුග්ගලස්ස උපඝාතො, අථ ඛො එතදෙව බහුතරං ‘සොහං සක්කොමි එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතු’න්ති. සචෙ භික්ඛවෙ, එවමස්ස කල්ලං වචනාය.

---

1. සචාහං - මජසං.

ඉදින් එහි ලා තොපට මෙබඳු සිතෙක් වේ නම් : ' මේ ආයුෂ්මතුන් ගේ වාදය අර්ථ විසිනුදු සම වෙයි, ව්‍යඤ්ජන විසිනුදු සම වෙති ' යි කියායි. එහි ලා යම් මහණකු සුවචතර කොට හඟනවු ද, වෙත පැමිණ ඒ මහණ මෙසේ කියයුතු වෙයි : ආයුෂ්මතුන් ගේ (වාදය) අර්ථ විසිනුදු සම වෙයි, ව්‍යඤ්ජන විසිනුදු සම වෙයි, ' යම් පරිදි අර්ථ විසිනුදු සම වේ ද, ව්‍යඤ්ජන විසිනුදු සම වේ ද තෙල කරුණ මෙසෙයිනුදු ආයුෂ්මතුන් දන්නේ මැනැව, එහෙයින් ආයුෂ්මත්හු විවාදයට නහමක් වදුව ' යි. යළි සපක්ෂ වූ අන්‍ය භික්ෂූන් අතුරෙන් යම් මහණකු සුවචතර කොට හඟනවු ද, වෙත එළැඹ ඒ මහණ මෙසේ කියයුතු වෙයි : ' ආයුෂ්මතුන් ගේ වාදය අර්ථ විසිනුදු සම වෙයි. ව්‍යඤ්ජන විසිනුදු සම වෙයි. යම් පරිදි අර්ථ විසිනුදු සම වේ ද, ව්‍යඤ්ජන විසිනුදු සම වේ ද, තෙල කරුණ ආයුෂ්මත්නි, තෙපි මෙයිනුදු දනුව, ආයුෂ්මත්නි, විවාදයට නහමක් වදුව ' යි. මෙසේ මොනොවට ගත් දය මොනොවට ගත් සෙයින් ධැරිය යුතු, මොනොවට ගත් දය මොනොවට ධරා ගෙන යම් ධර්මයෙක් යම් විනයයෙක් ඇද්ද එය දෙසිය යුතු.

මහණෙනි, සමඟ වූ සමඟ සතුටුවන විවාද නො කරන (ශික්ෂාශාසනයෙහි) හික්මෙන තොප අතුරෙන් අන්‍යතර මහණක් හට ඇවතෙක් වෙයි. අධ්‍යාචාරයෙක් වෙයි, චොදනා පිණිස නො යා යුතු ය. සාපත්තික පුද්ගලයා පරීක්ෂා කළ යුතු ය. (කිසේ යැ යත් :) මෙසේ පරීක්ෂා කරත් ම මට ද වෙහෙස නො වෙයි, මෙරමා හට ද උපඝාත නො වෙයි, යම් හෙයෙකින් අනෙක් පුඟුලා නො කිපෙනසුලු බද්ධවෛර නැති තර කොට ගත් දෘෂ්ටි නැති සුවසේ ඇවතින් මුදලියහෙනසුලුයෙක් වේ ද, මම වැලිත් තෙල පුඟුලා අකුසලින් නංවා කුසල්හි පිහිටුවාලන්නට හැකියෙම් ද ' යි කියායි. ඉදින් මහණෙනි, මෙසේ වේ නම්, (චොදනා නඟා) කියන්නට නිසි වෙයි.

ඉදින් මහණෙනි, මෙබඳු සිත් වේ නම් : ' මට වැලිත් වෙහෙසෙක් නො වෙයි, පරපුඟුල්හට දුක් උපදනේ වෙයි, අනෙක් පුඟුලා කිපෙනසුලු බද්ධවෛර ඇති තර කොට නො ගත් දෘෂ්ටි ඇති වහා ඇවතින් නඟාලියැහෙන්නෙක් වේ ද, තවද මම තෙල පුඟුලා ඇවතින් නඟා නිරාපත්තියෙහි පිහිටුවාලන්නට හැකියෙමි. පරපුඟුලාහට දුකෙක් වේ ය යන තෙල කරුණ අල්පමාත්‍ර වෙයි. වැලිත් (මම තෙල පුඟුලා ඇවතින් නඟා නිරාපත්තියෙහි පිහිටුවාලන්නට හැක්කෙමි ' යන) තෙල කරුණ ම බහුතර වෙයි කියා යි. ඉදින් මහණෙනි, මෙසේ වේ නම් චොදනා නඟා බණන්නට නිසි වෙයි.

ඉදින් මහණෙනි, මෙබඳු සිත් වේ නම් : ' මට වැලිත් වෙහෙස වෙයි, පරපුඟුල්හට දුක් නො වෙයි, පරපුඟුල් නො කිපෙනසුලු උපනාහ නැති තර කොට ගත් දෘෂ්ටි නැති දුක සේ ඇවැතින් මුදලියහෙනුයෙක් වෙයි. මම තෙල පුඟුල් ඇවතින් නඟා නිරාපත්තික භාවයෙහි පිහිටුවාලන්නට හැකියෙමි, මට වෙහෙසක් වෙයි යන තෙල කරුණ අල්පමාත්‍ර ය, මම තෙල පුඟුල් ඇවතින් මුදා නිරාපත්තික භාවයෙහි පිහිටුවාලන්නට හැකියෙමි යන තෙල කරුණ ම වැඩිතරම් වෙයි කියා යි. මහණෙනි, ඉදින් මෙසේ සිත් වේ නම්, චොදනා නඟා බණන්නට නිසි වෙයි.

ඉදින් මහණෙනි, මෙබඳු සිතෙක් වේ නම් : ' මට ද වෙහෙසෙක් වෙයි, පරපුඟුල්හට ද දුකෙක් වෙයි, පරපුඟුල් කිපෙනසුලු උපනාහ ඇති තර කොට ගත් දිට්ඨි නැති ඇවතින් දුකසේ නඟාලියැ හෙනුයෙක් වෙයි. මම් වැලිත් තෙල පුඟුල් ඇවතින් මුදා නිරාපත්තික භාවයෙහි පිහිටුවාලන්නට හැකියෙමි, ' මට වෙහෙසෙක් වෙයි, පරපුඟුල්හට දුකෙක් වෙයි යන තෙල අල්පමාත්‍ර කාරණයෙකි, වැලිත් ' මම තෙල පුඟුල් ඇවතින් මුදා නිරා පත්තිකභාවයෙහි පිහිටුවාලන්නට හැකියෙමි යන තෙල ම බහුතර කාරණ වෙයි ' කියා යි. මහණෙනි, ඉදින් මෙබඳු සිත් වේ නම්, චොදනා නඟා බණන්නට නිසි වෙයි.

සචෙ පන භික්ඛවෙ, එවමස්ස: 'මය්හඤ්ච බො විහෙසා භවිස්සති. පරස්ස ච පුග්ගලස්ස උපඝාතො, පරෙ හි පුග්ගලො කොධනො උපනාහී දළ්හදිට්ඨී දුප්පටිනිස්සග්ගී. න චාහං සක්කොමි එතං පුග්ගලං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතු'න්ති. එවරූපෙ භික්ඛවෙ, පුග්ගලෙ උපෙක්ඛා නාතිමඤ්ඤිතබ්බා

තෙසඤ්ච වො භික්ඛවෙ, සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛතං අඤ්ඤමඤ්ඤස්ස වචීසංසාරෙ[1] උප්පජ්ජෙය්‍ය දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි. තත්ථ එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරං මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං නො ආවුසො, අම්හාකං සමග්ගානං සම්මොද-මානානං අවිවදමානානං සික්ඛතං අඤ්ඤමඤ්ඤස්ස වචීසංසාරෙ උප්පන්නො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි. තං ජානමානො සමානො[2] ගරහෙය්‍යාති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ, භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය: 'යං නො ආවුසො අම්හාකං සමග්ගානං සම්මොදමානානං අවිවාදමානානං සික්ඛතං අඤ්ඤමඤ්ඤස්ස වචීසංසාරෙ[1] උප්පන්නො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි. තං ජානමානො සමානො[2] ගරහෙය්‍යාති. එතං පනාවුසො ධම්මං අප්පහාය නිබ්බානං සච්ඡිකරෙය්‍යාති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ, එවං බ්‍යාකරෙය්‍ය: එතං බො ආවුසො, ධම්මං අප්පහාය න නිබ්බානං සච්ඡිකරෙය්‍යාති.

අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං යං භික්ඛුං සුවචතරා මඤ්ඤෙය්‍යාථ, සො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: යං නො අවුසො අම්හාකං සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛතං අඤ්ඤ-මඤ්ඤස්ස වචීසංසාරෙ[1] උප්පන්නො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි. තං ජානමානො සමානො[2] ගරහෙය්‍යාති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ, භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය: යං නො ආවුසො අම්හාකං සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛතං අඤ්ඤ-මඤ්ඤස්ස වචීසංසාරෙ උප්පන්නො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි. තං ජානමානො සමානො ගරහෙය්‍යාති. එතං පනාවුසො ධම්මං අප්පහාය න නිබ්බානං සච්ඡිකරෙය්‍යාති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය: එතං බො ආවුසො, ධම්මං අප්පහාය න නිබ්බානං සච්ඡිකරෙය්‍යා'ති.

තඤ්චෙ භික්ඛවෙ, භික්ඛුං පරෙ එවං පුච්ඡෙය්‍යුං: ආයස්මතා නො එතෙ භික්ඛූ අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපිතාති. සම්මා බ්‍යාකරමානො භික්ඛවෙ, භික්ඛු එවං බ්‍යාකරෙය්‍ය: ඉධාහං ආවුසො, යෙන භගවා තෙනුපසඞ්කමිං, තස්ස මෙ භගවා ධම්මං දෙසෙසි, තාහං ධම්මං සුත්වා තෙසං භික්ඛූනං අභාසිං: තං තෙ භික්ඛූ ධම්මං සුත්වා අකුසලා වුට්ඨහිංසු. කුසලෙ පතිට්ඨහිංසු'ති. එවං බ්‍යාකරමානො බො භික්ඛවෙ, භික්ඛු න චෙව අත්තානං උක්කංසෙති, න පරං වම්භෙති, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොති, න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතී'ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

කින්ති සුත්තං තතියං

---

1. {වචීසංහාරෙ - මජසං.
   {සංඛාරෙ - සීමු.

2. සමණො - මජසං, PTS.

ඉදින් මහණෙනි, මෙසේ සිත් වේ නම්, ' මට ද වෙහෙසෙක් වෙයි, අනෙකාහට ද දුකෙක් වෙයි, අනෙක් පුඟුල් කොපනසීලී වූ උපනාහී වූ තර කොටගත් දෘෂ්ටිගති ඇති ඇවතින් දුකසේ මුදලියැ හෙනුයෙක් වෙයි, මම වැලිත් තුලුන් ඇවතින් මුද නිරාපත්තික භාවයෙහි පිහිටුවාලන්නට නො හැකියෙමි ' කියා යි. මහණෙනි, මෙබඳු පුඟුල් කෙරෙහි මධ්‍යස්ථතා කළ යුතු.

මහණෙනි, සමඟ වූ සමඟ සතුටු වන උනුන් විවාද නො කරන ශික්ෂාශාසනයෙහි හික්මෙන තොප පිළිබඳ උනුනට දෘෂ්ටිවිපර්‍යාස වූ චිත්තාඝාත වූ සිතට නො සතුටු වූ සිත් නො අලවන වචනයෙක් උපදනේ ද, එහි දී සපක්ෂ භික්ෂූන් අතුරින් යම් මහණකු සුවචතර කොට හඟනාහු ද, වෙත පැමිණ හේ මෙසේ කියැයුතු වෙයි : ' ඇවත, සමඟ වූ සමඟ සතුටු වන උනුන් විවාද නො කරන අප පිළිබඳ උනුනට දෘෂ්ටිවිපර්‍යාස වූ චිත්තාඝාත වූ නො සතුටට කරුණු වූ සිත් නො අලවන බසෙක් උපන. එය දනිමින් ගර්හා කරන්නේ යයි ' කියා යි. මහණෙනි, මොනොවට පවසන මහණ මෙසේ පවසන්නේ ය : (කෙසේ යැ :) ' ඇවත, සමගි වූ සමඟ සතුටු වන උනුන් විවාද නො කරන ශික්ෂාශාසනයෙහි හික්මෙන අප පිළිබඳ උනුනට දෘෂ්ටිවිපර්‍යාස වූ චිත්තාඝාත වූ නො සතුටට කරුණු වූ ව්‍යාපාද ජනක වූ යම් බසෙක් උපන් ද, එබස දන්මින් බුදුහු ගරහති, ඇවත, තෙල කලහ භණ්ඩනධර්මය නො පියා නිවන් පසක් නො කරන්නේ ය ' කියා යි. මහණෙනි, මොනොවට බණන මහණ මෙසේ බණන්නේ ය : (කෙසේ යැ:) ' ඇවත, තෙල කලහ භණ්ඩනධර්මය නො පියා නිර්වාණධර්මය ප්‍රත්‍යක්ෂ නො කරන්නේ ය ' යි.

ඉක්බිති සපක්ෂ වූ අන්‍ය භික්ෂූන් අතුරින් යම් මහණකු සුවචතර කොට හඟනාවු ද, වෙත එළැඹ ඒ මහණ මෙසේ කියැයුතු වෙයි : ' ඇවත, සමගි වූ සමඟ සතුටු වූ උනුන් විවාද නො කරන ශික්ෂාශාසනයෙහි හික්මෙන අප පිළිබඳ උනුනට යම් හෙයෙකින් දෘෂ්ටි ප්‍රදස වූ චෙතාඝාත වූ අප්‍රත්‍යය වූ ව්‍යාපාදජනක වචනයෙක් උපන් ද, එය දන්මින් ගරහති ' යි. මහණෙනි, මොනොවට පවසන මහණ මෙසේ පවසන්නේ ය : (කිසේ යැ:) ' ඇවත, සමඟ වූ සමඟ සතුටු වන උනුන් විවාද නො කරන ශික්ෂාශාසනයෙහි හික්මෙන අප පිළිබඳ අන්‍යොන්‍යයනට දෘෂ්ටිප්‍රදස වූ චෙතාඝාත වූ අප්‍රත්‍යය වූ ව්‍යාපාදකර වූ වාක්සංස්කාර යෙක් යම් හෙයකින් උපන් ද, එය දන්මින් ශාස්තෲන් වහන්සේ ගර්හා කරති. ' ඇවත, තෙල කලහ භණ්ඩනධර්මය හැරපියා මුත් නිවන් පසක් නො කළහෙන්නේ ය 'යි කියා යි. මහණෙනි, මොනොවට බණන මහණ මෙසේ බණන්නේ ය : (කිසේ ය යත්) ' ඇවත, තෙල දහම නො පියා නිවන පසක් නො කළහෙන්නේ ය ' යි.

මහණෙනි, ඉදින් අන්‍යයෝ ඒ මහණ මෙසේ පුළුවුස්නාහු නම් : ආයුෂ්මතුන් විසින් තෙල භික්ෂූහු ඇවතින් මුද කුසල්හි පිහිටුවන ලද්දහු නො වේ ද ' යි. මහණෙනි, මොනොවට බණන මහණ මෙසේ බණන්නේ ය : ' ඇවත, මම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියෙමි, භාග්‍යවතුන් වහන්සේ මට දහම් දෙසූසේක. මම ඒ දහම අසා එ මහණුනට කීමි, ඒ මහණහු එ දහම අසා අකුසලින් නැඟීසිටියහ, මහණෙනි, මෙසේ බණන ඒ මහණ ආත්මොත්කර්‍ෂ නො ද කරන්නේ ය, පරපරිභවත් නො කරන්නේ ය, ධර්මානුධර්මත් පවසන්නේ ය, සහෙතුක වූ කිසිත් වාදනුවාදයෙක් ගර්හනීය තැනට නො ද එන්නේ ය ' යි.

භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ ඒ භාෂිතය අභිමුඛ ව ගෙන සතුටුවූහු.

තුන්වැනි කින්ති සූත්‍ර යි.

# 3. 1. 4

## සාමගාම සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති සාමගාමෙ. තෙන ඛො පන සමයෙන නිගණ්ඨො නාතපුත්තො[1] පාවායං අධුනා කාලකතො[2] හොති. තස්ස කාලකිරියාය[3] භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි, කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡා පටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ, අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණං[4] තෙ විපරාවත්තං, ආරොපිතො තෙ වාදො, නිග්ගහිතොසි, චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි වා සචෙ පහොසී’ති. වධො යෙව ඛො[5] මඤ්ඤෙ නිගණ්ඨෙසු නාතපුත්තියෙසු වත්තති.

යෙපි නිගණ්ඨස්ස නාතපුත්තස්ස සාවකා ගිහී ඔදාතවසනා, තෙපි නිගණ්ඨෙසු නාතපුත්තියෙසු නිබ්බින්නරූපා විරත්තරූපා පටිවානරූපා, යථා තං දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනිය්‍යානිකෙ අනුපසම-සංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ භින්නථූපෙ අප්පටිසරණෙ’ති.

අථ ඛො චුන්දො සමණුද්දෙසො පාවායං වස්සං වුත්ථො[6] යෙන සාමගාමො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මන්තං ආනන්දං එතදවොච: නිගණ්ඨො භන්තෙ, නාතපුත්තො පාවායං අධුනා කාලකතො. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති -පෙ- භින්නථූපෙ අප්පටිසරණෙ’ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො චුන්දං සමණුද්දෙසං එතදවොච: අත්ථි ඛො ඉදං ආවුසො චුන්ද, කථාපාභතං භගවන්තං දස්සනාය. ආයාමාවුසො චුන්ද, යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම, උපසඞ්කමිත්වා එතමත්ථං භගවතො ආරොචෙස්සාමා’ති. එවං භන්තෙති ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි.

---

1. නාථපුත්තො – මජසං, සයා.
2. කාලඞ්කතො – මජසං, සීමු.
3. කාලඞ්කිරියාය – මජසං,
4. අධිචිණ්ණං – මජසං. අවිචිණ්ණං – සීමු.
5. වධොයෙවෙකො – සීමු, PTS.
6. { වස්සං වුට්ඨො – මජසං.
   { වස්සාවුත්ථො – PTS.

# 3. 1. 4

# සාමගාම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපද යෙහි වූ සාමග්‍රාමයෙහි වැඩවාස කරන සේක. එකල්හි නිගණ්ඨනාතපුත්‍ර පාවානුවර කලුරිය කළ නො බෝකල් ඇති වෙයි. ඔහු ගේ කාලක්‍රියායෙන් බුන් නුවටහු ද්විභාග වූවාහු හටගත් භණ්ඩන ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදපන්න වූවාහු උනුන් මුවසැතින් පෙළන්නාහු වෙසෙති. කෙසේ යැ : ' තෝ මේ ධර්මවිනය නො දන්හි, මම මේ දහම්විනය පිළිපැද දන්මි, කිම තෝ මේ දහම්විනය දන්හි ද, තෝ වරදවා පිළිපන්හි, මම මොනොවට පිළිපන්මි, ම බස අර්ථ සංහිත ය, තා බස අර්ථසංහිත නො වෙයි. කැලම කියැයුත්ත පසුවලා කීයෙහි, පසුවලා කියැයුත්ත කැලම කීයෙහි, (චිරකාලාසෙවන වශයෙන්) ආචීර්ණ වූ තාගේ වාදය පෙරළිණ, තට වාදරොපණ කරන ලද, නිගන්නා ලද්දෙහි, වාදප්‍රමොක්ෂයට (උත්තර සපයමින්) ඇවිදුව, ඉදින් හැක්කෙහි නම්, නිරවුල් හෝ කරවයි ' කියා යි. නාතපුත්‍රයා සිසු නුවටුන් කෙරෙහි වධයක් සෙයින් වැටෙයි.

නිගණ්ඨනාතපුත්‍රයා ගේ සුදු පිළිහඳනා යම් ගිහිසව් කෙනෙක් ඇද්ද ඔහුත් වරදවා කී වරදවා දන්වාලු අනෛර්‍යාණික වූ ක්ලෙශව්‍යුපශම පිණිස නො වැටෙන සම්‍යක් සම්බුද්ධ නො වන්නකු විසින් කියන ලද බුන් පිහිට ඇති පිළිසරණ රහිත ධර්මවිනයෙක යම්සේ කලකිරෙත් ද, එසේ නාතපුත්‍ර අතැවැසි වූ නුවටුන් කෙරෙහි උකැටිසැහැවි ඇත්තාහු නො ඇලුණාහු සත්කෘත්‍යක්‍රියායෙන් වැළැකුණාහු වෙති.

එසඳ චූන්‍දසමණුද්දේස තෙරණුවෝ පාවානුවර වස්විසුවාහු සාමග්‍රාමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් කරා එළැඹියහ. එළැඹ ආයුෂ්මත් ආනන්‍ද තෙරුණුවන් සකසාවැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් චූන්‍දසමණුද්දෙස තෙරණුවෝ ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවනට මෙල කීහු : ' වහන්ස, නිගණ්ඨනාතපුත්‍ර පාවානුවර දී කලුරියකළ නො බෝකල් ඇත්තේ ය, ඔහුගේ කාලක්‍රියායෙන් බුන් නුවටහු දෙබෙ වූවාහු හටගත් භණ්ඩන ඇතියාහු හටගත් කලහ ඇතියාහු විවාදපන්න වූවාහු උනුන් මුවසැතින් විදුනාහු වාස කෙරෙති ' . . . බුන් පිහිට ඇති පිළිසරණ නැති (වරදවා කී ධර්මවිනයෙක යම්සේ කල කිරෙත් ද එසෙයින් . . . කලකිරෙති.)

මෙසේ කී කල ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ චූන්‍දසමණුද්දෙස තෙරණුවනට තෙල කීහු : ' ඇවැත් චූන්‍දයෙනි, භාග්‍යවතුන් වහන්සේ දක්නා සඳහා මේ කථාවස්තු පඩුරෙක් ඇත, යම්හ, ඇවත චූන්‍දයෙනි, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙම්හ, එළැඹ භාග්‍යවතුන් වහන්සේට තෙල කථාර්ථය සැලකරම්හ ' යි. ' වහන්ස, එසේ යැ ' යි චූන්‍දසමණුද්දෙස තෙරණුවෝ ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවනට පිළිවදන් දුන්හු.

අථ ඛො ආයස්මා ච ආනන්දො චුන්දො ච සමණුද්දෙසො යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අයං භන්තෙ, චුන්දො සමණුද්දෙසො එවමාහ: නිගණ්ඨො භන්තෙ, නාතපුත්තො පාවායං අධුනා කාලකතො. තස්ස කාලකිරියාය භින්නා නිගණ්ඨා ද්වෙධිකජාතා භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති-පෙ-භින්නථූපෙ අප්පටිසරණෙ'ති. තස්ස මය්හං භන්තෙ, එවං හොති: මාහෙව භගවතො අච්චයෙන සඞ්ඝෙ විවාදො උප්පජ්ජි. සොස්ස[1] විවාදො බහු ජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සාන'න්ති.

තං කිං මඤ්ඤසි ආනන්ද, යෙ වො මයා ධම්මා අභිඤ්ඤා දෙසිතා සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. පස්සසි නො ත්වං ආනන්ද, ඉමෙසු ධම්මෙසු ද්වෙපි භික්ඛූ නානාවාදෙ'ති. යෙමෙ භන්තෙ, ධම්මා භගවතා අභිඤ්ඤා දෙසිතා, සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. නාහං පස්සාමි ඉමෙසු ධම්මෙසු ද්වෙපි භික්ඛූ නානාවාදෙ. යෙ ච ඛො[2] භන්තෙ, පුග්ගලා භගවන්තං පතිස්සයමානරූපා විහරන්ති. තෙපි භගවතො අච්චයෙන සඞ්ඝෙ විවාදං ජනෙය්‍යුං අජ්ඣාජීවෙ වා අධිපාතිමොක්ඛෙ වා. සොස්ස[1] විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානන්ති.

අප්පමත්තකො සො ආනන්ද, විවාදො යදිදං අජ්ඣාජීවෙ වා අධිපාතිමොක්ඛෙ වා. මග්ගෙ වාපි ආනන්ද, පටිපදාය වා සඞ්ඝෙ විවාදො උප්පජ්ජමානො උප්පජ්ජෙය්‍ය. සොස්ස[1] විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානන්ති.

ඡයිමානි ආනන්ද, විවාදමූලානි. කතමානි ඡ: ඉධානන්ද, භික්ඛු කොධනො හොති උපනාහී, යො සො ආනන්ද භික්ඛු කොධනො හොති උපනාහී, සො සත්ථරිපි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො. සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො. සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො ආනන්ද, භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ -පෙ- සඞ්ඝෙ අගාරවො විහරති අප්පතිස්සො. සික්ඛාය න පරිපූරකාරී හොති. සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ ආනන්ද, විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ. තත්‍ර තුම්හෙ ආනන්ද, තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ ආනන්ද, විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ. තත්‍ර තුම්හෙ ආනන්ද, තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

---

1. සවාස්ස - මජසං, ස්‍යා.
2. සන්ති ච ඛො - ස්‍යා.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් හා චුන්දසමණුද්දෙස තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්වැ හුන්හු. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැලකළෝ : ' වහන්ස, මේ චුන්දසමණුද්දෙස තෙරණුවෝ මෙසේ කියති : (කිසේ යැ :) ' වහන්ස, නිගණ්ඨනාතපුත්‍ර පාවාහුවර මෙසඳ කලුරිය කළේ යැ, ඔහුගේ කාලක්‍රියායෙන් බිුන් හුවටහු දෙබෙ වැ භණ්ඩනජාත වැ කලහජාත වැ විවාදපන්න වැ උනුන් මුවසැතින් විදුමින් වාස කෙරෙති, . . . බිුන් පිහිට ඇති පිළිසරණ නැති (වරදවා කී ධර්මවිනයෙක කලකිරෙනුවන් සෙයින් උන්ගේ ගිහිසවුවෝ ද උන් කෙරෙහි කල කිරුණහ.) වහන්ස, මට මෙවන් සිතෙක් පහළ වෙයි : භාග්‍යවතුන් වහන්සේ ගේ ඇවෑමෙන් සඟුන් කෙරෙහි නහමක් විවාද උපදීවා, (කවර හෙයින ?) ඒ විවාද බොහෝ දෙනාට අහිත පිණිස බොහෝදෙනාට නොසුව පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස වේ ද එහෙයිනි.

ආනන්දය, ඒ කෙසේ හඟිහි, මා විසින් තොපට යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කොට දෙසන ලදහු ද, ඔහු කවරහ යත් : සතර සිවටන්හු යැ, සතර සම්‍යක් ප්‍රධානයෝ යැ, සතර ඍද්ධිපාදයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්ච බලයෝ යැ, සප්ත බොධ්‍යඞ්ගයෝ යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මොහු යි. ආනන්දය, තෙපි මේ ධර්මයන් කෙරෙහි භින්නවාද වූ දෙ මහණ කෙනකුදු දක්නාව ? වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කොට දෙසන ලදහු ද, ඔහු කවරහ යත් : සතර සිවටන් හු යැ, සතර සම්‍යක්ප්‍රධානයෝ යැ, සතර ඍද්ධිපාදයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්ච බලයෝ යැ, සප්ත බොධ්‍යඞ්ගයෝ යැ ; ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මොහු යි. මම මේ ධර්මයන් කෙරෙහි භින්නවාද වූ දෙ මහණ කෙනකුදු නො දක්මි. වහන්ස, යම් මැ පුද්ගල කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්නාහු වාස කෙරෙත් ද, ඔහුද භාග්‍ය වතුන් වහන්සේ ගේ ඇවෑමෙන් ආජීවනිමිත්තෙහි හෝ (තදන්‍ය) ප්‍රාතිමොක්ෂ නිමිත්තෙහි හෝ සඞ්ඝයා කෙරෙහි විවාද දනවන්නාහු නම් ඒ විවාද බොහෝදෙනාට අහිත පිණිස බොහෝදෙනාට දුක් පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස වැටෙති ' සැලකළෝ.

ආනන්දය, ආජීවනිමිත්තෙහි වේවයි, අධිප්‍රාතිමොක්ෂනිමිත්තෙහි වේවයි යම් මැ විවාදයෙක් ඇත්නම් ඒ විවාද අල්පමාත්‍ර විවාදයෙකි, ආනන්දය, මාර්ගය නිමිති කොට හෝ ප්‍රතිපත් නිමිති කොට හෝ උපදනාවිවාදයෙක් වේ නම් ඒ විවාදය බොහෝදෙනාට අහිත පිණිස බොහෝදෙනාට දුක් පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස වැටෙයි.

ආනන්දය, මේ විවාදමූලයෝ සදෙනෙකි, කවර සදෙනෙක යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණෙක් කිපෙනසුලු වූයේ බද්ධවෛර ඇතියේ වේ ද, ආනන්දය, යම් ඒ මහණෙක් කිපෙනසුලු වූයේ බද්ධවෛර ඇතියේ වේ නම්, ඒ මහණ ශාස්තෘන් වහන්සේ කෙරෙහිදු අගෞරව ව යටත් පැවැතුම් නැති ව වාස කෙරෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැති ව ප්‍රතිශ්‍රය නැති ව වාස කෙරෙයි, සඞ්ඝයා කෙරෙහි දු ගෞරව නැති ව අප්‍රතිශ්‍රය ව වාස කෙරෙයි, ශික්ෂායෙහි දු පරිපූරකාරි නො වෙයි. ආනන්දය, යම් මහණෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත ව ප්‍රතිශ්‍රය රහිත ව වාස කෙරේ ද, ධර්මය කෙරෙහි . . . ගෞරව රහිත ව ප්‍රතිශ්‍රය රහිත ව වාස කෙරේ ද, ශික්ෂායෙහි පරිපූරකාරි නො වේ ද, හේ සඞ්ඝයා කෙරෙහි විවාද දනවා ද, ඒ විවාද බොහෝදෙනාට අහිත පිණිස බොහෝදෙනාට දුක් පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස වැටේ. ඉදින් ආනන්දය, තෙපි මෙවන් විවාදමූලයක් තමා තුළ හෝ බැහැර හෝ දක්නහු නම්, ආනන්දය, එහි ලා තෙපි ඒ පාපක වූ විවාදමූලයා ගේ මැ ප්‍රහාණය පිණිස ව්‍යායාම කරව, ඉදින් ආනන්දය, තෙපි මෙබඳු විවාදමූලයක් තමා කෙරෙහි හෝ මෙරමා කෙරෙහි හෝ නො දක්නහු නම්, ආනන්දය, එහි ලා තෙපි පාපක වූ ඒ විවාදමූලයා ගේ මැ මතු නූපදනා පිණිස පිළිපදුව. මෙසේ තෙල පාපක විවාදමූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසේ තෙල විවාදමූලයා ගේ මතු නො ඉපැද්ම වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- ඉස්සුකී හොති මච්ඡරී -පෙ- සඨෝ හොති මායාවී -පෙ- පාපිච්ඡෝ හොති මිච්ඡාදිට්ඨී -පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී[1] දුප්පටිනිස්සග්ගී. යො සො ආනන්ද, භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. සො සත්ථරිපි අගාරවො විහරති අප්පතිස්සො., ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො ආනන්ද, භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො., ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය න පරිපූරකාරී හොති. සො සඞ්ඝෙ විවාදං ජනෙති. යො හොති විවාදො බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ ආනන්ද, විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ. තත්‍ර තුම්හෙ ආනන්ද, තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ ආනන්ද, විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ. තත්‍ර තුම්හෙ ආනන්ද, තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ එවමෙතස්ස පාපකස්ස විවාද-මූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති. ඉමානි ඛො ආනන්ද, ඡ විවාදමූලානි.

චත්තාරිමානි ආනන්ද, අධිකරණානි. කතමානි චත්තාරි: විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං, ඉමානි ඛො ආනන්ද චත්තාරි අධිකරණානි.

සත්ත ඛො පනිමෙ ආනන්ද, අධිකරණසමථා උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය, සම්මුඛාවිනයො දාතබ්බො සතිවිනයො දාතබ්බො අමූළ්හවිනයො දාතබ්බො පටිඤ්ඤාය කාරෙතබ්බං යෙභුය්‍යසිකා තස්සපාපිය්‍යසිකා තිණවත්ථාරකො'ති.

කථඤ්ච ආනන්ද, සම්මුඛාවිනයො හොති: ඉධානන්ද භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා විනයොති වා අවිනයොති වා. තෙහානන්ද[2] භික්ඛූහි සබ්බෙහෙව සමග්ගෙහි සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ධම්මනෙත්ති සමනුමජ්ජිතබ්බා. ධම්මනෙත්තිං සමනුමජ්ජිත්වා යථා තත්ථ සමෙති. තථා තං අධිකරණං වූපසමෙතබ්බං. එවං ඛො ආනන්ද, සම්මුඛාවිනයො හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං සම්මුඛාවිනයෙන.

කථඤ්ච ආනන්ද, යෙභුය්‍යසිකා හොති: තෙ චෙ ආනන්ද, භික්ඛූ න සක්කොන්ති තං අධිකරණං තස්මිං ආවාසෙ වූපසමෙතුං. තෙහානන්ද, භික්ඛූහි යස්මිං ආවාසෙ බහුතරා භික්ඛූ, සො ආවාසො ගන්තබ්බො. තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ධම්මනෙත්ති සමනුමජ්ජිතබ්බා. ධම්මනෙත්තිං සමනුමජ්ජිත්වා යථා තත්ථ සමෙති, තථා තං අධිකරණං වූපසමෙතබ්බං. එවං ඛො ආනන්ද, යෙභුය්‍යසිකා හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං යෙභුය්‍යසිකාය.

1. ආධානග්ගාහී - මජ්ඣං.
2. තෙනෙව ආනන්ද - සීමු, ස්‍යා.

තවද ආනන්දය, මහණ ගුණමකු වෙයි, යුගග්‍රාහලක්ෂණ ප්‍රදස ඇති වෙයි, . . . ඊෂ්‍යා ඇති වෙයි, මසුරු ඇති වෙයි, . . . ශඨ වෙයි, මායාවී වෙයි, . . . පාපෙච්ඡ වෙයි, මිථ්‍යා දෘෂ්ටික වෙයි . . . යුගග්‍රාහ ඇතියේ මුදවාලියැ නො හෙනුයේ සිය දිටු පරාමර්ශ කරනසුලු වෙයි, ආනන්දය, යම් ඒ මහණෙක් ආධානගාහී වැ දුප්පටිනිස්සග්ගී වැ සිය දෘෂ්ටිය ම පරාමර්ශ කරනසුලු වේ නම් හේ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ද ගෞරව රහිත වැ ප්‍රතිශ්‍රය රහිත වැ වාස කෙරෙයි, ධර්මය කෙරෙහිදු අගෞරව වැ ප්‍රතිශ්‍රය රහිත වැ වාස කෙරෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව රහිත වැ ප්‍රතිශ්‍රය රහිත වැ වාස කෙරෙයි, ශික්ෂාශාසනයෙහි ද පරිපූරකාරී නො වෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි අගෞරව වැ ප්‍රතිශ්‍රය රහිත වැ වාස කෙරේ ද, ධර්මය කෙරෙහි . . . සඞ්ඝයා කෙරෙහි . . . (ප්‍රතිශ්‍රය රහිත වැ වාස කෙරේ ද) ශික්ෂායෙහි පරිපූරකාරී නො වේ ද, හේ සඞ්ඝයා කෙරෙහි විවාද දනවයි, ඒ විවාද බොහෝ දෙනාට අහිත පිණිස බොහෝදෙනාට දුක් පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස වෙයි. ඉදින් ආනන්දය, තෙපි මෙබඳු විවාදමූලයක් තමා කෙරෙහි හෝ මෙරමා කෙරෙහි හෝ නුවණින් දක්නහු නම්, ආනන්දය, තෙපි ඒ පාපක විවාදමූලයා ගේ මැ ප්‍රහාණය පිණිස වෑයම් කරව. ඉදින් ආනන්දය, තෙපි මෙබඳු විවාද මූලයක් තමා කෙරෙහි හෝ මෙරමා කෙරෙහි හෝ නො දක්නහු නම්, ආනන්දය, තෙපි එහි ලා ඒ පාපක විවාද මූලයා ගේ මැ මතු නො ඉපැද්ම පිණිස පිළිපදව, මෙසේ තෙල පාපක විවාදමූලයා ගේ ප්‍රහාණ වෙයි, මෙසේ තෙල පාපක විවාදමූලයා ගේ මතු නො ඉපැද්ම වෙයි. ආනන්දය, මොහු සවැදෑරුම් විවාදමූලයෝ යි.

ආනන්දය, මේ අධිකරණයෝ සතරදෙනෙකි. කවර සතරදෙනෙක යත් : විවාදධි කරණ යැ, අනුවාදධිකරණ යැ, ආපත්තාධිකරණ යැ, කිච්චාධිකරණ යි. ආනන්දය, මොහු සතර අධිකරණයෝ යි.

යළි ආනන්දය, මේ අධිකරණසමථයෝ සත්දෙනෙක් වෙති : ' උපනුපන් අධිකරණ යන් ගේ ශමථය පිණිස ව්‍යුපශමය පිණිස (චතුර්විධ සම්මුඛතායෙන්) සම්මුඛාවිනය දිය යුතු ය. (රහත් මහණහට චොදනා නො කරනු සඳහා) සතිවිනය දියයුතු යැ (උමතු ව සිටි මහණහට චොදනා නො කරනු සඳහා) අමූළ්හවිනය දියයුතු යැ, (ඇවත පිළිගන්නහුට) ප්‍රතිඥයෙන් කටයුතු යැ, (ධර්මවාදීන් ගේ බාහුල්‍යයෙන් කරන) යෙභුය්‍යසිකා යැ, (පාපොත්සද පුද්ගල හට කරන) තස්සපාපිය්‍යසිකා යැ, තිණවත්ථාරකකර්ම යැ යන මොහු යි.

ආනන්දය, කිසෙයින් සම්මුඛාවිනය වෙයි යත් : ආනන්දය, මෙහි භික්ෂු කෙනෙක් ධර්ම යැ කියා හෝ අධර්ම යැ කියා හෝ විනය යැ කියා හෝ අවිනයයැකියා හෝ විවාද කෙරෙති. ආනන්දය, සමඟ වූ එ හැම භික්ෂූහු රැස්විය යුතු වෙති. රැස් වැ ධර්මනීතිය විමසියැ යුත්තී යැ, ධර්මනීතිය විමසා ඒ ධර්මන්‍යායයෙහි යම්සේ සම වේ ද, එසෙයින් ඒ අධිකරණය සන්හිඳුවිය යුතු. ආනන්දය, මෙසේ සම්මුඛාවිනය වෙයි. යම් අධිකරණ යෙක් යම් සම්මුඛාවිනයෙකින් සන්හිඳේ ද, මෙසෙයිනුදු මෙහි ඇතැම් විවාදධිකරණයන් ගේ සන්හිඳීම වේ.

කිසෙයින් ආනන්දය යෙභුය්‍යසිකා වෙයි යත් : ඉදින් ආනන්දය, ඒ භික්ෂූහු ඒ අධිකරණය ඒ ආවාසයෙහි (හිඳ) සන්හිඳුවාලන්නට නො හැකි වෙත් ද, ආනන්දය, ඒ භික්ෂූන් විසින් යම් ආවාසයෙක බහුතර භික්ෂූහු වෙසෙත් ද, ඒ ආවාසය ගන්තව්‍ය වෙයි. (ඒ ආවාසයට යායුතුයි) එහි සමඟ වූ හැම භික්ෂූහු මැ රැස්විය යුත්තාහ. රැස්වැ ධර්මන්‍යාය විමසියැ යුතු ය. ධර්මන්‍යාය විමසා එහි යම්සේ සම් වේ ද, එසෙයින් ඒ අධිකරණය සන්හිඳුවිය යුතු. ආනන්දය, මෙසේ යෙභුය්‍යසිකා වෙයි. යම් අධිකරණයෙක් යම් යෙභුය්‍යසිකායෙකින් සන්හිඳේ ද, මෙසෙයිනුදු මේ ශාසනයෙහි කිසි අධිකරණ කෙනකුන් ගේ ව්‍යුපශම වෙයි.

කථඤ්ච ආනන්ද, සතිවිනයො හොති: ඉධානන්ද, භික්ඛු භික්ඛුං එවරූපාය ගරුකාය ආපත්තියා චොදෙති පාරාජිකෙන වා පාරාජිකසාමන්තෙන වා ‘සරතායස්මා එවරූපිං[1] ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘න ඛො අහං ආවුසො, සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. තස්ස ඛො ආනන්ද[2], භික්ඛුනො සතිවිනයො දාතබ්බො. එවං ඛො ආනන්ද, සතිවිනයො හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං සතිවිනයෙන.

කථඤ්ච ආනන්ද, අමූළ්හවිනයො හොති: ඉධානන්ද, භික්ඛු භික්ඛුං එවරූපාය ගරුකාය ආපත්තියා චොදෙති පාරාජිකෙන වා පාරාජිකසාමන්තෙන වා සරතායස්මා එවරූපිං[1] ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වාති. සො එවමාහ: ‘න ඛො අහං ආවුසො, සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. තමෙනං සො නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති[3] ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි, යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘අහං ඛො ආවුසො, උම්මාදං පාපුණිං චෙතසො විපරියෙසං.[4] තෙන මෙ උම්මත්තකෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං[5], නාහං තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති. තස්ස ඛො ආනන්ද, භික්ඛුනො අමූළ්හවිනයො දාතබ්බො. එවං ඛො ආනන්ද, අමූළ්හවිනයො හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං අමූළ්හවිනයෙන.

කථඤ්ච ආනන්ද, පටිඤ්ඤාතකරණං හොති: ඉධානන්ද, භික්ඛු චොදිතො වා අචොදිතො වා[6] ආපත්තිං සරති විවරති උත්තානීකරොති. තෙනානන්ද, භික්ඛුනා වුඩ්ඪතරො භික්ඛු[7] උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො ‘අහං භන්තෙ, ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො, තං පටිදෙසෙමී’ති. සො එවමාහ: ‘පස්සසී’ති, ‘පස්සාමී’ති.[8] ආයතිං සංවරං ආපජ්ජෙය්‍යාසීති[9] සංවරං ආපජ්ජිස්සාමීති.[10] එවං ඛො ආනන්ද, පටිඤ්ඤාතකරණං හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං පටිඤ්ඤාතකරණෙන.

කථඤ්ච ආනන්ද, තස්සපාපිය්‍යසිකා[11] හොති: ඉධානන්ද, භික්ඛු භික්ඛුං එවරූපාය ගරුකාය ආපත්තියා චොදෙති පාරාජිකෙන වා පාරාජිකසාමන්තෙන වා, ‘සරතායස්මා එවරූපිං ගරුකං ආපත්තිං

---

1. එවරූපං - ස්‍යා. 2. තස්ස ඛො එවං ආනන්ද - සීමු, ස්‍යා, PTS.
3. නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති - ස්‍යා.
4. විපරියාසං - මජසං, PTS. 5. පරික්කන්තං - මජසං
6. චුදිතො වා අචුදිතො වා - ස්‍යා.
7. වුඩ්ඪතරං භික්ඛුං - මජසං, සීමු.
8. ආම පස්සාමීති - සීමු, මජසං.
9. ආයතිං සංවරෙය්‍යාසීති - මජසං.
10. සංවරිස්සාමීති - මජසං.
11. තස්සපාපියසිකා - මජසං, ස්‍යා.

ආනන්දය, කිසෙයින් සතිවිනය වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ මෙබඳු ගරුකාපත්තියෙකින් මහණක්හු සොයයි : පරාජිකයෙන් චෝවයි ඇවත් අවන් ආයුෂ්මත් පරිජි හෝ පාරාජිකසාමන්ත හෝ මෙබඳු ගරුකාපත්තියක් සිහි කෙරේදැයි. ඒ මහණ මෙසේ කියයි : ' ඇවත, ඇවත් අවන් මම පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙබඳු ගරුකාපත්තියක් සිහි නො කරමි ' ආනන්දය, ඒ මහණහට සතිවිනය දියයුතු. ආනන්දය මෙසේ සතිවිනය වෙයි. සතිවිනයෙන් යම් අධිකරණයෙක් ව්‍යුපශම වේ ද, ආනන්දය, මෙසෙයිනුදු මෙ සස්නෙහි කිසි අනුවාදධිකරණ කෙනකුන්ගේ ව්‍යුපශම වෙයි.

ආනන්දය, කිසෙයින් අමූළ්හවිනය වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ පාරාජිකයෙන් චෝවයි පාරාජිකසාමන්තයෙන් චෝවයි මෙබඳු ගරුකාපත්තියකින් මහණකු සොයයි : ' ආවැත් අවන් ආයුෂ්මත් පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙබඳු ගරුකා පත්තියක් සිහි කෙරේ ද ' යි. හේ මෙසේ කියයි : ' ඇවත, ඇවැත් අවන් මම පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙබඳු ගරුකාපත්තියක් සිහි නො කරමි ' ඒ චොදක මහණ ඇවැත්වෙළුම් හරන තෙල චූදිත මහණහු තර කොට ඇවතින් වෙළයි : ' ඇවැත් අවන් ආයුෂ්මත් පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙබඳු ගරුකාපත්තියක් ඉදින් සිහි කරහි නම්, එයින් ආයුෂ්මත් මනාකොට මැ දනුව ' යි. (එසඳ) ඒ චූදිත මහණ මෙසේ කියයි : ' ඇවත මම් වූ කලි චිත්තවිපයාසස වූ උන්මාදයට පැමිණියෙමි, උමතු වූ මා විසින් බසින් බිණූ කයින් කළ බොහෝ නො සරුප් ද ආචාර බිඳ කරන ලද. මම් ඒ නො සිහි කරමි, සම්මූළ වූ මා විසින් තෙල කැරුණේ ය ' යි. ආනන්දය, ඒ මහණ හට අමූළ්හවිනය දියයුතු. ආනන්දය, මෙසේ අමූළ්හවිනය වෙයි. යම් අධිකරණයෙක් යම් අමූළ්හවින යෙකින් සන්හිඳේ ද, මෙසෙයින් මෙ සස්නෙහි කිසි අනුවාදධිකරණ කෙනකුන්ගේ සන්හිඳීම වෙයි.

කිසෙයින් ආනන්දය, පටිඤ්ඤාතකරණ වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ චොදිත වූයේ හෝ අචෝදිත වූයේ හෝ ඇවැත් සිහි කෙරෙයි, විවර කෙරෙයි, පාළ කෙරෙයි. ආනන්දය, ඒ මහණහු විසින් වෘද්ධතර මහණ වෙත එළැඹ සිවුරු එකස් කොට පාසඟුළුවන් වැඳ උළුලුයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වෙයි : ' වහන්ස ,මම් මෙනම් ඇවැත් අවන්මි, එ ඇවැත් දෙසමි ' හේ මෙසේ කියයි : ' දක්නෙහි ද ' යි. ' දක්මි '. ' මතුයෙහි සංවරයට පැමිණෙහි ' යයි. ' සංවරයට පැමිණෙමි ' යි. ආනන්දයෙනි, මෙසේ පටිඤ්ඤාතකරණ වෙයි. යම් අධිකරණයෙක් යම් පටිඤ්ඤාතකරණ නම් සමථ- යෙකින් සන්හිඳේ ද, මෙසේන් මෙ සස්නෙහි ඇතැම් ආපත්තාධිකරණ කෙනකුන්ගේ ව්‍යුපශම වෙයි.

ආනන්දය, කිසෙයින් ' තස්සපාපියාසිකා ' වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ මහණක්හට පරිජි ඇවතින් චෝවයි පාරාජිකසාමන්තයෙකින් චෝවයි ' ආයුෂ්මත් පරිජි හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියේ සිහි කෙරේව ' යි. මෙ බඳු ගරු ඇවැතෙකින් චොදනා කෙරෙයි. හේ මෙසේ

ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘න ඛො අහං ආවුසො, සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති තමෙනං සො නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති. ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි, යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘න ඛො අහං ආවුසො, සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා, සරාමි ඛො අහං ආවුසො එවරූපිං අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිතා’ති තමෙනං සො නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති, ඉඞ්ඝායස්මා, සාධුකමෙව ජානාහි, යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘ඉමං හි නාමාහං ආවුසො, අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිත්වා අපුට්ඨො පටිජානිස්සාමි. කිම්පනාහං එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිත්වා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා පුට්ඨො න පටිජානිස්සාමී’ති. සො එවමාහ: ‘ඉමං හි නාම ත්වං ආවුසො, අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිත්වා අපුට්ඨො න පටිජානිස්සසි. කිම්පන ත්වං එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිත්වා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා පුට්ඨො පටිජානිස්සසි, ‘ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි, යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. සො එවමාහ: ‘සරාමි ඛො අහං ආවුසො, එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා ‘දවා මෙ එවං වුත්තං, රවා මෙ එවං වුත්තං, ‘නාහං තං සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා’ති. එවං ඛො ආනන්ද, තස්සපාපියස්සිකා හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං තස්සපාපියස්සිකාය.

කථඤ්ච ආනන්ද, තිණවත්ථාරකො හොති: ඉධානන්ද, භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තෙහානන්ද, භික්ඛූහි සබ්බෙහෙව සමග්ගෙහි සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තතරෙන[1]. භික්ඛුනා උට්ඨායාසනා එකංසං චීවරං කත්වා අඤ්ජලිම්පනාමෙත්වා සඞ්ඝො ඤාපෙතබ්බො.

‘සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: ඉදං අම්හාකං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති, ඉමෙසඤ්චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්ත’න්ති.

අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තතරෙන[1] භික්ඛුනා උට්ඨායාසනා එකංසං චීවරං කත්වා අඤ්ජලිම්පනාමෙත්වා සඞ්ඝො ඤාපෙතබ්බො:

---

1 ව්‍යත්තෙන - මජ්සං, ස්‍යා.

කියයි : ' ඇවැත්නි, මම පරිජි හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙම් නො මැ සිහි කෙරෙමි ' යි. ඒ චොදක මහණ නිවේෂ්ඨන කරන (තමා මුදන) තෙල චුදිතයා අතිවෙඨන කෙරෙයි : ' ඉදින් පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙහි සිහි කෙරෙහි නම් ආයුෂ්මත් එකාන්තයෙන් මනාකොට මැ දනුව ' යි. හේ මෙසේ කියයි : ' ඇවත්නි, මම පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙම් නො මැ සිහි කෙරෙමි. ඇවැත්නි, මම මෙ බඳු වූ අල්පමාත්‍ර ඇවැතකට පැමිණියෙම් සිහි කෙරෙමි ' යි. ඒ චොදක මහණ නිවේෂ්ඨන කරන තෙල චුදිත මහණහු අතිවෙඨන කෙරෙයි : ' එකාන්ත යෙන් ආයුෂ්මත් මනාකොට මැ දන්හි. ඉදින් පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙහි සිහි කරව ' යි. හේ මෙසේ කියයි : ' ඇවැත්නි, මම යම් හෙයෙකින් මේ අල්පමාත්‍ර වූ ඇවැතකට පැමිණ නො පුළුවුස්නා ලදුයෙම් ප්‍රතිඥ කෙරෙම් නම් කිමෙක් ද මම පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැත කට පැමිණ පුළුවුස්නාලදුයෙම් පිළින නො කෙරෙම් ද ' යි. ඒ චොදක මහණ මෙසේ කියයි : ' ඇවැත්නි, යම් හෙයෙකින් තෝ මේ අල්පමාත්‍ර වූ ඇවැතකට පැමිණ නො පුළුවුස්නාලද්දෙහි ප්‍රතිඥ නො කරව. කිමෙක තෝ පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණ පුළුවුස්නාලදුයෙහි ප්‍රතිඥ කරන්නෙහි ද ? එකාන්ත යෙන් ආයුෂ්මත් මනාකොට මැ දන්හි. ඉදින් පාරාජික හෝ පාරාජිකසාමන්ත හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියහු සිහි කරව ' යි. ඒ චුදිත මහණ කියයි. ඇවැත්නි, මම පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙම් සිහි කෙරෙම් මැ යැ. ' මා විසින් සැහැසි වැ මෙසේ කියන ලද. මා විසින් අනෙකක් කියනු කැමැති වැ මෙසේ කියන ලද. මම පාරාජික හෝ පාරාජිකසාමන්ත වූ හෝ මෙ බඳු ගරු ඇවැතකට පැමිණියෙම් එය නො සිහි කෙරෙමි ' යි. ආනන්දය, මෙසේ ' තස්ස-පාපියාසිකා වෙයි. මෙ සස්නෙහි ' තස්සපාපියාසිකා ' නම් සමථයෙකින් යම් අධිකරණයෙක් සන්හිදේ ද, මෙසේත් මෙ සස්නෙහි ඇතැම් ආපත්තාධිකරණ කෙනකුන් ගේ ව්‍යුපශම වෙයි.

ආනන්දය, කිසෙයින් ' තිණවත්ථාරක ' වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි උපන් ඩබර ඇති උපන් කලහ ඇති විවාදයට පැමිණ වෙසෙන භික්ෂූන් විසින් බසින් කී කයින් වැයම් කොට කළ බොහෝ නොසරුප් ද කරන ලද වෙයි. ආනන්දය, ඒ භික්ෂූන් හැම සමඟ වූවන් රැස්විය යුතු, රැස්වැ සපක්ෂ භික්ෂූන් අතුරෙන් ව්‍යක්තතර මහණක්හු විසින් හුනස්නෙන් නැඟිසිට සිවුර එකස් කොට පෙරෙව ඇඳිලි බැඳ සඞසයා මෙසේ දන්විය යුතු :

' වහන්ස, සඞස තෙමේ මා කියන්නක් අසාවා, උපන් ඩබර ඇති උපන් කලහ ඇති විවාදපන්න වැ වෙසෙන අප විසින් බසින් කී කයින් කළ මේ බොහෝ නො සරුප් ද කරන ලද, ඉදින් සඟනට පැමිණි කල් වී නම්, මේ ආයුෂ්මතුන් ගේ යම් මැ ඇවැතකුත් වේ ද, තමා ගේ යම් ඇවැතකුත් වේ ද, (එය) මේ ආයුෂ්මතුන් සඳහාත් තමා සඳහාත් ස්ථූලවද්‍ය (පරිජි සඟවෙසෙස්) ඇවැත් තබා ගෘහීප්‍රතිසංයුක්ත ඇවැත් තබා, සඟමැද තිණවත්ථාරක යෙන් දෙසන්නෙමැ ' යි.

ඉක්බිති සපක්ෂ වූ අන්‍ය භික්ෂූන් අතුරෙන් ව්‍යක්තර මහණක්හු විසින් හුනස්නෙන් නැඟිසිට සිවුරු එකස් කොට පෙරෙව ඇඳිලි බැඳ සඞස තෙමේ ඥාපනීය වෙයි :

'සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: ඉදං අම්හාකං[1] භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති, ඉමෙසඤ්චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං, ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්ත'න්ති.

එවං ඛො ආනන්ද, තිණවත්ථාරකො හොති. එවඤ්ච පනිධෙකච්චානං අධිකරණානං වූපසමො හොති, යදිදං තිණවත්ථාරකෙන.

ඡයිමෙ ආනන්ද, ධම්මා සාරාණීයා[2] පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති. කතමෙ ඡ: ඉධානන්ද, භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවිචෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං ආනන්ද, භික්ඛුනො මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති. සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං ආනන්ද, භික්ඛුනො මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං ආනන්ද, භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී[3] හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං ආනන්ද, භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි[4] විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි. තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං ආනන්ද, භික්ඛු යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

ඉමෙ ඛො ආනන්ද, ඡ සාරාණීයා ධම්මා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති.

---

1. ඉධම්හාකං - ස්‍යා.
2. සාරණීයා - මජසං.
3. අපටිවිභත්තභොගී - සීමු.
4. භුජ්ජිස්සානි - PTS.

' වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, උපන් ඩබර ඇති උපන් කලහ ඇති විවාදපන්න වැ වෙසෙන අප විසින් බසින් කී කයින් කළ මේ බොහෝ නො සරුප් ද වෙයි, ඉදින් සහනට පැමිණි කල් වී නම්, මම මේ ආයුෂ්මතුන් ගේ යම් මැ ඇවැතකුත් ඇද්ද තමා ගේ යම් ඇවැතකුත් ඇද්ද, (එය) මේ ආයුෂ්මතුන් සඳහාත් තමා සඳහාත් (පරිජි සහවෙසෙස් යන) ස්ථූලවද්‍ය ඇවැත් තබා ගෘහිප්‍රතිසංයුක්ත ඇවැත් තබා, සහමැද තිණවත්ථාරකයෙන් දෙසන්නෙමැ ' යි.

ආනන්දය, මෙසේ තිණවත්ථාරක සමථ වෙයි. මෙසේ වැලිත් සස්නෙහි යම් ' තිණ වත්ථාරක ' නම් ශමථයෙක් ඇද්ද එයින් ඇතැම් අපත්තාධිකරණ කෙනකුන් ගේ සන්හිඳීම වෙයි.

ආනන්දය, සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන සබ්‍රම්සරුන් ගරු කරන මේ ධර්මයෝ සදෙනෙක් සබ්‍රම්සරුන් විසින් සඞ්ග්‍රහ කළයුතු බවට අවිවාදයට සමඟ බවට එකීභාවයට වැටෙති. කවර සදෙනෙක යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණහට සබ්‍රම්සරුන් කෙරෙහි සම්මුඛයෙහි ද පරාම්මුඛයෙහි ද මෛත්‍රී කායකර්මය එළඹසිටියේ වෙයි. සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මේ ධර්මය ද සබ්‍රම්සරුන් විසින් සඞ්ග්‍රහ පිණිස (ඔවුන් හා) අවිවාද පිණිස සාමග්‍රිය පිණිස එකීභාවය පිණිස වැටෙයි.

යළිදු ආනන්දය, මහණහට සබ්‍රම්සරුන් කෙරෙහි මෛත්‍රී වාක්කර්මය හමුයෙහි දු නො හමුයෙහි දු එළැඹසිටියේ වෙයි. සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සාමග්‍රිය පිණිස එකීභාවය පිණිස වැටෙයි.

යළිදු ආනන්දය, මහණහට සබ්‍රම්සරුන් කෙරෙහි මෛත්‍රීමනඃකර්මය හමුයෙහි දු නොහමුයෙහි දු එළැඹසිටියේ වෙයි. සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහයට අවිවාදයට සමගියට එකඟ බවට වැටෙයි.

යළිදු ආනන්දය, දැහැමි වූ දැහැමින් ලද යම් ලාභ කෙනෙක් වෙත් ද, යටත්පිරිසෙයින් පාත්‍රපර්‍යාපන්නමාත්‍රයෙකුදු වේ නම් එබඳු ලාභයෙන් සිල්වත් සබ්‍රම්සරුන් සමග (ආමිෂය හෝ පුද්ගලයා) වෙන් කොට නො වළඳනුයේ සාධාරණභොගී වෙයි. සිහි කටයුතු වූ ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහයට අවිවාදයට සමගියට එකඟ බවට වැටෙයි.

යළිදු ආනන්දය, නො කඩ වූ නො සිදුරු වූ නො සබල වූ කල්මාෂ නො වූ නිදස් වූ නුවණැත්තන් විසින් පසස්නාලද (තෘෂ්ණාදෘෂ්ටියෙන්) නො පහස්නාලද, සමාධි පිණිස පවත්නා වූ යම් ශීල කෙනෙක් වෙත් ද, එබඳු ශීලයෙහි හමුයෙහි දු නො හමුයෙහි දු සබ්‍රම් සරුන් සමග ශීලයෙන් සමාන බවට පැමිණ වෙසෙයි. සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මෙ දහම ද සඞ්ග්‍රහයට අවිවාදයට සාමග්‍රියට එකීභාවයට වැටෙයි.

යළිදු ආනන්දය, මහණ ආර්‍ය වූ නෛර්‍යාණික වූ යම් දෘෂ්ටියක් එලෙසින් කරනුවහට මැනැවින් දුක් කෙළවර කිරීමට පැමිණේ ද, එබඳු වූ දෘෂ්ටියෙන් හමුයෙහි දු නො හමුයෙහි දු සබ්‍රම්සරුන් සමග දෘෂ්ටියෙන් සමාන බවට පැමිණියේ වෙසෙයි. සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මෙ දහම ද සඞ්ග්‍රහයට අවිවාදයට සාමග්‍රියට එකීභාවයට වැටෙයි.

ආනන්දය, සිහි කටයුතු වූ සබ්‍රම්සරුන් ප්‍රිය කරන ගරු කරන මේ ධර්මයෝ සදෙන සඞ්ග්‍රහයට අවිවාදයට සාමග්‍රියට එකීභාවයට වැටෙත්.

ඉමෙ චෙ තුම්හෙ ආනන්ද, ඡ සාරණීයෙ ධම්මෙ සමාදාය සංවත්තෙය්‍යාථ. පස්සථ නො තුම්හෙ, ආනන්ද, තං වචනපථං අණුං වා ථූලං වා, යං තුම්හෙ නාධිවාසෙය්‍යාථාති.

නො හෙතං භන්තෙ.

තස්මාතිහානන්ද, ඉමෙ ඡ සාරණීයෙ ධම්මෙ සමාදාය වත්තථ.[1] තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

සාමගාම සුත්තං චතුත්ථං.

1. සංවත්තෙය්‍යාථ - සය්‍යා.

ආනන්දය, ඉදින් තෙපි සිහි කටයුතු වූ මේ ධර්මයන් සඳෙන මොනොවට ගෙන වැටෙන්නහු නම් ආනන්දය, තෙපි අල්පසාවද්‍ය හෝ මහාසාවද්‍ය හෝ යම් වචනපථයක් නො ඉවසන්නහු ද එ වචනපථය තෙපි දක්නහු ද ?

වහන්ස, තෙල නො වේ මැ යැ.

එහෙයින් ආනන්දය, මෙ කරුණෙහි ලා මේ ෂට්සාරාණීයධර්මයන් මොනොවට ගෙන වැටෙවු. එය තොපට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වන්නේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය පිළිගත්තාහ ' යි.

**සිව් වැනි සාමගාම සූත්‍ර යි.**

---

# 3. 1. 5

## සුනක්ඛත්ත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සම්බහුලෙහි භික්ඛූහි භගවතො සන්තිකෙ අඤ්ඤා බ්‍යාකතා හොති 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමා'ති. අස්සොසි ඛො සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො 'සම්බහුලෙහි කිර භික්ඛූහි භගවතො සන්තිකෙ අඤ්ඤා බ්‍යාකතා හොති 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාමා'ති.

අථ ඛො සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො භගවන්තං එතදවොච:

'සුතං මෙතං භන්තෙ සම්බහුලෙහි කිර භික්ඛූහි භගවතො සන්තිකෙ අඤ්ඤා බ්‍යාකතා 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාමා'ති. යෙ තෙ භන්තෙ, භික්ඛූ භගවතො සන්තිකෙ අඤ්ඤං බ්‍යාකංසු 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාමා'ති. කච්චි තෙ භන්තෙ, භික්ඛූ සම්මදෙව අඤ්ඤං බ්‍යාකංසු උදාහු සන්තෙත්ථෙකච්චෙ භික්ඛූ අධිමානෙන අඤ්ඤං බ්‍යාකංසූ'ති?

යෙ තෙ සුනක්ඛත්ත, භික්ඛූ මම සන්තිකෙ අඤ්ඤං බ්‍යාකංසු 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමා'ති. සන්තෙත්ථෙකච්චෙ භික්ඛූ සම්මදෙව අඤ්ඤං බ්‍යාකංසු, සන්ති පනිධෙකච්චෙ භික්ඛූ අධිමානෙනපි අඤ්ඤං බ්‍යාකංසු. තත්‍ර, සුනක්ඛත්ත, යෙ තෙ භික්ඛූ සම්මදෙව අඤ්ඤං බ්‍යාකංසු තෙසං තං තථෙව හොති. යෙ පන තෙ භික්ඛූ අධිමානෙන අඤ්ඤං බ්‍යාකංසු, තත්‍ර සුනක්ඛත්ත, තථාගතස්ස එවං හොති: 'ධම්මං නෙසං දෙසෙස්ස'න්ති. එවඤ්චෙත්ථ සුනක්ඛත්ත, තථාගතස්ස හොති: 'ධම්මං නෙසං දෙසෙස්ස'න්ති. අථ ච පනිධෙකච්චෙ මොඝපුරිසා පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති. තත්‍ර සුනක්ඛත්ත, යම්පි තථාගතස්ස එවං හොති: 'ධම්මං නෙසං දෙසෙස්ස'න්ති. තස්සපි හොති අඤ්ඤථත්තන්ති.

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො. 'යං භගවා ධම්මං දෙසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී'ති. තෙන හි සුනක්ඛත්ත, සුණොහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති

එවං භන්තෙති ඛො සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

# 3. 1. 5

## සුනක්ඛත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි වූ මහවෙනෙහි කූටාගාරශාලායෙහි වැඩ වාස කරනසේක. එසමයෙහි බොහෝ මහණුන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි '' ජාති ක්ෂය කරනලද, මහ බඹසරවස් වැස නිමවන ලද, කරණී කරනලද, මේ බවට කළයුතු අන් කිසෙක් නැතැ ' යි දනුම්හ '' යි අර්හත්වය ප්‍රකාශ කරන ලද වෙයි. සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර '' බොහෝ මහණුන් විසින් භාග්‍යවතුන් සමීපයෙහි දී ' ජාති ක්ෂය කරනලද, මහබඹසරවස් වැස නිමවනලද, කරණී කරනලද, මෙ බවට කළයුතු අන් කිසෙක් නැතැ ' යි දනුම්හ ' යි අර්හත්වය පවසන ලද වේ '' යයි ඇසී.

එසඳ සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර භාග්‍යවතුන් කරා එළඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ :

'' වහන්ස, මා විසින් තෙල අසන ලද : ' බොහෝ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි අර්හත්වය ප්‍රකාශ කරන ලද, ජාතිය ක්ෂය වූ යැ, මහබඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, ඉත්ථම්භාවය (කෙලෙසුන් නැසීම) පිණිස මහබවුන් කිසයෙක් නැතැ ' යි දනුම්හ '' යි. කිමෙක වහන්ස, ඒ භික්ෂූහු මැනැවින් ම අර්හත්වය පැවැසූහු ද, නොහොත් ඔවුන් කෙරෙහි ඇතැම් භික්ෂූහු අධිමානයෙන් අර්හත්වය පැවසූහු ඇත් ද ' යි.

සුනක්ඛත්තය, යම් භික්ෂූ කෙනෙක් මා සමීපයෙහි ' ජාති ක්ෂය වූ යැ, මහබඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, ඉත්ථම්භාවය පිණිස අන් කිසයෙක් නැතැ ' යි දනුම්හ ' යි රහත්බව පැවැසූහු ද, ඔවුන් කෙරෙහි ඇතැම් භික්ෂූහු මැනැවින් ම අර්හත්වය ප්‍රකාශ කළාහු ඇත. යලි ඇතැම් භික්ෂූහු අධිගතමානයෙනුදු අර්හත්වය ප්‍රකාශ කළාහු ඇත. සුනක්ඛත්තය, ඔවුන් කෙරෙහි යම් භික්ෂූ කෙනෙක් මැනැවින් මැ අර්හත්වය ප්‍රකාශ කළාහු ද, ඔවුන් ගේ ඒ ව්‍යාකරණය එසෙයින් මැ වෙයි. යලි යම් භික්ෂූ කෙනෙක් අධිගතමානයෙන් අර්හත්වය ප්‍රකාශ කළාහු ද, එහි ලා සුනක්ඛත්තය, තථාගතයනට මෙසේ සිත් වෙයි : ' ඔවුනට දහම් දෙසන්නෙමැ ' යි. සුනක්ඛත්තය, ඒ භික්ෂූන් ගේ අඤ්ඤාව්‍යාකරණයෙහි ලා ' ඔවුනට දහම් දෙසන්නෙමැ ' යි තථාගතයනට මෙසේත් සිත් වෙයි. එතකුදු වත් මෙ සස්නෙහි ඇතැම් මොඝපුරුෂයෝ පැන පුනපුනා සකසා තථාගතයන් කරා එළැඹ පුළුවුස්ති. එහි ලා සුනක්ඛත්තය, යම් කරුණෙකින් ' ඔවුනට දහම් දෙසන්නෙමැ ' යි තථාගතයනට මෙසේ සිත් වෙයි, ඒ චිත්තයා ගේ ද අන්‍යථාත්වය වේ යයි.

' යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක් ද, භාග්‍යවතුන් වහන්ස, මේ ඊට කලැ, සුගතයන් වහන්ස, මේ ඊට කලැ, භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ දෙසුම් අසා ධරන්නාහ ' යි. සුනක්ඛත්තය, එසේ වී නම් අස, මනා කොට මෙනෙහි කර, දෙසන්නෙමි ' යි.

එසේ යැ වහන්සැ ' යි සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී, භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක :

පඤ්ච ඛො ඉමෙ සුනක්ඛත්ත, කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො සුනක්ඛත්ත පඤ්ච කාමගුණා.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති යං ඉධෙකච්චො පුරිසපුග්ගලො ලොකාමිසාධිමුත්තො අස්ස, ලොකාමිසාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති, තදනුධම්මඤ්ච අනුවිතක්කෙති, අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති. ආනෙඤ්ජපටිසංයුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඕදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති[1], න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පුරිසො සකම්හා ගාමා වා නිගමා වා චිරවිප්පවුත්තො අස්ස, සො අඤ්ඤතරං පුරිසං පස්සෙය්‍ය තම්හා ගාමා වා නිගමා වා අචිරපක්කන්තං, සො තං පුරිසං තස්ස ගාමස්ස වා නිගමස්ස වා ඛෙමතඤ්ච සුභික්ඛතඤ්ච අප්පාබාධතඤ්ච පුච්ඡෙය්‍ය, තස්ස සො පුරිසො තස්ස ගාමස්ස වා නිගමස්ස වා ඛෙමතඤ්ච සුභික්ඛතඤ්ච අප්පාබාධතඤ්ච සංසෙය්‍ය. තං කිං මඤ්ඤසි සුනක්ඛත්ත, අපි නු සො පුරිසො තස්ස පුරිසස්ස සුස්සූසෙය්‍ය,[2] සොතං ඕදහෙය්‍ය, අඤ්ඤා චිත්තං උපට්ඨපෙය්‍ය, තඤ්ච පුරිසං භජෙය්‍ය, තෙන ච විත්තිං ආපජ්ජෙය්‍යා'ති?

එවං භන්තෙ.

එවමෙව ඛො, සුනක්ඛත්ත, ඨානමෙතං[3] විජ්ජති: යං ඉධෙකච්චො පුරිසපුග්ගලො ලොකාමිසාධිමුත්තො අස්ස, ලොකාමිසාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති. තදනුධම්මඤ්ච අනුවිතක්කෙති, අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති. ආනෙඤ්ජපටිසඤ්ඤුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඕදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති,[1] න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති. සො එවමස්ස වෙදිතබ්බො: ආනෙඤ්ජසංයොජනෙන හි ඛො විසංයුත්තො, ලොකාමිසාධිමුත්තො පුරිසපුග්ගලොති.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති: යං ඉධෙකච්චො පුරිසපුග්ගලො ආනෙඤ්ජාධිමුත්තො අස්ස, ආනෙඤ්ජාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති තදනුධම්මඤ්ච අනුවිතක්කෙති, අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති. ලොකාමිසපටිසඤ්ඤුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඕදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති[1] න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති.

---

1. උපට්ඨාපෙති - මජසං. 2. තස්ස සුස්සූසෙය්‍ය - PTS.
3. ඨානං එතං - සීමු.

සුනක්ඛත්තය, මේ කාමගුණයෝ පස්දෙනෙක, කවර පස්දෙනෙක යත් : චක්ෂුර් විඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව වූ (අරමුණු කොට උපදනා) කාමයෙන් යුක් රාග ඉපදීමට කරුණු වූ රූපයෝ යැ, ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු ශබ්දයෝ යැ . . . ඝ්‍රාණවිඥානයෙන් දතයුතු ගන්ධයෝ යැ . . . ජිහ්වාවිඥානයෙන් දතයුතු රසයෝ යැ . . . කායවිඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව වූ කාමොත්පාදක වූ රාගයට කරුණු වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, සුනක්ඛත්තය, මොහු පඤ්චකාමගුණයෝ යි.

තවද සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි : මෙලොවැ ඇතැම් පුරුෂ පුද්ගලයෙක් යම්හෙයෙකින් (වට්ට–කාම–ලොකාමිසසංඛ්‍යාත) පස්කම්ගුණයෙහි ඇලුණේ වේ නම්, සුනක්ඛත්තය, ඒකාන්තයෙන් පඤ්චකාමගුණයෙහි අධිමුක්ති ඇති පුරුෂපුද්ගල හට ඒ කාමගුණ සභාග වූ මැ කථාව පවතී, ඊට අනුරූප ධර්ම වූ විතර්කය ද විතර්ක කෙරෙයි, විචාරණය කෙරෙයි, ඒ (කාමගුණ කථා කරන) පුරුෂයා ද භජනය කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි, යළි ආනෙඤ්ජසමාපත්ති පිළිබැඳි කථාව කරනු ලබන කල්හි නො අසනු කැමැති වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, ඒ පුරුෂයා නො ද බෙජෙයි, ඔහු ගෙන් නො ද සතුටට පැමිණෙයි.

යම්සේ සුනක්ඛත්තය, පුරුෂයෙක් සිය ගමින් හෝ නිගමයෙන් හෝ බොහෝ කල් වෙන් වැ වසන්නේ ද, හේ ඒ ගමින් හෝ නිගමයෙන් හෝ පැමිණි නො බෝකල් ඇති අන්‍යතර පුරුෂයකු දක්නේ නම්, හේ ඒ පුරුෂයා අතින් ඒ ගම හෝ නිගමය හෝ පිළිබඳ ක්‍ෂෙම බව ද සුභික්ෂ බව ද නිරාබාධ බව ද පුළුවුස්නේ ය, ඔහට ඒ පුරුෂ ඒ ගම හෝ නියම්ගම හෝ පිළිබඳ ක්‍ෂෙම බව ද සුභික්ෂ බව ද නිරාබාධ බව ද පවසන්නේය. සුනක් ඛත්ත, එ කිමැයි සිතයි ද ? ඒ පුරුෂ ඒ (පැමිණි) පුරුෂයා ගේ බස් අසනු කැමැතිවන්නේ නො ද, ඇසීමට කන නමන්නේ නො ද, දැනුමට සිත එළවන්නේ නො ද, ඒ පුරුෂයාත් සෙවුනේ නො ද, ඔහුගෙනුදු සතුටට පැමිණෙන්නේ නො වේ දැ ? 'යි.

එසේ යැ වහන්ස,

එසෙයින් මැ සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි: යම් හෙයෙකින් මෙලොව ඇතැම් පුරුෂපුද්ගලයෙක් (වට්ට–කාම–ලොකාමිෂ සංඛ්‍යාත) පඤ්චකාමගුණයෙහි ඇලුණේ වන්නේ ද, සුනක්ඛත්තය, ලොකාමිෂයෙහි ඇලුණු පුරුෂපුද්ගලහට ඊට අනුරූප වූ මැ කථාව පවතී, ඊට අනුරූප වූ ධර්මය මැ විතර්ක කෙරෙයි, විචාරණය කෙරෙයි, ඒ පස්කම් ගුණයෙහි ඇලුණු පුරුෂයා භජනය ද කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි, යළි ආනෙඤ්ජසමාපත්ති පිළිබැඳි වූ කථාව කරනු ලබන කල්හි අසන්නට නොරිසි වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, ඒ පුරුෂයා නො ද භජනය කෙරෙයි, එයින් සතුටට නො ද පැමිණෙයි. හේ මෙසේ දතයුතු වන්නේ ය. ආනෙඤ්ජ සමාපත්තිසංයොජනයෙන් යුක්ත නො වූ පඤ්චකාමගුණාමිෂයෙහි ඇලුණු පුරුෂපුද්ගල යෙකැ ' යි කියා යි.

සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි: මෙලොවැ ඇතැම් පුරුෂපුද්ගල යෙක් ආනෙඤ්ජසමාපත්තියෙහි ඇලුණේ වේ ද, සුනක්ඛත්තය, ආනෙඤ්ජසමාපත්තියෙහි අධිමුක්ති ඇති පුරුෂපුද්ගලහට ඊට අනුරූප වූ කථාව පවතී, ඊට අනුරූප වූ ධර්මය විතර්කවිචාර ද කෙරෙයි, ඒ පුරුෂයා භජනය ද කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි. යළි පඤ්චකාමගුණාමිෂයෙන් යුක්ත වූ කථාව කරනුලබන කල්හි නො අසනු කැමැති වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, ඒ පුරුෂයා නො ද ඇසුරු කෙරෙයි, ඔහුගෙන් නො ද සතුටු වෙයි.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පණ්ඩුපලාසො බන්ධනා පවුත්තො අභබ්බො හරිතත්තාය. එවමෙව ඛො සුනක්ඛත්ත, ආනෙඤ්ජාධිමුත්තස්ස පුරිසපුග්ගලස්ස යෙ ලොකාමිසසඤ්ඤොජනෙ සෙ පවුත්තෙ. සො එවමස්ස වෙදිතබ්බො: ලොකාමිසසඤ්ඤොජනෙන හි ඛො විසඤ්ඤුත්තො ආනෙඤ්ජාධිමුත්තො පුරිසපුග්ගලො'ති.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති: යං ඉධෙකච්චො පුරිසපුග්ගලො ආකිඤ්චඤ්ඤායතනාධිමුත්තො අස්ස. ආකිඤ්චඤ්ඤායතනාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති, තදනුධම්මඤ්ච අනුවිතක්කෙති අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති. ආනෙඤ්ජපටිසඤ්ඤුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඔදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති, න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පුථුසිලා ද්වෙධා භින්නා අප්පටිසන්ධිකා හොති. එවමෙව ඛො සුනක්ඛත්ත, ආකිඤ්චඤ්ඤායතනාධිමුත්තස්ස පුරිසපුග්ගලස්ස යෙ ආනෙඤ්ජසඤ්ඤොජනෙ සෙ භින්නෙ. සො එවමස්ස වෙදිතබ්බො: ආනෙඤ්ජසඤ්ඤොජනෙන හි ඛො විසඤ්ඤුත්තො ආකිඤ්චඤ්ඤායතනාධිමුත්තො පුරිසපුග්ගලො'ති.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති: යං ඉධෙකච්චො පුරිසපුග්ගලො නෙවසඤ්ඤානාසඤ්ඤායතනාධිමුත්තො අස්ස, නෙවසඤ්ඤානාසඤ්ඤායතනාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති, තදනුධම්මඤ්ච අනුවිතක්කෙති අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති. ආකිඤ්චඤ්ඤායතනපටිසඤ්ඤුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඔදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති, න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පුරිසො මනුඤ්ඤභොජනං භුත්තාවී ඡඩ්ඩෙය්‍ය. තං කිං මඤ්ඤසි සුනක්ඛත්ත, අපි නු තස්ස පුරිසස්ස තස්මිං භත්තෙ පුන භොත්තුකම්‍යතා[1] අස්සා'ති?

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: අදුං හි භන්තෙ, භත්තං පටිකූලසම්මතන්ති.

එවමෙව ඛො සුනක්ඛත්ත, නෙවසඤ්ඤානාසඤ්ඤායතනාධිමුත්තස්ස පුරිසපුග්ගලස්ස යෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤොජනෙ සෙ වන්තෙ. සො එවමස්ස වෙදිතබ්බො: ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤොජනෙන හි ඛො විසඤ්ඤුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනාධිමුත්තො පුරිසපුග්ගලො'ති.

---

1. භත්තකම්‍යතා - PTS.

යම්සේ සුනක්ඛත්තය, නටුයෙන් ගිලිහුණු පඩුවන් වූ පත්‍රයෙක් හරිද්වර්ණය පිණිස අභව්‍ය වේ ද, එසෙයින් මැ සුනක්ඛත්තය, ආනෙඤ්ජසමාපත්තියෙහි ඇලුණු පුරුෂපුද්ගල හට යම් ලොකාමිෂසංයොජනයෙක් ඇද්ද, එය ගිලිහුණේ වෙයි. හේ මෙසේ දතයුතු වන්නේ ය: ලොකාමිෂසංයොජනයෙන් විසංයුක්ත වූ ආනෙඤ්ජසමාපත්තියෙහි අධිමුක්ත ඇති පුරුෂපුද්ගලයෙකැ ' යි කියා යි.

තවද සුනක්ඛත්තය, මෙකරුණ විද්‍යමාන වෙයි. යම් හෙයෙකින් මෙලොවැ ඇතැම් පුරුෂපුද්ගලයෙක් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි අධිමුක්ති ඇත්තේ වේ ද, සුනක්ඛත්තය, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි අධිමුක්ති ඇති පුරුෂපුද්ගලහට ඊට අනුරූ වූ මැ කථාව පවතී, ඊට අනුරූප වූ ධර්මය ද විතර්ක විචාර කෙරෙයි, ඒ පුරුෂයා භජනය ද කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි. යළි ආනෙඤ්ජසමාපත්තිපටිසංයුක්ත කථාව කරනු ලබන කල්හි නො අසනුකැමැති වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, ඒ පුරුෂයා නො ද භජනය කෙරෙයි, ඔහුගෙන් නො ද සතුටට පැමිණෙයි.

යම්සේ සුනක්ඛත්තය, මහගලක් දෙකඩ වැ බිඳුණේ ප්‍රතිසන්ධානයට නො නිසි වේ ද, එසෙයින් මැ සුනක්ඛත්තය, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි ඇලුණු පුරුෂ පුද්ගලහට යම් ආනෙඤ්ජසමාපත්තිසංයොජනයෙක් ඇද්ද, එය බිඳුණේ ' වෙයි. හේ මෙසේ දතයුතු වන්නේ යැ : '' ආනෙඤ්ජසමාපත්තිසංයොජනයෙන් විසංයුක්ත වූ ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි අධිමුක්ත වූ පුරුෂපුද්ගලයෙකැ '' යි කියා යි.

තවද සුනක්ඛත්තය, මෙ කරුණ විද්‍යමාන වෙයි : යම් හෙයෙකින් මෙලොවැ ඇතැම් පුරුෂපුද්ගලයෙක් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙහි අධිමුක්ති ඇත්තේ වේද සුනක්ඛත්තය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙහි අධිමුක්ත වූ පුරුෂපුද්ගලහට ඊට අනුරූප වූ මැ කථාව පවතී, ඊට අනුරූප වූ මැ ධර්මය ද විතර්කවිචාර කෙරෙයි, ඒ පුරුෂයා භජනය ද කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි. යළි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ප්‍රතිසංයුක්ත කථාව කරනුලබන කල්හි නො අසනුකැමැති වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, එ පුරුෂයා නො ද භජනය කෙරෙයි, ඔහුගෙන් නො ද සතුටට පැමිණෙයි.

යම්සේ සුනක්ඛත්තය, පුරුෂයෙක් බත්කිස නිමවූයේ මනොඥ භොජනය බැහැර ලන්නේ යැ. සුනක්ඛත්තය, ඒ කෙසේ හඟිහි ? කිමෙක් ද ඒ පුරුෂයාහට එ බත වටාලා බුදිනුකැමැත්තක් වන්නේ ද ? යි.

වහන්ස, නෙල නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, නෙල බත පිළිකුලැ' යි සම්මත හෙයිනි.

එසෙයින් මැ සුනක්ඛත්තය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමවත්හි ඇලුණු පුරුෂ පුද්ගලහට යම් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති සංයොජනයෙක් ඇද්ද, එය ඔහු විසින් වමාළේ වෙයි. හේ මෙසේ දතයුතු වන්නේ යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති යෙහි ඇලුණු පුරුෂපුද්ගල ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති සංයොජනයෙන් විසංයුක්ත වූයේ මැ යැ කියා යි.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති: යං ඉධෙකච්චො පුරිසපුග්ගලො සම්මානිබ්බානාධිමුත්තො අස්ස. සම්මානිබ්බානාධිමුත්තස්ස ඛො සුනක්ඛත්ත, පුරිසපුග්ගලස්ස තප්පතිරූපී චෙව කථා සණ්ඨාති, තදනුධම්මඤ්ච අනුවිතක්කෙති, අනුවිචාරෙති, තඤ්ච පුරිසං භජති, තෙන ච විත්තිං ආපජ්ජති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනපටිසඤ්ඤුත්තාය ච පන කථාය කච්ඡමානාය න සුස්සූසති, න සොතං ඔදහති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙති, න ච තං පුරිසං භජති, න ච තෙන විත්තිං ආපජ්ජති.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරූළ්හියා. එවමෙව ඛො සුනක්ඛත්ත, සම්මානිබ්බානාධිමුත්තස්ස පුරිසපුග්ගලස්ස යෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤොජනෙ සෙ උච්ඡින්නමූලෙ තාලාවත්ථුකතෙ අනභාවකතෙ[1] ආයතිං අනුප්පාදධම්මෙ. සො එවමස්ස වෙදිතබ්බො: 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤොජනෙන හි ඛො විසඤ්ඤුත්තො සම්මානිබ්බානාධිමුත්තො පුරිසපුග්ගලො'ති.

ඨානං ඛො පනෙතං සුනක්ඛත්ත, විජ්ජති. යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවමස්ස: 'තණ්හා ඛො සල්ලං සමණෙන වුත්තං අවිජ්ජාවිසදොසො ඡන්දරාගබ්‍යාපාදෙන රුප්පති. තං මෙ තණ්හාසල්ලං පහීනං, අපනීතො අවිජ්ජාවිසදොසො, සම්මානිබ්බානාධිමුත්තොහමස්මී'ති. එවංමානී[2] අස්ස අතථං 'ස මානං[3]. සො යානි සම්මානිබ්බානාධිමුත්තස්ස අසප්පායානි, තානි අනුයුඤ්ජෙය්‍ය: අසප්පායං චක්ඛුනා රූපදස්සනං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං සොතෙන සද්දං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං ඝානෙන ගන්ධං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං ජිව්හාය රසං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං මනසා ධම්මං අනුයුඤ්ජෙය්‍ය. තස්ස අසප්පායං චක්ඛුනා රූපදස්සනං අනුයුත්තස්ස, අසප්පායං සොතෙන සද්දං අනුයුත්තස්ස, අසප්පායං ඝානෙන ගන්ධං අනුයුත්තස්ස, අසප්පායං ජිව්හාය රසං අනුයුත්තස්ස, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං අනුයුත්තස්ස, අසප්පායං මනසා ධම්මං අනුයුත්තස්ස රාගො චිත්තං අනුද්ධංසෙය්‍ය. සො රාගානුද්ධංසිතෙන චිත්තෙන මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පුරිසො සල්ලෙන විද්ධො අස්ස සවිසෙන ගාළ්හූපලෙපනෙන. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං[4] තස්ස සො භිසක්කො සල්ලකත්තො සත්ථෙන වණමුඛං පරිකන්තෙය්‍ය, සත්ථෙන වණමුඛං පරිකන්තිත්වා එසනියා සල්ලං එසෙය්‍ය, එසනියා සල්ලං එසිත්වා සල්ලං අබ්බහෙය්‍ය[5] අපනෙය්‍ය විසදොසං සඋපාදිසෙසං, සඋපාදිසෙසොති[6] මඤ්ඤමානො[7] සො එවං වදෙය්‍ය: 'අම්භො පුරිස, උබ්භතං ඛො තෙ සල්ලං, අපනීතො

---

1. අනභාවං කතෙ - සීමු, මජසං / අනභාවං ගතෙ - ස්‍යා.
2. එවංමානි - මජසං, එවමානි - ස්‍යා.
3. අත්ථං සමානං - PTS, ස්‍යා. / අතථං සමානං - සීමු.
4. උපට්ඨපෙය්‍යුං - සීමු, ස්‍යා, මජසං.
5. අබ්බුහෙය්‍ය - සීමු, මජසං. / අබ්බාහෙය්‍ය - ස්‍යා.
6. අනුපාදිසෙසොති - ස්‍යා, PTS.
7. ජානමානො - සීමු, මජසං, ස්‍යා.

සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි : යම්හෙයෙකින් මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් මනාකොට නිර්වාණයෙහි අධිමුක්ති ඇත්තේ වේ ද, සුනක්ඛත්තය, මනාකොට නිර්වාණයෙහි අධිමුක්ත වූ ඊට අනුරූප වූ මැ කථාව පවතී, ඊට අනුගත වූ ධර්මය ද විතර්ක විචාර කෙරෙයි, ඒ පුරුෂයා සේවනය ද කෙරෙයි, ඔහුගෙන් සතුටට ද පැමිණෙයි, යළි නේවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති ප්‍රතිසංයුක්ත වූ කථාව කරනුලබන කල්හි නො අසනු කැමති වෙයි, ඇසීමට කන නො නමයි, දැනුමට සිත නො එළවයි, ඒ පුරුෂයා නො ද භජනය කෙරෙයි, ඔහුගෙන් නො ද සතුටට පැමිණෙයි.

යම්සේ සුනක්ඛත්තය, මුදුන සුන් තලෙක් යළි වැඩීමට නො නිසි වේද, එසෙයින් ම සුනක්ඛත්තය, මනාකොට නිර්වාණාධිමුක්ත වූ පුරුෂපුද්ගලහට යම් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනසමාපත්තිසංයොජනයෙක් ඇද්ද, එය උපුන් මුල් ඇතියේ තාලවස්තුවක් සෙයින් කරන ලදුයේ අනුඅභාවය කරන ලදුයේ මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි. හේ මෙසේ දතයුත්තේ වන්නේ ය : මනාකොට නිර්වාණාධිමුක්ත වූ පුරුෂපුද්ගල නෙව-සඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිසංයොජනයෙන් විසංයුක්ත වූයේ මැ යැ කියා යි.

තවද සුනක්ඛත්තය, මෙ කරුණ විද්‍යමාන වෙයි. කිමෙක යත් : මෙ සස්නෙහි ඇතැම් මහණක් හට මෙසේ සිත් වෙයි: ' තෘෂ්ණාව වනාහි ශල්‍යයෙකැ ' යි බුද්ධශ්‍රමණ යන් විසින් වදරන ලද, අවිද්‍යා සංඛ්‍යාත විෂදෝෂය ඡන්දරාගයෙන් හා ව්‍යාපාදයෙන් කොප්‍ය වෙයි. මට ඒ තෘෂ්ණාශල්‍යය ප්‍රහීණ යැ, අවිද්‍යා සංඛ්‍යාත විෂදොෂය බැහැර කරන ලද, මම් මනාකොට නිර්වාණයෙහි අධිමුක්ත වූයෙම් වෙමි ' යි. (අධිගත) මාන ඇතියේ වෙයි. ඔහුගේ මානය අතථ්‍ය (හිස්) වෙයි. හේ මනාකොට නිර්වාණයෙහි බැසගත් සිත් ඇත්තහුට අහිත වූ යම් අරමුණු කෙනෙක් ඇද්ද, එහි යෙදෙන්නේ ය, ඇසින් අහිත වූ රූ දක්මෙහි යෙදෙන්නේ ය, කනින් අහිත වූ ශබ්දයෙහි යෙදෙන්නේ ය, නැහැයෙන් අහිත වූ ගන්ධයෙහි යෙදෙන්නේ ය, දිවින් අහිත වූ රසයෙහි යෙදෙන්නේ ය, කයින් අහිත වූ පැහැසියයුත්තෙහි යෙදෙන්නේ ය, සිතින් අහිත වූ දහම්හි යෙදෙන්නේ ය. ඇසින් අහිත වූ රූදක්මෙහි යෙදුණු, කනින් අහිත වූ ශබ්දයෙහි යෙදුණු, නැහැයෙන් අහිත වූ ගන්ධයෙහි යෙදුණු, දිවින් අහිත වූ රසයෙහි යෙදුණු, කයින් අහිත වූ පැහැසියයුත්තෙහි යෙදුණු, සිතින් අහිත වූ දහම්හි යෙදුණු ඔහු ගේ සිත රාගය විසුරුවාලන්නේ ය. හේ රාගයෙන් මඩනා ලද සිතින් යුක්ත ව මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙන්නේ ය.

සුනක්ඛත්තය, යම්සේ පුරුෂයෙක් විෂ සහිත වූ පුනපුනා විෂ පෙවූ හීයෙකින් විදිනා ලද්දේ වන්නේ ද, ඔහු ගේ මිත්‍රාමාත්‍යයෝ නෑ සහලේනැයෝ සැත්කම් කරන වෙදකු එළවන්නාහු ය, ඒ සැත්කම් කරන වෛද්‍ය සැතින් ඔහු ගේ ව්‍රණමුඛය සිඳින්නේ ය, සැතින් ව්‍රණමුඛය සිඳ එෂණිසලාකායෙන් ශල්‍යය සොයන්නේ ය, එෂණියෙන් ශල්‍යය සොයා ශල්‍යය උදුරන්නේ ය ග්‍රහණශෙෂ සහිත කොට විෂදෙෂය බැහැර කරන්නේ ය. ග්‍රහණ ශෙෂ සහිත යයි හඟනා වූ හෙතෙම මෙසේ කියන්නේ ය : '' එම්බා පුරුෂය, තාගේ ශල්‍යය

විසදොසො සඋපාදිසෙසො[1], අනලඤ්ච[2] තෙ අන්තරායාය. සප්පායානි චෙව භොජනානි භුඤ්ජෙය්‍යාසි, මා තෙ අසප්පායානි භොජනානි භුඤ්ජතො වණො අස්සාවී අස්ස. කාලෙන ච කාලං වණං ධොවෙය්‍යාසි, කාලෙන ච කාලං වණමුඛං ආලිම්පෙය්‍යාසි, මා තෙ න කාලෙන කාලං වණං ධොවතො න කාලෙන කාලං වණමුඛං ආලිම්පතො පුබ්බලොහිතං වණමුඛං පරියොනන්ධි, මා ච වාතාතපෙ චාරිත්තං අනුයුඤ්ජි, මා තෙ වාතාතපෙ චාරිත්තං අනුයුත්තස්ස රජොසූකං[3] වණමුඛං අනුද්ධංසෙසි, වණානුරක්ඛී ච අම්භො පුරිස විහරෙය්‍යාසි වණසාරොපී'ති. තස්ස එවමස්ස : 'උබ්භතං ඛො මෙ සල්ලං, අපනීතො විසදොසො අනුපාදිසෙසො, අනලඤ්ච මෙ අන්තරායායා'ති. සො අසප්පායානි චෙව භොජනානි භුඤ්ජෙය්‍ය. තස්ස අසප්පායානි භොජනානි භුඤ්ජතො වණො අස්සාවී අස්ස. න ච කාලෙන කාලං වණං ධොවෙය්‍ය. න ච කාලෙන කාලං වණමුඛං ආලිම්පෙය්‍ය. තස්ස න කාලෙන කාලං වණං ධොවතො න කාලෙන කාලං වණමුඛං ආලිම්පතො පුබ්බලොහිතං වණමුඛං පරියොනන්ධෙය්‍ය. වාතාතපෙ ච චාරිත්තං අනුයුඤ්ජෙය්‍ය. තස්ස වාතාතපෙ චාරිත්තං අනුයුත්තස්ස රජොසූකං[3] වණමුඛං අනුද්ධංසෙය්‍ය න ච වණානුරක්ඛී විහරෙය්‍ය න වණසාරොපී. තස්ස ඉමිස්සා ච[4] අසප්පායකිරියාය, අසු ච විසදොසො[5] අපනීතො සඋපාදිසෙසො, තදුභයෙන වණො පුථුත්තං ගච්ඡෙය්‍ය, සො පුථුත්තං ගතෙන වණෙන මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං.

එවමෙව ඛො සුනක්ඛත්ත, ඨානමෙතං විජ්ජති යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවමස්ස : තණ්හා ඛො සල්ලං සමණෙන වුත්තං, අවිජ්ජාවිසදොසො ඡන්දරාගබ්‍යාපාදෙන[6] රුප්පති, තං මෙ තණ්හාසල්ලං පහීනං, අපනීතො අවිජ්ජාවිසදොසො, සම්මා නිබ්බානාධිමුත්තොහමස්මී'ති එවං මානී අස්ස. අතථං 'ස මානං[7]. සො යානි සම්මානිබ්බානාධිමුත්තස්ස අසප්පායානි තානි අනුයුඤ්ජෙය්‍ය: අසප්පායං චක්ඛුනා රූපදස්සනං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං සොතෙන සද්දං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං ඝානෙන ගන්ධං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං ජිව්හාය රසං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං අනුයුඤ්ජෙය්‍ය, අසප්පායං මනසා ධම්මං අනුයුඤ්ජෙය්‍ය. තස්ස අසප්පායං චක්ඛුනා රූපදස්සනං අනුයුත්තස්ස, අසප්පායං සොතෙන සද්දං අනුයුත්තස්ස, අසප්පායං ඝානෙන ගන්ධං අනුයුත්තස්ස, අසප්පායං ජිව්හාය රසං අනුයුත්තස්ස, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං අනුයුත්තස්ස, අසප්පායං මනසා ධම්මං අනුයුත්තස්ස රාගො චිත්තං අනුද්ධංසෙය්‍ය. සො රාගානුද්ධංසිතෙන චිත්තෙන මරණං වා නිගච්ඡෙය්‍ය, මරණ මත්තං වා දුක්ඛං. මරණං හෙතං සුනක්ඛත්ත, අරියස්ස විනයෙ යො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. මරණමත්තං හෙතං සුනක්ඛත්ත, දුක්ඛං යො අඤ්ඤතරං සංකිලිට්ඨං ආපත්තිං ආපජ්ජති.

---

1. අනුපාදිසෙසො - සයා, PTS.
2. අලඤ්ච - සයා, PTS.
3. රජොසූකං - සයා, PTS, සීමු.
4. ඉමිස්සාච - සයා.
5. අසුචි විසදොසො - සබ්බත්ථ.
6. ඡන්දරාගව්‍යාපාදෙහි - PTS, සයා
7. අතථං සමානං - සබ්බත්ථ.

උදුරන ලද මැ ය, ග්‍රහණශෙෂ සහිත වූ විෂදෙෂය බැහැර කරන ලද, එතෙකුදු වත් තට අන්තරාය පිණිස අසමර්ථ ය. පථ්‍ය වූ හොජන ම වළඳන්නෙහි ය, අහිත බොදුන් වළඳන තාගේ ව්‍රණය නහමක් පූයා වැහෙනසුලු වේවා, කලින් කල ව්‍රණය ධොවනය කරන්නෙහි, කලින් කල ව්‍රණමුඛය ආලිම්පන කරන්නෙහි, කලින් කල ව්‍රණය ධොවනය නො කරන කලින් කල ව්‍රණමුඛය ආලිම්පනය නො කරන තාගේ ව්‍රණමුඛය නහමක් ලේසැරව බඳීවා, අව්සුළංහි හැසිරීමෙහි ද නහමක් යෙදෙව, අව්සුළංහි හැසිරීමෙහි යෙදුණු තාගේ ව්‍රණමුඛය දූලි හා නණ්ඩු නහමක් පෙළාවා, එම්බා පුරුෂය, ව්‍රණය රක්නාසුලුව ව්‍රණ රොපණය කරනසුලුව වාසය කරන්නෙහි යයි.'' එ පුරුෂහට මෙබඳු සිතෙක් වන්නේ ය : ' එකාන්තයෙන් මාගේ ශල්‍යය උදුරන ලද, විෂදෙෂය බැහැර කරන ලද, ග්‍රහණශෙෂ රහිත යැ, මට අන්තරාය පිණිස ද අසමර්ථ වේ ය ' යි. හේ අපථ්‍ය වූ හොජන ද වළඳන්නේ ය, අපථ්‍යභොජනයන් වළඳකරන ඔහුගේ ව්‍රණය පූයා වැහෙනසුලු වන්නේ ය, කලින් කල වණය නො ද ධොවනය කරන්නේ ය, කලින් කල වණමුඛය නො ද ආලෙපනය කරන්නේ ය, ඔහු කලින් කල වණය නො දෙවූනා හට කලින් කල වණමුඛය ආලෙපන නො කරනු වහුට ලේසැරව වණමුඛය අවටින් බඳනේය, අව්සුළංහි හැසිරීමෙහිදු යෙදෙන්නේය, අව්සුළංහි හැසිරීමෙහි යෙදුණු ඔහුගේ ව්‍රණමුඛය දූලි හා නණ්ඩු පෙළන්නේ ය, වණය රක්නාසුලු ව ව්‍රණරොපණය කරනසුලු ව නො ද වෙසෙන්නේ ය. ඔහුගේ මේ අපථ්‍ය ක්‍රියාහෙතුයෙනුදු ඒ බැහැර කළ විෂදෙෂයත් ග්‍රහණශෙෂ සහිත විය, එ දෙකින් වණය මහත් බවට යන්නේ ය, හේ මහත් බවට ගිය වණයෙන් මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙන්නේ යි.

එසෙයින් මැ සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි. කිමෙක යත් : '' මෙ සස්නෙහි මැනැවින් නිර්වාණයෙහි අධිමුක්ත වූ මැ ඇතැම් මහණක් හට මෙසේ සිත් වෙයි : ' තෘෂ්ණාව වනාහි ශල්‍යයෙකැ 'යි බුද්ධශ්‍රමණයන් විසින් වදරන ලද, අවිද්‍යා සංඛ්‍යාත විෂදෙෂය ඡන්දරාගයෙන් හා ව්‍යාපාදයෙන් කොප්‍ය වෙයි. මා විසින් ඒ තෘෂ්ණාශල්‍යය ප්‍රහීණ යැ, අවිද්‍යා සංඛ්‍යාත විෂදෙෂය බැහැර කරන ලද, මම් මැනැවින් නිර්වාණයෙහි අධිමුක්ත වූයෙම් වෙමි '' යි. (අධිගත) මාන ඇතියේ වෙයි. ඔහුගේ මානය අතථ්‍ය (සිස්) වෙයි. හේ මැනවින් නිර්වාණයෙහි අධිමුක්ත වූවහුට අහිත වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයන්හි යෙදෙන්නේ ය. ඇසින් අහිත වූ රූපදර්ශනයෙහි යෙදෙන්නේ ය, කනින් අහිත වූ ශබ්ද ඇසීමෙහි යෙදෙන්නේ ය, නැහැයෙන් අහිත වූ ගඳ ගැන්මෙහි යෙදෙන්නේ ය, දිව්න් අහිත වූ රස විඳුමෙහි යෙදෙන්නේ ය, කයින් අහිත වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි යෙදෙන්නේ ය, සිතින් අහිත වූ ධර්මයෙහි යෙදෙන්නේ ය, ඇසින් අපථ්‍ය වූ රූපදර්ශනයෙහි යෙදුණු, කනින් අහිත වූ ශබ්දශ්‍රවණයෙහි යෙදුණු, නැහැයෙන් අපථ්‍ය වූ ගඳගැන්මෙහි යෙදුණු, දිව්න් අපථ්‍ය වූ රසාස්වාදනයෙහි යෙදුණු, කයින් අපථ්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි යෙදුණු, සිතින් අපථ්‍ය වූ ධර්මයෙහි යෙදුණු ඔහුගේ සිත රාගය තෙමේ වියළන්නේ ය, හේ රාගයෙන් අනුධ්වස්ත වූ සිතින් මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙන්නේ ය. සුනක්ඛත්තය, යමෙක් ශික්ෂාව හැරපියා ලාමක වූ ගිහිබවට වැටේ ද, තෙල ආර්‍ය්‍යවිනයෙහි (සස්නෙහි) මරණය මැ වෙයි. සුනක්ඛත්තය, යමෙක් සංක්ලිෂ්ට වූ අන්‍යතර ආපත්තියකට පැමිණේ ද, තෙල මරණමාත්‍ර වූ මැ දුක වේ.

ඨානං ඛො පනෙතං, සුනක්ඛත්ත, විජ්ජති යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවමස්ස: 'තණ්හා ඛො සල්ලං සමණෙන වුත්තං, අවිජ්ජාවිසදොසො ඡන්දරාගබ්‍යාපාදෙන රුප්පති. තං මෙ තණ්හාසල්ලං පහීනං අපනීතො අවිජ්ජාවිසදොසො. සම්මා නිබ්බානාධිමුත්තොහමස්මී'ති සම්මා නිබ්බානාධිමුත්තස්සෙව සතො. සො යානි සම්මානිබ්බානාධිමුත්තස්ස අසප්පායානි, තානි නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං චක්ඛුනා රූපදස්සනං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං සොතෙන සද්දං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං ඝානෙන ගන්ධං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං ජිව්හාය රසං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං නානුයුඤ්ජෙය්‍ය: අසප්පායං මනසා ධම්මං නානුයුඤ්ජෙය්‍ය. තස්ස අසප්පායං චක්ඛුනා රූපදස්සනං නානුයුත්තස්ස, අසප්පායං සොතෙන සද්දං නානුයුත්තස්ස, අසප්පායං ඝානෙන ගන්ධං නානුයුත්තස්ස, අසප්පායං ජිව්හාය රසං නානුයුත්තස්ස, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං නානුයුත්තස්ස, අසප්පායං මනසා ධම්මං නානුයුත්තස්ස රාගො චිත්තං නානුද්ධංසෙය්‍ය. සො න රාගානුද්ධංසිතෙන චිත්තෙන නෙව මරණං වා නිගච්ඡෙය්‍ය, න මරණමත්තං වා දුක්ඛං.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, පුරිසො සල්ලෙන විද්ධො අස්ස සවිසෙන ගාළ්හූපලෙපනෙන. තස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා භිසක්කං සල්ලකත්තං උපට්ඨාපෙය්‍යුං. තස්ස සො භිසක්කො සල්ලකත්තො සත්ථෙන වණමුඛං පරිකන්තෙය්‍ය. සත්ථෙන වණමුඛං පරිකන්තිත්වා එසනියා සල්ලං එසෙය්‍ය. එසනියා සල්ලං එසිත්වා සල්ලං අබ්බහෙය්‍ය[1] අපනෙය්‍ය විසදොසං අනුපාදිසෙසං. අනුපාදිසෙසොති ජානමානො. සො එවං වදෙය්‍ය: අම්භො පුරිස, උබ්භතං ඛො තෙ සල්ලං අපනීතො විසදොසො අනුපාදිසෙසො, අනලඤ්ච තෙ අන්තරායාය. සප්පායානි චෙව භොජනානි භුඤ්ජෙය්‍යාසි. මා තෙ අසප්පායානි භොජනානි භුඤ්ජතො වණො අස්සාවී අස්ස. කාලෙන ච කාලං වණං ධොවෙය්‍යාසි. කාලෙන ච කාලං වණමුඛං ආලිම්පෙය්‍යාසි. මා තෙ න කාලෙන කාලං වණං ධොවතො න කාලෙන කාලං වණමුඛං ආලිම්පතො පුබ්බලොහිතං වණමුඛං පරියොනන්ධී. මා ච වාතාතපෙ චාරිත්තං අනුයුඤ්ජි. මා තෙ වාතාතපෙ චාරිත්තං අනනුයුත්තස්ස[2] රජොසූකං වණමුඛං අනුද්ධංසෙසි. වණානුරක්ඛී ච අම්භො පුරිස, විහරෙය්‍යාසි වණසාරොපී'ති. තස්ස එවමස්ස: උබ්භතං ඛො මෙ සල්ලං අපනීතො විසදොසො අනුපාදිසෙසො, අනලඤ්ච මෙ අන්තරායායා'ති. සො සප්පායානි චෙව භොජනානි භුඤ්ජෙය්‍ය, තස්ස සප්පායානි භොජනානි භුඤ්ජතො වණො න අස්සාවී අස්ස. කාලෙන ච කාලං වණං ධොවෙය්‍ය, කාලෙන ච කාලං වණමුඛං ආලිම්පෙය්‍ය, තස්ස කාලෙන කාලං වණං ධොවතො කාලෙන කාලං වණමුඛං ආලිම්පතො පුබ්බලොහිතං වණමුඛං න පරියොනන්ධෙය්‍ය, න ච වාතාතපෙ චාරිත්තං අනුයුඤ්ජෙය්‍ය, තස්ස වාතාතපෙ චාරිත්තං අනනුයුත්තස්ස රජොසූකං වණමුඛං නානුද්ධංසෙය්‍ය, වණානුරක්ඛී ච විහරෙය්‍ය වණසාරොපී. තස්ස ඉමිස්සා ච සප්පායකිරියාය අසු ච විසදොසො අපනීතො අනුපාදිසෙසො. තදුභයෙන වණො විරූහෙය්‍ය[3] සො රූළ්හෙන වණෙන සඤ්ඡවිනා නෙව මරණං වා නිගච්ඡෙය්‍ය, න මරණමත්තං වා දුක්ඛං.

---

1. අබ්බුහෙය්‍ය – මජ්සං. / අබ්බාහෙය්‍ය – ස්‍යා.
2. අනුයුත්තස්ස – PTS.
3. පරූහෙය්‍ය – PTS.

යළි සුනක්ඛත්තය, මෙල කරුණ විද්‍යමාන වෙයි, කිමෙක යත් : මෙ සස්නෙහි මැනැවින් නිර්වාණයෙහි අධිමුක්ත වූ මැ ඇතැම් මහණක්හට මෙසේ සිත් වෙයි : 'තෘෂ්ණාව වනාහි ශල්‍යයෙකැයි බුද්ධශ්‍රමණයන් විසින් වදරන ලද, අවිද්‍යා සංඛ්‍යාත විෂදෝෂය ඡන්දරාගයෙන් හා ව්‍යාපාදයෙන් කොප්‍ය වෙයි. මට ඒ තෘෂ්ණාශල්‍යය ප්‍රහීණ යැ, අවිද්‍යා සංඛ්‍යාත විෂදෝෂය බැහැර කරන ලද, මම් මැනැවින් නිර්වාණයෙහි අධිමුක්තයෙම් වෙමි ' යි. හේ මැනවින් නිර්වාණාධිමුක්ති ඇත්තකුට අහිත වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයන්හි නො යෙදෙන්නේ ය. ඇසින් අහිත වූ රූපදර්ශනයෙහි නො යෙදෙන්නේ ය, කනින් අහිත වූ ශබ්ද ඇසීමෙහි නො යෙදෙන්නේ යැ, නැහැයෙන් අහිත වූ ගඳ ගැන්මෙහි නො යෙදෙන්නේ යැ, දිවින් අහිත වූ රස විඳීමෙහි නො යෙදෙන්නේ යැ, කයින් අහිත වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො යෙදෙන් නේ යැ, සිතින අහිත වූ දහම්හි නො යෙදෙන්නේ යැ, ඇසින් අහිත වූ රූපදර්ශනයෙහි නො යෙදුණු, කනින් අහිත වූ ශබ්ද ඇසීමෙහි නො යෙදුණු, නැහැයෙන් අහිත වූ ගඳ ගැන්මෙහි නො යෙදුණු, දිවෙන් අහිත වූ රස විඳීමෙහි නො යෙදුණු, කයින් අහිත වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො යෙදුණු, සිතින් අහිත වූ දහම්හි නො යෙදුණු ඔහු ගේ සිත රාගය තෙමේ නො වියළන්නේ ය, (නොමැඩපියන්නේ ය.) හෙතෙම රාගය විසින් නො මඩනා ලද සිතින් යුක්ත ව මරණයට හෝ නො මැ පැමිණෙන්නේ ය, මරණමාත්‍ර දුකට හෝ නො පැමිණෙන්නේ යි.

යම්සේ සුනක්ඛත්තය, පුරුෂයෙක් විෂ සහිත වූ පුනපුනා විෂ පෙවූ හීයෙකින් විදුනා ලද්දේ වේ ද, ඔහුගේ මිත්‍රාමාත්‍යයෝ නෑසහලේනෑයෝ සැත්කම් කරන වෙදකු එළවන් නාහු ය, ඒ ශල්‍යවෛද්‍යයා සැතින් ඔහුගේ ව්‍රණමුඛය සිඳින්නේ ය, සැතින් ව්‍රණමුඛය සිඳපියා එෂණියෙන් ශල්‍යය සොයන්නේය, එෂණියෙන් ශල්‍යය සොයා ශල්‍යය උදුරන් නේ ය, ග්‍රහණශෙෂ රහිත කොට විෂදෝෂය බැහැර කරන්නේ ය, ග්‍රහණශෙෂ රහිත වී යයි දන්නා ඒ විෂවෛද්‍ය මෙසේ කියන්නේ ය : '' එම්බා පුරුෂය, තොප ගේ ශල්‍යය උදුරන ලද්දේ මැ ය, විෂදෝෂය බැහැර කරන ලද, ග්‍රහණශෙෂ රහිත විය, තොපට අන්තරාය පිණිස අසමර්ථ ද වෙයි. යළි පථ්‍ය වූ භොජනයන් වළඳනුනෙහි ය, අපථ්‍ය වූ භොජන වළඳකරන්නා වූ තාගේ වණය නහමක් ලේසැරව ගලනසුලු වන්නේ ය, යළි කලින් කල වණය ධොවනය කරන්නෙහි ය. කලින් කල ව්‍රණමුඛය ආලෙප කරන්නෙහි, කලින් කල වණය නො දෙවුනා, කලින් කල වණමුඛය අලෙව් නො දෙන තාගේ වණ මුඛය නහමක් ලේසැරව බැඳේවා, අව්සුළංහි හැසිරෙන බැව්හි නහමක් යෙදෙව, අව් සුළංහි හැසිරීමෙහි යෙදෙන තාගේ ව්‍රණමුඛය දූලි හා නණ්ඩු නහමක් පෙළාවා, එම්බා පුරුෂය වණය රක්නෙහි ව්‍රණරොපණය කරන සුල්ලෙහි වාසය කරන්නෙහි ය '' යි. ඔහුට මෙවන් සිතෙක් වෙයි : ' මාගේ ශල්‍යය උදුරන ලද්දේ මැ යැ විෂදෝෂ බැහැර කරන ලදුයේ ග්‍රහණශෙෂ රහිත යැ, මට අන්තරාය පිණිස අසමර්ථ ද වේ ය ' යි. හේ පථ්‍ය වූ බොදුනුදු බුදින්නේ ය, පථ්‍ය වූ බොදුන් වළඳ කරන ඔහුගේ වණය ලේපූයා වැහෙන සුලු නො වෙයි, යළි කලින් කල වණය දෝනේ ය, කලින් කල වණය අලෙව් දෙන්නේ ය, කලින් කල වණය දෝනා කලින් කල වණමුඛය අලෙව්දෙන ඔහුගේ වණමුඛය ලේසැරව හාත්පසින් නො බඳනේ ය, අව්සුළංහි හැසිරීමෙහි නො ද යෙදෙන්නේ ය, අව්සුළංහි හැසිරීමෙහි නො යෙදුණු ඔහුගේ වණමුඛය රජස් හා නණ්ඩු නො පෙළන්නේ ය, යළි වණය රක්නාසුලු වූයේ ව්‍රණරොපණය කරනසුලු වූයේ වෙසෙන්නේ ය, ඔහුගේ මේ පථ්‍යක්‍රියාහෙතුයෙනුදු, ඒ විෂදෝෂයත් බැහැර කරන ලදුයේ ග්‍රහණශෙෂ රහිත විය. එ දෙකින් වණය (මස්) වැඩෙන්නේ ය. හේ වැඩුණු වණයෙන් හටගත් සිවියෙන් යුක්ත ව මරණයට හෝ නො පැමිණෙන්නේ ය, මරණමාත්‍ර දුකට හෝ නො පැමිණෙන්නේ යි.

එවමෙව ඛො සුනක්ඛත්ත, ඨානමෙතං විජ්ජති යං ඉධෙකච්චස්ස භික්ඛුනො එවමස්ස: තණ්හා ඛො සල්ලං සමණෙන වුත්තං. අවිජ්ජාවිසදොසො ඡන්දරාගබ්‍යාපාදෙන රුප්පති. තං මෙ තණ්හාසල්ලං පහීනං, අපනීතො අවිජ්ජාවිසදොසො. සම්මා නිබ්බානාධිමුත්තොහමස්මී'ති සම්මා නිබ්බානාධිමුත්තස්සෙව සතො සො යානි සම්මා නිබ්බානාධිමුත්තස්ස අසප්පායානි, තානි නානුයුඤ්ජෙය්‍ය: අසප්පායං චක්ඛුනා රූපදස්සනං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං සොතෙන සද්දං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං ඝානෙන ගන්ධං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං ජිව්හාය රසං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං කායෙන ඵොට්ඨබ්බං නානුයුඤ්ජෙය්‍ය, අසප්පායං මනසා ධම්මං නානුයුඤ්ජෙය්‍ය. තස්ස අසප්පායං චක්ඛුනා රූපදස්සනං නානුයුත්තස්ස අසප්පායං සොතෙන සද්දං නානුයුත්තස්ස අසප්පායං ඝානෙන ගන්ධං නානුයුත්තස්ස අසප්පායං ජිව්හාය රසං නානුයුත්තස්ස අසප්පායං කායෙන ඵොට්ඨබ්බං නානුයුත්තස්ස අසප්පායං මනසා ධම්මං නානුයුත්තස්ස රාගො චිත්තං නානුද්ධංසෙය්‍ය, සො න රාගානුද්ධංසිතෙන චිත්තෙන නෙව මරණං වා නිගච්ඡෙය්‍ය, න මරණමත්තං වා දුක්ඛං.

උපමා ඛො මෙ අයං සුනක්ඛත්ත, කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයමෙවෙත්ථ අත්ථො: වණොති ඛො සුනක්ඛත්ත, ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. විසදොසොති ඛො සුනක්ඛත්ත, අවිජ්ජායෙතං අධිවචනං. සල්ලන්ති ඛො සුනක්ඛත්ත, තණ්හායෙතං අධිවචනං. එසනීති ඛො සුනක්ඛත්ත, සතියායෙතං අධිවචනං. සත්ථන්ති ඛො සුනක්ඛත්ත, අරියායෙතං පඤ්ඤාය අධිවචනං. භිසක්කො සල්ලකත්තොති ඛො සුනක්ඛත්ත, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. සො වත සුනක්ඛත්ත, භික්ඛු ඡසු ඵස්සායතනෙසු සංවුතකාරී. උපධි දුක්ඛස්ස මූලන්ති[1] ඉති විදිත්වා නිරුපධි, උපධිසඞ්ඛයෙ විමුත්තො උපධිස්මිං වා කායං උපසංහරිස්සති චිත්තං වා උප්පාදෙස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, ආපානීයකංසො වණ්ණසම්පන්නො ගන්ධසම්පන්නො රසසම්පන්නො, සො ච ඛො විසෙන සංසට්ඨො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො. තං කිං මඤ්ඤසි සුනක්ඛත්ත, අපි නු සො පුරිසො අමුං ආපානීයකංසං පිවෙය්‍ය. යං ජඤ්ඤා ඉමාහං පිවිත්වා මරණං වා නිගච්ඡාමි, මරණමත්තං වා දුක්ඛ'න්ති?

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො සුනක්ඛත්ත, සො වත භික්ඛු ඡසු ඵස්සායතනෙසු සංවුතකාරී උපධි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා නිරුපධි, උපධිසඞ්ඛයෙ විමුත්තො උපධිස්මිං වා කායං උපසංහරිස්සති, චිත්තං වා උප්පාදෙස්සතීති නෙතං ඨානං විජ්ජති.

---

1. දුක්ඛමූලං - ස්‍යා.

එසෙයින් මැ සුනක්ඛත්තය, තෙල කරුණ විද්‍යමාන වෙයි, කිමෙක යත් : මෙ සස්නෙහි මැනැවින් නිර්වාණාධිමුක්ත වූ මැ ඇතැම් මහණක් හට මෙවන් සිතෙක් වෙයි : ' තෘෂ්ණාව වනාහි ශල්‍යයෙකැයි බුද්ධශ්‍රමණයන් විසින් වදරන ලද, අවිද්‍යා සංඛ්‍යාත විෂදෝෂය ඡන්දරාගයෙන් හා ව්‍යාපාදයෙන් කොප්‍ය වෙයි. මා විසින් ඒ තෘෂ්ණාශල්‍යය ප්‍රහීණ කරන ලද, අවිද්‍යාවිෂදෝෂය බැහැර කරන ලද, මම් මැනැවින් නිර්වාණයෙහි අධිමුක්ත වූයෙම් වෙමි ' යි. හේ මැනැවින් නිර්වාණයෙහි අධිමුක්ත වූවහුට අහිත වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද ඒ ධර්මයන්හි නො යෙදෙන්නේ ය, ඇසින් අහිත වූ රූපදර්ශනයෙහි නො යෙදෙන්නේය, කනින් අහිත වූ ශබ්දශ්‍රවණයෙහි නො යෙදෙන්නේ ය. ඝ්‍රාණයෙන් අහිත වූ ගන්ධාඝ්‍රාණයෙහි නො යෙදෙන්නේ ය, දිවින් අහිත වූ රසාස්වාදනයෙහි නො යෙදෙන්නේ ය, කයින් අහිත වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො යෙදෙන්නේ ය, සිතින් අහිත වූ දහම් දැනුමෙහි නො යෙදෙන්නේ ය. ඇසින් අහිත වූ රූ දක්මෙහි නො යෙදුණු, කනින් අහිත වූ ශබ්ද ඇසීමෙහි නො යෙදුණු, නැහැයෙන් අහිත වූ ගඳ ගැන්මෙහි නො යෙදුණු, දිවින් අහිත වූ රස විඳීමෙහි නො යෙදුණු, කයින් අහිත වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො යෙදුණු, සිතින් අහිත වූ දහම්හි නො යෙදුණු ඔහු ගේ සිත රාගය තෙමේ නො මඩනේ ය. හේ රාගය විසින් නො මඩනා ලද සිතින් යුක්ත ව මරණයට හෝ නො මැ පැමිණෙන්නේ ය, මරණමාත්‍ර වූ දුකට හෝ නො පැමිණෙන්නේ යි.

සුනක්ඛත්තය, මා විසින් තොපට අරුත් හඟවනු සඳහා මේ උපමා කරන ලදු. තෙල උපමායෙහි මෙ මැ අර්ථ වෙයි : ' වණ 'යි සුනක්ඛත්තය, සවැදෑරුම් අධ්‍යාත්මික ආයතනයට තෙල නමෙක, ' විසදෙස ' යි සුනක්ඛත්තය, අවිද්‍යාවට තෙල නමෙක, ' සල්ල ' යි සුනක්ඛත්තය, තෘෂ්ණාවට තෙල නමෙක, ' එසණී ' යි සුනක්ඛත්තය, ස්මෘතියට තෙල නමෙක, ' සත්ථ ' යි සුනක්ඛත්තය, ආර්‍යප්‍රඥාවට තෙල නමෙක, ' භිසක්ක සල්ලකත්ත ' යි සුනක්ඛත්තය, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ තථාගතයනට තෙල නමෙකි. සුනක්ඛත්තය, ඒකාන්තයෙන් ඒ මහණ සවැදෑරුම් ස්පර්ශායතනයෙහි සංවෘතකාරී වෙයි. පඤ්චස්කන්ධොපධිය දුකට මුලැයි මෙසේ දැන (ක්ලෙශොපධීන්) උපධි රහිත වූයේ, උපධිසංඛ්‍යය සංඛ්‍යාත නිවනෙහි විමුක්ත වූයේ කාමෝපධියෙහි කය හෝ එළවන්නේ ය, සිත හෝ උපදවන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

සුනක්ඛත්තය, යම්සේ වර්ණසම්පන්න වූ ගන්ධසම්පන්න වූ රසසම්පන්න වූ මිහිරි පැන් පිරූ කස්තලියෙක් වේ ද, හෙ ද වනාහි හලාහලවිෂයෙන් මුසු කරන ලදුයේ වෙයි, එකල්හි ජීවත්වනු කැමැති සුව කැමැති නො මැරෙනු කැමැති දුකට පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේ යැ, සුනක්ඛත්තය, එ කිමැයි සිතයි ද ? ඒ පුරුෂ යම්හෙයෙකින් ' මම් මෙය පානය කොට මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙමැ ' යි දන්නේ නම්, ඒ මිහිරි පැන් පිරූ කස්තලිය පානය කරන්නේ ද ? ' යි.

වහන්සැ, තෙල නො වේ මැ ය.

එසෙයින් මැ සුනක්ඛත්තය, ඒකාන්තයෙන් ඒ මහණ ෂට් ස්පර්ශායතනයන්හි සංවෘතකාරී වූයේ (පස්වැදෑරුම්) ස්කන්ධොපධිය දුකට මුලැ ' යි මෙසේ දැන උපධි රහිත වූයේ, උපධික්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි විමුක්ත වූයේ කාමොපධියෙහි කය හෝ එළවන් නේ යැ, සිත හෝ උපදවන්නේ යැ යන තෙල කරුණ නො වන්නේ යි.

සෙය්‍යථාපි සුනක්ඛත්ත, ආසීවිසො ඝොරවිසො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො. තං කිං මඤ්ඤසි සුනක්ඛත්ත, අපි නු සො පුරිසො අමුස්ස ආසීවිසස්ස ඝොරවිසස්ස හත්ථං වා අඞ්ගුට්ඨං වා දජ්ජෙය්‍ය යං ජඤ්ඤා ඉමිනාහං දට්ඨො මරණං වා නිගච්ඡාමි, මරණමත්තං වා දුක්ඛ'න්ති?

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො සුනක්ඛත්ත, සො වත භික්ඛු ඡසු ඵස්සායතනෙසු සංවුතකාරී, උපධි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා නිරූපධි, උපධිසඞ්ඛයෙ විමුත්තො උපධිස්මිං වා කායං උපසංහරිස්සති, චිත්තං වා උප්පාදෙස්සතී'ති නෙතං ඨානං විජ්ජතීති.

ඉදමවොච භගවා, අත්තමනො සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො භගවතො භාසිතං අභිනන්දී'ති.

සුනක්ඛත්ත සුත්තං පඤ්චමං.

යම්සේ සුනක්ඛත්තය, ක්‍රූර විෂ ඇති ආශීර්විෂයෙක් වේ ද, එකල්හි ජීවත්වනු කැමැති නො මැරෙනු කැමැති සුව කැමැති දුකට පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේ යැ, සුනක්ඛත්තය, ඒ කිමැයි සිතයි ද ? ඒ පුරුෂ ' යම්හෙයෙකින් මම මොහු විසින් දෂ්ට කරන ලද්දෙම් නම්, මරණයට හෝ මරණමාත්‍ර දුකට හෝ පැමිණෙමැ ' යි දන්නේ නම්, ඒ ඝෝරවිෂ වූ ආශීර්විෂයහට අතක් හෝ ඇඟිල්ලක් හෝ මෙහෙයන්නේ ද ? ' යි.

වහන්ස, තෙල නො වේ මැ ය.

එසෙයින් මැ සුනක්ඛත්තය, ඒකාන්තයෙන් ඒ මහණ ෂඩ්ස්පර්ශායතනයන්හි සංවෘතකාරී වූයේ, ස්කන්ධොපධිය දුකට මුලැ ' යි මෙසේ දැන ක්ලෙශෝපධි රහිත වූයේ, උපධික්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි විමුක්ත වූයේ කාමොපධියෙහි කය හෝ එළවන්නේ යැ, සිත හෝ උපදවන්නේ යැ යන තෙල කරුණ නො වන්නේ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සතුටු සිත් ඇති සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනය කෙළේ යි.

පස්වැනි සුනක්ඛත්ත සූත්‍ර යි.

---

# 3. 1. 6

## ආනෙඤ්ජසප්පාය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං නාම කුරූනං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අනිච්චා භික්ඛවෙ, කාමා තුච්ඡා මොසධම්මා. මායාකතමෙතං භික්ඛවෙ, බාලලාපනං. යෙ ච දිට්ඨධම්මිකා කාමා, යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා, යා ච සම්පරායිකා කාමසඤ්ඤා, උභයමෙතං මාරධෙය්‍යං, මාරස්සෙසවිසයො, මාරස්සෙසනිවාපො, මාරස්සෙසගොචරො. එත්ථෙතෙ පාපකා අකුසලා මානසා අභිජ්ඣාපි බ්‍යාපාදපි සාරම්භාපි සංවත්තන්ති. තෙව අරියසාවකස්ස ඉධමනුසික්ඛතො අන්තරායාය සම්භවන්ති.

තත්‍ර භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා, උභයමෙතං මාරධෙය්‍යං. මාරස්සෙසවිසයො, මාරස්සෙසනිවාපො, මාරස්සෙසගොචරො. එත්ථෙතෙ පාපකා අකුසලා මානසා අභිජ්ඣාපි බ්‍යාපාදපි සාරම්භාපි සංවත්තන්ති. තෙව අරියසාවකස්ස ඉධමනුසික්ඛතො අන්තරායාය සම්භවන්ති. යන්නූනාහං විපුලෙන මහග්ගතෙන චෙතසා විහරෙය්‍යං අභිභුය්‍ය ලොකං අධිට්ඨාය මනසා. විපුලෙන හි මෙ මහග්ගතෙන චෙතසා විහරතො අභිභුය්‍ය ලොකං අධිට්ඨාය මනසා. යෙ පාපකා අකුසලා මානසා අභිජ්ඣාපි සාරම්භාපි, තෙ න භවිස්සන්ති. තෙසං පහානා අපරිත්තඤ්ච මෙ චිත්තං භවිස්සති, අප්පමාණං සුභාවිත'න්ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා ආනෙඤ්ජං[1] සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආනෙඤ්ජුපගං. අයං භික්ඛවෙ, පඨමා ආනෙඤ්ජසප්පායා පටිපදා අක්ඛායති.

---

1. ආනෙජ්ජං - සිමු.

# 3. 1. 6

## ආනෙඤ්ජසප්පාය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කුරුදනව්යෙහි වූ කල්මාෂදම්‍ය නම් කුරුරට වැසියන් ගේ නියම්ගම්හි වැඩවාස කරන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් බණවා වදළ සේක. ' පින්වතුන් වහන්සැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය සූත්‍රය වදළ සේක.

මහණෙනි, වත්කම් කෙලෙස්කම්හු ඇතිවැ නැතිවන අර්ථින් අනිත්‍යයහ, (නිත්‍යසාර ධ්‍රැවසාර ආත්මසාර විරහිතයෙන්) සිස්හ, නැසෙනුවහ, නැසෙනසැහැවි ඇතියවහ. මහණෙනි, මායාවෙන් කරන ලද බාලලාපනයෙක, (බාලයන් ලවා මා ගේ යයි කියවනු යෙක). දෘෂ්ටධාර්මික වූ යම් මානුෂක පඤ්චකාමගුණ කෙනෙක් ඇද්ද, සාම්පරායික වූ යම් තදවශෙෂ කාම කෙනෙකුත් ඇද්ද, දෘෂ්ටධාර්මික වූ යම් කාමසංඥවකුත් ඇද්ද, සාම්පරායික වූ යම් කාමසංඥවකුත් ඇද්ද, මෙය කාම කාමසංඥ යන දෙක ම මාරායත්ත යෙක (මාරයා ගේ වශයෙහි වැටෙයි) මෙය මාරයාගේ විෂයයෙක, මෙය මාරයා ගේ නිවාපයෙක, මෙය මාරයා ගේ ගොචරයෙක. මේ පස්කම් විෂයෙහි මෙනෙහි උපදනා අභිධ්‍යාව ද ව්‍යාපාදය ද (කරණුත්තරියකරණ ලක්ෂණ) සාරම්භය ද යන මෙය ලාමක අකුශල ධර්මයෝ පවත්නාහ. ඒ තුන් කෙලෙස්හු මෙ සස්නෙහි හික්මෙන ආර්යශ්‍රාවක හට අන්තරාය පිණිස වෙත්.

මහණෙනි, එහි ලා ආර්යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාමයෝත් යම් සාම්පරායික කාමයෝත් වෙත් ද, යම් දෘෂ්ටධාර්මික කාමසංඥ කෙනෙකුත් යම් සාම්පරායික කාමසංඥ කෙනෙකුත් වෙත් ද, මෙය කාම කාමසංඥ යන දෙක ම මරුට තැන් වෙයි, මෙලෙ මරුට විෂය වෙයි, මෙලෙ මරුගේ නිවාප යැ, මෙලෙ මරුගේ ගොචර යි. මේ කාමගුණ විෂයෙහි මානසික වූ අභිධ්‍යා යැ ව්‍යාපාද යැ සාරම්භ යැ යන මෙය ලාමක අකුශලධර්මයෝ පවත්නාහ. ඒ තුන් කෙලෙස්හු මෙ සස්නෙහි හික්මෙන ආර්යශ්‍රාවක හට අන්තරාය පිණිස වෙති. මම් කාමගුණලොකය මැඩපියා, දුහැන් අරමුණු සිතින් ඉවා, විපුල වූ මහද්ගත වූ සිතින් යුක්ත ව වෙසෙම් නම් මැනව. යම්හෙයෙකින් කාමගුණලොකය මැඩපියා, දුහැන් අරමුණු සිතින් ඉවා, විපුල වූ මහද්ගත වූ සිතින් යුක්ත ව වෙසෙන මට චිත්තසම්භූත වූ අභිධ්‍යා යැ ව්‍යාපාද යැ සාරම්භ යැ යන යම් ලාමක අකුශල කෙනෙක් වෙත් නම්, ඔහු නො වන්නාහ. ඔවුන්ගේ ප්‍රහාණයෙන් මාගේ සිත (ලොකොත්තර විසින්) මහද්ගත ද අප්‍රමාණ ද සුභාවිත ද වන්නේය ' යි. මෙසේ පිළිපන් එ මැ පිළිවෙත බහුල කොට වෙසෙන ඔහුගේ සිත (අර්හත්ත්වාදි) කාරණයෙහි පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි විදසුන් නුවණින් රහත්බව හෝ පසක් කෙරෙයි, ආනෙඤ්ජ (චතුර්ථධ්‍යාන) සමාපත්තියට හෝ සමවදියි. කාබුන් මරණින් මත්තෙහි මෙය කරුණ විද්‍යමාන වෙයි. යම්හෙයෙකින් ඒ භික්ෂූහු ගේ උපදනට නිසි විපාක විඥනය වි ද, එය කුශලානෙඤ්ජස්වභාවයට පැමිණියේ වන්නේ ය. මහණෙනි, මේ පළමුවන ආනෙඤ්ජසප්පාය (චතුර්ථධ්‍යානයට හිත වූ) ප්‍රතිපදව යයි කියනු ලැබේ.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති, යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා, යං කිඤ්චි රූපං[1] චත්තාරි ච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං රූප'න්ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා ආනෙඤ්ජං සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආනෙඤ්ජූපගං. අයං භික්ඛවෙ, දුතියා ආනෙඤ්ජසප්පායා පටිපදා අක්ඛායති.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති. යෙ ච දිට්ඨධම්මිකා කාමා, යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා, යෙ ච දිට්ඨධම්මිකා රූපා, යෙ ච සම්පරායිකා රූපා, යා ච දිට්ඨධම්මිකා රූපසඤ්ඤා යා ච සම්පරායිකා රූපසඤ්ඤා උභයමෙතං අනිච්චං යදනිච්චං තං නාලං අභිනන්දිතුං, නාලං අභිවදිතුං, නාලං අජ්ඣොසිතු'න්ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා ආනෙඤ්ජං සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආනෙඤ්ජූපගං. අයං භික්ඛවෙ, තතියා ආනෙඤ්ජසප්පායා පටිපදා අක්ඛායති.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති. යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා, යෙ ච දිට්ඨධම්මිකා රූපා යෙ ච සම්පරායිකා රූපා, යා ච දිට්ඨධම්මිකා රූපසඤ්ඤා යා ච සම්පරායිකා රූපසඤ්ඤා, යා ච ආනෙඤ්ජසඤ්ඤා, සබ්බා සඤ්ඤා යත්ථෙතා අපරිසෙසා නිරුජ්ඣන්ති. එතං සන්තං එතං පණීතං යදිදං ආකිඤ්චඤ්ඤායතන'න්ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජති. පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආකිඤ්චඤ්ඤායතනූපගං. අයං භික්ඛවෙ, පඨමා ආකිඤ්චඤ්ඤායතනසප්පායා පටිපදා අක්ඛායති.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති සම්පසාදෙ සති එතරහි වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආකිඤ්චඤ්ඤායතනූපගං. අයං භික්ඛවෙ, දුතියා ආකිඤ්චඤ්ඤායතනසප්පායා පටිපදා අක්ඛායති.

---

1. යං කිඤ්චි රූපං සබ්බං රූපං - මජසං, සයා.

යළිදු මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාම කෙනෙකුත් යම් සාම්පරායිකකාම කෙනෙකුත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික කාම සංඥවකුත් යම් සාම්පරායික කාමසංඥවකුත් ඇද්ද, යම් කිසි රූපයෙක් ඇද්ද, (එ හැම) සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද ' යි (කියායි). මෙසේ පිළිපන් එ මැ පිළිවෙත බහුල කොට වෙසෙන ඔහුගේ සිත (අර්හත්වාදි) කාරණයෙහි පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි විදසුන් නුවණින් රහත්බව හෝ පසක් කෙරෙයි. ආනෙඤ්ජසමාපත්තියට හෝ සමවදියි. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහුගේ උපදනට නිසි විපාක විඥනය වී නම්, එය කුශලානෙඤ්ජස්වභාවයට පැමිණියේ වන්නේ ය. මහණෙනි, මේ දෙවැනි චතුර්ථධ්‍යාන සංඛ්‍යාත ආනෙඤ්ජසප්පාය ප්‍රතිපදව යයි කියනු ලැබේ.

යළිදු මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාමයෝත් යම් සාම්පරායික කාමයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික කාමසංඥවකුත් යම් සාම්පරායික කාමසංඥවකුත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපයෝත් යම් සාම්පරායික රූපයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපසංඥවකුත් යම් සාම්පරායික රූපසංඥවකුත් ඇද්ද, තෙල (දිට්ඨධම්මික සාම්පරායික යන) දෙකම අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය තෘෂ්ණා දෘෂ්ටි විසින් අභිනන්දනා කරන්නට නො නිසි වෙයි. අභිමානයෙන් කියන්නට නො නිසි වෙයි, බැසැගෙන සිටින්නට නො නිසි වේ ය ' යි. මෙසේ පිළිපන් ඒ කාම–රූපප්‍රතිබාහන යෙන් එමැ පිළිවෙත බහුල කොට වෙසෙන ඒ මහණහු ගේ සිත අර්හත්වාදි කාරණයෙහි පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි මැ විදසුන් නුවණින් රහත්බව හෝ පසක් කෙරෙයි. විඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ආනෙඤ්ජයට හෝ සමවදී. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහු ගේ උපතට නිසි විපාකවිඥනය වී නම්, එය කුශලානෙඤ්ජස්වභාවයට පැමිණියේ වන්නේය. මහණෙනි, මේ තුන්වැනි අනෙඤ්ජසප්පාය ප්‍රතිපදව යයි කියනු ලැබේ.

යළිදු මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාමයෝත් යම් සාම්පරායික කාමයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික කාමසංඥවකුත් සාම්පරායික කාමසංඥවකුත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපයෝත් යම් සාම්පරායික රූපයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපසංඥවකුත් යම් සාම්පරායික රූපසංඥවකුත් ඇද්ද, යම් විඤ්ඤානඤ්චායතන සංඛ්‍යාත ආනෙඤ්ජසංඥවකුත් ඇද්ද, යම් ආකිඤ්චඤ්ඤ යතනයකට පැමිණ තෙල සියලු සංඥවෝ නිරවශේෂ කොට නිරුද්ධ වෙත් ද, යම් මේ ආකිඤ්චඤ්ඤයතනයෙක් ඇද්ද, තෙල (අඞගශාන්තතායෙන් ද ආලම්බනශාන්තතායෙන් ද) ශාන්ත යැ තෙල (අතෘප්තකාර්ථයෙන්) ප්‍රණීත යැ' යි. මෙසේ පිළිපන් (ඒ සංඥ යටපත් කිරීමෙන්) එ මැ පිළිවෙත බහුල කොට වෙසෙන ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤ යතනයෙහි පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි විදසුන් නුවණින් රහත්බව හෝ පසක් කෙරෙයි. ආකිඤ්චඤ්ඤයතන සමාපත්තියට හෝ සමවදී. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහු ගේ උපදනට නිසි විපාකවිඥනය වී නම් එය ආකිඤ්චඤ්ඤයතනකුශල ස්වභාවයට පැමිණියේ වන්නේ යැ. මහණෙනි, මේ පළමු වන ආකිඤ්චඤ්ඤයතනසප්පාය ප්‍රතිපද යයි කියනු ලැබේ.

යළිදු මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක අරණ්‍යසෙනාසනයට ගියේ වේව ' යි වෘක්ෂමූලයට ගියේ වේව ' යි ශූන්‍යාගාරයට ගියේ වේව ' යි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ' මේ පඤ්චස්කන්ධය (මම ය මාගේ ය යන) ආත්මයෙන් ද ආත්මනීයභාවයෙන් ද ශූන්‍ය වේ ' යයි. මෙසේ පිළිපන් (යට කී පිළිවෙත හා) මේ ශූන්‍යතප්‍රතිපදව බහුල කොට වෙසෙන ඔහුගේ සිත ආයතනයෙහි පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි රහත්බව හෝ පසක් කෙරෙයි, ආකිඤ්චඤ්ඤයතන සමවතට හෝ සමවදී. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහුගේ උපතට නිසි විපාක විඥනය වී නම් ආකිඤ්චඤ්ඤයතන කුශලභාවයට පැමිණියේ වන්නේ යැ. මහණෙනි, දෙවැනි ආකිඤ්චඤ්ඤයතනසප්පාය ප්‍රතිපද යයි කියනු ලැබේ.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: නාහං ක්වචනි කස්සචි කිඤ්චනතස්මිං, න ච මම ක්වචනි කිස්මිඤ්චි කිඤ්චන-නත්ථී'ති[1] තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස ආකිඤ්චඤ්ඤායතනූපගං. අයං භික්ඛවෙ, තතියා ආකිඤ්චඤ්ඤායතනසප්පායා පටිපදා අක්ඛායති.

පුන ච පරං භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති. යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා, යෙ ච දිට්ඨධම්මිකා රූපා යෙ ච සම්පරායිකා රූපා, යා ච දිට්ඨධම්මිකා රූපසඤ්ඤා යා ච සම්පරායිකා රූපසඤ්ඤා, යා ච ආනෙඤ්ජසඤ්ඤා, යා ච ආකිඤ්චඤ්ඤා-යතනසඤ්ඤා, සබ්බා සඤ්ඤා යත්ථෙතා අපරිසෙසා නිරුජ්ඣන්ති. එතං සන්තං එතං පණීතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතන'න්ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුලවිහාරිනො ආයතනෙ චිත්තං පසීදති. සම්පසාදෙ සති එතරහි වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජති, පඤ්ඤාය වා අධිමුච්චති. කායස්ස භෙදා පරම්මරණා ඨානමෙතං විජ්ජති: යං තං සංවත්තනිකං විඤ්ඤාණං අස්ස නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනූපගං, අයං භික්ඛවෙ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසප්පායා පටිපදා අක්ඛායතීති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච : 'ඉධ භන්තෙ. භික්ඛු එවං පටිපන්නො හොති, නො චස්ස, නො ච මෙ සියා, න භවිස්සති, න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමී'ති එවං උපෙක්ඛං පටිලභති. පරිනිබ්බායෙය්‍ය නු ඛො සො භන්තෙ, භික්ඛු න වා පරිනිබ්බායෙය්‍යා'ති.

අපෙත්ථෙකච්චො ආනන්ද, භික්ඛු පරිනිබ්බායෙය්‍ය, අපෙත්ථෙකච්චො භික්ඛු න පරිනිබ්බායෙය්‍යා'ති.

කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙනපෙත්ථෙකච්චො භික්ඛු පරිනිබ්බායෙය්‍ය, අපෙත්ථෙකච්චො භික්ඛු න පරිනිබ්බායෙය්‍යාති.

ඉධානන්ද භික්ඛු එවං පටිපන්නො හොති : 'නො චස්ස, නො ච මෙ සියා. න භවිස්සති. න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමී'ති එවං උපෙක්ඛං පටිලභති. සො තං උපෙක්ඛං අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං උපෙක්ඛං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තං නිස්සිතං හොති විඤ්ඤාණං, තදුපාදානං. සඋපාදානො ආනන්ද, භික්ඛු න පරිනිබ්බායතී'ති.

---

1. කිඤ්චනං නත්ථීති - සීමු, මජසං, PTS.

තවද මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : ' මම කිසි තැනෙක්හි ආත්මය ඇතියෙම් නො වෙමි, කිසි අනෙකක්හට පළිබොධ ඇතියෙම් නො වෙමි, කිසි තැනෙක්හි (මෙරමාගේ ආත්මය) නො ද දක්මි, කිසි තැනෙක්හි මාගේ පළිබොධබවෙක් නැතැ ' යි. මෙසේ පිළිපන් (යට කී පිළිවෙත හා) මේ චතුකොටික ශූන්‍යතාව බහුල කොට වෙසෙන ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි පහදියි. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි රහත්බව හෝ පසක් කෙරෙයි, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට හෝ සමවදී. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහුගේ ප්‍රතිසන්ධියට නිසි විපාකවිඥානය වී නම් ආකිඤ්චඤ්ඤායතන කුශලභාව යට පැමිණියේ වන්නේ යැ. මහණෙනි, මේ තුන්වැනි ආකිඤ්චඤ්ඤායතනසප්පාය ප්‍රතිපදයයි කියනු ලැබෙ.

යළිදු මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාමයෝත් යම් සාම්පරායික කාමයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික කාමසංඥවකුත් යම් සාම්පරායික කාමසංඥවකුත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මිකරූපයෝත් යම් සාම්පරායික රූපයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපසංඥවකුත් යම් සාම්පරායික රූපසංඥවකුත් ඇද්ද, යම් ආනෙඤ්ජ (චතුර්ථධ්‍යාන) සංඥවකුත් ඇද්ද, යම් ආකිඤ්චඤ්ඤායතනසංඥවකුත් ඇද්ද යම් තැනෙක්හි තෙල සියලු සංඥවෝ නිරවශෙෂ වූවාහු නිරුද්ධ වෙත් ද, යම් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙක් ඇද්ද තෙල (අංගශාන්තතායෙන් ද ආලම්බන ශාන්තතායෙන් ද) ශාන්ත යැ, තෙල (අතෘප්තකාර්ථයෙන්) ප්‍රණීත යැ ' යි. මෙසේ පිළිපන් (ඒ සංඥ යටපත් කිරීමෙන්) ඒ පිළිවෙත බහුල කොට වෙසෙන ඔහුගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පහදියි. සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහි මැ රහත්බව හෝ පසක් කෙරෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට හෝ සමවදී. කාබුන් මරණින් මත්තෙහි තෙල කරුණ විද්‍යමාන වෙයි : ' යම් කරුණෙකින් ඒ මහණහු ගේ පිළිසඳගන්නට නිසි විපාකවිඥානය වී නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශලභාවයට පැමිණියේ වන්නේ ය. මහණෙනි, මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසප්පාය ප්‍රතිපද යයි කියනු ලැබෙ යයි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ආනන්ද ' තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ : " වහන්සැ, මෙ සස්නෙහි මහණෙක් මෙසේ පිළිපන්නේ වෙයි : ' ඉදින් මා විසින් (පෙර පස්වැදෑරුම්) කම්වට රැස් නො කරන ලද නම්, මට දැන් (පස්වැදෑරුම්) විවාවට නො ද වන්නේ ය. ඉදින් මෙකල්හි කම්වට රැස් නො කරනු වන්නේ නම්, අනාගතයෙහි මට පස්වැදෑරුම් විවාවට නො වන්නේ ය. ඉහාත්මයෙහි යම් කම්වටක් ඇද්ද භවගත් යම් ස්කන්ධපඤ්චකයක් ඇද්ද, එය දුරු කරමි ' යි මෙසේ විදර්ශනා උපෙක්ෂාව ලබයි. වහන්ස, ඒ මහණ පිරිනිවෙන්නේ දෝ හෝ නොහොත් නො පිරිනිවෙන්නේ දෑ යි.

' ආනන්දය, මෙහි ඇතැම් මහණෙක් පිරිනිවෙන්නේ ද වෙයි, මෙහි ඇතැම් මහණෙක් නො පිරිනිවෙන්නේ ද වෙ ' යයි.

වහන්ස, යම්හෙයෙකින් මෙහි ඇතැම් මහණෙක් පිරිනිවෙන්නේත් වේ ද, මෙහි ඇතැම් මහණෙක් නො පිරිනිවෙන්නේත් වේ ද ඊට හෙතු කවරේ ද ? ප්‍රත්‍යය කවරේ දෑ ' යි.

ආනන්දය, මෙසස්නෙහි මහණ මෙසේ පිළිපන්නේ වෙයි : ' ඉදින් මා විසින් පෙර පස්වැදෑරුම් කම්වට රැස් නො කරන ලද නම්, මෙකල්හි මට පස්වැදෑරුම් විවාවට නො ද වන්නේය. ඉදින් මෙකල්හි පස්වැදෑරුම් කම්වට අනායූහිත වන්නේ නම්, මට අනාගතයෙහි පස්වැදෑරුම් විවාවට නො වන්නේ ය. ඉහාත්මයෙහි යම් කම්වටෙක් ඇද්ද, භූත වූ යම් පඤ්චස්කන්ධයෙක් ඇද්ද, එය දුරු කෙරෙමි ' යි මෙසේ විදර්ශනොපෙක්ෂාව ලබයි. ඒ මහණ ඒ විදර්ශනොපෙක්ෂාව තෘෂ්ණාදෘෂ්ටිඅභිනන්දනායෙන් අභිනන්දනා කෙරෙයි. අභිමානයෙන් බෙණෙයි, බැසගෙන සිටී. ඒ උපෙක්ෂාව අභිනන්දනා කරන අභිමානයෙන් බණනා බැසගෙන සිටුනා ඔහුගේ නිකාන්තිවිඥානය ඒ විදර්ශනාව ඇසුරු කරන ලද වෙයි. ඒ නිකාන්තිවිඥානය ඔහුට උපාදන වෙයි, ආනන්දය, උපාදන (ග්‍රහණ) සහිත වූ මහණ නො පිරිනිවේ ' යයි.

‘කහම්පන සො භන්තෙ, භික්ඛු උපාදියමානො උපාදියතී’ති.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනං ආනන්දාති.

උපාදානසෙට්ඨං කිර සො භන්තෙ, භික්ඛු උපාදියමානො උපාදියතීති.

උපාදානසෙට්ඨං හි සො ආනන්ද, භික්ඛු උපාදියමානො උපාදියති. උපාදානසෙට්ඨං හෙතං ආනන්ද, යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං.

ඉධානන්ද, භික්ඛු එවං පටිපන්නො හොති : නො චස්ස, නො ච මෙ සියා. න භවිස්සති. න මෙ භවිස්සති. යදත්ථි යං භූතං තං පජහාමී’ති. එවං උපෙක්ඛං පටිලභති. සො තං උපෙක්ඛං නාභිනන්දති, නාභිවදති, නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං උපෙක්ඛං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තං නිස්සිතං හොති විඤ්ඤාණං, න තදුපාදානං අනුපාදානො ආනන්ද, භික්ඛු පරිනිබ්බායතීති.

අච්ඡරියං භන්තෙ! අබ්භූතං භන්තෙ! නිස්සාය නිස්සාය කිර නො භන්තෙ, භගවතා ඔඝස්ස නිත්ථරණා අක්ඛාතා. කතමො පන භන්තෙ, අරියො විමොක්ඛොති

ඉධානන්ද, අරියසාවකො භික්ඛු ඉතිපටිසඤ්චික්ඛති : යෙ ච දිට්ඨධම්මිකා කාමා, යෙ ච සම්පරායිකා කාමා, යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා, යා ච සම්පරායිකා කාමසඤ්ඤා යෙ ච දිට්ඨධම්මිකා රූපා, යෙ ච සම්පරායිකා රූපා, යා ච දිට්ඨධම්මිකා රූපසඤ්ඤා, යා ච සම්පරායිකා රූපසඤ්ඤා, යා ච ආනෙඤ්ජසඤ්ඤා, යා ච ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා, යා ච නෙව-සඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා, එස සක්කායො, යාවතා සක්කායො, එතං අමතං යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛො.

ඉති ඛො ආනන්ද, දෙසිතා මයා ආනෙඤ්ජසප්පායා පටිපදා, දෙසිතා ආකිඤ්චඤ්ඤායතනසප්පායා පටිපදා, දෙසිතා නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සප්පායා පටිපදා, දෙසිතා නිස්සාය නිස්සාය ඔඝස්ස නිත්ථරණා, දෙසිතො අරියො විමොක්ඛො. යං ඛො ආනන්ද, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය. කතං වො තං මයා. එතානි ආනන්ද, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ ආනන්ද, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

ආනෙඤ්ජසප්පාය සුත්තං ඡට්ඨං.

වහන්ස, පිළිසඳ ගන්නා ඒ මහණ කොහි වැලිත් පිළිසඳ ගනිද්ද ' යි.

ආනන්දය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය 'යි.

වහන්ස, ඒ මහණ පිළිසඳ ගන්නේ ශ්‍රේෂ්ඨ වූ භවය උපාදනය කෙරෙයි (උත්තම භවයෙහි පිළිසඳ ගනී සේ යි.)

ආනන්දය, පිළිසඳ ගන්නා ඒ මහණ ශ්‍රේෂ්ඨ වූ භවය ම උපාදනය කෙරෙයි. ආනන්දය, යම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙක් ඇද්ද, තෙල ශ්‍රේෂ්ඨ වූ භවය වේ මැ යි.

ආනන්දය, මෙ සස්නෙහි මහණෙක් මෙසේ පිළිපන්නේ වෙයි : ' ඉදින් මා විසින් පෙර පස්වැදෑරුම් කම්වට රැස් නො කරන ලද නම්, මෙ කල්හි, මට පස්වැදෑරුම් විවාවට නො ද වන්නේ ය. ඉදින් මෙකල්හි පස්වැදෑරුම් කම්වට ආයූහිත නො වන්නේ නම්, මට අනාගතයෙහි පස්වැදෑරුම් විවාවට නො වන්නේ ය. ඉහාත්මයෙහි යම් කම්වටෙක් ඇද්ද, භූත වූ යම් පඤ්චස්කන්ධයෙක් ඇද්ද, එය දුරු කෙරෙමි ' යි. මෙසේ විදර්ශනොපේක්ෂාව ප්‍රතිලාභ කෙරෙයි. හේ උපේක්ෂාව තෘෂ්ණාදෘෂ්ටි අභිනන්දනායෙන් අභිනන්දනා නො කෙරෙයි, අභිමාන වශයෙන් නො බෙණෙයි, බැසගෙන නො සිටී. ඒ උපේක්ෂාව අභිනන්දනා නො කරන අභිමානයෙන් නො බණන නො බැසගෙන සිටුනා ඔහුගේ නිකාන්තිවිඥානය ඒ විදර්ශනාව ඇසුරු නො කරන ලද වෙයි. ඒ විඥානය ඔහුට උපාදන නො වෙයි. ආනන්දය, උපාදන රහිත වූ මහණ පිරිනිවේ යයි.

වහන්ස, ආශ්වයර්‍ය යැ, වහන්ස, අද්භූත යැ වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අපට ඒ ඒ සමවත් නිසා ඕඝතරණය වදරන ලද. වහන්ස, යළි ආර්‍ය්‍යවිමොක්ෂය කවරේද්ද' යි.

ආනන්දය, මෙ සස්නෙහි (ශුෂ්කවිදර්ශක වූ) ආර්‍ය්‍යශ්‍රාවක මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : ' යම් දෘෂ්ටධාර්මික කාමයෝත් යම් සාම්පරායික කාමයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික කාමසංඥවකුත් යම් සාම්පරායික කාමසංඥවකුත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපයෝත් සාම්පරායික රූපයෝත් ඇද්ද, යම් දෘෂ්ටධාර්මික රූපසංඥවකුත් යම් සාම්පරායික රූපසංඥවකුත් ඇද්ද, යම් ආනෙඤ්ජසංඥවකුත් යම් ආකිඤ්චඤ්ඤායතනසංඥවකුත් යම් නේවසඤ්ඤානාසඤ්ඤායතනසංඥවකුත් ඇද්ද, යම් පමණ (වට්ට සංඛ්‍යාත) සත්කායයෙක් ඇද්ද, තෙල හැම සත්කාය වෙයි. චිත්තයා ගේ යම් අනුපාද විමොක්ෂයෙක් ඇද්ද තෙල අමෘතයයි (ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි.)

මෙසෙයින් ආනන්දය, මා විසින් ආනෙඤ්ජසප්පාය ප්‍රතිපද දෙසන ලද, ආකිඤ්චඤ්ඤායතනසප්පාය ප්‍රතිපද දෙසන ලද, නේවසඤ්ඤානාසඤ්ඤායතනසප්පාය ප්‍රතිපද දෙසනලද. ඒ ඒ සමවත් නිසා චතුරෝඝ නිස්තරණ දෙසන ලද, ආර්‍ය්‍යවිමෝක්ෂය දෙසන ලද. ආනන්දය, ශ්‍රාවකයනට හිතෛෂී වූ අනුකම්පා කරන ශාස්තෘහු විසින් අනුකම්පා පිණිස යමක් කටයුතු ද, එය තොපට මා විසින් කරන ලද, ආනන්දය, තෙල රුක්මුල් සෙනසුනැ, තෙල ශූන්‍යාගාර සෙනසුනැ, ආනන්දය, (තෙපි) ධ්‍යාන වඩවූ, නහමක් පමා වවූ, පසු වැ නහමක් විපිළිසර ඇත්තාහු වවූ, මේ තොපට අප ගේ අනුසසුන් වේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත දෙශනා කළ සේක, සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ ' යි.

සවැනි ආනෙඤ්ජසප්පාය සූත්‍ර යි.

# 3. 1. 7

## ගණකමොග්ගල්ලාන සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො ගණකමොග්ගල්ලානො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ගණකමොග්ගල්ලානො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච :

සෙය්‍යථාපි භො ගොතම, ඉමස්ස මිගාරමාතු පාසාදස්ස දිස්සති අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා, යදිදං යාව පච්ඡිමා සොපානකළෙබරා[2] ඉමෙසම්පි හි භො ගොතම බ්‍රාහ්මණානං දිස්සති අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා, යදිදං අජ්ඣෙනෙ. ඉමෙසම්පි හි භො ගොතම, ඉස්සාසානං දිස්සති අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා යදිදං ඉස්සත්ථෙ. අම්හාකම්පි හි භො ගොතම, ගණකානං ගණනාජීවානං[3] දිස්සති අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා, යදිදං සඞ්ඛානෙ. මයං හි භො ගොතම, අන්තෙවාසී ලභිත්වා පඨමං එවං ගණාපෙම : එකං එකකං, ද්වෙ දුකා, තීණි තිකා, චත්තාරි චතුක්කා, පඤ්ච පඤ්චකා, ඡ ඡක්කා, සත්ත සත්තකා, අට්ඨ අට්ඨකා, නව නවකා, දස දසකාති; සතම්පි මයං භො ගොතම, ගණාපෙම. භිය්‍යොපි ගණාපෙම සක්කා නු ඛො භො ගොතම, ඉමස්මිම්පි ධම්මවිනයෙ එවමෙව අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා පඤ්ඤාපෙතු’න්ති.

සක්කා බ්‍රාහ්මණ, ඉමස්මිම්පි ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා පඤ්ඤාපෙතුං. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, දක්ඛො අස්සදම්මකො භද්‍රං අස්සාජානීයං ලභිත්වා පඨමෙනෙව මුඛාධානෙ කාරණං කාරෙති. අථ උත්තරිං කාරණං කාරෙති. එවමෙව ඛො බ්‍රාහ්මණ, තථාගතො පුරිසදම්මං[4] ලභිත්වා පඨමං එවං විනෙති : ‘එහි ත්වං භික්ඛු, සීලවා හොහි පාතිමොක්ඛසංවරසංවුතො විහරාහි ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛස්සු සික්ඛාපදෙසූ’ති.

යතො ඛො බ්‍රාහ්මණ, භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. තමෙනං තථාගතො උත්තරිං විනෙති: ‘එහි ත්වං භික්ඛු, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොහි, චක්ඛුනා රූපං දිස්වා මා නිමිත්තග්ගාහී හොහි මානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජාහි. රක්ඛාහි චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජාහි. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මා නිමිත්තග්ගාහී හොහි මානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජාහි. රක්ඛාහි මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජාහී’ති.

---

1. සාරණීයං – මජසං.
2. පච්ඡිමසොපානකලෙබරා – සීමු.
3 ගණානං ගණනාජීවානං – PTS.
4. පුරිසධම්මං – සීමු.

# 3. 1. 7

## ගණකමොග්ගල්ලාන සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වෙත පූර්වාරාම නම් වූ මිගාරමාතුප්‍රාසාදයෙහි වැඩවසන සේක. එකල්හි ගණකමොග්ගල් ලාන බමුණු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හිත. එකත්පස් වැ හුන් ගණකමොග්ගල්ලාන බමුණු භාග්‍යවතුන් වහන්සේට තෙල කී :

භවත් ගෞතමයෙනි, මේ මුවරමා පහය පිළිබඳ කොට යම් පරිදි යම් අනුපූර්වශික්ෂා යෙක් අනුපූර්වක්‍රියායෙක් අනුපූර්වප්‍රතිපදයෙක් පැනේ ද, භවත් ගෞතමයෙනි, මේ බමුණන් ගේ ද මේ අධ්‍යයනයෙහි ද අනුපූර්වශික්ෂායෙක් අනුපූර්වක්‍රියායෙක් අනුපූර්වප්‍රතිපදයෙක් පැනේ. භවත් ගෞතමයෙනි, මේ ධනුර්ධරයන්ගේ ද මේ ආයුධශිල්පයෙහි අනුපූර්ව ශික්ෂායෙක් අනුපූර්වක්‍රියායෙක් අනුපූර්වප්‍රතිපදයෙක් පැනෙයි. භවත් ගෞතමයෙනි, ගණනයෙන් ජීවිකා කරන අප ගණකයනුදු ගේ මේ ගණනායෙහි අනුපූර්වශික්ෂායෙක් අනුපූර්වක්‍රියායෙක් අනුපූර්වප්‍රතිපදයෙක් පැනේ. භවත් ගෞතමයෙනි, අපි අතැවැස්සන් ලැබැ පළමුව ලා මෙසේ ගණනා කරම්හ. එක එකකය, දෙක ද්විකය, තුන ත්‍රිකය, සතර චතුෂ්කය, පස පඤ්චකය, සය ෂට්කය, සත සප්තකය, අට අෂ්ටකය, නවය නවකය, දසය දශකය ' යි. භවත් ගෞතමයෙනි, අපි සියය ද ගණනා කරවම්හ. ඉන් වැඩියකුදු ගණනා කරවම්හ. භවත් ගෞතමයෙනි, මෙ සස්නෙහි දු එපරිදි ම අනුපූර්වශික්ෂා අනුපූර්ව ක්‍රියා අනුපූර්වප්‍රතිපද පනවා ලන්නට හැක්කාව ?

බමුණ, මෙ සස්නෙහි දු අනුපූර්වශික්ෂා අනුපූර්වක්‍රියා අනුපූර්වප්‍රතිපත් පනවන්නට හැක්ක. බමුණ, යම් පරිදි දක්ෂ අස්දම්සැරියෙක් භද්‍ර සෛන්ධවයකු ලැබ පළමු කොට ම මුවවළලුයෙහි කාරණා කෙරේ ද, නැවත මතුයෙහි කාරණා කෙරේ ද බමුණ එපරිදිම තථාගත දමිය යුතු පුරුෂයකු ලැබැ පළමු කොට මෙසේ විනයන කෙරෙයි : ' මහණ, තො එ, සිල්වත් ව, ප්‍රාතිමොක්ෂසංවර සංවෘත ව ආචාරගොචර සම්පන්න ව අණුමාත්‍ර වරදෙහි දු බිය දක්නාසුලු ව වාස කරව. සමාදන්වැ සිකපදයෙහි හික්මෙව ' යි.

බමුණ, යම් කලෙක මහණ සිල්වත් වේ ද, ප්‍රාතිමොක්ෂසංවරසංවෘත ව ආචාර ගොචර සම්පන්න ව අණුමාත්‍ර වරදෙහි බිය දක්නාසුලු ව වාස කෙරේ ද, සමාදන් ව සිකපද යෙහි හික්මේ ද, තථාගත තුලුන් මතුයෙහි විනයන කෙරෙයි : ' මහණ, තො එ, ඉන්ද්‍රි යෙහි ගුප්තද්වාර වව, ඇසින් රූප දැක නිමිත්තග්‍රාහී නො වව, අනුව්‍යඤ්ජනග්‍රාහී නො වව, යමක් හෙතු කොටගෙන චක්‍ෂුරින්ද්‍රියයෙහි අසංවෘත ව වාස කරන තෙල මහණහු අභිධ්‍යා දෞර්මනස්‍යපාපකඅකුශලධර්මයෝ ලුහුබැඳ යෙත් ද, ඒ චක්‍ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදුව, චක්‍ෂුරින්ද්‍රිය රක්ව, චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව, කනින් ශබ්ද අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධ ආඝ්‍රාණය කොට . . . දිවින් රස ආස්වාද කොට . . . කයින් පහස් ස්පර්ශ කොට . . . සිතින් ධර්ම දැන නිමිත්තග්‍රාහී නො වව, අනුව්‍යඤ්ජනග්‍රාහී නො වව, යමක් හේතු කොටගෙන මනින්ද්‍රිය අසංවෘත කොට වාස කරන තෙල මහණහු අභිධ්‍යාදෞර්මනස්‍ය පාපක අකුශලධර්මයෝ ලුහුබැඳ යෙත් ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදුව, මනින්ද්‍රිය රක්ව, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව ' යි.

යතො ඛො බ්‍රාහ්මණ, භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති: 'එහි ත්වං භික්ඛු, භොජනෙ මත්තඤ්ඤූ හොහි. පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙය්‍යාසි. නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසු විහාරො චා'ති.

යතො ඛො බ්‍රාහ්මණ, භික්ඛු භොජනෙ මත්තඤ්ඤූ හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති: 'එහි ත්වං භික්ඛු, ජාගරියං අනුයුත්තො විහරාහි, දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍යාසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහී'ති.

යතො ඛො බ්‍රාහ්මණ, භික්ඛු ජාගරියං අනුයුත්තො හොති තමෙනං තථාගතො උත්තරිං විනෙති 'එහි ත්වං භික්ඛු, සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොහි 'අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී'ති.

යතො ඛො බ්‍රාහ්මණ, භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති: 'එහි ත්වං භික්ඛු, විවිත්තං සෙනාසනං භජ[1] අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජ'න්ති. සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති, බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථිනමිද්ධා චිත්තං පරිසොධෙති උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති. අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

---

1. භජාහි - සීමු, මජසං.

බමුණ, යම් කලෙක මහණ ඉන්ද්‍රියයෙහි ගුප්තද්වාර වේ ද, තථාගත තෙල මහණහු මතු විනයන කෙරෙයි. ' මහණ, තො එ, භොජනයෙහි මාත්‍රඥ වව, නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට අහර වළඳ කරව, දවය පිණිස නො වෙයි, මදය පිණිස නො වෙයි, මණ්ඩනය පිණිස නො වෙයි, විභූෂණය පිණිස නො වෙයි, හුදෙක් මේ කරජකායයාගේ ස්ථිතිය පිණිස යාපනය පිණිස විහිංසොපරති පිණිස බ්‍රහ්මචරියානුග්‍රහය පිණිස ම වෙයි. මෙසේ පුරාණ වෙදනා ද නස්මි, නවවෙදනා ද නො උපදවමි, මාගේ ජීවිත යාත්‍රා ද වෙයි, අනවද්‍යතා ඵාසුවිහාර ද වෙති, කියායි.

බමුණ, යම් කලෙක මහණ භොජනයෙහි මාත්‍රඥ වේ ද, තථාගත තෙල මහණහු මතුයෙහි විනයන කෙරෙයි. ' මහණ, තො එ, නිදි වැරීමෙහි අනුයුක්ත ව වාස කරව, දවහල්කල චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යයෙන් සිත් අවුරන දහමින් සිත පිරිසිදු කරව, රෑකල පෙරයම්හි චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යායෙන් සිත් අවුරන දහමින් සිත පිරිසිදු කරව, රෑකල මැදියම පයෙහි පය හයාතබා ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව උත්ථානසංඥා මෙනෙහි කොටගෙන දකුණුඇළයෙන් සිංහශය්‍යා කරව, රෑකල පැසුළුයමැ හොත් අස්නෙන් නැගී සිට චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යායෙන් සිත් අවුරන දහමින් සිත පිරිසිදු කරව, කියායි.

බමුණ, යම් කලෙක මහණ නිදි වැරීමෙහි අනුයුක්ත වේ ද, තථාගත තෙල මහණහු මතුයෙහි විනයන කෙරෙයි : ' මහණ, තො එ, ස්මෘතිසම්ප්‍රඥානයෙන් සමන්වාගත වව, ඉදිරියට යෑමෙහි පෙරළා ඊමෙහි සම්ප්‍රඥානයෙන් කරනසුලු වව, ඉදිරිපස බැලීමෙහි අනුදික් බැලීමෙහි නුවණින් කරනසුලු වව, (පර්යන්) හැකිළීමෙහි දිගුකිරීමෙහි නුවණින් කරනසුලු වව, සඟළපාසිවුරු ධැරීමෙහි නුවණින් කරනසුලු වව, භොජනයෙහි පානයෙහි කෑමෙහි රස විඳීමෙහි නුවණින් කරනසුලු වව, සුළුවටන් මහවටන් කිරීමෙහි නුවණින් කරනසුලු වව, ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි ශයනයෙහි නිදි වැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි නුවණින් කරනසුලු වව ' යි කියායි.

බමුණ යම් කලෙක මහණ ස්මෘතිසම්ප්‍රඥානයෙන් සමන්වාගත වේ ද, තථාගත තෙල මහණ මතුයෙහි විනයන කෙරෙයි : ' මහණ, තො එ, ජනශූන්‍ය සෙනසුන් භජනය කරව, අරණ්‍ය ය වෘක්ෂමූල ය පර්වත ය කඳුර ය ගිරිගුහා ය ශ්මසාන ය වානප්‍රස්ථ ය අභ්‍යවකාශ ය පලාලපුඤ්ජය යන මේ යි. හේ අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුර ගිරිගුහා ශ්මසාන වානප්‍රස්ථ අභ්‍යවකාශ පලාලපුඤ්ජ යන විවික්ත ශයනාසන භජන කෙරෙයි.

හේ පසුබත පිඩුවායෙන් වැළැකියේ පලක් බැඳ උඩුකය සෘජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා තබාගෙන හිඳුනේ ය. හේ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යා හැරපියා පැහූ අභිධ්‍යා ඇති සිතින් වාස කෙරෙයි. අභිධ්‍යායෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාදප්‍රදෙවෂ හැරපියා අව්‍යාපන්නචිත්ත ව සර්වසත්ව හිතානුකම්පී ව වාස කෙරෙයි. ව්‍යාපාදප්‍රද්වෙෂයෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය පියා පැහූ ස්ත්‍යානමිද්ධ ඇති ව ආලොකසංඥා ඇති ව ස්මෘතිමත් ව නුවණින් දන්මින් වාස කෙරෙයි, ස්ත්‍යානමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චය හා කුක්කුච්චය හැරපියා අනුද්ධත ව අධ්‍යාත්මයෙහි උපශාන්ත සිත් ඇති ව වාස කෙරෙයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡා පියා තරණය කළ විචිකිත්සා ඇති ව කුසල්දහම්හි කථංකථා රහිත ව වාස කෙරෙයි. විචිකිත්සායෙන් සිත පිරිසිදු කෙරෙයි.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1] උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[2] උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති, උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති. තං තතියං ඣානං[3] උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[4] උපසම්පජ්ජ විහරති.

යෙ ඛො තෙ බ්‍රාහ්මණ, භික්ඛූ සෙඛා[5] අප්පත්තමානසා[6] අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තෙසු මෙ අයං එවරූපී අනුසාසනී හොති: 'යෙ පන තෙ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසඤ්ඤොජනා සම්මදඤ්ඤා විමුත්තා. තෙසං ඉමෙ ධම්මා දිට්ඨධම්මසුඛවිහාරාය චෙව සංවත්තන්ති සතිසම්පජඤ්ඤාය චා'ති.

එවං වුත්තෙ ගණකමොග්ගල්ලානො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: 'කින්නු ඛො භොතො ගොතමස්ස සාවකා භොතා ගොතමෙන එවං ඔවදියමානා එවං අනුසාසියමානා සබ්බෙව අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති, උදාහු එකච්චෙ නාරාධෙන්තී'ති?

අප්පෙකච්චෙ ඛො බ්‍රාහ්මණ, මම සාවකා මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති, එකච්චෙ නාරාධෙන්තී'ති.

කො නු ඛො භො ගොතම, හෙතු, කො පච්චයො, යං තිට්ඨතෙව නිබ්බානං, තිට්ඨති නිබ්බානගාමිමග්ගො, තිට්ඨති භවං ගොතමො සමාදපෙතා, අථ ච පන භොතො ගොතමස්ස සාවකා භොතා ගොතමෙන එවං ඔවදියමානා එවං අනුසාසියමානා අප්පෙකච්චෙ අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති, එකච්චෙ නාරාධෙන්තී'ති.

තෙන හි බ්‍රාහ්මණ, තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි. 'තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, කුසලො ත්වං රාජගහගාමිස්ස මග්ගස්සා'ති?

එවං භො, කුසලො අහං රාජගහගාමිස්ස මග්ගස්සා'ති.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, ඉධ පුරිසො ආගච්ඡෙය්‍ය රාජගහං ගන්තුකාමො, සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: 'ඉච්ඡාමහං භන්තෙ, රාජගහං ගන්තුං, තස්ස මෙ රාජගහස්ස මග්ගං උපදිසා'ති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: 'එහම්භො පුරිස, අයං මග්ගො රාජගහං ගච්ඡති, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි අමුකං නාම ගාමං, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි අමුකං නාම නිගමං, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි රාජගහස්ස ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යක'න්ති. සො තයා එවං ඔවදියමානො එවං අනුසාසියමානො උම්මග්ගං ගහෙත්වා පච්ඡාමුඛො ගච්ඡෙය්‍ය.

---

1. පඨමජ්ඣානං - සිමු, PTS.
2. දුතියජ්ඣානං - සිමු, PTS.
3. තතියජ්ඣානං - සිමු, PTS.
4. චතුත්ථජ්ඣානං - සිමු, PTS
5. සෙක්ඛා - සිමු, මජසං.
6. අපත්තමානසා - සිමු, මජසං.

ඒ මහණ චිත්තොපක්ලෙශ වන ප්‍රඥාව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් හැරපියා කාමයෙන් වෙන්ව මැ අකුශල ධර්මයෙන් වෙන්ව සවිතර්ක සවිචාර වූ විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. විතර්කවිචාරයන් සන්හිඳීමෙන් සිය සතන්හි පැහැදීම් කරන සිත පිළිබඳ එකොදිභාව ඇති අවිතර්ක අවිචාර වූ සමාධියෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යාන උපයාගෙන වාස කෙරෙයි. ප්‍රීතිවිරාග යෙනුදු උපෙක්ෂක ව ස්මෘතිමත් ව නුවණින් දන්මින් වාස කෙරෙයි, නාමකයින් සුඛය ද විඳියි. ආර්‍යයෝ ' උපෙක්ෂක යැ ස්මෘතිමත් යැ සුඛවිහාරී යයි යම් තෘතීයධ්‍යානයක් ගෙන කියත් ද, ඒ තුන්වන දෑහැන් උපයා වාස කෙරෙයි. සුඛයාගේ ප්‍රහාණයෙනුදු දුඃඛයාගේ ප්‍රහාණයෙනුදු කැලම සෞමනස්‍ය දෞර්මනස්‍යයන් අස්තයට යැමෙන් අදුඃඛ අසුඛ වූ උපෙක්ෂායෙන් ජනිත ස්මෘතිපරිශුද්ධභාව ඇති චතුර්ථධ්‍යාන උපයා වාස කෙරෙයි.

බමුණ, යම් මහණ කෙනෙක් ශෛක්ෂ ව අර්හත්වයට නො පැමිණි සිත් ඇති ව අනුත්තර යොගක්ෂේමය පතමින් වාස කෙරෙත් ද, උන් කෙරෙහි මාගේ මේ මෙබඳු අනුශාසනා වෙයි : ' අර්හත් වූ ක්ෂීණාස්‍රව වූ වැස නිමකළ බඹසර ඇති කළ කරණී ඇති බහාතැබූ කෙලෙස්බර ඇති ලැබූ ස්වාර්ථ ඇති පරික්ෂීණ භවසංයොජන ඇති මොනොවට දත කෙලෙසුන් කෙරෙන් මිදුණු යම් මහණ කෙනෙක් ඇද්ද, ඔවුනට මේ දහම්හු ඉහාත්ම සුඛවිහාර පිණිසත් ස්මෘති සම්ප්‍රජන්‍යය පිණිසත් වැටෙති ' වදළ සේක.

මෙසේ වදළ කල ගණකමුගලන් බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළේ : 'කිමෙක! භවත් ගෞතමයන්ගේ සව්වෝ භවත් ගෞතමයන් විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු හැම දෙනම අත්‍යන්ත නිෂ්ඨා සංඛ්‍යාත නිර්වාණය ආරාධනා කෙරෙත් ද ? නොහොත් නො එසේ වුව, කෙනෙක් ආරාධනා නො කෙරෙත් ද ' යි.

බමුණ, මා විසින් මෙසේ අවවාද කරනු ලබන මෙසේ අනුශාසනා කරනු ලබන මාගේ ඇතැම් සව්වෝ අත්‍යන්තනිෂ්ඨා සංඛ්‍යාත නිර්වාණය ආරාධනා කෙරෙත්, කෙනෙක් ආරාධනා නො කෙරෙත් යයි වදළෝ.

භවත් ගෞතමයෙනි, යම්හෙයෙකින් නිවන් ඇත්තේ ම වේ ද, නිවන්මඟ ඇද්ද, සමාදන් කරවන භවත් ගෞතමයෝ ඇද්ද, වැලිත් භවත් ගෞතමයන් විසින් මෙසේ අවවාද කරනු ලබන මෙසේ අනුශාසනා කරනු ලබන භවත් ගෞතමයන්ගේ ඇතැම් සව්වෝ අත්‍යන්තනිෂ්ඨා සංඛ්‍යාත නිර්වානය ආරධනා කෙරෙත් නම්, කෙනෙක් ආරාධනා නො කෙරෙත් නම් එයට හෙතු කවරේ යැ ? ප්‍රත්‍යය කවරේ යැ ?

බමුණ, එකරුණෙන් මෙහි ලා තා මැ පුළුවුස්මි : යම් පරිදි තට රුස්නේ නම් එපරිදි එය පවසාලව. බමුණ, ඒ කෙසේ හඟනාව, තෝ රජගහනුවර කරා යන මඟ කියන්නට දක්ෂයෙහි? යි වදළෝ.

භවත්නි, එසේ යැ, මම රජගහ කරා යන මඟට දක්ෂයෙමි ' කී.

බමුණ, එ කෙසේ හඟිහි, පුරුෂයෙක් රජගහ යනු කැමැති ව එන්නේ ය, හේ තා කරා එළැඹ මෙසේ බණෙයි : 'වහන්ස. මම රජගහ වදනට කැමැතියෙමි, මට රජගහනුවරට මං දක්වයි, තෝ තෙල පුරුෂ හට මෙසේ කියන්නෙහි, එම්බා පුරුෂය, එ, මෙ මඟ රජගහ නුවරට යේ, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් මෙ නම් ගම දක්නෙහි, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් මෙනම් නියම්ගම දක්නෙහි, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් රජගහනුවර අරම්රමණිය වනරමණිය බිම්රමණිය පොකුණුරමණීය දක්නෙහි ' යි. ඒ පුරුෂ තා විසින් මෙසේ අවවාද කරනු ලබනුයේ මෙසේ අනුශාසනා කරනු ලබනුයේ උන්මාර්ගයක් ගෙන පශ්චාත්-මුඛ ව යන්නේ ය.

අථ දුතියො පුරිසො ආගච්ඡෙය්‍ය රජගහං ගන්තුකාමො. සො තං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: 'ඉච්ඡාමහං භන්තෙ, රජගහං ගන්තුං. තස්ස මෙ රජගහස්ස මග්ගං උපදිසා'ති. තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: එහම්භො පුරිස, අයං මග්ගො රජගහං ගච්ඡති, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි අමුකං නාම ගාමං, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි අමුකං නාම නිගමං, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි රජගහස්ස ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. සො තයා එවං ඔවදියමානො එවං අනුසාසියමානො සොත්ථිනා රජගහං ගච්ඡෙය්‍ය.

කො නු ඛො බ්‍රාහ්මණ, හෙතු, කො පච්චයො, යං තිට්ඨතෙව රජගහං තිට්ඨති රජගහගාමී මග්ගො, තිට්ඨති ත්වං සමාදපෙතා. අථ ච පන තයා එවං ඔවදියමානො එවං අනුසාසියමානො එකො පුරිසො උම්මග්ගං ගහෙත්වා පච්ඡාමුඛො ගච්ඡෙය්‍ය. එකො සොත්ථිනා රජගහං ගච්ඡෙය්‍යා'ති?

එත්ථ ක්‍යාහං භො ගොතම කරෙමි, මග්ගක්ඛායීහං භො ගොතමා'ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, තිට්ඨතෙව නිබ්බානං, තිට්ඨති නිබ්බානගාමීමග්ගො, තිට්ඨාමහං සමාදපෙතා, අථ ච පන මම සාවකා මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අප්පෙකච්චෙ අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති, එකච්චෙ නාරාධෙන්ති. එත්ථ ක්‍යාහං බ්‍රාහ්මණ, කරෙමි? මග්ගක්ඛායීහං බ්‍රාහ්මණ, තථාගතො'ති.

එවං වුත්තෙ ගණකමොග්ගල්ලානො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: 'යෙමෙ භො ගොතම, පුග්ගලා අස්සද්ධා ජීවිකත්ථා[1] අගාරස්මා අනගාරියං පබ්බජිතා සඨා මායාවිනො කෙටුභිනො[2] උද්ධතා උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාර භොජනෙ අමත්තඤ්ඤුනො ජාගරියං අනනුයුත්තා සාමඤ්ඤෙ අනපෙක්ඛවන්තො[3] සික්ඛාය න තිබ්බගාරවා බාහුලිකා[4] සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා කුසීතා හීනවිරියා මුට්ඨස්සතිනො අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා දුප්පඤ්ඤා එළමූගා, න තෙහි භවං ගොතමො සද්ධිං සංවසති.

යෙ පනමෙ කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතා අසඨා අමායාවිනො අකෙටුභිනො අනුද්ධතා අනුන්නළා අචපලා අමුඛර අවිකිණ්ණවාචා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාර භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තා සාමඤ්ඤෙ අපෙක්ඛවන්තො සික්ඛාය තිබ්බගාරවා න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා ආරද්ධවිරියා පහිතත්තා උපට්ඨිතසතිනො සම්පජානා සමාහිතා එකග්ගචිත්තා පඤ්ඤවන්තො[5] අනෙළමූගා, තෙහි භවං ගොතමො සද්ධිං සංවසති.

---

1. ජීවිකත්ථා න සද්ධා - මජ්සං.
2. කෙතබිනො - මජ්සං
3. අනපෙඛවන්තො - PTS.
4. බාහුල්ලිකා - සයා,
5. පඤ්ඤවන්තො - සිමු.

නැවත රජගහ යනු කැමැති දෙවන පුරුෂයෙක් එන්නේ ය, හේ තා වෙත එළැඹ මෙසේ බෙණෙයි : ' වහන්ස, මම රජගහ යන්නට කැමැතියෙමි, මට රජගහනුවරට මං කියව ' යි. තෝ තෙල පුරුෂ හට මෙසේ කියහි, ' එම්බා පුරුෂය, එ, මේ මඟ රජගහ නුවරට යෙයි, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් මෙනම් ගම දක්නෙහි, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් මෙනම් නියම්ගම දක්නෙහි, එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් රජගහනුවර අරම්රමණිය වනරමණිය බිම්රමණිය පොකුණුරමණිය දක්නෙහි ' යි. හේ තා විසින් මෙසේ අවවාද කරනු ලබනුයේ මෙසේ අනුශාසනා කරනු ලබනුයේ සුවසේ රජගහනුවරට යන්නේ ය.

බමුණ, රජගහනුවර ඇත් මැ යැ, රජගහනුවර යන මඟ ඇත් මැ යැ, සමාදන් කරවන තොයිත් ඇත් මැ යැ, වැලි තා විසින් මෙසේ අවවාද කරනු ලබන මෙසේ අනුශාසනා කරනු ලබන එක් පුරුෂයෙක් උන්මාර්ග ගෙන පශ්චාත්මුඛ ව යන්නේ යැ. එකෙක් සුවසේ රජගහනුවර යන්නේයැ, ඊට හෙතු කිම ? ප්‍රත්‍යය කිමැ ' යි.

භවත් ගෞතමයෙනි, මෙහි ලා මම කුම් කෙරෙම් ද ? භවත් ගෞතමයෙනි, මම මඟ කියන සුල්ලෙමි.

එසෙයින් මැ බමුණ, නිවන් ඇත් මැ යැ, නිවන් යන මඟ ඇත් මැ යැ, සමාදන් කරවන මම් සිටිම් මැ යැ. එතෙකුදුවත් මාගේ සව්වෝ මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු ඇතැම් කෙනෙක් අත්‍යන්තනිෂ්ඨා වූ නිර්වාණය සම්පාදනය කෙරෙති, ඇතැම් කෙනෙක් සම්පාදනය නො කෙරෙත්. බමුණ, මෙහි ලා මම් කුම් කෙරෙම් ද ? බමුණ, මම් මඟ පවසන තථාගතයෙමි.

මෙසේ වදළ කල්හි ගණකමොග්ගල්ලාන බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : '' භවත්ගෞතමයෙනි, යම් පුද්ගල කෙනෙක් ශ්‍රද්ධා නැත්තාහු ජීවිකාව ප්‍රයොජන කොට ඇති ව ගිහිගෙන් නික්ම සස්නට පැමිණියාහු ශඨ වූවාහු මායා ඇත්තාහු වඤ්චක වූවාහු උඩඟු වූවාහු නැඟුණු මානනළ ඇත්තාහු චපල වූවාහු දෙඩමලු වූවාහු විසුරුණු වචන ඇත්තාහු ඉඳුරන්හි නො පියූ දෙර ඇත්තාහු භෝජනයෙහි අමාත්‍ර වූවාහු ජාගර්‍ය්‍යායෙහි නොයෙදුණාහු ශ්‍රාමණ්‍යයෙහි අපේක්ෂා නැත්තාහු ශික්ෂායෙහි තීව්‍රගෞරව නැත්තාහු ප්‍රත්‍යය බහුල කොට ඇත්තාහු සස්න ලිහිල් කොට ගත්තාහු පඤ්චනීවරණයෙහි පෙරදැරි වූවාහු ප්‍රවිවෙකයෙහි හළ වීර්‍ය්‍ය ඇත්තාහු කුසීත වූවාහු හීන වීර්‍ය්‍ය ඇත්තාහු මුඨස්මෘති ඇත්තාහු සම්‍යග්ඥාන නැත්තාහු අසමාහිත වූවාහු විභ්‍රාන්ත සිත් ඇත්තාහු දුෂ්ප්‍රාඥ වූවාහු කෙළතොලු වූවාහු වෙත් ද, භවත් ගෞතමයෝ ඔවුන් සමග සංවාස නො කෙරෙති.

යළි යම් කුලපුත්‍ර කෙනෙක් සැදැහැති ව ගිහිගෙන් නික්ම සස්නට පැමිණියාහු ශඨ නොවූවාහු මායාවී නො වූවාහු වඤ්චක නො වූවාහු අනුද්ධත වූවාහු උද්ගත මානනළ නැත්තාහු චපල නො වූවාහු මුඛර නො වූවාහු අවිකීර්ණ වචන ඇත්තාහු ඉඳුරන් හි පියූ දෙර ඇත්තාහු භොජනයෙහි මාත්‍රඥ වූවාහු ජාගර්‍ය්‍යායෙහි යෙදුණාහු ශ්‍රාමණ්‍යයෙහි අපෙක්ෂා වත් වූවාහු ශික්ෂායෙහි තීව්‍රගෞරව ඇත්තාහු බාහුලික නොවූවාහු සාථලික නො වූවාහු පඤ්චනීවරණයෙහි නික්ෂිප්තධුර ඇත්තාහු ප්‍රවිවෙකයෙහි පූර්වඞ්ගම වූවාහු ආරබ්ධ වීර්‍ය්‍ය ආත්තාහු නිවනට මෙහෙයූ සිත් ඇත්තාහු එළඹසිටි සිහි ඇත්තාහු සම්‍යග්ඥාන ඇත්තාහු සමාහිත වූවාහු එකඟ සිත් ඇත්තාහු ප්‍රඥවත් වූවාහු එළමුග නො වූවාහු වෙත් ද, භවත් ගෞතමයෝ ඔවුන් සමග සංවාස කෙරෙත්.

8—ඒ 00502 (8/73)

සෙය්‍යථාපි භො ගොතම, යෙ කෙචි මූලගන්ධා, කාලානුසාරිකං[1] තෙසං අග්ගමක්ඛායති. යෙ කෙචි සාරගන්ධා, ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති. යෙ කෙචි පුප්ඵගන්ධා, වස්සිකං තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භොතො ගොතමස්ස ඔවාදො පරමජ්ජධම්මෙසු.

'අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ගණක මොග්ගල්ලාන සුත්තං සත්තමං.

---

1. කාලානුසාරී - සීමු, මජසං.

යම්සේ භවත් ගෞතමයෙනි, යම් කිසි මූලගන්ධ කෙනෙක් ඇද්ද, ඔවුනතුරෙන් කළුඅගිල් අග්‍ර යයි කියනු ලැබෙයි. යම් කිසි සාරගන්ධ කෙනෙක් ඇද්ද, ඔවුනතුරෙන් ලොහිත චන්දන අග්‍ර යයි කියනු ලැබෙයි, යම් කිසි පුෂ්පගන්ධ කෙනෙක් ඇද්ද ඔවුනතුරෙන් දුසමන් අග්‍රයයි කියනු ලැබෙයි. එසෙයින් ම ෂට්ශාස්තෘධර්මයන් කෙරෙහි භවත් ගෞතමයන් ගේ (අව) වාදය උත්තම වෙයි.

භවත් ගෞතමයෙනි, ඉතා කාන්තය, භවත් ගෞතමයෙනි, ඉතා කාන්තය, යම්සේ භවත් ගෞතමයෙනි, යටිහුරු කරන ලද්දක් උඩුහුරු කරන්නේ හෝ වේ ද, ප්‍රතිච්ඡන්න වූවක් විවර කරන්නේ හෝ වේ ද, මුළාවූවක්හට මඟ කියන්නේ හෝ වේ ද, ' ඇස් ඇත්තෝ රූප දකිත් ව ' යි අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ හෝ වේද, එසෙයින් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් අනේකප්‍රකාරයෙන් දහම් පවසන ලද. තෙල මම් භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසංඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද ආදි කොට දිවිහිම් ව සරණ ගිය උපාසකයකු කොට ධරන සේක්වා ' යි.

සත්වැනි ගණකමොග්ගල්ලාන සූත්‍ර යි.

# 3. 1. 8

## ගොපකමොග්ගල්ලාන සුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ආනන්දො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ අචිරපරිනිබ්බුතෙ භගවති. තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජගහං පටිසඞ්ඛාරාපෙති රඤ්ඤො පජ්ජොතස්ස ආසඞ්කමානො. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය රාජගහං පිණ්ඩාය පාවිසි.

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: 'අතිප්පගො ඛො තාව රාජගහං[1] පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන ගොපකමොග්ගල්ලානස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො, යෙන ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො, තෙනුපසඞ්කමෙය්‍ය'න්ති. අථ ඛො ආයස්මා ආනන්දො යෙන ගොපකමොග්ගල්ලානස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො, යෙන ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො, තෙනුපසංකමි. අද්දසා ඛො ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං ආනන්දං එතදවොච:

'එතු ඛො භවං ආනන්දො, ස්වාගතං භොතො ආනන්දස්ස, චිරස්සං ඛො භවං ආනන්දො ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භවං ආනන්දො, ඉදමාසනං පඤ්ඤත්ත'න්ති. නිසීදි ඛො ආයස්මා ආනන්දො පඤ්ඤත්තෙ ආසනෙ. ගොපකමොග්ගල්ලානොපි ඛො බ්‍රාහ්මණො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං එතදවොච:

අත්ථි නු ඛො භො ආනන්ද[2], එකභික්ඛුපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො, යෙහි ධම්මෙහි සමන්නාගතො සො භවං ගොතමො අහොසි අරහං සම්මාසම්බුද්ධො'ති.

නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො, යෙහි ධම්මෙහි සමන්නාගතො සො භගවා අහොසි අරහං සම්මාසම්බුද්ධො. සො හි බ්‍රාහ්මණ, භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා'ති.

1. රාජගහෙ – සිමු, මජසං, ස්‍යා.
2. අත්ථි ඛො ආනන්ද – PTS.

# 3. 1. 8
# ගෝපකමොග්ගල්ලාන සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි නොබෝ කාලයෙහි රජගහනුවර කලන්දකනිවාප නම් වේළුවනයෙහි වාස කෙරෙති. තවද එසමයෙහි වේදේහිපුත්‍ර වූ අජාතසත්තු නම් මගධදෙශයෙහි රජ ප්‍රද්‍යොත රජුට සැක කෙරෙමින් රජගහනුවර ප්‍රතිසංස්කරණ කරවයි. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු කාලයෙහි හැදපෙරෙවැ පාසිවුරු ගෙන රජගහ නුවරට පිඩු පිණිස පිවිසියහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙසේ සිත් විය : ' රජගහනුවර පිඩු සිඟා යන්නට තව ඉතා උදෑසන වෙයි. මම ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණයා ගේ කර්මාන්ත ස්ථානය යම් තැනෙක්හි ද ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ යම් තැනෙක්හි ද එහි එළැඹෙම් නම් මැනැවැ ' යි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණයා ගේ කර්මාන්තස්ථානයෙහි ගෝපකමොග්ගල්ලාන බමුණු වෙත එළැඹියහ. ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ දුරින් මැ වඩනා ආයුෂ්මත් ආනන්ද තෙරුන් දුටුයේ ය, දැක ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මෙසේ කී :

' භවත් ආනන්දයෝ පැමිණෙත්වා, භවත් ආනන්දයනට ස්වාගත යැ, භවත් ආනන්දයෝ මෙහි පැමිණීමෙන් බොහෝ කලෙකින් මේ පරියාය කළහ. භවත් ආනන්දයෝ වැඩ හිඳිත්වා, මේ අසුන් පනවන ලද ' යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පැනැවූ අස්නෙහි වැඩහුන්හ. ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ ද එක්තරා මිටි අස්නක් ගෙන එක් පසෙක හිඳගත. එකත්පස් වැ හුන් ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ ආයුෂ්මත් ආනන්ද තෙරණු වන්ට මෙසේ කී :

' භවත් ආනන්දයෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයෙකින් සමන්විත වූ සේක් ද, ඒ සර්වඥතාඥානධර්මයන්ගෙන් සියල්ලෙන් සියල්ල සර්වාංයෙන් සියල්ල සමන්විත වූ එක භික්ෂු කෙනෙක් නමුදු ඇත් දැ ' යි.

' බමුණ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයෙකින් සමන්වාගත වූ සේක් ද, ඒ සර්වඥතාඥානධර්මයන්ගෙන් සියල්ලෙන් සියල්ල සර්වාංයෙන් සියල්ල සමන්විත වූ එක භික්ෂු කෙනෙකුදු නැත. එසේ ම ය, ඒ භාග්‍යවත්හු නූපන් මාර්ගය (ස්වසන්තානයෙහි) උපදවනුවහ., (වෛනෙයසන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය දනවනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණවශයෙන්) පවසනුවහ, (ප්‍රත්‍යවෙක්ෂා වශයෙන්) මාර්ගය දතුවහ, මාර්ගය දක්නාසුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ, ඒ බුදුන් විසින් හෙළිකළ මාර්ගය හේතු කොටගෙන මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යෙමින් වෙසෙති ' යි.

අයඤ්ච හිදං ආයස්මතො ආනන්දස්ස ගොපකමොග්ගල්ලානෙන බ්‍රාහ්මණෙන සද්ධිං අන්තරකථා විප්පකතා හොති[1]. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො රාජගහෙ කම්මන්තෙ අනුසඤ්ඤායමානො යෙන ගොපකමොග්ගල්ලානස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරණීයං[2] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච: කායනුත්ථ භො ආනන්ද[3], එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතා’ති?

ඉධ මං බ්‍රාහ්මණ, ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො එවමාහ: ‘අත්ථි නු ඛො භො ආනන්ද, එකභික්ඛුපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො, යෙහි ධම්මෙහි සමන්නාගතො සො භවං ගොතමො අහොසි අරහං සම්මාසම්බුද්ධො’ති. එවං වුත්තෙ අහං බ්‍රාහ්මණ, ගොපකමොග්ගල්ලානං බ්‍රාහ්මණං එතදවොචං: ‘නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො, යෙහි ධම්මෙහි සමන්නාගතො සො භගවා අහොසි අරහං සම්මාසම්බුද්ධො සො හි බ්‍රාහ්මණ, භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො, මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා’ති. අයං ඛො නො බ්‍රාහ්මණ, ගොපකමොග්ගල්ලානෙන බ්‍රාහ්මණෙන සද්ධිං අන්තරා කථා විප්පකතා. අථ ත්වං අනුප්පත්තො’ති.

අත්ථි නු ඛො භො ආනන්ද, එකභික්ඛුපි තෙන භොතා ගොතමෙන ඨපිතො: ‘අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතී’ති යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථාති[4]?

නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ඨපිතො: ‘අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතී’ති යං මයං එතරහි පටිධාවෙය්‍යාමා’ති.

අත්ථි පන ඛො භො ආනන්ද, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො: ‘අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී’ති, යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථා’ති[4]?

නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො, අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී’ති, යං මයං එතරහි පටිධාවෙය්‍යාමා’ති[4].

එවං අප්පටිසරණෙ ච පන භො ආනන්ද, කො හෙතු සාමග්ගියා’ති?

න ඛො මයං බ්‍රාහ්මණ, අප්පටිසරණා, සප්පටිසරණා මයං බ්‍රාහ්මණ ධම්මපටිසරණා’ති.

---

1. විප්පකථා අහොසි – සීමු, මජසං, ස්‍යා.
2. සාරණීයං – සීමු, මජසං.
3. කායනුත්ථ ආනන්ද – PTS.
4. පටිපාදෙය්‍යාථාති – මජසං.

තවද ගෝපකමොග්ගල්ලාන බමුණු සමග ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ මේ අතුරු කථාව නො නිමියා වෙයි. එකල්හි මගධමහාමාත්‍ය වූ වස්සකාර බ්‍රාහ්මණ රාජගෘහයෙහි කර්මාන්තයන් විමසනුයේ ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණයාගේ කර්මාන්තස්ථානය වෙත ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළැඹියේය, එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමග සතුටු විය, සතුටුවිය යුතු සිහි කළ යුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් මගධමහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කී : ' භවත් ආනන්දයෙනි, දැන් කවර කථායෙකින් යුක්ත ව හුන්නු ද ? තොප ගේ කවර අතුරු කථායෙක් කොට අඩාළ වී ද ' යි.

බමුණ, මෙහි දී ගොපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ මට මෙසේ කී : ' භවත් ආනන්දයෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයෙකින් සමන්විත වූවාහු නම් ඒ සර්‍වඥතාඥනධර්මයන් ගෙන් සියල්ලෙන් සියල්ල සර්‍වථායෙන් සියල්ල සමන්විත වූ එක් භික්ෂු කෙනෙකුදු ඇද්ද ' යි. මෙසේ කී කල්හි බමුණ, මම ගොපකමොග්ගල්ලාන බමුණුහට මෙසේ කීමි : ' බමුණ, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයෙකින් සමන්වාගත වූ සේක් නම් ඒ සර්‍වඥතාඥන ධර්මයන්ගෙන් සියල්ලෙන් සියල්ල සර්‍වථායෙන් සියල්ල සමන්විත වූ එක භික්ෂු කෙනෙකුදු නැත. බමුණ, එසේ ම ය, ඒ භාග්‍යවතුන් වහන්සේ (ස්වසන්තානයෙහි) නූපන් මාර්ගය උපදවනුවහ, (වෛනෙයසන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය දනවනුවහ, (විවරණවශයෙන්) ප්‍රකාශ නො කළ මාර්ගය පවසනුවහ, (තමන් වහන්සේ ඉපැදවූ) ආර්‍යමාර්ගය (ප්‍රත්‍යවෙක්ෂා විසින්) දතුවහ, (වෛනෙයසන්තානයෙහි දැනැවිය යුතු) මාර්ගය දන්නාසුල්ලහ, (බෝසත්නට පැවැසිය යුතු) මාර්ගයෙහි විචක්ෂණයහ. ඒ බුදුන් විසින් හෙළිකළ මාර්ගය හෙතු කොටගෙන මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යෙමින් වෙසෙති ' යි බමුණ, ගෝපක මොග්ගල්ලාන බමුණු සමග අපගේ මේ අතුරු කථාව අඩාළ විය, එකල්හි තෙපි පැමිණියහු යැ' යි.

භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නාහු නම් ඒ භවත් ගෞතමයන් විසින් ' මේ තෙම තොපට මා ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි.

බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නමෝ නම් දතයුතු දන්නාවූ දක්ක යුතු දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ' මේ තෙම තොපට මා ඇවෑමෙන් පිළිසරණ වන්නේයැ ' යි තබන ලද එක් භික්ෂු කෙනෙකුදු නැතැ 'යි.

භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නහු නම් සංඝයා විසින් සම්මත වූ බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් ' මේ තෙම අපට භාග්‍යවතුන් වහන්සේ ගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි.

බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නමෝ නම් සංඝයා විසින් සම්මත වූ බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් ' මේ තෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු නැතැ ' යි.

තවද භවත් ආනන්දයෙනි, මෙසේ අප්‍රතිසරණ ශාසනයෙහි සාමග්‍රියට හේතු කවරේ ද ' යි.

බමුණ, ඇපි අප්‍රතිසරණයමෝ නො වම් හ, බමුණ, ඇපි සප්‍රතිසරණයම්හ, දහම් පිළිසරණ කොට ඇතියම් හ ' යි.

'අත්ථි නු ඛො භො ආනන්ද, එකභික්ඛුපි තෙන භොතා ගොතමෙන ඨපිතො: 'අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථා'ති. ඉති පුට්ඨො සමානො: 'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ඨපිතො: 'අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං මයං එතරහි පටිධාවෙය්‍යාමා'ති වදෙසි. 'අත්ථි පන භො ආනන්ද, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො: අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථා'ති. ඉති පුට්ඨො සමානො: 'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො: 'අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං මයං එතරහි පටිධාවෙය්‍යාමා'ති වදෙසි. 'එවං අප්පටිසරණෙ ච පන භො ආනන්ද, කො හෙතු සාමග්ගියා'ති. ඉති පුට්ඨො සමානො: 'න ඛො මයං බ්‍රාහ්මණ, අප්පටිසරණා, සප්පටිසරණා මයං බ්‍රාහ්මණ, ධම්මපටිසරණා'ති වදෙසි. ඉමස්ස පන භො ආනන්ද, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බො'ති?

අත්ථි ඛො බ්‍රාහ්මණ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං, පාතිමොක්ඛං උද්දිට්ඨං. තෙ මයං තදහුපොසථෙ යාවතිකා එකං ගාමක්ඛෙත්තං උපනිස්සාය විහරාම. තෙ සබ්බෙ එකජ්ඣං සන්නිපතාම, සන්නිපතිත්වා යස්ස තං පවත්තති. තං අජ්ඣෙසාම. තස්මිං චෙ භඤ්ඤමානෙ හොති භික්ඛුස්ස ආපත්ති, හොති වීතික්කමො, තං මයං යථාධම්මං යථානුසිට්ඨං කාරෙමා'ති.

න කිර නො භවන්තො කාරෙන්ති. ධම්මො නො කාරෙතීති.

අත්ථි නු ඛො භො ආනන්ද, එකභික්ඛුපි යං තුම්හෙ එතරහි සක්කරෙථ, ගරුකරෙථ,[1] මානෙථ, පූජෙථ, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරථා'ති?

'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි යං මයං එතරහි සක්කරෙම, ගරුකරෙම, මානෙම, පූජෙම, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරාමා'ති.

'අත්ථි නු ඛො භො ආනන්ද, එකභික්ඛුපි තෙන භොතා ගොතමෙන ඨපිතො: 'අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතීති යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථා'ති. ඉති පුට්ඨො සමානො: 'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ඨපිතො: 'අයං වො මමච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං මයං එතරහි පටිධාවෙය්‍යාමා'ති වදෙසි. 'අත්ථි පන භො ආනන්ද, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො:

1. ගරුං කරෙථා - සීමු, මජසං.

භවත් ආනන්දයෙනි, මෙකල්හි තෙපි යම් මහණක්හු අනුව යන්නවූ නම් ඒ භවත් ගෞතමයන් විසින් ' මේ තෙම මා ඇවෑමෙන් තොපට පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි මෙසේ පුළුවුත්හු ' බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නමෝ නම් දතයුතු දන්නාවූ දක්කයුතු දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ' මේ තෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු නැතැයි කියහු. යළි භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නවූ නම් සංඝයා විසින් සම්මත වූ බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් ' මේ තෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයැ ' යි තබන ලද එක භික්ෂු කෙනකුදු ඇත්තාහු ද ' යි පුළුවුත්හු ' බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නමෝ නම් සංඝයා විසින් සම්මත වූ බොහෝ ස්ථවිරභික්ෂූන් විසින් ' මේ තෙමෙ අපට භාග්‍යවතුන් වහන්සේ ගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු නැත්තාහ ' යි කීවහු ය. තවද මෙසේ අප්‍රතිසරණ වූ ශාසනයෙහි භවත් ආනන්දයෙනි, සාමග්‍රියට හෙතු කවරේ ද ' යි පුළුවුත්හු ' බ්‍රාහ්මණය, ඇපි අප්‍රතිසරණ නො වම්හ, බමුණ, ඇපි සප්‍රතිසරණයම්හ, ධර්මය පිළිසරණ කොට ඇතියම්හ ' යි කියහු. යළි භවත් ආනන්දයෙනි, මේ භාෂිතයාගේ අර්ථ කිසෙයින් දත යුත්තේ ද ' යි.

බමුණ, දතයුතු දන්නාවූ දක්කයුතු දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට සිකපද පනවන ලද්දේ පාමොක් උදෙසන ලද්දේ ඇත් මැ ය. ඒ ඇපි එදවස් පොහොයැ එක් ගම්කෙතක් ඇසුරු කොට යම් පමණ වාස කරමෝ ද එ හැමදෙනාමෝ එක් තැනැ රැස්වම්හ, රැස්වැ යමක්හට එ පාමොක් පුහුණුව වැටේ නම් ඔහුට ආරාධනා කරම්හ, ඉදින් එ පාමොක් දෙසන කල්හි මහණක් හට ඇවැත් වේ නම්, ව්‍යතික්‍රම වේ නම්, ඔහු ලවා ඇපි දහම් වූ පරිදි අනුසසුන් වූ පරිදි කරවම් හ ' යි.

භවත්හු නො කරවත් ල, ධර්මය මැ කරවා ල යි.

භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු සත්කාර කරවූ ද, ගරු කරවූ ද, බුහුමන් කරවූ ද, පුදවූ ද, සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාසය කරවූ නම්, එබඳු එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි පිළිවිත්.

බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු සත්කාර කරමෝ නම්, ගරු කරමෝ නම්, බුහුමන් කරමෝ නම්, පුදමෝ නම්, සත්කාර කොට ගරු කොට ඔහු ඇසුරු කොට වසමෝ නම්, එබඳු එක් භික්ෂු කෙනෙකුදු නැතැ ' යි කීහ.

භවත් ආනන්දයෙනි, මෙකල්හි, තෙපි යම් මහණක්හු අනුව යන්නවූ නම්, ඒ භවත් ගෞතමයන් විසින් ' මේ තෙම මාගේ ඇවෑමෙන් තොපට පිළිසරණ වන්නේ ය ' යි තබනලද එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි මෙසේ පුළුවුත්හු ' බමුණ, ඇපි මෙකල්හි යම මහණක්හු අනුව යන්නමෝ නම් දතයුතු දන්නාවූ දක්කයුතු දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ' මේ තෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ ය ' යි තබනලද එක භික්ෂු කෙනෙකුදු නැතැ ' යි කියහු. යළි ' භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නවූ නම් සංඝයා විසින් සම්මත වූ

'අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී'ති යං තුම්හෙ එතරහි පටිධාවෙය්‍යාථාති. ඉති පුට්ඨො සමානො : 'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි සඞ්ඝෙන සම්මතො සම්බහුලෙහි ථෙරෙහි භික්ඛූහි ඨපිතො : අයං නො භගවතො අච්චයෙන පටිසරණං භවිස්සතී'ති, යං මයං එතරහි පටිධාවෙය්‍යාමා'ති වදෙසි. අත්ථි නු ඛො හො ආනන්ද, එකභික්ඛුපි යං තුම්හෙ එතරහි සක්කරොථ, ගරුකරොථ, මානෙථ, පූජෙථ, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරථා'ති ඉති පුට්ඨො සමානො: 'නත්ථි ඛො බ්‍රාහ්මණ, එකභික්ඛුපි යං මයං එතරහි සක්කරොම ගරුකරොම මානෙම පූජෙම. සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරාමා'ති වදෙයි. ඉමස්ස පන හො ආනන්ද, භාසිතස්ස කථං අත්ථො දට්ඨබ්බොති.

අත්ථි ඛො බ්‍රාහ්මණ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දස පසාදනීයා ධම්මා අක්ඛාතා, යස්මිං නො ඉමෙ ධම්මා සංවිජ්ජන්ති. තං මයං එතරහි සක්කරොම ගරුකරොම මානෙම පූජෙම. සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරාම. කතමෙ දස :

ඉධ බ්‍රාහ්මණ, භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා[1] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධතා[2] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.

සන්තුට්ඨො හොති ඉතරීතරෙහි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි.

චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං[3] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ[4] ගච්ඡති සෙය්‍යථාපි පථවියං. ආකාසෙපි පල්ලඞ්කෙන චඞ්කමති[5] සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති, පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සාත්ථං සබ්‍යඤ්ජනං - සීමු, මජසං, PTS.
2. ධාතා - සීමු, මජසං.
3. නිමුජ්ජං - PTS.
4. අභෙජ්ජමානො - සී.
5. කමති - මජසං.

බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් ' මේ තෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යැ ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු ඇත්තාහු ද ' යි පුළුවුත්හු ' බමුණ, ඇපි මෙකල්හි යම් මහණක්හු අනුව යන්නමෝ නම් සංඝයා විසින් සම්මත වූ බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් ' මේ තෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ ය ' යි තබන ලද එක භික්ෂු කෙනෙකුදු නැත්තාහ ' යි කියහු. ' භවත් ආනන්දයෙනි, තෙපි මෙකල්හි යම් මහණක්හු සත්කාර කරවු ද, බුහුමන් කරවු ද, පූජා කරවු ද, සත්කාර කොට ගරු කොට ඇසුරු කොට වාසය කරවු ද ' යි මෙසේ පුළුවුත්හු ' බමුණ ඇපි මෙකල්හි යම් මහණක්හු සත්කාර කරමෝ නම් ගරුකාර කරමෝ නම් බුහුමන් කරමෝ නම් පුදමෝ නම් සත්කාර කොට ගරුකාර කොට නිසා වසමෝ නම් එබඳු එක් භික්ෂු කෙනෙකුදු නැතැ ' යි කියහු. තවද භවත් ආනන්දයෙනි, මේ භාෂිතයා ගේ අර්ථ කිසෙයින් දතයුත්තේ ද ' යි, කීය.

බමුණ, දතයුතු දන්නාවූ දක්කයුතු දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දස ප්‍රසාදනීය ධර්ම කෙනෙක් වදරන ලද්දහ, යමක්හු කෙරෙහි මේ ධර්මයෝ විද්‍යමාන වෙත් නම්, ඇපි මෙකල්හි ඒ මහණහු සත්කාර කරම්හ, ගරුකාර කරම්හ, බුහුමන් කරම්හ, පුදම්හ, සත්කාර කොට ගරුකාර කොට නිසා වාසය කරම්හ, කවර දසයෙක යත් :

බමුණ, මෙ සස්නෙහි මහණ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ සිල්වත් වෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ අල්පමාත්‍ර අකුශලයෙහි භය දක්නාසුලු වැ වෙසෙයි, සමාදන් වැ ගෙන ප්‍රඥප්තශික්ෂාපදයන්හි හික්මෙයි.

ශ්‍රැතයට ආධාර වූ ශ්‍රැතසන්නිචය ඇති බහුශ්‍රැතයෙක් වෙයි. ආදියෙහි කල්‍යාණ වූ මධ්‍යයෙහි කල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ යම් ධර්ම කෙනෙක් සර්වපරිපූර්ණ වූ පරිශුද්ධ වූ ශික්ෂාත්‍රයසංගෘහිත ශාසනය ප්‍රකාශ කෙරෙත් ද, ඔහු විසින් එබඳු ධර්මයෝ ධරන ලද්දහු වචනයෙන් ප්‍රගුණ කරන ලද්දහු සිතින් විමසන ලද්දහු (අර්ථ විසින් කාරණ විසින්) ප්‍රඥයෙන් සුප්‍රතිවිදිත වූවාහු වෙත්.

ඉතරීතර චීවරයෙන් පිණ්ඩපාතයෙන් සෙනාසනයෙන් ගිලන්පසබෙහෙසත්පිරිකරින් සතුටුවූයේ වෙයි.

අභිචිත්තය ඇසුරු කළ ඉහාත්මසුඛවිහරණයට හේතු වූ සතර ධ්‍යානයන් රිසිරිසි කෙණෙහි ලබනසුලු වූයේ නිදුකින් ලබනසුලු වූයේ විපුල ව ලබනසුලු වූයේ වෙයි.

අනෙකවිධ වූ සෘද්ධි කොටස් වළඳ කෙරෙයි : එකෙක් මැ වී බහුප්‍රකාර වෙයි, බහුප්‍රකාර වැ එකෙක් වෙයි, ආවිර්භාවය තිරොභාවය කෙරෙයි, බිතින් ඈතට පවුරින් ඈතට පව්වෙන් ඈතට අහසෙහි සෙයින් නො ගැටෙමින් යෙයි, දියෙහි සෙයින් පොළොවෙහි ද උම්මුජ්ජනිමුජ්ජන කෙරෙයි. පොළොවෙහි සෙයින් නො බිඳෙන දියෙහි දු යෙයි, පක්ෂි ලිහිණියක සෙයින් අහස්හි දු පලඟින් සක්මන් කෙරෙයි, මෙසේ මහර්ද්ධි ඇති මෙසේ මහානුභාව ඇති මේ චන්ද්‍ර සූර්‍ය්‍යයනුදු අත්ලෙන් පරාමර්ශ පරිමාර්ජන කෙරෙයි. බඹලොව දක්වාත් නාමකයින් වශයෙහි පවත්වයි.

දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය[1] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මනුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසත-සහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[2], තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවං-වණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො’ති, ඉති සාකාරං සඋද්දෙසං අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙ ඛො බ්‍රාහ්මණ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දස පසාදනීයා ධම්මා අක්ඛාතා. යස්මිං නො ඉමෙ ධම්මා සංවිජ්ජන්ති, තං මයං එතරහි සක්කරොම ගරුකරොම[3] මානෙම පූජෙම, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරාමාති.

---

1. අතික්කන්ත මානුසිකාය - PTS.
2. උපපාදිං - සීමු.
3. ගරුං කරොම - සීමු, මජසං.

මනුෂ්‍යශ්‍රෝත්‍රය ඉක්මැ සිටි විශුද්ධ වූ දිව්‍යශ්‍රෝත්‍රධාතුයෙන් දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද දුර වූ ද ළඟ වූ ද උභය ශබ්දයන් අසයි.

පරසත්ත්වයන් ගේ පරපුද්ගලයන් ගේ සිත තමා සිතින් පිරිසිඳ දනගනී : රාගසහිත චිත්තය ද, සරාග සිතැ ' යි දනගනී, වීතරාග චිත්තය ද, වීතරාග වූ සිතැ ' යි දන ගනී, සද්වෙෂ චිත්තය ද, සද්වෙෂ චිත්තයැ ' යි දනගනී, වීතද්වෙෂ චිත්තය ද ' විගතද්වෙෂ චිත්ත යැ ' යි දනගනී, සමෝහ චිත්තය ද ' සමෝහ චිත්තයැ ' යි දනගනී, වීතමෝහ චිත්තය ද ' විගතමොහ චිත්තයැ ' යි දනගනී, හැකුළුණු සිත ද ' හැකුළුණු සිතැ ' යි දනගනී, විසුරුණු සිත ද ' විසුරුණු සිතැ ' යි දනගනී, මහද්ගත චිත්තය ද 'මහද්ගත චිත්තයැ ' යි දනගනී, අමහද්ගත චිත්තය ද ' අමහද්ගත චිත්තයැ ' යි දනගනී, සඋත්තර චිත්තය ද ' සඋත්තර චිත්තයැ ' යි දනගනී, අනුත්තර චිත්තය ද ' අනුත්තර චිත්තයැ ' යි දනගනී, සමාහිත චිත්තය ද ' සමාහිත චිත්තයැ ' යි දනගනී, අසමාහිත චිත්තය ද ' අසමාහිත චිත්ත යැ ' යි දනගනී, විමුක්ත වූ චිත්තය ද ' විමුක්ත චිත්තයැ ' යි දනගනී, අවිමුක්ත චිත්තය ද අවිමුක්ත චිත්තයැ ' යි දනගනී.

අනේකවිධ වූ පූර්වනිවාස සිහි කෙරෙයි. එ මෙසේ යැ : එක් ජාතියකුදු ජාති දෙකකුදු තුන් ජාතියකුදු සතර ජාතියකුදු පස් ජාතියකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සතයකුදු ජාති සහස්‍රයකුදු ජාති සතසහස්‍රයකුදු නොයෙක් සංවර්තකල්පයනුදු නොයෙක් විවර්තකල්පයනුදු නොයෙක් සංවර්තවිවර්ත කල්පයනුදු අසුවල් තැන මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත්‍ර ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් වින්දෙම් මෙබඳු ආයුපර්‍යන්ත ඇත්තෙම් වීමි. ඒ මම ඉන් සැවැ අසුවල් තැනැ උපන්මි. එ තැන්හිදු මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගෝත්‍ර ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් විඳිනසුලු වූයෙම් මෙබඳු ආයුපර්‍යන්ත ඇත්තෙම් වීමි. ඒ මම එයින් සැවැ මෙහි උපන්මි, මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි.

මිනිසැස ඉක්මැ සිටි විශුද්ධ වූ දිව ඇසින් ච්‍යුතවෙමින් උපදමින් සිටි සත්ත්වයන් දකී, හීනප්‍රණීත වූ සුවර්ණදුර්වර්ණ වූ සුගතදුර්ගත වූ යථාකර්මෝපගත සත්ත්වයන් දනගනී.

ආස්‍රවයන් ක්‍ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි මැ තෙමේ විශිෂ්ටඥනයෙන් දන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කෙරෙයි.

බමුණ, දතයුතු දන්නාවූ දක්කයුතු දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ දසවැදෑරුම් ප්‍රසාදනීය ධර්මයෝ වදරන ලද්දහ. යම් මහණක්හු කෙරෙහි මේ ධර්මයෝ විද්‍යමාන වෙත් ද, ඇපි මෙකල්හි ඒ මහණහු සත්කාර කරම්හ, ගරුකාර කරම්හ, බුහුමන් කරම්හ, පුදම්හ. සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාස කරම්හ ' යි.

එවං වුත්තෙ වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො උපනන්දං සෙනාපතිං ආමන්තෙසි. තං කිං මඤ්ඤසි භවං සෙනාපති[1], යදිමෙ එවං භොන්තො[2] සක්කාතබ්බං සක්කරොන්ති, ගරුකාතබ්බං ගරුකරොන්ති. මානෙතබ්බං මානෙන්ති, පූජෙතබ්බං පූජෙන්ති. තග්ඝිමෙ භොන්තො සක්කාතබ්බං සක්කරොන්ති, ගරුකාතබ්බං ගරුකරොන්ති, මානෙතබ්බං මානෙන්ති, පූජෙතබ්බං පූජෙන්ති. ඉමඤ්ච හි තෙ භොන්තො න සක්කරෙය්‍යුං, න ගරුකරෙය්‍යුං, න මානෙය්‍යුං, න පූජෙය්‍යුං, අථ කිඤ්චරහි තෙ භොන්තො සක්කරෙය්‍යුං, ගරුකරෙය්‍යුං, මානෙය්‍යුං, පූජෙය්‍යුං, සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යුන්ති.

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච : 'කහං පන භවං ආනන්දො එතරහි විහරතී'ති.

වෙළුවනෙ ඛො අහං බ්‍රාහ්මණ එතරහි විහරාමීති.

කච්චි පන භො ආනන්ද, වෙළුවනං රමණීයඤ්චෙව අප්පසද්දඤ්ච අප්පනිග්ඝොසඤ්ච විජනවාතං මනුස්සරාහස්සෙය්‍යකං[3] පටිසල්ලානසාරුප්පන්ති.

තග්ඝ බ්‍රාහ්මණ, වෙළුවනං රමණීයඤ්චෙව අප්පසද්දඤ්ච අප්පනිග්ඝොසඤ්ච විජනවාතං මනුස්සරාහස්සෙය්‍යකං පටිසල්ලානසාරුප්පං යථා තං තුම්හාදිසෙහි රක්ඛකෙහි ගොපකෙහීති.

තග්ඝ භො ආනන්ද, වෙළුවනං රමණීයඤ්චෙව අප්පසද්දඤ්ච අප්පනිග්ඝොසඤ්ච විජනවාතං මනුස්සරාහස්සෙය්‍යකං පටිසල්ලානසාරුප්පං යථා තං භවන්තෙහි ඣානසීලීහි. ඣායිනො චෙව භවන්තො ඣානසීලිනො ච.

එකමිදාහං භො ආනන්ද, සමයං සො භවං ගොතමො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො අහං[4] භො ආනන්ද, යෙන මහාවනං කූටාගාරසාලා, යෙන සො භවං ගොතමො, තෙනුපසඞ්කමිං. තත්‍ර ච පන සො භවං ගොතමො අනෙකපරියායෙන ඣානකථං කථෙසි. ඣායී චෙව සො භවං ගොතමො අහොසි ඣානසීලී ච. සබ්බඤ්ච පන සො භවං ගොතමො ඣානං වණ්ණෙසීති.

න ඛො[5] බ්‍රාහ්මණ, සො භගවා සබ්බං ඣානං වණ්ණෙසි. නාපි[6] සො භගවා සබ්බං ඣානං න වණ්ණෙසීති.

1. එවං සෙනාපති - ස්‍යා, PTS.
2. යදිමෙ භොන්තො - මජසං, PTS.
3. මනුස්සරාහස්සෙය්‍යකං - මජසං.
4. අථ ඛ්වාහං - මජසං.
5. න ච ඛො - මජසං.
6. නපි - මජසං.

මෙසේ කී කල්හි මගධමහාමාත්‍ය වූ වස්සකාර බ්‍රාහ්මණ උපනන්ද සේනාපති ඇමැති : ' භවත් සේනාපතිය, ඒ කිමැයි සිතයි ද, ඉදින් මේ භවත්හු මෙසේ සත්කාර කළයුත්තහු සත්කාර කෙරෙත් නම් ගරු කළ යුත්තහු ගරු කෙරෙත් නම් බුහුමන් කළයුත්තහු බුහුමන් කෙරෙත් නම් පිදියයුත්තහු පුදත් නම්, ඒකාන්තයෙන් මේ භවත්හු සත්කාර කළයුත්තහුට සත්කාර කෙරෙති, ගරු කළයුත්තහුට ගරු කෙරෙති, බුහුමන් කළයුත්තහුට බුහුමන් කෙරෙති, පිදිය යුත්තහුට පූජා කෙරෙති. තවද යම් හෙයෙකින් ඒ භවත්හු මේ මහණහු සත්කාර නො කරන්නාහු නම් ගරු නො කරන්නාහු නම් බුහුමන් නො කරන්නාහු නම් නො පුදන්නාහු නම්, එකල්හි ඒ භවත්හු කවරක්හට සත්කාර කරන්නාහු ද ගරු කරන්නාහු ද බුහුමන් කරන්නාහු ද පුදන්නාහු ද, සත්කාර කොට ගරු කොට නිසා වාස කරන්නාහු ද ' යි.

ඉක්බිති මගධමහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කී : ' භවත් ආනන්දයෝ මෙකල්හි කොහි වෙසෙත් ද ' යි.

බමුණ, මම මෙකල්හි වේළුවනයෙහි වාස කෙරෙමි ' කීහ.

කිමෙක භවත් ආනන්දයෙනි, වේළුවනය රමණී වූයේත් අල්පශබ්ද අල්පනිර්ඝොෂ වූයේත් ඇද්ද, ජනවාත රහිත වූයේ මිනිසුන්ගේ රාහස්‍යයට යොග්‍ය වූයේ විවේකයට සුදුසු වූයේ වී ද ' යි පිළිවිත.

බමුණ, ඒකාන්තයෙන් වෙළුවනය රමණී වූයේත් අල්පශබ්ද අල්පනිර්ඝොෂ වූයේත් වෙයි, ජනවාත රහිත වූයේ මිනිසුන්ගේ රාහස්‍යයට යොග්‍ය වූ විවේකයට නිසි වෙයි, තොප වැනි වූ රක්ෂක ගොපකයන් විසින් (රක්නාලදුයේ) යම්සේ ද එමෙනි.

භවත් ආනන්දයෙනි, ඒකාන්තයෙන් වේළුවනය රමණී වූයේත් අල්පශබ්ද අල්ප නිර්ඝෝෂ වූයේත් වෙයි, විජනවාත වූයේ මිනිසුන්ගේ රහස්‍යකර්මයනට සුදුසු වූයේ විවේකවාසයට නිසි වූයේ වෙයි. ධ්‍යානශීලි වූ පින්වතුන් විසින් යම්සේ ද එමෙනි. භවත් ධ්‍යායීහු ද ධ්‍යානශීලීහු ද වෙති.

භවත් ආනන්දයෙනි, එක් සමයෙක්හි ඒ භවත් ගෞතමයන් වහන්සේ විසාලා නුවර මහාවනයෙහි වූ කූටාගාරශාලායෙහි වැඩවෙසෙති. භවත් ආනන්දයෙනි, එකල්හි මම මහාවනයෙහි කූටාගාරශාලාව යම් තැනෙක්හි ද, ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් තැනෙක්හි ද, එතැන්හි එළැඹියෙමි. එහි වූ කලි ඒ භවත් ගෞතමයන් වහන්සේ නන් අයුරින් ධ්‍යානකථාව වදළහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ ධ්‍යායී ද ධ්‍යානශීලි ද වූහ. යළි ඒ භවත් ගෞතමයන් වහන්සේ සියලු ධ්‍යානය වර්ණනා කළහ ' යි කීය.

බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු ධ්‍යානය වර්ණනා නො කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු ධ්‍යානය නො ද වර්ණනා නො කළ සේක ' යි.

කථං රූපඤ්ච බ්‍රාහ්මණ, සො භගවා ඣානං න වණ්ණෙසි. ඉධ බ්‍රාහ්මණ, එකච්චො කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. සො කාමරාගංයෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති බ්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. සො බ්‍යාපාදංයෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන. උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. සො ථීනමිද්ධංයෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන. උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. සො උද්ධච්චකුක්කුච්චංයෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති සො විචිකිච්ඡංයෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. එවරූපං ඛො බ්‍රාහ්මණ, සො භගවා ඣානං න වණ්ණෙසි.

කථං රූපඤ්ච බ්‍රාහ්මණ, සො භගවා ඣානං වණ්ණෙසි. ඉධ බ්‍රාහ්මණ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවරූපං ඛො බ්‍රාහ්මණ සො භගවා ඣානං වණ්ණෙසීති.

ගාරය්හං කිර භො ආනන්ද, සො භවං ගොතමො ඣානං ගරහි. පාසංසං පසංසි. හන්ද ච'දානි මයං භො ආනන්ද ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයාති.

යස්සදානි ත්වං බ්‍රාහ්මණ කාලං මඤ්ඤසීති.

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ගොපකමොග්ගල්ලානො බ්‍රාහ්මණො අචිරපක්කන්තෙ වස්සකාරෙ බ්‍රාහ්මණෙ මගධමහාමත්තෙ ආයස්මන්තං ආනන්දං එතදවොච: 'යං නො මයං භවන්තං ආනන්දං අපුච්ඡිම්හා[1] තං නො භවං ආනන්දො න බ්‍යාකාසීති.

---

1. අපුච්ඡිම්හො - මජසං.

බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ කෙබඳු වූ ධ්‍යානයක් වර්ණනා නො කළ සේක් ද යත් : ' බමුණ, මෙලොවැ කිසිවෙක් කාමරාගයෙන් මඩනා ලද කාමරාගයෙන් පෙළන ලද සිතින් යුක්ත වැ වෙසෙයි, යළි උපන් කාමරාගයාගේ නිස්සරණය තතුසේ නො දනී. හේ කාමරාගය මැ ඇතුළු කොට ගෙන සිතයි, අතිශයින් සිතයි, අනේකප්‍රකාරයෙන් සිතයි, ඉන් බැහැර වැ සිතයි. ව්‍යාපාදයෙන් මැඩුණු ව්‍යාපාදයෙන් පෙළුණු සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ව්‍යාපාදයාගේ ද නිස්සරණය තතුසේ නො දතහෙයි, හේ ව්‍යාපාදය මැ ඇතුළු කොටගෙන සිතයි, අතිශයින් සිතයි, නන් අයුරින් සිතයි, ඉන් බැහැර වැ සිතයි. ථිනමිද්ධයෙන් මැඩුණු ථිනමිද්ධයෙන් පෙළුණු සිතින් යුක්ත වැ වෙසෙයි. උපන් ථිනමිද්ධයාගේත් නිස්සරණය තතුසේ නො දතහෙයි. හේ ථිනමිද්ධය මැ ඇතුළු කොටගෙන සිතයි, අතිශයින් සිතයි, නන්අයුරින් සිතයි, ඉන් බැහැර වැ සිතයි. උද්ධච්ච කුක්කුච්චයෙන් මැඩුණු උද්ධච්චකුක්කුච්චයෙන් පෙළුණුසිතින් යුක්ත වැ වෙසෙයි. උපන් උද්ධච්චකුක්කුච්චයාගේත් නිස්සරණය තතුසේ නො දතහෙයි. හේ උද්ධච්ච කුක්කුච්චය මැ ඇතුළු කොටගෙන සිතයි, අතිශයින් සිතයි, නන්අයුරින් සිතයි, ඉන් බැහැර වැ සිතයි. විචිකිච්ඡායෙන් මැඩුණු විචිකිච්ඡායෙන් පෙළුණු සිතින් යුක්ත වැ වෙසෙයි, උපන් විචිකිච්ඡාවගේ ද නිස්සරණය තතුසේ නො දතහෙයි, හේ විචිකිච්ඡාව මැ ඇතුළු කොටගෙන සිතයි, අතිශයින් සිතයි, නන් අයුරින් සිතයි, ඉන් බැහැර වැ සිතයි. බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු වූ ධ්‍යානය වර්ණනා නො කළ සේක.

බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ කෙබඳු ධ්‍යානයක් වර්ණනා කළසේක් ද යත් : ' බමුණ, මෙ සස්නෙහි මහණ කාමරාගයෙන් වෙන් වැ අකුශලධර්මයන්ගෙන් වෙන් වැ සවිතර්ක වූ සවිචාර වූ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ප්‍රථමධ්‍යානය උපදවා වෙසෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදය ඇති චිත්තයාගේ එකෝදි භාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධිජ වූ ප්‍රීතිසුඛය ඇති ද්විතීයධ්‍යානය උපදවා වෙසෙයි. ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්ෂා ඇත්තේ ද ස්මෘති ඇති ව සම්‍යග්ඥාන ඇති ව වෙසෙයි, නාමකයින් සුඛය ද විඳී, යම් ධ්‍යානයක් හේතුකොටගෙන ආර්‍ය්‍යයෝ ' උපේක්ෂා ඇත්තේ යැ ස්මෘතිමත් යැ සුඛවිහාරී යැ ' යි පවසත් ද, ඒ තෘතීයධ්‍යානය උපදවා වෙසෙයි. සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පෙර මැ සොමනස් දෙම්නසුන්ගේ අස්තංගමයෙන් දුක් නො වූ සුව නො වූ උපේක්ෂාව හා ස්මෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථ ධ්‍යානය උපදවා වෙසෙයි. බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු වූ ධ්‍යානය වර්ණනා කළ සේකැ ' යි වදළහ.

භවත් ආනන්දයෙනි, ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැරැහියැ යුතු ධ්‍යානය කලි ගැරැහූහ. පැසැසියැ යුත්ත පැසැසූහ. මැනැවැ භවත් ආනන්දයෙනි, මෙවිට ඇපි යම්හ, ඇපි බොහෝ කිස ඇතියම්හ, බොහෝ කරණී ඇතියම්හ ' යි.

බමුණ, තෙපි දන් ඒ කටයුතු සඳහා කල් දනුව 'යි.

ඉක්බිති මගධමහාමාත්‍ර වස්සකාර බ්‍රාහ්මණ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ භාෂිතය අභිනන්දනා කොට අනුමොදන් වැ හුනස්නෙන් නැගිට නික්මැ ගියේ ය.

ඉක්බිති ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණ මගධමහාමාත්‍ර වූ වස්සකාර බමුණු නික්මැ ගිය නොබෝවේලෙහි ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කී : ' ඇපි භවත් ආනන්දයන් යමක් විචාළමෝ නම් භවත් ආනන්දයෝ එය ප්‍රකාශ නො කළහ ' යි.

අපි නු තෙ[1] බ්‍රාහ්මණ, අවොචුම්හ: නත්ථි ඛො බ්‍රාහ්මණ එකභික්ඛුපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො, යෙහි ධම්මෙහි සමන්නාගතො සො භගවා අහොසි අරහං සම්මාසම්බුද්ධො. සො හි බ්‍රාහ්මණ, භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතාති.

ගොපකමොග්ගල්ලානසුත්තං අට්ඨමං.

---

1. න නු තෙ - සීමු, මජසං

බමුණ, තොපට කිවමෝ නො ද : ' බමුණ, ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේ යම් සර්වඥතාඥාන ධර්මයෙකින් සමන්වාගත සේක් නම් ඒ ධර්මයන්ගෙන් සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල සමන්විත වූ එක භික්ෂු කෙනෙකුදු නැත්තාහ. එසේ මැ යැ, බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ (සිය සතන්හි) නූපන් මඟ උපදවනුවහ, (වෛනෙයසන්තානයෙහි) අසඤ්ජාත මාර්ගය දනවනුවහ. ප්‍රකාශ නො කළ මඟ පවසනුවහ ආර්‍ය්‍යමාර්ග ප්‍රත්‍යවෙක්ෂා විසින් දතුවහ, (වෛනෙයසන්තානයෙහි) දතැවියයුතු මඟ දන්නාසුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ, ඒ බුදුන් හෙළිකළ මාර්ගය හේතුකොටගෙන මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යෙමින් වාස කෙරෙත් යයි වදළහ.

අටවැනි ගෝපකමොග්ගල්ලාන සූත්‍ර යි.

---

# 3. 1. 9

## මහාපුණ්ණම සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්‍ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ, තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පණ්ණරසෙ පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: 'පුච්ඡෙය්‍යාහං භන්තෙ, භගවන්තං කිඤ්චිදෙව දෙසං සචෙ මෙ භගවා ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායා'ති.

තෙන හි ත්වං භික්ඛු සකෙ ආසනෙ නිසීදිත්වා පුච්ඡ යදාකඞ්ඛසීති.

අථ ඛො සො භික්ඛු සකෙ ආසනෙ නිසීදිත්වා භගවන්තං එතදවොච:

'ඉමෙ නු ඛො භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධා, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො'ති.

ඉමෙ ඛො භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා, සෙය්‍යථීදං: 'රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො'ති.

සාධු භන්තෙති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං පුච්ඡි.

'ඉමෙ පන භන්තෙ පඤ්චුපාදානක්ඛන්ධා කිම්මූලකා'ති?

'ඉමෙ ඛො භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා ඡන්දමූලකා'ති.

තංයෙව නු ඛො භන්තෙ, උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා උදාහු අඤ්ඤත්‍ර පඤ්චුපාදානක්ඛන්ධෙහි උපාදානං'ති?

න ඛො භික්ඛු, තං යෙව උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා, නාපි[1] අඤ්ඤත්‍ර පඤ්චුපාදානක්ඛන්ධෙහි උපාදානං. යො ඛො භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගො, තං තත්‍ථ උපාදානන්ති.

සියා පන භන්තෙ, පඤ්චසු උපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතා'ති?

---

1. නපි – PTS.

# 3. 1. 9

## මහාපුණ්ණම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි මිගාරමාතෘප්‍රසාද නම් වූ පූර්වාරාමයෙහි වැඩවාස කරන සේක. තවද එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ එදවස් පසළොස්වක් පොහොයෙහි මස් පිරුණු සඳ පිරුණු රාත්‍රියෙහි භික්ෂුසංඝයා විසින් පිරිවරන ලද්දහු අභ්‍යවකාශයෙහි වැඩහුන් සේක.

ඉක්බිති එක්තරා මහණෙක් හුනස්නෙන් නැඟීසිට සිවුර එකස්කොට පෙරෙව භාග්‍යවතුන් වහන්සේ දිසාවට දෙහොත් මුදුන් තබා වැඳ භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ' වහන්ස, ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ පැන විසඳනුවට අවකාස කරන සේක් නම්, මම භාග්‍යවතුන් වහන්සේ එකදෙසමාත්‍රයක් පුළුවුස්මි ' කීය.

එසේ වී නම් මහණ තෙපි සිය අස්නෙහි හිඳ යමක් රිසියෙයි නම් පුළුවුස්ව ' යි වදාළහ.

එ සඳ එ මහණ සිය අස්නෙහි හිඳ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැල කෙළේ :

වහන්ස, පඤ්චොපාදනස්කන්ධයෝ මොවුහු නො ද, ඒ මෙසේ යැ : රූපොපාදනස්කන්ධය වේදනොපාදනස්කන්ධය සංඥෙපාදනස්කන්ධය සංස්කාරොපාදනස්කන්ධය විඥනොපාදනස්කන්ධ යි.

මහණ, පඤ්චොපාදනස්කන්ධයෝ මොහු යැ, ඒ මෙසේ යැ : රූපොපාදනස්කන්ධ වේදනොපාදනස්කන්ධ සංඥෙපාදනස්කන්ධ සංස්කාරොපාදනස්කන්ධ විඥනොපාදනස්කන්ධ යි.

' මැනැවැ වහන්සැ ' යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කොට අනුමොදන් වැ බුදුරදුන් මත්තෙහි පැන පිළිවිත් :

යළි වහන්සැ, මේ පඤ්චොපාදනස්කන්ධයෝ කුමක් මුල් කොට ඇත්තාහු ද ' යි.

මහණ, මේ පඤ්චොපාදනස්කන්ධයෝ තෘෂ්ණාව මුල් කොට ඇත්තාහ ' යි.

වහන්ස, එ මැ උපාදන ඒ පඤ්චස්කන්ධයෝ වෙත් ද, නොහොත් පඤ්චොපාද ස්කන්ධයෙන් වෙන් වැ උපාදන වේ ද ' යි.

මහණ, එ මැ උපාදනය ඒ පඤ්චොපාදනස්කන්ධයෝ නො වෙති, පඤ්චොපාදනස්කන්ධයෙන් වෙන් වැ නො ද උපාදන වෙයි. මහණ පඤ්චොපාදනස්කන්ධයෙහි යම් ඡන්දරාගයෙක් ඇද්ද, ඒ එහි උපාදන යි.

වහන්ස, යළි පඤ්චොපාදනස්කන්ධයන් විෂයෙහි ඡන්දරාගයාගේ වෙනස්බවෙක් ඇද්ද ' යි පිළිවිත්.

සියා භික්ඛූති භගවා අවොච. ඉධ භික්ඛු, එකච්චස්ස එවං හොති. එවංරූපො සියං අනාගතමද්ධානං, එවංවෙදනො සියං අනාගතමද්ධානං, එවංසඤ්ඤො සියං අනාගතමද්ධානං, එවංසඞ්ඛාරො සියං අනාගතමද්ධානං, එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති. එවං ඛො භික්ඛු, සියා පඤ්චසු උපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතාති.

කිත්තාවතා පන භන්තෙ, ඛන්ධානං ඛන්ධාධිවචනං හොතීති?

යං කිඤ්චි භික්ඛු, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, අයං රූපක්ඛන්ධො. යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා, අයං වෙදනාක්ඛන්ධො. යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා, අයං සඤ්ඤාක්ඛන්ධො. යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ සන්තිකෙ වා, අයං සඞ්ඛාරක්ඛන්ධො. යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, අයං විඤ්ඤාණක්ඛන්ධො. එත්තාවතා ඛො භික්ඛු, ඛන්ධානං ඛන්ධාධිවචනං හොතී'ති.

කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායාති?

චත්තාරො ඛො භික්ඛු, මහාභූතා හෙතු චත්තාරො මහාභූතා පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, ඵස්සො හෙතු ඵස්සො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, ඵස්සො හෙතු ඵස්සො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, ඵස්සො හෙතු ඵස්සො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, නාමරූපං ඛො භික්ඛු, හෙතු නාමරූපං පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායාති.

කථං පන භන්තෙ, සක්කායදිට්ඨි හොතීති?

ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛු, සක්කායදිට්ඨි හොතීති.

මහණ, ' ඇතැ ' යි බුදුහු වදළහ : ' මහණ, මෙලොවැ කිසිවක්හට මෙසේ සිත් වෙයි : අනාගතකාලයෙහි මෙබඳු රූප ඇත්තෙම් වන්නෙමි. අනාගත කාලයෙහි මෙබඳු වෙදනා ඇත්තෙම් වන්නෙමි, අනාගතකාලයෙහි මෙබඳු සංඥ ඇත්තෙම් වන්නෙමි, අනාගත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙම් වන්නෙමි, අනාගතකාලයෙහි මෙබඳු විඥන ඇත්තෙම් වන්නෙමි. මහණ, මෙසේ පඤ්චොපාදනස්කන්ධ විෂයෙහි ඡන්දරාගයාගේ විවිධත්වය වන්නේ ය ' යි වදළහ.

වහන්ස, යළි කොපමණෙකින් ස්කන්ධයන් ගේ ස්කන්ධප්‍රඥප්තිය වේ ද ' යි.

මහණ, අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි රූපයෙක් ඇද්ද, දුර හෝ සමීපයෙහි හෝ යම් රූපයෙක් ඇද්ද, මේ රූපස්කන්ධ යැ, අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්මයෙහි වේවයි බාහ්‍යයෙහි වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් වේදනාවක් ඇද්ද, දුර හෝ සමීපයෙහි යම් වෙදනාවක් ඇද්ද, මේ වෙදනාස්කන්ධ යැ, අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්මයෙහි වේවයි බාහ්‍යයෙහි වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි සංඥවක් ඇද්ද, දුර හො සමීපයෙහි හෝ යම් සංඥවක් ඇද්ද, මේ සංඥස්කන්ධ යැ. අතීතානාගතප්‍රත්‍යුත්‍යන්න වූ අධ්‍යාත්මයෙහි වේවයි බාහ්‍යයෙහි වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් සංස්කාර කෙනෙක් ඇද්ද, දුර හෝ සමීපයෙහි හෝ යම් සංස්කාර කෙනෙක් ඇද්ද, මේ සංස්කාරස්කන්ධ යැ. අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්මයෙහි වේවයි බාහ්‍යයෙහි වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි විඥනයෙක් ඇද්ද, දුර හෝ සමීපයෙහි හෝ යම් විඥනයෙක් ඇද්ද, මේ විඥනස්කන්ධ යැ. මහණ, මෙතෙකින් ස්කන්ධයන් ගේ ස්කන්ධප්‍රඥප්තිය වේයයි වදළහ.

වහන්ස, රූපස්කන්ධයාගේ පැනැවීමට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද, වෙදනා ස්කන්ධය පැනැවීමට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද, සංඥස්කන්ධය පැනැවීමට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද, සංස්කාරස්කන්ධය පැනැවීමට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද, විඥනස්කන්ධය පැනැවීමට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද ' යි.

මහණ, රූපස්කන්ධය පැනැවීමට සතර මහාභූතයෝ හේතු වෙති, සතර මහාභූතයෝ ප්‍රත්‍යය වෙති. වේදනාස්කන්ධය පැනැවීමට ස්පර්ශය හේතු වෙයි. ස්පර්ශය ප්‍රත්‍යය වෙයි. සංඥස්කන්ධය පැනැවීමට ස්පර්ශය හේතු වෙයි, ස්පර්ශය ප්‍රත්‍යය වෙයි. සංස්කාරස්කන්ධය පැනැවීමට ස්පර්ශය හේතු වෙයි, ස්පර්ශය ප්‍රත්‍යය වෙයි. මහණ, විඥනස්කන්ධය පැනැවීමට නාමරූපය හේතු වෙයි, නාමරූපය ප්‍රත්‍යය වේ යයි වදළසේක.

වහන්ස, යළි කිසෙයින් සත්කායදෘෂ්ටි වේ දැයි පිළිවිත්.

මහණ, මෙලොවැ අශ්‍රුතවත් පෘථග්ජන ආර්‍ය්‍යයන් නුදුටුයේ ආර්‍ය්‍යධර්මයෙහි අකෝවිද වූයේ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූයේ, සත් පුරුෂයන් නුදුටුයේ සත්පුරුෂධර්මයෙහි අකෝවිද වූයේ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූයේ රූපය ආත්ම වශයෙන් දකී, රූපවත් ආත්මය හෝ ආත්මයෙහි රූපය හෝ රූපයෙහි ආත්මය හෝ දකී. වෙදනාව ආත්මවශයෙන් දකී, වේදනාවත් ආත්මය හෝ ආත්මයෙහි වෙදනාව හෝ වේදනාවෙහි ආත්මය හෝ දකී. සංඥව ආත්මවශයෙන් දකී, සංඥවත් ආත්මය හෝ ආත්මයෙහි සංඥව හෝ සංඥයෙහි ආත්මය හෝ දකී. සංස්කාරයන් ආත්මවශයෙන් දකී, සංස්කාරවත් ආත්මය හෝ ආත්මයෙහි සංස්කාරයන් හෝ සංස්කාරයන්හි ආත්මය හෝ දකී. විඥනය ආත්මවශයෙන් දකී, විඥනවත් ආත්මය හෝ ආත්මයෙහි විඥනය හෝ විඥනයෙහි ආත්මය හෝ දකී. මහණ, මෙසෙයින් සත්කායදෘෂ්ටි වේ යයි වදළහ.

කථං පන භන්තෙ, සක්කායදිට්ඨි න හොතීති?

ඉධ භික්ඛු, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො, න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, නාත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, නාත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං. න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, නාත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං. න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, න සඞ්ඛාරවන්තං වා අත්තානං, නාත්තනි වා සඞ්ඛාරෙ, න සඞ්ඛාරෙසු වා අත්තානං. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, නාත්තනි වා විඤ්ඤාණං න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛු, සක්කායදිට්ඨි න හොතීති.

කො නු ඛො භන්තෙ රූපෙ අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං. කො වෙදනාය අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං. කො සඤ්ඤාය අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං. කො සඞ්ඛාරෙසු අස්සාදො කො ආදීනවො කිං නිස්සරණං. කො විඤ්ඤාණෙ අස්සාදො කො ආදීනවො කිං නිස්සරණන්ති.

යං ඛො භික්ඛු, රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපෙ අස්සාදො, යං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං අයං රූපෙ ආදීනවො, යො රූපෙ ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං රූපෙ නිස්සරණං. යං ඛො භික්ඛු, වෙදනං පටිච්ච-පෙ-සඤ්ඤං පටිච්ච-පෙ-සඞ්ඛාරෙ පටිච්ච-පෙ-විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං විඤ්ඤාණෙ අස්සාදො, යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාම-ධම්මං අයං විඤ්ඤාණෙ ආදීනවො, යො විඤ්ඤාණෙ ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං විඤ්ඤාණෙ නිස්සරණන්ති.

කථං පන භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාර-මානානුසයා න හොන්තීති?

යං කිඤ්චි භික්ඛු, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, 'සබ්බං රූපං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, 'සබ්බං විඤ්ඤාණං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාර මමිඞ්කාරමානානුසයා[1] න හොන්තී'ති.

1. අහඞ්කාරමමඞ්කාරමානානුසයා - සිමු, මජසං, සයා, PTS.

වහන්ස, යළි කිසෙයින් සත්කායදෘෂ්ටි නො වේද ' යි පිළිවිත්.

මහණ, මෙලොවැ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක ආර්‍ය්‍යයන් දුටුයේ ආර්‍ය්‍යධර්මයට නිපුණ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි සුවිනීත වූයේ, සත්පුරුෂයන් දුටුයේ සත්පුරුෂධර්මයට නිපුණ වූයේ සත්පුරුෂධර්මයෙහි සුවිනීත වූයේ රූපය ආත්මවශයෙන් නො දකී, රූපවත් ආත්මය හෝ ආත්මයෙහි රූපය හෝ රූපයෙහි ආත්මය හෝ නො දකී. වේදනාව ආත්මවශයෙන් නො දකී, වේදනාවත් ආත්මය හෝ ආත්මයෙහි වේදනාව හෝ වේදනායෙහි ආත්මය හෝ නො දකී. සංඥව ආත්මවශයෙන් නො දකී, සංඥවත් ආත්මය හෝ ආත්මයෙහි සංඥව හෝ සංඥයෙහි ආත්මය හෝ නො දකී. සංස්කාරයන් ආත්මවශයෙන් නො දකී. සංස්කාරවත් ආත්මය හෝ ආත්මයෙහි සංස්කාරයන් හෝ නො දකී. විඥනය ආත්ම වශයෙන් නො දකී, විඥනවත් ආත්මය හෝ ආත්මයෙහි විඥනය හෝ විඥනයෙහි ආත්මය හෝ නො දකී. මහණ, මෙසෙයින් සත්කායදෘෂ්ටි නො වේ යයි වදළහ.

වහන්ස, රූපයෙහි ආස්වාද කවර, ආදීනව කවර, නිස්සරණ කිම ? වේදනායෙහි ආස්වාද කවර, ආදීනව කවර, නිස්සරණ කිම ? සංඥයෙහි ආස්වාද කවර, ආදීනව කවර, නිස්සරණ කිම ? සංස්කාරයන්හි ආස්වාද කවර, ආදීනව කවර, නිස්සරණ කිම ? විඥනයෙහි ආස්වාද කවර, ආදීනව කවර, නිස්සරණ කිමැ ' යි පිළිවිත්.

මහණ, රූපය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ රූපයෙහි ආස්වාද යැ. යම්හෙයෙකින් රූපය අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ ද, මේ රූපයෙහි ආදීනව යැ. රූපයෙහි යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් වේ ද, මේ රූපයෙහි නිස්සරණ යි. මහණ, වේදනාව නිසා යම් . . . සංඥව නිසා . . . සංස්කාරයන් නිසා . . . විඥනය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදීද, මේ විඥනයෙහි ආස්වාද යැ, යම් හෙයෙකින් විඥනය අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ ද, මේ විඥනයෙහි ආදීනව යැ, විඥනයෙහි යම් ඡන්ද රාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් වේ ද, මේ විඥනයෙහි නිස්සරණැ ' යි වදළහ.

වහන්ස, යළි කිසෙයින් දන්නාහට කිසෙයින් දක්නාහට මේ සවිඥනක කයෙහි ද මෙරමාගේ සවිඥනක කයෙහි හා අනින්ද්‍රියබද්ධයෙහි ද අහංකාර මාන යැ මමංකාර තෘෂ්ණා යැ යන අනුශයධර්මයෝ නො වෙත් ද ' යි.

මහණ, අධ්‍යාත්ම වූ ද බාහ්‍ය වූ ද ඖදරික වූ ද සූක්ෂ්ම වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් රූපයෙක් ඇද්ද, දුරා හෝ සමීපයෙහි හෝ යම් රූපයෙක් ඇද්ද, එ හැම රූපය මාගේ නො වෙයි, තෙල මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ යැ ' යි මෙසේ තෙල රූපය යථාස්වභාවයෙන් විදර්ශනාප්‍රඥයෙන් දකී. යම් කිසි වේදනා වක් . . . යම් කිසි සංඥවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද ඖදරික වූ ද සූක්ෂ්ම වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි විඥනයෙක් ඇද්ද, දුරා හෝ සමීපයෙහි හෝ යම් විඥනයෙක් ඇද්ද, තෙල හැම විඥනය මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ යැ ' යි මෙසේ තෙල විඥනය තත්වූ පරිදි විදර්ශනාප්‍රඥයෙන් දකී. මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට මේ සවිඥනක කයෙහි ද බාහ්‍ය වූ සවිඥනක කයෙහි හා අනින්ද්‍රියබද්ධ යෙහි ද අහංකාර මාන යැ මමංකාර තෘෂ්ණා යැ යන අනුශය ධර්මයෝ නො වෙත් යයි වදළහ.

අථ ඛො, අඤ්ඤතරස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'ඉති කිර භො, රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා[1] අනත්තකතානි කම්මානි කමත්තානං ඵුසිස්සන්තීති.

අථ ඛො භගවා තස්ස භික්ඛුනො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය භික්ඛූ ආමන්තෙසි: ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො මොඝපුරිසො අවිද්වා අවිජ්ජාගතො තණ්හාධිපතෙය්‍යෙන චෙතසා සත්ථුසාසනං අතිධාවිතබ්බං මඤ්ඤෙය්‍ය: 'ඉති කිර භො රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා අනත්තකතානි කම්මානි කමත්තානං ඵුසිස්සන්තී'ති. පටිච්ච විනීතා[2] ඛො මෙ තුම්හෙ භික්ඛවෙ, තත්‍ර තත්‍ර ධම්මෙසු[3] තං. කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති?

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං

'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ.

තං කිංමඤ්ඤථ භික්ඛවෙ, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා-පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති?

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ.

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, 'සබ්බං රූපං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

---

1. විඤ්ඤාණං අනත්තං - සීමු.
2. පටිවිනීතා - සීමු, මජ්සං. / පටිපුච්ඡාවිනීතා - ස්‍යා.
3. තත්‍ර තත්‍ර තෙසු තෙසු ධම්මෙසු සීමු, PTS.

එකල්හි එක්තරා මහණක්හට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන : ' භවත්නි, මෙසේ කලි රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥව අනාත්ම යැ, සංස්කාරයෝ අනාත්මයෝ යැ, විඥනය අනාත්ම යැ, අනාත්මයෙහි සිට කළ කර්මයෝ කවර ආත්මයෙකැ සිට විපාක දෙන්නාහුද ' යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහුගේ චිත්තපරිවිතර්කය තමන් වහන්සේගේ සිතින් දැන භික්ෂූන් ඇමැතූ සේක : ' මහණෙනි, මෙල කරුණ වැලිත් විද්‍යමාන වෙයි, යම් කරුණෙකින් මෙලොවැ ඇතැම් මෝඝපුරුෂයෙක් අවිද්වද් වූයේ අවිද්‍යාවට පැමිණියේ තෘෂ්ණාව අධිපති කොට ඇති සිතින් යුක්ත වැ ශාස්තෘශාසනය ඉක්මැයායුතු කොට සිතන්නේ ය : ' භවත්නි, මෙසේ කලි රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥව අනාත්ම යැ, සංස්කාරයෝ අනාත්මයෝ යැ, විඥනය අනාත්ම යැ, අනාත්මයෙහි සිට කළ කර්මයෝ කවර ආත්මයෙකැ සිට විපාක දෙන්නාහු ද ' යි. මහණෙනි, මා විසින් තෙපි ඒ ඒ ධර්මයෙහි (ධර්ම) පිණිස විනීතයහ. මහණෙනි, ඒ කිමැයි සිතවු ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ' යි.

' වහන්ස, අනිත්‍ය යැ.'

' යළි යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ' යි.

' වහන්ස, දුක් වෙයි.'

' යළි යම් රූපයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වී නම් එය ' මෙලෙ මාගේ යැ, මෙලෙ මම වෙමි, මෙලෙ මාගේ ආත්මයැ ' යි (තෘෂ්ණාදෘෂ්ටි විසින්) දක්නට නිසි වේ ද ' යි.

' වහන්ස, මෙල නො වේ මැ යි.'

' මහණෙනි, ඒ කිමැයි සිතවු ද, වේදනාව . . . සංඥව . . .සංස්කාරයෝ . . . විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ' යි.

' වහන්ස, අනිත්‍ය වෙයි.'

' යළි යම් විඥනයක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ' යි.

' වහන්ස, දුක් වෙයි.'

' යළි යම් විඥනයක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වී නම් එය මෙලෙ මාගේ යැ, මෙලෙ මම වෙමි, මෙලෙ මාගේ ආත්ම වී යැ ' යි (තෘෂ්ණාදෘෂ්ටි විසින්) දක්නට නිසි වේ ද ' යි.

' වහන්ස, මෙලෙ නො වේ මැ යි.'

' එහෙයින් මහණෙනි, මෙහි ලා අධ්‍යාත්ම වූ ද බාහ්‍ය වූ ද ඖදරික වූ ද සූක්ෂ්ම වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි රූපයෙක් ඇද්ද දුර හෝ සමීප යෙහි හෝ යම් රූපයෙක් ඇද්ද මෙල හැම රූපය මාගේ නො වෙයි, මෙලෙ මම නො වෙමි, මෙලෙ මාගේ ආත්ම නො වේ යයි මෙසේ මෙල රූපය යථාභූත කොට සම්‍යග්ඥනයෙන් දක්ක යුතු. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥවක්. . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අධ්‍යාත්ම වූ ද බාහ්‍ය වූ ද ඖදරික වූ ද සූක්ෂම වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි විඥනයෙක් ඇද්ද දුර හෝ සමීපයෙහි හෝ යම් විඥනයෙක් ඇද්ද මෙල හැම විඥනය මාගේ නො වෙයි, මෙලෙ මම නො වෙමි, මෙලෙ මාගේ ආත්ම නො වේ ' යයි මෙසේ මෙල යථාභූත කොට සම්‍යග්ඥනයෙන් දක්ක යුතු.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිං නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාතීති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ඉමස්මිං ඛො පන[1] වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

මහාපුණ්ණම සුත්තං නවමං.

---

1. ඉමස්මිං ච පන - මජසං, සයා.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක රූපයෙහි කලකිරෙයි, වේදනායෙහිදු කලකිරෙයි, සංඥයෙහිදු කලකිරෙයි, සංස්කාරයන්හිදු කලකිරෙයි, විඥනයෙහි කලකිරෙයි, කලකිරෙනුයේ විරාගයට පැමිණෙයි, විරාගයෙන් විමුක්ත වෙයි, විමුක්ත කල්හි විමුක්ත යයි ප්‍රත්‍යවෙක්ෂාඥනය වෙයි : ' ජාතිය ක්ෂීණ යැ, බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, ඉත්ථම්භාවය පිණිස අන් කිසෙක් නැතැයි දනගනී.

භාග්‍යවතුන් වහන්සේ මේ වදළහ. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්‍දනා කළහ ' යි.

තවද මේ වෙය්‍යාකරණය වදරන කල්හි සැටක් පමණ භික්ෂූන්ගේ සිත් උපාදනා රහිත කොට ආශ්‍රවයන් කෙරෙන් මිදුණාහ ' යි.

නවවැනි මහාපුණ්ණම සූත්‍ර යි.

# 3. 1. 10

## චූළපුණ්ණම සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පණ්ණරසෙ පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි:

ජානෙය්‍ය නු ඛො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසං, 'අසප්පුරිසො අයං භව'න්ති.

නො හෙතං, භන්තෙ.

සාධු භික්ඛවෙ, අට්ඨානමෙතං භික්ඛවෙ, අනවකාසො යං අසප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය, 'අසප්පුරිසො අයං භව'න්ති.

ජානෙය්‍ය පන භික්ඛවෙ, අසප්පුරිසො සප්පුරිසං, 'සප්පුරිසො අයං භව'න්ති.

නො හෙතං, භන්තෙ.

සාධු භික්ඛවෙ, එතම්පි ඛො භික්ඛවෙ, අට්ඨානං අනවකාසො, යං අසප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භව'න්ති.

අසප්පුරිසො භික්ඛවෙ, අසද්ධම්මසමන්නාගතො හොති, අසප්පුරිසභත්තී හොති, අසප්පුරිසචින්තී හොති, අසප්පුරිසමන්තී හොති, අසප්පුරිසවාචො හොති, අසප්පුරිසකම්මන්තො හොති, අසප්පුරිසදිට්ඨී හොති, අසප්පුරිසදානං දෙති.

කථඤ්ච භික්ඛවෙ. අසප්පුරිසො අසද්ධම්මසමන්නාගතො[1] හොති: ඉධ භික්ඛවෙ, අසප්පුරිසො අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති. 'එවං ඛො භික්ඛවෙ අසප්පුරිසො අසද්ධම්මසමන්නාගතො[1] හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසභත්තී හොති : ඉධ භික්ඛවෙ, අසප්පුරිසස්ස යෙ තෙ සමණබ්‍රාහ්මණා අස්සද්ධා අහිරිකා අනොත්තප්පිනො අප්පස්සුතා කුසීතා මුට්ඨස්සතිනො දුප්පඤ්ඤා, ත්‍යාස්ස මිත්තා හොන්ති තෙ සහායා. එවං ඛො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසභත්තී හොති.

---

1. අස්සද්ධම්මසමන්නාගතො – මජසං.

# 3. 1. 10
# චූලපුණ්ණම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙකැ භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පූර්වාරාම නම් මුවරමා පායෙහි වැඩවසන සේක. තවද, එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ එදවස් පසළොස්වක් පොහොයෙහි කලා පිරුණු මැදිපොහොයැ රාත්‍රියෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරනලද සේක් අභ්‍යවකාශයෙහි වැඩහුන් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිහඬ ව හුන් භික්ෂුසංඝයා බලා භික්ෂූන් ඇමතූ සේක :

මහණෙනි, අසත්පුරුෂ ' මේ භවත් අසත්පුරුෂයෙකැ ' යි අසත්පුරුෂයා දතහෙන්නේද ' යි.

වහන්ස, තෙල නො වේ මැ ' යි.

මැනැව මහණෙනි, යම් කරුණෙකින් අසත්පුරුෂ ' මේ භවත් අසත්පුරුෂයෙකැ ' යි අසත්පුරුෂයා දතහෙන්නේ ද, මහණෙනි, තෙල අකාරණ යැ, අනවකාශ යි.

යළි මහණෙනි, අසත්පුරුෂ ' මේ භවත් සත්පුරුෂයෙකැ ' යි සත්පුරුෂයා දතහෙන්නේද ' යි.

වහන්ස, තෙල නො වේ මැ යැ.

මැනැවැ මහණෙනි, යම් කරුණෙකින් අසත්පුරුෂ ' මේ භවත් සත්පුරුෂයෙකැ ' යි සත්පුරුෂයා දතහෙන්නේ ද, මහණෙනි, තෙල ද අකාරණ යැ අනවකාශ යි.

මහණෙනි, අසත්පුරුෂ පාප (අසද්) ධර්මයෙන් යුක්ත වූයේ වෙයි, අසත්පුරුෂයන් සෙවුනේ වෙයි, අසත්පුරුෂචින්තායෙන් සිතන්නේ වෙයි, අසත්පුරුෂමන්ත්‍රණ ඇත්තේ වෙයි, අසත්පුරුෂ බස් බණන්නේ වෙයි, අසත්පුරුෂකම් කරනුයේ වෙයි, අසත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වෙයි, අසත්පුරුෂ දන් දෙනුයේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂධර්මසමන්වාගත වෙයි යත් : මහණෙනි මෙලොවැ අසත්පුරුෂ ශ්‍රද්ධා නැතියේ වෙයි, (පාපයෙහි) ලජ්ජා නැතියේ වෙයි, භය නැතියේ වෙයි, අල්පශ්‍රැත වෙයි, කුසීත වෙයි, මුළාසිහි ඇතියේ වෙයි, දුෂ්ප්‍රාඥ වෙයි. මහණෙනි, මෙසෙයින් අසත්පුරුෂ අසද්ධර්මසමන්වාගත වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂයන් සෙවුනේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ හට ශ්‍රද්ධා නැති පාපයෙහි ලජ්ජා නැති බිය නැති අල්පශ්‍රැත වූ කුසීත වූ මුඨස්මෘති ඇති දුෂ්ප්‍රාඥ වූ යම් මහණබමුණු කෙනෙක් වෙද්ද, ඔවුහු මිත්‍ර වෙති, ඔවුහු සහායයෝ වෙත්. මහණෙනි, මෙසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂයන් සෙවුනේ වේ.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසචින්තී හොති: ඉධ භික්ඛවෙ, අසප්පුරිසො අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති. එවං බො භික්ඛවෙ අසප්පුරිසො අසප්පුරිසචින්තී හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසමන්තී හොති. ඉධ භික්ඛවෙ, අසප්පුරිසො අත්තව්‍යාබාධායපි මන්තෙති, පරව්‍යාබාධායපි මන්තෙති, උභයව්‍යාබාධායපි මන්තෙති. එවං බො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසමන්තී හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසවාචො හොති: ඉධ භික්ඛවෙ, අසප්පුරිසො මුසාවාදී[1] හොති. පිසුනාවාචො[2] හොති. ඵරුසවාචො හොති. සම්ඵප්පලාපී හොති. එවං බො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසවාචො හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසකම්මන්තො හොති: ඉධ භික්ඛවෙ, අසප්පුරිසො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති. එවං බො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසකම්මන්තො හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසදිට්ඨී හොති : ඉධ භික්ඛවෙ, අසප්පුරිසො එවංදිට්ඨී[3] හොති : 'නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවං බො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසදිට්ඨී හොති.

කථඤ්ච භික්ඛවෙ, අසප්පුරිසො, අසප්පුරිසදානං දෙති : ඉධ භික්ඛවෙ, අසප්පුරිසො අසක්කච්චං දානං[4] දෙති, අසහත්ථා දානං දෙති, අචිත්තීකත්වා[5] දානං දෙති, අපවිද්ධං[6] දානං දෙති, අනාගමනදිට්ඨිකො දානං දෙති. එවං බො භික්ඛවෙ, අසප්පුරිසො අසප්පුරිසදානං දෙති.

ස බො සො භික්ඛවෙ,[7] අසප්පුරිසො එවං අසද්ධම්මසමන්නාගතො, එවං අසප්පුරිසභත්තී, එවං අසප්පුරිසචින්තී, එවං අසප්පුරිසමන්තී, එවං අසප්පුරිසවාචො, එවං අසප්පුරිසකම්මන්තො, එවං අසප්පුරිසදිට්ඨී, එවං අසප්පුරිසදානං දත්වා කායස්ස භෙදා පරම්මරණා යා අසප්පුරිසානං ගති, තත්ථ උප්පජ්ජති. කා ච භික්ඛවෙ, අසප්පුරිසානං ගති, නිරයො වා තිරච්ඡානයොනි වා.

ජානෙය්‍ය නු බො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසං 'සප්පුරිසො අයං භව'න්ති.

එවං භන්තෙ.

---

1. මුසාවාදෙ - සීමු, 2. පිසුණවාචො - සීමු, මජ්ඣං, ස්‍යා.
3. එවංදිට්ඨිකො - ස්‍යා. 4. අසක්කච්චදානං - PTS.
5. {අචිත්තීකත්වා - සීමු, මජ්ඣං, PTS.
{අචිත්තිං කත්වා - ස්‍යා.
6. අපවිට්ඨං - සීමු, මජ්ඣං, ස්‍යා. 7. සො භික්ඛවෙ - සීමු, මජ්ඣං

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂචින්ති වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ තමහට දුක් පිණිස ද සිතයි, මෙරමාහට දුක් පිණිස ද සිතයි, තමා හා පරහට දුක් පිණිස ද සිතයි. මෙසෙයින් මහණෙනි, අසත්පුරුෂ අසත්පුරුෂ සිතුවිලි සිතනුයේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂමන්ත්‍රණ ඇත්තේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ ආත්මපීඩා පිණිස ද මන්ත්‍රණ කෙරෙයි, පරපීඩා පිණිස ද මන්ත්‍රණ කෙරෙයි, උභයපීඩා පිණිස ද මන්ත්‍රණ කෙරෙයි. මෙසෙයින් මහණෙනි, අසත්පුරුෂ අසත්පුරුෂ මන්ත්‍රණ ඇත්තේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂබස් බණන්නේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ මුසවා ඇතියේ වෙයි, පිසුනු බණන්නේ වෙයි, පරොස්බස් බණනු යේ වෙයි, සිස්බස් බණනුයේ වෙයි. මෙසෙයින් මහණෙනි, අසත්පුරුෂ අසත්පුරුෂ බස් බණන්නේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂකම් ඇතියේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ ප්‍රාණවධ කරනුයේ වෙයි, අයිනාදන් ගන්නේ වෙයි, කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මෙසෙයින් මහණෙනි, අසත්පුරුෂ අසත්පුරුෂ කර්මාන්ත ඇතියේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂදෘෂ්ටි ඇතියේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි : දනයෙහි ඵල නැත, යාගයෙහි ඵල නැත, පුදනා ලද්දයෙහි ඵල නැත, කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක නැත, මෙලොව නැත, පරලොව නැත, මවු නැත, පියා නැත, සැවැ උපදනා සත්ත්ව කෙනෙක් නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රකාශ කෙරෙත් ද, එබඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න වූ මහණබමුණු කෙනෙක් ලොවැ නැතැ ' යි. මෙසෙයින් මහණෙනි, අසත්පුරුෂ අසත්පුරුෂදෘෂ්ටි ඇතියේ වේ.

මහණෙනි, කිසෙයින් අසත්පුරුෂ අසත්පුරුෂදන දෙයි යත් : මහණෙනි, මෙලොවැ අසත්පුරුෂ නො සකසා දන් දෙයි, සියතින් දන් නො දෙයි, (දෙය ධර්ම, පුද්ගලයන් කෙරෙහි) බුහුමන් නො කොට දන් දෙයි, බැහැරලන රිසි ඇති වැ (අපවිත්‍ර වැ) දන් දෙයි, විපාක ලැබෙයි යන දෘෂ්ටි නැති ව දන් දෙයි. මහණෙනි, මෙසෙයින් අසත්පුරුෂ අසත් පුරුෂදනය දෙයි.

මහණෙනි, තෙල අසත්පුරුෂ මෙසේ අසද්ධර්මයෙන් සමන්වාගත වූයේ මෙසේ අසත් පුරුෂසේවන ඇතියේ මෙසේ අසත්පුරුෂචින්තා ඇතියේ මෙසේ අසත්පුරුෂ මන්ත්‍රණ ඇතියේ මෙසේ අසත්පුරුෂ බස් ඇතියේ මෙසේ අසත්පුරුෂ කම් ඇතියේ මෙසේ අසත් පුරුෂ දෘෂ්ටි ඇතියේ මෙසේ අසත්පුරුෂ දන් දී කාබුන් මරණින් මත්තෙහි අසත්පුරුෂ යන්ගේ යම් ගතියෙක් ඇද්ද, එහි උපදී. මහණෙනි, අසත්පුරුෂයන්ගේ ගති කවර යැ : නිරය හෝ තිරිසන් යොනිය හෝ යි.

මහණෙනි, සත්පුරුෂ ' මේ භවත් සත්පුරුෂයෙකැ ' යි සත්පුරුෂයා දනහෙන්නේ ද ' යි.

එසේයැ, වහන්ස,

සාධු භික්ඛවෙ, ඨානමේතං භික්ඛවෙ, විජ්ජති යං සප්පුරිසො සප්පුරිසං ජානෙය්‍ය 'සප්පුරිසො අයං භව'න්ති.

ජානෙය්‍ය පන භික්ඛවෙ, සප්පුරිසො අසප්පුරිසං 'අසප්පුරිසො අයං භව'න්ති.

එවං භන්තෙ.

සාධු භික්ඛවෙ, එතම්පි ඛො භික්ඛවෙ, ඨානං විජ්ජති යං සප්පුරිසො අසප්පුරිසං ජානෙය්‍ය 'අසප්පුරිසො අයං භව'න්ති.

සප්පුරිසො භික්ඛවෙ, සද්ධම්මසමන්නාගතො හොති, සප්පුරිසභත්ති හොති, සප්පුරිසචින්තී හොති, සප්පුරිසමන්තී හොති, සප්පුරිසවාචො හොති, සප්පුරිසකම්මන්තො හොති, සප්පුරිසදිට්ඨි හොති, සප්පුරිසදානං දෙති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සද්ධම්මසමන්නාගතො හොති : ඉධ භික්ඛවෙ, සප්පුරිසො සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතසති හොති, පඤ්ඤවා හොති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සද්ධම්මසමන්නාගතො හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසභත්ති හොති : ඉධ භික්ඛවෙ, සප්පුරිසස්ස යෙ තෙ සමණබ්‍රාහ්මණා සද්ධා හිරිමන්තො ඔත්තප්පිනො බහුස්සුතා ආරද්ධවිරියා උපට්ඨිතසතිනො පඤ්ඤවන්තො, ත්‍යාස්ස මිත්තා හොන්ති තෙ සහායා.[1] එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසභත්ති හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසචින්තී හොති: ඉධ භික්ඛවෙ, සප්පුරිසො නෙවත්තබ්‍යාබාධාය චෙතෙති, න පරබ්‍යාබාධාය චෙතෙති, න උභයබ්‍යාබාධාය චෙතෙති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසචින්තී හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසමන්තී හොති: ඉධ භික්ඛවෙ, සප්පුරිසො නෙවත්තබ්‍යාබාධාය මන්තෙති, න පරබ්‍යාබාධාය මන්තෙති, න උභයබ්‍යාබාධාය මන්තෙති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසමන්තී හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසවාචො හොති: ඉධ භික්ඛවෙ, සප්පුරිසො මුසාවාදා පටිවිරතො හොති, පිසුනාය වාචාය[2] පටිවිරතො හොති, ඵරුසාය වාචාය[3] පටිවිරතො හොති. සම්ඵප්පලාපා පටිවිරතො හොති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසවාචො හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසකම්මන්තො හොති, ඉධ භික්ඛවෙ, සප්පුරිසො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමේසු මිච්ඡාචාරා පටිවිරතො හොති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසකම්මන්තො හොති.

---

1. තෙ සහායා හොන්ති - PTS.
2 පිසුණාවාචාය - PTS.
3. ඵරුසාවාචාය - PTS.

මැනැවැ මහණෙනි. යම් කරුණෙකින් මහණෙනි, සත්පුරුෂ ' මේ භවත් සත්පුරුෂ යෙකැ ' යි සත්පුරුෂයා දතහෙන්නේය යන මෙකරුණ වන්නේ යි.

යළි මහණෙනි, සත්පුරුෂ ' මෙ භවත් අසත්පුරුෂයෙකැ ' යි අසත්පුරුෂයා දත හෙන්නේ ද ' යි.

එසේ යැ, වහන්ස,

මැනැවැ මහණෙනි. යම් කරුණෙකින් මහණෙනි, සත්පුරුෂ ' මේ භවත් අසත්පුරුෂ යෙකැ ' යි අසත්පුරුෂයා දතහෙන්නේ යි.

මහණෙනි, සත්පුරුෂ සද්ධර්මයෙන් සමන්වාගත වෙයි, සත්පුරුෂයන් සෙවුනේ වෙයි, සත්පුරුෂ සිතිවිලි සිතන්නේ වෙයි, සත්පුරුෂමන්ත්‍රණ ඇත්තේ වෙයි, සත්පුරුෂ බස් ඇත්තේ වෙයි, සත්පුරුෂ ක්‍රියා ඇත්තේ වෙයි, සත්පුරුෂදෘෂ්ටි ඇත්තේ වෙයි, සත්පුරුෂදන දෙයි.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සද්ධර්මසමන්වාගත වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ ශ්‍රද්ධා ඇත්තේ වෙයි, හ්‍රී ඇත්තේ වෙයි, අපත්‍රපා ඇත්තේ වෙයි, බහුශ්‍රත වූයේ වෙයි, ආරබ්ධවීර්‍ය්‍ය වෙයි, එළැඹසිටි සිහි ඇත්තේ වෙයි, ප්‍රඥවත් වෙයි. මෙසෙයින් මහණෙනි, සත්පුරුෂ සද්ධර්මසමන්වාගත වූයේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂයන් සෙවුනේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂහට යම් මහණබමුණු කෙනෙක් ශ්‍රද්ධා ඇත්තාහු හ්‍රී ඇත්තාහු අපත්‍රපා ඇත්තාහු බහුශ්‍රැත වූවාහු ආරබ්ධවීර්‍ය්‍ය වූවාහු එළැඹසිටි සිහි ඇත්තාහු ප්‍රඥවත් වූවාහු වෙත් ද, ඔවුහු මිත්‍ර වෙති, ඔවුහු සහායයෝ වෙත්. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂයන් සෙවුනේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂචින්තා ඇත්තේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ ආත්මපීඩාව පිණිස නො මැ සිතයි, පරපීඩා පිණිස නො සිතයි, උභයපීඩා පිණිස නො සිතයි. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂචින්තා ඇත්තේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂමන්ත්‍රණ ඇත්තේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ ආත්මපීඩා පිණිස නො මැ මන්ත්‍රණ කෙරෙයි, පරපීඩා පිණිස මන්ත්‍රණ නො කෙරෙයි, උභයපීඩා පිණිසමන්ත්‍රණ නො කෙරෙයි. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂමන්ත්‍රණ ඇත්තේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂවචන ඇතියේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ මුසවායෙන් වැළැකුණේ වෙයි, පිසුනු බසින් වැළැකුණේ වෙයි, පරොස්බසින් වැළැකුණේ වෙයි, සිස්බස් බිණීමෙන් වැළැකුණේ වෙයි. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂ වචන ඇත්තේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂ කර්මාන්ත ඇතියේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ ප්‍රාණවධයෙන් වැළැකුණේ වෙයි, අදත්තාදානයෙන් වැළැකුණේ වෙයි, කාමමිථ්‍යාචාරයෙන් වැළැකුණේ වෙයි. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂකර්මාන්ත ඇතියේ වේ.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසදිට්ඨී හොති: ඉධ භික්ඛවෙ, සප්පුරිසො එවංදිට්ඨී හොති: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසදිට්ඨී හොති.

කථඤ්ච භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසදානං දෙති: ඉධ භික්ඛවෙ, සප්පුරිසො සක්කච්චං දානං[1] දෙති, සහත්ථා දානං දෙති, චිත්තීකත්වා[2] දානං දෙති, පරිසුද්ධං[3] දානං දෙති, ආගමනදිට්ඨිකො දානං දෙති. එවං ඛො භික්ඛවෙ, සප්පුරිසො සප්පුරිසදානං දෙති.

ස ඛො සො භික්ඛවෙ[4], සප්පුරිසො එවං සද්ධම්මසමන්නාගතො, එවං සප්පුරිසභත්තී, එවං සප්පුරිසචින්තී, එවං සප්පුරිසමන්තී, එවං සප්පුරිසවාචො, එවං සප්පුරිසකම්මන්තො, එවං සප්පුරිසදිට්ඨී, එවං සප්පුරිසදානං දත්වා කායස්ස භෙදා පරම්මරණා යා සප්පුරිසානං ගති, තත්ථ උපපජ්ජති. කා ච භික්ඛවෙ, සප්පුරිසානං ගති, දෙවමහත්තතා වා මනුස්සමහත්තතා වා'ති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

චූළපුණ්ණම සුත්තං දසමං.

---

## දෙවදහ වග්ගො පඨමො.

තස්ස වග්ගස්ස උද්දානං

දෙවදහං පඤ්චත්තය කින්ති සාම සුනක්ඛත්තක සප්පායා.
ගණකො ගොපක පුණ්ණකා ද්වෙ ඉති පඨමො අසමො වරවග්ගො.

---

1. සක්කච්චදානං - PTS.
2. චිත්තීකත්වා - මජසං, PTS. / චිත්තිංකත්වා - සයා.
3. අනපවිට්ඨං - මජසං.
4. සො භික්ඛවෙ - සීමු, මජසං.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂ දෘෂ්ටි ඇතියේ වෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි : දානයෙහි විපාක ඇත, යාගයෙහි විපාක ඇත, පූජායෙහි විපාක ඇත, සුකෘතදුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක ඇත, (පර ලොවැ සිටියානට) මෙලොව ඇත, (මෙලොව සිටියානට) පරලොව ඇත, මවු (මාතෘ-උපස්ථානයෙහි විපාක) ඇත, පියා ඇත, ඔපපාතික ව උපදනා සත්ත්වයෝ ඇත, ලොවැ යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද, එබඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න වූ මහණබමුණෝ ඇතැ ' යි මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂදෘෂ්ටි ඇත්තේ වේ.

මහණෙනි, කිසෙයින් සත්පුරුෂ සත්පුරුෂදාන දෙයි යත් : මහණෙනි, මෙලොවැ සත්පුරුෂ සකසා දන් දෙයි, සියතින් දන් දෙයි, සිතින් බුහුමන් කොට දන් දෙයි, පරිශුද්ධ කොට දන් දෙයි, විපාක ලැබෙයි යන දෘෂ්ටි ඇති ව දන් දෙයි. මහණෙනි, මෙසෙයින් සත්පුරුෂ සත්පුරුෂදාන දෙයි.

මහණෙනි, තෙල සත්පුරුෂ මෙසේ සද්ධර්මසමන්වාගත වූයේ මෙසේ සත්පුරුෂයන් සෙවුනේ මෙසේ සත්පුරුෂචින්තා ඇතියේ මෙසේ සත්පුරුෂමන්ත්‍රණ ඇතියේ මෙසේ සත්පුරුෂ බස් ඇතියේ මෙසේ සත්පුරුෂකර්මාන්ත ඇතියේ මෙසේ සත්පුරුෂදෘෂ්ටි ඇතියේ මෙසේ සත්පුරුෂදාන දී කාබුන් මරණින් මත්තෙහි සත්පුරුෂයන් ගේ යම් ගතියෙක් ඇද්ද, එහි උපදනේය. මහණෙනි, සත්පුරුෂයන්ගේ ගති කවර යත් : ෂට්කාමාවචර දෙව සංඛ්‍යාත දේවමහත්වය හෝ මනුෂ්‍යමහත්වය හෝ යි.

භාග්‍යවතුන් වහන්සේ මේ සුත වදළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කළාහ ' යි.

දසවැනි චූළපුණ්ණම සූත්‍ර යි

---

# පළමුවන දෙවදහ වර්ගය නිමි.

**දෙවදහවර්ගයේ, උද්දානය :**

දෙවදහ නම් ශාක්‍යනිගමය නිසා වැඩවෙසෙමින් වදළ දෙවදහ සූත්‍රය ද, සංඥා ආදි ත්‍රිකය උච්ඡේද දෘෂ්ටධර්මනිර්වාණ හා පඤ්චකය ගෙන " ඉති ඉමානි පඤ්ච හුත්වා තීණි හොන්ති, තීණි හුත්වා පඤ්ච හොන්ති " යි පඤ්චත්‍රය උද්දෙස කොට වදළ පඤ්චත්තය සූත්‍රය හා " කින්ති වො භික්ඛවෙ " යනාදීන් ආරබ්ධකින්ති සූත්‍රය ද, සාමග්‍රාමයෙහි වැඩහිඳ වදළ සාමගාම සූත්‍රය, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත භික්ෂුව සඳහා වදළ සුනක්ඛත්ත සූත්‍රය හා චතුර්ථධ්‍යානාදි ආනෙඤ්ජසමාපත්තියට උපකාරවූ ප්‍රතිපත් වදළ ආනෙඤ්ජ-සප්පාය සූත්‍රය ද, ශාසනයෙහි අනුපූර්වශික්ෂා වදළ ගණකමොග්ගල්ලාන සූත්‍රය ද, බුද්ධපරිනිර්වාණයට සමනන්තර ව ආනන්ද තෙරුන් විසින් ගොපකමොග්ගල්ලාන බමුණුහු ගේ කර්මාන්ත ස්ථානයෙහි දී වදළ ගොපකමොග්ගල්ලාන සූත්‍රය හා පුවරම් මුවරමාපායෙහි වැඩහිඳ සඳ පිරුණු මැදිපොහොයෙහි වදළ මහාපුණ්ණම චූළපුණ්ණම දෙ සුත ද යන මෙයින් සැදුණු පළමු වන දෙවදහ වග නිමියේ යි.

# 2 අනුපදවග්ගො

## 3. 2. 1

## අනුපද සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පණ්ඩිතො භික්ඛවෙ සාරිපුත්තො, මහාපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො පුථුපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, හාසුපඤ්ඤො[1] භික්ඛවෙ සාරිපුත්තො, ජවනපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, තික්ඛපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො, නිබ්බෙධිකපඤ්ඤො භික්ඛවෙ සාරිපුත්තො. සාරිපුත්තො භික්ඛවෙ, අඩ්ඪමාසං අනුපදධම්මවිපස්සනං විපස්සති. තත්‍රිදං භික්ඛවෙ සාරිපුත්තස්ස අනුපදධම්මවිපස්සනාය හොති.

ඉධ භික්ඛවෙ, සාරිපුත්තො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. යෙ ච පඨමෙ ඣානෙ[3] ධම්මා විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං[4] සති උපෙක්ඛා[5] මනසිකාරො. ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති, ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපයො[6] අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං[7] නිස්සරණ'න්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස[8] හොති.

---

1. හාසපඤ්ඤා – මජසං, සය්‍යා.
2. පඨමජ්ඣානං – සිමු, PTS.
3. පඨමජ්ඣානෙ – සිමු, PTS.
4. විරියං – මජසං.
5. උපෙඛා – PTS.
6. අනුපායො – සිමු.
7. උත්තරි – මජසං.
8. අත්ථිතෙවස්ස – PTS.

# 2 අනුපදවර්ගය

## 3. 2. 1
## අනුපද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහි දී භාග්‍ය වතුන්වහන්සේ මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ' යි ඒ වහන්ද භාග්‍යවතුන් වහන්සේට පිළිවදත් ඇස්සූහ. භාග්‍යවතුන්වහන්සේ මෙල අනුපද සූත වදළ සේක.

මහණෙනි, ශාරිපුත්‍ර (ධාත්වාදි කුශලතාවෙන්) පණ්ඩිත වූයේ ය, මහණෙනි, ශාරිපුත්‍ර මහාප්‍රඥ ඇත්තේ ය, මහණෙනි, ශාරිපුත්‍ර (නානාස්කන්ධාදියෙහි ප්‍රවෘත්ත වූ) පෘථුප්‍රඥ ඇත්තේ ය, මහණෙනි, ශාරිපුත්‍ර (හර්ෂබහුල ව ශීලස්කන්ධාදිය පූරන)හාසුප්‍රඥ ඇත් තේය, මහණෙනි, ශාරිපුත්‍ර (රූපාදියෙහි අනිත්‍යාදි විසින් වහා දිවෙන) ජවන ප්‍රඥ ඇත්තේ ය, මහණෙනි, ශාරිපුත්‍ර (වහා කෙලෙස් සිඳින) තීක්ෂ්ණ ප්‍රඥ ඇත්තේය. මහණෙනි, ශාරිපුත්‍ර (පෙර නොබුත් ලොභස්කන්ධාදිය ප්‍රදාරණ කරන) නිබ්බේධික ප්‍රඥ ඇත්තේය. මහණෙනි, ශාරිපුත්‍ර අඩ මසක් මුළුල්ලෙහි (සමාපත්ති විසින් හෝ ධ්‍යානාංග විසින් හෝ) අනුපිළිවෙළින් ධර්මවිදර්ශනාව කෙරෙයි. මහණෙනි, ඒ අනුපද ධර්මවිදර්ශනා විෂයෙහි ශාරිපුත්‍රයන්ගේ මේ (අනුපදධර්ම විදර්ශනාව) වෙයි.

මහණෙනි, මෙ සස්නෙහි ශාරිපුත්‍ර, කාමච්ඡන්ද නීවරණයෙන් වෙන් ව (ශෙෂනීවරණ) අකුශල ධර්මයන්ගෙන් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙයි. තවද ප්‍රථම ධ්‍යානයෙහි විතර්කය ද, විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතා ද ඵස්ස වෙදනා සඤ්ඤා චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යන යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු විසින් ඒ ධර්මයෝ අනු පිළිවෙළින් පිරිසිඳුනා ලද්දාහු වෙති. ඔහුට ඒ ධර්මයෝ ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නාහු වෙති, ප්‍රකට ව නිරුද්ධ වෙත්. හේ මෙසෙයින් දනගනී ; මෙසේ මේ ධර්මයෝ පෙර නොවී උපදිති, ඉපිද වැනැසෙත් යයි. හේ ඒ ධර්මයන්, කෙරෙහි රාග වශයෙන් නො පැමිණෙනුයේ ප්‍රතිඝවශයෙන් අනපගත වූයේ තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ඡන්දරාගයෙන් නො බැඳුණේ කාමරාගයෙන් වෙසෙසින් මිදුණේ චතුර් යෝගයෙන් නො යෙදුණේ සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණු සිතින් යුක්ත ව වෙසෙයි. හේ මතුයෙහි අනන්තර විසේස සංඛ්‍යාත නිස්සරණය ඇතැ'යි දනගනී. ඒ දනුම බහුලී කාරයෙන් ඇත් මැ යයි ඔහුට දඩි ව සිත් වෙ.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. යෙ ච දුතියෙ ඣානෙ[2] ධම්මා අජ්ඣත්තං සම්පසාදො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච එස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො, ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: 'එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති. හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපායො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො 'අත්ථි උත්තරිං නිස්සරණ'න්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස හොති.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො පීතියා ච විරාගා උපෙක්ඛකො ච[3] විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. යෙ ච තතියෙ ඣානෙ ධම්මා සුඛඤ්ච සති ච සම්පජඤ්ඤඤ්ච චිත්තෙකග්ගතා ච එස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො. ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: 'එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපායො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස හොති.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, යෙ ච චතුත්ථෙ ඣානෙ ධම්මා උපෙක්ඛා අදුක්ඛමසුඛා වෙදනා පස්සද්ධත්තා[4] චෙතසො අනාභොගො සතිපාරිසුද්ධි චිත්තෙකග්ගතා ච එස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො. ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: 'එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපායො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස හොති.

---

1. දුතියජ්ඣානං - සීමු. PTS.
2. දුතියජ්ඣානෙ - සීමු, PTS.
3. උපෙඛකොච - PTS.
4. පස්සද්ධත්තා - සීමු. / පරිසුද්ධත්තා - ස්‍යා. / පස්සි වෙදනා - PTS.

යළිදු අනෙකෙකි. මහණෙනි, ශාරිපුත්‍ර විතර්ක විචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්ම යෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති අවිතර්ක අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති දෙවෙනි දූහැනට පැමිණ වෙසෙයි. ද්විතීය ධ්‍යානයෙහි අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෙකාග්‍රතාව ද ඵස්ස වෙදනා සඤ්ඤා චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද්ද, උන් විසින් ඒ ධර්මයෝ අනු පිළිවෙළින්, පිරිසිඳුනා ලදහු වෙති, ඔහුට ඒ දහම්හු ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නාහු වෙති, ප්‍රකට ව නිරුද්ධ වෙත්. හේ මෙසේ දනගනී ; මෙසේ මේ ධර්මයෝ පෙර නොවී උපදිති, ඉපද වැනැසෙත් යයි. හේ ඒ දහම්හි රාග විසින් නො පැමිණෙනුයේ ප්‍රතිඝ විසින් අනපගත වූයේ තෘෂ්ණා දෘෂ්ටීන් අනිශ්‍රිත වූයේ ඡන්දරාගයෙන් නො බැඳුණේ (කාමරාගයෙන්) වෙසෙසින් මිදුණේ චතුර්යොගයෙන් නො යෙදුණේ කෙලෙසුන් කෙරෙන් මිදුණු සිතින් යුක්ත ව වෙසෙයි, හේ මත්තෙහි නිස්සරණය ඇතැ යි දනගනී. ඒ දනුම බිහිලි කිරීමෙන් ඇතැයි කියා ම ඔහුට සිත වේ.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර ප්‍රීතියගේ ද විරාගයෙන් ධ්‍යානෝපෙක්ෂා ඇති ව වෙසෙයි. ස්මෘති ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව කයින් සුවය ද විඳී, යම් ධ්‍යානයක් හේතු කොටගෙන ආර්‍යයෝ ඒ ධ්‍යාන සමඞ්ගී පුඟුල්හු උපේක්ෂා ඇත්තෙක ස්මෘතිමත් යැ සුව විහරණ ඇත්තෙකැ යි පවසත් ද, ඒ තුන්වැනි දූහැනට පැමිණ වෙසෙයි. තවද තෘතීය ධ්‍යානයෙහි – සුඛය ද ස්මෘතිය ද සම්ප්‍රජන්‍යය ද චිත්තෙකාග්‍රතාව ද ඵස්ස වෙදනා සඤ්ඤා චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද්ද, උන් විසින් ඒ ධර්මයෝ අනුපරිපාටියෙන් ව්‍යවස්ථිත වූවාහු වෙති, ඔහුට ඒ ධර්මයෝ ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නාහු වෙති: ප්‍රකට ව නිරුද්ධ වෙත්. හේ මෙසේ දනගනී: මෙසේ මෙ දහම්හු පෙර නො වී උපදිති, ඉපද වැනැසෙත්' යයි. හේ ඒ ධර්මයන්හි රාග විසින් නො පැමිණෙනුයේ ප්‍රතිඝ විසින් අනපගත වනුයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විගත මර්‍යාද කළ සිතින් යුක්ත ව වාස කෙරෙයි. හේ මතුයෙහි නිස්සරණයෙක් ඇතැයි දනගනී. ඒ දනුම බහුලීකරණයෙන් ඇතැයි කියා මැ ඔහුට සිත් වේ.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර කායිකසුඛයාගේ ද ප්‍රහාණයෙන් කායික දුඃඛයාගේ ද ප්‍රහාණ යෙන් පෙර මැ සොමනස්, දොම්නසුන් ගේ අස්තඞ්ගමයෙන් දුක් නො වූ සුව නො වූ උපේක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය ඇති සිවුවන දූහැනට පැමිණ වෙසෙයි. චතුර්ථ ධ්‍යානයෙහි වෙදනුපෙක්ඛා (සංඛ්‍යාත) නො දුක් නො සුව වෙදනාව ද ප්‍රශ්‍රබ්ධ හෙයින් චිත්තයාගේ අනාභොග යැ ස්මෘතිපාරිශුද්ධි යැ (එයින්) චිත්තෙකාග්‍රතාව ද ඵස්ස වෙදනා සඤ්ඤා චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද්ද ඔහු විසින් ඒ ධර්මයෝ අනු පිළිවෙළින් පිරිසිඳුනා ලදහු වෙති. ඔහුට ඒ ධර්මයෝ ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නාහු ය, ප්‍රකට ව නිරුද්ධ වෙත්, හේ මෙසේ දනගනී ; මෙසේ මේ දහම් හු පෙර නොවී උපදිති, ඉපද වැනසෙත්'යයි. හේ ඒ දහම්හි රාග විසින් නො ගන්නේ ප්‍රතිඝ විසින් අපගත නො වනුයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ කාමරාගයෙන් වෙසෙසින් මිදුණේ චතුර්යෝගයෙන් නො යෙදුණේ සියලු කෙලෙසුන් කෙරෙහි මිදුණු සිතින් යුක්ත ව වෙසෙයි. හේ මතුයෙහි නිස්සරණයෙක් ඇතැ'යි දනගනී. ඒ දනුම බහුලීකාරයෙන් ඇතැයි කියා මැ ඔහුට සිත් වේ.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. යෙ ච ආකාසානඤ්චායතනෙ ධම්මා ආකාසානඤ්චායතනසඤ්ඤා ච චිත්තෙකග්ගතා ච ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො, ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: 'එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං[1] නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස[2] හොති.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. යෙ ච විඤ්ඤාණඤ්චායතනෙ ධම්මා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා ච චිත්තෙකග්ගතා ච ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො, ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: 'එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති සො අත්ථි උත්තරිං[1] නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස[2] හොති.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. යෙ ච ආකිඤ්චඤ්ඤායතනෙ ධම්මා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා ච චිත්තෙකග්ගතා ච ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඡන්දො අධිමොක්ඛො විරියං සති උපෙක්ඛා මනසිකාරො, ත්‍යාස්ස ධම්මා අනුපදවවත්ථිතා හොන්ති. ත්‍යාස්ස ධම්මා විදිතා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. සො එවං පජානාති: එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස හොති.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සො තාය සමාපත්තියා සතො වුට්ඨහති. සො තාය සමාපත්තියා සතො වුට්ඨහිත්වා යෙ තෙ ධම්මා[3] අතීතා නිරුද්ධා විපරිණතා, තෙ ධම්මෙ සමනුපස්සති: එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සො අත්ථි උත්තරිං නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා අත්ථිත්වෙවස්ස හොති.

---

1. උත්තරි - මජ්ඣං.  2. අත්ථිතෙවස්ස - PTS.
3. යෙ ධම්මා - මජ්ඣං, ස්‍යා, PTS.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් ඉක්මැවීමෙන් ප්‍රතිඝ සංඥවන් ගේ අස්තංගමයෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් ආකාසය අනන්ත යැ'යි ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වෙසෙයි. ආකාසානඤ්චාය තනයෙහි අකාසානඤ්චායතනසංඥ ව ද චිත්තෛකාග්‍රතාව ද ඵස්ස වෙදනා සඤ්ඤ චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද් ද, ඔහු විසින් ඒ ධර්මයෝ අනුපිළිවෙළින් පිරිසිඳුනා ලදහු වෙති, ඔහුට ඒ දහම්හු ප්‍රකට ව උපදිති, ප්‍රකටව පවත්නාහු වෙති, ප්‍රකට ව නිරුද්ධ වෙත්. හේ මෙසේ දනගනී : මෙසේ මෙ දහම්හු පෙර නො වී උපදිති, ඉපද වැනැසෙති යි, හේ ඒ දහම්හි රාග විසින් අනුපගතවූයේ ප්‍රතිඝ විසින් අනපගත වූයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විගත මය්‍යාද කළ සිතින් යුක්ත ව වෙසෙයි. හේ මත්තෙහි නිස්සරණ ඇතැයි දනගනී. ඒ දනුම බිහිලි කිරීමෙන් ඇතැයි කියා මැ ඔහුට සිත් වේ.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඥනය අනන්ත යයි විඤ්ඤණඤ්චායතන සමාපත්තියට පැමිණ වෙසෙයි. විඤ්ඤණඤ්චායතන-යෙහි විඤ්ඤණඤ්චායතන සංඥව ද චිත්තෛකාග්‍රතාව ද ඵස්ස වෙදනා සඤ්ඤ චෙතනා චිත්ත අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද්ද ඔහු විසින් ඒ ධර්මයෝ අනුපිළිවෙළින් පිරිසිඳුනා ලදහු වෙති, ඔහුට ඒ දහම්හු ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නාහු වෙති, ප්‍රකට ව නිරුද්ධ වෙත්. හේ මෙසේ දනගනී : මෙසේ මෙ දහම්හු පෙර නො වී උපදිති, ඉපද වැනැසෙති'යි, හේ ඒ දහම්හි අනුපගත වූයේ අනපගත වූයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමය්‍යාදීකෘත චිත්තයෙන් යුක්ත ව වෙසෙයි. හේ මතුයෙහි නිස්සරණ ඇතැයි දනගනී, ඒ දනුම බිහිලි කිරීමෙන් ඇතැයි කියා මැ ඔහුට සිත් වේ.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර විඤ්ඤණඤ්චායතනය ඉක්මැවීමෙන් නත්ථි කිඤ්චි යි ආකි ඤ්චඤ්ඤයතන සමාපත්තිය උපදවා වෙසෙයි. ආකිඤ්චඤ්ඤයතනයෙහි ආකිඤ්චඤ්ඤය තන සංඥව ද චිත්තෛකාග්‍රතා ද ඵස්ස වෙදනා සඤ්ඤ චෙතනා චිත්ත ඡන්ද අධිමොක්ඛ විරිය සති උපෙක්ඛා මනසිකාර යැ යන යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු විසින් ඒ දහම්හු අනුපිළිවෙළින් පිරිසිඳුනා ලදහු වෙති. ඔහුට ඒ දහම්හු ප්‍රකට ව උපදිති, ප්‍රකට ව පවත්නා හු වෙති, ප්‍රකටව නිරුද්ධ වෙත්. හේ මෙසේ දනගනී ; මෙසේ මේ දහම්හු පෙර නො වී උපදිති, ඉපදු වැනැසෙති'යි. හේ ඒ දහම්හි අනුපගත වූයේ අනපගත වූයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමය්‍යාදීකෘත චිත්තයෙන් යුක්ත ව වෙසෙයි. හේ මත්තෙහි නිස්සරණ ඇතැයි දනගනී. ඒ දනුම බිහිලි කිරීමෙන් ඇතැයි කියා මැ ඔහුට සිත් වේ.

යළිදු මහණෙනි, ශාරිපුත්‍ර සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤයතන සමාපත්තිය ඉක්මවා නෙවසඤ්ඤනාසඤ්ඤයතන සමාපත්තියට පැමිණ වෙසෙයි, හේ ඒ සමවතින් සිහි ඇති ව නැඟී සිටී, හේ ඒ සමවතින් සිහි ඇති ව නැඟී සිට යම් ධර්ම කෙනෙක් ඉක්මැ ගියාහු නිරුද්ධ වූවාහු විපරිණත වූවාහු ද ඒ ධර්මයන් විදසුන් නුවණින් දකී : මෙසේ මෙ දහම්හු පෙර නො වී උපදිති, ඉපද වැනැසෙත් යයි, හේ ඒ දහම්හි අනුපගත වූයේ අනපගත වූයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමය්‍යාදීකෘත චිත්තයෙන් යුක්ත ව වෙසෙයි. හේ මත්තෙහි නිස්සරණ ඇතැ යි දනගනී, ඒ දනුම බහුල කිරීමෙන් ඇතැ'යි කියා මැ ඔහුට සිත් වේ.

පුන ච පරං භික්ඛවෙ, සාරිපුත්තො සබ්බසො නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. සො තාය සමාපත්තියා සතො වුට්ඨහති. සො තාය සමාපත්තියා සතො වුට්ඨහිත්වා යෙ තෙ ධම්මා[1] අතීතා නිරුද්ධා විපරිණතා, තෙ ධම්මෙ සමනුපස්සති: එවං කිර මෙ ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පටිවෙන්තී'ති. සො තෙසු ධම්මෙසු අනුපායො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති. සො නත්ථි උත්තරිං නිස්සරණන්ති පජානාති. තබ්බහුලීකාරා නත්ථිත්වෙවස්ස[2] හොති.

යං ඛො තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය: වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සීලස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සමාධිස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය පඤ්ඤාය[3], වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය විමුත්තියාති. සාරිපුත්තමෙව තං සම්මා වදමානො වදෙය්‍ය වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සීලස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සමාධිස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය පඤ්ඤාය, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය විමුත්තියා'ති.

යං ඛො තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය: භගවතො පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදො නො ආමිසදායාදො'ති සාරිපුත්තමෙව තං සම්මා වදමානො වදෙය්‍ය භගවතො පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදො නො ආමිසදායාදො'ති

සාරිපුත්තො භික්ඛවෙ, තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙතීති

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

අනුපද සුත්තං පඨමං.

---

1. යෙ ධම්මා - මජසං, සයා, PTS.
2. නත්ථිතෙවස්ස - PTS.
3. සඤ්ඤාය - PTS.

යළිදු, මහණෙනි, ශාරිපුත්‍ර, සර්වප්‍රකාරයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත් ඉක්මවා සංඥාවේදයිතනිරෝධයට පැමිණ වෙසෙයි. යළි ඔහු විසින් මහනුවණින් සිව්සස් දැක චතුරාස්‍රවයෝ ක්‍ෂය කරන ලද්දාහු වෙති. හේ ඒ පලසමවතින්, සිහි ඇති ව නැඟී සිටී, හේ ඒ සමවතින් සිහි ඇති ව නැඟී සිට යම් ධර්ම කෙනෙක් ඉක්මැගියාහු නිරුද්ධ වූවාහු විපරිණත වූවාහු ද, ඒ (ඇතුළුසමවතැ පැවැති තිසමුට්ඨානික) රූපධර්මයන් (නොහොත් යට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි පැවැති ධර්මයන්) නුවණින් දකී. මෙසේ මේ ධර්මයෝ පෙර නො වී උපදිති ඉපද වැනැසෙත් යයි. හේ ඒ ධර්ම යන්හි අනුපගතවූයේ අනපගතවූයේ අනිශ්‍රිත වූයේ අප්‍රතිබද්ධ වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වෙසෙයි. හේ මතුයෙහි නිස්සරණයෙක් නැතැ,යි දනගනී. ඒ දනුම බහුලීකරණයෙන් නැතැ යි කියා මැ ඔහුට සිත් වේ.

මහණෙනි, මනා කොට කියනුයෙක් ආර්‍ය්‍යශීලයෙහි විශීවශීබවට පැමිණියේ නිෂ්පත්ති යට පැමිණියේ යැ. ආර්‍ය්‍ය සමාධියෙහි වශීප්‍රාප්ත යැ පාරමී ප්‍රාප්ත යැ ආර්‍ය්‍ය ප්‍රඥායෙහි වශීප්‍රාප්ත යැ , පාරමී ප්‍රාප්ත යැ, ආර්‍ය්‍ය විමුක්තියෙහි වශී ප්‍රාප්තයැ පාරමී ප්‍රාප්ත යැ'යි යම් බසක් කියා නම් ශාරිපුත්‍රයන් මැ ගෙන මනා කොට කියනුයෙක් ආර්‍ය්‍යශීලයෙහි වශීප්‍රාප්ත යැ පාරමීප්‍රාප්ත යැ, ආර්‍ය්‍ය සමාධියෙහි වශීප්‍රාප්ත යැ පාරමීප්‍රාප්ත යැ, ආර්‍ය්‍යප්‍රඥායෙහි වශීප්‍රාප්ත යැ පාරමීප්‍රාප්ත යැ ආර්‍ය්‍ය විමුක්තියෙහි වීර්ණවශී බවට පැමිණියේ ය. නිෂ් පත්තියට පැමිණියේ යැ යනු ඒ බස කියන්නේ යි.

මහණෙනි, මනා කොට කියනුයෙක් භාග්‍යවතුන් වහන්සේගේ (ළෙහි නිපන් ශබ්දය අසා ජාත නුයි) ඖරස වූ මුවින් පහළ වූ ශබ්ද අසා ජාත වූ ධර්මයෙන් නිර්මිත වූ ධර්මය දයාදා කොට ගත් ආමිෂ දායාදා කොට නො ගත් පුත්‍ර යැයි යමක් කියා නම් මනා කොට කියනුයෙක් ඖරස වූ මුඛයෙන් උපන් ධර්මජ වූ ධර්ම නිර්මිත වූ ධර්මය දයාදා කොට ගත් ආමිෂ දයාදා කොට නොගත් භාග්‍යවතුන් වහන්සේ ගේ පුත්‍රයා යැ යනු ඒ බස ශාරිපුත්‍රයන් මැ ගෙන කියන්නේ යි.

මහණෙනි, ශාරිපුත්‍ර තථාගතයන් විසින් පවත්වන ලද අනුත්තර ධර්මචක්‍රය මනා කොට මැ අනුප්‍රවර්තන කෙරේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ අනුපද සූත වදළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

පළමුවන අනුපද සූත්‍ර යි.

# 3. 2. 2

# ඡබ්බිසොධන සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ, භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී’ති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා පඤ්හො පුච්ඡිතබ්බො: චත්තාරොමෙ ආවුසො වොහාරා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කතමෙ චත්තාරො: දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා. ඉමෙ ඛො ආවුසො, චත්තාරො වොහාරා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා.

කථං ජානතො පනායස්මතො කථං පස්සතො ඉමෙසු චතූසු වොහාරෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්ත’න්ති: ඛීණාසවස්ස භික්ඛවෙ, භික්ඛුනො වුසිතවතො කතකරණීයස්ස ඔහිතභාරස්ස අනුප්පත්තසදත්ථස්ස පරික්ඛීණභවසඤ්ඤොජනස්ස සම්මදඤ්ඤා විමුත්තස්ස අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය: දිට්ඨෙ ඛො අහං ආවුසො, අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරාමි, සුතෙ ඛො අහං ආවුසො-පෙ-මුතෙ ඛො අහං ආවුසො-පෙ-විඤ්ඤාතෙ ඛො අහං ආවුසො, අනුපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරාමි. එවං ඛො මෙ ආවුසො, ජානතො එවං පස්සතො ඉමෙසු චතූසු වොහාරෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්ත’න්ති.

තස්ස භික්ඛවෙ භික්ඛුනො සාධූති භාසිතං අභිනන්දිතබ්බං, අනුමොදිතබ්බං. සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො: පඤ්ච ඛො ඉමෙ[1] ආවුසො, උපාදානක්ඛන්ධා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කතමෙ පඤ්ච: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ ඛො ආවුසො, පඤ්චුපාදානක්ඛන්ධා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කථං ජානතො පනායස්මතො

1. පඤ්චිමෙ – සීමු, මජසං.

# 3. 2. 2
# ඡබ්බිසොධන සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීප යෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවාසය කරන සේක, එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු ' වහන්සැ ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

මහණෙනි, මෙ සස්නෙහි මහණෙක් ' ජාතිය ක්ෂය විය, බඹසර වසනලද, කරණී කරන ලද, මේ රහත්බව පිණිස කළ යුතු අන් කිසෙක් නැති යි නුවණින් දනිමි' කියා අර්හත්ත්‍වය ප්‍රකාශ කෙරෙයි. මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය අභිනන්දනා නො කටයුතු ය, පිළිකෙව් නො කටයුතු ය. අභිනන්දනා නො කොට පිළිකෙව් නො කොට ප්‍රශ්නයෙක් විචාළ යුතු ය : ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ සතර වොහාර කෙනෙක් මොනොවට වදරන ලදහ. කවර සතර කෙනෙක යත් : දක්නා ලද්දෙහි දෘෂ්ටවාදී බව යැ. අසන ලද්දෙහි ශ්‍රුතවාදී බව යැ, ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය සඞ්ඛ්‍යාත මුතයෙහි මුතවාදී බව යැ, ධර්මා ලම්බන සඞ්ඛ්‍යාත විඥාතයෙහි විඥාතවාදී බව යැ ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ සතර වෝහාර කෙනෙක් මොනොවට වදරන ලදහ.

කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ ඒ ආයුෂ්මත්හුගේ සිත මේ සතර වෝහාරයන් කෙරෙහි උපාදාන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදුණේ වේ ද යත් : මහණෙනි, වැස නිම වූ බඹසර ඇති කළ කරණී ඇති බහා තැබූ කෙලෙස්බර ඇති පැමිණි ස්වාර්ත්ථ සඞ්ඛ්‍යාත රහත්ඵල ඇති පරික්ෂීණ වූ භවසංයෝජන ඇති මොනොවට දැන මිදුණු ක්ෂීණාස්‍රව මහණහට පිළිතුරු පවසනු පිණිස මේ ස්වභාවය වෙයි. ' ඇවැත්නි, මම රූපාලම්බනයෙහි රාගවශයෙන් උපගමන නැතියෙම්, ප්‍රතිඝ වශයෙන් අපගමන නැතියෙම් තෘෂ්ණාදෘෂ්ටි විසින් අනිශ්‍රිත වූයෙම් ඡන්දරාග වශයෙන් ප්‍රතිබද්ධ නො වූයෙම් කාමරාගයෙන් මිදුණෙම් කෙලෙසුන් කෙරෙන් විසංයුක්ත වූයෙම් විගතමයර්‍යාද කළ සිතින් යුක්ත ව වාසකරමි. ඇවැත්නි, මම ශබ්ද ලම්බනයෙහි ...ඇවැත්නි, මම (ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය) මුතයෙහි ...ඇවැත්නි, මම ධර්මා ලම්බනයෙහි රාගවශයෙන් උපගමන නැතියෙම්, ප්‍රතිඝවශයෙන් අපගමන නැතියෙම්, තෘෂ්ණාදෘෂ්ටි විසින් අනිශ්‍රිත වූයෙම් ඡන්දරාග විසින් ප්‍රතිබද්ධ නො වූයෙම් කාමරාග යෙන් මිදුණෙම් කෙලෙසුන් කෙරෙන් විසංයුක්ත වූයෙම් විගතමයර්‍යාද කළ සිතින් යුක්ත ව වාස කරමි. ඇවැත්නි, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මාගේ සිත මේ සතර වෝහාරයන් කෙරෙහි උපාදාන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදිණැ' යි කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය 'මැනැවැ' යි අභිනන්දනා කළ යුතු යැ, අනුමෝදනා කළ යුතු යැ, මැනැවැ' යි ඒ භාෂිතය අභිනන්දනා කොට අනුමෝදන් ව මතුයෙහි ප්‍රශ්නයෙක් පිළිවිසියැ යුතු : ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ මොනොවට දෙසන ලදහ. කවර පසෙක යත් : ඒ මෙසේ යැ : රූපූපාදානස්කන්ධ යැ, වෙදනු පාදනස්කන්ධ යැ, සඤ්ඤූපාදනස්කන්ධ යැ, සඞ්ඛාරූපාදනස්කන්ධ යැ, විඤ්ඤාණූපාදන ස්කන්ධ යි. ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ සම්‍යක්

කථං පස්සතො ඉමේසු පඤ්චසූපාදානක්ඛන්ධෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති: ඛීණාසවස්ස භික්ඛවේ, භික්ඛුනො වුසිතවතො කතකරණීයස්ස ඔහිතභාරස්ස අනුප්පත්තසදත්ථස්ස පරික්ඛීණභවසඤ්ඤොජනස්ස සම්මදඤ්ඤා විමුත්තස්ස අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය: රූපං ඛො අහං ආවුසො, අබලං විරාගං අනස්සාසික'න්ති විදිත්වා යෙ රූපෙ උපයූපාදානා[1] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මේ චිත්ත'න්ති පජානාමි. වෙදනං ඛො අහං ආවුසො-පෙ-සඤ්ඤං ඛො අහං ආවුසො-පෙ-සඞ්ඛාරෙ ඛො අහං ආවුසො-පෙ-විඤ්ඤාණං ඛො අහං ආවුසො අබලං විරාගං අනස්සාසික'න්ති විදිත්වා යෙ විඤ්ඤාණෙ උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මෙ චිත්තන්ති පජානාමි. එවං ඛො මෙ ආවුසො, ජානතො එවං පස්සතො ඉමේසු පඤ්චසූපාදානක්ඛන්ධෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

තස්ස භික්ඛවෙ, භික්ඛුනො සාධූති භාසිතං අභිනන්දිතබ්බං, අනුමොදිතබ්බං. සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො: ඡයිමා[2] ආවුසො, ධාතුයො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කතමා ඡ: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු. ඉමා ඛො ආවුසො ඡ ධාතුයො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කථං ජානතො පනායස්මතො කථං පස්සතො ඉමාසු ඡසු ධාතුසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති: ඛීණාසවස්ස භික්ඛවේ, භික්ඛුනො වුසිතවතො කතකරණීයස්ස ඔහිතභාරස්ස අනුප්පත්තසදත්ථස්ස පරික්ඛීණභවසඤ්ඤොජනස්ස සම්මදඤ්ඤා විමුත්තස්ස අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය: පඨවිධාතුං ඛො අහං ආවුසො න අත්තතො උපගච්ඡිං, න ච පඨවිධාතුනිස්සිතං අත්තානං. යෙ ච පඨවිධාතුනිස්සිතා උපයූපාදානා[1] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මෙ චිත්තන්ති පජානාමි. ආපොධාතුං ඛො අහං ආවුසො-පෙ- තෙජොධාතුං ඛො අහං ආවුසො-පෙ- වායොධාතුං ඛො අහං ආවුසො-පෙ- ආකාසධාතුං ඛො අහං ආවුසො-පෙ- විඤ්ඤාණධාතුං ඛො අහං ආවුසො, න අත්තතො උපගච්ඡිං න ච විඤ්ඤාණධාතුනිස්සිතං අත්තානං. යෙ ච විඤ්ඤාණධාතුනිස්සිතා උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මෙ චිත්තන්ති පජානාමි. එවං ඛො මෙ ආවුසො, ජානතො එවං පස්සතො ඉමාසු ඡසු ධාතුසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

---

1. උපායූපාදානා - සීමු, PTS.
   උපාඝූපාදානා - මජසං.
   උපාදයූපාදානා - සයා.
2. ඡ ඛො පනිමාති - මජසං.

සම්බුද්ධයන් වහන්සේ විසින් මේ පඤ්චෝපාදාන ස්කන්ධයෝ මොනොවට දෙසන ලදහ. කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ ඒ ආයුෂ්මත්හුගේ සිත මේ පඤ්චොපාදානස්කන්ධයන් කෙරෙහි උපාදාන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදුණේ වේ ද : මහණෙනි, වැස නිමවූ බඹසර ඇති කළ කරණී ඇති බහාතැබූ කෙලෙස්බර ඇති පැමිණි රහත්ඵල ඇති පරික්ෂීණ භවසංයොජන ඇති ක්ෂීණාස්‍රව මහණහුගේ ප්‍රශ්නව්‍යාකරණයට මේ ස්වභාව වෙයි : ඇවැත්නි, මම රූපය අබල ය, විරාග ය, අනස්වාසික යයි දැන රූපයෙහි යම් උපයුපාදාන කෙනෙක් ඇද්ද සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවෙශ අනුශය කෙනෙක් ඇද්ද උන්ගේ ක්ෂය හේතුයෙන් විරාගහේතුයෙන් නිරොධ හේතුයෙන් ත්‍යාග හේතුයෙන් හැරපීම්හේතුයෙන් මාගේ සිත මිදිණැ' යි නුවණින් දනිමි. ඇවැත්නි, මම වේදනාව . . . ඇවැත්නි, මම සංඥාව . . . ඇවැත්නි, මම සංස්කාරයන් . . . ඇවැත්නි, මම විඥානය අබල ය විරාග ය අනාස්වාසික යැ' යි දැන විඥානයෙහි යම් උපය-උපාදාන කෙනෙක් ඇද්ද සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවෙශ අනුශය කෙනෙක් ඇද්ද, උන්ගේ ක්ෂයහේතුයෙන් විරාග හේතුයෙන් නිරෝධ හේතුයෙන් ත්‍යාග හේතුයෙන් හැරපීම් හේතුයෙන් 'මාගේ සිත මිදිණැ' යි නුවණින් දනිමි. ඇවැත්නි, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මාගේ සිත පඤ්චෝපාදානස්කන්ධයන් කෙරෙහි උපාදාන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදිණැ' යි කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය 'මැනැවැ' යි අභිනන්දන කළයුතු යි. අනුමෝදනා කළයුතු යි. 'මැනව' යි ඒ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ මතුයෙහි ප්‍රශ්න යෙක් පිළිවිසිය යුතු : ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ ධාතුහු සදෙනෙක් මොනොවට වදරන ලදහ. කවර සදෙනෙක යත් : පෘථිවිධාතු යැ, අබ්ධාතු යැ, තේජෝධාතු යැ, වායෝ ධාතු යැ, ආකාශධාතු යැ, විඥානධාතු යි. ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ ධාතුහු සදෙන මොනොවට වදරන ලදහ. කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ ආයුෂ්මත්හුගේ සිත මෙ සවැදෑරුම් ධාතූන් කෙරෙහි උපාදාන වශයෙන් නොගෙන ආස්‍රවයන් කෙරෙන් මිදුණේ වේ ද : මහණෙනි, වැසැ නිමවූ බඹසර ඇති, කළ කරණී ඇති, බහා තැබූ කෙලෙස් බර ඇති, පැමිණි රහත්ඵල ඇති, පරික්ෂීණ භවසංයෝජන ඇති, මොනොවට දැන මිදුණු ක්ෂීණාස්‍රව මහණහට ප්‍රශ්නව්‍යාකරණය පිණිස මෙ ස්වභාවය ඇත : ඇවැත්නි, මම පෘථිවිධාතුව ආත්මවශයෙන් නො පැමිණියෙමි. පෘථිවිධාතු නිඃශ්‍රිත වූ සෙසු ධාතු ද ආත්මකොටගෙන නො පැමිණියෙමි. පෘථිවිධාතු නිඃශ්‍රිත වූ (තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත) යම් උපය උපාදාන කෙනෙක් ඇද්ද, සිත පිළිබඳ (තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත) යම් අධිෂ්ඨාන අභිවෙස අනුසය කෙනෙක් ඇද්ද, උන්ගේ ක්ෂය හේතුයෙන් විරාග හේතුයෙන් නිරෝධ හේතුයෙන් ත්‍යාග හේතුයෙන් හැරපීම් හේතුයෙන් '' මා සිත මිදිණැ '' යි නුවණින් දන්මි. ඇවැත්නි, මම අබ්ධාතු . . . ඇවැත්නි, මම තේජෝධාතු . . . ඇවැත්නි, මම වායෝ ධාතු . . . ඇවැත්නි, මම අකාශධාතු . . . ඇවැත්නි, මම විඥානධාතු ආත්ම වශයෙන් නො ගතිමි. ආත්මය විඥාන ධාතු නිඃශ්‍රිතකොට ද නො ගතිමි. විඥානධාතු නිඃශ්‍රිත වූ (තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත) යම් මැ උපය උපාදාන කෙනෙක් ඇද්ද, සිත පිළිබඳ (තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත) යම් අධිෂ්ඨාන අභිනිවේස අනුසය කෙනෙක් ඇද්ද, උන්ගේ ක්‍ෂය හේතුයෙන් විරාග හේතුයෙන් නිරෝධහේතුයෙන් ත්‍යාග හේතුයෙන් ''මා සිත මිදිණැ '' යි නුවණින් දනිමි. ඇවැත්නි, මෙසෙයින් දක්නා වූ මෙසෙයින් දක්නා වූ මාගේ සිත මෙ සවැදෑරුම් ධාතූන් කෙරෙහි උපදාන වශයෙන් නො ගෙන මිදිණැ යි කියායි.

තස්ස භික්ඛවෙ, භික්ඛුනො සාධූති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො: ඡ ඛො පනිමානි ආවුසො අජ්ඣත්තිකබාහිරානි[1] ආයතනානි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතානි. කතමානි ඡ: චක්ඛුං චෙව[2] රූපා ච, සොතං ච සද්දා ච, ඝානං ච ගන්ධා ච, ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච, මනො ච ධම්මා ච, ඉමානි ඛො ආවුසො ඡ අජ්ඣත්තිකබාහිරානි ආයතනානි තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතානි. කථං ජානතො පනායස්මතො කථං පස්සතො ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති: ඛීණාසවස්ස භික්ඛවෙ, භික්ඛුනො වුසිතවතො කතකරණීයස්ස ඔහිතභාරස්ස අනුප්පත්තසදත්ථස්ස පරික්ඛීණභවසඤ්ඤොජනස්ස සම්මදඤ්ඤාවිමුත්තස්ස අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය: චක්ඛුස්මිං ආවුසො, රූපෙ චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු යො ඡන්දො, යො රාගො, යා නන්දි, යා තණ්හා, යෙ ච උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මෙ චිත්තන්ති පජානාමි. සොතස්මිං ආවුසො, සද්දෙ සොතවිඤ්ඤාණෙ-පෙ- ඝානස්මිං ආවුසො, ගන්ධෙ ඝානවිඤ්ඤාණෙ -පෙ-ජිව්හාය ආවුසො, රසෙ ජිව්හාවිඤ්ඤාණෙ-පෙ-කායස්මිං ආවුසො, ඵොට්ඨබ්බෙ කායවිඤ්ඤාණෙ-පෙ- මනස්මිං ආවුසො, ධම්මෙ මනොවිඤ්ඤාණෙ මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු යො ඡන්දො, යො රාගො, යා නන්දි, යා තණ්හා, යෙ ච උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විමුත්තං මෙ චිත්තන්ති පජානාමි. එවං ඛො මෙ ආවුසො ජානතො එවං පස්සතො ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

තස්ස භික්ඛවෙ, භික්ඛුනො ‘සාධූ’ති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො: ‘කථං ජානතො පනායස්මතො කථං පස්සතො ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාර මමිඞ්කාරමානානුසයා[3] සුසමූහතාති[4]. ඛීණාසවස්ස භික්ඛවෙ, භික්ඛුනො වුසිතවතො කතකරණීයස්ස ඔහිතභාරස්ස අනුප්පත්තසදත්ථස්ස පරික්ඛීණභවසඤ්ඤොජනස්ස සම්මදඤ්ඤාවිමුත්තස්ස අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය: ‘පුබ්බෙ ඛො අහං ආවුසො අගාරියභූතො සමානො අවිද්දසු අහොසිං. තස්ස මෙ තථාගතො වා තථාගතසාවකො වා ධම්මං දෙසෙසි. තාහං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභිං. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛිං සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය’න්ති.

---

1. අජ්ඣත්තිකානි බාහිරානි - ස්‍යා, PTS.
2. චක්ඛු චෙව - මජසං, ස්‍යා, PTS.
3. අහංකාරමමංකාරමානානුසයා - මජසං, සීමු, ස්‍යා.
4. සමූහතානි - මජසං.

මහණෙනි, ඒ මහණහුගේ වචනය 'මැනැවැ' යි සතුටින් පිළිගත යුතු යැ. අනුමෙවුනි කළ යුතු යැ. වචනය ' මැනැව ' යි සතුටින් පිළිගෙන අනුමෙවුනි කොට මතුයෙහි ප්‍රශ්නයක් පිළිවිසිය යුතු : ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ, සියල්ල දක්නා වූ, අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මේ ආධ්‍යාත්මික බාහිර ආයතනයෝ සදෙන මොනොවට වදරන ලදහ. කවර සදෙනෙක යත් : ඇස හා රූපයෝ යැ, කන හා ශබ්දයෝ යැ. නාසය හා ගන්ධයෝ යැ, දිව හා රසයෝ යැ, කය හා ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ සිත හා ධර්මයෝ යි. ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙ ආධ්‍යාත්මික බාහිර ආයතනයෝ සදෙන මොනොවට වදරන ලදහ. කිපරිදි දන්නා වූ කිපරිදි දක්නා වූ ආයුෂ්මත්හුගේ සිත මෙ සවැදැරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදුණේ වේ ද, මහණෙනි, වැසැනිම වූ බඹසර ඇති, කළ කරණී ඇති බැහූ කෙලෙස් බර ඇති. ලැබූ රහත් ඵල ඇති, ක්ෂය කළ භවසංයෝජන ඇති මොනො වට දූන මිදුණු ක්ෂීණාස්‍රව මහණහට ප්‍රශ්න ව්‍යාකරණය පිණිස මෙ ස්වභාවය ඇත : ඇවැත්නි, චක්ෂුස්හි රූපයෙහි චක්‍ෂුර්විඥානයෙහි චක්‍ෂුර්විඥානයෙන් විඥතව්‍ය ධර්මයෙහි යම් තෘෂ්ණා ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් (තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත) යම් උපය උපාදන කෙනෙක් සිත පිළිබඳ තෘෂ්ණා දෘෂ්ටි නම් වන අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් ඇද්ද, උන්ගේ ක්‍ෂය හේතුයෙන් විරාග හෙතුයෙන් නිරොධ හෙතුයෙන් ත්‍යාග හෙතුයෙන් හැරපීම් හෙතුයෙන් ''මා සිත මිදිණැ'' යි නුවණින් දනිමි. ඇවැත්නි, ශ්‍රොත්‍රයෙහි ශබ්දයෙහි, ශ්‍රොත්‍ර විඥනයෙහි . . . . ඇවැත්නි, ඝ්‍රාණයෙහි ගන්ධයෙහි ඝ්‍රාණවිඥනයෙ හි. . . ඇවැත්නි, ජිහ්වායෙහි, රසයෙහි, ජිහ්වා විඥනයෙහි . . . ඇවැත්නි, කයෙහි. ස්ප්‍රෂ්ටව්‍යයෙහි, කායවිඥනයෙහි . . . . ඇවැත්නි, මනස්හි, ධර්මයෙහි-මනෝවිඥනයෙහි, මනෝවිඥනයෙන් දතයුතු ධර්ම යෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක්, යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් ඇද්ද, යම් උපය උපාදන කෙනෙක් සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් ඇද්ද, උන්ගේ ක්‍ෂය හේතුයෙන් විරාග හේතුයෙන් නිරොධ හේතුයෙන් ත්‍යාග හෙතුයෙන් හැරපීම් හෙතුයෙන් ' මා සිත මිදිණැ ' යි නුවණින් දන්මි. ඇවැත්නි, මෙ පරිදි දන්නා වූ මෙ පරිදි දක්නා වූ මා ගේ සිත මෙ සවැදැරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි උපාදන වශයෙන් නොගෙන ආස්‍රවයන් කෙරෙන් මිදිණ කියායි.

මහණෙනි, එමහණහුගේ තෙපුල ' මැනැවැ' යි සතුටින් පිළිගත යුතු යැ අනුමෝදන් කටයුතු යැ. තෙපල ' මැනැවැ ' යි සතුටින් පිළිගෙන අනුමෝදන් කොට මතුයෙහි ප්‍රශ්නයෙක් පිළිවිසිය යුතු: කිපරිදි දක්නා කිපරිදි දක්නා ආයුෂ්මත්හු විසින් මෙ සවිඥනක කායයෙහි ද බැහැර හැම නිමිත්තෙහි ද (මාන නම් වූ, අහංකාර තෘෂ්ණා නම් වූ) මමංකාර මානානුසයයෝ මොනොවට නසන ලද්දහු ද ? 'යි මහණෙනි, වැසැ නිමවූ බඹසර ඇති, කළ කරණී ඇති, බැහූ කෙලෙස්බර ඇති, ලැබූ රහත්ඵල ඇති, පරික්ෂීණ භවසංයෝජන ඇති, මොනොවට දූන මිදුණු ක්ෂීණාස්‍රව මහණහුගේ ප්‍රශ්නව්‍යාකරණ පිණිස මෙ ස්වභාවය වෙයි. ඇවැත්නි, මම පෙර ගිහිවූයෙමි අඥ වීමි. මට තථාගතයන් වහන්සේ හෝ තථාගතශ්‍රාවක කෙනෙක් හෝ දහම් දෙසූහ. මම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා ලැබීමි. මම ඒ ශ්‍රද්ධා ප්‍රතිලාභයෙන් යුක්ත වූයෙම් මෙසේ සැලැකීමි : ගෘහ වාසය සම්බාධ යැ, කෙලෙස් රජසුනට මඟ යැ, පැවිද්ද අභ්‍යවකාශ යැ, ගිහිගෙයි වසනහු විසින් ඒකාන්ත පරිපූර්ණ වූ ඒකාන්ත පරිශුද්ධ වූ ලියූ සකක් වැනි මෙ බඹසර පුරන්නට සුකර නො වෙ. මම කෙහෙමස් බහා කසටවත් හැඳපෙරවැ ගිහිගෙන් නික්මැ පැවිද්දට පැමිණෙන්නෙම් නම් මනාමැනැ ' යි කියා යි.

සො ඛො අහං ආවුසො, අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං. සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො අහොසිං, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහාසිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො අහොසිං. දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහාසිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී අහොසිං ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො අහොසිං, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො අහොසිං, ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා අහොසිං. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො අහොසිං, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං වාචං භාසිතා අහොසිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො අහොසිං කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා අහොසිං කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො අහොසිං. එකභත්තිකො අහොසිං රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො අහොසිං. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො අහොසිං. උච්චාසයනමහාසයනා පටිවිරතො අහොසිං. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො අහොසිං. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො අහොසිං. ආමකමංසපටිග්ගහණා පටිවිරතො අහොසිං. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො අහොසිං. දාසිදාසපටිග්ගහණා පටිවිරතො අහොසිං. අජෙළකපටිග්ගහණා පටිවිරතො අහොසිං. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො අහොසිං. හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතො අහොසිං. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො අහොසිං. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො අහොසිං. කයවික්කයා පටිවිරතො අහොසිං. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො අහොසිං. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො අහොසිං. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො අහොසිං.

සො සන්තුට්ඨො අහොසිං කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමිං, සමාදායෙව පක්කමිං. සෙය්‍යථාපි නාම පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති, සපත්තභාරොව ඩෙති. එවමෙව ඛො අහං ආවුසො, සන්තුට්ඨො අහොසිං කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමිං, සමාදායෙව පක්කමිං. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙසිං.

1. ඉත්ථිකුමාරිකාපටිග්ගහණා - සතථපි.

ඇවැත්නි, මම පසු කලෙක අල්ප වූ හෝ භෝගස්කන්ධය හැර මහත් වූ හෝ භෝගස්කන්ධය හැර අල්පවූ හෝ නෑ පිරිවට හැර මහත් වූ හෝ නෑ පිරිවට හැර කෙහෙමස් බහා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්මැ පැවිද්දට පැමිණියෙමි. මම මෙසේ පැවිදි වූයෙම් භික්ෂූන් ගේ ශික්ෂාසාජීවයට පැමිණියෙම් පණිවා හැර පණිවායෙන් වැළැකුණෙම් වීමි. බහා තැබූ දඬු ඇත්තෙම් බහා තැබූ ශස්ත්‍ර ඇත්තෙම්. ලජ්ජා ඇත්තෙම් දයාවට පැමිණියෙම් සර්වප්‍රාණභූත හිතානුකම්පී වූයෙම් වාස කළෙමි. අයිනාදන් හැර අයිනාදනින් වැළැකුණෙම් වීමි. දුන්දෑය ගන්නා සුලුයෙම් දුන්දෑය කැමැති වූයෙම් නොසොර වූ පවිත්‍ර වූ ආත්මයෙන් වාස කෙළෙමි. අබ්‍රහ්මචර්‍ය්‍යය හැර ග්‍රාමධර්ම සංඛ්‍යාත මෛථුනයෙන් විරත වැ දුරුවූ හැසිරීම් ඇති වැ බ්‍රහ්මචාරී වීමි. මුසවා හැර මුසවායෙන් වැළැකුණෙම් වීමි. සත්‍යවාදී වූයෙම් සත්‍ය සන්ධාන ඇත්තෙම් ස්ථිරවචන ඇත්තෙම් විශ්වසනීය වචන ඇත්තෙම් ලොකය විසංවාද නොකරන්නෙම් මුසවායෙන් වැළැකුණෙම් වීමි. පිසුණුබස් හැර මොබ අසා මුන්ගේ භෙදය පිණිස එහි නො කියනසුලු වූයෙම් ඔබ හෝ අසා තුලුන්ගේ භෙදය පිණිස මුනට නො කියනසුලු වූයෙම් මෙසේ භින්න වූවන් හෝ සන්ධානකරණසුල්ලෙම් සමඟ වූවන්ට හෝ අනුබල දෙනසුලු වූයෙම් සමග්‍රාරාම වූයෙම් සමග්‍රරත වූයෙම් සමගියෙහි සතුටු වූයෙම් සමග්‍රකරණ වූ තෙපුල් දෙනසුල්ලෙම් වීමි. පරොස්බස් හැර පරොස් බසින් වැළැකුණෙම් වීමි. යම් වචනයක් කෙළතොලු නො වී ද, කර්ණසුව වී ද, ප්‍රේමණීය වී ද, හෘදයංගම වී ද, පුරවැසි වී ද, බහුජන කාන්ත වී ද, බහුජන මනාප වී ද, එබඳු බස් කියන සුල්ලෙම් වීමි. පලප් හැර පලපින් වැළැකුණෙම් වීමි. කාලවාදී වූයෙම් භූතවාදී වූයෙම් අර්ථවාදී වූයෙම් ධර්මවාදී වූයෙම් විනයවාදී වූයෙම් සුදුසු කල්හි සාපදෙශ වූ පර්‍ය්‍යන්තවත් වූ අර්ථසංහිත වූ ළෙහි නිධන් කළ යුතු වූ තෙපුල් කියනසුලු වූයෙම් වීමි.

මම බීජගාම භූතගාමයන් ගේ නැස්මෙන් විරත වීමි. එක්වේලෙහි බත වළඳ කරනසුලු වීමි. විකල් බොජුනෙන් වැළකුණෙම් රෑ බොජුනෙන් වැළකුණෙම් වීමි. නටනු ගනු වයනු විසුළු දස්නෙන් වැළකුණෙම් වීමි. මල්ගඳවිලෙවුන් පිළිබඳ ධාරණය, මණ්ඩන යැ විභූෂණ යැ යන මෙයින් වැළකුණෙම් වීමි. උසසුන් මහඅස්නෙන් වැළකුණෙම් වීමි. රන්රිදී පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. අමුධාන්‍ය පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. අමුමස් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. ස්ත්‍රීකුමාරිකාවන් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. දැසිදස් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. එළු තිරෙළු පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. කුකුළන් හා හූරන් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. ඇත්ගව අස්වෙළඹුන් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. කෙත්වත් පිළිගැන්මෙන් වැළකුණෙම් වීමි. දූතකම් හා මෙහෙයුම් ගමන්හි යෙදීමෙන් වැළකුණෙම් වීමි. ක්‍රය වික්‍රය දෙකින් වැළකුණෙම් වීමි. තුලාකූට කසංකූට මානකූටයෙන් වැළකුණෙම් වීමි. උක්කොටන-වඤ්චන-නිකති-යන කුටිලයෝගයෙන් වැළකුණෙම් වීමි. ඡේදන යැ වධ යැ බන්ධන යැ විපරාමොෂ යැ වොලොගැන්ම යැ සහසාකාරයැ යන මෙයින් වැළකුණෙම් වීමි.

මම කායපරිහරණයට නිසි සිවුරින් කුක්ෂිපරිහරණයට නිසි පිඬුවායෙන් සතුටු වීමි. මම යම් යම් තැනෙකැ ගියෙම් නම්, සිවුරුආදිය රැගෙනැ මැ ගියෙමි. යම් පරිදි ලිහිණි පක්ෂි යම් යම් තැනෙකැ පියා පහරා යන්නේ පත්‍රභාර සහිත වැ මැ පියඹා යේ ද එසෙයිනි. ඇවැත්නි, මෙ පරිදි මැ මම කායපරිහරණයට නිසි සිවුරින් කුක්ෂිපරිහරණයට නිසි පිඬුවායෙන් සතුටු වීමි. මම යම් යම් තැනෙකැ යෙම් ද, (පිරිකර) රැගෙන මැ ගියෙමි. මම මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්වාගත වූයෙම් සිත් තුළ අනවද්‍යසුඛය වින්දෙමි.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී අහොසිං නානුව්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං[1] චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජිං, රක්ඛිං චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජිං. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී අහොසිං නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජිං, රක්ඛිං මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජිං. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙසිං.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී අහොසිං. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී අහොසිං. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී අහොසිං. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී අහොසිං. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී අහොසිං. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී අහොසිං. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී අහොසිං.

සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජිං අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදිං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහාසිං, අභිජ්ඣාය චිත්තං පරිසොධෙසිං. බ්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහාසිං සබ්බපාණභූතහිතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙසිං. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහාසිං ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙසිං. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහාසිං අජ්ඣත්තං වූපසන්තචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙසිං. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහාසිං අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙසිං.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසිං සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං. යං තං අරියා ආචික්ඛන්ති : උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං.

1. යතොධිකරණමෙනං - කත්ථචි.

මම ඇසින් රූ දැක නිමිති නොගන්නාසුලු වූයෙම් අනුව්‍යඤ්ජන නොගන්නාසුලුයෙම් වීමි. යම් හෙතුයෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල මා කරා ලාමක අකුශල ධර්ම වන අභිධ්‍යාදෞර්මනස්‍යයෝ ලුහුබඳනාහු නම්, ඒ අවුරනුවට පිළිපන්මි. චක්ෂුරින්ද්‍රිය රැක්කෙමි. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණියෙමි. ශ්‍රෝත්‍රයෙන් ශබ්ද අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධය අසා . . . ජිහ්වායෙන් රස විඳ . . . කයින් ස්ප්‍රෂ්ටව්‍යයන් පැහැසැ . . . මනසින් ධර්මයන් දැන නිමිති නොගන්නාසුලුයෙම් අනුව්‍යඤ්ජන නොගන්නාසුලුයෙම් වීමි. යම් කරුණෙකින් මනින්ද්‍රිය අසංවෘත කොට වසන තෙල මා කරා අභිධ්‍යාදෞමනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම්, ඒ අවුරනුවට පිළිපන්මි. මනින්ද්‍රිය රැකියෙමි. මනින්ද්‍රියෙහි සංවරයට පැමිණියෙමි. මම මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් සමන්වාගත වූයෙම් අධ්‍යාත්මයෙහි (කෙලෙසුන් විසින් අනාෂික්ත වූ) අව්‍යාසෙක සුඛය විඳියෙමි.

මම ඉදිරි බලා ගමන්හි දූ වටාලා ගමන්හි දූ සම්ප්‍රඥනකාරී වීමි. ඉදිරිබැලුම් හා දිගතුදික් බැලුම්හි සම්ප්‍රඥනකාරී වීමි. අත්පා හැකුළුම් හා දිගු කිරීමෙහි සම්ප්‍රඥනකාරී වීමි. සඟළපාසිවුරු දැරුම්හි සම්ප්‍රඥනකාරී වීමි. අසිත පීත ඛායිත සායිතයෙහි සම්ප්‍රඥනකාරී වීම් සුලුවටත්මහවටත්කම්හි සම්ප්‍රඥනකාරී වීමි. ගමනෙහි සිටුමෙහි හිඳුමෙහි නිදියෙහි නිදිවැරුම්හි කථායෙහි තුෂ්ණීම්භාවයෙහි සම්ප්‍රඥනකාරී වීමි.

මම මේ ආර්යශීලස්කන්ධයෙන් සමන්වාගත වූයෙම්, මේ ආර්යඉන්ද්‍රියසංවරයෙන් සමන්වාගත වූයෙම්, මේ ආර්යස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් සමන්වාගත වූයෙම්, අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කඳුරු යැ ගිරිගුහා යැ සොහොනයැ වනපෙත යැ අබවස් යැ පිදුරුකිළි යැ යන විවික්තශයනාසන භජනය කෙළෙමි. මම පසුබත්හි පිඩුවායෙන් පෙරළා ආයෙම්, පලක් බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා සිහි පරිමුඛ කොට එළවාගෙන හින්දෙමි.

මම පඤ්චොපාදනස්කන්ධලොකයෙහි අභිධ්‍යාව දුරු කොට පහවූ අභිධ්‍යා ඇති සිතින් වාස කෙළෙමි. අභිධ්‍යායෙන් සිත පිරිසිදු කෙළෙමි. ව්‍යාපාද සංඛ්‍යාත ප්‍රද්වෙෂය දුරු කොට ව්‍යාපාදයෙන් තොර වූ සිතැත්තෙම් සර්වප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතියෙම් වාස කෙළෙමි. ව්‍යාපාදප්‍රද්වෙෂයෙන් සිත පිරිසිදු කෙළෙමි. ස්ත්‍යානමිද්ධය දුරු කොට පහ වූ ස්ත්‍යානමිද්ධ ඇතියෙම්, (විගතනීවරණයෙන්) ආලොකසංඥ ඇතියෙම්, ස්මෘති ඇතියෙම්, සම්‍යක්ප්‍රඥ ඇතියෙම්, වාස කෙළෙමි. ස්ත්‍යානමිද්ධයෙන් සිත පිරිසිදු කළෙමි. ඖද්ධත්‍යය හා කෞකෘත්‍යය දුරු කොට උද්ධතභාව නැතියෙම්, අධ්‍යාත්මයෙහි මොනවට සන්හුන් සිත් ඇතියෙම් වාස කෙළෙමි. උද්ධච්චකුක්කුච්ච යෙන් සිත පිරිසිදු කෙළෙමි. විචිකිත්සා දුරු කොට තරණය කළ විචිකිත්සා ඇතියෙම්, කුශලධර්මයෙහි කථංකථීභාව නැතියෙම් වාස කෙළෙමි. විචිකිත්සායෙන් සිත පිරිසිදු කෙළෙමි.

මම චිත්තයාගේ උපක්ලේශ වූ ප්‍රඥවගේ දුර්වල කරණ වූ මේ පඤ්චනීවරණයන් දුරු කොට කාමයෙන් වෙන් වැ මැ අකුසල දහමින් වෙන් වැ සවිතර්ක වූ සවිචාර වූ විවෙක යෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපයා වාස කෙළෙමි. විතර්කවිචාර සන්හිඳීමෙන් තමා තුළ සම්ප්‍රසාදන කරන චිත්තයාගේ එකභාවබව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධි යෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යාන උපයා වාස කෙළෙමි. ප්‍රීතිවිරාගයෙනුදු උපෙක්ෂක වැ වාස කෙළෙමි. ස්මෘතිමත් වූයෙම්, සම්ප්‍රඥන ඇතියෙම්, නාමකයින් සුඛය ද වින්දෙමි. ආර්යයෝ යම් ධ්‍යානයක් ' උපෙක්ෂකයැ, ස්මෘතිමත් යැ, සුඛවිහාරී යැ ' යි (වෙන් කොට) කියත් ද, ඒ තෘතීයධ්‍යානය උපයා වාස කෙළෙමි. සුඛප්‍රහාණ යෙනුදු දුඃඛප්‍රහාණයෙනුදු සොම්නස්දොම්නස් කැලැ මැ අස්තංගමයෙනුදු අදුඃඛ වූ අසුඛ වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘතිපාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යාන උපයා වාස කෙළෙමි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ[1], භවාසවාපි චිත්තං විමුච්චිත්ථ, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි : 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසිං. එවං ඛො මෙ ආවුසො, ජානතො එවං පස්සතො ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානානුසයා සුසමූහතාති.

තස්ස භික්ඛවෙ, භික්ඛුනො සාධූති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා එවමස්ස වචනීයො : 'ලාභා නො ආවුසො, සුලද්ධං නො ආවුසො, යෙ මයං ආයස්මන්තං තාදිසං බ්‍රහ්මචාරිං පස්සාමා'ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ඡබ්බිසොධනසුත්තං දුතියං.

---

1. විමුච්චි - කත්ථචි

මම මෙසෙයින් සමාධිගත සිත පිරිසිදු වූ කල්හි පයර්‍යවදත වත් මැ අංගණ රහිත වත් මැ උපක්ලෙශවිගත වත් මැ මෘදු වත් මැ කර්මණ්‍ය වත් මැ ස්ථිත වත් මැ නොසැලෙනබවට පත් වත් මැ ආස්‍රවක්ෂයඥනය සඳහා සිත නතු කෙළෙමි. මම ' මේ දුකැ ' යි යථාභූතය දත්මි, ' මේ දුඃඛසමුදය ' යැයි යථාභූතය දත්මි. ' මේ දුඃඛනිරොධ යැ ' යි යථාභූතය දත්මි, ' මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපද යැ ' යි යථාභූතය දත්මි. ' මුහු ආස්‍රවයහ ' යි යථාභූතය දත්මි, ' මේ ආස්‍රවසමුදය ' යැ යි යථාභූතය දත්මි, ' මේ ආස්‍රවනිරොධ යැ ' යි යථාභූතය දත්මි, ' මේ ආස්‍රවනිරොධගාමිනීප්‍රතිපද යැ ' යි යථාභූතය දත්මි. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මාගේ සිත කාමාස්‍රවයෙහුදු මිදිණ, භවාස්‍රවයෙහුදු සිත මිදිණ, අවිද්‍යාස්‍රවයෙහුදු සිත මිදිණ. විමුක්ත කල්හි ' විමුක්ත යැ ' යන ඥනය වී. ' ජාතිය ක්ෂීණ වියැ. බ්‍රහ්මචය්‍ර්‍යය වසන ලදී. සිවුමහකරණී කරනලදී. ' මේ රහත්ඵලය සඳහා ' කළයුතු අන් කිසෙක් නැතියි දත්මි. ඇවැත්නි, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මා විසින් මේ සවිඥනක කයෙහි ද බැහැර හැම නිමිත්හි ද අහිංකාර මමිංකාරමානානුසයෝ නස්නා ලදහයි කියා යි.

මහණෙනි, ඒ මහණහුගේ භාෂිතය මැනැවැ ' යි සතුටින් පිළිගතයුතු යැ. අනුමෙවුනි කළ යුතු යැ, ' මැනැවැ ' යි ඒ භාෂිතය අභිමුඛ වැ පිළිගෙන අනුමෝදන් වැ මෙසේ කියයුතු වෙයි. ' යම් අපි එබඳු බ්‍රහ්මචාරියකු වන ආයුෂ්මතුන් දක්නමෝ ද ' ඇවැත්නි, ඒ අපට ලාභයෙකැ, ඇවැත්නි, ඒ අපට මනාලැබීමෙකැයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**දෙවැනිඡබ්බිසොධන සූත්‍රයි.**

# 3. 2. 3

## සප්පුරිස සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

සප්පුරිසධම්මඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අසප්පුරිසධම්මඤ්ච. තං සුණාථ සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

කතමො ච භික්ඛවෙ, අසප්පුරිසධම්මො: ඉධ භික්ඛවෙ, අසප්පුරිසො උච්චාකුලා පබ්බජිතො හොති. සො ඉති පටිසඤ්චික්ඛති : 'අහං ඛොම්හි උච්චාකුලා පබ්බජිතො ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න උච්චාකුලා පබ්බජිතාති. සො තාය උච්චාකුලීනතාය අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති : 'න ඛො උච්චාකුලීනතාය ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි උච්චාකුලා පබ්බජිතො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසොති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තාය උච්චාකුලීනතාය නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. අයං භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො මහාකුලා පබ්බජිතො හොති -පෙ- මහාභොගකුලා පබ්බජිතො හොති -පෙ- උළාරභොගකුලා පබ්බජිතො හොති. සො ඉති පටිසඤ්චික්ඛති : 'අහං ඛොම්හි උළාරභොග-කුලා පබ්බජිතො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න උළාරභොගකුලා පබ්බජිතා'ති. සො තාය උළාරභොගතාය අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති : 'න ඛො උළාරභොගතාය ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි උළාරභොගකුලා පබ්බජිතො හොති. සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තාය උළාරභොගතාය නෙවත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ සප්පුරිසධම්මො.

# 3. 2. 3
# සප්පුරිස සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජෙතවන නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරම්හි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු ' වහන්සැ ' යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහු. භාග්‍යවතුන් වහන්සේ මෙල සත්පුරුෂ සූත්‍රය වදාළ සේක :

මහණෙනි, තොපට සත්පුරුෂධර්මය හා අසත්පුරුෂධර්මය හා දෙසමි. එය අසව, මනා කොට මෙනෙහි කරව, කියමි ' යී.

වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු, භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළ සේක :

මහණෙනි, අසත්පුරුෂධර්ම නම් කවරෙ යත් : මහණෙනි, මෙලොවැ පාපපුරුෂ (කැත් බමුණු) උසස් කුලයෙන් පැවිදි වූයේ වෙයි. හේ මෙසේ සලකයි : ' මම් වනාහි උසස් කුලෙන් නික්ම පැවිදි වූයෙමි. මේ සෙසු භික්ෂූහු උසස් කුලෙන් පැවිදි නො වූහ' කියා යි. හේ ඒ උසස් කුල ඇතිබැවින් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්මයෙක. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : ' උච්චාකුලීන භාවයෙන් ලොභ ධර්මයෝ හෝ පරික්ෂයට නොයෙති, ද්වෙෂධර්මයෝ හෝ පරික්ෂයට නොයෙති, මොහධර්මයෝ හෝ පරික්ෂයට නොයෙති. ඉදින් උසස් කුලයෙන් පැවිදි නොවූයේ නමුදු හෙ ද ධර්මානුධර්මප්‍රතිපන්න වී නම්, සාමීචිප්‍රතිපන්න වී නම්, අනුධර්ම යෙහි හැසිරෙන සුලු වී නම්, හේ ඒ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි කියා යි. හේ ප්‍රතිපදව ම අභ්‍යන්තර කොට තබා ඒ උච්චා කුලීනතාහෙතුයෙන් තමා හුවන්නේ නො වෙයි, මෙරමා හෙළාදක්නේ නො වෙයි. මහණෙනි, මේ සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ (කැත් බමුණු ගැහැවි යන) මහාකුලයෙන් නික්ම පැවිදි වූයේ වෙයි . . . මහාභොග ඇති කුලයෙන් නික්ම පැවිදි වූයේ වෙයි . . . උදරභොගකුල සංඛ්‍යාත සතරකුලයෙන් නික්ම පැවිදි වූයේ වෙයි. හේ මෙසේ සලකයි : මම් වනාහි උදර භොග ඇති කුලයෙන් නික්ම පැවිදි වූයෙම් වෙමි. මේ සෙසු භික්ෂූහු උදරභොග කුලයෙන් නික්ම පැවිදි වූවාහු නො වෙති කියා යි. හේ ඒ උදරභොගතායෙන් තමා හුවන්නේ වෙයි, මෙරමා හෙළාදක්නේ වෙයි. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : උදරභොගතායෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වෙෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. උදරභොග ඇති කුලයෙන් නික්ම පැවිදි නො වූයේ නමුදු හේ ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වේ ද, සාමීචිධර්මයෙහි පිළිපන්නේ වේ ද, අනුධර්මය පූරනසුලු වේ ද, හේ ඒ භික්ෂූන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ භික්ෂූන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි කියා යි. හේ පිළිවෙත ම අභ්‍යන්තර කොට තබා ඒ උදරභොගතාහෙතුයෙන් තමා හුවන්නේ නො වෙයි, මෙරමා හෙළාදක්නේ නො වෙයි. මෙ ද මහණෙනි, සත්පුරුෂධර්ම යි.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො ඤාතො හොති යසස්සී. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ඤාතො යසස්සී. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අප්පඤ්ඤාතා[1] අප්පෙසක්ඛා'ති. සො තෙන ඤාතත්තෙන[2] අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉතිපටිසඤ්චික්ඛති: 'න ඛො ඤාතත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි ඤාතො හොති යසස්සී, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන ඤාතත්තෙන. නෙවත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න ලාභිනො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. සො තෙන ලාභෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො ලාභෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන ලාභෙන නෙවත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො බහුස්සුතො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි බහුස්සුතො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න බහුස්සුතා'ති. සො තෙන බාහුසච්චෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො බාහුසච්චෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි බහුස්සුතො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසොති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන බාහුසච්චෙන නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

---

1. අප්පඤාතා - සයා.
2. ඤාතෙන - සීමු.
   ඤාත්තෙන - මජ්ඣං.

තවද මහණෙනි, අසත්පුරුෂ ප්‍රසිද්ධ වූයේ පරිවාර සම්පන්න වූයේ වෙයි. හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂණ කෙරෙයි : මම වනාහි ප්‍රසිද්ධ වූයෙම් වෙමි, පරිවාරසම්පන්න වූයෙම් වෙමි. මේ සෙසු භික්ෂූහු වනාහි අප්‍රසිද්ධයහ, අල්පපරිවාර ඇතියහ කියා යි. හේ ඒ ඥාතභාවහෙතුයෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ ප්‍රත්‍යවේක්ෂණ කෙරෙයි : ඥාතභාවහෙතුයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ප්‍රසිද්ධ නො වූයේ නමුදු පරිවාරසම්පන්න නො වූයේ නමුදු හේ ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වේ ද, සාමීචිධර්ම යෙහි පිළිපන්නේ වේ ද, අනුධර්මය පුරනසුලු වේ ද, හේ ඒ භික්ෂූන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ භික්ෂූන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි කියා යි. හේ පිළිවෙත ම අභ්‍යන්තර කොට තබා ඒ ඥාතභාවහෙතුයෙන් තමා හුවන්නේ නො වෙයි, මෙරමා හෙළාදක්නේ නො වෙයි. මහණෙනි මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ සිවුරුපිඬුවාසෙනසුන්ගිලන්පසබෙහෙත්පිරිකර ලබන සුලු වෙයි. හේ මෙසේ සලකයි: මම වනාහි සිවුරුපිඬුවාසෙනසුන්ගිලන්පසබෙහෙත්පිරිකර ලබනසුලුයෙම් වෙමි. මේ සෙසු භික්ෂූහු සිවුරුපිඬුවාසෙනසුන්ගිලන්පසබෙහෙත්පිරිකර නොලබනසුලු වෙති කියා යි. හේ ඒ ලාභහෙතුයෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : ලාභ හෙතුයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නොයෙති, ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මොහධර්මයෝ හෝ පරික්ෂයට නොයෙති. සිවුරුපිඬුවාසෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර නොලබනසුලු වුව ද, හේ ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වේ නම්, සාමීචිධර්මයෙහි පිළිපන්නේ වේ නම්, අනුධර්ම පුරනසුලු වේ නම්, හේ ඒ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි කියායි. හේ පිළිවෙත මැ අභ්‍යන්තර කොට ගෙන ඒ ලාභහෙතුයෙන් තමා හුවාගන්නේ නො වෙයි. මෙරමා හෙළාදක්නේ හෝ නො වෙයි. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ බහුශ්‍රැත වෙයි. හේ මෙසේ සලකයි : ' මම වනාහි බහුශ්‍රැතයෙමි. මෙ සෙසු භික්ෂූහු බහුශ්‍රැතයෝ නො වෙති '' කියායි. හේ ඒ බහුශ්‍රැතභාවයෙන් තමා හුවාදකී, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : '' බහුශ්‍රැතභාවයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. බහුශ්‍රැත නො වුවද හේ ධර්මානුධර්මයෙහි පිළිපන්නේ නම්, සාමීචිධර්මයෙහිත් පිළිපන්නේ වේ නම්, අනුධර්මය පුරන සුලු වේ නම් හේ එ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි '' කියායි. හේ ප්‍රතිපත් ම කරුණු කොට ගෙන ඒ බහුශ්‍රැතභාවයෙන් තමා නොහුවන්නේ යැ. මෙරමා නො හෙළාදක්නේ යැ. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්මයි.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො විනයධරො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි විනයධරො , ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න විනයධරා'ති. සො තෙන විනයධරත්තෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො විනයධරත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි විනයධරො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන විනයධරත්තෙන නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො ධම්මකථිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ධම්මකථිකො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න ධම්මකථිකා'ති. සො තෙන ධම්මකථිකත්තෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො ධම්මකථිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි ධම්මකථිකො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන ධම්මකථිකත්තෙන නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො ආරඤ්ඤිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ආරඤ්ඤිකො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න ආරඤ්ඤිකා'ති. සො තෙන ආරඤ්ඤිකත්තෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: න ඛො ආරඤ්ඤිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි ආරඤ්ඤිකො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන ආරඤ්ඤිකත්තෙන නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො පංසුකූලිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි පංසුකූලිකො. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න පංසුකූලිකා'ති. සො තෙන පංසුකූලිකත්තෙන අත්තානුක්කංසෙති. පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො පංසුකූලිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි පංසුකූලිකො හොති, සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන පංසුකූලිකත්තෙන නෙවත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

තවද මහණෙනි, අසත්පුරුෂ විනයධර වෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂණ කෙරෙයි : '' මම වනාහි විනයධර වෙමි. මෙ සෙසු භික්ෂූහු විනයධර නො වෙති '' කියායි. හේ ඒ විනයධරභාවයෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ ප්‍රත්‍යවෙක්ෂණ කෙරෙයි : '' විනයධර භාවයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. විනයධර නොවුව ද හේ ධර්මානුධර්මයට පැමිණියේ වේ නම්, සාමීචිධර්මයට පැමිණියේ වේ නම්, අනුධර්මචාරී වේ නම්, හේ එ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි. ඒ මහණුන් කෙරෙහි ප්‍රශංසාහර් වෙයි '' කියා යි. හේ පිළිවෙත ම කරුණු කොට ගෙන ඒ විනයධරභාවයෙන් තමා නො හුවයි. මෙරමා නොහෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ තෙම ධර්මකථික වෙයි. හේ මෙසේ සිතයි : '' මම ධර්මකථිකයෙමි. මෙ සෙසු භික්ෂූහු ධර්මකථිකයෝ නො වෙති '' කියා යි. හේ ඒ ධර්මකථික භාවයෙන් තමා හුවයි. මෙරමා හෙළාදකී. මහණෙනි, මෙද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සිතයි : '' ධර්මකථික භාවයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වෙෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ධර්මකථික නොවුව ද හේ ධර්මානුධර්මය පිළිපදනෝ වේ නම්, සාමීචිධර්මය පිළිපදනෝ වේ නම්, අනුධර්මචාරී වේ නම්, හේ ඒ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි. හෙ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි '' කියා යි. හේ පිළිවෙත ම කරුණු කොට ගෙන ඒ ධර්මකථික භාවයෙන් තමා නො හුවයි. මෙරමා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තව ද මහණෙනි, අසත්පුරුෂ ආරණ්‍යක වෙයි. හේ මෙසේ සලකයි : '' මම ආරණ්‍යක යෙමි. මේ සෙසු භික්ෂූහු ආරණ්‍යක නො වෙති '' කියා යි. හෙ ඒ ආරණ්‍යක භාවයෙන් තමා හුවාගනී. පරා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : '' ආරණ්‍යකභාවයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. මොහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ආරණ්‍යක නො වුව ද හේ ධර්මානුධර්මප්‍රතිපන්න වේ නම්, සාමීචි ධර්ම ප්‍රතිපන්න වේ නම්, අනුධර්මචාරී වේ නම්, හේ එ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි. හෙ එ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි '' කියා යි. හේ පිළිවෙත ම කරුණු කොට ගෙන ඒ ආරණ්‍යක භාවයෙන් තමා නො හුවයි. පරා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ පංසුකූලික වෙයි. හේ මෙසේ සලකයි : '' මම වනාහි පංසුකූලිකයෙමි. මේ සෙසු භික්ෂූහු පංසුකූලික නො වෙති '' කියා යි. හේ ඒ පංසුකූලික භාවයෙන් තමා හුවාගනී, පරා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ ද වනාහි මෙසේ සිතයි : '' පංසුකූලික භාවයෙන් ලොභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. මොහ ධර්මයෝ හෝ පරික්ෂයට නො යෙත්. පංසුකූලික නො වුවද හේ ධර්මානුධර්ම ප්‍රතිපන්න වේ නම්, සාමීචිධර්මප්‍රතිපන්න වේ නම්, අනුධර්මචාරී වේ නම්, හේ එ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි, හෙ එ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි '' කියා යි. හෙ පිළිවෙත ම කරුණු කොටගෙන, එ පසුකූලික භාවයෙන් තමා නො හුවයි, පරා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො පිණ්ඩපාතිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි පිණ්ඩපාතිකො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න පිණ්ඩපාතිකා'ති. සො තෙන පිණ්ඩපාතිකත්තෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'න ඛො පිණ්ඩපාතිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි පිණ්ඩපාතිකො හොති. සො ච හොති. ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදංයෙව අන්තරං කරිත්වා තෙන පිණ්ඩපාතිකත්තෙන නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො රුක්ඛමූලිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි රුක්ඛමූලිකො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න රුක්ඛමූලිකා'ති. සො තෙන රුක්ඛමූලිකත්තෙන අත්තානුක්කංසෙති. පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති : 'න ඛො රුක්ඛමූලිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි රුක්ඛමූලිකො හොති සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදං යෙව අන්තරං කරිත්වා තෙන රුක්ඛමූලිකත්තෙන නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො සොසානිකො හොති -පෙ- අබ්භොකාසිකො හොති -පෙ- නෙසජ්ජිකො හොති -පෙ- යථාසන්ථතිකො හොති—පෙ—එකාසනිකො හොති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි එකාසනිකො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න එකාසනිකා'ති. සො තෙන එකාසනිකත්තෙන අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති : 'න ඛො එකාසනිකත්තෙන ලොභධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, දොසධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති, මොහධම්මා වා පරික්ඛයං ගච්ඡන්ති. නො චෙපි එකාසනිකො හොති. සො ච හොති ධම්මානුධම්මපටිපන්නො සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තත්ථ පුජ්ජො, සො තත්ථ පාසංසො'ති. සො පටිපදං යෙව අන්තරං කරිත්වා තෙන එකාසනිකත්තෙන නෙවත්තානුක්කංසෙති. න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති : 'අහං ඛොම්හි පඨමජ්ඣානසමාපත්තියා ලාභී, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ න පඨමජ්ඣානසමාපත්තියා ලාභිනො'ති. සො තාය පඨමජ්ඣානසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති, අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ. ඉති පටිසඤ්චික්ඛති : 'පඨමජ්ඣානසමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා යෙන යෙන හි මඤ්ඤන්ති, තතො තං හොති අඤ්ඤථා'ති සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය පඨමජ්ඣානසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

තවද මහණෙනි, අසත්පුරුෂ පිණ්ඩපාතික වෙයි. හේ මෙසේ සිතයි : '' මම වනාහි පිණ්ඩපාතිකයෙමි. මේ සෙසු භික්ෂූහු පිණ්ඩපාතිකයෝ නො වෙති '' කියා යි. හේ ඒ පිණ්ඩපාතික භාවයෙන් තමා හුවයි, පරා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සිතයි : '' පිණ්ඩපාතිකභාවයෙන් ලෝභ ධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. මෝහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. පිණ්ඩපාතික නො වූව ද ධර්මානුධර්ම ප්‍රතිපන්න වේ නම් සාමීචිධර්මප්‍රතිපන්න වේ නම් අනුධර්මචාරී වේ නම්, හේ එ මහණුන් කෙරෙහි පූජාර්හ වෙයි. හේ එ මහණුන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි '' කියා යි. හේ පිළිවෙත ම කරුණු කොටගෙන එ පිණ්ඩපාතිකභාවයෙන් තමා නො හුවයි. පරා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ රුක්ඛමූලික වෙයි. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂණ කෙරෙයි : ' මම වනාහි රුක්ඛමූලිකයෙමි. මේ සෙසු භික්ෂූහු රුක්ඛමූලිකයෝ නො වෙති ' කියා යි. හේ ඒ රුක්ඛමූලිකභාවයෙන් තමා හුවයි, පරා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි, සත්පුරුෂ මෙසේ ප්‍රත්‍යවේක්ෂණ කෙරෙයි : ' රුක්ඛමූලිකභාවයෙන් ලෝභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මෝහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. රුක්ඛ මූලික නොවූව ද, හේ ධර්මානුධර්මප්‍රතිපන්න වේ නම්, සාමීචිප්‍රතිපන්න වේ නම්, අනු ධර්මචාරී වේ නම්, හේ ඒ භික්ෂූන් කෙරෙහි පූජාර්හ වෙයි. හේ ඒ භික්ෂූන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි ' කියා යි. හේ පිළිවෙත මැ කරුණු කොට ගෙන ඒ රුක්ඛමූලික භාවයෙන් තමා නො හුවන්නේ වෙයි, පරා නො හෙළාදක්නේ යැ. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ සෝසානික වෙයි, . . . අබ්භොකාසික වෙයි, . . . නෙසජ්ජික වෙයි, . . . යථාසන්ථතික වෙයි, . . . එකාසනික වෙයි, හේ මෙසේ සලකයි ; '' මම එකාසනික වෙමි, මේ සෙසු භික්ෂූහු එකාසනික නො වෙති '' කියා යි. හේ ඒ ඒකාසනිකභාවයෙන් තමා හුවයි. මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත් පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : '' ඒකාසනික භාවයෙන් ලෝභධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, ද්වේෂධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති, මෝහධර්මයෝ හෝ පරික්ෂයට නො යෙති. ඒකාසනික නො වූව ද හෙ ද ධර්මානුධර්ම ප්‍රතිපන්න වෙ යි, සාමීචිප්‍රතිපන්න වෙයි, අනුධර්මචාරී වෙයි, හේ ඒ භික්ෂූන් කෙරෙහි පූජාර්හ වෙයි, හේ ඒ භික්ෂූන් කෙරෙහි ප්‍රශංසාර්හ වෙයි. හේ ප්‍රතිපදාව ම කරුණු කොටගෙන ඒ ඒකාසනිකභාවයෙන් තමා නො හුවයි, මෙරමා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ කාමයෙන් වෙන් වැ මැ අකුසල්දහමින් වෙන් වැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. හේ මෙසේ සලකයි : ' මම වනාහි ප්‍රථමධ්‍යානසමාපත්තිලාභී වෙමි. මේ සෙසු භික්ෂූහු ප්‍රථමධ්‍යානසමාපත්තිලාභීහු නො වෙති ' කියා යි. හේ ඒ ප්‍රථමධ්‍යාන සමාපත්තියෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : ' භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රථමධ්‍යාන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිතබව වදරන ලදි. යම් යම් මඤ්ඤනායෙකින් මඤ්ඤනා කෙරෙත් ද, එහෙයින් එය අන් පරිද්දෙකින් වෙයි කියා යි. හේ තෘෂ්ණා රහිතබව මැ කරුණු කොට ගෙන ඒ ප්‍රථමධ්‍යානසමාපත්තියෙන් තමා නො මැ හුවයි, මෙරමා නො හෙළා දකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

12—ඒ 00502 (8/73)

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි චතුත්ථජ්ඣානසමාපත්තියා ලාභී, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ චතුත්ථජ්ඣානසමාපත්තියා න ලාභිනො'ති. සො තාය චතුත්ථජ්ඣානසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'චතුත්ථජ්ඣානසමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා. යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා'ති. සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය චතුත්ථජ්ඣානසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභී. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ ආකාසානඤ්චායතනසමාපත්තියා න ලාභිනො'ති. සො තාය ආකාසානඤ්චායතනසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: ආකාසානඤ්චායතනසමාපත්තියා'පි අතම්මයතා වුත්තා භගවතා. යෙන යෙන හි මඤ්ඤන්ති, තතො තං හොති අඤ්ඤථා'ති. සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය ආකාසානඤ්චායතනසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම[1] අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියා ලාභී, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා න ලාභිනො'ති. සො තාය විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'විඤ්ඤාණඤ්චායතනසමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා, යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා'ති. සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම[1] නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභී, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා න ලාභිනො'ති. සො තාය ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා. යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා'ති. සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

1. සමතික්කමා - PTS.

තවද මහණෙනි, අසත්පුරුෂ විතර්ක විචාරයන් සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිත පිළිබඳ එකඟ බව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීති සුඛ ඇති ද්විතීය ධ්‍යානය ...... තෘතීය ධ්‍යානය ...... චතුර්ත්ථ ධ්‍යානය උපයාගෙන වාස කෙරෙයි. හේ මෙසේ සලක යි : '' මම වනාහි චතුර්ත්ථධ්‍යානසමාපත්තිලාභී වෙමි, මේ සෙසු භික්ෂූහු චතුර්ත්ථධ්‍යානසමාපත්තිලාභීහු නො වෙති '' කියා යි. හේ ඒ චතුර්ත්ථ ධ්‍යානසමාපත්තියෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : 'භාග්‍යවතුන් වහන්සේ විසින් චතුර්ත්ථධ්‍යානසමාපත්තියෙහුදු තෘෂ්ණා රහිත බව වදරන ලදී. යම් යම් මඤ්ඤනා යෙකින් මඤ්ඤනා කෙරෙත් ද, ඒ හේතුයෙන් එය අන් පරිදි වෙයි' කියා යි. හේ තෘෂ්ණා රහිතබව ම කරුණු කොට ගෙන ඒ චතුර්ත්ථධ්‍යානසමාපත්තියෙන් තමා නො හුවයි, මෙරමා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන්ගේ සමතික්‍රමණ යෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තංගමයෙන් නානාත්වසංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත යයි ආකාසානඤ්චායතන සමවතට පැමිණ වෙසෙයි. හේ මෙසේ සලකයි : මම වනාහි ආකාසානඤ්චායතනසමාපත්ති ලාභී වෙමි, මේ සෙසු භික්ෂූහු ආකාසානඤ්චායතනසමාපත්තිලාභීහු නො වෙති' කියා යි. හේ ඒ ආකාසානඤ්චා යතනසමාපත්තිහෙතුයෙන් තමා හුවයි, මෙරමා හෙළාදකියි. මහණෙනි, මෙ ද අසත් පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : භාග්‍යවතුන් වහන්සේ විසින් ආකාසානඤ්චායතනසමාපත්තියෙහුදු නිස්තෘෂ්ණතා වදාරන ලදු. යම් යම් මඤ්ඤනා යෙකින් මඤ්ඤනා කෙරෙත් ද, ඒ හේතුයෙන් අන් පරිදි වෙයි කියා යි. හේ නිස්තෘෂ්ණ බව මැ කරුණු කොට ගෙන ඒ ආකාසානඤ්චායතනසමාපත්තියෙන් තමා නො හුවයි, මෙරමා නො හෙළාදකියි.

තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ විඥනය අනන්ත යයි විඤ්ඤාණඤ්චායතන සමතට පැමිණ විහරණ කෙරෙයි. හේ මෙසේ සලකයි: 'මම වනාහි විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී වෙමි. මේ සෙසු භික්ෂූහු විඤ්ඤාණ ඤ්චායතන සමපත්තිලාභීහු නො වෙති'' කියා යි. හේ ඒ විඤ්ඤාණඤ්චායතනසමාපත්ති යෙන් තමා හුවයි, මෙරමා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි: ''භාග්‍යවතුන්වහන්සේ විසින් විඤ්ඤාණඤ්චා යතන සමාපත්තියෙහුදු නිස්තෘෂ්ණතාව වදරන ලදු. යම් යම් මඤ්ඤනායෙකින් මඤ්ඤනා කෙරෙත් ද එයින් එය අන් පරිදි වෙයි '' කියා යි. හේ නිස්තෘෂ්ණතාව ම කරුණු කොට ගෙන ඒ විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් තමා නො හුවයි, මෙරමා නො හෙළාදකී. මහණෙනි, මෙ ද සත්පුරුෂධර්ම යි.

තවද මහණෙනි, අසත්පුරුෂ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය සමතික්‍රමණය කොට 'කිසිදු නැති'යි ගෙනැ ආකිඤ්චඤ්ඤායතන සමවතට සම වැද විහාර කෙරෙයි. හේ මෙසේ සලකයි : 'මම වනාහි ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි. මේ සෙසු භික්ෂූහු ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභීහු නො වෙති'යි කියා යි. හේ ඒ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් තමා හුවයි. පරා හෙළාදකී. මහණෙනි, මෙ ද අසත්පුරුෂධර්මයි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි : ' භාග්‍යවතුන් වහන්සේ විසින් ආකිඤ්චඤ්ඤායතනසමා පත්තියෙහුදු නිස්තෘෂ්ණාව වදරන ලදු, යම් යම් මඤ්ඤනායෙකින් මඤ්ඤනා කෙරෙත් ද එයින් එය අන් පරිදි වෙයි කියා යි. හේ නිස්තෘෂ්ණතාව මැ කරුණු කොට ගෙන ඒ ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් තමා නො මැ හුවයි. පරා නො හෙළයි. මහණෙනි, මෙ ද සත්පුරුෂ ධර්ම යි.

පුන ච පරං භික්ඛවෙ, අසප්පුරිසො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම[1] නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: 'අහං ඛොම්හි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභී, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා න ලාභිනො'ති. සො තාය නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා අත්තානුක්කංසෙති, පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, අසප්පුරිසධම්මො. සප්පුරිසො ච ඛො භික්ඛවෙ, ඉති පටිසඤ්චික්ඛති: 'නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා. යෙන යෙන හි මඤ්ඤන්ති, තතො තං හොති අඤ්ඤථා'ති. සො අතම්මයතංයෙව අන්තරං කරිත්වා තාය නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා නෙව අත්තානුක්කංසෙති, න පරං වම්භෙති. අයම්පි භික්ඛවෙ, සප්පුරිසධම්මො.

පුන ච පරං භික්ඛවෙ, සප්පුරිසො සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම[1] සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති[2] අයං ඛො[3] භික්ඛවෙ, භික්ඛු න කිඤ්චි මඤ්ඤති, න කුහිඤ්චි මඤ්ඤති, න කෙනචි මඤ්ඤතී'ති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සප්පුරිස සුත්තං තතියං.

---

1. සමතික්කමා - PTS.
2. පරික්ඛයාපෙන්ති - PTS.
3. {අයම්පි - සීමු, PTS. / අයං - මජසං.

තවද මහණෙනි, අසත්පුරුෂ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවත උපයාගෙන විහාර කෙරෙයි. හේ මෙසේ සලකයි : ' මම වනාහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි.මේ සෙසු භික්ෂූහු නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභීහු නො වෙති' කියා යි. හේ ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභයෙන් තමා හුවයි, පරා හෙළාදකියි. මහණෙනි, මෙ ද අසත්පුරුෂ ධර්ම යි. මහණෙනි, සත්පුරුෂ වනාහි මෙසේ සලකයි: ' භාග්‍යවතුන් වහන්සේ විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙනුදු නිස්තෘෂ්ණතාව වදරන ලදු. යම් යම් මඤ්ඤනායෙකින් මඤ්ඤනා කෙරෙත් ද, එයින් එය අන් පරිදි වෙයි' කියා යි. හේ නිස්තෘෂ්ණතාව මැ කරුණු කොට ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් තමා නො මැ හුවයි, පරා නොහෙළයි. මහණෙනි, මෙ ද සත්පුරුෂ ධර්ම යි.

තව ද මහණෙනි, සත්පුරුෂ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සමතික්‍රම කොට සඤ්ඤාවේදයිතනිරොධය උපයාගෙන විහරණ කෙරෙයි. ප්‍රඥයෙන් දැකීම් හෙතු කොට ගෙන ඔහුගේ ආශ්‍රවයෝ පරික්ෂීණ වෙති. මහණෙනි, මේ මහණ වනාහි කිසිදු පුඟුලකු ත්‍රිවිධ මඤ්ඤනායෙන් නො හඟනෝ යැ. කිසිදු අවකාශයෙක ලා නො හඟනෝ යැ. කිසිදු වස්තුයෙකිනුදු නො හඟනෝ යැ යි වදළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළහ. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගන්නා ලද සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ දෙශනා අභිනන්දනයෙන් පිළිගත්හු.

**තුන්වැනි සප්පුරිස සූත්‍ර යි.**

# 3. 2. 4

## සෙවිතබ්බාසෙවිතබ්බ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච :

සෙවිතබ්බාසෙවිතබ්බං වො භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච :

කායසමාචාරම්පහං[1] භික්ඛවෙ දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං කායසමාචාරං. වචීසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං වචීසමාචාරං. මනොසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං මනොසමාචාරං. චිත්තුප්පාදම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං චිත්තුප්පාදං. සඤ්ඤාපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපටිලාභං. දිට්ඨිපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං දිට්ඨිපටිලාභං. අත්තභාවපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං අත්තභාවපටිලාභ'න්ති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච : ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි.

"කායසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං කායසමාචාර"න්ති. ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො කායසමාචාරො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො කායසමාචාරො සෙවිතබ්බො.

---

1. කායසමාචාරම්පාහං – සීමු, මජසං.

# 3. 2. 4
# සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහු ගේ අරමෙහි වැඩවාස කෙරෙති. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා මහණුන් ඇමතූ සේක. 'වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල සූත වදළ සේක.

මහණෙනි, තොපට සෙවිතව්‍ය අසෙවිතව්‍ය වූ ධර්මපර්‍ය්‍යාය දෙශනා කරමි. ඒ අසව, මනාකොට මෙනෙහි කරව, කියමි ' යි. වහන්ස, එසේ යයි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල වදළ සේක.

මහණෙනි, මම කායසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. එ ද එකිනෙක වෙනස් කායසමාචාර යි. මහණෙනි, මම වචීසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් වාක්සමාචාර යි. මහණෙනි, මම මනස්සමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිත්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් මනස්සමාචාර යි. මහණෙනි, මම චිත්තොත්පාදය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් චිත්තොත්පාද යි. මහණෙනි, මම සංඥප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් සංඥප්‍රතිලාභ යි. මහණෙනි, මම දෘෂ්ටිප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් දෘෂ්ටිප්‍රතිලාභ යි. මහණෙනි, මම ආත්මභාවප්‍රතිලාභ ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද එකිනෙක වෙනස් ආත්මභාවප්‍රතිලාභ වේ යයි.

මෙසේ වදළ කල ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළකළහ : වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදළ විස්තර විසින් අර්ථ විභාග නො කළ මේ භාෂිතයා ගේ අර්ථ විස්තර විසින් මෙසේ අවබොධ කොට දනිමි.

"මහණෙනි, මම කායසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි එ ද වෙන වෙන සිටි කායසමාචාරය " යි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මෙල බසෙක් වදරන ලද ද, මෙල බස කුමක් පිණිස වදරන ලද ද යත්: 'වහන්ස, යම්බඳු කායසමාචාරයෙක් සෙවුනහට අකුශලධර්මයෝ වෙසෙසා වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු කායසමාචාරය නො සෙවිය යුතු ය. වහන්ස, යම් බඳු කායසමාචාර යක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වෙසෙසා වැඩෙත් ද, මෙබඳු කායසමාචාරය සෙවිය යුතු යැයි.

කථං රූපං භන්තෙ, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. ඉධ භන්තෙ, එකච්චො පාණාතිපාතී හොති, ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. අදින්නාදායී ඛො පන හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති. කාමෙසු මිච්ඡාචාරී ඛො පන හොති, යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනී රක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුළපරික්ඛිත්තාපි. තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති. එවරූපං භන්තෙ කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති.

කථං රූපං භන්තෙ, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ භන්තෙ එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං න ආදාතා හොති කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතු රක්ඛිතා භාතුරක්ඛිතා භගිනීරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුළපරික්ඛිත්තාපි. තථාරූපාසු චාරිත්තං න ආපජ්ජිතා හොති. එවරූපං භන්තෙ කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

"කායසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං කායසමාචාර"න්ති ඉති යං තං වුත්තං භගවතා. ඉදමෙතං පටිච්ච වුත්තං.

"වචීසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං වචීසමාචාර"න්ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො වචීසමාචාරො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො වචීසමාචාරො සෙවිතබ්බො.

වහන්ස, කෙබඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, වහන්ස, මෙලොවැ කිසිවෙක් රෞද්‍ර ලෙහෙ වැකුණු අත් ඇති පරප්‍රහාරයෙහි පරවධයෙහි නියුක්ත ප්‍රාණීන් කෙරෙහි අදයාපන්න පණිවා ඇතියෙක් වේ ද, අයිනාදන් ගන්නේ වේ ද, මෙරමා සතු පරා අයත් සතුටු එළවන පිරිකර බඩු ඇද්ද ග්‍රාමගත වේවයි, අරණ්‍යගත වේවයි. ඒ නුදුන් දිය සොරසිතින් ගන්නේ වේ ද, යළි කාමයෙහි මිසහසර ඇතියේ වේ ද, මවු විසින් රක්නා ලද පියා විසින් රක්නා ලද දෙ මාපියන් විසින් රක්නා ලද බෑයා විසින් රක්නා ලද බුහුන විසින් රක්නා ලද නෑයන් විසින් රක්නා ලද ගොත්‍රය විසින් රක්නා ලද ධර්මය විසින් රක්නා ලද සස්වාමික සපරි දණ්ඩ වූ යටතින් මාලාගුණමාත්‍රයෙනුදු පරික්ෂිප්ත වූ යම් කුලකුමාරිකාවෝ ඇද්ද, එබඳු ස්ත්‍රීන් කෙරෙහි මිථ්‍යාචාර වශයෙන් ව්‍යතික්‍රම කරන්නේ වේ ද. වහන්ස, මෙබඳු කාය සමාචාරය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙති කියා යි.

වහන්ස, කෙබඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ කිසිවෙක් පණිවා හැරපියා පණිවායෙන් දුරුවූයේ වේ ද, බහාතැබූ දඬු ඇති ව බහාතැබූ ශස්ත්‍ර ඇති ව ලජ්ජාවට පැමිණ දයාපන්න ව සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පී ව වාස කෙරේ ද, අයිනාදන් හැරපියා අයිනාදනින් විරත වේ ද, මෙරමා සතු පරා අයත් තෘෂ්ටිජනක යම් උපකරණ ඇද්ද, ග්‍රාමගත වේවයි අරණ්‍යගත වේවයි එ හැම අයිනාදන් සොරසිතින් නො ගන්නේ වේ ද. කාමයෙහි මිසහසර හැරපියා කාමයෙහි මිසහසරින් වැළැකුණේ වේ ද, මාතුරක්ඛිතා ය, පිතුරක්ඛිතා ය, මාතාපිතුරක්ඛිතා ය, භාතුරක්ඛිතා ය, භගිනිරක්ඛිතා ය, ඤාතිරක්ඛිතා ය, ගොත්තරක්ඛිතා ය, ධම්මරක්ඛිතා ය, සස්සාමිකා ය, සපරිදණ්ඩා ය යන මොවුන් හා යටතින් මල්දමින් වටලා වෙන්කළා වූවා ද ' යි යම් කුලකුමාරිකාවෝ ඇද්ද, එබඳු ස්ත්‍රීන් කෙරෙහි ව්‍යතික්‍රම නො කරන්නේ වේ ද, වහන්ස, මෙබඳු කායසමාචාර සෙවුනා හට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති කියා යි.

'' මහණෙනි, මම කායසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන කායසමාචාර වෙති '' භාග්‍යවතුන් වහන්සේ යමක් වදරන ලද ද, මෙය තෙල පිණිස වදරන ලදි.

'' මහණෙනි, මම වාක්සමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවි තව්‍ය ද ' යි. එ ද වෙන වෙන වාක්සමාචාර වෙති '' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල කුමක් පිණිස වදරන ලද්දේ ද යත් : වහන්ස, යම්බඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු වාක්සමාචාරය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු වාක්සමා චාරය සෙවිය යුතු ය.

කථං රූපං භන්තෙ, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. ඉධ භන්තෙ එකච්චො මුසාවාදී හොති. සභග්ගතො[1] වා පරිසග්ගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො, 'එහම්භො පුරිස, යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ 'ජානාමී'ති, ජානං වා ආහ 'න ජානාමී'ති, අපස්සං වා ආහ 'පස්සාමීති, පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති. පිසුනාවාචො[3] ඛො පන හොති ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති සමග්ගානං වා භෙත්තා[4], භින්නානං වා අනුප්පදාතා, වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසවාචො[5] ඛො පන හොති, යා සා වාචා අණ්ඩකා[6] කක්කසා ඵරුසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපී ඛො පන හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා හොති අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං. එවරූපං භන්තෙ, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති.

කථං රූපං භන්තෙ, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ භන්තෙ, එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති. සභග්ගතො වා පරිසග්ගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස, යං ජානාසි තං 'වදෙහී'ති, සො අජානං වා ආහ 'න ජානාමී'ති, ජ නං වා ආහ ජානාමී'ති, අපස්සං වා ආහ 'න පස්සාමී'ති පස්සං වා ආහ පස්සාමී'ති ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං එවරූපං භන්තෙ, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

---

1. සභාගතො - ස්‍යා.
2. පරිසගතො - සීමු. / පරිසාගතො - මජ්සං, PTS.
3. පිසුණවාචො - මජ්සං, ස්‍යා. / පිසුණාවාචො - සීමු, PTS.
4. භෙදෙතා - ස්‍යා.
5. ඵරුසාවාචො - සීමු, ස්‍යා,
6. කණ්ණකා - සීමු, මජ්සං.

වහන්ස, කෙබඳු වාක්සමාචාරයක් සෙවුනහුට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, වහන්ස, මෙලොවැ එකෙක් මුසවා කියනසුලු වෙයි. සභායෙහි සිටියේ වේවයි, ගම්පිරිස්හි සිටියේ වේවයි, නෑ මුළුයෙහි සිටියේ වේවයි, සෙනීන් මැද සිටියේ වේවයි, රජකුලන් මැද සිටියේ වේවයි, ඉදිරියට පමුණුවන ලදු ව ' එම්බා පුරුෂය, එ, යමක් දන්හි නම් ඒ කියා ' යි සාක්ෂ්‍ය කොටපුළුවුස්නා ලදු ව හේ නො දන්මින් හෝ ' දන්මි ' කියයි. දන්මින් හෝ ' නො දන්මි ' කියයි. නො දක්මින් හෝ ' දක්මි ' යි කියයි. දක්මින් හෝ ' නො දක්මි ' යි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් හෝ පරහෙතු යෙන් හෝ අල්පමාත්‍ර අත්ලස් හේතුයෙන් හෝ දැන දැන මුසවා කියනු වෙයි. යළි මෙහි දී අසා එතැන දී මුන්ගේ බිඳුමට ඇසුවා කියනු වෙයි, එතැන දී හෝ අසා උන්ගේ බිඳුමට මුනට ඇසුවා කියනු වේ යයි මෙසේ පිසුනුබස් ඇතියේ වෙයි. මෙසේ සමග වූවන් හෝ බිඳිනුයේ බුන් ඇත්තනට හෝ අනුබල දෙනු වෙයි. වර්ගාරාම ව වර්ගරත ව වර්ගනන්දි ව වර්ග කරන බස් බණනු වෙයි. යළි පරොස් බස් බණනු වෙයි : යම් බසෙක් සදෙස් වී ද කැකුළු වේ ද, පරොස් වේ ද, පරාහට මනොපදෙස ඇති කෙරේ ද, මෙරමා ගටනු වේ ද, ක්‍රොධාසන්න වේ ද, සමාධිසංවත්තනික නො වේ ද, එබඳු වාග් බණනු වෙයි. යළි පලප් ඇතියේ වෙයි ; අකාලවාදී ව අභූතවාදී ව අනර්ථවාදී ව අධර්මවාදී ව අවිනයවාදී ව අකාලයෙහි සූත්‍රාපදෙස නැති පර්යන්ත රහිත අනර්ථසංහිත ළෙහි නිදහනට නො නිසි බස් බණනු වෙයි. වහන්ස, මෙබඳු වාක්සමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙති.

වහන්ස, කෙබඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් මුසවා හැරපියා මුසවායෙන් වැළැකියේ වෙයි. සභාගත ව වේවයි, පර්ෂද්ගත ව වේවයි, ඥතිමධ්‍යගත ව වේවයි, පූගමධ්‍යගත ව වේවයි, රාජකුලමධ්‍යගත ව වේවයි, ඉදිරියට පමුණුවන ලදුයේ ' භවත් පුරුෂය ' ඒ, යමක් දන්හි නම් ඒ කියව ' යි සාක්ෂ්‍ය විසින් පුළුවුස්නා ලදු ව හේ නො දන්මින් හෝ ' නො දන්මි ' යි කියයි. දන්මින් හෝ ' දන්මි ' යි කියයි. නො දක්මින් හෝ ' නො දක්මි ' යි කියයි. දක්මින් හෝ ' දක්මි ' යි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි, පරහෙතුයෙන් වේවයි ඇලුප් අල්ලස් මතුයෙකින් වේවයි දැන දැන මුසවා නො කියනු වෙයි. පෙහෙසුන් හැරපියා පෙහෙසුන් බසින් වැළැකියේ වෙයි. මෙහි අසා මුන් බිඳිනු පිණිස එහි ලා නො කියනු වෙයි. එහි අසා හෝ උන් බිඳිනු පිණිස මුනට නො කියනු හෝ වෙයි. මෙසේ හෙදගතයන් සන්ධාන කරනුයේ හෝ සන්ධාන වූවනට අනුබල දෙනුයේ හෝ සමග්‍රාරාම ව සමග්‍රරත ව සමග්‍රනන්දි ව සමඟ කරන බස් කියනු වෙයි. පරොස්බස් හැරපියා පරොස් බසින් වැළැකියේ වෙයි. යම් බසෙක් නිර්දෝෂ වේ ද, කනට සුව එළවා ද, ප්‍රෙමනීය වේ ද, හෘදයඞ්ගම වේ ද, පුරවැසි වේ ද, බොහෝ දෙනාට කන්කලු වේ ද, බොහෝ දෙනා මන්වඩනු වේ ද, එබඳු බස් බණනු වෙයි. පලප් හැරපියා පලප්බසින් වැළැකියේ වෙයි. කාලවාදී ව භූතවාදී ව අර්ථවාදී ව ධර්මවාදී ව විනයවාදී ව සූත්‍රාපදෙස සහිත පර්යන්ත ඇති අර්ථ සංහිත ළෙහි නිදහනට යන බස් කියනු වෙයි. වහන්ස, මෙබඳු වාක්සමාචාර සෙවුනහුට අකුශල ධර්මයෝ පිරිහෙති කුශලධර්මයෝ වැඩෙති.

වචීසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං වචීසමාචාර''න්ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

මනොසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තං ච අඤ්ඤමඤ්ඤං මනොසමාචාරන්ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො මනොසමාචාරො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො මනොසමාචාරො සෙවිතබ්බො.

කථං රූපං භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ භන්තෙ එකච්චො අභිජ්ඣාලු හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං, තං අභිජ්ඣාතා[1] හොති: 'අහො වත යං පරස්ස, තං මම අස්සා''ති. ව්‍යාපන්නචිත්තො ඛො පන හොති පදුට්ඨමනසංකප්පො: 'ඉමෙ සත්තා හඤ්ඤන්තු වා වජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා, විනස්සන්තු වා, මා වා අහෙසුන්ති[2]. එවරූපං භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති.

කථං රූපං භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති : ඉධ භන්තෙ, එකච්චො අනභිජ්ඣාලු හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං, තං නාභිජ්ඣාතා හොති : අහො වත යං පරස්ස, තං මම අස්සා'ති. අව්‍යාපන්නචිත්තො ඛො පන හොති. අප්පදුට්ඨමනසංකප්පො 'ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ඣා අනීඝා සුඛිනො අත්තානං[3] පරිහරන්තූ'ති. එවරූපං භන්තෙ, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

''මනොසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං මනොසමාචාර''න්ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

චිත්තුප්පාදම්පහං[4] භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං චිත්තුප්පාද''න්ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො චිත්තුප්පාදො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො චිත්තුප්පාදො සෙවිතබ්බො.

---

1. අභිජ්ඣිතා - PTS.
2. මා අහෙසුං වාති - ස්‍යා.
3. සුඛී අත්තානං - මජසං.
4. චිත්තුප්පාදම්පාහං - සීමු, මජසං.

" මහණෙනි, මම වාක්සමාචාර ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන වාක්සමාචාර වෙති " යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තර පිණිස වදරන ලදි.

" මහණෙනි, මම මනඃසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන මනඃසමාචාර වෙති " යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල කුමක් පිණිස වදරන ලද්දේ යැ යත් : වහන්ස, යම්බඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු මනස්සමාචාරය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු මනස්සමාචාරය සෙවිය යුතු ය.

වහන්ස, කෙබඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අභිධ්‍යා බහුල වෙයි, මෙරමාගේ යම් පරගත තුෂ්ටිජනක උපකරණ ඇද්ද, ' පරා අයත් යමෙක් වේ ද, ඒ මා සතු වේ නම් මැනැවැ ' යි මෙසේ එය අභිධ්‍යායෙන් බලනු වෙයි. ව්‍යාපන්න සිත් ඇතියේ ' මේ සත්ත්වයෝ නැසෙත්වා, වධයට වැටෙත්වා, සිඳෙත්වා, වැනැසෙත්වා, නො වෙත්වා ' යි මෙසේ ද්වේෂයෙන් දුෂ්ට මනස්සංකල්ප ඇතියේ වෙයි. වහන්ස, මෙබඳු මනස්සමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙති.

වහන්ස, කෙබඳු මනස්සමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අභිධ්‍යා බහුල නො වෙයි, මෙරමා අයත් යම් පරායත්ත තුෂ්ටිජනක උපකරණ ඇද්ද, ' පරා අයත් යමක් ඇද්ද, ඒ මා සතු වේව ' යි මෙසේ එය අභිධ්‍යායෙන් නො බලනු වෙයි. අව්‍යාපන්න සිත් ඇතියේ ' මේ සත්ත්වයෝ අවෛර වූවාහු නිදුක් වූවාහු ව්‍යසන නැත්තාහු සුඛිත වූවාහු තමන් පරිහරණ කෙරෙත්ව ' යි මෙසේ අප්‍රදුෂ්ට මනස්සංකල්ප ඇත්තේ වෙයි. වහන්ස, මෙබඳු මනස්සමාචාර සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති.

" මහණෙනි, මම මනස්සමාචාර ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන මනස්සමාචාර වෙති ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය පිණිස වදරන ලදි.

මහණෙනි, මම චිත්තොත්පාදය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන චිත්තොත්පාද වෙති ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ තෙල බසෙක් වදරන ලද ද, තෙල බස කුමක් පිණිස වදරන ලද්දේ යැ යත් : වහන්ස, යම්බඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු චිත්තෝත්පාදය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු චිත්තෝත්පාදය සෙවිය යුතු ය.

කථංරූපං භන්තෙ, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ භන්තෙ, එකච්චො අභිජ්ඣාලු හොති, අභිජ්ඣාසහගතෙන චෙතසා විහරති. ව්‍යාපාදවා හොති, ව්‍යාපාදසහගතෙන චෙතසා විහරති. විහෙසවා හොති. විහෙසාසහගතෙන චෙතසා විහරති. එවරූපං භන්තෙ, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති.

කථංරූපං භන්තෙ, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ භන්තෙ එකච්චො අනභිජ්ඣාලු හොති, අනභිජ්ඣාසහගතෙන චෙතසා විහරති. අව්‍යාපාදවා හොති, අව්‍යාපාදසහගතෙන චෙතසා විහරති. අවිහෙසවා හොති, අවිහෙසාසහගතෙන චෙතසා විහරති. එවරූපං භන්තෙ චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

"චිත්තුප්පාදම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තඤ්ච අඤ්ඤමඤ්ඤං චිත්තුප්පාද"න්ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

"සඤ්ඤාපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තඤ්ච අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපටිලාභන්ති" ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො සඤ්ඤාපටිලාභො න සෙවිතබ්බො, යථාරූපං ච ඛො භන්තෙ සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො සඤ්ඤාපටිලාභො සෙවිතබ්බො.

කථංරූපං භන්තෙ, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ භන්තෙ, එකච්චො අභිජ්ඣාලු හොති. අභිජ්ඣාසහගතාය සඤ්ඤාය විහරති. ව්‍යාපාදවා හොති. ව්‍යාපාද සහගතාය සඤ්ඤාය විහරති. විහෙසවා හොති. විහෙසාසහගතාය සඤ්ඤාය විහරති. එවරූපං භන්තෙ, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, කථංරූපං භන්තෙ සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ භන්තෙ, එකච්චො අනභිජ්ඣාලු හොති, අනභිජ්ඣාසහගතාය සඤ්ඤාය විහරති. අව්‍යාපාදවා හොති, අව්‍යාපාදසහගතාය සඤ්ඤාය විහරති. අවිහෙසවා හොති, අවිහෙසාසහගතාය සඤ්ඤාය විහරති. එවරූපං භන්තෙ සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

"සඤ්ඤාපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තං ච අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපටිලාභන්ති" ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

"දිට්ඨිපටිලාභම්පහං[1] භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තං ච අඤ්ඤමඤ්ඤං දිට්ඨිපටිලාභන්ති" ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං, යථාරූපං භන්තෙ දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො දිට්ඨිපටිලාභො න සෙවිතබ්බො, යථාරූපඤ්ච ඛො භන්තෙ, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති එවරූපො දිට්ඨිපටිලාභො සෙවිතබ්බො.

1. දිට්ඨිපටිලාභම්පාහං - සීමු, මජසං.

වහන්ස, කෙබඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අභිධ්‍යා බහුල වෙයි. අභිධ්‍යා සහගත සිතින් වාස කෙරෙයි. ව්‍යාපාද ඇතියේ වෙයි. ව්‍යාපාදසහගත සිතින් වාස කෙරෙයි. විහිංසා ඇතියේ වෙයි. විහිංසාසහගත සිතින් වාස කෙරෙයි. වහන්ස, මෙබඳු චිත්තෝත්පාදය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්.

වහන්ස, කෙබඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අභිධ්‍යා බහුල නො වෙයි. අනභිධ්‍යාසහගත සිතින් වාස කෙරෙයි. අව්‍යාපාද ඇතියේ වෙයි, අව්‍යාපාද සහගත සිතින් වාස කෙරෙයි. අවිහිංසා ඇතියේ වෙයි, අවිහිංසාසහගත සිතින් වාස කෙරෙයි. වහන්ස, මෙබඳු චිත්තෝත්පාද සෙවුනාහුට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

" මහණෙනි, මම චිත්තෝත්පාදයත් දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දූ ' යි. එ ද වෙන වෙන චිත්තෝත්පාද වෙති " යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙ බස තෙල විස්තරය පිණිස වදරන ලදි.

" මහණෙනි, මම සංඥප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දූ ' යි. හෙ ද වෙන වෙන සංඥප්‍රතිලාභ යැ ' යි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල කුමක් පිණිස වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු වූ සංඥප්‍රතිලාභය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු සංඥප්‍රති ලාභය සෙවිය යුතු ය.

වහන්ස, කෙබඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අභිධ්‍යාලු වෙයි, අභිධ්‍යාසහගත සංඥයෙන් වෙසෙයි. ව්‍යාපාද ඇතියේ වෙයි, ව්‍යාපාදසහගත සංඥයෙන් වෙසෙයි. විහිංසා ඇතියේ වෙයි, විහිංසාසහගත සංඥයෙන් වෙසෙයි. වහන්ස, මෙබඳු සංඥප්‍රති ලාභය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්. වහන්ස, කෙබඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් අනභිධ්‍යාලු වෙයි, අනභිධ්‍යාසහගත සංඥයෙන් වෙසෙයි. අව්‍යාපාද ඇතියේ වෙයි, අව්‍යාපාදසහගත සංඥයෙන් වෙසෙයි. අවිහිංසා ඇතියේ වෙයි, අවිහිංසාසහගත සංඥයෙන් වෙසෙයි. වහන්ස, මෙබඳු සංඥ ප්‍රතිලාභය සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

" මහණෙනි, මම සංඥප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දූ ' යි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය පිණිස වදරන ලදි.

" මහණෙනි, මම දෘෂ්ටිප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දූ ' යි. එ ද වෙන වෙන දෘෂ්ටිප්‍රතිලාභ වෙති " යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල බස් කුමක් පිණිස වදරන ලද්දේ ය යත් : වහන්ස, යම්බදු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු දෘෂ්ටිප්‍රතිලාභය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු දෘෂ්ටිප්‍රතිලාභ යක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු දෘෂ්ටි ප්‍රතිලාභය සෙවිය යුතු ය.

කථංරූපං භන්තෙ, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ භන්තෙ, එකච්චො එවංදිට්ඨිකො හොති: 'නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරෙ ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවරූපං භන්තෙ දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං භන්තෙ, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති? ඉධ භන්තෙ, එකච්චො එවංදිට්ඨිකො හොති: 'අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරෙ ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති. එවරූපං භන්තෙ, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

“දිට්ඨිපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං දිට්ඨිපටිලාභ”න්ති. ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

“අත්තභාවපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තඤ්ච අඤ්ඤමඤ්ඤං අත්තභාවපටිලාභ”න්ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, අත්තභාවපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති එවරූපො අත්තභාවපටිලාභො න සෙවිතබ්බො. යථාරූපං ච ඛො භන්තෙ, අත්තභාවපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො අත්තභාවපටිලාභො සෙවිතබ්බො.

කථංරූපං භන්තෙ, අත්තභාවපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: සබ්‍යාපජ්ඣං භන්තෙ, අත්තභාවපටිලාභං අභිනිබ්බත්තයතො අපරිනිට්ඨිතභාවාය අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං භන්තෙ, අත්තභාවපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. අබ්‍යාපජ්ඣං භන්තෙ, අත්තභාවපටිලාභං අභිනිබ්බත්තයතො පරිනිට්ඨිතභාවාය අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

“අත්තභාවපටිලාභම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං අත්තභාවපටිලාභ'න්ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි.

වහන්ස, කෙබඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් එවංදෘෂ්ටික වෙයි : දුන් දයැ විපාක නැත. යාග විපාක නැත. ප්‍රාහූණසත්කාර විපාක නැත. සුකෘතදුෂ්කෘත කර්ම ඵල විපාක නැත. (පරලොවැ සිටුනාහට) මෙලොව නැත. (මෙලොවැ සිටුනා හට) පරලොව නැත. මවු නැත, පියා නැත, ච්‍යුත වැ උපදනා සත්ත්වයෝ නැත. යම් මහණ බමුණු කෙනෙක් මෙලොව හා පරලොව හා තුමූ විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්ෂ කොට පවසත් ද, එබඳු වූ සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණු කෙනෙක් නැති ' යි කියා යි. වහන්ස, මෙබඳු දෘෂ්ටිප්‍රතිලාභය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්. වහන්ස, කෙබඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, මෙලොවැ එකෙක් එවංදෘෂ්ටික වෙයි : දන විපාක ඇත, යාගවිපාක ඇත, ප්‍රාහූණසත්කාරවිපාක ඇත, සුකෘතදුෂ්කෘතකර්ම ඵල විපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත, මවු ඇත, පියා ඇත, ච්‍යුත වැ උපදනා සත්ත්ව යෝ ඇත, යම් මහණ බමුණු කෙනෙක් මෙලොව හා පරලොව හා තුමූ විශිෂ්ටප්‍රඥයෙන් ප්‍රත්‍යක්ෂ කොට පවසත් ද, සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න එබඳු මහණබමුණෝ ඇතැ ' යි කියා යි. වහන්ස, මෙබඳු දෘෂ්ටිප්‍රතිලාභ සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති කුශල ධර්මයෝ වැඩෙත්.

' මහණෙනි, මම දෘෂ්ටිප්‍රතිලාභය දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන දෘෂ්ටිප්‍රතිලාභ වෙති '' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය පිණිස වදරන ලදි.

'' මහණෙනි, මම ආත්මභාවප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. හෙ ද වෙන වෙන ආත්මභාවප්‍රතිලාභ වෙති '' යි. මෙසේ භාග්‍ය වතුන් වහන්සේ විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල බස් කුමක් පිණිස වදරන ලද්දේ යැ යත් : වහන්ස, යම්බඳු ආත්මභාවප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු ආත්මභාවප්‍රතිලාභය නො සෙවිය යුතු ය. වහන්ස, යම්බඳු ආත්මභාවප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු ආත්මභාවප්‍රතිලාභය සෙවිය යුතු ය.

වහන්ස, කෙබඳු ආත්මභාවප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, යත් : වහන්ස, සදුඃඛආත්මභාවප්‍රතිලාභය නිපදවනුවහට භවයන්ගේ අපරිනිෂ්ඨිතභාවය පිණිස අකුශලධර්මයෝ වැඩෙත් කුශලධර්මයෝ පිරිහෙත්. වහන්ස, කෙබඳු ආත්මභාවප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද කුශලධර්මයෝ වැඩෙත් ද යත් : වහන්ස, අදුඃඛආත්මභාවප්‍රතිලාභය නිපයනුවහට භවයන්ගේ පරිනිෂ්ඨිතභාවය පිණිස අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

''මහණෙනි, මම ආත්මභාවප්‍රතිලාභය ද දෙපරිද්දෙකින් කියමි: සෙවිතව්‍ය ද අසෙවි තව්‍ය ද ' යි. එ ද වෙන වෙන ආත්මභාවප්‍රතිලාභ වෙති '' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය පිණිස වදරන ලදි.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද විස්තර විසින් අර්ථ විභාග නො කළ මේ භාෂිතයා ගේ අර්ථ මෙසේ විස්තර විසින් අවබොධ කොට ගනිමි.

ශාරීපුත්‍රය, මැනැව, මැනැව. ශාරීපුත්‍රය, තෙපි මා විසින් සැකෙවින් වදළ විස්තර විසින් අර්ථවිභාග නො කළ මේ භාෂිතයා ගේ අර්ථ මනාකොට අවබොධ කරන්නාව.

13—ඒ 00502 (8/78)

“කායසමාචාරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං කායසමාචාර’න්ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං සාරිපුත්ත, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො කායසමාචාරො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො කායසමාචාරො සෙවිතබ්බො.

කථංරූපං සාරිපුත්ත, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො පාණාතිපාතී හොති -පෙ- එවරූපං සාරිපුත්ත, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. කථං රූපං සාරිපුත්ත, කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. ඉධ සාරිපුත්ත, එකච්චො පාණාතිපාතං පහාය -පෙ- එවරූපං සාරිපුත්ත කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. “කායසමාචාරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තං ච අඤ්ඤමඤ්ඤං කායසමාචාරන්ති ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

“වචීසමාචාරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තං ච අඤ්ඤමඤ්ඤං වචීසමාචාර’න්ති ඉති ඛො පනෙතං වුත්තං මයා. කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො වචීසමාචාරො න සෙවිතබ්බො, යථාරූපං ච ඛො සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො වචීසමාචාරො සෙවිතබ්බො.

කථංරූපං සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. ඉධ සාරිපුත්ත, එකච්චො මුසාවාදී හොති -පෙ- එවරූපං සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. ඉධ සාරිපුත්ත, එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති -පෙ- එවරූපං සාරිපුත්ත, වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

“වචීසමාචාරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං වචීසමාචාර’න්ති ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

“මනොසමාචාරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තං ච අඤ්ඤමඤ්ඤං මනොසමාචාර’න්ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො මනොසමාචාරො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො මනොසමාචාරො සෙවිතබ්බො.

මහණෙනි, මම කායසමාචාරය ද දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන කායසමාචාර වෙති ' යි මෙසේ මා විසින් තෙල බසෙක් කියන ලද ද, තෙල බස් කුමක් පිණිස කියන ලද යැ යත් : ශාරීපුත්‍රය, යම්බඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු කාය සමාචාර නො සෙවිය යුතු ය. ශාරීපුත්‍රය, යම්බඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු කායසමාචාරය සෙවිය යුතු ය.

ශාරීපුත්‍රය, කෙබඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරීපුත්‍රය, මෙලොවැ එකෙක් පණිවා කරනු වෙයි. . . . ශාරීපුත්‍රය, මෙබඳු කායසමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්. ශාරීපුත්‍රය, කෙබඳු කායසමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : ශාරීපුත්‍රය, මෙලොවැ එකෙක් පණිවා හැරපියා . . . ශාරීපුත්‍රය, මෙබඳු කායසමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්. '' ශාරීපුත්‍රය, මම කායසමාචාර ද, දෙපරිද්දෙකින් කියමි : සෙවිතව්‍ය ද, අසෙවිතව්‍ය ද ' යි. එ ද වෙන වෙන කායසමාචාර වෙති '' යි මෙසේ මා විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය පිණිස වදරන ලදි.

'' ශාරීපුත්‍රය, මම වාක්සමාචාරය ද, සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙ පරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන වාක්සමාචාර වෙති '' යි මෙසේ මා විසින් තෙල බසෙක් වදරන ලද ද, තෙල කුමක් සඳහා කියන ලද ද යත් : ශාරීපුත්‍රය, යම්බඳු වාක්සමාචාරයක් සෙවුනා හට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු වාක්සමාචාරය නො සෙවිය යුතු ය. තවද ශාරීපුත්‍රය, යම්බඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු වාක්සමාචාරය සෙවිය යුතු ය.

ශාරීපුත්‍රය, කෙබඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරීපුත්‍රය, මෙලොවැ එකෙක් මුසවා ඇත්තේ වෙයි. . . . ශාරීපුත්‍රය, මෙබඳු වාක්සමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති. කුශලධර්ම යෝ පිරිහෙත්. ශාරීපුත්‍රය, කෙබඳු වාක්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : ශාරීපුත්‍රය, මෙලොවැ එකෙක් මුසවා හැර පියා මුසවායෙන් වැළැකුණේ වෙයි. . . . ශාරීපුත්‍රය, මෙබඳු වාක්සමාචාර සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

'' ශාරීපුත්‍රය, මම වාක්සමාචාරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන වාක්සමාචාර යැ '' යි මෙසේ මා විසින් යමක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා පවසන ලද්දේ ය.

'' ශාරීපුත්‍රය, මම මනස්සමාචාරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන මනස්සමාචාර යැ '' යි මෙසේ මා විසින් තෙල (සැකෙවින්) කියන ලද. තෙල බස් කුමක් සඳහා කියන ලද ද යත් : ශාරීපුත්‍රය, යම්බඳු මනස්සමා චාරයක් සෙවුනා හට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු මනස්සමාචාරය නො සෙවිය යුතු ය. තව ද ශාරීපුත්‍රය, යම්බඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙබඳු මනස්සමා චාරය සෙවිය යුතු ය.

කථංරූපං සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො අභිජ්ඣාලු හොති -පෙ- එවරූපං සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති.

කථංරූපං සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. ඉධ සාරිපුත්ත, එකච්චො අනභිජ්ඣාලු හොති -පෙ- එවරූපං සාරිපුත්ත, මනොසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

“මනොසමාචාරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං මනොසමාචාර”න්ති ඉති යං තං වුත්තං මයා ඉදමෙතං පටිච්ච වුත්තං.

“චිත්තුප්පාදම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං චිත්තුප්පාදන්ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං සාරිපුත්ත චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො චිත්තුප්පාදො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො චිත්තුප්පාදො සෙවිතබ්බො.

කථංරූපං සාරිපුත්ත, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො අභිජ්ඣාලු හොති, අභිජ්ඣාසහගතෙන චෙතසා විහරති. ව්‍යාපාදවා හොති, ව්‍යාපාදසහගතෙන චෙතසා විහරති. විහෙසවා හොති, විහෙසා සහගතෙන චෙතසා විහරති. එවරූපං සාරිපුත්ත, චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං සාරිපුත්ත චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො අනභිජ්ඣාලු හොති, අනභිජ්ඣා-සහගතෙන චෙතසා විහරති. අව්‍යාපාදවා හොති, අව්‍යාපාදසහගතෙන චෙතසා විහරති. අවිහෙසවා හොති, අවිහෙසාසහගතෙන චෙතසා විහරති. එවරූපං සාරිපුත්ත චිත්තුප්පාදං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

“චිත්තුප්පාදම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තං ච අඤ්ඤමඤ්ඤං චිත්තුප්පාද”න්ති ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

“සඤ්ඤාපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං සඤ්ඤා පටිලාභන්ති” ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො සඤ්ඤාපටිලාභො න සෙවිතබ්බො. යථාරූපං ච ඛො සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො සඤ්ඤාපටිලාභො සෙවිතබ්බො.

ශාරිපුත්‍රය, කෙබඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ එකෙක් අභිධ්‍යාලු වෙයි. . . . ශාරිපුත්‍රය, මෙබඳු මනස්සමාචාරය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති. කුශල ධර්මයෝ පිරිහෙත්.

ශාරිපුත්‍රය, කෙබඳු මනස්සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ කිසිවෙක් අනභිධ්‍යාලු වෙයි. . . . ශාරිපුත්‍රය, මෙබඳු මනස්සමාචාරය සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති. කුශල ධර්මයෝ වැඩෙත්.

" ශාරිපුත්‍රය, මම මනස්සමාචාරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන මනස්සමාචාර වෙති " යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා කියන ලද.

" ශාරිපුත්‍රය, මම චිත්තෝත්පාදයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන චිත්තෝත්පාද යැ " යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද තෙල කුමක් සඳහා කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු චිත්තෝත්පාදය නො සෙවිය යුතු ය. තවද ශාරිපුත්‍රය, යම්බඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු චිත්තෝත්පාදය සෙවිය යුතු.

ශාරිපුත්‍රය, කෙබඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ එකෙක් අභිධ්‍යාලු වෙයි, අභිධ්‍යා සහගත සිතින් වෙසෙයි. ව්‍යාපාද ඇතියේ වෙයි, ව්‍යාපාද සහගත සිතින් වෙසෙයි. විහිංසා ඇතියේ වෙයි, විහිංසාසහගත සිතින් වෙසෙයි. ශාරිපුත්‍රය මෙබඳු චිත්තෝත්පාදය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති. කුශලධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳු චිත්තෝත්පාදයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ කිසිවෙක් අනභිධ්‍යාලු වෙයි, අනභිධ්‍යාසහගත සිතින් යුක්ත ව වෙසෙයි. අව්‍යාපාද ඇතියේ වෙයි, අව්‍යාපාදසහගත සිතින් වෙසෙයි. අවිහිංසා ඇතියේ වෙයි, අවිහිංසාසහගත සිතින් වෙසෙයි. ශාරිපුත්‍රය, මෙබඳු චිත්තෝත්පාදය සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

" ශාරිපුත්‍රය, මම චිත්තෝත්පාදයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන චිත්තෝත්පාද යැ " යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා කියන ලදි.

" ශාරිපුත්‍රය, මම සංඥප්‍රතිලාභයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන සංඥප්‍රතිලාභ වෙති " යි මෙසේ මා විසින් තෙල කරුණ කියන ලද, කුමක් සඳහා තෙල බස් කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු සංඥප්‍රතිලාභය නො සෙවිය යුතු ය. තවද ශාරිපුත්‍රය, යම්බඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු සංඥප්‍රතිලාභය සෙවිය යුතු.

කථංරූපං සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො අභිජ්ඣාලු හොති, අභිජ්ඣාසහගතාය සඤ්ඤාය විහරති. ව්‍යාපාදවා හොති, ව්‍යාපාදසහගතාය සඤ්ඤාය විහරති. විහෙසවා හොති විහෙසා සහගතාය සඤ්ඤාය විහරති. එවරූපං සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො අනභිජ්ඣාලු හොති, අනභිජ්ඣා සහගතාය සඤ්ඤාය විහරති. අව්‍යාපාදවා හොති, අව්‍යාපාදසහගතාය සඤ්ඤාය විහරති. අවිහෙසවා හොති, අවිහෙසා-සහගතාය සඤ්ඤාය විහරති. එවරූපං සාරිපුත්ත, සඤ්ඤාපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

''සඤ්ඤාපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තඤ්ච අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපටිලාභන්ති'' ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

'දිට්ඨිපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං දිට්ඨිපටිලාභන්ති' ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං? යථාරූපං සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො දිට්ඨිපටිලාභො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො දිට්ඨිපටිලාභො සෙවිතබ්බො.

කථංරූපං සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො එවංදිට්ඨිකො හොති: නත්ථි දින්නං -පෙ- පවෙදෙන්තීති. එවරූපං, සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. කථංරූපං සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති: ඉධ සාරිපුත්ත, එකච්චො එවංදිට්ඨිකො හොති: අත්ථි දින්නං,-පෙ-පවෙදෙන්තීති. එවරූපං සාරිපුත්ත, දිට්ඨිපටිලාභං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.

''දිට්ඨිපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. තඤ්ච අඤ්ඤමඤ්ඤං දිට්ඨිපටිලාභන්ති'' ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

අත්තභාවපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන -පෙ- වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං සාරිපුත්ත, -පෙ- න සෙවිතබ්බො, යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, අත්තභාවපටිලාභං -පෙ- අභිවඩ්ඪන්ති. එවරූපො අත්තභාවපටිලාභො සෙවිතබ්බො.

ශාරිපුත්‍රය, කෙබඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ එකෙක් අභිධ්‍යාලු වෙයි, අභිධ්‍යා සහගත සංඥයෙන් යුක්ත ව වෙසෙයි. ව්‍යාපාද ඇත්තේ වෙයි, ව්‍යාපාදසහගත සංඥයෙන් වෙසෙයි. විහිංසා ඇතියේ වෙයි, විහිංසාසහගත සංඥයෙන් වෙසෙයි. ශාරිපුත්‍රය, මෙබඳු සංඥප්‍රතිලාභය සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳු සංඥප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ කිසිවෙක් අනභිධ්‍යාලු වෙයි, අනභිධ්‍යා සහගත සංඥයෙන් යුක්ත ව වෙසෙයි. අව්‍යාපාද ඇතියේ වෙයි, අව්‍යාපාදසහගත සංඥ යෙන් වෙසෙයි. අවිහිංසා ඇතියේ වෙයි, අවිහිංසාසහගත සිතින් වෙසෙයි. ශාරිපුත්‍රය, මෙබඳු සංඥප්‍රතිලාභ සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

'' ශාරිපුත්‍රය, මම සංඥප්‍රතිලාභයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන සංඥප්‍රතිලාභ වෙති '' යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා කියන ලදි.

'' ශාරිපුත්‍රය, මම දෘෂ්ටිප්‍රතිලාභයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන දෘෂ්ටිප්‍රතිලාභ වෙති '' යි මෙසේ මා විසින් තෙල කරුණ කියන ලද. කුමක් සඳහා තෙල කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනා හට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු දෘෂ්ටිප්‍රතිලාභය නො සෙවිය යුතු ය. තවද ශාරිපුත්‍රය, යම්බඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු දෘෂ්ටිප්‍රතිලාභය සෙවිය යුතු.

ශාරිපුත්‍රය, කෙබඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ එකෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි : දුන් දැය ඵල විපාක නැත, . . . යම්, කෙනෙක් මෙ ලොවත් පරලොවත් මොනොවට දැන ප්‍රත්‍යක්ෂ කොට දැනගනිත් ද, එබඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණු කෙනෙක් ලොවැ නැතැ ' යි. ශාරිපුත්‍රය, මෙබඳු දෘෂ්ටිප්‍රතිලාභය සෙවුනාහට අකුශල ධර්මයෝ වැඩෙති, කුශලධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳු දෘෂ්ටිප්‍රතිලාභයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද යත් : ශාරිපුත්‍රය, මෙලොවැ කිසිවෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි : දුන් දැය ඵල විපාක ඇත, . . . යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ මොනොවට දැන ප්‍රත්‍යක්ෂ කොට දැනැගනිත් ද, එබඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණබමුණෝ ලොවැ ඇතැ ' යි. ශාරිපුත්‍රය, මෙබඳු දෘෂ්ටිප්‍රතිලාභ සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙත්.

'' ශාරිපුත්‍රය, මම දෘෂ්ටිප්‍රතිලාභයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන දෘෂ්ටිප්‍රතිලාභ වෙති '' යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා කියන ලදි.

ශාරිපුත්‍රය, මම ආත්මභාවප්‍රතිලාභයත් දෙපරිද්දෙකින් . . . මා විසින් යම් බසෙක් කියන ලද ද, කුමක් සඳහා තෙල බස් කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු . . . නො සෙවිය යුතු. තවද ශාරිපුත්‍රය, යම්බඳු ආත්මභාවප්‍රතිලාභයක් . . . කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු ආත්මභාවප්‍රතිලාභය සෙවිය යුතු.

කථංරූපං සාරිපුත්ත, -පෙ- පරිහායන්ති: සබ්‍යාපජ්ඣං සාරිපුත්ත, -පෙ- පරිහායන්ති. කථංරූපං සාරිපුත්ත, -පෙ- අභිවඩ්ඪන්ති? අබ්‍යාපජ්ඣං සාරිපුත්ත, -පෙ- අභිවඩ්ඪන්ති. "අත්තභාවපටිලාභම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, තඤ්ච අඤ්ඤමඤ්ඤං අත්තභාවපටිලාභන්ති" ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමස්ස ඛො, සාරිපුත්ත, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො.

චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. සොතවිඤ්ඤෙය්‍යං සද්දම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි ඝානවිඤ්ඤෙය්‍යං ගන්ධම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ජිව්හාවිඤ්ඤෙය්‍යං රසම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. මනොවිඤ්ඤෙය්‍යං ධම්මම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ඉමස්ස ඛො අහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

'චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති' ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං න සෙවිතබ්බං. යථාරූපඤ්ච ඛො භන්තෙ, චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවිතබ්බං. චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති' ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

'සොතවිඤ්ඤෙය්‍යං සද්දම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, සොතවිඤ්ඤෙය්‍යං සද්දං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො සොතවිඤ්ඤෙය්‍යො සද්දො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, සොතවිඤ්ඤෙය්‍යං සද්දං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො සොතවිඤ්ඤෙය්‍යො සද්දො සෙවිතබ්බො. 'සොතවිඤ්ඤෙය්‍යං සද්දම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ශාරිපුත්‍රය, කෙබඳු . . . කුශලධර්මයෝ පිරිහෙත් ද, ශාරිපුත්‍රය, දුක් සහිත වූ . . කුශලධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳු . . . කුශලධර්මයෝ වැඩෙත් ද යත් : ශාරිපුත්‍රය, නිදුක් වූ . . . කුශලධර්මයෝ වැඩෙත්. ශාරිපුත්‍රය මම ආත්මභාවප්‍රතිලාභයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. එ ද වෙන වෙන ආත්මභාවප්‍රතිලාභ වෙති '' යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය මෙසේ විස්තරය සඳහා කියන ලදී.

ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් කියන ලද මේ භාෂිතයා ගේ මෙසේ විස්තර හෙයින් අර්ථ දත යුත්තේ යි.

ශාරිපුත්‍රය, මම චක්ෂුර්විඥානයෙන් දතයුතු රූපයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ඝ්‍රාණවිඥෙය ගන්ධයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ජිහ්වාවිඥෙය රසයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම මනොවිඥෙය ධර්මයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ : ' වහන්ස, මේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද, විස්තර යෙන් අර්ථ විභාග නො කළ මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දනිමි :

'ශාරිපුත්‍රය, මම චක්ෂුර්විඥෙය රූපයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදරන ලද. කුමක් සඳහා මෙසේ බස් වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු චක්ෂුර්විඥෙය රූපයක් සෙවුනාහට අකුශල ධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු චක්ෂුර්විඥෙය රූපය නො සෙවිය යුතු ය. තවද වහන්ස, යම්බඳු චක්ෂුර්විඥෙය රූපයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු චක්ෂුර්විඥෙය රූපය සෙවිය යුතු ය. '' ශාරිපුත්‍රය, මම චක්ෂුර්විඥෙය රූපයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි '' යි මෙසේ භාග්‍යවතුන්වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය මෙසේ විස්තර සඳහා වදරන ලදී.

'ශාරිපුත්‍රය, මම ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ බස් වදරන ලද. කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දය නො සෙවිය යුතු ය. යළි වහන්ස, යම්බඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දය සෙවිය යුතු. ' ශාරිපුත්‍රය, මම ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය මෙසේ විස්තරය සඳහා වදරන ලදී.

'ඝානවිඤ්ඤෙය්‍යං ගන්ධම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙව තං පටිච්ච වුත්තං? යථාරූපං භන්තෙ, ඝානවිඤ්ඤෙය්‍යං ගන්ධං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො ඝානවිඤ්ඤෙය්‍යො ගන්ධො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, ඝානවිඤ්ඤෙය්‍යං ගන්ධං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො ඝානවිඤ්ඤෙය්‍යො ගන්ධො සෙවිතබ්බො 'ඝානවිඤ්ඤෙය්‍යං ගන්ධම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ජිව්හාවිඤ්ඤෙය්‍යං රසම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං භන්තෙ, ජිව්හාවිඤ්ඤෙය්‍යං රසං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො ජිව්හාවිඤ්ඤෙය්‍යො රසො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, ජිව්හාවිඤ්ඤෙය්‍යං රසං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො ජිව්හාවිඤ්ඤෙය්‍යො රසො සෙවිතබ්බො ජිව්හාවිඤ්ඤෙය්‍යං රසම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

'කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති' ඉති ඛො පනෙතං වුත්තං භගවතා කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො කායවිඤ්ඤෙය්‍යො ඵොට්ඨබ්බො න සෙවිතබ්බො යථාරූපඤ්ච ඛො භන්තෙ, කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො කායවිඤ්ඤෙය්‍යො ඵොට්ඨබ්බො සෙවිතබ්බො. 'කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

'මනොවිඤ්ඤෙය්‍යං ධම්මම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං භන්තෙ, මනොවිඤ්ඤෙය්‍යං ධම්මං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො මනොවිඤ්ඤෙය්‍යො ධම්මො න සෙවිතබ්බො. යථාරූපඤ්ච ඛො භන්තෙ, මනොවිඤ්ඤෙය්‍යං ධම්මං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපො මනොවිඤ්ඤෙය්‍යො ධම්මො සෙවිතබ්බො. මනොවිඤ්ඤෙය්‍යං ධම්මම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි.

'ශාරිපුත්‍රය, මම ඝ්‍රාණවිඥෙය ගන්ධයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල වදරන ලද. තෙල බස් කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු ඝ්‍රාණවිඥෙය ගන්ධයක් සෙවුනාහට අකුශල ධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද එබඳු ඝ්‍රාණවිඥෙය ගන්ධය නො සෙවිය යුතු ය. වහන්ස, යළි යම්බඳු ඝ්‍රාණවිඥෙය ගන්ධයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු ඝ්‍රාණවිඥෙය ගන්ධය සෙවිය යුතු. ' ශාරිපුත්‍රය, මම ඝ්‍රාණවිඥෙය ගන්ධයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය සඳහා වදරන ලදි.

'ශාරිපුත්‍රය, මම ජිහ්වාවිඥෙය රසයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල වදරන ලද. තෙල බස් කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු ජිහ්වාවිඥෙය රසයක් සෙවුනාහට අකුශල ධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු ජිහ්වාවිඥෙය රසය නො සෙවිය යුතු ය. වහන්ස, යළි යම්බඳු ජිහ්වාවිඥෙය රසයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු ජිහ්වාවිඥෙය රසය සෙවිය යුතු. ශාරිපුත්‍රය, මම ජිහ්වාවිඥෙය රසයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය සඳහා වදරන ලදි.

' ශාරිපුත්‍රය, මම කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස් වදරන ලදි. තෙල කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යය නො සෙවිය යුතු ය. යළි වහන්ස, යම්බඳු කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයක්, සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යය සෙවියයුතු. ' ශාරිපුත්‍රය, මම කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය සඳහා වදරන ලදි.

' ශාරිපුත්‍රය, මම මනොවිඥෙය ධර්මයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස් වදරන ලද, තෙල කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු මනොවිඥෙය ධර්මයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු මනොවිඥෙය ධර්මය නො සෙවිය යුතු ය. යළි වහන්ස, යම්බඳු මනොවිඥෙය ධර්මයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු මනොවිඥෙය ධර්මය සෙවිය යුතු. 'ශාරිපුත්‍රය, මම මනොවිඥෙය ධර්මයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් බසෙක් වදරන ලද ද, මෙය තෙල විස්තරය සඳහා වදරන ලදි.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ ධර්මයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දනිමි ' යි.

සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං අජානාසි.

‘චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී’ති ඉති ඛො පනෙතං වුත්තං මයා. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපං සාරිපුත්ත -පෙ- න සෙවිතබ්බං. යථාරූපඤ්ච ඛො සාරිපුත්ත, -පෙ- අසෙවිතබ්බම්පී’ති ඉති යං තං වුත්තං මයා, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

‘සොතවිඤ්ඤෙය්‍යං සද්දම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී’ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං සාරිපුත්ත සොතවිඤ්ඤෙය්‍යං සද්දං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලා ධම්මා පරිහායන්ති. එවරූපො සොතවිඤ්ඤෙය්‍යො සද්දො න සෙවිතබ්බො -පෙ- එවරූපො සොතවිඤ්ඤෙය්‍යො සද්දො සෙවිතබ්බො -පෙ- එවරූපො ඝානවිඤ්ඤෙය්‍යො ගන්ධො න සෙවිතබ්බො -පෙ- එවරූපො ඝානවිඤ්ඤෙය්‍යො ගන්ධො සෙවිතබ්බො -පෙ- එවරූපො ජිව්හාවිඤ්ඤෙය්‍යො රසො න සෙවිතබ්බො -පෙ- එවරූපො ජිව්හාවිඤ්ඤෙය්‍යො රසො සෙවිතබ්බො. එවරූපො කායවිඤ්ඤෙය්‍යො ඵොට්ඨබ්බො න සෙවිතබ්බො -පෙ- එවරූපො කායවිඤ්ඤෙය්‍යො ඵොට්ඨබ්බො සෙවිතබ්බො -පෙ-.

මනොවිඤ්ඤෙය්‍යං ධම්මම්පහං සාරිපුත්ත -පෙ- එවරූපො මනොවිඤ්ඤෙය්‍යො ධම්මො න සෙවිතබ්බො -පෙ- එවරූපො මනොවිඤ්ඤෙය්‍යො ධම්මො සෙවිතබ්බො. ‘මනොවිඤ්ඤෙය්‍යං ධම්මම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී’ති ඉති යං තං වුත්තං මයා ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමස්ස ඛො සාරිපුත්ත, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො.

චීවරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. පිණ්ඩපාතම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. සෙනාසනම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ගාමම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. නිගමම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. නගරම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ජනපදම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. පුග්ගලම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ‘ඉමස්ස ඛො අහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි:

සාධු සාධු ශාරිපුත්‍රය, මැනැවැ ශාරිපුත්‍රය, තෙපි මා විසින් සැකෙවින් දෙසන ලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දන්නාව.

" ශාරිපුත්‍රය, මම චක්ෂුර්විඥෙය රූපයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ මා විසින් තෙල කියන ලද, තෙල බස් කුමක් සඳහා කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු . . . නො සෙවිය යුතු ය. යළි ශාරිපුත්‍රය, යම්බඳු . . . අසෙවිතව්‍ය ද ' යි මෙසේ මා විසින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල විස්තරය සඳහා කියන ලද ' යි.

' ශාරිපුත්‍රය, මම ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ මා විසින් තෙල පවසන ලද, තෙල කුමක් සඳහා පවසන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් කුශලධර්මයෝ පිරිහෙත් ද, එබඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දය නො සෙවිය යුතු. . . . එබඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දය සෙවිය යුතු . . . එබඳු ඝ්‍රාණවිඥෙය ගන්ධය නො සෙවිය යුතු ය . . . එබඳු ඝ්‍රාණවිඥෙය ගන්ධය සෙවිය යුතු, . . . එබඳු ජිහ්වාවිඥෙය රසය සෙවිය යුතු. . . . එබඳු කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යය නො සෙවිය යුතු ය. . . . එබඳු කාය විඥෙය ස්ප්‍රෂ්ටව්‍යය සෙවිය යුතු. . . .

ශාරිපුත්‍රය, මම මනො විඥෙය ධර්මයත් . . . එබඳු මනොවිඥෙය ධර්මය නො සෙවිය යුතු ය, . . . එබඳු මනොවිඥෙය ධර්මය සෙවිය යුතු. ශාරිපුත්‍රය මම මනොවිඥෙය ධර්මයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ මා විසින් යම් බසෙක් පවසන ලද ද, මෙය තෙල විස්තරය සඳහා පවසන ලදි.

ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් පවසන ලද විස්තරයෙන් අර්ථය විභාග නො කරන ලද මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දත යුත්තේ යි.

ශාරිපුත්‍රය, මම චීවරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ශයනාසනයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ග්‍රාමයත් සේවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම නියම්ගමත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම නගරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම ජනපද යත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි. ශාරිපුත්‍රය, මම පුද්ගල ද සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ : ' වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද, විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දනගනිමි :

චීවරම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා. කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං භන්තෙ, චීවරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති. එවරූපං චීවරං න සෙවිතබ්බං. යථාරූපඤ්ච ඛො භන්තෙ, චීවරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපං චීවරං සෙවිතබ්බං. චීවරම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති යං තං වුත්තං භගවතා ඉදමෙතං පටිච්ච වුත්තං.

පිණ්ඩපාතම්පා'හං සාරිපුත්ත දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. සෙනාසනම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. ගාමම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. නිගමම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. නගරම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. ජනපදම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. පුග්ගලම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමස්ස ඛො අහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි.

'චීවරම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං : යථාරූපං සාරිපුත්ත, චීවරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති -පෙ- පටිච්ච වුත්තං. පිණ්ඩපාතම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං මයා කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපඤ්ච සාරිපුත්ත, පිණ්ඩපාතං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං. සෙනාසනම්පහං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති -පෙ- එවරූපං සෙනාසනං න සෙවිතබ්බං -පෙ- එවරූපං සෙනාසනං සෙවිතබ්බං -පෙ- එවරූපො ගාමො න සෙවිතබ්බො -පෙ- එවරූපො ගාමො සෙවිතබ්බො -පෙ- එවරූපො නිගමො න සෙවිතබ්බො -පෙ- එවරූපො නිගමො සෙවිතබ්බො -පෙ- එවරූපං නගරං න සෙවිතබ්බං -පෙ- එවරූපං නගරං සෙවිතබ්බං -පෙ- එවරූපො ජනපදො න සෙවිතබ්බො -පෙ- එවරූපො ජනපදො සෙවිතබ්බො -පෙ- 'පුග්ගලම්පා'හං සාරිපුත්ත, දුවිධෙන වදාමි : සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී'ති ඉති ඛො පනෙතං වුත්තං මයා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. යථාරූපං සාරිපුත්ත, පුග්ගලං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං.

" ශාරිපුත්‍රය, මම චීවරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි " යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල වදරන ලද, තෙල භාෂිතය කුමක් සඳහා වදරන ලද ද යත් : වහන්ස, යම්බඳු චීවරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, එබඳු චීවරය නො සෙවිය යුතු ය. වහන්ස, යළි යම්බඳු චීවරයක් සෙවුනාහට අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, එබඳු චීවරය සෙවිය යුතු. ' ශාරිපුත්‍රය, මම චීවරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් භාෂිතයක් වදරන ලද ද, මෙය තෙල විස්තරය සඳහා වදරන ලදි.

ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය, මම ශයනාසනයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය, මම ග්‍රාමයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය, මම නිගමයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය· මම නගරයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය, මම ජනපදයත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි. ශාරිපුත්‍රය, මම පුද්ගලයාත් දෙපරිද්දෙකින් කියමි, . . . තෙල සඳහා වදරන ලදි.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද, විස්තරයෙන් අර්ථ විභාග නො කළ මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දැනගනිමි.

සාධු සාධු ශාරිපුත්‍රය, මැනැවැ ශාරිපුත්‍රය, තෙපි මා විසින් සැකෙවින් කියන ලද, විස්තර යෙන් අර්ථ විභාග නො කළ මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථය දන්නාව.

ශාරිපුත්‍රය, මම චීවරයත් සේවිතව්‍ය ද අසේවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි යි මෙසේ මා විසින් තෙල කියන ලද, තෙල බස් කුමක් සඳහා කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු චීවරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද . . . තෙල සඳහා කියන ලදි. ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයත් සේවිතව්‍ය ද අසේවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ මා විසින් තෙල බස් කියන ලද. තෙල කුමක් සඳහා කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු පිණ්ඩපාතයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද . . . තෙල සඳහා කියන ලදි. ශාරිපුත්‍රය, මම ශයනාසනයත් සේවිතව්‍ය ද අසේවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි ' යි . . . මෙබඳු ශයනාසනය නො සෙවිය යුතු ය . . . මෙබඳු ශයනාසනය සෙවිය යුතු, . . . මෙබඳු ග්‍රාමය නො සෙවිය යුතු ය . . . මෙබඳු ග්‍රාමය සෙවිය යුතු. . . . මෙබඳු නිගමය නො සෙවිය යුතු ය . . . මෙබඳු නිගමය සෙවිය යුතු, . . . මෙබඳු නගරය නො සෙවිය යුතු ය . . . මෙබඳු නගරය සෙවිය යුතු, . . . මෙබඳු ජනපදය නො සෙවිය යුතු ය . . . මෙබඳු ජනපදය සෙවිය යුතු. . . . ' ශාරිපුත්‍රය, මම පුද්ගලයාත් සේවිතව්‍ය ද අසේවිතව්‍ය දැ ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ තෙල බස් මා විසින් පවසන ලද, තෙල කුමක් සඳහා කියන ලද ද යත් : ශාරිපුත්‍රය, යම්බඳු පුද්ගලයකු සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද . . . තෙල සඳහා වදරන ලදි.

ඉමස්ස ඛො සාරිපුත්ත, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස[1] එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො.

සබ්බෙපි චෙ සාරිපුත්ත, ඛත්තියා ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යුං සබ්බෙසානම්ප’ස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙපි චෙ සාරිපුත්ත, බ්‍රාහ්මණා-පෙ-වෙස්සා-පෙ-සබ්බෙපි චෙ සාරිපුත්ත, සුද්දා ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යුං. සබ්බෙසානම්ප’ස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛාය සදෙවකො පි චෙ සාරිපුත්ත, ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා ඉමස්ස මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානෙය්‍ය. සදෙවකස්සපිස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දීඝරත්තං හිතාය සුඛායාති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා සාරිපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

සෙවිතබ්බාසෙවිතබ්බසුත්තං චතුත්ථං.

ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් දෙසන ලද විස්තරයෙන් අර්ථ විභාග නො කරන ලද මේ භාෂිතයා ගේ මෙසේ විස්තරයෙන් අර්ථ දතයුතු.

ශාරිපුත්‍රය, ඉදින් හැම ක්ෂත්‍රියයෝ මා විසින් සැකෙවින් දෙසන ලද මේ ධර්මපරියාය මෙසේ විස්තරයෙන් අර්ථ දන්නාහු නම්, හැම ක්ෂත්‍රියයනට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වන්නේය. ශාරිපුත්‍රය, හැම බ්‍රාහ්මණයෝ . . . වෛශ්‍යයෝ . . . ශාරිපුත්‍රය, ඉදින් හැම ශුද්‍රයෝ මා විසින් සැකෙවින් දෙසන ලද මේ ධර්මපරියාය මෙසේ විස්තරයෙන් අර්ථ දන්නාහු නම්, හැම ශුද්‍රයනට දීර්ඝරාත්‍රයෙහි හිතයට සුවයට වන්නේය. ශාරිපුත්‍රය, ඉදින් සමාරක සබ්‍රහ්මක සදෙවක ලොක ද, දෙව්මිනිසුන් සහිත ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත ප්‍රජාව මා විසින් සැකෙවින් දෙසන ලද මේ ධර්මපරියාය මෙසේ විස්තරයෙන් අර්ථ දන්නේ නම්, මරුන් සහිත බඹුන් සහිත සදෙවක ලොකයට ද, දෙව්මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාවට ද දීර්ඝරාත්‍රයෙහි හිතයට සුවයට වන්නේය යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මේ සෙවිතව්‍යාසෙවිතව්‍ය ධර්මපරියාය වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනා කළ සේකැ ' යි.

සතරවැනි සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍ර යි

14—ඊ 00502 (8/73)

# 3 2. 5

# බහුධාතුක සුත්තං

එවං මෙ සුත්තං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යානි කානිචි භික්ඛවෙ, භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො. යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො. සෙය්‍යථාපි භික්ඛවෙ, නළාගාරෙ වා තිණාගාරෙ වා[1] අග්ගිමුක්කො[2] කූටාගාරානිපි දහති[3] උල්ලිත්තාවලිත්තානි නිවාතානි ඵුසිතග්ගළානි[4] පිහිතවාතපානානි. එවමෙව ඛො භික්ඛවෙ, යානි කානිචි භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො. ඉති ඛො භික්ඛවෙ, සප්පටිභයො බාලො අප්පටිභයො පණ්ඩිතො. සඋපද්දවො බාලො අනුපද්දවො පණ්ඩිතො. සඋපසග්ගො බාලො අනුපසග්ගො පණ්ඩිතො. නත්ථි භික්ඛවෙ, පණ්ඩිතතො භයං. නත්ථි පණ්ඩිතතො උපද්දවො. නත්ථි පණ්ඩිතතො උපසග්ගො. තස්මාතිහ භික්ඛවෙ, *එවං සික්ඛිතබ්බං: පණ්ඩිතා භවිස්සාම වීමංසකාති[5], එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: කිත්තාවතා නු ඛො භන්තෙ, පණ්ඩිතො භික්ඛු වීමංසකොති අලං වචනායා’ති.

යතො ඛො ආනන්ද, භික්ඛු ධාතුකුසලො ච හොති, ආයතනකුසලො ච හොති, පටිච්චසමුප්පාදකුසලො ච හොති, ඨානාඨානකුසලො ච හොති. එත්තාවතා ඛො ආනන්ද, පණ්ඩිතො භික්ඛු වීමංසකොති අලං වචනායාති.

කිත්තාවතා පන භන්තෙ, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

අට්ඨාරස ඛො ඉමා ආනන්ද, ධාතුයො: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතූති. ඉමා ඛො ආනන්ද, අට්ඨාරස ධාතුයො යතො ජානාති පස්සති, එත්තාවතාපි ඛො ආනන්ද, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

---

1. නළාගාරා වා තිණාගාරා වා - සිමු, මජසං.
2. අග්ගි මුත්තො - සයා, මජසං.
3. ඩහති - සිමු.
4. ඵුසිතග්ගළානි - සිමු, මජසං.
5. පණ්ඩිතා භවිස්සාමාති - සයා.

* එවං සික්ඛිතබ්බං’ ඉති පොත්ථකෙසු න දිස්සති.

# 3. 2. 5
# බහුධාතුක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු මහසිටුහු ගේ අරමෙහි වැඩවසන සේක. එහිදී භාග්‍ය වතුන් වහන්සේ ' මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ' වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල බහුධාතුක සූත වදාළ සේක.

මහණෙනි, යම් කිසි භය කෙනෙක් උපදනාහු ද ඒ හැම බාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. යම් කිසි උපද්‍රව කෙනෙක් උපදනාහු ද, ඒ හැම බාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. යම් කිසි උපසෘෂ්ටාකාරයෝ උපදනාහු ද, ඒ හැම බාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. මහණෙනි, ගිනි ඇවිළැගත් නළ (බට) සෙවෙනිගෙයක් වේවයි තණ සෙවෙනි ගෙයක් වේවයි ඇතුළත පිටත සුණු පිරියම් කළ වැළැහු වාත ප්‍රවෙශ ඇති පැහැසු දොර කවුළු ඇති පියූ වාතපාන ඇති කූළුගෙවලුදු යම් සේ දවා ද, එසෙයින් මැ මහණෙනි, යම් කිසි භය කෙනෙක් උපදනාහු ද ඒ හැම බාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. යම් කිසි උපද්‍රව කෙනෙක් උපදනාහු ද ඒ හැම බාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. යම් කිසි උපසෘෂ්ටාකාරයෝ උපදනා හු ද ඒ හැමබාලයා නිසා උපදිති, පණ්ඩිතයා නිසා නූපදිත්. මහණෙනි, මෙසේ බාල සප්‍රතිභය වෙයි, පණ්ඩිත අප්‍රතිභය වේ. බාල උපද්‍රව සහිත වෙයි, පණ්ඩිත අනුපද්‍රව වේ. බාල උපසර්ග සහිත වෙයි, පණ්ඩිත අනුපසර්ග වේ. මහණෙනි, පණ්ඩිතයා නිසා භයෙක් නැත, පණ්ඩිතයා නිසා උපද්‍රවයෙක් නැත, පණ්ඩිතයා නිසා උපසර්ගයෙක් නැත්. එ හෙයින් මහණෙනි, මෙහි ලා පණ්ඩිත වන්නම් හ. විමංසක වන්නම්හ'යි මෙසේ හික්මිය යුතු. මහණෙනි. තොප විසින් මෙසේ ම හික්මිය යුතු යයි.

මෙසේ වදාළ කල්හි ආනන්දයෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ : වහන්ස, කිපමණෙකින් මහණ පණ්ඩිත යැ විමංසක යැ යි කියන්නට නිසි වේදයි.

ආනන්දය, මහණ යම් හෙයකින් ධාතු කුශල වේ ද, ආයතනකුශල වේ ද, ප්‍රතීත්‍ය-සමුත්පාද කුශල වේ ද, ස්ථානාස්ථානකුශල වේ ද, ආනන්දය, මෙතෙකින් මහණ පණ්ඩිත යැ විමසෙක යැ,යි කියන්නට නිසි වේ යයි.

යළි වහන්ස, කිපමණෙකින් ධාතුකුශල මහණැයි කියන්නට නිසි වේ ද,යි.

ආනන්දය, මේ අටළොස් ධාතු කෙනෙක් වෙති; චක්ෂුර්ධාතු රූප ධාතු චක්ෂුර්විඥනධාතු යැ, ශ්‍රොත්‍රධාතු ශබ්ද ධාතු ශ්‍රොත්‍රවිඥනධාතු යැ, ඝ්‍රාණ ධාතු ගන්ධධාතු ඝ්‍රාණවිඥන ධාතු යැ, ජිහ්වාධාතු රස ධාතු ජිහ්වාවිඥනධාතු යැ, කායධාතු ස්ප්‍රෂ්ටව්‍යධාතු කායවිඥන ධාතු යැ, මනොධාතු ධර්මධාතු මනොවිඥනධාතු යි. ආනන්දය, යම් හෙයකින් මේ අටළොස් ධාතූන් දනී ද, දකී ද, ආනන්දය, මෙතෙකිනුදු ධාතුකුශල මහණැ,යි කියන්නට නිසි වේ යයි.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා ආනන්ද, ඡයිමා ආනන්ද, ධාතුයො: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු. ඉමා ඛො ආනන්ද, ඡ ධාතුයො යතො ජානාති පස්සති. එත්තාවතාපි ඛො ආනන්ද ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා ආනන්ද, ඡයිමා ආනන්ද, ධාතුයො: සුඛධාතු දුක්ඛධාතු සොමනස්සධාතු දොමනස්සධාතු උපෙක්ඛාධාතු අවිජ්ජාධාතු. ඉමා ඛො ආනන්ද, ඡ ධාතුයො යතො ජානාති පස්සති. එත්තාවතාපි ඛො ආනන්ද, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා ආනන්ද, ඡයිමා ආනන්ද, ධාතුයො: කාමධාතු නෙක්ඛම්මධාතු ව්‍යාපාදධාතු අව්‍යාපාදධාතු විහිංසාධාතු අවිහිංසාධාතු[1] ඉමා ඛො ආනන්ද, ඡ ධාතුයො යතො ජානාති පස්සති. එත්තාවතාපි ඛො ආනන්ද, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා ආනන්ද, තිස්සො ඉමා ආනන්ද, ධාතුයො: කාමධාතු රූපධාතු අරූපධාතු. ඉමා ඛො ආනන්ද, තිස්සො ධාතුයො යතො ජානාති පස්සති. එත්තාවතාපි ඛො ආනන්ද, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා පන භන්තෙ, අඤ්ඤොපි පරියායො යථා ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

සියා ආනන්ද, ද්වෙ ඉමා ආනන්ද, ධාතුයො: සඞ්ඛතා ච ධාතු අසඞ්ඛතා ච ධාතු. ඉමා ඛො ආනන්ද, ද්වෙ ධාතුයො යතො ජානාති පස්සති. එත්තාවතාපි ඛො ආනන්ද, ධාතුකුසලො භික්ඛූති අලං වචනායාති.

කිත්තාවතා පන භන්තෙ, ආයතනකුසලො භික්ඛූති අලං වචනායාති.

ඡ ඛො පනිමානි ආනන්ද, අජ්ඣත්තිකබාහිරානි ආයතනානි: චක්ඛුං චෙව[2] රූපා ච[3], සොතඤ්ච සද්දා ච[4], ඝානඤ්ච ගන්ධා ච[5], ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච[6], මනො ච ධම්මා ච. ඉමානි ඛො ආනන්ද, ඡ අජ්ඣත්තිකබාහිරානි ආයතනානි යතො ජානාති පස්සති. එත්තාවතා ඛො ආනන්ද, ආයතනකුසලො භික්ඛූති අලං වචනායාති.

1. විහෙසාධාතු අවිහෙසාධාතු – PTS.
2. චක්ඛු චෙව – සීමු, මජසං, ස්‍යා.
3. රූපඤ්ච – PTS.
4. සද්දෙ ච – PTS.
5. ගන්ධෙ ච – PTS.
6. ඵොට්ඨබ්බෙ ච – PTS.

යළි වහන්ස, යම් කරුණෙකින් ධාතුකුශල මහණැයි කියන්නට නිසි වේද, එබඳු අන් කරුණෙකුදු වන්නේ දැ'යි.

ආනන්‍දය, වන්නේය. ආනන්‍දය, මේ ධාතුහු සදෙනෙක් වෙති ; පෘථුවිධාතු යැ, අබ්ධාතු යැ, තෙජොධාතු යැ, වායුධාතු යැ, ආකාශධාතු යැ, විඥනධාතු යි. ආනන්‍දය. යම් කරුණෙකින් මේ ෂඩ්ධාතූන් දනී ද, දකී ද, ආනන්‍දය, මෙතෙකිනුදු ධාතුකුශල මහණැයි කියන්නට නිසි වේ යයි.

යළි වහන්ස, යම් කරුණෙකින් ධාතුකුශල මහණැ,යි කියන්නට නිසි වේ ද, එබඳු අන් කරුණෙකුදු වන්නේ දැ'යි.

ආනන්දය, වන්නේය. ආනන්දය, මේ ධාතුහු සදෙනෙක් වෙති: සුඛධාතු යැ දුඃඛධාතු යැ සෞමනස්‍යධාතු යැ දෞර්මනස්‍යධාතු යැ උපෙක්ෂාධාතු යැ අවිද්‍යාධාතු යයි. ආනන්දය, යම් කරුණෙකින් මේ ෂඩ්ධාතූන් දනී ද, දකී ද, ආනන්දය, මෙතෙකිනුදු ධාතු කුශල මහණැ,යි කියන්නට නිසි වේ යයි.

යළි වහන්ස, යම් කරුණෙකින් ධාතු කුශල මහණැ,යි කියන්නට නිසි වේ ද, එබඳු අන් කරුණෙකුදු වන්නේ දැ,යි.

ආනන්දය, වන්නේය. ආනන්දය, මේ ධාතුහු සදෙනෙක් වෙති : කාමධාතු යැ නෙක්ඛම්මධාතු යැ ව්‍යාපාදධාතු යැ අව්‍යාපාදධාතු යැ විහිංසාධාතු යැ අවිහිංසාධාතු යි. ආනන්දය, යම් කරුණෙකින් මේ ෂඩ් ධාතූන් දනී ද දකී ද, ආනන්දය, මෙතෙකිනුදු ධාතුකුශල මහණැ යි කියන්නට නිසි වේ යයි.

යළි වහන්ස, යම් කරුණෙකින් ධාතුකුශල මහණැ යි කියන්නට නිසි වේ ද, එබඳු අන් කරුණෙකුදු වන්නේ දැ යි.

වන්නේ ය ආනන්දය, ආනන්දය, මේ ධාතුහු තිදෙනෙක් වෙති : කාමධාතුයැ රූප ධාතු යැ අරූප ධාතු යි. ආනන්දය, යම් කරුණෙකින් මේ තුන් ධාතූන් දනී ද දකී ද ආනන්දය මෙතෙකිනුදු ධාතුකුශල මහණැයි කියන්නට නිසි වේ ය'යි.

යළි වහන්ස, යම් කරුණෙකින් ධාතු කුශල මහණැ යි කියන්නට නිසි වේ ද, එබඳු අන් කරුණෙකුත් වන්නේ දැ යි.

වන්නේය, ආනන්දය, ආනන්දය, මේ ධාතුහු දෙදෙනෙක් වෙති : සඞ්ඛත ධාතු ද අසඞ්ඛත ධාතු දැ'යි. ආනන්දය. යම් කරුණෙකින් මේ දෙ ධාතූන් දනී ද දකී ද, මෙතෙකිනුදු ධාතු කුශල මහණැයි කියන්නට නිසි වේ ය'යි.

යළි වහන්ස, කිපමණෙකින් ආයතනකුශල මහණැයි කියන්නට නිසි වේ දැ යි.

ආනන්දය, මේ අධ්‍යාත්මික බාහ්‍ය වූ ආයතනයෝ සදෙනෙක් වෙති: ඇස ද රූපයෝ ද කන ද ශබ්දයෝ ද නැහැය ද ගන්ධයෝ ද දිව ද රසයෝද කය ද සප්‍රෂ්ටව්‍යයෝ ද සිත ද ධර්මයෝ දැ යි. ආනන්දය, යම් කරුණකින් මේ ආධ්‍යාත්මික බාහ්‍ය වූ ෂඩායතනයන් දනී ද, දකී ද, ආනන්දය, මෙතෙකින් ආයතන කුශල මහණැයි කියන්නට නිසි වේ යැයි.

කිත්තාවතා පන භන්තෙ, පටිච්චසමුප්පාදකුසලො භික්ඛූති අලං වචනායාති.

ඉධානන්ද, භික්ඛු එවං පජානාති : ඉමස්මිං සති ඉදං හොති. ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති. ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. එත්තාවතා ඛො ආනන්ද, පටිච්චසමුප්පාදකුසලො භික්ඛූති අලං වචනායාති.

කිත්තාවතා පන භන්තෙ, ඨානාඨානකුසලො භික්ඛූති අලං වචනායාති.

ඉධානන්ද, භික්ඛු : ‘අට්ඨානමෙතං අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී’ති පජානාති. ‘ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජතී’ති පජානාති.

‘අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී’ති පජානාති. ‘ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජතී’ති පජානාති.

‘අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී’ති පජානාති. ‘ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජතී’ති පජානාති.

‘අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො මාතරං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී’ති පජානාති. ‘ඨානඤ්ච ඛො එතං විජ්ජති යං පුථුජ්ජනො මාතරං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජතී’ති පජානාති.

යළි වහන්ස, කිපමණෙකින් ප්‍රතීත්‍යසමුත්පාදකුශල මහණැ,යි කියන්නට නිසි වේ ද'යි.

ආනන්දය, මෙ සස්නෙහි මහණ මෙසේ දනගනී : මේ අවිද්‍යාදි ප්‍රත්‍යය ඇති කල්හි මේ සංස්කාරාදි ඵලය වෙයි. මේ අවිද්‍යාදි ප්‍රත්‍යයාගේ ඉපැදීමෙන් මේ සංස්කාරාදි ඵලය උපදී. මේ අවිද්‍යාදි ප්‍රත්‍යය නැති කල්හි මේ සංස්කාරාදි ඵලය නො වෙයි. මේ අවිද්‍යාදි ප්‍රත්‍යයාගේ අනුත්පාද නිරොධයෙන් මේ සංස්කාරාදි ඵලය නිරුද්ධ වෙයි. එ කිසේ යැ යත් : අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ සම්භව වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විපාක විඥනය වෙයි. ප්‍රතිසන්ධිවිඥනප්‍රත්‍යයෙන් නාමරූප වෙයි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩා යතන වෙයි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා වෙයි. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. කර්මභව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ හා සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසයෝ සම්භව වෙත්. මෙසේ යථොක්ත අසම්මිශ්‍ර දුඃඛසමුදයයාගේ නිර්වෘතිය වෙයි. යළි අවිද්‍යාවගේ මැ විරාග සංඛ්‍යාත මාර්ග යෙන් අශේෂ නිරොධය හෙතු කොටගෙන සංස්කාරයන්ගේ අනුත්පාද නිරොධය වෙයි. සංස්කාරයන්ගේ නිරොධයෙන් විඥනයාගේ නිරොධය වෙයි. විඥනනිරොධයෙන් නාමරූපයන්ගේ නිරොධය වෙයි. නාමරූප නිරොධයෙන් ෂඩායතනයාගේ නිරොධය වෙයි. ෂඩායතන නිරොධයෙන් ස්පර්ශයාගේ නිරොධය වෙයි. ස්පර්ශ නිරොධයෙන් වෙදනාවන්ගේ නිරොධය වෙයි. වෙදනා නිරොධයෙන් තෘෂ්ණා නිරොධය වෙයි. තෘෂ්ණා නිරොධයෙන් උපාදානයන්ගේ නිරොධය වෙයි. උපාදාන නිරොධයෙන් භව නිරොධය වෙයි. භව නිරොධයෙන් ජාති නිරොධය වෙයි. ජාති නිරොධයෙන් ජරාමරණ හා සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායසයෝ නිරුද්ධ වෙත්. මෙසේ අසම්මිශ්‍ර වූ යථොක්ත දුඃඛරාශීහුගේ අනුත්පාද නිරොධය වේ. ආනන්දය, මෙතෙකින් ප්‍රතීත්‍යසමුත්-පාද කුශල මහණැ යි කියන්නට නිසි වේ යයි.

යළි වහන්ස, කිපමණෙකින් ස්ථානාස්ථානකුශල මහණැ,යි කියන්නට කිසි වේ ද'යි.

ආනන්දය, මේ සස්නෙහි මහණ යම් කරුණෙකින් මාර්ගදෘෂ්ටිසම්පන්න (ස්‍රොතාපන්න ආයර්‍ය්‍යශ්‍රාවක) පුද්ගල (චාතුර්භූමක සංස්කාරයන් කෙරෙහි) කිසි එක් සංස්කාරයකුදු නිත්‍ය වශයෙන් ගන්නේ ද තෙල හෙතු රහිත යැ, ප්‍රත්‍යය රහිත යැ, තෙල කරුණ නො ලැබෙ'යයි දනගනී. යළි තෙල කරුණ ඇත : යම් හෙයකින් පෘථග්ජන කිසි සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේ ද, තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරණ අහෙතුකය, අප්‍රත්‍යය : යම් හෙයකින් මාර්ගදෘෂ්ටිසම්පන්න ආයර්‍ය්‍යශ්‍රාවක පුද්ගල (චාතුර්භූමක සංස්කාරයන් කෙරෙහි) කිසි එක ද සංස්කාරයක් සුව වශයෙන් ගන්නේය යන තෙල කරුණ නැතැයි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුහුල් (ත්‍රෛභූමක සංස්කාරයන් කෙරෙහි) කිසි සංස්කාරයක් සුව විසින් ගන් නේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල කරුණ අහෙතුක ය, අප්‍රත්‍යය : යම් කරුණකින් මාර්ග දෘෂ්ටියෙන් සමන්වාගත පුද්ගල (චාතුර්භූමක ධර්මයන් කෙරෙහි ) කිසි එක ද ධර්මයක් ආත්ම විසින් ගන්නේය යන තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුහුල් (ත්‍රෛභූමක ධර්මයන් කෙරෙහි) කිසි ධර්මයක් ආත්ම විසින් ගන්නේ ය යන තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරුණ අහෙතුක ය අප්‍රත්‍යය : යම් කරුණෙකින් දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුහුල් මව දිවියෙන් තොරකරන්නේය යන තෙල කරුණ නැතැ,යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් කරුණකින් පුහුදුන් පුහුල් මව දිවියෙන් තොරකරන්නේය යන තෙල කරුන ඇතැ'යි දනගනී.

'අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො පිතරං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං පුථුජ්ජනො පිතරං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං පුථුජ්ජනො අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං දිට්ඨිසම්පන්නො පුග්ගලො දුට්ඨචිත්තො තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානං ච ඛො එතං විජ්ජති: යං පුථුජ්ජනො දුට්ඨචිත්තො තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝං භින්දෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානං ච ඛො එතං විජ්ජති: යං පුථුජ්ජනො සඞ්ඝං භින්දෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං දිට්ඨිසම්පන්නො පුග්ගලො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානං ච ඛො එතං විජ්ජති: යං පුථුජ්ජනො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානං ච ඛො එතං විජ්ජති: යං එකිස්සා ලොකධාතුයා එකො අරහං සම්මාසම්බුද්ධො උප්පජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං එකිස්සා ලොකධාතුයා ද්වෙ රාජානො චක්කවත්තිනො අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානං ච ඛො එතං විජ්ජති: යං එකිස්සා ලොකධාතුයා එකො රාජා චක්කවත්ති උප්පජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං ඉත්ථී අරහං අස්ස සම්මාසම්බුද්ධො, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං පුරිසො අරහං අස්ස සම්මාසම්බුද්ධො, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො: යං ඉත්ථී රාජා අස්ස චක්කවත්ති, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං පුරිසො රාජා අස්ස චක්කවත්ති, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨාමෙතං අනවකාසො: යං ඉත්ථී සක්කත්තං කරෙය්‍ය[1], නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං පුරිසො සක්කත්තං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති

1. කාරෙය්‍ය - ස්‍යා.

තෙල කරුණ අස්ථාන යැ අනවකාශ යි: යම් හෙයකින් සෝවාන් පුඟුල් පියා දිවියෙන් තොර කරන්නේය යන තෙල කරුණ නැතැ'යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුඟුල් පියා දිවියෙන් තොර කරන්නේය යන තෙල කරුණ ඇතැ'යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ අනවකාශ යි: යම් හෙයකින්සොවාන් පුඟුල් රහතක්හු දිවියෙන් තොරකරන්නේය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් කරුණෙකින් පුහුදුන් පුඟුල් රහත්හු දිවියෙන් තොර කරන්නේ ය යන තෙල කරුණ ඇතැ'යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි : යම් කරුණෙකින් මාර්ගදෘෂ්ටියෙන් සමන්වාගත පුද්ගල (වධකචෙතනායෙන්) ප්‍රදුෂ්‍ය වූ සිත් ඇති යේ තථාගතයන් වහන්සේගේ (ජීවමානක සිරුරුහි කුඩා මැස්සක බොන පමණකුදු) ලෙහෙ උපදවන්නේ ය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුඟුල් ප්‍රදුෂ්‍ය වූ සිත් ඇතියේ තථාගතයන් වහන්සේගේ (දිවමන් සිරුරුහි කුඩා මැස්සක බොන පමණකුදු) ලෙහෙ උපද වන්නේ ය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් සෝවාන් පුඟුල් (සමාන සංවාසක) සංඝයා හෙද කරන්නේය යන තෙල කරුණ නැතැ 'යි දන ගනී. තෙලකරුණ වලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුඟුල් සංඝයා හෙද කරන්නේ ය යන තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි ; යම් කරුණකින් සෝවාන් පුද්ගල අන් ශාස්තෘ වක්හු (මේ මාගේ ශාස්තෘ යයි) ගන්නේය යන මෙකරුණ නැතැ,යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුහුදුන් පුද්ගල අන් ශාස්තෘවක් හු (මේ මාගේ ශාස්තෘ යයි) ගන්නේය යන තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි: යම් හෙයකින් ලොකධාතුයෙක් හි අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ දෙදෙනෙක් පෙර පසු නො වැ එක්වට උපදනාහුය යන තෙල කරුණ නැතැ,යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් එක් ලොකධාතුයෙක එක් අර්හත් සම්‍යක්සම්බුද්ධ කෙනෙක් උපදනාහ යන තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් එක් ලොකධාතුයෙක සක්විති රජවරු දෙදෙනෙක් පර පසු නො වැ එක්වට උපදනාසුලුය යන තෙල නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත: යම් හෙයකින් එක් ලොකධාතුයෙක එක් සක්විති රජෙක් උපදනේය යන තෙල කරුණ ඇතැ යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ අනවකාශ යි : යම් හෙයකින් ස්ත්‍රියක් අර්හත් සම්‍යක්-සම්බුද්ධ වන්නීය යන තෙල කරුණ නැතැ යි දන ගනී. තෙල කරුණ වැලිත් ඇත: යම් හෙයකින් පුරුෂයෙක් අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නේය යන තෙල කරුණ ඇතැ'යි දනගනී..

තෙල කරුණ අස්ථාන යැ : අනවකාශ ය : යම් හෙයකින් ස්ත්‍රියක් සක්විතිරජ වන්නීය යන තෙල කරුණ නැතැයි දනගනී. තෙල කරුණ වැලිත් ඇත: යම් හෙයකින් පුරුෂයෙක් සක්විති රජ වන්නේ ය යන තෙල කරුණ ඇතැ'යි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් ස්ත්‍රියක් ශක්‍රභාවය කරන්නීය යන තෙල කරුණ නැතැ,යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුරුෂයෙක් ශක්‍රභාවය කරන්නේ ය යන තෙල කරුණ ඇතැයි දනගනී.

'අට්ඨානමෙතං අනවකාසො : යං ඉත්ථි මාරත්තං කරෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං පුරිසො මාරත්තං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං ඉත්ථි බ්‍රහ්මත්තං කරෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති 'ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං පුරිසො බ්‍රහ්මත්තං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං කායදුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං කායදුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො : යං වචීදුච්චරිතස්ස -පෙ- යං මනො-දුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං මනො දුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං කායසුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං කායසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානං මෙතං විජ්ජතී'ති පජානාති.

'අට්ඨානමෙතං අනවකාසො : යං වචීසුචරිතස්ස —පෙ— යං මනො සුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං මනොසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං කායදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං කායදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං වචීදුච්චරිතසමඞ්ගී—පෙ—යං මනොදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති. යං මනො දුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

අට්ඨානමෙතං අනවකාසො : යං කායසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. 'ඨානඤ්ච ඛො එතං විජ්ජති : යං කායසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති.

තෙල අස්ථාන යැ, අනවකාශ යි: යම් හෙයකින් ස්ත්‍රියක් මාර බව කරන්නීය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුරුෂ මාර බව කරන්නේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ අනවකාශ යි: යම් හෙයකින් ස්ත්‍රියක් බ්‍රහ්මත්වය කරන්නේය යන තෙල කරුණ නැතැ යි දන ගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් පුරුෂ බ්‍රහ්මත්වය කරන්නේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ අනවකාශ යි : යම් හෙයකින් කායදුශ්චරිතයා ගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකයෙක්උපදනේය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් කායදුශ්චරිතයාගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ විපාකය උපදනේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් වාග්දුශ්චරිතයාගේ ... මනොදුශ් චරිතයාගේ ඉෂ්ට කාන්ත මනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ නැතැ ,යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත: යම් හෙයකින් මනොදුශ්චරිතයාගේ අනිෂ්ට ආකාන්ත අමනාප විපාකය උපදනේ ය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ අනවකාශයි: යම් හෙයකින් කාය සුචරිතයාගේ අනිෂ්ට අකාන්ත අමනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ නැතැ'යි දන ගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් කාය සුචරිතයාගේ ඉෂ්ටකාන්ත මනාප විපාකය උපදනේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් වාක්සුචරිතයා ගේ ... යම් හෙයකින් මනස්සුචරිතයාගේ අනිෂ්ට ආකාන්ත අමනාප විපාකයෙක් උපදනේය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් මනස්සුචරිත යා ගේ ඉෂ්ට කාන්ත මනාප විපකය උපදනේ ය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් කායදුශ්චරිතසමඞ්ගී පුද්ගල ඒ හේතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් සුගති ස්වර්ග ලෝකයට පැමිණෙන්නේය යන තෙල කරුණ නැතැ'යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් කායදුශ්චරිත සමඞ්ගී පුද්ගල එ කරුණෙක් ඒ හේතුයෙන් අපාය දුර්ගතිවිනිපාත වූ නිරයට පැමිණෙන්නේය යන තෙල කරුණ ඇතැයි දනගනී.

තෙල අස්ථාන යැ අනවකාශ යි : යම් හෙයකින් වාග් දුශ්චරිත සමඞ්ගී ... මනොදුශ්චරිත සමඞ්ගී පුද්ගල එකරුණෙන් ඒ හේතුයෙන් කාබුන් මරණින් මතු සුගති ස්වර්ග ලෝකයටපැමිණෙන්නේය යන තෙල කරුණ නාතැ'යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් මනොදුශ්චරිත සමංගී පුද්ගල එකරුණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත වූ නිරයට පැමිණෙන්නේය යන තෙල කරුණ ඇතැ'යි දනගනී.

තෙල අස්ථාන යැ, අනවකාශ යි : යම් හෙයකින් කාය සුචරිත සමඞ්ගී පුද්ගල එකරු ණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත නිරයෙහි උපදනේය යන තෙල කරුණ නැතැ යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් හෙයකින් කාය සුචරිත සමඞ්ගී පුද්ගල එකරුණෙන් ඒ හෙතුයෙන් කාබුන් මරණින් මතු සුගති ස්වර්ග ලෝකයට පැමිණෙන්නේය යන තෙල කරුණ ඇතැ'යි දනගනී.

අට්ඨානමෙතං අනවකාසො : යං වචීසුචරිතසමඞ්ගී—පෙ—යං මනොසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජතී'ති පජානාති. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං මනොසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතී'ති පජානාති. එත්තාවතා ඛො ආනන්ද, ඨානාඨානකුසලො භික්ඛූති අලං වචනායාති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච : අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, කො නාමො අයං භන්තෙ, ධම්මපරියායොති.

තස්මාතිහ ත්වං ආනන්ද, ඉමං ධම්මපරියායං බහුධාතුකොතිපි නං ධාරෙහි, චතුපරිවට්ටොතිපි නං ධාරෙහි, ධම්මාදාසොතිපි නං ධාරෙහි, අමතදුන්දුභීතිපි නං ධාරෙහි, අනුත්තරො සඞ්ගාමවිජයොතිපි නං ධාරෙහීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

බහුධාතුකසුත්තං පඤ්චමං.

---

තෙල කරුණ අස්ථාන යැ, අනවකාශයි ; යම් හෙයකින් වාක්සුචරිත සමඞ්ගී පුද්ගල … මනො සුචරිත සමඞ්ගී පුද්ගල එ කරුණෙන් ඒ හේතුයෙන් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙන්නේය යන තෙල කරුණ නැතැ'යි දනගනී. තෙල කරුණ වැලිත් ඇත : යම් කරුණෙකින් මනස්සුචරිත සමඞ්ගී පුද්ගල එකරුනෙන් එ හෙතු යෙන් කාබුන් මරණින් මතු සුගති ස්වර්ග ලොකයට පැමිණෙන්නේය යන තෙල කරුණ ඇතැ යි දනගනී. ආනන්දය, මෙතෙකින් ඨානාඨානකුසල මහණැයි කියන්නට නිසි වේ යයි වදළ සේක.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන්වහන්සේට තෙල සැළකළහ : ආශ්චර්‍ය්‍ය යැ වහන්ස, අද්භූත යැ වහන්ස, වහන්ස, මේ කිනම් ධර්මපර්යා යෙක් දැ යි.

එහෙයින් ආනන්දය, තෙපි මේ ධර්මපර්යාය බහුධාතුක ' යී ද ධරව, චතුෂ්පරිවර්ත යී ද ධරව, ධර්මාදර්ශ යී ද ධරව, අමෘතදුන්දුභි යී ද ධරව, අනුත්තර සංග්‍රාමවිජය යී ද ධරව'යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්යේ මේ බහුධාතුක සූත වදළසේක. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගත්හ'යි.

**පස්වැනි බහුධාතුක සූත්‍ර යි.**

# 3. 2. 6

# ඉසිගිලි සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රජගහෙ විහරති ඉසිගිලිස්මිං පබ්බතෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං වෙභාරං පබ්බතන්ති.

එවං භන්තෙ.

එතස්සපි ඛො භික්ඛවෙ, වෙභාරස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති, පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං පණ්ඩවං පබ්බතන්ති.

එවං භන්තෙ.

එතස්සපි ඛො භික්ඛවෙ, පණ්ඩවස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං වෙපුල්ලං පබ්බතන්ති.

එවං භන්තෙ.

එතස්සපි ඛො භික්ඛවෙ, වෙපුල්ලස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං ගිජ්ඣකූටං පබ්බතන්ති.

එවං භන්තෙ.

එතස්සපි ඛො භික්ඛවෙ, ගිජ්ඣකූටස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, ඉමං ඉසිගිලිං පබ්බතන්ති.

එවං භන්තෙ

ඉමස්ස ඛො භික්ඛවෙ, ඉසිගිලිස්ස පබ්බතස්ස එසාව සමඤ්ඤා අහොසි එසා පඤ්ඤත්ති.

භූතපුබ්බං භික්ඛවෙ, පඤ්ච පච්චෙකබුද්ධසතානි ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසිනො අහෙසුං. තෙ ඉමං පබ්බතං පවිසන්තා දිස්සන්ති, පවිට්ඨා න දිස්සන්ති. තමෙනං[1] මනුස්සා දිස්වා එවමාහංසු: 'අයං පබ්බතො ඉමෙ ඉසී ගිලතී'ති ඉසිගිලි ඉසිගිලීත්වෙව සමඤ්ඤා උදපාදි. ආචික්ඛිස්සාමි භික්ඛවෙ, පච්චෙකබුද්ධානං නාමානි. කිත්තයිස්සාමි භික්ඛවෙ, පච්චෙකබුද්ධානං නාමානි. දෙසිස්සාමි භික්ඛවෙ, පච්චෙකබුද්ධානං නාමානි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.

1. තමෙතං - සිමු, මජසං.

# 3. 2. 6

# ඉසිගිලි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ඉසිගිලි පව්වෙහි වැඩවසන සේක. එකල්හි එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි ' යි භික්ෂූන් අඩගාවදළ සේක. 'පින්වතුන් වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල ඉසිගිලි සූත වදළ සේක :

' මහණෙනි, තෙපි තෙල වෙභාර පර්වතය දක්නාහු නො ද ' යි.

එසේ යැ වහන්ස,

මහණෙනි තෙල පෙනෙන වෙභාර පර්වතයට ද අන් මැ සංඥවක් විය. අන් ප්‍රඥප්තියක් වී. මහණෙනි, තෙපි තෙල පාණ්ඩව පර්වතය දක්නාහු නො ද'යි.

එසේ යැ වහන්ස.

මහණෙනි, තෙල පෙනෙන පාණ්ඩව පර්වතයට ද අන් මැ සංඥවක් විය. අන් ප්‍රඥප්තියක් වී. මහණෙනි, තෙපි තෙල වෙපුල්‍ය පර්වතය දක්නාහු නො ද' යි.

එසේ යැ වහන්ස.

මහණෙනි, තෙල පෙනෙන වෙපුල්‍ය පර්වතයට ද අන් මැ සංඥවක් විය. අන් ප්‍රඥප්තියක් වී. මහණෙනි, තෙපි තෙල ගෘධ්‍රකූට පර්වතය දක්නාහු නො ද'යි.

එසේ යැ වහන්ස,

මහණෙනි, තෙල පෙනෙන ගෘධ්‍රකූට පර්වතයට ද අන් මැ සංඥවක් විය. අන් ප්‍රඥප්තියක් වී. මහණෙනි, තෙපි මේ ඉසිගිලි පර්වතය දක්නාහු නො ද'යි.

එසේ යැ වහන්ස.

මහණෙනි, මේ ඉසිගිලි පර්වතයට තෙල සංඥව මැ විය, තෙල ප්‍රඥප්තිය වී.

මහණෙනි, භූත පූර්වයෙකි ; මේ ඉසිගිලි පර්වතයෙහි පන්සියක් පසේබුදුහු බොහෝ කලක් වාසය කළාහුය. ඔහු මේ පර්වතයට පිවිසෙන්නාහු දක්නා ලැබෙති, පිවිසියාහු නො දක්නා ලැබෙත්. එ දුක මනුෂ්‍යයෝ මෙසේ කීහු : ' මේ පර්වත මේ ප්‍රත්‍යෙක බුද්ධ ඍෂීන් ගිලගනී ' යයි. එහෙයින් ' ඉසිගිලි ඉසිගිලි ' යි කියා මැ නම් උපන. මහණෙනි, පසේබුදුවරුන්ගේ නම් පවසන්නෙමි. මහණෙනි, පසේ බුදුවරුන්ගේ නම් කීර්තනය, කරන්නෙමි, මහණෙනි, පසේ බුදුවරයන්ගේ නම් දෙසන්නෙමි. ඒ අසව්, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි' යි.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

අරිට්ඨො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො[1] ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. උපරිට්ඨො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. තගරසිඛී නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. යසස්සී නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. සුදස්සනො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. පියදස්සී නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. ගන්ධාරො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. පිණ්ඩොලො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. උපාසභො නාම භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. නීතො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. තථො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. සුතවා නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි. භාවිතත්තො නාම භික්ඛවෙ, පච්චෙකසම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසීති.

යෙ සත්තසාරා අනීඝා නිරාසා
පච්චෙකමෙවජ්ඣගමුං සුබොධිං[2],
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතො සුණාථ.

අරිට්ඨො උපරිට්ඨො තගරසිඛී යසස්සී
සුදස්සනො පියදස්සී ච බුද්ධො[3],
ගන්ධාරො පිණ්ඩොලො උපාසභො ච
නීතො තථො සුතවා භාවිතත්තො.

සුම්භො සුභො මෙථුලො[4] අට්ඨමො ච
අථස්සුමෙඝො අනීඝො සුදාඨො,
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා
හිඞ්ගු ච හිඞ්ගො ච මහානුභාවා.

ද්වෙ ජාලිනො මුනිනො අට්ඨකො ච
අථ කොසලො[5] බුද්ධො අථො සුබාහු,
උපනෙමිසො නෙමිසො සන්තචිත්තො
සච්චො තථො විරජො පණ්ඩිතො ච.

1. පච්චෙකබුද්ධො - PTS.
2. ගමංසු බොධිං - සීමු, මජසං
3. සම්බුද්ධො - මජසං, සීමු.
4. මතුලො - මජසං.
5. කොසල්ලො - මජසං.

එසේ යැ වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මහණෙනි, අරිට්ඨ නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි බොහෝ කල් විසූහ. මහණෙනි උපරිට්ඨ නම් පසේ බුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, තගරසිඛී නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, යසස්සී නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, සුදස්සන නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, පියදස්සී නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, ගන්ධාර නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, පිණ්ඩොල නම් පසේ බුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, උපාසභ නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, නීත නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි, තථ නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ. මහණෙනි සුතවන්තු නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි බොහෝ කල් විසූහ. මහණෙනි, භාවිතත්ත නම් පසේබුදුහු මේ ඉසිගිලි පව්යෙහි චිරනිවාසී වූහ'යි.

සත්ත්වයන් කෙරෙහි සාර වූ හෙවත් උත්තම සත්ත්ව වූ නිදුක් වූ නිස්තෘෂ්ණ වූ යම් පසේබුදු කෙනෙක් වෙන වෙන මැ සතර මාර්ගඥාන බොධිය අවබොධ කළාහු ද විගත වූ රාගාදී ශල්‍ය ඇති ඒ නරොත්තමයන් ගේ නාමයන් කීර්තනය කරන්නාවූ මාගේ බසින් අසව්.

අරිට්ඨ යැ, උපරිට්ඨ යැ, තගරසිඛී යැ, යසස්සී යැ, සුදස්සන යැ, පියදස්සී බුද්ධ යැ, ගන්ධාර යැ, පිණ්ඩොල යැ, උපාසභ යැ, නීත යැ, තථ යැ, සුතවන්තු යැ, භාවිතත්ත යැ, යන පසේබුදුහු ද,

සුම්භ යැ, සුභ යැ, මෙථුල යැ, අට්ඨම යැ, යළි සුමෙඝ යැ, අනීඝ යැ, සුදාඨ යැ, හිඞ්ගු යැ, හිඞ්ග යැ, යන මහත් අනුභාව ඇති භවනෙත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණා ක්ෂය කළ පසේ බුදුහු යැ—

ද්වුල්ලජාලී මහාජාලී යැයි ජාලී නම් ඇති දෙ මුනිහු යැ, අට්ඨක බුදුහු යැ, නැවත කොසල බුද්ධ යැ, යළි සුබාහු යැ, උපනෙමිස යැ, නෙමිස යැ. සන්ත චිත්ත යැ, සච්ච යැ, තථ යැ, විරජ යැ, පණ්ඩිත යැ, යන පසේබුදුහු ද—

කාළූපකාලා විජිතො ජිතො ච
අඞ්ගො ච පඞ්ගො ච ගුත්තිජ්ජිතො[1] ච,
පස්සි ජහි උපධිං[2] දුක්ඛමූලං
අපරජිතො මාරබලං අජෙසි.

සත්ථා පවත්තා සරභඞ්ගො ලොමහංසො
උච්චඞ්ගමායො අසිතො අනාසවො,
මනොමයො මානච්ඡිදො ච බන්ධුමා
තදාධිමුත්තො විමලො ච කෙතුමා.

කෙතුම්භරාගො ච මාතඞ්ගො අරියො
අථච්චුතො අච්චුතගාමබ්‍යාමකො,
සුමඞ්ගලො දබ්බිලො සුප්පතිට්ඨිතො[3]
අසය්හො ඛෙමාභිරතො ච සොරතො.

දුරන්නයො සඞ්ඝො අථොපි උච්චයො[4]
අපරො මුනී[5] සය්හො අනොමනික්කමො,
ආනන්දනන්දො[6] උපනන්දො ද්වාදස
භාරද්වාජො[7] අන්තිමදෙහධාරී.

බොධී මහානාමො අථොපි උත්තරො
කෙසී සිඛී සුන්දරො භාරද්වාජො[8]
තිස්සුපතිස්සා භවබන්ධනච්ඡිදා
උපසීදරී[9] තණ්හච්ඡිදො ච සීදරී[10].

බුද්ධො අහු මඞ්ගලො වීතරාගො
උසභච්ඡිදා ජාලිනිං දුක්ඛමූලං,
සන්තං පදං අජ්ඣගමූපනීතො[11].
උපොසථො සුන්දරො සච්චනාමො.

ජෙතො ජයන්තො පදුමො උප්පලො ච
පදුමුත්තරො රක්ඛිතො පබ්බතො ච,
මානත්ථද්ධො සොභිතො වීතරාගො
කණ්හො ච බුද්ධො සුවිමුත්තචිත්තො.

එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා.
තෙ සබ්බසඞ්ගාතිගතෙ[12] මහෙසී
පරිනිබ්බුතෙ වන්දථ අප්පමෙය්‍යෙ'ති.

ඉසිගිලිසුත්තං ඡට්ඨං

---

1. ගුත්තිලිතො - සීමු. / ගුත්තිජිතො - මජසං. / ගුත්තිච්ඡිතො - සයා.
2. පස්සි ජහි උපධි - මජසං.
3. සුපතිට්ඨිතො - සීමු, මජසං, සයා, PTS.
4. උජ්ජයො - PTS.
5. මුනි - සයා, මජසං.
6. ආනන්දො නන්දො - මජසං.
7. භාරද්වාජා - PTS.
8. ද්වාරභාජො - මජසං.
9. උපසිඛී - මජසං.
10. සිඛරී - මජසං.
11. අජ්ඣගමොපනීතො - මජසං.
12. සබ්බසඞ්ගාධිගතෙ - සයා.

කාල උපකාල යන දෙ බුදුහු යැ, විජිත යැ, ජිත යැ, අඞ්ග යැ, පඞ්ග යැ, ගුතිජ්ජිත යැ, පස්සී නම් ඒ පසේබුදුහු ස්කන්ධ දුඃඛයට මූල වූ උපධි හළය. අපරාජිත නම් පසේබුදුහු මාරබල දිනූය.

සත්ථු, පවත්තු, සරභඞ්ග, ලොමහංස, උච්චඞ්ගමාය, යන නම් ඇති පස් පසේබුදුහු යැ, අසිත, අනාසව, මනොමය, යන තුන් පසේබුදුහු යැ, නවවිධ මාන පසුන් කළ බන්ධුමන්තු නම් පසේබුදුහු යැ, තදධිමුත්ත යැ, විමල යැ, කෙතුමන්තු යැ, යන පසේ බුදුහු ද—

කෙතුම්බරාග යැ, මාතඞ්ග යැ, අරිය යැ, යන තුන් පසේ බුදුහු යැ, යළි අච්චුත යැ, අච්චුතගාමබ්‍යාමක යැ, යන පසේබුදුහු දෙදෙන යැ, සුමංගල, දබ්බිල, සුප්පතිට්ඨිත, අසය්හ යන පසේබුදුහු යැ, ඛෙමාභිරත යැ, සොරත යැ, යන පසේ බුදුහු දෙදෙන ද—

දුරන්නය, සඞ්ඝ, යන පසේ බුදුහු යැ, යළිදු උච්ච යැ, අලාමක වීර්‍ය්‍ය ඇති සය්හ නම් අන්‍යත් පසේබුදු මුනිවරයෙකැ, ආනන්ද, නන්ද, උපනන්ද, සියු දෙනකුන් බැගින් දෙළොස් පසේබුදු කෙනෙකැ, අන්තිම ශරීරය ධරන භාරද්වාජ නම් පසේ බුදුහු ද—

බොධි, මහානාම යන පසේ බුදුහු යැ, යළිදු උත්තර, කෙසී, සිඛී, සුන්දර, භාරද්වාජ යන පස් පසේබුදුහු යැ, බවබැඳුම් පසුන් කළ තිස්ස, උපතිස්ස යන පසේබුදුහු දෙදෙන යැ, උපසිදරි නම් පසේබුදුහු යැ, තෘෂ්ණා පසුන් කළ සිදරි නම් පසේබුදුහු ද—

වීතරාග වූ මංගල පසේබුදුහු ද වූහ. උසභ නම් පසේබුදුහු පස්කඳදුකට මුල් වූ තෘෂ්ණාජාලිනිය සුන් කළය. උපනීත නම් පසේබුදුහු ශාන්ත නිර්වාණපදය අධිගම කළය. උපොසථ සුන්දර සච්චනාම යන තුන් පසේ බුදුහු ද—

ජෙත ජයන්ත, පදුම, උප්පල, යන සියු පසේබුදුහු ද, පදුමුත්තර, රක්ඛිත පබ්බත, යන තුන් පසේබුදුහු ද, මානත්ථද්ධ, සොභිත, වීතරාග, යන පසේබුදුහු ද, මොනොවට කෙළෙසුන් කෙරෙන් මිදුණු සිත් ඇති කණ්හ නම් පසේබුදුහු ද යන—

නාම විසින් පෙළ ආ තෙල පසේබුදුහු ද, ගුණු භවතෘෂ්ණා ඇති මහත් අනුභාව ඇති (පසේ බුදුන් පන්සියක් කෙරෙහිපෙළ නො ආ) අන්‍ය වූත් යම් පසේබුදු කෙනෙක් ඇද්ද, සියලු කෙලශසඞ්ගයන් ඉක්මවා ගිය ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන් වන් ගුණ විසින් අප්‍රමෙය වූ ඒ ප්‍රත්‍යෙකබුද්ධ මහර්ෂීන්හට නමස්කාර කරව'යි.

**සවැනි ඉසිගිලි සූත්‍ර යි.**

# 3. 2. 7

## මහාචත්තාරීසක සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

අරියං වො, භික්ඛවෙ, සම්මාසමාධිං දෙසිස්සාමි සඋපනිසං සපරික්ඛාරං. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමො ච භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො සපරික්ඛාරො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති. යා ඛො භික්ඛවෙ, ඉමෙහි සත්තහ'ඞ්ගෙහි[1] චිත්තස්ස එකග්ගතා පරික්ඛතා· අයං වුච්චති භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො ඉතිපි, සපරික්ඛාරො ඉතිපි.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: මිච්ඡාදිට්ඨිං මිච්ඡාදිට්ඨීති පජානාති. සම්මාදිට්ඨිං සම්මාදිට්ඨීති පජානාති. සාස්ස හොති සම්මාදිට්ඨි.

කතමා ච භික්ඛවෙ, මිච්ඡාදිට්ඨි: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං භික්ඛවෙ, මිච්ඡාදිට්ඨි.

කතමා ච භික්ඛවෙ, සම්මාදිට්ඨි: සම්මාදිට්ඨිම්පහං[2] භික්ඛවෙ, ද්වයං[3] වදාමි: අත්ථි භික්ඛවෙ, සම්මාදිට්ඨි සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා. අත්ථි භික්ඛවෙ, සම්මාදිට්ඨි අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා.

කතමා ච භික්ඛවෙ, සම්මාදිට්ඨි සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං භික්ඛවෙ, සම්මාදිට්ඨි සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා.

---

1. සත්තඞ්ගෙහි – PTS.
2. සම්මාදිට්ඨිම්පාහං – සීමු.
3. ද්වායං – මජසං.

# 3. 2. 7
# මහාචත්තාරීසක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඩුසිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, කියා භික්ෂූන් අඩගාවදළ සේක. පින්වතුන් වහන්සැ'යි ඒ වහන්ද භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල මහාචත්තා රීසක සූත වදළ සේක.

මහණෙනි, තොපට නිර්දොෂ වූ මාර්ගසමාධිය සප්‍රත්‍යය කොට සපරිවාර කොට දෙසන්නෙමි. ඒ අසව්, මොනොවට මෙනෙහි කරව් ප්‍රකාශ කරන්නෙමි.'යි වදළ සේක.

එසේ යැ වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක.

මහණෙනි, ප්‍රත්‍යය සහිත වූ සපරිවාර වූ ආර්‍ය්‍ය සම්‍යක්සමාධිය කවරෙ යැ ය ත් : එ මෙසේ යැ : සම්මාදිට්ඨි සම්මාසංකප්ප සම්මාවාචා සම්මා කම්මන්ත සම්මා ආජීව සම්මා වායාම සම්මාසති යන මේ සතහින් චිත්තයා ගේ යම් එකාග්‍ර බවක් පරිවාර බවක් වේ ද, මහණෙනි, මේ ආර්‍ය්‍ය සම්‍යක්සමාධිය සප්‍රත්‍ය යි ද සපරිවාර යි ද කියනු ලැබේ.

මහණෙනි, එහි ලා (විපස්සනා සම්මාදිට්ඨි, මග්ග සම්මාදිට්ඨි යන ද්විවිධ) සම්‍යක් දෘෂ්ටිය පූර්වඞ්ගම වෙයි. කිසෙයින් මහණෙනි, සම්‍යග්දෘෂ්ටිය පූර්වඞ්ගම වෙයි යත් : මිථ්‍යාදෘෂ්ටිය 'මිථ්‍යාදෘෂ්ටි' යයි ලක්ෂණ ප්‍රති වේධයෙහි ලා ආරම්මණ වශයෙන් දනගනී. සම්‍යග්දෘෂ්ටිය (කෘත්‍යවශයෙන් අසම්මූඪ හෙයින්) දනගනී. මෙසේ ඒ දනුම ඔහුට සම්මාදිට්ඨි නම් වෙයි.

මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි කවර යත්: දුන් දය විපාක නැත, යජන ලදුයෙහි විපාක නැත. පුදන ලදුයෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක නැත, (පරලොවැ සිටියහුට) මේ ලොව නැත, (මෙලොවැ සිටියහුට) පරලොව නැත, (මව්පියන් කෙරෙහි සම්‍යක් ප්‍රතිපත්ති-මිථ්‍යා ප්‍රතිපත්තීන්ගේ ඵලාභාවයෙන්) මවු නැත. පියා නැත. (සැවැ උපදනා) ඕපපාතික සත්ත්වයෝ නැත, ලොවැ යම් කෙනෙක් මෙ ලොවත් පර ලොවත් විශිෂ්ටඥානයෙන් තුමූ මැ ප්‍රත්‍යක්ෂ කොට දන ප්‍රකාශ කෙරෙත් ද, එබඳු සම්‍ය ග්ගත සම්‍යක්ප්‍රතිපන්න ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් නැතැ'යි. මහණෙනි, මේ මිථ්‍යා දෘෂ්ටි නම් වෙයි.

මහණෙනි, සම්‍යක්දෘෂ්ටි කවර යත් : මහණෙනි, මම සම්‍යග්දෘෂ්ටියත් දෙ පරිදි කොට කියමි. මහණෙනි, සාස්‍රව වූ පුණ්‍යභාගිය වූ උපධි සංඛ්‍යාත විපාකය දෙන සම්‍යග්දෘෂ්ටි යක් ඇත. මහණෙනි, ආර්‍ය්‍ය වූ අනාස්‍රව වූ ලෝකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යග්දෘෂ්ටියක් ඇති.

මහණෙනි, සාස්‍රව වූ පුණ්‍යභාගිය වූ උපධි විපාකය දෙන සම්‍යග්දෘෂ්ටි කවර යත්: දුන් දය විපාක ඇත. යජන ලදුයෙහි විපාක ඇත. පුදන ලදුයෙහි විපාක ඇත. සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක ඇත. මෙලොව ඇත. පරලොව ඇත. මවු ඇත. පියා ඇත, උපදනා ඕපපාතික සත්ත්වයෝ ඇත, ලොවැ යම් කෙනෙක් මෙලොවත් පරලොවත් විශිෂ්ටඥානයෙන් තුමූ මැ ප්‍රත්‍යක්ෂ කොට දන ප්‍රකාශ කෙරෙත් ද, එබඳු සම්‍යග්ගත සම්‍යක් ප්‍රතිපන්න ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතැ'යි. මහණෙනි, මේ සාස්‍රව පුණ්‍ය භාගී වූ උපධි සංඛ්‍යාත විපාකය දෙන සම්මාදිට්ඨි නම් වෙයි.

කතමා ච භික්ඛවෙ, සම්මාදිට්ඨි අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා: යා ඛො භික්ඛවෙ, අරියචිත්තස්ස අනාසවචිත්තස්ස අරියමග්ගසමඞ්ගිනො අරියමග්ගං භාවයතො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො සම්මාදිට්ඨි මග්ගඞ්ගං[1] අයං වුච්චති භික්ඛවෙ සම්මාදිට්ඨි අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා. සො[2] මිච්ඡාදිට්ඨියා පහානාය වායමති සම්මාදිට්ඨියා උපසම්පදාය. ස්වාස්ස[3] හොති සම්මාවායාමො. සො සතො මිච්ඡාදිට්ඨිං පජහති. සතො සම්මාදිට්ඨිං උපසම්පජ්ජ විහරති. සාස්ස හොති සම්මාසති. ඉතිස්සිමෙ[4] තයො ධම්මා සම්මාදිට්ඨිං අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාවායාමො සම්මාසති.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: මිච්ඡාසඞ්කප්පං මිච්ඡාසඞ්කප්පොති පජානාති සම්මාසඞ්කප්පං සම්මාසඞ්කප්පොති පජානාති. සාස්ස හොති සම්මාදිට්ඨි.

කතමො ච භික්ඛවෙ, මිච්ඡාසඞ්කප්පො: කාමසඞ්කප්පො, ව්‍යාපාදසඞ්කප්පො, විහිංසාසඞ්කප්පො. අයං භික්ඛවෙ, මිච්ඡාසඞ්කප්පො.

කතමො ච භික්ඛවෙ, සම්මාසඞ්කප්පො: සම්මාසඞ්කප්පම්ප'හං[5] භික්ඛවෙ, ද්වයං[6] වදාමි. අත්ථි භික්ඛවෙ, සම්මාසඞ්කප්පො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො, අත්ථි භික්ඛවෙ, සම්මාසඞ්කප්පො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො.

කතමො ච භික්ඛවෙ, සම්මාසඞ්කප්පො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො: නෙක්ඛම්මසඞ්කප්පො අව්‍යාපාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො. අයං භික්ඛවෙ, සම්මාසඞ්කප්පො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො.

කතමො ච භික්ඛවෙ, සම්මාසඞ්කප්පො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො: යො ඛො භික්ඛවෙ, අරියචිත්තස්ස අනාසවචිත්තස්ස අරියමග්ගසමඞ්ගිනො අරියමග්ගං භාවයතො තක්කො විතක්කො සඞ්කප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා වචීසඞ්ඛාරො. අයං භික්ඛවෙ, සම්මාසඞ්කප්පො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො. සො මිච්ඡාසඞ්කප්පස්ස පහානාය වායමති සම්මාසඞ්කප්පස්ස උපසම්පදාය. ස්වාස්ස[3] හොති සම්මාවායාමො. සො සතො මිච්ඡාසඞ්කප්පං පජහති. සතො සම්මාසඞ්කප්පං උපසම්පජ්ජ විහරති. සා'ස්ස හොති සම්මාසති. ඉතිස්සි'මෙ[4] තයො ධම්මා සම්මාසඞ්කප්පං අනුපරිධාවන්ති. අනුපරිවත්තන්ති. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාවායාමො සම්මාසති.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: මිච්ඡාවාචං මිච්ඡාවාචාති පජානාති. සම්මාවාචං සම්මාවාචාති පජානාති. සා'ස්ස හොති සම්මාදිට්ඨි.

---

1. මග්ගඞ්ගා - සීමු, PTS.
2. යො - PTS.
3. සාස්ස - සීමු.
4. { ඉතියිමෙ - මජ්ඣං. / ඉතිමෙ - සීමු.
5. සම්මාසඞ්කප්පම්පාහං - සීමු.
6. ද්වායං - මජ්ඣං
7. සාස්ස - සීමු, PTS.

මහණෙනි, ආර්‍ය වූ අනාස්‍රව වූ ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්මාදිට්ඨි කවර යත්: මහණෙනි, ආර්‍ය සිත් ඇති අනාස්‍රව සිත් ඇති ආර්‍යමාර්ගසමඞ්ගී වූ ආර්‍යමාර්ගය වඩනුවහු ගේ යම් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් මාර්ගාඞ්ගයෙක් ඇද්ද, මහණෙනි, මේ ආර්‍ය වූ අනාස්‍රව වූ ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්මාදිට්ඨි යයි කියනු ලැබේ. ඒ මහණ මිථ්‍යාදෘෂ්ටි ප්‍රහාණය පිණිස සම්‍යග්දෘෂ්ටි ප්‍රතිලාභය පිණිස වෑයම් කෙරෙයි. ඒ වෑයම ඔහුට සම්මාවායාම වෙයි. හේ ස්මෘතියෙන් සමන්වාගත ව මිථ්‍යාදෘෂ්ටිය දුරු කෙරෙයි. ස්මෘතිමත් ව සම්‍යග් දෘෂ්ටිය උපදවා වෙසෙයි. ඒ ස්මෘතිය ඔහුට සම්මාසති වෙයි. මෙසේ ඔහුට මේ තුන් ධර්මයෝ සම්‍යග්දෘෂ්ටිය අනුපරිධාවන කෙරෙති. (සහජාත ද පුරෙජාත ද වී) පරිවාර වෙත්. ඒ කවර තුන් දහම්හ යත් : සම්මාදිට්ඨි සම්මා වායාම සම්මාසති යන මොහු යි.

මහණෙනි, එහි ලා සම්‍යග්දෘෂ්ටි පූර්වාඞ්ගමවෙයි. මහණෙනි, කි සෙයින් සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි යත් : මිථ්‍යාසඞ්කල්පය 'මිථ්‍යාසඞ්කල්ප' යයි. (ලක්ෂණ ප්‍රතිවෙධයෙහි ලා අරමුණු විසින්) දැනගනී. සම්‍යක්සඞ්කල්පය 'සම්‍යක්සඞ්කල්ප' යයි දැනගනී, ඔහුට ඒ දැනුම සම්මාදිට්ඨි නම් වෙයි.

මහණෙනි මිථ්‍යාසඞ්කල්ප කවරෙ යත් : කාමසඞ්කල්ප ව්‍යාපාදසඞ්කල්ප විහිංසා සඞ්කල්ප යි. මහණෙනි, මේ මිථ්‍යාසඞ්කල්ප නම්.

මහණෙනි, සම්‍යක්සඞ්කල්ප කවරෙ යත් : මහණෙනි, මම සම්‍යක්සඞ්කල්පයත් දෙ පරිදි කොට කියමි. මහණෙනි, සාස්‍රව වූ පුණ්‍යභාගිය වූ උපධිවිපාක දෙන සම්‍යක් සඞ්කල්පයෙක් ඇත. මහණෙනි, ආර්‍ය අනාස්‍රව ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යක් සඞ්කල්පයෙක් ඇති.

මහණෙනි, සාස්‍රව පුණ්‍යභාගිය උපධිවිපාක දෙන සම්‍යක් සඞ්කල්ප කවරෙ යත් : නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප අව්‍යාපාදසඞ්කල්ප අවිහිංසාසඞ්කල්ප යි. මහණෙනි, මේ සම්‍යක් සඞ්කල්පය සාස්‍රව යෑ පුණ්‍යභාගිය යෑ උපධිවිපාක දෙන්නේ යි.

මහණෙනි, ආර්‍ය අනාස්‍රව ලෝකෝත්තර මාර්ගාඞ්ග වූ සම්‍යක්සඞ්කල්ප කවරෙ යත්: මහණෙනි, ආර්‍ය සිත් ඇති අනාස්‍රව සිත් ඇති ආර්‍යමාර්ගසමඞ්ගී වූ ආර්‍යමාර්ගය වඩනුවහු ගේ යම් තර්කයෙත් විතර්කයෙත් සඞ්කල්පයෙක් සිත අරමුණෙහි පිහිටුවීමෙක් වෙසෙසින් පිහිටුවීමෙක් සිත අරමුණට නැංවීමෙක් වාක්සංස්කාරයෙක් වේ ද, මහණෙනි, මේ සම්‍යක්සංකල්පය ආර්‍ය යෑ අනාස්‍රව යෑ ලොකොත්තර යෑ මාර්ගාඞ්ග යි. ඒ මහණ මිථ්‍යාසඞ්කල්පයා ගේ, ප්‍රහාණයට වෑයම් කරයි, සම්‍යක්සඞ්කල්පයා ගේ ප්‍රතිලාභයට වෑයම් කරයි. ඒ ව්‍යායාමය ඔහුට සම්මාවායාම වෙයි. හේ ස්මෘතිමත් වූයේ මිථ්‍යාසඞ්කල්පය දුරලයි. ස්මෘතිමත් වූයේ සම්‍යක්සඞ්කල්පය උපදවා වෙසෙයි. ඔහුට ඒ ස්මෘතිය සම්මාසති වෙයි. මෙසේ මේ තුන් ධර්මයෝ (සහජාත ද පුරෙජාත ද වී) සම්‍යක් සඞ්කල්පය අනුව යෙති. අනුව වැටෙත්, ඒ කවර තුන් දහම්හ යත් : සම්මාදිට්ඨි සම්මාවයාම සම්මාසති යන මොහු යි.

මහණෙනි ඒ (ආර්‍ය සම්‍යක් සමාධියෙහි) ලා සම්‍යක්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි. කිසෙයින් මහණෙනි, සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි යත් : මිථ්‍යාවචනය 'මිථ්‍යාවචන' යයි දැනගනී. සම්‍යග්වචනය 'සමග්වචන' යයි දැනගනී. ඒ දැනුම ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි.

කතමා ච භික්ඛවෙ, මිච්ඡාවාචා: මුසාවාදො පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො. අයං භික්ඛවෙ මිච්ඡාවාචා.

කතමා ච භික්ඛවෙ සම්මාවාචා: සම්මාවාචම්ප'හං භික්ඛවෙ, ද්වයං වදාමි. අත්ථි භික්ඛවෙ, සම්මාවාචා සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා, අත්ථි භික්ඛවෙ, සම්මාවාචා අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා.

කතමා ච භික්ඛවෙ, සම්මාවාචා සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා: මුසාවාදා වෙරමණී, පිසුනාය වාචාය වෙරමණී. ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී. අයං භික්ඛවෙ, සම්මාවාචා සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා.

කතමා ච භික්ඛවෙ, සම්මාවාචා අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා: යා ඛො භික්ඛවෙ, අරියචිත්තස්ස අනාසවචිත්තස්ස අරියමග්ගසමඞ්ගිනො අරියමග්ගං භාවයතො චතූහිපි වචීදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී. අයං භික්ඛවෙ, සම්මාවාචා අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා. සො මිච්ඡාවාචාය පහානාය වායමති, සම්මාවාචාය උපසම්පදාය. ස්වාස්ස[1] හොති සම්මාවායාමො. සො සතො මිච්ඡාවාචං පජහති. සතො සම්මාවාචං උපසම්පජ්ජ විහරති. සාස්ස හොති සම්මාසති. ඉතිස්සිමෙ[2] තයො ධම්මා සම්මාවාචං අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති. සෙය්‍යථීදං : සම්මාදිට්ඨි, සම්මාවායාමො, සම්මාසති.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: මිච්ඡාකම්මන්තං මිච්ඡාකම්මන්තොති පජානාති සම්මාකම්මන්තං සම්මාකම්මන්තොති පජානාති. සාස්ස හොති සම්මාදිට්ඨි.

කතමො ච භික්ඛවෙ, මිච්ඡාකම්මන්තො: පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො. අයං භික්ඛවෙ, මිච්ඡාකම්මන්තො.

කතමො ච භික්ඛවෙ, සම්මාකම්මන්තො: සම්මාකම්මන්තම්පහං භික්ඛවෙ, ද්වයං වදාමි. අත්ථි භික්ඛවෙ, සම්මාකම්මන්තො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො. අත්ථි භික්ඛවෙ සම්මාකම්මන්තො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො.

කතමො ච භික්ඛවෙ, සම්මාකම්මන්තො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො: පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී. අයං භික්ඛවෙ සම්මාකම්මන්තො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො.

කතමො ච භික්ඛවෙ, සම්මාකම්මන්තො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො: යා ඛො භික්ඛවෙ, අරියචිත්තස්ස අනාසවචිත්තස්ස අරියමග්ගසමඞ්ගිනො අරියමග්ගං භාවයතො තීහිපි කායදුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී. අයං භික්ඛවෙ, සම්මාකම්මන්තො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො. සො මිච්ඡාකම්මන්තස්ස පහානාය වායමති, සම්මාකම්මන්තස්ස උපසම්පදාය. ස්වා'ස්ස හොති සම්මාවායාමො. සො සතො මිච්ඡාකම්මන්තං පජහති. සතො සම්මාකම්මන්තං උපසම්පජ්ජ විහරති. සා'ස්ස හොති සම්මාසති. ඉති'ස්සිමෙ[1] තයො ධම්මා සම්මාකම්මන්තං අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාවායාමො සම්මාසති.

1. සාස්ස - සීමු.
2. ඉතිසිමෙ - මජසං.

මහණෙනි, මිථ්‍යාවාක් කවර යත් : මෘෂාවාද පිශුනවාක් පරුෂවාක් ප්‍රලාප යැ, මහණෙනි, මේ මිථ්‍යාවාක් නම.

මහණෙනි, සම්‍යග්වචන කවරෙ යත් : මහණෙනි, මම සම්‍යග්වචන ද දෙපරිදි කොට කියමි : මහණෙනි, සාස්‍රව වූ පුණ්‍ය කොටසෙහි වූ උපධිවිපාක දෙන සම්‍යග්වචනයෙක් ඇත. මහණෙනි, ආර්‍ය්‍ය වූ අනාස්‍රව ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යග්වචනයෙක් ඇති.

මහණෙනි, සාස්‍රව පුණ්‍ය කොටසෙහි වූ උපධි විපාක දෙන සම්‍යග්වචන කවරෙ යත්; මුසවායෙන් වෙන්වීම යැ, පිසුනුබසින් වෙන්වීම යැ, පරොස්බසින් වෙන්වීම යැ, ප්‍රලාපයෙන් වෙන්වීම යි. මහණෙනි, මේ සම්‍යග්වචනය සාස්‍රව යැ, පුණ්‍යභාගයෙහි වූයෙ යැ උපධිවිපාක දෙනුයේ යි.

මහණෙනි, ආර්‍ය්‍ය වූ අනාස්‍රව ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යග්වචන කවරෙ යත් : මහණෙනි, ආර්‍ය්‍ය සිත් ඇති අනාස්‍රව සිත් ඇති ආර්‍ය්‍යමාර්ගසමඞ්ගී වූ ආර්‍ය්‍ය මාර්ගය වඩනු වහුගේ සිව්වැදෑරුම් වාග්දුශ්චරිතයෙන් ම යම් දුරුවීමෙක් වෙන්වීමෙක් නැවැත්මෙක් විරමණයෙක් ඇද්ද මහණෙනි, මේ සම්‍යග්වචනය ආර්‍ය්‍ය යැ, අනාස්‍රව යැ ලොකොත්තර යැ, මාර්ගාඞ්ග යි. ඒ මහණ මිථ්‍යාවචනයාගේ ප්‍රහාණයට සම්‍යග්වචනයාගේ ප්‍රතිලාභයට වෑයම් කෙරෙයි, ඒ වෑයම ඔහුට සම්මාවායාම වෙයි. හේ ස්මෘතිමත් වූයේ මිථ්‍යාවාක් දුරලයි, ස්මෘතිමත් වූයේ සම්‍යග්වචනය උපදවා වෙසෙයි. ඒ ස්මෘතිය ඔහුට සම්මාසති වෙයි, මෙසේ මේ තුන් දහම්හු සම්‍යග්වචනය අනුව යෙති, අනුව වැටෙත්, ඔහු කවරහ යත් : සම්‍යග්දෘෂ්ටි සම්‍යග්ව්‍යායාම සම්‍යක්ස්මෘති යන මොහු යි.

මහණෙනි, ඒ සම්‍යක්සමාධියෙහි ලා සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි. මහණෙනි, කිසෙයින් සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි යත් : මිථ්‍යාකර්මාන්තය මිථ්‍යාකර්මාන්ත යැයි දනගනී, සම්‍යක්කර්මාන්තය සම්‍යක්කර්මාන්ත යැ යි දන ගනී, ඒ දැනුම ඔහුට සම්මා දිට්ඨි වෙයි.

මහණෙනි, මිථ්‍යා කර්මාන්ත කවරෙ යත් : පරපණ නැසුම යැ, අයිනාදන් ගැනුම යැ, කාමයෙහි මිසහසර යි. මහණෙනි, මේ මිථ්‍යා කර්මාන්ත යි.

මහණෙනි සම්‍යක්කර්මාන්ත කවරෙ යත් : මහණෙනි, මම සම්‍යක්කර්මාන්තයත් දෙපරිදි කොට කියමි : මහණෙනි, සාස්‍රව වූ පුණ්‍යභාගයෙහි වූ උපධි විපාක දෙන සම්‍යක් කර්මාන්තයෙක් ඇත. මහණෙනි, ආර්‍ය්‍ය වූ අනාස්‍රව ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යක් කර්මාන්තයෙක් ඇති.

මහණෙනි, සාස්‍රව වූ පුණ්‍යභාගිය වූ උපධිවිපාක දෙන සම්‍යක්කර්මාන්තය කවරෙ යත් : පරපණ නැසීමෙන් වැළැකීම යැ අයිනාදතින් වැළැකීම යැ කාමයෙහි මිසහසරින් වැළැකීම යැ. මහණෙනි, මේ ආස්‍රව සහිත පුණ්‍යභාගයෙහි වූ උපධි විවා දෙන සම්‍යක් කර්මාන්ත යි.

මහණෙනි, ආර්‍ය්‍ය වූ අනාස්‍රව වූ ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යක්කර්මාන්තය කවරෙ යත් : මහණෙනි, ආර්‍ය්‍ය සිත් ඇති අනාස්‍රව සිත් ඇති ආර්‍ය්‍යමාර්ගසමඞ්ගී වූ ආර්‍ය්‍යමාර්ගය වඩනුවහු ගේ තුන් කායදුශ්චරිතයෙන් ම යම් දුරුවීමෙක් වෙන්වීමෙක් නැවැත්මෙක් විරමණයෙක් ඇද්ද මහණෙනි, මේ සම්‍යක්කර්මාන්තය ආර්‍ය්‍ය යැ අනාස්‍රව යැ ලොකොත්තර යැ මාර්ගාඞ්ග යි. ඒ මහණ මිථ්‍යාකර්මාන්තයා ගේ ප්‍රහාණය පිණිස සම්‍යක්කර්මාන්තයා ගේ ප්‍රතිලාභය පිණිස වෑයම් කෙරෙයි. ඒ වෑයම ඔහුට සම්මා වායාම වෙයි, හේ ස්මෘතිමත් ව මිථ්‍යාකර්මාන්තය දුරලයි ස්මෘතිමත් ව සම්‍යක්කර්මාන්තය උපදවා වෙසෙයි. ඒ ස්මෘතිය ඔහුට සම්මාසති වෙයි. මෙසේ මේ තුන් දහම්හු සම්‍යක් කර්මාන්තය අනුව යෙති, අනුව වැටෙත්. ඔහු කවරහ යත් ; සම්‍යග්දෘෂ්ටි සම්‍යග්ව්‍යායාම සම්‍යක්ස්මෘති යන මොහු යි.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: මිච්ඡාආජීවං මිච්ඡාආජීවොති පජානාති. සම්මාආජීවං සම්මාආජීවොති පජානාති. සාස්ස හොති සම්මාදිට්ඨි.

කතමො ච භික්ඛවෙ, මිච්ඡාආජීවො: කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා[1] අයං භික්ඛවෙ, මිච්ඡාආජීවො.

කතමො ච භික්ඛවෙ, සම්මාආජීවො: සම්මාආජීවම්පහං භික්ඛවෙ, ද්වයං වදාමි. අත්ථි භික්ඛවෙ, සම්මාආජීවො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො, අත්ථි භික්ඛවෙ, සම්මාආජීවො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො.

කතමො ච භික්ඛවෙ, සම්මාආජීවො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො: ඉධ භික්ඛවෙ, අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති. අයං භික්ඛවෙ, සම්මා ආජීවො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කො.

කතමො ච භික්ඛවෙ, සම්මාආජීවො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො: යා ඛො භික්ඛවෙ, අරියචිත්තස්ස අනාසවචිත්තස්ස අරියමග්ගසමඞ්ගිනො අරියමග්ගං භාවයතො මිච්ඡාආජීවා ආරති විරති පටිවිරති වෙරමණී. අයං භික්ඛවෙ, සම්මාආජීවො අරියො අනාසවො ලොකුත්තරෙ මග්ගඞ්ගො. සො මිච්ඡාආජීවස්ස පහානාය වායමති. සම්මා ආජීවස්ස උපසම්පදාය. ස්වාස්ස[2] හොති සම්මාවායාමො. සො සතො මිච්ඡාආජීවං පජහති. සතො සම්මාආජීවං උපසම්පජ්ජ විහරති. සා'ස්ස හොති සම්මාසති. තස්සිමෙ තයො ධම්මා සම්මාආජීවං අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති. සෙය්‍යථීදං : සම්මාදිට්ඨි, සම්මාවායාමො, සම්මාසති.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති: සම්මාදිට්ඨිස්ස භික්ඛවෙ, සම්මාසඞ්කප්පො පහොති සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති. සම්මාවාචස්ස සම්මාකම්මන්තො පහොති. සම්මාකම්මන්තස්ස සම්මාආජීවො පහොති. සම්මාආජීවස්ස සම්මාවායාමො පහොති. සම්මාවායාමස්ස සම්මාසති පහොති. සම්මාසතිස්ස සම්මාසමාධි පහොති. සම්මාසමාධිස්ස සම්මාඤාණං පහොති. සම්මාඤාණස්ස සම්මාවිමුත්ති පහොති. ඉති ඛො භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතො සෙඛො[3] දසඞ්ගසමන්නාගතො අරහා හොති.

තත්‍ර භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. කථඤ්ච භික්ඛවෙ, සම්මාදිට්ඨි පුබ්බඞ්ගමා හොති. සම්මාදිට්ඨිස්ස භික්ඛවෙ, මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසඞ්කප්පස්ස භික්ඛවෙ, මිච්ඡාසඞ්කප්පො නිජ්ජිණ්ණො හොති, යෙ ච මිච්ඡාසඞ්කප්පපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාසඞ්කප්පපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

---

1. නිජිගීසනතා - මජ්ඣං.
2. සොස්ස - සීමු, PTS.
3. සෙක්ඛො - මජ්ඣං. / සෙඛො පටිපදෙ - PTS.

මහණෙනි, ඒ ආර්‍ය සම්‍යක් සමාධියෙහි ලා සම්‍යග්දෘෂ්ටිය පූර්වඞ්ගම වෙයි, මහණෙනි, කිසෙයින් සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි යත් : මිථ්‍යාආජීවය මිථ්‍යාආජීවය යි දන ගනී. සම්‍යග්ආජීවය සම්‍යගාජීවය'යි දනගනී. ඔහුට ඒ දනුම සම්මාදිට්ඨී වෙයි.

මහණෙනි, මිථ්‍යා ආජීව කවරෙ යත් : ත්‍රිවිධ කුහනවස්තුයෙන් ලොව විස්මයපත් කිරීම යැ ලාභසත්කාරාශායෙන් බිණීම යැ නිමිත්තයීලි බව යැ නිෂ්පෙසික බව යැ ලාභයෙන් ලාභ සොයන බව යැ යන මේ මහණෙනි මිථ්‍යාජීව නම් වෙයි.

මහණෙනි, සම්‍යගාජීව කවරෙ යත් : මහණෙනි, මම සම්‍යගාජීවයත් දෙවැදෑරුම් කොට කියමි : මහණෙනි, සාශ්‍රව පුණ්‍යභාගිය වූ උපධිවිපාක උපදවන සම්‍යගාජීවයෙක් ඇත. මහණෙනි, ආර්‍ය අනාශ්‍රව වූ ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යගාජීවයෙක් ඇති.

මහණෙනි, සාශ්‍රව පුණ්‍යභාගිය වූ උපධිවිපාක උපදවන සම්‍යගාජීවය කවරෙ යත් : මහණෙනි, මෙ සස්නෙහි ආර්‍යශ්‍රාවක මිථ්‍යාආජීවය හැරපියා සම්‍යගාජීවයෙන් ජීවිකාව කෙරෙයි. මහණෙනි, මේ සම්‍යගාජීවය සාශ්‍රව යැ පුණ්‍යභාගිය යැ උපධිවිපාක දෙනුයේ යි.

මහණෙනි, ආර්‍ය අනාශ්‍රව වූ ලොකොත්තර මාර්ගාඞ්ග වූ සම්‍යගාජීවය කවරෙ යත් : මහණෙනි, ආර්‍ය සිත් ඇති අනාශ්‍රව සිත් ඇති ආර්‍යමාර්ගසමඞ්ගී වූ ආර්‍යමාර්ගය වඩනුවහු ගේ මිථ්‍යාආජීවයෙන් යම් දුරුවීමෙක් වෙන්වීමෙක් නැවැත්මෙක් විරමණයෙක් වේ ද, මහණෙනි, මේ සම්‍යගාජීවය ආර්‍ය යැ අනාශ්‍රව යැ ලොකොත්තර යැ මාර්ගඞ්ග යි. ඒ මහණ මිථ්‍යාආජීවයා ගේ ප්‍රහාණයට සම්‍යගාජීවයා ගේ ප්‍රතිලාභයට වැයම් කෙරෙයි. ඔහුගේ ඒ වැයම සම්මාවායාම වෙයි. හේ ස්මෘතිමත් ව මිථ්‍යාජීවය දුරු කෙරෙයි. ස්මෘතිමත් ව සම්‍යගාජීවයට පැමිණ වෙසෙයි, ඒ ස්මෘතිය ඔහුට සම්මාසති වෙයි. මෙසේ මේ තුන් දහම්හු සම්‍යගාජීවය අනුව යෙති, අනුව වැටෙත්. ඔහු කවරහ යත් : සම්‍යග් දෘෂ්ටි සම්‍යග්ව්‍යායාම සම්‍යක්ස්මෘති යන මොහු යි.

මහණෙනි, ඒ ආර්‍ය සම්‍යක්සමාධියෙහි ලා සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි. කිසෙයින් මහණෙනි, සම්‍යග්දෘෂ්ටි පූර්වඞ්ගම වෙයි යත් : මහණෙනි, මාර්ගසම්‍යග් දෘෂ්ටියෙහි සිටි පුහුල්හට මාර්ගසම්‍යක්සඞ්කල්පය පොහොනේ වෙයි. සම්‍යක් සඞ්කල්පයෙහි සිටියහුට සම්‍යග්වාචා පොහොනේ වෙයි. සම්‍යග්වචනයෙහි සිටියහුට සම්‍යක්කර්මාන්තය පොහොයි. සම්‍යක්කර්මාන්තයෙහි සිටියහුට සම්‍යගාජීවය පොහොයි. සම්‍යගාජීවයෙහි සිටියහුට සම්‍යග්ව්‍යායාමය පොහොනේ වෙයි. සම්‍යග් ව්‍යායාමයෙහි සිටියහුට සම්‍යක්සමාධිය පොහොනේ වෙයි. සම්‍යක්සමාධියෙහි සිටි පුහුල්හට ප්‍රත්‍යවෙක්ෂණ සංඛ්‍යාත සම්‍යග්ඥනය පොහොයි. ප්‍රත්‍යවෙක්ෂණ සම්‍යග් ඥනයෙහි සිටි පුහුල් හට සම්‍යග්විමුක්තිය පොහොනේ වෙයි. මහණෙනි, මෙසෙයින් ශෛක්ෂ අෂ්ටාඞ්ග සමන්වාගත වෙයි. රහත්හු දශාඞ්ග සමන්වාගත වෙත්.

මහණෙනි ඒ ආර්ය සම්‍යක්සමෘධියෙහි ලා සම්‍යග්දෘෂ්ටිය පූර්වඞ්ගම වෙයි. මහණෙනි, කෙසෙයින් සම්‍යග්දෘෂ්ටිය පූර්වඞ්ගම වෙයි යත් : මහණෙනි, සම්‍යග් දෘෂ්ටියෙහි සිටි පුහුල් හට මිථ්‍යාදෘෂ්ටි නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාදෘෂ්ටිහෙතුයෙන් යම් ලාමක වූ අනෙක අකුශලධර්මයෝ වෙත් ද, ඔහුදු නිර්ජීර්ණ වෙත්. යළි සම්‍යග්දෘෂ්ටි හෙතුයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යක්සඞ්කල්පයෙහි සිටි පුහුල් හට මිථ්‍යාසඞ්කල්පය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාසඞ්කල්පහෙතුයෙන් නොයෙක් ලාමක වූ අකුශලධර්මයෝ වෙත් ද, ඔහුදු නිර්ජීර්ණවෙත්. සම්‍යක්සඞ්කල්ප හෙතුයෙනුදු නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

සම්මාවාචස්ස භික්ඛවෙ, මිච්ඡාවාචා නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාවාචාපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවාචාපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාකම්මන්තස්ස භික්ඛවෙ, මිච්ඡාකම්මන්තො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාකම්මන්තපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාකම්මන්තපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාආජීවස්ස භික්ඛවෙ, මිච්ඡාආජීවො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාආජීවපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාආජීවපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මවායාමස්ස භික්ඛවේ, මිච්ඡාවායාමො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාවායාමපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවායාමපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසතිස්ස භික්ඛවෙ, මිච්ඡාසති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාසතිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති; තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාසතිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසමාධිස්ස භික්ඛවෙ, මිච්ඡාසමාධි නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡා සමාධිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාසමාධිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාඤාණස්ස භික්ඛවෙ, මිච්ඡාඤාණං නිජ්ජිණ්ණං හොති. යෙ ච මිච්ඡාඤාණපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාඤාණපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාවිමුත්තස්ස භික්ඛවෙ, මිච්ඡාවිමුත්ති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවිමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

ඉති ඛො භික්ඛවෙ, වීසති කුසලපක්ඛා වීසති අකුසලපක්ඛා, මහාචත්තාරීසකො ධම්මපරියායො පවත්තිතො අප්පතිවත්තියො, සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා, මාරෙන වා, බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

මහණෙනි, සම්‍යග්වචනයෙහි සිටි පුහුල් හට මිථ්‍යාවාක් නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාවාක් හෙතුයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ වෙත් ද, ඔහුදු නිර්ජීර්ණ වෙත්. යළි සම්‍යග්වාචා හෙතුයෙන් නොයෙක් කුශලධර්මයෝ වැඩීමෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යක්කර්මාන්තයෙහි සිටි පුහුල් හට මිථ්‍යාකර්මාන්තය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාකර්මාන්තප්‍රත්‍යයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ වෙත් ද, ඔහුදු නිර්ජීර්ණ වෙත්. යළි සම්‍යක්කර්මාන්තප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යගාජීවයෙහි සිටි පුහුල් හට මිථ්‍යාජීවය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාජීව ප්‍රත්‍යයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ සම්භව වෙත් ද, ඔහුදු නිර්ජීර්ණ වූවාහු වෙත්. සම්‍යගාජීවප්‍රත්‍යයෙහුදු නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යග්ව්‍යායාමයෙහි සිටි පුහුල් හට මිථ්‍යාව්‍යායාමය නිර්ජීර්ණ වූයේ වෙයි. මිථ්‍යාව්‍යායාමප්‍රත්‍යයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ සම්භව වෙත් ද, ඔහුදු නිර්ජීර්ණ වූවාහු වෙත්. යළි සම්‍යග්ව්‍යායාමප්‍රත්‍යයෙන් නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යක්සමෘතියෙහි සිටි පුහුල් හට මිථ්‍යාස්මෘතිය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාස්මෘතිප්‍රත්‍යයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ සම්භව වෙත් ද, ඒඅකුශලයෝ ද ඔහුට නිර්ජීර්ණ වූවාහු වෙත්. යළි සම්‍යක්ස්මෘති ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යක්සමාධියෙහි සිටි පුහුල් හට මිථ්‍යාසමාධිය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාසමාධි හෙතුයෙන් යම් නොයෙක් පාපක අකුශලධර්මයෝ වෙත් ද, ඔහුදු ඔහුට නිර්ජීර්ණ වූවාහු වෙත්. යළි සම්‍යක්සමාධිහෙතුයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යග්ඥානයෙහි සිටි පුහුල් හට මිථ්‍යාඥානය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යා ඥාන ප්‍රත්‍යයෙන් යම් නොයෙක් පාපක අකුශල ධර්මයෝ වෙත් ද, ඔහුදු ඔහුට නිර්ජීර්ණ වෙත්. යළි සම්‍යග්ඥාන හෙතුයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, සම්‍යග්විමුක්තියෙහි සිටි පුහුල් හට මිථ්‍යාවිමුක්තිය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාවිමුක්ති හෙතුයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් ද, ඔහුදු ඔහුට නිර්ජීර්ණ වූවාහු වෙත්, යළි සම්‍යග්විමුක්ති හෙතුයෙන් නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පිරීමට යෙත්.

මහණෙනි, මෙපරිද්දෙන් (සම්මාදිට්ඨී ආදි දස යැ, යළි සම්මාදිට්ඨී ප්‍රත්‍යයෙන් අනෙක කුශලධර්මයෝ වෙති ' යි ආදීන් වදළ දස යැයි) කුශලපක්ෂයෙහි වූ විසි ධර්මයෝ යැ, ('මිච්ඡාදිට්ඨී නිජ්ජිණ්ණා හොති' යනාදීන් වදළ මිච්ඡාදිට්ඨී ආදි දස යැ, ''මිච්ඡාදිට්ඨී පච්චයා අනෙකෙ '' යනාදීන් වදළ දස යැයි) අකුශලපක්ෂයෙහි වූ විසි ධර්මයෝ යැ යන ශ්‍රමණයක්හු විසින් හෝ බ්‍රාහ්මණයක්හු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ නො පවත්වාලියැ හැකි මහාචත්තාරීසක ධර්මපර්යාය පවත්වන ලද්දේ යි.

යො හි කොචි භික්ඛවෙ, සමණො වා බ්‍රාහ්මණො වා ඉමං මහාචත්තාරීසකං ධම්මපරියායං ගරහිතබ්බං පටික්කොසිතබ්බං මඤ්ඤෙය්‍ය, තස්ස දිට්ඨෙව ධම්මෙ දස සහධම්මිකා වාදානුවාද ගාරය්හං ඨානං ආගච්ඡන්ති. සම්මාදිට්ඨිං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාදිට්ඨී සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා. තෙ හොතො පාසංසා. සම්මාසඞ්කප්පං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාසඞ්කප්පා සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා, තෙ හොතො පාසංසා. සම්මාවාචං චෙ භවං ගරහති, යෙ ච මිච්ඡාවාචා සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාකම්මන්තං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාකම්මන්තා සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාආජීවං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාආජීවා සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාවායාමං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාවායාමා සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාසතිං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාසතී සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාසමාධිඤ්චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාසමාධී සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාඤාණං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාඤාණී සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා. සම්මාවිමුත්තිං චෙ භවං ගරහති. යෙ ච මිච්ඡාවිමුත්තී සමණබ්‍රාහ්මණා, තෙ හොතො පුජ්ජා තෙ හොතො පාසංසා.

යො හි කොචි භික්ඛවෙ සමණො වා බ්‍රාහ්මණො වා ඉමං මහාචත්තාරීසකං ධම්මපරියායං ගරහිතබ්බං පටික්කොසිතබ්බං මඤ්ඤෙය්‍ය. තස්ස දිට්ඨෙව ධම්මෙ ඉමෙ දස සහධම්මිකා වාදානුවාද ගාරය්හං ඨානං ආගච්ඡන්ති.

යෙපි තෙ භික්ඛවෙ, අහෙසුං උක්කලා වස්සභඤ්ඤා[1] අහෙතුවාද අකිරියවාද නත්ථිකවාද, තෙපි මහාචත්තාරීසකං ධම්මපරියායං න ගරහිතබ්බං, න පටික්කොසිතබ්බං[2] මඤ්ඤිංසු.[3] තං කිස්ස හෙතු: නින්දාබ්‍යාරොසඋපාරම්භභයාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාචත්තාරීසක සුත්තං සත්තමං.

---

1. ඔක්කලා / වයභිඤ්ඤා = මජසං.
2. නපපටික්කොසිතබ්බං = මජසං.
3. මඤ්ඤෙය්‍යුං = මජසං - ස්‍ය - PTS

මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි බමුණෙක් වේවයි මේ මහාචත්තාරීසක ධර්ම පර්යාය ගැරැහියැ යුතු යැ, බැහැර කළ යුතු යයි සිතන්නේ නම්, දිටුදම්යෙහි මැ (පරා විසින් කී කරුණෙන්) සකාරණ ව ඔහු ගේ වාදනුවාදයෝ දස දෙනෙක් විඥයන් විසින් ගැරැහිය යුතු තැනට පැමිණෙත්. ඉදින් හවත් සම්‍යග්දෘෂ්ටිය ගරහා නම් යම් මැ මිසදිටු ගත් මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍යයෝ වෙති. ඔහු හවතුන් විසින් පසැස්ස මනා වෙති. ඉදින් හවත් සම්‍යක්සඞකල්ප ගරහා නම්, මිථ්‍යාසඞකල්ප ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යග්වචන ගරහා නම්, මිථ්‍යාවචන ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යක්කර්මාන්ත ගරහා නම්, මිථ්‍යාකර්මාන්ත ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යගාජීව ගරහා නම්, මිත්‍ථ්‍යාජීව ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යග්ව්‍යායාම ගරහා නම්, මිථ්‍යාව්‍යායාම ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යක්ස්මෘති ගරහා නම්, මිථ්‍යාස්මෘති ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යක්සමාධි ගරහා නම්, මිථ්‍යාසමාධි ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යග්ඥනය ගරහා නම් මිථ්‍යාඥන ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්. ඉදින් හවත් සම්‍යග්විමුක්ති ගරහා නම්, මිථ්‍යාවිමුක්ති ඇති යම් මැ මහණ බමුණු කෙනෙක් ඇද්ද, ඔහු හවතුන් විසින් පූජ්‍ය වෙති, ඔහු හවතුන් විසින් පැසැස්ස මනා වෙත්.

මහණෙනි, යම් කිසි මහණෙක් වේවයි බමුණෙක් වේවයි මේ මහාචත්තාරීසක ධර්ම ක්‍රමය ගැරැහියැ යුතු කොට පිළිකෙව් කළ යුතු කොට හඟනේ නම්, මෙලොව්හි මැ ඔහු ගේ මේ දස වාදනුවාදයෝ සකාරණ ව ගැරැහියැ යුතු තැනට එත්.

මහණෙනි, උක්කල දනව්වැසි අහෙතුවාද අක්‍රියවාද නාස්තිකවාද ඇති යම් වස්ස භඤ්ඤ නම් වාදී කෙනෙක් වූහු ද, ඔහුදු මහාචත්තාරීසක ධර්මපරියාය නො ගැරැහියැ යුතු සේ පිළිකෙව් නො කළයුතු සේ සිතූහු. ඒ කවර හෙයින යත් ? තමහට නින්දභය හා ගැටුම් බිය හා පරිභාෂණ බියෙනැ ' යි වදළහ.

භාග්‍යවතුන් වහන්සේ මේ මහාචත්තාරීසක සූත්‍රය වදළ සේක. ප්‍රීතිසොම්නස්‍යයන් විසින් ගත් සිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිමුඛ ව පිළිගත්හු.

**සත්වැනි මහාචත්තාරීසක සූත්‍ර යි.**

# 3. 2. 8

## ආනාපානසති සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ සම්බහුලෙහි අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං, ආයස්මතා ච සාරිපුත්තෙන ආයස්මතා ච මහාමොග්ගල්ලානෙන ආයස්මතා ච මහාකස්සපෙන ආයස්මතා ච මහාකච්චායනෙන ආයස්මතා ච මහාකොට්ඨිතෙන ආයස්මතා ච මහාකප්පිනෙන ආයස්මතා ච මහාචුන්දෙන ආයස්මතා ච අනුරුද්ධෙන ආයස්මතා ච රෙවතෙන ආයස්මතා ච ආනන්දෙන අඤ්ඤෙහි ච අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං.

තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛූ නවෙ භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ දසපි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ වීසම්පි[1] භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ තිංසම්පි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ චත්තාරීසම්පි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. තෙ ච නවා භික්ඛූ ථෙරෙහි භික්ඛූහි ඔවදියමානා අනුසාසියමානා උළාරං[2] පුබ්බෙනාපරං විසෙසං පජානන්ති.[3]

තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පන්නරසෙ පවාරණාය පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි : 'ආරද්ධොස්මි භික්ඛවෙ, ඉමාය පටිපදාය. ආරද්ධචිත්තොස්මි භික්ඛවෙ, ඉමාය පටිපදාය. තස්මාතිහ භික්ඛවෙ, භිය්‍යොසොමත්තාය විරියං ආරභථ අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉධෙවාහං සාවත්ථියං කොමුදිං චාතුමාසිනිං ආගමෙස්සාමීති.

අස්සොසුං ඛො ජානපදා භික්ඛූ : භගවා කිර තත්ථෙව සාවත්ථියං කොමුදිං චාතුමාසිනිං ආගමෙස්සතීති. තෙ ච ජානපදා භික්ඛූ සාවත්ථිං ඔසරන්ති භගවන්තං දස්සනාය. තෙ ච ඛො ථෙරා භික්ඛූ භිය්‍යොසොමත්තාය නවෙ භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ දසපි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ වීසම්පි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ තිංසම්පි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. අප්පෙකච්චෙ ථෙරා භික්ඛූ චත්තාරීසම්පි භික්ඛූ ඔවදන්ති අනුසාසන්ති. තෙ ච නවා භික්ඛූ ථෙරෙහි භික්ඛූහි ඔවදියමානා අනුසාසියමානා උළාරං පුබ්බෙනාපරං විසෙසං පජානන්ති.

---

1. වීසතිම්පි – PTS.
2. ඔළාරං – සයා.
3. ජානන්ති – සීමු, මජසං

# 3. 2. 8

# ආනාපානසති සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද නොහොත් මා ඇසූ හැටි මෙසේ යැ : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පුවරම් නම් මුවරමාපායෙහි හැම තැනැ ශීලාදී ගුණයෙන් පළට වූ බොහෝ ස්ථවිර ශ්‍රාවකයන් සමග වැඩවසන සේක. ආයුෂ්මත් සැරියුත් තෙරුන් ද, ආයුෂ්මත් මහමුගලන් තෙරුන් ද, ආයුෂ්මත් මහසුප් තෙරුන් ද, ආයුෂ්මත් මහකසයින් තෙරුන් ද, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් ද, ආයුෂ්මත් මහාකප්පින තෙරුන් ද, ආයුෂ්මත් මහාචුන්ද තෙරුන් ද, ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ද, ආයුෂ්මත් රෙවත තෙරුන් ද, ආයුෂ්මත් අනඳ තෙරුන් ද, අන්‍ය වූ මහත් ගුණයෙන් ප්‍රකට වූ ස්ථවිර ශ්‍රාවක භික්ෂූන් ද සමග පුවරම් මුවරමාපායෙහි වැඩවසන සේක.

තව ද එසමයෙහි ස්ථවිර භික්ෂූහු නවක පැවිද්දනට අවවාද අනුශාසනා කෙරෙති. ඇතැම් ස්ථවිර භික්ෂූහු පැවිද්දන් දසදෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. ඇතැම් ස්ථවිර භික්ෂූහු පැවිද්දන් විසි දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. ඇතැම් ස්ථවිර භික්ෂූහු පැවිද්දන් තිස්දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. ඇතැම් ස්ථවිර භික්ෂූහු පැවිද්දන් හතලිස් දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. තෙර මහණුන් විසින් අවවාද අනුශාසනා කරනු ලබන ඒ නවක භික්ෂූහු ශීලපරිපූරණාදී පූර්වවිශෙෂයෙන් වැඩි උදරතර අපර කෘත්ස්න පරිකර්මාදි විශේෂ දනිත්.

එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ එදවස් පොහොයැ පණුරැසියෙහි පවුරුණු ඇති සඳ පිරුණු මැදිපොහෝරැයැ භික්ෂුසංඝපරිවෘත ව අභ්‍යවකාශයෙහි වැඩහුන් සේක. එසඳ භාග්‍යවතුන් වහන්සේ නිහඬ නිහඬ ව හුන් මහණුන් බලා ඒ මහණුන් ඇමතූ සේක. "මහණෙනි, මේ ප්‍රතිපදයෙන් (මම්) ආරාධිතයෙමි. මහණෙනි, මේ ප්‍රතිපදයෙන් මම ඇරැයු සිතැතියෙමි. එහෙයින් මහණෙනි, නො පත් අර්හත්ඵලයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගත ඵලයා ගේ අධිගමය පිණිස නො පසක් කළ නිවන පසක් කරනු පිණිස වෙසෙසින් වියර්‍යාරම්භ කරවු, මම් මේ සැවතෙහි මැ පිපි කුමුදු ඇති චාතුමාසිනිය හෙවත් පශ්චිමකාර්තික පූර්ණිමාව දක්වා බලමි'යි වදළහ.

"භාග්‍යවතුන් වහන්සේ එ සැවැත්හි මැ කුමුදු ඇති ඉල්පොහොය දක්වා බලන සේක් ලැ "යි දනව්වැසි සඟහු ඇසූහු මැ ය. ඒ දනව්වැසි භික්ෂූහු බුදුන් දක්නට පැමිණෙත්. ඒ තෙර මහණහු වැඩි පමණින් නවක පැවිද්දනට අවවාද අනුශාසනා කෙරෙති. කිසි තෙර මහණ කෙනෙක් පැවිද්දන් දසදෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. කිසි තෙර මහණ කෙනෙක් පැවිද්දන් විසි දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති, කිසි තෙර මහණ කෙනෙක් පැවිද්දන් තිස්දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙති. කිසි තෙර මහණ කෙනෙක් පැවිද්දන් සතලිස්දෙනකුට ද අවවාද අනුශාසනා කෙරෙත්. තෙරමහණුන් විසින් අවවාද අනුශාසනා කරනු ලබන ඒ නවක භික්ෂූහු පූර්ව විශෙෂයට වඩා අපර වූ ශ්‍රොතාපත්ති ආදි උදර විශෙෂය වෙසෙසින් දනිත්.



16—ඒ 00502 (8/73)

තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පන්නරසෙ කොමුදියා චාතුමාසිනියා පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝ-පරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි : අපලාපායං භික්ඛවෙ, පරිසා. නිප්පලාපායං භික්ඛවෙ, පරිසා සුද්ධා සාරෙ පතිට්ඨිතා. තථාරූපො අයං භික්ඛවෙ, භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ, පරිසා. යථාරූපා පරිසා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. තථාරූපො අයං භික්ඛවෙ, භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ, පරිසා. යථාරූපාය පරිසාය අප්පං දින්නං බහුං[1] හොති, බහුං[1] දින්නං බහුතරං. තථාරූපො අයං භික්ඛවෙ, භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ, පරිසා. යථාරූපා පරිසා දුල්ලභා දස්සනාය ලොකස්ස. තථාරූපො අයං භික්ඛවෙ, භික්ඛුසඞ්ඝො. තථාරූපායං භික්ඛවෙ, පරිසා. යථාරූපං පරිසං අලං යොජනගණනානි දස්සනාය ගන්තුං පුටොසෙනාපි[2].

සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණ-භවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ.

සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ චතුන්නං සම්මප්පධානානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ, චතුන්නං ඉද්ධිපාදානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති, එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ පඤ්චන්නං බලානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ.

1. බහු - මජසං, ස්‍යා.
2. පුටංසෙනාපි - පු. ස්‍යා.

එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ එදින පොහොලත් පණුරස කුමුදු පිපි ඉල් පුණු පොහොද රැයැ බික්සඟන විසින් පිරිවරන ලදු ව අබවස හුන් සේක. එසඳ භාග්‍යවතුන් වහන්සේ නිහඬ නිහඬ ව හුන් බික්සඟන දක ඒ සඟුන් ඇමතූ සේක. “ මහණෙනි, මේ භික්ෂුපර්ෂත් නො සිස් යැ. මහණෙනි, මේ භික්ෂු පර්ෂත් නිෂ්ප්‍රලාප යැ, ශුද්ධ යැ, අධිගමසාරයෙහි පිහිටි යැ. සම්බුදු පිරිසෙක් ආහුනෙය්‍ය වේ ද, පාහුනය්‍ය වේ ද දක්ඛිණෙය්‍ය වේ ද අඤ්ජලිකරණිය වේ ද, ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වේ ද, මහණෙනි, මේ භික්ෂු සංඝ තෙමේ එබඳු යැ. මහණෙනි, මේ පිරිස එබඳු යැ යම්බඳු පිරිසක් කෙරෙහි දුන් ඇලුප් දනෙක් බොහෝ වේ ද, දුන් බොහෝ දනෙක් ඉබොහෝ වේ ද, මහණෙනි මේ, භික්ෂු සඞ්ඝ එබඳු යැ, මහණෙනි, මේ පිරිස එබඳු යැ. යම්බඳු පිරිසෙක් ලොකයා ගේ දර්ශනයට දුර්ලභ වේ ද, මහණෙනි, මේ භික්ෂුසංඝ එබඳු යැ, මහණෙනි, මේ පර්ෂත් එබඳු යැ. යම්බඳු පිරිසක් දක්නට යොදුන් දහසකුදු වුව මාර්ගොපකරණ ගෙනත් යන්නට නිසි වේ ද, මහණෙනි, මේ බික්සඟු එබන්දඟ, මේ පර්ෂත්දු එබඳු වෙති’ වදළෝ.

මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි අර්හත් ක්ෂීණාස්‍රව වූ වුසු මහබඹසර ඇති කළ කරණී ඇති තැබූ කෙලෙස්බර ඇති පැමිණි සදර්ථ ඇති ක්‍ෂය වූ භවසංයොජන ඇති මොනොවට දැන විමුක්ත වූ මහණහු ඇත. මෙබඳු රහත් මහණහු ද මේ බික්සඟුන් කෙරෙහි ඇත්තාහ. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි පඤ්චොරම්භාගිය සංයොජන යන් ක්‍ෂය වීමෙන් ඕපපාතික වූ එහි මැ පිරිනිවෙනසුලු වූ ඒ ශුද්ධාවාසලොකයෙන් පෙරලා නො එන සැහැවි ඇති භික්ෂූහු වෙති. මහණෙනි, බික්සඟුන් කෙරෙහි මෙබඳු වූ අනාගාමී මහණහු ද ඇත්තාහ. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි ත්‍රිවිධ සංයොජනයන් ගේ පරික්ෂය හෙතුයෙන් රාග ද්වේෂ මොහයන් ගේ තානවයෙන් සකෘදගාමී ව වරෙක මැ මෙලොවට අවුත් දුක් කෙළවර කරන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් සකෘදගාමී මහණහු ද ඇත්තාහ. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි ත්‍රිවිධ සංයොජනයන් ගේ පරික්ෂය හෙතුයෙන් ශ්‍රොතාපන්න ව අවිනිපාත ස්වභාව ඇති ව නියත ව සම්බොධිපරායණ වූ සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් ශ්‍රොතාපන්න භික්ෂූහු ද ඇත්තාහ.

මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි සතර සිව්වටන් පිළිබඳ භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් සතිපට්ඨාන භාවනානු යොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි සතර සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍ය පිළිබඳ භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් මහණහු දු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි සතර ඍද්ධිපාදයන් පිළිබඳ භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් ඍද්ධිපාද භාවනානුයොගී මහණහු ද ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි පඤ්චප්‍රකාර ඉන්ද්‍රියභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් ඉන්ද්‍රිය භාවනානුයොගී මහණහුද වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි පඤ්චප්‍රකාර බලභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි මේ බික්සඟුන් කෙරෙහි මෙබඳු බලභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි මේ බික්සඟුන් කෙරෙහි සප්තබොධ්‍යංග භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙබඳු බොධ්‍යඞ්ගභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි අරිඅටඟිමඟ පිළිබඳ භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් මාර්ගභාවනානුයොගී මහණහුදු වෙත්.

සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ මෙත්තාභාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ කරුණාභාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ මුදිතාභාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ උපෙක්ඛාභාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අසුභභාවනානුයොගමනුයුත්තා විහරන්ති එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ. සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ අනිච්චසඤ්ඤාභාවනානුයොගමනුයුත්තා විහරන්ති. එවරූපාපි භික්ඛවෙ, සන්ති භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ.

සන්ති භික්ඛවෙ, භික්ඛූ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ ආනාපානසති[1] භාවනානුයොගමනුයුත්තා විහරන්ති. ආනාපානසති භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. ආනාපානසති භික්ඛවෙ භාවිතා බහුලීකතා චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති[2] චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති.

කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති කථං බහුලීකතා මහප්ඵලා[3] හොති මහානිසංසා. ඉධ භික්ඛවෙ, භික්ඛූ අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සතොව අස්සසති, සතො[4] පස්සසති.

දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති. සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.

පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.

---

1. ආනාපානස්සති - මජ්සං.
2. පරිපූරෙන්ති - මජ්සං, සිමු.
3. කථං මහප්ඵලා - PTS.
4. සතොව - සිමු, මජ්සං.

මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙත්තාභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් මෙත්තාභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි කරුණාභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කරෙහි මෙවන් කරුණානුභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මුදිතාභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් මුදිතාභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි උපක්ෂා භාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් උපෙක්ෂාභාවනානු යොගී මහණහුදු වෙත්. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි අශුභභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් අශුභභාවනානුයොගී මහණහුදු වෙති. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි අනිත්‍යසං ඥාභාවනානුයොගයෙහි යෙදී වසන සඟහු ඇත. මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි මෙවන් අනිත්‍යභාවනානු යොගී මහණහුදු වෙත්.

මහණෙනි, මේ බික්සඟුන් කෙරෙහි අනාපන්සි භාවනානුයොගයෙහි යෙදී වසන මහණහු ඇත. මහණෙනි, භාවිත බහුලීකෘත අනාපන්සි භාවනා මහත්ඵල මහනාශංස වෙයි. මහණෙනි, භාවිත බහුලීකෘත අනාපන්සි සතර සිවටන් සපුරාලයි. භාවිත බහුලීකෘත සතර සිවටන්හු සප්තබොධ්‍යඞ්ගයන් සපුරාලති. භාවිත බහුලීකෘත සප්ත බොධ්‍යඞ්ගයෝ විද්‍යාවිමුක්ති සපුරාලත්.

මහණෙනි, කිසෙයින් භාවිත කිසෙයින් බහුලීකෘත අනාපන්සි මහත්ඵල මහානෘශංස වෙය යත් : මහණෙනි, මෙසස්නෙහි මහණ අරණ්‍යගත වේවයි වෘක්ෂමූලගත වේවයි ශූන්‍යාගාරගත වේවයි පලක් බැද කය සෘජු කොට තබා සිහිය කමටහන් අභිමුඛ කොට එළවා හිඳී. හේ සිහි ඇති ව ම ආශ්වාස කෙරෙයි, සිහි ඇති ව ප්‍රශ්වාස කෙරෙයි.

දීර්ඝ කොට හෝ ආශ්වාස කරනුයේ 'දීර්ඝ කොට අසස් කරමී' නුවණින් දනී. දීර්ඝ කොට හෝ ප්‍රශ්වාස කරනුයේ ' දීර්ඝ කොට පසස් කරමී ' නුවණින් දනී. හ්‍රස්ව කොට හෝ ආශ්වාස කරනුයේ හ්‍රස්ව කොට අසස් කරමී ' නුවණින් දනී. හ්‍රස්ව කොට හෝ ප්‍රශ්වාස කරනුයේ හ්‍රස්ව කොට පසස් කරමී ' නුවණින් දනී. සර්වකායප්‍රතිසංවෙදී ව අසස් කරමී හික්මෙයි. සර්වකායප්‍රතිසංවෙදී ව පසස් කරමී ' හික්මෙයි. කායසංස්කාර සන්හිඳුවමින් අසස් කරමී හික්මෙයි. කායසංස්කාර සන්හිඳුවමින් පසස් කරමී හික්මෙයි.

ප්‍රීති ප්‍රතිසංවෙදී ව ආශ්වාස කරමී හික්මෙයි, ප්‍රීති ප්‍රතිසංවෙදී ව ප්‍රශ්වාස කරමී හික්මෙයි. සුඛප්‍රතිසංවෙදී ව අසස් කරමී' හික්මෙයි, සුඛ ප්‍රතිසංවෙදී ව පසස් කරමී, හික්මෙයි. චිත්තසංස්කාර ප්‍රතිසංවෙදී ව අසස් කරමී හික්මෙයි. චිත්තසංස්කාර ප්‍රතිසංවෙදී ව පසස් කරමී හික්මෙයි. චිත්තසංස්කාර සන්හිඳුවමින් අසස් කරමී හික්මෙයි. චිත්තසංස්කාර සන්හිඳුවමින් පසස් කරමී හික්මෙයි. චිත්තප්‍රතිසංවෙදී ව අසස් කරමී හික්මෙයි. චිත්තප්‍රතිසංවෙදී ව පසස් කරමී හික්මෙයි. චිත්තය වෙසෙසින් ප්‍රමොද කරමින් අසස් කරමී හික්මෙයි. චිත්තය වෙසෙසින් ප්‍රමොද කරමින් පසස් කරමී හික්මෙයි. චිත්තය සමාධාන කරමින් අසස් කරමී ' හික්මෙයි. චිත්තය සමාධාන කරමින් පසස් කරමී' හික්මෙයි, චිත්තය විමුක්දවන කරමින් අසස් කරමී' හික්මෙයි. චිත්තය විමුක්දවන කරමින් පසස් කරමී' හික්මෙයි.

අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති[1] එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා.

කථං භාවිතා ච භික්ඛවෙ, ආනාපානසති[1] කථං බහුලීකතා චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති: යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, කායෙ කායානුපස්සී භික්ඛවෙ, තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. කායෙසු කායඤ්ඤතරාහං භික්ඛවෙ, එවං වදාමි: යදිදං අස්සාසපස්සාසා. තස්මාතිහ භික්ඛවෙ, කායෙ කායානුපස්සී තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාර පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාර පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, වෙදනාසු වෙදනානුපස්සී භික්ඛවෙ, තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වෙදනඤ්ඤතරාහං භික්ඛවෙ, එවං වදාමි: යදිදං අස්සාසපස්සාසානං සාධුකං මනසිකාරං. තස්මාතිහ භික්ඛවෙ, වෙදනාසු වෙදනානුපස්සී තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, චිත්තෙ චිත්තානුපස්සී භික්ඛවෙ, තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. නාහං භික්ඛවෙ, මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපානසතිභාවනං වදාමි. තස්මාතිහ භික්ඛවෙ, චිත්තෙ චිත්තානුපස්සී තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.

---

1. ආනාපානස්සති - මජ්සං.

අනිත්‍යය නුවණින් දක්නෙම් අසස් කරමි හික්මෙයි. අනිත්‍යය නුවණින් දක්නෙම් පසස් කරමි හික්මෙයි. විරාගය අනුව නුවණින් දක්නෙම් අසස් කරමි හික්මෙයි. විරාගය අනුව නුවණින් දක්නෙම් පසස් කරමි හික්මෙයි. නිරෝධය නුවණින් දක්නෙම් අසස් කරමි හික්මෙයි. නිරෝධය නුවණින් දක්නෙම් පසස් කරමි හික්මෙයි. පටිනිස්සජ්ජනය නුවණින් දක්නෙම් අසස් කරමි හික්මෙයි. පටිනිස්සජ්ජනය නුවණින් දක්නෙම් පසස් කරමි හික්මෙයි. මහණෙනි, මෙසේ භාවිත මෙසේ බහුලීකෘත වූ අනාපන්සි භාවනාව මහත් ඵල මහානෘශංස වෙයි.

තවද මහණෙනි, කිසෙයින් භාවිත කිසෙයින් බහුලීකෘත අනාපන්සි සතර සිවටන් පරිපූර්ණ කෙරෙයි යත් : මහණෙනි, යම් කලෙක මහණ දීර්ඝ කොට හෝ අසස් කරනුයේ ' දීර්ඝ කොට අසස් කරමි ' දැනගනී ද, දීර්ඝ කොට හෝ පසස් කරනුයේ 'දීර්ඝ කොට පසස් කරමි ' දැනගනී ද, හ්‍රස්ව කොට හෝ අසස් කරනුයේ 'හ්‍රස්ව කොට අසස් කරමි' දැනගනී ද, හ්‍රස්ව කොට හෝ පසස් කරනුයේ 'හ්‍රස්ව කොට පසස් කරමි' දැනගනී ද, සර්වකාය 'ප්‍රතිසංවේදී ව ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සර්වකායප්‍රතිසංවේදී ව ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද, කායසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, කාය සංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ කයෙහි කායානුදර්ශී ව කෙලෙසුන් තවන වැර ඇති ව සම්‍යක්ප්‍රඥ ඇති ව ස්මෘතිමත් ව කායසඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍යය දුරු කොට වෙසෙයි. මහණෙනි, යම් ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් ඇද්ද, එය පෘථිව්‍යාදී චතුර්විධ කායයන් කෙරෙහි කායාන්‍යතරයක් කොට මම මෙසේ කියමි. මහණෙනි, එහෙයින් මෙහි ලා එසමයෙහි මහණ කයෙහි කායානුදර්ශී ව ආතාපී ව සම්‍යක්ප්‍රඥ ඇති ව ස්මෘතිමත් ව කායලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට වාසය කෙරෙයි.

මහණෙනි, යම් කලෙක මහණ 'ප්‍රීතිප්‍රතිසංවේදී ව ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'ප්‍රීතිප්‍රතිසංවේදී ව ප්‍රශ්වාස කෙරෙමි' හික්මේ ද, 'සුඛප්‍රතිසංවෙදීව ආශ්වාස කරමි' හික්මේ ද, 'ප්‍රීතිප්‍රතිසංවේදී ව ප්‍රශ්වාස කෙරෙමි' හික්මේ ද, 'සුඛප්‍රතිසංවේදීව ආශ්වාස කරමි' හික්මේ ද, 'සුඛප්‍රතිසංවේදීව ප්‍රශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තසංස්කාර ප්‍රතිසංවේදීව ආශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තසංස්කාර ප්‍රතිසංවේදීව ප්‍රශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරමි' හික්මේ ද, මහණෙනි, එසමෙයෙහි මහණ වේදනායෙහි වේදනා නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥන ඇති ව සමෘතිමත් ව ස්කන්ධ සංඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරු කොට වාසය කෙරෙයි. යම් ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ සුන්දර මනසිකාරයෙක් වේ ද, මහණෙනි, මම මෙසේ වේදනාවන් කෙරෙහි එය අන්‍යතරයෙකි'යි කියමි. මහණෙනි, එහෙයින් එසමයෙහි මහණ වේදනායෙහි වේදනා නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥන ඇති ව සමෘතිමත් ව ස්කන්ධ ලොකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරු කොට වාස කරන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක මහණ 'චිත්තප්‍රතිසංවේදීව ආශ්වාස කෙරෙමි' හික්මේ ද, 'චිත්තප්‍රතිසංවෙදීව ප්‍රශ්වාස කෙරෙමි' හික්මේ ද, චිත්තය ප්‍රමොද කරමින් ආශ්වාස කෙරෙමි' හික්මේ ද, 'චිත්තය ප්‍රමොද කරමින් ප්‍රශ්වාස කෙරෙමි' හික්මේ ද, 'චිත්තය සමාධාන කරමින් ආශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තය සමාධාන කරමින් ප්‍රශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තය විමුක්ත්වන කරමින් ආශ්වාස කරමි' හික්මේ ද, 'චිත්තය විමුක්ත්වන කරමින් ප්‍රශ්වාස කරමි' හික්මේද ,මහණෙනි, එසමයෙහි මහණ චිත්තයෙහි චිත්තය නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥන ඇති ව සමෘතිමත් ව ස්කන්ධ ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය පහා වාස කෙරෙයි. මහණෙනි, මම මුෂිත ස්මෘති ඇති සම්ප්‍රඥන නැතියහුට අනාපන්සි භවුන් නො වදරමි. මහණෙනි, එහෙයින් එසමයෙහි මහණ චිත්තයෙහි චිත්තය නුවණින් දක්නේ ආතාප ඇති වැ සම්ප්‍රඥන ඇති ව ස්මෘති ඇති ව ස්කන්ධලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය පහා වාස කරන්නේ වෙයි.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, ධම්මෙසු ධම්මානුපස්සී භික්ඛවෙ, තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. සො යං තං අභිජ්ඣාදොමනස්සානං පහානං තං පඤ්ඤාය දිස්වා සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. තස්මාතිහ භික්ඛවෙ, ධම්මෙසු ධම්මානුපස්සී තස්මිං සමයෙ භික්ඛු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. එවං භාවිතා ඛො භික්ඛවෙ, ආනාපානසති එවං බහුලීකතා චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙති.

කථං භාවිතා ච භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා කථං බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති: යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, උපට්ඨිතස්ස[1] තස්මිං සමයෙ සති හොති අසම්මුට්ඨා[2]. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා,[2] සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති, පවිචයති, පරිවීමංසං ආපජ්ජති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති, පවිචයති,[3] පරිවීමංසං ආපජ්ජති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

තස්ස තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචයතො පරිවීමංසං ආපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචයතො[4] පරිවීමංසං ආපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. විරියසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා, පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පීතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

---

1. උපට්ඨිතස්ස - මජ්ඣං.
2. අප්පමුට්ඨා - ස්‍යා.
3. පවිචරති - ස්‍යා, PTS.
4. පවිචරතො - ස්‍යා, PTS.

මහණෙනි, යම් කලෙක මහණ අනිත්‍යානුදර්ශී වූයේ ආශ්වාස කෙරෙමි හික්මේ ද, අනිත්‍යානුදර්ශී වූයේ ප්‍රශ්වාස කෙරෙමි හික්මේ ද, විරාගය නුවණින් දක්නේ ආශ්වාස කෙරෙමි හික්මේ ද, විරාගය නුවණින් දක්නේ ප්‍රශ්වාස කෙරෙමි හික්මේ ද, නිරෝධය නුවණින් දක්නේ ආශ්වාස කෙරෙමි හික්මේ ද, නිරොධය නුවණින් දක්නේ ප්‍රශ්වාස කෙරෙමි හික්මේ ද, පටිනිස්සජ්ජනය නුවණින් දක්නේ ආශ්වාස කෙරෙමි හික්මේ ද, පටිනිස්සජ්ජනය නුවණින් දක්නේ ප්‍රශ්වාස කෙරෙමි හික්මේ ද, මහණෙනි, එසමයෙහි මහණ ධර්මයෙහි ධර්මය නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥාන ඇති ව ස්මෘති ඇති ව ස්කන්ධලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය පහා වාස කෙරෙයි. හේ අභිධ්‍යා දෞර්මනස්‍යයන් පිළිබඳ යම් ඒ ප්‍රහාණයෙක් වේ ද, ඒ ප්‍රඥයෙන් දැක මනා කොට එහි ආලම්බනඅධ්‍යුපෙක්ෂායෙන් උපෙක්ෂණ කරනුයේ වෙයි. මහණෙනි, එසමයෙහි මහණ ධර්මයෙහි ධර්මය අනුව නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥාන ඇති ව ස්මෘති ඇති ව ස්කන්ධලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට වාස කරනුයේ නම් වෙයි. මහණෙනි, මෙසේ භාවිත බහුලීකෘත අනාපන්සි සතර සිවටන් සපුරනු වේ.

මහණෙනි, කෙසේ භාවිත වූ කෙසේ බහුලීකෘත වූ සතර සිවටන්හු සප්තබොධ්‍යඞ්ග-යන් සපුරාලත් ද යත් : මහණෙනි, යම් කලෙක මහණ කයෙහි කය නුවණින් දක්නේ ආතාප ඇති ව සම්ප්‍රඥාන ඇති ව ස්මෘති ඇති ව ස්කන්ධලෝකයෙහි අභිධ්‍යාදෞර්මස්‍ය දුරු කොට වාස කෙරේ ද, එසමයෙහි ඔහුට ස්මෘතිය එළඹ සිටියා වෙයි, මුෂිත නො වෙයි. මහණෙනි, යම් කලෙක මහණහට ස්මෘතිය එළඹ සිටියා මුෂිත නො වූවා වේ ද, එසමයෙහි මහණහට ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ ස්මෘති සම්බොධ්‍යාඞ්ගය භවයි. එසමයෙහි ඒ මහණහට ස්මෘතිසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

ඒ මහණ එසේ ස්මෘතිමත් ව වසනුයේ ඒ දහම ප්‍රඥයෙන් (අනිත්‍යාදි වශයෙන්) විචින්වන කෙරෙයි, ප්‍රවිචය කෙරෙයි, ප්‍රකර්ෂ මීමාංසාවට එළඹෙයි. මහණෙනි, යම් කලෙක මහණ එසේ ස්මෘතිමත් ව වසනුයේ ඒ දහම ප්‍රඥයෙන් විචින්වන කෙරේ ද, ප්‍රවිචය කෙරේ ද, මීමාංසාවට එළඹේ ද, එසමයෙහි ඒ මහණහට ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහි ඒ මහණහට ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

ඒ දහම ප්‍රඥවෙන් ප්‍රවිචින්වන කරන ප්‍රවිචය කරන පරිවීමාංසාවට පැමිණෙන ඒ මහණ හට අසංලීන වීර්‍ය්‍යය ආරබ්ධ වෙයි. මහණෙනි ,යම් කලෙක ඒ දහම ප්‍රඥයෙන් ප්‍රවිචින්වන ප්‍රවිචය කරන විමසීමට පැමිණෙන ඒ මහණහට අසංලීන වීර්‍ය්‍යය ආරබ්ධ වේ ද, එ සමයෙහි ඒ මහණහු විසින් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය පටන්ගන්නා ලද වෙයි. එසමයෙහි ඒ මහණ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහි ඒ මහණහට වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය භාවනා යෙන් පරිපූර්ණභාවයට යෙයි.

රුකුළු වැර ඇති ඒ මහණහට නිරාමිස ප්‍රීති උපදී. මහණෙනි, යම් කලෙක රුකුළු වැර ඇති ඒ මහණහට නිරාමිස ප්‍රීති උපදී ද, එසමයෙහි ඒ මහණහට ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග වඩයි. එසමයෙහි ඒ මහණහු ගේ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

පීතිමනස්ස කායොපි පස්සම්භති. චිත්තම්පි පස්සම්භති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, සමාධි-සම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සමාධි-සම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛු වෙදනාසු-පෙ-චිත්තෙ-පෙ-ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා, විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං උපට්ඨිතස්ස තස්මිං සමයෙ සති හොති අසම්මුට්ඨා. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො උපට්ඨිතා සති හොති අසම්මුට්ඨා, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සති-සම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති, පවිචයති, පරිවීමංසං ආපජ්ජති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති, පවිචයති පරිවීමංසං ආපජ්ජති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

තස්ස තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචයතො පරිවීමංසං ආපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛුනො තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචයතො පරිවීමංසං ආපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. විරියසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා. යස්මිං සමයෙ භික්ඛවෙ භික්ඛුනො ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා, පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පීතිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

ප්‍රීති සිත් ඇති මහණහු ගේ නාමකය ද සන්හිඳෙයි, සිත ද සන්හිඳෙයි. මහණෙනි, යම්කලෙක ප්‍රීති සිත් ඇති ඒ මහණහු ගේ නාමකයත් සන්හිඳේ ද, සිතත් සන්හිඳේ ද, එසමයෙහි ඒ මහණහු විසින් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි. එසමයෙහි ඒ මහණහට ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

සන්හුන් නාමකය ඇති සුඛිත මහණහු ගේ චිත්තය සමාධිගත වෙයි. මහණෙනි, යම් කලෙක ප්‍රශ්‍රබ්ධ කාය ඇති සුඛිත මහණහු ගේ චිත්තය සමාධිගත වේ ද එසමයෙහි ඒ මහණහට සමාධිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ සමාධි සම්බොධ්‍යඞ්ගය භවයි. එසමෙයෙහි ඒ මහණහු ගේ සමාධිසම්බොධ්‍යගඞ්ය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

හේ එසේ සමාධිගත චිත්තය මනා කොට (ආලම්බනඅධ්‍යුපෙක්ෂායෙන්) අධ්‍යුපෙක්ෂණ කරනු වෙයි. මහණෙනි, යම් කලෙක ඒ මහණ එසේ සමාධිගත චිත්තය මනාකොට අධ්‍යුපෙක්ෂණ කරනු වේ ද, එසමයෙහි ඒ මහණහට උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහි ඒ මහණහු ගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

මහණෙනි, යම් කලෙක මහණ වේදනායෙහි . . . චිත්තයෙහි ... ධර්මයෙහි ධර්මය නුවණින් දක්නේ කෙලෙස් තවන වැර ඇති ව සම්ප්‍රඥන ඇති ව ස්මෘති ඇති ව ස්කන්ධ ලොකයෙහි අභිධ්‍යා දොම්නස්‍ය දුරු කොට වාසය කෙරේ ද, එසමයෙහි ඔහු ගේ සිහිය එළැඹ සිටියා වෙයි, නුමුළා වෙයි. මහණෙනි, යම් කලෙක මහණහට ස්මෘතිය එළැඹ සිටියා වේ ද, නුමුළා වේ ද, එසමයෙහි මහණහට ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි මහණ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහි මහණහු ගේ ස්මෘති සම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණ භාවයට යෙයි.

හේ එසේ ස්මෘතිමත් ව වසනුයේ ඒ දහම ප්‍රඥයෙන් සොයයි, වෙසෙසින් සොයයි, විමසීමට පැමිණෙයි. මහණෙනි, යම් කලෙක ඒ මහණ එසේ ස්මෘතිමත් ව වසනුයේ ඒ දහම ප්‍රඥයෙන් සොයා ද, වෙසෙසින් සොයා ද, හැමසේ විමසීමට පැමිණේ ද, එසමයෙහි ඒ මහණහට ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහී ඒ මහණහු ගේ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

ඒ දහම ප්‍රඥයෙන් සොයන වෙසෙසින් සොයන හැමසේ විසීමටම පැමිණි ඒ මහණ විසින් වීය්‍ර්‍යය ආරබ්ධ වෙයි. වැර අසංලීන වෙයි. මහණෙනි, යම් කලෙක ඒ දහම ප්‍රඥයෙන් සොයන ප්‍රවිචය කරන මීමාංසාවට පැමිණෙන ඒ මහණහට වීය්‍ර්‍යය ආරබ්ධ වේද ඒ වැර අසංලීන වේ ද, එසමයෙහි ඒ මහණහට වීය්‍ර්‍යසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි ඒ මහණ වීය්‍ර්‍යසම්බොධ්‍යඞ්ගය භවයි. එසමයෙහි ඒ මහණහුගේ වීය්‍ර්‍යසම් බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

ආරබ්ධ වීය්‍ර්‍ය ඇති මහණහට නිරාමිස ප්‍රීතිය උපදී. මහණෙනි, යම් කලෙක ආරබ්ධ වීය්‍ර්‍ය ඇති මහණහට නිරාමිස ප්‍රීතිය උපදී ද, එසමයෙහි මහණහට ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි මහණ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩයි. එසමයෙහි මහණහට ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් වැඩීමට යෙයි.

පීතිමනස්ස කායොපි පස්සම්භති චිත්තම්පි පස්සම්භති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සමාධිසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති. යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං තස්මිං සමයෙ භික්ඛු භාවෙති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

එවං භාවිතා ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා එවං බහුලීකතා සත්ත සම්බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති.

කථං භාවිතා ච භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං.

එවං භාවිතා ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආනාපානසති සුත්තං අට්ඨමං.

ප්‍රීති සිත් ඇත්තහු ගේ කය ද සන්හිඳෙයි, සිත ද සන්හිඳෙයි. මහණෙනි, යම් කලෙක ප්‍රීති සිත් ඇති මහණහුගේ කයත් සන් හිඳේ ද, සිතත් සන්හිඳේ ද, මහණෙනි, එසමයෙහි මහණහු විසින් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. මහණෙනි, එසමයෙහි මහණ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි. එසමයෙහි මහණහට ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය භාවනා යෙන් පරිපූර්ණ භාවයට යෙයි.

සන්හුන් කය ඇති එහෙයින් ම සුව්ත වූවහු ගේ සිත සමාධිගත වෙයි. මහණෙනි, යම් කලෙක ප්‍රශ්‍රබ්ධ කය ඇති සුව්ත වූ මහණහුගේ සිත එකඟ වේ ද එසමයෙහි මහණහු විසින් සමාධිසම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වෙයි. එසමයෙහි මහණ සමාධිසම්බොධ්‍යඞ්ග වඩයි. එසමයෙහි මහණහට සමාධි සම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවට යෙයි.

හේ එසේ සමාහිත චිත්තය මනා කොට අධ්‍යුපෙක්ෂණ කරනු වෙයි.මහණෙනි, යම් කලෙක මහණ එසේ සමාධිගත වූ චිත්තය අධ්‍යුපෙක්ෂණ කරනු වේ ද, එසමයෙහි මහණහු විසින් උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ආරබ්ධ වූයේ වෙයි. එසමයෙහි මහණ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වඩයි. එසමයෙහි මහණහට උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය භාවනායෙන් පරිපූර්ණභාවයට යෙයි.

මහණෙනි, මෙපරිද්දෙන් වඩන ලද මෙපරිද්දෙන බහුලීකෘත වූ සතර සිවටන්හු සප්ත බොධ්‍යඞ්ගයන් පරිපූර්ණ කෙරෙත්.

තවද මහණෙනි, කිසෙයින් වඩන ලද කිසෙයින් බහුලීකෘත සප්ත බොධ්‍යඞ්ගයෝ විද්‍යාවිමුක්ති පරිපූර්ණ කෙරෙති යත් : මහණෙනි, මෙ සස්නෙහි මහණ විවෙකනිශ්‍රිත විරාගනිශ්‍රිත නිරොධනිශ්‍රිත ව්‍යොස්සග්ගයට පිරිනැමුණු ස්මෘතිසම්බොධ්‍යඞ්ගය වඩයි. .........ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වඩයි.......වීර්‍යසම්බොධ්‍යඞ්ගය වඩයි.........ප්‍රීතිසම් බොධ්‍යඞ්ගය වඩයි......ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩයි.......සමාධි සම්බොධ්‍යඞ්ගය වඩයි. .........විවෙකනිශ්‍රිත විරාගනිශ්‍රිත නිරොධනිශ්‍රිත ව්‍යොස්සග්ගයට පිරිනැමුණු උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වඩයි.

මහණෙනි, මෙසේ භාවිත වූ මෙසේ බහුලීකෘත වූ සප්ත බොධ්‍යඞ්ගයෝ විද්‍යාවිමුක්ති පරිපූර්ණ කෙරෙත්.

භාග්‍යවතුන් වහන්සේ මේ ආනාපානසති සූත්‍ර වදාළ සේක. ආත්තමනස්ක වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්තාහු යයි.

අටවැනි ආනාපානසති සූත්‍ර යි.

# 3. 2. 9

## කායගතාසති සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨානසාලායං සන්නිසින්නානං සන්නි-පතිතානං අයමන්තරා කථා උදපාදි: අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා-සම්බුද්ධෙන කායගතා සති භාවිතා බහුලීකතා මහප්ඵලා වුත්තා මහානිසංසා'ති. අයං ච හිදං[1] තෙසං භික්ඛූනං අන්තරාකථා විප්පකතා හොති.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන උපට්ඨානසාලා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: කායනුත්ථ භික්ඛවෙ, එතරහි කථාය සන්නිසින්නා කා ච පන වො අන්තරා කථා විප්පකතා'ති.

ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨානසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි: අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන කායගතා සති භාවිතා බහුලීකතා මහප්ඵලා වුත්තා මහානිසංසා'ති. අයං නො[2] භන්තෙ අන්තරාකථා විප්පකතා. අථ භගවා අනුප්පත්තො'ති.

කථං භාවිතා ච භික්ඛවෙ, කායගතා සති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූල-ගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති, සතො[3] පස්සසති. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති. සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං[4] භාවෙති.

---

1. අයඤ්ච ඛො හිදං – සයා. 3. සතොව – සීමු, මජසං.
2. අයං ඛො නො – සීමු, මජසං. 4. කායගතා සතිං – මජසං.

# 3. 2. 9

## කායගතාසති සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහුගේ ජේතවන නම් අරමෙහි වැඩවසන සේක. එකල්හි පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළැකුණු උපස්ථානශාලායෙහි රැස්ව හුන් බොහෝ භික්ෂූන් අතර මේ අතුරු කථාව පැන නැඟිණ. " ඇවැත්නි, අසිරි යැ, ඇවැත්නි අද්භුත යැ, භගවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් භාවිත බහුලීකෘත වූ කායගතස්මෘති භාවනා මහත්ඵල මහානෘශංස යයි " වදරන ලද මැ යැ. ඒ මහණුනතර මේ අතුරු කථාව අඩහළ විය.

එ සඳ භාග්‍යවතුන් වහන්සේ සවස්වරුයෙහි පිළිසලනින් නැඟීසිටි සේක් උපස්ථාන ශාලාව කරා එළැඹි සේක. එළැඹ පැන්වූ අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ මහණුන් ඇමැතූ සේක : මහණෙනි. දන් කවර කථායෙකින් රැස්ව හුන්නහු වව, තොප ගේ කිනම් අතුරු කථායෙක් කොට අඩාළ වී දයි වදළෝ.

වහන්ස, පස්වරුයෙහි පිණ්ඩපාතයෙන් වැළැකී මේ උපස්ථාන ශාලායෙහි රැස්ව හුන් අප අතර මේ අතුරු කථාව පහළ වී : " ඇවැත්නි, ආශ්චර්‍ය්‍ය යැ, ඇවැත්නි, අද්භුත යැ, සියල්ල දන්නා සියල්ල දක්නා භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් භාවිත බහුලීකෘත කායගතස්මෘති භාවනා මහත්ඵල මහානෘශංස ය "යි වදරන ලදු, වහන්ස, අපගේ මේ අතුරු කථා අඩහළ වූ, එසඳ භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ"යි.

මහණෙනි, කිසෙයින් භාවිත වූ කිසෙයින් බහුලීකෘත වූ කාගියාසි මහත්ඵල මහානෘශංස වෙ යැ යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ අරණ්‍යගත වේවයි වෘක්ෂමූලගත වේවයි ශූන්‍යාගාරගත වේවයි පලක් බැඳ උඩුකය සෘජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා හිඳී. හේ සිහි ඇති ව මැ ආශ්වාස කෙරෙයි, සිහි ඇතිව ප්‍රශ්වාස කෙරෙයි, දීර්ඝ කොට හෝ ආශ්වාස කරනුයේ දීර්ඝ කොට ආශ්වාස කරමි' නුවණින් දනී. දීර්ඝ කොට හෝ ප්‍රශ්වාස කරනුයේ දීර්ඝ කොට ප්‍රශ්වාස කරමි දනී. හ්‍රස්ව කොට හෝ ආශ්වාස කරනුයේ හ්‍රස්ව කොට ආශ්වාස කරමි දනී, හ්‍රස්ව කොට හෝ ප්‍රශ්වාස කරනුයේ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරමි දනී. සර්වකායප්‍රතිසංවේදී ව ආශ්වාස කරමි හික්මෙයි. සර්වකායප්‍රතිසංවේදී ව ප්‍රශ්වාස කරමි හික්මෙයි. කායසංස්කාර සන්හිඳුවමින් ආශ්වාස කරමි හික්මෙයි. කායසංස්කාර සන්හිඳුවමින් ප්‍රශ්වාස කරමි හික්මෙයි. මෙසේ ස්මෘතිවිප්‍රවාස නැතිව කෙලෙස් තවන වැර ඇතිව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වසන ඒ මහණහු ගේ පඤ්චකාමගුණ නිඃශ්‍රිත වූ යම් දිවෙන සංකල්පනාවෝ ඇද්ද ඔහු පහව යෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචරාධ්‍යාත්මයෙහි ම සිත පිහිටා සිටී. පිහිටා හිඳී, එකඟ වෙයි, සමාහිත වෙයි. මහණෙනි, මෙසෙයිනුදු මහණ කාගියාසි භවයි.

පුන ච පරං භික්ඛවේ, භික්ඛු ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති. ඨිතො වා ඨිතොම්හීති පජානාති. නිසින්නො වා නිසින්නොම්හීති පජානාති. සයානො වා සයානොම්හීති පජානාති. යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති. තථා තථා නං පජානාති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවේ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවේ, භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති: තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවේ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවේ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා[1] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්ත'න්ති.

සෙය්‍යථාපි භික්ඛවේ, උභතො මුඛා මූතොළි[2] පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස. සෙය්‍යථීදං: සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං, තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය: ඉමෙ සාලී, ඉමෙ වීහී, ඉමෙ මුග්ගා, ඉමෙ මාසා, ඉමෙ තිලා, ඉමෙ තණ්ඩුලා'ති. එවමෙව ඛො භික්ඛවේ, භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා[1] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්ත'න්ති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති සමාධියති, එවම්පි භික්ඛවේ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවේ, භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථාපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

1. අට්ඨිමිඤ්ජං - මජසං.
2. පුතොළි - මජසං.

යළිදු මහණෙනි, මහණ යන්නේ හෝ 'යෙමි' නුවණින් දනී, සිටියේ හෝ 'සිටියෙමි' නුවණින් දනී, හුන්නේ හෝ 'හුන්නෙමි' නුවණින් දනගනී, හෝනේ හෝ 'හෝනෙමි' නුවණින් දනගනී, යළි යම් යම් පරිද්දෙකින් හෝ ඔහුගේ කය පිහිටුවන ලදුයේ වේ ද, ඒ ඒ පරිද්දෙන් එය නුවණින් දනගනී, මෙසේ අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති නිවනට මෙහෙයූ සිතැතිව වසන ඔහුගේ යම් ගෘහශ්‍රිත වූ දිවෙන සංකල්පයෝ වෙත් ද, ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචර සංඛ්‍යාත අධ්‍යාත්මයෙහි ම සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකඟ වෙයි, සමාහිත වෙයි. මහණෙනි, මෙසෙයිනුදු මහණ කායගතස්මෘති වඩයි.

තවද මහණෙනි, මහණ ඉදිරි ගමන්හි දු පෙරළා ගමන්හි දු සම්පජානකාරී වෙයි. ඉදිරි බැලීමෙහි දු අවට බැලීමෙහි දු සම්පජානකාරී වෙයි, අත් පා දිගු කිරීමෙහි දු හැකිළීමෙහි දු සම්පජානකාරී වෙයි. සඟළ පාසිවුරු ධැරීමෙහි දු සම්පජානකාරී වෙයි. අසන පාන ඛාදන ආස්වාදන ක්‍රියායෙහි දු සම්පජානකාරී වෙයි. අස්පස්කිසෙහි දු සම්පජානකාරී වෙයි, ගමන ස්ථාන නිෂීදන ශයන ජාගරණ භාෂණ තුෂ්ණීම්භාවක්‍රියායෙහි දු සම්පජානකාරී වෙයි. මෙසේ අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන ඔහුගේ යම් ගෘහශ්‍රිත දිවෙන සංකල්පනයෝ ඇද්ද, ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචර සංඛ්‍යාත අධ්‍යාත්මයෙහි ම සිත වැදගෙන සිටී, සන්හුන්වෙයි, එකඟ වෙයි, සමාධිගත වෙයි. මහණෙනි, මෙසෙයිනුදු මහණ කායගත ස්මෘති වඩයි.

තවද මහණෙනි, මහණ පාදතලයෙන් උඩ කෙස් මතුයෙන් යට ත්වක්පර්‍ය්‍යන්ත වූ නානාප්‍රකාර අසුචි පිරුණු මේ කරජකය ම ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : ' මේ කයෙහි කෙස් යැ, ලොමැ නිය යැ දතැ සමැ මසැ නහර යැ ඇට යැ ඇටමිදුළු යැ වකුගඩු යැ හෘදය යැ අක්මා යැ දලබු යැ බඩදිව යැ පපුමසැ අතුණු යැ අතුණුබහනැ නො පැසුණු අහර යැ මල යැ පිතැ සෙමැ පූයා යැ ලෙහෙ යැ සෝදිය යැ මේදස යැ කඳුළු යැ වුරුණුතෙලැ කෙළ යැ මුකුණු යැ සඳමිදුලු යැ මූත්‍ර යැ යන මේ ඇතැයි කියා යි.

මහණෙනි, යම් සේ නානාවිධ ධාන්‍ය පිරුණු දෙපස මුව ඇති මල්ලෙක් වේ ද, එ කෙබඳු ධාන්‍ය යැ යත් : හැල් වී මුං මැ තල සහල් යන මේ ධාන්‍යයන්ගේ යැ. ඇස් ඇති පුරුෂයෙක් තෙල මල්ල මුද ප්‍රත්‍යාවෙක්ෂා කරන්නේ යැ : මොහු හැල්හ, මොහු වීහ, මොහු මුඟුහ, මොහු මාසහ, මොහු තිලයහ, මොහු තණ්ඩුලයහ යි කියා යි, මහණෙනි, එපරිදි ම මහණ පාතෙලෙන් උඩ කෙහෙමතුයෙන් යට සම පිරිවරා සිටින නානාවිධ අසුචි පිරුණු මේ කරජකය මැ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මේ කයෙහි කෙස් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුළු වකුගඩු ළය අක්මා දලබු බඩදිව් පපුමස් අතුණු අතුණුබහන් නො පැසුණු අහර මල පිත් සෙම් පූයා ලෙහෙ සෝදිය මේදස කඳුළු වුරුණුතෙල් කෙළ මුකුණු සඳමිදුලු මූ යන මේ ඇතැ යි කියා යි. මෙසෙයින් අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන ඒ මහණහු ගේ ගෘහාශ්‍රිත වූ යම් මැ දිවෙන සංකල්පයෝ ඇද්ද ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචර සංඛ්‍යාත අධ්‍යාත්මයෙහි මැ සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකඟ වෙයි, සමාහිත වෙයි. මහණෙනි, මෙසෙයිනුදු මහණ කායගතස්මෘති භවයි.

තවද මහණෙනි, මහණ සිටි පරිදි තුබු පරිදි මැ මේ කය ම ධාතු වශයෙන් ප්‍රත්‍ය වෙක්ෂා කෙරෙයි: මේ කයෙහි පෘථිවිධාතු අබ්ධාතු තෙජොධාතු වායොධාතු ඇත කියා'යි.

සෙය්‍යථාපි භික්ඛවෙ, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ[1] බිලසො[2] විභජිත්වා[3] නිසින්නො අස්ස, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථාපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති: අත්ථි ඉමස්මිං කායෙ පථවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූ'ති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති. එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතං. සො ඉමමෙව කායං උපසංහරති: 'අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතො'ති.[4] තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං සුවාණෙහි[5] වා ඛජ්ජමානං සිගාලෙහි[6] වා ඛජ්ජමානං විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං. සො ඉමමෙව කායං උපසංහරති: 'අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතො'ති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසංකප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං න්හාරුසම්බන්ධං. -පෙ- අට්ඨිකසඞ්ඛලිකං නිම්මංසලොහිතමක්ඛිතං න්හාරුසම්බන්ධං, -පෙ- අට්ඨිකසඞ්ඛලිකං අපගතමංසලොහිතං න්හාරුසම්බන්ධං, -පෙ- අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසාසු වික්ඛිත්තානි[7] අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං.[8] අඤ්ඤෙන කටට්ඨිකං අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං[9] අඤ්ඤෙන සීසකටාහං[10] සො ඉමමෙව කායං උපසංහරති: අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

---

1. චතුමහාපථෙ - මජසං.
2. පලසො - ස්‍යා.
3. පටිවිභජිත්වා - ස්‍යා, PTS.
4. එවං අනතීතොති - සීමු, මජසං
5. සුනඛෙහි - සීමු, මජසං.
6. සිඞ්ගාලෙහි - මජසං, ස්‍යා.
7. දිසා විදිසා වික්ඛිත්තොති - ස්‍යා.
8. ඌරුට්ඨිකං - මජසං, ස්‍යා.
9. පිට්ඨිට්ඨිකං - සීමු, මජසං.
10. විසදිසපදානි මජසං පොත්ථකෙ දිස්සන්ති.

මහණෙනි, යම් පරිදි දක්ෂ ගොඝාතකයෙක් හෝ ගොඝාතක අතැවැසියෙක් හෝ දෙනක මරා සිව්මංසන්ධියෙහි කොටස් විසින් බෙදා තබා හුන්නේ වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ යථාස්ථිත වූ මේ කය ම ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි : මේ කයෙහි පෘථිවිධාතු අබ්ධාතු තෙජොධාතු වායොධාතු ඇතැ'යි කියා යි. මෙසේ අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන ඔහුගේ යම් ගෘහශ්‍රිත සරසංකල්පකෙනෙක් ඇද්ද ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් අධ්‍යාත්ම යෙහි මැ සිත පිහිටුවා සිටී. සන්හුන් වෙයි, එකඟ වෙයි, සමාහිත වේ. මෙසේත් මහණෙනි, මහණ කායිගයාසි වඩයි.

තවද මහණෙනි, මහණ මළ එක් දවසක් ඇති වේවයි මළ දෙදවසක් ඇති වේවයි මළ තුන්දවසක් ඇති වේවයි ඉදිමැගිය තැන තැන කුත්සිත නීලවර්ණ ඇති හටගත් පුයා ඇති සොහොනෙහි බහාලන ලද සිරුරක් යම් සේ දක්නේ ද හේ (තමා ගේ) මේ කයට එළවා බලයි : මේ කය ද මෙබඳු ස්වභාව ඇත්තේ යැ, මෙසේ වනසුලු යැ, තෙල ස්වභාව නො ඉක්මවන ලදැ යි. මෙසේ අප්‍රමත්ත ව ආතාපන වැර ඇති ව ප්‍රහිතාත්ම ව වෙසෙන ඔහුගේ යම් ගෘහශ්‍රිත යම් සරසංකල්ප කෙනෙක් වෙත් ද ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචරාධ්‍යාත්මයෙහි ම සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකඟ වෙයි,සමාධි ගත වෙයි. මෙසේත් මහණෙනි, මහණ කායිගයාසි භවයි.

තවද මහණෙනි, මහණ සොහොනෙහි දමන ලද කවුඩන් විසින් හෝ කනු ලබන උකුස්සන් විසින් හෝ කනු ලබන ගිජුලිහිණියන් විසින් හෝ කනු ලබන ශුනකයන් විසින් හෝ කනු ලබන සිවලුන් විසින් හෝ කනු ලබන විවිධ ක්ෂුද්‍රප්‍රාණිජාතීන් විසින් හෝ කනු ලබන සිරුරක් යම්සේ දක්නේ ද, හේ (තමා ගේ) මේ කය මැ එළවා බලයි : මේ කය ද මෙබඳු ස්වභාව ඇත්තේ යැ, මෙසේ වනසුලු යැ තෙල ස්වභාව නො ඉක්මවන ලදයි. මෙසේ අප්‍රමත්තව ආතාපන වීර්‍ය්‍ය ඇති ව ප්‍රහිතාත්ම ව වෙසෙන ඔහු ගේ යම් ගෘහශ්‍රිත සරසංකල්ප කෙනෙක් ඇත් ද ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචරාධ්‍යාත්මයෙහි මැ සිත පිහිටා සිටී, සන්හුන් වෙයි. එකාග්‍ර වෙයි, සමාධිගත වෙයි. මෙසේත් මහණෙනි, මහණ කායිගයාසි වඩයි.

තවද මහණෙනි, මහණ සොහොනෙහි දමන ලද මස් ලේ සහිත වූ නහරවලින් බැඳුණු ඇටසැකිලි වූ සිරුරක් යම් සේ දක්නේ ද ... මස් රහිත ලෙයින් වැකුණු නහරවැලින් බැඳුණු ඇටසැකිලි වූ සිරුර ... අපගත මස්ලෙහෙ ඇති නහර වැලින් බැඳුණු ඇටසැකිලි වූ සිරුර ... අපගත සම්බන්ධ ඇති දිසාවිදිසායෙහි විසුරුණු ඇට ඇති අන් තැනෙක අත් ඇටය අන් තැනෙක පාඇටය අන් තැනෙක කෙණ්ඩාඇටය අන් තැනෙක කලවාඇටය අන් තැනෙක පිටකටුවය අන් තැනෙක හිස්කබලය යන මේ ඇති සිරුරක් යම් සේ දක්නේ ද, ඒ මහණ මේ කය මැ එළවා බලයි : මේ කය ද මෙබඳු ස්වභාව ඇත්තෙ යැ, මෙසේ වනසුලු යැ, තෙල ස්වභාව නොඉක්මවන ලදැ යි. මෙසේ අප්‍රමත්ත ව ආතාපන වීර්‍ය්‍ය ඇති ව ප්‍රහිතාත්ම ඇතිව වසන ඔහුගේ යම් ගෘහශ්‍රිත සරසංකල්ප කෙනෙක් ඇද්ද ඔහු ප්‍රහීණ වෙති. ඔවුන් ගේ ප්‍රහාණයෙන් අධ්‍යාත්මයෙහි සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකාග්‍ර වෙයි, සමාධිගත වෙයි. මෙසෙයිනුදු මහණෙනි, මහණ කායිගයාසි වඩයි.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි[1] -පෙ- අට්ඨිකානි පුඤ්ජකිතානි[2], තෙරොවස්සිකානි, -පෙ- අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි, සො ඉමමෙව කායං උපසංහරති: අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, දක්ඛො නහාපකො[3] වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය, සාස්ස[4] නහානීයපිණ්ඩි සෙනහානුගතා සෙනහපරෙතා සන්තරබාහිරා ඵුටා සෙනහෙන, න ච පග්ඝරිණී. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති, පරිසන්දෙති, පරිපූරෙති, පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා, තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති, පරිසන්දෙති, පරිපූරෙති, පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, උදකරහදො ගම්භීරො උබ්භිදොදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සායමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්සායමුඛං[5], න උත්තරාය දිසාය උදකස්සායමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්සායමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. අථ ඛො තම්හාව උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා[6] තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය. නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

---

1. සඞ්ඛවණ්ණපටිභාගානි - මජ්සං
2. පුඤ්ජකජාතානි - ස්‍යා.
3. නහාපකො - මජ්සං.
4. සායං - මජ්සං
5. උදකස්සාගුම්බං - PTS.
6. උබ්භිජ්ජිත්වා - සීමු.

තවද මහණෙනි, මහණ සොහොනෙහි දමන ලද සක්වත් පැහැති සුදු ඇට...එකතු වූ හවුරුදු පැන ගිය ඇට ... සුණු ව සිටි කුණු වූ ඇට යම්සේ දක්නේ ද ඒ මහණ මේ කය ද මෙ බඳු ස්වභාව ඇත්තේ යැ. මෙසේ වන්නේ යැ, තෙල සැහැවි නො ඉක්මවන ලද යි. මෙසේ නො පමා ව ආතාපන වීර්‍ය්‍ය ඇතිව ප්‍රහිතාත්ම ව වාස කරනා ඒ මහණහු ගේ ගෘහශ්‍රිත යම් ම ධාවන සංකල්ප කෙනෙක් ඇද්ද, ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචරාධ්‍යාත්මයෙහි ම සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකාග්‍ර වෙයි, සමාධිගත වෙයි. මෙසේත් මහණෙනි, මහණ කාගියාසි භවයි.

තවද මහණෙනි, මහණ කාමයෙන් වෙන් ව මැ අකුශල දහමින් වෙන් ව සවිතර්ක සවිචාර විවෙකජ ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසෙයි. හේ මේ කය මැ විවේකජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි. හාත්පසින් පුරයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. මොහුගේ හැම කය පිළිබඳ කිසිදු තැනෙක් විවේකජ ප්‍රීතිසුඛයෙන් ස්පර්ශ නො කරන ලද්දේ නො වෙයි. මහණෙනි, යම් පරිදි දක්ෂ වූ නහවනුයෙක් හෝ නහවනු අතැවැසියෙක් හෝ කස්ලෝතලියෙහි නහනුසුණු විසුරුවා පුන පුනා දිය ඉසැ පිඩු කෙරේ ද, ඒ නහනුපිඩු අනුගත උදකස්නේහ ඇති ව පරිගත උදක ස්නේහ ඇති ව දියෙන් ඇතුළත හා බැහැර පහස්නා ලද වේ ද නො ද වැගිරේ ද මහණෙනි, එපරිදි ම මහණ මේ කය මැ විවෙකජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි, හැම කය පිළිබඳ කිසිදු තැනෙක් විවේකජ ප්‍රීතිසුඛයෙන් නො පහළේ නො වෙයි. මෙසේ අප්‍රමත්ත ව ආතාපන වීර්‍ය්‍ය ඇති ව ප්‍රහිතාත්ම ව වසන ඔහු ගේ ගෘහශ්‍රිත වූ යම් මැ ධාවන සංකල්ප කෙනෙක් ඇද්ද, ඔහු ප්‍රහීණ වෙති. ඔවුන්ගේ ප්‍රහාණයෙන් ගොචාරාධ්‍යාත්මයෙහි මැ සිත පිහිටාසිටී. සන්හුන් වෙයි, එකාග්‍ර වෙයි, සමාධිගත වෙයි. මෙසෙයිනුදු මහණෙනි, මහණ කාගියාසි වඩයි.

තවද මහණෙනි, මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් තමා තුළ පැහැදීම ඇති චිත්තෛකාග්‍රභාවය ඇති අවිතර්ක අවිචාර සමාධිජ ප්‍රීති සුඛ ඇති ද්විතීය ධ්‍යානය උපදවා වෙසෙයි. හේ මෙ කය මැ සමාධිජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත් පසින් තෙමයි, හාත්පසින් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. හැම කය පිළිබඳ කිසිදු තැනෙක් සමාධිජ ප්‍රීතිසුඛයෙන් නො පහළේ නො වෙයි. මහණෙනි, යම් පරිදි ගැඹුරු නැඟෙන දිය ඇති, උදකහ්‍රදයෙක් වේ ද එයට පෙරදික්හි දු දිය එන මගෙක් නැද්ද පැසිම් දික්හි දු දිය එන මහෙක් නැද්ද, උතුරු දික්හි දු දිය එන මහෙක් නැද්ද, දකුණු දික්හි දු දිය එන මහෙක් නැද්ද මෙසයත් කලින් කල සම්‍යග්ධාරා නො වස්වා ද එසඳ ඒ හ්‍රදයෙන් ශීතවාරිධාරාව පොළොවින් නැඟී ඒ හ්‍රදය මැ ශීතජලයෙන් තෙමා ද හාත්පසින් තෙමා ද, පුරවා ද හාත්පසින් ස්පර්ශ කෙරේ ද, හැම හ්‍රදය පිළිබඳ කිසිදු තැනෙක් ශීතජලයෙන් නොපහළේ නො වේ ද මහණෙනි, එපරිදි මැ මහණ මේ කය මැ සමාධිජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, හාත්පස පුරවයි, ස්පර්ශ කෙරෙයි, හැම කය පිළිබඳ කිසි දු තැනෙක් සමාධිජ ප්‍රීතිසුඛයෙන් නො පහළේ නො වෙයි. මෙසෙයින් නො පමා වූ කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඔහුගේ යම් කාමනිශ්‍රිත ධාවන සංකල්ප කෙනෙක් ඇද්ද, ඔහු ප්‍රහීණ වෙති. උන්ගේ ප්‍රහාණයෙන් ගොචරාධ්‍යාත්මයෙහි මැ සිත පිහිටා සිටී, සන්හුන් වෙයි, එකඟ වෙයි, සමාධිගත වෙයි. මෙලෙසිනි දු මහණෙනි, මහණ කායගතස්මෘති වඩන්නේ ය.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති : උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති, සෙය්‍යථාපි භික්ඛවෙ, උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි. තානි යාව ච අග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි. නාස්ස කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා, අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. තස්ස එවං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො යෙ ගෙහසිතා සරසඞ්කප්පා තෙ පහීයන්ති. තෙසං පහානා අජ්ඣත්තමෙව චිත්තං සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති, සමාධියති. එවම්පි ඛො භික්ඛවෙ, භික්ඛු කායගතං සතිං භාවෙති.

යස්ස කස්සචි භික්ඛවෙ, කායගතා සති භාවිතා බහුලීකතා අන්තොගධා තස්ස[1] කුසලා ධම්මා යෙ කෙචි විජ්ජාභාගියා. සෙය්‍යථාපි භික්ඛවෙ, යස්ස කස්සචි මහාසමුද්දො චෙතසා ඵුටො, අන්තොගධා තස්ස[1] කුන්නදියො යා කාචි සමුද්දඞ්ගමා. එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතාසති භාවිතා බහුලීකතා අන්තොගධා තස්ස කුසලා ධම්මා යෙ කෙචි විජ්ජාභාගියා.

යස්ස කස්සචි භික්ඛවෙ, භික්ඛුනො කායගතා සති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං, ලභති තස්ස මාරො ආරම්මණං.

---

1. අන්තොගධාවාස්ස - මජ්සං.

තව ද මහණෙනි, මහණ ප්‍රීතිවිරාගයෙනුදු උපෙක්ෂක ව ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව ද වාස කෙරෙයි. නාමකයින් සුඛය ද විඳී. බුද්ධාදි ආර්‍ය්‍යයෝ යම් ඒ ධ්‍යානයක් ගෙන උපෙක්ෂක යැ ස්මෘතිමත් යැ සුඛවිහාරී යැයි බෙණෙත් ද, ඒ තෘතීයධ්‍යාන උපයාගෙන වාස කෙරෙයි. හේ මේ කය මැ නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරවයි, ස්පර්ශ කෙරෙයි. හැම කය පිළිබඳව කිසිදු තැනෙක් නිෂ්ප්‍රීතික සුඛයෙන් නො පහළේ නො වේ. මහණෙනි, යම් පරිදි උපුල් විලෙක වේවයි හෙළපියුම් විලෙක වේවයි රත්පියුම් විලෙක වේවයි ඇතැම් උපුල්හු හෝ හෙළපියුම්හු හෝ රත්පියුම්හු හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැංගාහු දියතුළ ගැලී වැඩෙන්නාහු වෙත් ද, ඔහු අග දක්වාත් මුල දක්වාත් සිහිල් දියෙන් තෙමුණාහු හාත්පසින් තෙමුණාහු පිරුණාහු පහළාහු වෙත් ද, උපුල් වේවයි හෙළපියුම් වේවයි රත්පියුම් වේවයි හැම පද්මයන්ගේ කිසිදු තැනෙක් සිහිල් දියෙන් නො පහළේ නො වේ ද, මහණෙනි, එපරිදි මැ මහණ මෙ කය මැ නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරවයි, ස්පර්ශ කෙරෙයි, සියලු කය පිළිබඳ කිසිදු තැනෙක් නිෂ්ප්‍රීතික සුඛයෙන් නො පහළේ නො වෙ යි. මෙසෙයින් අප්‍රමාදවිහාරී වැ ආතාපන වීර්‍ය්‍ය ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරන ඔහුගේ ගෘහශ්‍රිතවූ යම් මැ ධාවනසංකල්ප කෙනෙක් ඇද්ද, ඔහු ප්‍රහීණ වෙති. උන්ගේ ප්‍රහාණයෙන් අධ්‍යාත්මයෙහි මැ සිත පිහිටා සිටී. සන්සුන් වෙයි, එකාග්‍ර වෙයි, සමාධිගත වෙයි. මෙසෙයිනුදු මහණෙනි, මහණ කාගියාසි වඩයි.

තවද මහණෙනි, මහණ සුඛයාගේ ප්‍රහාණයෙනුදු දුඃඛයාගේ ප්‍රහාණයෙනුදු කැලම සොම් නස් දොම්නසුන් ගේ අස්තංගමයෙන් අදුඃඛ වූ අසුඛ වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘතිපාරි ශුද්ධි ඇති චාතුර්ථධ්‍යාන උපයාගෙන වාස කෙරෙයි. හේ මෙ කය මැ නිරුපක්ලෙශ වූ ප්‍රභාස්වර වූ සිතින් පැහැර හුන්නේ වෙයි. ඔහු ගේ හැම කය පිළිබඳ කිසිදු තැනෙක් පරිශුද්ධ පර්‍ය්‍යාවදාත වූ සිතින් නො පහළේ නො වෙයි. මහණෙනි යම් පරිදි පුරුෂයෙක් අවදාත වස්ත්‍රයෙකින් හිස වටා පෙරව හුන්නේ වේ ද, ඔහුගේ හැම කය පිළිබඳ කිසිදු තැනෙක් අවදත වස්ත්‍රයෙන් නො පහළේ නො වේ ද, එපරිදී මැ මහණෙනි, මහණ මෙ කය මැ පරිශුද්ධ පර්‍ය්‍යවදාත වූ සිතින් පැහැරගෙන හුන්නේ වෙයි. ඔහුගේ හැම කය පිළිබඳ කිසිදු තැනෙක් පිරිසිදු පර්‍ය්‍යවදාත වූ සිතින් නො පහරන ලද නො වෙයි. මෙසේ අප්‍රමාද විහරණ ඇති ව ආතාපන වීර්‍ය්‍ය ඇති වැ කායජීවිත නිරපෙක්ෂක ව වාසය කරන ඔහුගේ යම් කාමනිඃශ්‍රිත දිවෙන සංකල්ප කෙනෙක් ඇද්ද ඔහු ප්‍රහීණ වෙති. උන් ගේ ප්‍රහාණ යෙන් අධ්‍යාත්මයෙහි මැ සිත පිහිටා සිටී. සන්හුන් වෙයි, සමාධිගත වෙයි. මෙසෙ යිනුදු මහණෙනි, මහණ කාගියාසි වඩයි.

මහණෙනි, යම් කිසි මහණක්හු විසින් කාගියාසි භාවිත වේ ද බීහිලී කරන ලද වේ ද, විද්‍යා භාගයට අයත් යම් කිසි ධර්මකෙනෙක් ඇත් නම් ඒ කුශලධර්මයෝ ඔහුට අන්තොගධ වෙති. මහණෙනි, යම් පරිදි යමක්හු විසින් මහමුහුද සිතින් පහස්නා ලද ද මුහුද කරා යන හැම කුන්නදීහු ඇද්ද එයට ඇතුළත් වෙති. මහණෙනි, එපරිදි මැ යම්කිසි මහණක්හු විසින් කාගියාසි භාවිත වේ ද බහුලීකෘත වේ ද, විද්‍යාභාගයෙහි වූ යම් මැ කුශලධර්ම කෙනෙක් ඇද්ද ඔහු එයට ඇතුළත් වෙති.

මහණෙනි, යම්කිසි මහණක්හු විසින් කාගියාසි අභාවිත වේ ද අබහුලීකෘත වේ ද, ඔහුට මාරයා අවතරණ ලබයි. ඔහුට මාරයා ආලම්බන ලබයි.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ගරුකං සිලාගුළං අල්ලමත්තිකාපුඤ්ජෙ පක්ඛිපෙය්‍ය, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු තං ගරුකං සිලාගුළං අල්ලමත්තිකාපුඤ්ජෙ ලභෙථ ඔතාරන්ති.

එවං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං ලභති තස්ස මාරො ආරම්මණං.

සෙය්‍යථාපි භික්ඛවෙ, සුක්ඛං කට්ඨං කොළාපං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි[1]. තෙජො පාතුකරිස්සාමීති[2]. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං සුක්ඛං කට්ඨං කොළාපං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යාති

එවං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං ලභති තස්ස මාරො ආරම්මණං.

සෙය්‍යථාපි භික්ඛවෙ, උදකමණිකො රිත්තො තුච්ඡො ආධාරෙ ඨපිතො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උදකභාරං ආදාය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො ලභෙථ උදකස්ස නික්ඛෙපනන්ති.

එවං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං ලභති තස්ස මාරො ආරම්මණං.

යස්ස කස්සචි භික්ඛවෙ, කායගතා සති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං, න තස්ස ලභති මාරො ආරම්මණං. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො ලහුකං සුත්තගුළං සබ්බසාරමයෙ අග්ගළඵලකෙ පක්ඛිපෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො තං ලහුකං සුත්තගුළං සබ්බසාරමයෙ අග්ගළඵලකෙ ලභෙථ ඔතාරන්ති.

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං න තස්ස ලභති මාරො ආරම්මණං.

සෙය්‍යථාපි භික්ඛවෙ, අල්ලං කට්ඨං සස්නෙහං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි තෙජො පාතුකරිස්සාමීති. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං උත්තරාරණිං ආදාය අභිමන්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යාති.

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං න තස්ස ලභති මාරො ආරම්මණං.

---

1. අභිනිබ්බත්තිස්සාමි - ස්‍යා.
2. තෙජොධාතුං කරිස්සාමීති - ස්‍යා.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් බර වූ ශිලාගුලයක් එක් මැටිපිඩෙක බහාලන්නේ වේ ද, මහණෙනි එ කිමැයි හඟනවු ද ඒ බර වූ ගල් කැට තෙත් මැටි පිඩෙහි ගිලීම් ලබා ද,

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි මැ යම් කිසි මහණක්හු විසින් කාගියායි අභාවිත අබහුලීකෘත වේ ද, ඒ මහණහු පිළිබඳ ව මාරයා අවතරණ ලබයි. මාරයා ඔහු පිළිබඳ අරමුණු ලබයි.

මහණෙනි, යම් පරිදි වියළි කොළපු වූ කාෂ්ටයෙක් ඇත් ද, එසඳ කිසි පුරුෂයෙක් ' ගිනි නිපදවම් තෙජොධාතු පහළ කරමි ' උතුරුරිණි (ගිනිගානාදඩු) ගෙන එන්නේ වේ ද, මහණෙනි ඒ කෙසේ හඟනහු; ඒ පුරුෂ වියළි කොළපු වූ මේ කාෂ්ටය උතුරුරිණි ගෙන මඩනේ ගිනි නිපද වන්නේ වේ ද ? තෙජොධාතු පහළ කරන්නේ වේ ද ?

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි ම යම් කිසි මහණක්හු විසින් කායගත ස්මෘතිය අභාවිත වේ ද, අබහුලීකෘත වේ ද, ඒ මහණහු පිළිබඳ ව මාරයා අවතරණ ලබයි. ඔහු පිළිබඳව මාරයා අරමුණු ලබයි.

මහණෙනි, යම් පරිදි ආධාරයෙක තැබූ හිස් වූ මහදිය සැළියෙක් ඇද්ද, එසඳ පුරුෂයෙක් දිය බරක් ගෙන එන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ හඟනාව ; ඒ පුරුෂ දිය බහාලීම් ලබන්නේ වේ ද ?

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි ම යම් කිසි මහණක්හු, විසින් කාගියායි අභාවිත අබහුලීකෘත වේ ද, ඒ මහණහු පිළිබඳව මාරයා අවතරණ ලබයි. ඔහු පිළිබඳව මාරයා අරමුණු ලබයි.

මහණෙනි, යම් කිසි මහණක්හු විසින් කායගතාසතිය භාවිත බහුලීකෘත වේ ද, ඔහු පිළිබඳව මාරයා අවතරණ නොලබයි, ඔහු පිළිබඳව මාරයා අරමුණු නොලබයි, මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් සැහැල්ලු වූ හුහුළක් හැම හරමුවා කවුළුපුවරුයෙක්හි බහා ලන්නේද මහණෙනි ඒ කිමැයි හඟනවු ද ; ඒ පුරුෂ ඒ සැහැල්ලු වූ හුහුළ හැම හරමුවා කවුළු පුවරුයෙහි අවතරණය ලබන්නේ ද ?

වහන්ස, තෙල නොවේ මැ ය.

මහණෙනි, එපරිදි මැ යම් කිසි මහණක්හු විසින් කායගතාසති භාවිත බහුලීකෘත වෙ ද, ඔහු පිළිබඳ ව මාරයා අවකාශ නො ලබයි. ඔහු පිළිබඳ ව මාරයා අරමුණු නො ලබයි.

මහණෙනි, යම් සේ කිරි සහිත අමු දිඹුල් කැටෙක් වේ ද, එසඳ පුරුෂයෙක් උතුරුරිණි ගෙන ගිනි නිපදවම් තෙද පහළ කෙරෙමි එන්නේ වේ ද, මහණෙනි ඒ කෙසේ හඟනාව : කිම ඒ පුරුෂ දිය සහිත වූ තෙත් මේ උදුම්බර කාෂ්ඨය උතුරු ගිනිගානා දඬු ගෙන මඩනේ ගිනි නිපදවා ද, තෙද පහළ කෙරේ ද ?

වහන්ස, තෙල නො වේ මැ ය.

මහණෙනි, එසෙයින් ම යම් කිසි මහණක්හු විසින් කාගියායි භාවිත බහුලීකෘත වේ ද, මාරයා ඔහුට අවතරණ නො ලබයි. මාරයා ඔහුට අරමුණු නො ලබයි.

සෙය්‍යථාපි භික්ඛවෙ, උදකමණිකො පූරො උදකස්ස සමතිත්තිකො කාකපෙය්‍යො ආධාරෙ ඨපිතො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උදකහාරං ආදාය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො ලභෙථ උදකස්ස නික්ඛෙපනන්ති.

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං, න තස්ස ලභති මාරො ආරම්මණං.

යස්ස කස්සචි භික්ඛවෙ, කායගතා සති භාවිතා බහුලීකතා, සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං[1] පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ, උදකමණිකො පූරො උදකස්ස සමතිත්තිකො කාකපෙය්‍යො ආධාරෙ ඨපිතො, තමෙනං බලවා පුරිසො යතො යතො ආවජ්ජෙය්‍ය[2], ආගච්ඡෙය්‍ය උදකන්ති.

එවං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ, සමෙ භූමිභාගෙ චතුරස්සා පොක්ඛරණී[3] අස්ස ආළිබද්ධා[4] පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. තමෙනං බලවා පුරිසො යතො යතො ආළිං මුඤ්චෙය්‍ය[5], ආගච්ඡෙය්‍ය උදකන්ති.

එවං භන්තෙ.

එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ, සුභූමියං චාතුම්මහාපථෙ ආජඤ්ඤරථො යුත්තො අස්ස ඨිතො ඔධස්තපතොදො[6]. තමෙනං දක්ඛො යොග්ගාචරියො අස්සදම්මසාරථි අභිරුහිත්වා වාමෙන හත්ථෙන රස්මියො ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන පතොදං[7] ගහෙත්වා යෙනිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍යාපි පච්චාසාරෙය්‍යාපි[8] එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතා සති භාවිතා බහුලීකතා, සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

---

1. සක්ඛිබ්‍යතං - ස්‍යා.
   සක්ඛිව්‍යතං - PTS.
2. ආපජ්ජෙය්‍ය - ස්‍යා.
   ආවිජ්ඣෙය්‍ය - PTS.
3. පොක්ඛරිණී - සීමු.
4. ආළිබන්ධා - මජසං.
5. ආළිං පවෙජ්ජය්‍ය - ස්‍යා.
6. උභන්තරපටොදො - ස්‍යා.
7. පටොදං - ස්‍යා.
8. යදිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍ය - ස්‍යා.

මහණෙනි, යම් සේ මුව විට සමව සිටි කවුඩන් විසින් පියැ‍ෙහන ආධාරයෙක තැබූ දිය පිරුණු දිය සැළෙක් වේ ද, එසඳ පුරුෂයෙක් දිය තෙරනා බඳුනක් ගෙන එන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ හඟනාව ? කිම ඒ පුරුෂ උදක නික්ෂෙපයක් ලබා ද ?

වහන්ස, නෙල නො වේ මැ යැ.

මහණෙනි, එපරිදි මැ යම් කිසි මහණක්හු විසින් කාගියාසි භාවිත බහුලීකෘත වේ ද, මරු ඔහු පිළිබඳ අවතරණ නො ලබයි. මරු ඔහු පිළිබඳව ආලම්බන නො ලබයි.

මහණෙනි, යම් කිසි මහණක්හු විසින් කාගියාසි භාවිත බහුලීකෘත වේ ද. හේ අභිඥයෙන් පසක් කළ යුතු යම් යම් දහමක් පිළිබඳව අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස සිත නතු කෙරේ ද කාරණ ඇතිවත් ම ඒ ඒ දහමෙහි ප්‍රත්‍යක්ෂ භාවයට පැමිණෙයි.

මහණෙනි, යම් පරිදි සමතිත්තික ව සිටි කාකපෙය ව සිටි ආධාරයෙහි ස්ථාපිත දිය පිරුණු මහදිය සැළෙක් වේ ද, බලවත් පුරුෂයෙක් තෙල දිය සැළ '' යම් යම් පසෙකින් නමන්නේ නම් (ඒ ඒ පසින්) දිය එන්නේ වේ ද''යි.

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි මැ යම් කිසි මහණක්හු විසින් කායගතස්මෘති භාවිත බහුලීකෘත වේ ද, හේ අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුතු යම් යම් දහමකට අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස සිත නතු කෙරේ ද, අභිඥ කාරණ ඇති වන්නේ මැ ප්‍රත්‍යක්ෂ භාවයට පැමිණෙයි.

මහණෙනි, යම් පරිදි සම භූමිභාගයෙක්හි බැඳි මියර ඇති සම තිත්තික ව කාකපෙය වැ දිය පිරුණු සිවරැස් පොකුණෙක් වේ ද, බලවත් පුරුෂයෙක් යම් යම් පසෙකින් තෙල පොකුණ මියර බිඳුණේ නම් දිය වහනය වේ ද ?

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි මැ යම් කිසි මහණක්හු විසින් කායගතස්මෘති භාවිත බහුලීකෘත වේ ද, හේ අභිඥයෙන් පසක් කළ යුතු යම් මැ දහමකට අභිඥයෙන් පසක් කරනු පිණිස සිත නතු කෙරේ නම් අභිඥ කාරණ ඇති වත් ම සාක්ෂ්‍ය භව්‍යතාවට පැමිණෙයි.

මහණෙනි, යම් පරිදි මනා බිමෙක සිවමං සන්ධියෙක්හි ගත හැකි සේ තබන ලද කෙවිටි ඇති ව සිටි යුක්ත කළ ආජන්‍ය රථයෙක් වේ ද, දක්ෂ අශ්වාචාර්‍ය වූ අස්දම් සැරියෙක් තෙල රිය නැඟී වමතින් රැහැන් ගෙන දකුණතින් කැහිටි ගෙන කැමැති සේ කැමැති දිගෙක පද වන්නේත් පෙරළා පදවන්නේත් වේ ද, මහණෙනි, එපරි දි ම යම් කිසි මහණක්හු විසින් කාගියාසි භාවිත බහුලීකෘත වේ ද, හේ අභිඥයෙන් පසක් කළ යුතු යම් මැ දහමකට අභිඥයෙන් පසක් කරනු පිණිස සිත නතු කෙරේ ද, ඒ ඒ දහමෙහි අභිඥකාරණ ඇති ඇති විට ප්‍රත්‍යක්ෂභාවයට පැමිණෙයි.

කායගතාය භික්ඛවෙ, සතියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ දසානිසංසා පාටිකඞ්ඛා. කතමෙ දස:

අරතිරතිසහො හොති, න ච තං අරති සහති, උප්පන්නං අරතිං අභිභුය්‍ය අභිභුය්‍ය විහරති, භයභෙරවසහො හොති, න ච තං භයභෙරවං සහති, උප්පන්නං භයභෙරවං අභිභුය්‍ය අභිභුය්‍ය විහරති. ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

සො අනෙකවිහිතං ඉද්ධිවිධං[1] පච්චනුභොති. එකොපි හුත්වා බහුධා හොති. බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ[2]. ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති : දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ සන්තිකෙ ච. පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති : සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. ඉද්ධිවිධිං - ස්‍යා.
2. අභිජ්ජමානො - සීමු.

මහණෙනි, කායගතාසතිය ආසෙවිත කල්හි භාවිත කල්හි බහුලීකෘත කල්හි යුක්ත යානයක් සේ කළ කල්හි ප්‍රතිෂ්ඨා කළ කල්හි නැවත නැවත පැවැත් වූ කල්හි පරිචය කළ කල්හි සම්ප්‍රග්‍රහ කළ කල්හි මේ දස අනුසස් කෙනෙක් කැමැති විය යුත්තාහ. කවර දස අනුසස් යැ යත් :

අධිකුශලයෙහි නො ඇලීම හා පඤ්චකාමගුණිකරතිය සිහියැ හැකි වෙයි. අරතිය ඔහු නො සහයි. උපන් අරතිය පුනපුනා මැඩ වෙසෙයි. භයභෛරව සිහියැ හැකි වෙයි. භය හා භෛරවාලම්බන ඔහු නො සෙහෙයි. උපන් භය භෛරවාලම්බන මැඩ මැඩ වෙසෙයි. ශීත උෂ්ණ සාපවස් මැසිමදුරුවාඅව් සපුන්ගේ පහස් සහනු වෙයි. දුරුක්ත දුරාගත වචනපථ හා දුඃඛ තීව්‍ර බර කටුක අමධුර අමනාපකර ප්‍රාණහර වූ උපන් ශාරීරික වෙදනාවන් ඉවසන සැහැවි ඇති වෙයි. අභිචිත්තය ඇසුරු කළ ඉහාත්මසුඛප්‍රතිලාභයට හෙතු වූ සිව් දැහැන් කැමැතිසේ ලබනසුලු වෙයි, නිදුකින් ලබනසුලු වෙයි, විපුල කොට ලබනසුලු වෙයි.

හේ අනෙක ප්‍රකාර ඍද්ධිභෙද වළඳ කෙරෙයි. එකෙක් වැ සිට බහුප්‍රකාර වෙයි, බහු ප්‍රකාර වැ සිට එකෙක් වෙයි. ආවිර්භාවයට තිරොභාවයට භිත්තියගේ පාරයට ප්‍රාකාර යාගේ පාරයට පර්වතයාගේ පාරයට අහසෙහි සෙයින් නො පැහැර ආකාශයෙහි යනුවන් සෙයින් යෙයි. පොළොවෙහි ද දියෙහි සෙයින් උන්මජ්ජන කෙරෙයි. දියෙහි ද පොළොවෙහි සෙයින් අභිද්‍යමාන වැ යෙයි. අහස්හිදු පක්ෂශකුනීන් සෙයින් පලඟින් යෙයි. මෙබඳු මහත් ඍද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද කර තලයෙන් පරාමර්ශ පරිමාර්ජන කෙරෙයි. යාවද්බ්‍රහ්මලොකය දක්වා ස්වශරීරයෙන් සිය විසිය පවත්වයි.

මිනිස් කන ඉක්මැ වූ විශුද්ධ දිව්‍යශ්‍රොත්‍රධාතුයෙන් දුරස්ථ වූත් සමීපස්ථ වූත් දිව්‍යමානුෂ උභය ශබ්දයන් අසයි. සිය සිතින් පර සත්ත්වයන්ගේ පර පුද්ගලයන්ගේ සිත පිරිසිඳ දනී, සරාග සිත හෝ සරාග සිතැයි දැනගනී. වීතරාග සිත හෝ වීතරාග සිතැ යි දැනගනී. සදොෂ සිත හෝ සදොෂ සිතැයි දැනගනී. වීතදොෂ සිත හෝ වීතදොෂ සිතැයි දැනගනී. සමොහ සිත හෝ සමොහ සිතැයි දැනගනී. වීතමොහ සිත හෝ වීතමොහ සිතැයි දැනගනී. සංක්ෂිප්ත සිත හෝ සංක්ෂිප්ත සිතැ යි දැනගනී. වික්ෂිප්ත සිත හෝ වික්ෂිප්ත සිතැ යි දැනගනී. මහද්ගත සිත හෝ මහද්ගත සිතැ යි දැනගනී, අමහද්ගත සිත හෝ අමහද්ගත සිතැයි දැනගනී. සඋත්තර සිත හෝ සඋත්තර සිතැයි දැනගනී. අනුත්තර සිත හෝ අනුත්තර සිතැයි දැනගනී, සමාහිත සිත හෝ සමාහිතැයි සිතැයි දැනගනී. අසමාහිත සිත හෝ අසමාහිත සිතැයි දැනගනී. විමුක්ත සිත හෝ විමුක්ත සිතැයි දැන ගනී. අවිමුක්ත සිත හෝ අවිමුක්ත සිතැයි දැනගනී.

සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

කායගතාය භික්ඛවෙ, සතියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ දසානිසංසා පාටිකඞ්ඛාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

කායගතාසති සුත්තං නවමං.

හේ අනෙක ප්‍රකාර පූර්වනිවාස අනුස්මරණ කෙරෙයි. කිසේ යැ යත්: එක් ජාතියකුදු ජාති දෙකකකුදු ... මෙසේ සාකාර සඋද්දෙස අනෙකප්‍රකාර පූර්වනිවාස අනුස්මරණ කෙරෙයි. මිනිසැස ඉක් මැ සිටී විශුද්ධ දිව්‍ය චක්ෂුසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සත්ත්වයන් දකී. මෙසේ යථාකර්මොපගත සත්ත්වයන් ප්‍රඥයෙන් දනගනී. ආශ්‍රවක්ෂය හෙතුයෙන් අනාශ්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥවිමුක්ති දුටුධැමි යෙහි මැ තෙමේ විශිෂ්ට ඥනයෙන් පසක් කොට උපයා වාස කෙරෙයි.

මහණෙනි, ආසෙවිත භාවිත බහුලීකෘත යුක්තයානයක් සේ කළ ප්‍රතිෂ්ඨා කළ අනුස්ථිත පරිචිත සුසමාරබ්ධ කායගතස්මෘතිය ගේ මේ දශ ප්‍රකාර අනුසස්හු කැමැති විය යුත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ මේ කායගතාසති සූත්‍රය වදාළ සේක. ප්‍රීතිසෞමනස්‍යයෙන් ගත් සිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ ඒ භාෂිතය අභිනන්දනයෙන් පිළිගත්හු.

නවවැනි කායගතාසති සූත්‍ර යි.

---

# 3. 2. 10
## සඞ්ඛාරූපපත්ති සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවෝති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච :

සඞ්ඛාරූපපත්තිං[1] වො, භික්ඛවෙ, දෙසිස්සාමි. තං සුණාථ. සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති. සීලෙන සමන්නාගතො හොති. සුතෙන සමන්නාගතො හොති. චාගෙන සමන්නාගතො හොති. පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවං භාවිතා එවංබහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති. සීලෙන සමන්නාගතො හොති. සුතෙන සමන්නාගතො හොති. චාගෙන සමන්නාගතො හොති. පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා බ්‍රාහ්මණමහාසාලානං වා -පෙ- ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති. සීලෙන සමන්නාගතො හොති. සුතෙන සමන්නාගතො හොති. චාගෙන සමන්නාගතො හොති. පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : චාතුම්මහාරාජිකා[2] දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා'ති තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති.

1. සඞ්ඛාරූපපත්තිං - සීමු, මජසං, ස්‍යා.
2. චාතුමහාරාජිකා - මජසං.

# 3. 2. 10
# සංඛාරුපපත්ති සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීප යෙහි අනේපිඬු මහසිටුහු ගේ දෙවරම් වෙහෙර වැඩ වාසය කෙරෙති. එකල භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යී මහණුන් ඇමතූ සේක. ' වහන්සැ ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල සංඛාරුප්පත්ති සූත්‍රය වදාළෝ.

මහණෙනි, තොපට සංස්කාරොත්පත්තිය දෙසමි. ඒ අසව, මනා කොට මෙනෙහි කරව. කියමි ' යි වදළ කල වහන්ස, එසේ යැ ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රැතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහුට මෙසේ සිතෙක් වෙයි : " මම කාබුන් මරණින් මතුයෙහි කැත් මහසල්කුලන් ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු " යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් හවයි. මෙසේ භාවිත මෙසේ බහුලීකෘත ඔහු ගේ ඒ සංස්කාරයෝ ද විහරණයෝ ද එහි උපත පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපත් ඒ උපත පිණිස පවතී.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රැතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහුට මෙසේ සිත් වෙයි : ' මම කාබුන් මරණින් මතුයෙහි බමුණු මහසල් කුලන් ගේ හෝ . . . ගැහැවිමහසල් කුලන් ගේ හෝ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු ' යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් හවයි. ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහරණයෝ මෙසේ භාවිත වූවාහු මෙසේ බහුලීකෘත වූවාහු එහි උපත පිණිස වැටෙත්. මහණෙනි, මේ පිළිවෙත එහි උපතට වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රැතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් අසන ලද වෙයි. ' සියුමහරජයෙහි වූ දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ ' යි කියා යි. ඔහුට මෙසේ සිත් වෙයි : ' මම කාබුන් මරණින් මතුයෙහි සිවුමහරජයෙහි දෙවියන් ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු ' යි, හේ එසිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් වඩයි. ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහරණයෝ මෙසේ භාවිත ව මෙසේ බහුලීකෘත ව සිට ඒ දෙව්ලොව උපත් පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ග මේ ප්‍රතිපත් එහි උපතට වැටෙයි.



18—ඒ 00502 (8/73)

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති. සීලෙන සමන්නාගතො හොති. සුතෙන සමන්නාගතො හොති. චාගෙන සමන්නාගතො හොති. පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති: තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මාණරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තිනො[1] දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති. අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවං බහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං ඛො භික්ඛවෙ මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන සමන්නාගතො හොති, සුතෙන සමන්නාගතො හොති, චාගෙන සමන්නාගතො හොති, පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති: 'සහස්සො බ්‍රහ්මා දීඝායුකො වණ්ණවා සුඛබහුලො'ති. සහස්සො භික්ඛවෙ, බ්‍රහ්මා සහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ, චක්ඛුමා පුරිසො එකං ආමණ්ඩං හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ, සහස්සො බ්‍රහ්මා සහස්සිං ලොකධාතුං[2] ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස එවං හොති: අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා සහස්සස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන සමන්නාගතො හොති, සුතෙන සමන්නාගතො හොති, චාගෙන සමන්නාගතො හොති, පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති: ද්විසහස්සො බ්‍රහ්මා -පෙ- තිසහස්සො බ්‍රහ්මා -පෙ- චතුසහස්සො බ්‍රහ්මා -පෙ- පඤ්චසහස්සො බ්‍රහ්මා දීඝායුකො වණ්ණවා සුඛබහුලොති. පඤ්චසහස්සොපි භික්ඛවෙ, බ්‍රහ්මා පඤ්චසහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ, චක්ඛුමා පුරිසො පඤ්ච ආමණ්ඩානි හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ, පඤ්චසහස්සො බ්‍රහ්මා පඤ්චසහස්සිං ලොකධාතුං. ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස එවං හොති: අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා පඤ්චසහස්සස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති. තං චිත්තං අධිට්ඨාති. තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රූපපත්තියා සංවත්තති.

---

1. පරනිම්මිතවසවත්තී - සීමු, මජසං.
2. සහස්සී ලොකධාතුං - මජසං.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රුතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද වෙයි : ' තව්තිසා වැසි දෙවියෝ . . . යාමවැසි දෙවියෝ . . . තුසිපුර වැසි දෙවියෝ . . . නිර්මාණරතියෙහි වැසි දෙවියෝ . . . පරිනිර්මිත වශවර්තියෙහි වැසි දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණ ඇතියහ, බහුල සුව ඇතියහ ' යි. ඔහුට මෙබඳු සිත් වෙයි : '' මම කාබුන් මරණින් මතු පරනිර්මිතවශවර්ති යෙහි වැසි දෙවියන් ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු ' යි හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් වඩයි. ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහාරයෝ මෙසේ භාවිත වූවෝ බහුලීකෘත වූවෝ එහි උපත පිණිස පවතිත්. මහණෙනි, මේ මග මේ පිළිවෙත් එහි උපතට වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රුතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද : ' සහස්‍රබ්‍රහ්ම දිගා ඇතියෙ යැ, වර්ණ ඇතියෙ යැ, සුවබහුල යැ ' යි. මහණෙනි, සහස්‍රබ්‍රහ්ම සහශ්‍රී ලොකධාතු පැතිරගෙන බැසගෙන වාස කෙරෙයි. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද, උනුදු පැතිරගෙන වැදගෙන වාස කෙරෙයි. මහණෙනි, යම් පරිදි ඇස් ඇති පුරුෂයෙක් එක් ඇඹුලක් අතෙහි කොට ගෙන ප්‍රත්‍යවෙක්ෂා කෙරේ ද, මහණෙනි, එපරිදි මැ සහස්‍රබ්‍රහ්ම සහශ්‍රීලොකධාතු පැතිරගෙන වැදගෙන වාස කෙරෙයි. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද උනුදු පැතිරගෙන වැදගෙන වාස කෙරෙයි. ඒ මහණහට මෙබඳු සිතෙක් වෙයි : '' මම කාබුන් මරණින් මතු සහස්‍ර බ්‍රහ්මයා ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු '' යි හේ එ සිත තබයි, එ සිත පිහිටුවයි, එ සිත වඩයි. මෙසේ භාවිත වූ මෙසේ බහුලීකෘත වූ ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහාරයෝ එහි උපත් පිණිස පවතිත්. මහණෙනි, මේ මග මේ පිළිවෙත එහි උපත් පිණිස පවතී.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රුතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද වෙයි : ' ද්විසහස්‍රබ්‍රහ්ම . . . ත්‍රිසහස්‍රබ්‍රහ්ම . . . චතුස්සහස්‍ර බ්‍රහ්ම . . . පඤ්චසහස්‍ර බ්‍රහ්ම දිගා ඇතියේය, වර්ණ ඇතියේ ය, සුවබිහිලි යයි. මහණෙනි, පඤ්චසහස්‍ර බ්‍රහ්ම ද, පඤ්චසහශ්‍රී ලොකධාතුව පැතිරගෙන වැදගෙන වාස කෙරෙයි. එහි යම් මැ සත්ත්ව කෙනෙක් උපන්හු නම් උනුදු පැතිරගෙන ආවිෂ්ට කොටගෙන වාස කෙරෙයි. මහණෙනි, යම් පරිදි ඇස් ඇති පුරුෂයෙක් ඇඹුලුපක් පසක් අතෙහි කොට ගෙන ප්‍රත්‍යවෙක්ෂා කෙරේ ද, මහණෙනි, එපරිදි මැ පඤ්චසහස්‍රබ්‍රහ්ම පඤ්චසහශ්‍රී ලොකධාතු පැතිරගෙන ආවිෂ්ට කොටගෙන වාස කෙරෙයි. එහි යම් ම සත්ත්ව කෙනෙක් උපන්හු නම්, උනුදු පැතිරගෙන ආවිෂ්ට කොටගෙන වාස කෙරෙයි. ඒ මහණහට මෙසේ සිත් වෙයි : '' මම කාබුන් මරණින් මතු පඤ්චසහස්‍ර බ්‍රහ්මයා ගේ සහභාවයට එළැඹෙම් නම්, මනා මැනු '' යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් වඩයි. එවංභාවිත එවංබහුලීකෘත වූ ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහාරයෝ මේ උපත් සඳහා වැටෙත්. මහණෙනි, මේ මාර්ග මේ ප්‍රතිපද එහි උපත් සඳහා වැටෙයි,

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති -පෙ- සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : දසසහස්සො බ්‍රහ්මා දීඝායුකො වණ්ණවා සුඛබහුලොති. දසසහස්සො භික්ඛවෙ, බ්‍රහ්මා දසසහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො පණ්ඩුකම්බලෙ නික්ඛිත්තො භාසතෙ ච, තපතෙ ච,[1] විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ, දසසහස්සො බ්‍රහ්මා දසසහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා දසසහස්සස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවං බහුලීකතා තත්‍රුපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රුපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : සතසහස්සො බ්‍රහ්මා දීඝායුකො වණ්ණවා සුඛබහුලොති. සතසහස්සො භික්ඛවෙ, බ්‍රහ්මා සතසහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ, නෙක්ඛං ජම්බොනදං දක්ඛකම්මාරපුත්තඋක්කාමුඛසුකුසලසම්පහට්ඨං පණ්ඩුකම්බලෙ නික්ඛිත්තං භාසතෙ ච තපතෙ ච[1] විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ, සතසහස්සො බ්‍රහ්මා සතසහස්සිං ලොකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා සතසහස්සස්ස බ්‍රහ්මුණො සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රුපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රුපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : ආභා දෙවා -පෙ- පරිත්තාභා දෙවා -පෙ- අප්පමාණාභා දෙවා -පෙ- ආභස්සරා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ආභස්සරානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති, තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවංභාවිතා එවංබහුලීකතා තත්‍රුපපත්තියා සංවත්තන්ති. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා තත්‍රුපපත්තියා සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : පරිත්තසුභා දෙවා -පෙ- අප්පමාණසුභා දෙවා -පෙ- සුභකිණ්ණා දෙවා -පෙ- දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති : අහො වතාහං -පෙ- සංවත්තති.

---

1. භාසති ච තපති ච - PTS.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, . . . ශීලයෙන් . . . ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද : '' දශසහස්‍ර බ්‍රහ්ම දීර්ඝායුෂ්ක යැ, වර්ණවත් යැ, සුඛබහුල යැ '' යි. මහණෙනි, දශසහස්‍ර බ්‍රහ්ම දශසහස්‍රීලොකධාතුව පැතිරගෙන ආවිෂ්ට කොට ගෙන වාස කෙරෙයි. එහි යම් මැ සත්ත්වකෙනෙක් උපන්හු නම් උනුදු පැතිරගෙන ආවිෂ්ට කොටගෙන වාස කෙරෙයි. මහණෙනි, යම් පරිදි සුන්දර ආකාරසම්පන්න වූ මොනොවට පිරියම් කළ රක්තකම්බලයෙක්හි තැබූ අටැස් වෙරළුමිණ බබළා ද දිලියේ ද වෙසෙසින් දිලියේ ද, මහණෙනි, එපරිදි මැ දශසහස්‍ර බ්‍රහ්ම දශසහස්‍රී ලොකධාතු පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. එහි යම් මැ සත්ත්ව කෙනෙක් උපන්හු නම්, උනුදු පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. ඔහුට මෙසේ සිත් වෙයි : ' මම කායභෙදයෙන් මරණින් මතු දශසහස්‍ර බ්‍රහ්මයා ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු ' යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් වඩයි. මෙසේ වැඩූ මෙසේ බිහිලි කළ ඒ මහණහු ගේ ඒ සංස්කාරයන් හා විහාරයෝ එහි උපතට සංවර්තන කෙරෙත්. මහණෙනි, මේ මාර්ග මේ ප්‍රතිපත් එහි උපතට වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධාවෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලදි : '' ශතසහශ්‍ර බ්‍රහ්ම දීර්ඝජීවී යැ, වර්ණසම්පන්න යැ, සුඛබහුල යැ '' යි. මහණෙනි, ශතසහස්‍රබ්‍රහ්ම ශතසහස්‍රී ලොකධාතුව පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. එහි යම් මැ සත්ත්ව කෙනෙක් උපන්හු නම් උනුදු පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. මහණෙනි, යම් පරිදි ජම්බුනදියෙහි උපන් පස්හුණෙකින් කළ පළඳනා දක්ෂ ලොහකාර පුත්‍රයකු විසින් කඹුරු උදුනෙහි ලා සුධෞත වූයේ පාණ්ඩුකම්බලයෙහි නික්ෂිප්ත වූයේ බබළා ද, දිලියේ ද, වෙසෙසින් දිලියේ ද, මහණෙනි, එපරිදි මැ ශතසහස්‍රබ්‍රහ්ම ශතසහස්‍රී ලොකධාතුව පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. එහි යම් මැ සත්ත්ව කෙනෙක් උපන්හු නම්, උනුදු පැතිරගෙන බිම්සැගෙන වාස කෙරෙයි. ඔහුට මෙසේ සිත් වෙයි : '' මම කායභෙදයෙන් මරණින් පසු ශතසහස්‍රබ්‍රහ්මයා ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු '' යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එසිත් වඩයි. මෙසේ වැඩූ මෙසේ බිහිලි කළ ඔහු ගේ ඒ සංස්කාරයන් හා විහාරයෝ එහි උපත් පිණිස සංවර්තන කෙරෙත්. මහණෙනි, මේ මාර්ග මේ ප්‍රතිපත් එහි උපත් පිණිස සංවර්තන කෙරේ.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධාවෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලදි : '' ආභ දෙවියෝ . . . පරිත්තාභ දෙවියෝ . . . අප්පමාණාභ දෙවියෝ . . . ආභස්සර දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ ' යි. ඔහුට මෙසේ සිත් වෙයි : '' මම කාබුන් මරණින් මතුයෙහි ආභස්සර දෙවියන් ගේ සහභාවයට පැමිණෙම් නම් මනා මැ නු ' යි. හේ එ සිත් තබයි, එ සිත් පිහිටුවයි, එ සිත් වඩයි. ඔහු ගේ මෙසේ භාවිත වූ මෙසේ බහුලීකෘත වූ ඒ සංස්කාරයන් හා විහාරයෝ එහි උපතට වැටෙත්. මහණෙනි, මේ මාර්ග මේ ප්‍රතිපත් එහි උපතට වැටේ.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශිලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලදි : '' පරිත්තසුභ දෙවියෝ . . . අප්පමාණසුභ දෙවියෝ . . . සුභකිණ්ණකදෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ ' යි. ඔහුට මෙබඳු සිත් වෙයි. ' මම . . . වැටෙයි.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති. සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : වෙහප්ඵලා දෙවා -පෙ- අවිහා දෙවා -පෙ- අතප්පා දෙවා -පෙ- සුදස්සා දෙවා -පෙ- සුදස්සී දෙවා -පෙ- අකනිට්ඨා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති : අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා අකනිට්ඨානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති -පෙ- සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති: ආකාසානඤ්චායතනූපගා දෙවා දීඝායුකා චිරට්ඨිතිකා සුඛබහුලාති. තස්ස එවං හොති : අහො වතාහං -පෙ- සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස සුතං හොති : විඤ්ඤාණඤ්චායතනූපගා දෙවා -පෙ-

පුන ච පරං භික්ඛවෙ, -පෙ- ආකිඤ්චඤ්ඤායතනූපගා දෙවා -පෙ-

පුන ච පරං භික්ඛවෙ, -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා දෙවා දීඝායුකා චිරට්ඨිතිකා සුඛබහුලාති. තස්ස එවං හොති : අහො වතාහං -පෙ- සංවත්තති.

පුන ච පරං භික්ඛවෙ, භික්ඛු සද්ධාය සමන්නාගතො හොති, සීලෙන සමන්නාගතො හොති, සුතෙන සමන්නාගතො හොති, චාගෙන සමන්නාගතො හොති, පඤ්ඤාය සමන්නාගතො හොති. තස්ස එවං හොති : අහො වතාහං ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ, භික්ඛු න කත්ථචි උපපජ්ජති, න කුහිඤ්චි උපපජ්ජතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සඞ්ඛාරුප්පත්ති සුත්තං දසමං.

---

## අනුපදවග්ගො දුතියො.

### තස්ස වග්ගස්ස උද්දානං.

අනුපදසොධන පොරිස ධම්මා—සෙවිතබ්බ බහුධාතු විභත්ති.
ඉසිගිලිකිත්තිතචත්තාලීසං—ආනාපානසතී උපපත්තිං.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද වෙයි : ' වෙහප්ඵල දෙවියෝ . . . අවිහ දෙවියෝ . . . අතප්ප දෙවියෝ . . . සුදස්ස දෙවියෝ . . . සුදස්සී දෙවියෝ . . . අකණිට්ඨකදෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ ' යි. ඔහුට මෙබඳු සිත් වෙයි : ' මම කාබුන් මරණින් මතු අකිණිට්ඨකදෙවියන් ගේ සහභාවයට පැමිණෙම් නම්, මනා මැ නු ' යි. හේ එ සිත් තබයි . . . වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් මෙසේ අසන ලද : ' ආකාසානඤ්චායතනූපග දෙවියෝ දීර්ඝායුෂ්කයහ, චිරස්ථිතිකයහ, සුඛබහුලයහ ' යි. ඔහුට මෙබඳු සිත් වෙයි : ' මම . . . වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් ... ශ්‍රැතයෙන් . . . ත්‍යාගයෙන් . . . ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහු විසින් අසන ලද වෙයි : විඤ්ඤාණඤ්චායතනූපග දෙවියෝ . . .

තවද මහණෙනි, . . . ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියෝ . . .

තවද මහණෙනි . . . නේවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියෝ දීර්ඝායුෂ්කයහ, චිරස්ථිතිකයහ, සුඛබහුලයහ ' යි, ඔහුට මෙබඳු සිත් වෙයි, . . . වැටෙයි.

තවද මහණෙනි, මහණ ශ්‍රද්ධායෙන් සමන්වාගත වෙයි, ශීලයෙන් සමන්වාගත වෙයි, ශ්‍රැතයෙන් සමන්වාගත වෙයි, ත්‍යාගයෙන් සමන්වාගත වෙයි, ප්‍රඥයෙන් සමන්වාගත වෙයි. ඔහුට මෙබඳු සිත් වෙයි : ' මම ආස්‍රවක්ෂයහෙතුයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥවිමුක්ති දුටුධැම්යෙහි මැ තමා විශිෂ්ටඥනයෙන් පසක් කොට උපයා වාස කෙරෙම් නම් මනා මැ නු ' යි. හේ ආස්‍රවක්ෂය හෙතුයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥවිමුක්ති ඉහාත්මයෙහි මැ තමා අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කොට උපසම්පාදන කොට වාස කෙරෙයි. මහණෙනි, මේ මහණ කිසිදු තැනෙක නො පැමිණෙයි, කිසිදු තැනෙක ප්‍රතිසන්ධි විසින් නො උපදනේ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙ සුත් වදළෝ සියමන ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ සංඛාරුප්පත්ති සූත්‍ර දේශනාව අභිනන්දනායෙන් පිළිගත්හු.

දසවැනි සංඛාරුප්පත්ති සූත්‍ර යි.

---

# දෙවැනි අනුපදවග්ගී යි

ඒ වර්ගයා ගේ උද්දානය :

අනුපද සූත්‍රය, ඡබ්බිසොධන සූත්‍රය, සප්පුරිස සූත්‍රය, සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය, බහුධාතුක සූත්‍රය, ඉසිගිලි සූත්‍රය, මහාචත්තාරීසක සූත්‍රය, ආනාපානසති සූත්‍රය, කායගතාසති සූත්‍රය, සංඛාරුප්පත්ති සූත්‍ර යි.

# 3 සුඤ්ඤතවග්ගො

## 3. 3. 1

## චූළසුඤ්ඤත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො ආයස්මා ආනන්දො සායන්හසමයං පටිසල්ලානා[1] වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

එකමිදං භන්තෙ, සමයං භගවා සක්කෙසු විහරති නාගරකං[2] නාම සක්‍යානං නිගමො. තත්ථ මෙ භන්තෙ, භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. සුඤ්ඤතාවිහාරෙනාහං ආනන්ද, එතරහි බහුලං විහරාමීති. කච්චි මෙ තං භන්තෙ, සුස්සුතං සුග්ගහිතං[3]. සුමනසිකතං සූපධාරිතන්ති.

තග්ඝ තෙ එතං ආනන්ද, සුස්සුතං සුග්ගහිතං[3]. සුමනසිකතං සූපධාරිතං. පුබ්බෙපාහං[4] ආනන්ද, එතරහි පි[5] සුඤ්ඤතාවිහාරෙන බහුලං විහරාමි. සෙය්‍යථාපි ආනන්ද, අයං මිගාරමාතුපාසාදො සුඤ්ඤො හත්ථිගවාස්සවළවෙන, සුඤ්ඤො ජාතරූපරජතෙන, සුඤ්ඤො ඉත්ථිපුරිස-සන්නිපාතෙන, අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං භික්ඛුසඞ්ඝං පටිච්ච එකත්තං. එවමෙව ඛො ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ගාමසඤ්ඤං, අමනසිකරිත්වා මනුස්සසඤ්ඤං, අරඤ්ඤසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අරඤ්ඤසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති[6]. සො එවං පජානාති: 'යෙ අස්සු දරථා ගාමසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා මනුස්සසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං අරඤ්ඤසඤ්ඤං පටිච්ච එකත්තන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ගාමසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං මනුස්සසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං අරඤ්ඤසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති, තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

1. පතිසල්ලානා - ස්‍යා.
2. නගරකං - මජසං.
3. {සුග්ගහිතං - සීමු, මජසං. {සුගහිතං - ස්‍යා.
4. පුබ්බෙ චාහං - PTS, ස්‍යා.
5. එතරහි ච - PTS, ස්‍යා.
6. විමුච්චති - PTS.

# 3 සුඤ්ඤතවර්ගය

## 3. 3. 1
## චූළසුඤ්ඤත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි පුවරම් වෙහෙර මුවරමාපායෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සවස්කාලයෙහි පිළිසලනින් නැඟිසිටියාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ :

වහන්ස, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි ශාක්‍යයන් ගේ නාගරක නම් නියම් ගම්හි වැඩ වසන සේක. වහන්ස, එහි දී මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි දී '' ආනන්දය, මම දැන් ශූන්‍යතාවිහාරයෙන් බහුල කොට වෙසෙමි '' අසන ලදි. හමුයෙහි දී පිළිගන්නා ලදි. ' වහන්ස, කිම, මා ගේ ඒ ඇසීම සුශ්‍රැත වේ ද ? සුගෘහීත වේ ද ? මනා කොට මෙනෙහි කරන ලද වේ ද ? මොනොවට කළ විමසීමෙක් වේ ද ?

ආනන්දය, එකාන්තයෙන් තොප ගේ මෙල ඇසීම සුශ්‍රැත වෙයි, සුගෘහීත වෙයි, මනා කොට මෙනෙහි කරන ලද වෙයි, මොනොවට විමසන ලද වෙයි. ආනන්දය, මම පළමුවත් දැනුත් ශූන්‍යතවිහරණයෙන් බහුල කොට වෙසෙමි. ආනන්දය, යම් පරිදි මේ මුවරමා පහය ඇත් ගව අස් වෙළඹුන් ගෙන් ශූන්‍ය වේ ද, රන්රිදියෙන් ශූන්‍ය වේ ද, ස්ත්‍රීපුරුෂ සන්නිපාතයෙන් ශූන්‍ය වේ ද, (එතෙකුදු වුව) මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත් : බික්සඟුන් නිසා වන එකත්වය යි. ආනන්දය, එපරිදි ම මහණ ග්‍රාමසංඥ මෙනෙහි නො කොට මනුෂ්‍යසංඥ මෙනෙහි නො කොට අරණ්‍යසංඥ පිණිස එකත්වයක් මෙනෙහි කෙරේ ද, ඒ මහණහු ගේ අරණ්‍යසංඥයෙහි සිත දිවෙයි. පහදියි, මොනොවට සිටී, බැස ගනී. ඒ මහණ මෙසේ නුවණින් දන්නේ ය. ග්‍රාමසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. මනුෂ්‍යසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. (එතෙකුදු වුව) මේ දරථමාත්‍රයෙක් ඇත, කිමෙක යත් : අරණ්‍යසංඥ නිසා වන එකත්වය යි. ඒ මහණ ග්‍රාමසංඥව පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දන්නේය. මනුෂ්‍යසංඥ පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දන්නේය. (එතෙකුදු වුව) ශූන්‍යතායෙක් ද ඇත, කිමෙක යත් : අරණ්‍යසංඥ නිසා වන එකත්වය යි (කියා ද දන්නේ ය). මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍ය යයි මොනොවට නුවණින් දනී. යමෙක් එහි ඉතිරි වේ ද, විද්‍යමාන වන එය ඒ මේ අශූන්‍යතාව ඇතැ ' යි නුවණින් දන්නේ ය. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණ හට මෙල යථාභූතවූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ ශූන්‍යතාවක්‍රාන්තියෙක් වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා මනුස්සසඤ්ඤං අමනසිකරිත්වා අරඤ්ඤසඤ්ඤං පඨවිසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස පඨවිසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සෙය්‍යථාපි ආනන්ද, ආසභචම්මං[1] සඞ්කුසතෙන සුවිහතං විගතවලිකං එවමෙව ඛො ආනන්ද, භික්ඛු යං ඉමිස්සා පඨවියා උක්කූලවික්කූලං[2] නදීවිදුග්ගං ඛාණුකණ්ටකධානං[3] පබ්බතවිසමං, තං සබ්බං අමනසිකරිත්වා පඨවිසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස පඨවිසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති : 'යෙ අස්සු දරථා මනුස්සසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා අරඤ්ඤසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං පඨවිසඤ්ඤං පටිච්ච එකත්තන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං මනුස්සසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං අරඤ්ඤසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං පඨවිසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා අරඤ්ඤසඤ්ඤං අමනසිකරිත්වා පඨවිසඤ්ඤං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති : 'යෙ අස්සු දරථා අරඤ්ඤසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා පඨවිසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්ත'න්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං අරඤ්ඤ සඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං පඨවිසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති, තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා පඨවිසඤ්ඤං, අමනසිකරිත්වා ආකාසානඤ්චායතනසඤ්ඤං, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති : 'යෙ අස්සු දරථා පඨවිසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්ත'න්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං පඨවිසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකාසානඤ්චායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

---

1. උසභචම්මං - PTS.
2. උක්කූලවික්කූලං - සීමු, මජසං.
3. ඛානුකණ්ටකට්ඨානං - මජසං. ඛාණුකණ්ටකාධානං - සීමු.

තවද ආනන්දය, මහණ මනුෂ්‍යසංඥ සිත්හි නො කොට, අරණ්‍යසංඥ සිත්හි නො කොට, පෘථිවිසංඥ පිණිස එකත්වය සිත්හි කෙරෙයි. ඔහුට පෘථිවිසංඥයෙහි සිත අවතරණ කෙරෙයි. පහදී, මොනොවට පිහිටයි, නිශ්චයට බැසගනී. ආනන්දය, යම් පරිදි ගෙරි සමෙක් සියක්හුලින් මොනොවට හිඳුවන ලද්දේ පහවගිය රැළි ඇත්තේ වේ ද, ආනන්දය, එපරිදි ම මහණ මේ පොළොවෙහි යම් උස්පහත් තැන් ඇද්ද, නදීන් හා දුර්ගමස්ථාන ඇද්ද, කණුකටු තැන් ඇද්ද, පර්වතයෙන් විෂම වූ තැන් ඇද්ද, එ හැම සිත්හි නො කොට පෘථිවිසංඥ නිසා එකත්වය මෙනෙහි කෙරේ ද, ඔහුට පෘථිවිසංඥයෙහි සිත බසී, පහදී, මොනොවට පිහිටයි, නිශ්චය කොට ගනී. ඒ මහණ මෙසේ නුවණින් දනී : මනුෂ්‍යසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද ඔහු මෙහි නැත. අරණ්‍යසංඥ නිසා යම් දරථ කෙනෙක් ආද්ද, ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත් : පෘථිවිසංඥ නිසා වන ඒකත්වයයි කියා යි. හේ මනුෂ්‍යසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි නුවණින් දනී, අරණ්‍යසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි දනී, (එහෙත්) මේ අශුන්‍ය තායෙක් ද ඇත. කිමෙක යත් : පෘථිවිසංඥ නිසා වන එකත්වයයි කියාත් දනී. මෙසේ එහි යමෙක් නැද්ද එයින් ඒ ශුන්‍ය යයි නුවණින් දකී, එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇතැ ' යි නුවණින් දනී. මෙසෙයිනුදු ආනන්දය, ඔහුට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශුන්‍යතාවක්‍රාන්තිය වෙයි.

තවද ආනන්දය, මහණ අරණසංඥ මෙනෙහි නො කොට පෘථිවිසංඥ මෙනෙහි නො කොට ආකාසානඤ්චායතනසංඥ පිණිස ඔහුගේ සිත බසී, පහදී, මොනොවට පිහිටයි, නිශ්චය කොට ගනී, හේ මෙසේ නුවණින් දනී : අරණ්‍යසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. පෘථිවිසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. (එහෙත්) මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත් : ආකාසානඤ්චායතනසංඥ නිසා වන එකත්වය කියායි. හේ අරණසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි නුවණින් දනී. පෘථිවිසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි නුවණින් දනී. එහෙත් මේ අශුන්‍යතා යෙක් ද ඇත. කිමෙක යත් : ආකාසානඤ්චායතනසංඥ නිසා වන එකත්වය (කියා ද දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශුන්‍ය යයි නුවණින් දකී, එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යාමාන වූ එය ඇති ' යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශුන්‍යතාවක්‍රාන්ති වෙයි.

තවද ආනන්දය, මහණ පෘථිවිසංඥ මෙනෙහි නො කොට, ආකාසානඤ්චායතනසංඥ මෙනෙහි නො කොට, විඤ්ඤාණඤ්චායතනසංඥ නිසා වන එකභාවය මෙනෙහි කෙරෙයි විඤ්ඤාණඤ්චායතනසංඥයෙහි ඔහු ගේ සිත බසී, පහදී, මොනොවට පිහිටයි, නිශ්වයට යෙයි. හේ මෙසේ නුවණින් දනී ; පෘථිවිසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද ඔහු මෙහි නැත. ආකාසානඤ්චායතනසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. විඤ්ඤාණඤ්චායතනසංඥ නිසා වන යම් එකීභාවයෙක් වේ ද, මේ දරථ මාත්‍රා මතුයෙක් ඇත කියා යි. හේ පෘථිවිසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි නුවණින් දනී. ආකාසා නඤ්චායතනසංඥ පිළිබඳ මේ සංඥගතය ශුන්‍ය යයි දනී. විඤ්ඤාණඤ්චායතනසංඥ නිසා එකහභාවයෙක් වේ ද, මේ අශුන්‍යතා ඇති ' යි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශුන්‍ය යයි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යාමාන වූ එය ඇති ' යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශුන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකාසානඤ්චායතනසඤ්ඤං අමනසිකරිත්වා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: 'යෙ අස්සු දරථා ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච තෙධ න සන්ති. යෙ අස්සු දරථා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා, යදිදං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්ත'න්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකාසානඤ්චායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති : 'යෙ අස්සු දරථා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා, යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්ත'න්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා, ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අමනසිකරිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං අනිමිත්තං චෙතොසමාධිං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අනිමිත්තෙ චෙතොසමාධිම්හි චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. 'යෙ අස්සු දරථා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයා'ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයාති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ ආකාසානඤ්චායතනය සිත්හි නො කොට විඤ්ඤාණඤ්චායතනය සිත්හි නො කොට ආකිඤ්චඤ්ඤායතනය නිසා එකභාවය මෙනෙහි කෙරෙයි. ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බසී, පහදියි, මොනොවට පිහිටයි, නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී : ' ආකාසානඤ්චායතන සංඥව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. විඤ්ඤාණඤ්චායතනසංඥව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. එහෙත් මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත් : ආකිඤ්චඤ්ඤායතනය නිසා වන එකභාවය යි කියා යි. හේ ආකාසානඤ්චායතනසංඥ පිළිබඳ ශූන්‍ය යයි නුවණින් දනී. විඤ්ඤාණඤ්චායතනසංඥව පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දනී. (එතෙකුදු වුව) මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත් : ආකිඤ්චඤ්ඤායතනසංඥ නිසා වන එකත්වය වෙති නුවණින් දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එය ශූන්‍ය යයි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යාමාන වූ එය ඇති ' යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

තවද ආනන්දය, මහණ විඤ්ඤාණඤ්චායතනසංඥ මෙනෙහි නො කොට ආකිඤ්චඤ්ඤායතනසංඥ මෙනෙහි නො කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥ නිසා එකත්වය මෙනෙහි කෙරෙයි. ඔහුගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි බැසගෙන සිටී, පහදියි, මොනොවට පිහිටයි, නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී : ' විඤ්ඤාණඤ්චායතන සංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. ආකිඤ්චඤ්ඤායතනසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇත. කිමෙක යත් : නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ නිසා වන එකත්වය වෙති ' යි දනී, හේ විඤ්ඤාණඤ්චායතන සංඥව පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දනී, ආකිඤ්චඤ්ඤායතනසංඥව පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි දනී. වැලිත් මේ අශූන්‍යත්වයෙක් ද ඇත, කිමෙක යත් : නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පිළිබඳ එකත්වය වෙති ' යි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍ය යයි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යාමාන වූ එය ඇති ' යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණ හට යථාභූත වූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

තවද ආනන්දය, මහණ ආකිඤ්චඤ්ඤායතනසංඥ මෙනෙහි නො කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ මෙනෙහි නො කොට අනිමිත්තචෙතොසමාධිය (විදර්ශනාචිත්ත සමාධිය) නිසා එකභාවය මෙනෙහි කෙරෙයි. ඔහු ගේ සිත අනිමිත්තචේතොසමාධියෙහි බැසගෙන සිටී, පහදියි, මොනොවට පිහිටයි, නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනියි : ' ආකිඤ්චඤ්ඤායතනසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇත. කිමෙක යත් : ' මේ කය ම නිසා ෂඩායතනප්‍රතිසංයුක්ත වූ ජීවිතයට ප්‍රත්‍යය වූ ප්‍රවෘත්ත දරථමාත්‍රායෙක් ඇති ' යි දනී. හේ ආකිඤ්චඤ්ඤායතනසංඥ පිළිබඳ මේ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දනී. නෙවසඤ්ඤානාසඤ්ඤාසංඥ පිළිබඳ සංඥගතය ශූන්‍ය යයි නුවණින් දනී. වැලිත් මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත් : මේ කය ම නිසා වූ ෂඩායතනප්‍රතිසංයුක්ත වූ ජීවිතප්‍රත්‍යය දරථමාත්‍රායෙක් ඇති ' යි දනී. මෙසේ යමෙක් එහි නැද්ද, එයින් එය ශූන්‍ය යයි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යාමාන වූ එය ඇති ' යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණ හට යථාභූත වූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අමනසිකරිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං අනිමිත්තං චෙතොසමාධිං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අනිමිත්තෙ චෙතොසමාධිම්හි චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: 'අයම්පි ඛො අනිමිත්තො චෙතොසමාධි අභිසඞ්ඛතො අභිසඤ්චෙතයිකො. යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිකං, තදනිච්චං නිරොධධම්ම'න්ති පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. සො එවං පජානාති: 'යෙ අස්සු දරථා කාමාසවං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා භවාසවං පටිච්ච තෙධ න සන්ති. යෙ අස්සු දරථා අවිජ්ජාසවං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා, යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයා'ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං කාමාසවෙනාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං භවාසවෙනාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං අවිජ්ජාසවෙනාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයාති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති යං පන තත්ථ අවසිට්ඨං හොති, තං සන්තමිදං අත්ථීති පජානාති· එවමස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා පරමානුත්තරා සුඤ්ඤතාවක්කන්ති භවති.

යෙපි හි කෙචි ආනන්ද, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිංසු. සබ්බෙ තෙ ඉමං යෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිංසු. යෙපි හි කෙචි ආනන්ද, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සන්ති. සබ්බෙ තෙ ඉමංයෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සන්ති. යෙපි හි කෙචි ආනන්ද, එතරහි සමණා වා, බ්‍රාහ්මණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරන්ති. සබ්බෙ තෙ ඉමංයෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරන්ති. තස්මාතිහ ආනන්ද, පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සාමාති. එවං හි වො, ආනන්ද, සික්ඛිතබ්බන්ති·

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

චූළසුඤ්ඤතසුත්තං පඨමං.

තවද ආනන්දය, මහණ ආකිඤ්චඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට අනිමිත්තචේතොසමාධිය සඳහා එකත්වයක් මෙනෙහි කෙරෙයි. ඔහුගේ සිත අනිමිත්තචේතොසමාධියෙහි බසී, පහදී, මෙනොවට පිහිටයි, නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී : ' මේ අනිමිත්තචෙතොසමාධිය ද අභිසංස්කෘත ය, ආභිසංචෙතසික ය, යම් කිසිවක් අභිසංස්කෘතත් අභිසංචෙතසිකත් වේ නම් ඒ අනිත්‍ය ය, නිරොධස්භාව ඇති ' යි නුවණින් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු ගේ සිත කාමාශ්‍රවයන් කෙරෙනුදු වෙසෙසින් මිදෙයි, භවාශ්‍රවයන් කෙරෙනුදු සිත මිදෙයි, අවිද්‍යාශ්‍රවයන් කෙරෙනුදු සිත මිදෙයි. විමුක්ත වත් මැ විමුක්ත යැ යන ඥානය වෙයි. ජාතිය ක්ෂීණ ය, බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද, කරණී කරන ලද, මේ අර්හත්වය පිණිස මතුයෙහි කිසිදු නැති ' යි නුවණින් දනී. හේ මෙසේ නුවණින් දනී : කාමශ්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ග-ඵලයෙහි නැත. භවාශ්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ග-ඵලයෙහි නැත. අවිද්‍යාශ්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ග-ඵලයෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇති. කිමෙක යත් : මේ කය ම නිසා ෂඩායතනසම්ප්‍රයුක්ත ජීවිතප්‍රත්‍යය වූ දරථමාත්‍ර යයි දනී. හේ කාමාශ්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍ය යයි දනී. භාවාශ්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍ය යයි දනී. අවිද්‍යාශ්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍ය යයි දනී. වැලිත් මේ අශූන්‍යතායෙක් ද ඇති. කිමෙක යත් : ' මේ කය ම නිසා ෂඩායතන-ප්‍රතිසංයුක්ත වූ ජීවිතප්‍රත්‍යය වූ දරථමාත්‍ර සංඛ්‍යාත අශූන්‍යතා යයි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍ය යයි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති ' යි දනී. ආනන්දය, මෙසේ ඒ මහණ හට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ නිරුපක්ලෙශ වූ තෙල පරමානුත්තර ශූන්‍යතාවක්‍රාන්ති වේ.

ආනන්දය, අතීත කාලයෙහි යම් මැ ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ නිරුපක්ලේශ පරමානුත්තර ශූන්‍යතාඵලසමාපත්තියට පැමිණ විසූහු ද, ඒ හැම මහණ බමුණෝ පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාවට ම පැමිණ විසූහු. ආනන්දය, අනාගත කාලයෙහි යම් මැ ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ කෙනෙක් වෙත් ද, ඔහු පරමානුත්තර පරිශුද්ධ ශූන්‍යතාව උපයා වාස කෙරෙත් ද, එ හැම පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාව ම උපයා ගෙන වෙසෙත්. ආනන්දය, දැන් යම් මැ ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ කෙනෙක් පරිශුද්ධ පරමානුත්තර ශූන්‍යතාවට පැමිණ වෙසෙත් ද, එ හැම පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍ය තාවට මැ පැමිණ වෙසෙති. ආනන්දය, එහෙයින් පරිශුද්ධ පරමානුත්තර ශූන්‍යතාව උපයාගෙන වසම්හ ' යි ආනන්දය, මෙසේ තොප හික්මෙන්නෝ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බුදුවදන් සතුටින් පිළිගත්හ.

**පළමුවැනි චූල්ලසුඤ්ඤත සූත්‍ර යි.**

---

# 3. 3. 2

## මහාසුඤ්ඤත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කපිලවත්ථුං පිණ්ඩාය පාවිසි. කපිලවත්ථුස්මිං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන කාළඛෙමකස්ස සක්කස්ස විහාරො, තෙනුපසඞ්කමි දිවාවිහාරාය. තෙන ඛො පන සමයෙන කාළඛෙමකස්ස සක්කස්ස විහාරෙ සම්බහුලානි සෙනාසනානි පඤ්ඤත්තානි හොන්ති. අද්දසා ඛො භගවා කාළඛෙමකස්ස සක්කස්ස විහාරෙ සම්බහුලානි සෙනාසනානි පඤ්ඤත්තානි. දිස්වාන භගවතො එතදහොසි: සම්බහුලානි ඛො කාළඛෙමකස්ස සක්කස්ස විහාරෙ සෙනාසනානි පඤ්ඤත්තානි සම්බහුලා නු ඛො ඉධ භික්ඛූ විහරන්තීති.

තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං ඝටාය සක්කස්ස විහාරෙ චීවරකම්මං කරොති. අථ ඛො භගවා සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො, යෙන ඝටාය සක්කස්ස විහාරො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: සම්බහුලානි ඛො ආනන්ද කාළඛෙමකස්ස සක්කස්ස විහාරෙ සෙනාසනානි පඤ්ඤත්තානි, සම්බහුලා නු ඛො එත්ථ භික්ඛූ විහරන්තීති.

සම්බහුලානි භන්තෙ, කාළඛෙමකස්ස සක්කස්ස විහාරෙ සෙනාසනානි පඤ්ඤත්තානි, සම්බහුලා එත්ථ භික්ඛූ විහරන්ති. චීවරකාරසමයො නො භන්තෙ, වත්තතීති.

න ඛො ආනන්ද, භික්ඛු සොභති සඞ්ගණිකාරාමො සඞ්ගණිකාරතො සඞ්ගණිකාරාමතං අනුයුත්තො ගණාරාමො ගණරතො ගණසම්මුදිතො. සො වතානන්ද, භික්ඛු සඞ්ගණිකාරාමො සඞ්ගණිකාරතො සඞ්ගණිකාරාමතං අනුයුත්තො ගණාරාමො ගණරතො ගණසම්මුදිතො, යං තං නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධසුඛං[1] තස්ස සුඛස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභීති නෙතං ඨානං විජ්ජති. යො ච ඛො සො ආනන්ද, භික්ඛු එකො ගණස්මා වූපකට්ඨො විහරති. තස්සෙතං භික්ඛුනො පටිකඞ්ඛං: යං තං නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධසුඛං[1] තස්ස සුඛස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභීති ඨානමෙතං විජ්ජති.

සො වතානන්ද, භික්ඛු සඞ්ගණිකාරාමො සඞ්ගණිකාරතො සඞ්ගණිකාරාමතං අනුයුත්තො ගණාරාමො ගණරතො ගණසම්මුදිතො සාමයිකං[2] වා කන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරිස්සති, අසාමයිකං[3] වා අකුප්පන්ති නෙතං ඨානං විජ්ජති. යො ච ඛො සො ආනන්ද, භික්ඛු එකො ගණස්මා වූපකට්ඨො විහරති, තස්සෙතං භික්ඛුනො පාටිකඞ්ඛං: සාමයිකං[2] වා කන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරිස්සති, අසාමයිකං[3] වා අකුප්පන්ති ඨානමෙතං විජ්ජති.

---

1. සම්බොධිසුඛං - ස්‍යා, මජසං. 2. සාමායිකං - මජසං.
3. අසාමායිකං - මජසං.

# 3. 3. 2

## මහාසුඤ්ඤත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැහැජනවියෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ පෙරවරු යෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන කිඹුල්වතට පිඩු පිණිස වැඩි සේක. කිඹුල්වත්හි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැලැකී සේක් කාළඛෙමක සැහැරජහු ගේ විහාරය කරා දිවා විහරණය පිණිස වැඩියෝ. එසමයෙහි කාළඛෙමක සැහැරජහු ගේ වෙහෙර පනවන ලද බොහෝ සෙනසුන් ඇත. භාග්‍යවතුන්වහන්සේ කාළඛෙමක සැහැරජහු ගේ වෙහෙරෙහි පනවන ලද බොහෝ සෙනසුන් දුටු සේක. දැක භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිත් වී. කාළඛෙමක සැහැරජහු ගේ වෙහෙර පනවන ලද බොහෝ සෙනසුන් ඇත. මෙ වෙහෙර භික්ෂූහු සම්බහුල වශයෙන් වෙසෙත් ද හෝ යි.

එසමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බොහෝ භික්ෂූන් හා සමඟ ඝටාය නම් ශාක්‍යයන්ගේ විහාරයෙහි චීවරකර්ම කෙරෙති. එක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්-වේලෙහි පිළිසලණින් නැඟී සිටි සේක් ඝටාය නම් ශාක්‍යයන්ගේ විහාරය කරා වැඩි සේක. වැඩැ පැන්වූ අසනෙහි හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ හිඳ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූ සේක. '' ආනන්දය, කාළඛෙමක ශාක්‍යයන් ගේ විහාරයෙහි සම්බහුල සෙනාසනයෝ පනවන ලද්දාහු වෙති. කිම මෙහි සම්බහුල භික්ෂූහු වාස කෙරෙත් ද හෝ '' යී, පුළුවුත්හ.

වහන්ස, කාළඛෙමක ශාක්‍යයන් ගේ විහාරයෙහි පැන්වූ බොහෝ සෙනසුන් ඇත. මෙහි බොහෝ භික්ෂූහු වාස කෙරෙති. වහන්ස, අපගේ චීවරකාර සමය පවත්නේ යයි පිළිවදන් දුන්හු.

ආනන්දය, සංගණිකාරාම වූ සංගණිකායෙහි ඇලුණු සංගණිකාරාමතායෙහි යෙදුණු ගණාරාම වූ ගණයා කෙරෙහි ඇලුණු ගණයා හා සම්මුදිත වූ මහණ නො හොබනේ ය. ආනන්දය, සංගණිකාරාම වූ සංගණිකායෙහි ඇලුණු සංගණිකාරාමතායෙහි අනුයුක්ත වූ ගණාරාම වූ ගණයා කෙරෙහි ඇලුණු ගණයා කෙරෙහි සම්මුදිත වූ ඒ මහණ යම් ඒ නෛෂ්ක්‍රම්‍යසුඛයෙක් ප්‍රවිවේකසුඛයෙක් උපශමසුඛයෙක් සම්බෝධසුඛයෙක් ඇද්ද, ඒ සුඛය එකාන්තයෙන් කැමැති සේ ලබනුයේ නිදුක් ව ලබනුයේ විපුල ව ලබනුයේ වෙයි යන මෙල කරුණ නො වේ. ආනන්දය, යම් මහණෙක් එකලා වූයේ ගණයා කෙරෙන් වෙන් වූයේ වාස කෙරේ ද, ඒ මහණහට මෙල කැමති විය යුතු ය : '' යම් ඒ නෛෂ්ක්‍රම්‍යසුඛ යෙක් ප්‍රවිවෙකසුඛයෙක් උපශමසුඛයෙක් සම්බොධ සුඛයෙක් ඇද්ද, ඒ සුඛය කැමැති සේ ලබන්නේ නිදුක් ව ලබන්නේ විපුල ව ලබන්නේ වෙයි '' යන මෙල කරුණ ඇත.

ආනන්දය, එකැතින් ඒ මහණ ස්වකීය පර්ෂත්සමොධානයෙහි නියැලියේ සිය පිරිස් හා එක්වීමෙහි ඇලුණේ සංගණිකාරාමතායෙහි යෙදුණේ ගණයා කෙරෙහි නියැලියේ ගණයා කෙරෙහි ඇලුණේ ගණයා හා සම්මුදිත වූයේ මනාප වූ රූපාරූපාවචර චිත්ත විමුක්තිය හෝ කෙලෙසුන් විසින් අකොප්‍ය වූ අසාමයික හෙවත් ලොකොත්තර අත්‍යන්ත විමුක්තිය හෝ උපයා වෙසෙන්නේ ය යන මෙල කරුණ නො වේ. ආනන්දය, යම් ඒ මහණෙක් එකලා වූයේ ගණයා කෙරෙන් ව්‍යපකර්ෂ වූයේ වෙසේ ද, ඒ මහණහට මෙල කැමැති විය යුතු ය. කිමෙක යත් : කාන්ත වූ සාමයික චෙතොවිමුක්තිය හෝ අකොප්‍ය වූ අසාමයික චෙතොවිමුක්තිය හෝ උපයා වෙසෙන්නේ ය යන මෙල කරුණ වෙයි.



19—ඊ 00502 (8/73)

නාහං ආනන්ද, එකරූපම්පි සමනුපස්සාමි: යත්ථ රත්තස්ස[1] යථාභිරතස්ස[2] රූපස්ස විපරිණාමඤ්ඤථාභාවා න උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

අයං ඛො ආනන්ද, විහාරො තථාගතෙන[3] අභිසම්බුද්ධො, යදිදං සබ්බනිමිත්තානං අමනසිකාරා අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිතුං[4] තත්‍ර චෙ ආනන්ද, තථාගතං ඉමිනා විහාරෙන විහරන්තං භවන්ති උපසඞ්කමිතාරො භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො රාජානො රාජමහාමත්තා තිත්ථියා තිත්ථියසාවකා. තත්‍රානන්ද, තථාගතො විවෙකනින්නෙනෙව චිත්තෙන විවෙකපොණෙන විවෙකපබ්භාරෙන වූපකට්ඨෙන නෙක්ඛම්මාභිරතෙන බ්‍යන්තීභූතෙන සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි අඤ්ඤදත්ථු උය්‍යොජනිකපටිසංයුත්තංයෙව කථං කත්තා හොති. තස්මාතිහ ආනන්ද, භික්ඛු චෙපි ආකඞ්ඛෙය්‍ය: අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. තෙනානන්ද, භික්ඛුනා අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙතබ්බං, සන්නිසාදෙතබ්බං, එකොදි කාතබ්බං, සමාදහාතබ්බං.

කථඤ්ච ආනන්ද, භික්ඛු අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙති සන්නිසාදෙති එකොදිං කරොති සමාදහති. ඉධානන්ද, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො ආනන්ද, භික්ඛු අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙති, සන්නිසාදෙති, එකොදි කරොති, සමාදහති. සො අජ්ඣත්තං සුඤ්ඤතං මනසිකරොති. තස්ස අජ්ඣත්තං සුඤ්ඤතං මනසිකරොතො සුඤ්ඤතාය චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති: අජ්ඣත්තං සුඤ්ඤතං ඛො මෙ මනසිකරොතො අජ්ඣත්තං සුඤ්ඤතාය චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චතී'ති. ඉතිහ තත්ථ සම්පජානො හොති. සො බහිද්ධා සුඤ්ඤතං මනසිකරොති -පෙ- සො අජ්ඣත්තබහිද්ධා සුඤ්ඤතං මනසිකරොති -පෙ- සො ආනෙඤ්ජං මනසිකරොති. තස්ස ආනෙඤ්ජං මනසිකරොතො ආනෙඤ්ජාය චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති: ආනෙඤ්ජං ඛො මෙ මනසිකරොතො ආනෙඤ්ජාය චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චතී'ති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

තෙනානන්ද, භික්ඛුනා තස්මිංයෙව පුරිමස්මිං සමාධිනිමිත්තෙ අජ්ඣත්තං එව චිත්තං සණ්ඨපෙතබ්බං, සන්නිසාදෙතබ්බං, එකොදිකාතබ්බං, සමාදහාතබ්බං. සො අජ්ඣත්තං සුඤ්ඤතං මනසිකරොති. තස්ස අජ්ඣත්තං සුඤ්ඤතං මනසිකරොතො අජ්ඣත්තං සුඤ්ඤතාය චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති: අජ්ඣත්තං සුඤ්ඤතං ඛො මෙ මනසිකරොතො අජ්ඣත්තං සුඤ්ඤතාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චතීති.

---

1. රතස්ස - සීමු, මජසං, PTS.
2. යථාභිරතස්ස - සීමු, මජසං, PTS.
3. තත්ථ තථාගතෙන - සයා.
4. විහරති - සයා.

ආනන්දය, යම් රූපයෙක රාග වශයෙන් ඇලුණක් හට යම් රූපයෙක අභිරක්ත වූවක්හට ඒ රූපයා ගේ විපරිණාම අන්‍යථා භාව හේතුයෙන් ශෝක පරිදෙව දුඃඛ දොර්මනස්‍ය උපායාසයෝ නූපදිත් නම්, මම එබඳු එක ද ශරීරයක් නුවණැයින් නො දක්මි.

ආනන්දය, තථාගතයන් විසින් මේ විහාරය මොනවට අවබෝධ කරන ලද, කුමක් පිණිස යැ යත් : රූපාදි හැම නිමිති නො මෙනෙහි කිරීමෙන් විෂය අධ්‍යාත්මයෙහි ශූන්‍යත ඵලසමාපත්තිය සපයා වාස කිරීම පිණිස යි. ආනන්දය, ඉදින් මේ විහරණයෙන් වාස කරන ඒ තථාගතයන් කරා මහණ මෙහෙණ උවසු උවැසි රජ රජමහමැති තොටු තොටු සව්වෝ එළඹෙන්නාහු වෙත් ද, ආනන්දය, එ පිරිස්හි තථාගත විවෙක ප්‍රවණ වූ විවෙක ප්‍රාග්භාර වූ ව්‍යපකර්ෂ වූ නිෂ්කාමාභිරත වූ සර්වප්‍රකාරයෙන් ආශ්‍රවයනට හෙතුභූත ධර්මයන් කෙරෙන් විසංයුක්ත වූ නිවනට නැඹුරු වූ මැ සිතින් එකැතින් යන්නට මෙහෙ යන කථායෙන් යුක්ත කථාවක් ම කරනු වෙයි. ආනන්දය, එහෙයින් ඉදින් මහණ ද ගොචරාධ්‍යාත්මයෙහි ශූන්‍යතාව උපයාගෙන වාසය කරන්නේ නම් මැනැවැ'යි කැමැති වන්නේ ද ආනන්දය, ඒ මහණ විසින් අධ්‍යාත්මයෙහි සිත මොනොවට පිහිටු වියැ යුතු යි, හිඳුවියැ යුතු යි, එකග කළ යුතු යි, සමාධාන කළ යුතු යි.

ආනන්දය, කෙසේ නම් මහණ අධ්‍යාත්මයෙහි ම සිත මොනොවට පිහිටුවන්නේ මොනොවට හිඳුවන්නේ එකග කරන්නේ සමාධාන කරන්නේ වේ ද යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන්ව මැ අකුසල දහමින් වෙන් ව සවිතර්ක සවිචාර විවේකජ ප්‍රීතිසුඛ ඇති පළමු දහැන් උපයා වාස කෙරෙයි. විතර්ක විචාරයන්ගේ ව්‍යපශම හෙතුයෙන් සිත්හි පැහැදීම් කරන සිත පිළිබඳ එකඟ බව ඇති අවිතර්ක අවිචාර සමාධිජ ප්‍රීතිසුඛ ඇති දෙවන දහැන් ... තෙවන දහැන් ... සිව්වන දහැන් උපයාගෙන වාස කෙරෙයි. ආනන්දය, මෙසේ මහණ අධ්‍යාත්මයෙහි සිත මොනොවට පිහිටුවයි, මොනොවට හිඳුවයි, එකඟ කෙරෙයි, සමාධාන කෙරෙයි. හේ සිය පස්කඳෙහි උපන් ශූන්‍යතාව මෙනෙහි කෙරෙයි. අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව මෙනෙහි කරන ඔහුට ශූන්‍යතායෙහි සිත නො බසී, නො පහ දී, මොනොවට නො පිහිටයි, නො මිදේ. ආනන්දය, මහණ මෙසේ වූ තෙල සිත මෙසේ නුවණින් දනී: අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව මෙනෙහි කරන මාගේ අධ්‍යාත්මයෙහි ශූන්‍යතාවට සිත නොබස්නේ ය, නො පහදනේ ය, නො පිහිටන්නේ ය නො මිදේ ය කියා යි. මෙසේ එහි සම්ප්‍රඥන ඇති වෙයි. හේ පරපඤ්චස්කන්ධයෙහි ශූන්‍යතා මෙනෙහි කරයි ... හේ ස්ව පර උභය පඤ්චස්කන්ධයෙහි ශූන්‍යතා මෙනෙහි කෙරෙයි. ... හේ ආනෙඤ්ජ අරූපසමාපත්ති මෙනෙහි කෙරෙයි, අරූප සමාපත්ති මෙනෙහි කරන ඔහුට ආනෙඤ්ජ අරූප සමාපත්තියට සිත නො බසී, නො පහ දී, මොනොවට නො පිහිටයි. නො මිදේ. ආනන්දය, මහණ මෙසේ විද්‍යමාන වූ තෙල සිත මෙසේ නුවණින් දනගනී: ආනෙඤ්ජය මෙනෙහි කරන මට ආනෙඤ්ජය පිණිස සිත නොබස්නේ ය නො පහදන්නේ ය. මොනොවට නො පිහිටන්නේ ය. නො මිදෙන්නේ ය කියා යි. මෙ සේ එහි සම්ප්‍රඥන ඇති වෙයි.

ආනන්දය, ඒ මහණ විසින් එ මැ පූර්වසමාධිනිමිත්තයෙහි අධ්‍යාත්මයෙහි ම සිත මොනොවට පිහිටුවිය යුතු යැ, මොනොවට හිඳුවියැ යුතු යැ, එකඟ කළ යුතු යැ, සමාධාන කළ යුතු යි. හේ අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව මෙනෙහි කරයි. අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව මෙනෙහි කරන ඔහුගේ සිත අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව පිණිස බැසගනී, පහදී, මොනොවට පිහිටයි, මිදේ. ආනන්දය, ඒ මහණ මෙසේ ඇති තෙල සිත මෙසේ නුවණින් දනී : අධ්‍යාත්ම යෙහි ශූන්‍යතාව මෙනෙහි කරන මාගේ සිත අධ්‍යාත්මයෙහි ශූන්‍යතාව පිණිස බැසගනී.

ඉතිහ තත්ථ සම්පජානො හොති. සො බහිද්ධා සුඤ්ඤතං මනසිකරොති -පෙ- සො අජ්ඣත්තබහිද්ධා සුඤ්ඤතං මනසිකරොති. -පෙ- සො ආනෙඤ්ජං මනසිකරොති. තස්ස ආනෙඤ්ජං මනසිකරොතො ආනෙඤ්ජාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති: ආනෙඤ්ජං ඛො මෙ මනසිකරොතො ආනෙඤ්ජාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චතීති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො චඞ්කමාය චිත්තං නමති. සො චඞ්කමති එවං මං චඞ්කමන්තං නාභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තීති. ඉතිහ තත්ථ සම්පජානො හොති. තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො ඨානාය චිත්තං නමති. සො තිට්ඨති: එවං මං තිට්ඨන්තං[1] නාභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තීති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො නිසජ්ජාය චිත්තං නමති. සො නිසීදති: එවං මං නිසීදන්තං[2] නාභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තීති. ඉතිහ තත්ථ සම්පජානො හොති. තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො සයනාය චිත්තං නමති. සො සයති: එවං මං සයන්තං නාභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තීති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො කථාය[3] චිත්තං නමති. සො යායං කථා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. සෙය්‍යථීදං: රාජකථා චොරකථා මහාමත්තකථා සෙනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වත්ථකථා සයනකථා මාලාකථා ගන්ධකථා ඤාතිකථා යානකථා ගාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ඉත්ථිකථා පුරිසකථා සුරකථා විසිඛාකථා කුම්භට්ඨානකථා පුබ්බපෙතකථා නානත්තකථා ලොකක්ඛායිකා සමුද්දක්ඛායිකා ඉතිභවාභවකථා, ඉති වා ඉති එවරූපිං කථං න කථෙස්සාමීති. ඉතිහ තත්ථ සම්පජානො හොති. යා ච ඛො අයං ආනන්ද, කථා අභිසල්ලෙඛිකා චෙතොවිනීවරණසප්පායා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. සෙය්‍යථීදං: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙකකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථා, ඉති එවරූපිං කථං කථෙස්සාමීති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

---

1. ඨිතං - සීමු, මජ්සං, ස්‍යා.
2. නිසින්නං - සීමු.
3. භාසාය - ස්‍යා.

පහදියි, මොනොවට පිහිටයි, වෙසෙසින් මිදේ යයි කියා යි. මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි. ඒ මහණ පර පඤ්චස්කන්ධයෙහි ශූන්‍යතාව මෙනෙහි කෙරෙයි ... හේ ස්ව පර උභය පඤ්චස්කන්ධයෙහි ශූන්‍යතාව මෙනෙහි කෙරෙයි. ආනෙඤ්ජය මෙනෙහි කරන ඔහුගේ සිත ආනෙඤ්ජය පිණිස බැසගනී, පහදී, මොනොවට පිහිටයි, මිදේ. ආනන්දය, ඒ මහණ මෙසේ ඇති කෙල සිත මෙසේ නුවණින් දනී : ආනෙඤ්ජය මෙනෙහි කරන මාගේ සිත අනෙඤ්ජය පිණිස බැසගනී, පහදී, මොනොවට පිහිටයි, වෙසෙසින් මිදේ ය යි කියා යි.

ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට සක්මන පිණිස සිත නැමේ නම් හේ සක්මන් කෙරෙයි. මෙසේ සක්මන් කරන මා අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහු නො බඳනාහ යි කියා යි. මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි. ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට සිටිනු පිණිස සිත නැමේ නම් හේ සිටී. මෙසේ සිටුනා මා අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ නො ලුහුබඳනාහ යි කියා මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි.

ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට හිඳිනු පිණිස සිත නැමේ නම් හේ හිඳියි. 'මෙසේ හිඳුනා මා අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත පාපක අකුශල ධර්මයෝ නො ලුහුබඳනාහ ' යි කියා මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි. ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට හෝනා පිණිස සිත නැමේ නම් හේ හෝනේ වෙයි. ' මෙසේ හෝනා මා අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත පාපක අකුශල ධර්මයෝ නො ලුහුබඳනාහ ' යි කියා මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි.

ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට භාෂ්‍යකථා පිණිස සිත නැමේ නම්, හේ යම් කථායෙක් හීන ග්‍රාම්‍ය පුහුදුනන් කෙරෙහි වැටෙන අනාර්‍ය්‍ය අනර්ථ සංහිත වේ ද, නිර්වේදය පිණිස නො වැටේ ද, විරාගය පිණිස නො වැටේ ද, නිරෝධය පිණිස නො වැටේ ද, උපශමය පිණිස නො වැටේ ද, අභිඥ පිණිස නො වැටේ ද, සම්බෝධය පිණිස නො වැටේ ද, නිර්වාණය පිණිස නො වැටේ ද, ඒ කෙබඳු කථා යැ යත් : රාජකථා චෞරකථා මහාමාත්‍ර කථා සෙනාකථා භයකථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා මාලා කථා ගන්ධකථා ඥතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා සුරාකථා වීථිකථා කුම්භස්ථාන-කථා පූර්වප්‍රෙතකථා නානාත්වකථා ලොකායතකථා සාමුද්‍රිකකථා ඉතිභවාභවකථා යයි මෙසේ හෝ මෙසේ මෙබඳු වූ හෝ කථා නො කියමි ' කියා මෙසෙයින් එහි සමප්‍රඥන ඇති වෙයි. ආනන්දය, යම් කථායෙක් ක්ලේශයන් ගේ තුනුබව කරන්නේ චිත්තයා ගේ විනිවරණයට සත්ප්‍රාය වූයේ එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශමය පිණිස අභිඥ පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස වැටේ ද, කෙබඳු කථා යැ යත් : අල්පෙච්ඡ කථා සන්තුෂ්ටිකථා ප්‍රවිවෙකකථා අසංසර්ගකථා වීර්‍ය්‍යාරම්භ කථා ශීලකථා සමාධිකථා ප්‍රඥකථා විමුක්තිකථා විමුක්ති ඥනදර්ශනකථා යයි ' මෙසේ මෙබඳු කථා කියමි ' යි කියා මෙසෙයින් එහි සම්ප්‍රඥන ඇති වෙයි.

තස්ස චෙ ආනන්ද, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො විතක්කාය චිත්තං නමති. සො යෙ තෙ විතක්කා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථසංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. සෙය්‍යථීදං : කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො, ඉති එවරූපෙ විතක්කෙ න[1] විතක්කෙස්සාමීති. ඉතිහ තත්ථ සම්පජානො හොති. යෙ ච ඛො ඉමෙ ආනන්ද, විතක්කා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. සෙය්‍යථීදං : නෙක්ඛම්මවිතක්කො අව්‍යාපාදවිතක්කො අවිහිංසාවිතක්කො ඉති එවරූපෙ විතක්කෙ විතක්කෙස්සාමීති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

පඤ්ච ඛො ඉමෙ ආනන්ද, කාමගුණා. කතමෙ පඤ්ච : චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා—පෙ—ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා—පෙ—ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා—පෙ—කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො ආනන්ද, පඤ්චකාමගුණා, යත්ථ භික්ඛුනා අභික්ඛණං සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං. අත්ථි නු ඛො මෙ ඉමෙසු පඤ්චසු කාමගුණෙසු අඤ්ඤතරස්මිං වා අඤ්ඤතරස්මිං වා ආයතනෙ උප්පජ්ජති චෙතසො සමුදාචාරොති. සචෙ ආනන්ද, භික්ඛු පච්චවෙක්ඛමානො එවං පජානාති : අත්ථි ඛො මෙ ඉමෙසු පඤ්චසු කාමගුණෙසු අඤ්ඤතරස්මිං වා අඤ්ඤතරස්මිං වා ආයතනෙ උප්පජ්ජති චෙතසො සමුදාචාරොති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති : යො ඛො ඉමෙසු පඤ්චසු කාමගුණෙසු ඡන්දරාගො, සො මෙ අප්පහීනොති.[2] ඉතිහ තත්ථ සම්පජානො හොති. සචෙ පනානන්ද, භික්ඛු පච්චවෙක්ඛමානො එවං පජානාති. නත්ථි ඛො මෙ ඉමෙසු පඤ්චසු කාමගුණෙසු අඤ්ඤතරස්මිං වා අඤ්ඤතරස්මිං වා ආයතනෙ උප්පජ්ජති චෙතසො සමුදාචාරොති, එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති : යො ඛො ඉමෙසු පඤ්චසු කාමගුණෙසු ඡන්දරාගො, සො මෙ පහීනොති. ඉතිහ තත්ථ සම්පජානො හොති.

පඤ්ච ඛො ඉමෙ ආනන්ද, උපාදානක්ඛන්ධා, යත්ථ භික්ඛුනා උදයබ්බයානුපස්සිනා විහාතබ්බං. ඉති රූපං ඉති රූපස්ස සමුදයො. ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථඞ්ගමො, ඉති සඤ්ඤා—පෙ—ඉති සඞ්ඛාරා—පෙ—ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. තස්ස ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සිනො විහරතො, යො පඤ්චසූපාදානක්ඛන්ධෙසු අස්මිමානො, සො පහීයති. එවං සන්තමෙතං ආනන්ද, භික්ඛු එවං පජානාති : යො ඛො ඉමෙසු පඤ්චසූපාදානක්ඛන්ධෙසු අස්මිමානො, සො මෙ පහීනොති. ඉතිහ තත්ථ සම්පජානො හොති. ඉමෙ ඛො තෙ ආනන්ද, ධම්මා එකන්තකුසලායතිකා[3] අරියා ලොකුත්තරා අනවක්කන්තා පාපිමතා.

තං කිං මඤ්ඤසි ආනන්ද, කං අත්ථවසං සම්පස්සමානො අරහති සාවකො සත්ථාරං අනුබන්ධිතුං අපි පනුජ්ජමානොති.

---

1. එවරූපෙන විතක්කෙන - සීමු, ස්‍යා. 2 නප්පහීණො - සීමු.
3. එකන්තකුසලායාතිකා - සීමු.

ආනන්දය, ඉදින් මේ විහාරයෙන් විහරණ කරන ඒ මහණහට විතර්කය පිණිස සිත නැමේ නම්, ඒ මහණ යම් ඒ විතර්ක කෙනෙක් හීන වූවාහු ග්‍රාම්‍ය වූවාහු පෘථුජ්ජනයන් කෙරෙහි පවත්නාහු අනාර්‍ය්‍ය වූවාහු අනර්ථසංහිත වූවාහු නිර්වේදයට නො වැටෙන්නාහු විරාගයට නො වැටෙන්නාහු නිරොධයට නො වැටෙන්නාහු උපශමයට නො වැටෙන්නාහු අභිඥාවට නො වැටෙන්නාහු සම්බෝධියට නො වැටෙන්නාහු නිවනට නො වැටෙන්නාහු වෙත් ද, කෙබඳු විතර්කයෝ යැ යත් : ' කාමවිතර්ක යැ ව්‍යාපාද විතර්ක යැ විහිංසාවිතර්ක යි. මෙසේ මෙබඳු විතර්කයන් විතර්කණය නො කෙරෙමි ' යි කියා මෙසේ එහි සම්ප්‍රඥාන ඇති වෙයි. ආනන්දය, යම් විතර්ක කෙනෙක් ආර්‍ය්‍ය වූවාහු නෛර්‍ය්‍යාණික වූවාහු ඒ විතර්කණ කරනුවන් මොනොවට දුක් කෙළවර කරනු පිණිස පමුණුවත් ද, කෙබඳු විතර්කයෝ යැ යත් : ' නිෂ්කාමවිතර්ක යැ අව්‍යාපාදවිතර්ක යැ අවිහිංසාවිතර්ක යි. මෙසේ මෙබඳු විතර්කයන් විතර්කණ කෙරෙමි ' යි කියා මෙසෙයින් මෙහි සම්ප්‍රඥාන ඇති වෙයි.

ආනන්දය, මේ කාමගුණයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව අරමුණු කොට උපදනා කාමයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ චක්ෂුර්විඥානයෙන් දක්ක යුතු රූපයෝ යැ, . . . ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු ශබ්දයෝ යැ . . . ඝ්‍රාණවිඥානයෙන් දතයුතු ගන්ධයෝ යැ . . . ජිහ්වාවිඥානයෙන් විත්දයුතු රසයෝ යැ . . . ඉෂ්ටාලම්බන වූ කමනීය වූ මනවඩන ප්‍රියස්වභාව අරමුණු කොට උපදනා කාමයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ කායවිඥානයෙන් දතයුතු ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. යම් කාමගුණයෙක මහණහු විසින් ' මේ පස්කම් ගුණයෙහි යම් යම් කාමගුණයෙක උපදනා චිත්තසමුදවාරයෙක් ඇද්දෝ ' යි නිතර තම සිත ප්‍රත්‍යවේක්ෂා කළ යුතු වේ ද, ආනන්දය, මේ ඒ පස්කම්ගුණයෝ යි. ආනන්දය, ඉදින් මහණ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මෙසේ නුවණින් දන්නේ වේ ද, කිසේ යැ යත් : ' මේ පස්කම්ගුණයෙහි අන්‍යතර අන්‍යතර ගුණයෙක මා ගේ චිත්තසමුදවාරයෙක් උපදනේ ඇද්ද කියා යි. ආනන්දය, මහණ මෙසේ විද්‍යමාන වූ තෙල කරුණ මෙසේ නුවණින් දන්නේ යැ. කිසේ යැ යත් : ' මේ පස්කම් ගුණයෙහි යම් ඡන්‍දරාගයෙක් වී නම් මට ඒ ප්‍රහීණ යයි කියා යි. මෙසෙයින් එහි සම්ප්‍රඥාන ඇති වෙයි. ආනන්දය, ඉදින් මහණ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මෙසේ නුවණින් දන්නේ වේ ද, කිසේ යැ යත් : ' මේ පස්කම් ගුණයෙහි අන්‍යතර අන්‍යතර ආයතනයෙක මා ගේ චිත්තසමුදවාරයෙක් නැත ' කියා යි. ආනන්දය, ඒ මහණ මෙසේ විද්‍යමාන වූ තෙල කරුණ මෙසේ නුවණින් දන්නේ ය : මේ පඤ්චකාමගුණයන් කෙරෙහි යම් ඡන්දරාගයෙක් වී නම්, ඒ මට ප්‍රහීණය කියා යි. මෙසෙයින් එහි සම්ප්‍රඥාන ඇති වෙයි.

ආනන්දය, මහණ යම් උපාදාන ස්කන්ධයෙක උදයව්‍යය නුවණින් දක්නාහු විසින් විසිය යුතු වේ ද, එබඳු මේ උපාදාන ස්කන්ධයෝ පස්දෙනෙකි. රූපය මෙසේ යැ, රූපසමුදය මෙසේ යැ, රූපයා ගේ අස්තඞ්ගමය මෙසේ යැ, වේදනා මෙසේ යැ, වෙදනා සමුදය මෙසේ යැ, වෙදනාව ගේ අස්තඞ්ගමය මෙසේ යැ, සංඥා මෙසේ යැ ......සංස්කාර මෙසේ යැ...... විඥාන මෙසේ යැ, විඥානසමුදය මෙසේ යැ, විඥානයා ගේ අස්තංගමය මෙසේ යැ'යි කියා යි. මේ පඤ්චොපාදානස්කන්ධයෙහි උදයව්‍යය නුවණින් දක්මින් වාස කරන ඒ මහණහට පඤ්චොපාදාන ස්කන්ධයෙහි යම් අස්මිමානයෙක් ඇද්ද, ඒ පහ වෙයි. ආනන්දය, මෙසේ විද්‍යමාන වූ තෙල කරුණ ඒ මහණ මෙසේ නුවණින් දනී ; මේ පඤ්චොපාදානස්කන්ධයෙහි යම් අස්මිමානයෙක් වී ද, ඒ මට ප්‍රහීණය කියා යි. මෙසේ එහි සම්ප්‍රඥාන ඇති වෙයි. ආනන්දය, ඒකාන්ත කුශලයෙන් පැමිණි නිකෙලෙස් වූ ලොකයෙහි විශිෂ්ට වූ මරහු විසින් නො ඇක්මුණු ඒ දම්හු නම් මොහු ය :

ආනන්දය, ඒ කෙසේ හඟනෙහි ද ශ්‍රාවකයා කිනම් අර්ථයක් දක්මින් නොරතුදු ශාස්තෲන් නුහුබඳනට නිසි වේ ද ?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා භගවංනෙත්තිකා භගවම්පටිසරණා. සාධු වත භන්තෙ, භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

න ඛො ආනන්ද, අරහති සාවකො සත්ථාරං අනුබන්ධිතුං යදිදං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං තස්ස හෙතු[1] තං කිස්ස හෙතු: දීඝරත්තස්ස හි වො[2] ආනන්ද, ධම්මා සුතා ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. යා ච ඛො අයං ආනන්ද, කථා අභිසල්ලෙඛිකා චෙතො විනීවරණසප්පායා, එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. සෙය්‍යථීදං: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙකකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථා. එවරූපියා ඛො ආනන්ද කථාය හෙතු අරහති සාවකො සත්ථාරං අනුබන්ධිතුං අපි පනුජ්ජමානො.

එවං සන්තෙ ඛො ආනන්ද, ආචරියූපද්දවො හොති. එවං සන්තෙ අන්තෙවාසූපද්දවො හොති. එවං සන්තෙ බ්‍රහ්මචාරූපද්දවො හොති.

කථං චානන්ද, ආචරියූපද්දවො හොති: ඉධානන්ද, එකච්චො සත්ථා විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. තස්ස තථා වූපකට්ඨස්ස විහරතො අන්වාවට්ටන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච. සො අන්වාවට්ටන්තෙසු[3] බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච මුච්ඡති, නිකාමයති, ගෙධං ආපජ්ජති, ආවට්ටති බාහුල්ලාය. අයං වුච්චතානන්ද, උපද්දවො ආචරියො. ආචරියූපද්දවෙන අවධිංසු නං පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා[4] සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, එවං ඛො ආනන්ද, ආචරියූපද්දවො හොති.

කථං චානන්ද, අන්තෙවාසූපද්දවො හොති. තස්සෙව ඛො පනානන්ද, සත්ථු සාවකො තස්ස සත්ථු විවෙකමනුබ්‍රූහයමානො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං, තස්ස තථා වූපකට්ඨස්ස විහරතො අන්වාවට්ටන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච. සො අන්වාවට්ටන්තෙසු බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච මුච්ඡති, නිකාමයති, ගෙධං ආපජ්ජති, ආවට්ටති බාහුල්ලාය. අයං වුච්චතානන්ද, උපද්දවො අන්තෙවාසී. අන්තෙවාසූපද්දවෙන අවධිංසු නං පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො ආනන්ද, අන්තෙවාසූපද්දවො හොති.

---

1. {සුත්තගෙය්‍යවෙය්‍යාකරණස්ස සොතුං - ස්‍යා.
   {සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණස්ස හෙතු - PTS.
2. තෙ - සීමු, මජසං.
3. {අන්වාවත්තන්තෙසු - සීමු, මජසං.
   {අන්වාවට්ටෙසු - ස්‍යා, PTS.
4. පොනොබ්භවිකා - මජසං. 5. කාමයති - PTS.

වහන්ස, දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත. භාග්‍යවතුන් වහන්සේ නෙත්‍ර කොට ඇත. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත. වහන්සෙ තෙල භාෂිතයා ගේ අර්ථ නුඹ වහන්සේට මැ වැටහේ නම් මනාමැනූ භාග්‍යවතුන් වහන්සේගේ බස් අසා භික්ෂූහු ධරති'යි සැල කළෝ.

ආනන්දය, ශ්‍රාවකයා සූත්‍ර ය ගෙය ය වෙය්‍යාකරණ ය යන ඒ හෙතු කොට ශාස්තෲන් වහන්සේ නුහුබඳනට නිසි වෙයි. ඒ කවර හෙයින යත් : ආනන්දය, පැවිදි ව බොහෝ කල් ඇත්තහු විසින් පර්‍ය්‍යාප්තිධර්මයෝ අසන ලදහ, ධරන ලදහ, බසින් පුරුදු කරන ලදහ, සිතින් දක්නා ලදහ, ප්‍රඥායෙන් අවබොධ කරන ලදහ. ආනන්දය, යම් කථා කෙනෙක් ක්ලේශයන් ගේ තුනුබව කරන්නාහු චෙතොවිනීවරණයට සත්ප්‍රාය වූවාහු එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශම පිණිස අභිඥා පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස වැටෙත් ද, ඔහු කවරහ යත් : අල්පෙච්ඡකථා යැ, සන්තුෂ්ටිකථා යැ, ප්‍රවිවේකකථා යැ, අසංසර්ගකථා යැ, වීර්‍ය්‍යාරම්භකථා යැ, ශීලකථා යැ, සමාධිකථා යැ, ප්‍රඥාකථා යැ, විමුක්තිකථා යැ, විමුක්තිඥානදර්ශනකථා යැ යන මොහු යි. ආනන්දය, ශ්‍රාවකයා නෙරතුදු මෙවන් කථාහෙතුයෙන් ශාස්තෲන් වහන්සේ නුහුබැඳ යන්නට නිසි වෙයි.

ආනන්දය, මෙසේ වත්ම ආචාර්‍ය්‍යොපද්‍රව වෙයි, මෙසේ වත් ම අන්තෙවාසිකොපද්‍රව වෙයි, මෙසේ වත් ම බ්‍රහ්මචාරූපද්‍රව වේ.

ආනන්දය, කෙසේ ආචාර්‍ය්‍යොපද්‍රව වේ යැ යත් : ආනන්දය, මෙලොවැ ඇතැම් ශාස්තෲවරයෙක් අරණ්‍ය ය, වෘක්ෂමූල ය, පර්වත ය, කඳුරැලි ය, ගිරිගුහා ය ශ්මසාන ය, වන ප්‍රස්ථ ය, අභ්‍යවකාශ ය, පලාලපුඤ්ජ යයි විවික්ත ශායනාසන ඇසුරු කෙරෙයි. එසේ එකලා වැ වාස කරන ඔහු වෙත බමුණු ගැහැවියෝ ද නියම්ගම්වැස්සෝ ද දනව්වැස්සෝ ද එළැඹෙත්. හේ බමුණු ගැහැවියනුදු නියම්ගම්වැස්සනුදු දනව්වැස්සනුදු එළැඹෙන කල තෘෂ්ණායෙන් මූර්ච්ඡිත වෙයි නිකාම කෙරෙයි, ගිජුබවට පැමිණෙයි, ප්‍රත්‍යයබාහුල්‍ය යට වැටෙයි. ආනන්දය, මේ ආචාර්‍ය්‍යොපද්‍රව යයි කියනු ලැබේ. ආචාර්‍ය්‍යොපද්‍රව හෙතුයෙන් සංක්ලෙශයට හිත වූ පුනර්භවය පිණිස පවත්නා දරථ සහිත වූ දුඃඛවිපාක ඇති මතුයෙහි ජාතිජරාමරණයට හිත වූ පාපක අකුශලධර්මයෝ ඒ ආචාර්‍ය්‍යවරයා ගුණ මරණයෙන් මැරූහ. ආනන්දය, මෙසේ ආචාර්‍ය්‍යාහට උපද්‍රව වෙයි.

ආනන්දය, කිසෙයින් අන්තෙවාසිකොපද්‍රව වේ යැ යත් ආනන්දය: , ඒ ශාස්තෲහු ගේ මැ සච්චෙක් ඒ ශාස්තෲහු ගේ විවේකය අනුව වඩනුයේ අරණ්‍ය ය, වෘක්ෂමූල ය, පර්වත ය, කඳුරු ය, ගිරිලෙන, සොහොන, වනපෙත, අභ්‍යවකාශය, පිදුරුකිළිය යන සෙනසුන් සෙවෙයි. එසෙයින් එකලා වැ වාස කරන ඔහු වෙත බමුණු ගැහැවියන් හා නියම්ගම් වැස්සෝ ද දනව්වැස්සෝ ද එළැඹෙති. හේ බමුණුගැහැවියන් හා නියම්ගම් වැස්සනුදු දනව්වැස්සනුදු එළැඹෙත් ම තෘෂ්ණාමූර්ච්ඡායෙන් මුසපත් වෙයි, නිකාම කෙරෙයි, ගිජුබවට පැමිණෙයි, බාහුල්‍යයට වැටෙයි. ආනන්දය, මේ අන්තෙවාසිකොපද්‍රව යයි කියනු ලැබේ. අන්තෙවාසිකොපද්‍රව හෙතුයෙන් කෙලෙසන පුනර්භවය කරන දරථ සහිත දුඃඛවිපාක දෙන මතුයෙහි ජාතිජරාමරණ උදකරන ලාමක අකුසලදහම්හු ඒ අතැවැස්සා ගුණමරණ යෙන් මැරූහ. ආනන්දය, මෙසේ අන්තෙවාසිකෝපද්‍රව වෙයි.

කථං චානන්ද, බ්‍රහ්මචාරූපද්දවො හොති: ඉධානන්ද තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං, තස්ස තථා වූපකට්ඨස්ස විහරතො අන්වාවට්ටන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච. සො අන්වාවට්ටන්තෙසු බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච න මුච්ඡති, න නිකාමයති, න ගෙධං ආපජ්ජති. න ආවට්ටති බාහුල්ලාය. තස්සෙව ඛො පනානන්ද, සත්ථු සාවකො තස්ස සත්ථු විවෙකමනුබ්‍රූහයමානො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං, තස්ස තථා වූපකට්ඨස්ස විහරතො අන්වාවට්ටන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපදා ච. සො අන්වාවට්ටන්තෙසු බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමෙසු චෙව ජානපදෙසු ච මුච්ඡති, නිකාමයති, ගෙධං ආපජ්ජති. ආවට්ටති බාහුල්ලාය. අයං වුච්චතානන්ද, උපද්දවො බ්‍රහ්මචාරී බ්‍රහ්මචාරූපද්දවෙන අවධිංසු නං පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරා-මරණියා. එවං ඛො ආනන්ද, බ්‍රහ්මචාරූපද්දවො හොති.

තත්‍රානන්ද, යො චෙවායං ආචරියූපද්දවො යො ච අන්තෙවාසූපද්දවො, අයං තෙහි බ්‍රහ්මචාරූපද්දවො දුක්ඛවිපාකතරො චෙව කටුකවිපාකතරො ච, අපි ච විනිපාතාය සංවත්තති.

තස්මාතිහ මං ආනන්ද, මිත්තවතාය සමුදාචරථ, මා සපත්තවතාය. තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය.

කථං චානන්ද, සත්ථාරං සාවකා සපත්තවතාය සමුදාචරන්ති නො මිත්තවතාය: ඉධානන්ද, සත්ථා සාවකානං ධම්මං දෙසෙති අනුකම්පකො හිතෙසී අනුකම්පං උපාදාය ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති. වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. එවං ඛො ආනන්ද සත්ථාරං සාවකා සපත්තවතාය සමුදාචරන්ති නො මිත්තවතාය.

කථඤ්චානන්ද, සත්ථාරං සාවකා මිත්තවතාය සමුදාචරන්ති නො සපත්තවතාය: ඉධානන්ද, සත්ථා සාවකානං ධම්මං දෙසෙති අනුකම්පකො හිතෙසී අනුකම්පං උපාදාය: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස සාවකා සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං[1] උපට්ඨපෙන්ති, න ච වොක්කම්ම සත්ථුසාසනා[2] වත්තන්ති. එවං ඛො ආනන්ද, සත්ථාරං

---

1. අඤ්ඤං චිත්තං - PTS. 2. සාසනං - සයා.

ආනන්දය, කෙසේ බ්‍රහ්මචාරි උපද්‍රව වේ යැ යත් : ආනන්දය, මෙලොවැ අර්හත් සම්‍යක්සම්බුද්ධ විද්‍යාචරණසම්පන්න සුගත වූ ලොකවිද් අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ චතුස්සත්‍යාවබොධ කළ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ උපදනා සේක. ඔබ අරණ්‍ය ය, වෘක්ෂමූල ය, පර්වත ය, කන්‍දර ය, ගහ්වර ය, ශ්මසානය වනප්‍රස්ථ ය, අභ්‍යවකාශ ය, පලාලපුඤ්ජ යයි විවික්ත ශයනාසන සෙවූති. එසේ එකලා ව වාස කරන ඔබ වෙත බමුණුගැහැවියෝ ද නියම්ගම්වැස්සෝ ද දනව්වැස්සෝ ද පැමිණෙති, ඔබ බමුණු ගැහැවියනුදු නියම්ගම් වැසියනුදු දනව්වැසියනුදු පැමිණෙන කල මූර්ච්ඡිත නො වෙති, නිකාම නො කෙරෙති, ගෙධයට නො පැමිණෙති, බාහුල්‍යයට නො වැටෙත්. ආනන්දය. ඒ තථාගත ශාස්තෲන් ගේ මැ සව්වෙක් ඒ ශාස්තෲන් ගේ විවෙකය වඩන්නේ අරණ රුක්මුල පව් කඳුරු ලෙන සොහොන වනපෙත එළිමහන පිදුරුකිළි යයි ජනසුන් සෙනසුන් සෙවී. එසේ එකලා වැ වාස කරන ඔහු වෙත බ්‍රාහ්මණ ගෘහපතියෝ ද නිගම වාසීහු ද ජනපදවාසීහු ද පැමිණෙති. හේ බ්‍රාහ්මණ ගෘහපතියනුදු නිගමවාසීනුදු ජනපද වාසීනුදු පැමිණෙත් ම තෘෂ්ණාමූර්ච්ඡායෙන් මූර්ච්ඡිත වෙයි, නිකාම කෙරෙයි, ගෙධයට පැමිණෙයි, බාහුල්‍යයට වැටෙයි. ආනන්දය, මේ බ්‍රහ්මචාරිඋපද්‍රව යයි කියනු ලැබේ. බ්‍රහ්මචාරි උපද්‍රව හෙතුයෙන් සංක්ලේශයට හිත වූ පුනර්භවයට වැටෙන සදර වූ දුඃඛවිපාක වූ මතු ජාතිජරාමරණයට කරුණු වූ ලමු අකුසලදහම්හු ඒ බ්‍රම්සරහු ගුණමරණයෙන් මැරූහ.

ආනන්දය, එහි යම් ආචාර්‍ය්‍යොපද්‍රවයෙක් ඇද්ද, යම් අන්තෙවාසිකොපද්‍රවයෙක් ඇද්ද, ඒ උපද්‍රවයනට වඩා මේ බ්‍රහ්මචාරිඋපද්‍රවය දුඃඛවිපාකතර වෙයි. කටුක විපාකතර ද වෙයි. තවද විනිපාතයට වැටෙයි.

ආනන්දය, එකරුණෙන් මා මෛත්‍රප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කරව, වෛරප්‍රතිපත්ති යෙන් ව්‍යවහාර නො කරව, එය තොපට දීර්ඝරාත්‍රියෙහි හිත පිණිස සුව පිණිස වෙයි.

ආනන්දය, කෙසේ සව්වෝ ශාස්තෲන් වහන්සේ වෛරප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කෙරෙති යත් : මෛත්‍රප්‍රතිපත්තියෙන් ව්‍යවහාර නො කෙරෙති යත් : ' ආනන්දය, මෙලොවැ ශාස්තෲන් වහන්සේ අනුකම්පා ඇති වැ හිතෛෂී වැ අනුකම්පා පිණිස සව්වනට දහම් දෙසති. ' මෙය තොපට හිත පිණිස ය, මෙය තොපට සුව පිණිස ය කියා යි. සව්වෝ ඔබ ගේ වචනය නො අසනු කැමැති වෙති, කන් නො නතු කෙරෙති, දැනගනුවට සිත නො එළවති, ශාස්තෘශාසනයෙන් ඉවත් ව වැටෙත්. ආනන්දය, මෙසේ සව්වෝ ශාස්තෲන් වහන්සේ වෛරප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කෙරෙති. මෛත්‍රප්‍රතිපත්ති යෙන් ව්‍යවහාර නො කෙරෙත්.

ආනන්දය, කෙසේ සව්වෝ ශාස්තෲන් වහන්සේ මෛත්‍ර ප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කෙරෙති යත් : වෛරප්‍රතිපත්තියෙන් ව්‍යවහාර නො කෙරෙති යත් : ' ආනන්දය, මෙලොවැ ශාස්තෲන් වහන්සේ අනුකම්පක ව හිතෛෂී ව අනුකම්පා පිණිස සව්වනට දහම් දෙසති : ' මෙය තොපට හිත පිණිස ය, මෙය තොපට සුව පිණිස ය කියා ' යි සව්වෝ ඔබ ගේ වචනය අසනු කැමැති වෙති, කන් නතු කෙරෙති, දැනගන්නට සිත එළවති, ශාස්තෘශාසනයෙන් ඉවත් ව නො ද වැටෙත්. ආනන්දය, මෙසෙයින් සව්වෝ

සාවකා මිත්තවතාය සමුදාචරන්ති නො සපත්තවතාය. තස්මාතිහ මං ආනන්ද, මිත්තවතාය සමුදාචරථ, මා සපත්තවතාය තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය. න ඛො අහං ආනන්ද, තථා පරක්කමිස්සාමි. යථා කුම්භකාරෙ ආමකෙ ආමකමත්තෙ. නිග්ගය්හ නිග්ගය්හාහං ආනන්ද වක්ඛාමි. පවය්හ ආනන්ද පවය්හ වක්ඛාමි. යො සාරො සො ඨස්සතීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මහාසුඤ්ඤත සුත්තං දුතියං.

ශාස්තෲන් වහන්සේ මෙත්තාප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කෙරෙති, වෛරප්‍රතිපත්තියෙන් ව්‍යවහාර නො කෙරෙත්. ආනන්දය, එකරුණෙන් මා මෙත්තාප්‍රතිපත්තියෙන් ව්‍යවහාර කරව, වෛරප්‍රතිපත්තියෙන් ව්‍යවහාර නො කරව, එය තොපට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වෙයි. ආනන්දය, යම් පරිදි කුම්භකාරයෙක් අපක්ව වූ අමු මැටිබඳුනෙහි ක්‍රියා කෙරේ ද, මම එපරිදි නො පිළිපදිමි. ආනන්දය, මම පුනපුනා නිග්‍රහ කොට කියමි, ආනන්දය, දෙස් පුනපුනා නෙර කියමි. යම් සාරයෙක් ඇද්ද, ඒ සිටුනේය කියා යි.

භාග්‍යවතුන් වහන්සේ මේ මහාසුඤ්ඤත සූත්‍ර වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

දෙවැනි මහාසුඤ්ඤතසූත්‍ර යි.

## 3. 3. 3.

## අච්ඡරියබ්භුත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨානසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවකතා[1] යත්‍ර හි නාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජානිස්සති: එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංගොත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංසීලා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංධම්මා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංපඤ්ඤා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංවිහාරී තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො තෙ භික්ඛූ එතදවොච: අච්ඡරියා චෙව ආවුසො, තථාගතා අච්ඡරියධම්මසමන්නාගතා ච අබ්භුතා චෙව ආවුසො, තථාගතා අබ්භුතධම්මසමන්නාගතා චාති.

අයඤ්ච හිදං තෙසං භික්ඛූනං අන්තරා කථා විප්පකතා හොති. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

කායනුත්ථ භික්ඛවෙ, එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතාති.

ඉධ භන්තෙ, අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං උපට්ඨානසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: අච්ඡරියං ආවුසො-පෙ-එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. එවං වුත්තෙ භන්තෙ, ආයස්මා ආනන්දො අම්හෙ එතදවොච: අච්ඡරියා චෙව ආවුසො, තථාගතා අච්ඡරියධම්මසමන්නාගතා ච, අබ්භුතා චෙව ආවුසො, තථාගතා අබ්භුතධම්මසමන්නාගතා චාති. අයං ඛො නො භන්තෙ, අන්තරාකථා විප්පකතා. අථ භගවා අනුප්පත්තොති.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: තස්මාතිහ තං ආනන්ද, භිය්‍යොසොමත්තාය පටිභන්තු තථාගතස්ස අච්ඡරියා අබ්භුතධම්මාති.

---

1. මහානුභාවතා - සිමු, මජසං, PTS.

# 3. 3. 3
# අචඡරියබභූත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජෙතවන නම් අනේපිඩු සිටුහු ගේ අරම්හි වැඩවසන සේක. එකල්හි පසුබත පිණ්ඩපාතයෙන් වැළැකුණු උවටන්හල්හි එක්රැස්ව වැඩහුන් බොහෝ භික්ෂූන් ගේ මේ අතුරුකථායෙක් පහළ වී : යම් තථාගතයන් වහන්සේ කෙනෙක් තෘෂ්ණාමානදෘෂ්ටි සුන් කළ කම්වට සුන් කළ ගෙවාලූ කම්වට ඇති හැම විවාදුක් ඉක්මැ සිටි පිරිනිවි අතීත බුදුවරයන් දත්සේක් ද, ඇවත, තථාගතයන් වහන්සේ ගේ මහත්–සෘද්ධි ඇති බව මහත්–අනුභාව ඇති බව ආශ්වර්‍ය්‍ය යැ, ඇවත, අද්භූත යැ. කිසේ යැ යත්: ඒ භාග්‍යවත්හු මෙබඳු ජාති ඇති වූහ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙබඳු නම් ඇති වූහ' යි කියා ද ඒ භාග්‍යවත්හු මෙබඳු ගොත් ඇති වූ හ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙබඳු සිල් ඇති වූහ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙබඳු දහම් ඇති වූහ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙබඳු ප්‍රඥ ඇති වූ හ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙබඳු විහරණ ඇති වූ හ ' යි කියා ද, ඒ භාග්‍යවත්හු මෙසේ විමුක්ත වූහ ' යි කියා ද, දත්හ ' යි.

මෙසේ කී කල්හි, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඒ භික්ෂූන් හට මෙසේ කීහ: ඇවැත්නි, තථාගතවරයෝ ආශ්වර්‍ය්‍ය ද වෙති, ආශ්වර්‍ය්‍යධර්ම සමන්වාගත ද වෙති. ඇවැත්නි, තථාගතවරයෝ අද්භූත ද වෙති, අද්භූතධර්ම සමන්වාගත ද වෙත් යයි.

ඒ භික්ෂූන් ගේ මේ අතුරු කථාව කොට අඩාල වෙයි. එසඳ භාග්‍යවතුන් වහන්සේ පිළිසලනින් නැඟිසිටි සේක් උවටන්හල කරා වැඩි සේක. වැඩ පැන්වූ අස්නෙහි හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ සඟුන් ඇමතූ සේක :

මහණෙනි, දැන් මා එන්නාට පළමුව කිනම් කථායෙකින් යුක්ත ව රැස්ව හුන්නහු ද ? තොප ගේ කිනම් අතුරු කථාවක් කොට අඩාළ වී ද ' යි, පුළුවුත් සේක.

වහන්ස, මෙහි පසුබත පිණ්ඩපාතයෙන් වැළැකුණු උවටන්හලැ රැස්වැ හුන් අප ගේ මේ අතුරු කථාව උපන : ' ඇවැත්නි, ආශ්වර්‍ය්‍ය යැ . . . ඒ භාග්‍යවත්හු මෙසේ විමුක්ත වූහ ' යි කියා යි. වහන්ස, මෙසේ කී කල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අපට තෙල කීහ : ' ඇවැත්නි, තථාගතවරයෝ ආශ්වර්‍ය්‍ය වූවාහු ද ආශ්වර්‍ය්‍යධර්මසමන්වාගත වූවාහු ද වෙති. ඇවැත්නි, තථාගතවරයෝ අද්භූත වූවාහු ද අද්භූතධර්මසමන්වාගත වූවාහු ද වෙත් ' යයි. වහන්ස, මේ අප ගේ කොට අඩාළ වූ අතුරු කථාව වී. එකල්හි භාග්‍යවතුන් වහන්සේ අනුප්‍රාප්ත සේකැ ' යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූ සේක : " ආනන්දය, එහෙයින් තථාගතයන් ගේ ආශ්වර්‍ය්‍ය අද්භූතධර්මයෝ තොපට අධිමාත්‍ර ව වැටැහෙත්ව " යි, වදළහ.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: සතො සම්පජානො ආනන්ද[1], බොධිසත්තො තුසිතං කායං උපපජ්ජීති යම්පි භන්තෙ, සතො සම්පජානො බොධිසත්තො තුසිතං කායං උපපජ්ජි. ඉදම්හං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: සතො සම්පජානො ආනන්ද, බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසීති. යම්පි භන්තෙ සතො සම්පජානො බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසි. ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යාවතායුකං ආනන්ද, බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසීති. යම්පි භන්තෙ, යාවතායුකං බොධිසත්තො තුසිතෙ කායෙ අට්ඨාසි. ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: සතො සම්පජානො ආනන්ද, බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමීති. යම්පි භන්තෙ, සතො සම්පජානො බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමි, ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමි. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථපිමෙ චන්දිමසූරියා එවංමහිද්ධිකා එවංමහානුභාවා ආභාය නානුභොන්ති තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති: අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නාති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පති සම්පකම්පති සම්පවෙධති. අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවන්ති. යම්පි භන්තෙ, -පෙ- ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. චත්තාරො නං දෙවපුත්තා[2] චතුද්දිසං ආරක්ඛාය උපගච්ඡන්ති: මා නං බොධිසත්තං වා බොධිසත්තමාතරං වා මනුස්සො වා අමනුස්සො වා කොචි වා විහෙඨෙසීති[3]. යම්පි භන්තෙ,—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

---

1. උපපජ්ජමානො ආනන්ද - PTS.
2. චත්තාරො දෙවපුත්තා - මජ්ඣං, සීමු.
3. විහෙසීති - ස්‍යා

වහන්ස, මා විසින් තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙහි අසන ලද, සම්මුඛයෙහි පිළිගන්නා ලද : ' ආනන්දය, බෝසත්හු ස්මෘතිමත් ව සම්‍යග්ඥාන ඇති ව තුසිකයට එළඹුණාහ ' යි. වහන්ස, බෝසත්හු ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව තුසිකයට එළඹුණාහ' යන යමක් ඇද්ද, වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද, '' ආනන්දය, බෝසත්හු ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව තුසිකයෙහි සිටියහ '' යි. වහන්ස, බෝසත්හු ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව තුසිකයෙහි සිටියහ, යන යමක් ඇද්ද, වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, බෝසත්හු ආයු ඇති තාක් තුසිකයෙහි සිටියහ '' යි. වහන්ස, බෝසත්හු ආයු ඇති තාක් තුසිකයෙහි සිටියහ ' යන යමක් ඇද්ද, වහන්ස මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, බෝසත්හු ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව තුසිකයෙන් සැව මව්කුස පිළිසඳ ගත්හ '' යි. වහන්ස, බෝසත්හු ස්මෘතිමත් ව සම්ප්‍රඥාන ඇති ව තුසිකයෙන් සැව මව්කුස පිළිසඳ ගත්හ ' යන යමක් ඇද්ද, වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් තුසිකයෙන් සැව මව්කුස පිළිසඳ ගත්තේ වේ ද, එකල මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලොකයෙහි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි දෙවියන් ගේ දෙවානුභාව ඉක්මැගෙන ම අප්‍රමාණ වූ උදර වූ අවභාසයෙක් පහළ වෙති '' ' නිත්‍යවිවෘත වූ අසංවෘත වූ අන්ධකාර වූ ඝනාන්ධකාර ඇති යම් ලොකාන්තරික නිරය කෙනෙක් ඇද්ද, යම් නිරයෙක මෙසේ මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙනා පවා සිය එළියෙන් වළඳ නො කෙරෙත් ද, එබඳු ඒ ලොකාන්තරිකයෙහි දු දෙවියන් ගේ දෙවානුභාව ඉක්මැගෙන ම නො පමණ උදර එළියෙක් ලොකයෙහි පහළ වෙයි'. ඒ නිරැහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද, ඒ සත්හු දු ඒ එළියෙන් ' මෙහි උපන් අන්‍ය සත්ත්වයෝත් ඇති ' යි උනුන් හඳුනාගනිත්. මේ දශසහශ්‍රී ලොකධාතුව ද කම්පිත වෙයි, ප්‍රකර්ෂයෙන් කම්පිත වෙයි, වෙසෙසින් වෙවුළයි. දෙවියන් ගේ දෙවානුභාව ඉක්මැ ගෙන ම අප්‍රමාණ වූ උදර වූ අවභාසයෙක් ලොකයෙහි පහළ වෙති '' ඇසිණ. වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුස පිළිසඳ ගන්නේ වේ ද, එකල මිනිසෙක් වේවයි නො මිනිසෙක් වේව ' යි කිසිවෙක් ඒ බෝසත් හෝ බෝසත්මව හෝ නහමක් පෙළාව ' යි සතරවරම් දෙව්පුත්හු සිවුදිග ආරක්ෂා පිණිස ඔහු කරා පැමිණෙති.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

20—ඒ 00502 (8/73)

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. පකතියා සීලවතී බොධිසත්තමාතා හොති. විරතා පාණාතිපාතා, විරතා අදින්නාදානා, විරතා කාමෙසු මිච්ඡාචාරා, විරතා මුසාවාදා, විරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානාති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං. අනතික්කමනීයා ච බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙනාති. යම්පි භන්තෙ,—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. ලාභිනී බොධිසත්තමාතා හොති පඤ්චන්නං කාමගුණානං. සා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙතී'ති. යම්පි භන්තෙ,—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති. සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා. බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං. සෙය්‍යථාපි ආනන්ද, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො. තත්‍රාස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වාති. එවමෙව ඛො ආනන්ද, යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති. සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා. බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියන්ති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: සත්තාහජාතෙ ආනන්ද, බොධිසත්තෙ බොධිසත්තමාතා කාලං කරොති. තුසිතං කායං උප්පජ්ජතී'ති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යථා ඛො පනානන්ද අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති. න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. දසෙව මාසානි බොධිසත්තං බොධිසත්තමාතා කුච්ඡිනා පරිහරිත්වා විජායතී'ති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි තෙල අසන ලද, හමුවෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුස පිළිසඳ ගනී ද, එකල බෝසත් මව පියවින් සිල්වත් වෙයි, පණිවායෙන් දුරු වෙයි, අයිනාදනින් දුරු වෙයි, කාමයෙහි මිසහසරින් දුරු වෙයි, මුසවායෙන් දුරු වෙයි, මද්‍යප්‍රමාදස්ථාන වූ රහමෙරින් දුරු වෙති '' වහන්ස මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමුවෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මවුකුස පිළිසඳ ගනී ද, එකල බෝසත් මව ගේ කාමගුණොපසංහිත සිතෙක් පුරුෂයන් කෙරෙහි නූපදනේ ය, රාගයෙන් රත් සිතැති යම් මැ පුරුෂයකු විසින් බෝසත්මව අනතික්‍රමණීය ද වෙති '' වහන්ස, මම . . . භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුස පිළිසඳ ගනී ද, එකල බෝසත්මව පස්කම්ගුණ ලබනසුලු වෙයි. ඕ පස්කම්ගුණයෙන් සමර්පිත ව සමන්විත ව ඉඳුරන් පිනවති '' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද: ''ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුස පිළිසඳ ගනී ද, එකල බෝසත්මවට කිසිදු ආබාධයෙක් නූපදනේ ය. බෝසත්මව නො කලකුළු කය ඇති ව සුඛිනී වෙයි, බෝසත්මව බෝසතු ද කුසතුළ සිටියහු හැම අඟපසඟ ඇතියහු නුහුනු ඉඳුරන් ඇතියහු දක්නී ය. ආනන්දය, යම්පරිදි ශුභ වූ ජාතිමත් වූ අෂ්ටාංශ වූ මොනොවට පිරියම් කළ වෙරළුම්ණෙක් වේ ද, එහි නිල් වූ හෝ කසාවන් වූ හෝ ලේවන් වූ හෝ සුදු වූ හෝ පඬුවන් වූ හෝ හුයෙක් අවුණන ලද ද, ඇස් ඇති පුරුෂයෙක් තෙල හුය අතෙහි ලා බලා නම් මේ වෙරළුම්ණ ශුභ යැ, ජාතිමත් යැ, අෂ්ටාංශ යැ, සුපරිකර්මකෘත ද වෙයි. එහි නිල්වන් හෝ කසාවන් හෝ ලෙහෙවන් හෝ සුදු වූ හෝ පඬුවන් හෝ මේ හුයෙක් අවුණන ලද ' යි දක්නේ වේ ද, ආනන්දය, එපරිදි මැ යම් කලෙක බෝසත් මව්කුස පිළිසඳ ගනී ද, එකල බෝසත්මවට කිසිදු ආබාධයෙක් නූපදනේ ය. බෝසත්මව ක්ලාන්ත නො වූ කය ඇති ව සුඛිත ව සිටුනී ය. බෝසත්මව බෝසතු ද කුසතුළ සිටියහු අඟපසඟ ඇතියහු නුහුනු ඉඳුරන් ඇතියහු දක්නී යයි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමුවෙහි තෙල අසන ලද, හමුවෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, බෝසතුන් උපන් සත්වනද බෝසත්මව කලුරිය කෙරෙයි, තුසිතයට එළෙඹෙති '' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමුවෙහි තෙල අසන ලද, හමුවෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම්සේ අන්‍ය ස්ත්‍රීහු නවමසක් හෝ දසමසක් හෝ දරුගැබ් කුසින් ධරාසිට ප්‍රසව කෙරෙත් ද, එසේ බෝසත්මව බෝසතුන් ප්‍රසව නො කෙරේ. බෝසත්මව දසමසක් ම බෝසතුන් කුසින් ධරාසිට ප්‍රසව කෙරෙතී.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යථා ඛො පනානන්ද, අඤ්ඤා ඉත්ථිකා නිසින්නා වා නිපන්නා වා විජායන්ති. න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. ඨිතාව ඛො බොධිසත්තං බොධිසත්තමාතා විජායතීති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද. බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, දෙවා නං පඨමං පටිග්ගණ්හන්ති, පච්ඡා මනුස්සාති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති අප්පත්තොව බොධිසත්තො පඨවිං හොති. චත්තාරො නං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතු පුරතො ඨපෙන්ති: 'අත්තමනා දෙවි හොහි, මහෙසක්ඛො තෙ පුත්තො උප්පන්නො'ති. යම්පි භන්තෙ—පෙ—ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදෙව නික්ඛමති අමක්ඛිතො උද්දෙන[1] අමක්ඛිතො සෙම්හෙන, අමක්ඛිතො රුහිරෙන, අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදො. සෙය්‍යථාපි ආනන්ද, මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං, නෙව මණිරතනං කාසිකං වත්ථං මක්ඛෙති. නාපි කාසිකං වත්ථං මණිරතනං මක්ඛෙති. තං කිස්ස හෙතු: උභින්නං සුද්ධත්තා. එවමෙව ඛො ආනන්ද, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදෙව නික්ඛමති අමක්ඛිතො උද්දෙන අමක්ඛිතො සෙම්හෙන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදොති. යම්පි භන්තෙ පෙ- ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති. ද්වෙ උදකස්ස ධාරා අන්තලික්ඛා පාතුභවන්ති එකා සීතස්ස එකා උණ්හස්ස, යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරෙන්ති[2] මාතු චාති. යම්පි භන්තෙ -පෙ- ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: සම්පති ජාතො ආනන්ද, බොධිසත්තො සමෙහි පාදෙහි පඨවියං පතිට්ඨහිත්වා උත්තරාභිමුඛො සත්තපදවීතිහාරෙන ගච්ඡති. සෙතම්හි ඡත්තෙ අනුහීරමානෙ[3] සබ්බා ච දිසා විලොකෙති ආසභිං ච වාචං භාසති: 'අග්ගොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො'ති. යම්පි භන්තෙ -පෙ- ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමි.

---

1 උදෙන - මජසං. 2. කරොති - සයා.

3. {අනුහීරමානෙ - PTS.
{අනුධාරියමානෙ - සීමු, මජසං.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම්සේ සෙසු ස්ත්‍රීහු හුන්නාහු හෝ හොත්තාහු හෝ ප්‍රසව කෙරෙත් ද, එසේ බෝසත්මව බෝසතුන් ප්‍රසව නො කෙරෙයි. බෝසත් මව සිටියා මැ බෝසතුන් ප්‍රසව කෙරෙති '' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් දිනෙක බෝසත් මව්කුසින් නික්මේ ද, එකල දෙව්යෝ පළමු ඔහු පිළිගනිති, පසුව මිනිස්සු පිළිගනිති.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුසින් බිහි වේ ද, එ බෝසත් පොළොවට නො පැමිණියේ මැ වෙයි, සිව්දෙව්පුත්හු ඔහු පිළිගෙන මව පෙරට තබති. දෙවිය, සතොස්වා, මහෙශාක්‍ය පිතෙක් තිට උපනැ '' යි. වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් දිනෙක බෝසත් මව්කුසින් බිහි වේ ද, එකල විශද ව මැ බිහි වෙයි. දියෙන් නො වැකුණේ සෙමෙන් නො වැකුණේ ලෙහෙයෙන් නො වැකුණේ කිසිදු අසුචියෙකින් නො වැකුණේ ශුද්ධ ව විශද ව බිහිවෙයි. ආනන්දය, යම් පරිදි කසීවතෙක බහාලූ මිණිරුවනෙක් වේ ද, ඒ මිණිරුවන කසීවත් නො මකා ද, කසීවත් ද මිණිරුවන නො මකා ද, එ කවර හෙයින යත් : දෙදෙනා ශුද්ධ හෙයින. ආනන්දය, එපරිදි මැ යම් කලෙක බෝසත් මව්කුසින් බිහි වේ ද, විශද ව මැ නික්මෙයි, දියෙන් නො වැකුණේ සෙමෙන් නො වැකුණේ ලෙහෙයෙන් නො වැකුණේ කිසිදු අසුචියෙකින් නො වැකුණේ ශුද්ධ ව විශද ව බිහි වෙති.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මව්කුසින් බිහි වේ ද, එකල දෙ දියදහර කෙනෙක් අහසින් පහළ වෙති. ශීත එකෙක, උෂ්ණ එකෙකැ ' යි. එයින් බෝසත් හට ද, බෝසත්මවට ද දියකිස කෙරෙති.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමියෙහි තෙල අසන ලද, හමියෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, උපන් ඇසිල්ලෙහි බෝසත් සමපාදයෙන් බිමැ සිට උත්තරදිශාභිමුඛ ව සත්පියවරින් යෙයි. සේසත් ධරන කල්හි හැම දික් ඔබැ මොබැ බලයි. අභීත බස් බෙණෙයි, ' මම ලොවට අග්‍රයෙමි, මම ලොවට ශ්‍රෙෂ්ඨයෙමි, මම ලොවට ජ්‍යෙෂ්ඨයෙමි. මේ අන්තිම ජාති යැ, දැන් පුනර්භවයෙක් නැතැ '' යි. වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: යදා ආනන්ද, බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව-මනුස්සාය අප්පමාණො උළාරො ඕභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථපිමෙ චන්දිමසුරියා එවං මහිද්ධිකා එවං මහානුභාවා ආභාය නානුභොන්ති. තත්ථපි අප්පමාණො උළාරො ඕභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං, යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති: අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නාති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පති, සම්පකම්පති, සම්පවෙධති. අප්පමාණො ච උළාරො ඕභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවන්ති. යම්පි භන්තෙ -පෙ- ඉදම්පාහං භන්තෙ, භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමීති.

තස්මාතිහ ත්වං ආනන්ද, ඉදම්පි තථාගතස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙහි. ඉධානන්ද, තථාගතස්ස විදිතා වෙදනා උප්පජ්ජන්ති. විදිතා උපට්ඨහන්ති. විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති -පෙ- විදිතා විතක්කා උප්පජ්ජන්ති. විදිතා උපට්ඨහන්ති. විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. ඉදම්පි ඛො ත්වං ආනන්ද, තථාගතස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙහීති.

යම්පි භන්තෙ, භගවතො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා සඤ්ඤා -පෙ- විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. ඉදම්පාහං භන්තෙ භගවතො අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමීති.

ඉදමවොච ආයස්මා ආනන්දො, සමනුඤ්ඤො සත්ථා අහොසි. අත්තමනා ච තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දුන්ති.

අච්ඡරියබ්භුත සුත්තං තතියං.

වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගේ හමුවෙහි තෙල අසන ලද, හමුවෙහි පිළිගන්නා ලද : '' ආනන්දය, යම් කලෙක බෝසත් මවකුසින් බිහි වේ ද, එකල මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලොකයෙහි ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි දෙවියන් ගේ දෙවානුභාවය ඉක්මැගෙන මැ අප්‍රමාණ උදර අවභාසයෙක් පහළ වෙයි. මෙසේ මහත් ඉදුහ ඇති මහත් අනුභාව ඇති මේ සඳහිරුහු ද එළිය නො කළ හෙන විවෘත වූ අසංවෘත වූ අඳුරු වූ ගනඅඳුරින් වැසුණු යම් ලොකාන්තරික නිරය කෙනෙක් ඇද්ද, එහි දු දෙවියන් ගේ දෙවානුභාව ඉක්මැගෙන මැ අප්‍රමාණ උදර අවභාසයෙක් ලොකයෙහි පහළ වෙයි. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද, ඔහුත් ඒ එළියෙන් උනුන් හැඳින අන්‍ය සත්ත්වයෝත් මෙහි උපන්හ ' යි දනිති. මේ දශසහශ්‍රී ලොකධාතු ද කම්පිත වෙයි, වෙසෙසින් කම්පිත වෙයි, වෙසෙසින් වෙවුළයි, දෙවියන් ගේ දෙවානුභාව ඉක්මැගෙන මැ අප්‍රමාණ උදර අවභාසයෙක් පහළ වෙතී.'' වහන්ස, . . . මම භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරමි.

ආනන්දය, එහෙයින් තෙපි තථාගතයන් ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරව : ' ආනන්දය, තථාගතයන් වහන්සේට ප්‍රකට වූවාහු වෙදනා උපදිති. විදිත ව වටහති, විදිත ව අස්තයට යෙති, විදිත ව සංඥවෝ උපදිති, . . . විදිත ව විතර්කයෝ උපදිති, විදිත ව අස්තයට යෙත්. ආනන්දය තෙපි තථාගතයන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ධරව.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේට විදිත ව වෙදනාවෝ උපදිත් ද, විදිත ව වටහත් ද, විදිත ව අස්තයට යෙත් ද, විදිත ව සංඥවෝ . . . විදිත ව විතර්කයෝ උපදිත් ද, විදිත ව වටහත් ද, විදිත ව අස්තයට යෙත් ද, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ආශ්චර්‍ය්‍ය '' අද්භූත ධර්මය ද ධරමි '' යි සැලකළෝ.

ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ මෙය සැලකළහ : ශාස්තෲන් වහන්සේ අනුදත් සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ භාෂිතය අභිමුඛ ව පිළිගත්හු ය.

**තුන් වැනි අච්ඡරියබ්භූත සූත්‍ර යි.**

# 3. 3. 4

## බක්කුල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා බක්කුලො[1] රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො අචෙලකස්සපො[2] ආයස්මතො බක්කුලස්ස[3] පුරාණගිහිසහායො යෙනායස්මා බක්කුලො[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා බක්කුලෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අචෙලකස්සපො[2] ආයස්මන්තං බක්කුලං එතදවොච:

කීවචිරං පබ්බජිතොසි, ආවුසො බක්කුලාති:

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්සාති.

ඉමෙහි පන තෙ ආවුසො බක්කුල, අසීතියා වස්සෙහි කතික්ඛත්තුං මෙථුනො ධම්මො පතිසෙවිතොති:

න ඛො මං ආවුසො කස්සප, එවං පුච්ඡිතබ්බං: 'ඉමෙහි පන තෙ ආවුසො බක්කුල, අසීතියා වස්සෙහි කතික්ඛත්තුං මෙථුනො ධම්මො පතිසෙවිතො'ති. එවඤ්ච ඛො මං ආවුසො කස්සප, පුච්ඡිතබ්බං: 'ඉමෙහි පන තෙ ආවුසො බක්කුල, අසීතියා වස්සෙහි කතික්ඛත්තුං කාමසඤ්ඤා උප්පන්නපුබ්බා'ති.

ඉමෙහි පන තෙ ආවුසො, බක්කුල, අසීතියා වස්සෙහි කතික්ඛත්තුං කාමසඤ්ඤා උප්පන්නපුබ්බාති.

අසීති මෙ ආවුසො කස්සප, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි කාමසඤ්ඤං උප්පන්නපුබ්බං.

යම්පායස්මා බක්කුලො අසීතියා වස්සෙහි නාභිජානාති කාමසඤ්ඤං උප්පන්නපුබ්බං, ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි බ්‍යාපාදසඤ්ඤං-පෙ-විහිංසාසඤ්ඤං උප්පන්නපුබ්බං.

යම්පායස්මා බක්කුලො අසීතියා වස්සෙහි නාභිජානාති විහිංසාසඤ්ඤං උප්පන්නපුබ්බං, ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි කාමවිතක්කං උප්පන්නපුබ්බං, යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස නාභිජානාමි බ්‍යාපාදවිතක්කං-පෙ-විහිංසාවිතක්කං උප්පන්නපුබ්බං, යම්පායස්මා-පෙ-ධාරෙම.

---

1. බාකුලො - මජසං
2. අචෙලො කස්සපො - සයා.
3. බාකුලස්ස - මජසං.

# 3. 3. 4
# බක්කුල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි ආයුෂ්මත් බක්කුලස්ථවිරයන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වෙළුවනයෙහි වැඩවසන සේක. එසඳ අචෙලකස්සප තුවට ආයුෂ්මත් බක්කුලස්ථවිරයන් වහන්සේ ගේ පැරණි ගිහි යහළුවකු වූයේ ආයුෂ්මත් බක්කුලස්ථවිරයන් වහන්සේ කරා එළැඹිණ. එළැඹ ආයුෂ්මත් බක්කුල තෙරණුවන් හා සමග සතුටු විය. සම්මොදනයට නිසි සිහිකරනට නිසි කථා කොට නිමවා එකත්පස් වැ හිඳ. එකත්පස් වැ හුන් අචෙලකසුබු තුවට ආයුෂ්මත් බක්කුල තෙරණුවන්ට තෙල කී :

ඇවැත්නි, බක්කුලයෙනි, පැවිදි වැ කොතෙක් දිගුකල් ඇතියාව ?

ඇවැත්නි, පැවිදි වන් මට අසූහවුරුද්දෙක.

ඇවැත්නි, බක්කුලයෙනි, තොප විසින් මේ අසූවසින් කෙතෙක් වර මෙවුන්දම් සෙවුනා ලද ද ?

ඇවත කස්බ, ' ඇවැත්නි බක්කුලයෙනි, තොප විසින් මේ අසූවසින් කොතෙක් වර මෙවුන්දම් සෙවුනා ලද ද ' යි මෙසේ මා නො පුළුවුස්නේ යැ, ඇවත කස්බ, '' ඇවත්නි බක්කුලයෙනි, මේ අසූවසින් කොතෙක්වර කාමසංඥ උපන් විරූ ද '' යි මෙසේ මා පුළුවුස්නේ ය.

'' ඇවත්නි බක්කුලයෙනි, මේ අසූවසින් කොතෙක් වර තොපට කාමසංඥ උපන්විරූ ඇද්ද '' යි.

ඇවත කස්බ, පැවිදි වූ මට අසූවසෙක. උපන්විරූ කාමසංඥ සිහි කොට නො දන්මි.

ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අසූවසෙකින් උපන්විරූ කාමසංඥ සිහි කොට නො දනිති ' යි යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. උපන් විරූ ව්‍යාපාදසංඥ . . . විහිංසාසංඥ නො දන්මි.

ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අසූවසෙකින් උපන්විරූ විහිංසාසංඥ නො දනිති ' යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. උපන්විරූ කාමවිතර්ක නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. උපන්විරූ ව්‍යාපාදවිතර්ක . . . විහිංසාවිතර්ක නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි ගහපතිචීවරං සාදිතා. යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති-පෙ-නාභිජානාමි සත්ථෙන චීවරං ඡින්දිතා. යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි සූචියා චීවරං සිබ්බිතා. යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති මෙ-පෙ-නාභිජානාමි රජනෙන චීවරං රජිතා. යම්පායස්මා -පෙ-ධාරෙම.

අසීති-පෙ-නාභිජානාමි කඨිනෙ[1] චීවරං සිබ්බිතා. යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති-පෙ-නාභිජානාමි සබ්‍රහ්මචාරී චීවරකම්මෙ බ්‍යාපාරිතා[2] යම්පායස්මා-පෙ-ධාරෙම.

අසීති මෙ ආවුසො -පෙ- නිමන්තනං සාදිතා. යම්පායස්මා -පෙ-ධාරෙම.

අසීති මෙ -පෙ- නාභිජානාමි එවරූපං චිත්තං උප්පන්නපුබ්බං: අහො-වත මං කොචි නිමන්තෙය්‍යාති. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති -පෙ- නාභිජානාමි අන්තරඝරෙ නිසීදිතා. යම්පායස්මා -පෙ- අන්තරඝරෙ නිසීදිතා. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අසීති —පෙ— නාභිජානාමි අන්තරඝරෙ භුඤ්ජිතා. යම්පායස්මා බක්කුලො අසීතියා වස්සෙහි නාභිජානාති අන්තරඝරෙ භුඤ්ජිතා. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි මාතුගාමස්ස අනුබ්‍යඤ්ජනසො නිමිත්තං ගහෙතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො -පෙ- මාතුගාමස්ස ධම්මං දෙසිතා, අන්තමසො චතුප්පදම්පි ගාථං. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි භික්ඛුණූපස්සයං උපසඞ්කමිතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි භික්ඛුණියා ධම්මං දෙසිතා -පෙ- නාභිජානාමි සික්ඛමානාය ධම්මං දෙසිතා. -පෙ- නාභිජානාමි සාමණෙරියා ධම්මං දෙසිතා. යම්පායස්මා බක්කුලො අසීතියා වස්සෙහි නාභිජානාති සාමණෙරියා ධම්මං දෙසිතා. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි පබ්බාජෙතා -පෙ- නාභිජානාමි උපසම්පාදෙතා -පෙ- නාභිජානාමි නිස්සයං දාතා -පෙ- නාභිජානාමි සාමණෙරං උපට්ඨාපෙතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

---

1. කථිනෙ - මජසං.
2. සබ්‍රහ්මචාරීනං චීවරකම්මෙ විචාරිතා - මජසං, ස්‍යා.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. ගෘහැවි සිවුරු ඉවසූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි . . . අසූවසෙක. ශස්ත්‍රයෙන් සිවුරුපිළි සිඳෑලූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. හිදින් සිවුරු මැසූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. රඳනින් සිවුරු රැඳූයෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ, . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. කඨිනයෙහිලා සිවුරු මැසූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. සබ්‍රම්සරහු සිවුරුකම්හි මෙහෙයූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. නිමන්ත්‍රණ ඉවසූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. යමෙක් මා නිමන්ත්‍රණ කළේ නම් මැනැවැ ' යි මෙබඳු සිතක් උපන්විරූ නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. අන්තරඝරයෙහි හුන්නෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අන්තරඝරයෙහි හුන්නා නො දනිති යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. අන්තරඝරයෙහි වැළඳූයෙම් නො දන්මි, ' ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අසූවසෙකින් අන්තරඝරයෙහි වැළඳූවාහු නො දනිති ' යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. අනුව්‍යඤ්ජන වශයෙන් මාගමක ගේ නිමිති ගත්තෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, . . . අසූවසෙක. මාගමකට යටතින් සිව්පැදි ගයක් පමණකුදු දහමක් දෙසූයෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවත්නි, පැවිදි වූ මට අසූවසෙක. මෙහෙණවරකට ගියෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. මෙහෙණකට දහම් දෙසූයෙම් නො දන්මි, . . . සික්ඛමානාවකට දහම් දෙසූයෙම් නො දන්මි, . . . හෙරණියකට දහම් දෙසූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අසූවසෙකින් හෙරණියකට දහම් දෙසූවාහු නො දනිති ' යි යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. පැවිදි කරවූයෙම් නො දන්මි, . . . උපසපන් කරවූයෙම් නො දන්මි, . . . නිස දුන්නෙම් නො දන්මි, . . . හෙරණකු ලවා උවටන් කරවූයෙම් නො දන්මි. ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි ජන්තාඝරෙ නහායිතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි චුණ්ණෙන නහායිතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි සබ්‍රහ්මචාරී ගත්තපරිකම්මෙ ව්‍යාපාරිතා[1] යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි ආබාධං උප්පන්නපුබ්බං අන්තමසො ගද්දුහනමත්තම්පි. යම්පායස්මා —පෙ— ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි භෙසජ්ජං පරිහරිතා[2] අන්තමසො හරීතකීඛණ්ඩම්පි. යම්පායස්මා -පෙ- ධාරෙම

අසීති මෙ ආවුසො වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි අපස්සෙනකං අපස්සෙතා[3] යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි සෙය්‍යං කප්පෙතා. යම්පායස්මා -පෙ- ධාරෙම.

අසීති මෙ ආවුසො, වස්සානි පබ්බජිතස්ස, නාභිජානාමි ගාමන්තසෙනාසනෙ වස්සං උපගන්තා. යම්පායස්මා බක්කුලො අසීතියා වස්සෙහි නාභිජානාති ගාමන්තසෙනාසනෙ වස්සං උපගන්තා. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

සත්තාහමෙව ඛො අහං ආවුසො, සරණො රට්ඨපිණ්ඩං භුඤ්ජිං. අථ අට්ඨමියං අඤ්ඤා උදපාදි. යම්පායස්මා බක්කුලො සත්තාහමෙව සරණො රට්ඨපිණ්ඩං භුඤ්ජි, අථ අට්ඨමියං අඤ්ඤා උදපාදි. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

ලභෙය්‍යාහං ආවුසො බක්කුල, ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො අචෙලකස්සපො ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා කස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරෝ ඛො පනායස්මා කස්සපො අරහතං අහොසි.

1. විචාරිතා - මජ්ඣසං. 2. උපහරිතා - මජ්ඣසං.
3. අපස්සයිතා - සීමු, මජ්ඣසං.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. ගිනිහල්ගෙහි ස්නානය කෙළෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. (කොසඹආදි) සුණුයෙන් ස්නානය කෙළෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. සබ්‍රම්සරුන් සිරුරුපිරියම්හි යෙදවූයෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. යටත්පිරිසෙයින් දෙනක තනයෙන් කිරිපිහිරක් දෝනා කල්මතු දු ආබාධයක් උපන්විරූ නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. යටත් පිරිසෙයින් අරළුකඩකුදු බෙහෙදක් පරිහරණය කෙළෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. අපශ්‍රයණයෙක පිට එළවූයෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. ශයනය කෙළෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ . . . ධරම්හ.

ඇවැත්නි, පැවිදි වූ මට අසූවසෙක. ග්‍රාමාන්ත සෙනස්නෙහි වස් එළැඹියෙම් නො දන්මි, ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ අසූවසෙකින් ග්‍රාමාන්තශයනාසනයෙක්හි වස් එළැඹියාහු නො දනිති යන මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඇවැත්නි, මම් සතියක් මතු සක්ලේශ වැ රටවැසියා දුන් පිණ්ඩපාතය වැළඳුයෙමි. යළි අටවන දවස් අර්හත්වය උපන. '' ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ සතියක් මතු සක්ලේශ වැ රටවැසියා දුන් පිණ්ඩපාතය වැළැඳු සේක, යළි අටවන දවස් රහත්බව උපන '' යන යම් කරුණෙක් ඇද්ද, මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

'' ඇවැත්නි බක්කුලයෙනි, මම මේ ශාසනයෙහි පැවිද්ද ලබම්වා, උපසපුව ලබම්ව '' යි කීය.

අචෙල කසුබු මෙ සස්නෙහි පැවිදි ලද, උපසපු ලද. යළි ආයුෂ්මත් කසුබු උපසපන් නොබෝකල් ඇතියේ එකලා වූයේ ගණයා කෙරෙන් වෙන් වූයේ නො පමා වූයේ කෙලෙස් තවන වැර ඇතියේ නිවනට මෙහෙයූ සිතැති ව වසනුයේ නො බෝකලෙකින් ම යම් අර්හත්ත්වයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්මැ පැවිදි වෙත් ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍ය අවසන් කොට ඇති ඒ අනුත්තර අර්හත්ඵලය දිටුධැම්යෙහි මැ තමා විසින් මැ ප්‍රඥයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කළේ ය. ජාති ක්ෂය වූ යැ, මහබඹසර වැසනිමවන ලද, සිව්මඟ කරණී කොට නිමවන ලද, ඉත්ථම්භාවය පිණිස කටයුතු අනෙකෙක් නැතැයි මොනොවට දැනගති. ආයුෂ්මත් කසුබු තෙරණුවෝ රහතුන් කෙරෙහි අන්‍යතර කෙනෙක් වූහ.

අථ ඛො ආයස්මා බක්කුලො අපරෙන සමයෙන අපාපුරණං[1] ආදාය විහාරෙන විහාරං උපසඞ්කමිත්වා එවමාහ : 'අභික්කමථායස්මන්තො, අභික්කමථායස්මන්තො, අජ්ජ මෙ පරිනිබ්බානං භවිස්සතී'ති.

යම්පායස්මා බක්කුලො අපාපුරණං[1] ආදාය විහාරෙන විහාරං උපසඞ්කමිත්වා එවමාහ : 'අභික්කමථායස්මන්තො, අභික්කමථායස්මන්තො, අජ්ජ මෙ පරිනිබ්බානං භවිස්සතී'ති. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙම.

අථ ඛො ආයස්මා බක්කුලො මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නකොව පරිනිබ්බායි.

යම්පායස්මා බක්කුලො මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නකොව පරිනිබ්බායි. ඉදම්පි මයං ආයස්මතො බක්කුලස්ස අච්ඡරියං අබ්භුතධම්මං ධාරෙමාති.

බක්කුලසුත්තං චතුත්ථං.

---

1. අවාපුරණං - මජසං.

ඉක්බිති ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ මැත භාගයෙහි කෙයි යතුරු ගෙන විහාරයෙන් විහාරයට එළැඹ මෙසේ කීහ : '' ආයුෂ්මත්නි, නික්මෙව, ආයුෂ්මත්නි, නික්මෙව, අද මා ගේ පිරිනිවන වන්නේ ය '' යි.

ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ කෙයි යතුරු ගෙන විහාරයෙන් විහාරයට එළැඹ මෙසේ කීහ : '' නික්මෙව ආයුෂ්මත්නි, නික්මෙව ආයුෂ්මත්නි, අද මා ගේ පිරිනිවන වන්නේ ය '' යන යම් කරුණෙක් ඇද්ද, මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම්හ.

ඉක්බිති ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ භික්ෂුසංඝයා වහන්සේ මැද හුන්නාහු මැ පිරිනිවි සේක.

ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ භික්ෂුසංඝයා වහන්සේ මැද වැඩහුන්නාහු මැ පිරිනිවි සේක යන යමක් ඇද්ද, මෙ ද අපි ආයුෂ්මත් බක්කුල තෙරණුවන් ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම යයි ධරම් හ ' යි.

**සතරවැනි බක්කුල සූත්‍ර යි.**

---

# 3. 3. 5

# දන්තභූමි සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන අචිරවතො සමණුද්දෙසො අරඤ්ඤකුටිකායං විහරති. අථ ඛො ජයසෙනො රාජකුමාරො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන අචිරවතො සමණුද්දෙසො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අචිරවතෙන සමණුද්දෙසෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජයසෙනො රාජකුමාරො අචිරවතං සමණුද්දෙසං එතදවොච: සුතං මෙතං භො අග්ගිවෙස්සන, ඉධ භික්ඛු අප්පමත්තො ආතාපි පහිතත්තො විහරන්තො ඵුසෙය්‍ය චිත්තස්ස එකග්ගත'න්ති.

එවමෙතං රාජකුමාර, එවමෙතං රාජකුමාර, ඉධ භික්ඛු අප්පමත්තො ආතාපි පහිතත්තො විහරන්තො ඵුසෙය්‍ය චිත්තස්ස එකග්ගතන්ති.

සාධු මෙ භවං අග්ගිවෙස්සනො යථාසුතං යථාපරියත්තං ධම්මං දෙසෙතූති.

න ඛො තෙ අහං රාජකුමාර, සක්කොමි යථාසුතං යථාපරියත්තං ධම්මං දෙසෙතුං. අහං චරහි[1] තෙ රාජ කුමාර, යථාසුතං යථාපරියත්තං ධම්මං දෙසෙය්‍යං, ත්වඤ්ච මෙ භාසිතස්ස අත්ථං න ආජානෙය්‍යාසි. සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසාති.

දෙසෙතු මෙ භවං අග්ගිවෙස්සනො යථාසුතං යථාපරියත්තං ධම්මං, අප්පෙවනාමාහං භොතො අග්ගිවෙස්සනස්ස භාසිතස්ස අත්ථං ආජානෙය්‍යන්ති.

දෙසෙය්‍යං ඛො තෙ අහං රාජකුමාර, යථාසුතං යථාපරියත්තං ධම්මං, සචෙ මෙ ත්වං භාසිතස්ස අත්ථං ආජානෙය්‍යාසි ඉච්චෙතං කුසලං. නො චෙ මෙ ත්වං භාසිතස්ස අත්ථං ආජානෙය්‍යාසි. යථා සකෙ තිට්ඨෙය්‍යාසි න මං තත්ථ උත්තරිං පටිපුච්ඡෙය්‍යාසීති.

දෙසෙතු මෙ භවං අග්ගිවෙස්සනො යථාසුතං යථාපරියත්තං ධම්මං. සචෙ අහං භොතො අග්ගිවෙස්සනස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමි. ඉච්චෙතං කුසලං, නො චෙ අහං භොතො අග්ගිවෙස්සනස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමි. යථා සකෙ තිට්ඨිස්සාමි. නාහං තත්ථ භවන්තං අග්ගිවෙස්සනං උත්තරිං පටිපුච්ඡිස්සාමීති

අථ ඛො අචිරවතො සමණුද්දෙසො ජයසෙනස්ස රාජකුමාරස්ස යථාසුතං යථාපරියත්තං ධම්මං දෙසෙසි. එවං වුත්තෙ ජයසෙනො රාජකුමාරො අචිරවතං සමණුද්දෙසං එතදවොච: 'අට්ඨානමෙතං භො අග්ගිවෙස්සන, අනවකාසො, යං භික්ඛු අප්පමත්තො ආතාපි පහිතත්තො විහරන්තො ඵුසෙය්‍ය චිත්තස්ස එකග්ගත'න්ති. අථ ඛො ජයසෙනො රාජකුමාරො අචිරවතස්ස සමණුද්දෙසස්ස අට්ඨානතඤ්ච අනවකාසතඤ්ච පවෙදෙත්වා උට්ඨායාසනා පක්කාමි.

---

1. අහඤ්ච හි - සීමු, මජසං.

# 3. 3. 5
# දන්තභූමි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දක නිවාප නම් වූ වේළුවනයෙහි වැඩවසන සේක. තව ද එසමයෙහි අචිරවත සමණුද්දෙස අරණ්‍යකුටිකායෙක්හි වෙසෙයි. එකල්හි ජයසෙන රාජකුමාර ජංඝාවිහරණයෙන් ඔබැ මොබැ හැසිරෙනුයේ අචිරවත සමණුද්දේස යම් තැනෙක්හි ද එතැන්හි එළැඹියේ ය. එළැඹ අචිරවත සමණුද්දෙසයන් සමග සතුටු විය, සතුටු විය යුතු සිහි කරන්නට නිසි කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ජයසෙන රාජකුමාර අචිරවත සමණුද්දෙසයනට තෙල කී : '' භවත ගිනිවෙස්න, මෙ සස්නෙහි මහණ අප්‍රමත්ත වැ ආතාපන වීර්‍ය්‍ය ඇති වැ ප්‍රහිතාත්ම වැ වසනුයේ චිත්තෛකාග්‍රතා ලබන්නේ ය යන මෙ කරුණ මා විසින් අසන ලද යි.

රාජ කුමාරය, තෙල එ සේ මැය, රාජ කුමාරය, තෙල එසේ මැය. මෙ සස්නෙහි මහණ අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරනුයේ චිත්තෛකාග්‍රතා ලබන්නේ යයි ඇසූ සේකි.

භවත් ගිනිවෙස්න, ඇසූ පරිදි පුහුණු කළ පරිදි මට දහම් දෙසාවයි අයැද සිටිමි.

රාජ කුමාරය, මම තොපට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙසන්නට නො හැකියෙමි. රාජ කුමාරය, මම තොපට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙසන්නෙම් නම් තෙපි ද මබස අරුත් අවබොධ නො කරන්නහු නම් ඒ මට කායක්ලමථුයෙක් වෙයි, ඒ මට විහිංසායෙක් වෙයි.

භවත් අග්ගිවෙස්සනයෝ මට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙසත්වා. මම භවත් අග්ගිවෙස්සනයන් ගේ කී අරුත් නුවණින් දන්නෙම් නම් මනා මැ නු.

රාජ කුමාරය, මම තොපට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙසමි. ඉදින් තෙපි මබස අරුත් නුවණින් දැනගන්නහු නම් තෙල මැනැව, ඉදින් තෙපි මබස අරුත් දැන නො ගන්නහු නම් තමා නො දන්නා තන්හි මැ සිටුහු නම්, එහි ලා මතුයෙහි මා නුපුළුවුස් නා බව යයි.

භවත් අග්නිවෙස්සනයෝ මට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙසත්වා, ඉදින් මම භවත් අග්ගිවෙස්සනයන්ගේ බස අරුත් නුවණින් දන්නෙම් නම්, මෙසේ මේ මැනව, ඉදින් මම භවත් අග්ගවෙස්සනයන් ගේ බස අරුත් නුවණින් නො දන්නෙම් නම් තමන් සතු නො දන්නා තන්හි මැ සිටිම් නම් එහි දී භවත් අග්ගිවෙස්සනයන් මතුයෙහි නො පුළුවුස්මි'යි.

එසඳ අචිරවත හෙරණ ජයසෙන රජකුමරහට ඇසූ පරිදි පුහුණු කළ පරිදි දහම් දෙයි. මෙසේ දෙසූ කල ජයසෙන රජකුමර අචිරවත හෙරණහට තෙල කී : '' භවත් ගිනිවෙස්න, මහණ නොපමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසනුයේ චිත්තෛකාග්‍රතා ලබා යන යමෙක් ඇද්ද, තෙල නො වන්නෙකි. වන්නට අවකාශ ද නැති. එ සඳ ජයසෙන රජකුමර අචිරවත හෙරණ හට අස්ථානතා ද අනවකාසතා ද පවසා හුනස්නෙන් නැගී ගියේ.

අථ ඛො අචිරවතො සමණුද්දෙසො අචිරපක්කන්තෙ ජයසෙනෙ රාජකුමාරෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අචිරවතො සමණුද්දෙසො යාවතකො අහොසි ජයසෙනෙන රාජකුමාරෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

එවං වුත්තෙ භගවා අචිරවතං සමණුද්දෙසං එතදවොච: 'තං කුතෙත්ථ අග්ගිවෙස්සන, ලබ්භා යං තං නෙක්ඛම්මෙන ඤාතබ්බං, නෙක්ඛම්මෙන දට්ඨබ්බං, නෙක්ඛම්මෙන පත්තබ්බං, නෙක්ඛම්මෙන සච්ඡිකාතබ්බං, තං වත ජයසෙනො රාජකුමාරො කාමමජ්ඣෙ වසන්තො කාමෙ පරිභුඤ්ජන්තො කාමවිතක්කෙහි ඛජ්ජමානො කාමපරිළාහෙන පරිඩය්හ-මානො කාමපරියෙසනාය උස්සුක්කො[1] ඤස්සති වා දක්ඛිති වා සච්ඡි වා කරිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපිස්සු අග්ගිවෙස්සන, ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතා, ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා අදන්තා අවිනීතා. තං කිං මඤ්ඤසි අග්ගිවෙස්සන, යෙ තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතා, අපි නු තෙ දන්තාව දන්තකාරණං ගච්ඡෙය්‍යුං, දන්තාව දන්තභූමිං සම්පාපුණෙය්‍යුන්ති:

එවං භන්තෙ.

යෙ පන තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා අදන්තා අවිනීතා, අපි නු තෙ අදන්තාව දන්තකාරණං ගච්ඡෙය්‍යුං. අදන්තාව දන්තභූමිං සම්පාපුණෙය්‍යුං. සෙය්‍යථාපි තෙ ද්වෙ හත්ථිදම්මා වා අස්සදම්මා වා ගොදම්මා වා සුදන්තා සුවිනීතාති:

නො හෙතං භන්තෙ.

එවමෙව ඛො අග්ගිවෙස්සන, යං තං නෙක්ඛම්මෙන ඤාතබ්බං නෙක්ඛම්මෙන දට්ඨබ්බං නෙක්ඛම්මෙන පත්තබ්බං නෙක්ඛම්මෙන සච්ඡිකාතබ්බං, තං වත ජයසෙනො රාජකුමාරො කාමමජ්ඣෙ වසන්තො කාමෙ පරිභුඤ්ජන්තො කාමවිතක්කෙහි ඛජ්ජමානො කාමපරිළාහෙන පරිඩය්හමානො කාමපරියෙසනාය උස්සුක්කො ඤස්සති වා දක්ඛිති වා සච්ඡි වා කරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සෙය්‍යථාපි අග්ගිවෙස්සන, ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහාපබ්බතො, තමෙනං ද්වෙ සහායකා තම්හා ගාමා වා නිගමා වා නික්ඛමිත්වා හත්ථවිලඞ්ඝකෙන යෙන සො පබ්බතො, තෙනුපසඞ්කමෙය්‍යුං. උපසඞ්කමිත්වා එකො සහායකො හෙට්ඨා පබ්බතපාදෙ තිට්ඨෙය්‍ය. එකො සහායකො උපරිපබ්බතං ආරොහෙය්‍ය. තමෙනං හෙට්ඨා පබ්බතපාදෙ ඨිතො සහායකො උපරිපබ්බතෙ ඨිතං සහායකං එවං වදෙය්‍ය: 'යං සම්ම කිං ත්වං පස්සසි උපරිපබ්බතෙ ඨිතො'ති: සො එවං වදෙය්‍ය: 'පස්සාමි

1. උස්සුකො - මජසං.

එසඳ අචිරවත හෙරණ ජයසෙන රජකුමරු නැඟී යන්නා හා මැ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස් වැ හින. එකත් පස් වැ හුන් අචිරවත හෙරණ ජයසෙන රජකුමරු හා යම් පමණ කථා සංලාපයෙක් වී ද, එ හැම භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේ.

මෙසේ සැල කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ අචිරවත හෙරණ හට තෙල වදළ සේක: '' ගිනිවෙස්න, යම් දහමෙක් කාමයෙන් නික්මැ යැමෙන් දත යුතු වේ ද නික්මීමෙන්, දක්ක යුතු වේ ද, නික්මීමෙන් ලැබිය යුතු වේ ද, නික්මීමෙන් පසක්කළ යුතු වේද, ඒ දහම මෙහි ලා කොයින් ලැබේ ද ? ජයසෙන රජකුමර දෙවැදෑරුම් කාමමධ්‍යයෙහි වසනුයේ කාමයන් වළඳ කරනුයේ කාම විතර්කයන් විසින් කනු ලබනුයේ කාමපරිදහයෙන් දවෙනු යේ කාමපයෝෂණයෙහි උත්සුක වූයේ එකාන්තයෙන් ඒ දහම දන්නේ වේව'යි දක්නේ වේව යි පසක් කරනුයේ වේව'යි යන තෙල කරුණ නො වෙයි. ගිනිවෙස්න, යම් පරිදි හස්තිදම්‍යයෝ දෙදෙනෙක් හෝ අශ්වදම්‍යයෝ දෙදෙනෙක් හෝ ගොදම්‍යයෝ දෙදෙනෙක් හෝ සුදාන්ත වූවාහු සුවිනීත වූවාහු ඇද්ද, හස්තිදම්‍යයෝ දෙදෙනෙක් හෝ අශ්වදම්‍යයෝ දෙදෙනෙක් හෝ ගොදම්‍යයෝ දෙදෙනෙක් හෝ අදාන්ත වූවාහු අවිනීත වූවාහු ඇද්ද, ගිනිවෙස්න, ඒ කෙසේ හඟිහි, සුදන්ත වූ සුවිනීත වූ යම් හස්තිදම්‍යයෝ දෙදෙනෙක් හෝ අශ්වදම්‍යයෝ දෙදෙනෙක් හෝ ගෝදම්‍යයෝ දෙදෙනෙක් හෝ ඇද්ද, ඔහු දමුණා හු මැ දන්තකාරණයට යන්නා හු නො වේ ද ? දමුණාහු මැ දන්ත කාරණයට දන්තභූමියට යන්නාහු නො වේ ද ?

වහන්ස, එසේ යැ.

යම් ඒ හස්තිදම්‍යයෝ දෙදෙනෙක් හෝ අශ්වදම්‍යයෝ දෙදෙනෙක් හෝ ගොදම්‍යයෝ දෙදෙනෙක් හෝ අදන්ත වූවාහු අවිනීත වූවාහු ඇද්ද, ඔහු අදන්ත වැ මැ සිට සුදන්ත සුවිනීත වූ ඒ හස්තිදම්‍යයන් දෙදෙනා සෙයින් අශ්වදම්‍යයන් දෙදෙනා සෙයින් ගොදම්‍යයන් දෙදෙනාසෙයින් දන්ත කාරණයට යන්නාහු වේ ද, අදන්ත ව මැ සිට දන්ත කාරණයට යන්නාහු වේ ද ?

වහන්ස, තෙල නො වන්නේ මැ යි.

ගිනිවෙස් න, එපරිදි මැ යම් දහමෙක් නික්මීමෙන් දත යුතු වේ ද නික්මීමෙන් දක්ක යුතු වේ ද, නික්මීමෙන් ලැබිය යුතු වේ ද, නික්මීමෙන් පසක් කළ යුතු වේ ද, ජයසෙන රජ කුමර කාම මධ්‍යයෙහි වසනුයේ කාමයන් වළඳ කරනුයේ කාම විතර්කයන් විසින් කනු ලබනුයේ කාමපරිදහයෙන් දවෙනුයේ කාමපයෝෂණයෙහි උත්සුක වූයේ එකැතින් ඒ දහම දන්නේ වේව'යි දක්නේ වේව'යි පසක් කරනුයේ වේව'යි යන තෙල කරුණ නො වේ.

ගිනිවෙස්න, යම් පරිදි ගමකට හෝ නිගමයකට හෝ නුදුරෙහි මහාපර්වතයෙක් වේ ද, යහළුවෝ දෙදෙනෙක් ඒ ගමින් හෝ නියම් ගමින් හෝ නික්මැ අතිනත් ගෙන ඒ පර්වතය යම් තැනෙක් හි ද එහි එළැඹෙන්නාහු ය. එළඹැ එක් යහළුවෙක් යට පවුපාත්හි සිටිනේ ය. එක් යහළුවෙක් පර්වත මස්තකයට නඟින්නේ ය. යට පවුපාත්හි සිටි යහළු පර්වත මස්තකයෙහි සිටි යහළුහට මෙසේ කියන්නේ ය : යහළුව, තෙපි ගල් මුදුන්හි සිටියහු කුමක් දක්නා ව'යි. හේ මෙසේ කියන්නේ ය : 'යහළුව මම් ගල් මුදුන්හි සිටියෙම් රමණී අරම් රමණී වන රමණී බිම් පෙදෙස් රමණී පොකුණු දක්මි'යි. හේ මෙසේ කියන්නේ ය : 'යහළු, යම් හෙයෙකින් තෙපි උපරි පර්වතයෙහි සිටියහු රමණී අරම් රමණී වන රමණී බිම්පෙදෙස් රමණී පොකුණු දක්නහු නම් තෙල අස්ථාන යැ අනවකාශ ය'යි. එසඳ පර්වත මස්තකයෙහි සිටි යහළු යට පවුපාතට බැස ඒ යහළුවා අත ගෙන උපරි පර්වතයට නඟා මොහොතක් අස්වසා මෙසේ කියන්නේ ය : යහළු, තෙපි උපරි පර්වත යෙහි සිටියහු කුමක් දක්නාව,යි හේ මෙසේ කියන්නේ ය : 'යහළු, මම් උපරි පර්වතයෙහි

ඛො අහං සම්ම, උපරි පබ්බතෙ ඨිතො ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. සො එවං වදෙය්‍ය: අට්ඨානං ඛො එතං සම්ම, අනවකාසො යං ත්වං උපරිපබ්බතෙ ඨිතො පස්සෙය්‍යාසි ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. තමෙනං උපරිපබ්බතෙ ඨිතො සහායකො හෙට්ඨිමපබ්බතපාදං ඔරොහිත්වා තං සහායකං බාහායං ගහෙත්වා උපරිපබ්බතං ආරොපෙත්වා මුහුත්තං අස්සාසෙත්වා එවං වදෙය්‍ය: 'යං සම්ම කිං ත්වං පස්සසි උපරිපබ්බතෙ ඨිතොති. සො එවං වදෙය්‍ය: 'පස්සාමි ඛො අහං සම්ම, උපරිපබ්බතෙ ඨිතො ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. සො එවං වදෙය්‍ය: 'ඉදානෙව ඛො තෙ සම්ම, භාසිතං: 'මයං එවං ආජානාම: අට්ඨානං ඛො එතං සම්ම, අනවකාසො යං ත්වං උපරිපබ්බතෙ ඨිතො පස්සෙය්‍යාසි ආරාමරාමණෙය්‍යකං -පෙ- පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. ඉදානෙව ච පන තෙ භාසිතං: 'මයං එවං ආජානාම: පස්සාමි ඛො අහං සම්ම, උපරිපබ්බතෙ ඨිතො ආරාමරාමණෙය්‍යකං -පෙ- පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. සො එවං වදෙය්‍ය: තථා හි පනාහං සම්ම, ඉමිනා මහතා පබ්බතෙන ආවුතො දට්ඨෙය්‍යං නාද්දසන්ති.

එවමෙව ඛො අතො මහන්තතරෙන ඛො අග්ගිවෙස්සන, අවිජ්ජාඛන්ධෙන ජයසෙනො රාජකුමාරො ආවුතො[1] නිවුතො ඔවුතො, පරියොනද්ධො. සො වත යං තං නෙක්ඛම්මෙන ඤාතබ්බං, නෙක්ඛම්මෙන දට්ඨබ්බං, නෙක්ඛම්මෙන පත්තබ්බං, නෙක්ඛම්මෙන සච්ඡිකාතබ්බං, තං වත ජයසෙනො රාජකුමාරො කාමමජ්ඣෙ වසන්තො කාමෙ පරිභුඤ්ජන්තො කාමවිතක්කෙහි ඛජ්ජමානො කාමපරිළාහෙන පරිඩය්හමානො කාමපරියෙසනාය උස්සුක්කො ඤස්සති වා දක්ඛිති වා සච්ඡි වා කරිස්සතීති නෙතං ඨානං විජ්ජති. සචෙ ඛො තං අග්ගිවෙස්සන, ජයසෙනස්ස රාජකුමාරස්ස ඉමා ද්වෙ උපමා පටිභාසෙය්‍යුං අනච්ඡරියං තෙ ජයසෙනො රාජකුමාරො පසීදෙය්‍ය: පසන්නො ච තෙ පසන්නාකාරං කරෙය්‍යාති.

කුතො පන මං භන්තෙ, ජයසෙනස්ස රාජකුමාරස්ස ඉමා ද්වෙ උපමා පටිභාසිස්සන්ති අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා. සෙය්‍යථාපි භගවන්තන්ති.

සෙය්‍යථාපි අග්ගිවෙස්සන, රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නාගවනිකං ආමන්තෙති: එහි ත්වං සම්ම නාගවනික, රඤ්ඤො නාගං අභිරුහිත්වා නාගවනං පවිසිත්වා ආරඤ්ඤකං නාගං අතිපස්සිත්වා රඤ්ඤො නාගස්ස ගීවාය[2] උපනිබන්ධාහීති. එවං දෙවාති ඛො අග්ගිවෙස්සන, නාගවනිකො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස පටිස්සුත්වා රඤ්ඤො නාගං අභිරුහිත්වා නාගවනං පවිසිත්වා ආරඤ්ඤකං නාගං අතිපස්සිත්වා රඤ්ඤො නාගස්ස ගීවාය[2] උපනිබන්ධති. තමෙනං රඤ්ඤො නාගො අබ්භොකාසං නීහරති. එත්තාවතා ච ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො අබ්භොකාසං ගතො හොති. එත්ථ ගෙධා හි අග්ගිවෙස්සන, ආරඤ්ඤකා නාගා යදිදං නාගවනං, තමෙනං නාගවනිකො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ආරොචෙති ; අබ්භොකාසගතො ඛො දෙව, ආරඤ්ඤකො නාගොති.

1. ඔවුටො - මජසං. 2. ගීවායං - සීමු, මජසං.

සිටියෙම් රමණී අරම් රමණී වන රමණී බිම් පෙදෙස් රමණී පොකුණු දක්මි'යි. හේ මෙසේ කියන්නේ ය : යහළු මෙවිටැ මැ තොප විසින් කියන ලද : '' ඇපි මෙසේ දනුම් හ ; යහළු යම් හෙයෙකින් තෙපි උපරි පර්වතයෙහි සිටියහු රමණී අරම්......රමණී පොකුණු දක්නහු ද, තෙල අස්ථාන යැ, අනවකාශ ය යි. තව ද යළි මෙවිට මැ තොප විසින් කියන ලද : ඇපි මෙසේ දනුම් හ : යහළු මම් ගල්මුදුන්හි සිටියෙම් රමණී අරම් ... රමණී පොකුණු දක්මි'යි. හේ මෙසේ කියන්නේ ය : ඒ එසේ මැ යැ. යහළු, මම් මේ මහාපර්වතයෙන් අවුරන ලදුයෙම් දක්ක යුතු දෑ නො දිටි මි'යි.

එසෙයින් ම ගිනිවෙස්න, තෙල මහාපර්වතයට වඩා ඉතා මහත් වූ අවිද්‍යාස්කන්ධයෙන් ජයසෙන රජකුමර අවුරන ලද වළහන ලද වෙලන ලද හාත්පසින් බඳනා ලදි. හේ ඒකාන්තයෙන් කාමයෙන් නික් මැ යැමෙන් දත යුතු නික්මීමෙන් දක්ක යුතු නික්මීමෙන් පැමිණිය යුතු නික්මීමෙන් පසක්කළ යුතු යම් චිත්තෛකාග්‍රතා ධර්මයෙක් ඇද්ද, ජයසෙන රජකුමර වත්කම් කෙලෙස්කම් මැද වසනුයේ කාමයන් වළඳනුයේ කාමවිතර්කයන් විසින්, කනු ලබනුයේ කාමපරිදාහයෙන් දැවෙනුයේ කාමපර්යේෂණයෙහි උත්සුක වූයේ ඒකාන්තයෙන් ඒ දහම දන්නේ යැ හෝ දක්නේ යැ හෝ පසක් කරන්නේ යැ හෝ යන තෙල කරුණ නො වන්නේ ය. ඉදින් ගිනිවෙස්න, ජයසෙන රජකුමර හට මේ උපමාවෝ දෙදෙන තා ලකුණු කොට හෙළි වෙත් නම් තොපට ජයසෙන රජකුමර පහදින්නේ ය යනුදු ප්‍රසන්න ව තොපට සත්කාර කරන්නේ ය යනුදු අසිරි නො වේ.

වහන්ස, භාග්‍යවතුන්වහන්සේ ලකුණු කොට හෙලි වන්නා සෙයින් කෙසේ නම් මා ලකුණු කොට ජයසේන රජකුමරහට පුනපුනා අසිරියට නිසි වූ පෙර නො ඇසූවිරූ මේ උභය උපමාවෝ හෙලි වෙත් ද.

ගිනිවෙස්න, යම් පරිදි මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජ නාගවනික හස්තිගොපයක්හු අමතාද '' සගය, නාගවනිකය, තෝ එ රජු ගේ ඇතු නැඟී නාගවනයට වැද අරන්වැසි නාගයකු සොයා බලා රජු සතු නාගයාගේ ගෙලෙහි ලා බඳනේ යයි. ගිනිවෙස්න, නාගවනිකයා මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජ හට එසේ යැ දෙවයෙනි, පිළිවදන් දී රජුගේ ඇතු නැඟී නාග වනයට වැද අරන්වැසි නාගයකු සොයා බලා රාජනාගයාගේ ගෙලෙහි බඳනේ ය. රාජනාගයා තෙල ඇතු එළියට නෙරනේ වෙයි. ගිනිවෙස්න, මෙතෙකිනුදු ආරණ්‍යක නාගයා අභ්‍යවකාශ ගත වූයේ වෙයි. ගිනිවෙස්න, යම් නාගවනයෙක් ඇද්ද, ආරණ්‍යක නාගයෝ එහි පැවැති ගෙධ ඇත්තා හු ම ය. නාගවනිකයා මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජ හට දෙවයිනි, ආරණ්‍යක නාගයා එළියට අළැයි සැල කරන්නේ ය.

අථ ඛො අග්ගිවෙස්සන තමෙනං රාජා ඛත්තියො මුද්ධාවසිත්තො හත්ථිදමකං ආමන්තෙසි: එහි ත්වං සම්ම හත්ථිදමක, ආරඤ්ඤකං නාගං දමයාහි ආරඤ්ඤකානඤ්චෙව සීලානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව සරසඞ්කප්පානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව දරථකිලමථපරිළාහානං අභිනිම්මදනාය, ගාමන්තෙ අභිරමාපනාය, මනුස්සකන්තෙසු සීලෙසු සමාදපනායාති. එවං දෙවාති ඛො අග්ගිවෙස්සන, හත්ථිදමකො රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස පටිස්සුත්වා මහන්තං ථම්භං පථවියං නිඛණිත්වා ආරඤ්ඤකස්ස නාගස්ස ගීවායං උපරිබන්ධති. ආරඤ්ඤකානඤ්චෙව සීලානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව සරසඞ්කප්පානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව දරථකිලමථපරිළාහානං අභිනිම්මදනාය, ගාමන්තෙ අභිරමාපනාය මනුස්සකන්තෙසු සීලෙසු සමාදපනාය. තමෙනං හත්ථිදමකො යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපාහි වාචාහි සමුදාචරති. යතො ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො හත්ථිදමකස්ස යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපාහි වාචාහි සමුදාචරියමානො සුස්සූසති. සොතං ඔදහති. අඤ්ඤා චිත්තං උපට්ඨපෙති. තමෙනං හත්ථිදමකො උත්තරිං තිණඝාසොදකං අනුප්පවෙච්ඡති.

යතො ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො හත්ථිදමකස්ස තිණඝාසොදකං පතිගණ්හාති.[1] තත්‍ර හත්ථිදමකස්ස එවං හොති: ජීවිස්සති ඛො දානි[2] ආරඤ්ඤකො[3] නාගො'ති. තමෙනං හත්ථිදමකො උත්තරිං කාරණං කාරෙති. ආදිය භො, නික්ඛිප භොති. යතො ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො හත්ථිදමකස්ස ආදානනික්ඛෙපෙ වචනකරො හොති ඔවාදපතිකරො.[4] තමෙනං හත්ථිදමකො උත්තරිං කාරණං කාරෙති අභික්කම භො, පටික්කම භොති. යතො ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො හත්ථිදමකස්ස අභික්කමපටික්කමෙ වචනකරො[5] හොති, ඔවාද පතිකරො. තමෙනං හත්ථිදමකො උත්තරිං කාරණං කාරෙති. උට්ඨහ භො, නිසීද භොති.[6] යතො ඛො අග්ගිවෙස්සන, ආරඤ්ඤකො නාගො හත්ථිදමකස්ස උට්ඨානනිසජ්ජාය[7] වචනකරො හොති, ඔවාදපතිකරො. තමෙනං හත්ථිදමකො උත්තරිං ආනෙඤ්ජං නාම කාරණං කාරෙති. මහන්තස්ස ඵලකං සොණ්ඩාය උපනිබන්ධති. තොමරහත්ථො ච පුරිසො උපරි ගීවාය නිසින්නො හොති. සමන්තතො ච තොමරහත්ථා පුරිසා පරිවාරෙත්වා ඨිතා හොන්ති. හත්ථිදමකො ච දීඝතොමරයට්ඨිං ගහෙත්වා පුරතො ඨිතො හොති. සො ආනෙඤ්ජකාරණං කාරියමානො නෙව පුරිමෙ පාදෙ චොපෙති, න පච්ඡිමෙ පාදෙ චොපෙති, න පුරිමං කායං චොපෙති, න පච්ඡිමං කායං චොපෙති. න සීසං

1. පටිග්ගණ්හාති - මජසං, ස්‍යා.
2. ජීවිස්සති නුඛො දානි - සීමු, PTS.
3. රඤ්ඤො - PTS.
4. ඔවාදප්පටිකරෙ - මජසං.
5. අභික්කමපටික්කම වචනකරෙ - සීමු, මජසං.
6. නිසජ්ජ හොති - ස්‍යා.
7. උට්ඨානනිපජ්ජාය - ස්‍යා.

එසඳ ගිනිවෙස්න, මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය රජ හස්තිදමකයකු ඇමතී : සගය හස්ති-දමකය, තෝ ඒ ආරණ්‍යක වූ මැ සැහැවි සන්හිඳුවීම සඳහා අරණ්‍යක වූ මැ ස්වරසංකල්ප සන්හිඳුවනු සඳහා ආරණ්‍යක වූ මැ පීඩා ක්ලමථ පරිදහයන් සන්හිඳුවනු සඳහා ග්‍රාමාන්තයෙහි සිත් අලවාලනු සඳහා මිනිසුනට කල් වූ සැහැවියෙහි පිහිටුවාලනු සඳහා ආරණ්‍යක නාගයා දමනය කරව'යි. ගිනිවෙස්න, දෙවයෙනි, එසේ යැයි හස්තිදමක මුදුනෙහි බිසෙස් කළ කැත් රජහට පිළිවදන් දී, මහත් ටැඹක් පොළොවෙහි පිහිටුවා ආරණ්‍යක නාගයාගේ ගල ඊමත බඳී. ආරණ්‍යක වූ මැ සැහැවි සන්හිඳුවනු සඳහා ආරණ්‍යක වූ මැ ස්වර සංකල්ප සන්හිඳුවනු සඳහා ආරණ්‍යක වූ මැ පීඩා ක්ලමථ පරිදාහයන් සන්හිඳුවනු සඳහා, ග්‍රාමාන්තයෙහි සිත් අලවාලනු සඳහා, මිනිස්නට කල් වූ සැහැවියෙහි පිහිටුවනු සඳහා වෙයි. හස්තිදමක නිර්දොෂ වූ කර්ණ සුඛ වූ ප්‍රෙමණීය වූ හෘදයංගම වූ පුරවැසි වූ බහුජනකාන්ත වූ බහුජන මනාප වූ යම් වචන කෙනෙක් ඇද්ද, එබඳු වචනයෙන් බෙණෙයි. ගිණිවෙස්න, යම් කලෙක ආරණ්‍යක නාගයා හස්තිදමකයාගේ නිදොස් වූ කන්කලු වූ පෙම් කළ යුතු ළගන්නා වූ පුරවැසි වූ බහුජන කාන්ත වූ බහුජන මනාප වූ යම් බස්හු ඇද්ද, එවන් බසින් බණනු ලබනුයේ අසනු කැමැති වේ ද, කන් නතු කෙරේ ද, දැනගන්නට සිත් එළවා ද, උහුට හස්තිදමක මත්තෙහි තණ කබල හා දිය එළවයි.

ගිනිවෙස්න, යම් තැනෙක පටන් ආරණ්‍යක නාග හස්තිදමකයා ගේ තණ කබල හා දිය පිළිගනී ද, එහිදී හස්තිදමකහට මෙ සිත් වෙයි : ආරණ්‍යකනාග දැන් ජීවත් වන්නේ ය'යි. ඔහුට හස්තිදමක මත්තෙහි කර්මකාරණ කෙරෙයි : නහාගන භවත, බහාතබ භවත යි. ගිනි වෙස්න, යම් තැනෙක පටන් ආරණ්‍යකනාග හස්තිදමකයා ගේ නහා ගැනුම් බහා තැබුම් හි වචනකරු වූයේ අවවාද පිළිගෙන කරනුයේ වේ ද, හස්තිදමක තුලුන් මතුයෙහි කර්මකාරණ කෙරෙයි : භවත, ඉදිරියටම යා, වටාලා ඒ'යි කියා යි. ගිනිවෙස්න, යම් කලෙක ආරණ්‍යකනාගයා හස්තිදමකයාගේ අභික්‍රම ප්‍රතික්‍රම වචනකරු වේ ද, අවවාද පිළිගෙන කරන්නේ වේ ද, හස්තිදමක තුලුන් මතුයෙහි දු කාරණ කෙරෙයි : භවත, නැඟී සිටුව, භවත හිඳුව'යි. ගිනිවෙස්න, යම් කලෙක ආරණ්‍යකනාගයා හස්තිදමකයාගේ උත්ථාන නිෂද්‍යාවිධානයෙහි වචනකරු වේ ද, අවවාද ප්‍රතිකර වේ ද, හස්තිදමක තුලුන් මතුයෙහි අනිඤ්ජන කාරණ කෙරෙයි : ඔහුගේ සොඬෙහි මහත් ඵලකයක් බඳියි, තෙබගත් අත් ඇති පුරුෂයෙක් ග්‍රීවාමතුයෙහි හිඳුනේ වෙ යි. තෙබගත් අත් ඇති පුරුෂයෝ වටාගෙන පිරිවරා සිටිත් ; හස්තිදමක ද දිගු තෙබයටක් ගෙන පෙරට සිටියේ වෙයි. උයිත් අනිඤ්ජන කාරණ කැරෙනුයේ ඉදිරි පා නො සලයි. පසු පා නො සලයි, පෙරට කය නො සලයි,

චොපෙති. න කණ්ණෙ චොපෙති. න දන්තෙ චොපෙති. න නඞ්ගුට්ඨං චොපෙති. න සොණ්ඩං චොපෙති. සො හොති ආරඤ්ඤකො නාගො ඛමො සත්තිප්පහාරානං අසිප්පහාරානං උසුප්පහාරානං පරසත්ථප්පහාරානං[1] භෙරිපණව[2] වංසසඞ්ඛදෙණ්ඩිම[3]නින්නාදසද්දානං සබ්බවඞ්කදොසනිහිත-නින්නීතකසාවො රාජාරහො රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො, අග්ගිවෙස්සන, ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: "සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති: සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

එත්තාවතා ඛො අග්ගිවෙස්සන, අරියසාවකො අබ්භොකාසගතො හොති. එත්ථ ගෙධා හි අග්ගිවෙස්සන, දෙවමනුස්සා, යදිදං පඤ්චකාමගුණා. තමෙනං තථාගතො උත්තරිං විනෙති: 'එහි ත්වං භික්ඛු සීලවා හොහි. පාතිමොක්ඛසංවරසංවුතො විහරාහි, ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛස්සු සික්ඛාපදෙසූ'ති.

යතො ඛො අග්ගිවෙස්සන, අරියසාවකො සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති. ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. තමෙනං තථාගතො උත්තරිං විනෙති. 'එහි ත්වං භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොහි. චක්ඛුනා රූපං දිස්වා මා නිමිත්තග්ගාහී. මානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජ. රක්ඛ චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජ. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය මා නිමිත්තග්ගාහී මානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජ. රක්ඛ මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජා'ති.

---

1. පරසත්තුප්පහාරානං - ස්‍යා, PTS.
   සරසත්තප්පහාරානං - සීමු, මජසං.
2. තිනව - PTS, පණව - ස්‍යා.
3. දිණ්ඩිම - සීමු, ස්‍යා, ඩිණ්ඩිම - මජසං.

පසු කය නො සලයි, හිස නො සලයි. කන් නොසලයි, දත් නො සලයි, නඟුට නො සලයි, සොඬ නො සලයි. ඒ ආරණ්‍යකනාග සිරිපහර කඩුපහර හීපහර පරශස්ත්‍රප්‍රහාර බෙර පණා බෙර වස්දඬු සක් දෙණ්ඩිම හඬ සහනු වෙයි. හළ සර්වවක්‍රදෝෂ ඇතියේ හළ කසට ඇතියේ රාජාර්හ වූයේ රාජාවයවයෙක යන පරිගණනාවට යෙයි.

ගිනිවෙස්න, එපරිදි මැ මෙලො වැ අර්හත් සම්‍යක් සම්බුද්ධ විද්‍යාචරණයෙන් යුක්ත සුගත වූ ලොකය දන්නා වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ පහළ වෙති. ඔබ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලොකය ද මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ද තුමූ විශිෂ්ට ඥනයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කෙරෙති. ඔබ ආදි කල්‍යාණ කොට, මධ්‍යකල්‍යාණ කොට පර්‍ය්‍යවසාන කල්‍යාණ කොට, අර්ථ සහිත කොට, ව්‍යඤ්ජන සහිත කොට, කෙවල පරිපූර්ණ කොට, දහම් දෙසති. පරිශුද්ධ කොට බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙති.

ඒ ධර්මය ගැහැවියෙක් හෝ ගැහැවි පුතෙක් හෝ එක්තරා කුලයෙක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවයි. හේ ඒ ශ්‍රද්ධාව ලැබීමෙන් යුක්ත වූයේ මෙසේ සිතයි : " ගෘහවාසය සම්බාධ ය රාගාදි රජසුන්ට මාර්ගයෙකි, පැවිද්ද එළිමහණක් වැන්න, එකාන්තයෙන් පරිපූර්ණ වූ එකාන්තයෙන් පරිශුද්ධ වූ මේ සංඛලිඛිත බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නට ගිහිගෙයි වසන්නහු විසින් පහසු නො වේ. මම කෙහෙ රවුළු බහා කහවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්මැ අනගාර්‍ය්‍ය සංඛ්‍යාත පැවිද්දට පැමිණෙන්නෙම් නම් යෙහෙකැ" යි. හෙතෙම පසු කාලයෙක ස්වල්ප වූ හෝ භොගරාශිය හැර මහත් වූ හෝ භොග රාශිය හැර ස්වල්ප වූ හෝ නෑ පිරිවර හැර මහත් වූ හෝ නෑ පිරිවර හැර කෙස් රවුළු බහා කහවත් හැඳ පෙරෙව, ගිහිගෙන් නික් මැ අනගාර්‍ය්‍ය සංඛ්‍යාත පැවිද්දට පැමිණෙයි.

ගිනිවෙස්න, මෙතෙකින් ආර්‍ය්‍යශ්‍රාවක අභ්‍යවකාශගත වූයේ වෙයි. ගිනිවෙස්න, දෙව්මිනිස්හු පඤ්චකාම ගුණයෙහි ගෙධ වෙති. තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති : " මහණ තෝ එම සිල්වත් ව, ප්‍රාතිමෝක්ෂ සංවර සංවෘත ව වාස කර ආචාර ගොචර සම්පන්න ව අණුමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු ව සිකපද සමාදන් ව හික්මෙව"යි.

ගිනිවෙස්න, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක සිල්වත් වේ ද, ප්‍රාතිමොක්ෂසංවර සංවෘත ව වාස කෙරේ ද, ආචාරගොචර සම්පන්න ව අණුමාත්‍ර වරදෙහි බිය දක්නාසුලු ව සිකපද සමාදන් ව හික්මේ ද, තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති. " මහණ, තෝ එම ඉන්ද්‍රියෙහි ගුප්තද්වාර වව, ඇසින් රූ දැක නිමිත්තග්‍රාහී නො වව, අනුව්‍යඤ්ජනග්‍රාහී නො වව, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියයෙහි අසංවෘත ව වාස කරන තෙල මහණ අභිධ්‍යාදෞර්මනස්‍ය සංඛ්‍යාත පාපක අකුශලධර්මයෝ ලුහුබැඳගනිත් ද, එහි සංවරය පිණිස පිළිපදුව, චක්ෂුරින්ද්‍රිය රක්ව, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව. කණින් ශබ්ද අසා . . . ඝ්‍රාණයෙන් ගඳ ආඝ්‍රාණය කොට . . . දිවින් රස ආස්වාද කොට ... කයින් ස්ප්‍රෂ්ටව්‍ය පැහැස ... මනසින් දහම් දැන නිමිත්තග්‍රාහී නො වව, අනුව්‍යඤ්ජනග්‍රාහී නො වව, යම් හෙයෙකින් මනින්ද්‍රියයෙහි අසංවෘත ව වාස කරන තෙල මහණහු අභිධ්‍යාදෞර්මනස්‍ය සංඛ්‍යාත පාපක අකුශලධර්මයෝ ලුහුබැඳගනිත් ද, එහි සංවරය පිණිස පිළිපදුව, මනින්ද්‍රිය රක්ව, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව " යි.

යතො ඛො අග්ගිවෙස්සන, අරියසාවකො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති. එහි ත්වං භික්ඛු, භොජනෙ මත්තඤ්ඤූ හොහි. පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙය්‍යාසි. නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති.

යතො ඛො අග්ගිවෙස්සන, අරියසාවකො භොජනෙ මත්තඤ්ඤූ හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති: එහි ත්වං භික්ඛු ජාගරියං අනුයුත්තො විහරාහි. දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි. රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍යාසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහී'ති.

යතො ඛො අග්ගිවෙස්සන, අරියසාවකො ජාගරියං අනුයුත්තො හොති. තමෙනං තථාගතො උත්තරිං විනෙති: 'එහි ත්වං භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොහි. අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොහී'ති.

යතො ඛො අග්ගිවෙස්සන, අරියසාවකො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති, තමෙනං තථාගතො උත්තරිං විනෙති: එහි ත්වං භික්ඛු විවිත්තං සෙනාසනං භජ, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජන්ති. සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූත-හිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

ගිනිවෙස්න, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක ඉන්ද්‍රියයෙහි ගුප්තද්වාර වේ ද, තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති : " මහණ, තෝ ඒ, භොජනයෙහි මාත්‍රඥ වව, නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාර වළඳ කරව, (කිසේ යැ යත්) දවයට නො මැ වෙයි. මද වඩන්නට නො වෙයි. උනුතැන් පුරවන්නට නො වෙයි. විභූෂණයට නො වෙයි. මෙ කය සිටිනු පිණිස යැපෙනු පිණිස මැ වෙයි. විහිංසා සන්හිඳුවනු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයට අනුග්‍රහ පිණිස මැ වෙයි. මෙසේ පැරණි වෙදනා නස්මි, නවවෙදනා නූපදවමි, මාගේ ජීවිතයාත්‍රා ද වෙයි. අනවද්‍යතා හා එාසුවිහාර හා වෙති " කියා යි.

ගිනිවෙස්න, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක භොජනයෙහි මාත්‍රඥ වේ ද, තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති : " මහණ තෝ ඒ, නිදි වැරීමෙහි යෙදී වාස කර, දහවලැ සක්මනිනුදු හිඳුමිනුදු ආවරණිය දහමින් සිත පිරිසිදු කර, රැයැ පළමුයමැ චඞ්ක්‍රමණයෙනුදු නිෂද්‍යායෙනුදු ආවරණිය දහමින් සිත පිරිසිදු කර, රැයැ මැදුම්යමැ දකුණු ඇලයෙන් ගෙන පය මත පය මඳක් හයාතබා, ස්මෘතිමත් ව සම්ප්‍රඥන ඇති වැ ' නැඟිගන්මි ' යන සත් මෙනෙහි කොට සිංහශය්‍යා කර, රැයැ පැසුළුයමැ නැඟිසිට චඞ්ක්‍රමණයෙනුදු නිෂද්‍යායෙනුදු ආවරණිය දහමින් සිත පිරිසිදුකර " යී.

ගිනිවෙස්න, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක නිදි වැරීමෙහි යෙදුණේ වේ ද, තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති : ' මහණ, තෝ ඒ, සතිසම්පජඤ්ඤයෙන් සමන්වාගත වව, ඉදිරිගමන්හි ද පෙරළාඊම්හි ද සම්පජානකාරී වව, ආලොකන විලොකන යෙහි සම්පජානකාරී වව, සමිඤ්ජන ප්‍රසාරණයෙහි සම්පජානකාරී වව, සඞ්ඝාටි පාත්‍රචීවර ධාරණයෙහි සම්පජානකාරී වව, ඛාද්‍යභොජ්‍යලෙය්‍යපෙය සඞ්ඛ්‍යාත සියුඅහරෙහි සම්පජාන කාරී වව, අස්පස්කිසෙහි සම්පජානකාරී වව, ගමන–ස්ථාන–නිෂීදන–ස්වප්න–ජාගර්‍ය්‍යා–භාෂණ–තුෂ්ණීම්භාව යන මෙහි සම්පජානකාරී වව " යි.

ගිනිවෙස්න, යම් කලෙක ආර්‍ය්‍යශ්‍රාවක සතිසම්පජඤ්ඤයෙන් සමන්වාගත වේ ද, තථාගතයන් වහන්සේ තුලුන් මතුයෙහි විනයන කෙරෙති : " මහණ, තෝ ඒ, ජනශූන්‍ය සෙනසුන් ඇසුරු කර, අරණැ, රුක්මුලැ, පව් යැ, කඳුර, ගිරිලෙනැ, සොහොනැ, වන පෙතැ, අබවස, පිදුරුකිළියැ " යි. හේ අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කන්දර යැ ගිරිගුහා යැ ශ්මශාන යැ වනප්‍රස්ත යැ අභ්‍යවකාශ යැ පලාලපුඤ්ජ යැ යන ජනශූන්‍ය ශයනාසන භජන කෙරෙයි. හේ පසුබත්හි පිඩුවායෙන් වැළැකුණේ පලක් අවුළුවා උඩුකය ඍජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා හිඳී. හේ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යාව දුහැ විගතාභිධ්‍ය සිතින් වාස කෙරෙයි. අභිධ්‍යායෙන් සිත පරිශොධන කෙරෙයි. ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වේෂය දුහැ අව්‍යාපන්නචිත්ත වැ සර්වප්‍රාණහිතානුකම්පී වැ වාස කෙරෙයි. ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රද්වේෂයෙන් සිත පරිශොධන කෙරෙයි. ස්ත්‍යානමිද්ධය දුහැ ආලොකසංඥ ඇති වැ ස්මෘතිමත් වැ සම්ප්‍රඥන ඇති වැ පැහූ ථීනමිද්ධ ඇති වැ වාස කෙරෙයි. ථීනමිද්ධයෙන් සිත පරිශොධන කෙරෙයි. ඖද්ධත්‍යකෞකෘත්‍ය දුහැ අධ්‍යාත් මයෙහි සන්හුන් සිත් ඇති වැ අනුද්ධත වැ වාස කෙරෙයි. ඖද්ධත්‍යකෞකෘත්‍යයෙන් සිත පරිශොධන කෙරෙයි. විචිකිත්සා දුහැ කුසල් දහම්හි කථඞ්කථා රහිත වැ තුනු විසිකිස් ඇති වැ වාස කෙරෙයි. විමතියෙන් සිත පිරිසිදු කෙරෙයි.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු-පෙ-චිත්තෙ-පෙ-ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සෙය්‍යථාපි අග්ගිවෙස්සන, හත්ථිදම්මකො මහන්තං ථම්භං පථවියං නිඛණිත්වා ආරඤ්ඤකස්ස නාගස්ස ගීවායං උපනිබන්ධති. ආරඤ්ඤකානඤ්චෙව සීලානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව සරසඞ්කප්පානං අභිනිම්මදනාය, ආරඤ්ඤකානඤ්චෙව දරථකිලමථපරිළාහානං අභිනිම්මදනාය, ගාමන්තෙ අභිරමාපනාය, මනුස්සකන්තෙසු සීලෙසු සමාදපනාය[1] එවමෙව ඛො අග්ගිවෙස්සන, අරියසාවකස්ස ඉමෙ චත්තාරො සතිපට්ඨානා චෙතසො උපනිබන්ධනා හොන්ති. ගෙහසිතානඤ්චෙව සීලානං අභිනිම්මදනාය, ගෙහසිතානඤ්චෙව සරසඞ්කප්පානං අභිනිම්මදනාය, ගෙහසිතානඤ්චෙව දරථකිලමථපරිළාහානං අභිනිම්මදනාය, ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය.

තමෙනං තථාගතො උත්තරිං විනෙති: එහි ත්වං භික්ඛු, කායෙ කායානුපස්සී විහරාහි. මා ච කාමූපසංහිතං[1] විතක්කං විතක්කෙසි. වෙදනාසු-පෙ-චිත්තෙ-පෙ-ධම්මෙසු ධම්මානුපස්සී විහරාහි. මා ච කාමූපසංහිතං[2] විතක්කං විතක්කෙසී'ති. සො විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං-පෙ-තතියං ඣානං-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා-පෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

---

1. කායූපසංහිතං - PTS.
2. ධම්මූපසංහිතං - PTS

ඒ ආර්‍යශ්‍රාවක චිත්තොපක්ලෙශ වූ ප්‍රඥාව දුබල කරන මේ පඤ්චනීවරණයන් හැරපියා කෙලෙස් තවන වැර ඇති ව නුවණින් දන්නේ සිහි ඇති වැ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය හැරපියා කයෙහි කය නුවණින් දක්නාසුලු ව වාස කෙරෙයි. වෙදනායෙහි . . . චිත්තයෙහි . . . කෙලෙස් තවන වැර ඇතිව නුවණින් දන්නේ පඤ්චස්කන්ධලොකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය හැරපියා ධර්මයෙහි ධර්මය නුවණින් දක්නාසුලු ව වාස කෙරෙයි. ගිනිවෙස්න, යම් පරිදි හස්තිදමක මහත් වැඹක් පොළොවෙහි සිටුවා ආරණ්‍යකනාගයා ගේ ගෙලෙහි බඳනේ වේ ද, ආරණ්‍යක ස්වභාවයන් මඩනු පිණිස ය, ආරණ්‍යක වාක්සඞ්කල්ප මඩනු පිණිස ය, ආරණ්‍යක වූ මැ පීඩා ක්ලමථ පරිදහ මඩනු පිණිස යැ, ග්‍රාමාන්තයෙහි අලවනු පිණිස යැ, මිනිස්නට කල් වූ සැහැවියෙහි සමාදන් කරවනු පිණිස යි. ගිනිවෙස්න, එපරිදි මැ ආර්‍යශ්‍රාවකයාහට මේ සතර සිවටන්හු චිත්තොපනිබන්ධන වෙති. ගෘහශ්‍රිත වූ මැ සැහැවි මඩනු පිණිස යැ, ගෘහශ්‍රිත වූ මැ ස්වරසඞ්කල්ප මඩනු පිණිස යැ, ගෘහශ්‍රිත වූ මැ පීඩා ක්ලමථ පරිදහ මඩනු පිණිස යැ, න්‍යායධර්මයා ගේ අධිගමය පිණිස යැ, නිර්වාණයා ගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස යි.

තථාගතයන් වහන්සේ තුලුත් මතුයෙහි විනයන කෙරෙති : " මහණ, තෝ ඒ, කයෙහි කය නුවණින් දක්නාසුලු ව වාස කර, කාමොපසංහිත විතර්ක නහමක් විතර්කණ කර, වෙදනායෙහි . . . චිත්තයෙහි . . . ධර්මයෙහි ධර්මය නුවණින් දක්නාසුලු ව වාස කර, කාමූපසංහිත විතර්ක නහමක් විතර්කණ කර " යි, හේ විතර්කවිචාරයන් සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ලකුණු කොට ඇති චිත්තයා ගේ එකඟබව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිසුව ඇති ද්විතීයධ්‍යානය . . . තෘතීයධ්‍යානය . . . චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි.

ඒ මහණ මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ ව පර්‍යවදත ව අනඞ්ගණ ව විගතොපක්ලෙශ ව මෘදු ව කර්මණ්‍ය ව ස්ථිත ව අනිඤ්ජනප්‍රාප්ත ව සිටි කල්හි පූර්වනිවාසානුස්මෘති ඥානය පිණිස සිත නතු කෙරෙයි, හේ අනෙකවිධ පූර්වනිවාසය සිහි කෙරෙයි. කෙසේ යැ යත් : එක් ජාතියකුදු දෙ ජාතියකුදු . . . මෙසේ සාකාර සොද්දෙශ අනෙකප්‍රකාර පූර්වනිවාසය සිහි කරයි.

ඒ මහණ මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ ව පර්‍යවදත ව අනඞ්ගණ ව විගතොපක්ලෙශ ව මෘදු ව කර්මණ්‍ය ව ස්ථිත ව අනිඤ්ජනප්‍රාප්ත ව සිටි කල්හි සත්ත්වයන් ගේ චුතූපපාත ඥානය පිණිස සිත නතු කෙරෙයි. හේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ච්‍යුත වන උපදනා හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකී. කම් වූ පරිදි පරලොව ගිය සතුන් දනී. මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගත යහ. . . . මෙසේ යථාකර්මොපග සත්ත්වයන් නුවණින් දනී.

හේ මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ ව පර්‍යවදත ව අනඞ්ගණ ව විගතෝපක්ලේශ ව මෘදු ව කර්මණ්‍ය ව ස්ථිත ව අනිඤ්ජනප්‍රාප්ත ව සිටි කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත නතු කෙරෙයි. හේ ' මේ දුකැ ' යි යථාභූත ව නුවණින් දනී. ' මේ දුඃඛසමුදයැ ' යි යථාභූත ව නුවණින් දනී. ' මේ දුඃඛනිරොධ යැ ' යි යථාභූත ව නුවණින් දනී. ' මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදව යැ ' යි යථාභූත ව නුවණින් දනී. මොහු ආස්‍රවයහ ' යි යථාභූත ව නුවණින් දනී. ' මේ ආස්‍රවසමුදය යැ' යි යථාභූත ව නුවණින් දනී. මේ ආස්‍රව නිරොධ යැ ' යි යථාභූත ව නුවණින් දනී. මේ ආස්‍රවනිරොධගාමිනීප්‍රතිපද යැ ' යි යථාභූත ව නුවණින් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුට කාමාස්‍රවයෙනුදු සිත මිදෙයි. භවාස්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදෙයි. මුත් සඳ විමුක්ත යයි ප්‍රත්‍යවෙක්ෂාඥානය වෙයි. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මේ රහත්බවට අන් කිසෙක් නැති ' යි නුවණින් දනී.

සො හොති, භික්ඛු ඛමො සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති. සබ්බරාගදොසමොහනිහතනින්නීතකසාවො, ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

මහල්ලකො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො අදන්තො අවිනීතො කාලංකරොති. අදන්තමරණං මහල්ලකො රඤ්ඤො නාගො කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති. මජ්ඣිමො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො -පෙ- දහරො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො අදන්තො අවිනීතො කාලංකරොති. අදන්තමරණං දහරො රඤ්ඤො නාගො කාලඞ්කකතොත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො අග්ගිවෙස්සන ථෙරො චෙපි භික්ඛු අඛීණාසවො කාලංකරොති. අදන්තමරණං ථෙරො භික්ඛු කාලඞ්කකතොත්වෙව සඞ්ඛං ගච්ඡති. මජ්ඣිමො චෙපි අග්ගිවෙස්සන භික්ඛු-පෙ-නවො චෙපි අග්ගිවෙස්සන, භික්ඛු අඛීණාසවො කාලංකරොති. අදන්තමරණං නවො භික්ඛු කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

මහල්ලකො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො සුදන්තො සුවිනීතො කාලංකරොති. දන්තමරණං මහල්ලකො රඤ්ඤො නාගො කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති. මජ්ඣිමො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො-පෙ-දහරො චෙපි අග්ගිවෙස්සන, රඤ්ඤො නාගො සුදන්තො සුවිනීතො කාලංකරොති. දන්තමරණං දහරො රඤ්ඤො නාගො කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො අග්ගිවෙස්සන ථෙරො චෙපි භික්ඛු ඛීණාසවො කාලංකරොති. දන්තමරණං ථෙරො භික්ඛු කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති. මජ්ඣිමො චෙපි අග්ගිවෙස්සන, භික්ඛු-පෙ-නවො චෙපි අග්ගිවෙස්සන භික්ඛු ඛීණාසවො කාලංකරොති. දන්තමරණං නවො භික්ඛු කාලඞ්කතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

ඉදමවොච භගවා අත්තමනො අචිරවතො සමණුද්දෙසො භගවතො භාසිතං අභිනන්දීති.

දන්තභූමි සුත්තං පඤ්චමං.

ඒ මහණ ශීත ය උෂ්ණ ය බඩසය පවස මැසි මදුරු අව් සුළං දික්දැපහස යන මේ සහනුයේ දුරුක්ත දුරාගත වචනපථ හා උපන් දුඃඛ තීව්‍ර ඛර කටුක අසාත අමනාප ප්‍රාණහර ශාරීරික වේදනා හා සහනසැහැව් ඇති වෙයි. පැහූ සියලු රාගද්වෙෂමොහ ඇතියේ නෙරුලූ කසට ඇතියේ වෙයි. දෙන්නට නිසි අන්නපානප්‍රතිග්‍රහණයට අර්හ වෙයි. ප්‍රාඝුණ සඞ්ඛ්‍යාත ආගන්තුකසත්කාරයට නිසි වෙයි. දක්ෂිණාවට නිසි වෙයි. ඇඳිලි කළයුතු වෙයි. ලොකයට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍රත් වේ.

ගිනිවෙස්න, රාජනාගයා මහලුවත් අදාන්ත ව අවිනීත ව කලුරියකෙරේ, රාජනාගයා මහලු වුව අදාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි ගණනට යෙයි. ගිනිවෙස්න, රාජනාගයා මධ්‍යමවයස්කවත් . . . ගිනිවෙස්න, රාජනාගයා දහරවත් අදාන්ත ව අවිනීත ව කාලක්‍රියා කෙරේ නම්, රාජනාගයා දහර ව අදාන්තමරණයෙන් කාලක්‍රියා කෙළේ යයි ගණනට යෙයි. ගිනිවෙස්න, එපරිදි ම මහණ ස්ථවිර ව සිට ද ක්ෂීණාස්‍රව නො වූයේ කාලක්‍රියා කෙරේ ද, මහණ ස්ථවිර ව සිට අදාන්තමරණයෙන් කාලක්‍රියා කෙළේ යයි සඞ්ඛ්‍යානයට යෙයි. ගිනිවෙස්න, මහණ මධ්‍යම වයස්ක ව සිටත් . . . ගිනිවෙස්න, මහණ නවක ව සිටත් ක්ෂීණාස්‍රව නො වූයේ කලුරිය කෙරේ ද නවක මහණ අදාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි සඞ්ඛ්‍යානයට යෙයි.

ගිනිවෙස්න, රාජනාගයා මහලුව සිටත් සුදාන්ත ව සුවිනීත ව කලුරිය කෙරේ ද, රාජ නාගයා මහලු ව දාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි ගණනට යෙයි. ගිනිවෙස්න, රාජනාගයා මධ්‍යම වයස්ක ව සිටත් . . . ගිනිවෙස්න රාජනාගයා දහර ව සිටත් සුදාන්ත ව සුවිනීත ව කාලක්‍රියා කෙරේ ද, රාජනාගයා දහර ව සිට දාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි ගණනට යෙයි. ගිනිවෙස්න, එපරිදි ම ස්ථවිර ව සිටත් ක්ෂීණාස්‍රව ව කලුරිය කෙරේ ද, මහණ ස්ථවිර ව සිට දාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි පරිගණනාවට යෙයි. ගිනිවෙස්න, මහණ මධ්‍යම වයස්ක ව සිටත් . . . ගිනිවෙස්න, මහණ නවක ව සිටත් ක්ෂීණාස්‍රව ව කලුරිය කෙරේ ද, මහණ නවක ව සිට දාන්තමරණ කාලක්‍රියා කෙළේ යයි පරිගණනාවට යෙයි.

භාග්‍යවතුන් වහන්සේ මේ දන්තභූමි සූත්‍රය වදාළ සේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් සිත් ඇති අචිරවත හෙරණ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනා කළේ යි.

පස්වැනි දන්තභූමිසූත්‍ර යි.

# 3. 3. 6

# භූමිජ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, අථ ඛො ආයස්මා භූමිජො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන ජයසෙනස්ස රජකුමාරස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

අථ ඛො ජයසෙනො රජකුමාරො යෙනායස්මා භූමිජො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා භූමිජෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජයසෙනො රජකුමාරො ආයස්මන්තං භූමිජං එතදවොච: සන්ති හො භූමිජ, එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමායාති. ඉධ භොතො භූමිජස්ස සත්ථා කිංවාදී කිමක්ඛායී'ති?

න ඛො මෙතං රජකුමාර, භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං. ඨානඤ්ච ඛො එතං විජ්ජති යං භගවා එවං ව්‍යාකරෙය්‍ය: ආසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය අනාසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා එලස්ස අධිගමාය. ආසඤ්චෙපි කරිත්වා යොනිසො බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා එලස්ස අධීගමාය. අනාසඤ්චෙපි කරිත්වා යොනියො බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා එලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා යොනිසො බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා එලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා යොනිසො බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා එලස්ස අධිගමායාති. න ඛො මෙතං රාජකුමාර, භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං, ඨානඤ්ච ඛො එතං විජ්ජති, යං භගවා එවං ව්‍යාකරෙය්‍යාති.

සචෙ ඛො භොතො භූමිජස්ස සත්ථා එවංවාදී එවමක්ඛායී, අද්ධා භොතො භූමිජස්ස සත්ථා සබ්බෙසංයෙව පුථුසමණබ්‍රාහ්මණානං මුද්ධානං මඤ්ඤෙ ආහච්ච තිට්ඨතීති. අථ ඛො ජයසෙනො රජකුමාරො ආයස්මන්තං භූමිජං සකෙනෙව ථාලිපාකෙන පරිවිසි.

# 3. 3. 6
# භූමිජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වෙළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් භූමිජ තෙරණුවෝ පෙරවරු කාලයෙහි හැඳපෙරෙව පාසිවුරු ගෙන ජයසෙන රජකුමරහු ගේ නිවෙස්න යම් තැනෙක්හි ද එතැන්හි එළැඹියහ. එළැඹ පැන්වූ අස්නෙහි වැඩහුන්හ.

එසඳ ජයසෙන රාජකුමාර ආයුෂ්මත් භූමිජ තෙරණුවන් කරා එළැඹ, ආයුෂ්මත් භූමිජ තෙරණුවන් සමග සතුටු විය. සම්මොදනයට නිසි සිහි කරන්නට නිසි කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් ව හුන් ජයසෙන රජකුමර ආයුෂ්මත් භූමිජ තෙරණුවන්ට තෙල කී : " භවත් භූමිජයෙනි, මෙවන් වාද ඇති මෙවන් දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ : " ඉදින් ආශා කොට බඹසර සෙරෙත් නමුදු ඵලාධිගමයට අභව්‍යයෝ යැ, අනාශා කොට බඹසර සෙරෙත් නමුදු ඵලාධිගමයට අභව්‍යයෝ යැ, කලෙක ආශා කොටත් කලෙක අනාශා කොටත් බඹසර සෙරෙත් නමුදු ඵලාධිගමයට අභව්‍යයෝ යැ, නො මැ ආශා කොටත් අනාශා නො කොටත් බඹසර සෙරෙත් නමුදු ඵලාධිගමයට අභව්‍යයෝ වෙති " යි. මෙහි ලා භවත් භූමිජ තෙරුන් ගේ ශාස්තෘන් වහන්සේ කුමන වාද ඇති සේක් ද ? කුමක් ප්‍රකාශ කරන සේක් දැ " යි.

රාජකුමාරය, මා විසින් තෙල කරුණ බුදුන් හමුයෙහි නො අසන ලද, හමුයෙහි නො පිළිගන්නා ලද, " බුදුහු මෙසේ වදරති " යන තෙල කරුණ ඇත. " ආශා කොටත් නුනුවණින් බඹසර වසත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, අනාශා කොටත් නුනුවණින් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, ආශා ද අනාශා ද කොටත් නුනුවණින් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, ආශා නො කොටත් අනාශා නො කොටත් නුනුවණින් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, ආශා කොටත් නුවණින් බඹසර පුරත් නම්, ඵලාධිගමයට භව්‍යයහ, අනාශා කොටත් නුවණින් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට භව්‍යයහ, ආශා ද අනාශා ද කොටත් නුවණින් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට භව්‍යයහ, ආශා නො කොටත් අනාශා නො කොටත් නුවණින් බඹසර හැසිරෙත් නම් ඵලාධිගමයට භව්‍යයහ " යන තෙල කරුණ යි. රාජකුමාරය, මා විසින් තෙල කරුණ බුදුන් හමුයෙහි නො අසන ලද, හමුයෙහි නො පිළිගන්නා ලද, " බුදුහු මෙසේ වදරති " යන තෙල කී කරුණ විය හෙයි.

ඉදින් භවත් භූමිජයන් ගේ ශාස්තෘන් වහන්සේ මෙසේ වදරන සේක් නම්, මෙසේ බණන සේක් නම්, භවත් භූමිජයන් ගේ ශාස්තෘන් වහන්සේ හැම මහණ බමුණන් ගේ මුදුන් පැහැර සිටුනා සේක් වැන්න. එසඳ ජයසෙන රාජකුමාර ආයුෂ්මත් භූමිජ තෙරණුවන් තමන් සතු වූ මැ මුළුබතින් පිරිවිසි.



22—ඒ 00502 (8/73)

අථ ඛො ආයස්මා භූමිජො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා භූමිජො භගවන්තං එතදවොච: 'ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන ජයසෙනස්ස රාජකුමාරස්ස නිවෙසනං, තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. අථ ඛො භන්තෙ ජයසෙනො රාජකුමාරො යෙනාහං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මම සද්ධිං[1] සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භන්තෙ, ජයසෙනො රාජකුමාරො මං එතදවොච: 'සන්ති හො භූමිජ, එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමායාති. ඉධ භොතො භූමිජස්ස සත්ථා කිංවාදී කිමක්ඛායීති?

එවං වුත්තෙ අහං භන්තෙ, ජයසෙනං රාජකුමාරං එතදවොචං: 'න ඛො මෙතං රාජකුමාර, භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. ඨානං ච ඛො එතං විජ්ජති, යං භගවා එවං ව්‍යාකරෙය්‍ය: 'ආසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. -පෙ- නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා අයොනිසො බ්‍රහ්මචරියං චරන්ති. අභබ්බා ඵලස්ස අධිගමාය. ආසඤ්චෙපි කරිත්වා යොනිසො බ්‍රහ්මචරියං චරන්ති. භබ්බා ඵලස්ස අධිගමාය, අනාසඤ්චෙපි කරිත්වා -පෙ- නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා යොනිසො බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමායා'ති. න ඛො මෙතං රාජකුමාර, භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. ඨානඤ්ච ඛො එතං විජ්ජති: යං භගවා එවං බ්‍යාකරෙය්‍යාති. සචෙ භොතො භූමිජස්ස සත්ථා එවංවාදී එවංදිට්ඨී අද්ධා භොතො භූමිජස්ස සත්ථා සබ්බෙසං යෙව පුථුසමණබ්‍රාහ්මණානං මුද්ධානං මඤ්ඤෙ ආහච්ච තිට්ඨතීති.

කච්චි[2] භන්තෙ, එවං පුට්ඨො එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව භගවතො හොමි, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාමි. ධම්මස්ස චානුධම්මං ව්‍යාකරෙමි. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතීති.

තග්ඝ ත්වං භූමිජ, එවං පුට්ඨො එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ හොසි, න ච මං අභූතෙන අබ්භාචික්ඛසි, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරෙසි. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡති.

යෙ හි කෙචි භූමිජ, සමණා වා බ්‍රාහ්මණා වා මිච්ඡාදිට්ඨිනො මිච්ඡාසඞ්කප්පා මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තා මිච්ඡාආජීවා මිච්ඡාවායාමා මිච්ඡාසති මිච්ඡාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

1. මයා සද්ධිං - මජසං, ස්‍යා. 2. කච්චාහං - සීමු, මජසං, ස්‍යා

ඉක්බිති ආයුෂ්මත් භූමිජ තෙරණුවෝ පසුබතැ පිඩුවායෙන් වැළැක්කාහු බුදුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් භූමිජ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළෝ. " වහන්ස, මම පෙරවරු හැඳපෙරෙව පාසිවුරු ගෙන ජයසෙන රජකුමරුන් නිවෙසට ගියෙමි. ගොස් පැන්වූ අස්නෙහි හිනිමි. වහන්ස, එසඳ ජයසෙන රජකුමර මා කරා එළැඹියේය, එළැඹ මා සමග සතුටු වී. සම්මොදනයට තිසි කලතුරුහි සිහි කළයුතු කථාව කොට නිමවා, එකත්පස් ව හින. වහන්ස, එකත්පස් ව හුන් ජයසෙන රජකුමර මට මෙසේ සැලකෙළේ : " භවත් භූමිජයෙනි, මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති මහණබමුණු කෙනෙක් ඇත. 'ආශා කොටත් බ්‍රම්සර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, අනාශා කොටත් ... ආශා ද අනාශා ද කොටත් බඹසර පුරත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, ආශා නො කොටත් අනාශා නො කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ ' යි. මෙහි ලා භවත් භූමිජයන් ගේ ශාස්තෲන් වහන්සේ කෙබඳු වාද ඇති සේක් ද ? කුමක් ප්‍රකාශ කරන සේක් ද " යි.

වහන්ස, මෙසේ කී කල මම ජයසෙන රජකුමරහට මෙසේ කීමි : " රාජකුමාරය, මෙසේ කරුණ මා විසින් බුදුන් හමුයෙහි නො අසන ලද, හමුයෙහි නො පිළිගන්නා ලද, ' බුදුහු මෙසේ වදරති ' යන මෙසේ කරුණ ඇත : ' ආශා කොට ද නුනුවණින් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ . . . ආශා නො කොට ද අනාශා නො කොට ද නුනුවණින් බඹසර පුරත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, ආශා කොට ද නුවණින් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට භව්‍යයහ, අනාශා කොට ද . . . ආශා නො කොට ද අනාශා නො කොට ද නුවණින් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට භව්‍යයහ " යි. රජකුමර, මෙසේ මෙසේ කරුණ මා විසින් බුදුන් හමුයෙහි නො අසන ලද, හමුයෙහි නො පිළිගන්නා ලද. ' බුදුහු මෙසේ වදරති ' යන මෙසේ කරුණ ඇතැ ' යි කීමි. ඉදින් භවත් භූමිජයන් ගේ ශාස්තෲන් වහන්සේ මෙබඳු වාද ඇති සේක් නම්, මෙබඳු දෘෂ්ටි ඇති සේක් නම්, භවත් භූමිජයන් ගේ ශාස්තෲන් වහන්සේ හැම මහණබමුණන් ගේ මුදුන් පැහැරගෙන සිටුනාක් වැන්නාහ " යි, හේ කී.

වහන්ස, කිම මෙසේ පුළුවුස්නා ලද්දෙම් මෙසේ පිළිතුරු විසින් පවසන්නෙම්, භගවත් හට උක්තවාදී වෙම් දෝ, භාග්‍යවතුන් වහන්සේ අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කෙරෙම් දෝ, ධර්මානුධර්මය ප්‍රකාශ කෙරෙම් දෝ, කිසියම් සකාරණ වාදානුවාදයෙක් ගර්හණීය තැනට නොද ඒ දෝ හෝ ' යි, (දන්නට රිසියෙමි).

භූමිජය, ඒකාන්තයෙන් තෙපි මෙසේ විචාරන ලදුවහු මෙසේ ප්‍රකාශ කරන්නාහු මා පිළිබඳ ව උක්තවාදී වව, මට අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කරන්නාහු වව, ධර්මයට අනුධර්මය ද ප්‍රකාශ කරන්නාහු වව, කිසි යම් සහෙතුක වාදානුවාදයෙක් ගර්හණීයස්ථානයට ද නො එයි.

භූමිජය, මිථ්‍යාදෘෂ්ටික වූ මිථ්‍යාසංකල්ප ඇති මිථ්‍යාවාක් ඇති මිථ්‍යාකර්මාන්ත ඇති මිථ්‍යාආජීව ඇති මිථ්‍යාව්‍යායාම ඇති මිථ්‍යාස්මෘති ඇති මිථ්‍යාසමාධි ඇති යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ඇද්ද, ඔහු ආශා කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, අනාශා කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, ආශා කොටත් අනාශා කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ, ආශා නො කොටත් අනාශා නො කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට මෙසේ අනුපාය වේ ද එහෙයිනි.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො තෙලත්ථිකො තෙලගවෙසී තෙලපරියෙසනං චරමානො වාලිකං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, ආසඤ්චෙපි කරිත්වා වාලිකං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, අභබ්බො තෙලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා වාලිකං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, අභබ්බො තෙලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා වාලිකං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, අභබ්බො තෙලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා වාලිකං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, අභබ්බො තෙලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා[1] භූමිජ, තෙලස්ස අධිගමාය. එවමෙව ඛො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා මිච්ඡාදිට්ඨිනො මිච්ඡාසඞ්කප්පා මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තා මිච්ඡාආජීවා මිච්ඡාවායාමා මිච්ඡාසතී මිච්ඡාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා[1] භූමිජ, ඵලස්ස අධිගමාය.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො ඛීරත්ථිකො ඛීරගවෙසී ඛීරපරියෙසනං චරමානො ගාවිං තරුණවච්ඡං විසාණතො ආවිඤ්ඡෙය්‍ය. ආසඤ්චෙපි කරිත්වා ගාවිං තරුණවච්ඡං විසාණතො ආවිඤ්ඡෙය්‍ය, අභබ්බො ඛීරස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා -පෙ- නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා ගාවිං තරුණවච්ඡං විසාණතො ආවිඤ්ඡෙය්‍ය, අභබ්බො ඛීරස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා භූමිජ, ඛීරස්ස අධිගමාය. එවමෙව ඛො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා මිච්ඡාදිට්ඨිනො -පෙ- මිච්ඡාසමාධිනො තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති. අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා -පෙ- නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය තං කිස්ස හෙතු: අයොනි හෙසා[1] භූමිජ, ඵලස්ස අධිගමාය.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො නොනීතත්ථිකො නොනීත[2]ගවෙසී නොනීතපරියෙසනං චරමානො උදකං කලසෙ ආසිඤ්චිත්වා මන්ථෙන[3] ආවිඤ්ඡෙය්‍ය, ආසඤ්චෙපි කරිත්වා උදකං කලසෙ ආසිඤ්චිත්වා මන්ථෙන[3] ආවිඤ්ඡෙය්‍ය, අභබ්බො නොනීතස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා -පෙ- නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා උදකං කලසෙ ආසිඤ්චිත්වා මන්ථෙන ආවිඤ්ඡෙය්‍ය, අභබ්බො නොනීතස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා[1] භූමිජ, නොනීතස්ස අධිගමාය. එවමෙව ඛො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා මිච්ඡාදිට්ඨිනො -පෙ- මිච්ඡාසමාධිනො. තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

---

1. අයොනිසො හෙසා - මජසං, සීමු. 2. නවනීත - සීමු, මජසං.
3. මත්ථෙන - සීමු, මජසං, ස්‍යා, PTS.

යම්සේ භූමිජය, තෙල් කැමැති තෙල් සොයන තෙල් සෙවීමෙහි හැසිරෙන පුරුෂයෙක් පැසෙහි වැලි එව දිය ඉස ඉස පෙළන්නේ නම්, ආශා කොට නමුදු පැසෙහි වැලි එව දිය ඉස ඉස මිරිකනුයේ නමුදු තෙල් ලැබීමට අභව්‍ය ය. ආශා නො කොටපියාත් පැසෙහි වැලි එව දිය ඉස ඉස පෙළා නමුදු තෙල් ලැබීමට අභව්‍ය ය, ආශා කොටත් අනාශා කොටත් පැසෙහි වැලි එව දිය ඉස ඉස පෙළා නමුදු තෙල් ලැබීමට අභව්‍ය ය, නො මැ ආශා කොට ද අනාශා නො කොට ද පැසෙහි වැලි එව දියෙන් තෙම තෙමා පෙළන්නේ නමුදු තෙල් ලබාගැනීමට අභව්‍ය ය. එ කවර හෙයින යත් : භූමිජය, තෙල් මිරිකා ගැනීමට ඒ අකාරණ හෙයිනි. එසෙයින් ම භූමිජය, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මිථ්‍යාදෘෂ්ටික වූවාහු මිථ්‍යාසංකල්ප ඇත්තාහු මිථ්‍යාවචන ඇත්තාහු මිථ්‍යාකර්මාන්ත ඇත්තාහු මිථ්‍යාආජීව ඇත්තාහු මිථ්‍යාව්‍යායාම ඇත්තාහු මිථ්‍යාස්මෘති ඇත්තාහු මිථ්‍යාසමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොටත් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, අනාශා කොටත් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, ආශා හා අනාශා හා කොටත් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, ආශා නො කොටත් අනාශා නො කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට අභව්‍යයහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල අනුපාය වෙයි, එහෙයිනි.

භූමිජය, යම් පරිදි කිරැටි වූ කිරි සොයන ක්ෂීරපයෞෂණ කරන පුරුෂයෙක් තුරුණු වසුපැටකු ඇති දෙනක් ගෙන අඟ අදනේ වේ ද, ආශා කොටත් තරුණ වසුපැටකු ඇති දෙන අඟ අදනේ වේ ද, කිරි ලබන්නට අභව්‍ය වෙයි, අනාශා කොටත් . . . ආශාත් අනාශාත් කොටත් . . . ආශා ද නො කොට අනාශා ද නො කොටත් තුරුණු වසුපැටකු ඇති දෙන ගෙන අඟ අදනේ වේ ද, කිරි ලබන්නට නො නිස්ස. එ කවර හෙයින යත් : භූමිජය, කිරි ලබන්නට තෙල අනුපාය වෙයි, එහෙයිනි. භූමිජය, එපරිදි ම යම් මැ මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු . . . මිථ්‍යා සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොට ද බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට නො නිස්සහ, අනාශා කොට ද . . . ආශා හා අනාශා හා කොට ද . . . ආශා නො කොට ද අනාශා නො කොට ද බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට නො නිස්සහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල අනුපාය වේ ද, එහෙයිනි.

භූමිජය, යම් පරිදි වෙඬරු කැමැති වෙඬරු ඉලියන වෙඬරු පිරියෙස්ලි කරන පුරුෂයෙක් දියත්තක් ගෙන කලසයෙකැ එවැ මථනදඬියෙන් කලබන්නේ වේ ද, ආශා කොට ද කෙළෙහි දිය එව මන්ථනදණ්ඩකින් කලබන්නේ වේ ද, වෙඬරු ලබන්නට නො නිස්ස. අනාශා කොට ද . . . ආශා හා අනාශා හා කොට ද . . . ආශා නො කොට ද අනාශා නො කොට ද දිය කළයෙක්හි එව මන්ථනයෙන් කලබන්නේ වේ ද, වෙඬරු ලබන්නට නො නිස්ස, භූමිජය, වෙඬරුවට තෙල අනුපාය වේ ද, එහෙයිනි. භූමිජය, එපරිදි මැ යම් කිසි මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු . . . මිථ්‍යාසමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොට ද බඹසර වසත් නම්, ඵලාධිගමයට අභව්‍යයහ, අනාශා කොට ද . . . බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට නො නිස්සහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල අනුපාය වේ ද, එහෙයිනි.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො අග්ගත්ථිකො[1] අග්ගිගවෙසී අග්ගිපරියෙසනං චරමානො අල්ලං කට්ඨං සස්නෙහං උත්තරාරණිං ආදාය අභිමත්ථෙය්‍ය[2], ආසඤ්චෙපි කරිත්වා අල්ලං කට්ඨං සස්නෙහං උත්තරාරණිං ආදාය අභිමත්ථෙය්‍ය, අභබ්බො අග්ගිස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා අල්ලං කට්ඨං සස්නෙහං උත්තරාරණිං ආදාය අභිමත්ථෙය්‍ය, අභබ්බො අග්ගිස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා භූමිජ, අග්ගිස්ස අධිගමාය එවමෙව ඛො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා මිච්ඡාදිට්ඨිනො-පෙ-මිච්ඡාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, අභබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: අයොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

යෙ ච ඛො කෙචි[3] භූමිජ, සමණා වා බ්‍රාහ්මණා වා සම්මාදිට්ඨිකා සම්මාසඞ්කප්පා සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීවා සම්මාවායාමා සම්මාසතී සම්මාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො තෙලත්ථිකො තෙලගවෙසී තෙලපරියෙසනං චරමානො තිලපිට්ඨං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, ආසඤ්චෙපි කරිත්වා තිලපිට්ඨං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, භබ්බො තෙලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ- ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා තිලපිට්ඨං දොණියා ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං පීළෙය්‍ය, භබ්බො තෙලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, තෙලස්ස අධිගමාය. එවමෙව ඛො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා සම්මාදිට්ඨිනො-පෙ-සම්මාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති. භබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

---

1. අග්ගිත්ථිකො - සීමු, මජසං, ස්‍යා, PTS.
2. අභිමන්ථෙය්‍ය - සීමු, ස්‍යා, PTS.
3. යෙහි කෙචි - සීමු, මජසං, PTS.

භූමිජය, යම් පරිදි ගිනි කැමැති ගිනි සොයන අග්නිපර්‍යෙෂණ කරන පුරුෂයෙක් සස්නේහ වූ තෙත් දඬුකඩක් ගෙන උතුරුරිණි ගෙන මථනය කරන්නේ වේ ද, ආශා කොට ද, සස්නෙහ තෙත් දඬුකඩ ගිනිගානා උතුරු දඬු ගෙන මඩනේ වේ ද, ගිනි ලබන්නට නො නිස්ස, අනාශා කොට ද . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොට ද අනාශා නො කොට ද සස්නෙහ ආර්ද්‍ර කාෂ්ටය ගිනිගානා උතුරු දඬු ගෙන මඩනේ වේ ද, ගිනි ලබන්නට නො නිස්ස. ඒ කවර හෙයින යත් : භූමිජය, ගිනි ලබන්නට තෙල අනුපාය වේ ද එහෙයිනි. භූමිජය, එපරිදි මැ යම් මැ මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු . . . මිථ්‍යාසමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොට ද, බ්‍රම්සර පුරත් නම්, ඵලාධිගමයට අභව්‍ය වෙති, අනාශා කොට ද . . . ආශාත් අනාශාත් කොට ද . . . ආශා නො කොට ද අනාශා නො කොට ද බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට අභව්‍ය වෙති. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල අනුපාය වෙයි, එහෙයිනි.

භූමිජය, යම් කිසි මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි සම්‍යග් දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්සංකල්ප ඇත්තාහු සම්‍යග්වචන ඇත්තාහු සම්‍යක්කර්මාන්ත ඇත්තාහු සම්‍යගාජීව ඇත්තාහු සම්‍යග්ව්‍යායාම ඇත්තාහු සම්‍යක්ස්මෘති ඇත්තාහු සම්‍යක්සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොට ද බ්‍රහ්මචර්‍ය්‍යී පුරත් නම්, ඵලාධිගමයට භව්‍යයහ, අනාශා කොට ද බ්‍රහ්මචර්‍ය්‍යීය කෙරෙත් නම්, ඵලාධිගමයට යොග්‍යයහ. ආශා ද අනාශා ද කොටත් බ්‍රහ්මචර්‍ය්‍යීය කෙරෙත් නම්, ඵලාධිගමයට යුතුවහ. ආශා නො කොට ද අනාශා නො කොට ද බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට සුදුසුයහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල උපාය වෙයි, එහෙයිනි.

භූමිජය, යම් පරිදි තෙල් කැමැති තෙල් සොයන තෙලපර්යෙෂණ කරන පුරුෂයෙක් තලපිටි පැසෙහි එව දිය ඉස ඉස පෙළන්නේ වේ ද, ආශා කොටත් තලපිටි පැස එව දිය ඉස ඉස පෙළන්නේ වේ ද, තෙල් ලබන්නට නිස්ස, අනාශා කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් තලපිටි පැස එව දිය ඉස ඉස පෙළන්නේ වේ ද, තෙල් ලබන්නට නිස්ස. එ කවර හෙයින යත් : භූමිජය, තෙල් ලබන්නට තෙල උපාය වේ ද එහෙයිනි. භූමිජය, එපරිදි මැ යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු . . . සම්‍යක්සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොටත් බ්‍රම්සර සෙරෙත් නම්, ඵලාධිගමයට නිසි වෙති, ආශා නො කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් බඹසර වෙසෙත් නම් ඵලාධිගමයට භව්‍ය වෙති. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල උපාය වේ ද, එහෙයිනි.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො ඛීරත්ථිකො ඛීරගවෙසී ඛීරපරියෙසනං චරමානො ගාවිං තරුණවච්ඡං ථනතො ආවිඤ්ඡෙය්‍ය, ආසඤ්චෙපි කරිත්වා ගාවිං තරුණවච්ඡං ථනතො ආවිඤ්ඡෙය්‍ය, භබ්බො ඛීරස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා ගාවිං තරුණවච්ඡං ථනතො ආවිඤ්ඡෙය්‍ය, භබ්බො ඛීරස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඛීරස්ස අධිගමාය. එවමෙව බො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා සම්මාදිට්ඨිනො-පෙ-සම්මාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා-පෙ-බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො නොනීතත්ථිකො නොනීතගවෙසී නොනීතපරියෙසනං චරමානො දධිං කලසෙ ආසිඤ්චිත්වා මත්ථෙන ආවිඤ්ඡෙය්‍ය, ආසඤ්චෙපි කරිත්වා දධිං කලසෙ ආසිඤ්චිත්වා මත්ථෙන ආවිඤ්ඡෙය්‍ය, භබ්බො නොනීතස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා-පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා දධිං කලසෙ ආසිඤ්චිත්වා මත්ථෙන ආවිඤ්ඡෙය්‍ය, භබ්බො නොනීතස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, නොනීතස්ස අධිගමාය. එවමෙව බො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා, සම්මාදිට්ඨිනො -පෙ- සම්මාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා -පෙ-ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා-පෙ-නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

සෙය්‍යථාපි භූමිජ, පුරිසො අග්ගිත්ථිකො අග්ගිගවෙසී අග්ගිපරියෙසනං චරමානො සුක්ඛං කට්ඨං කොළාපං උත්තරාරණිං ආදාය අභිමන්ථෙය්‍ය, භබ්බො අග්ගිස්ස අධිගමාය. ආසඤ්චෙපි කරිත්වා-පෙ-අනාසඤ්චෙපි කරිත්වා සුක්ඛං කට්ඨං කොළාපං උත්තරාරණිං ආදාය අභිමන්ථෙය්‍ය, භබ්බො අග්ගිස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා සුක්ඛං කට්ඨං කොළාපං උත්තරාරණිං ආදාය අභිමන්ථෙය්‍ය, භබ්බො අග්ගිස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා සුක්ඛං කට්ඨං කොළාපං උත්තරාරණිං ආදාය අභිමන්ථෙය්‍ය, භබ්බො අග්ගිස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, අග්ගිස්ස අධිගමාය. එවමෙව බො භූමිජ, යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා සම්මාදිට්ඨිනො-පෙ-සම්මාසමාධිනො, තෙ ආසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. ආසඤ්ච අනාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති භබ්බා ඵලස්ස අධිගමාය. නෙවාසං නානාසඤ්චෙපි කරිත්වා බ්‍රහ්මචරියං චරන්ති, භබ්බා ඵලස්ස අධිගමාය. තං කිස්ස හෙතු: යොනි හෙසා භූමිජ, ඵලස්ස අධිගමාය.

භූමිජය, යම් පරිදි කිරි කැමැති කිරි සොයන ක්ෂීරපර්යේෂණ කරන පුරුෂයෙක් තුරුණු වස්සකු ඇති දෙනක් තන ගෙන අදනේ වේ ද, ආශා කොටත් තුරුණු වසු ඇති දෙන තෙනෙහි ගෙන අදනේ වේ ද, කිරි ලබන්නට නිස්ස. ආශා නො කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් තුරුණු වසු ඇති දෙන තන ගෙන අදනේ වේ ද, කිරි ලබන්නට නිස්ස. එ, කවර හෙයින යත් : භූමිජය, කිරි ලබන්නට තෙල උපාය වේ ද එහෙයිනි. එසෙයින් ම භූමිජය, යම් කිසි මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව' යි සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු . . . සම්‍යක් සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොටත් . . . බ්‍රම්සර පුරත් නම් ඵලාධිගමයට යුතුවහ, අනාශා කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් බ්‍රම්සර සෙරෙත් නම් ඵලාධිගමයට භව්‍යයහ. ඒ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල උපාය වෙයි, එහෙයිනි.

භූමිජය, යම් පරිදි වෙඩරු කැමැති වෙඩරු ඉලියන වෙඩරු පිරියෙස්ලි කරන පුරුෂයෙක් කළයෙහි දිහි එවගෙන මතින් කලබන්නේ වේ ද, ආශා කොටත් කළයෙහි දිහි එවගෙන මතින් අලළන්නේ වේ ද, වෙඩරු ලබන්නට නිස්ස. අනාශා කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් කළයෙහි දිහි එවගෙන මතින් අලළන්නේ වේ ද, වෙඩරු ලබන්නට නිස්ස. ඒ කවර හෙයින යත් : භූමිජය, වෙඩරු ලබන්නට තෙල උපාය වෙයි, එහෙයිනි. භූමිජය, එපරිදි ම යම් කිසි මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු . . . සම්‍යක් සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොටත් බ්‍රම්සර පුරත් නම්, ඵලාධිගමයට භව්‍ය වෙති. අනාශා කොටත් . . . ආශා ද අනාශා ද කොටත් . . . ආශා නො කොටත් අනාශා නො කොටත් බ්‍රම්සර පුරත් නම්, ඵලාධිගමයට භව්‍ය වෙති, ඒ කවර හෙයින යත් : භූමිජය, තෙල ඵලාධිගමයට උපාය වෙයි, එහෙයිනි.

භූමිජය, යම් පරිදි ගිනි කැමැති ගිනි සොයන අග්නිපර්යේෂණ කරන පුරුෂයෙක් කොළපු වූ ශුෂ්කකාෂ්ටයක් ගෙන, උතුරුරිණි ගෙන, මඩනේ නම්, ගිනි ලබන්නට නිස්ස. ආශා කොටත් . . . අනාශා කොටත් කොළපු වූ වියළි දඬක් ගෙන ගිනිගානා උතුරු දඩු ගෙන මඩනේ නම්, ගිනි ලබන්නට නිස්ස. ආශා ද අනාශා ද කොටත් කොළපු වූ වියළි කට ගෙන උතුරුරිණි ගෙන මඩනේ නම්, ගිනි ලබන්නට නිස්ස, ආශා නො කොටත් අනාශා නො කොටත් වියළි කට හා උතුරුරිණි ගෙන මඩනේ නම්, ගිනි ලබන්නට නිස්ස. එ කවර හෙයින යත් : භූමිජය, ගිනි ලබන්නට තෙල උපාය වෙයි. එහෙයිනි. භූමිජය, එපරිදි ම යම් කිසි මහණ කෙනෙක් වෙත්ව ' යි බමුණු කෙනෙක් වෙත්ව ' යි සම්දිටු ඇත්තාහු . . . සම්‍යක්සමාධි ඇත්තාහු වෙත් ද, ඔහු ආශා කොටත් බ්‍රම්සර පුරත් නම්, ඵලාධිගමයට නිස්සහ. අනාශා කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට නිස්සහ, ආශා ද අනාශා ද කොටත් බඹසර සෙරෙත් නම් ඵලාධිගමයට නිස්සහ, ආශා නො කොටත් අනාශා නො කොටත් බඹසර සෙරෙත් නම්, ඵලාධිගමයට නිස්සහ. එ කවර හෙයින යත් : භූමිජය, ඵලාධිගමයට තෙල උපාය වේ ද එහෙයිනි.

සචෙ ඛො තං භූමිජ,[1] ජයසෙනස්ස රාජකුමාරස්ස ඉමා චතස්සො උපමා පටිභාසෙය්‍යුං, අනච්ඡරියං තෙ ජයසෙනො රාජකුමාරො පසීදෙය්‍ය. පසන්නො ච තෙ පසන්නාකාරං කරෙය්‍යාති.

කුතො පන මං භන්තෙ, ජයසෙනස්ස රාජකුමාරස්ස ඉමා චතස්සො උපමා පටිභාසිස්සන්ති. අනච්ඡරියා පුබ්බෙ අස්සුතපුබ්බා, සෙය්‍යථාපි භගවන්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා භූමිජො භගවතො භාසිතං අභිනන්දීති.

භූමිජසුත්තං ඡට්ඨං.

---

1. සචෙ ඛො භූමිජ - ස්‍යා, PTS.

භූමිජය, ඉදින් ජයසෙන් කුමර හට මේ සතර උපමාවෝ වැටහුණාහු නම්, '' ජයසෙන් කුමර තොපට පහදනේ ය '' යනු අසිරි නො වෙයි. '' පහන් ව තොපට පහන් අයුරු කරන්නේ ය '' යනුත් අසිරි නො වෙයි.

වහන්ස, ජයසෙන් කුමරහු පිළිබඳ කොට මේ සතර උපමාවෝ මා ලකුණු කොට එළිවෙත් ද ඔහු නැවත නැවත අසිරියට නිසියහ. පූර්වයෙහි නො ඇසූ විරූහ. භාග්‍යවතුන් වහන්සේට එළිදරව් වූවා සෙයිනැ ' යි.

භාග්‍යවතුන් වහන්සේ තෙල සූත්‍රය වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් භූමිජ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිමුඛ ව සතුටින් පිළිගත්හ.

සවැනි භූමිජ සූත්‍ර යි.

# 3. 3. 7

## අනුරුද්ධ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො පඤ්චකඞ්ගො ථපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: 'එහි ත්වං අම්භො පුරිස, යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො අනුරුද්ධස්ස පාදෙ සිරසා වන්දාහි. පඤ්චකඞ්ගො භන්තෙ, ථපති ආයස්මතො අනුරුද්ධස්ස පාදෙ සිරසා වන්දතී'ති. එවඤ්ච වදෙහි: අධිවාසෙතු කිර භන්තෙ, ආයස්මා අනුරුද්ධො පඤ්චකඞ්ගස්ස ථපතිස්ස ස්වාතනාය අත්තචතුත්ථො භත්තං, යෙන ච කිර භන්තෙ, ආයස්මා අනුරුද්ධො පගෙවතරං ආගච්ඡෙය්‍ය, පඤ්චකඞ්ගො භන්තෙ, ථපති බහුකිච්චො බහුකරණීයො රාජකරණීයෙනා'ති.

එවං භන්තෙති ඛො සො පුරිසො පඤ්චකඞ්ගස්ස ථපතිස්ස පටිස්සුත්වා යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: 'පඤ්චකඞ්ගො භන්තෙ, ථපති ආයස්මතො අනුරුද්ධස්ස පාදෙ සිරසා වන්දති. එවං ච වදෙති: 'අධිවාසෙතු කිර භන්තෙ, ආයස්මා අනුරුද්ධො පඤ්චකඞ්ගස්ස ථපතිස්ස ස්වාතනාය අත්තචතුත්ථො භත්තං. යෙන ච කිර භන්තෙ, ආයස්මා අනුරුද්ධො පගෙවතරං ආගච්ඡෙය්‍ය. පඤ්චකඞ්ගො භන්තෙ, ථපති බහුකිච්චො බහුකරණීයො රාජකරණීයෙනා'ති. අධිවාසෙසි ඛො ආයස්මා අනුරුද්ධො තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මා අනුරුද්ධො තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන පඤ්චකඞ්ගස්ස ථපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං අනුරුද්ධං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං අනුරුද්ධං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං අනුරුද්ධං එතදවොච:

ඉධ මං භන්තෙ[1] ථෙරා භික්ඛූ උපසඞ්කමිත්වා එවමාහංසු: 'අප්පමාණං ගහපති, චෙතොවිමුත්තිං භාවෙහී'ති. එකච්චෙ ථෙරා එවමාහංසු: 'මහග්ගතං ගහපති, චෙතොවිමුත්තිං භාවෙහී'ති. යා චායං භන්තෙ, අප්පමාණා චෙතොවිමුත්ති, යා ච මහග්ගතා චෙතොවිමුත්ති, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච? උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති?

තෙන හි ගහපති, තඤ්ඤෙවෙත්ථ පටිභාතු අපණ්ණකං තෙ ඉතො භවිස්සතීති.

---

1. ඉධ භන්තෙ – PTS.

# 3. 3. 7
# අනුරුද්ධ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඩුසිටුහු ගේ අරම්හි වැඩවසන සේක. එකල්හි පඤ්චකඞ්ග නම් වඩුදෙටුවාණෝ එක්තරා පුරුෂයකු ඇමතූහ : '' එම්බා පුරුෂය, තෙපි එව, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් කරා එළැඹ මා ගේ බසින් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් ගේ පාදයන් හිසින් වඳුව, ' වහන්ස, පඤ්චකඞ්ග ථපති ආයුෂ්මත් අනුරුද්ධ, තෙරණුවන් ගේ පාදයන් හිසින් වඳීයයි. මෙසේත් කියව : '' වහන්ස, ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන් වහන්සේ පඤ්චකඞ්ග ථපතිහු ගේ සෙට දින බත තමා සතරවනු ව ඉවසන සේක්වා, වහන්ස, පඤ්චකඞ්ග ථපති බොහෝ කිස ඇතියෙක, රාජකරණීයයෙන් බොහෝ කරණී ඇතියෙක, වහන්ස, එයින් ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන් වහන්සේ ඉතා අලුයම වඩනා සේක්ව '' යි.

' එසේ යැ වහන්සැ ' යි එපුරිස් පඤ්චකඞ්ග ථපති හට පිළිවදන් දී, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් කරා එළැඹියේය. එළැඹ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් සකසා වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් එපුරිස් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවනට තෙල සැලකෙළේ : '' වහන්ස, පඤ්චකඞ්ග ථපති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් ගේ පා හිසින් වඳී, මෙසේත් සැලකෙරෙයි : ' වහන්ස, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ පඤ්චකඞ්ග ථපතිහු ගේ සෙට බත ආත්මචතුර්ථ ව ඉවසන සේක්වා, වහන්ස, පඤ්චකඞ්ග ථපති බොහෝ කිස ඇතියෙක, රාජකරණීයයෙන් බොහෝ කරණී ඇතියෙක, වහන්ස, එයින් ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන් වහන්සේ ඉතා අලුයම වඩනේ මැනැවැ '' යි. ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ තුෂ්ණීම්භාවයෙන් ඉවසූහු. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ රෑගෙවීමෙන් පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙන පඤ්චකඞ්ග ථපතිහු ගේ නිවෙස්න කරා වැඩියෝ, වැඩැ පැන්වූ අස්නෙහි හුන්හු. එසඳ පඤ්චකඞ්ග ථපති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් ප්‍රණීත ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් සැතැපී. මොනොවට පැවරී. ඉක්බිති පඤ්චකඞ්ග ථපති වළඳා නිමවූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් වෙත අන්‍යතර නීචාසනයක් ගෙන එකත්පස් වැ හින, එකත්පස් වැ හුන් පඤ්චකඞ්ග ථපති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවනට තෙල සැලකළේ.

'' වහන්ස, ස්ථවිර භික්ෂූහු මා කරා එළැඹ මෙසේ කීහ : ' ගැහැවියෙනි, අප්‍රමාණ චේතොවිමුක්ති වඩව ' යි. කිසි තෙර කෙනෙක් මෙසේ කීහ : ' ගැහැවිය, මහද්ගත චේතොවිමුක්ති වඩව ' යි. වහන්ස, යම් අප්‍රමාණ චේතොවිමුක්තියෙක් ඇද්ද, යම් මහද්ගතචේතොවිමුක්තියෙක් ඇද්ද, මේ දහම්හු නානාර්‍ථ වෙත් ද, නානාව්‍යඤ්ජනත් වෙත් ද, නොහොත් එකාර්ථ වෙත් ද, ව්‍යඤ්ජනමාත්‍රය මැ වෙනස් වේ ද '' යි.

ගැහැවිය, එකරුණෙන් මෙහි ලා තොපට මැ වැටැහේවා, මෙයින් තොපට අවිරාධිත බවෙක් වෙයි.

මය්හං ඛො භන්තෙ, එවං හොති. යා චායං අප්පමාණා චෙතොවිමුත්ති, යා ච මහග්ගතා චෙතොවිමුත්ති, ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති.

යා චායං ගහපති, අප්පමාණා චෙතොවිමුත්ති, යා ච මහග්ගතා චෙතොවිමුත්ති, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච. තදමිනාපෙතං ගහපති, පරියායෙන වෙදිතබ්බං, යථා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.

කතමා ච ගහපති, අප්පමාණා චෙතොවිමුත්ති? ඉධ ගහපති භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා—පෙ—මුදිතාසහගතෙන චෙතසා—පෙ—උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං—පෙ—විහරති. අයං වුච්චති ගහපති අප්පමාණා චෙතොවිමුත්ති.

කතමා ච ගහපති මහග්ගතා චෙතොවිමුත්ති? ඉධ ගහපති භික්ඛු යාවතා එකං රුක්ඛමූලං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා රුක්ඛමූලානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයම්පි වුච්චති ගහපති මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති, භික්ඛු යාවතා එකං ගාමක්ඛෙත්තං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයම්පි වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති, භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා ගාමක්ඛෙත්තානි ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයම්පි වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති, භික්ඛු යාවතා එකං මහාරජ්ජං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයම්පි වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති, භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා මහාරජ්ජානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති, අයම්පි වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉධ පන ගහපති භික්ඛු යාවතා සමුද්දපරියන්තං පථවිං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයම්පි වුච්චති ගහපති, මහග්ගතා චෙතොවිමුත්ති. ඉමිනා ඛො එතං ගහපති පරියායෙන වෙදිතබ්බං යථා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.

චතස්සො ඛො ඉමා ගහපති, භවූපපත්තියො, කතමා චතස්සො? ඉධ ගහපති එකච්චො පරිත්තාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සො කායස්ස භෙදා පරම්මරණා පරිත්තාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. ඉධ පන ගහපති, එකච්චො අප්පමාණාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සො කායස්ස භෙදා පරම්මරණා අප්පමාණාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. ඉධ පන ගහපති, එකච්චො සඞ්කිලිට්ඨාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සො කායස්ස භෙදා පරම්මරණා සඞ්කිලිට්ඨාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. ඉධ පන ගහපති, එකච්චො පරිසුද්ධාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. සො කායස්ස භෙදා පරම්මරණා පරිසුද්ධාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. ඉමා ඛො ගහපති, චතස්සො භවූපපත්තියො.

'වහන්ස, මට මෙසේ සිත් වෙයි : යම් අප්‍රමාණචෙතොවිමුක්තියක් හා යම් මහද්ගතචෙතොවිමුක්තියක් හා ඇද්ද, මේ දහම්හු එකාර්ථයහ ව්‍යඤ්ජනමාත්‍රය මැ වෙන වෙන යැ කියා යි.

ගැහැවිය, යම් අප්‍රමාණචේතොවිමුක්තියක් හා යම් මහද්ගතචේතොවිමුක්තියක් හා ඇද්ද, මේ දහම්හු නානාර්ත්ථ ද වෙති, නානාව්‍යඤ්ජන ද වෙත්. යම් පරිදි මේ දහම්හු නානාර්ත්ථත් නානාව්‍යඤ්ජනත් වෙත් ද, ගැහැවිය, මේ ක්‍රමයෙනුදු තෙල දත්තේ මැනැව.

ගැහැවිය, අප්‍රමාණ චේතොවිමුක්ති නම් කවර : ගැහැවිය, මෙ සස්නෙහි මහණ මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වාස කෙරෙයි. දෙවන දිග එපරිදි ම ය, තෙවන දිග එපරිදි මය, සතරවන දිග එපරිදි මැ යි. මෙ සැටියෙන් උඩ ය, යට යැ සරස යැ, යි හැම තැන සර්‍වාත්මතායෙන් සියලු සතුන් ඇති ලොකය විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යාබාධ වූ මෛත්‍රිසහගත සිතින් පැතිරගෙන වාස කෙරෙයි. කරුණාසහගත සිතින් . . . මෘදුතාසහගත සිතින් . . . උපෙක්ෂා සහගත සිතින් එක් දිගක් පැතිරගෙන වාස කෙරෙයි. දෙවන දිග ද එසේ යැ . . . වාස කෙරෙයි. ගැහැවිය, මේ අප්‍රමාණචේතො විමුක්ති වෙයි.

ගැහැවිය, මහදග්තචේතොවිමුක්ති කවර : ගැහැවිය, මෙ සස්නෙහි මහණ එක් රුක් මුලක් පමණ තැන් මහද්ගත යයි පතුරුවා නිශ්චය කොට වාස කෙරෙයි. ගැහැවිය, මේ මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මෙ සස්නෙහි මහණ රුක්මුල් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි පතුරුවා නිශ්චය කොට වාස කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මෙ සස්නෙහි මහණ එක් ගම්කෙතක් පමණ තැන මහද්ගත යයි පතුරුවා නිශ්චය කොට වාස කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මෙ සස්නෙහි මහණ ගම්කෙත් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන මහද්ගත යයි පතුරුවා නිශ්චය කොට වාස කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මෙ සස්නෙහි මහණ එක් මහාරාජ්‍යයක් පමණ තැන් මහද්ගත යයි පතුරුවා නිශ්චය කොට වාස කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මෙ සස්නෙහි මහණ මහාරාජ්‍ය දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොටගෙන වාස කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය, මේ සස්නෙහි මහණ සමුද්‍ර පර්‍යන්ත පෘථුවිය පමණ තැන් මහත්ගත යයි අරමුණු කොට නිශ්චය කොටගෙන වාසය කෙරෙයි. ගැහැවිය, මෙ ද මහද්ගතචේතොවිමුක්ති යයි කියනු ලැබේ. ගැහැවිය යම් පරිදි මේ දහම්හු නානාර්ථත් වෙත් ද නානාව්‍යඤ්ජනත් වෙත් ද, තෙල මෙ කරුණිනුදු දතයුතු වේ.

ගැහැවිය, මේ භවොත්පත්තීහු සතරදෙනෙකි ; කවර සතරදෙනෙක යත් : ගැහැවිය, මෙ සස්නෙහි කිසි මහණෙක් ' පරිත්තාභ ' යයි අරමුණු කොට, නිශ්චය කොට වෙසෙයි, හේ කාබුන් මරණින් මතුයෙහි පරිත්තාභ දෙවියන් ගේ සහභාවයට පැමිණෙයි. ගැහැවිය, මෙ සස්නෙහි කිසි මහණෙක් ' අප්පමාණාභ ' යයි අරමුණු කොට අධිමොක්ෂ කොටගෙන වෙසෙයි. හේ කාබුන් මරණින් මතුයෙහි අප්පමාණාභ දෙවියන් ගේ සහභාවයට පැමිණෙයි. ගැහැවිය, මෙ සස්නෙහි කිසි මහණෙක් ' සංකිලිට්ඨාභ ' යයි අරමුණු කොට අධිමොක්ෂ වශයෙන් බැසගෙන වෙසෙයි. හේ කාබුන් මරණින් මතුයෙහි සංකිලිට්ඨාභ දෙවියන් ගේ සහභාවයට පැමිණෙයි. ගැහැවිය, මෙ සස්නෙහි කිසි මහණෙක් ' පරිසුද්ධාභ ' යයි අරමුණු කොට අධිමොක්ෂ වශයෙන් නිශ්චය කොටගෙන වෙසෙයි. හේ කාබුන් මරණින් මතුයෙහි පරිසුද්ධාභ දෙවියන් ගේ සහභාවයට පැමිණෙයි. ගැහැවිය, මේ සතර භවොප්පත්තීහු යි.

හොති ඛො සො ගහපති, සමයො, යා තා දෙවතා එකජ්ඣං සන්නිපතන්ති. තාසං එකජ්ඣං සන්නිපතිතානං වණ්ණනානත්තං හි ඛො පඤ්ඤායති. නො ච ආභානානත්තං. සෙය්‍යථාපි ගහපති, පුරිසො සම්බහුලානි තෙලප්පදීපානි එකං ඝරං පවෙසෙය්‍ය, තෙසං එකං ඝරං පවෙසිතානං අච්චිනානත්තං හි ඛො පඤ්ඤායෙථ නො ච ආභානානත්තං. එවමෙව ඛො ගහපති, හොති ඛො සො සමයො, යා තා දෙවතා එකජ්ඣං සන්නිපතන්ති, තාසං එකජ්ඣං සන්නිපතිතානං වණ්ණනානත්තං හි ඛො පඤ්ඤායති. නො ච ආභානානත්තං. හොති ඛො සො ගහපති සමයො, යා තා දෙවතා තතො විපක්කමන්ති, තාසං තතො විපක්කමන්තීනං වණ්ණනානත්තං චෙව පඤ්ඤායති, ආභානානත්තඤ්ච. සෙය්‍යථාපි ගහපති, පුරිසො තානි සම්බහුලානි තෙලප්පදීපානි තම්හා ඝරා නීහරෙය්‍ය තෙසං තතො නීහරන්තානං අච්චිනානත්තං චෙව පඤ්ඤායෙථ ආභානානත්තඤ්ච. එවමෙව ඛො ගහපති, හොති ඛො සො සමයො, යා තා දෙවතා තතො විපක්කමන්ති. තාසං තතො විපක්කමන්තීනං වණ්ණනානත්තං චෙව පඤ්ඤායති ආභානානත්තඤ්ච. න ඛො ගහපති, තාසං දෙවතානං එවං හොති: ඉදං අම්හාකං නිච්චන්ති වා ධුවන්ති වා සස්සතන්ති වා. අපි ච යත්ථ යත්ථෙව තා දෙවතා අධිවසන්ති[1] තත්ථ තත්ථෙව තා දෙවතා අභිරමන්ති. සෙය්‍යථාපි ගහපති, මක්ඛිකානං කාජෙන වා පිටකෙන වා හරීයමානානං න එවං හොති: ඉදං අම්හාකං නිච්චන්ති වා ධුවන්ති වා සස්සතන්ති වා, අපි ච යත්ථ යත්ථෙව තා මක්ඛිකා අභිනිවිසන්ති, තත්ථ තත්ථෙව තා මක්ඛිකා අභිරමන්ති. එවමෙව ඛො ගහපති තාසං දෙවතානං න එවං හොති: ඉදං අම්හාකං නිච්චන්ති වා ධුවන්ති වා සස්සතන්ති වා, අපි ච යත්ථ යත්ථෙව තා දෙවතා අධිවසන්ති, තත්ථ තත්ථෙව තා දෙවතා අභිරමන්තීති.

එවං වුත්තෙ ආයස්මා සභියො කච්චානො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: සාධු භන්තෙ අනුරුද්ධ, අත්ථි ච මෙ එත්ථ උත්තරිං පටිපුච්ඡිතබ්බං. යා තා භන්තෙ දෙවතා ආභා, සබ්බා තා පරිත්තාභා? උදහු සන්තෙත්ථ එකච්චා දෙවතා අප්පමාණාභාති?

තදඞ්ගෙන ඛො ආවුසො කච්චාන, සන්ති පන එත්ථ[2] එකච්චා දෙවතා පරිත්තාභා, සන්ති පනෙත්ථෙකච්චා දෙවතා අප්පමාණාභාති.

කො නු ඛො භන්තෙ අනුරුද්ධ, හෙතු, කො පච්චයො, යෙන තාසං දෙවතානං එකං දෙවනිකායං උපපන්නානං සන්තෙත්ථෙකච්චා, දෙවතා පරිත්තාභා? සන්ති පනෙත්ථෙකච්චා දෙවතා අප්පමාණාභාති?

තෙන හාවුසො කච්චාන, තංයෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා එකං රුක්ඛමූලං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා රුක්ඛමූලානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගතතරාති?

1. අභිනිවිසන්ති - සීමු. PTS
2. සන්තෙත්ථ - මජසං.

ගැහැවිය, යම් කලෙක ඒ දෙවියෝ එක්රැස් වෙත් ද, එබඳු කලෙක් වෙයි. එක්රැස් වූ ඒ දෙවියන් ගේ වර්ණනානාත්වය මැ පැනෙයි, ආලොකනානාත්වයෙක් නො ද පැනෙයි. යම්සේ ගැහැවිය, පුරුෂයෙක් බොහෝ තෙල්පහන් එක් ගෙයකට ප්‍රවෙශ කරන්නේ නම්, ඒ එක් ගෙයකට ප්‍රවෙශ කළ ප්‍රදීපයන් ගේ ගිනිසිළු වෙනස මැ පැනෙයි, ආලොකනානාත්වයෙක් නො ද පැනෙයි. එසෙයින් මැ ගැහැවිය, ඒ දෙවියෝ යම් කලෙක එක්රැස් වෙත් ද, එබඳු කලෙක් වෙයි. එක්රැස් වූ ඒ දෙවියන් ගේ වර්ණනානාත්වය මැ පැනෙයි, ආලොකනානාත්වයෙක් නො ද පැනේ. ගැහැවිය, යම් කලෙක ඒ දෙවියෝ එතැනින් නික්මයෙත් ද, එබඳු කලෙක් වෙයි. එයින් නික්මයන ඒ දෙවියන් ගේ ශරීරවර්ණයා ගේ නානාත්වය ද ආලොකයෙහි නානාත්වය ද පැනෙයි. යම් පරිදි ගැහැවිය, පුරුෂයෙක් ඒ බොහෝ වූ තෙල් පහන් ඒ ගෙයින් බැහැර කරන්නේ නම්, එයින් බැහැර කරන ඒ ප්‍රදීපයන් ගේ සිළුනානාත්වයත් ආලොකයෙහි නානාත්වයත් පැනෙයි. එපරිදි ම ගැහැවිය, යම් කලෙක ඒ දෙවියෝ එතැනින් නික්මයෙත් ද, එබඳු කලෙක් වෙයි. ඉන් නික්මයන ඒ දෙවියන් ගේ ශරීරවර්ණනානාත්වය ද ආලොකයෙහි නානාත්වය ද පැනේ. ගැහැවිය, ඒ දෙවියනට මෙබඳු සිතෙක් නො මැ වෙයි : ' මේ අපට නිත්‍ය යැයි හෝ ධ්‍රැව යැයි හෝ ශාශ්වත හෝ වේ යැ ' යි කියා යි. තවද ඒ දෙවියෝ උයන් විමන් කප්රුක් ඈ යම් යම් තැනෙක්හි මැ වෙසෙත් ද, ඒ ඒ තැන්හි ඒ දෙවියෝ රමණය කෙරෙත්. ගැහැවිය, යම් පරිදි කදෙකින් හෝ පැසෙකින් හෝ ගෙනයනු ලබන මැස්සනට " මේ අප ගේ නිත්‍යස්ථාන යයි හෝ ධ්‍රැවස්ථාන යයි හෝ ශාශ්වතස්ථාන යයි හෝ මෙබඳු සිත් නො වන්නේ වේ ද, වැලිත් යම් යම් තැනෙක ඒ මැස්සෝ වැදගනිත් ද, ඒ ඒ තැන්හි මැ ඒ මැස්සෝ රමණය කෙරෙත් ද, ගැහැවිය, එපරිදි ම ඒ දෙවියනට " මේ අප ගේ නිත්‍යස්ථාන යයි හෝ ධ්‍රැවස්ථාන යයි හෝ ශාශ්වතස්ථාන යයි හෝ මෙබඳු සිත් නො වේ. වැලිත් යම් යම් තැනෙක්හි මැ ඒ දෙවියෝ වෙසෙත් ද, ඒ ඒ තැන්හි මැ ඒ දෙවියෝ රමණය කෙරෙත්.

මෙසේ කී කල ආයුෂ්මත් සභිය කච්චායන තෙර ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවනට තෙල සැලකළේ : " වහන්ස, අනුරුද්ධයෙනි, මැනැවැ, මෙහි ලා මා විසින් මතුයෙහි පිළිවිසියැ යුතු දෑයෙක් ඇත්තේ ද වෙයි. වහන්ස, යම් ආභ දෙව් කෙනෙක් ඇද්ද, ඒ හැම දෙවියෝ පරිත්තාභ වෙත් ද, නොහොත් අප්පමාණාභ වූ කිසි දෙව් කෙනෙක් ඇද්ද ?

ඇවැත් කාත්‍යායනයෙනි, ඒ භවොපපත්ති කාරණයෙන් මෙහි පරිත්තාභ වූ කිසි දෙව් කෙනෙක් ඇත. මෙහි අප්පමාණාභ වූ කිසි දෙව් කෙනෙක් ද ඇත.

වහන්ස, අනුරුද්ධයෙනි, යම් හෙයකින් එක් මැ දෙවනිකායට වැදගෙන සිටුනා ඒ දෙවියන් අතුරින් මෙහි ලා පරිත්තාභ වූ කිසි දෙව් කෙනෙක් ඇද්ද, මෙහි ලා අප්පමාණාභ වූ කිසි දෙව් කෙනෙක් ඇද්ද, එයට කවර හෙතු යැ ? කවර ප්‍රත්‍යය යැ ?

ඇවැත් කාත්‍යායනයෙනි, එකරුණින් මෙහි ලා තොප ම පුළුවුස්මි : යම් පරිදි තොපට රුස්නේ නම් එපරිදි එය ප්‍රකාශ කරව, ඇවැත් කාත්‍යායනයෙනි, ඒ කිමැයි හඟනාව ? යම් මහණෙක් එක් රුක්මුලක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොටගෙන අධිමොක්ෂ වශයෙන් බැසගෙන වෙසේ ද, යම් මහණෙක් රුක්මුල් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ වශයෙන් නිශ්චය කොටගෙන වෙසේ ද, මේ උභය චිත්තභාවනා අතුරින් කවර චිත්තභාවනායෙක් මහද්ගතතර වේ ද ?

ය්වායං භන්තෙ භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා රුක්ඛමූලානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා රුක්ඛමූලානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා එකං ගාමක්ඛෙත්තං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගතතරාති?

ය්වායං භන්තෙ භික්ඛු යාවතා එකං ගාමක්ඛෙත්තං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා එකං ගාමක්ඛෙත්තං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා ගාමක්ඛෙත්තානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගතතරාති?

ය්වායං භන්තෙ භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා ගාමක්ඛෙත්තානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා ගාමක්ඛෙත්තානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා එකං මහාරජ්ජං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගතතරාති?

ය්වායං භන්තෙ, භික්ඛු යාවතා එකං මහාරජ්ජං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා එකං මහාරජ්ජං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා මහාරජ්ජානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගත-තරාති?

ය්වායං භන්තෙ භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා මහාරජ්ජානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

තං කිම්මඤ්ඤසි ආවුසො කච්චාන, ය්වායං භික්ඛු යාවතා ද්වෙ වා තීණි වා මහාරජ්ජානි මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. යො චායං භික්ඛු යාවතා සමුද්දපරියන්තං පඨවිං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. ඉමාසං උභින්නං චිත්තභාවනානං කතමා චිත්තභාවනා මහග්ගතතරාති?

වහන්ස, යම් මහණෙක් රුක්මුල් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ වශයෙන් බැසගෙන වාස කෙරේ නම්, මේ භාවනාව මේ උභය චිත්තභාවනාවන් අතුරෙන් මහද්ගතතර වේ යයි.

ඇවැත් කාත්‍යායනයෙනි, ඒ කිමැයි හඟනාව ? යම් මහණෙක් රුක්මුල් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොට වෙසේ ද, තවද යම් මහණෙක් එක් ගම්කෙතක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොට ගෙන වෙසේ ද, මේ උභයචිත්තභාවනාවන් අතුරෙන් කවරක් මහද්ගතතර වේ දැ ' යි.

වහන්ස, යම් මහණෙක් එක් ගම්කෙතක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොටගෙන වෙසේ ද, මේ භාවනාව මේ උභයචිත්තභාවනාවන් අතුරෙන් මහද්ගත තර වේ යයි.

ඇවැත් කාත්‍යායනයෙනි, ඒ කිමැයි හඟනාව ? යම් මහණෙක් එක් ගම්කෙතක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට දැනගෙන වෙසේ ද, තවද යම් මහණෙක් ගම්කෙත් දෙකක් තුනක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට දැනගෙන වෙසේ ද, මේ උභය චිත්තභාවනාවන් අතුරෙන් කවර චිත්තභාවනායෙක් මහද්ගතතර වේ දැ ' යි.

වහන්ස, යම් මහණෙක් ගම්කෙත් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් අරමුණු කොට අධිමොක්ෂ කොට වාස කෙරේ ද, මේ චිත්තභාවනාව මේ උභයචිත්තභාවනාවන් අතුරින් මහද්ගතතර වෙයි.

ඇවැත් කාත්‍යායනයෙනි, ඒ කුමැයි හඟනාව ? යම් මහණෙක් ගම්කෙත් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොටගෙන වෙසේ ද, යම් මහණෙක් එක් මහරජයක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොට ගෙන වෙසේ ද, මේ උභයචිත්තභාවනාවන් අතුරින් කවර චිත්තභාවනායෙක් මහද්ගතතර වේ දැ ' යි.

වහන්ස, යම් මහණෙක් එක් මහරජයක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වෙසේ ද, මේ චිත්තභාවනාව මේ උභයචිත්තභාවනාවන් අතුරින් මහද්ගතතර වෙයි.

ඇවැත් කාත්‍යායනයෙනි, යම් මහණෙක් එක් මහරජයක් පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට නිශ්චය කොටගෙන වෙසේ ද, යම් මහණෙක් මහරජයන් දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් අරමුණු කොට නිශ්චය කොටගෙන වෙසේ ද, මේ උභය චිත්ත භාවනාවන් අතුරින් කවර චිත්තභාවනායෙක් මහද්ගතතර වේ දැ ' යි.

වහන්ස, යම් මහණෙක් මහරජ දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වෙසේ ද, මේ චිත්තභාවනාව මේ උභයචිත්තභාවනාවන් අතුරින් මහද්ගතතර වෙයි.

ඇවැත් කාත්‍යායනයෙනි, ඒ කුමැයි හඟනාව ? යම් මහණෙක් මහරජ දෙකක් හෝ තුනක් හෝ පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වෙසේ ද, යම් මහණෙක් සමුද්‍රපර්‍ය්‍යන්ත පෘථිවිය පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වාස කෙරේ ද, මේ උභයචිත්තභාවනාවන් අතුරින් කවර චිත්තභාවනායෙක් මහද්ගතතර වේ දැ ' යි.

ය්වායං භන්තෙ, භික්ඛු යාවතා සමුද්දපරියන්තං පථවිං මහග්ගතන්ති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. අයං ඉමාසං උභින්නං චිත්තභාවනානං මහග්ගතතරාති.

අයං ඛො ආවුසො කච්චාන, හෙතු අයං පච්චයො, යෙන තාසං දෙවතානං එකං දෙවනිකායං උපපන්නානං සන්තෙකච්චා දෙවතා පරිත්තාභා, සන්ති පනෙකච්චා දෙවතා අප්පමාණාභාති.

සාධු භන්තෙ අනුරුද්ධ, අත්ථි ච මෙ එත්ථ උත්තරිං පටිපුච්ඡිතබ්බං. යාවතා භන්තෙ, දෙවතා ආභා, සබ්බා තා සඞ්කිලිට්ඨාභා? උදාහු සන්තෙකච්චා දෙවතා පරිසුද්ධාභාති?

තදඞ්ගෙන ඛො ආවුසො කච්චාන, සන්තෙකච්චා දෙවතා සඞ්කිලිට්ඨාභා සන්ති පනෙකච්චා දෙවතා පරිසුද්ධාභාති.

කො නු ඛො භන්තෙ අනුරුද්ධ, හෙතු කො පච්චයො, යෙන තාසං දෙවතානං එකං දෙවනිකායං උපපන්නානං සන්තෙකච්චා දෙවතා සඞ්කිලිට්ඨාභා සන්ති පනෙකච්චා දෙවතා පරිසුද්ධාභාති.

තෙන හාවුසො කච්චාන, උපමං තෙ කරිස්සාමි. උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි ආවුසො කච්චාන, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අපරිසුද්ධං, වට්ටිපි අපරිසුද්ධා, සො තෙලස්සපි අපරිසුද්ධත්තා වට්ටියාපි අපරිසුද්ධත්තා අන්ධන්ධං විය ඣායති. එවමෙව ඛො ආවුසො කච්චාන, ඉධෙකච්චො භික්ඛු සංකිලිට්ඨාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස කායදුට්ඨුල්ලම්පි න සුප්පටිප්පස්සද්ධං හොති. ථීනමිද්ධම්පි න සුසමූහතං හොති. උද්ධච්චකුක්කුච්චම්පි න සුප්පටිවිනීතං හොති. සො කායදුට්ඨුල්ලස්සපි න සුප්පටිප්පස්සද්ධත්තා ථීනමිද්ධස්සපි න සුසමූහතත්තා උද්ධච්චකුක්කුච්චස්සපි න සුප්පටිවිනීතත්තා අන්ධන්ධං විය ඣායති. සො කායස්ස භෙදා පරම්මරණා සංකිලිට්ඨාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. සෙය්‍යථාපි ආවුසො කච්චාන, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි පරිසුද්ධං, වට්ටිපි පරිසුද්ධා, සො තෙලස්සපි පරිසුද්ධත්තා වට්ටියාපි පරිසුද්ධත්තා න අන්ධන්ධං විය ඣායති. එවමෙව ඛො ආවුසො කච්චාන, ඉධෙකච්චො භික්ඛු පරිසුද්ධාභාති ඵරිත්වා අධිමුච්චිත්වා විහරති. තස්ස කායදුට්ඨුල්ලම්පි සුප්පටිප්පස්සද්ධං හොති. ථීනමිද්ධම්පි සුසමූහතං හොති. උද්ධච්චකුක්කුච්චම්පි සුප්පටිවිනීතං හොති. සො කායදුට්ඨුල්ලස්සපි සුප්පටිප්පස්සද්ධත්තා ථීනමිද්ධස්සපි සුසමූහතත්තා උද්ධච්චකුක්කුච්චස්සපි සුප්පටිවිනීතත්තා න අන්ධන්ධං විය ඣායති. සො කායස්ස භෙදා පරම්මරණා පරිසුද්ධාභානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

අයං ඛො ආවුසො කච්චාන, හෙතු අයං පච්චයො, යෙන තාසං දෙවතානං එකං දෙවනිකායං උපපන්නානං සන්තෙකච්චා දෙවතා සඞ්කිලිට්ඨාභා, සන්ති පනෙකච්චා දෙවතා පරිසුද්ධාභාති.

එවං වුත්තෙ ආයස්මා සභියො කච්චානො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච : 'සාධු භන්තෙ අනුරුද්ධ, න භන්තෙ, ආයස්මා අනුරුද්ධො එවමාහ : එවං මෙ සුතන්ති වා, එවං අරහති භවිතුන්ති වා.

වහන්ස, යම් මහණෙක් සමුද්‍රපර්‍යන්ත පෘථිවිය පමණ තැන් මහද්ගත යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වාස කෙරේ ද, මේ චිත්තභාවනාව මේ උභයචිත්තභාවනාවන් අතුරින් මහද්ගතතර වෙයි.

ඇවැත් කාත්‍යායනයෙනි, යම් කරුණෙකින් එක් දේවනිකායකට පැමිණි ඒ දෙවියන් අතුරින් මෙහි කිසි පරිත්තාභ දෙවි කෙනෙක් ඇද්ද, මෙහි අප්පමාණාභ කිසි දෙවිකෙනෙක් ඇද්ද, මේ එයට හෙතු යැ, මේ එයට ප්‍රත්‍යයැ ' යි.

වහන්ස, අනුරුද්ධයෙනි, මනා මැ ය, මෙහි දී මා විසින් මතුයෙහි ඇසියයුතු පැනයෙක් ද ඇත. වහන්ස, යම් පමණ ආභ දෙවියෝ ඇද්ද, එ හැම දෙවියෝ සඞ්කිලිට්ඨාභ වෙත් ද, නොහොත් මෙහි කිසි දෙවිකෙනෙක් පරිසුද්ධාභ වූවාහු ඇද්ද ?

ඇවැත් කාත්‍යායනයෙනි, තදඞ්ගවශයෙන් මෙහි සඞ්කිලිට්ඨාභ කිසි දෙවි කෙනෙක් ඇත, මෙහි පරිසුද්ධාභ කිසි දෙවි කෙනෙක් ද ඇත.

වහන්ස, අනුරුද්ධයෙනි, යම් කරුණෙකින් එක් දේවනිකායකට පැමිණි ඒ දෙවියන් අතර සඞ්කිලිට්ඨාභ කිසි දෙවි කෙනෙක් ඇද්ද, පරිසුද්ධාභ කිසි දෙවි කෙනෙක් ඇද්ද, ඊට හේතු කවරේ ය ? ඊට ප්‍රත්‍යය කවරේ යැ' යි.

ඇවැත් කාත්‍යායනයෙනි, එකරුණින් තොපට උපමාවක් කරමි : මෙ ලොවැ කිසි විඥපුරුෂ කෙනෙක් උපමායෙනුදු භාෂිතයා ගේ අර්ථය අවබොධ කොට දනිත්. ඇවැත් කාත්‍යායනයෙනි, යම් පරිදි දූල්වෙන තෙල්පහනක්හු ගේ තෙලුදු නො පිරිසිදු වේ නම්, වැටිදු නො පිරිසිදු වේ නම්, ඒ පහන තෙල් නො පිරිසිදු හෙයිනුදු වැටි නො පිරිසිදු හෙයිනුදු අතිශයින් අඳුරු වූවක් සෙයින් දිලෙයි. ඇවැත් කාත්‍යායනයෙනි, එපරිදි ම මෙ සස්නෙහි කිසි මහණෙක් සංකිලිට්ඨාභ යයි අරමුණු කොට අධිමොක්ෂ කොට වාස කෙරේ ද, ඔහු ගේ දෙෂනිශ්ශ්‍රිත කය ත් නො සන්හිඳුණේ වේ ද, ථීනමිද්ධයත් නො නැසුණේ වේ ද, උද්ධච්ච කුක්කුච්චයත් මොනොවට විනීත නො වේ ද, හේ කායදුට්ඨුල්ලය නො සන්හුන් බැවිනුදු ථීනමිද්ධය නො නට බැවිනුදු උද්ධච්චකුක්කුච්චය අවිනීත බැවිනුදු වැඩිපමණ අඳුරු වූවාක් සෙයින් දිලෙයි. හේ කාබුන් මරණින් මතු සඞ්කිලිට්ඨාභ දෙවියන් ගේ සභභාවයට පැමිණෙයි. ඇවැත් කාත්‍යායනයෙනි, යම් පරිදි දූල්වෙන තෙල්පහනක්හු ගේ තෙලත් පිරිසිදු වේ ද, වැටිත් පිරිසිදු වේ ද, ඒ පහන තෙලත් පිරිසිදු හෙයිනුදු වැටිත් පිරිසිදු හෙයිනුදු වැඩිපමණ අඳුරු වූවාක් සෙයින් නො දිලේ ද, ඇවැත් කාත්‍යායනයෙනි, එපරිදි ම මෙසස්නෙහි කිසි මහණෙක් පරිසුද්ධාභ යයි අරමුණු කොට නිශ්චය කොට වෙසේ ද, ඔහු ගේ කායදුට්ඨුල්ලයත් සන්හුන් වේ ද, ථීනමිද්ධයත් නටුයේ වේ ද, උද්ධච්චකුක්කුච්ච යත් විනීත වේ ද, ඒ මහණ කායදුට්ඨුල්ලයත් සන්හුන් හෙයින් ථීනමිද්ධයත් නටහෙයින් උද්ධච්චකුක්කුච්චයත් විනීත හෙයින් අතිශයින් අඳුරු වූවාක් සෙයින් නො දිලෙයි. හේ කාබුන් මරණින් මතු පරිසුද්ධාභ දෙවියන් ගේ සභභාවයට පැමිණෙයි.

ඇවැත් කාත්‍යායනයෙනි, එක් දෙවනිකායකට පැමිණි ඒ දෙවියන් අතර සඞ්කිලිට්ඨාභ වූ කිසි දෙවි කෙනෙක් ඇද්ද, පරිසුද්ධාභ වූ කිසි දෙවි කෙනෙක් ඇද්ද, මේ ඊට හේතු යැ, මේ ඊට ප්‍රත්‍යය යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් සභිය කාත්‍යායන ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවනට තෙල කී : '' වහන්ස, අනුරුද්ධයෙනි, මැනැව. වහන්ස, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ මෙසේ නො කියති. කිසේ යැ යත් : ' මා විසින් මෙසේ අසන ලද ' යි කියා හෝ ' මෙසේ වන්නට නිස්සැ ' යි කියා හෝ '' යි.

අථ ච පන භන්තෙ, ආයස්මා අනුරුද්ධො 'එවම්පි තා දෙවතා ඉතිපි තා දෙවතා'ත්වෙව භාසති. තස්ස මය්හං භන්තෙ, එවං හොති: අද්ධායස්මතා අනුරුද්ධෙන තාහි දෙවතාහි සද්ධිං සන්නිවුත්ථපුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බාති.

අද්ධා ඛො තෙ අයං ආවුසො කච්චාන, ආසජ්ජ උපනීය වාචා භාසිතා. අපි ච තෙ අහං ව්‍යාකරිස්සාමි. දීඝරත්තං ඛො මෙ ආවුසො කච්චාන, තාහි දෙවතාහි සද්ධිං සන්නිවුත්ථපුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බාති.

එවං වුත්තෙ ආයස්මා සභියො කච්චානො පඤ්චකඞ්ගං ථපතිං එතදවොච: 'ලාභා තෙ ගහපති. සුලද්ධං තෙ ගහපති. යං ත්වං චෙව තං කඞ්ඛාධම්මං පහාසි. මයඤ්චි'මං ධම්මපරියායං අලත්ථම්හා සවණායා'ති.

අනුරුද්ධ සුත්තං සත්තමං

තවද වහන්ස, ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ '' ඒ දෙවියෝ මෙසේත් වෙති, ඒ දෙවියෝ මේ අයුරු වෙති '' යි කියා ම කියති. වහන්ස, මට මෙබඳු සිතෙක් වෙයි : එකාන්තයෙන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ඒ දෙවියන් හා එක්ව විසූවිරුහ, සල්ලාප කළ විරුහ, සාකච්ඡා කළවිරුහ, කියා යි.

ඇවැත් කාත්‍යායනයෙනි, තොප විසින් සටා නිගා එළවා බස් පැවැසිණ, වැලිත් මම තොපට කියමි : ' ඇවැත් කාත්‍යායනයෙනි, මා දීර්ඝරාත්‍රයෙහි ඒ දෙවියන් හා විසූවිරු ඇත, සල්ලාප කළවිරු ඇත, සාකච්ඡා කළවිරු ඇතැ ' යි.

මෙසේ කී කල ආයුෂ්මත් සභිය කාත්‍යායන පඤ්චකඞ්ග ථපති හට තෙල කී : ' ගැහැවිය, තොපට ලාභයෙක, ගැහැවිය, තොපට සුලද්ධයෙකි, යම් හෙයකින් තෙපිදු ඒ සැක දහම හැරපියව් ද, අපිත් මේ ධර්මපර්යාය අසන්නට ලදුමෝ ද එහෙයිනි.

**සත්වැනි අනුරුද්ධ සූත්‍ර යි.**

# 3. 3. 8

## උපක්කිලෙස සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන කොසම්බියං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ඉධ භන්තෙ, කොසම්බියං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. සාධු භන්තෙ, භගවා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො භගවා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච : 'අලං භික්ඛවෙ, මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද'න්ති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච. ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමි. අප්පොස්සුක්කො භන්තෙ, භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු. මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමාති.

දුතියම්පි ඛො භගවා තෙ භික්ඛූ එතදවොච : 'අලං භික්ඛවෙ, මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද'න්ති.

දුතියම්පි ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමි. අප්පොස්සුක්කො භන්තෙ, භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු. මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමාති.

තතියම්පි ඛො භගවා තෙ භික්ඛූ එතදවොච : අලං භික්ඛවෙ, මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද'න්ති.

තතියම්පි ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : 'ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමි. අප්පොස්සුක්කො භන්තෙ, භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමාති.

# 3. 3. 8

# උපක්කිලෙස සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩවසන සේක. එකල කොසඹෑනුවර මහණහු හටගත් භණ්ඩන ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදපන්න වූවාහු උනුන් මුවසැතින් පෙළන්නාහු වෙසෙති. ඉක්බිති අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව සිටියේය. එකත්පස් ව සිටි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : " වහන්ස, මේ කොසඹෑනුවර මහණහු හටගත් භණ්ඩන ඇති ව හටගත් කලහ ඇති ව විවාදයට පැමිණ, උනුන් මුවසැතින් පෙළමින් වෙසෙති. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන් කරා අනුකම්පා පිණිස වඩනේ මැනැවැ ' යි ඇයැද සිටිමි " යි, භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් අධිවාසනා කළෙඃ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුන් කරා එළැඹි සේක. එළඹ ඒ මහණුනට මෙසේ වදළෝ : " මහණෙනි, කම් නැත, නහමක් භණ්ඩන කරව, නහමක් කලහ කරව, නහමක් විග්‍රහ කරව, නහමක් විරුද්ධවාද කරව " යි.

මෙසේ වදළ කල අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : " වහන්ස, ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ බලන සේක්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අල්පොත්සුක ව දෘෂ්ටධර්මසුඛවිහරණයෙහි අනුයුක්ත ව වැඩවසන සේක්වා. අපි මෙසේ භණ්ඩන කලහ විග්‍රහ විවාදයෙන් පැනෙම්හ " යි.

දෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුනට මෙසේ වදළෝ : " මහණෙනි, කම් නැත, භණ්ඩන නො කරව, කලහ නො කරව, විග්‍රහ නො කරව, විවාද නො කරව " යි.

දෙවනවටත් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ : "වහන්ස, ධර්ම ස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අල්පොත්සාහ ව ඉහාත්මසුඛවිහාරයෙහි අනුයුක්ත ව වසන සේක්වා, මෙසේ භණ්ඩනයෙන් කලහයෙන් විරුද්ධග්‍රහණයෙන් විරුද්ධවාදයෙන් අපි පැනෙම්හ " යි.

තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ ඒ මහණුනට මෙසේ වදළෝ : " මහණෙනි, කම් නැත, භණ්ඩන නො කරන්නේ මැනැව, කලහ නො කරන්නේ මැනැව, විග්‍රහ නො කරන්නේ මැනැව, විවාද නො කරන්නේ මැනැවැ " යි.

තෙවනවටත් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ. "වහන්ස, නවත්නේ මැනැව, වහන්ස, ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ නිරුත්සුක ව මෙලොවැ සුඛ විහරණයෙහි යෙදුණාහු වැඩවසන සේක්වා. අපි මෙසේ භණ්ඩන කලහ විග්‍රහ විවාදයෙන් පැනෙම්හ " යි.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කොසම්බිං පිණ්ඩාය පාවිසි. කොසම්බියං[1] පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය ඨිතකොව ඉමා ගාථා අභාසි :

පුථු සද්දො සමජනො න බාලො කොචි මඤ්ඤථ,
සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං නාඤ්ඤං භියො අමඤ්ඤථ[2]

පරිමුට්ඨා පණ්ඩිතා භාසා වාචා ගොචරභාණිනො,
යාවිච්ඡන්ති මුඛායාමං යෙන නීතා න තං විදූ.

අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ ච තං[3] උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො.

පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

අට්ඨිච්ඡින්නා[4] පාණහරා ගවාස්සධනහාරිනො,
රට්ඨං විලුම්පමානානං තෙසම්පි හොති සඞ්ගති.
තස්මා තුම්හාක නො සියා?

සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො.

එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා,
එකො චරෙ න ච පාපානි කයිරා අප්පොස්සුක්කො මාතඞ්ග
රඤ්ඤෙව නාගො'ති.

අථ ඛො භගවා ඨිතකොව ඉමා ගාථා භාසිත්වා යෙන බාලකලොණකාරගාමො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ආයස්මා භගු බාලකලොණකාරගාමෙ විහරති. අද්දසා ඛො ආයස්මා භගු භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආසනං පඤ්ඤපෙසි උදකඤ්ච පාදානං[5]. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි. ආයස්මාපි ඛො භගු භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං භගුං භගවා එතදවොච :

කච්චි භික්ඛු, ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි පිණ්ඩකෙන න කිලමසීති?

---

1. කොසම්බිං - PTS. 2. අමඤ්ඤං - සීමු. 3. යෙ තං - PTT.
4. අට්ඨිච්ඡින්නා - සීමු, මජසං. 5. පාදානං ධොවනං - සීමු, මජසං

එසඳ භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙන කොසඹෑනුවර පිඩු පිණිස වැඩිසේක. කොසඹෑයෙහි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළැකුණාහු සෙනසුන් සඟවානබා, පාසිවුරු ගෙන සිටිවන සිටිසේක් ම මේ ගාථා වදළ සේක :

සමානස්වරූප වූ මේ භණ්ඩනකාරක ජන තෙමේ මහාශබ්ද ඇතියේ ය, කිසිවෙක් ' මම බාලයෙමි ' නො සිතී, සංඝයා බිඳෙන කල්හි වැඩි පමණ වූ (මා නිසා සඟහු බිඳෙති යන) අන් කරුණ නො සිතී.

යම් කලහයෙකින් මේ නිර්ලජ්ජභාවයට එළවන ලද්දහු (මෙසේ මේ ආදීනව සහිතය යන) එ කරුණ නො දනිත් ද, ඔහු මුළාවූ සිහි ඇතියාහු පණ්ඩිතාභාස ඇතියාහු වාග්ගෝචර කොට ඇත්තාහු යම් තාක් මුව ඇයුම් කැමැති වෙත් ද, එතෙක් බණනාහු වෙති.

මට ආක්‍රොශ කෙළේය, මා පෙළී ය, මා දිනී ය, මා අයත් වස්තු පැහැර ගතැ ' යි යම් කෙනෙක් ඒ වෛරය සිතැ බඳිත් ද, උන් ගේ වෛරය නො සන්හිඳෙයි.

මට ආක්‍රොශ කෙළේ ය, මා පහළේ ය, මා දිනී ය, මා සතු ද පැහැර ගතැ ' යි යම් කෙනෙක් ඒ අයුරු වෛරය සිතැ නො බඳිත් ද, උන් ගේ වෛරය සන්හිඳේ.

මෙ ලොවැ කිසිදු කලෙක වෛරයෝ වෛරයෙන් නො සන්හිඳෙති, අවෛරයෙන් ම සන්හිඳෙත්, මෙය පුරාතන වූ (බුදු පසේබුදු මහරහතන් විසින් පුරුදු කළ) ධර්මයෙකි.

මේ කලහයෙහි දී ' අපි නැසෙම්හ ' යි (කලහකාර) අන්‍යජනයෝ නො දන්නාහ. යම් කෙනෙක් ඒ කලහයෙහි දී (අපි නැසෙම්හ ' යි) දනිත් ද, ඒ හේතුයෙන් කලහයෝ සන්හිඳෙත්.

ඇට බිඳුනා පණ නස්නා ගෙරි අස් ධන පැහැරගන්නා යම් කෙනෙක් ඇත් ද, රට වොලොගන්නා ඔවුනුදු ගේ සඩගති වෙයි, තොප ගේ සඩගති කවර හෙයින් නො වේ ද ?

ඉදින් සම්ප්‍රඥන ඇති තමා හා වසන්නට නිසි සත් විහරණ ඇති, ධිර වූ කල්‍යාණ මිත්‍රයකු ලබන්නේ නම්, (ප්‍රකට වූත් අප්‍රකට වූත්) හැම උවදුරු තාක් මැඩ ඔහු හා සතුටු සිත් ඇති ව ස්මෘතිමත් ව හැසිරෙන්නේ ය.

ඉදින් සම්ප්‍රඥන ඇති තමා හා වසන්නට නිසි සත් විහරණ ඇති ධිර වූ කල්‍යාණ මිත්‍රයකු නො ලබන්නේ නම්, දිනන ලද රට හැරපියා එකලා වූ (මහාජනක) රජු සෙයින් ද, රක්ෂිතවනයෙහි එකලා වූ මාතඩග නාගයා මෙන් ද එකලා වැ වසන්නේ ය.

එකලා වූවහු ගේ හැසිරීම ශ්‍රේෂ්ඨ වෙයි, බාලයා කෙරෙහි සහායභාවයෙක් නැත, අල්පොත්සුක ව අරණ්‍යයෙහි වාසයට පැමිණි ශ්‍රෙෂ්ඨ මාතඩගයා සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිටිසේක් ම මේ ගාථා වදරා (උපාලි ගැහැවිහු ගේ භොගග්‍රාම වූ) බාලකලොණකාර ග්‍රාමයට වැඩිසේක. එකල ආයුෂ්මත් භගු තෙරණුවෝ බාලකලොණකාර ගම්හි වෙසෙති. ආයුෂ්මත් භගු තෙරණුවෝ වඩනා භාග්‍යවතුන් වහන්සේ දුර දී මැ දුටහ, දැක අසුන් පැන්වී, පා දෝනා දිය ද එළැවී. භාග්‍යවතුන් වහන්සේ පැන්වූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ පා දෙවූහ, ආයුෂ්මත් භගු තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හු. එකත්පස්ව හුන් ආයුෂ්මත් භගු තෙරණුවනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

" මහණ, කිම සිහියැ හැකි ද ? කිම යැපියැ හේ ද ? කිම පිඩුවායෙන් ක්ලාන්ත නො වන්නෙහි ද ? "

ඛමනීයං භගවා, යාපනීයං භගවා, න චාහං භන්තෙ පිණ්ඩකෙන කිලමාමී'ති.

අථ ඛො භගවා ආයස්මන්තං භගුං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා යෙන පාචීනවංසදායො තෙනුපසඞ්කමි.

තෙන ඛො පන සමයෙන ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො[1] පාචීනවංසදායෙ විහරන්ති. අද්දසා ඛො දායපාලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: 'මා මහාසමණ එතං දායං පාවිසි, සන්තෙත්ථ තයො කුලපුත්තා අත්තකාමරූපා විහරන්ති, මා තෙසං අඵාසුං අකාසී'ති. අස්සොසි ඛො ආයස්මා අනුරුද්ධො දායපාලස්ස භගවතා සද්ධිං මන්තයමානස්ස. සුත්වාන දායපාලං එතදවොච:

'මා ආවුසො දායපාල, භගවන්තං වාරෙසි. සත්ථා නො භගවා අනුප්පත්තො'ති.

අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙනායස්මා ච නන්දියො යෙනායස්මා ච කිම්බිලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ච නන්දියං ආයස්මන්තං ච කිම්බිලං එතදවොච: 'අභික්කමථායස්මන්තො, සත්ථා නො භගවා අනුප්පත්තො'ති. අථ ඛො ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි, එකො ආසනං පඤ්ඤපෙසි, එකො පාදොදකං උපට්ඨපෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි. තෙපි ඛො ආයස්මන්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොච:

කච්චි වො, අනුරුද්ධා, ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි පිණ්ඩකෙන න කිලමථාති?

'ඛමනීයං භගවා, යාපනීයං භගවා. න ච මයං භන්තෙ, පිණ්ඩකෙන කිලමාමා'ති.

කච්චි පන වො, අනුරුද්ධා, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථාති?

තග්ඝ මයං භන්තෙ, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමා'ති.

යථා කථං පන තුම්හෙ අනුරුද්ධා, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථා'ති.

ඉධ මය්හං භන්තෙ, එවං හොති: 'ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමී'ති. තස්ස මය්හං භන්තෙ, ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. මෙත්තං වචීකම්මං -පෙ- මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. තස්ස මය්හං භන්තෙ, එවං හොති: යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍ය'න්ති. සො ඛො අහං භන්තෙ, සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසංයෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ, කායා, එකං ච පන මඤ්ඤෙ චිත්තන්ති.

---

1. කිම්බිලො - මජසං.

භාග්‍යවතුන් වහන්ස, සිහියැ හැකි යැ, භාග්‍යවතුන් වහන්ස, යැපියැ හැකි යැ, වහන්ස, මම පිඩුවායෙන් ක්ලාන්ත නො වෙමි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් භගු තෙරණුවනට දැහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා පහදවා හුනස්නෙන් නැඟී පාචීනවංසදය කරා වැඩි සේක.

එසමයෙහි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ද ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද පාචීනවංසදයයෙහි වෙසෙති. උයන්පලු වඩනා බුදුරදුන් දුරදී මැ දිට, දැක භාග්‍යවතුන් වහන්සේට තෙල කී : ''මහමහණ, තෙල වනයට නො වදූ, මෙහි තමන් කැමැති සේ වැඩවසන කුලපුත්‍රයෝ තුන්දෙනෙක් ඇත. ඔවුනට නහමක් නො පහසු කරව '' යි. ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ බුදුන් හා මන්ත්‍රණ කරන දයපාලයා ගේ බස් ඇසූහ. අසා දයපාලයාට තෙල කී :

'' ඇවත දයපාලයෙනි, භාග්‍යවතුන් වහන්සේ නො වළහව, අප ගේ ශාස්තෘ වූ බුදුහු වැඩියහ '' යි.

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් නන්දිය තෙරණුවන් හා ආයුෂ්මත් කිම්බිල තෙරණුවන් කරා ගියහ, ගොස් ආයුෂ්මත් නන්දිය තෙරණුවන් හා ආයුෂ්මත් කිම්බිල තෙරණුවනට තෙල කී : ' ආයුෂ්මත්නි, වහා එව, ආයුෂ්මත්නි, වහා එව. අප ගේ ශාස්තෘ වූ බුදුහු වැඩියහ '' යි. එසඳ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ද ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද බුදුන්ට පෙර ගමන් කොට, එක් නමෙක් භාග්‍යවතුන් වහන්සේ ගේ පාසිවුරු පිළිගති, එක් නමෙක් අසුන් පැන්වී, එක් නමෙක් පා දෝනා දිය එළැවී. බුදුහු පැන්වූ අස්නෙහි වැඩහුන්හ. හිඳ පා දෙවූහ. ඒ ආයුෂ්මත්හු ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හු, එකත්පස්ව හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළෝ:

'' කිම අනුරුද්ධයෙනි, තොප විසින් සිහියැ හැකි ද ? කිමැ යැපියැ හැකි ද ? කිම පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නො වවු ද '' යි.

භාග්‍යවතුන් වහන්ස, සිහියැ හැකි ය, භාග්‍යවතුන් වහන්ස, යැපියැ හැකි ය, වහන්ස, අපි පිණ්ඩපාතයෙන් ක්ලාන්ත නො වම්හ ' යි.

කිම අනුරුද්ධයෙනි, තෙපි සමගි ව සම්මොදමාන ව විවාද නො කරනු ව කිරබ වැනි ව උනුන් පිය ඇසින් දක්නහු වාස කරවු ද ?

වහන්ස, එකාන්තයෙන් අපි සමගි ව සම්මොදමාන ව විවාද නො කරනු ව කිරබ වැනි ව උනුන් පිය ඇසින් දක්නමෝ වසම්හ ' යි.

අනුරුද්ධයෙනි, කෙසේ නම් තෙපි සමගි ව සම්මොදමාන ව විවාද නො කරනු ව කිරබ වැනි ව උනුන් පිය ඇසින් දක්මින් වාස කරව ද ?

වහන්ස, මෙහි වසන මට මෙබඳු සිත් වෙයි : ''මම මෙබඳු සබ්‍රම්සරුන් සමග වාස කෙරෙම් ද, මට එකාන්තයෙන් ලාභයෙක, මට ඒකාන්තයෙන් මනා ලැබීමෙක, වහන්ස, මේ ආයුෂ්මතුන් කෙරෙහි හමුයෙහිත් නො හමුයෙහිත් මෛත්‍රීසහගත කායකර්ම එළැඹ සිටියේ ය, මෛත්‍රීසහගත වාක්කර්ම . . . හමුයෙහිත් නො හමුයෙහිත් මෛත්‍රීසහගත මනඃකර්ම එළැඹසිටියේ ය. වහන්ස, ' මම සිය සිත තබා මේ ආයුෂ්මතුන් ගෙ චිත්ත වශයෙන් වැටෙම් නම් මැනැවැ ' යි මට මෙබඳු සිත් විය. වහන්ස, මම සිය සිත් පියා මේ ආයුෂ්මතුන් ගේ සිත් විසින් වැටෙමි. වහන්ස, අපගේ ශරීරයෝ වෙන වෙන වෙති, සිත එකක් මෙනි.

ආයස්මාපි ඛො නන්දියො -පෙ- ආයස්මාපි කිම්බිලො භගවන්තං එතදවොච[1]. මය්හම්පි ඛො භන්තෙ, එවං හොති: 'ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යොහං -පෙ- එකං ච පන මඤ්ඤෙ චිත්තන්ති.

එවං ඛො මයං භන්තෙ, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමාති.

සාධු සාධු අනුරුද්ධා, 'කච්චි පන වො අනුරුද්ධා, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථා'ති?

'තග්ඝ මයං භන්තෙ, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා'ති.

'යථා කථං පන තුම්හෙ අනුරුද්ධා, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථා'ති?

ඉධ භන්තෙ, අම්හාකං යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති. සො ආසනානි පඤ්ඤපෙති, පානීයං පරිභොජනීයං උපට්ඨපෙති, අවක්කාරපාතිං උපට්ඨපෙති. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති, භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති අප්පහරිතෙ වා ඡඩ්ඩෙති, අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙති. සො ආසනානි පටිසාමෙති, පානීයං පරිභොජනීයං පටිසාමෙති. අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙති, භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං. සො උපට්ඨපෙති. සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨපෙම. න ත්වෙව මයං භන්තෙ තප්පච්චයා වාචං භින්දාම. පඤ්චාහිකං ඛො පන මයං භන්තෙ, සබ්බරත්තියං ධම්මියා කථාය සන්නිසීදාම. එවං ඛො මයං භන්තෙ, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා'ති.

සාධු සාධු අනුරුද්ධා, අත්ථි පන වො අනුරුද්ධා, එවං අප්පමත්තානං ආතාපීනං පහිතත්තානං විහරන්තානං උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො'ති

ඉධ මයං භන්තෙ, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා ඔභාසඤ්චෙව සඤ්ජානාම දස්සනඤ්ච රූපානං. සො ඛො පන නො ඔභාසො න චිරස්සෙව අන්තරධායති දස්සනඤ්ච රූපානං. තඤ්ච නිමිත්තං න පටිවිජ්ඣාමා'ති.

තං ඛො පන වො අනුරුද්ධා, නිමිත්තං පටිවිජ්ඣිතබ්බං. අහම්පි සුදං අනුරුද්ධා පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො ඔභාසඤ්චෙව සඤ්ජානාමි දස්සනඤ්ච රූපානං. සො ඛො පන මෙ ඔභාසො න චිරස්සෙව අන්තරධායති දස්සනඤ්ච රූපානං. තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි: 'කො නුඛො හෙතු කො පච්චයො, යෙන මෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපාන'න්ති. තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි: 'විචිකිච්ඡා ඛො මෙ උදපාදි. විචිකිච්ඡාධි-

1. එතදවොචුං - සීමු, PTS.

ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ ද ... ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළෝ : 'වහන්ස, මට ද මෙබඳු සිත් වෙයි : ඒකාන්තයෙන් මට ලාභයෙක, ඒකාන්තයෙන් මට මනා ලාභයෙක, මම . . . සිත එක්බඳු වෙති.

වහන්ස, මෙසේ අපි සමගි ව සතුටු ව විවාද නො කරනු ව කිරි හා දිය වැනි ව උනුන් පියඇසින් දක්නමෝ වසම්හ ' යි.

මැනැව මැනැව අනුරුද්ධයෙනි, කිමෙක අනුරුද්ධයෙනි, තෙපි නො පමාව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරව් ද ?

' වහන්ස, අපි ඒකාන්තයෙන් අප්‍රමත්ත ව ආතාපන වීර්‍ය්‍ය ඇති ව ප්‍රහිතාත්ම ව වසමහ'යි.

අනුරුද්ධයෙනි, තෙපි කෙසේ නම් නො පමා ව කෙලෙස් තැවුලි වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරව් ද ?

වහන්ස, මේ වන වසන අප අතුරින් යමෙක් පළමු ව ගමින් පිඩු පිණිස හැසිර වටාලා එන්නේද, හේ අසුන් පන්වයි, පියයුතු පැන් පරිභොග කළයුතු පැන් එළවයි. අවකරතලිය එළවාතබයි. යමෙක් පසුව ගමින් පිඩු සිඟා වටාලා ඒ ද, ඉදින් වළඳා ඉතිරි අහරෙක් වේ නම්, ඉදින් රිසි වී නම්, වළඳ කෙරෙයි. ඉදින් නො රිසි වී නම්, නිල් තණ රහිත බිමෙකැ හෝ දමයි, (එයින් නැසෙන) ප්‍රාණීන් නැති දියෙක හෝ බහාලයි. හේ අසුන් සඟවා තබයි, පානීය පරිභොජනීය දිය සඟවා තබයි, අවකර තලි සෝදා සඟවයි, භක්තග්‍රය හමදී. යමෙක් පැන්කළය හෝ පිරිබෝදියකළය හෝ හිස් වූවා දක්නේ ද, හේ එ ද එළවාතබයි. ඉදින් ඔහුට නො සැහියැ හැකි වී නම්, හස්තවිකාරයෙන් දෙවැන්නා අමතා අතිනත් ගැනීමෙන් වටම්හ. වහන්ස, අපි ඒ හෙතුයෙන් වාග්භෙදයක් නො කරම්හ. වහන්ස, අපි පස්දවසකට වරක් කොට මුළු රැය දැහැමි කථායෙන් මුළු දී හිඳුම්හ. වහන්ස, මෙසේ අපි නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරම්හ ' යි.

මැනැව මැනැව අනුරුද්ධයෙනි, යළි අනුරුද්ධයෙනි, මෙසේ අප්‍රමත්ත ව ආතාප ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරන තොපට මනුෂ්‍යධර්මයෙන් මතුයෙහි ආර්‍ය්‍ය භාවකරණයට සමර්ථ ඥානදර්ශනවිශේෂයෙක් අධිගත ව ඵාසුවිහාර ව ඇද්ද ?

වහන්ස, අපි මේ, වෙනෙහි නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව කායජීවිත නිර පේක්ෂක ව වසන්නමෝ අවභාසය හා (දිවැසින්) රූපදර්ශනය හඳුනම්හ, අප ගේ ඒ අවභාසය හා රූපදර්ශනය නො බෝකල්හි මැ අන්තර්හිත වෙයි. ඒ කරුණ ද නො පිළිවිදුම්හ ' යි.

අනුරුද්ධයෙනි, තොප විසින් ඒ කරුණ පිළිවිදිය යුතු ය. අනුරුද්ධයෙනි, මම ද සම්බොධියෙන් පෙර මැ අනභිසම්බුද්ධ බොධිසත්ත්ව වූයෙම් මැ පරිකර්මාවභාසය හා රූපදර්ශන හැඳිනිමි. මා ගේ ඒ පරිකර්මාවභාසය ද දිවැසින් කළ රූපදර්ශනය ද නො බෝකල්හි මැ අන්තර්හිත වී, අනුරුද්ධයෙනි මට තෙල සිත් වී : ' යම් හෙයෙකින් මා ගේ අවභාසයත් රූපදර්ශනත් අන්තර්හිත වේ ද, ඊට හේතු කවරෙ යැ ඊට ප්‍රත්‍යය කවරේ ය ' යි, අනුරුද්ධයෙනි, එසඳ මට තෙල සිත් වී මට විචිකිච්ඡා උපන.

කරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි, යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සතීති. සො ඛො අහං අනුරුද්ධා, අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්ෙච සඤ්ජානාමි දස්සනඤ්ච රූපානං. සො ඛො පන මෙ ඔභාසො න චිරස්සෙව අන්තරධායති දස්සනඤ්ච රූපානං. තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි : ‘කො නු ඛො හෙතු කො පච්චයො, යෙන මෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපාන’න්ති. තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි : ‘අමනසිකාරො ඛො මෙ උදපාදි. අමනසිකාරාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි. යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති. න අමනසිකාරොති.

සො ඛො අහං අනුරුද්ධා—පෙ—තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි : ථීනමිද්ධං ඛො මෙ උදපාදි. ථීනමිද්ධාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති, න අමනසිකාරො, න ථීනමිද්ධන්ති.

සො ඛො අහං අනුරුද්ධා,—පෙ—තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි : ඡම්භිතත්තං ඛො මෙ උදපාදි. ඡම්භිතත්තාධිකරණං ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සෙය්‍යථාපි අනුරුද්ධා, පුරිසො අද්ධානමග්ගපටිපන්නො, තස්ස උභතො පස්සෙ වධකා[1] උප්පතෙය්‍යුං[2] තස්ස තතො නිදානං ඡම්භිතත්තං උප්පජ්ජෙය්‍ය. එවමෙව ඛො මෙ අනුරුද්ධා, ඡම්භිතත්තං උදපාදි. ඡම්භිතත්තාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි, යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථීනමිද්ධං න ඡම්භිතත්තන්ති.

සො ඛො අහං අනුරුද්ධා,—පෙ—තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි : උබ්බිල්ලං[3] ඛො මෙ උදපාදි. උබ්බිල්ලා[4]ධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සෙය්‍යථාපි අනුරුද්ධා පුරිසො එකං නිධිමුඛං ගවෙසන්තො සකිදෙව පඤ්චනිධිමුඛානි අධිගච්ඡෙය්‍ය. තස්ස තතො නිදානං උබ්බිල්ලං උප්පජ්ජෙය්‍ය. එවමෙව ඛො අනුරුද්ධා උබ්බිල්ලං ඛො මෙ උදපාදි. උබ්බිල්ලාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි, යථා මෙ පුන න විචිකිච්ඡා, උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථීනමිද්ධං න ඡම්භිතත්තං න උබ්බිල්ලන්ති.

සො ඛො අහං අනුරුද්ධා—පෙ—තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි : දුට්ඨුල්ලං ඛො මෙ උදපාදි. දුට්ඨුල්ලාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි, යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසි-කාරො න ථීනමිද්ධං න ඡම්භිතත්තං න උබ්බිල්ලං න දුට්ඨුල්ලන්ති.

---

1. වද්ධකා - මජසං.
2. උප්පජ්ජෙය්‍යුං - සයා.
3. උප්පිල්ලං - මජසං.
4. උප්පිල්ලා - න - ම.

විචිකිච්ඡා හේතුයෙන් මා ගේ සමාධි ගිලිහිණ, සමාධි ගිලිහුණු කල්හි අවභාසයත් රූප දර්ශනත් අන්තර්හිත වී, යම්පරිදි මට විචිකිච්ඡා නූපදනේ ද, මම එසේ කරමී, කියා යි. අනුරුද්ධයෙනි, මම නො පමා ව වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරන්නෙම් අවභාසයත් රූපදර්ශනයත් හැඳිනීමි. මා ගේ ඒ අවභාසය හා රූපදර්ශන නො බෝ කල්හි මැ අන්තර්හිත වී, අනුරුද්ධයෙනි, මට මෙ සිත් වී : යම් හෙයෙකින් මා ගේ අවභාසය හා රූපදර්ශන අන්තර් හිත වී ද, එයට හේතු කවරෙ යැ, ඊට ප්‍රත්‍යය කවරේ යැ ' යි, අනුරුද්ධයෙනි, මට මෙ සිත් වී : මට අමනසිකාරය උපන, අමනසිකාර හේතුයෙන් මා ගේ සමාධි ගිලිහිණි, සමාධි ගිලිහුණු කල අවභාස හා රූපදර්ශන අන්තර්හිත වී. යම්පරිදි මට යළි විචිකිච්ඡා නූපදනේ ද, අමනසිකාර නූපදනේ ද, මම එසේ කරමි ' යි කියා යි.

අනුරුද්ධයෙනි, මම . . . අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට ථිනමිද්ධය උපන, ථිනමිද්ධහෙතුයෙන් මා ගේ සමාධි ගිලිහිණ, සමාධිය ගිලිහුණු කල අවභාසය හා රූපදර්ශන අන්තර්හිත වෙයි. යම්පරිදි මට නැවත විචිකිච්ඡා නූපදනේ ද, අමනසිකාර නූපදනේ ද, ථිනමිද්ධ නූපදනේ ද, මම එසේ කරමී ' කියා යි.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට තැතිගැනුම් උපන, තැතිගැනුම් හෙතුයෙන් මා ගේ සමාධි ගිලිහිණ, සමාධිය ගිලිහුණු කල අවභාසය හා රූපදර්ශන අන්තර්හිත වෙයි. අනුරුද්ධයෙනි, යම් පරිදි අදන්මඟට පිළිපන් පුරුෂයෙක් ඇද්ද, ඔහු දෙපස වධකයෝ නැඟීසිටිත් ද, ඔහුට ඒ හෙතුවෙන් තැතිගැනුම් උපදනේ වේ ද, අනුරුද්ධයෙනි, එපරිදි ම තැතිගැනුම් උපන. තැතිගැනුම් හේතුයෙන් මා ගේ සමාධි ගිලිහිණ, සමාධිය ගිලිහුණු කල අවභාසය හා රූපදර්ශන අන්තර්හිත වෙයි. යම්පරිදි මට විචිකිච්ඡා, අමනසිකාර ථිනමිද්ධ තැතිගැනුම් නූපදනේ වේ ද, එසේ කරමි ' යි කියා යි.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට ඉපිලීම් උපන, ඉපිලීම් හේතුයෙනුදු මා ගේ සමාධි ගිලිහිණ, සමාධි ගිලිහුණු කල අවභාසය හා රූපදර්ශන අන්තර්හිත වී. අනුරුද්ධයෙනි, යම්පරිදි පුරුෂයෙක් එක් නිධිමුඛයක් සොයනුයේ එක්වර ම නිධිමුඛ පසක් ලබා ද, ඔහුට ඒ හේතුයෙන් ඉල්පීම් උපදනේ වේ ද, අනුරුද්ධයෙනි, එපරිදි ම මට ඉල්පීම් උපන, ඉල්පීම් හේතුයෙනුදු මා ගේ සමාධි ගිලිහිණ, සමාධි ගිලිහුණු කල අවභාසය හා රූපදර්ශන අන්තර්හිත වෙයි. යම් පරිදි මට නැවත විචිකිච්ඡා නූපදනේ වේ ද, අමනසිකාර නූපදනේ වේ ද, ථිනමිද්ධ නූපදනේ වේ ද, තැතිගැනුම් නූපදනේ වේ ද, ඉල්පීම් නූපදනේ වේ ද, මම එසේ කරමී ' කියා යි.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට කායදරථ උපන, කායදරථ හෙතුයෙනුදු මා ගේ සමාධි ගිලිහිණ, සමාධි ගිලිහුණු කල අවභාසය හා රූප දර්ශන අන්තර්හිත වෙයි. යම් පරිදි මට නැවත විචිකිච්ඡා නූපදනේ වේ ද, අමනසිකාර නූපදනේ වේ ද, ථිනමිද්ධ නූපදනේ වේ ද, තැතිගැනුම් නූපදනේ වේ ද, ඉල්පීම් නූපදනේ වේ ද, කායදරථ නූපදනේ වේ ද, මම එසේ කරමී ' කියා යි.

24—ඒ 00502 (8/73)

සො ඛො අහං අනුරුද්ධා -පෙ- තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි: අච්චාරද්ධවිරියං ඛො මෙ උදපාදි. අච්චාරද්ධවිරියාධිකරණඤ්ච පන මෙ සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං. සෙය්‍යථාපි අනුරුද්ධා පුරිසො උභොහි හත්ථෙහි වට්ටකං ගාළ්හං ගණ්හෙය්‍ය. සො තත්ථෙව පතමෙය්‍ය[1]. එවමෙව ඛො අනුරුද්ධා, අච්චාරද්ධවිරියං ඛො මෙ උදපාදි. අච්චාරද්ධවිරියාධිකරණඤ්ච -පෙ- දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථිනමිද්ධං න ඡම්භිතත්තං, න උබ්බිල්ලං, න දුට්ඨුල්ලං, න අච්චාරද්ධවිරියන්ති.

සො ඛො අහං අනුරුද්ධා-පෙ-තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: අතිලීනවිරියං ඛො මෙ උදපාදි. අතිලීනවිරියාධිකරණඤ්ච -පෙ- දස්සනඤ්ච රූපානං. සෙය්‍යථාපි අනුරුද්ධා පුරිසො වට්ටකං සිථිලං ගණ්හෙය්‍ය. සො තස්ස හත්ථතො උප්පතෙය්‍ය. එවමෙව ඛො මෙ අනුරුද්ධා, අතිලීනවිරියං උදපාදි. අතිලීනවිරියාධිකරණඤ්ච -පෙ- දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථිනමිද්ධං න ඡම්භිතත්තං න උබ්බිල්ලං න දුට්ඨුල්ලං න අච්චාරද්ධවිරියං න අතිලීනවිරියන්ති.

සො ඛො අහං අනුරුද්ධා -පෙ- තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: 'අභිජප්පා ඛො මෙ උදපාදි. අභිජප්පාධිකරණඤ්ච -පෙ- දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථිනමිද්ධං න ඡම්භිතත්තං න උබ්බිල්ලං න දුට්ඨුල්ලං න අච්චාරද්ධවිරියං න අතිලීනවිරියං න අභිජප්පාති.

සො ඛො අහං අනුරුද්ධා -පෙ- තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: නානත්තසඤ්ඤා ඛො මෙ උදපාදි. නානත්තසඤ්ඤාධිකරණඤ්ච -පෙ- දස්සනඤ්ච රූපානං. සොහං තථා කරිස්සාමි යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො, න ථිනමිද්ධං, න ඡම්භිතත්තං, න උබ්බිල්ලං, න දුට්ඨුල්ලං, න අච්චාරද්ධවිරියං, න අතිලීනවිරියං, න අභිජප්පා, න නානත්තසඤ්ඤා'ති.

සො ඛො අහං අනුරුද්ධා, අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්චෙව සඤ්ජානාමි දස්සනඤ්ච රූපානං, සො ඛො පන මෙ ඔභාසො න චිරස්සෙව අන්තරධායති දස්සනඤ්ච රූපානං. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො යෙන මෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපාන'න්ති. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: 'අතිනිජ්ඣායිතත්තං ඛො මෙ රූපානං උදපාදි. අතිනිජ්ඣායිතත්තාධිකරණඤ්ච පන මෙ රූපානං සමාධි චවි. සමාධිම්හි චුතෙ ඔභාසො අන්තරධායති දස්සනඤ්ච රූපානං, සොහං තථා කරිස්සාමි, යථා මෙ පුන න විචිකිච්ඡා උප්පජ්ජිස්සති න අමනසිකාරො න ථිනමිද්ධං න ඡම්භිතත්තං න උබ්බිල්ලං න දුට්ඨුල්ලං න අච්චාරද්ධවිරියං න අතිලීනවිරියං න අභිජප්පා න නානත්තසඤ්ඤා න අතිනිජ්ඣායිතත්තං රූපානන්ති.

---

1. මතමෙය්‍ය - සීමු.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට මෙ සිත් විය : මට අත්‍යාරබ්ධ වීර්‍ය්‍යය උපන, යළි අත්‍යාරබ්ධ වීර්‍ය්‍යහේතුයෙන්ද මා ගේ සමාධි ගිලිහිණ, සමාධි ගිලිහුණු කල්හි අවභාසය ද රූපදර්ශනය ද අන්තර්හිත වෙයි. යම්පරිදි අනුරුද්ධයෙනි, පුරුෂයෙක් දෑතින් වටුවකු දැඩි කොට ගන්නේ ද, ඌ එහි මැ මරුමුවට පැමිණේ ද, එපරිදි මැ අනුරුද්ධයෙනි, මට අත්‍යාරබ්ධවීර්‍ය්‍යය උපන, අත්‍යාරබ්ධවීර්‍ය්‍ය හේතුයෙන්ද . . . රූපදර්ශනය ද අන්තර්හිත වී. යම්පරිදි මට නැවත විචිකිච්ඡා නූපදනේ ද අමනසිකාර නූපදනේ ද ථිනමිද්ධ නූපදනේ ද තැතිගැනුම් නූපදනේ ද ඉල්පීම් නූපදනේ ද කායදරථ නූපදනේ ද අත්‍යාරබද්ධවීර්‍ය්‍ය නූපදනේ ද මම එපරිදි කරමි.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට තෙල සිත්වී : මට අතිලීනවීර්‍ය්‍ය උපන. අතිලීන වීර්‍ය්‍යහේතුයෙන්ද . . . රූපදර්ශනය අන්තර්හිත වී. අනුරුද්ධයෙනි, යම්පරිදි පුරුෂයෙක් වටුවකු ලිහිල් කොට ගන්නේ වේ ද, එ වටු ඔහු අතින් පිය හඹා නගී ද, අනුරුද්ධයෙනි, එපරිදි ම මට අතිලීන වීර්‍ය්‍ය උපන. අතිලීන වීර්‍ය්‍ය හේතුයෙන්ද . . . රූපදර්ශනය ද අන්තර්හිත වී. යම්පරිදි මට නැවත විචිකිච්ඡා නූපදී ද අමනසිකාර නූපදී ද ථිනමිද්ධ නූපදී ද තැතිගැනුම් නූපදී ද ඉල්පීම් නූපදී ද කායදරථ නූපදී ද අත්‍යාරබ්ධවීර්‍ය්‍ය නූපදී ද අතිලීනවීර්‍ය්‍ය නූපදී ද මම එසේ කරමි.

අනුරුද්ධයෙනි, මම ... අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට තෘෂ්ණා උපනා තෘෂ්ණාහෙතුයෙන්ද . . . රූපදර්ශනය ද අන්තර්හිත වී. යම් පරිදි මට නැවත විචිකිච්ඡා නූපදී ද අමනසිකාර නූපදී ද ථිනමිද්ධ නූපදී ද තැතිගැනුම් නූපදී ද ඉල්පීම් නූපදී ද කායදරථ නූපදී ද අත්‍යාරබ්ධවීර්‍ය්‍ය නූපදී ද අතිලීනවීර්‍ය්‍ය නූපදී ද තෘෂ්ණා නූපදී ද මම එසේ කරමි.

අනුරුද්ධයෙනි, මම . . . අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට නානත්තසඤ්ඤා උපන. නානත්තසඤ්ඤා හේතුයෙන්ද . . . රූපදර්ශන අන්තර්හිත වී. යම් පරිදි මට නැවත විචිකිච්ඡා නූපදී ද අමනසිකාර නූපදී ද ථිනමිද්ධ නූපදී ද තැතිගැනුම් නූපදී ද ඉල්පීම් නූපදී ද කායදරථ නූපදී ද අත්‍යාරබ්ධවීර්‍ය්‍ය නූපදී ද අතිලීනවීර්‍ය්‍ය නූපදී ද තෘෂ්ණා නූපදී ද නානත්තසඤ්ඤා නූපදී ද, මම එසේ කරමි.

අනුරුද්ධයෙනි, මම නොපමාව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වාස කරන්නෙම් ඔභාසය ද රූපදර්ශනය ද හඳුනමි. මා ගේ ඒ ඔභාසය හා රූප දර්ශනය නොබෝ වේලෙහි අතුරුදහන් කෙරෙයි. අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී. යම් හේතුයෙකින් මාගේ ඔභාසය හා රූපදර්ශන අතුරුදහන් කෙරේ ද, ඊට හේතු කවරේ යැ ? ප්‍රත්‍යය කවරේ යැ ? අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මට රූපයන් පිළිබඳ අධික නිජ්ඣායනා ඇති බව උපන. මාගේ රූපයන් පිළිබඳ අතිනිජ්ඣායනා ඇති බව හේතු කොටගෙන සමාධි බුන. සමාධිය බුන් කල ඔභාස හා රූපදර්ශන අතුරුදහන් කෙරෙයි. යම්පරිදි මට නැවත විචිකිච්ඡා නූපදනේ ද අමනසිකාර නූපදනේ ද ථිනමිද්ධ නූපදනේ ද තැතිගැනුම් නූපදනේ ද ඉල්පීම් නූපදනේ ද කායදරථ නූපදනේ ද අත්‍යාරබ්ධවීර්‍ය්‍ය නූපදනේ ද අතිලීනවීර්‍ය්‍ය නූපදනේ ද තෘෂ්ණා නූපදනේ ද නානත්තසඤ්ඤා නූපදනේ ද රූපයන් පිළිබඳ අතිනිජ්ඣායනා නූපදනේ ද මම එසේ කරමි.

සො බො අහං අනුරුද්ධා, විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා විචිකිච්ඡං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අමනසිකාරො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අමනසිකාරං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. ථිනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථිනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. ඡම්භිතත්තං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඡම්භිතත්තං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. උබ්බිල්ලං[1] චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උබ්බිල්ලං[1] චිත්තස්ස උපක්කිලෙසං පජහිං. දුට්ඨුල්ලං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා දුට්ඨුල්ලං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අච්චාරද්ධවිරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අච්චාරද්ධවිරියං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අතිලීනවිරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිලීනවිරියං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අභිජප්පා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජප්පං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. නානත්තසඤ්ඤා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා නානත්තසඤ්ඤං චිත්තස්ස උපක්කිලෙසං පජහිං. අතිනිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිනිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසං පජහිං.

සො බො අහං අනුරුද්ධා, අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසම්පි හි බො සඤ්ජානාමි, න ච රූපානි පස්සාමි. රූපානි හි බො පස්සාමි, න ච ඔභාසං සඤ්ජානාමි. කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං[2] කෙවලම්පි රත්තින්දිවන්ති. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: කො නු බො හෙතු, කො පච්චයො, සොහං[3] ඔභාසම්පි බො සඤ්ජානාමි. න ච රූපානි පස්සාමි. රූපානි හි බො තස්මිං සමයෙ පස්සාමි. න ච ඔභාසං සඤ්ජානාමි. කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං කෙවලම්පි රත්තින්දිවන්ති. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: යස්මිං හි බො අහං සමයෙ රූපනිමිත්තං අමනසිකරිත්වා ඔභාසනිමිත්තං මනසිකරොමි. ඔභාසං හි බො තස්මිං සමයෙ සඤ්ජානාමි න ච රූපානි පස්සාමි. යස්මිං පනාහං සමයෙ ඔභාසනිමිත්තං අමනසි කරිත්වා රූපනිමිත්තං මනසි කරොමි. රූපානි හි බො තස්මිං හි සමයෙ පස්සාමි. න ච ඔභාසං සඤ්ජානාමි. කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං කෙවලම්පි රත්තින්දිවන්ති

සො බො අහං අනුරුද්ධා අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො පරිත්තං චෙව ඔභාසං සඤ්ජානාමි. පරිත්තානි ච රූපානි පස්සාමි. අප්පමාණඤ්චෙව ඔභාසං සඤ්ජානාමි. අප්පමාණානි ච රූපානි පස්සාමි, කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං, කෙවලම්පි රත්තින්දිව'න්ති. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: 'කො නු බො හෙතු, කො පච්චයො, සොහං[3] පරිත්තං චෙව ඔභාසං සඤ්ජානාමි, පරිත්තානි ච රූපානි පස්සාමි. අප්පමාණඤ්චෙව ඔභාසං සඤ්ජානාමි, අප්පමාණානි ච රූපානි පස්සාමි. කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං කෙවලම්පි රත්තින්දිව'න්ති. තස්ස මය්හං අනුරුද්ධා, එතදහොසි: යස්මිං බො මෙ සමයෙ පරිත්තො, සමාධි හොති, පරිත්තං මෙ තස්මිං සමයෙ චක්ඛු හොති. සොහං පරිත්තෙන චක්ඛුනා පරිත්තඤ්චෙව ඔභාසං සඤ්ජානාමි. පරිත්තානි ච රූපානි පස්සාමි. යස්මිං පන සමයෙ අප්පමාණො[4] මෙ සමාධි හොති. අප්පමාණං මෙ තස්මිං සමයෙ චක්ඛු හොති. සොහං අප්පමාණෙන චක්ඛුනා අප්පමාණඤ්චෙව ඔභාසං සඤ්ජානාමි, අප්පමාණානි ච රූපානි පස්සාමි කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං කෙවලම්පි රත්තින්දිව'න්ති.

1. උප්පිල්ලං - මජ්සං,
2. දිවං - මජ්සං,
3. යවාහං - මජ්සං,
4. අප්පරිත්තො - PTS.

අනුරුද්ධයෙනි, මම විචිකිච්ඡාව චිත්තොපක්ලෙශයෙකැ' යි මෙසේ දැන චිත්තොප ක්ලෙශ වූ විචිකිච්ඡාව හළෙමි. අමනසිකාරය චිත්තොපක්ලෙශයෙකැයි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ අමනසිකාරය හළෙමි. ථිනමිද්ධය චිත්තොපක්ලෙශ යෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලේශ වූ ථිනමිදධය හළෙමි. තැතිගැනුම චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලේශ වූ තැතිගැනුම හළෙමි. ඉල්පීම චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ ඉල්පීම හළෙමි. කායදරථය චිත්තොපක්ලෙශයෙකැ යි මෙසේ දැන චිත්තොප ක්ලේශ වූ කායදරථය හළෙමි. අත්‍යාරබ්ධවීය‍ර්‍යය චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තෝපක්ලෙශ වූ අත්‍යාරබ්ධවීය‍ර්‍යය හළෙමි. අතිලීන වීය‍ර්‍යය චිත්තොප ක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ අතිලීනවීය‍ර්‍යය හළෙමි. තෘෂ්ණාව චිත්තොපක්ලෙශයෙකැ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ තෘෂ්ණාව හළෙමි. නානත්තසඤ්ඤාව චිත්තොපක්ලෙශයෙකැ යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ නානත්ත සඤ්ඤාව හළෙමි. රූපයන් පිළිබඳ අතිනිජ්ඣායනාව චිත්තොපක්ලෙශයෙකැ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ රූපයන් පිළිබඳ අතිනිජ්ඣායනාව හළෙමි.

අනුරුද්ධයෙනි, මම අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන්නෙම් මුළු රැය ද මුළු දවස ද මුළු දවරැ දෙක ද ඔභාසය දනිමි, රූප නො දක්මි. රූප දක්මි, එතෙකුදු ඔභාස නො දනිමි. අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී: මුළු රැය ද මුළු දවස ද මුළු දවරැ දෙක ද මම ඔභාස දනිම් ද රූප නො දකිම් ද, එසමයෙහි රූප දකිම් ද ඔභාස නො ද දනිම් ද, ඊට හේතු කවරෙ යැ, ප්‍රත්‍යය කවරෙ යැ යි. අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මුළු රැය ද මුළු දවල ද මුළු දවරැ දෙකම දැයි මෙසේ යම් සමයෙක මම රූප නිමිති මෙනෙහි නො කොට ඔභාස නිමිති මෙනෙහි කෙරෙම් ද, එ සමයෙහි ඔභාස දනිමි. රූප නො දක්මි. යම් කලෙක මම ඔභාසනිමිති මෙනෙහි නො කොට රූපනිමිති මෙනෙහි කෙරෙම් ද, එ සමයෙහි රූප දක්මි, ඔභාස නො ද දනිමි.

අනුරුද්ධයෙනි, මම අප්‍රමත්ත ව ආතාපන වීය‍ර්‍ය ඇති ව ප්‍රහිතාත්ම ව වසනුයෙම් මුළුරැය ද මුළු දවල ද මුළු දවරැ දෙක ද පරිත්ත වූ කර්මස්ථානයෙහි ඕභාසයක් දැනගනිමි, පරිත්ත වූ කර්මස්ථානයෙහි රූපයනුදු දක්මි. අප්‍රමාණ කර්මස්ථානයෙහි ඔභාසයත් දැනගතිමි, අප්‍රමාණකර්මස්ථානයෙහි රූප ද දක්මි. අනුරුද්ධයෙනි, මට තෙල සිත් විය : ' මුළු රැය ද මුළු දවල ද මුළු දවරැ දෙක ද මම පරිත්ත ඔභාස හඳුනමි, පරිත්ත රූප දක්මි. අප්‍රමාණොභාස හඳුනමි, අප්‍රමාණ රූප දක්මි. ඊට හේතු කවරෙ යැ, ඊට ප්‍රත්‍යය කවරෙ යැ ' යි. අනුරුද්ධයෙනි, මට තෙල සිත් විය : ' යම් කලෙක පරිත්ත පරිකර්මොභාස වේ ද, එ සමයෙහි මට පරිත්ත වූ දිවැස් වෙයි, මම පරිත්ත වූ දිවැසින් පරිත්ත වූ ඔභාස හඳුනමි, පරිත්තරූප දක්මි. යම් කලෙක මට අප්‍රමාණ සමාධි වේ ද, එසමයෙහි මට අප්‍රමාණ වූ දිවැස වෙයි, මම අප්‍රමාණ වූ දිවැසින් අප්‍රමාණ වූ ඔභාස හඳුනමි, අප්‍රමාණ වූ රූප ද දක්මි. මුළු රැය ද මුළු දවල ද මුළු දවරැ දෙක ද ගෙනය කියා යි.

යතො ඛො මෙ අනුරුද්ධා, විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. අමනසිකාරො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අමනසිකාරො චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. ථිනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථිනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. ඡම්භිතත්තං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඡම්භිතත්තං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. උබ්බිල්ලං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උබ්බිල්ලං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. දුට්ඨුල්ලං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා දුට්ඨුල්ලං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. අච්චාරද්ධවිරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අච්චාරද්ධවිරියං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. අතිලීනවිරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිලීනවිරියං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. අභිජප්පා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජප්පා චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. නානත්තසඤ්ඤා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා නානත්තසඤ්ඤා චිත්තස්ස උපක්කිලොසො පහීනො අහොසි. අතිනිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිනිජ්ඣායිතත්තං රූපානං චිත්තස්ස උපක්කිලෙසො පහීනො අහොසි. තස්ස මය්හං අනුරුද්ධා එතදහොසි. යෙ ඛො මේ චිත්තස්ස උපක්කිලෙසා, තෙ මෙ පහීනා හන්දදානාහං තිවිධෙන සමාධිං භාවෙමී’ති. සො ඛො අහං අනුරුද්ධා සවිතක්කම්පි සවිචාරං සමාධිං භාවෙසිං. අවිතක්කම්පි විචාරමත්තං සමාධිං භාවෙසිං. අවිතක්කම්පි අවිචාරං සමාධිං භාවෙසිං. සප්පීතිකම්පි සමාධිං භාවෙසිං. නිප්පීතිකම්පි සමාධිං භාවෙසිං. සාතසහගතම්පි සමාධිං භාවෙසිං. උපෙක්ඛාසහගතම්පි සමාධිං භාවෙසිං. යතො ඛො මෙ අනුරුද්ධා, සවිතක්කොපි සවිචාරො සමාධි භාවිතො අහොසි, අවිතක්කොපි විචාරමත්තො සමාධි භාවිතො අහොසි, අවිතක්කොපි අවිචාරො සමාධි භාවිතො අහොසි, සප්පීතිකොපි සමාධි භාවිතො අහොසි. නිප්පීතිකොපි සමාධි භාවිතො අහොසි, සාතසහගතොපි සමාධි භාවිතො අහොසි. උපෙක්ඛාසහගතොපි සමාධි භාවිතො අහොසි. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා අනුරුද්ධො භගවතො භාසිතං අභිනන්දීති.

උපක්කිලෙසසුත්තං අට්ඨමං.

---

අනුරුද්ධයෙනි, යම් කලෙක විචිකිච්ඡාව චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ විචිකිච්ඡාව ප්‍රහීණ වී ද, අමනසිකාරය චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ අමනසිකාරය ප්‍රහීණ වී ද, ථීනමිද්ධය චිත්තොපක්ලෙශ යෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ ථීනමිද්ධය ප්‍රහීණ වී ද, තැතිගැන්ම චිත්තොප ක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ තැතිගැන්ම ප්‍රහීණ වී ද, ඉල්පීම චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ ඉල්පීම ප්‍රහීණ වී ද, කායදරථ චිත්තොපක්ලේශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලේශ වූ කායදරථය ප්‍රහීණ වී ද, අත්‍යාරබ්ධවීර්‍ය්‍යය චිත්තොපක්ලෙශ යෙකැ ' යි මෙසේ දැන චිත්තොප ක්ලේශ වූ අත්‍යාරබ්ධවීර්‍ය්‍යය ප්‍රහීණ වී ද, අතිලීනවීර්‍ය්‍යය චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ අතිලීනවීර්‍ය්‍යය ප්‍රහීණ වී ද, තෘෂ්ණාව චිත්තොප ක්ලේශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ තෘෂ්ණාව ප්‍රහීණ වී ද, නානාත්ව සංඥව චිත්තොපක්ලෙශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ නානාත්වසංඥව ප්‍රහීණ වී ද, රූපයන් පිළිබඳ අතිනිජ්ඣායනාව චිත්තෝපක්ලේශයෙකැ ' යි මෙසේ දැන චිත්තොපක්ලෙශ වූ අතිනිජ්ඣායනාව ප්‍රහීණ වී ද, අනුරුද්ධයෙනි, මට තෙල සිත් වී : මා ගේ යම් චිත්තොපක්ලෙශයෝ ඇද්ද, ඔහු මට ප්‍රහීණයහ, එයින් දැන් මම තුන් අයුරෙකින් සමාධිය වඩමි, අනුරුද්ධයෙනි, මම සවිතර්ක වූ ද සවිචාර වූ ද සමාධිය වැඩුවෙමි, අවිතර්ක වූ ද විචාරමාත්‍ර සමාධිය වැඩීමි. අවිතර්ක වූ ද අවිචාරසමාධිය වැඩීමි, සප්‍රීතික සමාධිය වැඩීමි, නිෂ්ප්‍රීතික වූ ද සමාධිය වැඩීමි, සුඛසහගත වූ ද සමාධිය වැඩීමි, උපෙක්ෂා සහගත වූ ද සමාධිය වැඩීමි. අනුරුද්ධයෙනි, යම් කලෙක මා විසින් සවිතර්ක වූ ද සවිචාර වූ ද සමාධිය වඩන ලදුයේ වී ද, අවිතර්ක වූ ද විචාරමාත්‍ර සමාධිය වඩන ලදුයේ වී ද, අවිතර්ක වූ ද අවිචාර සමාධිය වඩන ලදුයේ වී ද, සප්‍රීතික වූ ද සමාධිය වඩන ලදුයේ වී ද, නිෂ්ප්‍රීතික වූ ද සමාධිය වඩන ලදුයේ වී ද, සුඛසහගත වූ ද සමාධිය වඩන ලදුයේ වී ද, උපෙක්ෂා සහගත වූ ද සමාධිය වඩන ලදුයේ වී ද, (එකල්හි) මට සියල්ල දක්නා සර්වඥතාඥනය ද උපන : ' මාගේ චිත්තවිමුක්තිය අකොප්‍ය ය, මේ අන්තිම ජාතිය යි, මෙවිට පුනර්භවයෙක් නැතැ ' යි.

භාග්‍යවතුන් වහන්සේ මේ උපක්ලේශ සූත්‍රය වදළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්‍දනා කළහ.

අටවැනි උපක්කිලෙස සුත්‍ර යි.

# 3. 3. 9

# බාලපණ්ඩිත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

තීණිමානි භික්ඛවෙ, බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානානි. කතමානි තීණි: ඉධ භික්ඛවෙ, බාලො දුච්චින්තිතචින්තී ච හොති දුබ්භාසිතභාසී ච දුක්කතකම්මකාරී ච. නො චෙතං භික්ඛවෙ, බාලො දුච්චින්තිතචින්තී ච අභවිස්ස දුබ්භාසිතභාසී ච දුක්කතකම්මකාරී ච කෙන නං පණ්ඩිතා ජානෙය්‍යුං: බාලො අයං භවං අසප්පුරිසො'ති යස්මා ච ඛො භික්ඛවෙ, බාලො දුච්චින්තිතචින්තී ච හොති දුබ්භාසිතභාසී ච දුක්කතකම්මකාරී ච, තස්මා නං පණ්ඩිතා ජානන්ති: බාලො අයං භවං අසප්පුරිසොති.

ස ඛො සො භික්ඛවෙ, බාලො තිවිධං දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දෝමනස්සං පටිසංවෙදෙති. සචෙ භික්ඛවෙ, බාලො සභායං වා නිසින්නො හොති. රථියාය[1] වා නිසින්නො හොති. සිඞ්ඝාටකෙ වා නිසින්නො හොති. තත්‍ර චෙ ජනො තජ්ජං තස්සාරුප්පං කථං මන්තෙති සචෙ භික්ඛවෙ, බාලො පාණාතිපාතී හොති. අදින්නාදායී හොති කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති. තත්‍ර භික්ඛවෙ බාලස්ස එවං හොති: යං ඛො ජනො තජ්ජං තස්සාරුප්පං කථං මන්තෙති. සංවිජ්ජන්තෙ තෙ ච ධම්මා මයි, අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමීති. ඉදං භික්ඛවෙ, බාලො පඨමං දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දෝමනස්සං පටිසංවෙදෙති.

පුන ච පරං භික්ඛවෙ, බාලො පස්සති රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්තෙ: කසාහිපි තාළෙන්තෙ, වෙත්තෙහිපි තාළෙන්තෙ, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්තෙ, හත්ථම්පි ඡින්දන්තෙ පාදම්පි ඡින්දන්තෙ, හත්ථපාදම්පි ඡින්දන්තෙ, කණ්ණම්පි ඡින්දන්තෙ, නාසම්පි ඡින්දන්තෙ, කණ්ණනාසම්පි ඡින්දන්තෙ, බිලඞ්ගථාලිකම්පි කරොන්තෙ, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්තෙ, රාහුමුඛම්පි කරොන්තෙ, ජොතිමාලිකම්පි කරොන්තෙ, හත්ථපජ්ජොතිකම්පි කරොන්තෙ, එරකවත්තිකම්පි කරොන්තෙ, චීරකවාසිකම්පි කරොන්තෙ, එණෙය්‍යකම්පි කරොන්තෙ, බලිසමංසිකම්පි කරොන්තෙ, කහාපණකම්පි කරොන්තෙ, ඛාරාපතච්ඡිකම්පි කරොන්තෙ, පලිඝපරිවත්තිකම්පි කරොන්තෙ, පලාලපීඨකම්පි කරොන්තෙ, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්තෙ, සුනඛෙහිපි ඛාදාපෙන්තෙ, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්තෙ, අසිනාපි සීසං ඡින්දන්තෙ. තත්‍ර භික්ඛවෙ, බාලස්ස එවං හොති: යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතු රාජානො චොරං ආගුචාරිං

1. රථිකාය - මජ්ඣං, සීමු.

# 3. 3. 9

# බාලපණ්ඩිත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහසිටුහු ගේ ජේතවන අරම්හි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල බාලපණ්ඩිත සූත්‍ර වදළ සේක.

මහණෙනි, බාලයා පිළිබඳ බාලයා දනගන්නා ලක්ෂණයෝ බාලයා දනගන්නා කාරණයෝ බාලචරිතාපදනයෝ මොහු තුන්දෙනෙක. කවර තුන්දෙනෙක යත් : මහණෙනි, මෙලොවැ බාල තෙමේ අභිජ්ඣා ආදි නපුරු සිතිවිලි සිතනසුලු වෙයි. මුසවා ආදි නපුරු බස් බණනසුලු ද වෙයි. පණිවා ආදි නපුරුකම් කරනසුලු ද වෙයි. ඉදින් මහණෙනි, බාල තෙමේ නපුරු සිතිවිලි සිතනසුලු වේ ය, නපුරු බස් බණනසුලු ද වේ ය, නපුරු කම් කරනසුලු ද වේ ය යන මෙල නො වී නම් කවර අයුරෙකින් පණ්ඩිත ජනයෝ ''මේ භවත් අසත්පුරුෂ බාලයෙකැ''යි ඔහු හඳුනාගනිත් ද, මහණෙනි, යම් හෙයෙකින් බාල තෙමේ නපුරු සිතිවිලි සිතනසුලු වේ ද, නපුරු බස් බණනසුලු වේ ද, නපුරු කම් කරනසුලු වේ ද, එහෙයින් පණ්ඩිත ජනයෝ ''මේ භවත් අසත්පුරුෂ බාලයෙකැ''යි ඔහු හඳුනාගනිති.

මහණෙනි, ඒ බාල ඉහාත්මයෙහි ම තුන්වැදැරුම් දුක්දොම්නසක් විඳුනේ ය. ඉදින් මහණෙනි, බාල සභායෙක වේව'යි හුන්නේ වේ ද, වීථියෙක වේව'යි හුන්නේ වේ ද, සතරමංසන්ධියෙක වේව'යි හුන්නේ වේ ද, එහිදු ජනයා එයින් උපන් එයට නිසි කථා මන්ත්‍රණ කෙරෙයි. මහණෙනි, ඉදින් බාල පණිවා කරනසුලු වේ ද, අයිනාදන් ගන්නාසුලු වේ ද, කාමයෙහි මිසහසර ඇති වේ ද, මුසවා බණනසුලු වේ ද, මද පමා දෙකට කරුණු වූ රහමෙර බොනසුලු වේ ද, මහණෙනි, එහි දී බාලයා හට මෙසේ සිත් වෙයි : ''ජනයා එයින් උපන් එයට නිසි යම් කථාවක් මන්ත්‍රණ කෙරේ ද, ඒ දුසිරිත් දහම්හු මා කෙරෙහි ඇත, මම ද ඒ දහම්හි ලා දක්වෙමි. මහණෙනි, බාල තෙමේ ඉහාත්මයෙහි ම මේ පළමුවන දුක්දොම්නස විඳුනේ වෙයි.

තවද මහණෙනි, බාල තෙමේ රජදරුවෝ අපරාධකාරී සොරු ගෙන විවිධ කම්කටුලු කෙරෙත් ද, කසයෙනුදු තළනුවන් වේවැලිනුදු තළනුවන් අඩදඬියෙනුදු තළනුවන් අත ද සිඳිනුවන් පය ද සිඳිනුවන් අත්පා ද සිඳිනුවන් කනුදු සිඳිනුවන් නැහැදු සිඳිනුවන් කන් නැහැදු සිඳිනුවන් බිලඞ්ගථාලික නම් වධ ද කරනුවන් ශඞ්ඛමුණ්ඩික නාම් වධ ද කරනුවන් රාහුමුඛ නම් වධ ද කරනුවන් ජොතිමාලික නම් වධ ද කරනුවන් හත්ථපජ්ජොතික නම් වධ ද කරනුවන් එරකවත්තික නම් වධ ද කරනුවන් චීරකවාසික නාම් වධ ද කරනුවන් එණෙය්‍යක නම් වධ ද කරනුවන් බලිසමංසික නම් වධ ද කරනුවන් කහාපණක නම් වධ ද කරනුවන් ඛාරාපතච්ඡික නම් වධ ද කරනුවන් පලිඝපරිවත්තික නම් වධ ද කරනුවන් පලාලපීඨක නම් වධ ද කරනුවන් රත්තෙලිනුදු ඉස්නවුන් ශුනකයන් ලවා කවනුවන් දිවස්හුල හිඳුවනුවන් කඩුවෙනුදු හිස සිඳිනුවන් දක්නේ වේ ද, මහණෙනි, එහි දී බාලයා හට මෙසේ සිත් වෙයි : යම්බදු පාපකර්ම හෙතු කොටගෙන රජදරුවෝ අපරාධකාරී

ගහෙත්වා විවිධා කම්මකාරණා කරෙන්ති: කසාහිපි තාළෙන්ති වෙත්තෙහිපි තාළෙන්ති. අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති. හත්ථම්පි ඡින්දන්ති. පාදම්පි ඡින්දන්ති. හත්ථපාදම්පි ඡින්දන්ති. කණ්ණම්පි ඡින්දන්ති. නාසම්පි ඡින්දන්ති. කණ්ණනාසම්පි ඡින්දන්ති. බිලඞ්ගථාලිකම්පි කරොන්ති. සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති. රාහුමුඛම්පි කරොන්ති. ජොතිමාලිකම්පි කරොන්ති. හත්ථපජ්ජොතිකම්පි කරොන්ති. එරකවත්තිකම්පි කරොන්ති. චීරකවාසිකම්පි කරොන්ති. එණෙය්‍යකම්පි කරොන්ති. බලිසමංසිකම්පි කරොන්ති. කහාපණකම්පි කරොන්ති. ඛාරාපතච්ඡිකම්පි කරොන්ති. පලිඝපරිවත්තිකම්පි කරොන්ති. පලාලපීඨකම්පි කරොන්ති. තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති. සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති. අසිනාපි සීසං ඡින්දන්ති. සංවිජ්ජන්තෙ තෙ ච ධම්මා මයි, අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. මඤ්චෙපි රාජානො ආජානෙය්‍යුං මම්පි රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙය්‍යුං: කසාහිපි තාළෙය්‍යුං. වෙත්තෙහිපි තාළෙය්‍යුං. අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙය්‍යුං හත්ථම්පි ඡින්දෙය්‍යුං. පාදම්පි ඡින්දෙය්‍යුං. හත්ථපාදම්පි ඡින්දෙය්‍යුං. කණ්ණම්පි ඡින්දෙය්‍යුං. නාසම්පි ඡින්දෙය්‍යුං. කණ්ණනාසම්පි ඡින්දෙය්‍යුං. බිලඞ්ගථාලිකම්පි කරෙය්‍යුං. සඞ්ඛමුණ්ඩිකම්පි කරෙය්‍යුං. රාහුමුඛම්පි කරෙය්‍යුං. ජොතිමාලිකම්පි කරෙය්‍යුං. හත්ථපජ්ජොතිකම්පි කරෙය්‍යුං. එරකවත්තිකම්පි කරෙය්‍යුං. චීරකවාසිකම්පි කරෙය්‍යුං. එණෙය්‍යකම්පි කරෙය්‍යුං. බලිසමංසිකම්පි කරෙය්‍යුං. කහාපණකම්පි කරෙය්‍යුං. ඛාරාපතච්ඡිකම්පි කරෙය්‍යුං. පලිඝපරිවත්තිකම්පි කරෙය්‍යුං. තත්තෙනපි තෙලෙන ඔසිඤ්චෙය්‍යුං. සුනඛෙහිපි ඛාදාපෙය්‍යුං. ජීවන්තම්පි සූලෙ උත්තාසෙය්‍යුං. අසිනාපි සීසං ඡින්දෙය්‍යුන්ති. ඉදම්පි භික්ඛවෙ, බාලො දුතියං දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

පුන ච පරං භික්ඛවෙ, බාලං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය[1] වා සෙමානං යානිස්ස පුබ්බෙ පාපකානි කම්මානි කතානි[2] කායෙන දුච්චරිතානි වාචාය දුච්චරිතානි මනසා දුච්චරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති, අජ්ඣොලම්බන්ති, අභිප්පලම්බන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ, මහන්තානං[3] පබ්බතකූටානං ඡායා සායන්හසමයං පථවියා ඔලම්බන්ති, අජ්ඣොලම්බන්ති, අභිප්පලම්බන්ති. එවමෙව ඛො භික්ඛවෙ, බාලං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය[1] වා සෙමානං, යානිස්ස පුබ්බෙ පාපකානි කම්මානි කතානි කායෙන දුච්චරිතානි වාචාය දුච්චරිතානි මනසා දුච්චරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති, අජ්ඣොලම්බන්ති, අභිප්පලම්බන්ති, තත්‍ර භික්ඛවෙ බාලස්ස එවං හොති: 'අකතං වත මෙ කල්‍යාණං, අකතං කුසලං, අකතං භීරුත්තාණං. කතං පාපං, කතං ලුද්දං, කතං කිබ්බිසං. යා ච හොති අකතකල්‍යාණානං අකතකුසලානං අකතභීරුත්තාණානං කතපාපානං කතලුද්දානං කතකිබ්බිසානං ගති. තං ගතිං පෙච්ච ගච්ඡාමී'ති. සො සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති. ඉදම්පි ඛො භික්ඛවෙ, බාලො තතියං දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

---

1. ඡමායං - මජසං, සීමු, ස්‍යා. 2. පාපකානි කම්මානි - PTS.
3. මහන්තං - මජසං.

සොරු ගෙන විවිධ කම්කටොලු කෙරෙත් ද, කසයෙනුදු තළත් ද, වේවැළිනුදු තලත් ද අඩදඬියෙනුදු තළත් ද, අත ද සිඳිත් ද, පය ද සිඳිත් ද, අත්පාත් සිඳිත් ද, කන ද සිඳිත් ද, නැහැය ද සිඳිත් ද, කන්නැහැ ද සිඳිත් ද, බිලඞ්ගථාලිකවධ ද කෙරෙත් ද, ශඞ්ඛමුණ්ඩිකවධ ද කෙරෙත් ද, රාහුමුඛවධ ද කෙරෙත් ද, ජොතිමාලිකවධ ද කෙරෙත් ද, හත්ථපජ්ජොතික වධ ද කෙරෙත් ද, එරකවත්තිකවධ ද කෙරෙත් ද, චීරකවාසිකවධ ද කෙරෙත් ද, එණෙයාකවධ ද කෙරෙත් ද, බලිසමංසිකවධ ද කෙරෙත් ද, කහාපණකවධ ද කෙරෙත් ද, ඛාරාපතච්ඡිකවධ ද කෙරෙත් ද, පලිඝපරිවත්තිකවධ ද කෙරෙත් ද, පලාලපිට්ඨිකවධ ද කෙරෙත් ද, රත්තෙලිනුදු ඉසිත් ද, ශුනකයන් ලවා කවත් ද, දිවස්හුලෙහි හිඳුවත් ද, කඩුවෙනුදු හිස සිඳිත් ද, එබඳු පාපධර්මයෝ මා කෙරෙහි ඇත, මම ද ඒ දහම්හි දක්වෙමි. රජදරුවෝ මයිත් දනගන්නාහු නම් රජදරුවෝ මයිදු ගෙන විවිධ කම්කටොලු කරන්නාහු ය. කසයෙනුදු තළන්නාහු ය, වේවැලිනුදු තළන්නාහු ය. අඩදඬියෙනුදු තළන්නාහුය, අත ද සිඳින්නාහු ය, පය ද සිඳින්නාහු ය, අත්පා ද සිඳින්නාහු ය, කන ද සිඳින්නාහු ය, නැහැය ද සිඳින්නාහු ය, කන්නැහැ ද සිඳින්නාහු ය, බිලඞ්ගථාලික නම් වධ ද කරන්නාහු ය, ශඞ්ඛමුණ්ඩික නම් වධ ද කරන්නාහු ය, රාහුමුඛ නම් වධ ද කරන්නාහු ය, ජොතිමාලික නම් වධ ද කරන්නාහු ය, හත්ථපජ්ජොතික නම් වධ ද කරන්නාහු ය, එරකවත්තික නම් වධ ද කරන්නාහු ය, චීරකවාසික නම් වධ ද කරන්නාහු ය, එණෙයාක නම් වධ ද කරන්නාහු ය, බලිසමංසික නම් වධ ද කරන්නාහු ය, කහාපණක නම් වධ ද කරන්නාහු ය, ඛාරාපතච්ඡික නම් වධ ද කරන්නාහු ය, පලිඝපරිවත්තික නම් වධ ද කරන්නාහු ය, රත්වූ තෙලිනුදු ඉස්නාහු ය, ශුනකයන් ලවා ද කවන්නාහු ය, දිවමනුහු දු හුලැ හිඳුවන්නාහු ය, කඩුවෙනුදු හිස සිඳින්නාහු යයි කියා යි. මහණෙනි, බාල තෙමේ ඉහාත්මයෙහි ම මේ දෙවන දුක්දොම්නස විඳුනේ වෙයි.

යළිදු මහණෙනි, බාලයා පියයෙහි නැඟී හුන්නහුට වේව'යි මඤ්චයෙහි නැඟී හුන්නහුට වේ ව'යි බිමැ හෝනහුට වේව'යි ඔහු විසින් පෙර කරන ලද කායදුශ්චරිත වූ වාග් දුශ්චරිත වූ මනොදුශ්චරිත වූ යම් ලාමක කර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කර්මයෝ එළැඹ සිටිති, (අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වෙත්.) මහණෙනි, යම් පරිදි සවස් කාලයෙහි මහත් පර්වතකූටයන් ගේ සෙවණැලි පොළොවෙහි පැතිරේ ද, එපරිදි මැ මහණෙනි, පියයෙහි නැඟී හුන්නහු වේව'යි මඤ්චයෙහි නැඟී හුන්නහු වේව'යි බිමැ හෝනහු වේව'යි බාල හට ඔහු විසින් කළ කායදුශ්චරිත වූ හෝ වාග්දුශ්චරිත වූ හෝ මනොදුශ්චරිත වූ හෝ යම් පූර්ව පාපකර්ම කෙනෙක් ඇද්ද එකල්හි එ කර්මයෝ එළැබ සිටිත්. මහණෙනි, ඒ වැටැහීම් ආපාතගත කල්හි බාලයා හට මෙසේ සිත් වෙයි : 'මා විසින් කල්‍යාණයෙක් නො කරන ලද මැ ය, කුශලයෙක් නො කරන ලද මැ ය, බියට පිහිටෙක් නො කරන ලද මැ ය, පව් කරන ලද, කැකුළුකම් කරන ලද, කිලුටු කම් කරන ලද. කලණ කම් නොකළ කුසල් නො කළ බියට පිහිට නො කළ පව් කළ කැකුළුකම් කළ කිලුටුකම් කළ ඇත්තනට යම් ගතියෙක් ඇද්ද, පරලොවැ එ ගතියට යෙමි'යි කියා යි. හේ ශෝක කෙරෙයි, හේ ක්ලාන්ත වෙයි, පරිදේවනා කෙරෙයි, ළෙහි අත් පැහැර හඬයි, සම්මොහයට පැමිණෙයි. මහණෙනි, බාල තෙමේ ඉහාත්මයෙහි ම මේ තුන්වන දුක්දොම්නස ද විඳුනේ වෙයි.

ස ඛො සො භික්ඛවෙ බාලො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යං ඛො තං භික්ඛවෙ සම්මා වදමානො වදෙය්‍ය: 'එකන්තං අනිට්ඨං එකන්තං අකන්තං එකන්තං අමනාප'න්ති. නිරයමෙවේතං[1] සම්මා වදමානො වදෙය්‍ය: එකන්තං අනිට්ඨං එකන්තං අකන්තං එකන්තං අමනාපන්ති. යාවඤ්චිදං භික්ඛවෙ, උපමාපි න[2] සුකරා යාව දුක්ඛා නිරයාති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: සක්කා පන මෙ භන්තෙ,* උපමං කාතුන්ති?

සක්කා භික්ඛූති භගවා අවොච. 'සෙය්‍යථාපි භික්ඛු, චොරං ආගුචාරිං ගහෙත්වා රඤ්ඤො දස්සෙය්‍යුං: 'අයං ඛො දෙව, චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි, තං දණ්ඩං පණෙහී'ති. තමෙනං රාජා එවං වදෙය්‍ය: 'ගච්ඡථ භො, ඉමං පුරිසං පුබ්බණ්හසමයං සත්තිසතෙන හනථා'ති. තමෙනං පුබ්බණ්හසමයං සත්තිසතෙන හනෙය්‍යුං. අථ රාජා මජ්ඣන්තිකසමයං එවං වදෙය්‍ය: 'අම්භො, කථං සො පුරිසො'ති? 'තථෙව දෙව ජීවතී'ති. තමෙනං රාජා එවං වදෙය්‍ය: 'ගච්ඡථ, භො, තං පුරිසං මජ්ඣන්තිකසමයං සත්තිසතෙන හනථා'ති. තමෙනං මජ්ඣන්තිකසමයං සත්තිසතෙන හනෙය්‍යුං. අථ රාජා සායන්හසමයං එවං වදෙය්‍ය: 'අම්භො, කථං සො පුරිසො'ති? 'තථෙව දෙව ජීවතී'ති, තමෙනං රාජා එවං වදෙය්‍ය: 'ගච්ඡථ භො, තං පුරිසං සායන්හසමයං සත්තිසතෙන හනථා'ති. තමෙනං සායන්හසමයං සත්තිසතෙන හනෙය්‍යුං. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො තීහි සත්තිසතෙහි හඤ්ඤමානො තතො නිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදියෙථා'ති?

එකිස්සාපි භන්තෙ, සත්තියා හඤ්ඤමානො පුරිසො තතො නිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදියෙථ. කො පන වාදො තීහි සත්තිසතෙහීති.

අථ ඛො භගවා පරිත්තං පාණිමත්තං පාසාණං ගහෙත්වා භික්ඛූ ආමන්තෙසි: 'තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමො නු ඛො මහන්තතරො, යො චායං මයා පරිත්තො පාණිමත්තො පාසාණො ගහිතො, යො ච හිමවා පබ්බතරාජා'ති?

අප්පමත්තකො ඛො අයං භන්තෙ, භගවතා පරිත්තො පාණිමත්තො පාසාණො ගහිතො, හිමවන්තං පබ්බතරාජානං උපනිධාය සඞ්ඛම්පි න උපෙති, කලභාගම්පි න උපෙති, උපනිධිම්පි[3] න උපෙතී'ති.

එවමෙව ඛො භික්ඛවෙ, යං සො පුරිසො තීහි සත්තිසතෙහි හඤ්ඤමානො තතො නිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. තං නෙරයිකස්ස දුක්ඛස්ස[4] උපනිධාය සඞ්ඛම්පි න උපෙති. කලභාගම්පි න උපෙති. උපනිධිම්පි න උපෙති.

---

1. නිරයමෙව තං - මජසං. 2. උපමාහිපි - සීමු.
3. උපනිධම්පි - මජසං, සය්‍යා. * "සක්කා පන භන්තෙ" අට්ඨකථායං.
4. {නිරයකස්ස දුක්ඛස්ස - මජසං. {නෙරයිකස්ස - PTS.

මහණෙනි, ඒ බාල කයින් දුශ්චරිත කොට බසින් දුශ්චරිත කොට සිතින් දුශ්චරිත කොට කාබුන් මරණින් මතුයෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට එළැඹෙයි, මහණෙනි, මොනොවට බණනුයෙක් ඒකාන්ත අනිෂ්ට යයි ඒකාන්ත අකාන්ත යයි ඒකාන්ත අමනාප යයි යමක් ගෙන බෙණේ නම් මොනොවට බණනුයේ ඒකාන්ත අනිෂ්ට යයි ඒකාන්ත අමනාප යයි තෙල නිරය මැ ගෙන බණන්නේ ය, මහණෙනි, නිරයයෝ අතිශය දුක් ඇතියහ'යි දක්වන්නට උපමාවකුදු සුකර නො වේ යයි වදළෝ.

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළේ : 'වහන්ස, උපමාවක් කරන්නට හැකි දැ'යි.

භාග්‍යවතුන් වහන්සේ 'මහණ, හැක්කැ'යි වදළ සේක; ''මහණ, යම් පරිදි 'දෙවයෙනි, මේ අපරාධකාරී සොරෙක, මුහුට යම් දඬුවමක් කැමැත්තහු නම් ඒ දඬුවම එළවාලව'යි පාපකාරී සොරකු ගෙන රජුට දක්වත් ද, රජ ඔහුට මෙසේ කියන්නේ ය : 'භවත, යා, මේ පුරුෂයා පෙරවරුයෙහි සියක් සිරිපහරින් හිංසා කරව'යි පෙරවරුයෙහි තුලුන් ගෙන සියක් සිරියෙන් හිංසා කෙරෙයි. ඉක්බිති රජ මධ්‍යාහ්නයෙහි මෙසේ කියන්නේ ය : 'එම්බා පුරුෂය, ඒ වධ්‍යමාන පුරුෂයා කෙසේ වේ දැ'යි. දෙවයන් වහන්ස, එසේ ම ජීවත් වේ ය'යි. රජ තුලුන්ට මෙසේ කියන්නේ ය; 'භවත, යා, ඒ පුරුෂයා මධ්‍යාහ්න සමයෙහි සියක් සිරියෙන් හිංසා කරව'යි. මධ්‍යාහ්න සමයෙහි තුලුන් ගෙන සියක් සිරියෙන් හිංසා කරන්නාහු ය. ඉක්බිති රජ සවස්වරුයෙහි මෙසේ කියන්නේ ය; එම්බා පුරුෂය, ඒ වධ්‍යමාන පුරුෂයා කෙසේ වේ දැ'යි. දෙවයෙනි, එසේ ම ජීවත් වේ යැ'යි. රජ තුලුන්ට මෙසේ කියන්නේ ය : 'භවත, යා, ඒ පුරුෂයා සවස්වරුයෙහි සියක් සිරියෙන් හිංසා කරව'යි, සවස්වරුයෙහි තුලුන් ගෙන සියක් සිරියෙන් නස්නාහුය. මහණෙනි, කෙසේ හඟව, ඒ පුරුෂ සියක් සිරියෙන් නැස්නේ ඒ හෙතුයෙන් දුක් දොම්නස් විඳුනේ වේ දැ''යි.

වහන්ස, එක් සිරිපහරකිනුදු හන්‍යමාන පුරුෂ ඒ හෙතුයෙන් දුක්දොම්නස් විඳුනේ ය. තුන්සියක් සිරියෙන් නැස්නේ කවර කථා යැ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඇතුළුමිටැ සිටුනා පමණ කුඩා කැටක් ගෙන මහණුන් ඇමැතූ සේක : 'මහණෙනි, ඒ කිසේ හඟව, මා විසින් ඇතුළුමිටැ සිටුනා පමණ ඇලුප් කැටෙක් ගන්නා ලද ද, යම් හිමාලය පර්වතරාජයෙක් ඇද්ද, මුන් කෙරෙහි කිමෙක් මහත්තර වේ ද?

වහන්ස, මුබ වහන්සේ විසින් යම් ඇතුළුමිටැ සිටුනා පමණ අල්ප පාෂාණයෙක් ගන්නා ලද ද, මෙය හිමවත් පර්වතරාජයා පිණිස අල්පමාත්‍ර වෙයි, ගණනාවට ද නො යෙයි. කලභාගයට ද නො යෙයි, වෙතැ නැඹීමට ද නො යෙයි.

එසෙයින් මැ මහණෙනි, ඒ පුරුෂ තුන් අඩයටි සියෙන් පෙළනු ලබනුයේ ඒ හෙතුයෙන් යම් දුකක් දොම්නසක් විඳි ද, එය නිරයදුක සඳහා ගණනාවට ද නො යෙයි, කලභාගයට ද නො යෙයි, වෙතැ නැඹීමට ද නො යෙයි.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං[1] කරොන්ති: තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති. තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා සංවෙසෙත්වා[2] කුඨාරීහි තච්ඡන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා උද්ධපාදං[3] අධොසිරං ගහෙත්වා[4] වාසීහි තච්ඡන්ති සො තත්ථ -පෙ- යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පඨවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි. සො තත්ථ -පෙ- යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොති-භූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති. සකිම්පි අධො ගච්ඡති. සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන භික්ඛවෙ, මහානිරයො.

චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

අනෙකපරියායෙනපි ඛො අහං භික්ඛවෙ, නිරයකථං කථෙය්‍යං, යාවඤ්චිදං භික්ඛවෙ, න සුකරං[5] අක්ඛානෙන පාපුණිතුං යාව දුක්ඛා නිරයාති.

---

1. කම්මකාරණං - මජසං, සිමු.
2. සංවෙඨෙත්වා - ස්‍යා.
3. උද්ධං පාදං - ස්‍යා.
4. ඨපෙත්වා - PTS.
5. සුකරා - මජසං, සිමු.

මහණෙනි, ඔහුට නිරයපාලයෝ පඤ්චවිධබන්ධන නම් වධයක් කෙරෙති : රත්වූ යහුලක් දකුණතෙහි ගසති, රත් යහුලක් දෙවැනි අතෙහි ගසති, රත් යහුලක් දකුණු පයෙහි ගසති, රත් යහුලක් දෙවැනි පයෙහි ගසති, රත් යහුලක් ළමැද ගසති, හේ එහි දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳී, යම් තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒ තාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු යපොළො වැ හොවා කෙටේරියෙන් සසිති, හේ එහි දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳී. යම් තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒ තාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු ඌර්ධ්වපාද කොට අධඃශීර්ෂ කොට ගෙන වෑයෙන් සසිති. හේ එහි . . . යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒ තාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු ගෙන සම්ප්‍රජ්වලිත වූ රථයෙහි යොද ප්‍රදීප්ත වූ හාත්පසින් ප්‍රජ්වලිත වූ සප්‍රභ වූ අයොමය පෘථිවියෙහි සාරණය ද ප්‍රත්‍යාසාරණය ද කරවත්. (ඔබ මොබැ ඇවිදුවත්.) හේ එහි . . . යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒ තාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු ගෙන ප්‍රදීප්ත වූ හාත්පසින් ප්‍රජ්වලිත වූ ඇවිළගත් ගිනි ඇති මහත් අඞ්ගාරපර්වතයකට නැංවීම ද බැස්වීම ද කෙරෙති, හේ එහි තීව්‍ර වූ කටුක වූ දුක් වෙදනා විඳී, යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒ තාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු උඩුපා කොට හිස් යටිහුරු කොට ගෙන ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ගිනි ඇවිළගත් ප්‍රතප්ත ලොහොකුඹුනිරයෙහි බහාලති, හේ එහි පෙණ පිඩක් බඳු දෙහ ඇති ව පැසෙයි. හේ එහි පෙණපිඩක් බඳු දෙහ ඇති ව පස්නේ එක්වට උඩ නැඟෙ යි; එක්වට යටට බස්සි, එක්වට සරස ඇවිදී, හේ එහි තීව්‍ර වූ කටුක වූ දුඃඛ වෙදනා විඳී. යම් තාක් ඒ පාපක්‍රියා නො ගෙ වේ ද, ඒ තාක් කලුරිය නො කෙරේ.

මහණෙනි, නිරයපාලයෝ ඔහු ගෙන මහානිරයෙහි බහාලති. මහණෙනි, ඒ මහානිරය නම් :

(ඒ මහානිරය) චතුෂ්කර්ණ යැ, චතුර්ද්වාර යැ, වෙන වෙන ම කොටස් වශයෙන් බෙදන ලද, අයස්ප්‍රාකාරයෙන් පරික්ෂිප්ත යැ, යපියනින් පිළිසොයන ලද.

ඒ නරකයා ගේ අයොමය වූ භූමියැ, එ ද ජ්වලිත යැ, ගිනිදල සහිත යැ, හැමදම අවට සියක් යොදුන් තන්හි පැතිරැ සිටුනේ යි.

මහණෙනි, මම නන් අයුරින් නිරයකථා කියමි, මහණෙනි, නිරයයෝ මෙතෙක් දුක් ඇතියහ'යි කීමෙකින් මස්තකප්‍රාප්ත කොට කියන්නට සුකර නො වේ මැයි,

සන්ති භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා තිණභක්ඛා. තෙ අල්ලානිපි තිණානි සුක්ඛානිපි තිණානි දන්තුල්ලෙහකං ඛාදන්ති. කතමෙ ච භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා තිණභක්ඛා, අස්සා ගොණා ගද්‍රභා අජා මිගා, යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡානගතා පාණා තිණභක්ඛා. ස ඛො සො භික්ඛවෙ, බාලො ඉධ පුබ්බෙ රසාදො ඉධ පාපානි කම්මානි කරිත්වා කායස්ස භෙදා පරම්මරණා තෙසං සත්තානං සහව්‍යතං උපපජ්ජති යෙ තෙ සත්තා තිණභක්ඛා.

සන්ති භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා ගූථභක්ඛා, තෙ දූරතොව ගූථගන්ධං ඝායිත්වා ධාවන්ති: 'එත්ථ භුඤ්ජිස්සාම, එත්ථ භුඤ්ජිස්සාමා'ති. සෙය්‍යථාපි නාම බ්‍රාහ්මණා ආහුතිගන්ධෙන ධාවන්ති: 'එත්ථ භුඤ්ජිස්සාම, එත්ථ භුඤ්ජිස්සාමා'ති. එවමෙව ඛො භික්ඛවෙ, සන්ති තිරච්ඡානගතා පාණා ගූථභක්ඛා, තෙ දූරතොව ගූථගන්ධං ඝායිත්වා ධාවන්ති: එත්ථ භුඤ්ජිස්සාම, එත්ථ භුඤ්ජිස්සාමාති. කතමෙ ච භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා ගූථභක්ඛා: කුක්කුටා සූකරා සොණා සිගාලා, යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡානගතා පාණා ගූථභක්ඛා. ස ඛො සො භික්ඛවෙ බාලො ඉධ පුබ්බෙ රසාදො ඉධ පාපානි කම්මානි කරිත්වා කායස්ස භෙදා පරම්මරණා තෙසං සත්තානං සහව්‍යතං උපපජ්ජති යෙ තෙ සත්තා ගූථභක්ඛා.

සන්ති භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා අන්ධකාරෙ ජායන්ති අන්ධකාරෙ ජීයන්ති අන්ධකාරෙ මීයන්ති. කතමෙ ච භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා අන්ධකාරෙ ජායන්ති අන්ධකාරෙ ජීයන්ති අන්ධකාරෙ මීයන්ති: කීටා පුළවා ගණ්ඩුප්පාදා, යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡානගතා පාණා අන්ධකාරෙ ජායන්ති අන්ධකාරෙ ජීයන්ති අන්ධකාරෙ මීයන්ති. ස ඛො සො භික්ඛවෙ, බාලො පුබ්බෙ රසාදො ඉධ පාපානි කම්මානි කරිත්වා කායස්ස භෙදා පරම්මරණා තෙසං සත්තානං සහව්‍යතං උපපජ්ජති, යෙ තෙ සත්තා අන්ධකාරෙ ජායන්ති අන්ධකාරෙ ජීයන්ති අන්ධකාරෙ මීයන්ති.

සන්ති භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා උදකස්මිං ජායන්ති උදකස්මිං ජීයන්ති උදකස්මිං මීයන්ති. කතමෙ ච භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා උදකස්මිං ජායන්ති උදකස්මිං ජීයන්ති උදකස්මිං මීයන්ති: මච්ඡා කච්ඡපා සුංසුමාරා[2] යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡානගතා පාණා උදකස්මිං ජායන්ති උදකස්මිං ජීයන්ති උදකස්මිං මීයන්ති. ස ඛො සො භික්ඛවෙ, බාලො ඉධ පුබ්බෙ රසාදො ඉධ පාපානි කම්මානි කරිත්වා කායස්ස භෙදා පරම්මරණා තෙසං සත්තානං සහව්‍යතං උපපජ්ජති, යෙ තෙ සත්තා උදකස්මිං ජායන්ති උදකස්මිං ජීයන්ති උදකස්මිං මීයන්ති.

සන්ති භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා අසුචිස්මිං ජායන්ති අසුචිස්මිං ජීයන්ති අසුචිස්මිං මීයන්ති කතමෙ ච භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා අසුචිස්මිං ජායන්ති අසුචිස්මිං ජීයන්ති අසුචිස්මිං මීයන්ති: යෙ තෙ භික්ඛවෙ සත්තා පූතිමච්ඡෙ වා ජායන්ති පූතිමච්ඡෙ වා ජීයන්ති පූතිමච්ඡෙ වා මීයන්ති. පූතිකුණපෙ වා-පෙ-පූතිකුම්මාසෙ වා-පෙ-චන්දනිකාය වා-පෙ-ඔළිගල්ලෙ වා ජායන්ති-පෙ-ස ඛො සො භික්ඛවෙ, බාලො ඉධ පුබ්බෙ රසාදො ඉධ පාපානි කම්මානි කරිත්වා කායස්ස භෙදා පරම්මරණා තෙසං සත්තානං සහව්‍යතං උපපජ්ජති යෙ තෙ සත්තා අසුචිස්මිං ජායන්ති අසුචිස්මිං ජීයන්ති අසුචිස්මිං මීයන්ති.

---

1. හත්ථි අස්සා - මජ්සං.
2. සුසුමාරා - මජ්සං.

මහණෙනි, තණපතක් බුදිනා තිරිසන්ගිය ප්‍රාණීහු ඇත, ඔහු තෙත් වූත් වියැළි වූත් තණ දතින් සිඳිමින් කති. මහණෙනි, තණ බුදිනා තිරිසන්ගිය සත්හු කවරහ යත් : අශ්වයෝ යැ, ගොන්නු යැ, ගදුහයෝ යැ, එළුවෝ යැ, මෘගයෝ යි, තෘණභක්ෂා වූ මෙයින් අන්‍ය තිරිසන්ගිය කිසි ප්‍රාණි කෙනෙක් හෝ ඇද්ද, මහණෙනි, ඒ බාල පෙර මෙලොවැ රස බුදිනේ මෙලොවැ පව්කම් කොට කාබුන් මරණින් මතු තණ බුදිනා සත්හු වෙත් නම් ඒ සතුන් ගේ සහවාසයට එළැඹෙයි.

මහණෙනි, අසුචි බුදිනා තිරිසන්ගිය ප්‍රාණීහු ඇත, ඔහු දුරින් මැ අසුචිගඳ අසා ''මෙහි දී කම්හ, මෙහි දී කම්හ''යි දිවෙති. යම් සේ බමුණෝ ''මෙහි දී වළඳම්හ, මෙහි දී වළඳම් හ''යි යාගගන්ධයෙන් දිවෙත් ද, මහණෙනි, එපරිදි මැ අසුචි කන තිරිසන්ගිය ප්‍රාණි කෙනෙක් ඇත, ඔහු දුරින් මැ ගූථගන්ධය අසා මෙහි කම්හ, මෙහි කම්හ' යි දිවෙත්, මහණෙනි, අසුචි කන තිරිසන්ගිය ප්‍රාණීහු කවරහ යත් : කුකුළෝ යැ, ඌරෝ යැ, බල්ලෝ යැ, සිවල්හු යි, අසුචි බුදිනා මෙයින් අන්‍ය යම් කිසි තිරිසන්ගිය ප්‍රාණීහු ඇද්ද, මහණෙනි, ඒ බාල මෙලොවැ පෙර ගෙධයෙන් රස වලදනේ මෙලොවැ පව්කම් කොට කායභෙදයෙන් මරණින් මතු අසුචි බුදිනා යම් සත්ත්ව කෙනෙක් වෙත් නම් ඒ සතුන් ගේ සහවාසයට එළැඹෙයි.

මහණෙනි, අඳුරෙහි උපදනා අඳුරෙහි දිරන අඳුරෙහි මියන තිරිසන් ගිය ප්‍රාණීහු ඇත. මහණෙනි, අඳුරෙහි උපදනා අඳුරෙහි දිරන අඳුරෙහි මියන තිරිසන්ගිය ප්‍රාණීහු කවරහ යත් : කීටයෝ යැ, පණුවෝ යැ, ගඬවිල්හු යි. අඳුරෙහි උපදනා අඳුරෙහි දිරන අඳුරෙහි මියන මෙයින් අන්‍ය යම් කිසි තිරිසන්ගිය ප්‍රාණීහු හෝ ඇද්ද, මහණෙනි, ඒ බාල පෙර මෙලොවැ රස වළඳනේ මෙලොවැ පව්කම් කොට කාබුන් මරණින් මතු අඳුරෙහි උපදනා අඳුරෙහි දිරන අඳුරෙහි මියන යම් සත්හු වෙත් නම් ඒ සතුන් ගේ සහවාසයට එළැඹෙයි.

මහණෙනි, දියෙහි උපදනා දියෙහි දිරන දියෙහි මියන ප්‍රාණීහු ඇත, මහණෙනි, දියෙහි උපදනා දියෙහි දිරන දියෙහි මියන ප්‍රාණීහු කවරහ යත් : මස් හ, කසුබුවෝ යැ, කිඹුල්හු යි. දියෙහි උපදනා දියෙහි දිරන දියෙහි මියන මෙයින් අන්‍ය යම් කිසි ප්‍රාණි කෙනෙක් හෝ ඇද්ද, මහණෙනි, ඒ බාල පෙර මෙලොවැ ගෙධයෙන් රස වළඳනේ මෙලොවැ පව් කම් කොට කාබුන් මරනින් මතු දියෙහි දනන දියෙහි දිරන දියෙහි මියන යම් සත්හු වෙත් නම් ඒ සතුන් ගේ සහවාසයට එළැඹෙයි.

මහණෙනි, අසුචියෙහි උපදනා අසුචියෙහි දිරන අසුචියෙහි මියන තිරිසන්ගිය ප්‍රාණි කෙනෙක් ඇත. මහණෙනි, අසුචියෙහි දනන අසුචියෙහි දිරන අසුචියෙහි මියන ප්‍රාණීහු කවරහ යත් : මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් කුණුමසෙහි හෝ උපදිත් ද, කුණුමසෙහි හෝ දිරත් ද, කුණුමසෙහි හෝ මියත් ද, පූතිකුණපයෙහි හෝ . . . කුණු කොමුයෙහි හෝ . . . මොහොළෙහි හෝ . . . ගවරවළැ හෝ උපදනා . . . සත්ත්වයෝ ඇද්ද . . . . මහණෙනි, ඒ බාල පෙර මෙලොවැ ගෙධයෙන් රස වළඳනේ මෙලොවැ පව්කම් කොට කාබුන් මරණින් මතුයෙහි අසුචියෙහි දනන අසුචියෙහි දිරන අසුචියෙහි මියන යම් සත්ත්ව කෙනෙක් ඇද්ද, ඒ සතුන් ගේ සහ වාසයට එළැඹෙයි.

25—ඒ 00502 (8/73)

අනෙකපරියායෙනපි ඛො අහං භික්ඛවෙ, තිරච්ඡානයොනිකථං කථෙය්‍යං, යාවඤ්චිදං භික්ඛවෙ, න සුකරං අක්ඛානෙන පාපුණිතුං යාව දුක්ඛා තිරච්ඡානයොනීති.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො එකච්ඡිග්ගලං යුගං මහාසමුද්දෙ පක්ඛිපෙය්‍ය, තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය. පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය. උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය. තත්‍රාස්ස කාණකච්ඡපො, සො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං උම්මුජ්ජෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති?

යදි නූන[1] භන්තෙ, කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙනාති.

ඛිප්පතරං ඛො සො භික්ඛවෙ, කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍ය. අතො දුල්ලභතරාහං භික්ඛවෙ මනුස්සත්තං වදාමි සකිං විනිපාතගතෙන බාලෙන. තං කිස්ස හෙතු : න හෙත්ථ භික්ඛවෙ, අත්ථි ධම්මචරියා සමචරියා කුසලකිරියා පුඤ්ඤකිරියා, අඤ්ඤමඤ්ඤඛාදිකා එත්ථ භික්ඛවෙ, වත්තති දුබ්බලඛාදිකා.

ස ඛො සො භික්ඛවෙ, බාලො සචෙ කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන මනුස්සත්තං ආගච්ඡති. යානි තානි නීචකුලානි : චණ්ඩාලකුලං වා නෙසාදකුලං වා වෙණකුලං[2] වා රථකාරකුලං වා පුක්කුසකුලං වා, තථාරූපෙ කුලෙ පච්චාජායති දළිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ, යත්ථ කසිරෙන ඝාසච්ඡාදෙ ලබ්භති. සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො, කාණො වා කුණී වා ඛුඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති වාචාය දුච්චරිතං චරති මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

සෙය්‍යථාපි භික්ඛවෙ, අක්ඛධුත්තො පඨමෙනෙව කලිග්ගහෙන පුත්තම්පි ජීයෙථ දාරම්පි ජීයෙථ සබ්බං සාපතෙය්‍යම්පි ජීයෙථ උත්තරිම්පි අනුබන්ධං[3] නිගච්ඡෙය්‍ය. අප්පමත්තකො සො භික්ඛවෙ, කලිග්ගහො යං සො අක්ඛධුත්තො පඨමෙනෙව කලිග්ගහෙන පුත්තම්පි ජීයෙථ දාරම්පි ජීයෙථ සබ්බං සාපතෙය්‍යම්පි ජීයෙථ උත්තරිම්පි අනුබන්ධං නිගච්ඡෙය්‍ය. අථ ඛො අයමෙව තතො මහන්තතරො කලිග්ගහො: යං සො බාලො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයම්පි භික්ඛවෙ කෙවලපරිපූරා[4] බාලභූමීති.

1 යදි පන - මජසං, සීමු.
2. වෙනුකුලං - ස්‍යා
3. අනුබන්ධං - ස්‍යා.
4. කෙවලං පරිපූරා - මජසං.

මහණෙනි, මම නන්අයුරින් තිරශ්චීනයොනිකථා කියමි. මහණෙනි, තිරශ්චීනයොනිය ඉමහත් දුකැ'යි වචනයෙන් කියා නිමහම් පැමිණෙන්නට සුකර නො වෙයි.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් එක් සිදුරැති වියදඬක් මහමුහුදෙහි බහාලන්නේ වේ ද, තෙල වියදඬ පෙරදිගින් හමන සුළඟ පැසුළු දිග කරා ගෙන යන්නේ වේ ද, පැසුළු දිගින් හමන සුළඟ පෙරදිග කරා ගෙනයන්නේ වේ ද, උතුරුදිගින් හමන සුළඟ දකුණුදික්හි ගෙනයන්නේ වේ ද, දකුණුදිගින් හමන සුළඟ උතුරුදිග්හි ගෙනයන්නේ වේ ද, ඒ මුහුදෙහි කණකැස්බෙක් ඇද්ද, ඒ කසුබු වර්ෂශතයක් වර්ෂශතයක් ඇවෑමෙන් වරක් ඉල්පෙන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ හඟිව් ද, ඒ කණකැස්බා තෙල එක් සිදුරැති වියදඬියෙහි ගෙල බහන්නේ වේ ද'යි.

වහන්ස, දීර්ඝකාලයක් ඇවෑමෙන් යම් මැ දිනෙක වියැහෙන්නේ යැ'යි.

මහණෙනි, ඒ කණකැස්බා තෙල එක් සිදුරැති වියදඬියෙහි ඉතා ශීඝ්‍ර ව ගෙල බහන්නේය. මහණෙනි, මම වරක් විනිපාතගත බාලයා විසින් මනුෂ්‍යත්වය එයට වඩා දුර්ලභතර යයි කියමි. එ කවර හෙයින යත් : මහණෙනි, මෙහි ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා, කුශලක්‍රියා පුණ්‍යක්‍රියා නැත් ම ය, මහණෙනි, මෙහි උනුන් කෑම දුර්වලයන් කෑම ඇත.

මහණෙනි, ඒ බාල ඉදින් කිසි කලෙක දීර්ඝකාලයක්හු ගේ ඇවෑමෙන් සැඬල්කුලය වේව'යි වැදිකුලය වේව'යි කුලුපොතු කුලය වේව'යි රියකරු කුලය වේව'යි පුප්සවුකුලය වේව'යි යම් නීචකුල කෙනෙක් ඇද්ද, යම් කුලයෙක්හි දුකසේ බත් වත් ලැබේ ද, දිළිඳු වූ අල්ප ආහාරපාන භොජන ඇති දුකසේ දිවිවැටුම් ඇති එබඳු කුලයෙහි උපදනේය. හේ වැලිත් දුර්වර්ණ වූයේ බිය එළවන දකුම් ඇතියේ ලකුණ්ටක (අඟුටුමිටි) වූයේ බොහෝ ආබාධ ඇතියේ වෙයි, කණ හෝ කොර හෝ කුදු හෝ පිළු හෝ වෙයි, ආහාර පාන වස්ත්‍ර යාන මල්ගඳවිලෙවුන් ශයන අගාර හා පහන්තෙල් දුකසේ ලබනසුලු වෙයි. හේ කයින් දුසිරිත් කෙරෙයි, බසින් දුසිරිත් කෙරෙයි, සිතින් දුසිරිත් කෙරෙයි, හේ කයින් දුසිරිත් පුරා බසින් දුසිරිත් පුරා සිතින් දුසිරිත් පුරා කාබුන් මරණින් මතු සැපයෙන් පහවැගිය දුර්ගති ඇති විවස ව පතිත වන නිරයට එළැඹෙයි.

මහණෙනි, යම් පරිදි අක්ෂධූර්ත තෙමේ පළමු පරාජයෙන් ම පුතුගෙනුදු පිරිහෙන්නේ යැ, අඹුවන්ගෙනුදු පිරිහෙන්නේ යැ, හැම වස්තුවෙනුදු පිරිහෙන්නේ යැ, මතුයෙහි දු බන්ධනයට පැමිණෙන්නේ යැ. මහණෙනි, යම් හෙයකින් ඒ අක්ෂධූර්ත පළමු පරාජයෙන් මැ පුතුගෙනුදු පිරිහේ ද, අඹුවන්ගෙනුදු පිරිහේ ද, සියලු වස්තුවෙනුදු පිරිහේ ද, මතුයෙහිත් බන්ධනයට පැමිණේ ද, ඒ පරාජය අල්පමාත්‍ර වූයෙක, වැළි යම් හෙයකින් ඒ බාල කයින් දුසිරිත් කොට බසින් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මතුයෙහි අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණේ ද මෙය මැ ඊට වඩා ඉතා මහත් පරාජයෙකි. මෙ ද මහණෙනි, සර්වපරිපූර්ණ වූ බාලභූමි වේ'' යයි.

තීණිමානි භික්ඛවෙ, පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි. කතමානි තීණි: ඉධ භික්ඛවෙ, පණ්ඩිතො සුචින්තිතචින්තී ච හොති සුභාසිතභාසී ච සුකතකම්මකාරී ච. නො චෙ තං භික්ඛවෙ, පණ්ඩිතො සුචින්තිතචින්තී ච අභවිස්ස සුභාසිතභාසී ච සුකතකම්මකාරී ච. කෙන නං පණ්ඩිතා ජානෙය්‍යුං පණ්ඩිතො, අයං භවං සප්පුරිසො'ති. යස්මා ච ඛො භික්ඛවෙ, පණ්ඩිතො, සුචින්තිතචින්තී ච හොති සුභාසිතභාසී ච සුකතකම්මකාරී ච තස්මා, නං පණ්ඩිතා ජානන්ති පණ්ඩිතො අයං භවං සප්පුරිසො'ති.

ස ඛො සො භික්ඛවෙ, අයං පණ්ඩිතො තිවිධං දිට්ඨෙව ධම්මෙ සුඛං සොමනස්සං පටිසංවෙදෙති. සචෙ භික්ඛවෙ පණ්ඩිතො සභාය[1] වා නිසින්නො හොති, රථියාය වා නිසින්නො හොති. සිංඝාටකෙ වා නිසින්නො හොති. තත්‍ර චෙ ජනො තජ්ජං තස්සාරුප්පං කථං මන්තෙති. සචෙ භික්ඛවෙ, පණ්ඩිතො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. තත්‍ර භික්ඛවෙ, පණ්ඩිතස්ස එවං හොති: යං ඛො ජනො තජ්ජං තස්සාරුප්පං කථං මන්තෙති. සංවිජ්ජන්තෙව තෙ ධම්මා මයි, අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමී'ති. ඉදං භික්ඛවෙ පණ්ඩිතො පඨමං දිට්ඨෙව ධම්මෙ සුඛං සොමනස්සං පටිසංවෙදෙති.

පුන ච පරං භික්ඛවෙ, පණ්ඩිතො පස්සති රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්තෙ. කසාහිපි තාළෙන්තෙ වෙත්තෙහිපි තාළෙන්තෙ-පෙ-අසිනාපි සීසං ඡින්දන්තෙ. තත්‍ර භික්ඛවෙ පණ්ඩිතස්ස එවං හොති: යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතු රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා, කම්මකාරණා කාරෙන්ති කසාහිපි තාළෙන්ති. වෙත්තෙහිපි තාළෙන්ති -පෙ- අසිනාපි සීසං ඡින්දන්ති න තෙ ධම්මා මයි සංවිජ්ජන්ති, අහඤ්ච න තෙසු ධම්මෙසු සන්දිස්සාමීති. ඉදම්පි භික්ඛවෙ පණ්ඩිතො දුතියං දිට්ඨෙව ධම්මෙ සුඛං සොමනස්සං පටිසංවෙදෙති.

පුනචපරං භික්ඛවෙ, පණ්ඩිතං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා, ඡමාය[2] වා සෙමානං. යානිස්ස පුබ්බෙ කල්‍යාණානි කම්මානි කතානි කායෙන සුචරිතානි වාචාය සුචරිතානි මනසා සුචරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ, මහන්තානං[3] පබ්බතකූටානං ඡායා සායන්හසමයං පඨවියා ඔලම්බන්ති, අජ්ඣොලම්බන්ති, අභිප්පලම්බන්ති. එවමෙව ඛො, භික්ඛවෙ, පණ්ඩිතං පීඨසමාරූළ්හං වා, මඤ්චසමාරූළ්හං වා ඡමාය වා, සෙමානං යානිස්ස පුබ්බෙ කල්‍යාණානි කම්මානි කතානි කායෙන සුචරිතානි වාචාය සුචරිතානි මනසා සුචරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති, අජ්ඣොලම්බන්ති, අභිප්පලම්බන්ති. තත්‍ර භික්ඛවෙ, පණ්ඩිතස්ස එවං හොති: 'අකතං වත මෙ පාපං අකතං ලුද්දං අකතං කිබ්බිසං, කතං කල්‍යාණං කතං කුසලං කතං භීරුත්තාණං. යාවතා හොති[4] අකතපාපානං අකතලුද්දානං අකතකිබ්බිසානං, කතකල්‍යාණානං කතකුසලානං කතභීරුත්තාණානං ගති, තං ගතිං පෙච්ච ගච්ඡාමී'ති. සො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. ඉදම්පි භික්ඛවෙ, පණ්ඩිතො තතියං දිට්ඨෙව ධම්මෙ සුඛං සොමනස්සං පටිසංවෙදෙති.

---

1. සභායං – සීමු, මජසං.
2. ඡමායං – සීමු, මජසං.
3. මහතං – මජසං
4 යාවතා හො – මජසං.

මහණෙනි, පණ්ඩිතයාගේ මේ පණ්ඩිතලක්ෂණයෝ පණ්ඩිත නිමිති හා පණ්ඩිත අපදානයෝ තුන්දෙනෙක් වෙති. කවර තුන්දෙනෙකැ යත් : මහණෙනි, මෙලොව පණ්ඩිත මනා සිතිවිලි සිතනුයේ ද වෙයි, මනා බස් බණනුයේ ද වෙයි, මනා ක්‍රියා කරනුයේ ද වෙයි. මහණෙනි, ඉදින් පණ්ඩිත මනා සිතිවිලි සිතනුයේත් නොවී නම් මනා බස් බණනු නො වී නම්, සුකෘත කර්ම නො කරනු වී නම් මේ භවත් පුරුෂ පණ්ඩිතයෙකැ යි පණ්ඩිතයෝ කවර ලකුණෙකින් ඔහු හඳුනත් ද, යම් හෙයකින් මහණෙනි, පණ්ඩිත මනා සිතිවිලි සිතනුයේත් වේ ද, සුභාෂිත බණනුයේත් වේ ද, සුකෘතකර්ම කරනුයේත් වේ ද, එහෙයින් පණ්ඩිතයෝ 'මේ භවත් සත්පුරුෂ පණ්ඩිතයෙකැ' යි ඔහු දැන ගනිති.

මහණෙනි, මේ පණ්ඩිතපුරුෂ ඉහාත්මයෙහි මැ තුන් වැදෑරුම් සුවසොම්නස් විඳුනේ යැ. මහණෙනි, ඉදින් මේ පණ්ඩිත තෙමේ සභායෙකැ හුන්නේ හෝ වේ ද, වීථියෙකැ හුන්නේ හෝ වේ ද, සතර මංසන්ධියෙකැ හුන්නේ හෝ වේ ද, එහිලා ජනයා එයින් උපන් එයට නිසි කථා මන්ත්‍රණ කෙරේ. මහණෙනි, ඉදින් පණ්ඩිත තෙමේ පණිවායෙන් දුරු වූයේ වේ ද, අයිනාදනින් දුරු වූයේ වේ ද, කාමයෙහි මිසහසරින් දුරු වූයේ වේ ද, මුසාවයෙන් දුරු වූයේ වේ ද, මදපමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වේ ද, මහණෙනි, එහි දී ඒ පණ්ඩිතහට මෙබඳු සිත් වෙයි : ජනයා එයින් උපන් එයට නිසි යම් කථාවක් මන්ත්‍රණ කෙරේ ද, ඒ පණ්ඩිතධර්මයෝ මා වෙත ඇත. මම ද ඒ පණ්ඩිතධර්මයෙහි මොනොවට පැනෙමි'යි. මහණෙනි, පණ්ඩිත තෙමේ ඉහාත්මයෙහි මැ මේ පළමු වන සුඛ සෞමනස්‍ය විඳුනේ යැ.

යළිදු මහණෙනි, පණ්ඩිත තෙමේ අපරාධකාරී සොරු ගෙන විවිධ කම්කටොලු කරන රජුන් දකී. කසයෙනුදු තළනුවන් වේවැලිනුදු තළනුවන් . . . . කඩුයෙනුදු හිස සිඳුනුවන් දකී. මහණෙනි, එහි දී පණ්ඩිත පුරුෂහට මෙ සිත වෙයි. 'යම්බඳු ලාමක අකුශල කර්මයන් හෙතුකොටගෙන අපරාධකාරී සොරු ගෙන රජදරුවෝ විවිධ කම්කටොලු කරද්ද; කසයෙනුදු තළද්ද, වේවැලිනුදු තළද්ද . . . කඩුයෙනුදු හිස සිඳිද්ද, ඒ අකුශල ධර්මයෝ මා කෙරෙහි විද්‍යමාන නො වෙති, මම ද ඒ අකුශලධර්මයන්හි නො පැනෙමි'යි. මහණෙනි, පණ්ඩිත තෙම ඉහාත්මයෙහි මේ දෙවැනි සුවසොම්නස වි දී.

යළිදු මහණෙනි, පණ්ඩිතයා පියයෙහි නැඟී සිටියහුට වේවයි මඤ්චයෙහි නැඟී සිටියහුට වේවයි බිම හෝනහුට වේවයි ඔහු විසින් පෙර කරනලද කායසුචරිත වූ වාක්සුචරිත වූ මනඃසුචරිත වූ යම් කුශල කර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කුශලකර්මයෝ එළැඹසිටිති අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වෙත්, යම්පරිදි මහණෙනි, මහත් වූ පර්වත කූටයන්ගේ සෙවණැළි සවස් කාලයෙහි පොළොවෙහි අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වශයෙන් පැතිරෙත් ද එපරිදි ම මහණෙනි, පණ්ඩිතයා පියයෙහි නැඟීසිටියහු වේවයි මඤ්චයෙහි නැඟීසිටියහු වේවයි බිමැ හෝනහු වේවයි ඔහු විසින් පෙර කරනලද කායසුචරිත වූ වාක්සුචරිත වූ මනස්සුචරිත වූ යම් කුශලකර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කර්මයෝ අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වශයෙන් එළැඹ සිටිත්. මහණෙනි, එහි දී පණ්ඩිතහට මෙබඳු සිත් වෙයි, 'එකාන්තයෙන් මා විසින් පව් නො කරනලද. රෞද්‍රකර්ම නො කරනලද, කිල්විෂ නො කරනලද, කල්‍යාණය කරනලද, කුශලය කරනලද, භයපරිත්‍රාණය කරන ලද, නො කළ පව් ඇති නො කළ රෞද්‍රකර්ම ඇති නො කළ කිල්විෂ ඇති කළ කල්‍යාණ ඇති, කළ කුසල් ඇති කළ භයපරිත්‍රාණ ඇති සත්නට යම්බඳු ගතියක් ඇද්ද, ඒ ගතියට පරලොවැ යෙමි'යි හේ ශොක නො කෙරෙයි, වෙහෙස නො වෙයි, පරිදෙවනා නො කෙරෙයි, ළෙහි අත් පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණෙයි. මහණෙනි, පණ්ඩිත තෙමේ ඉහාත්මයෙහි මැ මේ තුන් වැනි සුවසොම්නස විඳී.

ස ඛො සො භික්ඛවෙ, පණ්ඩිතො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. යං ඛො තං භික්ඛවෙ, සම්මා වදමානො වදෙය්‍ය 'එකන්තං ඉට්ඨං එකන්තං කන්තං එකන්තං මනාප'න්ති. සග්ගමෙව තං සම්මා වදමානො වදෙය්‍ය 'එකන්තං ඉට්ඨං එකන්තං කන්තං එකන්තං මනාප'න්ති. යාවඤ්චිදං භික්ඛවෙ, උපමාපි න සුකරා යාවසුඛා සග්ගාති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: සක්කා, පන භන්තෙ, උපමං කාතු'න්ති?

'සක්කා භික්ඛූ'ති භගවා අවොච. ''සෙය්‍යථාපි භික්ඛු[1], රාජා චක්කවත්ති සත්තහි රතනෙහි සමන්නාගතො චතූහි ච ඉද්ධීහි, තතො නිදානං සුඛං සොමනස්සං පටිසංවෙදෙති. කතමෙහි සත්තහි:

ඉධ භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුභවති සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං. තං දිස්වාන රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස එවං හොති: 'සුතං ඛො පන මෙතං: යස්ස රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුභවති සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං, සො හොති රාජා චක්කවත්තී. අස්සං නු ඛො අහං රාජා චක්කවත්තී'ති.

අථ ඛො භික්ඛවෙ, රාජා ඛත්තියො මුද්ධාවසිත්තො උට්ඨායාසනා[2] වාමෙන හත්ථෙන භිඞ්කාරං[3] ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන චක්කරතනං අබ්භුක්කිරති[4], 'පවත්තතු භවං චක්කරතනං, අභිවිජිනාතු භවං චක්කරතන'න්ති. අථ ඛො තං භික්ඛවෙ, චක්කරතනං පුරත්ථිමං දිසං පවත්තති, අන්වදෙව රාජා චක්කවත්ති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පන භික්ඛවෙ, පදෙසෙ චක්කරතනං පතිට්ඨාති. තත්‍ර රාජා චක්කවත්ති වාසං උපෙති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය.

යෙ ඛො පන භික්ඛවෙ, පුරත්ථිමාය දිසාය පටිරාජානො, තෙ රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු: 'එහි ඛො මහාරාජ, ස්වාගතං මහාරාජ, සකන්තෙ මහාරාජ, අනුසාස මහාරාජා'ති.

රාජා චක්කවත්ති එවමාහ: 'පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරිතබ්බා, මුසා න භාසිතබ්බා, මජ්ජං න පාතබ්බං, යථාභුත්තඤ්ච භුඤ්ජථා'ති. යෙ ඛො පන භික්ඛවෙ, පුරත්ථිමාය දිසාය පටිරාජානො, තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා[5] භවන්ති අථ ඛො තං භික්ඛවෙ චක්කරතනං පුරත්ථිමසමුද්දං අජ්ඣොගාහෙත්වා පච්චුත්තරිත්වා දක්ඛිණං දිසං පවත්තති -පෙ- දක්ඛිණං සමුද්දං අජ්ඣොගාහෙත්වා පච්චුත්තරිත්වා පච්ඡිමං දිසං පවත්තති -පෙ- පච්ඡිමං සමුද්දං අජ්ඣොගාහෙත්වා, පච්චුත්තරිත්වා උත්තරං දිසං පවත්තති. අන්වදෙව රාජා චක්කවත්තී සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය.

---

1. භික්ඛවෙ - මජසං.
2. උට්ඨායාසනා - මජසං නත්ථි.
3. භිඞ්ගාරං - ස්‍යා.
4. අබ්භුකිරති - ස්‍යා.
5. අනුයන්තා - මජසං, සීමු.

මහණෙනි, ඒ පණ්ඩිත තෙමේ කයින් සුචරිතය කොට බසින් සුචරිතය කොට සිතින් සුචරිතය කොට කාබුන් මරණින් මතුයෙහි සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. මහණෙනි, මනාකොට කියනුයෙක් යම්ගතියක් සඳහා ඒකාන්තයෙන් ඉෂ්ට යැ ඒකාන්තයෙන් කාන්ත යැ ඒකාන්තයෙන් මනාප යැයි කියා නම් මනාකොට කියනුයෙක් ඒ ස්වර්ගය මැ ඒකාන්තයෙන් ඉෂ්ට යැ ඒකාන්තයෙන් කාන්ත යැ ඒකාන්තයෙන් මනාප යැ'යි කියන්නේ යැ. මහණෙනි, ඒ ස්වර්ගයෝ අතිශය සුව ඇත්තාහ'යි දක්වන්නට උපමාවකුදු සුකර නො වේ'යයි වදළහ.

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ: වහන්ස, උපමාවක් එළවන්ට හැකි ද? යි.

භාග්‍යවතුන් වහන්සේ මහණ, හැකි යයි වදළසේක. 'මහණ, යම්සේ සප්තරත්නයෙන් ද චතුර්විධ ඍද්ධියෙන් ද සමන්වාගත වූ සක්විති රජ ඒ හේතුයෙන් සුවසොම්නස් විඳී. කවර සතෙකින් ද යත්:

මහණ මෙලොවැ මූර්ධාභිෂික්ත වූ එදවස් පසළොස්වක් පොහොයෙහි ස්නානය කළ පෙහෙවස් වූ මතුමහල්තලයට නැඟී සිටි කැත්රජුහට දහසක් අර ඇති නිම්වළලු සහිත වූ නැබ සහිත වූ සර්වාකාරයෙන් පරිපූර්ණ වූ දිව්‍ය චක්‍රරත්නය පහළ වෙයි. මූර්ධාභිෂික්ත වූ ඒ ක්ෂත්‍රියරජුට එදක මෙසිත වෙයි : 'මා විසින් මෙසේ අසන ලද, මූර්ධාභිෂික්ත වූ එදවස් පොහොයැ පසළොස්වක්යෙහි ස්නානය කළ පෙහෙවස් වූ මතුමහල් තලයට පැමිණි කැත් රජක්හට දහසක් අර ඇති නිම්වළලු සහිත වූ නැබ සහිත වූ සර්වාකාරයෙන් පරිපූර්ණ වූ දිව්‍ය චක්‍රරත්නය පහළ වේ ද, ඒ රජ සක්විති වෙයි. මම සක්විති රජ වීම් දෝ හො'යි.

මහණෙනි, ඉක්බිති මූර්ධාභිෂික්ත වූ ක්ෂත්‍රිය රජ හුනස්නෙන් නැගී වමතින් කෙණ්ඩිය ගෙන දකුණතින් චක්‍රරත්නයට පැන් වඩයි. භවත් චක්‍රරත්නය ප්‍රවර්තන කෙරේවා, භවත් චක්‍රරත්නය දිනාව'යි කියා යි. එසඳ මහණෙනි, ඒ චක්‍රරත්නය පෙරදිගට ප්‍රවර්තන කෙරෙයි. තදනු කොට සක්විති රජ ද සිවුරඟ සෙනඟ සමග ප්‍රවර්තන කෙරෙයි. මහණෙනි, යම් පෙදෙසකැ චක්‍රරත්නය පිහිටා ද එහි සක්විති රජ සිවුරඟ සෙනඟ සමග වාසයට පැමිණෙයි.

මහණෙනි, පෙරදිග යම් ප්‍රතිපක්ෂ රජ කෙනෙක් ඇද්ද ඔහු සක්විති රජු කරා එළැඹ මෙසේ කියති: 'එව මහරජ, මහරජ ස්වාගත යැ, මහරජ තොප අයති යැ, මහරජ අනුශාසනා කරව'යි.

සක්විතිරජ මෙසේ කියා : ප්‍රාණවධ නො කටයුතු යැ, අයිනාදන් නො ගතයුතු යැ, කාමයෙහි මිසහසර නො කටයුතු යැ. මෘෂා නො බිණියයුතු යැ. මද්‍ය නො පියයුතු යැ වැළඳූ පරිදි මැ වළඳව'යි කියා යි. යළි මහණෙනි, පූර්වදිශායෙහි යම් ප්‍රතිපක්ෂ රජ කෙනෙක් වෙද්ද, ඔහු සක්විති රජුට අනුයුක්ත වූවාහු වෙති. ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය පූර්ව සාගරයට වැදගෙන නැඟී දකුණුදිගට ප්‍රවර්තන කෙරෙයි . . . . දක්ෂිණ සාගරයට බැසගෙන නැඟී පශ්චිමදිශාවට ප්‍රවර්තන කෙරෙයි . . . . පශ්චිමසාගරයට බැසගෙන නැඟී උතුරුදිගට ප්‍රවර්තන කෙරෙයි. සක්විතිරජ සියුරඟ සෙනඟ සමග අනුප්‍රවර්තන කෙරෙයි.

යස්මිං ඛො පන භික්ඛවෙ, පදෙසෙ චක්කරතනං පතිට්ඨාති. තත්‍ර රාජා චක්කවත්ති වාසං උපෙති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පන භික්ඛවෙ, උත්තරාය දිසාය පටිරාජානො තෙ රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු: 'එහි ඛො මහාරාජ, ස්වාගතං මහාරාජ, සකං තෙ මහාරාජ, අනුසාස මහාරාජා'ති.

රාජා චක්කවත්ති එවමාහ: 'පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරිතබ්බා, මුසා න භාසිතබ්බා, මජ්ජං න පාතබ්බං, යථාභුත්තඤ්ච භුඤ්ජථා'ති. යෙ ඛො පන භික්ඛවෙ, උත්තරාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා භවන්ති.

අථ ඛො තං භික්ඛවෙ, චක්කරතනං සමුද්දපරියන්තං පඨවිං අභිවිජිනිත්වා තමෙව රාජධානිං පච්චාගන්ත්වා, රඤ්ඤො චක්කවත්තිස්ස අන්තෙපුරද්වාරෙ අක්ඛාහතං මඤ්ඤෙ තිට්ඨති, රඤ්ඤො චක්කවත්තිස්ස අන්තෙපුරද්වාරං උපසොභයමානං. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං චක්කරතනං පාතුභවති.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස හත්ථිරතනං පාතුභවති සබ්බසෙතො සත්තප්පතිට්ඨො ඉද්ධිමා වෙහාසඞ්ගමො උපොසථො[1] නාගරාජා. තං දිස්වාන රඤ්ඤො චක්කවත්තිස්ස චිත්තං පසීදති. භද්දකං වත භො හත්ථියානං, සචෙ දමථං උපෙය්‍යා'ති. අථ ඛො තං භික්ඛවෙ, හත්ථිරතනං සෙය්‍යථාපි නාම භද්‍රො හත්ථාජානීයො දීඝරත්තං සුපරිදන්තො, එවමෙව දමථං උපෙති. භූතපුබ්බං භික්ඛවෙ, රාජා චක්කවත්ති තමෙව හත්ථිරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පඨවිං අනුසංයායිත්වා තමෙව රාජධානිං පච්චාගන්ත්වා පාතරාසං අකාසි. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං හත්ථිරතනං පාතුභවති.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස අස්සරතනං පාතුභවති සබ්බසෙතො කාකසීසො[2] මුඤ්ජකෙසො ඉද්ධිමා වෙහාසඞ්ගමො වලාහකො[3] අස්සරාජා. දිස්වාන රඤ්ඤො චක්කවත්තිස්ස චිත්තං පසීදති: භද්දකං වත භො අස්සයානං, සචෙ දමථං උපෙය්‍යා'ති. අථ ඛො තං භික්ඛවෙ, අස්සරතනං සෙය්‍යථාපි නාම භද්‍රො අස්සාජානීයො දීඝරත්තං සුපරිදන්තො, එවමෙව දමථං උපෙති. භූතපුබ්බං භික්ඛවෙ, රාජා චක්කවත්ති තමෙව අස්සරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පඨවිං අනුසංයායිත්වා තමෙව රාජධානිං පච්චාගන්ත්වා පාතරාසං අකාසි. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං අස්සරතනං පාතුභවති.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස මණිරතනං පාතුභවති සො හොති මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො තස්ස ඛො පන භික්ඛවෙ, මණිරතනස්ස ආභා සමන්තා යොජනං ඵුටා හොති. භූතපුබ්බං භික්ඛවෙ, රාජා චක්කවත්ති තමෙව මණිරතනං වීමංසමානො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මණිං ධජග්ගං ආරොපෙත්වා රත්තන්ධකාරතිමිසායං පායාසි. යෙ ඛො පන භික්ඛවෙ, සමන්තා ගාමා අහෙසුං, තෙ තෙනොභාසෙන කම්මන්තෙ පයොජෙසුං දිවාති මඤ්ඤමානා. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං මණිරතනං පාතුභවති.

---

1. උපොසථොනාම - සීමු.
2. කාළසීසො - මජ්සං.
3. වලාහකානාම - සීමු.

තවද මහණෙනි, යම් පෙදෙසක චක්‍රරත්නය පිහිටා ද එහි සක්විතිරජ සියුරඟ සෙනඟ සමග වාසයට පැමිණෙයි. තවද මහණෙනි, උතුරු දිශායෙහි යම් ප්‍රතිපක්ෂ රජ කෙනෙක් ඇද්ද, ඔහු සක්විති රජු කරා එළඹ මෙසේ කියති : එව මහරජ, ස්වාගත යැ මහරජ, මහරජ තොපගේ අයතියැ වෙයි, අනුශාසනා කරව මහරජ'යි.

සක්විතිරජ මෙසේ කියයි: ප්‍රාණවධ නො කටයුතු යැ, අයිනාදන් නො ගතයුතු යැ, කාමයෙහි මිසහසර නො කටයුතු යැ, මෘෂා නො බිණියයුතු යැ, මද්‍ය නො පියයුතු යැ, වැළඳූ පරිදි මැ වළඳුව'යි, තවද මහණෙනි, උතුරු දිශායෙහි යම් ප්‍රතිපක්ෂ රජ කෙනෙක් ඇද්ද, ඔහු සක්විති රජුට අනුයුක්ත වූවාහු වෙති.

ඉක්බිති මහණෙනි, ඒ චක්‍රරත්නය සමුද්‍රපර්‍යන්ත කොට ඇති පෘථිවිය දිනා ඒ රාජධානියට ම පෙරළා අවුත් සක්විති රජුගේ අන්තඃපුරද්වාරය හොබවමින් අකුරු ගැසූ කලක් මෙන් සිටී. මහණෙනි, සක්විති රජුට මෙබඳු වූ චක්‍රරත්නය පහළ වෙයි :

තවද මහණෙනි, සක්විති රජුට හස්තිරත්නය පහළ වෙයි. සව්සුදු සතඟින් පොළොව පහස්නා ඉදුහ ඇති අහසැ යන උපොසථකුලයෙහි ඇත්රජෙකි. එ දක සක්විති රජුගේ සිත පහදී. 'භවත්නි, ඉදින් දමනයට පැමිණේ නම් එකාන්තයෙන් භද්‍ර වූ හස්තියානයෙකැ' යි. ඉක්බිති මහණෙනි, ඒ හස්තිරත්නය දීර්ඝරාත්‍රයෙහි මොනොවට දමනය කළ භද්‍ර වූ ආජානීය හස්තියකු යම්සේ නම් එපරිදි මැ දමනයට පැමිණෙයි. මහණෙනි, පෙර වූවකි : සක්විති රජ එ මැ හස්තිරත්නය විමසනුයේ පෙරවරුයෙහි නැඟී සමුද්‍රපර්‍යන්ත වූ පෘථිවිය වටා ගොස් එ මැ රාජධානියට පෙරළා අවුත් පෙරබත්කිස කෙළේ යැ. මහණෙනි, සක්විති රජුට මෙබඳු වූ හස්තිරත්නය පහළ වෙයි.

තවද මහණෙනි, සක්විතිරජුට අශ්වරත්නය පහළ වෙයි. සව්සුදු කළුවන්හිස් ඇති මුදුතණ බඳු කෙස් ඇති ඉදුහ ඇති අහසැ යන වලාහක කුලයෙහි අස්රජෙකි, එ දක සක්විතිරජුගේ සිත පහදී : 'භවත්නි, ඉදින් දමනයට පැමිණේ නම් එකැතින් භද්‍ර වූ අශ්වයානයෙකැ'යි. ඉක්බිති මහණෙනි, ඒ අශ්වරත්නය දීර්ඝරාත්‍රයෙහි මොනොවට දැමූ භද්‍ර වූ ආජානීය අශ්වයෙක් යම්සේ නම්, එපරිදි මැ දමනයට පැමිණෙයි. මහණෙනි, වූවකි : පෙර සක්විති රජ එ මැ අශ්වරත්නය විමසනුයේ පෙරවරුයෙහි නැඟී සමුද්‍රපර්‍යන්ත වූ පෘථිවිය වටා ගොස් එ මැ රාජධානියට පෙරළා අවුත් පාතරාසය කෙළේ යැ. මහණෙනි, සක්විති රජුට මෙ බඳු වූ අශ්වරත්නය පහළ වෙයි.

තවද මහණෙනි, සක්විති රජුට මණිරත්නය පහළ වෙයි. හේ ශොභන වූ ජාතිමත් වූ අටැස් වූ මොනවට පිරියම් කළ වෙරළුමිණෙක් වෙයි. මහණෙනි, ඒ මාණික්‍යරත්නයාගේ වැළිත් ආලොකය හාත්පසැ යොදුනක් පැතිර සිටියේ වෙයි. මහණෙනි, පෙර වූවකි : සක්විතිරජ එ මැ මිණිරුවන විමසනුයේ සියුරඟ සෙනඟ සන්නද්ධ කොට මිණිරුවන ධවජාග්‍රයට නඟා රැය ගනඅඳුරෙහි නික්ම ගියේ යැ. මහණෙනි, හාත්පසැ යම් ගම්වැසි කෙනෙක් වූවාහු ද ඔහු ඒ ආලොකයෙන් 'දහවලැ'යි සිතමින් කර්මාන්තයන් කළහ. මහණෙනි, සක්විති රජුට මෙ බඳු මිණිරුවන පහළ වෙයි.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස ඉත්ථිරතනං පාතුභවති අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා නාතිදීඝා නාතිරස්සා නාතිකිසා නාතිථූලා නාතිකාළී[1] නාච්චොදාතා අතික්කන්තා මානුසං වණ්ණං අප්පත්තා දිබ්බං වණ්ණං. තස්ස ඛො පන භික්ඛවෙ, ඉත්ථිරතනස්ස එවරූපො කායසම්ඵස්සො හොති: සෙය්‍යථාපි නාම තූලපිචුනො වා කප්පාසපිචුනො වා තස්ස ඛො පන භික්ඛවෙ, ඉත්ථිරතනස්ස සීතෙ උණ්හානි ගත්තානි හොන්ති. උණ්හෙ සීතානි ගත්තානි හොන්ති. තස්ස ඛො පන භික්ඛවෙ, ඉත්ථිරතනස්ස කායතො චන්දනගන්ධො වායති. මුඛතො උප්පලගන්ධො වායති. තං ඛො පන භික්ඛවෙ, ඉත්ථිරතනං රඤ්ඤො චක්කවත්තිස්ස පුබ්බුට්ඨායිනී හොති පච්ඡානිපාතිනී කිංකාරපටිස්සාවිනී මනාපචාරිනී පියවාදිනී. තං ඛො පන භික්ඛවෙ, ඉත්ථිරතනං රාජානං චක්කවත්තිං මනසාපි නො අතිචරති, කුතො පන කායෙන. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං ඉත්ථිරතනං පාතුභවති.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස ගහපතිරතනං පාතුභවති. තස්ස කම්මවිපාකජං දිබ්බං චක්ඛුං පාතුභවති, යෙන නිධිං පස්සති සස්සාමිකම්පි අස්සාමිකම්පි. සො රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහ: අප්පොස්සුක්කො ත්වං දෙව හොහි. අහං තෙ ධනෙන ධනකරණීයං කරිස්සාමී'ති. භූතපුබ්බං භික්ඛවෙ, රාජා චක්කවත්තී තමෙව ගහපතිරතනං වීමංසමානො නාවං අභිරුහිත්වා මජ්ඣෙගඞ්ගාය නදියා සොතං ඔගහෙත්වා ගහපතිරතනං එතදවොච: අත්ථො මෙ ගහපති හිරඤ්ඤසුවණ්ණෙනා'ති. තෙන හි මහාරාජ එකං තීරං නාවා උපෙතූ'ති. ඉධෙව මෙ ගහපති, අත්ථො හිරඤ්ඤසුවණ්ණෙනා'ති. අථ ඛො තං භික්ඛවෙ, ගහපතිරතනං උභොහි හත්ථෙහි උදකෙ ඔමසිත්වා පූරං හිරඤ්ඤසුවණ්ණස්ස කුම්භිං උද්ධරිත්වා රාජානං චක්කවත්තිං එවමාහ[2]: අලං එත්තාවතා මහාරාජ, කතං එත්තාවතා මහාරාජ, පූජිතං එත්තාවතා මහාරාජා'ති. රාජා චක්කවත්තී එවමාහ: අලං එත්තාවතා ගහපති, කතං එත්තාවතා ගහපති, පූජිතං එත්තාවතා ගහපතී'ති. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං ගහපතිරතනං පාතුභවති.

පුනචපරං භික්ඛවෙ, රඤ්ඤො චක්කවත්තිස්ස පරිනායකරතනං පාතුභවති. පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී පටිබලො රාජානං චක්කවත්තිං උපට්ඨාපෙතබ්බං[3] උපට්ඨාපෙතුං[4] අපයාපෙතබ්බං අපයාපෙතුං. ඨපෙතබ්බං ඨපෙතුං. සො රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහ: අප්පොස්සුක්කො ත්වං දෙව හොහි, අහං අනුසාසිස්සාමී'ති. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස එවරූපං පරිනායකරතනං පාතුභවති.

රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමෙහි සත්තහි රතනෙහි සමන්නාගතො හොති.

කතමාහි චතූහි ඉද්ධීහි :

ඉධ භික්ඛවෙ, රාජා චක්කවත්තී අභිරූපො හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමාය පඨමාය ඉද්ධියා සමන්නාගතො හොති.

---

1. නාතිකාළිකා - මජසං, සයා.
2. එතදවොච - සීමු, මජසං.
3. උපයාපෙතබ්බං - සීමු, මජසං.
4. උපයාපෙතුං - සීමු, මජසං.

තවද මහණෙනි, සක්විති රජුට ස්ත්‍රීරත්නය පහළ වෙයි. විශිෂ්ට රූප ඇත්තී යැ දකුම්කලු යැ ප්‍රසාද එළවන්නී යැ උතුම් වූ වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත යැ. ඉතා නො උස් යැ ඉතා නො මිටි යැ ඉතා සිහු නො වූ යැ ඉතා මහත් නො වූ යැ, ඉතා කැළි නො වූ යැ ඉතා සුදු නො වූ යැ මිනිස් පැහැ ඉක්ම නො සිටියා යැ දිව්‍යවර්ණයට නො පැමිණියා වෙයි. මහණෙනි, ඒ ස්ත්‍රීරත්නයාගේ මෙ බඳු කායසංස්පර්ශයෙක් වෙයි. හිඹුල්පුළුන් හෝ කපු පුළුන් හෝ යම්සේ නම් එමෙනි. යළි මහණෙනි, ඒ ස්ත්‍රීරත්නයාගේ ගාත්‍රයෝ සිහිලෙහි උණුසුම් වෙති, උණුසුමෙහි සිහිල්වූ ගාත්‍රයෝ වෙත්, මහණෙනි, ඒ ස්ත්‍රීරත්නයාගේ වැළිත් සිරිරින් සඳුන්සුවඳ හමයි, මුවින් උපුල්සුවඳ හමයි. තවද මහණෙනි, ඒ ස්ත්‍රීරත්නය සක්විති රජුට පළමු නැඟිසිටින්නී පසුව නිදන්නී 'කුම් කෙරෙම් ද' යි (උපස්ථායිකා වශයෙන්) පිළිවිස කරන්නී මනවඩනා ඇ කරන්නී ප්‍රිය තෙපුල් බණන්නී වෙයි. මහණෙනි, ඒ ස්ත්‍රීරත්නය වැළිත් සක්විතිරජු සිතිනුදු නො ඉක්මවයි, කයින් ඉක්මවයි යනු කිම? මහණෙනි, සක්විති රජුට මෙබඳු වූ ස්ත්‍රීරත්නය පහළ වෙයි.

තවද මහණෙනි, සක්විති රජුට ගෘහපති රත්නයෙක් පහළ වෙයි. ඔහට කර්මවිපාකජ වූ දිව ඇස පහළ වෙයි. යම් ඇසෙකින් සස්වාමික වූ ද අස්වාමික වූ ද නිධාන දකී ද එ බඳු ඇසෙකි. හේ සක්විතිරජු කරා එළැඹ මෙසේ කියයි: 'දේවයන් වහන්ස, තෙපි අල්-පොත්සුක වා. මම් තොපට ධනයෙන් ධනකරණී කෙරෙම්'යි. මහණෙනි, පෙර වූවකි: සක්විති රජ එ මැ ගෘහපතිරත්නය විමසනුයේ නැවකට නැඟී ගංහානදී මැද ශ්‍රොතසට වැද ගෘහපතිරත්නයට තෙල කී : 'ගෘහපතිය, මට හිරණ්‍යස්වර්ණයෙන් ප්‍රයොජන ඇතැ'යි. 'මහරජ, එසේ වී නම් නැව එක් ඉවුරකට පැමිණෙව'යි. 'ගෘහපතිය, මට මෙහි දී ම, හිරණ්‍යස්වර්ණයෙන් ප්‍රයොජන ඇතැ'යි. ඉක්බිති මහණෙනි, ඒ ගෘහපතිරත්නය දැතින් දිය ස්පර්ශ කොට රත්රන් අමුරන් පිරු කළයක් නහාගෙන සක්විති රජුට මෙසේ කී : 'මහරජ මෙතෙකින් පමණ, මහරජ මෙතෙකින් කළකිස ඇත. මහරජ මෙතෙකින් පුදනලද'යි. සක්විතිරජ මෙසේ කී : ගෘහපතිය මෙතෙකින් පමණ. ගැහැවිය මෙතෙකින් කළකිස ඇත. ගැහැවිය මෙතෙකින් පුදනලද'යි. මහණෙනි, සක්විතිරජුට මෙ බඳු වූ ගෘහපතිරත්නය පහළ වෙයි.

තවද මහණෙනි, සක්විති රජුට පරිනායක රත්නය පහළ වෙයි. හේ පණ්ඩිත යැ ව්‍යක්ත යැ විශිෂ්ටබුද්ධි ඇත්තේ යැ සක්විතිරජු කරා එළවියයුත්තහු එළවාලන්නට ද නෙරවා ලියයුත්තහු නෙරවාලන්නට ද ප්‍රතිබල වෙයි, තනතුරෙහි තැබියයුත්තහු තනතුරෙහි තබන්නට ද ප්‍රතිබල වෙයි. හේ සක්විතිරජු කරා එළැඹ මෙසේ කියයි : 'දෙවයන් වහන්ස, තෙපි අල්පොත්සුක වා. මම අනුශාසනා කෙරෙම්'යි. මහණෙනි, සක්විති රජහට මෙබඳු පුත්‍රරත්නය පහළ වෙයි.

මහණෙනි, සක්විතිරජ මේ සප්තරත්නයෙන් සමන්වාගත වෙයි.

කවර සතර සෘද්ධියකින් සමන්විත වෙ ද යත් :

මහණෙනි, මොලොව සක්විතිරජ අභිරූප වූයේ දර්ශනීය වූයේ ප්‍රසාද එළවනු වූයේ වෙයි. අන් මිනිසුන්ට වඩා උතුම් වර්ණසෞන්දර්‍ය්‍යයෙන් අතිශයින් සමන්වාගත වෙයි. මහණෙනි, සක්විතිරජ මේ පළමු වන සෘද්ධියෙන් සමන්විත වෙයි.

පුනචපරං භික්ඛවෙ, රාජා චක්කවත්තී දීඝායුකො හොති චිරට්ඨිතිකො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමාය දුතියාය ඉද්ධියා සමන්නාගතො හොති.

පුනචපරං භික්ඛවෙ, රාජා චක්කවත්තී අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමාය තතියාය ඉද්ධියා සමන්නාගතො හොති.

පුනචපරං භික්ඛවෙ, රාජා චක්කවත්තී බ්‍රාහ්මණගහපතිකානං පියො හොති මනාපො. සෙය්‍යථාපි භික්ඛවෙ, පිතා පුත්තානං පියො හොති මනාපො, එවමෙව ඛො භික්ඛවෙ, රාජා චක්කවත්තී, බ්‍රාහ්මණගහපතිකානං පියො හොති මනාපො. රඤ්ඤොපි භික්ඛවෙ, චක්කවත්තිස්ස බ්‍රාහ්මණගහපතිකා පියා හොන්ති මනාපා. සෙය්‍යථාපි භික්ඛවෙ, පිතු පුත්තා පියා හොන්ති මනාපා. එවමෙව ඛො භික්ඛවෙ, රඤ්ඤොපි චක්කවත්තිස්ස බ්‍රාහ්මණගහපතිකා පියා හොන්ති මනාපා. භූතපුබ්බං භික්ඛවෙ, රාජා චක්කවත්තී චතුරඞ්ගිනියා සෙනාය උය්‍යානභූමිං නිය්‍යාසි. අථ ඛො භික්ඛවෙ, බ්‍රාහ්මණගහපතිකා රාජානං චක්කවත්තිං උපසඞ්කමිත්වා එවමාහංසු : 'අතරමානො දෙව, යාහි, යථා තං මයං චිරතරං පස්සෙය්‍යාමා'ති. රාජාපි භික්ඛවෙ, චක්කවත්තී සාරථිං ආමන්තෙසි : 'අතරමානො සාරථි, පෙසෙහි යථා මං බ්‍රාහ්මණගහපතිකා චිරතරං පස්සෙය්‍යු'න්ති. රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමාය චතුත්ථාය ඉද්ධියා සමන්නාගතො හොති.

රාජා භික්ඛවෙ, චක්කවත්තී ඉමාහි චතූහි ඉද්ධීහි සමන්නාගතො හොති.

තං කිං මඤ්ඤථ, භික්ඛවෙ, අපි නු ඛො රාජා චක්කවත්තී ඉමෙහි සත්තහි රතනෙහි සමන්නාගතො ඉමාහි චතූහි ච ඉද්ධීහි, තතො නිදානං සුඛං සොමනස්සං පටිසංවෙදියෙථාති.

එකමෙකෙනාපි තෙන භන්තෙ, රතනෙන සමන්නාගතො රාජා චක්කවත්තී තතො නිදානං සුඛං සොමනස්සං පටිසංවෙදියෙථ. කො පන වාදො සත්තහි රතනෙහි චතූහි ච ඉද්ධීහීති.

අථ ඛො භගවා පරිත්තං පාණිමත්තං පාසාණං ගහෙත්වා භික්ඛූ ආමන්තෙසි : 'තං කිං මඤ්ඤථ භික්ඛවෙ, කතමො නු ඛො මහන්තතරො : යො චායං මයා පරිත්තො පාණිමත්තො පාසාණො ගහිතො, යො ච හිමවා පබ්බතරාජා'ති.

අප්පමත්තකො අයං භන්තෙ, භගවතා පරිත්තො පාණිමත්තො පාසාණො ගහිතො හිමවන්තං පබ්බතරාජානං උපනිධාය සඞ්ඛම්පි න උපෙති, කලභාගම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති.

එවමෙව ඛො භික්ඛවෙ, යං රාජා චක්කවත්තී සත්තහි රතනෙහි චතූහි ච ඉද්ධීහි සමන්නාගතො තතො නිදානං සුඛං සොමනස්සං පටිසංවෙදෙති. තං දිබ්බස්ස සුඛස්ස උපනිධාය සඞ්ඛම්පි න උපෙති, කලභාගම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති.

තවද මහණෙනි, සක්විතිරජ අන් මිනිසුනට වඩා අතිශයින් දීර්ඝායුෂ්ක වූයේ චිරස්ථායී වූයේ වෙයි. මහණෙනි, සක්විතිරජ මේ දෙවන සෘද්ධියෙන් සමන්විත වෙයි.

තවද මහණෙනි, සක්විතිරජ අන් මිනිසුනට වඩා අල්පාබාධ වූයේ අල්පාතඞ්ක වූයේ ඉතා සිහිල් නො වූ ඉතා උණුසුම් නො වූ සමව පැසෙන ග්‍රහණියෙන් සමන්විත වූයේ වෙයි. මහණෙනි, සක්විතිරජ මේ තුන්වැනි සෘද්ධියෙන් සමන්විත වෙයි.

තවද මහණෙනි, සක්විතිරජ බමුණු ගැහැවියනට ප්‍රිය මනාප වෙයි. මහණෙනි, යම්සේ පිය තෙම පුතුනට ප්‍රිය මනාප වේ ද, මහණෙනි, එපරිදි මැ සක්විතිරජ බමුණු ගැහැවියනට ප්‍රිය මනාප වේ. මහණෙනි, බමුණුගැහැවියෝ සක්විතිරජුට ද ප්‍රිය මනාප වෙති. මහණෙනි, යම්සේ පුත්‍රයෝ පියාට ප්‍රිය මනාප වෙත් ද, මහණෙනි, එපරිදි මැ බමුණුගැහැවියෝ සක්විතිරජුට ද ප්‍රිය මනාප වෙත්. මහණෙනි, පෙර සක්විතිරජ සියුරඟ සෙනඟ සමග උයන්බිමට නික්මිණ. මහණෙනි, එකල්හි බමුණුගැහැවියෝ සක්විතිරජු කරා එළඹ මෙසේ කීහ : 'දේවයෙනි, යම්සේ ඇපි තොප බොහෝ වෙලාවක් දක්නමෝ ද එසෙයින් ලැයි වැ ගියමැනැවැ'යි, මහණෙනි, සක්විතිරජ ද රියැදුරා ඇමැතී : 'සාරථිය, යම් පරිදි බමුණුගැහැවියෝ මා බොහෝ වේලාවක් දක්නාහු නම් එපරිදි ලැයි වැ (අසුන්) මෙහෙයාලව'යි. මහණෙනි, සක්විතිරජ මේ සතර වැනි සෘද්ධියෙන් සමන්වාගත වෙයි.

මහණෙනි, සක්විතිරජ මේ සතර සෘද්ධියෙන් සමන්වාගත වේ.

මහණෙනි, ඒ කිමැයි සිතවු ද, මේ සප්තරත්නයෙන් ද මේ චතුර්විධ සෘද්ධියෙන් ද සමන්වාගත වූ සක්විතිරජ කිම ඒ හේතුයෙන් සුවසොම්නස් විඳිනේ ද ? යි.

වහන්ස, ඒ එකෙකි රත්නයෙකිනුදු සමන්වාගත සක්විතිරජ ඒ හෙතුයෙන් සුවසොම්නස් විඳිනේ යැ, සත්රුවනින් ද සතර ඉද්ධයෙන් ද යුක්ත වූයේ කියනු කිමැ'යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මිට පමණ වූ පුරුතු පහණක් ගෙන භික්ෂූන් ඇමැතූ සේක. මහණෙනි, ඒ කිමැයි සිතවු ද? මා විසින් ගන්නාලද අතුල් පමණ වූ යම් පුරුතු පහණෙක් ඇද්ද, යම් හිමවත් පර්වතරාජයෙකුත් ඇද්ද, මෙයින් කවරෙක් අතිශයින් මහත් වේ ද ? යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අල්ප වූ පාණිමාත්‍ර වූ ගන්නාලද මේ පාෂාණය අල්පමාත්‍ර යැ හිමවත් පර්වතරාජයා නිසා සඞ්ඛ්‍යාවට ද නො පැමිණෙයි. කලභාගයට ද නො පැමිණෙයි. උපනික්ෂෙපයට ද නො පැමිණෙයි.

එපරිදි මැ මහණෙනි, සක්විතිරජ සත්රුවනින් ද සතර ඉද්ධයෙන් ද සමන්වාගත වූයේ එකරුණෙන් යම් සුවයක් සොම්නසක් විඳී ද එය දිව්‍ය සුඛය නිසා සඞ්ඛ්‍යාවට ද නො පැමිණෙයි, කලභාගයට ද නො පැමිණෙයි, උපනික්ෂෙපයට ද නො පැමිණෙයි.

ස ඛො සො භික්ඛවෙ, පණ්ඩිතො සචෙ කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන මනුස්සත්තං ආගච්ඡති. යානි තානි උච්චාකුලානි ඛත්තියමහාසාලකුලං වා බ්‍රාහ්මණමහාසාලකුලං වා ගහපතිමහාසාල-කුලං වා, තථාරූපෙ කුලෙ පච්චාජායති අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධනධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධ විලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ, අක්ඛධුත්තො පඨමෙනෙව කටග්ගහෙන මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡෙය්‍ය, අප්පමත්තකො සො භික්ඛවෙ, කටග්ගහො, යං සො අක්ඛධුත්තො පඨමෙනෙව කටග්ගහෙන මහන්තං භොගක්ඛන්ධං අධි-ගච්ඡෙය්‍ය. අථ ඛො අයමෙව තතො මහන්තතරො කටග්ගහො, යං සො පණ්ඩිතො කායෙන සුචරිතං චරිත්වා වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං භික්ඛවෙ කෙවලපරිපූර පණ්ඩිතභූමීති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

බාලපණ්ඩිතසුත්තං නවමං.

මහණෙනි, ඒ පණ්ඩිත ඉදින් කිසි කලෙක දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් මිනිසත් බවට පැමිණේ ද කැත්මහසල්කුල වේවයි බමුණු මහසල් කුල වේවයි ගෘහපතිමහසල්කුල වේවයි යම් ඒ කුල කෙනෙක් ඇද්ද, ආඪ්‍ය වූ මහත්ධන ඇති මහාභොග ඇති බොහෝ රන්රිදී ඇති බොහෝ පරිභොග උපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති එබඳු කුලයෙහි උපදනේ වෙයි. හෙ ද අභිරූප වූයේ දර්ශනීය වූයේ ප්‍රසාද එළවනුයේ උතුම් වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වූයේ වෙයි. ආහාර පාන වස්ත්‍ර යාන මල්ගඳවිලෙවුන් වාසාගාර හා පහන්තෙල් ලබනසුලු වෙයි. හේ කයින් සුචරිතය පුරයි, බයින් සුචරිතය පුරයි, සිතින් සුචරිතය පුරයි. හේ කයින් සුචරිතය පුරා බයින් සුචරිතය පුරා සිතින් සුචරිතය පුරා කාබුන් මරණින් මතුයෙහි සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. මහණෙනි, යම් පරිදි අක්ෂධූර්තයෙක් පළමු වන ජයග්‍රහණයෙන් මැ මහත් වූ භොගස්කන්ධය ලබා ද මහණෙනි, යම් හෙයෙකින් ඒ අක්ෂධූර්ත පළමු වන ජයග්‍රණයෙන් මැ මහත් වූ භොග ස්කන්ධය ලබා නම් ඒ ජයග්‍රහණය අල්පමාත්‍ර යැ. වැළි යම් හෙයෙකින් ඒ පණ්ඩිත කයින් සුචරිතය පුරා බයින් සුචරිතය පුරා සිතින් සුචරිතය පුරා කාබුන් මරණින් මතුයෙහි සුගති ස්වර්ගලොකයට පැමිණේ ද මේ ජයග්‍රහණය මැ ඊට වඩා අතිශයින් මහත් වෙයි. මහණෙනි, මේ සර්වපරිපූර්ණ වූ පණ්ඩිතභූමි වේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ බාලපණ්ඩිත සුත වදළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තාහු යි.

නව වැනි බාලපණ්ඩිත සූත්‍ර යි.

# 3. 3. 10

## දෙවදූත සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති· භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

සෙය්‍යථාපි භික්ඛවෙ, ද්වෙ අගාරා සද්වාරා, තත්ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි, අනුසඤ්චරන්තෙපි අනුවිචරන්තෙපි. එවමෙව ඛො අහං භික්ඛවෙ, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි.

ඉමෙ වත භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපන්නා.

ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නාති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා නානාබාහාසු ගහෙත්වා යමස්ස රඤ්ඤො දස්සෙන්ති 'අයං දෙව, පුරිසො අමත්තෙය්‍යො අපෙත්තෙය්‍යො අසාමඤ්ඤො අබ්‍රහ්මඤ්ඤො න කුලෙජෙට්ඨාපචායී, ඉමස්ස දෙවො දණ්ඩං පණෙතූති.

# 3. 3. 10
# දෙවදූත සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජෙතවන නම් වූ අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩවසනසේක. එකල්හි භාග්‍ය වතුන් වහන්සේ ' මහණෙනි 'යි භික්ෂූන් අමතාවදළහ. ඒ භික්ෂූහු, ' පින්වතුන් වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල දෙවදූත සූත්‍රය වදළ සේක :

මහණෙනි, දෙර සහිත වූ ගෘහ දෙකක් යම්සේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් මැද සිටියේ ගෙට පිවිසෙන්නා වූ ද ගෙන් නික්මෙන්නා වූ ද ගෙහි ඇවිදිනා වූ ද ඔබමොබ හැසිරෙන්නා වූ ද මිනිසුන් යම්සේ දකී ද, එපරිදි මැ මහණෙනි, මම විශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිවැසින් ච්‍යුත වන උපදනා හීනප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දක්මි. කම් වූ පරිදි මියගිය සත්ත්වයන් දැනගනිමි.

මේ භවත් සත්ත්වයෝ එකාන්තයෙන් කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයොපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන ඇත්තාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු ශොභන ගති ඇති ස්වර්ගලොකයට පැමිණියාහු ය. යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයොපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන ඇත්තාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු මිනිසුන් කෙරෙහි උපන්නාහු යැ.

මේ භවත් සත්ත්වයෝ එකාන්තයෙන් කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිත යෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයොපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන කළාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු ප්‍රෙත විෂයට පැමිණියාහු යැ. යළි මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයොපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන කළාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු තිරශ්චීනයොනියට පැමිණියාහු යැ. යළි මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයොප වාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන කළාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු අපාය වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයට පැමිණියාහු යයි.

මහණෙනි, නිරයපාලයෝ ඒ සත්ත්වයා වෙන වෙන අත් ගෙන යමරජුට දක්වති. ' දෙවයිනි, මේ පුරුෂ මෑණියන් කෙරෙහි වරදවා පිළිපන්නෙක, පියාණන් කෙරෙහි වරදවා පිළිපන්නෙක, මහණුන් කෙරෙහි වරදවා පිළිපන්නෙක, ක්ෂීණාස්‍රව බමුණන් කෙරෙහි වරදවා පිළිපන්නෙක, කුලදෙටුවන් කෙරෙහි අපචායන නො කළ කෙනෙක, දෙවයන් වහන්සේ මොහුට දඬුවම් පණවත්ව ' යි.



26—ඒ 00502 (8/73)

තමෙනං භික්ඛවෙ, යමො රාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු පඨමං දෙවදූතං පාතුභූත'න්ති? සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමාන'න්ති? සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: 'අහම්පි බොම්හි ජාතිධම්මො ජාතිං අනතීතො, හන්දාහං කල්‍යාණං කරෙමි කායෙන වාචාය මනසා'ති? සො එවමාහ: 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පන තෙ එතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. තයාවෙතං පාපං කම්මං කතං, ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

තමෙනං භික්ඛවෙ, යමො රාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා දුතියං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු දුතියං දෙවදූතං පාතුභූතන්ති? සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ආසීතිකං වා නාවුතිකං වා වස්සසතිකං වා ජාතියා ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායණං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං ඛණ්ඩදන්තං පලිතකෙසං විලූනං ඛලිතසිරං වලිතං තිලකාහතගත්ත'න්ති? සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස. සතො මහල්ලකස්ස න එතදහොසි: 'අහම්පි බොම්හි ජරාධම්මො ජරං අනතීතො, හන්දාහං කල්‍යාණං කරෙමි කායෙන වාචාය මනසා'ති? සො එවමාහ: 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පන තෙ එතං පාපං කම්මං නෙව මාතරු කතං, න පිතරු කතං, න භාතරු කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, තයාවෙතං පාපං කම්මං කතං, ත්වඤ්ඤෙව එතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

මහණෙනි, යමරජ තුලුන් අතින් පළමු වන දෙවදූතයා අනුයොග වතට නංවා ප්‍රශ්න කරයි. ලබයි පිහිටුවා ප්‍රශ්න කරයි. කරුණු විචාරයි: එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි ප්‍රථම දෙවදූතයා පහළවූවාහු නුදුටුයෙහි ? හෙ මෙසේ කියයි: වහන්ස, නුදුටුම් ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි: එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි මන්ද වූ උඩුහුරු වැ හෝනා සිය මලමූයෙහි ගැලුණු එහි හෝනා ළදරු කුමරුවකු නුදුටුයෙහි ? හේ මෙසේ කියයි : ' වහන්ස, දිටිමි ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : එම්බා පුරුෂය, විඥ වූ වෘද්ධ වූ තට තෙල සිත් නො වී නු? ' මයිත් ජාතිස්වභාව ඇතියෙමි, ජාතිය නො ඉක්ම ගියෙමි, එබැවින් මම කයින් වචසින් මනසින් පින් කෙරෙමි 'යි කියා යි. හේ මෙසේ කියයි : ' වහන්ස, නො හැකි වීමි, වහන්ස, පමාවීමි ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින් වචසින් මනසින් පින් නො කෙළෙහි යැ, එම්බා පුරුෂය, එයින් පමාවූවක්හට කරන්නාක් සෙයින් තට දඬුවම් කෙරෙති. තාගේ තෙල පාප කර්මය මව විසින් නො කරනලද, පියා විසින් නො කරනලද, බෑයා විසින් නො කරනලද, බුහුන විසින් නො කරනලද, මිත්‍රාමාත්‍යයන් විසින් නො කරනලද, නෑසහලේනෑයන් විසින් නො කරනලද මහණබමුණන් විසින් නො කරනලද, දෙවියන් විසින් නො කරන ලද, තා විසින් මැ තෙල පාප කර්මය කරන ලද, තො මැ තෙල පාප කර්මයාගේ විපාකය විඳිනෙහි' යැයි.

මහණෙනි, යමරජ ඔහුට පළමු වන දෙවදූතයා අනුයොග වශයෙන් ප්‍රශ්න කොට ලබයි පිහිටුවා ප්‍රශ්න කොට කරුණු විචාරා දෙවන දෙවදූතයා අනුයොගවතට නභා විචාරයි, ලබයි පිහිටුවා විචාරයි, කරුණු විචාරයි. එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි පහළ වූ දෙවැනි දෙවදූතයා නුදුටුයෙහි ? යි ' නුදුටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ ඔහුට මෙසේ කියයි : එම්බා පුරුෂය, මිනිසුන් කෙරෙහි උපතින් අසූවයස් වූ හෝ අනූ වයස් වූ හෝ සියක් වසක් වූ හෝ ජාතියෙන් දිරූ ගොනැස්සක් සෙයින් වක් වූ බිඳුණු සිරුරු ඇති සැරයටිය පිහිට කොට ඇති වෙවුළමින් යන ආතුර වූ ගිය යොවුන්බව් ඇති කඩදත් ඇති පැසුණු කෙස් ඇති ගිලිහුණු කෙස් ඇති මටතල වූ රැලිහුන් තලකැලැල් හුන් සිරුරු ඇති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ නුදුටුයෙහි ද ? යි. හේ මෙසේ කියයි : ' දිටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ ඔහුට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, විඥ වූ මහලු වියපත් තට තෙල සිත නො වී නු. ' මම් වූ කලි ජරාසැහැවියෙමි, ජරාව නො ඉක්ම වූයෙමි, මම එබැවින් කයින් වචසින් මනසින් කුසල් කෙරෙමි ' යි කියා යි. හේ මෙසේ කියයි : ' නො හැකි වීමි වහන්ස, පමා වීමි වහන්සැ ' යි. වහන්ස, යමරජ ඔහුට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, ප්‍රමාදවත් බැවින් කයින් වචසින් මනසින් කුසල් නො කෙළෙහි ? එම්බා පුරුෂය, එකාන්තයෙන් තට ප්‍රමාද වූවකුට යම් සේ ද එපරිද්දෙන් කරන්නාහ. තාගේ තෙල පාපකර්මය මව විසින් නො මැ කරනලද, පියා විසින් නො කරනලද, බෑයා විසින් නො කරන ලද, බුහුන විසින් නො කරනලද, සගයහළුවන් විසින් නො කරනලද, නෑසහලේනෑයන් විසින් නො කරනලද, මහණ බමුණන් විසින් නො කරනලද, දෙවියන් විසින් නො කරනලද, තා විසින් මැ තෙල පාපකර්මය කරනලද. තො මැ තෙල කර්ම යාගේ විපාකය විඳිනෙහි ' යැයි.

තමෙනං භික්ඛවෙ, යමො රාජා දුතියං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තතියං දෙවදූතං සමනුයුඤ්ජති, සමනුගාහති. සමනුභාසති : අම්භො පුරිස, න ත්වං අද්දස, මනුස්සෙසු තතියං දෙවදූතං පාතුභූත'න්ති. සො එවමාහ : 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමොරාජා එවමාහ : 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ආබාධිකං දුක්ඛිතං බාළ්හගිලානං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමාන'න්ති. සො එවමාහ : 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ : 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි : 'අහම්පි ඛොම්හි ව්‍යාධිධම්මො, ව්‍යාධිං අනතීතො, හන්දාහං කල්‍යාණං කරෙම් කායෙන වාචාය මනසා'ති. සො එවමාහ : 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ : 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පන තෙ එතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. තයාවෙතං පාපං කම්මං කතං. ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

තමෙනං භික්ඛවෙ, යමො රාජා තතියං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා චතුත්ථං දෙවදූතං සමනුයුඤ්ජති, සමනුගාහති, සමනුභාසති : 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු චතුත්ථං දෙවදූතං පාතුභූත'න්ති. සො එවමාහ : 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ : 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්තෙ, කසාහිපි තාළෙන්තෙ වෙත්තෙහිපි තාළෙන්තෙ අද්ධදණ්ඩකෙහිපි තාළෙන්තෙ හත්ථම්පි ඡින්දන්තෙ පාදම්පි ඡින්දන්තෙ හත්ථපාදම්පි ඡින්දන්තෙ කණ්ණම්පි ඡින්දන්තෙ නාසම්පි ඡින්දන්තෙ කණ්ණනාසම්පි ඡින්දන්තෙ බිලඞ්ගථාලිකම්පි කරොන්තෙ සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්තෙ රාහුමුඛම්පි කරොන්තෙ ජොතිමාලිකම්පි කරොන්තෙ හත්ථපජ්ජොතිකම්පි කරොන්තෙ එරකවත්තිකම්පි කරොන්තෙ චීරකවාසිකම්පි කරොන්තෙ එණෙය්‍යකම්පි කරොන්තෙ බලිසමංසිකම්පි කරොන්තෙ කහාපණකම්පි කරොන්තෙ ඛාරාපතච්ඡිකම්පි කරොන්තෙ පලිඝපරිවත්තිකම්පි කරොන්තෙ පලාලපීඨකම්පි කරොන්තෙ තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්තෙ සුනඛෙහිපි ඛාදාපෙන්තෙ ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්තෙ අසිනාපි සීසං ඡින්දන්තෙ'ති. සො එවමාහ : 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ : 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි : 'යෙ කිර භො පාපකානි කම්මානි කරොන්ති. තෙ දිට්ඨෙව ධම්මෙ එවරූපා විවිධා කම්මකාරණා කරීයන්ති. කිමඞ්ග පන පරත්ථ. හන්දාහං කල්‍යාණං කරෙම් කායෙන වාචාය මනසා'ති. සො එවමාහ : 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ : 'අම්භො පුරිස පමාදවතාය න කල්‍යාණමකාසි. කායෙන වාචාය මනසා, තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පන තෙ එතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. තයාවෙතං පාපං කම්මං කතං, ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති

මහණෙනි, යමරජ තුලුන් අතින් දෙවන දෙවදූතයා අනුයොග වශයෙන් පිළිවිස ලබයි වශයෙන් පිහිටුවා කරුණු අසා කරුණු බැණ තුන්වන දෙවදූතයා අනුයෝග වතට නංවා අසයි, ලබයි පිහිටුවයි. සමනුභාෂණ කම් කෙරෙයි : ' එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි තුන්වන දෙවදූතයා පහළ වූවහු නො දුටුහි ? හේ මෙසේ කියයි : ' නුදුටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ මෙසේ කියයි : ' එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි හැටි ආබාධ ඇති හටගත් දුක් ඇති දැඩි ගිලන් වූ සිය මලමූයෙහි පිළිපත් එහි හෝනා මෙරමා විසින් නහාසිටුවන ලබන මෙරමා විසින් හොවනු ලබන මාගමක හෝ පිරිමියකු හෝ නුදුටිහි ? ' හේ මෙසේ කියයි. ' දිටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : එම්බා පුරුෂය, විඥ වූ වෘද්ධ වූ තට තෙලසිත් නො වී නු ! මම ද ව්‍යාධි ධර්මයෙමි, ව්‍යාධිය අනතීතයෙමි. එයින් මම කයින් වචසින් මනසින් කලණකම් කෙරෙමි ' යි කියා යි. හේ මෙසේ කියයි : ' නො හැකි වීමි වහන්ස, පමාවීමි වහන්සැ 'යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, පමා ඇති වූ බැවින් කයින් වචසින් මනසින් කලණකම් නො කෙළෙහි යැ. එම්බා පුරුෂය, එබැවින් පමා වූවහුට දඩුවම් කරන්නා සෙයින් තට දඩුවම් කෙරෙති. තාගේ තෙල පාපකර්මය මව විසින් නො කරන ලද, පියා විසින් නො කරනලද, බෑයා විසින් නොකරන ලද, බුහුන විසින් නො කරනලද, මිත්‍රාමාත්‍යයන් විසින් නො කරනලද, නෑසාලේනෑයන් විසින් නො කරන ලද, මහණ බමුණන් විසින් නො කරනලද, දෙවියන් විසින් නො කරනලද. තා විසින් මැ කරනලද තො මැ තෙල කර්මයාගේ විපාක විඳුනෙහි '' යයි.

මහණෙනි, යමරජ තුලුන් අතින් තුන් වන දෙවදූතයා අනුයොගවතට නහා ලබයි ගන්වා සමනුභාෂණ කම් කොට සතර වන දෙවදූතයා අනුයොගවතට නංවයි, ලබයි පිහිටුවයි,කරුණු විචාරයි : ' එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි පහළ වූ සතර වන දෙවදූතයා නුදුටිහි ? හේ මෙසේ කියයි. ' නුදුටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, තෝ රජදරුවෝ මිනිසුන් කෙරෙහි අපරාධකාරී සොරු ගෙන විවිධ කම්කටොලු කෙරෙද්ද කසවැලිනුදු තළද්ද වෙවැලිනුදු තළත් ද, අඩදඬියෙනුදු තළත් ද, අත ද සිඳිත් ද පාද සිඳිත් ද අත්පාත් සිඳිත් ද, කනුදු සිඳිත් ද, නාසිකාත් සිඳිත් ද, කන්නැහැත් සිඳිත් ද බිලඞ්ගථාලිකවධත් කෙරෙත් ද සංඛමුණ්ඩික වධත් කෙරෙත් ද රාහුමුඛවධත් කෙරෙත් ද ජෝතිමාලිකවධත් කෙරෙත් ද හත්ථපජ්ජොතික වධත් කෙරෙත් ද ඒරකවත්තකවධත් කෙරෙත් ද චීරකවාසිකවධත් කෙරෙත් ද එණෙය්‍යකවධත් කෙරෙත් ද බලිසමංසිකවධත් කෙරෙත් ද කහාපණකවධත් කෙරෙත් ද ඛාරාපතච්ඡිකවධත් කෙරෙත් ද පලිඝපරිවත්තිකවධත් කෙරෙත් ද පලාලපීඨකවධත් කෙරෙත් ද තප්තතෛලයෙනුත් ඉසිත් ද නහවුන් ලවා කවත් ද ජීවත්වන්නහු හුල හිඳුවත් ද කඩුයෙනුදු හිස සිඳිත් ද තෙල අපරාධකාරීහු නුදුටිහි? හේ මෙසේ කියයි. ' දිටිමි වහන්ස, මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : එම්බා පුරුෂය, විඥ වූ වෘද්ධ වූ තට තෙලසිත් නො වී නු ! යම් කෙනෙක් පාපකර්ම කෙරෙත් ද ඔහු ඉහාත්මයෙහි මැ මෙබඳු විවිධ කම්කටොලු කරනු ලබති. පරලොව කියනු කිම ? එබැවින් මම කයින් වචසින් මනසින් කලණකම් කරමි ' කියා යි. හේ මෙසේ කියයි : නො හැකි වීමි, වහන්ස, පමා වීමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි. එම්බා පුරුෂය, පමා ඇති බැවින් කයින් වචසින් මනසින් කලණකම් නො කෙළෙහි යැ, එම්බා පුරුෂය, එබැවින් තට පමා වූවහුට යම්සේ ද එසෙයින් දඩුවම් කෙරෙති. තාගේ තෙල පාපකර්මය මව විසින් නො කරනලද, පියා විසින් නො කරනලද, බෑයා විසින් නො කරන ලද, බුහුන විසින් නො කරනලද, මිත්‍රාමාත්‍යයන් විසින් නො කරනලද, නෑසාලේ නෑයන් විසින් නො කරන ලද, මහණ බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරනලද, තා විසින් මැ තෙල පාපකර්මය කරන ලදි ' යි. තෝ මැ තෙල පාප කර්මයාගේ විපාක විඳුව ' යි.

තමෙනං භික්ඛවෙ, යමො රාජා චතුත්ථං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා පඤ්චමං දෙවදූතං සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු පඤ්චමං දෙවදූතං පාතුභූත'න්ති, සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාත'න්ති. සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: 'අහම්පි ඛොම්හි මරණධම්මො මරණං අනතීතො, හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසා'ති. සො එවමාහ: 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පන තෙ එතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, තයාවෙතං පාපං කම්මං කතං, ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

තමෙනං භික්ඛවෙ, යමො රාජා පඤ්චමං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තුණ්හී හොති.

තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කරොන්ති. තත්තං අයොඛීලං හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛීලං දුතියෙ හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛීලං පාදෙ ගමෙන්ති. තත්තං අයොඛීලං දුතියෙ පාදෙ ගමෙන්ති. තත්තං අයොඛීලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති. තමෙනං භික්ඛවෙ, නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි තච්ඡන්ති. සො තත්ථ දුක්ඛා-පෙ-තමෙනං භික්ඛවෙ, නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා[1] වාසීහි තච්ඡන්ති[2]. සො තත්ථ දුක්ඛා-පෙ-තමෙනං භික්ඛවෙ, නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පථවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි. සො තත්ථ දුක්ඛා-පෙ-තමෙනං භික්ඛවෙ, නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි. සො තත්ථ දුක්ඛා-පෙ-තමෙනං භික්ඛවෙ, නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති, සකිම්පි අධො ගච්ඡති, සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා[3] වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

---

1. ඨපෙත්වා - සීමු, PTS.
2. තච්ඡෙන්ති - සීමු, PTS.
3. ඛරා කටුකා - සීමු, මජසං

මහණෙනි, යමරජ තුලුන් අතින් සතර වන දෙවදූතයා ගෙන අනුයොග විසින් පිළිවිස ලබයි විසින් ගන්වා සමනුභාෂණකර්ම කොට පස් වන දෙවදූතයා ගෙන අනුයොග වතට නංවයි. ලබයි විසින් ගන්වයි, කරුණු පිළිවිසී. එම්බා පුරුෂය, තෝ මිනිසුන් කෙරෙහි පස් වන දේවදූතයා පහළ වූවහු නො දිටිහි ? හේ මෙසේ කියයි : ' නො දිටිමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : තෝ මිනිසුන් කෙරෙහි මළ එක් දින වූ හෝ මළ දෙදින වූ හෝ මළ තුන් දින වූ හෝ ඉදිමීගිය නිල්වන් වූ හටගත් පූයා ඇති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ නුදුටිහි ? හේ මෙසේ කියයි : ' දිටිමි වහන්සැ'යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, විඥ වූ වෘද්ධ වූ තට තෙල සිත් නො වී නු ! ' මම ද මරණධර්මයෙමි, අනතීත මරණ ඇතියෙමි, එහෙයින් කයින් වචසින් මනසින් කලණකම් කෙරෙමි ' කියා යි. හේ මෙසේ කියයි : නො හැකි වීමි වහන්ස, පමා වීමි වහන්සැ ' යි. මහණෙනි, යමරජ තුලුනට මෙසේ කියයි : ' එම්බා පුරුෂය, පමා ඇති වූ බැවින් කයින් වචසින් මනසින් කලණකම් නො කෙළෙහි යැ. එම්බා පුරුෂය, එබැවින් තට පමා වූවකුට යම්සේ ද එසෙයින් කෙරෙති. තාගේ තෙල පවකම මව විසින් නො කරන ලද, පියා විසින් නො කරනලද, බෑයා විසින් නො කරන ලද, බුහුන විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරනලද, නෑසාලේ නෑයන් විසින් නො කරනලද, මහණ බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරනලද, තා විසින් මැ තෙල පවකම් කරන ලදි. තො මැ තෙල කර්මයාගේ විපාක විඳුනෙහි ' යයි.

මහණෙනි, යමරජ තුලුන් පස් වන දෙවදූතයා ගෙන අනුයොග කොට ලබයි පිහිටුවා කරුණු පිළිවිය තුෂ්ණීම්භූත වෙයි.

මහණෙනි, නිරයපාලයෝ තුලුනට පඤ්චවිධබන්ධන නම් කම්කටොලු කෙරෙත් : තප්ත වූ යහුලක් එක් අතෙකැ ගසත්, තප්ත වූ යහුලක් දෙවන අතෙහි ගසත්, තප්ත වූ යහුලක් පළමු පයැ ගසත්, තප්ත වූ යහුලක් දෙවන පයැ ගසත්, තප්ත වූ යහුලක් ළමැඩියෙහි ගසත්. හේ එහි දුඃඛ වූ තිව්‍ර වූ කටුක වූ වේදනාවන් විඳී. ඒ පාපකර්මය ක්ෂය නො වූ තාක් කාලක්‍රියා නො කෙරේ. මහණෙනි, නිරයපාලයෝ ඔහු හොවා කුඨාරියෙන් සසිති. හේ එහි දුඃඛ වූ . . . මහණෙනි, නිරයපාලයෝ ඔහු ඌර්ධ්වපාද කොට අධඃශිරස්ක කොට ගෙන වෑයෙන් සසිත්. හේ එහි දුඃඛ වූ . . . මහණෙනි, නිරයපාලයෝ ඔහු රථ යෙහි යොද ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ හටගත් ගිනි ඇති පොළොවෙහි ඇවිදුවති· පෙරළාත් ඇවිදුවති, හේ එහි දුඃඛ වූ . . . මහණෙනි, නිරයපාලයෝ ඔහු ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ හටගත් ගිනි ඇති අඟුරුපව්යට නංවත්, බස්වත්. හේ එහි දුඃඛ වූ . . . මහණෙනි, නිරයපාලයෝ ඔහු ඌර්ධ්වපාද කොට හිස් බිම්බල්වාලීම් කොට ගෙන රත් වූ ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ගිනිගෙන දිලෙන ඇවිලගත් ගිනි සහිත ලොහොකුඹු නිරයෙහි බහත්, හේ එහි පෙනබඳු කොට පැසෙත්. හේ එහි පෙන බඳු කොට පස්නෝ වරක් උඩ එයි, වරක් යට බස්යි, වරක් සරස යෙයි. හේ එහි දුඃඛ වූ කටුක වූ තිව්‍ර වූ වේදනාවන් විඳී, යම් තාක් ඒ පවකම් ක්ෂය නො වේ ද ඒ තාක් කලුරිය නො කෙරේ.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන භික්ඛවෙ, මහානිරයො:

චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

තස්ස ඛො පන භික්ඛවෙ, මහානිරයස්ස පුරත්ථිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පච්ඡිමාය භිත්තියා පටිහඤ්ඤති. පච්ඡිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පුරත්ථිමාය භිත්තියා පටිහඤ්ඤති. උත්තරාය භිත්තියා අච්චි උට්ඨහිත්වා දක්ඛිණාය භිත්තියා පටිහඤ්ඤති. දක්ඛිණාය භිත්තියා අච්චි උට්ඨහිත්වා උත්තරාය භිත්තියා පටිහඤ්ඤති. හෙට්ඨා අච්චි උට්ඨහිත්වා උපරි පටිහඤ්ඤති. උපරිතො අච්චි උට්ඨහිත්වා හෙට්ඨා පටිහඤ්ඤති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්ථිමං ද්වාරං අවාපුරීයති[1]. සො තත්ථ සීඝෙන ජවෙන ධාවති. තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති, චම්මම්පි ඩය්හති, මංසම්පි ඩය්හති, න්හාරුම්පි ඩය්හති. අට්ඨීනිපි සම්පධූපායන්ති. උබ්භතං තාදිසමෙව හොති. යතො ච ඛො සො භික්ඛවෙ, බහුසම්පත්තො හොති, අථ තං ද්වාරං පිථීයති[2]. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පච්ඡිමං ද්වාරං අවාපුරීයති[1] -පෙ- උත්තරං ද්වාරං අවාපුරීයති -පෙ- දක්ඛිණං ද්වාරං අවාපුරීයති. සො තත්ථ සීඝෙන ජවෙන ධාවති. තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති, චම්මම්පි ඩය්හති, මංසම්පි ඩය්හති, න්හාරුම්පි ඩය්හති. අට්ඨීනිපි සම්පධූපායන්ති. උබ්භතං තාදිසමෙව හොති. යතො ච ඛො සො භික්ඛවෙ, බහුසම්පත්තො හොති. අථ තං ද්වාරං පිථීයති[2]. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්ථිමං ද්වාරං අවාපුරීයති. සො තත්ථ සීඝෙන ජවෙන ධාවති. තස්ස සීඝෙන ජවෙන ධාවතො ඡවිම්පි ඩය්හති, චම්මම්පි ඩය්හති, මංසම්පි ඩය්හති, න්හාරුම්පි ඩය්හති. අට්ඨීනිපි සම්පධූපායන්ති. උබ්භතං තාදිසමෙව හොති. සො තෙන ද්වාරෙන නික්ඛමති.

---

1. අපාපුරීයති - PTS.
2. පථීයති - මජසං.

මහණෙනි, නිරයපාලයෝ ඔහු මහනිරයෙහි බහත්. මහණෙනි, ඒ මහනිරය වනාහි :

චතුස්කර්ණ යැ, චතුර්ද්වාරය, කොටස් විසින් බෙදන ලද, යපවුරින් වටකරන ලද, යදලින් පිළිසොයන ලද,

ඒ මහානිරයයා ගේ අයෝමය භූමිය ඇවිළැගත් ගිනිදලින් යුක්ත ය, හැමද හාත්පස සියක්යොදුන් තැන් පැතිරැසිටී.

මහණෙනි, ඒ මහානිරයයා ගේ පෙරදිග බිතින් ගිනිසිළි නැඟී පැසුළු බිතෙහි හැනෙයි, පැසුළු බිතින් ගිනිසිළි නැඟී පෙරදිග බිතෙහි හැනෙයි, උතුරු බිතින් ගිනිසිළි නැඟී දකුණු බිතෙහි හැනෙයි, දකුණු බිතින් ගිනිසිළි නැඟී උතුරුබිතෙහි හැනෙයි, යට ගිනිසිළි නැඟී උඩුතල හැනෙයි, උඩතින් ගිනිසිළි නැඟී යට හැනේ. හේ එහි දුඃඛ වූ කටුක වූ තිව්‍ර වෙදනා විඳී. යම්තාක් පාපකර්මය ක්ෂය නො වේ ද ඒතාක් නො මියෙයි.

මහණෙනි, යම් හෙයෙකින් කිසිකලෙක දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් ඒ මහානරකයා ගේ පූර්වද්වාරය විවෘත වේ ද එබඳු කලෙක් වෙයි. ඒ නිරිසත් එහි ශීඝ්‍ර වූ නහර ද දැවෙයි, ජවයෙන් දුවයි. ශීඝ්‍රජවයෙන් දුවන ඔහුගේ සිවිය ද දැවෙයි, සම ද දැවෙයි, මස් ද දැවෙයි, ඇට දු දුමයි, නහනලදුයේ එබඳු මැ වෙයි. මහණෙනි, යම් කලෙක හෙතෙම බොහෝ වර්ෂසහස්‍රයෙන් සමීපයට පැමිණියේ වේ ද එකල්හි ඒ ද්වාරය වැසෙයි. හේ එහි දුඃඛ තිව්‍ර කටුක වෙදනා විඳියි. යම් තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් කල් නො මියෙයි.

මහණෙනි, යම් හෙයෙකින් කිසිවිටක දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් ඒ මහානරකයාගේ පශ්චිමද්වාරය විවෘත වේ ද එබඳු කාලයෙක් වෙයි. . . . උතුරු දෙර විවර වේ ද . . . දකුණුදෙර විවර වේ ද එබඳු කාලයෙක් වෙයි. හේ එහි ශීඝ්‍රජවයෙන් දිවෙයි. ශීඝ්‍ර ජවයෙන් දුවන ඔහුගේ සිවි ද දැවෙයි, සම් ද දැවෙයි, මස් ද දැවෙයි, නහර ද දැවෙයි, ඇටදු දුමයි, නහනලදුයේ එබඳු මැ වෙයි. මහණෙනි, හෙතෙම යම් කලෙක බොහෝ වර්ෂ සහස්‍රයෙන් සමීපයට පැමිණියේ වේ ද එකල්හි ඒ දෙර වැසෙයි. හේ එහි දුඃඛ තිව්‍ර කටුක වේදනා විඳියි. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් නො මියෙයි.

මහණෙනි, යම් හෙයෙකින් කිසිවිටක දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් ඒ මහානරකයාගේ පූර්වද්වාරය විවෘත වේ ද එබඳු කලෙක් වෙයි. හේ එහි ශීඝ්‍රජවයෙන් දුවයි, ශීඝ්‍රජවයෙන් දුවන ඔහුගේ සිවිදු දැවෙයි, සමුදු දැවෙයි, මසුදු දැවෙයි, නහරදු දැවෙයි, ඇටදු දුමයි. නැඟු පිය එබඳු මැ වෙයි. හේ ඒ දෙරින් නික්මයෙයි.

තස්ස ඛො පන භික්ඛවෙ, මහානිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තො ගූථනිරයො. සො තත්ථ පපතති[1] තස්මිං ඛො පන භික්ඛවෙ, ගූථනිරයෙ සූචිමුඛා පාණා ඡවිං ඡින්දන්ති. ඡවිං ඡෙත්වා චම්මං ඡින්දන්ති චම්මං ඡෙත්වා මංසං ඡින්දන්ති මංසං ඡෙත්වා නහාරුං ඡින්දන්ති. නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දන්ති. අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ඛාදන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරෙති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තස්ස ඛො පන භික්ඛවෙ, ගූථනිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තො කුක්කුලනිරයො. සො තත්ථ පපතති[1] සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තස්ස ඛො පන භික්ඛවෙ, කුක්කුලනිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තං සිම්බලිවනං උද්ධං[2] යොජනමුග්ගතං සොළසඞ්ගුලකණ්ටකං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, තත්ථ ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරෙති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තස්ස ඛො පන භික්ඛවෙ, සිම්බලිවනස්ස සමනන්තරා සහිතමෙව මහන්තං අසිපත්තවනං. සො තත්ථ පවිසති තස්ස වාතෙරිතානි පත්තානි පතිතානි හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති. කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තස්ස ඛො පන භික්ඛවෙ, අසිපත්තවනස්ස සමනන්තරා සහිතමෙව මහතී ඛාරොදිකා[3] නදී. සො තත්ථ පපතති. සො තත්ථ අනුසොතම්පි වුය්හති. පටිසොතම්පි වුය්හති. අනුසොතපටිසොතම්පි වුය්හති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා බළිසෙන උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙත්වා එවමාහංසු: 'අම්භො පුරිස, කිං ඉච්ඡසී'ති. සො එවමාහ: ජිඝච්ඡිතොස්මි භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, නිරයපාලා තත්තෙන අයොසඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන තත්තං ලොහගුළං මුඛෙ පක්ඛිපන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං. සො තස්ස[4] ඔට්ඨම්පි ඩය්හති,[5] මුඛම්පි ඩය්හති, කණ්ඨම්පි ඩය්හති, උරම්පි[6] ඩය්හති, අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

---

1. පතති – සීමු, මජසං.
2. උච්චං – ස්‍යා.
3. ඛාරොදකා – PTS, මජසං, සීමු.
4. තස්ස – සීමු, PTS.
5. දහති – මජසං.
6. උදරම්පි – PTS.

තවද මහණෙනි, ඒ මහානිරයට සමනන්තර වූ සවික වූ මැ මහත් වූ ගූථනිරය වෙයි. හේ එහි වැටෙයි. මහණෙනි, ඒ ගූථනිරයෙහි ගැලෙයි. මහණෙනි, ඒ ගූථනිරයෙහි වැළිත් හිදි බඳු තුඩු ඇති පණුවෝ සිවිය සිදිති, සිවිය සිඳ සම සිදිති, සම සිඳ මස් සිදිති, මස් සිඳ නහර සිදිති, නහර සිඳ ඇට සිදිති, ඇට සිඳ ඇටමිදුළු කත්. හේ එහි දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳී. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

තවද මහණෙනි, ඒ ගූථනරකයට සමන්තර වූ එක්ව මැ මහත් වූ උණු අළු නිරය වෙයි. හේ එහි වැටෙයි, හේ එහි දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳියි. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

තවද මහණෙනි, ඒ කුක්කුල නිරයට සමනන්තර වූ එක් වූ මැ සියක්යොදුන් උස නැඟුණු සොළොසඟුල් කටු ඇති ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ගිනිදල් සහිත වූ මහත් හිඹුල්වනය වෙයි. (ඔහු) එහි නංවති, බස්වති. හේ එහි දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳී. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද, ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

තවද මහණෙනි, ඒ හිඹුල්වනයට අනතුරු වූ එක් වූ මැ මහත් වූ අසිපත්‍රවනය වෙයි. හේ එහි පිවිසෙයි, වාතයෙන් සැලී වැටුණු පත්‍රයෝ ඔහුගේ අත ද සිඳුති පය ද සිඳුති අත්පා ද සිඳුති කන ද සිඳුති නැහැය ද සිඳුති. කන්නාසා ද සිඳුති හේ එහි දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳී. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

තවද මහණෙනි, ඒ අසිපත්‍රවනයට සමනන්තර වූ එක් වූ මැ මහත් වූ වෙතරණී නම් ක්ෂාරොදකනදිය වෙයි. හේ එහි වැටෙයි, හේ එහි අනුශ්‍රොතසට ද ගෙනයෙයි, ප්‍රති ශ්‍රොතසට ද ගෙනයෙයි, අනුශ්‍රොතප්‍රතිශ්‍රොතසට ද ගෙනයෙයි, හේ එහි දුඃඛ තීව්‍ර කටුක වෙදනා විඳී. යම්තාක් ඒ පාපකර්මය නො ගෙවේ ද ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, නිරයපාලයෝ ඔහු බිලියෙන් නඟා ස්ථලයෙහි හොවා මෙසේ කියති : 'එම්බා පුරුෂය, කුමක් රිසියෙයි ද ? යි. හේ මෙසේ කියා : ' සාමි ' වහන්ස ' යි. මහණෙනි, යමපල්හු ඔහු ගෙන ගිනිගෙන දිලියෙන යකඩුවෙන් මුව විවෘත කොට ගිනි ගෙන දිලියෙන ලොහොගුලා මුඛයෙහි ප්‍රක්ෂෙප කෙරෙත්. ඒ ලොහොගුලා ඔහුගේ දෙතොල ද දවයි, මුව ද දවයි, උගුර ද දවයි, උදරය ද දවයි, අතුණුදු අතුණුබහන්දු ගෙන අධොභාගයෙන් නික්මයේ. හේ එහි දුඃඛ තීව්‍ර කටුක වේදනා විඳී. යම්තාක් ඒ පාප කර්මය ක්ෂය නො වේ ද ඒ තාක් නො ද මියෙයි.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා එවමාහංසු: 'අම්භො පුරිස, කිං ඉච්ඡසී'ති. සො එවමාහ: 'පිපාසිතොස්මි භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ, නිරයපාලා තත්තෙන අයොසඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන තත්තං තම්බලොහං මුඛෙ ආසිඤ්චන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං. තං තස්ස ඔට්ඨම්පි ඩහති, මුඛම්පි ඩහති, කණ්ඨම්පි ඩහති, උරම්පි ඩහති. අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති.

තමෙනං භික්ඛවෙ, නිරයපාලා පුන මහානිරයෙ පක්ඛිපන්ති.

භූතපුබ්බං භික්ඛවෙ, යමස්ස රඤ්ඤො එතදහොසි: 'යෙ කිර භො ලොකෙ පාපකානි අකුසලානි කම්මානි කරොන්ති, තෙ එවරූපා විවිධා කම්මකාරණා කරීයන්ති. අහොවතාහං මනුස්සත්තං ලභෙය්‍යං. තථාගතො ච ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො. තඤ්චාහං භගවන්තං පයිරුපාසෙය්‍යං, සො ච මෙ භගවා ධම්මං දෙසෙය්‍ය, තස්ස චාහං භගවතො ධම්මං ආජානෙය්‍ය'න්ති.

තං ඛො පන අහං භික්ඛවෙ, නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි. අපි ච යදෙව මෙ සාමං ඤාතං, සාමං දිට්ඨං, සාමං විදිතං තමෙවාහං වදාමී'ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

චොදිතා දෙවදූතෙහි යෙ පමජ්ජන්ති මානවා,
තෙ දීඝරත්තං සොචන්ති හීනකායූපගා නරා.

යෙ ච ඛො දෙවදූතෙහි සන්තො සප්පුරිසා ඉධ,
චොදිතා නප්පමජ්ජන්ති අරියධම්මෙ කුදාචනං.

උපාදානෙ භයං දිස්වා ජාතිමරණසම්භවෙ,
අනුපාදා විමුච්චන්ති ජාතිමරණසඞ්ඛයෙ.

තෙ ඛෙමප්පත්තා[1] සුඛිනො දිට්ඨධම්මාභිනිබ්බුතා,
සබ්බවෙරභයාතීතා සබ්බදුක්ඛං උපච්චගුන්ති.

දෙවදූතසුත්තං දසමං.

---

## සුඤ්ඤතවග්ගො තතියො.

---

### තස්ස වග්ගස්ස උද්දානං.

ද්විධා ච සුඤ්ඤතා හොති - අබ්භුතධම්ම බාකුලං,
අචිරවත භූමිජ නාමො - අනුරුද්ධුපක්කිලෙසං
බාලපණ්ඩිතො දෙවදූතඤ්ච තෙ දසාති.

1. ඛෙමප්පත්තා - සීමු, PTS.

මහණෙනි, යමපල්හු ඔහුට මෙසේ කියති : ' එම්බා පුරුෂය, කුමක් රුස්වහි ?' හේ මෙසේ කියා : ' පිපාසිතයෙමි, වහන්සැ ' යි. මහණෙනි, යමපල්හු ඔහු ගෙන ගිනිගෙන දිලියෙන යහඬුවෙන් මුව විවෘත කොට ගිනිගෙන දිලියෙන ලොහොදිය මුඛයෙහි ප්‍රක්ෂෙප කෙරෙත්, ඒ ලොහොදිය ඔහුගේ තොල් ද දවයි, මුව ද දවයි, උගුර ද දවයි, ළය ද දවයි, අතුණුදු අතුණුබහනුදු ගෙන අධොභාගයෙන් නික්මෙයි. හේ එහි තීව්‍ර කටුක දුඃඛවෙදනා විඳී. යම්තාක් ඒ පාපකර්මය ක්ෂය නො වේ ද ඒතාක් නො ද කලුරිය කෙරෙයි.

මහණෙනි, යමපල්හු නැවත ඔහු මහානිරයෙහි ප්‍රක්ෂෙප කෙරෙත්.

මහණෙනි, පෙර යමරජුට මෙල සිත් වී. ' ලොවැ යම් කෙනෙක් ලමු අකුශලකර්ම කෙරෙත් ද ඔහු මෙබඳු විවිධ කම්කටොලු කරනු ලැබෙති. මම් මිනිසත්බව ලබම් නම් අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයෝත් ලොවැ උපදනාහු නම් මම් ඒ භාග්‍යවතුන් වහන්සේත් පර්යුපාසන කෙරෙම් නම් ඒ භාග්‍යවත්හු මට දහම් දෙසනසේක් නම් මම් ඒ භාග්‍යවත්හුගේ ධර්මය අවබොධ කෙරෙම් නම් ඉතා මැනැවැ ' යි.

තවද මහණෙනි, මම එකරුණ අන් ශ්‍රමණයකුගේ වේවයි බ්‍රාහ්මණයකුගේ වේවයි සමීපයෙන් අසා නො කියමි. වැළි යමක් මැ මා විසින් තමා මැ දන්නාලද තමා මැ දක්නාලද තමා මැ ප්‍රකට කොට දක්නාලද ද මම් එය මැ කියම් ' යි.

භාග්‍යවතුන් වහන්සේ මේ දෙවදූතසූත වදළහ. මේ වදරා සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි අනෙකුදු මෙල ගාථා වදළසේක :

" යම් මිනිස් කෙනෙක් දෙවදූතයන් විසින් චොදනා කරන ලද්දහු ප්‍රමාද වෙත් " ද, හීන වූ නරකයට පැමිණි ඒ නරයෝ දීර්ඝකාලයක් ශොක කෙරෙත්.

මෙලොවැ දෙවදූතයන් විසින් චොදිත වූ යම් සාධුපුරුෂ කෙනෙක් කිසිකලෙක ආර්‍ය්‍ය ධර්මයෙහි ප්‍රමාද නො වෙත් ද,

ජාතිමරණ දෙකට කාරණ වූ තෘෂ්ණාදෘෂ්ටි සංඛ්‍යාත උපාදනයෙහි බිය දැක ජාතිමරණ සඞ්ඛය සංඛ්‍යාත නිර්වාණයෙහි චතුරුපාදනයෙන් උපාදන නො කොට විමුක්ත වෙත් ද,

ඒ සත්ත්වයෝ ක්ෂෙමයට පැමිණියාහු සුඛිත වූවාහු දෘෂ්ටධර්ම සංඛ්‍යාත ඉහාත්මයෙහි ක්ලෙශපරිනිර්වාණයෙන් නිවුණාහු සියලු වෛරභය ඉක්මවූවාහු සියලු සසරදුක් ඉක්මැගියාහු යයි.

දස වැනි දෙවදූතසූත්‍ර යි.

---

## තුන් වැනි ශූන්‍යත වර්ග යි.

---

**ඒ වර්ගයාගේ උද්දනය :**

චූළසුඤ්ඤතමහාසුඤ්ඤත සූත්‍ර දෙක යැ අච්ඡරියධම්ම සූත්‍ර යැ බක්කුල සූත්‍ර යැ දන්තභූමි සූත්‍ර යැ භූමිජ සූත්‍ර යැ අනුරුද්ධ සූත්‍ර යැ උපක්කිලෙස සූත්‍ර යැ බාලපණ්ඩිත සූත්‍ර යැ දෙවදූත සූත්‍ර යැ යි දශසූත්‍රයෝ වෙති.

# 4 විභඞ්ගවග්ගො

## 3. 4. 1

## භද්දෙකරත්ත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

භද්දෙකරත්තස්ස වො භික්ඛවෙ, උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහිරං අසඞ්කුප්පං තං විද්ධා මනුබ්‍රූහයෙ.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

එවං විහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කථඤ්ච භික්ඛවෙ, අතීතං අන්වාගමෙති: එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංසඤ්ඤො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංසඞ්ඛාරො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවං ඛො භික්ඛවෙ, අතීතං අන්වාගමෙති.

කථඤ්ච භික්ඛවෙ, අතීතං නාන්වාගමෙති: එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංසඤ්ඤො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංසඞ්ඛාරො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො භික්ඛවෙ, අතීතං නාන්වාගමෙති.

# 4 විභඞ්ගවග්ගය

## 3. 4. 1

## භද්දෙකරත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩවසනසේක. එහි දී භාග්‍යවත්හු ' මහණෙනි ' යි භික්ෂූන් අඩගාවදළහ. ' පින්වතුන් වහන්සැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවත්හු මෙල භද්දෙකරත්ත සූත්‍රය වදළසේක.

' මහණෙනි, (විදර්ශනානුයොග සමන්වාගත හෙයින්) භද්‍ර වූ එක් රැයක්හුගේ මාතෘකාව ද විස්තරවිභාගය ද දෙසමි. ඒ අසව, මොනොවට මෙනෙහි කරව, කියමි ' යි වදළසේක.

'' එසේ යැ වහන්ස ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. බුදුහු මෙල වදළෝ :

' අතීත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටීන් අනුගමනය නො කරන්නේ යැ. අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටීන් නො පතන්නේ යැ. යම් හෙයකින් යමක් අතීත ද එය ප්‍රහීණ යැ. යමක් අනාගත ද එය නො පැමිණියේ යැ.

යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ (යම් ධර්මයෙක් ඇද්ද) ඒ ධර්මය ඒ ඒ තැන්හි අනිත්‍යාදි විසින් විදර්ශනා කෙරේ ද විද්වත් තෙමේ අසංහීර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ ය.

අද මැ ආතාපනවීර්‍ය්‍යය කර්තව්‍ය යි, සෙට මරණය කවරෙක් දතහෙන්නේ ද මහත් වූ (ගිනි විෂ ආදි) සේනා ඇති මරහු සමග (මිත්‍රසන්ථවාදි) සංගරයෙක් නැත් නු !

මෙ බඳු විහරණ ඇති ආතාපනවීර්‍ය්‍ය ඇති රෑදෙවෙහි අනලස් වූ ඒ පුඟුලා ' භද්දෙකරත්ත යැ ' යි බුද්ධ මුනි ප්‍රකාශ කෙරේ ' යයි.

මහණෙනි, කිසෙයින් අතීත පඤ්චස්කන්ධය අනුගමනය නො කෙරෙයි යත් : ' අතීත කාලයෙහි මෙ බඳු රූ ඇතියෙම් වීමි ' යි ඒ අතීත රූපයෙහි තෘෂ්ණාව පිහිටුවයි. ' අතීත යෙහි මෙ බඳු වේදනා ඇතියෙම් වීමි ' යි ඒ අතීත වේදනායෙහි තෘෂ්ණා එළවයි. '' අතීත යෙහි මෙ බඳු සංඥා ඇතියෙම් වීමි ' යි ඒ අතීත සංඥායෙහි තෘෂ්ණාව එළවයි. ' අතීත යෙහි මෙ බඳු සංස්කාර ඇතියෙම් වීමි ' යි ඒ අතීත සංස්කාරයෙහි තෘෂ්ණාව එළවයි. ' අතීතයෙහි මෙබඳු විඥාන ඇතියෙම් වීමි ' යි ඒ අතීත විඥානයෙහි තෘෂ්ණාව එළවයි. මහණෙනි, මෙසෙයින් අතීත පඤ්චස්කන්ධය අනුගමනය කෙරෙයි.

මහණෙනි, කිසෙයින් අතීත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටි විසින් අනුගමනය නො කෙරෙයි යත් : ' අතීතයෙහි මෙ බඳු වූ රූ ඇති වීමි ' යි ඒ අතීත රූපයෙහි තෘෂ්ණාදෘෂ්ටි විසින් අනුගමනය නො කෙරෙයි. අතීතයෙහි මෙ බඳු වේදනා ඇති වීමි ' යි එහි තෘෂ්ණාව නො එළවයි. ' අතීතයෙහි මෙ බඳු සංඥා ඇති වීමි ' යි එහි තෘෂ්ණාව නො එළවයි. ' අතීතයෙහි මෙ බඳු සංස්කාර ඇති වීමි ' යි එහි තෘෂ්ණාව නො එළවයි. ' අතීතයෙහි මෙ බඳු විඥාන ඇති වීමි ' යි එහි තෘෂ්ණාව නො එළවයි. මහණෙනි, මෙ සෙයින් අතීත පඤ්චස්කන්ධය අනුගමනය නො කෙරෙයි.

කථඤ්ච භික්ඛවෙ, අනාගතං පටිකඞ්ඛති: එවංරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංසඤ්ඤො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංසඞ්ඛාරො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවං ඛො භික්ඛවෙ, අනාගතං පටිකඞ්ඛති.

කථඤ්ච භික්ඛවෙ, අනාගතං නප්පටිකඞ්ඛති: එවංරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො සියං -පෙ- එවංසඤ්ඤො සියං -පෙ-. එවංසඞ්ඛාරො සියං -පෙ-. එවං විඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො භික්ඛවෙ, අනාගතං නප්පටිකඞ්ඛති.

කථඤ්ච භික්ඛවෙ, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති: ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛවෙ, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති.

කථඤ්ච භික්ඛවෙ, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති: ඉධ භික්ඛවෙ සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති. න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං, න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ-. න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛවෙ, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති.

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහීරං අසඞ්කුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

මහණෙනි, කිසෙයින් අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රාර්ථනා කෙරෙයි යත් : ' අනාගත කාලයෙහි මෙ බඳු රූ ඇති වෙම්ව ' යි ඒ අනාගත රූපයෙහි තෘෂ්ණාව එළවයි. ' අනාගතයෙහි මෙ බඳු වෙදනා ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණාව එළවයි. ' අනාගතයෙහි මෙ බඳු සංඥා ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණාව එළවයි. ' අනාගතයෙහි මෙ බඳු සංස්කාර ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණාව එළවයි. ' අනාගතයෙහි මෙ බඳු විඥාන ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණාව එළවයි. මහණෙනි, මෙසෙයින් අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රාර්ථනා කෙරෙයි.

මහණෙනි, කිසෙයින් අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රාර්ථනා නො කෙරෙයි යත් : ' අනාගත කාලයෙහි මෙ බඳු රූ ඇති වෙම්ව ' යි ඒ අනාගත රූපයෙහි තෘෂ්ණාව නො එළවයි. ' මෙ බඳු වෙදනා ඇති වෙම්ව ' යි . . . ' මෙ බඳු සංඥා ඇති වෙම්ව ' යි . . . ' මෙබඳු සංස්කාර ඇති වෙම්ව ' යි . . . ' අනාගතයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව ' යි ඒ අනාගත විඥානයෙහි තෘෂ්ණාව නො එළවයි. මහණෙනි, මෙසෙයින් අනාගත පඤ්චස්කන්ධය ප්‍රාර්ථනා නො කෙරේ.

මහණෙනි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න ධර්මයන්හි (තෘෂ්ණාදෘෂ්ටි විසින්) අදනා ලැබෙයි යත් : ' මහණෙනි, මෙ ලොවැ අශ්‍රුතවත් පෘථග්ජන ආර්‍ය්‍යයන් නො දක්නේ ආර්‍ය්‍ය ධර්මයට අදක්ෂ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූයේ සත්පුරුෂයන් නො දක්නේ සත්පුරුෂ ධර්මයට අදක්ෂ වූයේ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූයේ රූපය ආත්මහෙයින් තෘෂ්ණා දෘෂ්ටි විසින් දකී. ආත්මය රූපවත් කොට හෝ දකී. ආත්මයෙහි රූපය ඇතැ ' යි හෝ දකී. රූපයෙහි ආත්මය ඇතැ ' යි හෝ දකී. වෙදනාව ආත්ම හෙයින් දකී. වෙදනාවත් ආත්මය හෝ ආත්මයෙහි වෙදනාව හෝ වෙදනායෙහි ආත්මය හෝ දකී. සංඥාව ආත්ම හෙයින් තෘෂ්ණාදෘෂ්ටි විසින් දකී. සංඥාවත් ආත්මය හෝ ආත්මයෙහි සංඥාව හෝ සංඥායෙහි ආත්මය හෝ දකී. සංස්කාරයන් ආත්ම හෙයින් දකී. සංස්කාර වත් ආත්මය හෝ ආත්මයෙහි සංස්කාරයන් හෝ සංස්කාරයන්හි ආත්මය හෝ දකී. විඥානය ආත්ම හෙයින් දකී, විඥානවත් ආත්මය හෝ ආත්මයෙහි විඥානය හෝ විඥාන යෙහි ආත්මය හෝ දකී. මහණෙනි, මෙ සෙයින් ප්‍රත්‍යුත්පන්නධර්මයන්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් අදනා ලැබෙයි.

මහණෙනි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධධර්මයෙහි තෘෂ්ණාදෘෂ්ටි විසින් නො අදනා ලැබේ යැ යත් : මහණෙනි, මෙලොවැ බුද්ධාදි ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි සුවිනීත වූ බුද්ධාදි සත්පුරුෂයන් දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි කොවිද වූ සත්පුරුෂ ධර්මයෙහි සුවිනීත වූ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපය ආත්මවශයෙන් නො දක්නේ යැ, ආත්මය රූපවත් කොට හෝ ආත්මයෙහි ලා රූපය හෝ රූපයෙහි ලා ආත්මය හෝ නො දක්නේ ය. වෙදනා ආත්මවශයෙන් නො දක්නේ යැ . . . සංඥා ආත්මවශයෙන් නො දක්නේ යැ . . . සංස්කාර ආත්මවශයෙන් නො දක්නේ යැ . . . විඥාන ආත්මවශයෙන් නො දක්නේ යැ, ආත්මය විඥානවත් කොට හෝ ආත්මයෙහි ලා විඥානය හෝ විඥානයෙහි ලා ආත්මය හෝ නො දක්නේ යැ. මහණෙනි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධධර්මයෙහි (විදර්ශනා ඇතියෙන්) තෘෂ්ණාදෘෂ්ටීන් නො අදනා ලැබේ.

අතීත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටීන් අනුගමනය නො කරන්නේ යැ, අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටීන් නො පතන්නේ යැ, යම්හෙයෙකින් යමක් අතීත ද, එය ප්‍රහීණ යැ, යමක් අනාගත ද එය නො පැමිණියේ යැ, (එහෙයින් අනුගමන හා ප්‍රාර්ථනා නො කරන්නේ යයි සේ යි.)

යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ (යම් පඤ්චස්කන්ධධර්මයෙක් ඇද්ද,) ඒ ධර්මය ඒ ඒ තන්හි අනිත්‍යාදි විසින් විදර්ශනා කෙරේ ද, විද්වත් තෙමේ අසංහිර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ ය.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

එවං විහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

භද්දෙකරත්තස්ස වො භික්ඛවෙ, උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච දෙසිස්සාමීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

භද්දෙකරත්ත සුත්තං පඨමං.

---

අද ම අතාපන වීර්‍ය්‍යය කර්තව්‍ය යි, සෙට මරණය කවරෙක් දනහෙන්නේ ද, මහත් වූ සේනා ඇති මරහු සමග සඞ්ගරයෙක් නැත් නු !

මෙබඳු විහරණ ඇති අතාපන වීර්‍ය්‍ය ඇති දවරැ තන්ද්‍රා නැති ඒ පුඟුලා ඒකාන්තයෙන් ' භද්දෙකරත්ත ' යයි බුද්ධ මුනි ප්‍රකාශ කෙරේ.

මහණෙනි, භද්‍ර වූ ඒකරාත්‍ර විහරණ ඇති තොපට උද්දෙසය හා විභාගය හා දෙසමි ' යි යමක් කියන ලද ද, මෙ බස් තෙල සඳහා කියන ලදි.

භාග්‍යවතුන් වහන්සේ මේ භද්දෙකරත්ත සූත්‍රය වදළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**පළමුවැනි භද්දෙකරත්ත සූත්‍ර යි.**

# 3. 4. 2

## ආනන්ද භද්දෙකරත්ත සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො උපට්ඨානසාලායං භික්ඛූ[1] ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච භාසති.

අථ ඛො භගවා සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන උපට්ඨානසාලා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'කො නු ඛො භික්ඛවෙ උපට්ඨානසාලායං භික්ඛූ[1] ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසී'ති.

ආයස්මා භන්තෙ, ආනන්දො උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි භද්දෙක-රත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසී'ති.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි 'යථා කථං පන ත්වං ආනන්ද, භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසී'ති?

එවං ඛො අහං භන්තෙ, භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසිං සමාදපෙසිං සමුත්තෙජෙසිං සම්පහංසෙසිං භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසිං :

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහිරං අසඞ්කුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

එවං විහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කථඤ්චාවුසො අතීතං අන්වාගමෙති: එවංරූපො අහොසිං අතීතමද්ධා-නන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. -පෙ- එවං ඛො ආවුසො අතීතං අන්වාගමෙති.

---

1. භික්ඛූනං – සීමු.

# 3. 4. 2

# ආනන්ද භද්දෙකරත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේවඩු මහසිටුහු ගේ අරම්හි වැඩවසන සේක. එකල ආනද තෙරණුවෝ උපස්ථානශාලායෙහි දී භික්ෂූන් දහැමි කථායෙන් කරුණු දක්වති, සමාදන් කරවති, තෙද ගන්වති, ප්‍රහර්ෂ කරවති. භද්‍රඑකරාත්‍ර ඇති මහණ හට උද්දෙස හා විභාග හා කියති.

එකල භාග්‍යවතුන් වහන්සේ සවස්වරුයෙහි පලසමවතින් නැඟිසිටි සේක් උපස්ථාන ශාලාව කරා එළැඹියහ. එළැඹ පැන්වූ අස්නෙහි වැඩහුන්හු. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූසේක. " මහණෙනි, කවරෙක් නම් උපස්ථානශාලායෙහි ලා මහණුන් දහැමි කථායෙන් කරුණු දක්වාලී ද, සමාදන් කරවාලී ද, තෙද ගන්වාලී ද, සතුටු කරවාලී ද, භද්‍රෛකරාත්‍ර මහණ හට උදෙදස හා විභාග හා දෙසී ද " යි වදළෝ.

වහන්ස, අනද තෙරණුවෝ උපස්ථානශාලායෙහි දී භික්ෂූන් දහැමි කථායෙන් කරුණු දක්වූහ, සමාදන් කැරවූහ, තෙද ගැන්වූහ, සතුටු කැරවූහ. භද්‍රෛකරාත්‍ර මහණ හට උද්දෙස හා විභාග හා දෙසූහ ' යි.

එකල භාග්‍යවතුන් වහන්සේ අනද තෙරණුවන් ඇමතූසේක. " ආනන්දය, තෙපි කිසෙයින් භික්ෂූන් දහැමි කථායෙන් කරුණු දක්වූහු ද, සමාදන් කැරවූහු ද, තෙද ගැන්වූහු ද, පහදවාලූහු ද, භද්‍රෛකරාත්‍ර මහණහට උදෙදස හා විභාග හා දෙසූහු ද " යි.

වහන්ස, මෙසෙයින් මම භික්ෂූන් දහැමි කථායෙන් කරුණු දක්වීමි, සමාදන් කැරවීමි, තෙද ගැන්වීමි, සම්ප්‍රහර්ෂ කැරවීමි, භද්‍රෛකරාත්‍ර මහණහට උදෙදස හා විභාග හා දෙසීමි.

අතීත පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන් අනුගමනය නො කරන්නේයැ, අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණාදෘෂ්ටීන් නො පතන්නේ යැ, යම් හෙයකින් යමක් අතීත වේ ද, එය ප්‍රහීණ යැ, යමක් අනාගත වේ ද එය නො පැමිණියේ යි.

යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ පඤ්චස්කන්ධ ධර්මය ඒ ඒ තන්හි අනිත්‍යාදි විසින් විදර්ශනා කෙරේ ද, ඒ විද්වත් තෙමේ අසංහීර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ යැ.

අද ම ආතාපන වීර්‍ය්‍යය කර්තව්‍ය වෙයි. කවරෙක් සෙට මරණය ඇති ' යි දතහෙන්නේ ද, මහත් සෙන්බල ඇති මරහු සමග සංගරයෙක් නැත් නු !

මෙවන් විහරණ ඇති කෙලෙස් තවන වැර ඇති දවරැ දෙක්හි හළ තන්ද්‍රා ඇති ඒ යොගාවචරයා භද්දෙකරත්ත යයි ශාන්ත වූ බුද්ධ මුනි තෙමේ ප්‍රකාශ කෙරේ.

ඇවත්නි, කෙසේ නම්, අතීත ස්කන්ධධර්මය තෘෂ්ණාදෘෂ්ටීන් අනුගමනය කෙරේ යැ යත් : අතීත කාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වීමි ' යි එහි නන්දිය එළවයි. අතීත කාල යෙහි මෙබඳු වේදනා ඇතියෙම් වීමි ' යි එහි නන්දිය එළවයි . . . ඇවැත්නි, මෙසෙයින් අතීත ස්කන්ධධර්මය අනුගමනය කෙරෙයි.

කථඤ්චාවුසො අතීතං නාන්වාගමෙති: එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංසඤ්ඤො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංසඞ්ඛාරො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො ආවුසො අතීතං නාන්වාගමෙති.

කථඤ්චාවුසො අනාගතං පටිකඞ්ඛති: එවරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො සියං -පෙ- එවංසඤ්ඤො සියං -පෙ- එවංසඞ්ඛාරො සියං -පෙ- එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවං ඛො ආවුසො අනාගතං පටිකඞ්ඛති.

කථඤ්චාවුසො, අනාගතං නප්පටිකඞ්ඛති: එවංරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො සියං -පෙ- එවංසඤ්ඤො සියං -පෙ- එවංසඞ්ඛාරො සියං -පෙ- එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො, අවුසො, අනාගතං නප්පටිකඞ්ඛති[1].

කථඤ්චාවුසො පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති: ඉධාවුසො අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනා -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො ආවුසො පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති.

කථඤ්චාවුසො, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති: ඉධාවුසො, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරිධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො[2] සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො[2] න රූපං අත්තතො සමනුපස්සති. න රූපවන්තං වා අත්තානං, නාත්තනි වා රූපං න රූපස්මිං වා අත්තානං. න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං, එවං ඛො ආවුසො පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති.

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං, -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

එවං ඛො අහං භන්තෙ, භික්ඛු ධම්මියා කථාය සන්දස්සෙසිං සමාදපෙසිං සමුත්තෙජෙසිං සම්පහංසෙසං, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසින්ති.

---

1. න පටිකඞ්ඛති - සීමු.    2. විනීතො - PTS.

ඇවත්නි, කෙසෙයින් අතීත ස්කන්ධධර්මය අනුගමනය නො කෙරේ යැ යත් : අතීත කාලයෙහි මෙබඳු රූප ඇතියෙම් වීමි ' යි එහි නන්දිය නො එළවයි. අතීත කාලයෙහි මෙබඳු වේදනා ඇතියෙම් වීමි ' යි එහි නන්දිය නො එළවයි, අතීත කාලයෙහි මෙබඳු සංඥා ඇතියෙම් වීමි ' යි එහි නන්දිය නො එළවයි, අතීත කාලයෙහි මෙබඳු සංස්කාර ඇතියෙම් වීමි ' යි එහි නන්දිය නො එළවයි, අතීත කාලයෙහි මෙබඳු විඥාන ඇතියෙම් වීමි ' යි එහි නන්දිය නො එළවයි. ඇවත්නි, මෙසෙයින් අතීත ස්කන්ධධර්මය අනුගමනය නො කෙරේ.

ඇවැත්නි, කිසෙයින් අනාගත ස්කන්ධධර්මය තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රාර්ථනා කෙරේ යැ යත් : අනාගත කාලයෙහි මෙබඳු රූ ඇති වෙම්ව ' යි එහි නන්දිය එළවයි, මෙබඳු වේදනා ඇති වෙම්ව ' යි . . . මෙබඳු සංඥා ඇති වෙම්ව ' යි . . . මෙබඳු සංස්කාර ඇති වෙම්ව ' යි . . . අනාගත කාලයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව ' යි එහි නන්දිය එළවයි. ඇවැත්නි, මෙසෙයින් අනාගත ස්කන්ධධර්මය ප්‍රාර්ථනා කෙරෙයි.

ඇවැත්නි, කිසෙයින් අනාගත ස්කන්ධධර්මය ප්‍රාර්ථනා නො කෙරේ යැ යත් : අනාගත කාලයෙහි මෙබඳු රූ ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණා නො පිහිටුවයි, මෙබඳු වෙදනා ඇතිවෙම්ව ' යි . . . මෙබඳු සංඥා ඇති වෙම්ව ' යි . . . මෙබඳු සංස්කාර ඇති වෙම්ව ' යි . . . අනාගත කාලයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව ' යි එහි තෘෂ්ණා නො පිහිටුවයි. ඇවැත්නි, මෙසෙයින් අනාගත ස්කන්ධධර්මය ප්‍රාර්ථනා නො කෙරෙයි.

ඇවැත්නි, කෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්ම කෙරෙහි අදනා ලැබෙ යැ යත් : ' ඇවත්නි, මෙලොවැ බුද්ධාදී ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මය පිළිබඳ අදක්ෂ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මය පිළිබඳ අදක්ෂ සත්පුරුෂධර්මයෙහි අවිනීත අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම විසින් තෘෂ්ණාදෘෂ්ටීන් දකී, ආත්මය රූපවත් කොට ද, ආත්මයෙහි රූප කොට ද රූපයෙහි ආත්ම කොට ද දකී. වේදනා . . . සංඥා . . . සංස්කාර . . . විඥාන ආත්ම විසින් දකී. ආත්මය විඥානවත් කොට ද, ආත්මයෙහි විඥාන කොට ද විඥානයෙහි ආත්ම කොට ද දකී. ඇවැත්නි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්මයෙහි අදනා ලැබෙ.

ඇවැත්නි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්මයෙහි නො අදනා ලැබෙ යැ යත් : ඇවැත්නි, මෙලොවැ ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍යධර්මයට දක්ෂ ආර්‍ය්‍යධර්මයෙහි සුශික්ෂිත සත්පුරුෂයන් දක්නාසුලු සත්පුරුෂධර්මයට දක්ෂ සත්පුරුෂධර්මයෙහි සුශික්ශිත ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපය ආත්ම විසින් නො දක්නේ යැ, ආත්මය රූපවත් කොට ද නො දක්නේ යැ, ආත්මයෙහි රූපය ද නො දක්නේ යැ, රූපයෙහි ආත්මය ද නො දක්නේ යැ, වේදනා ආත්ම විසින් නො දක්නේ යැ . . . සංඥා ආත්ම විසින් නො දක්නේ යැ . . . සංස්කාර ආත්ම විසින් නො දක්නේ යැ . . . විඥාන ආත්ම විසින් නො දක්නේ යැ, ආත්මය විඥානවත් කොට ද නො දක්නේ යැ, ආත්මයෙහි ලා විඥාන ද නො දක්නේ යැ, විඥානයෙහි ලා ආත්ම ද නො දක්නේ යැ. ඇවැත්නි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධ ධර්මයෙහි නො අදනා ලැබෙ.

අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කරන්නේ යැ, අනාගත ස්කන්ධධර්ම නො පතන්නේ යැ . . . ඒ යොගාවචරයා ඒකාන්තයෙන් ශාන්ත වූ භද්දෙකරත්ත යයි බුද්ධ මුනි තෙමේ කියා.

වහන්ස, මෙසෙයින් මම භික්ෂූන් දැහැමි කථායෙන් කරුණු දක්වීමි, සමාදන් කරවීමි, තෙද ගැන්වීමි, සම්ප්‍රහර්ෂ කැරැවීමි, භද්‍රෛකරාත්‍ර මහණහුගේ උද්දෙස හා විභාග හා පැවැසීමි ' යි.

සාධු සාධු ආනන්ද සාධු ඛො ත්වං ආනන්ද භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසි.

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කථඤ්චානන්ද, අතීතං අන්වාගමෙති? -පෙ- එවං ඛො ආනන්ද අතීතං අන්වාගමෙති. කථඤ්චානන්ද, අතීතා නාන්වාගමෙති? -පෙ- එවං ඛො ආනන්ද, අතීතං නාන්වාගමෙති කථඤ්චානන්ද, අනාගතං පටිකඞ්ඛති? -පෙ- එවං ඛො ආනන්ද, අනාගතං පටිකඞ්ඛති. කථඤ්චානන්ද, අනාගතං නප්පටිකඞ්ඛති? -පෙ- එවං ඛො ආනන්ද, අනාගතං නප්පටිකඞ්ඛති. කථඤ්චානන්ද, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති: -පෙ- එවං ඛො ආනන්ද, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති. කථඤ්චානන්ද, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති: —පෙ— එවං ඛො ආනන්ද, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති.

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

ආනන්ද භද්දෙකරත්ත සුත්තං දුතියං

මැනැවි මැනැවි ආනන්දයෙනි, ආනන්දයෙනි, තෙපි මනා කොට භික්ෂූන්ට දැහැමි කථායෙන් කරුණු දක්වූවහු යැ, සමාදන් කැරවූහු යැ, තෙද ගන්වාලූහු යැ සතුටු කරවාලූහු යැ, භද්‍රෛකරාත්‍ර මහණුහු ගේ උද්දෙස හා විභාග හා ප්‍රකාශ කළහු යැ.

අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කරන්නේ යැ . . . ඒ යොගාවචරයා ඒකාන්ත යෙන් සත්හුන් භද්දෙකරත්ත යයි බුද්ධ මුනි වදරති ' යි කියා යි.

ආනන්දයෙනි කිසෙයින් අතීත ස්කන්ධධර්ම අනුගමනය කෙරේ යැ යත් . . . ආනන්ද යෙනි, මෙසෙයින් අතීත ස්කන්ධධර්ම අනුගමනය කෙරෙයි. ආනන්දයෙනි, කිසෙයින් අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කෙරේ යැ යත් . . . ආනන්දයෙනි, මෙසේ අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කෙරෙයි. ආනන්දයෙනි, කිසෙයින් අනාගත ස්කන්ධ ධර්ම පතන්නේ යැ යත් . . . ආනන්දයෙනි, මෙසෙයින් අනාගතස්කන්ධ ධර්ම පතන්නේ යැ. ආනන්දයෙනි, කිසෙයින් අනාගත ස්කන්ධධර්ම නො පතන්නේ යැ යත් . . . ආනන්දයෙනි, මෙසෙයින් අනාගත ස්කන්ධධර්ම නො පතන්නේ යැ. ආනන්දයෙනි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්ම කෙරෙහි අදනා ලැබේ යැ යත්: . . . ආනන්දයෙනි, මෙසේ ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්ම කෙරෙහි අදනා ලැබේ. ආනන්ද යෙනි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්ම කෙරෙහි නො අදනා ලැබේ යැ යත් . . . ආනන්දයෙනි, මෙසේ ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්ම කෙරෙහි නොඅදනා ලැබේ.

අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කරන්නේ යැ . . . ඒ යොගාවචරයා ඒකාන්ත යෙන් සත්හුන් භද්දෙකරත්ත යයි බුද්ධ මුනි වදරති ' යි කියා යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් සිත් ඇති අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දනය කළහ.

දෙවැනි ආනන්දභද්දෙකරත්ත සූත්‍ර යි.

# 3. 4. 3

## මහාකච්චානභද්දෙකරත්ත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති තපොදාරාමෙ. අථ ඛො ආයස්මා සමිද්ධි රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන තපොදෙ[1] තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. තපොදෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත-වණ්ණා කෙවලකප්පං තපොදං ඔභාසෙත්වා යෙනායස්මා සමිද්ධි, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා ආයස්මන්තං සමිද්ධිං එතදවොච :

'ධාරෙසි ත්වං භික්ඛු,භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චා'ති?

න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ත්වං පනාවුසො, ධාරෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චාති?

අහම්පි ඛො භික්ඛු, න ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ධාරෙසි පන ත්වං භික්ඛු, භද්දෙකරත්තියො ගාථාති?

න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තියො ගාථාති.

ත්වං පනාවුසො, ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති?

අහම්පි ඛො භික්ඛු, න ධාරෙමි භද්දෙකරත්තියො ගාථා.

උග්ගණ්හාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. පරියාපුණාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. අත්ථසංහිතො භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසො ච විභඞ්ගො ච ආදිබ්‍රහ්මචරියකො'ති.

ඉදමවොච සා දෙවතා, ඉදං වත්වා තත්ථෙවන්තරධායි. අථ ඛො ආයස්මා සමිද්ධි තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සමිද්ධි භගවන්තං එතදවොච. ඉධාහං භන්තෙ, රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන තපොදෙ[1] තෙනුපසඞ්කමිං. ගත්තානි පරිසිඤ්චිතුං. තපොදෙ ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසිං ගත්තානි පුබ්බාපයමානො. අථ ඛො භන්තෙ, අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං තපොදං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො භන්තෙ, සා දෙවතා මං එතදවොච :

---

1. තපොදා – සීමු.

# 3. 4. 3

# මහාකච්චාන භද්දෙකරත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර තපොදවනයෙහි වැඩ වසන සේක. එකල සමිද්ධි තෙරණුවෝ රෑ අලුයම නැඟීසිට ගාත්‍රපරිෂෙකයට තපොද හ්‍රදය කරා එළැඹියහ. තපොද හ්‍රදයෙහි ගාත්‍රපරිෂෙක කොට නැඟී ශරිරාවයව වියළවමින් එක් සිව්රි වැ සිටියහ. එකල එක්තරා දෙව්දුවක් රෑය ඉක්මැගිය කල්හි විශිෂ්ට ජව්වර්ණ ඇත්තී මුළු තපොද දහතලාව බබුළුවා සමිද්ධි තෙරණුවන් කරා එළැඹියා. එළැඹැ එකත්පස් වැ සිටගතු. එකත් පස් වැ සිටි ඒ දෙව්දු සමිද්ධි තෙරණුවනට තෙල කියූ:

මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා ධරන්නාව ?

ඇවත, මම භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා නො ධරමි,

ඇවත, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහුගේ උද්දෙස හා විභාග හා ධරන්නහු ?

මහණ, මමත් භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා නො ධරමි,

මහණ, තෙපි භද්දෙකරත්තගාථා ධරව ?

ඇවත්නි, මම භද්දෙකරත්තගාථා ද නො ධරමි.

ඇවත, තෙපි භද්දෙකරත්තගාථා ධරහු ?

මහණ, මම ද භද්දෙකරත්තගාථා නො ධරමි.

මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා උගනුව, මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා පුහුණු කරව, මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහුගේ උද්දෙස හා විභාග හා ධරව, මහණ, භද්‍රෛකරාත්‍ර මහණහුගේ උද්දෙස හා විභාග හා අර්ත්ථසංහිත යැ, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව ගේ ආදිභූත පූර්වභාගප්‍රතිපත්‍යැ.

ඒ දෙව්දු මෙ කියා එහි මැ අතුරුදහන් වූ. එසඳ සමිද්ධි තෙරණුවෝ එරෑය ඇවෑමෙන් බුදුන් කරා එළැඹියහ. එළැඹ බුදුන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළෝ. වහන්ස, මම රෑ අලුයම නැඟී තපොදදහතල කරා ගාත්‍රපරිෂෙකයට එළැඹියෙමි. තපොදයෙහි ගාත්‍රපරිෂෙක කොට නැඟී ගාත්‍රයන් වියළවමින් එකචීවර වැ සිටියෙමි. වහන්ස, එසඳ එක්තරා දෙව්දුවක් රෑය ඉකුත් කල මනා සිව්පැහැ ඇති වැ මුළු තපොදය බබුළුවා මා කරා එළැඹියා, එළැඹැ එකත්පස් වැ සිටගතු, එකත්පස් වැ සිටි ඒ දෙව්දු මට තෙල කියූ :

ධාරෙසි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චාති?

එවං වුත්තෙ අහං භන්තෙ, තං දෙවතං එතදවොචං[1]: න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ත්වං පන ආවුසො, ධාරෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චාති?

අහම්පි ඛො භික්ඛු න ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ධාරෙසි පන ත්වං භික්ඛු, භද්දෙකරත්තියො ගාථාති?

න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තියො ගාථාති.

ත්වං පනාවුසො, ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති?

අහම්පි ඛො භික්ඛු, න ධාරෙමි භද්දෙකරත්තියො ගාථාති.

උග්ගණ්හාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. පරියාපුණාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච, විභඞ්ගඤ්ච. ධාරෙහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච, අත්ථසංහිතො භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසො ච විභඞ්ගො ච ආදිබ්‍රහ්මචරියකොති.

ඉදමවොච භන්තෙ, සා දෙවතා. ඉදං වත්වා තත්ථෙවන්තරධායි. සාධු මෙ භන්තෙ, භගවා භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච දෙසෙතූති.

තෙන හි භික්ඛු, සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො ආයස්මා සමිද්ධි භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහිරං අසඞ්කුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

එවං විහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: 'ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො.

1. එතදවොච - සීමු.

'මහණ, තෙපි භද්දෙකරත්ත මහණහු ගේ උද්දෙස හා විභාග හා ධරව ?

වහන්ස, මෙසේ කීකල මම ඒ දෙව්දුවට තෙල කීමි: ඇවත, මම භද්දෙකරත්ත මහණහුගේ උද්දෙස හා විභාග හා නො ධරමි'යි.

ඇවත, තෙපි භද්දෙකරත්ත මහණහු ගේ උද්දෙස හා විභාග හා ධරහු?

මහණ මම ද භද්දෙකරත්ත මහණහු ගේ උද්දෙස හා විභාග හා නො ධරමි.

මහණ, තෙපි භද්දෙකරත්තගාථාවන් ධරව?

ඇවත, මම භද්දෙකරත්තගාථාවන් නො ධරමි,

ඇවත, තෙපි භද්දෙකරත්තගාථාවන් ධරහු?

මහණ, මම ද භද්දෙකරත්තගාථාවන් නො ධරමි.

මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා උගනුව, මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා පුහුණු කරව, මහණ, තෙපි භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දේස හා විභාග හා ධරව. මහණ, භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා අර්ත්ථසංහිත යැ, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට පූර්වභාග ප්‍රතිපතැ යි.

වහන්ස, ඒ දෙව්දූ මේ කියූ යැ, මේ කියා එහි මැ අතුරුදහන් වූ, මැනැවැ වහන්ස, මට භාග්‍යවතුන් වහන්සේ භද්‍රෛකරාත්‍ර මහණහු ගේ උද්දෙස හා විභාග හා දෙසනා කරන සේක්ව'යි.

එසේ නම් මහණ, අස, මොනොවට මෙනෙහි කර'යි වදළහ.

එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් සමිද්ධි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. බුදුහු තෙල වදළහ :

අතීත වූ (චක්ෂුරාදි ද්වාදශ) ආයතනධර්මය අනුගමනය නො කරන්නේ යැ, අනාගත වූ ආයතනධර්මය (තෘෂ්ණාදෘෂ්ටීන්) නො පතන්නේ ය. යමක් අතීත ද එය ප්‍රහීණ යැ, යමක් අනාගත ද එය නො පැමිණියේ යි.

යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ ආයතනධර්මය අනිත්‍යාදි විසින් ඒ ඒ තැන්හි විදර්ශනා කෙරේ ද, ඒ විද්වත් තෙමේ අසංහීර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ යැ.

අද ම ආතාපන වීර්‍ය්‍යය කර්තව්‍ය යැ, සෙට මරණය ඇත යනු කවරෙක් දතහෙන්නේ ද, (ගිනි විෂ ආදි) මහත් සෙන්බල ඇති මරහු සමග (මිත්‍රසන්ථවාදි) සංගරයෙක් නැත් නු!

මෙබදු විහරණ ඇති ආතාපන වීර්‍ය්‍ය ඇති අනලස් වූ පුහුලා 'භද්දෙකරත්ත' යැයි බුද්ධ මුනි ප්‍රකාශ කෙරේ යයි,

බුදුහු මෙය වදළහ. සුගතයන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟිසිට විහාරයට පිවිසිසේක.

ඉක්බිති බුදුන් වඩනා හා මැ ඒ භික්ෂූන්ට තෙල සිත් වී : ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් මේ උද්දෙසය වදරා විස්තරයෙන් අර්ථවිභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට පිවිසිසේක.

'අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනී'ති.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: 'අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා'ති.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං මහාකච්චානං එතදවොචුං: 'ඉදං ඛො නො ආවුසො කච්චාන, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො:

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

තෙසං නො ආවුසො කච්චාන, අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: 'ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො.

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා'ති. තෙසං නො ආවුසො කච්චාන, අම්හාකං එතදහොසි: 'අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා'ති. විභජතායස්මා මහාකච්චානොති.

අතීත වූ (චක්ෂුරාදි ද්වාදශ) ආයතනධර්මය අනුගමනය නො කරන්නේ යැ, අනාගත ආයතනධර්මය තෘෂ්ණාදෘෂ්ටියෙන් නො පතන්නේ ය . . . . ඒ පුහුල්හු ඒකාන්තයෙන් භද්දෙකරත්ත යයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ යයි.

කවරෙක් භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ උද්දෙශයාගේ අර්ථය විස්තරයෙන් විභාග කරන්නේ දැ'යි.

ඉක්බිති ඒ භික්ෂූන්ට මෙසේ සිත් විය. "මේ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ බුදුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථ විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය විස්තරයෙන් විභාග කරන්නට පොහොනාහු ද වෙති. ඇපි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ කරා එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් අතින් මෙසේ කරුණු පුළුවුස්නමෝ නම් මැනැවැ"යි.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ කරා එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් මහකසයින් තෙරණුවනට මෙසේ සැලකළහු : 'ඇවැත කාත්‍යායනයෙනි, බුදුහු මේ උද්දෙසය සැකෙවින් වදරා විස්තර විසින් අරුත් නො බෙදු හුනස්නෙන් නැඟී විහාරයට වන්හ :

අතීත ආයතනධර්මය අනුගමනය නො කරන්නේ ය . . . ඒ මහණහු ඒකාන්තයෙන් 'භද්දෙකරත්ත' යයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ යයි.

ඇවැත කාත්‍යායනයෙනි, බුදුන් නික්ම වඩනා හා මැ අපට මෙසේ සිත් විය : 'ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ මේ උද්දෙසය සැකෙවින් උදෙසා විතර විසින් අරුත් නො බෙදු හුනස්නෙන් නැඟී විහාරයට පිවිසියහ:

'අතීත ආයතනධර්මය අනුගමනය නො කරන්නේ ය . . . ඒ මහණහු ඒකාන්තයෙන් භද්දෙකරත්ත' යයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ' යයි.

කවරෙක් භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසනලද විතර විසින් අරුත් නො බෙදනලද මේ උද්දෙසයාගේ විතර විසින් අරුත් විභාග කරන්නේ ද? යි. ඇවැත කච්චානයෙනි, ඒ අපට මෙසේ සිත් විය : 'මේ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ බුදුන් විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහා කච්චාන තෙරණුවෝ බුදුන් විසින් සැකෙවින් උදෙසනලද විතර විසින් අරුත් නො බෙදනලද මෙ උද්දෙසයාගේ විතර විසින් අරුත් බෙද දක්වන්නට පොහොසත් ද වෙති, ඇපි ඇවැත් මහාකච්චාන තෙරුන් කරා එළඹෙන්නමෝ නම් එළැඹ ආයුෂ්මත් මහා කච්චානයන් අතින් මෙසේ කරුණු පුළුවුස්නමෝ නම් මැනැවැ'යි කියා යි. ඇවැත් මහකසයින් තෙරණුවෝ විභාග කෙරෙත්ව'යි.

සෙය්‍යථාපි ආවුසො, පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය. එවං සම්පදමිදං, ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතිසිත්වා අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සො 'හාවුසො භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමි තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තං යෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාථාති.

අද්ධාවුසො කච්චාන, භගවා ජානං ජානාති, පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමි තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තං යෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාම. යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාම. අපිචායස්මා මහාකච්චානො සත්ථුචෙව සංවණ්ණිතො. සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. විභජතායස්මා මහාකච්චානො අගරුං කරිත්වාති.

තෙන හාවුසො, සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති·

එවමාවුසොති බො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාකච්චානො එතදවොච:

යං බො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො:

> අතීතං නාන්වාගමෙය්‍ය-පෙ-
> තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඉමස්ස බො අහං ආවුසො, භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස, එවං විත්ථාරෙන අත්ථං ආජානාමි.

කථඤ්චාවුසො, අතීතං අන්වාගමෙති: ඉති මෙ චක්ඛුං[1] අහොසි අතීතමද්ධානං, ඉති රූපාති තත්‍ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො අතීතං අන්වාගමෙති. ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං, ඉති සද්දාති තත්‍ථ ඡන්දරාගපටිබද්ධං හොති-පෙ-ඉති මෙ ඝානං අහොසි අතීතමද්ධානං, ඉති ගන්ධාති-පෙ-ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං, ඉති රසාති-පෙ-ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං, ඉති මෙ ඵොට්ඨබ්බාති-පෙ-ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං, ඉති ධම්මාති තත්‍ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො අතීතං අන්වාගමෙති. එවං බො ආවුසො, අතීතං අන්වාගමෙති.

---

1. චක්ඛු – සීමු, මජසං.

ඇවැත්නි, යම් පරිදි සාරයෙන් අර්ථ ඇති හර සොයන හර සෙවීමෙහි හැසිරෙන පුරුෂයෙක් තර වැ පිහිටි හරවත් වූ මහත් රුකක්හුගේ මුල ඉක්මවා පියා කඳ ඉක්මවාපියා කොළඅතුයෙහි හර සෙවියයුතු කොට සිතන්නේ නම් මේ එබඳු යැ. ආයුෂ්මත්නට ශාස්තෲන් වහන්සේ හමුව සිටි කල්හි ඒ භාග්‍යවතුන් ඉක්මවාපියා තෙල කරුණ අප පිළිවිස්සයුතු කොට සිතවූ. ඇවත්නි, යම් හෙයෙකින් ඒ බුදුහු දතයුතු ඥෙයධර්මය දන්නාහ. දක්කයුතු ඥෙයධර්මය දක්නාසේක, ඇසක් වැන්නහ, ඥනමය වූහ, ධර්මමය වූවහ, ශ්‍රෙෂ්ඨ වූවහ, වක්තෘයහ, ප්‍රවක්තෘයහ, අර්ථය නභා දක්වනුවහ, නිවන් අමා දෙනුවහ, ධර්ම ස්වාමීහ, තථාගතයහ. යම් හෙයෙකින් තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේ මැ පුළුවුස්නවූ නම් තෙල කරුණට ඒ කල් විය. තොපට යම්සේ බුදුහු ප්‍රකාශ කරනසේක් නම් එය එපරිද්දෙන් දරව'යි.

ඇවැත කච්චානයෙනි, එකාන්තයෙන් බුදුහු දතයුත්ත දන්නාහ, දක්කයුත්ත දක්නාහ, ඇසක් මෙන් වූහ, ඥනමය වූහ, ධර්මමය වූහ, බ්‍රහ්ම වැනියහ, වක්තෘයහ, ප්‍රවක්තෘයහ, අර්ථ එළවා දක්වනුවහ, අමෘතය එළවනුවහ, ධර්මෙශ්වරයහ, තථාගතයහ. යම් හෙයෙකින් තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේ අතින් මැ පුළුවුස්නමෝ නම්, ඊට ඒ කල් මැ විය. යම්සේ අපට බුදුහු ප්‍රකාශ කරනසේක් ද එපරිදි ඒ ධරම්හ. වැළි එකෙක් ඇත. ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ, විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ, ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසනලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙසයාගේ අර්ථය විස්තර විසින් විභාග කරන්නට පොහොනාහු ද වෙති, ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ නො බර කොට විභාග කෙරෙත්ව'යි.

ඇවැත්නි, එසේ නම් අසව, මොනොවට මෙනෙහි කරව, ප්‍රකාශ කරන්නෙමි'යි.

'එසේ යැ ඇවැත්නි'යි ඒ භික්ෂූහු ඇවැත් මහකසයින් තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ තෙල වදළහ.

ඇවැත්නි, බුදුහු යම් උද්දේසයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට පිවිසිසේක් ද,

අතීත වූ ආයතනධර්මය අනුගමනය නො කරන්නේ ය . . . . ඒ මහණහු 'භද්දෙකරත්ත' නමැ යි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ යයි.

ඇවත්නි, මම බුදුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තර විසින් අර්ථය විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය මෙසේ විස්තර විසින් දනගනිමි.

ඇවැත්නි, කිසෙයින් අතීත වූ ද්වාදශායතනධර්මය අනුගමනය කෙරෙයි යත් : අතීත කාලයෙහි මාගේ ඇස විය, මෙසේ රූපයෝ වූහයි ඒ අතීත චක්ෂූරූපයන්හි විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ වෙයි. විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ හෙයින් එය අභිනන්‍දනා කෙරෙයි, එය අභිනන්‍දනා කරනුයේ අතීත ආයතනධර්මය අනුගමනය කෙරෙයි, අතීතයෙහි මෙසේ මාගේ ශ්‍රොත්‍රය විය, මෙසේ ශබ්දය වී යයි එහි ඡන්‍දරාග ප්‍රතිබද්ධ විඥනය වෙයි . . . . අතීතයෙහි මෙසේ මාගේ ඝ්‍රාණය විය මෙසේ ගන්ධයෝ වූහ යි . . . . මෙසේ අතීතයෙහි මාගේ ජිහ්වායතනය විය. මෙසේ රසයෝ වූහ'යි. . . . අතීතයෙහි මෙසේ මාගේ කායායතනය විය. මෙසේ මාගේ ස්ප්‍රෂ්ටව්‍යායතනය වී'යයි . . . . අතීතයෙහි මෙසේ මාගේ මනායතනය විය. මෙසේ ධර්මයෝ වූහ'යි එහි ඡන්‍දරාග ප්‍රතිබද්ධ වූ විඥනය වෙයි. විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ හෙයින් එය අභිනන්‍දනා කෙරෙයි. එය අභිනන්‍දනා කරනුයේ අතීත ආයතනධර්මය අනුගමනය කෙරෙයි. ඇවැත්නි, මෙසේ අතීත ආයතන ධර්මය අනුගමනය කෙරෙයි.

කථඤ්චාවුසො, අතීතං නාන්වාගමෙති : ඉති මෙ චක්ඛුං අහොසි අතීතමද්ධානං, ඉති රූපාති න තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති. න තදභිනන්දන්තො අතීතං නාන්වාගමෙති. ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං, ඉති සද්දාති-පෙ-ඉති මෙ ඝානං අහොසි අතීතමද්ධානං, ඉති ගන්ධාති-පෙ-ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං, ඉති රසාති-පෙ-ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං, ඉති ඵොට්ඨබ්බාති-පෙ-ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං, ඉති ධම්මාති න තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති. න තදභිනන්දන්තො අතීතං නාන්වාගමෙති. එවං ඛො ආවුසො අතීතං නාන්වාගමෙති.

කථඤ්චාවුසො, අනාගතං පටිකඞ්ඛති: ඉති මෙ චක්ඛුං සියා අනාගතමද්ධානං, ඉති රූපාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානපච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො අනාගතං පටිකඞ්ඛති. ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දාති-පෙ-ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං, ඉති ගන්ධාති-පෙ-ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං, ඉති රසාති-පෙ-ඉති මෙ කායො සියා අනාගතමද්ධානං, ඉති ඵොට්ඨබ්බාති-පෙ-ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානපච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො අනාගතං පටිකඞ්ඛති. එවං ඛො ආවුසො අනාගතං පටිකඞ්ඛති.

කථඤ්චාවුසො අනාගතං න පටිකඞ්ඛති[1] : ඉති මෙ චක්ඛුං සියා අනාගතමද්ධානං, ඉති රූපාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති[2]. චෙතසො අප්පණිධානපච්චයා න තදභිනන්දති. න තදභිනන්දන්තො අනාගතං න පටිකඞ්ඛති. ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දාති-පෙ-ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං, ඉති ගන්ධාති-පෙ-ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං, ඉති රසාති-පෙ-ඉති මෙ කායො සියා අනාගතමද්ධානං, ඉති ඵොට්ඨබ්බාති-පෙ-ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති. චෙතසො අප්පණිධානපච්චයා න තදභිනන්දති. න තදභිනන්දන්තො අනාගතං න පටිකඞ්ඛති. එවං ඛො ආවුසො අනාගතං න පටිකඞ්ඛති.

1. නප්පටිකඞ්ඛති - මජසං. 2. නප්පණිදහති - මජසං.

ඇවත්නි, කිසෙයින් අතීතය අනුගමනය නො කෙරෙයි යත් : අතීතයෙහි මෙසේ මාගේ චක්ෂුරායතනය විය මෙසේ රූපයෝ වූහ'යි ඒ අතීත චක්ෂුරූපයන්හි විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ නො වෙයි, විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ නො වූ හෙයින් එය අභිනන්‍දනා නො කෙරෙයි. එය අභිනන්‍දනා නො කරනුයේ අතීත ආයතනධර්මය අනුගමනය නො කෙරෙයි. අතීත කාලයෙහි මෙසේ මාගේ ශ්‍රොත්‍රායතනය විය, මෙසේ මාගේ ශබ්දයෝ වූහ'යි. . . . අතීතයෙහි මෙසේ මාගේ ඝ්‍රාණායතනය විය, මෙසේ ගන්ධයෝ වූහ'යි . . . . අතීතයෙහි මෙසේ මාගේ ජිහ්වායතනය විය, මෙසේ රසයෝ වූහ'යි. . . . අතීතයෙහි මෙසේ මාගේ කායායතනය විය, මෙසේ ස්ප්‍රෂ්ටව්‍යයෝ වූහ'යි අතීතයෙහි මෙසේ මාගේ මනායතනය විය. මෙසේ ධර්මයෝ වූහ'යි එහි විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ නො වෙයි. විඥනය ඡන්‍දරාග ප්‍රතිබද්ධ නො වූ හෙයින් එය අභිනන්‍දනා නො කෙරෙයි. එය අභි නන්‍දනා නො කරනුයේ අතීතය අනුගමනය නො කෙරෙයි, ඇවත්නි, මෙසේ අතීත ආයතනධර්මය අනුගමනය නො කෙරෙයි.

ඇවත්නි, කිසෙයින් අනාගත ආයතනධර්මය ප්‍රාර්ථනා කෙරෙයි යත් : අනාගතයෙහි මෙසේ මාගේ චක්ෂුරායතනය වන්නේ යැ, මෙසේ රූපයෝ වන්නාහ'යි. නො ලත් ආයතනධර්මයාගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවාලයි. චිත්තයාගේ ප්‍රණිධානප්‍රත්‍යයෙන් එය අභිනන්‍දනා කෙරෙයි. එය අභිනන්‍දනා කරනුයේ අනාගත ආයතනධර්මය ප්‍රාර්ථනා කෙරෙයි. අනාගත කාලයෙහි මෙසේ මාගේ ශ්‍රොත්‍රායතනය වන්නේ යැ. මෙසේ ශබ්දයෝ වන්නාහ'යි. . . . අනාගත කාලයෙහි මෙසේ මාගේ ඝ්‍රාණායතනය වන්නේ යැ මෙසේ ගන්ධයෝ වන්නාහ'යි. . . . අනාගත කාලයෙහි මෙසේ මාගේ ජිහ්වායතනය වන්නේ ය. මෙසේ රසයෝ වන්නාහ'යි. . . අනාගත කාලයෙහි මෙසේ මාගේ කායාය තනය වන්නේ යැ. මෙසේ ස්ප්‍රෂ්ටව්‍යායතනය වන්නේය'යි. . . . අනාගත කාලයෙහි මෙසේ මාගේ මනායතනය වන්නේ යැ. මෙසේ ධර්මායතනයෝ වන්නාහ'යි. අප්‍රති ලබ්ධ වූ ධර්මායතනයාගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවයි. ප්‍රණිධානප්‍රත්‍යයෙන් එය අභිනන්‍දනා කෙරෙයි. එය ප්‍රාර්ථනා කරනුයේ අනාගත ආයතනය ප්‍රාර්ථනා කෙරෙයි. ඇවත්නි, මෙසේ අනාගතය ප්‍රාර්ථනා කෙරෙයි.

ඇවත්නි, කිසෙයින් අනාගත ආයතනධර්මය ප්‍රාර්ථනා නො කෙරෙයි යත් : අනාගත යෙහි මෙසේ මාගේ චක්ෂුරායතනය වන්නේ යැ මෙසේ රූපයෝ වන්නාහ'යි නො ලත් ආයතනධර්මයාගේ ප්‍රතිලාභය පිණිස සිත නො පිහිටුවයි. සිත නො පිහිටුවීම් පසයෙන් එය අභිනන්දනා නො කෙරෙයි, එය අභිනන්දනා නො කරනුයේ අනාගත ආයතනධර්ම ප්‍රාර්ථනා නො කෙරෙයි. අනාගතයෙහි මෙසේ මාගේ ශ්‍රොත්‍රායතනය වන්නේ යැ, මෙසේ ශබ්දයෝ වන්නාහ'යි. . . . අනාගතයෙහි මෙසේ මාගේ ඝ්‍රාණායතනය වන්නේ යැ, මෙසේ ගන්ධයෝ වන්නාහ'යි. . . අනාගතයෙහි මෙසේ මාගේ ජිහ්වායතනය වන්නේ යැ, මෙසේ රසයෝ වන්නාහ'යි. . . . අනාගතයෙහි මෙසේ මාගේ කායායතනය වන්නේ යැ' මෙසේ ස්පර්ශයෝ වන්නාහ'යි. . . . අනාගතයෙහි මෙසේ මාගේ මනාය තනය වන්නේ යැ, මෙසේ ධර්මයෝ වන්නාහ'යි නො ලත් ධර්මායතනයාගේ ප්‍රතිලාභය පිණිස සිත නො පිහිටුවයි. සිත නො පිහිටුවීම පසයෙන් එය අභිනන්‍දනා නො කෙරෙයි. එය අභිනන්‍දනා නො කරනුයේ අනාගත ආයතනය ප්‍රාර්ථනා නො කෙරෙයි. ඇවත්නි, මෙසෙයින් අනාගත ආයතනය ප්‍රාර්ථනා නො කෙරේ.

කථඤ්චාවුසො පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති: යඤ්චාවුසො චක්ඛුං යෙ ච රූපා, උභයමෙතං පච්චුප්පන්නං, තස්මිං චෙ පච්චුප්පන්නෙ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති. යඤ්චාවුසො සොතං යෙ ච සද්දා-පෙ-යඤ්චාවුසො ඝානං යෙ ච ගන්ධා -පෙ-යා චාවුසො, ජිව්හා යෙ ච රසා-පෙ-යො චාවුසො, කායො යෙ ච ඵොට්ඨබ්බා-පෙ-යො චාවුසො, මනො යෙ ච ධම්මා, උභයමෙතං පච්චුප්පන්නං, තස්මිං චෙ පච්චුප්පන්නෙ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති එවං ඛො ආවුසො, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති.

කථඤ්චාවුසො පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති. යඤ්චාවුසො, චක්ඛුං, යෙ ච රූපා, උභයමෙතං පච්චුප්පන්නං, තස්මිං චෙ පච්චුප්පන්නෙ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති. න තදභිනන්දන්තො පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති. යඤ්චාවුසො, සොතං යෙ ච සද්දා -පෙ- යඤ්චාවුසො ඝානං, යෙ ච ගන්ධා -පෙ- යා චාවුසො, ජිව්හා යෙ ච රසා -පෙ- යො චාවුසො, කායො යෙ ච ඵොට්ඨබ්බා -පෙ- යො චාවුසො මනො යෙ ච ධම්මා, උභයමෙතං පච්චුප්පන්නං. තස්මිං චෙ පච්චුප්පන්නෙ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති. න තදභිනන්දන්තො පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති. එවං ඛො ආවුසො, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති.

යං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො:

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඉමස්ස ඛො අහං ආවුසො, භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ, ආයස්මන්තො, භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරොති. තථා නං ධාරෙය්‍යාථාති.

අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: යං ඛො නො භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො:

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඇවත්නි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්නධර්මයෙහි (තෘෂ්ණාදෘෂ්ටී විසින්) අදනා ලැබෙයි යත් : ඇවත්නි, යම් චක්ෂුරින්ද්‍රියයෙකුත් යම් රූපාලම්බන කෙනෙකුත් ඇද්ද, තෙල චක්ෂුරූප දෙක ප්‍රත්‍යුත්පන්න වෙයි. ඉදින් ඒ ප්‍රත්‍යුත්පන්නයෙහි ඡන්දරාග ප්‍රතිබද්ධ විඥානය වේද, විඥානය තමා ඡන්දරාග ප්‍රතිබද්ධ බැවින් ඒ ප්‍රත්‍යුත්පන්නය අභිනන්දනා කෙරෙයි. එය අභිනන්දනා කරනුයේ ප්‍රත්‍යුත්පන්නධර්මයෙහි අදනාලැබෙයි. ඇවත්නි, යම් ශ්‍රොත්‍රෙන්ද්‍රියයෙකුත් යම් ශබ්දලම්බන කෙනෙකුත් ඇද්ද. . . . ඇවත්නි, යම් ඝ්‍රාණෙන්ද්‍රියයෙකුත් යම් ගන්ධාලම්බන කෙනෙකුත් ඇද්ද. . . . ඇවත්නි යම් ජිහ්වෙන්ද්‍රිය යෙකුත් යම් රසාලම්බන කෙනෙකුත් ඇද්ද. . . . ඇවත්නි, යම් කායෙන්ද්‍රියයෙකුත් යම් ස්ප්‍රෂ්ටව්‍යාලම්බන කෙනෙකුත් ඇද්ද. . . . ඇවැත්නි යම් මනින්ද්‍රියයෙකුත් යම් ධර්මා ලම්බන කෙනෙකුත් ඇද්ද මෙදෙක ප්‍රත්‍යුත්පන්න වෙයි. ඉදින් ඒ ප්‍රත්‍යුත්පන්නයෙහි ඡන්දරාග ප්‍රතිබද්ධ විඥානය වේ ද, විඥානය තමා ඡන්දරාග ප්‍රතිබද්ධ බැවින් ඒ ප්‍රත්‍යුත්පන්නය අභිනන්දනා කෙරෙයි. එය අභිනන්දනා කරනුයේ ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි අදනා ලැබෙයි, ඇවත්නි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්නධර්මයෙහි අදනා ලැබේ.

ඇවත්නි, කිසෙයින් ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි නො අදනා ලැබේ යැ යත් : ඇවැත්නි, යම් චක්ෂුසෙක් යම් රූප කෙනෙක් ඇද්ද මෙ දෙක ප්‍රත්‍යුත්පන්න වෙයි. ඒ ප්‍රත්‍යුත්පන්න යෙහි මැ විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වේ ද, විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වනුයෙන් එය අභිනන්දනා නො කෙරෙයි ඒ අභිනන්දනා නො කරනුයේ ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි නො අදනා ලැබෙයි. ඇවත, යම් ශ්‍රොත්‍රයෙකුත් යම් ශබ්ද කෙනෙකුත් ඇද්ද. . . . ඇවත, යම් ඝ්‍රාණයෙකුත් යම් ගන්ධ කෙනෙකුත් ඇද්ද. . . . ඇවත, යම් ජිහ්වාවකුත් යම් රස කෙනෙකුත් ඇද්ද. . . . . ඇවැත, යම් කයෙකුත් යම් ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙකුත් ඇද්ද. . . . ඇවත, යම් මනසකුත් යම් ධර්ම කෙනෙකුත් ඇද්ද මෙදෙක ප්‍රත්‍යුත්පන්න යැ. ඉදින් ඒ ප්‍රත්‍යුත්පන්නයෙහි විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වේ ද, විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වනුයේ ඒ අභිනන්දනා නො කෙරෙයි. ඒ අභිනන්දනා නො කරනුයේ ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි නො අදනා ලැබේ. ඇවත්නි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ධර්මයෙහි නො අදනා ලැබේ.

ඇවත්නි, අපගේ බුදුහු යම් උද්දෙසයක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟී විහාරයට පිවිසියෝ ද,

අතීත ආයතනධර්මය අනුගමනය කරන්නේ යැ. . . . ඒ මහණහු එකාන්තයෙන් 'භද්‍රෙකරාත්‍ර'යයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ යයි.

ඇවත්නි, මම බුදුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ උද්දේසයාගේ විස්තරාර්ථය මෙසේ දනගනිමි. ආයුෂ්මත්නි, තෙපි ඉදින් කැමැත්තාහු නම් බුදුන් කරා මැ එළඹ තෙල කරුණ පුළුවුස්නවු යැ. යම්සේ බුදුහු ප්‍රකාශ කෙරෙත් ද එපරිද්දෙන් එය ධරව යි.

ඉක්බිති ඒ වහන්දැ ආයුෂ්මත් මහකසයින් තෙරණුවන්ගේ භාෂිතය අභිනන්දනා කොට අනුමොදනා කොට හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහු යැ, එළඹ භාග්‍යවතුන් වහන්සේ අභිවාදනය කොට එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ වහන්දැ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළෝ : ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපට යම් උද්දෙසයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක් ද,

'අතීතය අනුගමනය නො කරන්නේ යැ. . . එකාන්තයෙන් ඒ මහණහු 'භද්‍රෙකරාත්‍ර' යැයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ' යයි.

තෙසං නො භන්තෙ, අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ‘ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො:

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති. තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි: ‘අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා’ති. අථ ඛො මයං භන්තෙ, යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡිම්හ. තෙසං නො භන්තෙ, ආයස්මතා මහාකච්චානෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො විභත්තොති.

පණ්ඩිතො භික්ඛවෙ මහාකච්චානො. මහාපඤ්ඤො භික්ඛවෙ මහාකච්චානො. මං චෙපි තුම්හෙ භික්ඛවෙ, එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං එවමෙවං ව්‍යාකරෙය්‍යං, යථා තං මහාකච්චානෙන ව්‍යාකතං. එසො චෙව තස්ස අත්ථො, එවඤ්ච නං ධාරෙථාති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**මහාකච්චානභද්දෙකරත්ත සුත්තං තතියං.**

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නික්ම යත් මැ අපට මෙල සිත් විය : ඇවත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් මේ උද්දෙසය උදෙසා විස්තරාර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක.

අතීත ආයතනධර්මය අනුගමනය නො කරන්නේ යැ, නො පත් ආයතනධර්මය තෘෂ්ණාදෘෂ්ටීන් ප්‍රාර්ථනා නො කරන්නේ යැ. . . . ඒකාන්තයෙන් ඒ මහණ ‘භද්‍රෛකරාත්‍ර’ යයි ශාන්ත වූ බුද්ධමුනි ප්‍රකාශ කෙරේ’යයි.

භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අර්ථය විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය කවරෙක් විස්තරයෙන් විභාග කරන්නේ දැ’යි. වහන්ස, අපට මෙල සිත් විය : මේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් කච්චායන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තරාර්ථය විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය විස්තර විසින් විභාග කරන්නට පොහොසත් වන්නාහ. ඇපි ආයුෂ්මත් මහාකාත්‍යායනයන් කරා එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායනයන් අතින් මෙල කරුණු පුළුවුස්නමෝ නම් මැනැවැයි. වහන්ස, එකල්හි අපි ආයුෂ්මත් මහාකාත්‍යායනයන් කරා එළැඹියම්හ. එළඹ ආයුෂ්මත් මහා කච්චාන තෙරුන් අතින් පුළුවුසුම්හ. වහන්ස, ආයුෂ්මත් මහාකාත්‍යායනයන් විසින් අපට මේ අයුරින් මේ පදයෙන් මේ ව්‍යඤ්ජනයෙන් අර්ථය විභාග කරන ලදැ’යි.

මහණෙනි, මහාකාත්‍යායනයෝ පණ්ඩිතයහ, මහණෙනි, මහාකාත්‍යායනයෝ මහාප්‍රාඥයහ. මහණෙනි, ඉදින් තෙපි මයිදු අතින් මෙල කරුණ පුළුවුස්නවූ නම් මම් ද එය ‘යම්සේ එය මහාකාත්‍යායනයන් විසින් ප්‍රකාශ කරන ලද ද, එපරිදි මැ ප්‍රකාශ කරන් නෙම්. තවද ඒ උද්දෙසයාගේ තෙලෙ මැ අර්ථ වෙයි. එපරිද්දෙන් එය ධරව’යි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළසේක, සතුටු සිත් ඇති ඒ වහන්දැ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය පිළිගත්හ යි.

**තුන් වැනි මහාකච්චානභද්දෙකරත්ත සූත්‍ර යි.**

# 3. 4. 4

## ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ලොමසකඞ්ගියො සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො චන්දනො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං නිග්‍රොධාරාමං ඔභාසෙත්වා යෙනායස්මා ලොමසකඞ්ගියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො චන්දනො දෙවපුත්තො ආයස්මන්තං ලොමසකඞ්ගියං එතදවොච:

ධාරෙසි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චාති.

න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ත්වං පනාවුසො, ධාරෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චාති.

අහම්පි ඛො භික්ඛු, න ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච.

ධාරෙසි පන ත්වං භික්ඛු, භද්දෙකරත්තියො ගාථාති

න ඛො අහං අවුසො, ධාරෙමි භද්දෙකරත්තියො ගාථා.

ත්වං පනාවුසො, ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති

ධාරෙමි ඛොහං භික්ඛු, භද්දෙකරත්තියො ගාථාති.

යථා කථං පන ත්වං ආවුසො, ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති.

එකමිදහං භික්ඛු සමයං භගවා දෙවෙසු තාවතිංසෙසු විහරති පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං. තත්‍ර භගවා දෙවානං තාවතිංසානං භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසි:

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහීරං අසඞ්කුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ.
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

එවංවිහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

# 3. 4. 4

## ලොමසකඞ්ගියභද්දෙකරත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු මහසිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩ වාස කරන සේක. එකල ආයුෂ්මත් ලොමසකඞ්ගිය තෙරණුවෝ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි විහරණ කෙරෙති. එසඳ චන්දන දෙවපුත්‍ර මධ්‍යම රාත්‍රියෙහි විශිෂ්ට ජව්වර්ණ ඇති වැ සියලු නිග්‍රොධාරාමය බබුළුවා ලොමසකඞ්ගිය තෙරණුවන් කරා එළැඹියේ යි. එළඹ එකත්පස් වැ සිටියේ. එකත්පස් වැ සිටි චන්දන දෙවපුත් ආයුෂ්මත් ලොමසකඞ්ගිය තෙරණුවනට තෙල කී.

මහණ, තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා ධරව ? යි.

ඇවත, මම භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා නො ධරමි.

ඇවැත්නි, තෙපි වනාහි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා ධරවු යැ ?.

මහණ, මමත් භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා නො ධරමි.

මහණ, තෙපි භද්දෙකරත්ති ගාථා ධරව ?

ඇවැත්නි, මම භද්දෙකරත්ති ගාථා නො ධරමි.

ඇවත තෙපි භද්දේකරත්ති ගාථා ධරවු යැ ?

මහණ, මම භද්දෙකරත්ති ගාථා ධරමි.

ඇවත්නි, තෙපි කෙසෙයින් භද්දෙකරත්ති ගාථා ධරන්නාව ?

මහණ, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ තව්තිසාවැසි දෙවියන් කෙරෙහි වූ පරසතු මුල පඬුඇඹුල්සලස්නෙහි වැඩ වාස කරනසේක. එකල භාග්‍යවතුන් වහන්සේ තව්තිසා වැසි දෙවියනට භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා දෙසූසේක.

අතීතය අනුගමනය නො කරන්නේ යැ, අනාගතය තෘෂ්ණාදෘෂ්ටීන් නො ඉස්නේ යැ, යමෙක් ඉක්මිණි ද ඒ පුහුන් වෙයි. යමෙක් නො පැමිණි ද ඒ නො එළඹියේ වෙයි.

යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ ධර්මය ඒ ඒ තැන අනිත්‍යාදි විසින් විදර්ශනා කෙරේ ද, ඒ විද්වත් තෙමේ අසංහීර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ යැ.

අද මැ ආතාපනවීර්‍ය්‍යය කර්තව්‍ය වෙයි. ' සෙට යැ මරණ ය' යි කවරෙක් දන්නේ යැ, මහසෙන් ඇති ඒ මරහු හා මිත්‍රසංස්තවාදිසංගරයෙක් (ගිවිසුමෙක්) නැත්තු !

මෙවන් විහරණ ඇති කෙලෙස් තවන වැර ඇති දවරැ තන්ද්‍රා නැති ඒ යොගාවචරයා ශාන්ත වූ ' භද්‍රෛකරාත්‍ර ' යයි ශාන්ත වූ බුද්ධමුනි වදරයි.

එවං ඛො අහං භික්ඛු, ධාරෙමි භද්දෙකරත්තියො ගාථා. උග්ගණ්හාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. පරියාපුණාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. ධාරෙහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. අත්ථසංහිතො භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසො ච විභඞ්ගො ච ආදිබ්‍රහ්මචරියකොති. ඉදමවොච චන්දනො දෙවපුත්තො. ඉදං වත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො ආයස්මා ලොමසකඞ්ගියො තස්සා රත්තියා අච්චයෙන සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො, යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ලොමසකඞ්ගියො භගවන්තං එතදවොච :

'එකමිදාහං භන්තෙ, සමයං සක්කෙසු විහරාමි කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො භන්තෙ, අඤ්ඤතරො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො, කෙවලකප්පං නිග්‍රොධාරාමං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භන්තෙ, සො දෙවපුත්තො මං එතදවොච : 'ධාරෙසි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චා'ති. එවං වුත්තෙ අහං භන්තෙ තං දෙවපුත්තං එතදවොචං : 'නඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. ත්වං පනාවුසො ධාරෙසි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්චා'ති අහම්පි ඛො භික්ඛු, න ධාරෙමි භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. ධාරෙසි පන ත්වං භික්ඛු, භද්දෙකරත්තියො ගාථා'ති. න ඛො අහං ආවුසො, ධාරෙමි භද්දෙකරත්තියො ගාථාති. ත්වං පනාවුසො ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති. ධාරෙමි ඛො අහං භික්ඛු, භද්දෙකරත්තියො ගාථාති. යථා කථං පන ත්වං ආවුසො, ධාරෙසි භද්දෙකරත්තියො ගාථාති.

එකමිදාහං භික්ඛු, සමයං භගවා දෙවෙසු තාවතිංසෙසු විහරති පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං. තත්‍ර භගවා දෙවානං තාවතිංසානං භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච අභාසි :

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

'එවං ඛො අහං භික්ඛු, ධාරෙමි භද්දෙකරත්තියො ගාථා. උග්ගණ්හාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච, පරියාපුණාහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. ධාරෙහි ත්වං භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච. අත්ථසංහිතො භික්ඛු, භද්දෙකරත්තස්ස උද්දෙසො ච විභඞ්ගො ච ආදිබ්‍රහ්මචරියකොති. ඉදමවොච සො භන්තෙ, දෙවපුත්තො, ඉදං වත්වා තත්ථෙවන්තරධායි. සාධු මෙ භන්තෙ, භගවා භද්දෙකරත්තස්ස උද්දෙසඤ්ච විභඞ්ගඤ්ච දෙසෙතූ'ති.

ජානාසි පන ත්වං භික්ඛු, තං දෙවපුත්ත'න්ති.

න ඛො අහං භන්තෙ, ජානාමි තං දෙවපුත්තන්ති.

මහණ, මෙසෙයින් මම භද්දෙකරත්ති ගාථා ධරමි. මහණ තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා උගනුව. මහණ තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා බසින් පුහුණු කරව. මහණ තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා වාචනායෙන් ධරව. මහණ, භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා අර්ථසංහිත යැ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යයට මුල ද වෙයි. චන්දන දෙව්පුත් මෙය කී. මෙය කියා අතුරුදහන් කෙළේ.

ඉක්බිති ආයුෂ්මත් ලොමසකඞ්ගිය තෙරණුවෝ එරැය ඇවෑමෙන් සෙනසුන් සඟවා තබා පාසිවුරු ගෙන සැවැත්නුවර කරා චාරිකා කළෝ. චාරිකා කරන්නෝ සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම්වෙහෙර බුදුන් කරා ගියෝ, ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ලොමසකඞ්ගිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළෝ :

වහන්ස, එක් කලෙක සැහැදනවියෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි මම වාස කෙරෙමි. වහන්ස, එකල අන්‍යතර දෙවපුත්‍රයෙක් මධ්‍යම රාත්‍රියෙහි විශිෂ්ට ජව්වර්ණ ඇති වැ නිග්‍රොධාරාමය හාත්පස බබුළුවා මා කරා එළැඹියේ. එළඹ එකත්පස් වැ සිටියේ. වහන්ස, එකත්පස් වැ සිටි ඒ දෙව්පුත් මට මෙල කී : ' මහණ, තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා ධරව යි ? වහන්ස, මෙසේ කී කල මම ඒ දෙව්පුත්හට මෙල කීමි : ' ඇවත මම භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා නො ධරමි ' යි. ඇවත, තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා ධරන්නාව ' යි පිළිවිත්මි. මහණ මමත් භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා නො ධරමි ' යි කී. මහණ තෙපි භද්දෙකරත්ත ගාථා ධරන්නාව ? කී, (පිළිවිත්). ඇවත්නි, මම භද්දෙකරත්ති ගාථා නො ධරමි ' යි (කියා) ඇවත තෙපි භද්දෙකරත්ති ගාථා ධරන්නාව ? යි (පිළිවිත්මි). ' මහණ මම භද්දෙකරත්ති ගාථා ධරමි ' යි කී. ඇවත්නි, තෙපි කිසෙයින් භද්දෙකරත්ති ගාථා ධරව ! යි ඇසීමි.

මහණ එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙවියන් කෙරෙහි වූ පරසතුමුල පඩුඇඹුල් සලස්නෙහි විහාර කරනසේක. එකල භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙවියනට භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා දෙසූසේක.

අතීතය අනුගමනය නො කරන්නේ යැ . . . ඒ යොගාවචරයා ' භද්දෙකරත්ත ' යයි ශාන්ත වූ බුද්ධමුනි තෙමේ වදරයි.

මහණ, මෙසෙයින් මම භද්දෙකරත්ති ගාථා ධරමි. මහණ තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා අසා උගනුව. මහණ, තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා බසින් පුහුණු කරව, මහණ තෙපි භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා වාචනා වශයෙන් ධරව. මහණ භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා අර්ථ සංහිත යැ, ආදිබ්‍රහ්මචර්‍ය්‍යක ද වෙයි. වහන්ස, ඒ දෙව්පුත් මෙය කී, මෙය කියා එහි මැ අතුරුදහන් බිජි. වහන්ස, යදිමි. භාග්‍යවතුන් වහන්සේ මට භද්දෙකරත්තයා පිළිබඳ උද්දෙස හා විභාග හා දෙසන සේක්වා.

මහණ, තෝ එ දෙව්පුත් දන්නෙහි ?

වහන්ස, මම එ දෙව්පුත් නො දන්මි.

චන්දනො නාම සො භික්ඛු, දෙවපුත්තො. චන්දනො භික්ඛු, දෙවපුත්තො අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසො[1] සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති. තෙන හි භික්ඛු, සුණාහි. සාධුකං මනසිකරොහි. භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ලොමසකඞ්ගියො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච :

අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං, —පෙ—
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

කථඤ්ච භික්ඛු, අතීතං අන්වාගමෙති : එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො අහොසිං -පෙ- එවංසඤ්ඤො අහොසිං -පෙ- එවංසඞ්ඛාරෙ අහොසිං -පෙ- එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවං ඛො භික්ඛු අතීතං අන්වාගමෙති.

කථඤ්ච භික්ඛු, අතීතං නාන්වාගමෙති: එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො අහොසිං -පෙ- එවංසඤ්ඤො අහොසිං -පෙ- එවංසඞ්ඛාරෙ අහොසිං -පෙ- එවං-විඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො භික්ඛු අතීතං නාන්වාගමෙති.

කථඤ්ච භික්ඛු, අනාගතං පටිකඞ්ඛති: එවංරූපො සියං අනාගත-මද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවංවෙදනො සියං -පෙ- එවංසඤ්ඤො සියං -පෙ- එවංසඞ්ඛාරෙ සියං -පෙ- එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්වානෙති. එවං ඛො භික්ඛු, අනාගතං පටිකඞ්ඛති.

කථඤ්ච භික්ඛු, අනාගතං න පටිකඞ්ඛති. එවංරූපො සියං අනාගත-මද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවංවෙදනො සියං -පෙ- එවං සඤ්ඤො සියං -පෙ- එවංසඞ්ඛාරෙ සියං -පෙ- එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්වානෙති. එවං ඛො භික්ඛු, අනාගතං න පටිකඞ්ඛති.

කථඤ්ච භික්ඛු, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති: ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛු, පච්චුප්පන්නෙසු ධම්මෙසු සංහීරති.

1. සබ්බං චෙතසො - සීමු.

මහණ, එදෙව්පුත් චන්දන නම්. මහණ, චන්දන දෙව්පුත් අර්ථ කොට මෙනෙහි කොට මුළු හිතින් එළවා බැහූ කන් ඇති වැ දහම් අසයි. මහණ ,එයින් අස, මනා කොට මෙනෙහිකර කියමි ' යි. වහන්ස, එසේ යයි ලොමසකඞ්ගිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහු. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක.

අතීතය අනුගමනය නො කරන්නේ යැ, අනාගතය නො ඉස්නේ යැ . . . ඒ යොගාවචරයා එකැතින් ' භද්දෙකරත්ත ' යයි ශාන්ත වූ බුද්ධමුනි තෙමේ වදරයි.

මහණෙනි, කිසෙයින් අතීතය අනුව යේ ද යත් : අතීතයෙහි මෙබඳු රූප ඇතියෙම් වීමි ' යි, එහි තෘෂ්ණා එළවයි. මෙබඳු වෙදනා ඇතියෙම් වීමි . . . මෙබඳු සංඥ ඇතියෙම් වීමි . . . මෙබඳු සංස්කාර ඇතියෙම් වීමි . . . අතීතකාලයෙහි මෙබඳු විඥන ඇතියෙම් වීමි යි, එහි තෘෂ්ණා එළවයි. මහණ මෙසෙයින් අතීත ස්කන්ධධර්මය අනුගමනය කෙරෙයි.

මහණ, කෙසේ අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කෙරේ ය යත් : අතීත කාලයෙහි මෙබඳු රූප ඇතියෙම් වීමි ' යි එහි තෘෂ්ණා නො එළවයි. මෙබඳු වෙදනා ඇතියෙම් වීමි ' යි . . . මෙබඳු සංඥ ඇතියෙම් වීමි ' යි . . . මෙබඳු සංස්කාර ඇතියෙම් වී මි 'යි . . . අතීතකාලයෙහි මෙබඳු විඥන ඇතියෙම් වීමි ' යි එහි තෘෂ්ණා නො එළවයි. මහණ, මෙසෙයින් අතීත ස්කන්ධධර්ම අනුගමනය නො කරන්නේ නම් වෙයි.

මහණ, කෙසේ අනාගත ස්කන්ධධර්ම පතන්නේ යැ යත්: අනාගතයෙහි මෙබඳු රූප ඇතියෙම් වෙම්ව' යි එහි තෘෂ්ණා එළවයි. මෙබඳු වෙදනා ඇතියෙම් වෙම්වා . . . මෙබඳු සංඥ ඇතියෙම් වෙම්වා . . . මෙබඳු සංස්කාර ඇතියෙම් වෙම්වා . . . අනාගත කාලයෙහි මෙබඳු විඥන ඇතියෙම් වෙම්ව ' යි එහි තෘෂ්ණා එළවයි. මහණ, මෙසෙයින් අනාගත ස්කන්ධධර්ම පතන්නේ වෙයි.

මහණ, කෙසේ අනාගත ස්කන්ධධර්ම නො පතන්නේ යැ යත් : අනාගත කාලයෙහි මෙබඳු රූප ඇතියෙම් වෙම්ව ' යි එහි තෘෂ්ණා නො එළවයි. මෙබඳු වෙදනා ඇතියෙම් වෙම්වා . . . මෙබඳු සංස්කාර ඇතියෙම් වෙම්වා . . . අනාගත කාලයෙහි මෙබඳු විඥන ඇතියෙම් වෙම්ව ' යි එහි තෘෂ්ණා, නො එළවයි. මහණ, මෙසේ අනාගත ස්කන්ධධර්ම නො ඉස්නේ නම් වෙයි.

මහණ, කෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්මයෙහි අදනා ලැබේ යැ යත් : මහණ, මෙලොව බුද්ධාදි ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයට අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයට අකොවිද වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම වශයෙන් තෘෂ්ණාදීන් දකී. ආත්මය රූපවත් කොට ද ආත්මයෙහි රූපය ද රූපයෙහි ආත්මය ද දකී. වෙදනා . . . සංඥ . . . සංස්කාර . . . විඥනය ආත්ම වශයෙන් දකී. විඥනවත් ආත්මය ද ආත්මයෙහි විඥනය ද විඥනයෙහි ආත්මය ද දකී. මහණ, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධ ධර්මයෙහි අදනාලැබෙයි.

කථඤ්ච භික්ඛු, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති: ඉධ භික්ඛු සුතවා අරියසාවකො. අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො. න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො භික්ඛු, පච්චුප්පන්නෙසු ධම්මෙසු න සංහීරති.

අතීතං නාන්වාගමෙය්‍ය -පෙ-
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනීති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ලොමසකඞ්ගියො භගවතො භාසිතං අභිනන්දීති.

**ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සුත්තං චතුත්ථං.**

මහණෙනි, කෙසේ ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්මයෙහි නො අදනාලැබේ යැ යත් : මහණෙනි මෙලොව ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍යධර්මයට කොවිද වූ ආර්‍ය්‍යධර්මයෙහි සුවිනීත වූ සත්පුරුෂයන් දක්නාසුලු සත්පුරුෂධර්මයට දක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි සුවිනීත වූ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමෙ රූපය ආත්ම විසින් නො දක්නේ යැ. රූපවත් ආත්මය, ආත්මයෙහි රූපය, රූපයෙහි ආත්මය නො දක්නේ යැ. වේදනා . . . සංඥා . . . සංස්කාර . . . විඥාන ආත්ම විසින් නො දක්නේ යැ. විඥානවත් ආත්මය ද ආත්මයෙහි විඥානය ද විඥානයෙහි ආත්මය ද නො දක්නේ යැ. මහණෙනි, මෙසෙයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධධර්මයෙහි නො අදනා ලබන්නේ නම් වෙයි.

අතීත ස්කන්ධධර්මය අනුගමනය නො කරන්නේ යැ . . . එකාන්තයෙන් ඒ යොගාවචරයා ' භද්‍රෛකරාත්‍ර ' යයි ශාන්ත බුද්ධමුනි තෙමේ කියයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් සිත් ඇති ලොමසකඞ්ගිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කළහ.

සතර වැනි ලොමසකඞ්ගියභද්දෙකරත්ත සූත්‍ර යි.

# 3. 4. 5

## චූළකම්මවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච:

කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො, යෙන මනුස්සානං- යෙව සතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතා. දිස්සන්ති හි භො ගොතම, මනුස්සා අප්පායුකා, දිස්සන්ති දීඝායුකා. දිස්සන්ති බව්හාබාධා, දිස්සන්ති අප්පාබාධා. දිස්සන්ති දුබ්බණ්ණා, දිස්සන්ති වණ්ණවන්තො. දිස්සන්ති අප්පෙසක්ඛා, දිස්සන්ති මහෙසක්ඛා. දිස්සන්ති අප්පභොගා, දිස්සන්ති මහාභොගා. දිස්සන්ති නීචකුලීනා, දිස්සන්ති උච්චාකුලීනා. දිස්සන්ති දුප්පඤ්ඤා, දිස්සන්ති පඤ්ඤවන්තො. කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො, යෙන මනුස්සානං යෙව සතං මනුස්සභූතානං දිස්සන්ති හීනප්පණීතතාති.

කම්මස්සකා මාණව, සත්තා කම්මදායාද කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා. කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.

න ඛො අහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථාහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.

තෙන හි මාණව, සුණාහි සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

එවං භොති ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච:

ඉධ මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණ- භූතෙසු[1] සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්‍ථ යත්‍ථ පච්චාජායති, අප්පායුකො හොති. අප්පායුකසංවත්තනිකා එසා මාණව පටිපදා, යදිදං පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු.

---

1. පාණභූතෙසු – මජ්ඣං, PTS.

# 3. 4. 5

## චූලකම්මවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වසනසේක. එසඳ තොදෙය්‍ය බමුණුපුත් සුභ නම් මාණවක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සම්මොදනීය සාරාණීය කථා කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් තොදෙය්‍ය බමුණුපිත් සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැල කෙළේ යැ.

භවත් ගෞතමයන් වහන්ස, යම් කරුණෙකින් මිනිසත් බවට පැමිණි මිනිසුන්ගේ මැ හීනප්‍රණීත බව දක්නා ලැබෙයි. ඊට හේතු කවරෙ යැ ප්‍රත්‍යය කවරෙ යැ : භවත් ගෞතමයන් වහන්ස, අල්පායුෂ්ක මනුෂ්‍යයෝ දක්නා ලැබෙත් මැ යැ, දීර්ඝායුෂ්කයෝ දක්නා ලැබෙති. බොහෝ ආබාධ ඇත්තාහු දක්නා ලැබෙති, අල්පාබාධයෝ දක්නා ලැබෙති. දුර්වර්ණයෝ දක්නා ලැබෙති, වර්ණවත් වූවාහු දක්නා ලැබෙති. අල්ප යශස්කයෝ දක්නා ලැබෙති, මහායශස්කයෝ දක්නා ලැබෙති. අල්පභොග ඇත්තාහු දක්නා ලැබෙති, මහාභොග ඇත්තාහු දක්නා ලැබෙති. නිචකුලීනයෝ දක්නා ලැබෙති, උච්චාකුලීනයෝ දක්නා ලැබෙති. දුෂ්ප්‍රාඥයෝ දක්නා ලැබෙති, ප්‍රඥවත් වූවාහු දක්නා ලැබෙත්. භවත් ගෞතමයන් වහන්ස, යම් කරුණෙකින් මිනිසත් බවට පැමිණි මිනිසුන්ගේ මැ හීනප්‍රණීත බව දක්නා ලැබෙත් ද ඊට හේතු කවරේ ද ප්‍රත්‍යය කවරේ දැ ? යි.

මාණවකය, සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාදය කොට ඇත්තාහ. කර්මය කාරණ කොට ඇත්තාහ, කර්මය බන්ධු කොට ඇත්තාහ, කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය මේ හීනප්‍රණීතභාවය පිණිස සත්ත්වයන් විභාග කෙරේ යයි වදළහ.

භවත් ගෞතමයන් වහන්ස, මම භවත් ගෞතමයන් විසින් සැකෙවින් ප්‍රකාශ කළ විස්තර විසින් අර්ථය විභාග නො කළ මේ භාෂිතයාගේ විස්තරාර්ථය නො දතහෙමි භවත් ගෞතමයන් වහන්සේ යම් පරිදි මම භවත් ගෞතමයන් විසින් සැකෙවින් වදළ විස්තරාථය විභාග නො කළ මේ භාෂිතයාගේ විස්තරාර්ථය දතහෙම් ද එපරිද්දෙන් මට ධර්මය දෙශනා කෙරෙත්වා ' යි අයදිමි ' යි.

එසේ වී නම් මාණවකය, අසව මොනොවට මෙනෙහි කරව, ප්‍රකාශ කරන්නෙමි ' යි වදළහ.

' එසේ යැ භවත්නි ' යි තෝදෙය්‍යපුත්‍ර සුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දින. භාග්‍යවතුන් වහන්සේ තෙල ' චූළකම්මවිභඞ්ගය ' වදළසේක.

මාණවකය, මෙලොව ඇතැම් ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි රෞද්‍ර වූ ලෙහෙ වැකුණු අත් ඇති සතුන් වැනැසීමෙහි යෙදුණේ සියලු සත්ත්වයන් කෙරෙහි නිෂ්කාරුණික බවට පැමිණියේ ප්‍රාණවධ කරනසුලු වූයේ වේ ද, හේ මෙසේ රැස් කළ මෙසේ සමාදන් කළ ඒ කර්මය හේතු කොට ගෙන කාබුන් මරණින් මත්තෙහි සුවයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට ප්‍රතිසන්ධි විසින් පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මත්තෙහි අපාය වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට නො පැමිණේ ද ඉදින් මිනිස් බවට පැමිණේ නම් යම් යම් තැනෙක උපදනේ නම් අල්පායුෂ්ක වෙයි. මාණවකය, යම් ප්‍රාණවධ කරනසුලු බවෙක් වේ ද රෞද්‍ර වූයේ ලෙහෙ වැකුණු අත් ඇතියේ ප්‍රාණවධයෙහි යෙදුණේ සියලු ප්‍රාණීන් කෙරෙහි නිෂ්කාරුණික වූයේ වේ ද, මේ ප්‍රතිපදව අල්පායුෂ්කභාවය පිණිස පවත්නේ වේ.



29—ඒ 00502 (8/73)

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, දීඝායුකො හොති. දීඝායුකසංවත්තනිකා එසා මාණව පටිපදා යදිදං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති.

ඉධ මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං විහෙඨක-ජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, බව්හාබාධො හොති. බව්හාබාධසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං සත්තානං විහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, අප්පාබාධො හොති. අප්පාබාධසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං සත්තානං අවිහෙඨකජාතිකො හොති පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති දුබ්බණ්ණො හොති. දුබ්බණ්ණසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් ප්‍රාණවධ හැරපියා ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙයි. බහාතැබූ දඬුවම් ඇතියේ බහාතැබූ ශස්ත්‍ර ඇතියේ (අකුශලයෙහි) ලජ්ජා ඇතියේ දයාවට පැමිණියේ සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පී වැ වෙසේ ද, හේ මෙසේ සම්පූර්ණ කරනලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතුයෙහි සොභනගති ඇති සුවයෙන් අග්‍ර වූ ලොකයට (පිළිසඳ විසින්) පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතුයෙහි සුගති ස්වර්ගලොකයට නො පැමිණේ නම්, ඉදින් මිනිස් බවට පැමිණේ නම් යම් යම් තැනෙක උපදනේ නම් දීර්ඝායුෂ්ක වෙයි. මාණවකය, ප්‍රාණවධ හැරපියා ප්‍රාණවධයෙන් වැළැකුණේ වෙයි, බහා තැබූ දඬුවම් ඇති වැ බහා තැබූ ශස්ත්‍ර ඇති වැ ලජ්ජා ඇති වැ දයාවට පැමිණ සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පී වැ වාසය කෙරෙයි යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපද ව දීර්ඝායුෂ්ක බව පිණිස පවත්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් අතින් වේවයි කැටින් වේවයි දඬින් වේවයි සැතින් වේවයි සත්නට වෙහෙස කරන පියවි ඇති වේ ද, හේ මෙසේ සපුරන ලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතුයෙහි අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙයි. කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට ඉදින් නො පැමිණේ නම්, මිනිස් බවට ඉදින් ඒ නම්, යම් යම් තැනෙක උපදනේ නම්, බොහෝ ආබාධ ඇතියේ වෙයි. මාණවකය, අතින් වේවයි කැටින් වේවයි දඬින් වේවයි සැතින් වේවයි සත්ත්වයන් වෙහෙසන පියවි ඇති වෙයි යන යමක් ඇත්ද, තෙල ප්‍රතිපදව බොහෝ ආබාධ ඇති බව පිණිස පවත්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් අතින් වේවයි කැටින් වේවයි දඬින් වේවයි සැතින් වේවයි සත්ත්වයනට වෙහෙස නො කරන පියවි ඇත්තේ වේ ද? හේ මෙසේ පුරනලද මෙසේ සමාදන් කොට ගන්නාලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතු සුගතිවූ ස්වර්ගලොකයට (පිළිසඳ විසින්) පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට නො පැමිණේ නම් ඉදින් මිනිස් බවට ඒ නම් යම් යම් තැනෙක උපදනේ ද අල්පාබාධ වෙයි. මාණවකය, අතින් වේවයි කැටින් වේවයි දඬින් වේවයි සැතින් වේවයි සත්ත්වයන් නො වෙහෙසන පියවි ඇති වෙයි යන යමක් ඇත් ද, තෙල ප්‍රතිපදව අල්පාබාධ බව පිණිස පවත්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් කිපෙන සුලු වූයේ දැඩි ආයාස බහුලකොට ඇත්තේ වේ ද, මඳ බසකුදු කියන ලදුයේ (කොපයෙන්) ගැටේ ද කිපේ ද විරෝධයට පැමිණේ ද තද බවට පැමිණේ ද කොපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරේ ද, ඒ පුද්ගල මෙසේ පුරනලද මෙසේ සමාදන් කොට ගන්නාලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට නො පැමිණේ නම් ඉදින් මිනිස් බවට ඒ නම්, යම් යම් තැනෙක උපදනේ ද දුර්වර්ණ වූයේ වෙයි. මාණවකය, ක්‍රොධ කරනසුලු වූයේ උපායාස බහුල කොට ඇතියේ මඳ බසකුදු කියන ලදුයේ (කොපයෙන්) ගැටෙයි, කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, තද බවට පැමිණෙයි. කොපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව දුර්වර්ණ බවට වැටෙන්නී වේ.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජති, න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති පාසාදිකො හොති. පාසාදිකසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා ඉස්සාමනකො හොති, පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති, උපදුස්සති ඉස්සං බන්ධති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති අප්පෙසක්ඛො හොති. අප්පෙසක්ඛසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං ඉස්සාමනකො හොති, පරලාභසක්කාරගරුකාරමානනවන්දන-පූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා අනිස්සාමනකො හොති, පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති මහෙසක්ඛො හොති. මහෙසක්ඛසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං අනිස්සාමනකො හොති පරලාභසක්කාරගරුකාරමානනවන්දන-පූජනාසු න ඉස්සති න උපදුස්සති න ඉස්සං බන්ධති.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා න දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ-විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති අප්පභොගො හොති. අප්පභොගසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං න දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් ක්‍රොධ නො කරනසුලු වූයේ දැඩි ආයාස බහුල කොට නැතියේ වේ ද, බොහෝ කොටත් කියන ලදුයේ ක්‍රොධයෙන් නො ගැටෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තද බවට නො පැමිණෙයි. කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. හේ මෙසේ පූරන ලද සමාදන් කොට ගන්නා ලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතුයෙහි සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට නො පැමිණේ ද ඉදින් මිනිස් බවට ඒ ද යම් යම් තැනෙක උපදනේ නම්, ප්‍රසාද එළවන්නේ වෙයි. මාණවකය, ක්‍රෝධ නො කරන්නේ වෙයි, උපායාස බහුල කොට නැති වෙයි, බොහෝ කොටත් කියන ලදුයේ නො ගැටෙයි, නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තද බවට නො පැමිණෙයි, කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි යන යමක් ඇද්ද තෙල ප්‍රතිපදව ප්‍රසාද එළවන බවට වැටෙන්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ කිසිවෙක් ඊර්ෂ්‍යා සහගත සිත් ඇති වෙයි. මෙරමාගේ ලාභසත්කාර ගරුකාර මානන වන්දනා පූජනායෙහි ඊර්ෂ්‍යා කෙරෙයි, ද්වෙෂ කෙරෙයි, ඊර්ෂ්‍යාව බඳියි. හේ මෙසේ රැස් කළ මෙසේ සමාදන් කොට ගත් ඒ කර්මය හෙතු කොට ගෙන කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට නො පැමිණේ නම් ඉදින් මිනිස් බවට පැමිණේ නම්, යම් යම් තැනෙක උපදනේ වේ ද අල්පෙශාක්‍ය වෙයි. මාණවකය, ඊර්ෂ්‍යා සහගත සිත් ඇති වෙයි, පරලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යා කෙරෙයි, ද්වෙෂ කෙරෙයි, ඊර්ෂ්‍යාව බඳියි යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව අල්පෙශාක්‍ය බව පිණිස පවත්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් ඊර්ෂ්‍යා සහගත සිත් නැති වේ ද මෙරමාගේ ලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යා නො කෙරෙයි, ද්වෙෂ නො කෙරෙයි, ඊර්ෂ්‍යාව නො බඳියි. හේ මෙසේ රැස් කරන ලද මෙසේ සමාදන් කොට ගන්නාලද ඒ කර්මය හේතු කොට ගෙන කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ග ලොකයට නො පැමිණේ නම් ඉදින් මිනිස් බවට පැමිණේ නම්, යම් යම් තැනෙක උපදනේ වේ ද, (එකල්හි) මහෙශාක්‍ය වෙයි. මාණවකය, ඊර්ෂ්‍යා සහගත සිත් නැති වෙයි, මෙරමා හට ලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජනායෙහි ඊර්ෂ්‍යා නො කෙරෙයි, ද්වෙෂ නො කෙරෙයි, ඊර්ෂ්‍යා නො බඳී යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව මහෙශාක්‍ය බව පිණිස පවත්නී වෙයි.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් මහණෙක් හට හෝ බමුණෙක්හට හෝ ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශයන වාසාගාර පහන්තෙල් නො දෙන්නේ වෙයි. හේ මෙසේ පූරනලද මෙසේ සමාදන් කොට ගන්නාලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණෙයි. ඉදින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට නො පැමිණේ නම් ඉදින් මිනිස්බවට පැමිණේ නම් යම් යම් තැනෙක උපදනේ ද (එතැන්හි) අල්ප භොග වෙයි. මාණවකය, මහණෙක්හට හෝ බමුණෙක්හට හෝ ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශයනාගාර පහන්තෙල් නො දෙනු වෙයි යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව අල්පභොග ඇති බවට වැටෙන්නී වෙයි.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා, අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ-විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, මහාභොගො හොති. මහාභොගසංවත්තනිකා එසා, මාණව, පටිපදා යදිදං දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා ථද්ධො හොති අතිමානී. අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං න දෙති, මග්ගාරහස්ස මග්ගං න දෙති, සක්කාතබ්බං න සක්කරොති, න ගරුකාතබ්බං න ගරුකරොති, මානෙතබ්බං න මානෙති, පූජෙතබ්බං න පූජෙති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, නීචකුලීනො හොති. නීචකුලීනසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං ථද්ධො හොති අතිමානී, අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං න පච්චුට්ඨෙති, ආසනාරහස්ස න ආසනං දෙති, මග්ගාරහස්ස න මග්ගං දෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති, මානෙතබ්බං න මානෙති, පූජෙතබ්බං න පූජෙති.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා අත්ථද්ධො හොති අනතිමානී. අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං දෙති, මග්ගාරහස්ස මග්ගං දෙති, සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරුකරොති, මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජාති, උච්චාකුලීනො හොති. උච්චාකුලීනසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං අත්ථද්ධො හොති අනතිමානී, අභිවාදෙතබ්බං අභිවාදෙති, පච්චුට්ඨාතබ්බං පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං දෙති, මග්ගාරහස්ස මග්ගං දෙති, සක්කාතබ්බං සක්කරොති, ගරුකාතබ්බං ගරු කරොති. මානෙතබ්බං මානෙති, පූජෙතබ්බං පූජෙති.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් මහණක්හට හෝ බමුණක්හට හෝ ආහාර පාන වස්ත්‍ර යානා මාලා ගන්ධ විලෙපන ශයනාගාර පහන්තෙල් දෙන්නේ වෙයි. හේ මෙසේ පුරන ලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මයෙන් කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට එළැඹෙයි. ඉදින් කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට නො එළැඹේ නම් ඉදින් මිනිස් බවට පැමිණේ නම් යම් යම් තැනෙක උපදනේ වේ ද එකල්හි මහාභොග ඇත්තේ වෙයි. මාණවකය, මහණක්හට හෝ බමුණක්හට හෝ ආහාර පාන වස්ත්‍ර යානා මාලාගන්ධ විලෙපන ශයනාගාර පහන්තෙල් දෙන්නේ වෙයි යන යමක් ඇද්ද තෙල ප්‍රතිපදව මහාභොග ඇති බවට වැටෙන්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් ස්තබ්ධ වූයේ අධිකමාන ඇත්තේ වෙයි. අභිවාදනාර්හයාට අභිවාදනා නො කෙරෙයි. දක හුනස්නෙන් නැඟිසිටියයුතුවහුට දක හුනස්නෙන් නො නැඟෙයි. අසුන් දීමට නිසි වූවහුට අසුන් නො දෙයි. මාර්ගාර්හයාහට මාර්ගය නො දෙයි. සත්කාර කළයුත්තහුට සත්කාර නො කෙරෙයි. ගරු කළයුත්තහුට ගරු නො කෙරෙයි. බුහුමන් කළ යුත්තහුට බුහුමන් නො කෙරෙයි. පූජාර්හයාට පූජා නො කෙරෙයි. හේ මෙසේ රැස් කරනලද මෙසේ සමාදන් කොට ගන්නාලද ඒ කර්මය හෙතු කොටගෙන කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට එළැඹෙයි. ඉදින් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට නො පැමිණේ නම් ඉදින් මිනිස් බවට ඒ නම් යම් යම් තැනෙක උපදනේ වේ ද (එකල්හි) නීචකුල ඇත්තේ වෙයි. මාණවකය, ස්තබ්ධ වූයේ අධිකමාන ඇති වෙයි, අභිවාදනාර්හයාට අභිවාදනය නො කෙරෙයි, හුනස්නෙන් නැඟිසිටියයුත්තහු දක හුනස්නෙන් නැඟී නො සිටියි, ආසනාර්හයාහට අසුන් නො දෙයි, මාර්ගාර්හයාට මඟ නො දෙයි, සත්කාර කළයුත්තහුට සත්කාර නො කෙරෙයි, ගරු කළයුත්තහුට ගරු නො කෙරෙයි, බුහුමන් කළ යුත්තහුට බුහුමන් නො කෙරෙයි, පූජාර්හයාට පූජා නො කෙරෙයි යන යමක් ඇද්ද තෙල ප්‍රතිපදව නීචකුල බවට පවත්නී වේ.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් අස්තබ්ධ වූයේ අධිකමාන නැත්තේ වෙයි. අභිවාදනාර්හයාට අභිවාදනය කෙරෙයි. හුනස්නෙන් නැඟිසිටියයුත්තහු දක හුනස්නෙන් නැඟී සිටියි. ආසනාර්හයාට ආසනය දෙයි. මාර්ගාර්හයාට මඟ දෙයි. සත්කාර කළයුත්තහුට සත්කාර කෙරෙයි. ගරු කළයුත්තහුට ගරු කෙරෙයි. බුහුමන් කළයුතුවහුට බුහුමන් කෙරෙයි. පූජාර්හයාට පූජා කෙරෙයි. හේ මෙසේ සපුරන ලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මය හේතු කොට ගෙන උසස්කුල ඇත්තේ වෙයි. මාණවකය, අස්තබ්ධ වූයේ අධිකමාන නැති වෙයි, අභිවාදනාර්හයාට අභිවාදනය කෙරෙයි, හුනස්නෙන් නැඟිසිටියයුත්තහු දක හුනස්නෙන් නැඟෙයි, ආසනාර්හයාට අසුන් දෙයි, මාර්ගාර්හයාට මඟ දෙයි, සත්කාර කළයුත්තහුට සත්කාර කෙරෙයි, ගරු කළයුත්තහුට ගරු කෙරෙයි, බුහුමන් කළයුත්තහුට බුහුමන් කෙරෙයි, පූජාර්හයාට පූජා කෙරෙයි යන යමක් ඇද්ද තෙල ප්‍රතිපදව උසස්කුල බව පිණිස පවත්නී වේ.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා න පරිපුච්ඡිතා හොති: කිං භන්තෙ කුසලං, කිං අකුසලං, කිං සාවජ්ජං, කිං අනවජ්ජං, කිං සෙවිතබ්බං, කිං න සෙවිතබ්බං, කිං මෙ කරීයමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිං වා පන මෙ කරීයමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං නිරයං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං නිරයං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, දුප්පඤ්ඤො හොති. දුප්පඤ්ඤසංවත්තනිකා එසා මාණව, පටිපදා යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා න පරිපුච්ඡිතා හොති: කිං භන්තෙ කුසලං, කිං අකුසලං, කිං සාවජ්ජං, කිං අනවජ්ජං, කිං සෙවිතබ්බං, කිං න සෙවිතබ්බං, කිං මෙ කරීයමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිං වා පන මෙ කරීයමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති.

ඉධ පන මාණව, එකච්චො ඉත්ථී වා පුරිසො වා සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා හොති: කිං භන්තෙ, කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිං මෙ කරීයමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිං වා පන මෙ කරීයමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති. සො තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො චෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සචෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චාජායති, මහාපඤ්ඤො හොති. මහාපඤ්ඤසංවත්තනිකා එසා මාණව, පටිපදා, යදිදං සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා හොති: කිං භන්තෙ කුසලං, කිං අකුසලං, කිං සාවජ්ජං, කිං අනවජ්ජං, කිං සෙවිතබ්බං, කිං න සෙවිතබ්බං, කිං මෙ කරීයමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය හොති, කිං වා පන මෙ කරීයමානං දීඝරත්තං හිතාය සුඛාය හොතීති.

ඉති ඛො මාණව, අප්පායුකසංවත්තනිකා පටිපදා අප්පායුකත්තං උපනෙති. දීඝායුකසංවත්තනිකා පටිපදා දීඝායුකත්තං උපනෙති. බව්හාබාධසංවත්තනිකා පටිපදා බව්හාබාධත්තං උපනෙති. අප්පාබාධසංවත්තනිකා පටිපදා අප්පාබාධත්තං උපනෙති. දුබ්බණ්ණසංවත්තනිකා පටිපදා දුබ්බණ්ණත්තං උපනෙති. පාසාදිකසංවත්තනිකා පටිපදා පාසාදිකත්තං උපනෙති. අප්පෙසක්ඛසංවත්තනිකා පටිපදා අප්පෙසක්ඛත්තං උපනෙති. මහෙසක්ඛසංවත්තනිකා පටිපදා මහෙසක්ඛත්තං උපනෙති. අප්පභොගසංවත්තනිකා පටිපදා අප්පභොගත්තං උපනෙති. මහාභොගසංවත්තනිකා පටිපදා මහාභොගත්තං උපනෙති. නීචකුලීනසංවත්තනිකා පටිපදා නීචකුලීනත්තං උපනෙති. උච්චාකුලීනසංවත්තනිකා පටිපදා උච්චාකුලීනත්තං උපනෙති. දුප්පඤ්ඤසංවත්තනිකා පටිපදා දුප්පඤ්ඤත්තං උපනෙති. මහාපඤ්ඤසංවත්තනිකා පටිපදා මහාපඤ්ඤත්තං උපනෙති.

කම්මස්සකා මාණව, සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් මහණකු හෝ බමුණකු හෝ වෙත එළඹ වහන්ස, කුසල් කිම ? අකුසල් කිම ? සාවද්‍යය කිම ? අනවද්‍යය කිම ? සෙවියයුත්ත කිම ? නො සෙවියයුත්ත කිම ? මා විසින් කුමක් කරනු ලබන්නේ දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටේ ද? යළි මා විසින් කුමක් කරනු ලබන්නේ හිත පිණිස සුව පිණිස වේ ද ? යි නො පුළුවුස්නේ වෙයි. හේ මෙසේ සපුරන ලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මය හේතු කොට ගෙන . . . දුෂ්ප්‍රාඥ වෙයි. මාණවකය, මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ වහන්ස, කුසල් කිම ? අකුසල් කිම ? සාවද්‍යය කිම ? අනවද්‍යය කිම ? සෙවිතව්‍යය කිම ? නසෙවිතව්‍යය කිම ? මා විසින් කුමක් කරනු ලබන්නේ දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වේ ද ? යළි මා විසින් කුමක් කරනු ලබන්නේ හිත පිණිස සුව පිණිස වේ ද ? '' යි නො පුළුවුස්නේ වෙයි යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව දුෂ්ප්‍රාඥ බව පිණිස පවත්නී වෙයි.

තවද මාණවකය, මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි කිසිවෙක් මහණකු කරා හෝ බමුණකු කරා හෝ එළඹ '' වහන්ස, කුසල් කිම ? අකුසල් කිම ? සාවද්‍යය කිම ? අනවද්‍යය කිම ? සේවිතව්‍යය කිම ? නසේවිතව්‍යය කිම ? මා විසින් කුමක් කරනු ලබන්නේ දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වේ ද, යළි මා විසින් කුමක් කරනු ලබන්නේ හිත පිණිස සුව පිණිස වේ ද ? '' යි විචාරනුයේ වෙයි. හේ මෙසේ පුරන ලද මෙසේ සමාදන් කොට ගන්නා ලද ඒ කර්මය හෙතු කොට ගෙන . . . මහාප්‍රාඥ වෙයි. මාණවකය, මහණකු වෙත හෝ බමුණකු වෙත හෝ එළඹ වහන්ස, කුසල් කිම ? අකුසල් කිම ? සාවද්‍යය කිම ? අනවද්‍යය කිම ? සෙවිතව්‍යය කිම ? නසෙවිතව්‍යය කිම ? මා විසින් කුමක් කරනු ලබන්නේ දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුකට වැටේ ද ? යළි මා විසින් කුමක් කරනු ලබන්නේ හිතයට සුවයට වැටේ දැයි විචාරනුයේ වෙයි'' යන යමක් ඇද්ද, තෙල ප්‍රතිපදව මහාප්‍රාඥ බව පිණිස පවත්නී වේ.

මෙසෙයින් මාණවකය, අල්පායුෂ්ක බව පිණිස පවත්නා ප්‍රතිපදව අල්පායුෂ්ක බවට පමුණුවයි. දීර්ඝායුෂ්ක බව පිණිස පවත්නා ප්‍රතිපදව දීර්ඝායුෂ්ක බවට පමුණුවයි. බොහෝ ආබාධ ඇති බව පිණිස පවත්නා ප්‍රතිපදව බොහෝ ආබාධ ඇති බවට පමුණුවයි. අල්පාබාධ බව පිණිස පවත්නා ප්‍රතිපදව අල්පාබාධ ඇති බවට පමුණුවයි. දුර්වර්ණ බව පිණිස පවත්නා ප්‍රතිපදාව දුර්වර්ණ බවට පමුණුවයි. ප්‍රසාද එළවන බව පිණිස පවත්නා ප්‍රතිපදව ප්‍රසාද එළවන බවට පමුණුවයි. අල්පෙශාක්‍ය බව පිණිස පවත්නා ප්‍රතිපදව අල්පෙශාක්‍ය බවට පමුණුවයි. මහේශාක්‍ය බව පිණිස පවත්නා ප්‍රතිපදව මහේශාක්‍ය බවට පමුණුවයි. අල්පභොග බව පිණිස පවත්නා ප්‍රතිපදව අල්පභොග ඇති බවට පමුණුවයි. මහාභොග බව පිණිස පවත්නා ප්‍රතිපදව මහාභොග ඇති බවට පමුණුවයි. නීචකුලීන බව පිණිස පවත්නා ප්‍රතිපදව නීචකුල ඇති බවට පමුණුවයි. උච්චෛඃකුලීන භාවය පිණිස පවත්නා ප්‍රතිපදව උසස්කුල ඇති බවට පමුණුවයි. දුෂ්ප්‍රාඥ බව පිණිස පවත්නා ප්‍රතිපදව දුෂ්ප්‍රාඥ බවට පමුණුවයි. මහාප්‍රාඥ භාවය පිණිස පවත්නා ප්‍රතිපදව මහාප්‍රාඥභාවයට පමුණුවා.

මාණවකය, සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ, කර්මය දායාද්‍ය කොට ඇත්තාහ, කර්මය යොනි කොට ඇත්තාහ, කර්මය බන්ධු කොට ඇත්තාහ, කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය තෙමේ සත්ත්වයන් හීනප්‍රණීත බවට විභාග කෙරේ ' යයි.

එවං වුත්තෙ සුභො මාණවො තොදෙය්‍යපුත්තො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

චූළකම්මවිභඞ්ග සුත්තං පඤ්චමං.

මෙසේ වදාළ කල්හි තොදෙය්‍යපුත්‍ර ශුභ මාණවක භාග්‍යවතුන් වහන්සේට තෙල කී : භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යැ භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත යැ භවත් ගෞතමයන් වහන්ස, යම් පරිදි යටිහුරු කොට තබන ලද්දක් උඩුහුරු කරන්නේ හෝ වේ ද පිළිසන් වූවක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුළා වූ එකක්හට මාර්ගය ප්‍රකාශ කරන්නේ හෝ වේ ද, අන්ධකාරයෙහි ' ඇස් ඇත්තාහු රූපයන් දක්නාහ ' යි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද එපරිද්දෙන් මැ භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් පර්‍ය්‍යායයෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේ වන, තෙලෙ මම් භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යෙමි. ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු කොට මා ධරන සේක්ව ' යි.

පස්වැනි චූළකම්මවිභඞ්ගසූත්‍ර යි.

# 3. 4. 6

## මහාකම්මවිභඞ්ග සුත්තං

එවං මෙ සුත්තං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සමිද්ධි අරඤ්ඤකුටිකායං විහරති.

අථ ඛො පොතලිපුත්තො පරිබ්බාජකො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙනායස්මා සමිද්ධි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සමිද්ධිනා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පොතලිපුත්තො පරිබ්බාජකො ආයස්මන්තං සමිද්ධිං එතදවොච: 'සම්මුඛා මෙතං ආවුසො සමිද්ධි, සමණස්ස ගොතමස්ස සුතං, සම්මුඛා පටිග්ගහිතං: මොඝං කායකම්මං, මොඝං වචීකම්මං, මනොකම්මමෙව සච්ච'න්ති. අත්ථි ච සා සමාපත්ති යං සමාපත්තිං සමාපන්නො න කිඤ්චි වෙදියතීති.

මා එවං ආවුසො පොතලිපුත්ත අවච, මා එවං ආවුසො පොතලිපුත්ත අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය: 'මොඝං කායකම්මං, මොඝං වචීකම්මං, මනොකම්මමෙව සච්ච'න්ති. අත්ථි ච ඛො සා ආවුසො, සමාපත්ති යං සමාපත්තිං සමාපන්නො න කිඤ්චි වෙදියතීති.

කීව චිරං පබ්බජිතොසි ආවුසො, සමිද්ධීති.

න චිරං ආවුසො, තීණි වස්සානීති.

එත්ථ දානි මයං ථෙරෙ භික්ඛූ කිං වක්ඛාම, යත්‍ර හි නාමෙවං නවො භික්ඛු සත්ථාරං පරිරක්ඛිතබ්බං මඤ්ඤිස්සති. සඤ්චෙතනිකං ආවුසො සමිද්ධි, කම්මං කත්වා කායෙන වාචාය මනසා, කිං සො වෙදියතීති.

සඤ්චෙතනිකං ආවුසො පොතලිපුත්ත, කම්මං කත්වා කායෙන වාචාය මනසා, දුක්ඛං සො වෙදියතීති.

අථ ඛො පොතලිපුත්තො පරිබ්බාජකො ආයස්මතො සමිද්ධිස්ස භාසිතං නෙව අභිනන්දි න පටික්කොසි. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ආයස්මා සමිද්ධි අචිරපක්කන්තෙ පොතලිපුත්තෙ පරිබ්බාජකෙ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සමිද්ධි යාවතකො අහොසි පොතලිපුත්තෙන පරිබ්බාජකෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං ආයස්මතො ආනන්දස්ස ආරොචෙසි. එවං වුත්තෙ ආයස්මා ආනන්දො ආයස්මන්තං සමිද්ධිං එතදවොච: 'අත්ථි ඛො ඉදං ආවුසො සමිද්ධි, කථාපාභතං භගවන්තං දස්සනාය. ආයාමාවුසො සමිද්ධි, යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා එතමත්ථං භගවතො ආරොචෙය්‍යාම. යථා නො භගවා ව්‍යාකරිස්සති, තථා නං ධාරෙය්‍යාමාති.

# 3. 4. 6

# මහාකම්මවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්‍දකනිවාප නම් වේළුවනයෙහි වැඩ වසනසේක. එසමයෙහි ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ වනකිළියෙක්හි වෙසෙති.

එකල්හි පොතලිපුත්‍ර පරිව්‍රාජක ජඞ්ඝාවිහරණයෙන් ඔබ මොබ හැසිරෙනුයේ ආයුෂ්මත් සමිද්ධි තෙරුන් කරා එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් සමිද්ධි තෙරුන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කළ යුතු කථාව කොට නිමවා එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් පොතලිපුත්‍ර පරිව්‍රාජක ආයුෂ්මත් සමිද්ධි තෙරණුවනට තෙල කී : " ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෙනි, ශ්‍රමණ ගෞතමයන් හමුයෙහි මා විසින් තෙල අසනලද, හමුයෙහි පිළිගන්නා ලද: කායකර්මය සිස් යැ, වාක්කර්මය සිස් යැ, මනඃකර්මය මැ තථ යැ යි. තවද යම් සමවතකට සමවන්නේ කිසි වේදනාවක් නො විඳී ද, එබඳු සමවතක් ඇතැ ' යි කියා " යි.

ඇවත් පොතලිපුත්‍රය, නහමක් මෙසේ කිය. ඇවැත් පොතලිපුත්‍රය, නහමක් මෙසේ කිය. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන නහමක් කර. භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යානය නො මැනැවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො මැ වදරන්නාහ: ' කායකර්මය තුච්ඡ යැ, වාක්කර්මය තුච්ඡ යැ, මනඃකර්මය මැ සැබැවැ ' යි. ඇවැත්නි, යම් සමවතකට සමවන්නේ කිසි වේදනාවක් නො විඳී ද, එබඳු සමවතෙක් ඇත්තේ වේ යයි.

ඇවැත්නි, සමිද්ධි තෙරණුවෙනි, පැවිදි වැ කෙතෙක් දිගු කල් ඇද්ද ?

ඇවැත්නි, බොහෝ කල් නො වෙයි. තුන් වසක් වේ යයි,

යම් කරුණෙක්හි මෙසේ නවක මහණ ශාස්තෘහු (ගර්භායෙන් මිදීමෙන්) රක්කයුතු කොට සිතී නම් ස්ථවිර භික්ෂූන් ගෙන දන් මෙහිලා අපි කුමක් කියමෝ ද ? ඇවත්නි, සමිද්ධි තෙරණුවෙනි, කයින් බසින් සිතින් දැන දැන කර්ම කොට හේ කවර වේදනාව විඳී ද ? යි.

ඇවැත් පොතලිපුත්‍රය, කයින් බසින් සිතින් දැන දැන කර්ම කොට හේ දුඃඛවේදනා විඳී යයි.

එසඳ පොතලිපුත්‍ර පරිව්‍රාජක ආයුෂ්මත් සමිද්ධි තෙරුන්ගේ භාෂිතය නො මැ පිළිගත බැහැර නො කෙළේ යැ. නො පිළිගෙන බැහැර නො කොට හුනස්නෙන් නැඟී ගියේ.

ඉක්බිති ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ පෝතලිපුත්‍ර පරිව්‍රාජක නික්මගිය නොබෝ වේලෙහි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් කරා එළඹියහ. එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමග සතුටු විය. සතුටුවියයුතු සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස්වැ හුන්හ. එකත්පස්වැ හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ පොතලිපුත්‍ර පරිව්‍රාජකයන් සමග යම් පමණ කථාසල්ලාපයෙක් වී නම් එහැම ආයුෂ්මත් අනඳ තෙරණුවනට දන්වූහ. මෙසේ කී කල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ආයුෂ්මත් සමිද්ධි තෙරණුවනට තෙල වදළහ : " ඇවැත්නි, සමිද්ධි තෙරණුවෙනි, භාග්‍යවතුන් වහන්සේ දක්නට මේ කථාප්‍රාභෘතයෙක් (පඬුරෙක්) ඇත. ඇවැත්නි සමිද්ධි තෙරණුවෙනි, යම්හ. භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මෙකරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකරම්හ. භාග්‍යවතුන් වහන්සේ යම්සේ අපට ප්‍රකාශ කරනසේක් නම් එය එසේ ධරම්හ " යි.

එවමාවුසොති බො ආයස්මා සමිද්ධි ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. අථ බො ආයස්මා ච ආනන්දො ආයස්මා ච සමිද්ධි යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො බො ආයස්මා ආනන්දො යාවතකො අහොසි ආයස්මතො සමිද්ධිස්ස පොතලිපුත්තෙන පරිබ්බාජකෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

එවං වුත්තෙ භගවා ආයස්මන්තං ආනන්දං එතදවොච: 'දස්සනම්පි බො අහං ආනන්ද, පොතලිපුත්තස්ස පරිබ්බාජකස්ස නාභිජානාමි. කුතො පනෙවරූපං කථාසල්ලාපං. ඉමිනා ච ආනන්ද, සමිද්ධිනා මොඝපුරිසෙන පොතලිපුත්තස්ස පරිබ්බාජකස්ස විභජ්ජ ව්‍යාකරණීයො පඤ්හො එකංසෙන ව්‍යාකතො'ති.

එවං වුත්තෙ ආයස්මා උදායී භගවන්තං එතදවොච: 'සචෙ පන භන්තෙ, ආයස්මතා සමිද්ධිනා ඉදං සන්ධාය භාසිතං, යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මි'න්ති.

අථ බො[1] භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'පස්ස බො ත්වං ආනන්ද, ඉමස්ස උදායිස්ස මොඝපුරිසස්ස උම්මඞ්ගං[2]. අඤ්ඤාසිං බො අහං ආනන්ද, ඉදානෙවායං උදායි මොඝපුරිසො උම්මුජ්ජමානො අයොනිසො උම්මුජ්ජිස්සතී'ති. ආදිංයෙව ආනන්ද, පොතලිපුත්තෙන පරිබ්බාජකෙන තිස්සො වෙදනා පුච්ඡිතා. සචායං ආනන්ද, සමිද්ධි මොඝපුරිසො පොතලි- පුත්තස්ස පරිබ්බාජකස්ස එවං පුට්ඨො එවං ව්‍යාකරෙය්‍ය: 'සඤ්චෙතනිකං ආවුසො පොතලිපුත්ත, කම්මං කත්වා කායෙන වාචාය මනසා සුඛවෙදනියං, සුඛං සො වෙදියති.[3] සඤ්චෙතනිකං ආවුසො පොතලිපුත්ත, කම්මං කත්වා කායෙන වාචාය මනසා දුක්ඛවෙදනියං, දුක්ඛං සො වෙදියති[3] සඤ්චෙතනිකං ආවුසො පොතලිපුත්ත, කම්මං කත්වා කායෙන වාචාය මනසා අදුක්ඛමසුඛවෙදනියං, අදුක්ඛමසුඛං සො වෙදියතී'ති. එවං ව්‍යාකරමානො බො ආනන්ද, සමිද්ධි මොඝපුරිසො පොතලිපුත්තස්ස පරිබ්බාජකස්ස සම්මා ව්‍යාකරෙය්‍ය. අපිචානන්ද, කෙ ච අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා බාලා අව්‍යත්තා, කෙ ච තථාගතස්ස මහාකම්මවිභඞ්ගං ජානිස්සන්ති. සචෙ තුම්හෙ ආනන්ද, සුණෙය්‍යාථ තථාගතස්ස මහාකම්ම- විභඞ්ගං විභජන්තස්සා'ති.

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා මහාකම්ම- විභඞ්ගං විභජෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හා'නන්ද, සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති.

එවං භන්තෙති බො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

චත්තාරොමෙ ආනන්ද, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ඉධානන්ද, එකච්චො පුග්ගලො ඉධ පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨි හොති. සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

---

1. එවං වුත්තෙ - ස්‍යා. 2. උම්මඞ්ගං - මජසං.
3. වෙදයති - මජසං, සීමු.

'එසේ යැ ඇවැත්නි' යි ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිවදන් දුන්හ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ද ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදන කොට එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පොතලිපුත්‍ර පරිව්‍රාජකයා සමග ආයුෂ්මත් සමිද්ධි තෙරුන්ගේ යම් පමණ කථා සල්ලාපයෙක් වී ද එහැම භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට තෙල වදළහ: '' ආනන්දය, මම පොතලිපුත්‍ර පරිව්‍රාජකයාගේ දක්මකුදු නො දනිමි. මෙබඳු කථාසල්ලාප යෙක් වැළිත් කොයින් වී ද. තවද ආනන්දය, සමිද්ධි මොඝපුරුෂයා විසින් පොතලිපුත්‍ර පරිව්‍රාජකයාහට බෙද ප්‍රකාශ කළයුතු ප්‍රශ්නය එකාන්තයෙන් විසඳනලද 'යි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් උදයී තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ: වහන්ස, ඉදින් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන් විසින් යම් කිසි වේදනාවක් ඇද්ද එය ' දුක ' යි යන මේ සඳහා කියනලද ද ?

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් ඇමතූසේක. ' ආනන්දය, තෙපි මේ උදයී මොඝපුරුෂයාගේ ප්‍රඥ-උන්මාර්ගය බලව. ආනන්දය මම් මේ උදයී මොඝපුරුෂ මෙවිට මැ හිස නඟනුයේ නුනුවණින් හිස නඟා ' යයි දනිමි. ආනන්දය, පොතලිපුත්‍ර පරිව්‍රාජකයා විසින් ආදියෙහි මැ ත්‍රිවිධ වේදනාව පුළුවුස්නා ලද. ආනන්දය, ඉදින් මේ සමිද්ධි මොඝපුරුෂ මෙසේ පුළුවුස්නාලදුයේ පොතලිපුත්‍ර පරිව්‍රාජකයාහට මෙසේ ප්‍රකාශ කෙළේ නම් ' ඇවත, පොතලිපුත්‍රය, කයින් වචයින් මනයින් දන දන සුඛවේදනීය කර්මය කොට හේ සුව විඳී. ඇවත පොතලිපුත්‍රය, කයින් වචයින් මනයින් දන දන දුඃඛවේදනීය කර්මය කොට හේ දුක් විඳී. ඇවත පොතලිපුත්‍රය, කයින් වචයින් මනයින් දන දන අදුඃඛමසුඛවේදනීය කර්මය කොට හේ උපෙක්ෂා වේදනාව විඳී ' යයි. ආනන්දය, මෙසේ විසඳන සමිද්ධි මොඝපුරුෂ පොතලිපුත්‍ර පරිව්‍රාජකයාට මොනොවට ප්‍රකාශ කරන්නේ යැ. තවද ආනන්දය, බාල වූ අව්‍යක්ත වූ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයෝ කවරහු ද ? තථාගතයන්ගේ මහාකර්මවිභඞ්ගය කවරහු දතහෙත් ද ? ඉදින් ආනන්දය, තෙපි මහාකර්මවිභඞ්ගය විභාග කරන තථාගතයන්ගේ (දෙශනාධර්මය) අසන්නහු (නම් මැනැවැ).

භාග්‍යවතුන් වහන්ස, තෙල විභාගයට කල් වෙයි. සුගතයන් වහන්ස, තෙල විභාගයට කල් වෙයි. යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ මහාකර්මවිභඞ්ගය විභාග කරනසේක් නම් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසා ධරන්නාහ ' යි.

ආනන්දය, එසේ වී නම් අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි ' යි.

' එසේ යැ වහන්සැ ' යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ තෙල (මහාකර්මවිභඞ්ගය) වදළසේක.

ආනන්දය, ලොකයෙහි විද්‍යමාන වූ මේ පුද්ගලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙකැ යත් : ආනන්දය, මෙලොව කිසි පුද්ගලයෙක් මෙලොව පණිවා කරනු වෙයි, අයිනාදන් ගනු වෙයි, කාමයෙහි මිසහසර ඇති වෙයි, මුසවා බණනු වෙයි, පිසුනුබස් ඇති වෙයි, පරොස්බස් ඇති වෙයි, පලප් බණනු වෙයි, අභිධ්‍යා බහුල වෙයි, ව්‍යාපන්න චිත්ත වෙයි, මිථ්‍යාදෘෂ්ටික වෙයි. හේ කායභෙදයෙන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට වදියි.

ඉධ පනානන්ද, එකච්චො පුග්ගලො ඉධ පාණාතිපාතී හොති අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨී හොති. සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉධානන්ද එකච්චො පුග්ගලො ඉධ පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනා වාචා[1] පටිවිරතො හොති, ඵරුසා වාචා[2] පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨී හොති, සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

ඉධ පනානන්ද, එකච්චො පුග්ගලො ඉධ පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනා වාචා පටිවිරතො හොති, ඵරුසා වාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨී හොති. සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

ඉධානන්ද, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති. යථා සමාහිතෙ චිත්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන අමුං පුග්ගලං පස්සති: 'ඉධ පාණාතිපාතිං අදින්නාදායිං කාමෙසු මිච්ඡාචාරිං මුසාවාදිං පිසුනාවාචං ඵරුසාවාචං සම්ඵප්පලාපිං අභිජ්ඣාලුං ව්‍යාපන්නචිත්තං මිච්ඡාදිට්ඨිං. කායස්ස භෙදා පරම්මරණා පස්සති අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. සො එවමාහ: 'අත්ථි කිර භො, පාපකානි කම්මානි, අත්ථි දුච්චරිතස්ස විපාකො, අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතිං අදින්නාදායිං කාමෙසු මිච්ඡාචාරිං මුසාවාදිං පිසුනාවාචං ඵරුසාවාචං සම්ඵප්පලාපිං අභිජ්ඣාලුං ව්‍යාපන්නචිත්තං මිච්ඡාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සාමි අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නන්ති. සො එවමාහ: 'යො කිර භො පාණාතිපාතී අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨී, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති, යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉති සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස[3] අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

1. පිසුණාය වාචාය - මජසං, සිමු.
2. ඵරුසාය වාචාය - මජසං, සිමු.
3. පරාමාසා - මජසං.

ආනන්දය, මෙලොව කිසි පුද්ගලයෙක් මෙලොව දී පණිවා කරනු වෙයි, අයිනාදන් ගනු වෙයි, කාමයෙහි මිසහසර ඇති වෙයි, මුසවා බණනු වෙයි, පිසුනුබස් ඇති වෙයි, පරොස්බස් ඇති වෙයි, පලප් ඇති වෙයි, අභිධ්‍යා බහුල වෙයි, ව්‍යාපන්න සිත් වෙයි, මිථ්‍යාදෘෂ්ටික වෙයි. හේ කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙයි.

ආනන්දය, මෙලොව කිසි පුද්ගලයෙක් මෙලොව දී ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙයි, අයිනාදන් ගැනීමෙන් වැළකුණේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළැකුණේ වෙයි, මුසවායෙන් වැළකුණේ වෙයි, පිසුනු බසින් වැළකුණේ වෙයි, පරොස්බසින් වැළකුණේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළැකුණේ වෙයි, අනභිධ්‍යාලු වෙයි, අව්‍යාපන්න වූ සිත් ඇති වෙයි, සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි. හේ කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙයි.

තවද ආනන්දය, මෙලොව කිසි පුද්ගලයෙක් මෙලොව දී පරපණ නැසීමෙන් වැළකුණේ වෙයි, අයිනාදන් ගැනීමෙන් වැළැකුණේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළකුණේ වෙයි, මුසවායෙන් වැළකුණේ වෙයි, පිසුනුබසින් වැළකුණේ වෙයි, පරොස් බසින් වැළකුණේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළකුණේ වෙයි, අනභිධ්‍යාලු වෙයි, අව්‍යාපන්න සිත් ඇති වෙයි, සම්දිටු ඇති වෙයි. හේ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණේ.

ආනන්දය, මෙලොව කිසි මහණෙක් වේවයි බමුණෙක් වේවයි කෙලෙස් තවන වීර්‍ය්‍යයට පැමිණ ප්‍රධන්වීර්‍ය්‍යයට පැමිණ අනුයොගයට පැමිණ අප්‍රමාදයට පැමිණ සම්‍යග්මනසිකාරයට පැමිණ යම් පරිදි සිත සමාහිත කල්හි විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිව ඇසින් මෙලොව දී ප්‍රාණවධ කළා වූ අයිනාදන් ගත් කාමයෙහි මිසහසර ඇති මුසවා කියනසුලු පිසුනුබස් ඇති පරොස්බස් ඇති සම්ඵප්‍රලාප ඇති ව්‍යාපන්න සිත් ඇති මිසදිටු ගත් තෙල පුද්ගලයා දකී ද, කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණි යහු දකී ද, එබඳු වූ චිත්තසමාධිය ලබයි. හේ මෙසේ කියා: භවත, පාපකර්මයෝ ඇත. දුශ්චරිතයාගේ විපාකයෙක් ඇත. යම් හෙයෙකින් මම මෙලොව දී ප්‍රාණවධ කළ අයිනාදන් ගත් කාමයෙහි මිසහසර ඇති මුසවා කියනසුලු පිසුනුබස් ඇති පරොස්බස් ඇති සම්ඵප්‍රලාප ඇති අභිධ්‍යාලු වූ ව්‍යාපන්න සිත් ඇති මිසදිටු ගත් තෙල පුද්ගලයා කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණියහු දක්මි. හේ මෙසේ කියයි : '' භවත්නි, යමෙක් ප්‍රාණවධ කරනුයේ අයිනාදන් ගන්නේ . . . මිසදිටු ඇත්තේ වේ ද, එ හැම කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට එළැඹෙයි, යම් කෙනෙක් මෙසේ දනිත් ද, ඔහු මැනැවින් දනිති, යම් කෙනෙක් අන් පරිදි දනිත් ද උන්ගේ ඥනය මිථ්‍යා වෙයි '' කියා යි. මෙසේ හේ ඔහු විසින් තමා දන්නා ලද ද තමා දක්නාලද ද, තමා පහළ කරන ලද ද එය මැ එහි දෘෂ්ටියෙන් දැඩි සේ පරාමර්ශ කොට එහි වැදගෙන ' මේ මැ සත්‍ය යැ, අන්‍යය තුච්ඡ යැ ' යි ව්‍යවහාර කෙරේ ද, එබඳු චිත්තසමාධි යෙක් ස්පර්ශ කෙරෙයි.

ඉධ පනානන්ද, එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන අමුං පුග්ගලං පස්සති. ඉධ පාණාතිපාතිං අදින්නාදායිං -පෙ- මිච්ඡාදිට්ඨිං, කායස්ස භෙදා පරම්මරණා පස්සති සුගතිං සග්ගං ලොකං උපපන්නං. සො එවමාහ: 'නත්ථි කිර භො, පාපකානි කම්මානි, නත්ථි දුච්චරිතස්ස විපාකො, අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතිං අදින්නාදායිං -පෙ- මිච්ඡාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සාමි සුගතිං සග්ගං ලොකං උපපන්නන්ති. සො එවමාහ: යො කිර භො පාණාතිපාති අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨී, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති. යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉති සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස[1] අභිනිවිස්ස වොහරති: 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

ඉධානන්ද එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථා සමාහිතෙ චිත්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන අමුං පුග්ගලං පස්සති 'ඉධ පාණාතිපාතා පටිවිරතං අදින්නාදානා පටිවිරතං කාමෙසු මිච්ඡාචාරා පටිවිරතං මුසාවාදා පටිවිරතං පිසුනා වාචා[2] පටිවිරතං ඵරුසා වාචා[3] පටිවිරතං සම්ඵප්පලාපා පටිවිරතං අනභිජ්ඣාලුං අව්‍යාපන්නචිත්තං සම්මාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සති සුගතිං සග්ගං ලොකං උපපන්නං. සො එවමාහ: 'අත්ථි කිර භො කල්‍යාණානි කම්මානි, අත්ථි සුචරිතස්ස විපාකො. අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතා පටිවිරතං -පෙ- සම්මාදිට්ඨිං, කායස්ස භෙදා පරම්මරණා පස්සාමි සුගතිං සග්ගං ලොකං උපපන්න'න්ති. සො එවමාහ: 'යො කිර භො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨී සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති. යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉති සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස[1] අභිනිවිස්ස වොහරති: 'ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

ඉධ පනානන්ද එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථා සමාහිතෙ චිත්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන අමුං පුග්ගලං පස්සති. ඉධ පාණාතිපාතා පටිවිරතං අදින්නාදානා පටිවිරතං-පෙ-සම්මාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සති අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. සො එවමාහ: නත්ථි කිර භො කල්‍යාණානි කම්මානි,

1. පරාමාසා - මජසං.
2. පිසුණාය වාචාය - මජසං සීමු.
3. ඵරුසාය වාචාය - මජස, සීමු.

ආනන්දය, මෙලොව කිසි මහණෙක් වේවයි බමුණෙක් වේවයි කෙලෙස් තවන වීර්‍ය්‍යයට පැමිණ ප්‍රධන් වීර්‍ය්‍යයට පැමිණ අනුයෝගයට පැමිණ අප්‍රමාදයට පැමිණ සම්‍යග්මනසිකාරයට පැමිණ යම් පරිදි සිත සමාහිත කල්හි විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවඇසින් මෙලොව දී ප්‍රාණවධ කළ අයිනාදන් ගත් . . . මිසදිටු ගත් තෙල පුද්ගලයා කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණියහු දකී. හේ මෙසේ කියයි: පාපකර්මයෝ නැත. දුශ්චරිතයා ගේ විපාකයෙක් නැත. මම මෙලොව පණිවා කරන අයිනාදන් ගන්නා ... මිසදිටු ඇති පුද්ගලයා කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ග ලොකයට එළඹියහු දිටිම් නො ! හේ මෙසේ කියයි, යමෙක් පණිවා කරන්නේ අයිනාදන් ගන්නේ . . . මිසදිටු ඇතියේ වේ ද, එහැම දෙනේ කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණේ. යම් කෙනෙක් මෙසේ දනිත් ද, ඔහු මොනොවට දනිත්. යම් කෙනෙක් නො එසේ දනිත් ද, ඔවුන් ගේ දැනුම සිස් යැ කියා යි. මෙසේ හෙතෙම ඔහු විසින් තමා දත් තමා දුටු ස්වයංවිදිත යම් මැ දෘයෙක් ඇද්ද, එහි ලා එය මැ දැඩි සේ පරාමර්ශ කොට අභිනිවේශ කොට ' මෙය මැ සත්‍ය වෙයි, අනෙක අසත්‍ය යැ ' යි බෙණේ.

ආනන්දය, මෙලොව කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ කෙලෙස් තවන වැර නිසා ප්‍රධන් වැර නිසා අනුයොග වීර්‍ය්‍යය නිසා අප්‍රමාදය නිසා සම්‍යග් මනස්කාර නිසා යම්සේ සමාහිත චිත්තය ඇති වත් මැ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි තෙල පුහුලා මෙලොව පණිවායෙන් වෙන් වූවහු අයිනාදනින් වෙන් වූවහු කාමයෙහි මිසහසරින් වෙන් වූවහු මුසවායෙන් වෙන් වූවහු පිසුනුබසින් වෙන් වූවහු පරොස් බසින් වෙන් වූවහු සම්ඵ සංඛ්‍යාත ප්‍රලාපයෙන් වෙන් වූවහු අභිධ්‍යා බහුල නො වූවහු ව්‍යාපන්න චිත්ත නැතියහු සම්දිටු ඇතියහු කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණියහු දක්නේ වේ ද. එබඳු වූ දිව්‍යචක්ෂුස් සමාධියක් ස්පර්ශ කෙරේ. හේ මෙසේ කියයි. කල්‍යාණ කර්මයෝ ඇත. සුචරිතයාගේ විපාක ඇත. මම් මෙලොව පණිවායෙන් වෙන් වැ . . . සම්දිටු ඇති කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණි පුහුලා දිටිම් නො ! හේ මෙසේ කියයි : ' යමෙක් පණිවායෙන් දුරු වේ ද අයිනාදනින් දුරු වේ ද ... සම්දිටු ඇද්ද එහැම දෙනේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට පැමිණේ, යම් කෙනෙක් මෙසේ දනිත් ද ඔහු මොනොවට දනිත්. යම් කෙනෙක් නො එසේ දනිත් ද උන්ගේ දැන්ම මොස වෙති ' යි කියා යි. මෙසේ හෙතෙමේ ඔහු විසින් තමා දත් තමා දිටි තමා පළට කළ යම් මැ දැන්මෙක් ඇද්ද එහි ලා එය මැ දෘෂ්ටිශක්තියෙන් දෘෂ්ටි පරාමර්ශ කොට අභිනිවෙශ කොට තහවුරු වැ ගෙන බෙණේ : ' මෙ මැ සත්‍යය වෙයි, අනෙක අසත්‍ය යැ කියා යි.

ආනන්දය, මෙලොව කිසි මහණෙක් හෝ ආතාපනවීර්‍ය්‍යය නිසා ප්‍රධන්වීර්‍ය්‍යය නිසා අනුයොගවීර්‍ය්‍යය නිසා අප්‍රමාදය නිසා මනා මෙනෙහි කිරීම් නිසා එබඳු වූ දිව්‍යචක්ෂුස් සමාධිය ස්පර්ශ කෙරෙයි. යම්සේ සමාහිත සිත ඇති වත් මැ විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවැසින් තෙල පුහුලා මෙලොව පණිවායෙන් දුරු වූවහු අයිනාදනින් දුරු වූවහු . . . සම්දිටු ඇතියහු කාබුන් මරණින් මතු අපාය දුගර්ති විනිපාක සංඛ්‍යාත නිරයට එළැඹියහු දක්නේ වේ ද එබඳු දිව්‍යචක්ෂුස් සමාධිය යි. හේ මෙසේ කියයි. කල්‍යාණකර්මයෝ

නත්ථි සුචරිතස්ස විපාකො. අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතා පටිවිරතං අදින්නාදානා පටිවිරතං-පෙ-සම්මාදිට්ඨිං, කායස්ස භෙදා පරම්මරණා පස්සාමි අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්න'න්ති. සො එවමාහ: යො කිර භො පාණාතිපාතා පටිවිරතො-පෙ-සම්මාදිට්ඨී. සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති. යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණ'න්ති. ඉති සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

තත්‍රානන්ද, ය්වායං සමණො වා බ්‍රාහ්මණො වා එවමාහ: අත්ථි කිර භො, පාපකානි කම්මානි, අත්ථි දුච්චරිතස්ස විපාකොති. ඉදමස්ස අනුජානාමි. යම්පි සො එවමාහ: අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතිං අදින්නාදායිං-පෙ-මිච්ඡාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සාමි අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්න'න්ති. ඉදම්පිස්ස අනුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: යො කිර භො පාණාතිපාතී අදින්නාදායී-පෙ-මිච්ඡාදිට්ඨී, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා, අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතී'ති. ඉදමස්ස නානුජානාමි. යම්පි සො එවමාහ: යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති, යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉදම්පිස්ස නානුජානාමි. යම්පි සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති, ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤ'න්ති. ඉදම්පිස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අඤ්ඤථා හි ආනන්ද, තථාගතස්ස මහාකම්මවිභඞ්ගෙ ඤාණං හොති.

තත්‍රානන්ද, ය්වායං සමණො වා බ්‍රාහ්මණො වා එවමාහ: නත්ථි කිර භො, පාපකානි කම්මානි නත්ථි දුච්චරිතස්ස විපාකොති. ඉදමස්ස නානුජානාමි· යම්පි ඛො සො එවමාහ: අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතිං අදින්නාදායිං-පෙ-මිච්ඡාදිට්ඨිං කායස්ස භෙදා පරම්මරණා පස්සාමි සුගතිං සග්ගං ලොකං උපපන්න'න්ති, ඉදමස්ස අනුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: යො කිර භො පාණාතිපාතී අදින්නාදායී-පෙ-මිච්ඡාදිට්ඨී, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතී'ති. ඉදමස්ස නානුජානාමි. යම්පි සො එවමාහ: යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉදම්පිස්ස නානුජානාමි. යම්පි සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති. ඉදම්පිස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අඤ්ඤථා හි ආනන්ද, තථාගතස්ස මහාකම්මවිභඞ්ගෙ ඤාණං හොති.

නැත. සුචරිතයාගේ විපාකයෙක් නැත. මම මෙලොව පණිවායෙන් දුරු වූ අයිනාදනින් දුරු වූ . . . සම්දිටු ඇති, කාබුන් මරණින් මතු අපාය දුගර්ති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණි පුහුලකු දිටිම් නො ! කියා ' යි. හේ මෙසේ කියයි : ' යමෙක් පණිවායෙන් දුරු වූයේ . . . සම්දිටු ඇතියේ වේ ද, ඒ හැම දෙනෝ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණෙයි. යම් කෙනෙක් මෙසේ දනිත් ද ඔහු මොනොවට දනිති. යම් කෙනෙක් අන් සැටි දනිත් ද උන්ගේ දූන්ම මිථ්‍යා යැ ' කියා යි. මෙසේ හේ ඔහුගේ තමා දත් තමා දිටි තමා පළට කළ යම් මැ දූන්මෙක් ඇද්ද, එහි ලා ඒ දූන්ම මැ දෘෂ්ටිස්ථාමයෙන් පරාමර්ශ කොට අභිනිවෙශ කොට එහි බැසගෙන බෙණේ : ' මෙ මැ යැ සත්‍ය යැ, අනෙක මොස යැ කියා යි.

ආනන්දය, එහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියා ද : ' පාපකර්මයෝ ඇත, දුශ්චරිතයාගේ විපාකයෙක් ඇතැ ' යි. ඔහුගේ මේ කියමන අනුදනිමි. හේ මෙසෙයිනුත් යම් බසක් කියා ද මම මෙලොව පණිවා කරන අයිනාදන් ගන්නා . . . මිසදිටු ඇති පුහුලා කාබුන් මරණින් මතු අපාය දුගර්ති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණියහු දිටිම් නො ! යි, ඔහුගේ මෙබස ද අනුදනිමි. හේ මෙසෙයිනුදු යම් බසක් කියා ද පණිවා කරන අයිනාදන් ගන්නා . . . මිසදිටු ඇති යමෙක් ඇද්ද එහැම දෙනෝ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණේ යයි, ඔහුගේ මෙබස නො අනුදන්මි. හේ මෙසෙයිනුත් යම් බසක් කියා ද යම් කෙනෙක් මෙසේ දනිත් ද ඔහු මොනොවට දනිති. යම් කෙනෙක් අන් සැටි දනිත් ද ඔවුන් ගේ දූන්ම මිථ්‍යා යැ ' යි ඔහුගේ මෙබස ද නො අනුදන්මි. හේ ඔහුගේ තමා දත් තමා දිටි තමා පහළ කළ යම් මැ දූයෙක් ඇද්ද එහි එය මැ දෘෂ්ටිශක්තියෙන් පරාමර්ශ කොට අභිනිවේශ කොට බැසගෙන බෙණේ ද ' මෙ මැ යැ සත්‍ය යැ, අනෙක සිස් යැ ' යන යමක් ඇද්ද, ඔහුගේ මෙබස ද නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, අන් සැටියෙකින් තථාගතයන්ගේ මහාකර්මවිභාගයෙහි ඥනය වේ ද එහෙයිනි.

ආනන්දය, ඔවුනතුරෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියා ද : ' පාප කර්ම නැත, දුශ්චරිතයාගේ විපාක නැතැ ' යි ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : තවද මම් මෙලොව පණිවා කරන අයිනාදන් ගන්නා . . . මිසදිටුගත් පුහුලක්හු දිටිමි. කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණියහු දක්මි ' යි ඔහුගේ මෙබස් ද අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : ' යමෙක් පණිවා කරන්නෝ අයිනාදන් ගන්නෝ මිසදිටු ඇත්තෝ වේ ද, එහැම කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණෙති ' යි. ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : ' යම් කෙනෙක් මෙසේ දනිත් ද, ඔහු මොනොවට දනිති, යම් කෙනෙක් අන් සැටියෙකින් දනිත් ද උන්ගේ දූනුම මිථ්‍යා ' යි. ඔහුගේ මෙබස් නො අනුදන්මි. හේ ඔහුගේ යම් මැ තමා දත් තමා දුටු ස්වයංවිදිතයෙක් ඇද්ද, එහි එ මැ දුඩිසේ පරාමර්ශ කොට දෘෂ්ටියෙන් බැසගෙන ' මෙ මැ සත්‍ය යැ, අන්‍යය සිස් යැ ' යි කියා ද ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, තථාගතයන්ගේ මහාකර්මවිභාගයෙහි ඥනය අන් සැටි වන හෙයිනි.

තත්‍රානන්ද, ය්වායං සමණො වා බ්‍රාහ්මණො වා එවමාහ: අත්ථි කිර භො, කල්‍යාණානි කම්මානි, අත්ථි සුචරිතස්ස විපාකොති. ඉදමස්ස අනුජානාමි. යම්පි ඛො සො එවමාහ: අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතා පටිවිරතං අදින්නාදානා පටිවිරතං -පෙ- සම්මාදිට්ඨිං. කායස්ස භෙදා පරම්මරණා පස්සාමි සුගතිං සග්ගං ලොකං උපපන්න’න්ති. ඉදම්පිස්ස අනුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: යො කිර භො පාණාතිපාතා පටිවිරතො-පෙ-සම්මාදිට්ඨි, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතී’ති. ඉදමස්ස නානුජානාමි. යම්පි සො එවමාහ: යෙ එවං ජානන්ති තෙ සම්මා ජානන්ති, යෙ අඤ්ඤථා ජානන්ති මිච්ඡා තෙසං ඤාණන්ති. ඉදම්පිස්ස නානුජානාමි. යම්පි සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති. ඉදම්පිස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අඤ්ඤථා හි ආනන්ද, තථාගතස්ස මහාකම්මවිභඞ්ගෙ ඤාණං හොති.

තත්‍රානන්ද, ය්වායං සමණො වා බ්‍රාහ්මණො වා එවමාහ: නත්ථි කිර භො, කල්‍යාණානි කම්මානි, නත්ථි සුචරිතස්ස විපාකොති. ඉදමස්ස නානුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: අපාහං පුග්ගලං අද්දසං ඉධ පාණාතිපාතා පටිවිරතං අදින්නාදානා පටිවිරතං-පෙ-සම්මාදිට්ඨිං, කායස්ස භෙදා පරම්මරණා පස්සාමි අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්න’න්ති. ඉදමස්ස අනුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: යො කිර භො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො-පෙ-සම්මාදිට්ඨි, සබ්බො සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතී’ති. ඉදමස්ස නානුජානාමි. යඤ්ච ඛො සො එවමාහ: යෙ එවං ජානන්ති, තෙ සම්මා ජානන්ති, යෙ අඤ්ඤථා ජානන්ති, මිච්ඡා තෙසං ඤාණන්ති. ඉදම්පිස්ස නානුජානාමි. යම්පි සො යදෙව තස්ස සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙව තත්ථ ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති. ඉදම්පිස්ස නානුජානාමි. තං කිස්ස හෙතු: අඤ්ඤථා හි ආනන්ද, තථාගතස්ස මහාකම්මවිභඞ්ගෙ ඤාණං හොති.

තත්‍රානන්ද, ය්වායං පුග්ගලො ඉධ පාණාතිපාතී අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. පුබ්බෙ වාස්ස තං කතං හොති පාපකම්මං දුක්ඛවෙදනියං. පච්ඡා වාස්ස තං කතං හොති පාපකම්මං දුක්ඛවෙදනියං. මරණකාලෙ වාස්ස හොති මිච්ඡාදිට්ඨි සමත්තා සමාදින්නා.[1] තෙන සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යඤ්ච ඛො සො ඉධ පාණාතිපාතී හොති අදින්නාදායී හොති -පෙ- මිච්ඡාදිට්ඨි හොති. තස්ස දිට්ඨෙව ධම්මෙ විපාකං පටිසංවෙදෙති, උපපජ්ජෙ[2] වා, අපරෙ වා පරියායෙ.

1. සමාදිණ්ණා – PTS.
2. {උපපජ්ජ – මජසං, සීමු.
{උපපජ්ජං – PTS.

ආනන්දය, ඔවුනතුරෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියා ද : 'කල්‍යාණකර්ම ඇත, සුචරිතයාගේ විපාක ඇතැ ' යි. ඔහුගේ මෙබස් අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : තවද මම් මෙලොව පණිවායෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ . . . සම්දිටු ගත් පුහුලක්හු දිටිමි. කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණියහු දක්මි ' යි. ඔහුගේ මෙබස් ද අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද: යමෙක් පණිවායෙන් වෙන් වූයේ ... සම්දිටු ගත්තේ වේ ද, එහැම කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට පැමිණෙති ' යි. ඔහුගේ මෙබස් නො අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : ' යම් කෙනෙක් මෙසේ දනිත් ද, ඔහු මෙනොවට දනිති. යම් කෙනෙක් අන් සැටි දනිත් ද, උන්ගේ දූනුම මිථ්‍යා ' යි. ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. යමෙක් ඔහුගේ තමා දත් තමා දුටු යම් මැ දූයෙක් ඇද්ද, එහි එ මැ දූඩිසේ පරාමර්ශ කොට දෘෂ්ටියෙන් වැදගෙන මෙ මැ සත්‍ය යැ, අන්‍යය මොස යැ ' යි කියා ද ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, තථාගත යන්ගේ මහාකර්මවිභාගඥනය අන්සැටි වන හෙයිනි.

ආනන්දය, ඔවුනතුරෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසේ කියා ද : 'කල්‍යාණකර්ම නැත, සුචරිතයා ගේ විපාක නැතැ ' යි ඔහුගේ මෙබස් නො අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : තවද මම් මෙලොව පණිවායෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ . . . සම්දිටු ගත් පුහුලක්හු දිටිමි, කාබුන් මරණින් මතු අපාය දුගර්ති විනිපාත වූ නිරයට පැමිණියහු දක්මි ' යි. ඔහුගේ මෙබස් අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : ' යමෙක් පණිවායෙන් වෙන් වූයේ අයිනාදනින් වෙන් වූයේ . . . සම්දිටුගත්තේ වේ ද, එහැම කාබුන් මරණින් මතු අපාය දුගර්ති විනිපාත වූ නිරැ වදනාහ ' යි කියා ද, ඔහුගේ මෙබස් නො අනුදන්මි. හේ මෙසේ යමකුත් කියා ද : ' යම් කෙනෙක් මෙසේ දනිත් ද ඔහු මෙනොවට දනිති, යම් කෙනෙක් අන් සැටි දනිත් ද උන්ගේ ඥනය මිථ්‍යා යි කියා යි. ඔහුගේ මෙබස් ද නො අනුදන්මි, හේ ඔහුගේ යම් මැ තමා දත් තමා දුටු ස්වයංවිදිතයෙක් ඇද්ද, එහි එ මැ දූඩිසේ පරාමර්ශ කොට දෘෂ්ටියෙන් අභිනිවේශ කොට මෙ මැ සත්‍ය යැ, අන්‍යය තුච්ඡ යැ ' යි කියා ද, ඔහුගේ මෙබස් ද නො අනුදන්මි. ඒ කවර හෙයින යත් : ආනන්දය, තථාගතයන්ගේ මහාකර්මවිභාග ඥනය අන් සැටි වන හෙයිනි.

ආනන්දය, ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් මෙලොව පණිවා කරනුයේ අයිනාදන් ගන්නේ . . . මිසදිටු ඇත්තේ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නිරයට පැමිණේ ද, ඔහු විසින් දුඃඛවේදනාවහ වූ ඒ පාපකර්මය කැලැ මැ කරනලද හෝ වෙයි. ඔහු විසින් දුඃඛවේදනාවට හිත වූ ඒ පාපකර්මය පසු වැ කරන ලද හෝ වෙයි. ඔහු විසින් මිථ්‍යාදෘෂ්ටිය මරණකාලයෙහි හෝ සම්පූර්ණ කරනලද සමාදන කරනලද වෙයි. එහෙයින් හේ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත නම් වූ නිරයට එළැඹෙයි. යම් හෙයෙකින් හේ මෙලොව පණිවා ඇතියේ වේ ද අයිනාදන් ගත්තේ වේ ද . . . මිසදිටු ඇත්තේ වේ ද ඒ කර්මයාගේ විපාක ඉහාත්මයෙහි මැ විඳුනේ වෙයි. අනතුරු භවයෙහි හෝ තදන්‍යභවයෙක හෝ විඳුනේ වෙයි.

තත්‍රානන්ද, ය්වායං පුග්ගලො ඉධ පාණාතිපාතී අදින්නාදායී -පෙ- මිච්ඡාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. පුබ්බෙ වාස්ස තං කතං හොති කල්‍යාණකම්මං සුඛවෙදනියං. පච්ඡා වාස්ස තං කතං හොති කල්‍යාණකම්මං සුඛවෙදනියං. මරණකාලෙ වාස්ස හොති සම්මාදිට්ඨි සමත්තා සමාදින්නා, තෙන සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. යඤ්ච ඛො සො ඉධ පාණාතිපාතී හොති අදින්නාදායී හොති -පෙ- මිච්ඡාදිට්ඨි හොති. තස්ස දිට්ඨෙව ධම්මෙ විපාකං පටිසංවෙදෙති, උපපජ්ජෙ වා, අපරෙ වා, පරියායෙ.

තත්‍රානන්ද, ය්වායං පුග්ගලො ඉධ පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. පුබ්බෙ වාස්ස තං කතං හොති කල්‍යාණකම්මං සුඛවෙදනියං. පච්ඡා වාස්ස තං කතං හොති කල්‍යාණකම්මං සුඛවෙදනියං. මරණකාලෙ වාස්ස හොති සම්මාදිට්ඨි සමත්තා සමාදින්නා. තෙන සො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. යඤ්ච ඛො සො ඉධ පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. -පෙ- සම්මාදිට්ඨි හොති. තස්ස දිට්ඨෙව ධම්මෙ විපාකං පටිසංවෙදෙති, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ.

තත්‍රානන්ද, ය්වායං පුග්ගලො ඉධ පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨි, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. පුබ්බෙ වාස්ස තං කතං හොති පාපකම්මං දුක්ඛවෙදනියං. පච්ඡා වාස්ස තං කතං හොති පාපකම්මං දුක්ඛවෙදනියං. මරණ කාලෙ වාස්ස හොති මිච්ඡාදිට්ඨි සමත්තා සමාදින්නා. තෙන සො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යඤ්ච ඛො සො ඉධ පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති -පෙ- සම්මාදිට්ඨි හොති, තස්ස දිට්ඨෙව ධම්මෙ විපාකං පටිසංවෙදෙති, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ.

ඉති ඛො ආනන්ද, අත්ථි කම්මං අභබ්බං අභබ්බාභාසං, අත්ථි කම්මං අභබ්බං භබ්බාභාසං, අත්ථි කම්මං භබ්බඤ්චෙව භබ්බාභාසඤ්ච, අත්ථි කම්මං භබ්බං අභබ්බාභාසන්ති.

ඉදමවොච: භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මහාකම්මවිභඞ්ග සුත්තං ඡට්ඨං.

ආනන්දය, ඒ මහණබමුණන් කෙරෙහි යම් පුද්ගලයෙක් මෙලොව පණිවා ඇතියේ අයිනාදන් ගත්තේ . . . මිසදිටු ඇතියේ කාබුන් මරණින් මතු මනාගති ඇති ස්වර්ග ලොකයට වදනේ වේ ද, ඔහු විසින් සුඛවේදනාවට හිත වූ ඒ කල්‍යාණකර්මය කැල මැ කරන ලද වෙයි. ඔහු විසින් සම්‍යග්දෘෂ්ටිය මරණකාලයෙහි දී සම්පූර්ණ කරනලද සමාදන කරනලද හෝ වෙයි. එහෙයින් හේ කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ග ලොකයට පැමිණෙයි. යම් හෙයෙකින් හේ මෙලොව පණිවා ඇතියේ වේ ද, අයිනාදන් ගත්තේ වේ ද . . . මිථ්‍යාදෘෂ්ටික වේ ද ඒ කර්මයාගේ විපාක මෙලොව මැ විඳුනේ වෙයි. අනතුරු භවයෙහි හෝ තදන්‍යභවයෙක හෝ විඳුනේ වෙයි.

ආනන්දය, එහි යම් පුද්ගලයෙක් මෙලොව පණිවායෙන් දුරු වූයේ අයිනාදනින් දුරු වූයේ . . . සම්දිටු ඇතියේ කායභෙදයෙන් මරණින් මතු ඉෂ්ටගති ඇති ස්වර්ග ලොකයට පැමිණේ ද, ඔහු විසින් සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ඒ කල්‍යාණකර්මය කැල මැ කරනලද හෝ වෙයි. ඔහු විසින් පසු වැ සුඛවේදනාවට ප්‍රත්‍යය වූ ඒ කල්‍යාණකර්මය කරනලද හෝ වෙයි. ඔහු විසින් මරණකාලයෙහි සම්‍යග්දෘෂ්ටිය සම්පූර්ණ කරනලද සමාදන කරනලද හෝ වෙයි. එකරුණින් හේ කායභෙදයෙන් පසු මරණින් මතු ඉෂ්ටගති ඇති ස්වර්ගලොකයට පැමිණෙයි. යම් හෙයෙකින් හේ මෙලොව පණිවායෙන් දුරු වූයේ වේ ද අයිනාදනින් දුරු වූයේ වේ ද . . . සම්‍යග්දෘෂ්ටික වේ ද ඒ කර්මයාගේ විපාක මෙලොව මැ විඳුනේ වෙයි. අනන්තර භවයෙහි හෝ තදන්‍යභවයෙක හෝ විඳුනේ වෙයි.

ආනන්දය, ඒ ශ්‍රමණබ්‍රාහ්මණයන් අතුරින් යම් පුද්ගලයෙක් පණිවායෙන් වැළකියේ අයිනාදනින් වැළකියේ . . . සම්දිටු ඇතියේ ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැප යෙන් පහවූ නපුරු ගති ඇති විවස වැ පතිත වන නිරයට පැමිණේ ද, ඔහු විසින් දුඃඛවෙදනා වට ප්‍රත්‍යය වූ ඒ පාපකර්මය කැල මැ කරනලද හෝ වෙයි. ඔහු විසින් දුඃඛවෙදනාවට හේතු වූ ඒ පාපකර්මය පසු වැ කරන ලද හෝ වෙයි. ඔහු විසින් මරණාසන්නකාලයෙහි මිසදිටු සම්පූර්ණකරනලද සමාදන් කරනලද හෝ වෙයි. එකරුණින් හේ කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ අනිෂ්ටගති ඇති විවස වැ හෙන නිරයට පැමිණෙයි. යම් හෙයෙකින් හේ මෙලොව පණිවායෙන් දුරු වූයේ වේ ද අයිනාදනින් දුරු වූයේ වේ ද . . . සම්‍යග්දෘෂ්ටික වේ ද ඒ කර්මයාගේ විපාක මෙලොවැමැ විඳුනේ යැ, දෙවන භවයෙහි හෝ එයින් අන්‍යභවයෙක දී හෝ විඳුනේ යැ.

ආනන්දය, මෙසෙයින් අකුශලය මැඩලන අකුශලකර්මයෙක් ඇත. කුශලය මැඩලන අකුශලකර්මයෙක් ඇත. කුශලය මැඩලන කුශලකර්මයෙක් ද ඇත. අකුශලය මැඩලන කුශලකර්මයෙක් ඇතැ ' යි.

භාග්‍යවතුන් වහන්සෙ මේ මහාකම්මවිභඞ්ග දෙශනාව වදළ සේක. සතුටුසිත් ඇති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අනුමෝදන් වූහ.

**සවැනි මහාකම්මවිභඞ්ගසූත්‍ර යි.**

---

# 3. 4. 7

## සළායතනවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සළායතනවිභඞ්ගං වො භික්ඛවෙ, දෙසිස්සාමි තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානි. ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානි. ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බා. ඡ ඵස්සකායා වෙදිතබ්බා. අට්ඨාරස මනොපවිචාරා වෙදිතබ්බා. ඡත්තිංස සත්තපදා වෙදිතබ්බා. තත්‍රිදං නිස්සාය ඉදං පජහථ තයො සතිපට්ඨානා යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති, සො වුච්චති යොග්ගාචරියානං අනුත්තරො පුරිසදම්මසාරථී'ති. අයමුද්දෙසො සළායතනවිභඞ්ගස්ස.

ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානීති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං මනායතනං. ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානීති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානීති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ධම්මායතනං. ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානීති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝානවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොවිඤ්ඤාණං. ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඡ ඵස්සකායා වෙදිතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො. ඡ ඵස්සකායා වෙදිතබ්බාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

# 3. 4. 7

# සළායතනවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඩු මහසිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවාස කරනසේක. එකල භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් ඇමතූසේක. ' වහන්සැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල සූත්‍රය වදළසේක:

' මහණෙනි, තොපට ෂඩායතනවිභාගය දෙසමි. ඒ අසව, මනාකොට මෙනෙහි කරව, කියමි ' යි වදළෝ.

' වහන්ස, එසේ යැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහු. භාග්‍යවතුන් වහන්සේ මෙල වදළසේක.

සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ. සවැදෑරුම් බාහිර ආයතනයෝ දතයුත්තාහ. සවැදෑරුම් විඥනකායයෝ දතයුත්තාහ. සවැදෑරුම් ස්පර්ශකායයෝ දත යුත්තාහ. අටළොස් මනෝපවිචාරයෝ දතයුත්තාහ. සතිස් සත්ත්වපදයෝ දතයුත්තාහ. එහි ' මෙය නිසා මෙය දුරු කරව ' යනු දතයුත්තේ යැ. ආර්‍ය්‍ය තෙමේ යම් සිවටනක් සෙවුනේ වේ ද, ආර්‍ය්‍ය තෙමේ යම් සිවටනක් සෙවුනේ ශාස්තෘ වී ගණානුශාසනාවට නිසි වේ ද, ඒ තුන් සිවටන්හු දතයුත්තාහ. හේ ' ආචාර ශික්ෂණ කරන යොග්ගාචාරීන් අතුරින් අනුත්තර වූ " පුරුෂදම්‍යසාරථි " යයි කියනු ලැබේ, යනු දතයුත්තේ යැ. ෂඩායතනවිභාගයාගේ මේ උද්දේස යි.

' සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසේ මෙල බසෙක් කියන ලද ද, මෙල කුමක් සඳහා කියන ලද යැ යත් : චක්ෂුරායතන යැ ශ්‍රොත්‍රායතන යැ ඝ්‍රාණායතන යැ ජිහ්වායතන යැ කායායතන යැ මනායතන යි. ' සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් යම් බසෙක් කියන ලද ද, මෙල මෙය සඳහා කියන ලදි.

' සවැදෑරුම් බාහිර ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් මෙල බසෙක් කියන ලද ද, මෙල කුමක් පිණිස කියනලද යැ යත් : රූපායතන යැ ශබ්දයතන යැ ගන්ධායතන යැ රසායතන යැ ස්ප්‍රෂ්ටව්‍යායතන යැ ධර්මායතන යි. ' සවැදෑරුම් බාහිර ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසේ යම් බසෙක් කියන ලද ද, මෙල මෙය සඳහා කියන ලදි.

' සවැදෑරුම් විඥනකායයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් මෙල බසෙක් කියනලද ද, මෙල කුමක් සඳහා කියනලද යැ යත් : චක්ෂුර්විඥන යැ ශ්‍රොත්‍රවිඥන යැ ඝ්‍රාණවිඥන යැ ජිහ්වාවිඥන යැ කායවිඥන යැ මනොවිඥන යි. ' සවැදෑරුම් විඥනකායයෝ දත යුත්තාහ ' යි මෙසෙයින් යම් බසෙක් කියනලද ද, මෙල මෙය සඳහා කියන ලදි.

' සවැදෑරුම් ස්පර්ශකායයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් මෙල බසෙක් කියනලද ද, මෙල කුමක් සඳහා කියනලද යැ යත් : චක්ෂුස්සංස්පර්ශයැ ශ්‍රොත්‍රසංස්පර්ශ යැ ඝ්‍රාණසංස්පර්ශ යැ ජිහ්වාසංස්පර්ශ යැ කායසංස්පර්ශ යැ මනඃසංස්පර්ශ යි. ' සවැදෑරුම් ස්පර්ශකායයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් යම් බසෙක් කියන ලද ද, මෙල මෙය සඳහා කියන ලදි.

අට්ඨාරස මනොපවිචාරා වෙදිතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානියං රූපං උපවිචරති. දොමනස්සට්ඨානියං රූපං උපවිචරති. උපෙක්ඛට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ-මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති. දොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති. උපෙක්ඛට්ඨානියං[1] ධම්මං උපවිචරති. ඉති ඡ සොමනස්සුපවිචාරා, ඡ දොමනස්සුපවිචාරා, ඡ උපෙක්ඛුපවිචාරා. අට්ඨාරස මනොපවිචාරා වෙදිතබ්බාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඡත්තිංස සත්තපදා වෙදිතබ්බාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං : ඡ ගෙහසිතානි සොමනස්සානි, ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි, ඡ ගෙහසිතානි දොමනස්සානි, ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි, ඡ ගෙහසිතා උපෙක්ඛා, ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා

තත්ථ කතමානි ඡ ගෙහසිතානි සොමනස්සානි: චක්ඛුවිඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිස-පටිසංයුත්තානං පටිලාභං වා පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුස්සරතො උප්පජ්ජති සොමනස්සං, යං එවරූපං සොමනස්සං ඉදං වුච්චති ගෙහසිතං සොමනස්සං. සොතවිඤ්ඤෙය්‍යානං සද්දානං-පෙ-ඝානවිඤ්ඤෙය්‍යානං ගන්ධානං -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යානං රසානං -පෙ- කායවිඤ්ඤෙය්‍යානං ඵොට්ඨබ්බානං-පෙ-මනොවිඤ්ඤෙය්‍යානං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිසපටිසංයුත්තානං පටිලාභං වා පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුස්සරතො උප්පජ්ජති සොමනස්සං. යං එවරූපං සොමනස්සං, ඉදං වුච්චති ගෙහසිතං සොමනස්සං. ඉමානි ඡ ගෙහසිතානි සොමනස්සානි.

තත්ථ කතමානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි: රූපානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං, පුබ්බෙ චෙව රූපා එතරහි ච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති සොමනස්සං. යං එවරූපං සොමනස්සං, ඉදං වුච්චති නෙක්ඛම්මසිතං සොමනස්සං. සද්දානං ත්වෙව-පෙ-ගන්ධානං ත්වෙව-පෙ-රසානං ත්වෙව-පෙ-ඵොට්ඨබ්බානං ත්වෙව -පෙ-ධම්මානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං, පුබ්බෙ චෙව ධම්මා, එතරහි ච සබ්බෙ තෙ ධම්මා අනිච්චා දුක්ඛා විපරිණාම-ධම්මා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති සොමනස්සං. යං එවරූපං සොමනස්සං, ඉදං වුච්චති නෙක්ඛම්මසිතං සොමනස්සං. ඉමානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි.

---

1. උපෙක්ඛාඨානීයං — මජසං.

' අටළොස් මනෝපවිචාරයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් තෙල බසෙක් කියන ලද ද, තෙල කුමක් සඳහා කියනලද යැ යත් : ඇසින් සෞමනස්‍යයට ප්‍රත්‍යය වූ රූප දැක රූපොපවිචාර කෙරෙයි. දෞර්මනස්‍යයට ප්‍රත්‍යය වූ රූප දැක රූපොපවිචාර කෙරෙයි. උපේක්ෂාවට ප්‍රත්‍යය වූ රූප දැක රූපොපවිචාර කෙරෙයි. ශ්‍රොත්‍රයෙන් ශබ්ද අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධාඝ්‍රාණ කොට . . . ජිහ්වායෙන් රස ආස්වාද කොට . . . කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කොට . . . සිතින් සෞමනස්‍යයට ප්‍රත්‍යය වූ ධර්ම දැන ධර්මොපවිචාර කෙරෙයි. දෞර්මනස්‍යයට ප්‍රත්‍යය වූ ධර්ම දැන ධර්මොපවිචාර කෙරෙයි. උපෙක්ෂාවට ප්‍රත්‍යය වූ ධර්ම දැන ධර්මොපවිචාර කෙරේ. මෙසේ මොහු ෂට් සෞමනසොපවාරයෝ යැ ෂඩ් දෞර්මනසොපවාරයෝ යැ, ෂඩ් උපෙක්ෂොපවාරයෝ යි. ' අටළොස් මනොපවිචාර යෝ දතයුත්තාහ ' යි මෙසෙයින් යම් බසෙක් කියනලද ද. තෙල මෙය පිණිස කියන ලදි.

' සතිස් සත්ත්වපදයෝ දතයුත්තාහ ' යි මෙසෙයින් තෙල බසෙක් කියන ලද ද, තෙල බස කුමක් පිණිස කියන ලද යැ යත් : ගෙහනිඃශ්‍රිත සෞමනස්‍යයෝ සදෙනෙක, නිෂ්කාමතා නිඃශ්‍රිත සෞමනස්‍යයෝ සදෙනෙක, ගෙහනිඃශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙනෙක, නිෂ්කාමතා නිඃශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙනෙක, ගෙහනිඃශ්‍රිත උපෙක්ෂාවෝ සදෙනෙක, නිෂ්කාමතා නිඃශ්‍රිත උපෙක්ෂාවෝ සදෙනෙකි.

එහි ගෙහනිඃශ්‍රිත සෞමනස්‍යයෝ සදෙන කවරහ යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනෝරම වූ ලෝකාමිෂ ප්‍රතිසංයුක්ත වූ චක්ෂුර්විඥෙය රූපප්‍රතිලාභය ප්‍රතිලාභවශයෙන් දක්නහුට හෝ ප්‍රතිලබ්ධ බැවින් අතීත වූ නිරුද්ධ වූ ප්‍රකෘති විජහනයෙන් විපරිණාම වූ පෙර ලැබූ විරූ රූපයක් හෝ දක්නහුට සෞමනස්‍යය උපදනේ ය, මෙබඳු යම් සෞමනස්‍ය යෙක් ඇද්ද මේ ගෘහශ්‍රිත සෞමනස්‍ය යයි කියනු ලැබේ. ශ්‍රොත්‍ර විඥෙය ශබ්දප්‍රතිලාභය . . . ඝ්‍රාණවිඥෙය ගන්ධප්‍රතිලාභය . . . ජිහ්වාවිඥෙය රසප්‍රතිලාභය . . . කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යප්‍රතිලාභය . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනොරම වූ තෘෂ්ණා ප්‍රතිසංයුක්ත වූ මනොවිඥෙය ධර්මප්‍රතිලාභ වශයෙන් දක්නහුට හෝ අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ පෙර ලදවිරූ හෝ ධර්මයක් සිහි කරන්නහුට සෞමනස්‍යය උපදෙනේ ය. මෙබඳු යම් සෞමනස්‍යයෙක් ඇද්ද මේ ගෘහශ්‍රිත සෞමනස්‍ය යයි කියනු ලැබේ. මොහු සවැදෑරුම් ගෘහශ්‍රිත සෞමනස්‍යයෝ යි.

එහි විදර්ශනා නිඃශ්‍රිත සෞමනස්‍යයෝ සදෙන කවරහ යත් : රූපයන්ගේ මැ විපරිණාම විරාග නිරොධලක්ෂණ වූ අනිත්‍යාකාරය දැන පෙර වූ මැ රූපයෝ ඇද්ද ' දැනුදු එහැම රූපයෝ අනිත්‍යයහ, දුඃඛයහ, විපරිණාමධර්මයහ ' යි මෙසේ තෙල යථාභූතය විදර්ශනා ප්‍රඥයෙන් දක්නහුට සෞමනස්‍යය උපදනේ යැ. මෙබඳු වූ යම් සෞමනස්‍යයෙක් වේ ද මෙය ' විදර්ශනාශ්‍රිත සෞමනස්‍ය ' යයි කියනු ලැබේ. ශබ්දයන්ගේ මැ . . . ගන්ධයන්ගේ මැ . . . රසයන්ගේ මැ . . . ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ මැ . . . ධර්මයන්ගේ මැ විපරිණාම විරාග නිරොධ ලක්ෂණ වූ අනිත්‍යාකාරය දැන පෙර ද වූ මැ ධර්මයෝ ඇද්ද, දැනුදු රූපයෝ ඇද්ද, එහැම ධර්මයෝ අනිත්‍යයහ දුඃඛයහ විපරිණාම ධර්මයහ ' යි මෙසේ තෙල යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දක්නහුට සෞමනස්‍යය උපදනේ යැ. මෙබඳු වූ යම් සෞමනස්‍යයෙක් වේ ද මේ විදර්ශනාශ්‍රිත ' සෞමනස්‍ය ' යයි කියනු ලැබේ. මොහු සදෙන ' විදර්ශනාශ්‍රිත සෞමනස්‍යයෝ ' වෙති.

තත්ථ කතමානි ඡ ගෙහසිතානි දොමනස්සානි: චක්ඛුවිඤ්ඤෙය්‍යානං රූපානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිසපටිසංයුත්තානං අප්පටිලාභං වා අප්පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා අප්පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුස්සරතො උප්පජ්ජති දොමනස්සං. යං එවරූපං දොමනස්සං, ඉදං වුච්චති ගෙහසිතං දොමනස්සං. සොතවිඤ්ඤෙය්‍යානං සද්දානං-පෙ-ඝානවිඤ්ඤෙය්‍යානං ගන්ධානං-පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යානං රසානං-පෙ-කායවිඤ්ඤෙය්‍යානං ඵොට්ඨබ්බානං -පෙ- මනොවිඤ්ඤෙය්‍යානං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං මනොරමානං ලොකාමිසපටිසංයුත්තානං අප්පටිලාභං වා අප්පටිලාභතො සමනුපස්සතො පුබ්බෙ වා අප්පටිලද්ධපුබ්බං අතීතං නිරුද්ධං විපරිණතං සමනුපස්සතො උප්පජ්ජති දොමනස්සං යං එවරූපං දොමනස්සං, ඉදං වුච්චති ගෙහසිතං දොමනස්සං. ඉමානි ඡ ගෙහසිතානි දොමනස්සානි.

තත්ථ කතමානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි: රූපානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං, පුබ්බෙ චෙව රූපා එතරහි ච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපෙති: කුදස්සු[1] නාමාහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි. යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්තී'ති. ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො උප්පජ්ජති පිහපච්චයා දොමනස්සං. යං එවරූපං දොමනස්සං, ඉදං වුච්චති නෙක්ඛම්මසිතං දොමනස්සං. සද්දානං ත්වෙව-පෙ-ගන්ධානං ත්වෙව-පෙ-රසානං ත්වෙව-පෙ-ඵොට්ඨබ්බානං ත්වෙව-පෙ-ධම්මානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං පුබ්බෙ චෙව ධම්මා එතරහි ච සබ්බෙ තෙ ධම්මා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපෙති. කුදස්සු[1] නාමාහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්තී'ති. ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො උප්පජ්ජති පිහපච්චයා දොමනස්සං. යං එවරූපං දොමනස්සං, ඉදං වුච්චති නෙක්ඛම්මසිතං දොමනස්සං. ඉමානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි.

තත්ථ කතමා ඡ ගෙහසිතා උපෙක්ඛා: චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති උපෙක්ඛා බාලස්ස මූළ්හස්ස පුථුජ්ජනස්ස අනොධිජිනස්ස අවිපාකජිනස්ස අනාදීනවදස්සාවිනො අස්සුතවතො පුථුජ්ජනස්ස. යා එවරූපා උපෙක්ඛා, රූපං සා නාතිවත්තති. තස්මා සා උපෙක්ඛා ගෙහසිතාති වුච්චති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ-මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජති උපෙක්ඛා බාලස්ස මූළ්හස්ස පුථුජ්ජනස්ස අනොධිජිනස්ස අවිපාකජිනස්ස අනාදීනවදස්සාවිනො අස්සුතවතො පුථුජ්ජනස්ස යා එවරූපා උපෙක්ඛා, ධම්මං සා නාතිවත්තති තස්මා සා උපෙක්ඛා ගෙහසිතාති වුච්චති. ඉමා ඡ ගෙහසිතා උපෙක්ඛා.

---

1. කුදස්සු - මජසං.

එහි ගෘහශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙන කවරහ යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මනොරම වූ තෘෂ්ණාප්‍රතිසංයුක්ත වූ චක්ෂුර්විඥෙය රූපයන්ගේ අප්‍රතිලාභය අප්‍රතිලාභ වශයෙන් දක්නහුට හෝ පෙර අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ නොලදවිරූ රූපයක් සිහි කරන්නහුට හෝ දෞර්මනස්‍ය උපදනේ යැ. මෙබඳු වූ යම් දෞර්මනස්‍යයෙක් වේ ද මෙය ' ගෘහශ්‍රිත දෞර්මනස්‍ය ' යයි කියනු ලැබේ. ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයන්ගේ . . . ඝ්‍රාණවිඥෙය ගන්ධයන්ගේ ජිහ්වාවිඥෙය රසයන්ගේ . . . කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ තෘෂ්ණාසංශ්‍රිත වූ මනොවිඥෙය ධර්මයන්ගේ අප්‍රතිලාභය හෝ අප්‍රතිලාභ වශයෙන් දක්නහුට අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ පෙර නොලදවිරූ ධර්මයක් හෝ දක්නහුට දෙම්නස් උපදනේ යැ. මෙබඳු යම් දෙම්නසෙක් වේ ද මෙය ' ගෘහශ්‍රිත වූ දෙම්නසැ ' යි කියනු ලැබේ. මොහු සදෙන ගෘහශ්‍රිත වූ දෙම්නස්හු වෙති.

එහි විදර්ශනාශ්‍රිත දෞර්මනස්‍යයෝ සදෙන කවරහ යත්: රූපයන් ගේ මැ විපරිණාම විරාග නිරෝධලක්ෂණ වූ අනිත්‍යාකාරය දැන පෙර තුබූ රූපයෝ ඇද්ද, දැනුදු වූ රූපයෝ ඇද්ද, එහැම රූපයෝ ' අනිත්‍යයහ දුඃඛයහ විපරිණාමධර්මයහ ' යි මෙසේ තෙල යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දැක අනුත්තර විමොක්ෂයෙහි ස්පෘහා එළවයි. ආර්‍ය්‍යයෝ දැන් යම් ආයතනයකට පැමිණ විහරණ කෙරෙත් ද, මම කවර දිනෙක නම් ඒ ආයතනයට පැමිණ වාස කෙරෙම් ද කියා යි. මෙසේ අනුත්තර විමොක්ෂයෙහි ස්පෘහා එළවන්නහුට ස්පෘහා හේතුයෙන් දෙම්නස උපදනේ යැ. මෙබඳු යම් දෙම්නසෙක් වේ ද, මෙය විදර්ශනාශ්‍රිත වූ දෙම්නස යයි කියනු ලැබේ. ශබ්දයන්ගේ මැ . . . ගන්ධයන්ගේ මැ . . . රසයන්ගේ මැ . . . ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ මැ . . . ධර්මයන්ගේ මැ විපරිණාම විරාග නිරෝධලක්ෂණ වූ අනිත්‍යාකාරය දැන පෙරත් දැනුත් ධර්ම කෙනෙක් ඇද්ද එහැම ධර්මයෝ ' අනිත්‍යයහ දුඃඛයහ ප්‍රකෘති විජහනස්වභාව ඇතියහ ' යි මෙසේ තෙල ඇති සැටිය විදර්ශනාප්‍රඥයෙන් දැක අනුත්තර විමොක්ෂයෙහි කැමැත්ත එළවයි. ආර්‍ය්‍යයෝ දැන් යම් ආයතනයකට එළඹ විහාර කෙරෙත් ද මම කවර දිනෙක නම් ඒ ආයතනය උපයාගෙන වාස කෙරෙම්දෝ' කියා යි. මෙසේ අනුත්තර විමොක්ෂයෙහි ස්පෘහා උපයන්නහුට ස්පෘහාහේතුයෙන් දෙම්නස උපදනේ යැ. මෙබඳු යම් දෙම්නසෙක් වේ ද මේ ' විදර්ශනාශ්‍රිත වූ දෙම්නස ' යයි කියනු ලැබේ. මොහු සදෙන විදර්ශනාශ්‍රිත වූ දෙම්නස්හු වෙති.

එහි ගෘහශ්‍රිත (කාමගුණනිඃශ්‍රිත) උපේක්ෂාවෝ සදෙන කවරහ යත්: ඇසින් රූපයක් දැක බාල වූ මූඪ වූ බොහෝ කෙලෙස් දනවන ක්ලේශාවධි නො දිනූ ආයතිවිපාක නො දිනූ ආදීනව නො දක්නා අශ්‍රුතවත් පෘථග්ජනහට උපේක්ෂා උපදී. මෙබඳු යම් උපේක්ෂාවක් ඇද්ද, ඒ උපේක්ෂාව රූපය නො ඉක්ම පවතී. එහෙයින් ඒ උපේක්ෂාව ' ගෘහශ්‍රිත ' යයි කියනු ලැබේ. කනින් හඬක් අසා . . . නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට . . . දිවින් රසක් විඳ . . . කයින් පැහැසියක් පැහැස . . . සිතින් දහමක් දැන බාල වූ මූඪ වූ බොහෝ කෙලෙස් දනවන කෙලෙස්හිම් නො දිනූ ආයතිවිපාක නො දිනූ ආදීනව නො දක්නා ඇසූපිරූතැන් නැති පුහුදුන් පුහුල්හට උපේක්ෂා උපදී. මෙබඳු යම් උපේක්ෂාවක් ඇද්ද, ඒ උපේක්ෂාව දහම් නො ඉක්ම පවතී. එයින් ඒ උපේක්ෂා ' ගෘහශ්‍රිත ' යයි කියනු ලැබේ. මොහු සදෙන ගෘහශ්‍රිත උපේක්ෂාවෝ වෙති.

තත්ථ කතමා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා: රූපානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං, පුබ්බෙ චෙව රූපා එතරහි ච සබ්බෙ තෙ රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති උපෙක්ඛා යා එවරූපා උපෙක්ඛා රූපං සා අතිවත්තති. තස්මා සා උපෙක්ඛා නෙක්ඛම්මසිතාති වුච්චති. සද්දානං ත්වෙව-පෙ-ගන්ධානං ත්වෙව-පෙ-රසානං ත්වෙව-පෙ-ඵොට්ඨබ්බානං ත්වෙව -පෙ- ධම්මානං ත්වෙව අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං, පුබ්බෙ චෙව ධම්මා එතරහි ච සබ්බෙ තෙ ධම්මා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො උප්පජ්ජති උපෙක්ඛා. යා එවරූපා උපෙක්ඛා ධම්මං සා අතිවත්තති, තස්මා සා උපෙක්ඛා නෙක්ඛම්මසිතාති වුච්චති. ඉමා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා. ඡත්තිංස සත්තපදා වෙදිතබ්බාති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

තත්‍රිදං නිස්සාය ඉදං පජහථාති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ර භික්ඛවෙ, යානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි, තානි නිස්සාය තානි ආගම්ම, යානි ඡ ගෙහසිතානි සොමනස්සානි තානි පජහථ, තානි සමතික්කමථ. එවමෙතෙසං පහානං හොති, එවමෙතෙසං සමතික්කමො හොති. තත්‍ර භික්ඛවෙ යානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි තානි නිස්සාය තානි ආගම්ම යානි ඡ ගෙහසිතානි දොමනස්සානි, තානි පජහථ. තානි සමතික්කමථ. එවමෙතෙසං පහානං හොති. එවමෙතෙසං සමතික්කමො හොති. තත්‍ර භික්ඛවෙ යා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා, තා නිස්සාය තා ආගම්ම, යා ඡ ගෙහසිතා උපෙක්ඛා තා පජහථ, තා සමතික්කමථ එවමෙතාසං පහානං හොති, එවමෙතාසං සමතික්කමො හොති. තත්‍ර භික්ඛවෙ, යානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි, තානි නිස්සාය තානි ආගම්ම, යානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි, තානි පජහථ, තානි සමතික්කමථ. එවමෙතෙසං පහානං හොති, එවමෙතෙසං සමතික්කමො හොති. තත්‍ර භික්ඛවෙ, යා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා, තා නිස්සාය තා ආගම්ම යානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි තානි පජහථ, තානි සමතික්කමථ. එවමෙතෙසං පහානං හොති, එවමෙතෙසං සමතික්කමො හොති.

අත්ථි භික්ඛවෙ, උපෙක්ඛා නානත්තා නානත්තසිතා. අත්ථි උපෙක්ඛා එකත්තා එකත්තසිතා. කතමා ච භික්ඛවෙ, උපෙක්ඛා නානත්තා නානත්තසිතා: අත්ථි භික්ඛවෙ, උපෙක්ඛා රූපෙසු, අත්ථි සද්දෙසු, අත්ථි ගන්ධෙසු, අත්ථි රසෙසු, අත්ථි ඵොට්ඨබ්බෙසු. අයං භික්ඛවෙ උපෙක්ඛා නානත්තා නානත්තසිතා.

එහි විදර්ශනාශ්‍රිත උපේක්ෂාවෝ සදෙන කවරහ යත් : රූපයන්ගේ මැ විපරිණාම විරාග ලක්ෂණ වූ අනිත්‍යාකාරය දන ' පෙරත් රූප කෙනෙක් වූහු ද, දනුත් රූප කෙනෙක් ඇද්ද, එහැම රූපයෝ අනිත්‍යයහ දුඃඛයහ විපරිණාමස්වභාව ඇතියහ ' යි මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක්ප්‍රඥයෙන් දක්නාහට උපේක්ෂා උපදී. මෙබඳු යම් උපේක්ෂාවක් ඇද්ද, හෝ රූපය ඉක්ම පවතී. එයින් ඒ උපේක්ෂාව ' විදර්ශනාශ්‍රිත ' යයි කියනු ලැබේ. ශබ්දයන්ගේ මැ . . . ගන්ධයන්ගේ මැ . . . රසයන්ගේ මැ . . . ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ මැ . . . ධර්මයන්ගේ මැ විපරිණාම විරාග නිරොධ ලක්ෂණ වූ අනිත්‍යාකාරය දන පෙරත් ධර්ම කෙනෙක් වූහු ද, දනුත් ධර්ම කෙනෙක් ඇද්ද, එහැම ධර්මයෝ ' අනිත්‍යයහ දුඃඛයහ විපරිණාමස්වභාව ඇතියහ ' යි මෙසේ තෙල යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දක්නාහට උපෙක්ෂා උපදී. මෙබඳු යම් උපෙක්ෂාවක් ඇද්ද, හෝ ධර්මාලම්බනය ඉක්ම පවතී. එයින් ඒ උපෙක්ෂාව ' විදර්ශනාශ්‍රිත ' යයි කියනු ලැබේ. මොහු සදෙන විදර්ශනාශ්‍රිත උපේක්ෂාවෝ ' යි.' සතිස් සත්ත්වපදයෝ දතයුත්තාහ ' යි මෙසේ යමක් කියන ලද ද, තෙල මේ සඳහා කියනලදී.

එහි 'මෙය නිසා මෙය දුරු කරව ' යි යළි මෙසේ තෙල කියන ලදි. තෙල කුමක් සඳහා කියන ලද යැ යත් : මහණෙනි, එහි යම් විදර්ශනාශ්‍රිත සොම්නස්හු සදෙනෙක් ඇද්ද. උන් නිසා උන් ඇසුරුකොට යම් ගෘහශ්‍රිත සොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් හැරපියව, උන් ඉක්මව. මෙසේ තුලුන්ගේ ප්‍රහාණ වෙයි, මෙසේ තුලුන්ගේ සමතික්‍රමණ වේ. මහණෙනි, එහි යම් විදර්ශනාශ්‍රිත දොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් නිසා යම් ගෘහශ්‍රිත දොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් හැරපියව, උන් ඉක්මව, මෙසේ තුලුන්ගේ ප්‍රහාණ වෙයි, මෙසේ තුලුන්ගේ සමතික්‍රමණ වේ. මහණෙනි, එහි යම් විදර්ශනාශ්‍රිත උපේක්ෂාවෝ සදෙනෙක් ඇද්ද, උන් නිසා යම් ගෘහශ්‍රිත උපෙක්ෂාවෝ සදෙනෙක් ඇද්ද, උන් හැරපියව, උන් ඉක්මව, මෙසේ තුලුන්ගේ ප්‍රහාණ වෙයි. මෙසේ තුලුන්ගේ සමතික්‍රමණ වේ. මහණෙනි, එහි යම් විදර්ශනාශ්‍රිත සොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් නිසා යම් විදර්ශනාශ්‍රිත දොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් හැරපියව උන් ඉක්මව. මෙසේ තුලුන්ගේ ප්‍රහාණ වෙයි. මෙසේ තුලුන්ගේ සමතික්‍රමණ වේ. මහණෙනි, එහි යම් විදර්ශනාශ්‍රිත උපේක්ෂාවෝ සදෙනෙක් ඇද්ද, උන් නිසා උන් ලබා යම් විදර්ශනාශ්‍රිත සොම්නස්හු සදෙනෙක් ඇද්ද, උන් හැරපියව, උන් ඉක්මව. මෙසේ තුලුන්ගේ ප්‍රහාණ වෙයි. මෙසේ තුලුන්ගේ සමතික්‍රමණ වේ.

මහණෙනි, නානාලම්බන නිඃශ්‍රිත වූ නානාත්ව (නානාප්‍රකාර) උපේක්ෂාවක් ඇත. එකාලම්බන නිඃශ්‍රිත වූ එකත්ව උපේක්ෂාවක් ඇත. මහණෙනි, නානාලම්බන නිඃශ්‍රිත නානාත්වඋපේක්ෂා කවර යත් : මහණෙනි, රූපාලම්බනයන්හි උපේක්ෂා ඇත. ශබ්ද ලම්බනයන්හි උපේක්ෂා ඇත. ගන්ධාලම්බනයන්හි උපේක්ෂා ඇත. රසාලම්බනයන්හි උපේක්ෂා ඇත. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයන්හි උපේක්ෂා ඇති. මහණෙනි, මේ නානාලම්බන නිඃශ්‍රිත නානාත්වඋපේක්ෂා යි,

කතමා ච භික්ඛවෙ, උපෙක්ඛා එකත්තා එකත්තසිතා: අත්ථි භික්ඛවෙ, උපෙක්ඛා ආකාසානඤ්චායතනනිස්සිතා, අත්ථි විඤ්ඤාණඤ්චායතනනිස්සිතා, අත්ථි ආකිඤ්චඤ්ඤායතනනිස්සිතා, අත්ථි නෙවසඤ්ඤානාසඤ්ඤායතනනිස්සිතා. අයං භික්ඛවෙ, උපෙක්ඛා එකත්තා එකත්තසිතා. තත්‍ර භික්ඛවෙ, යා'යං උපෙක්ඛා එකත්තා එකත්තසිතා, තං නිස්සාය තං ආගම්ම, යා'යං උපෙක්ඛා නානත්තා නානත්තසිතා, තං පජහථ, තං සමතික්කමථ. එවමෙතිස්සා පහානං හොති, එවමෙතිස්සා සමතික්කමො හොති. අතම්මයතං භික්ඛවෙ නිස්සාය අතම්මයතං ආගම්ම යා'යං උපෙක්ඛා එකත්තා එකත්තසිතා තං පජහථ. තං සමතික්කමථ. එවමෙතිස්සා පහානං හොති, එවමෙතිස්සා සමතික්කමො හොති. තත්‍රිදං නිස්සාය ඉදං පජහථා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'තයො සතිපට්ඨානා යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහතී'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, සත්ථා සාවකානං ධම්මං දෙසෙති අනුකම්පකො හිතෙසී අනුකම්පං උපාදාය: 'ඉදං වො හිතාය ඉදං වො සුඛායා'ති. තස්ස සාවකා න සුස්සූසන්ති. න සොතං ඔදහන්ති. න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති. වොක්කම්ම ච සත්ථුසාසනං වත්තන්ති. තත්‍ර භික්ඛවෙ, තථාගතො න චෙව අත්තමනො හොති. න ච අත්තමනතං පටිසංවෙදෙති· අනවස්සුතො ච විහරති සතො සම්පජානො. ඉදං භික්ඛවෙ, පඨමං සතිපට්ඨානං, යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති.

පුන ච පරං භික්ඛවෙ, සත්ථා සාවකානං ධම්මං දෙසෙති අනුකම්පකො හිතෙසී අනුකම්පං උපාදාය: 'ඉදං වො හිතාය, ඉදං වො සුඛායා'ති. තස්ස එකච්චෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති. වොක්කම්ම ච සත්ථුසාසනං වත්තන්ති. එකච්චෙ සාවකා සුස්සූසන්ති. සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති. න ච වොක්කම්ම සත්ථුසාසනං වත්තන්ති. තත්‍ර භික්ඛවෙ, තථාගතො න චෙව අත්තමනො හොති, න ච අත්තමනතං පටිසංවෙදෙති. න ච අනත්තමනො හොති. න ච අනත්තමනතං පටිසංවෙදෙති. අත්තමනතඤ්ච අනත්තමනතඤ්ච[1] තදුභයං අභිනිවජ්ජෙත්වා සො උපෙක්ඛකො විහරති සතො සම්පජානො. ඉදං වුච්චති භික්ඛවෙ, දුතියං සතිපට්ඨානං යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති.

---

1. අත්තමනතා ච අනත්තමනතා ච - මජ්සං.

මහණෙනි, ඒකාලම්බනනිඃශ්‍රිත ඒකත්වඋපේක්ෂා කවර යත්: මහණෙනි, ආකාසානඤ්චායතන නිඃශ්‍රිත වූ උපේක්ෂා ඇත. විඤ්ඤාණඤ්චායතන නිඃශ්‍රිත වූ උපේක්ෂා ඇත. ආකිඤ්චඤ්ඤායතන නිඃශ්‍රිත වූ උපේක්ෂා ඇත. නේවසඤ්ඤා නාසඤ්ඤායතන නිඃශ්‍රිත වූ උපේක්ෂා ඇති. මහණෙනි, මේ ඒකාලම්බනනිඃශ්‍රිත වූ ඒකත්ව උපේක්ෂා යි. මහණෙනි, එහි ඒකාලම්බනනිඃශ්‍රිත ඒකත්ව වූ යම් උපේක්ෂාවක් ඇද්ද, එය නිසා එයට පැමිණ නානාලම්බනනිඃශ්‍රිත නානාත්ව වූ යම් උපේක්ෂාවක් ඇද්ද, එය දුරලව, එය ඉක්මව. මෙසේ තෙල උපේක්ෂාවගේ ප්‍රහාණ වෙයි. මෙසේ තෙල උපේක්ෂාවගේ සමතික්‍රමණ වේ. මහණෙනි, (තම්මයතා නම් වූ තෘෂ්ණාව මැඩලන ව්‍යුත්ථානගාමිනීවිදර්ශනා සංඛ්‍යාත) අතම්මයතාව නිසා අතම්මයතාවට පැමිණ ඒකාලම්බනනිඃශ්‍රිත ඒකත්ව වූ යම් උපේක්ෂාවක් ඇද්ද, එය දුරු කරව, එය ඉක්මව. මෙසේ තෙල උපේක්ෂාවගේ ප්‍රහාණ වෙයි. මෙසේ තෙල උපේක්ෂාවගේ සමතික්‍රමණ වේ. එහි ' මෙය නිසා මෙය දුරු කරව ' යි මෙසේ යමක් කියනලද ද, තෙල මෙය සඳහා කියන ලදි.

' යම් සීවටනක් ආර්‍ය්‍ය වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ සෙවුනාහු වෙත් ද, යම් සීවටනක් ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සෙවුනාහු අනුශාසක වැ ගණානුශාසන යට නිසි වෙත් ද, එබඳු සීවටන්හු තුන් දෙනෙකි ' යි මෙසෙයින් තෙල බසෙක් කියන ලද ද, තෙල බස කුමක් පිණිස කියන ලද යැ යත් : මහණෙනි, මෙලොවැ ශාස්තෘන් වහන්සේ අනුකම්පා ඇති වැ හිතෛෂී වැ අනුකම්පා නිසා සව්වනට දහම් දෙසති: ' මේ තොපට හිත පිණිස යැ, මේ තොපට සුව පිණිස යැ, කියා යි. ඔබගේ බස සව්වෝ අදහා අසනු නො කැමැති වෙති. කන් නතු නො කෙරෙති. දැනගන්නට සිත් නො එළවති. ශාස්තෘන්ගේ අනුසසුන් ඉක්මවා වැටෙත්. මහණෙනි, එහිලා තථාගතයන් වහන්සේ සතුටු වූවාහු නො වෙති. සතුටු සිතැති බව නො දන්වති. ස්මෘතිමත් වැ සම්ප්‍රඥාන ඇති වැ (ප්‍රතිඝ අවස්‍රවයෙන්) අනවස්‍රැත වැ වාස කෙරෙත්. මහණෙනි, ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් සීවටනක් සෙවුනාහු වෙත් ද, ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් සීවටනක් සෙවුනාහු අනුශාසක වැ ගණානුශාසනයට නිසි වැ වාස කෙරෙත් ද, මේ ඒ පළමු වැනි සීවටන යි.

තවද මහණෙනි, ශාස්තෘන් වහන්සේ අනුකම්පා ඇති වැ හිතෛෂී වැ අනුකම්පා සඳහා ශ්‍රාවකයනට දහම් දෙසති : මේ තොපට හිත පිණිස යැ. මේ තොපට සුව පිණිස යැ ' යි. ඔබගේ අනුශාසනාව කිසි ශ්‍රාවක කෙනෙක් නො අසනු කැමැති වෙති, කන් නතු නො කෙරෙති. දැනගන්නට සිත් නො එළවති. ශාස්තෘන්ගේ අනුශාසනාව ඉක්මවා වැටෙත්. කිසි ශ්‍රාවක කෙනෙක් අසනු කැමැති වෙති. කන් නතු කෙරෙති. දැනගන්නට සිත් එළවති. ශාස්තෘශාසනය ඉක්මවා නො වැටෙත්. මහණෙනි, එහි ලා තථාගතයන් වහන්සේ සතුටු වූවාහු නො වෙති. සතුටු සිතැති බව නො ද දන්වති. නො සතුටු වූවාහු නො ද වෙති. නො සතුටු සිතැති බව නො ද දන්වති. සතුටු සිතැති බව ද නො සතුටු සිතැති බව ද යන එදෙක වර්ජනය කොට උන් වහන්සේ උපේක්ෂක වැ ස්මෘතිමත් වැ සම්‍යක්ප්‍රඥාන ඇති වැ වාස කෙරෙත්. මහණෙනි ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධ යන් වහන්සේ යම් සීවටනක් සෙවුනාහු වෙත් ද ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් සීවටනක් සෙවුනාහු අනුශාසක වැ ගණානුශාසනා කරන්නට නිසි වැ වාස කෙරෙත් ද, මේ ඒ දෙවන සීවටන යයි කියනු ලැබේ.

පුන ච පරං භික්ඛවෙ, සත්ථා සාවකානං ධම්මං දෙසෙති අනුකම්පකො හිතෙසී අනුකම්පං උපාදාය: 'ඉදං වො හිතාය, ඉදං වො සුඛායා'ති තස්ස සාවකා සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, න ච වොක්කම්ම සත්ථුසාසනං වත්තන්ති. තත්‍ර භික්ඛවෙ, තථාගතො අත්තමනො චෙව හොති, අත්තමනතඤ්ච පටිසංවෙදෙති. අනවස්සුතො ච විහරති සතො සම්පජානො. ඉදං වුච්චති භික්ඛවෙ, තතියං සතිපට්ඨානං යදරියො සෙවති යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති.

තයො සතිපට්ඨානා යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහතීති ඉති යං තං වුත්තං ඉදමෙතං, පටිච්ච වුත්තං.

සො වුච්චති යොග්ගාචරියානං අනුත්තරො පුරිසදම්මසාරථීති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: හත්ථිදමකෙන භික්ඛවෙ, හත්ථිදම්මො සාරිතො එකංයෙව දිසං ධාවති, පුරත්ථිමං වා පච්ඡිමං වා උත්තරං වා දක්ඛිණං වා. අස්සදමකෙන භික්ඛවෙ, අස්සදම්මො සාරිතො එකංයෙව දිසං ධාවති, පුරත්ථිමං වා පච්ඡිමං වා උත්තරං වා දක්ඛිණං වා. ගොදමකෙන භික්ඛවෙ, ගොදම්මො සාරිතො එකංයෙව දිසං ධාවති පුරත්ථිමං වා පච්ඡිමං වා උත්තරං වා දක්ඛිණං වා. තථාගතෙන හි භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන පුරිසදම්මො සාරිතො අට්ඨදිසා විධාවති රූපී රූපානි පස්සති. අයං පඨමා දිසා[1] අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. අයං දුතියා දිසා. සුභන්තෙව අධිමුත්තො හොති. අයං තතියා දිසා. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථී දිසා. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති අයං පඤ්චමී දිසා. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨී දිසා. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමී දිසා. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමී දිසා. තථාගතෙන භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන පුරිසදම්මො සාරිතො. ඉමා අට්ඨ දිසා විධාවති. සො වුච්චති යොග්ගාචරියානං අනුත්තරො පුරිසදම්මසාරථීති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## සළායතනවිභඞ්ගසුත්තං සත්තමං.

---

1. අයං එකාදිසා - මජසං.

තවද මහණෙනි, ශාස්තෘන් වහන්සේ අනුකම්පා ඇති වැ හිතෙෂී වැ අනුකම්පා පිණිස සව්වනට දහම් දෙසති : ' මේ තොපට හිත පිණිස යැ. මේ තොපට සුව පිණිස යැ ' යි. ඔබගේ බස සව්වෝ අසනු කැමැති වෙති. කන් නතු කෙරෙති. දැනගන්නට සිත එළවති. ශාස්තෘශාසනය ඉක්මවා නො ද වැටෙත්. මහණෙනි, එහිලා තථාගතයන් වහන්සේ සතුටු සිත් ඇත්තාහු වෙති. සතුටු සිත් ඇති බව ද දන්වති. අනවස්‍රැත වැ ස්මෘතිමත් වැ සම්ප්‍රඥාන ඇති වැ වාස ද කෙරෙත්. මහණෙනි, ආර්‍ය්‍ය වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ යම් සිවටනක් සේවනය කෙරෙත් ද, ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් සිවටනක් සේවනය කරන්නාහු අනුශාසක වැ ගණානුශාසනා කරන්නට නිසි වැ වාස කෙරෙත් ද, මේ ඒ තෙවන සිවටන යයි කියනු ලැබේ.

' ආර්‍ය්‍ය වූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ යම් සිවටනක් සේවනය කෙරෙත් ද, ආර්‍ය්‍ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් සිවටනක් සේවනය කරන්නාහු අනුශාසක වැ ගණානුශාසනා කරන්නට නිසි වැ වාස කෙරෙත් ද, ඒ සිවටන්හු තුන් දෙනෙකි ' යි මෙසේ යම් බසෙක් කියනලද ද, මෙය තෙල සඳහා කියන ලදි.

හේ යොග්ගාචාරීන් අතුරින් ' අනුත්තර වූ පුරුෂදම්‍යසාරථී යයි කියනුලැබෙති ' යි. මෙසෙයින් යම් බසෙක් කියනලද ද, තෙල බස කුමක් පිණිස කියන ලද යැ යත් : මහණෙනි, හස්තිදමකයා විසින් නහඹු ඇත් මෙහෙයන ලදුයේ පෙරදිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ එක් මැ දිගකට දුවයි. මහණෙනි, අශ්වදමකයා විසින් නහඹු අසු දමිත වූයේ පෙරදිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ එක් මැ දිගකට දුවයි. මහණෙනි, ගොදමකයා විසින් නහඹු ගොන් මෙහෙයනලදුයේ පෙරදිග හෝ පැළදිග හෝ උතුරුදිග හෝ දකුණුදිග හෝ එක් මැ දිගකට දුවයි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ විසින් පුරුෂදම්‍යයා සාරිත වූයේ අෂ්ටදිශාවට දුවයි. රූපී වැ රූපයන් දක්නේ යැ. මේ පළමු වන දිග යි. අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇති වැ බැහැර රූපයන් දක්නේ යැ. මේ දෙවන දිග යි. ශුභ මැ යයි අධිමුක්ත වෙයි. මේ තෙවන දිග යි. හැමසේ රූපසංඥ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ' ආකාශය අනන්ත යැ ' යි ආකාසානඤ්චායතනය උපයා වාස කෙරෙයි. මේ සතර වන දිග යි. හැම සෙ ආකාසානඤ්චායතනය ඉක්ම ' විඥනය අනන්ත යැ ' යි විඤ්ඤාණඤ්චායතනය උපයා වාස කෙරෙයි. මේ පස් වන දිග යි. හැම සේ විඤ්ඤාණඤ්චායතනය ඉක්ම ' කිසිදු නැති ' යි ආකිඤ්චඤ්ඤායතනය උපයා වාස කෙරෙයි. මේ සවන දිග ' යි. හැම සේ ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපයා වාස කෙරෙයි. මේ සත් වන දිගයි. හැම සේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිතනිරොධය උපයා වාස කෙරෙයි මේ අට වැනි දිග යි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ විසින් පුරුෂදම්‍යයා මෙහෙයන ලදුයේ මේ අටදිගුත් කරා දිවෙයි. ' ඔහු යොග්ගාචාරීන් අතුරින් අනුත්තරපුරුෂදම්‍යසාරථී යයි කියනු ලැබෙති ' යි මෙසෙයින් යම් බසෙක් කියන ලද ද, මෙය තෙල පිණිස කියන ලදි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**සත් වැනි සළායතනවිභඞ්ග සූත්‍ර යි.**

# 3. 4. 8

## උද්දෙසවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි : භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

උද්දෙසවිභඞ්ගං වො භික්ඛවෙ, දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච :

තථා තථා භික්ඛවෙ, භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්ස[1] උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය. බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි : 'ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, තථා තථා භික්ඛවෙ භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්ස[1] උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය, බහිද්ධා භික්ඛවෙ විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා'ති.

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි : 'අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා'ති. අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං මහාකච්චානං එතදවොචුං :

---

1. යථා යථාස්ස – ස්‍යා, PTS.
   යථා යථා – මජසං, සීමු.

# 3. 4. 8

# උද්දෙසවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු සිටුහුගේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් අඩගාවදළ සේක. 'පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවත්හු මෙල උද්දෙසවිභඞ්ගය වදළ සේක.

මහණෙනි, තොපට උද්දෙස හා විභඞ්ග හා දෙසමි. එය අසව, මොනවට මෙනෙහි කරව. කියමි'යි වදළහ.

එසේ යැ වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. බුදුහු මෙල වදළහ :

යම් යම් පරිදි තුලනා කරන ඒ මහණහට බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසුරුණේ ගොචර අධ්‍යාත්මයෙහි නො පිහිටියේ උපාදන වශයෙන් නො ගෙන තෘෂ්ණා වශයෙන් පරිතස්සනා නො කරන්නේ ද එපරිද්දෙන් මහණ තුලනා කරන්නේ යැ. මහණෙනි, බාහිර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත කල්හි නො විසුරුණු කල්හි ගොචරාධ්‍යාත්මයෙහි නො පිහිටි කල්හි උපාදන වශයෙන් නො ගෙන තෘෂ්ණාපරිතස්සනා නො කරන්නාහට මත්තෙහි ජාතිජරාමරණ හා සෙසු දුක්ඛසමුදයාගේ සම්භවයෙක් නො වේ යයි භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. මෙය වදරා සුගතයන් වහන්සේ හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නික්මගිය නොබෝ කල්හි ඒ වහන්දැට මෙල සිත විය: ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් මේ උද්දෙසය උදෙසා විස්තර විසින් අර්ථවිභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට පිවිසිසේක. යම් යම් පරිද්දෙකින් විමසනුවහට බාහිර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසුරුණේ ගොචරාධ්‍යාත්මයෙහි නිකාන්ති වශයෙන් නො පිහිටියේ උපාදන නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නේ ද මහණ ඒ ඒ පරිද්දෙන් තුලනය කරන්නේ යැ. මහණෙනි, බාහ්‍යාලම්බනයෙහි විඥානය අවික්ෂිප්ත කල්හි නො විසුරුණු කල්හි ගොචරා ධ්‍යාත්මයෙහි නො පිහිටි කල්හි උපාදනය නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නහුට මතුයෙහි ජාතිජරාමරණයාගේ ද අවශෙෂ දුඃඛයාගේ ද සම්භවයෙක් නො වේ යයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තරාර්ථය විභාග නො කළ මේ උද්දෙසයා ගේ විස්තරාර්ථය කවරෙක් විභාග කරන්නේ දෝහෝ'යි.

ඉක්බිති ඒ වහන්දැට මෙල සිත විය: මේ ආයුෂ්මත් මහකසයින් තෙරණුවෝ බුදුන් විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහකසයින් තෙරණුවෝ භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථ විභාග නොකළ මේ උද්දේසයාගේ විස්තර විසින් අර්ථය විභාග කරන්නට පොහොනාහු ද වෙති. ඇපි ආයුෂ්මත් මහකසයින් තෙරණුවන් කරා එළඹෙන්නමෝ නම් එළැඹ ආයුෂ්මත් මහකසයින් තෙරුන් අතින් මෙල අර්ථය පුළුවුස්නමෝ නම් මැනැවැ'යි. ඉක්බිති ඒ වහන්දැ ආයුෂ්මත් මහකසයින් තෙරුන් කරා එළැඹියහ. එළැඹ ආයුෂ්මත් මහකසයින් තෙරුන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ වහන්දැ ආයුෂ්මත් මහකසයින් තෙරණු වනට මෙල සැලකළහු :

ඉදං ඛො නො ආවුසො කච්චාන, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. තථා තථා භික්ඛවෙ, භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්සු[1] උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය, බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. තෙසං නො ආවුසො කච්චාන, අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි :

ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: තථා තථා භික්ඛවෙ, භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්සු[1] උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය, බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

තෙසං නො ආවුසො කච්චාන, අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති. විභජතායස්මා මහාකච්චානොති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතිසිත්වා අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සො හා'වුසො, භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො, බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො, සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තං යෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාථා'ති.

---

1. යථායථාස්ස - ස්‍යා, PTS.
2. යථා යථා - මජසං, සීමු.

ඇවැත් කසයින් තෙරුණුවෙනි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් මේ උද්දෙසය උදෙසා විස්තර විසින් අර්ථ විභාග නො කොට විහාරයට පිවිසියහ. මහණෙනි, යම් යම් පරිද්දෙකින් තුලනය කරනුවහට බාහිර ආලම්බනයෙහි අවික්ෂිප්ත වැ නො විසිරු විඥනය ගොචරාධ්‍යාත්මයෙහි නො පිහිටියේ උපාදනය නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නේ ද මහණ ඒ ඒ පරිද්දෙන් තුලනය කරන්නේ යැ. මහණෙනි, වාහ්‍යා ලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත කල්හි අවිසෘෂ්ට කල්හි ගොචරාධ්‍යාත්මයෙහි නො පිහිටි කල්හි උපාදනය නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නහුට මත්තෙහි ජාතිජරාමරණයාගේ හා ශෙෂ දුඃඛ සමුදයාගේ සම්භවය නො වේ යයි. ආයුෂ්මත් කසයින් තෙරණුවෙනි, භාග්‍යවතුන් වහන්සේ නික්මගිය නොබෝ කාලයෙහි ඒ අපට තෙල සිත විය :

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දෙසය සැකෙවින් උදෙසා විස්තර විසින් අර්ථ විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක. මහණෙනි, යම් යම් පරිද්දෙකින් තුලනය කරන ඔහුට වාහ්‍යාලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත අවිසෘෂ්ට වූයේ ගෝචරාධ්‍යාත්මයෙහි නො පිහිටියේ උපාදනය නො කොට තෘෂ්ණාපරිතස්සනා යෙන් නො සැලේ ද, ඒ ඒ පරිද්දෙන් මහණ තුලනය කරන්නේ යැ. මහණෙනි, වාහ්‍යා-ලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත කල්හි නො විසිරු සිටි කල්හි ගොචරාධ්‍යාත්මයෙහි නිකාන්ති වශයෙන් නො පිහිටි කල්හි උපාදනය නො කොට නිකාන්ති වශයෙන් තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නහුට මත්තෙහි ජාතිජරාමරණයාගේ ද දුඃඛසමුදයාගේ ද සම්භවය නො වේ යයි. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අර්ථය විභාග නො කළ මේ උද්දේසයාගේ අර්ථය කවරෙක් විස්තර විසින් විභාග කරන්නේ දෝ හො'යි.

ඇවැත්නි, කාත්‍යායනයෙනි, ඒ අපට තෙල සිත විය : 'මේ ආයුෂ්මත් මහා කාත්‍යායනයෝ ශාස්තෘන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ උද්දේසයාගේ අර්ථය විස්තරයෙන් විභාග කරන්නට පොහොනාහු ද වෙති. ඇපි ආයුෂ්මත් කාත්‍යායන තෙරණුවන් කරා එළැඹෙන්නමෝ නම් එළැඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් අතින් තෙල කරුණ පුළුවුස්නමෝ නම් යෙහෙකැ'යි කියා යි, ආයුෂ්මත් මහා කාත්‍යායනයෝ (එය) විභාග කෙරෙත්ව'යි.

ඇවැත්නි, යම් පරිදි හරයෙන් ප්‍රයෝජන ඇති හරය සොයන පුරුෂයෙක් හර පයෙෂීණ කරනුයේ ස්ථිර වැ සිටි සාරවත් වූ මහත් වෘක්ෂයක්හුගේ මුල ඉක්මවා මැ කඳ ඉක්මවා මැ පලාසයෙහි හර සෙවියයුතු කොට සිතා නම් මෙකරුණ එබඳු යැ. ආයුෂ්-මත්නට ශාස්තෘන් වහන්සේ හමු වූ කල්හි ඒ භාග්‍යවතුන් ඉක්මවාපියා තෙල කරුණ අප අතින් පිළිවිස්සයුතු කොට සිතව, ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුතු ඥෙයධර්මය නුවණින් දනිති, දක්කයුතු දය නුවණැසින් දකිති, ඇසක් මෙන් වූහ, ඥනමය වූහ, ධර්මය වූහ, ශ්‍රෙෂ්ඨ වූහ, ධර්මය පවසනුවහ, නත් අයුරින් පවසනුවහ, අර්ථය එළවා දක්වනුවහ, අමෘතය දෙනුවහ. ධර්මස්වාමීහ, තථාගතයහ. යම් කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ මැ තෙල අර්ථය පුළුවුස්නවූ නම්, මෙයට එ මැ කල් වෙයි. යම් පරිදි අපට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරනසේක් නම් එසෙයින් එය ධරන්නහු යයි.

අද්ධාවුසො කච්චාන, භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි, යං භගවන්තංයෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාම, යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාම. අපි චායස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. විභජතායස්මා මහාකච්චානො අගරුං කරිත්වාති.

තෙන හා'වුසො, සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාකච්චානො එතදවොච :

යං ඛො නො, ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො : තථා තථා භික්ඛවෙ, භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය. බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. ඉමස්ස ඛො අහං ආවුසො, භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි.

කථඤ්චාවුසො, බහිද්ධා විඤ්ඤාණං වික්ඛිත්තං විසටන්ති වුච්චති : ඉධාවුසො භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා රූපනිමිත්තානුසාරි විඤ්ඤාණං හොති. රූපනිමිත්තස්සාදගථිතං[1] රූපනිමිත්තස්සාදවිනිබද්ධං[2] රූපනිමිත්තස්සාදසඤ්ඤොජනසංයුත්තං බහිද්ධා විඤ්ඤාණං වික්ඛිත්තං විසටන්ති වුච්චති. සොතෙන සද්දං සුත්වා-පෙ-ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය ධම්මනිමිත්තානුසාරි විඤ්ඤාණං හොති. ධම්මනිමිත්තස්සාදගථිතං ධම්මනිමිත්තස්සාදවිනිබද්ධං ධම්මනිමිත්තස්සාදසඤ්ඤොජනසංයුත්තං බහිද්ධා විඤ්ඤාණං වික්ඛිත්තං විසටන්ති වුච්චති. එවං ඛො ආවුසො බහිද්ධා විඤ්ඤාණං වික්ඛිත්තං විසටන්ති වුච්චති.

කථඤ්චාවුසො, බහිද්ධා විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටන්ති වුච්චති : ඉධාවුසො භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා න රූපනිමිත්තානුසාරි විඤ්ඤාණං හොති. න රූපනිමිත්තස්සාදගථිතං න රූපනිමිත්තස්සාදවිනිබද්ධං, න රූපනිමිත්තස්සාදසඤ්ඤොජනසංයුත්තං, බහිද්ධා විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටන්ති වුච්චති. සොතෙන සද්දං සුත්වා-පෙ-ඝානෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න ධම්මනිමිත්තානුසාරි විඤ්ඤාණං හොති. න ධම්මනිමිත්තස්සාදගථිතං, න ධම්මනිමිත්තස්සාදවිනිබද්ධං, න ධම්මනිමිත්තස්සාදසඤ්ඤොජනසංයුත්තං බහිද්ධා විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටන්ති වුච්චති. එවං ඛො ආවුසො, බහිද්ධා විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටන්ති වුච්චති.

---

1. රූපනිමිත්තස්සාදගධිතං - මජ්ඣං.
2. විනිබන්ධං - මජ්ඣං, ස්‍යා

ඇවත්නි, කාත්‍යායනයෙනි, ඒකාන්තයෙන් භාග්‍යවතුන්වහන්සේ දතයුතුදැයනුවණින් දන්නාහ. දක්කයුතු නුවණැසින් දක්නාහ. ඇසක් මෙන් වූහ. ඥානමය වූහ. ධර්මය වූහ. ශ්‍රේෂ්ඨ වූහ. වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, අර්ථය එළවා දක්වනුවහ. අමා දෙනුවහ. ධර්මස්වාමීහ. තථාගතයහ. යම් කරුණෙකින් තෙල අර්ථය භාග්‍යවතුන් වහන්සේ මැ පුළුවුස්නමෝ නම් යම් පරිද්දෙකින් භාග්‍යවතුන් වහන්සේ අපට ප්‍රකාශ කරනසේක් ද, එසෙයින් එය ධරන්නමෝ නම් මෙයට එ මැ කල් වෙයි. එතෙකුදුවත් ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ භාග්‍යවතුන් විසින් සැකෙවින් උදෙසනලද විස්තරයෙන් අර්ථය විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය විස්තරයෙන් විභාග කරන්නට පොහොනාහු ද වෙති. ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ නො බර කොට විභාග කෙරෙත්වා'යි.

එසේ වී නම් ඇවත්නි, අසව. මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි'යි.

'එසේ යැ ඇවත්නි'යි ඒ වහන්දැ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ තෙල වදළහ;

ඇවත්නි, භාග්‍යවතුන් වහන්සේ යම් යම් පරිදි තුලනා කරන ඒ මහණහුගේ බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසුරුණේ ගොචරාධ්‍යාත්මයෙහි නිකාන්ති වශයෙන් නො පිහිටියේ උපාදාන වශයෙන් නො ගෙන තෘෂ්ණා වශයෙන් පරිතස්සනාවට නො පැමිණේ ද, මහණ ඒ ඒ පරිදි තුලනා කරන්නේ යැ. මහණෙනි, බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වත් මැ නො විසිරෙත් මැ ගොචරාධ්‍යාත්මයෙහි නො පිහිටත් මැ උපාදාන වශයෙන් නො ගෙන පරිතස්සනා නො කරන ඒ මහණහට මතුයෙහි ජාතිජරා මරණ හා දුඃඛසමුදය සම්භවය නො වේ'යි. යම් උද්දෙසයක් සැකෙවින් උදෙසා විස්තර-යෙන් අර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට පිවිසිසේක් ද ඇවත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අර්ථ විභාග නො කරනලද මේ උද්දේසයාගේ මෙසේ විස්තර වශයෙන් අර්ථ අවබොධ කොට දනිමි.

ඇවත්නි, කෙසේ නම් 'බැහැර අරමුණෙහි විඥානය වික්ෂිප්ත වූයේ විසිරගියේ යැ'යි කියනු ලැබේ ද : ඇවත්නි, මෙසස්නෙහි මහණක්හට ඇසින් රූ දක රූ නිමිති අනුව ගිය විඥානය වේ ද රූපනිමිත්තාස්වාදයෙන් ග්‍රථිත වූ රූපනිමිත්තාස්වාදයෙන් වෙලීගිය රූපනිමිත්තාස්වාද සංයෝජනයෙන් සංයුක්ත වූ බැහැර අරමුණෙහි වැටුණු විඥානය වික්ෂිප්ත යැ'යි විසුරුණේ යැ'යි කියනු ලැබේ. කනින් ශබ්ද අසා. . . ඝ්‍රාණයෙන් ගන්ධ ආඝ්‍රාණය කොට . . . දිවින් රස ආස්වාද කොට . . . කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට. . . මනසින් ධර්මය දන ධර්මනිමිත්ත අනුව ගිය විඥානය වේ ද ධර්මනිමිත්තාස්වාදයෙන් ග්‍රථිත වූ ධර්මනිමිත්තාස්වාදයෙන් වෙළුණු ධර්මනිමිත්තාස්වාද සංයෝජනයෙන් සංයුක්ත වූ බැහැර අරමුණෙහි වැටුණු විඥානය වික්ෂිප්ත යැ'යි විසිරිණැ'යි කියනු ලැබේ. ඇවත්නි, මෙසේ බැහැර අරමුණෙහි වූ විඥානය වික්ෂිප්ත යැ විසිරිණැ'යි කියනු ලැබේ.

ඇවත්නි, කෙසේ නම් 'බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසිරිණැ'යි කියනු ලැබේ යැ යත් : ඇවත්නි, මෙසස්නෙහි මහණක්හට ඇසින් රූ දක විඥානය රූපනිමිත්ත අනුව යන්නේ නො වේ ද රූපනිමිත්තාස්වාදයෙන් ග්‍රථිත වූයේ නො වේ ද රූපනිමිත්තාස්වාදයෙන් වෙළුණේ නො වේ ද. රූපනිමිත්තාස්වාද සංයොජනයෙන් සංයුක්ත වූයේ නො වේ ද බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසිරිණැ'යි කියනු ලැබේ. කනින් ශබ්ද අසා . . . ඝ්‍රාණයෙන් ගන්ධ ආඝ්‍රාණය කොට . . . දිවින් රස ආස්වාද කොට . . . කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කොට . . . සිතින් දහම් දන විඥානය ධර්මනිමිත්ත අනුව යන්නේ නො වේ ද ධර්මනිමිත්තාස්වාදයෙන් ග්‍රථිත වූයේ නො වේ ද ධර්මනිමිත්තාස්වාදයෙන් වෙළුණේ නො වේ ද ධර්මනිමිත්තාස්වාද සංයොජනයෙන් සංයුක්ත වූයේ නො වේ ද බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසිරිණැ'යි කියනු ලැබේ. ඇවත්නි, මෙසේ බැහැර අරමුණෙහි විඥානය අවික්ෂිප්ත වූයේ නො විසිරිණැ යි කියනු ලැබේ.

කථඤ්චාවුසො අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති[1] වුච්චති : ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස විවෙකජපීතිසුඛානුසාරි විඤ්ඤාණං හොති. විවෙකජපීතිසුඛස්සාදගථිතං විවෙකජපීතිසුඛස්සාදවිනිබද්ධං විවෙකජපීතිසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති වුච්චති.

පුන ච පරං ආවුසො, භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස සමාධිජපීතිසුඛානුසාරි විඤ්ඤාණං හොති සමාධිජපීතිසුඛස්සාදගථිතං සමාධිජපීතිසුඛස්සාද-විනිබද්ධං සමාධිජපීතිසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති වුච්චති.

පුන ච පරං ආවුසො, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති. තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස උපෙක්ඛාසුඛානුසාරි[3] විඤ්ඤාණං හොති, උපෙක්ඛාසුඛස්සාදගථිතං උපෙක්ඛාසුඛස්සාදවිනිබද්ධං උපෙක්ඛාසුඛස්සාද-සඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති වුච්චති.

පුන ච පරං ආවුසො, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස අදුක්ඛමසුඛානුසාරි විඤ්ඤාණං හොති. අදුක්ඛමසුඛස්සාදගථිතං අදුක්ඛ-සුඛස්සාදවිනිබද්ධං අදුක්ඛමසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති වුච්චති. එවං ඛො ආවුසො, අජ්ඣත්තං චිත්තං සණ්ඨිතන්ති[1] වුච්චති.

කථඤ්චාවුසො, අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති[2] වුච්චති : ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති තස්ස න විවෙකජපීතිසුඛානුසාරි විඤ්ඤාණං හොති. න විවෙකජ-පීතිසුඛස්සාදගථිතං න විවෙකජපීතිසුඛස්සාදවිනිබද්ධං න විවෙකජ-පීතිසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති වුච්චති.

පුන ච පරං ආවුසො, භික්ඛු විතක්කවිචාරානං වූපසමා-පෙ-දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස න සමාධිජපීතිසුඛානුසාරි විඤ්ඤාණං හොති. න සමාධිජපීතිසුඛස්සාදගථිතං න සමාධිජ-පීතිසුඛස්සාදවිනිබද්ධං න සමාධිජපීතිසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති වුච්චති.

පුන ච පරං ආවුසො, භික්ඛු පීතියා ච විරාගා-පෙ-තතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස න උපෙක්ඛාසුඛානුසාරි[3] විඤ්ඤාණං හොති. න උපෙක්ඛාසුඛස්සාදගථිතං න උපෙක්ඛාසුඛස්සාදවිනිබද්ධං න උපෙක්ඛා-සුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති වුච්චති

1. අජ්ඣත්තං සණ්ඨිතන්ති - මජ්ඣං.
2. අජ්ඣත්තං අසණ්ඨිතන්ති - මජ්ඣං.
3. උපෙක්ඛා නුසාරි - සී.

ඇවත්නි, කෙසේ නම් ගෝචරාධ්‍යාත්මයෙහි සිත පිහිටියේ යැ'යි කියනු ලැබේ යැ යත් : ඇවැත්නි, මේ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසලදහමින් වෙන් වැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහුට විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛය අනුව යන විඥනය වෙයි. විවෙකජ ප්‍රීතිසුඛාස්වාදයෙන් ග්‍රථිත වූ විවෙකජ ප්‍රීතිසුඛාස්වාදයෙන් වෙළුණු විවෙකජ ප්‍රීතිසුඛාස්වාද සංයොජනයෙන් සංයුක්ත වෙයි. සිත ගොචරාධ්‍යාත්මයෙහි පිහිටියේ යැ'යි කියනු ලැබේ.

තවද ඇවත්නි, මහණ විතර්කවිචාරයන් සන්හිඳීමෙන් සිතෙහි පැහැදීම් ඇති චිත්තෛකාග්‍රතා ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහුට විඥනය සමාධිජ ප්‍රීතිසුඛය අනුව යන්නේ වේ. සමාධිජ ප්‍රීතිසුඛාස්වාදයෙන් ග්‍රථිත වූයේ සමාධිජ ප්‍රීතිසුඛාස්වාදයෙන් වෙළුණේ සමාධිජ ප්‍රීතිසුඛාස්වාද සංයොජනයෙන් සංයුක්ත වූයේ වෙයි. ගොචරාධ්‍යාත්මයෙහි සිත පිහිටියේ යැ'යි කියනු ලැබේ.

තවද ඇවැත්නි, මහණ ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂක වැ ස්මෘතිමත් වැ සම්ප්‍රඥන ඇති වැ වාස කෙරෙයි. සුඛය ද කයින් විඳියි. ආර්‍ය්‍යයෝ 'උපෙක්ෂක යැ ස්මෘතිමත් යැ සුඛවිහරණ ඇති'යි යම් ධ්‍යානයක් කියත් ද ඒ තෘතීය ධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහුට විඥනය උපෙක්ෂා සුඛය අනුව යන්නේ වෙයි. උපෙක්ෂා සුඛාස්වාදයෙන් ග්‍රථිත වූයේ උපෙක්ෂා සුඛාස්වාදයෙන් වෙළුණේ උපෙක්ෂා සුඛාස්වාද සංයොජනයෙන් සංයුක්ත වූයේ වෙයි. ගොචරාධ්‍යාත්මයෙහි පිටියේ යැ යි කියනු ලැබේ.

තව ද ඇවත්නි, මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැල මැ සොම්නස් දොම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නො දුක් නො සුඛ වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහුට අදුඃඛාසුඛවෙදනා අනුව යන විඥනය වෙයි. අදුඃඛාසුඛාස්වාදයෙන් ග්‍රථිත වූයේ අදුඃඛාසුඛාස්වාදයෙන් වෙළුණේ අදුඃඛාසුඛාස්වාද සංයෝජනයෙන් සංයුක්ත වූයේ වෙයි. ගෝචරාධ්‍යාත්මයෙහි සිත පිහිටියේ යැ'යි කියනු ලැබේ. ඇවත්නි, මෙසෙයින් ගෝචරාධ්‍යාත්මයෙහි සිත පිහිටියේ යැ යි කියනු ලැබේ.

ඇවත්නි, කිසෙයින් 'ගෝචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ යැ යත් : ඇවත්නි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ . . . ප්‍රථමධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහට විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛය අනුව යන විඥනය නො වෙයි. විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛාස්වාදයෙන් ග්‍රථිත නො වූයේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛාස්වාදයෙන් නො වෙළුණේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛාස්වාද සංයෝජනයෙන් සංයුක්ත නො වූයේ වෙයි. ගෝචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ.

තවද ඇවත්නි, මහණ විතර්කවිචාරයන් සන්හිඳීමෙන් . . . ද්විතීයධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහට සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය අනුව යන විඥනය නො වෙයි. සමාධියෙන් උපන් ප්‍රීතිසුඛාස්වාදයෙන් ග්‍රථිත නො වූයේ සමාධියෙන් උපන් ප්‍රීති සුඛාස්වාදයෙන් නො වෙළුණේ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛාස්වාද සංයොජනයෙන් සංයුක්ත නො වූයේ වෙයි. ගොචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ.

තවද ඇවත්නි, මහණ ප්‍රීතියගේ ද විරාගයෙන් . . . තෘතිය ධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහට උපේක්ෂා සුඛය අනුව යන විඥනය නො වෙයි. උපෙක්ෂාසුඛාස්වාදයෙන් ග්‍රථිත නො වූයේ උපේක්ෂා සුඛාස්වාදයෙන් නො වෙළුණේ උපේක්ෂාසුඛාස්වාදසංයොජනයෙන් සංයුක්ත නො වූයේ වෙයි. ගොචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ.

පුන ච පරං ආවුසො, භික්ඛු සුඛස්ස ච පහානා-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස න අදුක්ඛමසුඛානුසාරි විඤ්ඤාණං හොති. න අදුක්ඛමසුඛස්සාදගධිතං න අදුක්ඛමසුඛස්සාදවිනිබද්ධං න අදුක්ඛමසුඛස්සාදසඤ්ඤොජනසංයුත්තං අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති වුච්චති එවං ඛො ආවුසො, අජ්ඣත්තං චිත්තං අසණ්ඨිතන්ති[1] වුච්චති.

කථඤ්චාවුසො, අනුපාද පරිතස්සනා හොති: ඉධාවුසො, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදෙ අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදෙ සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා රූපවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස රූපවිපරිණාමානුපරිවත්තජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති. විඝාතවා ච අපෙක්ඛවා[2] ච අනුපාදාය ච පරිතස්සති. වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්ස තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා විඤ්ඤාණවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමානුපරිවත්තජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා අනුපාදාය ච පරිතස්සති. එවං ඛො ආවුසො, අනුපාද පරිතස්සනා හොති.

කථඤ්චාවුසො, අනුපාද[3] අපරිතස්සනා හොති: ඉධාවුසො, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදෙ අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදෙ සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා න ච රූපවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න රූපවිපරිණාමානුපරිවත්තජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං න පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා න චෙව උත්තාසවා[4] හොති න ච විඝාතවා, න ච අපෙක්ඛවා අනුපාදාය ච න පරිතස්සති. න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්ස තං විඤ්ඤාණං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා න ච විඤ්ඤාණවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න විඤ්ඤාණවිපරිණාමානුපරිවත්තජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං පරියාදාය තිට්ඨන්ති, චෙතසො පරියාදානා න චෙව උත්තාසවා හොති. න ච විඝාතවා, න ච අපෙක්ඛවා. අනුපාදාය ච න පරිතස්සති. එවං ඛො ආවුසො, අනුපාද අපරිතස්සනා හොති.

---

1. අජ්ඣත්තං අසණ්ඨිතන්ති - මජසං.
2. උපෙක්ඛවා - PTS.
3. අනුපාදනා - මජසං.
4. න චෙවුත්තාසවා - මජසං.

තවද ඇවත්නි, මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් . . . චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි. ඔහට අදුඃඛාසුඛය අනුව යන විඥනය වෙයි. අදුඃඛාසුඛාස්වාදයෙන් ග්‍රථිත නො වූයේ අදුඃඛාසුඛාස්වාදයෙන් නො වෙළුණේ අදුඃඛාසුඛාස්වාද සංයොජනයෙන් සංයුක්ත නො වූයේ වෙයි. ගොචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ. ඇවත්නි, මෙසෙයින් ගොචරාධ්‍යාත්මයෙහි සිත නො පිහිටියේ යැ'යි කියනු ලැබේ.

ඇවත්නි, කිසෙයින් උපාදනය නො කොට පරිතස්සනා වෙයි යත් : ඇවත්නි, මෙලොවැ අශ්‍රුතවත් පෘථග්ජන ආර්‍ය්‍යයන් නො දක්නාසුලු වූයේ ආර්‍ය්‍යධර්මයට අදක්ෂ වූයේ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූයේ සත්පුරුෂයන් නො දක්නාසුලු වූයේ සත්පුරුෂධර්මයට අදක්ෂ වූයේ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූයේ රූපය ආත්ම හෙයින් විපර්‍ය්‍යාසයෙන් දකියි. තමා රූපවත් කොට ද දකියි. තමා කෙරෙහි රූපය ද රූපය කෙරෙහි තමා ද දකියි. ඔහුගේ ඒ රූපය පෙරළෙයි. අන්‍යථාත්ව ඇති වෙයි. ඔහුට රූපවිපරිණාම අන්‍යථාභාව හෙතුයෙන් රූපවිපරිණාම අනුව වැටෙන විඥන වෙයි. ඔහුගේ රූපවිපරිණාමානු පරිවර්තනයෙන් උපන් පරිතස්සනා සඞ්ඛ්‍යාත ධර්මසමුත්පාදයෝ කුසල් සිත ගෙන සිටිත්. චිත්තපරියාදන හෙතුයෙන් උත්‍රාස ඇතියේ ද වෙයි. දුක් ඇතියේ ද වෙයි. ස්පෘහා ඇතියේ ද වෙයි, උපාදන වශයෙන් නො ගෙන ද පරිතස්සනා කෙරෙයි. වෙදනා . . . සංඥ . . . සංස්කාර . . . විඥනය ආත්ම විසින් විපර්‍ය්‍යාස වශයෙන් දකියි. ආත්මය විඥනවත් කොට ද ආත්මයෙහි විඥනය ද විඥනයෙහි ආත්මය ද දකියි. ඔහුගේ ඒ විඥන පෙරළෙයි. අන්‍යථාභාව ඇති වෙයි. ඔහුට විඥනවිපරිණාම හා අන්‍යථාභාව හෙතුයෙන් විඥනවිපරිණාමය අනුව වැටෙන විඥන වෙයි. ඔහුගේ විඥනවිපරිණාමානු පරිවර්තනයෙන් උපන් පරිතස්සනා සඞ්ඛ්‍යාත ධර්මසමුත්පාදයෝ සිත ක්ෂය කොට සිටිත්. චිත්තපරියාදන හෙතුයෙන් උත්‍රාස ඇතියේ ද වෙයි. දුක් ඇතියේ ද වෙයි. ස්පෘහා ඇත්තේ ද වෙයි. නො ගෙනත් පරිතස්සනා කෙරෙයි. ඇවැත්නි, මෙසේ අනුපාද පරිතස්සනා වෙයි.

ඇවත්නි, කෙසේ නම් 'අනුපාද අපරිතස්සනා වෙ යැ යත් : ඇවත්නි, මෙසස්නෙහි ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍යධර්මය පිළිබඳ කොවිද වූ ආර්‍ය්‍යධර්මයෙහි සුවිනීත වූ සත්පුරුෂ යන් දක්නාසුලු සත්පුරුෂධර්මය පිළිබඳ කෝවිද වූ සත්පුරුෂධර්මයෙහි සුවිනීත වූ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම රූපය ආත්ම වශයෙන් ගෙන විපර්‍ය්‍යාස විසින් නො දක්නේ යැ. ආත්මය රූපවත් කොට ද නො දක්නේ යැ, ආත්මයෙහි රූපය ද නො දක්නේ යැ. රූප යෙහි ආත්මය ද නො දක්නේ යැ. ඔහුට ඒ රූපය පෙරළෙයි. අන්‍යථාභාව ඇති වෙයි. ඔහුට රූප විපරිණාම හා අන්‍යථාභාව හෙතුවින් රූප විපරිණාමය අනුව වැටෙන විඥන නො වෙයි. ඔහුට රූප විපරිණාමය අනුව වැටීමෙන් උපදනා පරිතස්සනා සඞ්ඛ්‍යාත ධර්මසමුත්පාදයෝ සිත නො ගෙන සිටිත්. චිත්තපරියාදන හෙතුවින් උත්‍රාස ඇතියේ ද නො වෙයි. දුක් ඇතියේ ද නො වෙයි. ස්පෘහා ඇතියේ ද නො වෙයි. උපාදන වශයෙන් නො ගෙන ද පරිතස්සනා නො කෙරෙයි. වේදනා ආත්ම වශයෙන් නො දක්නේ යැ . . . සංඥ ආත්ම වශයෙන් නො දක්නේ යැ . . . සංස්කාර ආත්ම වශයෙන් නො දක්නේ යැ. . . විඥන ආත්ම වශයෙන් නො දක්නේ යැ. ආත්මය විඥනවත් කොට ද නො දක්නේ ය. ආත්මයෙහි විඥනය ද නො දක්නේ යැ. විඥනයෙහි ආත්මය ද නො දක්නේ යැ. ඔහුගේ විඥනය පෙරළෙයි. අන්‍යථාභාව ඇති වෙයි. ඔහුට විඥනවිපරි ණාම හා අන්‍යථාභාව හේතුවින් විඥන විපරිණාමය අනුව යන විඥන නො ද වෙයි. ඔහුට විඥන විපරිණාමය අනුව වැටීමෙන් උපන් පරිතස්සනා සඞ්ඛ්‍යාත ධර්මසමුත්පාදයෝ සිත පැහැරගෙන නො සිටීත්. චිත්තපරියාදන හේතුවින් උත්‍රාස ඇතියේ නො ද වෙයි. දුක් ඇතියේ නො ද වෙයි. ස්පෘහා ඇතියේ නො ද වෙයි. උපාදන වශයෙන් නො ගෙන ද පරිතස්සනා නො කෙරෙයි. ඇවත්නි, මෙසෙයින් 'අනුපාද අප[illegible]තස්සනා' වෙයි.

යං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, තථා තථා භික්ඛවෙ, භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය, බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතීති. ඉමස්ස ඛො අහං ආවුසො, භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආයස්මන්තො, භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරොති, තථා නං ධාරෙය්‍යාථා'ති.

අථ ඛො තෙ භික්ඛු ආයස්මතො මහාකච්චානස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛු භගවන්තං එතදවොචුං: යං ඛො නො භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. තථා තථා භික්ඛවෙ භික්ඛු උපපරික්ඛෙය්‍ය යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය. බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති. තෙසං නො භන්තෙ, අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි:

'ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. තථා තථා භික්ඛවෙ භික්ඛු උපපරික්ඛෙය්‍ය, යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස විඤ්ඤාණං අවික්ඛිත්තං අවිසටං අජ්ඣත්තං අසණ්ඨිතං අනුපාදාය න පරිතස්සෙය්‍ය, බහිද්ධා භික්ඛවෙ, විඤ්ඤාණෙ අවික්ඛිත්තෙ අවිසටෙ සති අජ්ඣත්තං අසණ්ඨිතෙ, අනුපාදාය අපරිතස්සතො ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති: තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: 'අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං, යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමා'ති.

ඇවත්නි, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් යම් උද්දේසයක් උදෙසා විස්තර විසින් අර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී වැඩිසේක් ද මහණෙනි, යම් යම් පරිදි තුලනා කරන ඔහුගේ බැහැර අරමුණෙහි විඥනය අවික්ෂිප්ත වූයේ නො විසුරුණේ ගෝචරාධ්‍යාත්මයෙහි උපාදන වශයෙන් නො ගෙන තෘෂ්ණා වශයෙන් පරිතස්සනා නො කෙරේ ද, මහණ ඒ ඒ පරිදි තුලනා කරන්නේ යැ. මහණෙනි, බැහැර අරමුණෙහි විඥනය අවික්ෂිප්ත කල්හි නො විසිරුණු කල්හි ගෝචරාධ්‍යාත්මයෙහි නො පිහිටි කල්හි උපාදන වශයෙන් නො ගෙන පරිතස්සනා නො කරන්නහුට ජාතිජරාමරණ දුඃඛයන්ගේ පහළවීම නො වේ යයි. ඇවත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අර්ථ විභාග නො කරන ලද මේ උද්දේසයාගේ විස්තර වශයෙන් මෙසේ අර්ථ අවබොධ කොට දන්මි. ඇවත්නි, තෙපි කැමැත්තහු නම් බුදුන් කරා මැ එළැඹ තෙල කරුණ පුළුවුස්ව. භාග්‍යවතුන් වහන්සේ තොපට යම්සේ විභාග කොට වදරනසේක් ද එසේ එය ධරව.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන්ගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපට යම් උද්දෙසයක් සැකෙවින් උදෙසා විස්තර විසින් අර්ථ විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක් ද 'මහණෙනි, යම් යම් පරිද්දෙකින් තුලනා කරන ඒ මහණහුගේ බාහ්‍යාලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත වූයේ නො විසිරුණේ ගෝචරාධ්‍යාත්මයෙහි නිකාන්ති වශයෙන් නො පිහිටියේ උපාදන වශයෙන් නො ගෙන තෘෂ්ණා වශයෙන් පරිතස්සනාවට නො පැමිණේ ද මහණ තෙමේ ඒ ඒ පරිදි තුලනා කරන්නේ යැ. බාහ්‍යාලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත වත් මැ නො විසිරෙත් මැ ගෝචරාධ්‍යාත්මයෙහි නො පිහිටත් මැ උපාදන වශයෙන් නො ගෙන පරිතස්සනා නො කරන ඒ මහණහට මතුයෙහි ජාතිජරාමරණ හා දුඃඛසමුදය සම්භවය නො වේ'යයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නික්මගිය නොබෝ කල්හි මැ අපට මේ සිත විය.

ඇවත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට මේ උද්දෙසය සැකෙවින් උදෙසා විස්තර විසින් අර්ථය විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වැඩිසේක. ''මහණෙනි, යම් යම් පරිද්දෙකින් තුලනය කරන ඔහුට වාහ්‍යාලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත වූයේ අවිසෘෂ්ට වූයේ ගෝචරාධ්‍යාත්මයෙහි නො පිහිටියේ උපාදනය නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලේ ද මහණ ඒ ඒ පරිද්දෙන් තුලනය කරන්නේ යැ. මහණෙනි, වාහ්‍යාලම්බනයෙහි විඥනය අවික්ෂිප්ත කල්හි නො විසිරැ සිටි කල්හි ගොචරාධ්‍යාත්මයෙහි නිකාන්ති වශයෙන් නො පිහිටි කල්හි උපාදනය නො කොට තෘෂ්ණා පරිතස්සනායෙන් නො සැලෙන්නහුට මත්තෙහි ජාතිජරාමරණයාගේ ද දුඃඛසමුදයාගේ ද සම්භවයෙක් නො වේ'' යයි.

භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විස්තර විසින් අර්ථය විභාග නො කළ මේ උද්දෙසයාගේ අර්ථය කවරෙක් විස්තර විසින් විභාග කරන්නේ දෝහෝ'යි. වහන්ස, ඒ අපට තෙල සිත විය. මේ ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ ශාස්තෘන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ වූ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් මහා කාත්‍යායනයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තරාර්ථය විභාග නො කළ මේ උද්දේසයාගේ අර්ථය විස්තර විසින් විභාග කරන්නට පොහොනාහු ද වෙති. ඇපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් කරා එළැඹෙන්නමෝ නම් එළඹැ තෙල අර්ථය ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් පුළුවුස්නමෝ නම් මැනැවැයි.

අථ ඛො මයං භන්තෙ, යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පටිපුච්ඡිම්හ. තෙසං නො භන්තෙ ආයස්මතා මහාකච්චානෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි බ්‍යඤ්ජනෙහි අත්ථො විභත්තො’ති.

පණ්ඩිතො භික්ඛවෙ, මහාකච්චානො, මහාපඤ්ඤො භික්ඛවෙ, මහාකච්චානො, මඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ, එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං එවමෙවං ව්‍යාකරෙය්‍යං, යථා තං මහාකච්චානෙන බ්‍යාකතං. එසො චෙවෙතස්ස අත්ථො. එවංච නං ධාරෙය්‍යාථා’ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

උද්දෙසවිභඞ්ග සුත්තං අට්ඨමං.

වහන්ස, ඉක්බිති ඇපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් කරා එළැඹියමහ. එළැඹ තෙල අර්ථය ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් පුළුවුසුමහ. වහන්ස, අපට ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් විසින් මේ අයුරින් මේ පෙදෙන් මේ ඛ්‍යඤ්ජනයෙන් අර්ථය විභාග කරන ලද්දේ යයි.

මහණෙනි, මහාකාත්‍යායන පණ්ඩිත යැ මහණෙනි, මහාකාත්‍යායන මහාප්‍රාඥ යැ ඉදින් මහණෙනි, තෙපි තෙල අර්ථය මයිද්‍ද පුළුවුස්නාහු නම් මම ද එය එපරිදි මැ ප්‍රකාශ කරන්නෙමි. යම්සේ මහාකාත්‍යායනයන් විසින් එය ප්‍රකාශ කරනලද ද තෙල උද්දේසයා ගේ තෙලෙ මැ අර්ථ වෙයි, එය එසේ මැ ධරන්නාහු යයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක, සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් හන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තාහු යයි.

අට වැනි උද්දේසවිභඞ්ග සූත්‍ර යි.

# 3. 4. 9

## අරණවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අරණවිභඞ්ගං වො භික්ඛවෙ, දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ. භාසිස්සාමීති.

එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

න කාමසුඛමනුයුඤ්ජෙය්‍ය හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං. න ච අත්තකිලමථානුයොගං අනුයුඤ්ජෙය්‍ය දුක්ඛං අනරියං අනත්ථසංහිතං. එතෙ තෙ[1] භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. උස්සාදනඤ්ච ජඤ්ඤා, අපසාදනඤ්ච ජඤ්ඤා. උස්සාදනඤ්ච ඤත්වා අපසාදනඤ්ච ඤත්වා නෙවුස්සාදෙය්‍ය නාපසාදෙය්‍ය ධම්මමෙව දෙසෙය්‍ය. සුඛවිනිච්ඡයං ජඤ්ඤා, සුඛවිනිච්ඡයං ඤත්වා අජ්ඣත්තං සුඛමනුයුඤ්ජෙය්‍ය, රහොවාදං න භාසෙය්‍ය, සම්මුඛා න ඛීණං[2] භණෙ, අතරමානො ව භාසෙය්‍ය, නො තරමානො. ජනපදනිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, සමඤ්ඤං නාතිධාවෙය්‍යාති. අයමුද්දෙසො අරණවිභඞ්ගස්ස.

'න කාමසුඛමනුයුඤ්ජෙය්‍ය හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න ච අත්තකිලමථානුයොගං අනුයුඤ්ජෙය්‍ය දුක්ඛං අනරියං අනත්ථසංහිත'න්ති ඉති බො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: යො කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො[3] සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. යො කාමපටිසන්ධි-සුඛිනො සොමනස්සානුයොගං අනනුයොගො හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. යො අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. යො අත්තකිලමථානුයොගං අනනුයොගො දුක්ඛං අනරියං අනත්ථසංහිතං, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. 'න කාමසුඛමනු-යුඤ්ජෙය්‍ය හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න ච අත්තකිලමථානුයොගං අනුයුඤ්ජෙය්‍ය දුක්ඛං අනරියං අනත්ථසංහිත'න්ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. { එතෙ බො - මජසං, සිමු. / එතෙතෙව - කම්බො }
2. නාභිඛීණං - සයා.
3. සවිඝාතො - කම්බො.

# 3. 4. 9

# අරණවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහසිටුහුගේ දෙව්රම් මහවෙහෙර වැඩ වාස කෙරෙති. එකල භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු ' වහන්සැ ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙල අරණවිභඞ්ගසූත්‍රය වදාළසේක:

' මහණෙනි, තොපට අරණවිභඞ්ගය දෙසමි. ඒ විභඞ්ගය අසව, මනා කොට මෙනෙහි කරව, කියමි ' යි වදාළෝ.

' වහන්ස, එසේ යැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහු. භාග්‍යවතුන් වහන්සේ මෙල විභඞ්ගය වදාළසේක.

හීන වූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් කෙරෙහි වැටෙන අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ කාම සුඛයෙහි නො යෙදෙන්නේ යැ. දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ ආත්මක්ලමථයෙහි නො යෙදෙන්නේ යැ. '' මහණෙනි, මෙකී ඒ උභයාන්තයන් නො ගෙන තථාගතයන් වහන්සේ විසින් නුවණැස කරන ඥානය කරන උපශමය පිණිස අභිඥා පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස වැටෙන මධ්‍යමප්‍රතිපද තොමෝ අවබෝධ කරනලදු. (කිසි පුඟුලකු) හුවාලීම ද දන්නේ යැ. හෙළාලීම ද දන්නේ යැ. හුවාලනුදු දැන හෙළාලනුදු දැන (ගෙහසිත වශයෙන් කිසිපුඟුලක්හු) නො මැ හුවන්නේ යැ නො හෙළන්නේ යැ. ස්වභාවය මැ කියන්නේ යැ. විනිශ්චිත සුඛය දන්නේ යැ. විනිශ්චිත සුඛය දැන අධ්‍යාත්මසුඛයෙහි යෙදෙන්නේයැ. නො හමුයෙහි අයුක්ත (පිසුනු) නො කියන්නේ යැ. හමියෙහි කිලිටිබස් නො බණන්නේ යැ. ත්වරිත නො වී බණන්නේ යැ. ත්වරිත වැ නො බණන්නේ යැ. ජනපද නිරුක්තියෙහි අභිනිවේශ නො කරන්නේ යැ. ලෞකික ප්‍රඥප්තිය නො ඉක්මවන්නේයැ. අරණවිභාගයාගේ මේ උද්දෙස යි.

' හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනන් කෙරෙහි වැටෙන (එහෙයින්) අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ කාමසුඛයෙහි නො යෙදෙන්නේ යැ. දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ අත්තකිලමථානුයෝගයෙහි නො යෙදෙන්නේ යැ ' යි මෙසෙයින් මෙල බසෙක් කියනලද ද, මෙබස් කුමක් පිණිස කියනලද යැ යත්: ' කාමෝපසංහිතසුඛයෙන් සුඛිත වූවහුගේ හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනන් කෙරෙහි වැටෙන අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ යම් සෞමනස්‍යානුයෝගයෙක් ඇද්ද, මෙල ධර්මය සදුඃඛ යැ උපඝාත සහිත යැ උපායාස සහිත යැ පරිදාහ සහිත යැ. මිථ්‍යාප්‍රතිපත් වෙයි. කාමප්‍රතිසන්ධිසුඛ ඇත්තහුගේ හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනන් කෙරෙහි වැටෙන අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ යම් සෞමනස්‍යානුයෝගයෙක නො යෙදීමෙක් වේ ද මෙල දහම දුඃඛ රහිත යැ උපඝාත රහිත යැ උපායාස රහිත යැ පරිදාහ රහිත යැ සම්‍යක් ප්‍රතිපත්ති වෙයි. දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ යම් අත්තකිලමථානුයෝගයෙක් ඇද්ද, මෙල දහම දුඃඛ සහිත යැ උපඝාත සහිත යැ උපායාස සහිත යැ පරිදාහ සහිත යැ මිථ්‍යාප්‍රතිපත් වෙයි. දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ යම් අත්තකිලමථානුයෝගයෙක නො යෙදීමෙක් ඇද්ද, මෙල දහම අදුඃඛ යැ අනුපඝාත යැ අනුපායාස යැ අපරිදාහ යැ සම්‍යක්ප්‍රතිපත්ති වෙයි. ' හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුනන් කෙරෙහි වැටෙන අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ කාමසුඛයෙහි නො යෙදෙන්නේ යැ ' දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථසංහිත වූ අත්තකිලමථානුයෝගයෙහි නො ද යෙදෙන්නේ යැ ' යි මෙසෙයින් යම් බසෙක් කියන ලද ද මෙබස මෙල පිණිස කියනලදි.

‘එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතී’ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මා-වායාමො සම්මාසති සම්මාසමාධි. එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතී’ති ඉති[1] යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

‘උස්සාදනඤ්ච ජඤ්ඤා අපසාදනඤ්ච ජඤ්ඤා, උස්සාදනඤ්ච ඤත්වා අපසාදනඤ්ච ඤත්වා නෙවුස්සාදෙය්‍ය න අපසාදෙය්‍ය ධම්මමෙව දෙසෙය්‍යා’ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: කථං ච භික්ඛවෙ, උස්සාදනා ච හොති අපසාදනා ච, නො ච ධම්මදෙසනා:

යෙ කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගං අනුයුත්තා හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටිපන්නාති ඉති වදං ඉත්ථෙකෙ අපසාදෙති. යෙ කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගං අනනුයුත්තා හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නාති ඉති වදං ඉත්ථෙකෙ උස්සාදෙති.

‘යෙ අත්තකිලමථානුයොගං අනුයුත්තා දුක්ඛං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටි-පන්නා’ති ඉති වදං ඉත්ථෙකෙ අපසාදෙති. ‘යෙ අත්තකිලමථානුයොගං අනනුයුත්තා දුක්ඛං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නා’ති ඉති වදං ඉත්ථෙකෙ උස්සාදෙති.

‘යෙසං කෙසඤ්චි භවසඤ්ඤොජනං අප්පහීනං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටිපන්නා’ති ඉති වදං ඉත්ථෙකෙ අපසාදෙති. ‘යෙසං කෙසඤ්චි විභවසඤ්ඤොජනං පහීනං, සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නා’ති ඉති වදං ඉත්ථෙකෙ උස්සාදෙති. එවං ඛො භික්ඛවෙ, උස්සාදනා ච හොති අපසාදනා ච, නො ච ධම්මදෙසනා.

කථඤ්ච භික්ඛවෙ, නෙව උස්සාදනා හොති න අපසාදනා, ධම්මදෙසනා ච: යෙ කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගං අනනුයුත්තා හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටිපන්නා’ති න එවමාහ: අනුයොගො ච ඛො සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා’ති ඉති වදං ධම්මමෙව දෙසෙති.

---

1. සංවත්තති ඉති - සීමු.

තෙල උභයාන්තයන්ට නො පැමිණ තථාගතයන් විසින් නුවණැස ඇති කරන නුවණ ඇති කරන ක්ලේශෝපශමය පිණිස අභිඥව පිණිස සත්‍යාවබෝධය පිණිස වැටෙන මධ්‍යම ප්‍රතිපදව අවබෝධ කරනලද ' යි. මෙසේ තෙල බසෙක් වදරනලද ද තෙල කුමක් සඳහා වදරනලද යැ යත් : මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යි. හෙමෙසේ යැ :' සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග්වචන ය සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යැ යි. තෙල උභයාන්තයන්ට නො පැමිණ තථාගත යන් විසින් අභිසම්බුද්ධ වූ මධ්‍යමප්‍රතිපදව නුවණැස ඇති කරන්නී යැ මාර්ගඥනය ඇති කරන්නී යැ ක්ලේශෝපශමය පිණිස අභිඥව පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස පවත්නී යැ යි. මෙසේ යමක් වදරනලද ද මෙය තෙල සඳහා වදරන ලදි.

උස්සාදනය ද දන්නේ යැ අපසාදනය ද දන්නේ යැ උස්සාදනයත් දැන අපසාදනයත් දැන (ගෘහශ්‍රිත විසින් කිසි පුඟුලක්හු) හුවා නො දක්නේ යැ හෙළා නො දක්නේ යැ ස්වභාවධර්මය මැ කියන්නේ යයි. මෙසේ තෙල කියන ලද. තෙලබස් කුමක් සඳහා කියනලද යැ යත් : මහණෙනි, හුවා දක්වීමුදු හෙළා දක්වීමුදු ස්වභාවධර්මය දෙසුමුදු කිසෙයින් වෙයි යත් :

හීන වූ ග්‍රාම්‍ය වූ පොථුජ්ජනික වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ සෞමනස්‍යානුයෝගයෙහි යෙදුණු කාමප්‍රතිසන්ධිසුඛ ඇත්තාහු ඇද්ද එහැම දුඃඛ සහිතයහ, උපඝාත සහිතයහ, උපායාස සහිතයහ පරිදහ සහිතයහ මිථ්‍යාප්‍රතිපන්නයහ ' යි මෙසේ කියනුයේ මෙසෙයින් කිසි කෙනකුන් හෙළා දක්නේ වෙයි. හීන වූ ග්‍රාම්‍ය වූ පොථුජ්ජනික වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ සෞමනස්‍යානුයෝගයෙහි නො යෙදුණු යම් කාමප්‍රතිසන්ධි සුඛයෙන් සුඛිත වූවෝ ඇද්ද එහැම අදුඃඛයහ උපඝාත රහිතයහ උපායාස රහිතයහ, පරිදහ රහිතයහ, සම්‍යක්ප්‍රතිපන්නයහ ' යි මෙසෙයින් කියනුයේ මෙසේ කිසිවකුන් හුවන්නේ වෙයි.

' යම් කෙනෙක් දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ අත්තකිලමථානුයෝගයෙහි යෙදුණාහු ද එහැමදෙන දුඃඛ සහිතයහ, උපඝාත සහිතයහ, උපායාස සහිතයහ, පරිදහ සහිතයහ, මිථ්‍යා ප්‍රතිපන්නයහ ' යි මෙසේ කියනුයේ මෙසෙයින් ඇතැමකුන් හෙළා දක්නේ වෙයි. ' යම් කෙනෙක් දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ අත්තකිලමථානුයෝග යෙහි යෙදුණාහු ද එහැමදෙන දුඃඛ රහිතයහ, උපඝාත රහිතයහ, උපායාස රහිතයහ, පරිදහ රහිතයහ, සම්‍යක්ප්‍රතිපන්නයහ ' යි මෙසේ කියනුයේ මෙසෙයින් ඇතැමකුන් හුවන්නේ වෙයි.

' යම් කෙනකුන්ට භවසංයෝජන අප්‍රහීණ වේ ද එහැමදෙන දුඃඛ සහිතයහ, උපඝාත සහිතයහ, උපායාස සහිතයහ, පරිදහ සහිතයහ, මිථ්‍යාප්‍රතිපන්නයහ ' යි මෙසේ කියනුයේ මෙසෙයින් ඇතැමකුන් හෙළා දක්නේ වෙයි. ' යම් කෙනකුන්ට විභවසංයෝජන ප්‍රහීණ වේ ද එහැමදෙන දුඃඛ රහිතයහ, උපඝාත රහිතයහ, උපායාස රහිතයහ, පරිදහ රහිතයහ, සම්‍යක්ප්‍රතිපන්නයහ ' යි මෙසේ කියනුයේ මෙසෙයින් ඇතැමකුන් හුවන්නේ වෙයි. මහණෙනි, මෙසේ උස්සාදන ද වෙයි, අපසාදන ද වෙයි, ධර්මදේශනා නො ද වෙයි.

මහණෙනි, කෙසේ උස්සාදන නො මැ වේ ද, අපසාදන නො වේ ද, ධර්මදේශනා වේ ද යත් : කාමප්‍රතිසන්ධියෙන් සුඛිත වූ යම් කෙනෙක් හීන වූ ග්‍රාම්‍ය වූ පොථුජ්ජනික වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ සෞමනස්‍යානුයෝගයෙහි නො යෙදුණාහු ද එහැමදෙන දුඃඛ සහිතයහ, උපඝාත සහිතයහ, උපායාස සහිතයහ, පරිදහ සහිතයහ, මිථ්‍යාප්‍රතිපන්නයහ'යි මෙසේ නො කියයි. අනුයෝග සංඛ්‍යාත තෙල දහම දුඃඛ සහිත ය, උපඝාත සහිත ය, උපායාස සහිත ය, පරිදහ සහිත ය, මිථ්‍යාප්‍රතිපත්ති යයි මෙසේ කියනුයේ දහම් මැ කියයි.

‘යෙ කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගං අනුයුත්තා හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නා’ති න එවමාහ. අනනුයොගො ච ඛො අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා’ති ඉති වදං ධම්මමෙව දෙසෙති.

යෙ අත්තකිලමථානුයොගං අනුයුත්තා දුක්ඛං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටිපන්නා’ති න එවමාහ: අනුයොගො ච ඛො සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදාති ඉති වදං ධම්මමෙව දෙසෙති.

යෙ අත්තකිලමථානුයොගං අනනුයුත්තා දුක්ඛං අනරියං අනත්ථසංහිතං, සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නාති න එවමාහ: අනනුයොගො ච ඛො අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා’ති ඉති වදං ධම්මමෙව දෙසෙති.

යෙසං කෙසඤ්චි භවසංයොජනං අප්පහීනං, සබ්බෙ තෙ සදුක්ඛා සඋපඝාතා සඋපායාසා සපරිළාහා මිච්ඡාපටිපන්නාති න එවමාහ භවසංයොජනෙ ච ඛො අප්පහීනෙ භවොපි අප්පහීනො හොතී’ති ඉති වදං ධම්මමෙව දෙසෙති.

යෙසං කෙසඤ්චි භවසංයොජනං පහීනං සබ්බෙ තෙ අදුක්ඛා අනුපඝාතා අනුපායාසා අපරිළාහා සම්මාපටිපන්නාති න එවමාහ භවසංයොජනෙ ච ඛො පහීනෙ භවොපි පහීනො හොතීති ඉති වදං ධම්මමෙව දෙසෙති. එවං ඛො භික්ඛවෙ, නෙවුස්සාදනා හොති න අපසාදනා ධම්මදෙසනා ච.

‘උස්සාදනඤ්ච ජඤ්ඤා, අපසාදනඤ්ච ජඤ්ඤා, උස්සාදනඤ්ච ඤත්වා අපසාදනඤ්ච ඤත්වා නෙවුස්සාදෙය්‍ය, න අපසාදෙය්‍ය. ධම්මමෙව දෙසෙය්‍යා’ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

සුඛවිනිච්ඡයං ජඤ්ඤා, සුඛවිනිච්ඡයං ඤත්වා අජ්ඣත්තං සුඛමනුයුඤ්ජෙය්‍යා’ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: පඤ්චිමෙ භික්ඛවෙ, කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා සොතවිඤ්ඤෙය්‍යා සද්ද-පෙ-ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා-පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා-පෙ-කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්චකාමගුණා. යං ඛො භික්ඛවෙ, ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං මීළ්හසුඛං පුථුජ්ජනසුඛං අනරියසුඛං. න ආසෙවිතබ්බං න භාවෙතබ්බං න බහුලීකාතබ්බං, භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමි.

කාමප්‍රතිසන්ධිසුඛයෙන් සුඛිත වූ යම් කෙනෙක් හීන වූ ග්‍රාම්‍ය වූ පෝථුජ්ජනික වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ සෞමනස්‍යානුයෝගයෙහි යෙදුණාහු ද එහැමදෙන දුඃඛ රහිතයහ, උපඝාත රහිතයහ, උපායාස රහිතයහ, පරිදාහ රහිතයහ, සම්‍යක්ප්‍රතිපන්නයහ'යි මෙසේ නො කියයි. (ඒ සෞමනස්‍යානුයෝගයෙහි) නො යෙදීමෙක් ඇද්ද තෙල දහම දුඃඛ රහිත යැ, උපඝාත රහිත යැ, උපායාස රහිත යැ, පරිදාහ රහිත යැ, සම්‍යක්ප්‍රතිපද යැ'යි මෙසේ කියනුයේ ධර්මය මැ දෙසන්නේ වෙයි.

යම් කෙනෙක් දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ අත්තකිලමථානුයෝගයෙහි යෙදුණාහු ද එහැමදෙන දුඃඛ සහිතයහ, උපඝාත සහිතයහ, උපායාස සහිතයහ, පරිදාහ සහිතයහ, මිථ්‍යාප්‍රතිපන්නයහ ' යි මෙසේ නො කියයි. එහි අනුයෝගයෙක් ඇද්ද, තෙල දහම දුඃඛ සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදාහ සහිත යැ, මිථ්‍යා ප්‍රතිපදයැ ' යි මෙසේ කියනුයේ ධර්මය මැ දෙසන්නේ වෙයි.

යම් කෙනෙක් දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ සංහිත වූ අත්තකිලමථානුයෝගයෙහි නො යෙදුණාහු ද එහැමදෙන දුඃඛ රහිත උපඝාත රහිත පරිදාහ රහිත වූ මනාව පිළිපන්හු යයි මෙසේ නො කියයි. එහි අනනුයෝගය යන තෙල දහම දුක් නැත්තේ යැ, උපඝාත නැත්තේ යැ, උපායාස නැත්තේ යැ, පරිදාහ නැත්තේ යැ, මනා පිළිවෙතෙකි යි මෙසේ කියනුයේ දහම මැ දෙසන්නේ වෙයි.

යම් කෙනකුන්ට භවසංයෝජන අප්‍රහීණ වැ ඇද්ද, එහැමදෙන දුක් ඇත්තෝ යැ, උපඝාත ඇත්තෝ යැ, උපායාස ඇත්තෝ යැ, පරිදාහ ඇත්තෝ යැ, මිථ්‍යාප්‍රතිපන්න යහ ' යි මෙසේ නො කියයි. භවසංයෝජනය අප්‍රහීණ වත් මැ භවය ද අප්‍රහීණ වේ යයි මෙසේ කියනුයේ ධර්මය මැ දෙසන්නේ වේ.

යම් කෙනකුන්ට භවසංයෝජන ප්‍රහීණ වැ ඇද්ද එහැමදෙන දුක් නැත්තාහ, උපඝාත නැත්තාහ, උපායාස නැත්තාහ, පරිදාහ නැත්තාහ, සම්‍යක්ප්‍රතිපන්නයහ' යි මෙසේ නො කියයි. භවසංයෝජනය ප්‍රහීණ වත් මැ භවය ද ප්‍රහීණ වේ යයි මෙසේ කියනුයේ ධර්මය මැ දෙසන්නේ වෙයි. මහණෙනි, මෙසේ හුවාලීම් නො වෙයි, හෙළාලීම් නො වෙයි, දහම්දෙසුමුදු වෙයි.

' හුවාලීමුදු දන්නේ යැ, හෙළාලීමුදු දන්නේ යැ, හුවාලීමුදු දැන හෙළාලීමුදු දැන නො හුවන්නේ යැ, නො හෙළන්නේ යැ, දහම් මැ දෙසන්නේ යයි යම් බසෙක් කියන ලද ද මෙය තෙල බස් පිණිස කියන ලදි.

' විනිශ්චිතසුඛය දන්නේ යැ, විනිශ්චිතසුඛය දැන අධ්‍යාත්මසුඛයෙහි යෙදෙන්නේ යයි මෙසේ තෙල බසෙක් කියනලද ද තෙල කුමක් පිණිස කියන ලද යැ යත් : මහණෙනි, මේ කාමගුණයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ සිත් අලවන චක්ෂුර්විඥෙය රූපයෝ යැ, ශ්‍රෝත්‍රවිඥෙය ශබ්දයෝ යැ . . . ඝ්‍රාණවිඥෙය වූ ගන්ධයෝ යැ . . . ජිහ්වාවිඥෙය වූ රසයෝ යැ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ සිත් අලවන කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ. මහණෙනි, මොහු පඤ්චකාමගුණයෝ යි. මහණෙනි, මේ පස්කම් ගුණයන් නිසා යම් සුඛසෞමනස්‍යයෙක් උපදනේ වේ ද මේ කාමසුඛය ' මීළ්හසුඛ ' යයි ' පෘථග්ජනසුඛ ' යයි කියනු ලැබේ. ආසේවන නො කළයුතු යැ, නො හැවියයුතු යැ, නො බිහිලි කළයුතු යැ මේ සුඛයෙන් බිය වියයුතු යැ යි කියමි.

ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං-ඣානං-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධිසුඛං ආසෙවිතබ්බං භාවෙතබ්බං බහුලීකාතබ්බං, න භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමි. 'සුඛවිනිච්ඡයං ජඤ්ඤා, සුඛවිනිච්ඡයං ඤත්වා අජ්ඣත්තං සුඛමනුයුඤ්ජෙය්‍යා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'රහොවාදං න භාසෙය්‍ය, සම්මුඛා න ඛීණං භණෙ'ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ර භික්ඛවෙ, යං ජඤ්ඤා රහොවාදං අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සසක්කං තං රහොවාදං න භාසෙය්‍ය. යම්පි ජඤ්ඤා රහොවාදං භූතං තච්ඡං අනත්ථසංහිතං, තස්සපි සික්ඛෙය්‍ය අවචනාය. යඤ්ච ඛො ජඤ්ඤා රහොවාදං භූතං තච්ඡං අත්ථසංහිතං, තත්‍ර කාලඤ්ඤූ අස්ස තස්ස රහොවාදස්ස වචනාය. තත්‍ර භික්ඛවෙ, යංජඤ්ඤා සම්මුඛා ඛීණවාදං අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සසක්කං තං සම්මුඛා ඛීණවාදං න භාසෙය්‍ය. යම්පි ජඤ්ඤා සම්මුඛා ඛීණවාදං භූතං තච්ඡං අනත්ථසංහිතං, තස්සපි සික්ඛෙය්‍ය අවචනාය. යඤ්ච ඛො ජඤ්ඤා සම්මුඛා ඛීණවාදං භූතං තච්ඡං අත්ථසංහිතං, තත්‍ර කාලඤ්ඤූ අස්ස තස්ස සම්මුඛා ඛීණවාදස්ස වචනාය. 'රහොවාදං න භාසෙය්‍ය, සම්මුඛා න ඛීණං භණෙ'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'අතරමානොව භාසෙය්‍ය, නො තරමානො'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ර භික්ඛවෙ, තරමානස්ස භාසතො කායොපි කිලමති. චිත්තම්පි උපහඤ්ඤති. සරෙපි උපහඤ්ඤති. කණ්ඨොපි ආතුරීයති. අවිසට්ඨම්පි හොති අවිඤ්ඤෙය්‍යං තරමානස්ස භාසිතං, තත්‍ර භික්ඛවෙ, අතරමානස්ස භාසතො කායොපි න කිලමති. චිත්තම්පි න උපහඤ්ඤති. සරෙපි න උපහඤ්ඤති. කණ්ඨොපි න ආතුරීයති. විසට්ඨම්පි හොති විඤ්ඤෙය්‍යං අතරමානස්ස භාසිතං. 'අතරමානො ච භාසෙය්‍ය, නො තරමානො'ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

'ජනපදනිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, සමඤ්ඤං නාතිධාවෙය්‍යා'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: කථඤ්ච භික්ඛවෙ, ජනපදනිරුත්තියා ච අභිනිවෙසො හොති සමඤ්ඤාය ච අතිසාරො: ඉධ භික්ඛවෙ, තදෙවෙකච්චෙසු ජනපදෙසු පාතීති සඤ්ජානන්ති, පත්තන්ති සඤ්ජානන්ති, විත්ථන්ති[1] සඤ්ජානන්ති. සරාවන්ති සඤ්ජානන්ති, ධාරොපන්ති සඤ්ජානන්ති, පොණන්ති සඤ්ජානන්ති. පිසීලවන්ති[2] සඤ්ජානන්ති ඉති යථා යථා නං තෙසු තෙසු ජනපදෙසු සඤ්ජානන්ති. තථා තථා ථාමසා පරාමස්ස[3] අභිනිවිස්ස වොහරති: ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. එවං ඛො භික්ඛවෙ,

1. විත්තන්ති - මජසං, සිමු.
2. පිසීලන්ති - PTS, ස්‍යා.
3. පරාමාස - මජසං, සිමු.

මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසලදහම්න් වෙන් වැ මැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් තමා තුළ පැහැදීම් කරන සිත පිළිබඳ එකඟ බැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මේ නෛෂ්ක්‍රම්‍යසුඛ යයි කියනු ලැබේ. ප්‍රවිවේකසුඛ වූ උපශමසුඛ වූ සම්බොධසුඛ වූ මේ නෛෂ්ක්‍රම්‍යසුඛය ආසේවන කළයුතු යැ, හැවියයුතු යැ, බිහිලි කළයුතු යි. තෙල සුඛයෙන් නො බානේ යැ යි කියමි. ' විනිශ්චිතසුඛය දන්නේ යැ, විනිශ්චිතසුඛය දන අධ්‍යාත්මසුඛයෙහි යෙදෙන්නේ යැ ' යි, මෙසේ යම් බසෙක් කියනලද ද මෙය තෙල බස් පිණිස කියන ලදි.

' පිසුනුබස් නො බණන්නේ යැ, හමියෙහිදු කිළිටිබස් නො බණන්නේ යැ ' යි, මෙසේ තෙල කියනලද. තෙල කුමක් සඳහා කියනලද යැ යත් : මහණෙනි, එහිලා යම් රහොවාදයක් අභූත යැ, අතථ්‍ය යැ, අනර්ථ සංහිත යැ ' යි ඒකාන්තයෙන් දන්නේ ද ඒ රහෝවාදය නො කියන්නේයැ. යම් රහෝවාදයෙකුත් භූත යැ තථ්‍ය යැ, අනර්ථසංහිත යැ ' යි දන්නේ ද එ ද නො කියනු සඳහා හික්මෙන්නේ යැ, යළි යම් රහෝවාදයක් භූත යැ, තථ්‍ය යැ, අර්ථසංහිත යැ ' යි දන්නේ ද එහිලා ඒ රහෝවාදය කියනු සඳහා කල් දන්නේ වන්නේ යැ. මහණෙනි, යම් තැනෙක්හි හමුයෙහි කියන කිලිටි බසක් අභූත යැ, අතථ්‍ය යැ, අනර්ථසංහිත යැ ' යි එකැතින් දන්නේ ද ඒ කිලිටිබස හමුයෙහි නො බණන්නේ යැ, හමුයෙහි කියන යම් ඛීණවාදයෙකුත් භූත යැ තථ්‍ය යැ, අනර්ථසංහිත යැ යි දන්නේ ද එබස ද නො කියනු සඳහා හික්මෙන්නේ යැ, තවද හමුයෙහි කියන යම් කිලිටි බසක් භූත යැ තථ්‍ය යැ අර්ථසංහිත යැ ' යි දන්නේ ද එහිලා ඒ ක්ෂීණවාදය ප්‍රකාශ කරනු පිණිස කල් දන්නේ වන්නේ යැ. පිසුනුබස් නො බණන්නේ යැ, හමුයෙහි ගුණ කැන නො බණන්නේ යැ ' යි මෙසේ යම් බසෙක් කියනලද ද මේ තෙල බස් සඳහා කියනලදි.

' ත්වරිත නො වැ බණන්නේ යැ, ත්වරිත වැ නො බණන්නේ යැ ' යි මෙසේ තෙල කියන ලද. තෙලබස් කුමක් සඳහා කියනලද යැ යත් : මහණෙනි, එහිලා ත්වරමාන වැ බණන්නහුගේ කය ද ක්ලාන්ත වෙයි, සිත ද පෙළෙයි, ශබ්දය ද බිඳෙයි, ගෙල ද ගිලන් වෙයි. ත්වරමානයාගේ භාෂිතය අවිසෘෂ්ට ද අවිඥෙය ද වෙයි. මහණෙනි, එහිලා ත්වරිත නො වී බණන්නහුගේ කය ද නො වෙහෙසෙයි, සිත ද නො පෙළෙයි, හඬ ද නො බිඳෙයි, ගෙල ද නො ගිලන් වෙයි. ත්වරිත නො වූවහුගේ භාෂිතය විසෘෂ්ට වූයේ විඥෙය ද වෙයි. ' අතුරිත ව බණන්නේ ය , තුරිත වැ නො බණන්නේ යැ ' යි යමක් කියනලද ද තෙල බස් මේ සඳහා කියන ලදි.

ජනපද නිරුක්තියෙහි අභිනිවෙශ නො කරන්නේ යැ, ලෝක ප්‍රඥප්තිය නො ඉක්මවන් නේ යැ ' යි මෙසේ තෙල කියනලද තෙල බස් කුමක් සඳහා කියනලද යැ යත් : මහණෙනි, කිසෙයින් ජනපද නිරුක්තියෙහි අභිනිවෙශත් වේ ද ලොකව්‍යවහාරයා ගේ ඉක්මීමත් වේ ද යත් : මහණෙනි, මෙහි එ මැ බඳුන ඇතැම් ජනපදයෙක්හි ' පාති ' යයි හඳුනති, ' පත්ත ' යයි හඳුනති, ' විත්ථ ' යයි හඳුනති, ' සරාව ' යයි හඳුනති, ' ධාරොප ' යයි හඳුනති, ' පොණ ' යයි හඳුනති, ' පිසීලව ' යයි හඳුනති. මෙසේ ඒ බඳුන ඒ ඒ ජනවියෙහි යම් යම් සෙයෙකින් හඳුනත් ද ඒ ඒ පරිද්දෙන් දැඩි වැ පරාමර්ශ කොට අභිනිවෙශ කොට ' මෙ මැ සැබව, සෙස්ස සිසැ ' යි ව්‍යවහාර කෙරෙයි. මහණෙනි, මෙසෙයින් ජනපද

ජනපද නිරුත්තියා ච අභිනිවෙසො හොති. සමඤ්ඤාය ච අතිසාරො. කථඤ්ච භික්ඛවෙ, ජනපදනිරුත්තියා ච අනභිනිවෙසො හොති, සමඤ්ඤාය ච අනතිසාරො: ඉධ භික්ඛවෙ, තදෙව එකච්චෙසු ජනපදෙසු පාතීති සඤ්ජානන්ති. පත්තන්ති සඤ්ජානන්ති. විත්ථන්ති සඤ්ජානන්ති. සරවන්ති සඤ්ජානන්ති. ධාරොපන්ති සඤ්ජානන්ති. පොණන්ති සඤ්ජානන්ති. පිසීලවන්ති සඤ්ජානන්ති. ඉති යථා යථා නං තෙසු තෙසු ජනපදෙසු සඤ්ජානන්ති: ඉදං කිර මෙ ආයස්මන්තො සන්ධාය වොහරන්තීති. තථා තථා වොහරති අපරාමසති[1]. එවං ඛො භික්ඛවෙ ජනපදනිරුත්තියා ච අනභිනිවෙසො හොති. සමඤ්ඤාය ච අනතිසාරො ජනපදනිරුත්තිං නාභිනිවෙසෙය්‍ය සමඤ්ඤං නාතිධාවෙය්‍යා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

තත්‍ර භික්ඛවෙ, යො කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, යො කාමපටිසන්ධිසුඛිනො සොමනස්සානුයොගං අනනුයොගො හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො. සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, යො අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, යො අත්තකිලමථානුයොගං අනනුයොගො දුක්ඛං අනරියං අනත්ථසංහිතං, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො

තත්‍ර භික්ඛවෙ, යා'යං මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, යා'යං උස්සාදනා ච අපසාදනා ච නො ච ධම්මදෙසනා, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, යා'යං නෙවුස්සාදනා න අපසාදනා ධම්මදෙසනා ච. අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, යමිදං කාමසුඛං මීළ්හසුඛං පොථුජ්ජනසුඛං අනරියසුඛං, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො. සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, යමිදං නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධිසුඛං[2] අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

---

1. අපරාමසං - මජසං. 2. සම්බොධිසුඛං - PTS. (ඌනං)

නිරුක්තියෙහි අනභිනිවේශ ද ලෝකව්‍යවහාරයාගේ ඉක්ම යැමද වෙයි. තවද මහණෙනි, ජනපද නිරුක්තියෙහි අනභිනිවේශ ද ලෝකව්‍යවහාරය නො ඉක්මවීම ද කිසෙයින් වෙයි යත් : මහණෙනි, මෙහි එ මැ බඳුන ඇතැම් ජනපදයෙක්හි ' පාති ' යයි හඳුනති, ' පත්ත ' යයි හඳුනති, ' විත්ථ ' යයි හඳුනති, ' සරාව ' යයි හඳුනති, ' ධාරොප ' යයි හඳුනති, ' පොණ ' යයි හඳුනති, ' පිසීලව ' යයි හඳුනති. මෙසේ එ බඳුන ඒ ඒ ජනවියෙහි යම් යම් පරිද්දෙකින් හඳුනත් ද ' මෙ ආයුෂ්මත්හු මෙ සඳහා ව්‍යවහාර කෙරෙති ' යි ඒ ඒ පරිද්දෙන් ව්‍යවහාර කෙරෙයි. දැඩි කොට නො ගනී. මහණෙනි, මෙසෙයින් ජනපද නිරුක්තියෙහි අනභිනිවෙශ ද ලෝකව්‍යවහාරය නො ඉක්මවීම ද වෙයි. ' ජනපද නිරුක්තියෙහි අභිනිවේශ නො කරන්නේ යැ, ලෝකව්‍යවහාරය නො ඉක්මවන්නෙ යැ ' යි මෙසේ යමක් කියනලද ද තෙල මේ සඳහා කියන ලදි.

මහණෙනි, එහි කාමප්‍රතිසන්ධිසුඛයෙන් සුඛිත වුවහුගේ හීන වූ ග්‍රාමීණ වූ පුහුදුනන් කෙරෙහි වූ අනාර්‍ය්‍ය වූ අනර්ථකර වූ යම් සෞමනස්‍යානුයෝගයෙක් වේ ද තෙල දහම දුඃඛ සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යාප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම ක්ලෙශරණ සහිත යැ.

මහණෙනි, එහි කාමප්‍රතිසන්ධීන් සුඛිත වුවහුගේ හීන වූ ග්‍රාමීණ වූ පුහුදුනන් කෙරෙහි වූ අනාර්‍ය්‍ය වූ අනර්ථ නිඃශ්‍රිත වූ සෞමනස්‍යානුයෝගයෙහි නො යෙදීමෙක් ඇද්ද තෙල දහම දුඃඛ රහිත යැ, උපඝාත රහිත යැ, උපායාස රහිත යැ, පරිදහ රහිත යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ රහිත යැ.

මහණෙනි, එහි දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථාවහ වූ යම් අත්තකිලමථානුයෝගයෙක් වේ ද තෙල දහම දුඃඛ සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යාප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ සහිත යැ.

මහණෙනි, එහි දුඃඛ වූ අනාර්‍ය්‍ය වූ අනර්ථාවහ වූ අත්තකිලමථානුයෝගයෙහි යම් නො යෙදීමෙක් වේ ද තෙල දහම දුක් රහිත යැ, උපඝාත රහිත යැ, උපායාස රහිත යැ, පරිදහ රහිත යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ රහිත යැ.

මහණෙනි, එහි නුවණැස කරන මාර්ගඥාන කරන යම් මධ්‍යමප්‍රතිපදයෙක් තථාගතයන් විසින් අවබෝධ කරනලද ද උපශමය පිණිස අභිඥා පිණිස සම්බොධය පිණිස නිවන් පිණිස පවත්නේ වේ ද තෙල දහම දුඃඛ රහිත යැ, උපඝාත රහිත යැ, උපායාස රහිත යැ, පරිදහ රහිත යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ රහිත යැ.

මහණෙනි, එහි යම් උස්සාදනායෙක් අපසාදනායෙක් ඇද්ද, ධර්මදේශනායෙක් නැද්ද තෙල දහම දුක් සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යා ප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ සහිත යැ.

මහණෙනි, එහි යම් උස්සාදනායෙක් නැද්ද අපසාදනායෙක් නැද්ද ධර්මදේශනායෙක් ඇද්ද තෙල දහම දුක් රහිත යැ, උපඝාත රහිත යැ, උපායාස රහිත යැ, පරිදහ රහිත යැ, එයින් තෙල දහම කෙලෙස් රණ රහිත යැ.

මහණෙනි, එහි මීඪසුඛ වූ පෘථග්ජනසුඛ වූ අනාර්‍ය්‍යසුඛ වූ යම් කාමසුඛයෙක් ඇද්ද තෙල දහම දුඃඛ සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යා ප්‍රතිපත් වෙයි. එයින් තෙල දහම කෙලෙස්රණ සහිත යැ.

මහණෙනි, එහි යම් නෛෂ්ක්‍රම්‍යසුඛයෙක් ප්‍රවිවෙකසුඛයෙක් උපශමසුඛයෙක් සම්බොධිසුඛයෙක් ඇද්ද (යම් හෙයෙකින්) තෙල දහම නො දුක් වූයේ පීඩා රහිත වූයේ උපායාස රහිත වූයේ පරිදහ රහිත වූයේ සම්‍යක්ප්‍රතිපත් වී ද එහෙයින් තෙල දහම කෙලෙස්රණ රහිත යැ.

තත්‍ර භික්ඛවෙ, ය්වායං රහොවාදො අභූතො අතච්ඡො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං රහොවාදො භූතො තච්ඡො අනත්ථසංහිතො සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං රහොවාදො භූතො තච්ඡො අත්ථසංහිතො, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං සම්මුඛා ඛීණවාදො අභූතො අතච්ඡො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං සම්මුඛා ඛීණවාදො භූතො තච්ඡො අනත්ථසංහිතො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා. තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං සම්මුඛා ඛීණවාදො භූතො තච්ඡො අත්ථසංහිතො, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, යමිදං තරමානස්ස භාසිතං, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා, තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, යමිදං අතරමානස්ස භාසිතං, අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ජනපදනිරුත්තියා ච අභිනිවෙසො සමඤ්ඤාය ච අතිසාරො, සදුක්ඛො එසො ධම්මො සඋපඝාතො සඋපායාසො සපරිළාහො මිච්ඡාපටිපදා තස්මා එසො ධම්මො සරණො.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ජනපදනිරුත්තියා ච අනභිනිවෙසො සමඤ්ඤාය ච අනතිසාරො අදුක්ඛො එසො ධම්මො අනුපඝාතො අනුපායාසො අපරිළාහො සම්මාපටිපදා. තස්මා එසො ධම්මො අරණො.

තස්මාතිහ භික්ඛවෙ, සරණඤ්ච ධම්මං ජානිස්සාම. අරණඤ්ච ධම්මං ජානිස්සාම සරණඤ්ච ධම්මං ඤත්වා අරණඤ්ච ධම්මං ඤත්වා අරණපටිපදං පටිපජ්ජිස්සාමාති. එවං හි වො, භික්ඛවෙ, සික්ඛිතබ්බං. සුභූති ච පන භික්ඛවෙ, කුලපුත්තො අරණපටිපදං පටිපන්නොති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

අරණවිභඞ්ගසුත්තං නවමං.

මහණෙනි, එහි යම් රහෝවාදයෙක් අභූත වූයේ අතථ්‍ය වූයේ අනර්ථ සංහිත වූයේ ද තෙල දහම දුක් සහිත යැ, පීඩා සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යා ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙල දහම කෙලෙස්රණ සහිත වෙයි.

මහණෙනි, එහි යම් රහෝවාදයෙක් භූත වූයේ තථ්‍ය වූයේ අනර්ථ සංහිත ද තෙල දහම දුක් සහිත යැ, උපඝාත සහිත යැ, උපායාස සහිත යැ, පරිදහ සහිත යැ, මිථ්‍යාප්‍රතිපත් වෙයි. එහෙයින් තෙල සරණධර්ම යි.

මහණෙනි, එහි යම් රහොවාදයෙක් භූත තථ්‍ය අර්ථසංහිත වේ ද තෙල දහම අදුඃඛ යැ, අනුපඝාත යැ, අනුපායාස යැ, අපරිදහ යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ අරණධර්ම වෙයි.

මහණෙනි, එහි යම් හමුයෙහි අයුණු බිණීමෙක් අභූත අතථ්‍ය අනර්ථසංහිත වේ ද තෙල දහම සදුක්ඛ සඋපඝාත සඋපායාස සපරිදහ වූයේ මිථ්‍යාප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ සරණධර්ම වෙයි.

මහණෙනි, එහි යම් හමුයෙහි අයුණු බිණීමෙක් භූත තථ්‍ය අනර්ථසංහිත වේ ද තෙල දහම සදුක්ඛ යැ, සඋපඝාත යැ, සඋපායාස යැ, සපරිදහ යැ, මිථ්‍යාප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ සරණධර්ම වෙයි.

මහණෙනි, එහි යම් හමුයෙහි අයුණු බිණීමෙක් භූත තථ්‍ය අර්ථසංහිත වේ ද තෙල දහම අදුඃඛ යැ, අනුපඝාත යැ, අනුපායාස යැ, අපරිදහ යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ අරණධර්ම වෙයි.

මහණෙනි, තුරිත වූවහුගේ යම් භාෂිතයෙක් දුක් සහිත වූයේ ද තෙල දහම සඋපඝාත යැ, සඋපායාස යැ, සපරිදහ යැ, මිථ්‍යාප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ සරණධර්ම වෙයි.

මහණෙනි, එහි අතුරිත වූවහුගේ යම් භාෂිතයෙක් නො දුක් වූයේ ද තෙල දහම අනුපඝාත අනුපායාස අපරිදහ වූයේ සම්‍යක්ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ අරණධර්ම වේ.

මහණෙනි, එහි යම් ජනපදනිරුක්තියෙහි අභිනිවෙශයෙකුත් ලෝකව්‍යවහාරයෙහි අතිධාවනයෙකුත් දුක් සහිත වේ ද තෙල දහම සඋපඝාත සඋපායාස සපරිදහ වූයේ මිථ්‍යා ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ සරණධර්ම වේ.

මහණෙනි, එහි යම් ජනපදනිරුක්තියෙහි අභිනිවෙශයෙක් ලෝකව්‍යවහාරයෙහි අනතිධාවනයෙක් ඇද්ද තෙල දහම අදුඃඛ යැ, අනුපඝාත යැ, අනුපයාස යැ, අපරිදහ යැ, සම්‍යක්ප්‍රතිපත් වෙයි. එහෙයින් තෙලෙ අරණධර්ම නම් වෙ යයි.

මහණෙනි, එහෙයින් මෙහි ලා සරණධර්මයත් දැනගනුම්හ, අරණධර්මයත් දැනගනුම්හ. සරණධර්මයත් දැන අරණධර්මයත් දැන අරණප්‍රතිපදයෙහි පිළිපදුම්හ ' යි. මහණෙනි, තොප විසින් මෙසේ මැ හික්මියයුතු. තවද මහණෙනි, සුභූති කුලපුත්‍ර අරණ ප්‍රතිපදවට පිළිපන්නේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ අරණවිභඞ්ගය වදාළසේක. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගත්තාහ ' යි.

නව වැනි අරණවිභඞ්ග සූත්‍ර යි.

## 3. 4. 10

# ධාතුවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා මගධෙසු චාරිකං චරමානො යෙන රජගහං තදවසරි. යෙන භග්ගවො කුම්භකාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භග්ගවං කුම්භකාරං එතදවොච: 'සචෙ තෙ භග්ගව අගරු, විහරෙම ආවෙසනෙ[1] එකරත්තින්ති.

න ඛො මෙ භන්තෙ ගරු, අත්ථි චෙත්ථ පබ්බජිතො පඨමං වාසූපගතො. සචෙ සො අනුජානාති විහරථ[2] භන්තෙ, යථාසුඛන්ති.

තෙන ඛො පන සමයෙන පුක්කුසාති නාම කුලපුත්තො භගවන්තං උද්දිස්ස සද්ධා[3] අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො තස්මිං කුම්භකාරාවෙසනෙ පඨමං වාසූපගතො හොති. අථ ඛො භගවා යෙනායස්මා පුක්කුසාති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං පුක්කුසාතිං එතදවොච: 'සචෙ තෙ භික්ඛු අගරු, විහරෙම ආවෙසනෙ එකරත්තින්ති. උරුන්දං ආවුසො, කුම්භකාරාවෙසනං. විහරතායස්මා යථාසුඛන්ති.

අථ ඛො භගවා කුම්භකාරාවෙසනං පවිසිත්වා එකමන්තං තිණසන්ථරං පඤ්ඤපෙත්වා නිසීදි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අථ ඛො භගවා බහුදෙව රත්තිං නිසජ්ජාය වීතිනාමෙසි. ආයස්මාපි ඛො පුක්කුසාති බහුදෙව රත්තිං නිසජ්ජාය වීතිනාමෙසි. අථ ඛො භගවතො එතදහොසි: 'පාසාදිකං නු ඛො අයං කුලපුත්තො ඉරියති, යන්නූනාහං පුච්ඡෙය්‍යන්ති. අථ ඛො භගවා ආයස්මන්තං පුක්කුසාතිං එතදවොච: 'කංසි ත්වං භික්ඛු උද්දිස්ස පබ්බජිතො, කො වා තෙ සත්ථා, කස්ස වා ත්වං ධම්මං රොචෙසී'ති.

අත්ථාවුසො, සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තා'හං භගවන්තං උද්දිස්ස පබ්බජිතො. සො ච මෙ භගවා සත්ථා, තස්සාහං[4] භගවතො ධම්මං රොචෙමී'ති.

කහං පන භික්ඛු, එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො'ති:

අත්ථාවුසො, උත්තරෙසු ජනපදෙසු සාවත්ථි නාම නගරං, තත්ථ සො භගවා එතරහි විහරති අරහං සම්මාසම්බුද්ධො'ති.

'දිට්ඨපුබ්බො පන තෙ භික්ඛු, සො භගවා. දිස්වා ච පන ජානෙය්‍යාසී'ති.

---

1. විහරෙමු ආවෙසනෙ - මජසං. විහරාම නිවෙසනෙ - ස්‍යා.
2. විහර - PTS.
3. සද්ධාය - සීමු, මජසං, PTS.
4. තස්ස චාහං - මජසං.

# 3. 4. 10
# ධාතුවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධදනව්වයෙහි සැරිසරනසේක් රජගහනුවර කරා වැඩිසේක. වැඩ භග්ගව කුම්භකාරයා කරා එළැඹිසේක. එළැඹ භග්ගව කුම්භකාරයාහට තෙල වදාළෝ: භාර්ගවය, ඉදින් තොපට නො බර වී නම් එක් රැයක් කුඹල්හලෙහි වසම්හ'යි.

වහන්ස, මට නො බර වෙයි, වැළි එකෙක් ඇත, මෙහි කැල මැ වාසොපගත වූ පැවිද්දෙක් ඇත. ඉදින් හේ අනුදන්නේ වී නම් වහන්ස, යථාසුඛවිහරණ කළ මැනැවැ'යි.

එසමයෙහි පුක්කුසාති නම් කුලපුත් බුදුන් උදෙසා සැදැහැයෙන් ගෙන් නික්ම සසුන් වන්නේ වෙයි. හේ ඒ කුම්භකාරාවෙසනයෙහි කැල මැ වාසොපගත වෙයි. එසඳ බුදුහු පුක්කුසාති කුලපුතු කරා වැඩිසේක, වැඩ ආයුෂ්මත් පුක්කුසාති කුලපුත්හට තෙල වදාළෝ: ඉදින් මහණ, තොපට නො බර වී නම් එක් රැයක් සිප්හලෙහි වසම්හ'යි. ඇවත්නි, කුම්භකාරාවෙසනය සම්බාධ රහිත යැ. ආයුෂ්මතුන් යථාසුඛයෙන් වසන්නේ මැනැවැ.

එසඳ භාග්‍යවතුන් වහන්සේ කුඹල්සිප්හල් වැද එකත්පසෙක තණඇතිරිය පනවා පලක් අවුළුවා උපරිම කය සෘජු කොට තබා පරිමුඛ කොට සිහි එළවා වැඩ හුන්හු. එසඳ බුදුහු රැය බොහෝ වේලාවක් නිෂද්‍යායෙන් කල් ගැළවූසේක. ආයුෂ්මත් පුක්කුසාති කුලපුත් හු ද රැය බොහෝ වේලාවක් නිෂද්‍යායෙන් කල් ගැළවූහ. එසඳ භාග්‍යවතුන් වහන්සේට තෙල සිත් වී. මේ කුලපුත් ප්‍රසාද එළවනසුලු ඉරියවු කෙරෙයි, මම පුළුවුස් නෙම් මැනැවැ'යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් පුක්කුසාති කුලපුත්හට තෙල වදාළෝ. මහණ, තෝ කවරක්හු උදෙසා පැවිදි වූයෙහි? තාගේ ශාස්තෘ කවරෙක හො? කවරක්හුගේ දහම් තෝ රුස්ව? යි.

ඇවත්නි, සැහැකුලෙන් නික්ම පැවිදි වූ සැහැකුලපුත් මහණගොයුම් ඇත. ඒ භගවත් ගෞතමයන් වහන්සේගේ මෙසේ කල්‍යාණ වූ කීර්ති ශබ්දයෙක් උස්ව නැඟිණි: 'මෙකරුණිනුදු භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිද්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථීයහ, දෙව්මිනිස්නට ශාස්තෘයහ, බුද්ධයහ, භගවත්හ'යි. මම ඒ භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වූයෙමි. මට ඒ භාග්‍යවතුන් වහන්සේ ශාස්තෘයහ. මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ දහම් රුස්මි යි.

මහණ, ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ මෙකල කොහි වෙසෙත් ද? යි.

ඇවත්නි, උතුරු දනව්වයෙහි ශ්‍රාවස්ති නම් නගරයෙක් ඇත. එහි ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ මෙකල්හි වාස කරන සේක' යි.

මහණ, තොප විසින් ඒ භාග්‍යවත්හු දුටුවිරුහු ද? යළි දැක හඳුනන්නහු ද? යි.



33—ඒ 00502 (8/73)

න ඛො මෙ ආවුසො, දිට්ඨපුබ්බො සො භගවා. දිස්වා චාහං න ජානෙය්‍ය'න්ති.

අථ ඛො භගවතො එතදහොසි: 'මමං ඛ්වායං[1] කුලපුත්තො උද්දිස්ස පබ්බජිතො. යන්නූනාස්සාහං ධම්මං දෙසෙය්‍ය'න්ති. අථ ඛො භගවා ආයස්මන්තං පුක්කුසාතිං ආමන්තෙසි: 'ධම්මං තෙ භික්ඛු, දෙසිස්සාමි. තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී'ති.

එවමාවුසොති ඛො ආයස්මා පුක්කුසාති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

'ඡද්ධාතුරො[2] අයං භික්ඛු, පුරිසො ඡඵස්සායතනො අට්ඨාරසමනොපවිචාරො චතුරාධිට්ඨානො, යත්ථ ඨිතං මඤ්ඤස්සවා නප්පවත්තන්ති, මඤ්ඤස්සවෙ ඛො පන නප්පවත්තමානෙ මුනි සන්තොති වුච්චති. පඤ්ඤං නප්පමජ්ජෙය්‍ය. සච්චමනුරක්ඛෙය්‍ය. චාගමනුබ්‍රූහෙය්‍ය. සන්තිමෙව සො සික්ඛෙය්‍යා'ති. අයමුද්දෙසො ඡධාතු විභඞ්ගස්ස.

'ඡද්ධාතුරො[2] අයං භික්ඛු, පුරිසො'ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං. පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු. 'ඡද්ධාතුරො[2]. අයං භික්ඛු, පුරිසො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'ඡඵස්සායතනො අයං භික්ඛු, පුරිසො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුසම්ඵස්සායතනං සොතසම්ඵස්සායතනං ඝානසම්ඵස්සායතනං ජිව්හාසම්ඵස්සායතනං කායසම්ඵස්සායතනං මනොසම්ඵස්සායතනං. 'ඡඵස්සායතනො අයං භික්ඛු, පුරිසො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'අට්ඨාරසමනොපවිචාරො අයං භික්ඛු, පුරිසො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානියං රූපං උපවිචරති. දොමනස්සට්ඨානියං රූපං උපවිචරති. උපෙක්ඛට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති. දොමනස්සට්ඨානියං ධම්මං උපවිචරති. උපෙක්ඛට්ඨානියං ධම්මං උපවිචරති. ඉති ඡ සොමනස්සුපවිචාරා ඡ දොමනස්සුපවිචාරා ඡ උපෙක්ඛුපවිචාරා. 'අට්ඨාරසමනොපවිචාරො අයං භික්ඛු, පුරිසො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

'චතුරාධිට්ඨානො අයං භික්ඛු, පුරිසො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: පඤ්ඤාධිට්ඨානො සච්චාධිට්ඨානො චාගාධිට්ඨානො උපසමාධිට්ඨානො. 'චතුරාධිට්ඨානො අයං භික්ඛු, පුරිසො'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. {මමඤ්ච ඛ්වායං – මජසං, සිමු.
   {මං ඛ්වායං – PTS.
2. ඡධාතුරො – මජසං, සිමු, PTS.

ඇවැත්නි, මා විසින් ඒ භාග්‍යවත්හු නුදුටුවිරූහ. මම් දුක ද නො හඳුනම්'යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිත් වී: 'මේ කුලපුත් මා උදෙසා පැවිදි වූයේ වන, මම් ඔහට දහම් දෙසම් නම් මැනැවැ' යි. ඉක්බිති බුදුහු ආයුෂ්මත් පුක්කුසාති කුලපුත් ඇමැතූසේක: 'මහණ, තොපට දහම් දෙසන්නෙමි, ඒ අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි'යි.

'එසේ යැ ඇවැත්නි'යි ආයුෂ්මත් පුක්කුසාති භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. භාග්‍යවතුන් වහන්සේ මෙසේ ධාතුවිභඞ්ග වදාළෝ.

මහණ, මේ පුරුෂ සවැදෑරුම් ධාතුමාත්‍රයෙක. සවැදෑරුම් ස්පර්ශායතන මාත්‍රයෙක. අටළොස් මනොපවිචාරමාත්‍රයෙක, සතර ප්‍රතිෂ්ඨා ඇත්තේ යැ. යම් අධිෂ්ඨානයෙක පිහිටියහුට උත්සන්න වූ (තෘෂ්ණාදි) මඤ්ඤනාවෝ නො පවතිත් ද (ඒ සතර අධිෂ්ඨානයෝ යි.) උත්සන්න වූ මඤ්ඤනාව නො පවත්නා කල්හි ක්ෂීණාශ්‍රව මුනි තෙම 'උපශාන්ත' යයි කියනු ලැබේ. (අර්හත්ඵලප්‍රඥ ප්‍රතිවෙධය පිණිස) සමාධිවිදර්ශනා ප්‍රඥයෙහි අප්‍රමත්ත වන්නේ යැ. වාක්සත්‍යය රක්නේ යැ. ක්ලෙශපරිත්‍යාගය වඩන්නේ ය. ඒ මහණ ක්ලෙශොපශමය මැ හික්මෙන්නේ යයි. ෂඩ්ධාතුවිභඞ්ගයාගේ මේ උද්දෙශ යැ.

'මහණ, මේ පුරුෂ සවැදෑරුම් ධාතුමාත්‍රයෙකැ'යි මෙසේ මෙසේ කියන ලද, මෙසේ බස් කුමක් සඳහා කියනලද ද යත්: පෘථිවිධාතු යැ අබ්ධාතු යැ තෙජොධාතු යැ වායොධාතු යැ ආකාශධාතු යැ විඥනධාතු යි. 'මහණ, මේ පුරුෂ සවැදෑරුම් ධාතුමාත්‍රයෙකැ'යි මෙසේ යමක් කියනලද ද මෙය මෙසේ සඳහා කියනලදි.

'මහණ, මේ පුරුෂ සවැදෑරුම් ස්පර්ශායතනමාත්‍රයෙකැ'යි මෙසේ මෙසේ කියන ලද. මෙසේ කුමක් සඳහා කියනලද ද යත්: චක්ඛු සම්ඵස්සායතන යැ සොතසම්ඵස්සායතන යැ ඝානසම්ඵස්සායතන යැ ජිව්හාසම්ඵස්සායතන යැ කායසම්ඵස්සායතන යැ මනොසම් ඵස්සායතන යි. 'මහණ, මේ පුරුෂ සවැදෑරුම් ස්පර්ශායතනමාත්‍රයෙකැ'යි මෙසේ යම් බසෙක් කියන ලද ද මෙය මෙසේ පිණිස කියන ලදි.

'මහණ, මේ පුරුෂ අටළොස් මනොපවිචාරමාත්‍රයෙකැ'යි මෙසේ මෙසේ බසෙක් කියන ලද , මෙසේ බස් කුමක් පිණිස කියන ලදයැ යත්: ඇසින් රූ දැක සොම්නසට කරුණු වූ රූපය විචාර කෙරෙයි. දොම්නසට කරුණු වූ රූපය විචාර කෙරෙයි. උපෙක්ෂාවට කරුණු වූ රූපය විචාර කෙරෙයි. කනින් ශබ්ද අසා . . . නැහැයෙන් ගඳ ආඝ්‍රාණ කොට . දිවින් රස ආස්වාද කොට . . . කයින් පහස ස්පර්ශ කොට . . . සිතින් දහම් දැන සොම්නසට කරුණු වූ දහම විචාර කෙරෙයි. දොම්නසට කරුණු වූ දහම විචාර කෙරෙයි. උපෙක්ෂාවට කරුණු වූ දහම විචාර කෙරෙයි. මෙසේ සොමනස්සූපවිචාරයෝ සදෙනෙක. දොමනස්සූපවිචාරයෝ සදෙනෙක, උපෙක්ඛූපවිචාරයෝ සදෙනෙක. 'මහණ, මේ පුරුෂ අටළොස් මනොපවිචාරමාත්‍රයෙකැ'යි මෙසේ යම් බසෙක් කියනලදද මෙය මෙසේ පිණිස කියන ලදි.

'මහණ, මේ පුරුෂ චතුරධිෂ්ඨානමාත්‍රයෙකැ'යි මෙසේ මෙසේ බසෙක් කියන ලද, මෙසේ කුමක් පිණිස කියන ලද යැ යත්: ප්‍රඥධිෂ්ඨාන යැ සත්‍යාධිෂ්ඨාන යැ ත්‍යාගාධිෂ්ඨාන යැ උපශමාධිෂ්ඨාන යි. 'මහණ, මේ පුරුෂ චතුරධිෂ්ඨානමාත්‍රයෙකැ'යි මෙසේ යම් බසෙක් කියන ලද ද, මෙය මෙසේ පිණිස කියන ලදි.

'පඤ්ඤං නප්පමජ්ජෙය්‍ය සච්චමනුරක්ඛෙය්‍ය චාගමනුබ්‍රෑහෙය්‍ය සන්තිමෙව සො සික්ඛෙය්‍යා'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: කථඤ්ච භික්ඛු, පඤ්ඤං නප්පමජ්ජති: ඡ ඉමා භික්ඛු, ධාතුයො: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු.

කතමා ච භික්ඛු, පඨවිධාතු: පඨවිධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච භික්ඛු, අජ්ඣත්තිකා පඨවිධාතු: යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං. සෙය්‍යථීදං: කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨී අට්ඨිමිඤ්ජා[1] වක්කං හදයං, යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං. අයං වුච්චති භික්ඛු, අජ්ඣත්තිකා පඨවිධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු, පඨවිධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති, පඨවිධාතුයා චිත්තං විරාජෙති.

කතමා ච භික්ඛු, ආපොධාතු: ආපොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච භික්ඛු, අජ්ඣත්තිකා ආපොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං. සෙය්‍යථීදං: පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං. යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං. අයං වුච්චති භික්ඛු, අජ්ඣත්තිකා ආපොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආපොධාතු යා ච බාහිරා ආපොධාතු, ආපොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආපොධාතුයා නිබ්බින්දති, ආපොධාතුයා චිත්තං විරාජෙති.

කතමා ච භික්ඛු, තෙජොධාතු: තෙජොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච භික්ඛු, අජ්ඣත්තිකා තෙජොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං. සෙය්‍යථීදං: යෙන ච සන්තප්පති[2] යෙන ච ජීරීයති[3], යෙන ච පරිඩය්හති, යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං. අයං වුච්චති භික්ඛු, අජ්ඣත්තිකා තෙජොධාතු. යා චෙව ඛො පන අජ්ඣත්තිකා තෙජොධාතු යා ච බාහිරා තෙජොධාතු, තෙජොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා තෙජොධාතුයා නිබ්බින්දති, තෙජොධාතුයා චිත්තං විරාජෙති.

1. අට්ඨිමිඤ්ජං - මජ්ජං.
2. සන්තපති - සීමු.
3. ජරීයති - සීමු, PTS.

'ප්‍රඥයෙහි නො පමා වන්නේ යැ, සත්‍යය රක්නේ යැ, ත්‍යාගය වඩනේ යැ, හේ ශාන්තිය මැ හික්මෙන්නේ යැ'යි මෙසේ තෙල බසෙක් කියනලද, තෙල බස් කුමක් පිණිස කියනලද යැ යත් : මහණ, කෙසේ ප්‍රඥව පමා නො කරන්නේ වේ ද : මහණ, මේ ධාතුහු සදෙනෙකි; පෘථිවීධාතු යැ අබ්ධාතු යැ තෙජොධාතු යැ වායොධාතු යැ ආකාශධාතු යැ විඥනධාතු යි.

මහණ, පෘථිවීධාතු කවර? පෘථිවීධාතු ආධ්‍යාත්මික වැ ඇත බාහිර වැ ඇත. මහණ ආධ්‍යාත්මිකපෘථිවීධාතු කවර? ආධ්‍යාත්මික වූ තමා කෙරෙහි පිහිටි තද වූ රළු වූ උපාදින්නක වූ යමක් ඇද්ද, හේ මෙසේ යැ : කෙශයෝ යැ රෝමයෝ යැ නඛයෝ යැ දන්තයෝ යැ ත්වක් යැ මාංශ යැ නහර යැ අස්ථිහු යැ අස්ථිමජ්ජා යැ වකුගඩු යැ හෘදය යැ අක්මා යැ ක්ලොම යැ ප්ලීහ යැ පුප්ඵුස යැ අන්ත යැ අන්තගුණ යැ නො පැසුණු අහර යැ මල යැ, යළි අන්‍ය වූත් අධ්‍යාත්ම වූ තමා කෙරෙහි පිහිටි තද වූ රළු වූ යම් කිසි උපාදින්නක යෙක් ඇද්ද, මහණ, මේ ආධ්‍යාත්මික පෘථිවීධාතු යයි කියනු ලැබේ. තවද යම් ආධ්‍යාත්මික පෘථිවීධාතුවකුත් ඇද්ද, යම් බාහ්‍ය වූ පෘථිවී ධාතුවකුත් ඇද්ද, තෙල පෘථිවීධාතු මැ යැ. තෙල මාගේ නො වෙයි. තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ යයි මෙසේ තෙල පෘථිවීධාතුව ඇතිසැටි විදර්ශනාප්‍රඥයෙන් දක්කයුතු යැ. මෙසේ තෙල යථාභූත කොට විදසුන් නුවණින් දක පෘථිවීධාතුයෙහි නිර්වෙදයට පැමිණෙයි. පෘථිවී ධාතුයෙහි සිත නො අලවයි.

මහණ, අබ්ධාතු කවරැ? අධ්‍යාත්මික අබ්ධාතුයෙක් ඇත. බාහ්‍ය අබ්ධාතුයෙක් ඇත. මහණ, ආධ්‍යාත්මික අබ්ධාතු කවරැ? අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ යම් ආපයෙක් අබ්ගතයෙක් කර්මසමුත්ථානයෙක් ඇද්ද, හේ මෙසේ යැ : පිත යැ සෙම යැ සැරව යැ ලෙහෙ යැ සෝදිය යැ මෙද තෙලැ කඳුළු යැ වුරුණුතෙලැ කෙළ යැ මුකුණු යැ සඳමිදුළු යැ සුලුදිය යි. යළි අන්‍ය වූත් අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ යම්කිසි ආපයෙක් අබ්ගතයෙක් උපාදින්නකයෙක් ඇද්ද මහණ, මේ 'ආධ්‍යාත්මික අබ්ධාතු' යයි කියනුලැබේ. යම් ආධ්‍යාත්මික අබ්ධාතුයෙක් ඇද්ද බාහ්‍ය වූ යම් අබ්ධාතුවකුත් ඇද්ද, තෙල අබ්ධාතු මැ යැ, තෙල මාගේ නො වෙයි. තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ යයි මෙසේ තෙල යථාභූත කොට සම්‍යක්ප්‍රඥයෙන් දක්කයුතු යැ. මෙසේ තෙල යථාභූත කොට සම්‍යක්ප්‍රඥයෙන් දක අබ්ධාතුයෙහි නිර්වෙදයට පැමිණෙයි. අබ්ධාතුයෙහි සිත නො අලවයි.

මහණ, තෙජොධාතු කවරැ? ආධ්‍යාත්මික වූ තෙජොධාතුයෙක් ඇත. බාහිර වූ තෙජොධාතුයෙක් ඇත. මහණ, ආධ්‍යාත්මික තෙජොධාතු කවරැ? තමා කෙරෙහි පිහිටි තෙජොගත වූ උපාදින්නක වූ යම් ආධ්‍යාත්මික තෙජසෙක් වේ ද, ඒ කෙසේ යැ : යම් තෙජසෙකින් තැවේ ද යම් තෙජසෙකින් දිරා ද යම් තෙජසෙකින් දැවේ ද යම් තෙජසෙකින් බිදි පී කෑ ලෙවි දය මොනොවට පැසීමට යේ ද, මෙයින් බැහැර යම්කිසි ද වූ තමා කෙරෙහි පිහිටි තෙජොගත වූ උපාදින්නක වූ යම් ආධ්‍යාත්මික තෙජසෙක් වේ ද මහණ, මේ ආධ්‍යාත්මික තෙජොධාතු යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික තෙජොධාතුයෙක් ඇද්ද යම් බාහිර තෙජොධාතුයෙක් ඇද්ද තෙල තෙජොධාතු මැ යැ. එය 'තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මා ආත්ම නො වෙයි, මෙසේ මේ යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු. මෙසේ මේ යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දන තෙජොධාතුයෙහි කලකිරෙයි. තෙජොධාතුයෙහි සිත නො අලවයි.

කතමා ච භික්ඛු, වායොධාතු: වායොධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා කතමා ච භික්ඛු, අජ්ඣත්තිකා වායොධාතු: යං අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං. සෙය්‍යථීදං: උද්ධඞ්ගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨසයා[1] වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා අස්සාසො පස්සාසො, ඉති යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං. අයං වුච්චති භික්ඛු, අජ්ඣත්තිකා වායොධාතු, යා චෙව ඛො පන අජ්ඣත්තිකා වායොධාතු යා ච බාහිරා වායොධාතු, වායොධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති, වායොධාතුයා චිත්තං විරජෙති.

කතමා ච භික්ඛු, ආකාසධාතු: ආකාසධාතු සියා අජ්ඣත්තිකා සියා බාහිරා. කතමා ච භික්ඛු, අජ්ඣත්තිකා ආකාසධාතු: යං අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං උපාදින්නං, සෙය්‍යථීදං: කණ්ණච්ඡිද්දං නාසච්ඡිද්දං මුඛද්වාරං යෙන ච අසිතපීතඛායිතසායිතං අජ්ඣොහරති, යත්ථ ච අසිතපීතඛායිතසායිතං සන්තිට්ඨති, යෙන ච අසිතපීතඛායිතසායිතං අධොභාගා[2] නික්ඛමති, යං වා පනඤ්ඤම්පි කිඤ්චි අජ්ඣත්තං පච්චත්තං ආකාසං ආකාසගතං අඝං අඝගතං විවරං විවරගතං අසම්ඵුට්ඨං මංසලොහිතෙහි උපාදින්නං. අයං වුච්චති භික්ඛු, අජ්ඣත්තිකා ආකාසධාතු, යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආකාසධාතු, යා ච බාහිරා ආකාසධාතු, ආකාසධාතුරෙවෙසා. තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආකාසධාතුයා නිබ්බින්දති, ආකාසධාතුයා චිත්තං විරජෙති.

අථාපරං විඤ්ඤාණං යෙව අවසිස්සති පරිසුද්ධං පරියොදාතං. තෙන ච විඤ්ඤාණෙන කිං ජානාති: සුඛන්තිපි විජානාති, දුක්ඛන්තිපි විජානාති, අදුක්ඛමසුඛන්තිපි විජානාති. සුඛවෙදනියං භික්ඛු, ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා, සො සුඛං වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව සුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මතීති පජානාති.

දුක්ඛවෙදනියං භික්ඛු, ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා සො දුක්ඛං වෙදනං වෙදියමානො දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව දුක්ඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා සා නිරුජ්ඣති· සා වූපසම්මතීති පජානාති.

අදුක්ඛමසුඛවෙදනියං භික්ඛු, ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. සො අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව අදුක්ඛමසුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා, යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මතීති පජානාති.

---

1. කොට්ඨාසයා - මජසං, සීමු.
2. අධොභාගං - මජසං.

මහණ, වායොධාතු කවරැ? ආධ්‍යාත්මික වායොධාතුයෙක් ඇත. බාහිර වායෝ ධාතුයෙක් ඇත. මහණ, ආධ්‍යාත්මික වායොධාතු කවරැ? තමා කෙරෙහි පිහිටි වායොගත වූ උපාදින්න වූ යම් ආධ්‍යාත්මික වායොධාතුයෙක් වේ ද, ඒ කෙසේ යැ? උද්ධඞ්ගම වාතයෝ යැ අධොගමවාතයෝ යැ කුච්ජිසයවාතයෝ යැ කොට්ඨසය වාතයෝ යැ අඞ්ගමඞ්ගානුසාරී වාතයෝ යැ ආශ්වාස ප්‍රශ්වාස යි. මෙසේ තමා කෙරෙහි වූ වායොගත වූ උපාදින්න වූ තදන්‍ය යම්කිසි වාතයෙක් ඇද්ද, මහණ, මේ 'ආධ්‍යාත්මිකවායොධාතු' යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික වායොධාතුයෙක් ඇද්ද යම් බාහිර වායොධාතුයෙක් ඇද්ද තෙල වායො ධාතු මැ වෙයි. ඒ 'තෙල මා ගැති නො වෙයි. මම තෙලෙ නො වෙමි. තෙලෙ මා ආත්ම නො වෙයි. මෙසේ මේ යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු යැ, මෙසේ මේ යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දුන වායොධාතු-යෙහි කලකිරෙයි. වායොධාතුයෙහි සිත නො අලවයි.

මහණ, ආකාසධාතු කවරැ? ආධ්‍යාත්මික ආකාසධාතුයෙක් ඇත. බාහිර ආකාස ධාතුයෙක් ඇත. මහණ, ආධ්‍යාත්මික ආකාසධාතු කවරැ? තමා කෙරෙහි වූ ආකාසගත වූ උපාදින්න වූ යම් ආධ්‍යාත්මික ආකාසයෙක් වේ ද, ඒ කෙසේ යැ: කන්සිදුරැ නැහැසිදුරැ මුවදෙරැ යම් ආකාසයෙකින් බිදි පි කැ ලෙවි දුය ගිලගනී ද, යම් අහසෙක බිදි පි කැ ලෙවි දුය සිටුනේ වේ ද, යම් අහසෙකින් බිදි පි කැ ලෙවි දැ අධොභාගයෙන් නික්මේ ද, තමා කෙරෙහි වූ ආකසගත වූ ඝර්ෂණ රහිත වූ අඝගත වූ විවර වූ විවරගත වූ මස්ලෙහෙයින් නො පහළ උපාදින්න වූ යම් තදන්‍ය කිසිදු ආකාසයෙක් වේ ද, මහණ, මේ 'ආධ්‍යාත්මික ආකාසධාතු' යයි කියනු ලැබේ. යම් ආධ්‍යාත්මික ආකාසධාතුයෙක් ඇද්ද යම් බාහිර ආකාසධාතුයෙක් ඇද්ද, තෙල ආකාසධාතු මැ යැ. එය 'තෙල මා ගැති නො වෙයි, මම තෙල නො වෙමි, තෙලෙ මා ආත්ම නො වෙයි. මෙසේ මේ යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු. මෙසේ තෙල යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දුන ආකාසධාතු යෙහි කලකිරෙයි. ආකාසධාතුයෙහි සිත නො අලවයි.

ඉක්බිති අපර වූ පරිශුද්ධ වූ පර්‍ය්‍යවදත වූ විඥනය මැ ඉතිරි වෙයි. ඒ විඥනයෙන් කුමක් දනී ද? 'සුඛ' යයි ද දනී. 'දුඃඛ' යයි ද දනී. 'අදුඃඛ අසුඛ' යයි ද දනී. මහණ, සුඛවේදනාවට කරුණු වූ ස්පර්ශය නිසා සුඛවෙදනා උපදී. හේ සුඛවෙදනා විඳුනේ 'සුඛවේදනා විඳිමි' යි දනී. ඒ සුඛවේදනීය ස්පර්ශයාගේ නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනායෙක් ඇද්ද, සුඛවෙදනිය ස්පර්ශය නිසා උපන් සුඛවෙදනායෙක් ඇද්ද, ඒ වෙදනා නිරුද්ධ වේ යයි ඒ වේදනා සන්හිඳේ යයි නුවණින් දනී.

මහණ, දුඃඛවෙදනාවට කරුණු වූ ස්පර්ශය නිසා දුඃඛවේදනා උපදී. හේ දුඃඛවෙදනා විඳුනේ 'දුඃඛවේදනා විඳිමි'යි නුවණින් දනී. එ මැ දුඃඛවෙදනාවට කරුණු වූ ස්පර්ශයාගේ නිරොධයෙන් එයින් හටගත් යම් වෙදයිතයෙක් ඇද්ද දුඃඛවෙදනාවට කරුණු වූ ස්පර්ශය නිසා උපන් දුඃඛවෙදනායෙක් ඇද්ද, ඒ නිරුද්ධ වේ යයි ඒ සන්හිඳේ යයි නුවණින් දනී.

මහණ, උපෙක්ෂාවෙදනාවට කරුණු වූ ස්පර්ශය නිසා උපෙක්ෂා වෙදනා උපදී. හේ උපෙක්ෂාවෙදනා විඳුනේ උපෙක්ෂාවෙදනා විඳිමි'යි නුවණින් දනී. උපෙක්ෂාවෙදනා වට කරුණු වූ එ මැ ස්පර්ශයාගේ නිරොධයෙන් එයින් හටගත් යම් වේදයිතයෙක් ඇද්ද උපෙක්ෂා වෙදනාවට කරුණු වූ ස්පර්ශය නිසා උපන් උපෙක්ෂාවෙදනා ඇද්ද, ඒ වෙදනා නිරුද්ධ වේ යයි ඒ වේදනා සන්හිඳේ යයි නුවණින් දනී.

සෙය්‍යථාපි භික්ඛු ද්වින්නං කට්ඨානං සමඵස්සසමොධානා[1] උස්මා ජායති, තෙජො අභිනිබ්බත්තති. තෙසං යෙව ද්වින්නං කට්ඨානං නානාභාවා විනික්ඛෙපා යා තජ්ජා උස්මා, සා නිරුජ්ඣති සා වූපසම්මති. එවමෙව ඛො භික්ඛු, සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. සො සුඛං වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව සුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මතීති පජානාති.

දුක්ඛවෙදනියං භික්ඛු, ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. සො දුක්ඛං වෙදනං වෙදියමානො දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව දුක්ඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා සා නිරුජ්ඣති සා වූපසම්මතීති පජානාති.

අදුක්ඛමසුඛවෙදනියං භික්ඛු, ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. සො අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමීති පජානාති. තස්සෙව අදුක්ඛමසුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා සා නිරුජ්ඣති සා වූපසම්මතීති පජානාති.

අථාපරං උපෙක්ඛායෙව අවසිස්සති පරිසුද්ධා පරියොදාතා මුදු ච කම්මඤ්ඤා ච පභස්සරා ච. සෙය්‍යථාපි භික්ඛු, දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා උක්කං බන්ධෙය්‍ය, උක්කං බන්ධිත්වා උක්කාමුඛං ආලිම්පෙය්‍ය, උක්කාමුඛං ආලිම්පෙත්වා සණ්ඩාසෙන ජාතරූපං ගහෙත්වා උක්කාමුඛෙ පක්ඛිපෙය්‍ය. තමෙනං කාලෙන කාලං අභිධමෙය්‍ය. කාලෙන කාලං උදකෙන පරිප්ඵොසෙය්‍ය. කාලෙන කාලං අජ්ඣුපෙක්ඛෙය්‍ය. තං හොති ජාතරූපං ධන්තං[2] සුධන්තං නිද්ධන්තං නීහටං[3] නීහටකසාවං[4] මුදු ච කම්මඤ්ඤං ච පභස්සරඤ්ච. යස්සා යස්සා ච පිළන්ධනවිකතියා ආකඞ්ඛති, යදි පවට්ටිකාය යදි කුණ්ඩලාය යදි ගීවෙය්‍යකාය යදි සුවණ්ණමාලාය, තඤ්චස්ස අත්ථං අනුභොති.

එවමෙව ඛො භික්ඛු, අථාපරං උපෙක්ඛායෙව අවසිස්සති පරිසුද්ධා පරියොදාතා මුදු ච කම්මඤ්ඤා ච පභස්සරා ච. සො එවං පජානාති: 'ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං ආකාසානඤ්චායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං. එවං මෙ අයං උපෙක්ඛා තන්නිස්සිතා තදුපාදානා චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය. ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං විඤ්ඤාණඤ්චායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං. එවං මෙ අයං උපෙක්ඛා තන්නිස්සිතා තදුපාදානා චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය. ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං ආකිඤ්චඤ්ඤායතනං උපසංහරෙයං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං. එවං මෙ අයං උපෙක්ඛා තන්නිස්සිතා තදුපාදානා චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය. ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසංහරෙය්‍යං. තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං, එවං මෙ අයං උපෙක්ඛා තන්නිස්සිතා තදුපාදානා චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍යා'ති.

1. සඞ්ඝට්ටා සමොධානා - මජ්ඣං, සීමු.
2. ධන්තං - මජ්ඣං ඌනං.
3. නිහතං - සීමු.
4. නින්නීතකසාවං - සීමු, මජ්ඣං, PTS.

මහණ, යම් පරිදි උභය කාෂ්ටයන්ගේ ස්පර්ශසමවධානයෙන් හුණුසුම් හටගනී ද ගිනික් නිපදවා ද ඒ උභයකාෂ්ටයන්ගේ මැ වෙන් වීමෙන් විසුරුවාලීමෙන් එයින් උපන් යම් උණුසුමෙක් වේ නම් ඒ නිරුද්ධ වේ ද ඒ සන්හිඳේ ද, මහණ, එපරිදි මැ සුඛවේදනාවට කරුණු වූ පහස නිසා සුඛවේදනා උපදී. හේ සුඛවේදනා විඳුනේ 'සුඛවේදනා විඳිමි'යි ප්‍රකාරයෙන් දනී. සුඛ වේදනාවට කරුණු වූ එ මැ ස්පර්ශයාගේ නිරොධයෙන් එයින් උපන් යම් වේදයිතයෙක් ඇද්ද, සුඛ වේදනාවට කරුණු වූ පහස නිසා උපන් සුඛවේදනාවෙක් ඇද්ද, ඒ නිරුද්ධ වේ යයි ඒ සන්හිඳේ යයි ප්‍රකාරයෙන් දනී.

මහණ, දුඃඛවේදනාවට කරුණු වූ පහස නිසා දුඃඛවේදනා උපදී. හේ දුඃඛවේදනා විඳුනේ 'දුඃඛවේදනා විඳිමි'යි ප්‍රකාරයෙන් දනී. දුඃඛවේදනාවට කරුණු වූ එ මැ ස්පර්ශයාගේ නිරෝධයෙන් එයින් උපන් යම් වේදයිතයෙක් ඇද්ද දුඃඛවේදනාවට කරුණු වූ පහස නිසා උපන් දුඃඛවේදනාවෙක් ඇද්ද, ඒ නිරුද්ධ වේ යයි එය සන්හිඳේ යයි ප්‍රකාරයෙන් දනී.

මහණ, උපෙක්ෂාවේදනාවට කරුණු වූ පහස නිසා උපෙක්ෂාවේදනා උපදී. හේ උපෙක්ෂාවේදනා විඳුනේ 'උපෙක්ෂාවේදනා විඳිමි'යි ප්‍රකාරයෙන් දනී. උපේක්ෂා වේදනාවට කරුණු වූ එ මැ ස්පර්ශයාගේ නිරොධයෙන් එයින් උපන් යම් වේදයිතයෙක් ඇද්ද, උපෙක්ෂාවේදනාවට කරුණු වූ පහස නිසා උපන් උපේක්ෂාවේදනායෙක් ඇද්ද ඒ නිරුද්ධ වේ යයි ඒ සන්හිඳේ යයි ප්‍රකාරයෙන් දනී.

ඉක්බිති පරිශුද්ධ වූ පයර්‍යවදත වූ මෘදු වූ කර්මණ්‍ය වූ ප්‍රභාස්වර වූ උපේක්ෂාව මැ ඉතිරි වෙයි. මහණ යම් පරිදි දක්ෂ වූ ස්වර්ණකාරයෙක් වේවයි ස්වර්ණකාර අන්තේවාසික යෙක් වේවයි කෝවයක් බඳනේ වේ ද කෝවය බැඳ කෝවාමුව ආලිම්පනය කෙරේ ද කෝවාමුව ආලිම්පන කොට අඩුවෙන් රන් ගෙන කෝවාමුවෙහි බහනේ වේ ද, ඒ රන කලින් කල පිඹිනේ වේ ද කලින්කල දියෙන් ඉස්නේ වේ ද කලින් කල උපේක්ෂා කෙරේ ද ඒ රන මල පිඹහළ මොනොවට පිඹහළ නිඃශෙෂයෙන් පිඹහළ නෙරාගත් නෙරළු කසට ඇති මෘදු වූත් කර්මණ්‍ය වූත් ප්‍රභාස්වර වූත් රනෙක් වෙයි. යම් යම් පිළන්ධනවිකෘතියක් පිණිස කැමැති වේ ද හිණුදම් පිණිස වේවයි කුණ්ඩලාභරණ පිණිස වේවයි ග්‍රීවාභරණ පිණිස වේවයි රන් මල්දම් පිණිස වේවයි ඔහුගේ ඒ අර්ථය ද සිද්ධ කෙරෙයි.

මහණ, එපරිදි මැ ඉක්බිති පරිශුද්ධ වූ පයර්‍යවදත වූ මෘදු වූ කර්මණ්‍ය වූ ප්‍රභාස්වර වූ උපේක්ෂාව මැ ඉතිරි වෙයි. හේ මෙසේ දනී : ඉදින් මම මෙසේ පරිශුද්ධ වූ මෙසේ පයර්‍යවදත වූ මේ උපේක්ෂාව ආකාසානඤ්චායතනයට එළවන්නෙම් නම් තදනුධර්ම වූ චිත්තය ද වඩන්නෙම් නම් මෙසේ මාගේ මේ උපේක්ෂාව එය ඇසිරි කළා එය උපාදන විසින් ගත්ති දීර්ඝකාලයක් සිටුනී යැ ඉදින් මම මෙසේ පිරිසුදු වූ මෙසේ පයර්‍යවදත වූ මේ උපේක්ෂාව විඤ්ඤාණඤ්චායතනයට එළවන්නෙම් නම් තදනුධර්මචිත්තය ද වඩන්නෙම් නම් තන්නිශ්‍රිත වූ තදුපාදන වූ මෙසේ මාගේ මේ උපේක්ෂාව දීර්ඝකාලයක් සිටුනී යැ. මෙසේ පරිශුද්ධ වූ මෙසේ පයර්‍යවදත වූ මේ උපේක්ෂාව ඉදින් මම ආකිඤ්චඤ්ඤායතනයට එළවන්නෙම් නම් තදනුධර්මචිත්තය ද වඩන්නෙම් නම් තන්නිඃශ්‍රිත වූ තදුපාදන වූ මෙසේ මාගේ මේ උපේක්ෂාව දිගුකල් සිටුනී යැ. ඉදින් මම මෙසේ පරිශුද්ධ වූ මෙසේ පයර්‍යවදත වූ මේ උපේක්ෂාව නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළවන්නෙම් නම් තදනු ධර්මචිත්තය ද වඩන්නෙම් නම් තන්නිඃශ්‍රිත වූ තදුපාදන වූ මෙසේ මාගේ මේ උපේක්ෂාව දිගුකල් සිටුනී යැ කියා යි.

සො එවං පජානාති: ‘ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං ආකාසානඤ්චායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං, සඞ්ඛතමෙතං. ඉමඤ්චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං විඤ්ඤාණඤ්චායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං, සඞ්ඛතමෙතං. ඉමං චෙ අහං උපෙක්ඛං එවංපරිසුද්ධං එවංපරියොදාතං ආකිඤ්චඤ්ඤායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං, සඞ්ඛතමෙතං. ඉමඤ්චෙ අහං උපෙක්ඛං එවං පරිසුද්ධං එවංපරියොදාතං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසංහරෙය්‍යං, තදනුධම්මඤ්ච චිත්තං භාවෙය්‍යං, සඞ්ඛතමෙතන්ති. සො නෙව තං අභිසඞ්ඛරොති, නාභිසඤ්චෙතයති භවාය වා විභවාය වා. සො අනභිසඞ්ඛරොන්තො අනභිසඤ්චෙතයන්තො භවාය වා විභවාය වා, න කිඤ්චි ලොකෙ උපාදියති. අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති. ‘ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා’ති පජානාති.

සො සුඛං චෙ වෙදනං වෙදෙති. සා අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති. දුක්ඛං චෙ වෙදනං වෙදෙති. සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති පජානාති. අභිනන්දිතාති පජානාති, අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදෙති, සා අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති.

සො සුඛං චෙ වෙදනං වෙදෙති, විසංයුත්තො තං න වෙදෙති. සො දුක්ඛං චෙ වෙදනං වෙදෙති, විසංයුත්තො තං න වෙදෙති.[1] අදුක්ඛමසුඛං චෙ වෙදනං වෙදෙති, විසංයුත්තො තං න වෙදෙති.[1] සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා පරම්මරණා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති’ති පජානාති.

සෙය්‍යථාපි භික්ඛු, තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලප්පදීපො ඣායති, තස්සෙව තෙලස්ස ච වට්ටියා ච පරියාදානා අඤ්ඤස්ස ච අනුපාහාරා[2] අනාහාරො නිබ්බායති. එවමෙව ඛො භික්ඛු, කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා පරම්මරණා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති’ති පජානාති. තස්මා එවං සමන්නාගතො භික්ඛු ඉමිනා පරමෙන පඤ්ඤාධිට්ඨානෙන සමන්නාගතො හොති. එසා හි භික්ඛු, පරමා අරියා පඤ්ඤා යදිදං සබ්බදුක්ඛක්ඛයෙ ඤාණං.

තස්ස සා විමුත්ති සච්චෙ ඨිතා අකුප්පා හොති. තං හි භික්ඛු මුසා, යං මොසධම්මං. තං සච්චං, යං අමොසධම්මං නිබ්බානං. තස්මා එවං සමන්නාගතො භික්ඛු ඉමිනා පරමෙන සච්චාධිට්ඨානෙන සමන්නාගතො හොති. එතං හි භික්ඛු, පරමං අරියසච්චං යදිදං අමොසධම්මං නිබ්බානං.

---

1. විසංයුත්තො නං වෙදෙති - මජ්ඣං, PTS.
2. අනුපාදානා - මජ්ඣං සිමු.
   අනුපහාරා - ස්‍යා.

හේ මෙසේ දනී : 'ඉදින් මම මෙසේ පිරිසිදු වූ මෙසේ පර්‍ය්‍යවදත වූ මේ උපෙක්ෂාව ආකාසානඤ්චායතනයට එළවම් නම් තදනුධර්ම චිත්තය ද වඩම් නම් තෙල සඞ්ඛතධර්මයෙකි. ඉදින් මම මෙසේ පිරිසුදු වූ මෙසේ පර්‍ය්‍යවදත වූ මේ උපෙක්ෂාව විඤ්ඤාණඤ්චායතනයට එළවම් නම් තදනුධර්ම චිත්තය ද වඩම් නම් තෙල සඞ්ඛතධර්මයෙකි. ඉදින් මම මෙසේ පිරිසුදු වූ මෙසේ පර්‍ය්‍යවදත වූ මේ උපෙක්ෂාව ආකිඤ්චඤ්ඤායතනයට එළවම් නම් තදනුධර්ම චිත්තය ද වඩම් නම් තෙල සඞ්ඛත ධර්මයෙකි. ඉදින් මම මෙසේ පිරිසුදු වූ මෙසේ පර්‍ය්‍යවදත වූ මේ උපෙක්ෂාව නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළවම් නම් තදනුධර්ම චිත්තය ද වඩම් නම් තෙල සඞ්ඛතධර්මයෙකි කියා යි. හේ එය අභිසංස්කරණ නො කෙරෙයි. භවය පිණිස චේතයි. විභවය පිණිස චේතයි අභිසඤ්චේතනා නො කෙරෙයි. හේ අභිසංස්කරණ නො කරන්නේ අභිසඤ්චේතනා නො කරන්නේ භවය පිණිස හෝ විභවය පිණිස හෝ ලොකයෙහි කිසිදු උපාදන වශයෙන් නොගනී. උපාදන වශයෙන් නො ගන්නේ තෘෂ්ණා වශයෙන් පරිතස්සනා නො කෙරෙයි. තණ්හා පරිතස්සනා නො කරනුයේ තමා තුළ මැ පිරිනිවෙයි. ජාතිය ක්ෂය වී. බඹසර වැස නිමවනලද, කරණී කරන ලද, මේ අර්හත්ත්වය පිණිස කළමනා අන් කිසෙක් නැති'යි දනී.

ඉදින් හේ සුඛවෙදනා විඳී නම් ඒ වේදනා අනිත්‍ය යැ'යි දනී. 'බැසගෙන සිටුනට නො නිසි යයි දනී. 'තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් අභිනන්‍දන කරනට නො නිසි යැ'යි දනී. ඉදින් දුඃඛවෙදනා විඳී නම් ඒ වෙදනා අනිත්‍ය යැ'යි දනී. ගැලගෙන සිටුනට නො නිසි යැ'යි දනී. තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් අභිනන්‍දනයට නො නිසි යැ'යි දනී. ඉදින් උපෙක්ෂා වෙදනා විඳී නම් ඒ වෙදනා අනිත්‍ය යැ'යි දනී. ගැලගන්නට නො නිසි යැ'යි දනී. අභිනන්‍දනාර්හ නො වෙති'යි දනී.

ඉදින් හේ සුඛවෙදනා විඳී නම් විසංයුක්ත වැ ඒ සුඛවෙදනා නො විඳී. ඉදින් හේ දුඃඛ වේදනා විඳී නම් විසංයුක්ත වැ ඒ දුඃඛවෙදනා නො විඳී. ඉදින් හේ උපෙක්ෂාවෙදනා විඳී නම් විසංයුක්ත වැ ඒ උපෙක්ෂා වෙදනා නො විඳී. හේ කායපර්‍ය්‍යන්තිකවෙදනා විඳුනේ කායපර්‍ය්‍යන්තික වේදනා විඳිමි'යි දනී. ජීවිතපර්‍ය්‍යන්තිකවේදනා විඳුනේ ජීවිතපර්‍ය්‍යන්තික වෙදනා විඳිමි'යි දනී. කාබුන් මරණින් මතු ජීවිතපර්‍ය්‍යාදනයෙන් මතු මෙලොව මැ අනභිනන්දිත වූ සියලු වෙදනාවෝ මේ ආයතනයන්හි මැ සන්හිඳෙති'යි දනී.

මහණ, යම් පරිදි තෙල් ද නිසා වැටි ද නිසා තෙල්පහන් දිලියේ ද ඒ තෛලයාගේ ද වැටියගේ ද ක්ෂය වැ යැමෙන් අනෙකක්හුගේ නො ගැනීමෙන් අනාහාර වැ නිවීයේ ද මහණ, එපරිදි මැ කායපර්‍ය්‍යන්තික වෙදනා විඳුනේ කායපර්‍ය්‍යන්තිකවෙදනා විඳිමි'යි දනී. ජීවිතපර්‍ය්‍යන්තිකවේදනා විඳුනේ ජීවිතපර්‍ය්‍යන්තිකවෙදනා විඳිමි'යි දනී. කාබුන් මරණින් මතු ජීවිතක්ෂයෙන් මතු මේ ආයතනයන්හි මැ අනභිනන්‍දන සියලු වෙදනාවෝ සන්හිඳෙති'යි දනී. එහෙයින් මෙසේ සමන්වාගත මහණ මේ පරම ප්‍රඥාධිෂ්ඨානයෙන් සමන්වාගත වූයේ නම් වෙයි. මහණ, මේ පරම ආර්‍ය්‍යප්‍රඥාව යි. කිමෙක යත් : සර්වදුඃඛක්ෂයෙහි ඥානය යි.

ඔහුගේ ඒ අර්හත්ඵලවිමුක්තිය පරමාර්ථසත්‍ය වූ නිවනෙහි සිටියා (කෙලෙසුන් විසින්) අකොප්‍ය වෙයි. මහණ, යමක් නැසෙන පියවි ඇද්ද එය විතථ වෙයි. නො නැසෙන පියවි ඇති යම් නිවනෙක් ඇද්ද, එය සත්‍ය වෙයි. එහෙයින් මෙසේ එයින් සමන්වාගත මහණ මේ පරමාර්ථසත්‍යාධිෂ්ඨානයෙන් සමන්විත වෙයි. මහණ, යම් නො නැසෙන ස්වභාව වූ නිවනෙක් ඇද්ද තෙල පරම වූ ආර්‍ය්‍යසත්‍ය යි.

තස්සෙව ඛො පන පුබ්බෙ අවිද්දසුනො උපධී හොන්ති සමත්තා සමාදින්නා. ත්‍යාස්ස පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා. තස්මා එවං සමන්නාගතො භික්ඛු ඉමිනා පරමෙන චාගාධිට්ඨානෙන සමන්නාගතො හොති. එසො හි භික්ඛු, පරමො අරියො චාගො යදිදං සබ්බූපධිපටිනිස්සග්ගො. තස්සෙව ඛො පන පුබ්බෙ අවිද්දසුනො අභිජ්ඣා හොති ඡන්දො සාරාගො, ස්වාස්ස පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො.

තස්සෙව ඛො පන පුබ්බෙ අවිද්දසුනො ආඝාතො හොති බ්‍යාපාදො සම්පදොසො, ස්වාස්ස පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො.

තස්සෙව ඛො පන පුබ්බෙ අවිද්දසුනො අවිජ්ජා හොති සම්මොහො සම්පදොසො, ස්වාස්ස පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. තස්මා එවං සමන්නාගතො භික්ඛු ඉමිනා පරමෙන උපසමාධිට්ඨානෙන සමන්නාගතො හොති. එසො හි භික්ඛු, පරමො අරියො උපසමො යදිදං රාගදොසමොහානං උපසමො.

'පඤ්ඤං නප්පමජ්ජෙය්‍ය, සච්චමනුරක්ඛෙය්‍ය, චාගමනුබ්‍රූහෙය්‍ය, සන්තිමෙව සො සික්ඛෙය්‍යා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

යත්ථ ඨිතං මඤ්ඤුස්සවා නප්පවත්තන්ති. මඤ්ඤුස්සවෙ ඛො පන අප්පවත්තමානෙ මුනි සන්තොති වුච්චතී'ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: අස්මීති භික්ඛු මඤ්ඤිතමෙතං. අයමහමස්මීති මඤ්ඤිතමෙතං. භවිස්සන්ති මඤ්ඤිතමෙතං. න භවිස්සන්ති මඤ්ඤිතමෙතං. රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. මඤ්ඤිතං භික්ඛු රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං. සබ්බමඤ්ඤිතානං ත්වෙව භික්ඛු, සමතික්කමා මුනි සන්තොති වුච්චති. මුනි ඛො පන භික්ඛු, සන්තො න ජායති න ජීයති න මීයති න කුප්පති න විහෙසති. තම්පිස්ස භික්ඛු නත්ථි, යෙන ජායෙථ, අජායමානො කිං ජීයිස්සති, අජීයමානො කිං මීයිස්සති, අමීයමානො කිං කුප්පිස්සති. අකුප්පමානො කිස්ස විහෙසති. 'යත්ථ ඨිතං මඤ්ඤුස්සවා නප්පවත්තන්ති. මඤ්ඤුස්සවෙ ඛො පන නප්පවත්තමානෙ මුනි සන්තොති වුච්චතී'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. ඉමං ඛො මෙ ත්වං භික්ඛු, සඞ්ඛිත්තෙන ඡ ධාතුවිභඞ්ගං ධාරෙහීති.

---

1. අනභාවං කතා – මජසං.

පෙර පෘථග්ජන කාලයෙහි අවිද්‍යායෙන් යුත් ඔහු විසින් මැ සම්පූර්ණ කරනලද ගන්නාලද ස්කන්ධාදි උපධීහු වෙත් ද ඔවුහු ඔහුට ප්‍රහීණ වූවාහු වෙති. උදුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දහු අනුඅභාවය කරන ලද්දහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත්. එහෙයින් මෙයින් සමන්වාගත මහණ මේ උත්තම වූ ත්‍යාගාධිෂ්ඨානයෙන් සමන්විත වෙයි. මහණ, යම් සියලු උපධීන්ගේ දුරලීමෙක් ඇද්ද තෙල උත්තම වූ ආර්‍ය්‍යත්‍යාගයවෙයි. පෙර පෘථග්ජන වූ අවිද්‍යායෙන් යුත් අභිධ්‍යායෙක් ඡන්දයෙක් බලවත් රාගයෙක් වේ ද, ඔහුට ඒ රාගය ප්‍රහීණ වෙයි. උදුන්මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනු අභාවය කරනලද්දේ මත්තෙහි නූපදනා පියවි ඇත්තේ වෙයි.

පෙර අවිද්‍යායෙන් යුත් ඔහුට මැ ආඝාතයෙක් ව්‍යාපාදයෙක් සම්ප්‍රදෙෂයෙක් වේ ද ඔහුට ඒ සම්ප්‍රදෙෂය ප්‍රහීණ වෙයි. උදුන්මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරනලද්දේ අනුඅභාවය කරනලද්දේ මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තේ වෙයි.

පෙර පෘථග්ජන කාලයෙහි අවිද්‍යායෙන් යුත් ඔහුට මැ යම් අවිද්‍යායෙක් සම්මොහයෙක් සම්ප්‍රදෙෂයෙක් වී ද, ඔහුට ඒ සම්මොහ සම්ප්‍රදෙෂය ප්‍රහීණ වෙයි. උදුන්මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරනලද්දේ අනාභාවය කරනලද්දේ මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තේ එහෙයින් මේ උපශමයෙන් සමන්විත වූ මහණ මේ උත්තම වූ උපශමාධිෂ්ඨානයෙන් සමන්වාගත වෙයි. මහණ, තෙල උත්තම වූ ආර්‍ය්‍ය උපශමය වෙයි, යම් රාගද්වෙෂමොහයන්ගේ උපශමයෙක් ඇද්ද එයයි.

'විදර්ශනාප්‍රඥායෙහි නො පමා වන්නේ යැ, වාක්සත්‍යය රක්නේ යැ, ක්ලෙශත්‍යාගය වඩනේ යැ, හේ නිර්වාණ ශාන්තිය මැ හික්මෙන්නේ යයි මෙසේ යමක් කියනලද ද තෙල බස් මේ සඳහා කියනලදි.

යම් අධිෂ්ඨානයෙකැ පිහිටියහුට උත්සන්න වූ (තෘෂ්ණාදි) මඤ්ඤනාවෝ නො පවතිත් ද, උත්සන්න වූ මඤ්ඤනාව නො පවත්නා කල්හි ක්ෂීණාස්‍රව මුනි තෙම උප ශාන්ත යැ යි කියනු ලැබෙයි යන තෙල බස් කුමක් සඳහා කියනලද ද යත්: මහණ (මම නිත්‍ය) වෙමි' යන තෙල දෘෂ්ටිකල්පනයෙකි, 'මේ මම වෙමි' යන තෙල තෘෂ්ණා මඤ්ඤිතයෙකි. '(මම) අනායෙහි වෙමි' යන තෙල දෘෂ්ටිකල්පනයෙකි. 'අනායෙහි නො වෙමි' යන තෙල දෘෂ්ටිකල්පනයෙකි. 'රූපවත් වෙමි' යන තෙල දෘෂ්ටිකල්පන යෙකි 'අරූපි ගවමි' යන තෙල දෘෂ්ටිකල්පනහෙකි. 'සංඥවත් වෙමි' යන තෙල දෘෂ්ටිකල්පනයෙකි. 'අසංඥ වෙමි' යන තෙල දෘෂ්ටි කල්පනයෙකි. 'නෛවසංඥනාසංඥ වෙමි' යන තෙල දෘෂ්ටිකල්පනයෙකි. මහණ මඤ්ඤිතය රොගයෙක. මඤ්ඤිතය ගණ්ඩයෙක. මඤ්ඤිතය ශල්‍යයෙක. මහණ මඤ්ඤිතයන්ගේ මැ, ඉක්මවාලීමෙන් ක්ෂීණාස්‍රව මුනි 'ශාන්ත යැ'යි කියනුලැබේ. තවද මහණ, ක්ෂීණාස්‍රව මුනි ශාන්ත වූයේ නූපදී, නො දිරයි, නො මියෙයි, කෙලෙසුන් විසින් අකොප්‍ය වෙයි. නො වෙහෙසෙයි. මහණ, යම් කරුණෙකින් උපදනේ ද, එකරුණ ඔහුට නැත. නූපදනේ කිම දිරන්නේ ද, නො දිරනුයේ කිම මියන්නේ ද, නො මියනුයේ කිම (කෙලෙසුන් විසින්) කොප්‍ය වේ ද, අකොප්‍ය වනුයේ කුමක් හෙයින් වෙහෙසේ ද? යම් අධිෂ්ඨානයෙක පිහිටියහුට උත්සන්න වූ (තෘෂ්ණාදි මඤ්ඤනාවෝ නො පවතිත් ද උත්සන්න වූ මඤ්ඤනාව නො පවත්නා කල්හි ක්ෂීණාස්‍රව මුනි තෙම 'උපශාන්ත යැ'යි කියනුලැබේ යයි මෙසේ යමක් කියනලද ද, මෙය තෙල කරුණ සඳහා කියනලදි. මහණ, තෙපි මා විසින් සැකෙවින් ප්‍රකාශ කළ මේ ෂඩ්ධාතුවිභඞ්ගය ධරව යි.

අථ ඛො ආයස්මා පුක්කුසාති 'සත්ථා කිර මෙ අනුප්පත්තො, සුගතො කිර මෙ අනුප්පත්තො, සම්මාසම්බුද්ධො කිර මෙ අනුප්පත්තො'ති උට්ඨායාසනා එකංසං චීවරං කත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: 'අච්චයො මං භන්තෙ, අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං, යොහං භගවන්තං ආවුසොවාදෙන සමුදාචරිතබ්බං අමඤ්ඤිස්සං. තස්ස මෙ භන්තෙ, භගවා, අච්චයං අච්චයතො පටිග්ගණ්හාතු ආයතිං සංවරායා'ති.

තග්ඝ ත්වං භික්ඛු, අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං, යං මං ත්වං ආවුසොවාදෙන සමුදාචරිතබ්බං අමඤ්ඤිත්ථ. යතො ච ඛො ත්වං භික්ඛු, අච්චයං අච්චයතො දිස්වා යථා ධම්මං පටිකරොසි. තං තෙ මයං පටිග්ගණ්හාම. වුද්ධි හෙසා භික්ඛු, අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථා ධම්මං පටිකරොති, ආයතිං සංවරං ආපජ්ජතී'ති.

ලභෙය්‍යාහං භන්තෙ, භගවතො සන්තිකෙ උපසම්පදන්ති.

පරිපුණ්ණං පන තෙ භික්ඛු, පත්තචීවරන්ති:

න ඛො මෙ භන්තෙ, පරිපුණ්ණං පත්තචීවරන්ති.

න ඛො භික්ඛු, තථාගතා අපරිපුණ්ණපත්තචීවරං උපසම්පාදෙන්තීති.

අථ ඛො ආයස්මා පුක්කුසාති භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පත්තචීවරපරියෙසනං පක්කාමි.

අථ ඛො ආයස්මන්තං පුක්කුසාතිං පත්තචීවරපරියෙසනං චරන්තං භන්තගාවී[1] ජීවිතා වොරොපෙසි.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා, තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: 'යො සො භන්තෙ, පුක්කුසාති නාම කුලපුත්තො භගවතා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො, සො කාලඞ්කතො. තස්ස කා ගති, කො අභිසම්පරායො'ති.

පණ්ඩිතො භික්ඛවෙ, පුක්කුසාති කුලපුත්තො, පච්චපාදි ධම්මස්සානුධම්මං. න ච මං ධම්මාධිකරණං විහෙඨෙසි. පුක්කුසාති භික්ඛවෙ, කුලපුත්තො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො, තස්මා ලොකාති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ධාතුවිභඞ්ගසුත්තං දසමං.

---

1. {විභන්තගාවී - සීමු.
{විභන්තා ගාවී - මජසං.

එසඳ පුක්කුසාති කුලපුත් මාගේ ශාස්තෲන් වහන්සේ වැඩිසේක, මාගේ සුගතයන් වහන්සේ වැඩිසේක, මාගේ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ වැඩිසේකැ'යි හුනස්නෙන් නැඟී සිවුර එකස් කොට ගෙන බුදුන්ගේ දෙපාමුල හිසින් වැටී සිට වැදහෙව භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ: වහන්ස, වරද මා මැඩගත. බාලභාවය වූ සැටියෙනි, මුඪභාවය වූ සැටියෙනි, අකුශලභාවය වූ සැටියෙනි, මම භාග්‍යවතුන් වහන්සේ 'ආවුසො වාදයෙන්' බිණියයුතු කොට සිතීම් ද එහෙයිනි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ වරද වරද විසින් පිළිගන්නාසේක්වා, ආයතිසංවරය පිණිස යයි.

මහණ, බාලයකු මැඩගන්නා සෙයින් මුඪයකු මැඩගන්නා සෙයින් අදක්ෂයකු මැඩ ගන්නා සෙයින් එකාන්තයෙන් වරද තා මැඩගත, යම් හෙයෙකින් තෝ මා 'ආවුසොවාද යෙන්' බිණියයුතු කොට සිතුයෙහි ද එහෙයිනි. මහණ, යම් හෙයෙකින් තෝ වරද වරද විසින් දක ධර්මානුකූල කොට ප්‍රතික්‍රියා කෙරෙහි ද, අපි තාගේ ඒ ක්‍රියා පිළිගනුම්හ. මහණ, යමෙක් වරද වරද විසින් දක ධර්මය නො ඉක්ම පිළියම් කෙරේ ද, ආයතිසංවරයට පැමිණේ ද, මෙල ආර්‍ය්‍යවිනයෙහි වෘද්ධියෙක් මැ යැ.

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි උපසම්පදව ලබම්වා!

මහණ, තාගේ පාසිවුරු පරිපූර්ණ වැ ඇද්ද ?

වහන්ස, මාගේ පාසිවුරු පරිපූර්ණ නො වෙ.

මහණ, තථාගතවරු නො පිරිපුන් පාසිවුරු ඇතියහු උපසපන් නො කෙරෙති.

එසඳ පුක්කුසාති කුලපුත් භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට පාත්‍රචීවර පර්‍ය්‍යෙෂණයට බැස ගියේ.

ඉක්බිති පාසිවුරු පිරිසෙයුම් කරන පුක්කුසාති කුලපුත්හු භ්‍රාන්ත වූ දෙනක් දිවියෙන් තොර කළා.

එසඳ බොහෝ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළෝ : වහන්ස, පුක්කුසාති නම් යම් කුලපුතෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂිප්ත අවවාදයෙකින් ඔවා දෙනලද ද, හේ කාලක්‍රියා කෙළේ, ඔහුගේ ගති කවර? පරලොව කවරෙ? යි.

මහණෙනි, පුක්කුසාති කුලපුත් පණ්ඩිත යැ, ධර්මානුධර්ම අවබොධ කෙළේ යැ. ධර්මහෙතුයෙන් මා නො පෙළී. මහණෙනි, පුක්කුසාති කුලපුත් පස්වැදෑරුම් ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ඕපපාතික වැ ඒ බඹලොවින් වටාලා නො එනසුලු වැ එහි මැ පිරිනිවන්පානේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මෙල වදළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්‍දන කළහ.

දස වැනි ධාතුවිභඞ්ග සූත්‍ර යි.

# 3. 4. 11

## සච්චවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

තථාගතෙන භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. දුක්ඛනිරොධ-ගාමිනියා පටිපදාය[1] අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. තථාගතෙන භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

සෙවෙථ භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානෙ. භජථ භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානෙ. පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීනං. සෙය්‍යථාපි භික්ඛවෙ, ජනෙත්ති[2] එවං සාරිපුත්තො. සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං ඛො මොග්ගල්ලානො. සාරිපුත්තො භික්ඛවෙ, සොතාපත්තිඵලෙ විනෙති. මොග්ගල්ලානො උත්තමත්ථෙ. සාරිපුත්තො භික්ඛවෙ, පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුන්ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො අචිරපක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

---

1. . . . ගාමිනී පටිපදා – සීමු.
2. ජනෙත්තා – මජසං, සීමු.

# 3. 4. 11
# සච්චවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස්නුවර මිගදය නම් ඉසිපතනාරාමයෙහි වැඩ වාස කරනසේක. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා මහණුන් ඇමතූසේක. ඒ මහණහු 'වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක :

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස ඉසිපතන නම් මුවළැව්හි දී මහණකු විසින් වේවයි බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොවැ කිසිවක්හු විසින් වේවයි, නො පැවැත්විය හෙන අනුත්තර ධර්මචක්‍රය පවත්වනලද, එ කිසෙ යැ යත් : චතුරාර්‍ය්‍යසත්‍යයන් පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභාගය පළට කිරීම යි. කවර සතර දෙනකුන්ගේ යැ යත් : දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යැ, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයාගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යැ, දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයාගේ පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යැ, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයාගේ පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යි. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස ඉසිපතන නම් මුවළැව්හි දී මහණකු වේවයි, බමුණකු වේවයි, දෙවියකු වේවයි, මරකු වේවයි, බඹකු වේවයි, ලොවැ කිසිවක්හු විසින් වේවයි, නො පැවැත්විය හෙන අනුත්තර ධර්මචක්‍රය පවත්වන ලද. මේ චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය ප්‍රකට කිරීම යි.

මහණෙනි, සැරියුත්මුගලන් දෙදෙන සෙවනය කරව. මහණෙනි, සැරියුත්මුගලන් දෙදෙන භජනය කරව, ඒ භික්ෂූහු දෙදෙන පණ්ඩිතයහ, සබ්‍රහ්මචාරීනට අනුග්‍රාහකයෝ යි. මහණෙනි, ශාරිපුත්‍රයෝ විජාතමාතෘ සදෘශයහ. මහණෙනි, මෞද්ගල්‍යායනයෝ පොෂක උපමාතෘ සදෘශයහ. මහණෙනි, ශාරිපුත්‍රයෝ සෝවන්පෙළෙහි විනයන කෙරෙති, මෞද්ගල්‍යායනයෝ උත්තමාර්ථ වූ අර්හත්වයෙහි පිහිටුවති. මහණෙනි, ශාරිපුත්‍රයෝ චතුරාර්‍ය්‍යසත්‍යයන් විස්තර විසින් පවසන්නට දෙසන්නට පනවන්නට පිහිටුවන්නට විවරණ කරන්නට විභාග කරන්නට ප්‍රකට කරන්නට ප්‍රභූ වෙති ' යි.

භාග්‍යවතුන් වහන්සේ මේ වදාළහ. සුගතයන් වහන්සේ මේ වදරා හුනස්නෙන් නැඟී විහාරයට වැඩියෝ.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වඩනා හා ම 'ඇවත්නි, මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවත්නි' යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය සච්චවිභඞ්ග සූත්‍ර වදාළෝ.



34—ඒ 00502 (8/73)

තථාගතෙන ආවුසො, අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. කතමෙසං චතුන්නං: දුක්ඛස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානකම්මං. දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

කතමඤ්චාවුසො දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

කතමාචාවුසො ජාති: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති[1] ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චතාවුසො ජාති.

කතමාචාවුසො ජරා: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චතාවුසො ජරා.

කතමඤ්චාවුසො[2] මරණං: යං තෙසං තෙසං[3] සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො, ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චතාවුසො මරණං.

කතමො චාවුසො සොකො: යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො, අයං වුච්චතාවුසො සොකො.

කතමො චාවුසො පරිදෙවො: යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං, අයං වුච්චතාවුසො පරිදෙවො.

කතමං චාවුසො දුක්ඛං: යං ඛො ආවුසො කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චතාවුසො දුක්ඛං.

කතමං චාවුසො දොමනස්සං: යං ඛො ආවුසො චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං වෙදයිතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චතාවුසො දොමනස්සං.

---

1. නිබ්බත්ති අභිනිබ්බත්ති - PTS. 2. කතමා චාවුසො - සීමු.
3. යා තෙසං - මජසං.

ඇවත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස ඉසිපතන නම් මුවළැව්හි දී මහණකු වේවයි, බමුණකු වේවයි, දෙවියකු වේවයි, මරකු වේවයි, බඹකු වේවයි, ලොවැ කිසිවක්හු විසින් හෝ නො පැවැත්විය හෙන අනුත්තර ධර්මචක්‍රය පවත්වන ලද. ඒ කිසෙ යැ යත් : චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණය යි. කවර සතර දෙනාකුන්ගේ යැ යත් : දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යැ, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයාගේ පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උක්තානීකරණ යැ, දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයාගේ පැවැසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යැ, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදර්‍ය්‍යසත්‍යයාගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානීකරණ යි.

ඇවත්නි, දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරෙ යැ : ජාතිය ද දුක් යැ, ජරාව ද දුකැ, මරණ ද දුකැ, ශොකපරිදෙවදුඃඛදෞර්මනස්‍ය–උපායාසයෝ ද දුක්ඛ. රිසි යමක් නො ලබා නම් එ ද දුකැ, සැකෙවින් පඤ්චොපාදනස්කන්ධයෝ දුක්ඛ.

ඇවත්නි, ජාති කවර යැ : ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායයෙහි යම් (අපරිපූර්ණායතන වශයෙන්) ඉපැත්මෙක් (පරිපූර්ණායතන වශයෙන්) මොනොවට ඉපැත්මෙක් (අණ්ඩජ ජලාබුජ වශයෙන්) අවක්‍රාන්තියෙක් (සංසෙදජ උපපාදුක වශයෙන්) ඉපැත්මෙක් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ආයතනයන්ගේ ප්‍රතිලාභයෙක් වේ ද ඇවත්නි, මේ ' ජාති ' යයි කියනු ලැබේ.

ඇවැත්නි, ජරා කවර : ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායයෙහි යම් දිරීමෙක් දිරන අයුරෙක්, කැඩුණු බවෙක්, පලිත ඇති බවෙක්, ඇඟ රැලි වැටුණු බවෙක්, ආයු පිරිහීමෙක් ඉඳුරන් පැසීමෙක් වේ ද, ඇවැත්නි, මේ ' ජරා ' යයි කියනු ලැබේ.

ඇවත්නි, මරණ කවරෙ යත් : ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් යම් ච්‍යුතියෙක් චවනාකාරයෙක් බිඳීමෙක් අතුරුදහනෙක් මෘත්‍යු සංඛ්‍යාත මරණයෙක් කාලක්‍රියායෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් ශරීරයාගේ නික්‍ෂෙපයෙක් ජීවිතෙන්ද්‍රියයාගේ උපච්ඡෙදයෙක් වේ ද, ඇවැත්නි, මේ ' මරණ ' යයි කියනුලැබේ.

ඇවත්නි, ' ශොක ' කවරෙ යත් : ඇවත්නි, අන්‍යතර අන්‍යතර ව්‍යසනයෙකින් සමන්වාගත වූ අන්‍යතර අන්‍යතර දුඃඛයෙකින් පහරනලද්දහුගේ යම් ශොකයෙක් ශොචනා යෙක් ශොක කළ බවෙක් ඇතුළත ශොකයෙක් අභ්‍යන්තර පරිශොකයෙක් වේ ද ඇවත්නි, මේ ' ශොක ' යයි කියනුලැබේ.

ඇවත්නි, පරිදෙව කවරෙ යැ යත් : ඇවත්නි, අන්‍යතර අන්‍යතර ව්‍යසනයෙකින් සමන්වාගත වූ අන්‍යතර අන්‍යතර දුඃඛයෙකින් පහරන ලද්දහුගේ නම්ගොත් දක්වමින් හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් නම කියා හඬන අයුරෙක් ගුණ කියා හඬන අයුරෙක් නම්ගොත් කියා හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් වේ ද ඇවත්නි, මේ ' පරිදෙව ' යයි කියනු ලැබේ.

ඇවත්නි, දුඃඛ කවරෙ යැ යත් : ඇවත්නි, යම් කායික දුඃඛයෙක් කායික අමධුරයෙක් කායසංස්පර්ශයෙන් උපන් දුකෙක් නො මිහිරෙක් වෙදනායෙක් වේ ද, ඇවත්නි, මේ ' දුඃඛ ' යයි කියනුලැබේ.

ඇවැත්නි, දෞර්මනස්‍ය කවරෙ යැ යත් : ඇවත්නි, යම් චෛතසික දුඃඛයෙක් චෛතසික අමධුරයෙක් මනොසම්ඵස්සයෙන් හටගත් දුඃඛවෙදනායෙක් අමධුර වෙදනා යෙක් ඇද්ද ? ඇවැත්නි, මේ දෞර්මනස්‍ය යයි කියනු ලැබේ.

කතමො චාවුසො උපායාසො: යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං, අයං වුච්චතාවුසො උපායාසො.

කතමං චාවුසො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං: ජාතිධම්මානං ආවුසො, සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: අහො වත මයං න ජාතිධම්මා අස්සාම, න ච වත නො ජාති ආගච්ඡෙය්‍යාති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං. ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. ජරාධම්මානං ආවුසො සත්තානං-පෙ-බ්‍යාධිධම්මානං ආවුසො, සත්තානං -පෙ- මරණධම්මානං ආවුසො, සත්තානං පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මානං ආවුසො, සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: අහො වත මයං න සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා අස්සාම, න ච වත නො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

කතමෙ චාවුසො සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා: සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ වුච්චන්තාවුසො සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චතාවුසො දුක්ඛං අරියසච්චං.

කතමඤ්චාවුසො, දුක්ඛසමුදයො[1] අරියසච්චං: යා'යං තණ්හා පොනොභවිකා[2] නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. ඉදං වුච්චතාවුසො දුක්ඛසමුදයො අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛනිරොධො[3] අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධො අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

කතමා චාවුසො සම්මාදිට්ඨි: යං ඛො ආවුසො දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං. අයං වුච්චතාවුසො සම්මාදිට්ඨි.

කතමො චාවුසො සම්මාසඞ්කප්පො: නෙක්ඛම්මසඞ්කප්පො, අබ්‍යාපාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො. අයං වුච්චතාවුසො සම්මාසඞ්කප්පො.

කතමා චාවුසො සම්මාවාචා: මුසාවාදා වෙරමණී, පිසුනාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී. අයං වුච්චතාවුසො සම්මාවාචා.

1. දුක්ඛසමුදයං - සීමු, මජසං, PTS.
2. පොනොබ්භවිකා - මජසං.
3. දුක්ඛනිරොධං - සීමු, මජසං, PTS.

ඇවත්නි, ' උපායාස ' කවරේ යැ යත් : ඇවත්නි, අන්‍යතර අන්‍යතර වූ ව්‍යසනයෙකින් යුක්ත වුවහුගේ අන්‍යතර අන්‍යතර වූ දුඃඛධර්මයෙකින් පහළහුගේ යම් ආයාසයෙක් උපායාසයෙක් ආයාසාකාරයෙක් උපායාසාකාරයෙක් ඇද්ද, ඇවත්නි, මේ ' උපායාස ' යයි කියනු ලැබේ.

ඇවත්නි, ' යම් ඉච්ඡාවක් නො ලබා නම් එ ද දුක යැ ' යනු කවරේ යැ යත් : ඇවත්නි, ජාතිස්වභාව ඇති සත්ත්වයනට මෙබඳු ඉච්ඡායෙක් උපදනේ යැ, ' අපි ජාතිස්වභාව ඇත්තමෝ නො වන්නමෝ නම් මනා මැනු ! උත්පත්තිය අප වෙත නො ඒ නම් මනා මැනු ! කියා යි. තෙල ඉච්ඡායෙන් නො ලැබිය හැක්කෙකි. මෙ ද ' යම් ඉච්ඡාවක් නො ලබා නම් එ ද දුක යැ යනු වෙයි. ඇවත්නි, ජරාස්වභාව ඇති සත්ත්වයනට . . . ඇවත්නි, ව්‍යාධිස්වභාව ඇති සත්ත්වයනට . . . ඇවත්නි, මරණ ස්වභාව ඇති සත්ත්වයනට . . . ඇවත්නි, ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍යස්වභාව ඇති සත්ත්වයනට මෙබඳු ඉච්ඡායෙක් උපදනේ යැ, ' අපි ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍යස්වභාව ඇත්තමෝ නො වන්නමෝ නම් මනා මැ නු ! ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාසයෝ අප කරා නො පැමිණෙත් නම් මනා මැ නු කියා යි. තෙල ඉච්ඡායෙන් නො ලැබිය හැක්කෙකි. මෙ ද ' යම් ඉච්ඡාවක් නො ලබා නම් එ ද දුක යැ ' යනු නම් වෙයි.

ඇවැත්නි, සංක්ෂෙපයෙන් දුඃඛ වූ පඤ්චොපාදනස්කන්ධයෝ කවරහ යත්. හෙ මෙසේ යැ : රූපොපාදනස්කන්ධ යැ වෙදනොපාදනස්කන්ධ යැ සංඥොපාදනස්කන්ධ යැ සංස්කාරොපාදනස්කන්ධ යැ විඥානොපාදනස්කන්ධ යි. ඇවත්නි, මොහු සැකෙවින් දුඃඛ වූ පඤ්චොපාදනස්කන්ධයහ'යි කියනු ලැබෙත්. ඇවත්නි, මේ 'දුඃඛාර්‍ය්‍යසත්‍ය' යයි කියනු ලැබේ.

ඇවත්නි, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය කවරේ යැ යත් : පුනර්භවය පිණිස වැටෙන නන්දිරාග සහගත වූ ඒ ඒ භවයෙහි ඇලුම් කරන යම් තෘෂ්ණායෙක් ඇද්ද, ඒ කෙසේ යැ යත් : කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. ඇවත්නි, මේ දුඃඛසමුදය-ආර්‍ය්‍යසත්‍යය යි කියනුලැබේ.

ඇවත්නි, දුඃඛනිරොධ-ආර්‍ය්‍යසත්‍යය කවරේ යැ යත් : ඒ තෘෂ්ණාවගේ මැ යම් අශෙෂවිරාග නිරොධයෙක් ත්‍යාගයෙක් නෙරැපීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් ඇද්ද ඇවත්නි, මේ දුඃඛනිරොධ-ආර්‍ය්‍යසත්‍යය යි කියනුලැබේ.

ඇවත්නි, දුඃඛනිරොධගාමීප්‍රතිපද-ආර්‍ය්‍යසත්‍යය කවරේ යැ යත් : මේ අරීඅටඟිමඟ මැ යි. ඒ කෙසේ යැ යත් : සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක් සංකල්පය සම්‍යග්වචන යැ සම්‍යක් කර්මාන්ත යැ සම්‍යක්ආජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි.

ඇවත්නි, සම්‍යග්දෘෂ්ටි කවර යත් : ඇවත්නි, යම් දුඃඛයෙහි ඥානයෙක් දුඃඛසමුදයෙහි ඥානයෙක් දුඃඛනිරොධයෙහි ඥානයෙක් දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥානයෙක් ඇද්ද. ඇවත්නි, මේ සම්‍යග්දෘෂ්ටි යයි කියනුලැබේ.

ඇවත්නි, සම්‍යක්සංකල්ප කවරේ යැ යත් : නෛෂ්ක්‍රම්‍යසංකල්ප යැ අව්‍යාපාද සංකල්ප යැ අවිහිංසාසංකල්ප යි. ඇවත්නි, මේ සම්‍යක්සංකල්ප යයි කියනු ලැබේ.

ඇවත්නි, සම්‍යග්වචන කවරේ යැ යත් : මුසවායෙන් වැළකීම පිසුනුබසින් වැළකීම පරොස්බසින් වැළකීම පලපින් වැළකීම යි. ඇවත්නි, මේ සම්‍යක්-වචන යයි කියනු ලැබේ.

කතමො චාවුසො සම්මාකම්මන්තො: පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී කාමෙසු මිච්ඡාචාරා වෙරමණී. අයං වුච්චතාවුසො සම්මාකම්මන්තො.

කතමො චාවුසො සම්මා ආජීවො: ඉධාවුසො අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මා ආජීවෙන ජීවිකං කප්පෙති. අයං වුච්චතාවුසො සම්මාආජීවො.

කතමො චාවුසො සම්මාවායාමො: ඉධාවුසො, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය[1] භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අයං වුච්චතාවුසො සම්මාවායාමො.

කතමා චාවුසො සම්මාසති: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු-පෙ- චිත්තෙ-පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී-පෙ-අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චතාවුසො සම්මාසති.

කතමො චාවුසො, සම්මාසමාධි: ඉධාවුසො, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං-පෙ-තතියං ඣානං-පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චතාවුසො සම්මාසමාධි. ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං.

තථාගතෙනාවුසො, අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මන්ති.

ඉදමවොචායස්මා සාරිපුත්තො, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

සච්චවිභඞ්ග සුත්තං එකාදසමං.

---

1. අසම්මොහාය - PTS.

ඇවත්නි, සම්‍යක්කර්මාන්ත කවරෙ යැ යත් : පණිවායෙන් වැළකීම අයිනාදනින් වැළකීම කාමයෙහි මිසහසරින් වැළකීම යි. ඇවත්නි, මේ සම්‍යක්කර්මාන්ත යයි කියනුලැබේ.

ඇවත්නි, සම්‍යක්-ආජීව කවරෙ යැ යත් : ඇවත්නි, මෙසස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක මිථ්‍යා-ආජීව හැරපියා සම්‍යක්-ආජීවයෙන් ජීවිකා කෙරෙයි. ඇවත්නි, මේ සම්‍යක්-ආජීව යයි කියනුලැබේ.

ඇවත්නි, සම්‍යක්-ව්‍යායාම කවරෙ යත් : ඇවත්නි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස කර්තුකම්‍යතා කුශලච්ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟයි, ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් ලාමක අකුශල ධර්මයන් දුරු කරනු පිණිස කුශලච්ඡන්‍දය උපදවයි ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. නූපන් කුශලධර්මයන් උපදනා පිණිස කුශලච්ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. උපන් කුශලධර්මයන්ගේ පැවැත්ම පිණිස නො නැසීම පිණිස බහුලභාවය පිණිස විපුල භාවය පිණිස වර්ධනය පිණිස පරිපූරණය පිණිස කර්තුකම්‍යතාකුශලච්ඡන්‍දය උපදවයි, ව්‍යායාම කෙරෙයි, වීර්‍ය්‍යය පවත්වයි, සිත නඟයි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරෙයි. ඇවත්නි, මේ සම්‍යග්ව්‍යායාම යයි කියනු ලැබේ.

ඇවත්නි, සම්‍යක්ස්මෘතිය කවර යත් : ඇවත්නි, මෙසස්නෙහි මහණ කයෙහි කය නුවණින් දක්නාසුලු වැ කෙලෙස් තවන වැර ඇති වැ සම්ප්‍රජ්‍ඥාන ඇති වැ ස්මෘතිමත් වැ පඤ්චස්කන්ධ ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරු කොට වාස කෙරෙයි. වෙදනා යෙහි. . . . චිත්තයෙහි. . . ධර්මයෙහි ධර්මය නුවණින් දක්නාසුලු වැ කෙලෙස් තවන වැර ඇති වැ. . . . අභිධ්‍යා දෞර්මනස්‍ය දුරුකොට වාස කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් ස්මෘති යයි කියනු ලැබේ.

ඇවත්නි, සම්‍යක්සමාධි කවරෙ යැ යත් : ඇවැත්නි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන්ව මැ අකුසල් දහමින් වෙන් වැ මැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිසුව ඇති පළමු වන දැහැන් උපයා වාස කෙරෙයි. විතර්ක විචාරයන්ගේ ව්‍යුපශම යෙන් සිය සතන්හි පැහැදීම් කරන චිත්තයාගේ එකාග්‍රභාව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිසුව ඇති දෙවන දැහැන් . . . තුන් වන දැහැන් . . . සිව් වන දැහැන් උපයා වාස කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් සමාධියයි කියනුලැබේ. ඇවැත්නි, මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපද ආර්‍ය්‍යසත්‍යයයි කියනු ලැබේ.

ඇවත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර මිගදය නම් වූ ඉසිපතනාරාමයෙහි දී මහණකු විසින් වේවයි බමුණකු විසින් වේවයි දෙවියකු විසින් වේවයි මරහු විසින් වේවයි බඹහු විසින් වේවයි ලෝකයෙහි අන් කිසිවකු විසින් වේවයි ප්‍රතිවර්තන නො කටහෙන අනුත්තර ධර්මචක්‍රය පවත්වනලදී. කිමෙක යත් : මේ චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ විභාග කොට පැවැසීමෙක් වේ ද දෙසීමෙක් වේ ද පැනවීමෙක් වේ ද ස්ථාපනයෙක් වේ ද විවෘත කිරීමෙක් වේ ද බෙදලීමෙක් වේ ද ප්‍රකට කිරීමෙක් වේ ද එය යි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මේ සච්චවිභඞ්ගසූත්‍රය දෙසූහ. සතුටුසිත් ඇති ඒ මහණහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**එකොළොස් වැනි සච්චවිභඞ්ග සූත්‍ර යි.**

# 3. 4. 12

## දක්ඛිණාවිභඞ්ග සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහාපජාපතී ගොතමී නවං දුස්සයුගං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච:

ඉදං මෙ භන්තෙ, නවං දුස්සයුගං භගවන්තං උද්දිස්ස සාමං කන්තං සාමං වායිතං. තං මෙ භන්තෙ, භගවා පතිගණ්හාතු අනුකම්පං උපාදායා'ති. එවං වුත්තෙ භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච: සඞ්ඝෙ ගොතමී දෙහි, සඞ්ඝෙ තෙ දින්නෙ අහං චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චා'ති. දුතියම්පි ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: ඉදං මෙ -පෙ- අනුකම්පං උපාදායා'ති. දුතියම්පි ඛො භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච: සඞ්ඝෙ ගොතමී දෙහි, සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චා'ති. තතියම්පි ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: ඉදං මෙ භන්තෙ -පෙ- අනුකම්පං උපාදායා'ති. තතියම්පි ඛො භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච: සඞ්ඝෙ ගොතමී දෙහි සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි සඞ්ඝො චා'ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: 'පතිගණ්හාතු භන්තෙ, භගවා මහපජාපතියා ගොතමියා නවං දුස්සයුගං, බහූපකාරා[1] භන්තෙ, මහාපජාපතී ගොතමී භගවතො මාතුච්ඡා ආපාදිකා පොසිකා ඛීරස්ස දායිකා, භගවන්තං ජනෙත්තියා කාලකතාය[2] ථඤ්ඤං පායෙසි. භගවාපි භන්තෙ, බහූපකාරො මහාපජාපතියා ගොතමියා. භගවන්තං භන්තෙ, ආගම්ම මහාපජාපතී ගොතමී බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා. භගවන්තං භන්තෙ, ආගම්ම මහාපජාපතී ගොතමී පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසුමිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. භගවන්තං භන්තෙ, ආගම්ම මහාපජාපතී ගොතමී බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා, අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා. භගවන්තං භන්තෙ, ආගම්ම මහාපජාපතී ගොතමී දුක්ඛෙ නික්කඞ්ඛා, දුක්ඛසමුදයෙ නික්කඞ්ඛා, දුක්ඛනිරොධෙ නික්කඞ්ඛා, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය නික්කඞ්ඛා. භගවාපි භන්තෙ බහූපකාරො මහාපජාපතියා ගොතමියාති.

---

1. බහුකාරා - ස්‍යා.
2. කාලඞ්කතාය - මජසං, සීමු.

# 3. 4. 12

# දක්ඛිණාවිභඞ්ග සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩවාස කරනසේක. එකල ගොයුම්ගොත් මහාප්‍රජාපතීදේවී අළුත් පිළී සඟළක් ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියෝ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්වැ හුන්හ. එකත්පස්වැ හුන් ගොයුම්ගොත් මහාප්‍රජාපතීදේවී භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කොළෝ :

වහන්ස, මා සතු මේ අළුත් පිළීසඟළ භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමන් විසින් මැ නූල් කැට වියන ලද. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ඒ පිළීසඟළ අනුකම්පා පිණිස පිළිගන්නාසේක්වා. මෙසේ කී කළ භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගොයුම්ගොතුවට තෙල වදළසේක. ගොයුම්ගොතුව, සංඝයා විෂයෙහි දෙව, තොප විසින් සංඝයා විෂයෙහි දුන් කල මම ද පූජිතයෙමි, සංඝයා ද පූජිත වෙයි. දෙවනවට ද ගොයුම් ගොත් මහාප්‍රජාපතී දේවී භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකොළෝ. වහන්ස, මා සතු මේ පිළීසඟළ ... අනුකම්පා පිණිස පිළිගන්නේ මැනැව. දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගොයුම්ගොතුවට තෙල වදළසේක. ගොයුම්ගොතුව, සංඝයා විෂයෙහි දෙව, තොප විසින් සඞ්ඝයා විෂයෙහි දුන් කල මම ද පූජිතයෙමි. සඞ්ඝයා ද පූජිත වෙයි. තුන්වනවට ද ගොයුම්ගොත් මහාප්‍රජාපතී දේවී භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කොළෝ: වහන්ස, මා සතු මේ පිළීසඟළ ... අනුකම්පා පිණිස පිළිගන්නේ මැනැවැ යි. තුන්වනවට ද භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපතී ගොයුම්ගොතුවට තෙල වදළහ : ගොයුම්ගොතුව, සඞ්ඝයා විෂයෙහි දෙව, තොප විසින් සඞ්ඝයා විෂයෙහි දුන් කල මම ද පූජිතයෙමි, සඞ්ඝයා ද පූජිත වෙයි.'' කියා යි.

මෙසේ වදළ කල ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගොයුම්ගොත් මහාප්‍රජාපතී දෙවියගේ අළුත් පිළීසඟළ පිළිගන්නේ මැනැවැ. වහන්ස, ගොයුම්ගොත් මහාප්‍රජාපතීදේවිය භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර ඇතියහ, කුඩාමව වූහ, අත්පා වැඩූහ, පොෂණය කළහ, කිරි දුන්හු යයි. වැදූ මව කලුරිය කළ කල භාග්‍යවතුන් වහන්සේට කිරි පෙවූහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ද ගොයුම්ගොත් මහාප්‍රජාපතීදෙවියට බොහෝ උපකාර ඇතියහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ලදින් ගොයුම්ගොත් මහාප්‍රජාපතීදෙවී බුදුන් සරණ ගියහ, දහම් සරණ ගියහ, සඟුන් සරණ ගියහ. වහන්ස, ගොයුම්ගොත් මහා–ප්‍රජාපතීදෙවී භාග්‍යවතුන් වහන්සේ ලදින් පණිවායෙන් දුරු වූහ. අයිනාදනින් දුරු වූහ. කාමයෙහි මිසහසරින් දුරු වූහ. මුසවායෙන් දුරු වූහ. මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූහ. වහන්ස, ගොයුම්ගොත් මහාප්‍රජාපතී දෙවී භාග්‍යවතුන් වහන්සේ ලදින් බුද්ධරත්නය කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගතයහ, ධමරත්නය කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගතයහ, සඞ්ඝරත්නය කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගතයහ, ආර්ය කාන්ත ශීලයෙන් සමන්වාගතයහ. වහන්ස, ගොයුම්ගොත් මහාප්‍රජාපතීදෙවී භාග්‍යවතුන් වහන්සේ ලදින් දුඃඛසත්‍යයෙහි නිසැක වූහ, දුඃඛසමුදය–සත්‍යයෙහි නිසැක වූහ, දුඃඛනිරෝධසත්‍යයෙහි නිසැක වූහ, දුඃඛනිරෝධගාමී ප්‍රතිපද සත්‍යයෙහි නිසැක වූහ. වහන්ස, (මෙසේ) භාග්‍යවතුන් වහන්සේ ද ගෞතමගොත්‍ර මහාප්‍රජාපතීදෙවියට බොහෝ වහල් වූහ යි.

එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද, යං හි ආනන්ද, පුග්ගලො පුග්ගලං ආගම්ම බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති. ඉමස්සානන්ද, පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි, යදදං අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචිකම්මචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානුප්පදානෙන.

යං හානන්ද, පුග්ගලො පුග්ගලං ආගම්ම. පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. ඉමස්සානන්ද, පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි. යදිදං අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචිකම්මචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානුප්පාදානෙන.

යං හානන්ද, පුග්ගලො පුග්ගලං ආගම්ම බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති, අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති. ඉමස්සානන්ද, පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි. යදිදං අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචිකම්මචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානුප්පදානෙන.

යං හානන්ද, පුග්ගලො පුග්ගලං ආගම්ම දුක්ඛෙ නික්කඞ්ඛො හොති, දුක්ඛසමුදයෙ නික්කඞ්ඛො හොති, දුක්ඛනිරොධෙ නික්කඞ්ඛො හොති, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය නික්කඞ්ඛො හොති. ඉමස්සානන්ද, පුග්ගලස්ස ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි, යදිදං අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචිකම්මචීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානුප්පදානෙන.

චුද්දස ඛො පනිමානන්ද, පාටිපුග්ගලිකා දක්ඛිණා. කතමා චුද්දස: තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙ දානං දෙති, අයං පඨමා පාටිපුග්ගලිකා දක්ඛිණා. පච්චෙකබුද්ධෙ[1] දානං දෙති, අයං දුතියා පාටිපුග්ගලිකා දක්ඛිණා. තථාගතසාවකෙ අරහන්තෙ දානං දෙති, අයං තතියා පාටිපුග්ගලිකා දක්ඛිණා. අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං චතුත්ථී පාටිපුග්ගලිකා දක්ඛිණා. අනාගාමිස්ස දානං දෙති, අයං පඤ්චමී පාටිපුග්ගලිකා දක්ඛිණා. අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං ඡට්ඨී පාටිපුග්ගලිකා දක්ඛිණා. සකදාගාමිස්ස දානං දෙති, අයං සත්තමී පාටිපුග්ගලිකා දක්ඛිණා. සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං අට්ඨමී පාටිපුග්ගලිකා දක්ඛිණා. සොතාපන්නෙ දානං දෙති, අයං නවමී පාටිපුග්ගලිකා දක්ඛිණා. සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං දසමී පාටිපුග්ගලිකා දක්ඛිණා. බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දෙති, අයං එකාදසමී පාටිපුග්ගලිකා දක්ඛිණා. පුථුජ්ජනසීලවන්තෙ දානං දෙති, අයං ද්වාදසමී පාටිපුග්ගලිකා දක්ඛිණා. පුථුජ්ජනදුස්සීලෙ දානං දෙති, අයං තෙරසමී පාටිපුග්ගලිකා දක්ඛිණා. තිරච්ඡානගතෙ දානං දෙති, අයං චුද්දසමී පාටිපුග්ගලිකා දක්ඛිණාති.

---

1. පච්චෙකසම්බුද්ධෙ - මජ්ඣං, සීමු.

ආනන්‍දය, තෙල එසේ යැ, ආනන්‍දය, තෙල එසේ යැ, ආනන්‍දය, යම් හෙයෙකින් පුද්ගලයෙක් පුද්ගලයකු ලදින් බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද ආනන්‍දය, මේ පුද්ගලයාහට මේ පුද්ගලයා විසින් උපකාර සඞ්ඛ්‍යාත මනා ප්‍රතික්‍රියා නො කටහැකි යයි කියමි. කිමෙකින යත් : අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරික්ෂාකාර යන මේ දීමෙන.

ආනන්‍දය, යම් හෙයෙකින් පුද්ගලයෙක් පුද්ගලයකු ලදින් පණිවායෙන් දුරු වූයේ වේ ද, අයිනාදනින් දුරු වූයේ වේ ද, කාමයෙහි මිසහසරින් දුරු වූයේ වේ ද, මුසවායෙන් දුරු වූයේ වේ ද, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වූයේ වේ ද, ආනන්‍දය, මේ පුද්ගලයාහට මේ පුද්ගලයා විසින් සුප්‍රතිකාර නො කට හැකි යයි කියමි. කිමෙකින යත් : අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛසජ්‍යපරිෂ්කාර දීමෙන.

ආනන්‍දය, යම් හෙයෙකින් පුද්ගලයෙක් පුද්ගලයකු ලදින් බුදුන් කෙරෙහි අවෙත්‍ය–ප්‍රසාදයෙන් සමන්වාගත වේ ද ධර්මය කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වේ ද සඞ්ඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වේ ද ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වා–ගත වේ ද. ආනන්‍දය මේ පුද්ගලයාහට මේ පුද්ගලයා විසින් ප්‍රත්‍යුපකාර නො කටහැකි යයි කියමි. කිමෙකින යත්: අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලාන ප්‍රත්‍ය භෛෂජ්‍යපරිෂ්කාර දීමෙන.

ආනන්දය, යම් හෙයෙකින් පුද්ගලයෙක් පුද්ගලයකු ලදින් දුඃඛසත්‍යයෙහි නිසැක වේ ද, දුඃඛසමුදයසත්‍යයෙහි නිසැක වේ ද, දුඃඛනිරොධසත්‍යයෙහි නිසැක වේ ද, දුඃඛනිරොධගාමීප්‍රතිපදසත්‍යයෙහි නිසැක වේ ද, ආනන්දය, මේ පුද්ගලයාහට මේ පුද්ගලයා විසින් ප්‍රත්‍යුපකාර නො කටහැකි යයි කියමි. වැඳීම හුනස්නෙන් නැඟීම ඇඳිලි බැඳීම සාමීචිකර්ම සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර දීම යන මෙයිනැ ' යි.

ආනන්දය, වෙන වෙන පුඟුලා කෙරෙහි පිහිටි මේ දක්ෂිණාවෝ තුදුස්දෙනෙකි. කවර තුදුස්දෙනෙක යත් : අර්හත් තථාගත සම්‍යක්සම්බුද්ධයන් විෂයෙහි දන් දෙයි. මේ පළමු වන පෞද්ගලික දක්ෂිණා යැ, ප්‍රත්‍යෙක බුද්ධයන් විෂයෙහි දන් දෙයි. මේ දෙවන පෞද්ගලික දක්ෂිණා යැ, අර්හත් තථාගතශ්‍රාවකයා විෂයෙහි දන් දෙයි. මේ තුන් වන පෞද්ගලික දක්ෂිණා යැ, රහත්පල පසක් කරන්නට පිළිපන් ශ්‍රාවකයා විෂයෙහි දන් දෙයි. මේ සිව් වන පෞද්ගලික දක්ෂිණා යැ, අනාගාමීහට දන් දෙයි. මේ පස්වන පෞද්ගලික දක්ෂිණා යැ, අනාගාමීඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි දන් දෙයි. මේ සවන පෞද්ගලික දක්ෂිණා යැ, සෙදගැමිහට දන් දෙයි. මේ සත් වන පෞද්ගලික දක්ෂිණා යැ, සෙදගැමිඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි දන් දෙයි. මේ අට වන පෞද්ගලික දක්ෂිණා යැ, සොවන්හු කෙරෙහි දන් දෙයි. මේ නව වන පෞද්ගලික දක්ෂිණා යැ, සොවත්ඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි දන් දෙයි. මේ දස වන පෞද්ගලික දක්ෂිණා යැ, කාමයෙහි වීතරාග වූ බාහිරක තාපසයා කෙරෙහි දන් දෙයි. මේ එකොළොස් වන පෞද්ගලික දක්ෂිණා යැ, පුහුදුන් සිල්වත්හු කෙරෙහි දන් දෙයි. මේ දෙළොස් වන පෞද්ගලික දක්ෂිණා යැ, පුහුදුන් දුසිල්හු කෙරෙහි දන් දෙයි. මේ තෙළෙස් වන පෞද්ගලික දක්ෂිණා යැ, තිරිසන් ගියහු කෙරෙහි දන් දෙයි. මේ තුදුස් වන පෞද්ගලික දක්ෂිණා යි.

තත්‍රානන්ද, තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා. පුථුජ්ජනදුස්සීලෙ දානං දත්වා සහස්සගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා. පුථුජ්ජනසීලවන්තෙ දානං දත්වා සතසහස්සගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා. බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දත්වා කොටිසතසහස්සගුණා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා. සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දත්වා අසඞ්ඛෙය්‍යා අප්පමෙය්‍යා දක්ඛිණා පාටිකඞ්ඛිතබ්බා. කො පන වාදෙ සොතාපන්නෙ, කො පන වාදෙ සකදාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්නෙ, කො පන වාදෙ සකදාගාමිස්ස, කො පන වාදෙ අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ, කො පන වාදෙ අනාගාමිස්ස, කො පන වාදෙ අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නෙ, කො පන වාදෙ තථාගතසාවකෙ අරහන්තෙ, කො පන වාදෙ පච්චෙකබුද්ධෙ, කො පන වාදෙ තථාගතෙ අරහන්තෙ සම්මාසම්බුද්ධෙති.

සත්ත ඛො පනිමානන්ද, සඞ්ඝගතා දක්ඛිණා. කතමා සත්ත: බුද්ධපමුඛෙ උභතො සඞ්ඝෙ දානං දෙති, අයං පඨමා සඞ්ඝගතා දක්ඛිණා. තථාගතෙ පරිනිබ්බුතෙ උභතො සඞ්ඝෙ දානං දෙති, අයං දුතියා සඞ්ඝගතා දක්ඛිණා. භික්ඛුසඞ්ඝෙ දානං දෙති, අයං තතියා සඞ්ඝගතා දක්ඛිණා. භික්ඛුනීසඞ්ඝෙ දානං දෙති, අයං චතුත්ථී සඞ්ඝගතා දක්ඛිණා. 'එත්තකා මෙ භික්ඛූ ච භික්ඛුනියො ච සඞ්ඝතො උද්දිස්සථා'ති දානං දෙති. අයං පඤ්චමී සඞ්ඝගතා දක්ඛිණා. 'එත්තකා මෙ භික්ඛූ සඞ්ඝතො උද්දිස්සථා'ති දානං දෙති, අයං ඡට්ඨී සඞ්ඝගතා දක්ඛිණා. 'එත්තිකා මෙ භික්ඛුනියො සඞ්ඝතො උද්දිස්සථා'ති දානං දෙති. අයං සත්තමී සඞ්ඝගතා දක්ඛිණා.

භවිස්සන්ති ඛො පනානන්ද, අනාගතමද්ධානං ගොත්‍රභුනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා, තෙසු දුස්සීලෙසු සඞ්ඝං උද්දිස්ස දානං දස්සන්ති. තදපහං[1] ආනන්ද සඞ්ඝගතං දක්ඛිණං අසඞ්ඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි. න ත්වෙවාහං ආනන්ද, කෙනචි පරියායෙන සඞ්ඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දානං මහප්ඵලතරං වදාමි.

චතස්සො ඛො ඉමා ආනන්ද, දක්ඛිණාවිසුද්ධියො. කතමා චතස්සො: අත්ථානන්ද, දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. අත්ථානන්ද, දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො. අත්ථානන්ද, දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. අත්ථානන්ද, දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච.

කථඤ්චානන්ද, දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො: ඉධානන්ද, දායකො හොති සීලවා කල්‍යාණධම්මො, පටිග්ගාහකා හොන්ති දුස්සීලා පාපධම්මා. එවං ඛො ආනන්ද, දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො.

කථඤ්චානන්ද, දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො: ඉධානන්ද දායකො හොති දුස්සීලො පාපධම්මො, පටිග්ගාහකා හොන්ති සීලවන්තො[2] කල්‍යාණධම්මා. එවං ඛො ආනන්ද, දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති නො දායකතො.

කථඤ්චානන්ද, දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. ඉධානන්ද, දායකො ච හොති දුස්සීලො පාපධම්මො, පටිග්ගාහකා ච හොන්ති දුස්සීලා පාපධම්මා. එවං ඛො ආනන්ද, දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො.

---

1. තදපාහං - මජසං. 2. සීලවන්තා - සීමු.

ආනන්දය, ඒ දනයන් කෙරෙහි තිරිසන්ගියහු කෙරෙහි දන් දී සියක් අනුසස් ඇති දක්ෂිණායෙක් කැමැති වියයුතු යැ. පෘථග්ජන දුශ්ශීලයා කෙරෙහි දන් දී දහස් අනුසස් ඇති දක්ෂිණායෙක් කැමැති වියයුතු යැ. පෘථග්ජන සිල්වත්හු කෙරෙහි දන් දී සියදහස් අනුසස් ඇති දක්ෂිණායෙක් කැමැති වියයුතු යැ. කාමයෙහි වීතරාග වූ බාහිරක තවුසා කෙරෙහි දන් දී කෙළලක්ෂයක් අනුසස් ඇති දක්ෂිණාව කැමැති වියයුතු යැ. සොවත්ඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි දන් දී අසඞ්ඛෙය අප්‍රමෙය අනුසස් ඇති දක්ෂිණායෙක් කැමැති වියයුතු යැ. සොවන්හු කෙරෙහි කවර කථා යැ ? සෙදගැමිඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි කවරකථා යැ ? සෙදගැමිහට කවර කථා යැ ? අනගැමිඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි කවර කථා යැ ? අනාගැමිහට කවර කථා යැ ? රහත්ඵල පසක් කරන්නට පිළිපන්නහු කෙරෙහි කවර කථා යැ ? තථාගතශ්‍රාවක වූ රහත්හු කෙරෙහි කවර කථා යැ ? ප්‍රත්‍යෙකබුද්ධයන් වහන්සේ කෙරෙහි කවර කථා යැ ? තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි කවර කථා යැ ?

ආනන්දය, මේ සංඝගත දක්ෂිණාවෝ සත් දෙනෙකි : කවර සත් දෙනෙක යත් : බුද්ධප්‍රමුඛ උභතොසංඝයා කෙරෙහි දන් දෙයි. මේ පළමු වන සංඝගත දක්ෂිණා යැ. තථාගතයන් වහන්සේ පිරිනිවි කල උභතොසංඝයා කෙරෙහි දන් දෙයි, මේ දෙවන සංඝගත දක්ෂිණා යැ. භික්ෂුසංඝයා කෙරෙහි දන් දෙයි, මේ තුන් වන සංඝගත දක්ෂිණා යැ. භික්ෂුණීසංඝයා කෙරෙහි දන් දෙයි, මේ සතර වන සංඝගත දක්ෂිණා යැ. ' මෙතෙක් මට භික්ෂූහු ද භික්ෂුණීහු ද සඟින් උදෙසාලව ' යි දන් දෙයි, මේ පස් වන සංඝගත දක්ෂිණා යැ. ' මෙතෙක් මට භික්ෂූහු සඟින් උදෙසාලව ' යි දන් දෙයි, මේ සවන සංඝගත දක්ෂිණා යැ. ' මෙතෙක් මට භික්ෂුණීහු සඟින් උදෙසාලව ' යි දන් දෙයි, මේ සත් වන සංඝගත දක්ෂිණා යි.

ආනන්දය, අනාගතකාලයෙහි ගොත්‍රභූ වූ දුශ්ශීල වූ පාපස්වභාව ඇති කාෂායකණ්ඨ කෙනෙක් වෙති. ඒ දුශ්ශීලයන් කෙරෙහි සඟුන් උදෙසා දන් දෙති. ආනන්දය, මම එකල්හිත් සංඝගත දක්ෂිණාව අසඞ්ඛෙය අප්‍රමෙය අනුසස් ඇති ' යි කියමි. ආනන්දය, මම කවර අයුරෙකින් වුව ද සංඝගත දක්ෂිණායෙන් පෞද්ගලික දනය මහාඵලතර යයි නො කියමි.

ආනන්දය, මේ දක්ෂිණාවිශුද්ධිහු සතර දෙනෙකි, කවර සතර දෙනෙක යත් : ආනන්දය, ප්‍රතිග්‍රාහකයන් තබා දයකයා හෙතු කොට විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, දයකයා තබා ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට ගෙන විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, දයකයා හෙතු කොටත් ප්‍රතිග්‍රාහකයන් හේතු කොටත් විශුද්ධ නො වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, දයකයා හේතු කොට ද ප්‍රතිග්‍රාහකයන් හේතු කොට ද විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත.

ආනන්දය, ප්‍රතිග්‍රාහකයා තබා දයකයන් හේතු කොට විශුද්ධ වන දක්ෂිණා කවර යත් : ආනන්දය, මෙහි දයකයා සිල්වත් වෙයි. කලණදහම් ඇති වෙයි. ප්‍රතිග්‍රාහකයෝ දුශ්ශීල වෙති. පාපධර්මයෝ වෙති. ආනන්දය, මෙසෙයින් ප්‍රතිග්‍රාහකයන් තබා දයකයා හෙතු කොට විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත.

ආනන්දය, දයකයා තබා ප්‍රතිග්‍රාහකයන් හේතු කොට විශුද්ධ වන දක්ෂිණා කවර ? ආනන්දය, මෙහි දයක දුශ්ශීල වෙයි, පාපධර්ම වෙයි. ප්‍රතිග්‍රාහකයෝ සිල්වත් වෙති, කලණදහම් වෙති. ආනන්දය, මෙසේ දයකයා තබා ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත.

ආනන්දය, දයකයා හෙතු කොට ද ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට ද විශුද්ධ නො වන දක්ෂිණා කවර ? ආනන්දය, මෙහි දයක ද දුශ්ශීල වෙයි, පාපධර්ම වෙයි. ප්‍රතිග්‍රාහකයෝත් දුශ්ශීල වෙති, පාපධර්ම වෙති. ආනන්දය, මෙසේ දයකයා හෙතු කොට ද ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට ද විශුද්ධ නො වන දක්ෂිණායෙක් ඇත.

කථඤ්චානන්ද, දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච: ඉධානන්ද, දායකො ච හොති සීලවා කල්‍යාණධම්මො, පටිග්ගාහකා ච හොන්ති සීලවන්තො කල්‍යාණධම්මා. එවං ඛො ආනන්ද, දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගාහකතො ච. ඉමා ඛො ආනන්ද, චතස්සො දක්ඛිණාවිසුද්ධියොති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

යො සීලවා දුස්සීලෙසු දදාති දානං
ධම්මෙන ලද්ධා[1] සුපසන්නචිත්තො,
අභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා දායකතො විසුජ්ඣති.

යො දුස්සීලො සීලවන්තෙසු දදාති දානං
අධම්මෙන ලද්ධා[1] අප්පසන්නචිත්තො,
අනභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති.

යො දුස්සීලො දුස්සීලෙසු දදාති දානං
අධම්මෙන ලද්ධා[1] අප්පසන්නචිත්තො
අනභිසද්දහං කම්මඵලං උළාරං
න තං දානං විපුලඵලන්ති[2] බ්‍රූමි.

යො සීලවා සීලවන්තෙසු දදාති දානං
ධම්මෙන ලද්ධා[1] සුපසන්නචිත්තො,
අභිසද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං විපුලඵලන්ති[2] බ්‍රූමි.

යො වීතරාගො වීතරාගෙසු දදාති දානං
ධම්මෙන ලද්ධා[1] සුපසන්නචිත්තො
අභිසද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං ආමිසදානානමග්ගන්ති[3]

**දක්ඛිණාවිභඞ්ග සුත්තං ද්වාදසමං**

---

## විභඞ්ගවග්ගො චතුත්ථො.

**තස්ස වග්ගස්ස උද්දානං**

භද්දෙකානන්ද කච්චාන ලොමසකඞ්ගියා සුභො,
මහාකම්ම සළායතන විභඞ්ගා,
උද්දෙස අරණා ධාතු සච්චං
දක්ඛිණා විභඞ්ග සුත්තන්ති[4].

---

1. ලද්ධං - සීමු.
2. විපුලපඵලන්ති - මජසං.
3. විපුලන්තිබ්‍රූමි - සීමු.

ආනන්දය දයකයා හෙතු කොට ද, ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට ද විශුද්ධ වන දක්ෂිණා කවර ? ආනන්දය, මෙහි දයක ද සිල්වත් වෙයි, කලණදහම් වෙයි. ප්‍රතිග්‍රාහකයෝ ද සිල්වත් වෙති. කලණදහම් වෙති. ආනන්දය මෙසේ දයකයා හෙතු කොට ද ප්‍රතිග්‍රාහකයන් හෙතු කොට ද විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, මේ දක්ෂිණාවිශුද්ධීහු සතරදෙන වෙති.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. සුගතයන් වහන්සේ මෙය වදරා නැවත අන්‍ය වූ තෙල ගාථා ද වදළෝ :

සිල්වත් වූ යමෙක් දැහැමින් ලැබ පහන්සිත් ඇති වැ මහත් වූ කම්පල අදහමින් දුශ්ශීලයන් විෂයෙහි දන් දේ ද, ඒ දක්ෂිණාව දයකයා කෙරෙන් පිරිසිදු වෙයි.

දුශ්ශීල වූ යමෙක් අධර්මයෙන් ලැබ නො පහන්සිත් ඇති වැ මහත් වූ කම්පල නො අදහනුයේ සිල්වතුන් විෂයෙහි දන් දේ ද ඒ දක්ෂිණාව පිළිගාවා කෙරෙන් විශුද්ධ වෙයි.

දුශ්ශීල වූ යමෙක් අධර්මයෙන් ලැබ නො පහන්සිත් ඇති වැ මහත් වූ කම්පල නො අදහනුයේ දුශ්ශීලයන් විෂයෙහි දන් දේ ද, ඒ දනය මහත්ඵල යයි නො කියමි.

සිල්වත් වූ යමෙක් දැහැමින් ලැබ පහන්සිත් ඇති වැ මහත් වූ කම්ඵල අදහමින් සිල්වතුන් විෂයෙහි දන් දේ ද එකාන්තයෙන් ඒ දනය මහත්ඵල ඇතැයි කියමි.

වීතරාග වූ යමෙක් දැහැමින් ලැබ පහන්සිත් ඇති වැ මහත් වූ කම්පල අදහමින් වීතරාගයන් විෂයෙහි දන් දේ ද එකාන්තයෙන් ඒ දනය ආමිසදනයන් අතුරෙන් අග්‍ර වේ යයි.

**දොළොස් වැනි දක්ෂිණාවිභඞ්ග සූත්‍ර යි.**

---

# සතර වැනි විභඞ්ග වර්‍ග යි

**එහි උද්දනය :**

භද්දෙකරත්ත, ආනන්දභද්දෙකරත්ත, කච්චානභද්දෙකරත්ත, ලොමසකඞ්ගිය භද්දෙකරත්ත සූත්‍රයෝ යැ, චූළකම්මවිභඞ්ග මහාකම්මවිභඞ්ග සළායතනවිභඞ්ග උද්දෙසවිභඞ්ග අරණවිභඞ්ග ධාතුවිභඞ්ග සච්චවිභඞ්ගසූත්‍රය හා දක්ෂිණාවිභඞ්ගසූත්‍රය ද වේ.

---

# 5 සළායතනවග්ගො

## 3. 5. 1

## අනාථපිණ්ඩිකොවාද සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අනාථපිණ්ඩිකො ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: 'එහි ත්වං අම්භො පුරිස, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි. 'අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. 'සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති. යෙන චායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දාහි 'අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දතී'ති. එවඤ්ච වදෙහි: 'සාධු කිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති.

'එවං භන්තෙ'ති ඛො සො පුරිසො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො භගවන්තං එතදවොච: 'අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දතී'ති. යෙන චායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: 'අනාථපිණ්ඩිකො භන්තෙ, ගහපති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො ආයස්මතො සාරිපුත්තස්ස පාදෙ සිරසා වන්දති. එවඤ්ච වදෙති: සාධු කිර භන්තෙ, ආයස්මා සාරිපුත්තො යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති.

අධිවාසෙසි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මා සාරිපුත්තො නිවාසෙත්වා පත්තචීවරමාදාය ආයස්මතා ආනන්දෙන පච්ඡාසමණෙන යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො ආයස්මා සාරිපුත්තො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: 'කච්චි තෙ ගහපති, ඛමනීයං කච්චි යාපනීයං, කච්චි තෙ දුක්ඛා වෙදනා පටික්කමන්ති, නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො'ති.

# 5 සළායතනවර්‍ගීය

## 3. 5. 1
## අනාථපිණ්ඩිකොවාද සූත්‍රය

මා විසින් මෙසේ අසනලදි : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩුසිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක. එසමයෙහි අනේපිඩුගැහැවි හටගත් ආබාධ ඇති වැ දුකට පැමිණියේ දැඩිගිලන් වූයේ වෙයි. ඉක්බිති අනේපිඩුගැහැවි එක්තරා පුරුෂයකු ඇමතී. එව එම්බා පුරුෂය, තෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ මාගේ බසින් භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ හිසින් වඳු. ' වහන්ස, අනේපිඩුගැහැවි හටගත් ආබාධ ඇති වැ දුකට පැමිණියේ දැඩිගිලන් වූයේ හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ හිසින් වඳී ' යයි. යළි ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා එළැඹැ මාගේ බසින් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ පාසහළ හිසින් වඳු. ' වහන්ස, අනේපිඩු ගැහැවි . . . වඳී ' යයි. මෙසේත් සැලකර. වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනේපිඩු සිටුහුගේ නිවෙස්න කරා අනුකම්පා පිණිස එළැඹෙනසේක්ව ' යි.

' එසේ යැ වහන්සැ ' යි ඒ පුරුෂ අනේපිඩුසිටුහට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඒ පුරුෂ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ : ' වහන්ස, අනේපිඩුගැහැවි ආබාධික වැ දුකට පැමිණියේ දැඩිගිලන් වූයේ වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළ හිසින් වඳී' යයි. යළි ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් අභිවාදනය කොට එකත්පස් වැ හින. එකත්පස් වැ හුන් ඒ පුරුෂ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කී : ' වහන්ස, අනේපිඩුගැහැවි ආබාධික වැ දුඃඛිත වැ දැඩි ගිලන් වෙයි. හේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ පාසහළ හිසින් වඳියි. මෙසේත් කියයි : ' වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනුකම්පා පිණිස අනේපිඩුසිටුහුගේ නිවෙස්න කරා එළැඹෙනසේක්ව ' යි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ නො බැණ ඉවසූසේක. ඉක්බිති, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන පසුවැ යන ආයුෂ්මත් අනඳ තෙරුන් සමග අනේපිඩුසිටුහුගේ නිවෙස්න කරා එළැඹියහ. එළැඹ පැනැවූ අස්නෙහි වැඩහුන්හ. වැඩහිඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනේපිඩුගැහැවියනට තෙල වදළහ. කිම ගැහැවිය, තොපට සැහිය හෙයි ද, කිම යැපියහෙයි ද, කිම තොපගේ දුක් වේදනාවෝ තනු වෙත් ද, නො වැඩෙත් ද, තනුභාවයාගේ අවසානය පැනේ ද, වැඩීම නො පැනේ ද, යි.



35—ඒ 00502 (8/73)

න මෙ භන්තෙ සාරිපුත්ත ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා. අභික්කමන්ති නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති.

සෙය්‍යථාපි භන්තෙ සාරිපුත්ත, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධනි අභිමත්ථෙය්‍ය, එවමෙව ඛො භන්තෙ සාරිපුත්ත, අධිමත්තා වාතා මුද්ධනි ඌහනන්ති. න මෙ භන්තෙ සාරිපුත්ත, ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ සාරිපුත්ත, බලවා පුරිසො දළ්හෙන වරත්තබන්ධෙන[1] සීසෙ සීසවෙඨනං[2] දදෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ සාරිපුත්ත, අධිමත්තා වාතා සීසං පරිකන්තන්ති[3]. න මෙ භන්තෙ සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ සාරිපුත්ත, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ සාරිපුත්ත, අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. න මෙ භන්තෙ සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි භන්තෙ සාරිපුත්ත, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං සම්පරිතාපෙය්‍යුං, එවමෙව ඛො මෙ භන්තෙ සාරිපුත්ත, අධිමත්තො කායස්මිං ඩාහො. න මෙ භන්තෙ සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං : 'න චක්ඛුං උපාදියිස්සාමි. න ච මෙ චක්ඛුනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: 'න සොතං උපාදියිස්සාමි. න ච මෙ සොතනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං : 'න ඝානං උපාදියිස්සාමි. න ච මෙ ඝානනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති සික්ඛිතබ්බං. තස්මාතිහ-පෙ- න ජිව්හං-පෙ-සික්ඛිතබ්බං. තස්මාතිහ-පෙ-න කායං-පෙ-සික්ඛිතබ්බං. තස්මාතිහ-පෙ-න මනං-පෙ-සික්ඛිතබ්බං.

තස්මාතිහ-පෙ-න රූපං-පෙ-සික්ඛිතබ්බං : තස්මාතිහ-පෙ-න සද්දං උපාදියිස්සාමි-පෙ-න ගන්ධං උපාදියිස්සාමි. -පෙ-න රසං උපාදියිස්සාමි. -පෙ- න ඵොට්ඨබ්බං උපාදියිස්සාමි. -පෙ- න ධම්මං උපාදියිස්සාමි. න ච මෙ ධම්මනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං.

---

1. වරත්තඛණ්ඩෙන - සීමු, මජසං.
2. සීසවෙඨං - මජසං.
3. අධිමත්තා සීසෙ සීසවෙදනා - මජසං.

ශාරිපුත්‍රයන් වහන්ස, මට ඉවැසිය නො හැක්ක, යැපිය නො හැක්ක, මාගේ දුඃඛ වෙදනාවෝ දැඩි වූවාහු, බලවත් වෙති. තුනී නො වෙත්, වැඩීමේ අවසානය පැනෙයි, බැසීමේ අවසානය නො පැනෙයි.

ශාරිපුත්‍රයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු සැතෙකින් මුදුන පෙළා ද එසෙයින් මැ ශාරිපුත්‍රයන් වහන්ස, අධිමාත්‍ර වූ වාතයෝ මුදුන පෙළති. ශාරිපුත්‍රයන් වහන්ස, මට ඉවසිය නො හැක්ක, යැපිය නො හැක්ක. මාගේ දැඩි වූ දුඃඛවෙදනාවෝ වැඩෙති, තනු නො වෙත්. වැඩීමේ අවසානය පැනෙයි, තනු බවෙක් නො පැනෙයි.

ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් වරපටබැඳුමෙකින් හිස්වෙළුම් දෙන්නේ ද එසෙයින් මැ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, අධිමාත්‍ර වූ වාතයෝ මාගේ හිස සිඳිති. ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, මට සිහිය නො හැක්ක, යැපිය නොහැක්ක. මාගේ දැඩි වූ දුඃඛවෙදනාවෝ වැඩෙති, තනු නො වෙත්. වැඩීමේ අවසානය පැනෙයි, තනු බවෙක් නො පැනේ යයි.

ස්වාමීනි ශාරිපුත්‍රයන් වහන්ස, යම්සේ දක්ෂ වූ ගොඝාතකයෙක් වේවයි ගොඝාතක අතැවැසියෙක් වේවයි තියුණු වූ ගෙරින් කපන සැතෙකින් කුස සිඳින්නේ ද, එසෙයින් මැ ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, අධිමාත්‍ර වූ වාතයෝ මාගේ කුස සිඳිති. ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, මට සිහිය නො හැක්ක, මාගේ දැඩි වූ දුඃඛවෙදනාවෝ වැඩෙති, තනු නො වෙත්. වැඩීමේ අවසානය පැනෙයි, තනු බවෙක් නො පැනේ යයි.

ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුබුල් පුරුෂයකු වෙන වෙන අත්ලාගෙන අඟුරුවළෙක්හි තවන්නාහු ද හාත්පසින් තවන්නාහු ද, එසෙයින් මැ ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, අධිමාත්‍ර වූ මාගේ ශාරිරදහය වෙයි. ස්වාමීනි ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සැ මට සිහිය නො හැක්ක, යැපිය නො හැක්ක.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු යැ, චක්ෂුස තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය චක්ෂුර්නිඃශ්‍රිත නො වේ යයි, ගැහැවිය, මෙසේ මැ තොප විසින් හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය; ශ්‍රොත්‍රය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය ශ්‍රොත්‍රනිඃශ්‍රිත ද නො වේ යයි, ගැහැවිය, මෙසේ මැ තොප විසින් හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ඝ්‍රාණය තෘෂ්ණා දීන් නො ගන්මි. මාගේ විඥනය ඝ්‍රාණනිඃශ්‍රිත ද නො වේ යයි, ගැහැවිය, මෙසේ මැ තොප විසින් හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් . . . මාගේ විඥන ජිහ්වා නිඃශ්‍රිත නො වේ යයි, . . . හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් . . . කය තෘෂ්ණාදීන් නො ගන්මි. . . හික්මියයුතු ය. ගැහැවිය එහෙයින් . . . මනස තෘෂ්ණාදීන් නො ගන්මි. . . හික්මියයුතු ය.

ගැහැවිය, එහෙයින් . . . රූපය තෘෂ්ණාදීන් නො ගන්මි. . . හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් . . . ශබ්දය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ගන්ධය තෘෂ්ණාදීන් නො ගන්මි. . . රසය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ධර්මය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය ධර්මනිඃශ්‍රිත නො ද වේ ' යයි, ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු ය.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න චක්ඛුවිඤ්ඤාණං උපාදියිස්සාමි. න ච මෙ චක්ඛුවිඤ්ඤාණනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න සොතවිඤ්ඤාණං උපාදියිස්සාමි. -පෙ- න ඝානවිඤ්ඤාණං උපාදියිස්සාමි -පෙ- න ජිව්හාවිඤ්ඤාණං උපාදියිස්සාමි -පෙ- න කායවිඤ්ඤාණං උපාදියිස්සාමි -පෙ- න මනොවිඤ්ඤාණං උපාදියිස්සාමි. න ච මෙ මනොවිඤ්ඤාණනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: 'න චක්ඛුසම්ඵස්සං උපාදියිස්සාමි. න ච මෙ චක්ඛුසම්ඵස්සනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න සොතසම්ඵස්සං උපාදියිස්සාමි -පෙ- න ඝානසම්ඵස්සං උපාදියිස්සාමි. -පෙ- න ජිව්හාසම්ඵස්සං උපාදියිස්සාමි -පෙ- න කායසම්ඵස්සං උපාදියිස්සාමි. -පෙ- න මනොසම්ඵස්සං උපාදියිස්සාමි. න ච මෙ මනොසම්ඵස්සනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න චක්ඛුසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි. න ච මෙ චක්ඛුසම්ඵස්සජවෙදනානිස්සිතං[1] විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: 'න සොතසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි -පෙ- න ඝානසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි -පෙ- න ජිව්හාසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි -පෙ- න කායසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි -පෙ- න මනොසම්ඵස්සජං වෙදනං උපාදියිස්සාමි. න ච මෙ මනොසම්ඵස්සජවෙදනානිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න පඨවිධාතුං උපාදියිස්සාමි න ච මෙ පඨවිධාතුනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ-පෙ-සික්ඛිතබ්බං: න ආපොධාතුං උපාදියිස්සාමි-පෙ-න තෙජොධාතුං උපාදියිස්සාමි-පෙ-න වායොධාතුං උපාදියිස්සාමි-පෙ-න ආකාසධාතුං උපාදියිස්සාමි-පෙ-න විඤ්ඤාණධාතුං උපාදියිස්සාමි. න ච මෙ විඤ්ඤාණධාතුනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න රූපං උපාදියිස්සාමි. න ච මෙ රූපනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න වෙදනං උපාදියිස්සාමි-පෙ-න සඤ්ඤං උපාදියිස්සාමි-පෙ-න සඞ්ඛාරෙ උපාදියිස්සාමි-පෙ-න විඤ්ඤාණං උපාදියිස්සාමි. න ච මෙ විඤ්ඤාණනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න ආකාසානඤ්චායතනං උපාදියිස්සාමි. න ච මෙ ආකාසානඤ්චායතනනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති, එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න විඤ්ඤාණඤ්චායතනං උපාදියිස්සාමි, -පෙ-න ආකිඤ්චඤ්ඤායතනං උපාදියිස්සාමි-පෙ- න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපාදියිස්සාමි. න ච මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං.

---

1. චක්ඛුසම්ඵස්සජාවෙදනානිස්සිතං - මජසං, සිමු.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ මැ හික්මියයුතු යැ: ' චක්ෂුර්විඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය චක්ෂුරවිඥනනිඃශ්‍රිත ද නො වේ ' යයි ගැහැවිය තොප විසින් මෙසේ මැ හික්මියයුතුය. ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මිය යුතු යැ: ශ්‍රොත්‍රවිඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ඝ්‍රාණවිඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ජිහ්වාවිඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. . . කායවිඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. . . මනෝවිඥනය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය මනොවිඥන නිඃශ්‍රිත ද නො වේ ' යයි ගැහැවිය, මෙසේ මැ තොප විසින් හික්මියයුතු ය.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය: ' චක්ෂුඃසංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය චක්ෂුඃසංස්පර්ශනිඃශ්‍රිත ද නො වේ ' යයි, ගැහැවිය, තොප විසින් මෙසේ හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය: ශ්‍රොත්‍රසංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ඝ්‍රාණසංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. . . ජිහ්වාසංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. . . කාය සංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. . . මනඃසංස්පර්ශය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය මනඃසංස්පර්ශනිඃශ්‍රිත ද නො වේ ' යයි, ගැහැවිය, මෙසේ මැ තොප විසින් හික්මියයුතු ය.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' චක්ෂුඃසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය චක්ෂුඃසංස්පර්ශයෙන් උපන් වෙදනානිඃශ්‍රිත ද නො වේ ' යයි, ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' ශ්‍රොත්‍රසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි . . . ඝ්‍රාණසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. . . ජිහ්වාසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. . . කායසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. . . මනඃසංස්පර්ශයෙන් උපන් වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය මනඃසංස්පර්ශයෙන් උපන් වෙදනානිඃශ්‍රිත ද නො වේ ' යයි, ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු යි.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' පෘථිවීධාතු තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය පෘථිවීධාතුනිඃශ්‍රිත ද නො වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු ය. ගැහැවිය, එහෙයින් . . . හික්මියයුතු ය : අබ්ධාතු තෘෂ්ණාදීන් නො ගන්මි. . . තෙජොධාතු තෘපිණාදීන් නො ගන්මි. . . වායොධාතු තෘෂ්ණාදීන් නො ගන්මි. . . ආකාශධාතු තෘෂ්ණාදීන් නො ගන්මි. . . විඥනධාතු තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය විඥනධාතුනිඃශ්‍රිත ද නො වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු යි.

එහෙයින් ගැහැවිය, තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' රූපය තෘෂ්ණාදීන් නො ගන්මි. මාගේ විඥනය රූප නිඃශ්‍රිත ද නො වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු ය. ' වෙදනාව තෘෂ්ණාදීන් නො ගන්මි. . . සංඥව . . . සංස්කාරයන් . . . විඥනය තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥනය නො ද විඥනනිඃශ්‍රිත වේ 'යයි, ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු.

ගැහැවිය, එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' ආකාසානඤ්චායතනය තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥනය නො ද ආකාසානඤ්චායතන නිඃශ්‍රිත වේ ' යයි, ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මිය යුතු ය. ගැහැවිය එහෙයින් තොප විසින් මෙසේ හික්මියයුතු ය : ' විඤ්ඤණඤ්චායතනය . . . ආකිඤ්චඤ්ඤයතනය . . . නෙවසඤ්ඤනාසඤ්ඤයතනය තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥනය නෙවසඤ්ඤනාසඤ්ඤයතන නිඃශ්‍රිත වූයේ නො ද වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු යි.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න ඉධ ලොකං උපාදියිස්සාමි. න ච මෙ ඉධ ලොකනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: න පරලොකං උපාදියිස්සාමි. න ච මෙ පරලොකනිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බං.

තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: යම්පිදං[1] දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං[2] අනුවිචරිතං[3] මනසා. තම්පි න උපාදියිස්සාමි. න ච මෙ තන්නිස්සිතං විඤ්ඤාණං භවිස්සතී'ති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බන්ති.

එවං වුත්තෙ අනාථපිණ්ඩිකො ගහපති පරොදි, අස්සූනි පවත්තෙසි. අථ ඛො ආයස්මා ආනන්දො, අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: ඔලීයසි ඛො ත්වං ගහපති, සංසීදසි[4]. ඛො ත්වං ගහපතී'ති.

නාහං භන්තෙ ආනන්ද, ඔලීයාමි, නපි සංසීදාමි. අපි ච මෙ දීඝරත්තං සත්ථා පයිරුපාසිතො, මනොභාවනීයා ච භික්ඛූ. න ච මෙ එවරූපී ධම්මී කථා සුතපුබ්බා'ති.

න ඛො ගහපති, ගිහීනං ඔදාතවසනානං එවරූපී ධම්මී කථා පටිභාති. පබ්බජිතානං ඛො ගහපති, එවරූපී ධම්මී කථා පටිභාතී'ති.

තෙන හි භන්තෙ සාරිපුත්ත, ගිහීනං ඔදාතවසනානං එවරූපී ධම්මී කථා පටිභාතු. සන්ති හි භන්තෙ සාරිපුත්ත, කුලපුත්තා අප්පරජක්ඛජාතිකා, අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො'ති.

අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච ආනන්දො, අනාථපිණ්ඩිකං ගහපතිං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කමිංසු.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති, අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ච සාරිපුත්තෙ ආයස්මන්තෙ ච ආනන්දෙ කායස්ස භෙදා පරම්මරණා[5] තුසිතං කායං උපපජ්ජි[6].

අථ ඛො අනාථපිණ්ඩිකො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො අනාථපිණ්ඩිකො දෙවපුත්තො භගවන්තං ගාථාහි අජ්ඣභාසි:

"ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරාජෙන පීතිසඤ්ජනනං මම.

කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා.

---

1. යම්පි මෙ - මජසං.
2. විඤ්ඤාතං පරියෙසිතං - PTS.
3. අනුපරියෙසිතං අනුවිචරිතං - මජසං, සීමු.
4. සංසීදති - සීමු.
5. කාලමකාසි - මජසං, සීමු.
6. උපපජ්ජි - PTS.

එහෙයින් ගැහැවිය, තොප විසින් මෙසේ හික්මියයුතු ය : 'මෙලොව තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥානය නො ද මෙලොව ඇසුරු කරනලද වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු. එහෙයින් ගැහැවිය, තොප විසින් මෙසේ හික්මිය යුතු ය : ' පරලොව තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥානය නො ද පරලොව ඇසුරු කරන ලද වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු.

එහෙයින් ගැහැවිය, තොප විසින් මෙසේ හික්මියයුතු ලැබූ සෙවූ සිතින් විමසූ ' යම් රූපායතනයෙක් ඇද්ද, ශබ්දයතනයෙක් ඇද්ද, ගන්ධරස ඵොට්ඨබ්බායතනයෙක් ඇද්ද ධම්මායතනයෙක් ඇද්ද, එ ද තෘෂ්ණාදි විසින් නො ගන්මි. මාගේ විඥානය ඒ රූපාදිය නො ද ඇසුරු කරනලද වේ ' යයි ගැහැවිය, තොප විසින් මෙසේ මැ හික්මියයුතු යයි.

මෙසේ වදළ කල්හි අනේපිඩු ගැහැවි හැඬි, කඳුළු හෙළී. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අනේපිඩු ගැහැවිහට මෙල වදළහ : ගැහැවිය, තෙපි (අරමුණෙහි) ඇලෙව, ගැලෙව යි.

වහන්ස ආනන්ද තෙරණුවෙනි, මම් අරමුණෙහි නො ඇලෙමි, නො ද ගැලෙමි. වැලි එකෙක් ඇති, මා විසින් දීර්ඝරාත්‍රයෙහි ශාස්තෲන් වහන්සේ පර්යුපාසිතයහ., මනොභාවනීය හික්ෂූහු ද පර්යුපාසිත වූහු. මා විසින් මෙබඳු වූ ධර්මකථාවක් නො ද ඇසුවිරු යයි.

ගැහැවිය, හෙළපිළිහඳනා ගිහිගේ වැසියනට මෙබඳු ධර්මකථා නො වැටහෙයි. ගැහැවිය, පැවිද්දනට මෙබඳු ධර්මකථා වැටහේ යයි.

එසේ වී නම් ස්වාමීනි, ශාරිපුත්‍රස්ථවිරයන් වහන්ස, හෙළපිළී හඳනා ගිහිගේ වැසියනට මෙබඳු ධර්මකථා වැටහේවා. ස්වාමීනි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්ස, අල්පරජස්ක ස්වභාව ඇති කුලපුත්‍රයෝ ඇත්තාහු මැ යැ. ධර්මය අශ්‍රවණතායෙන් (ඔහු) පිරිහෙති. දහම් අවබෝධ කරන්නාහු ඇත්තාහ ' යි.

ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ද ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ ද අනේපිඩු ගැහැවියනට මේ අවවාදයෙන් ඔවා දී හුනස්නෙන් නැගී නික්ම ගියාහ.

ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ද ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ ද නික්මගිය නොබෝ කාලයෙහි අනේපිඩු ගැහැවි කාබුන් මරණින් මතුයෙහි තුසිපුර උපන.

ඉක්බිති අනේපිඩු දෙව්පිත් මධ්‍යමරාත්‍රියෙහි මනා සිරුරු පැහැ ඇති වැ සියලු දෙව්රම බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනා කොට එකත්පස් වැ සිටගත. එකත්පස් වැ සිටි අනේපිඩු දෙව්පිත් භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කී :

භික්ෂුසංඝයා විසින් නිති සෙවුනා ලද, ධර්මරාජයන් වහන්සේ විසින් වාස කළ මේ ජේතවනය මට ප්‍රීති උපදවනු වෙයි.

මාර්ගචෙතනා සංඛ්‍යාත කර්මය ද මාර්ගප්‍රඥ සංඛ්‍යාත විද්‍යාව ද සමාධිපාක්ෂික ධර්මය ද සිල්වත්හුගේ ජීවිතය ද උතුම් වෙයි. මෙල කර්මාදිය හේතු කොට ගෙන සත්ත්වයෝ විශුද්ධ වෙති. ගොත්‍රයෙන් වේවයි ධනයෙන් වේවයි විශුද්ධ නො වෙත්.

තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති.

සාරිපුත්තොව පඤ්ඤාය සීලෙන උපසමෙන ච,
යො හි[1] පාරගතො භික්ඛු එතාව පරමො සියා''ති.

ඉදමවොච අනාථපිණ්ඩිකො දෙවපුත්තො, සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො අනාථපිණ්ඩිකො දෙවපුත්තො සමනුඤ්ඤො මෙ සත්ථාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉමං භික්ඛවෙ රත්තිං අඤ්ඤතරො දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ, සො දෙවපුත්තො මං ගාථාහි අජ්ඣභාසි:

ඉදං හි තං ජෙතවනං-පෙ-එතාව පරමො සියාති.

ඉදමවොච භික්ඛවෙ, සො දෙවපුත්තො. සමනුඤ්ඤො මෙ සත්ථාති මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායී'ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: 'සො හි නූන සො භන්තෙ, අනාථපිණ්ඩිකො දෙවපුත්තො භවිස්සති, අනාථ-පිණ්ඩිකො භන්තෙ, ගහපති ආයස්මන්තෙ සාරිපුත්තෙ අභිප්පසන්නො[2] අහොසීති.

සාධු සාධු, ආනන්ද, යාවතකං ඛො ආනන්ද, තක්කාය පත්තබ්බං, අනුප්පත්තං තයා. අනාථපිණ්ඩිකො සො ආනන්ද, දෙවපුත්තො නාඤ්ඤොති[3].

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

අනාථපිණ්ඩිකොවාද සුත්තං පඨමං.

---

1. යො පි - මජසං.
2. අවෙච්චප්පසන්නො - මජසං, සීමු, PTS.
3. නාඤ්ඤොති - මජසං, ඌනං.

එහෙයින් පණ්ඩිත පුරුෂ තමහට වැඩ පසස්නේ සමාධිපාක්ෂික ධර්මය උපායයෙන් (නුවණින්) විමසන්නේ ය. මෙසේ ඒ ආර්‍යමාර්ගයෙහි විශුද්ධ වෙයි.

ප්‍රඥයෙන් ද ශීලයෙන් ද ක්ලෙශොපශමයෙන් ද ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ මැ ශ්‍රෙෂ්ඨ වෙති. නිර්වාණපාරයට පැමිණි යම් මහණෙක් වේ ද තෙහෙම ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ පරම කොට ඇති වන්නේ ය ' යි.

අනේපිඩු දෙව්පිත් මේ කී ය : ශාස්තෘන් වහන්සේ අනුදත්සේක. ඉක්බිති අනේපිඩු දෙව්පිත් ශාස්තෘන් වහන්සේ මා කී වදන් අනුදත්හ ' යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි මැ අතුරුදහන් වී.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක : මහණෙනි, මේ රාත්‍රියෙහි එක්තරා දිව්‍යපුත්‍රයෙක් ඉක්මගිය මධ්‍යමරාත්‍රියෙහි මනා සිරුරු පැහැ ඇති වැ සියලු දෙව්රම බබුළුවා මා කරා එළඹ මා අභිවාදනය කොට එකත්පස් වැ සිටගත. මහණෙනි, එකත්පස් වැ සිටි ඒ දෙව්පිත් මට ගාථායෙන් කී :

මේ ජේතවනය. . . තෙල මැ පරම කොට ඇති වන්නේ යැ ' යි.

මහණෙනි, ඒ දෙවපුත්‍ර මෙය කී : ' මා කී වදන් ශාස්තෘන් වහන්සේ අනුදත්හ ' යි. මා වැඳ පැදකුණු කොට එහි මැ අතුරුදහන් වී යයි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට වහන්ස, හේ වනාහි එකාන්තයෙන් ඒ අනේපිඩු දෙව්පිත් වන්නේ ය. වහන්ස, අනේපිඩු ගැහැවි සැරියුත් තෙරණුවන් කෙරෙහි අතිශයින් පහන් වී යයි.

සාධු ! සාධු ! ! ආනන්දය, ආනන්දය යම් පමණ තර්කයෙන් දත යුතු ද තොප විසින් ඒ දන්නාලද්දේ ය. ආනන්දය, හේ අනේපිඩුදෙව්පිත. අනෙකෙක් නො වේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. සතුටුසිත් ඇති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කොළෝ.

**පළමු වැනි අනාථපිණ්ඩිකොවාද සූත්‍ර යි.**

# 3. 5. 2

## ඡන්නෝවාද සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාචුන්දො ආයස්මා ච ඡන්නො ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරන්ති. තෙන ඛො පන සමයෙන ආයස්මා ඡන්නො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො, යෙනායස්මා මහාචුන්දො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාචුන්දං එතදවොච : 'ආයාම ආවුසො චුන්ද, යෙනායස්මා ඡන්නො, තෙනුපසඞ්කමෙය්‍යාම ගිලානපුච්ඡකා'ති. එවමාවුසොති ඛො ආයස්මා මහාචුන්දො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසි.

අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාචුන්දො යෙනායස්මා ඡන්නො, තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මතා ඡන්නෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං ඡන්නං එතදවොච : 'කච්චි තෙ ආවුසො ඡන්න, ඛමනීයං කච්චි යාපනීයං කච්චි තෙ දුක්ඛා වෙදනා, පටික්කමන්ති නො අභික්කමන්ති. පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො'ති

න මෙ ආවුසො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා. අභික්කමන්ති, නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමො'ති. සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත, බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධනි අභිමත්ථෙය්‍ය, එවමෙව ඛො මෙ ආවුසො සාරිපුත්ත අධිමත්තා වාතා මුද්ධනි ඌහනන්ති. න මෙ ආවුසො සාරිපුත්ත, ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා, අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත, බලවා පුරිසො දළ්හෙන වරත්තක්ඛණ්ඩෙන සීසෙ සීසවෙඨනං දදෙය්‍ය. එවමෙව ඛො මෙ ආවුසො සාරිපුත්ත, අධිමත්තා වාතා සීසං පරිකන්තන්ති[1] න මෙ ආවුසො සාරිපුත්ත, ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා, අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය. එවමෙව ඛො මෙ ආවුසො සාරිපුත්ත, අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති. න මෙ ආවුසො සාරිපුත්ත, ඛමනීයං, න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති.

1. සීසෙ සීසවෙදනා - මජ්ඣං.

# 3. 5. 2
# ඡන්නොවාද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනයෙහි වැඩවසනසේක. එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ද ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ ද ගිජුකුළු පව්වෙහි වාස කෙරෙති. එසමයෙහි ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ ආබාධික වූ, දුඃඛිත වූ, දැඩිගිලන් වූවාහු වෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කාලයෙහි සමවතින් නැගිසිටියාහු ආයුෂ්මත් මහාචුන්ද තෙරුන් කරා එළඹ ආයුෂ්මත් මහාචුන්ද තෙරුන්ට මෙසේ කීහ: ඇවැත්නි චුන්දයෙනි, යම්හ ආයුෂ්මත් ඡන්න තෙරුන් කරා ගිලන් බව පුළුවුස්නමෝ එළඹෙම්හ. ඇවැත්නි, එසේ යයි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් දුන්හ.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ඡන්න තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ඡන්න තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු වූ සිහි කළයුතු වූ කථා කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් 'සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් ඡන්න තෙරණුවනට මෙසේ කීහ : කිම ඇවැත් ඡන්නයෙනි, තොප විසින් සිහිය හැකි ද ? කිම යැපිය හැකි ද ? කිම තොපගේ දුඃඛවේදනාවෝ බැසයෙත් ද ? නැඟ නො යෙත් ද ? බැසුම් පැනේ ද ? නැඟුම් නො පැනේ ද ? යි.

ඇවැත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සැහිය හෙයි, යැපිය නො හෙයි, මාගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟෙති බැස නො යෙත්. නැඟුම් පැනේ, බැස්ම නො පැනේ. ඇවැත් ශාරිපුත්‍රයෙනි, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු යහුලින් මුදුන මඩනේ වේ ද, ඇවැත් ශාරිපුත්‍රයෙනි, මාගේ මුදුන අධිමාත්‍ර වාතයෝ වෙසෙසින් පෙළත්. ඇවැත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැකි යැ, නො යැපිය හැකි යැ. මාගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟෙති, නො බසිත්. නැඟුම් පැනේ, බැසුම් නො පැනේ.

ඇවැත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි බලවත් පුරුෂයෙක් දළ වරබානින් හිසෙහි හිස්වෙළුම් දෙන්නේ වේ ද, ඇවැත් ශාරිපුත්‍රයෙනි, එපරිදි මැ මාගේ හිස අධිමාත්‍ර වාතයෝ වෙසෙසින් සිඳිති. ඇවැත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැකි යැ, නො යැපිය හැකි යැ. මාගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟෙති, බැස නො යෙත්. නැඟුම් පැනෙයි, බැසුම් නො පැනේ.

ඇවැත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි දක්ෂ ගොඝාතකයෙක් හෝ ගොඝාතක අතැවැසියෙක් හෝ තියුණු වූ ගෙරිකපන කැත්තෙන් කුස කපන්නේ වේ ද, ඇවැත් ශාරිපුත්‍රයෙනි, එපරිදි මැ අධිමාත්‍ර වාතයෝ මාගේ කුස සිඳිත්. ඇවැත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැකි යැ, නො යැපිය හැකි යැ. දැඩි දුඃඛවේදනාවෝ නැඟෙති, බැස නොයෙත්. නැඟුම් පැනෙයි, බැසුම් නො පැනේ.

සෙය්‍යථාපි ආවුසො සාරිපුත්ත, ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං, සම්පරිතාපෙය්‍යුං. එවමෙව ඛො මෙ ආවුසො සාරිපුත්ත, අධිමත්තො කායස්මිං ඩාහො. න මෙ ආවුසො සාරිපුත්ත, ඛමනීයං, න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති. සත්ථං ආවුසො සාරිපුත්ත, ආහරිස්සාමි, නාවකඞ්ඛාමි ජීවිතන්ති.

'මායස්මා ඡන්නො සත්ථං ආහරෙසි. යාපෙතායස්මා ඡන්නො, යාපෙන්තං මයං ආයස්මන්තං ඡන්නං ඉච්ඡාම. සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි සප්පායානි භොජනානි, අහං ආයස්මතො ඡන්නස්ස සප්පායානි භොජනානි පරියෙසිස්සාමි. සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි සප්පායානි භෙසජ්ජානි, අහං ආයස්මතො ඡන්නස්ස සප්පායානි භෙසජ්ජානි පරියෙසිස්සාමි. සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි පතිරූපො උපට්ඨාකො, අහං ආයස්මන්තං ඡන්නං උපට්ඨහිස්සාමි. මායස්මා ඡන්නො සත්ථං ආහරෙසි. යාපෙතායස්මා ඡන්නො, යාපෙන්තං මයං ආයස්මන්තං ඡන්නං ඉච්ඡාමා'ති.

නපි මෙ ආවුසො සාරිපුත්ත, නත්ථි සප්පායානි භොජනානි. නපි මෙ නත්ථි සප්පායානි භෙසජ්ජානි නපි මෙ නත්ථි පතිරූපා උපට්ඨාකා. අපි චාවුසො සාරිපුත්ත, පරිචිණ්ණො මෙ සත්ථා දීඝරත්තං මනාපෙනෙව නො අමනාපෙන. එතං හි ආවුසො සාරිපුත්ත, සාවකස්ස පතිරූපං : යං සත්ථාරං පරිචරෙය්‍ය මනාපෙනෙව නො අමනාපෙන, අනුපවජ්ජං ඡන්නො භික්ඛු සත්ථං ආහරිස්සතී'ති. එවමෙතං ආවුසො සාරිපුත්ත, ධාරෙහීති.

පුච්ඡෙය්‍යාම මයං ආයස්මන්තං ඡන්නං කඤ්චිදෙව දෙසං, සචෙ ආයස්මා ඡන්නො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායා'ති. පුච්ඡාවුසො සාරිපුත්ත, සුත්වා වෙදිස්සාමාති.

චක්ඛුං ආවුසො ඡන්න, චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සසි. සොතං ආවුසො ඡන්න, සොතවිඤ්ඤාණං -පෙ-. ඝානං ආවුසො ඡන්න, ඝානවිඤ්ඤාණං -පෙ-. ජිව්හං ආවුසො ඡන්න, ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායං ආවුසො ඡන්න, කායවිඤ්ඤාණං -පෙ- මනං ආවුසො ඡන්න, මනොවිඤ්ඤාණං. මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සසීති.

චක්ඛුං ආවුසො සාරිපුත්ත, චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සාමි. සොතං ආවුසො සාරිපුත්ත, සොතවිඤ්ඤාණං -පෙ-. ඝානං ආවුසො සාරිපුත්ත, ඝානවිඤ්ඤාණං -පෙ-. ජිව්හං ආවුසො සාරිපුත්ත, ජිව්හාවිඤ්ඤාණං -පෙ-. කායං ආවුසො සාරිපුත්ත, කායවිඤ්ඤාණං -පෙ- මනං ආවුසො සාරිපුත්ත, මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සාමීති.

---

1. වෙදිස්සාමීති - කෙචි.

ඇවත් ශාරිපුත්‍රයෙනි, යම් පරිදි බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුර්වල පුරුෂයකු වෙන වෙන අත් ගෙන අඩගාරකර්ෂූයෙක ලා තවත් ද, තර කොට තවත් ද, ඇවත් ශාරිපුත්‍ර යෙනි, එපරිදි මැ මාගේ කයෙහි අධිමාත්‍ර දහයෙක. ඇවත් ශාරිපුත්‍රයෙනි, මා විසින් නො සිහිය හැකි යැ, නො යැපිය හැකි යැ, මාගේ දැඩි දුඃඛවේදනාවෝ නැඟෙති, නො බසිත්. නැඟුම් පැනෙයි, බැසුම් නො පැනේ. ඇවත් ශාරිපුත්‍රයෙනි, ශස්ත්‍රයක් එළවා ලමි. ජීවිතය නො කැමැත්තෙමි.

ආයුෂ්මත් ඡන්න තෙමේ ශස්ත්‍රාහරණ නො කෙරේවා, ආයුෂ්මත් ඡන්න තෙමේ යැපේවා. අපි ආයුෂ්මත් ඡන්න තෙරුන් යැපෙන්නවුන් කැමැත්තම්හ. ඉදින් ආයුෂ්මත් ඡන්න තෙරුන්ට සත්ප්‍රායභොජනයෝ නැත් නම් මම ආයුෂ්මත් ඡන්න තෙරුන්ට සත්ප්‍රායභොජන සොයාලමි. ඉදින් ආයුෂ්මත් ඡන්න තෙරුන්ට සත්ප්‍රායභෛෂජ්‍ය නැත් නම් මම ආයුෂ්මත් ඡන්න තෙරුන්ට සත්ප්‍රායභෛෂජ්‍ය සොයාලමි. ඉදින් ආයුෂ්මත් ඡන්න තෙරුන්ට නිසි උපස්ථායකයෙක් නො වේ නම් මම ආයුෂ්මත් ඡන්න තෙරුන් උවටැන් කෙරෙමි. ආයුෂ්මත් ඡන්න තෙරුන් ශස්ත්‍රාහරණ නො කෙරේවා. ආයුෂ්මත් ඡන්න තෙමේ යැපේවා. අපි යැපෙන ආයුෂ්මත් ඡන්නයන් කැමැත්තම්හ ' යි.

ඇවත් ශාරිපුත්‍රයෙනි, මට සත්ප්‍රායභොජනයෝ නැත්තාහු නො වෙති. මට සත්ප්‍රාය භෛෂජ්‍යයෝ නැත්තාහු නො වෙති. මට ප්‍රතිරූප උපස්ථායකයෝ නැත්තාහු නො වෙත්. වැළිදු ඇවත් ශාරිපුත්‍ර තෙරණුවෙනි, මා විසින් දීර්ඝරාත්‍රියෙහි මනාපගතින් මැ ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන ලදහ, අමනාපගතින් නො වෙයි. ඇවත් ශාරිපුත්‍ර තෙරණුවෙනි, අමනාපගති තබා මනාපගතින් මැ ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන්නේ යැ යන යම් කරුණෙක් වේ ද, තෙල කරුණ ශ්‍රාවකයක්හට නිසි වෙයි. ඡන්න භික්ෂු අනුපවද්‍ය (අප්‍රතිසන්ධික) කොට ශස්ත්‍රාහරණ කෙරේ යයි මෙසේ ඇවත් සැරියුත් තෙරණුවෙනි, තෙල කරුණ ධරන්නේ මැනැව.

ඉදින් ආයුෂ්මත් ඡන්නයෝ ප්‍රශ්නව්‍යාකරණ සඳහා අවකාශකෙරෙත් නම් අපි ආයුෂ්මත් ඡන්නයන් අතින් කිසි දෙසක් පුළුවුසුම්හ. ඇවත් සැරියුත් තෙරණුවෙනි, පුළුවුස්නේ මැනැව, අසා දනුම්හ ' යි.

ඇවත් ඡන්නයෙනි, චක්ෂුස චක්ෂුර්විඥාන චක්ෂුර්විඥානයෙන් විඥාතව්‍යධර්ම " තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්මය " යි නුවණින් දක්නෙහි ද ? ඇවත් ඡන්නයෙනි, ශ්‍රොත්‍ර ශ්‍රොත්‍රවිඥාන . . . ඇවත් ඡන්නයෙනි, ඝ්‍රාණ ඝ්‍රාණවිඥාන . . . ඇවත් ඡන්නයෙනි, ජිහ්වා ජිහ්වාවිඥාන . . . ඇවත් ඡන්නයෙනි, කාය කායවිඥාන . . . ඇවත් ඡන්නයෙනි, මනස මනොවිඥාන මනොවිඥානයෙන් විඥාතව්‍යධර්ම " තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යයි නුවණින් දක්නෙහි ද " යි.

ඇවත් සැරියුත් තෙරණුවෙනි, චක්ෂුස චක්ෂුර්විඥාන චක්ෂුර්විඥානයෙන් විඥාතව්‍ය ධර්ම ' තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි. තෙලෙ මා ආත්ම නො වේ ' යයි නුවණින් දක්මි. ඇවත් සැරියුත් තෙරණුවෙනි, ශ්‍රොත්‍ර ශ්‍රොත්‍රවිඥාන . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, ඝ්‍රාණ ඝ්‍රාණවිඥාන . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, ජිහ්වා ජිහ්වාවිඥාන . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, කාය කායවිඥාන . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, මනස මනොවිඥාන මනොවිඥානයෙන් විඥාතව්‍යධර්ම ' තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ ' යයි නුවණින් දක්මි.

චක්ඛුස්මිං ආවුසො ඡන්න, චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු කිං දිස්වා කිං අභිඤ්ඤාය චක්ඛුං චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සසි. සොතස්මිං ආවුසො ඡන්න, සොතවිඤ්ඤාණෙ -පෙ- ඝානස්මිං ආවුසො ඡන්න, ඝානවිඤ්ඤාණෙ -පෙ- ජිව්හාය ආවුසො ඡන්න, ජිව්හාවිඤ්ඤාණෙ -පෙ- කායස්මිං ආවුසො ඡන්න, කායවිඤ්ඤාණෙ -පෙ- මනස්මිං ආවුසො ඡන්න, මනොවිඤ්ඤාණෙ මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු කිං දිස්වා කිං අභිඤ්ඤාය මනං මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සසීති.

චක්ඛුස්මිං ආවුසො සාරිපුත්ත, චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු නිරොධං දිස්වා නිරොධං අභිඤ්ඤාය චක්ඛුං චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සාමි. සොතස්මිං ආවුසො සාරිපුත්ත, සොතවිඤ්ඤාණෙ-පෙ- ඝානස්මිං ආවුසො සාරිපුත්ත, ඝානවිඤ්ඤාණෙ -පෙ- ජිව්හාය ආවුසො සාරිපුත්ත, ජිව්හා විඤ්ඤාණෙ -පෙ- කායස්මිං ආවුසො සාරිපුත්ත, කායවිඤ්ඤාණෙ -පෙ- මනස්මිං ආවුසො සාරිපුත්ත, මනොවිඤ්ඤාණෙ, මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු නිරොධං දිස්වා නිරොධං අභිඤ්ඤාය මනං මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති සමනුපස්සාමීති.

එවං වුත්තෙ ආයස්මා මහාචුන්දො, ආයස්මන්තං ඡන්නං එතදවොච: තස්මාතිහ ආවුසො ඡන්න, ඉදම්පි තස්ස භගවතො සාසනං නිච්චකප්පං මනසි කාතබ්බං: නිස්සිතස්ස චලිතං. අනිස්සිතස්ස චලිතං නත්ථි. චලිතෙ අසති පස්සද්ධි. පස්සද්ධියා සති නති න හොති. නතියා අසති ආගතිගති න හොති. ආගතිගතියා අසති චුතූපපාතො න හොති. චුතූපපාතෙ අසති නෙව ඉධ න හුරං න උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සා'ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මා ච මහාචුන්දො ආයස්මන්තං ඡන්නං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කමිංසු. අථ ඛො ආයස්මා ඡන්නො, අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ච සාරිපුත්තෙ ආයස්මන්තෙ ච මහාචුන්දෙ සත්ථං ආහරෙසි. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: ආයස්මතා භන්තෙ, ඡන්නෙන සත්ථං ආහරිතං, තස්ස කා ගති කො අභිසම්පරායොති;

ඇවත් ඡන්නයෙනි, චක්ඛුසෙහි චක්ඛුර්විඥානයෙහි චක්ඛුර්විඥානයෙන් විඥතව්‍ය ධර්මයෙහි කුමක් දැක කුමක් අවබොධ කොට චක්ඛුස චක්ඛුර්විඥාන චක්ඛුර්විඥානයෙන් විඥතව්‍යධර්ම යන මේ '' තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ යයි නුවණින් දක්නෙහි. ඇවත් ඡන්නයෙනි, ශ්‍රොත්‍රයෙහි ශ්‍රොත්‍ර විඥානයෙහි . . . ඇවත් ඡන්නයෙනි, ඝ්‍රාණයෙහි ඝ්‍රාණවිඥානයෙහි . . . ඇවත් ඡන්න යෙනි, ජිහ්වායෙහි ජිහ්වාවිඥානයෙහි . . . ඇවත් ඡන්නයෙනි, කයෙහි කායවිඥානයෙහි . . . ඇවත් ඡන්නයෙනි, මනස්හි මනොවිඥානයෙහි මනොවිඥානයෙන් විඥතව්‍ය ධර්මයෙහි කුමක් අවබොධ කොට මනස මනොවිඥාන මනොවිඥානයෙන් විඥතව්‍යධර්ම යන මේ තෙල මා ගැත්තේ නො වෙයි. තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ යයි නුවණින් දක්නෙහි ?

ඇවත් සැරියුත් තෙරණුවෙනි, චක්ඛුසෙහි චක්ඛුර්විඥානයෙහි චක්ඛුර්විඥානයෙන් විඥතව්‍ය ධර්මයෙහි නිරොධය දැක නිරොධය අවබොධ කොට චක්ඛු චක්ඛුර්විඥාන චක්ඛුර්විඥානයෙන් විඥතව්‍යධර්ම යන මේ '' තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි. තෙලෙ මාගේ ආත්ම නො වේ යයි නුවණින් දක්මි. ඇවත් සැරියුත් තෙරණුවෙනි, ශ්‍රොත්‍රයෙහි ශ්‍රොත්‍රවිඥානයෙහි ... ඇවත් සැරියුත් තෙරණුවෙනි, ඝ්‍රාණයෙහි ඝ්‍රාණවිඥානයෙහි . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, ජිහ්වායෙහි ජිහ්වා විඥානයෙහි . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, කයෙහි කායවිඥානයෙහි . . . ඇවත් සැරියුත් තෙරණුවෙනි, මනස්හි මනොවිඥානයෙහි මනොවිඥානයෙන් විඥතව්‍ය ධර්මයෙහි නිරොධය දැක, නිරොධය අවබොධ කොට මනස මනොවිඥාන මනොවිඥානයෙන් විඥතව්‍ය ධර්ම යන මේ '' තෙල මා ගැත්තේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි. තෙලෙ මා ගේ ආත්ම නො වේ යයි මෙසේ නුවණින් දක්මි '' යි කී.

මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ආයුෂ්මත් ඡන්න තෙරුන්ට තෙල කීහ : ' ඇවත් ඡන්නයෙනි, ඒ මාරණාන්තික වෙදනා ඇතියෙන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ මේ අනුශිෂ්ටිය ද නිරතුරු සිහි කරන්නේ මැනැව. තෘෂ්ණාදීන් නිඃශ්‍රිතයා හට ක්ලෙශකම්පනය වෙයි, අනිඃශ්‍රිතයා හට චලිතයෙක් නැත. චලිතය නැති කල්හි කෙලෙස් සන්හිඳුම් වෙයි. සන්හිඳුම් ඇතිවත් ම තෘෂ්ණා නො වෙයි. තෘෂ්ණා නැතිවත් ම (පිළිසඳ විසින්) ආගමන හා (ච්‍යුති විසින්) ගමන නො වෙයි. ආගති හා ගති නැති වත් ම ච්‍යුති උපපාත දෙක නො වෙයි. ච්‍යුති උපපාත දෙක නැති වත් ම මෙලොවැ හෝ නො වෙයි. පරලොවැ හෝ නො වෙයි. දෙලොවහි මැ නො වෙයි. දුඃඛයා ගේ තෙලෙ මැ කෙළවර වෙයි.

එසඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාචුන්දතෙරණුවෝ ද ආයුෂ්මත් ඡන්න තෙරණුවන්ට මේ අවවාදයෙන් අවවාද දී හුනස්නෙන් නැඟී වැඩියෝ. එසඳ ආයුෂ්මත් ඡන්න තෙරහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා ආයුෂ්මත් මහාචුන්ද තෙරණු වන් වඩනා හා මැ ශස්ත්‍රාහරණ කළෝ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ. '' වහන්ස, ආයුෂ්මත් ඡන්න තෙරුන් විසින් ශස්ත්‍රාහරණ කරන ලද '' ඔහුගේ ගති කවර ? පරලොව කවරෙ ' යි.

නනු තෙ සාරිපුත්ත, ඡන්නෙන භික්ඛුනා සම්මුඛායෙව අනුපවජ්ජතා බ්‍යාකතාති:

අත්ථි භන්තෙ, පුබ්බජිරං නාම වජ්ජිගාමො. තත්‍රායස්මතො[1] ඡන්නස්ස මිත්තකුලානි සුහජ්ජකුලානි උපවජ්ජකුලානී'ති. හොන්ති හෙතෙ සාරිපුත්ත, ඡන්නස්ස භික්ඛුනො මිත්තකුලානි සුහජ්ජකුලානි උපවජ්ජ-කුලානි. නාහං සාරිපුත්ත, එත්තාවතා සඋපවජ්ජොති වදාමි. යො ඛො සාරිපුත්ත, ඉමඤ්ච කායං නික්ඛිපති. අඤ්ඤඤ්ච කායං උපාදියති, තමහං සඋපවජ්ජො'ති වදාමි. තං ඡන්නස්ස භික්ඛුනො නත්ථි. අනුපවජ්ජො, ඡන්නො භික්ඛු සත්ථං ආහරෙසීති[2].

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා සාරිපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

ඡන්නොවාද සුත්තං දුතියං

---

1. තත්ථායස්මතො - මජසං.
2. එවමෙතං සාරිපුත්ත ධාරෙහීති - මජසං, අධිසං.

ශාරිපුත්‍රය, ඡන්න මහණහු විසින් තොප හමියෙහි මැ අනුපවද්‍යතා පවසන ලද නො ? යි.

වහන්ස, පුබ්බජිර නම් වැද්දගමෙක් ඇත. එහි ආයුෂ්මත් ඡන්න තෙරුන් ගේ මිත්‍ර කුලයන් හා සුහද කුලයන් හා එළැඹිය යුතු කුලයෝ ද ඇත. ශාරිපුත්‍රය, ඡන්න මහණහු ගේ තෙල මිත්‍රකුලයෝ ද සුහද කුලයෝ ද ' උපවජ්ජ ' (එළැඹියැ යුතු) කුලයෝ ද වෙති. ශාරිපුත්‍රය, මම මෙතෙකින් සඋපවජ්ජහ ' යි නො කියමි. ශාරිපුත්‍රය, යමෙක් මේ කය හරණේ වේ ද, අන් කයකුදු ගන්නේ වේ ද, මම ඔහු සඋපවජ්ජහ ' යි කියමි. ඒ ඡන්න භික්ෂුහට නැත. (එහෙයින්) අනුපවජ්ජ වූ ඡන්න මහණ ශස්ත්‍රාහරණ කෙළේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ වදළ සේක. ප්‍රීතිසෞමනස්‍යයන් විසින් ගත් සිත් ඇති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය අභිනන්දන කළෝ.

දෙවැනි ඡන්නොවාද සූත්‍ර යි.

# 3. 5. 3

## පුණ්ණොවාද සුත්තං

එවං මෙ සුතං : එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා පුණ්ණො සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා පුණ්ණො භගවන්තං එතදවොච :

සාධු මං භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදතු, 'යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍ය'න්ති.

තෙන හි පුණ්ණ, සුණොහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො ආයස්මා පුණ්ණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච :

සන්ති ඛො පුණ්ණ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දි සමුදයා දුක්ඛසමුදයො පුණ්ණාති වදාමි.

සන්ති ඛො පුණ්ණ, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දිසමුදයා දුක්ඛසමුදයො පුණ්ණාති වදාමි.

සන්ති ඛො පුණ්ණ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති. නාභිවදති. නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති. නන්දි නිරොධා දුක්ඛනිරොධො පුණ්ණාති වදාමි.

සන්ති ඛො පුණ්ණ, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති, නාභිවදති, නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දිනිරොධා දුක්ඛනිරොධො පුණ්ණාති වදාමි.

# 3. 5. 3

## පුණ්ණෝවාද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහුගේ අරම්හි වැඩවාස කෙරෙති. එසඳ ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ සවස් වේලෙහි පිළිසලනින් නැංගාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හු. එකත්පස් වැ හුන් ආයුෂමත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකොළෝ :

වහන්ස ' මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් නිවනට මෙහෙයූ සිත් ඇතියෙම් වාස කෙරෙම් ද භාග්‍යවතුන් වහන්සේ මට එබඳු සංක්ෂිප්ත අවවාදයෙකින් අවවාද කරනසේක්වා ' යි අයැදසිටුම්හ ' යි.

' එසේ වී නම් පුණ්ණය, අසව, මනා කොට මෙනෙහි කරව, කියම්හ ' යි වදළහ.

' වහන්ස, එසේ යැ ' යි ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ:

පුණ්ණය, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රිය ස්වරූප වූ කාමොපසංහිත වූ සිත් ඇලවීමට නිසි චක්ෂුර්විඥෙය රූපායතන කෙනෙක් ඇත. ඉදින් මහණ ඒ රූපායතන අභිනන්දන කෙරේ ද, සිතින් ගෙන තෘෂ්ණා වශයෙන් බෙණේ ද, ගැලගෙන සිටී ද, ඒ රූපායතන අභිනන්දන කරන තෘෂ්ණා වශයෙන් බණන ගැලගෙන සිටුනා ඒ මහණහට තෘෂ්ණාව උපදී. තෘෂ්ණා සමුදය හේතුයෙන් පුණ්ණය, දුඃඛසමුදය වේ යයි කියම්හ.

පුණ්ණය, ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයතන කෙනෙක් . . . ඝ්‍රාණවිඥෙය ගන්ධායතන කෙනෙක් . . . ජිහ්වාවිඥෙය රසායතන කෙනෙක් . . . කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යායතන කෙනෙක් . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රඤ්ජනයට නිසි වූ මනොවිඥෙය ධර්මායතන කෙනෙක් ඇත. ඉදින්, මහණ ඒ ධර්මායතන අභිනන්දන කෙරේ ද, තෘෂ්ණා වශයෙන් බෙණේ ද, ගැලගෙන සිටුනේ වේ ද, එය අභිනන්දන කරන තෘෂ්ණා වශයෙන් බණන ගැලගෙන සිටුනා ඔහුට තෘෂ්ණා උපදී. තෘෂ්ණාසමුදය හෙතුයෙන් දුඃඛසමුදය වේ යයි කියම්හ.

පුණ්ණය, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රඤ්ජනාර්හ වූ චක්ෂුර්විඥෙය රූපායතන කෙනෙක් ඇත. ඉදින් මහණ ඒ රූපායතන අභිනන්දන නො කෙරේ ද, තෘෂ්ණා විසින් නො බෙණේ ද, ගැලගෙන නො සිටුනේ වේ ද, ඒ රූපායතන අභිනන්දන නො කරන තෘෂ්ණා හෙයින් නො බණන ගැලගෙන නො සිටුනා ඒ මහණහට තෘෂ්ණා නිරුද්ධ වෙයි. තෘෂ්ණානිරොධ හෙතුයෙන් පුණ්ණය, දුඃඛනිරොධ වේ යයි කියම්හ.

පුණ්ණය, ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයතන කෙනෙක් . . . ඝ්‍රාණවිඥෙය ගන්ධායතන කෙනෙක් . . . ජිහ්වාවිඥෙය රසායතන කෙනෙක් . . . කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යායතන කෙනෙක් . . . ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රඤ්ජනයට නිසි වූ මනොවිඥෙය ධර්මායතන කෙනෙක් ඇත. ඉදින් මහණ ඒ ධර්මායතන අභිනන්දන නො කෙරේ ද, තෘෂ්ණා හෙයින් නො බෙණේ ද, ගැලගෙන නො සිටුනේ වේ ද, ඒ ධර්මායතන අභිනන්දන නො කරන තෘෂ්ණා හෙයින් නො බණන ගැලගෙන නො සිටුනා ඔහුගේ තෘෂ්ණා නිරුද්ධ වෙයි. තෘෂ්ණා නිරොධ හෙතුයෙන් පුණ්ණය, දුඃඛනිරොධ වේ යයි කියම්හ.

ඉමිනා ච ත්වං පුණ්ණ, මයා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො කතරස්මිං ජනපදෙ විහරිස්සසීති. ඉමිනාහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො අත්ථි සුනාපරන්තො නාම ජනපදො තත්ථාහං විහරිස්සාමි.

චණ්ඩා බො පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා, ඵරුසා බො පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා. සචෙ තං පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා අක්කොසිස්සන්ති පරිභාසිස්සන්ති, තත්ථ තෙ පුණ්ණ කින්ති භවිස්සතී'ති.

සචෙ මං භන්තෙ, සුනාපරන්තකා මනුස්සා අක්කොසිස්සන්ති. පරිභාසිස්සන්ති, තත්ථ මෙ එවං භවිස්සති : 'භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා. යං මෙ නයිමෙ පාණිනා පහාරං දෙන්තී'ති. එවමෙත්ථ භගවා, භවිස්සති. එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා පාණිනා පහාරං දස්සන්ති, තත්ථ පන තෙ පුණ්ණ, කින්ති භවිස්සතී'ති.

සචෙ මෙ[1] භන්තෙ, සුනාපරන්තකා මනුස්සා පාණිනා පහාරං දස්සන්ති. තත්ථ මෙ එවං භවිස්සති: 'භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මෙ නයිමෙ ලෙඩ්ඩුනා පහාරං දෙන්තී'ති. එවමෙත්ථ භගවා, භවිස්සති. එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා ලෙඩ්ඩුනා පහාරං දස්සන්ති. තත්ථ පන තෙ පුණ්ණ, කින්ති භවිස්සතී'ති. සචෙ මෙ භන්තෙ, සුනාපරන්තකා මනුස්සා ලෙඩ්ඩුනා පහාරං දස්සන්ති, තත්ථ මෙ එවං භවිස්සති : 'භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මෙ නයිමෙ දණ්ඩෙන පහාරං දෙන්තී'ති. එවමෙත්ථ භගවා, භවිස්සති. එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා දණ්ඩෙන පහාරං දස්සන්ති. තත්ථ පන තෙ පුණ්ණ, කින්ති භවිස්සතී'ති. 'සචෙ පන මෙ භන්තෙ සුනාපරන්තකා මනුස්සා දණ්ඩෙන පහාරං දස්සන්ති. තත්ථ මෙ එවං භවිස්සති: භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපන්තකා මනුස්සා, යං මෙ නයිමෙ සත්ථෙන පහාරං දෙන්තී'ති. එවමෙත්ථ භගවා, භවිස්සති එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා සත්ථෙන පහාරං දස්සන්ති. තත්ථ පන තෙ පුණ්ණ කින්ති භවිස්සතී'ති. 'සචෙ මෙ භන්තෙ සුනාපරන්තකා මනුස්සා සත්ථෙන පහාරං දස්සන්ති. තත්ථ මෙ එවං භවිස්සති : 'භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මං[2] නයිමෙ තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙන්ති. එවමෙත්ථ භගවා, භවිස්සති. එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

---

1. සචෙ මං - සිමු.   2. යං මෙ - සිමු.

පුණ්ණය, මා විසින් මේ සංක්ෂිප්ත වූ අවවාදයෙන් අවවාද කරන ලද තෝ කිනම් දනව්යෙක වාස කෙරෙහි ? වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සංක්ෂිප්ත අවවාද යෙන් මම ඔවා දෙනලදිමි. සුනාපරන්ත නම් දනව්යෙක් ඇත, එහි මම වාස කෙරෙමි.

පුණ්ණය, සුනපරන්ත දනවුවැසි මිනිස්හු චණ්ඩයහ. පුණ්ණය, සුනපරන්ත දනවුවැසි මිනිස්හු පරුෂයහ. පුණ්ණය, ඉදින් සුනාපරන්ත දනවුවැසි මිනිස්හු තට ආක්‍රොශ කෙරෙත් නම්, නින්ද බස් බෙණෙත් නම් පුණ්ණය, එහිලා තට කෙබඳු සිතෙක් වේ යැ ?

වහන්ස, ඉදින් සුනාපරන්ත දනව්වැසි මිනිස්හු මට ආක්‍රොශ කෙරෙත් නම් නින්ද බෙණෙත් නම් එහිලා මට මෙබඳු සිත් වෙයි : සුනාපරන්ත වැසි මේ මිනිස්හු එකාන්ත යෙන් භද්‍රයහ, සුනාපරන්ත වැසි මේ මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. යම් හෙයෙකින් මොහු මට අතින් පහර නො දෙත් ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි, සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙතියි සැල කොළෝ.

ඉදින් පුණ්ණය, තට සුනාපරන්ත වැසි මිනිස්හු අතින් පහර දෙත් නම් එහිලා පුණ්ණය තට කෙසේ සිත් වේ යැ ? යි.

වහන්ස, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්හු අතින් පහර දෙත් නම් එහිලා මට මෙසේ සිත් වෙයි : මේ සුනාපරන්ත වැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. මේ සුනාපරන්ත වැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. යම් හෙයෙකින් ඔහු මට කැටින් පහර නො දෙත් ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි. සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙති ' යි කී.

ඉදින් පුණ්ණය, සුනාපරන්ත වැසි මිනිස්හු තට කැටින් පහර දෙත් නම් පුණ්ණය, එහිලා තට කෙසේ සිත් වේ යැ ? යි. වහන්ස, ඉදින් මට සුනාපරන්ත වැසි මිනිස්හු කැටින් පහර දෙත් නම් එහිලා මට මෙසේ සිත් වෙයි : මේ සුනාපරන්ත වැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. මේ සුනාපරන්ත වැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. යම් හෙයෙකින් මොහු මට දඬින් පහර නො දෙත් ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි. සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙති ' යි කී.

ඉදින් පුණ්ණය, තට සුනාපරන්ත වැසි මිනිස්හු දඬින් පහර දෙත් නම් එහිලා පුණ්ණය, තට කෙසේ සිත් වේ යැ ? යි. වහන්ස, ඉදින් මට සුනාපරන්තවැසි මිනිස්හු දඬින් පහර දෙත් නම් එහිලා මට මෙසේ සිත් වෙයි. මේ සුනාපරන්තවැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ, මේ සුනාපරන්තවැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. යම් හෙයෙකින් ඔහු මට සැතින් පහර නො දෙත් ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි. සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙති ' යි කී.

ඉදින් පුණ්ණය, තට සුනාපරන්තවැසි මිනිස්හු සැතින් පහර දෙත් නම් එහිලා පුණ්ණය, තට කෙසේ සිත් වේ යැ ? යි. වහන්ස, ඉදින් මට සුනාපරන්තවැසි මිනිස්හු සැතින් පහර දෙත් නම් එහිලා මට මෙසේ සිත් වෙයි. මේ සුනාපරන්තවැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ, මේ සුනාපරන්තවැසි මිනිස්හු එකාන්තයෙන් භද්‍රයහ. යම් හෙයෙකින් තියුණු සැතින් මා දිවියෙන් තොර නො කෙරෙත් ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි. සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙති ' යි කී.

සචෙ පන තං පුණ්ණ[1], සුණාපරන්තකා මනුස්සා තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙස්සන්ති. තත්ථ පන තෙ පුණ්ණ, කින්ති භවිස්සතී'ති. සචෙ මං භන්තෙ, සුණාපරන්තකා මනුස්සා තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙන්ති. තත්ථ පන මෙ එවං භවිස්සති: සන්ති ඛො භගවතො සාවකා කායෙන ච ජීවිතෙන ච අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා සත්ථහාරකං පරියෙසන්ති, තං මෙ ඉදං අපරියිට්ඨංයෙව සත්ථහාරකං ලද්ධන්ති. එවමෙත්ථ භගවා, භවිස්සති. එවමෙත්ථ සුගත, භවිස්සතී'ති.

සාධු සාධු පුණ්ණ, සක්ඛිස්සසි ඛො ත්වං පුණ්ණ, ඉමිනා දමූපසමෙන සමන්නාගතො සුණාපරන්තස්මිං ජනපදෙ විහරිතුං. යස්සදානි ත්වං පුණ්ණ, කාලං මඤ්ඤසීති.

අථ ඛො ආයස්මා පුණ්ණො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සුණාපරන්තො ජනපදො, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සුණාපරන්තො ජනපදො, තදවසරි. තත්‍ර සුදං ආයස්මා පුණ්ණො සුණාපරන්තස්මිං ජනපදෙ විහරති.

අථ ඛො ආයස්මා පුණ්ණො තෙනෙවන්තරවස්සෙන පඤ්චමත්තානි උපාසකසතානි පටිපාදෙසි.[2] තෙනෙවන්තර වස්සෙන පඤ්චමත්තානි උපාසිකාසතානි පටිපාදෙසි. තෙනෙවන්තරවස්සෙන තිස්සො විජ්ජා සච්ඡාකාසි. අථ ඛො ආයස්මා පුණ්ණො අපරෙන සමයෙන පරිනිබ්බායි. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: යො සො භන්තෙ, පුණ්ණො නාම කුලපුත්තො භගවතා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො, සො කාලඞ්කතො. තස්ස කා ගති, කො අභිසම්පරායො'ති

පණ්ඩිතො භික්ඛවෙ, පුණ්ණො කුලපුත්තො, පච්චපාදි ධම්මස්සානුධම්මං, න ච මං ධම්මාධිකරණං විහෙඨෙසි. පරිනිබ්බුතො භික්ඛවෙ, පුණ්ණො කුලපුත්තොති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

පුණ්ණොවාද සුත්තං තතියං.

---

1. සචෙ පන තෙ පුණ්ණ - මජසං.
2. උපාසකසතානි පටිවෙදෙසි - මජසං.

ඉදින් පුණ්ණය, සුනාපරන්තවැසි මිනිස්හු තියුණු සැතින් තා දිවියෙන් තොර කෙරෙත් නම් පුණ්ණය, එහිලා තට කෙසේ සිත් වේ යැ ? යි. වහන්ස, ඉදින් සුනාපරන්තවැසි මිනිස්හු තියුණු සැතින් මා දිවියෙන් තොර කෙරෙත් නම් එහිලා මට මෙසේ සිත් වෙයි : ' භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක කෙනෙක් කයිනුදු දිවියෙනුදු පෙළෙන්නාහු ලජ්ජා කරන්නාහු පිළිකුල් කරන්නාහු ශස්ත්‍රහාරකයකු සොයන්නාහු ඇත. මා විසින් නො සොයනලද මැ ඒ ශස්ත්‍රහාරකයා ලැබිණැ ' යි භාග්‍යවතුන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙයි. සුගතයන් වහන්ස, මෙහිලා මෙසේ සිත් වෙති ' යි කී.

මැනැව මැනැව පුණ්ණය, මේ දම උපසම දෙකින් සමන්වාගත වැ සුනාපරන්ත දනවියෙහි වාස කරන්නට තෝ හැක්කෙහි පුණ්ණය, යි. දැන් එයට කල් දන පුණ්ණය, යි වදළෝ.

එසඳ ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට සෙනසුන් සඟවා තබා පාසිවුරු ගෙන සුනාපරන්තදනවු කරා සැරිසරා ගියහ. පිළිවෙළින් සැරිසරන්නාහු සුනාපරන්ත ජනපදය කරා ගියෝ. එසඳ ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ සුනාපරන්ත දනවියෙහි වාස කෙරෙති.

එකල ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ ඒ අතුරුවසෙහි පන්සියක් පමණ උපාසකයන් ඇති කොළෝ. ඒ අතුරුවසෙහි මැ පන්සියක් පමණ උපාසිකාවන් ඇති කොළෝ. ඒ අතුරුවසෙහි මැ ත්‍රිවිද්‍යා පසක් කොළෝ. ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ පසු කලෙක පිරිනිවියහ. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කොළෝ : වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂිප්ත අවවාදයෙන් ඔවා දෙනලද යම්පුණ්ණ නම් කුලපුත්‍රයෙක් වී ද හේ කලුරිය කෙළේ. ඔහුගේ ගති කවර ? පරලෝ කවරෙ ? යි.

මහණෙනි, පුණු කුලපුත් පණ්ඩිත වෙයි. ධර්මානුධර්මයෙහි පිළිපන්නෝ ය, ධර්ම හෙතුයෙන් මා නො වෙහෙසී. මහණෙනි, පුණ්ණ කුලපුත් පිරිනිවියේ යැ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්හු.

තුන් වැනි පුණ්ණොවාදසූත්‍ර යි.

# 3. 5. 4

## නන්දකොවාද සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො මහාපජාපතී ගොතමී පඤ්චමත්තෙහි භික්ඛුනීසතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච: ‘ඔවදතු භන්තෙ, භගවා භික්ඛුනියො, අනුසාසතු භන්තෙ, භගවා භික්ඛුනියො, කරොතු භන්තෙ, භගවා භික්ඛුනීනං ධම්මිං කථ’න්ති.

තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති පරියායෙන. ආයස්මා පන නන්දකො න ඉච්ඡති භික්ඛුනියො ඔවදිතුං පරියායෙන. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘කස්ස නු ඛො ආනන්ද, අජ්ජ පරියායො භික්ඛුනියො ඔවදිතුං පරියායෙනා’ති

නන්දකස්ස භන්තෙ, පරියායො භික්ඛුනියො ඔවදිතුං පරියායෙන[1], අයං භන්තෙ, ආයස්මා නන්දකො න ඉච්ඡති භික්ඛුනියො ඔවදිතුං පරියායෙනා’ති.

අථ ඛො භගවා ආයස්මන්තං නන්දකං ආමන්තෙසි: ‘ඔවද නන්දක, භික්ඛුනියො. අනුසාස නන්දක, භික්ඛුනියො, කරොහි ත්වං බ්‍රාහ්මණ. භික්ඛුනීනං ධම්මිං කථ’න්ති.

එවං භන්තෙති ඛො සො ආයස්මා නන්දකො භගවතො පටිස්සුත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි, සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො අත්තදුතියො යෙන රාජකාරාමො තෙනුපසඞ්කමි. අද්දසංසු[2] ඛො තා භික්ඛුනියො ආයස්මන්තං නන්දකං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආසනං පඤ්ඤපෙසුං, උදකඤ්ච පාදානං උපට්ඨපෙසුං. නිසීදි ඛො ආයස්මා නන්දකො පඤ්ඤත්තෙ ආසනෙ, නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි. තාපි ඛො භික්ඛුනියො ආයස්මන්තං නන්දකං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තා භික්ඛුනියො ආයස්මා නන්දකො එතදවොච: පටිපුච්ඡකථා ඛො භගිනියො, භවිස්සති. තත්ථ ආජානන්තීහි ආජානාමාතිස්ස වචනීයං, න ආජානන්තීහි න ආජානාමාතිස්ස වචනීයං. යස්සා වා පනස්ස කඞ්ඛා වා, විමති වා, අහමෙව තත්ථ පටිපුච්ඡිතබ්බො: ‘ඉදං භන්තෙ, කථං ඉමස්ස අත්ථො’ති.

එත්තකෙනපි මයං භන්තෙ, අය්‍යස්ස නන්දකස්ස අත්තමනා අභිරද්ධා. යං නො අය්‍යො නන්දකො පවාරෙතී’ති.

තං කිං මඤ්ඤථ භගිනියො, චක්ඛුං[3] නිච්චං වා අනිච්චං වා’ති?

අනිච්චං භන්තෙ.

---

1. සබ්බෙහෙව භන්තෙ, කතො පරියායො භික්ඛුනියො ඔවදිතුං - මඡසං, සීමු.
2. අද්දසාසුං - PTS.
3. චක්ඛු - මඡසං, සීමු.

# 3. 5. 4
# නන්දකොවාද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහසිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවාස කෙරෙති. එකල ගොයුම්ගොත් මහාප්‍රජාපතී මෙහෙණ පන්සියක් පමණ මෙහෙණන් හා සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ සිටගතු. එකත් පස් වැ සිටි ගොයුම්ගොත් මහාප්‍රජාපතී මෙහෙණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළා: ' වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහෙණනට ඔවා දෙනසේක්වා, වහන්ස භාග්‍යවතුන් වහන්සේ මෙහෙණනට අනුශාසනා කරන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහෙණනට ධර්ම කථා කරන සේක්වා යි.

එසමයෙහි ස්ථවිර භික්ෂූහු මෙහෙණනට වාර වශයෙන් ඔවා දෙති. ආයුෂ්මත් නන්දක තෙරණුවෝ මෙහෙණනට, වාර වශයෙන් ඔවා දෙන්නට නො කැමැති වෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරණුවන් ඇමැතූසේක : ' ආනන්දය, මෙහෙණනට වාර වශයෙන් ඔවා දෙන්නට අද කවරහුගේ වාරය වේ ද ? යි.

වහන්ස, මෙහෙණනට වාර වශයෙන් ඔවා දෙන්නට නන්දක තෙරණුවනට වාරය වෙයි. වහන්ස, මේ ආයුෂ්මත් නන්දක තෙරණුවෝ මෙහෙණනට වාර වශයෙන් ඔවා දෙන්නට නො කැමැතියහ.

එසඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දක තෙරණුවන් ඇමැතූසේක ; ' නන්දකය, මෙහෙණනට ඔවා දෙව. නන්දකය, මෙහෙණනට අනුශාසනා කරව. බ්‍රාහ්මණය, තෝ මෙහෙණනට ධර්මකථා කරව' යි.

' වහන්ස, එසේ යැ යි ඒ ආයුෂ්මත් නන්දක තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පෙරවරු හැඳ පෙරෙවු පාසිවුරු ගෙන සැවැතට පිඬු පිණිස පිවිසියහ. සැවැත්හි පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළැක්කාහු තමහට දෙවැන්නකු ඇති වැ රාජකාරාමය කරා එළඹියහ. ඒ මෙහෙණහු දුර දී මැ ආයුෂ්මත් නන්දක තෙරණුවන් එනුවන් දුටහ. දැක අසුන් පැන්වූහු. පා දෝනා දිය එළවූහු. ආයුෂ්මත් නන්දක තෙරණුවෝ පැන්වූ අස්නෙහි හුන්හ. හිඳ පාද ප්‍රක්ෂාලනා කොළෝ. ඒ මෙහෙණහු ද ආයුෂ්මත් නන්දක තෙරණුවන් සකසා වැඳ එකත්පස් වැ හුන්හ. එකත් පස් වැ හුන් මෙහෙණනට ආයුෂ්මත් නන්දක තෙරණුවෝ මෙල කීහ : බුහුනැණියෙනි, පිළිවිස කරන කථායෙක් ඇත. එහි දී වටහා දන්නවුන් විසින් ' දනුම්හ 'යි කියයුතු වෙයි. වටහා නො දන්නවුන් විසින් ' නො දනුම්හ' යි කියයුතු වෙයි. යමක්හට සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද එහි දී මම මැ පිළිවිස්ස යුතුයෙම් වෙමි. (කෙසේ යැ ?) ' වහන්ස, මේ කෙසේ යැ ? මේ වචනයාගේ අර්ථ කවරේ යැ ? යි.

වහන්ස, අපි මෙතෙකින්දු ආය්‍ය්‍ය වූ නන්දක තෙරණුවනට සතුටු සිතැත්තමෝ වම්හ. අභිරද්ධයම්හ. යම් හෙයෙකින් ආය්‍ය්‍ය වූ නන්දක තෙරණුවෝ අප පවරත් ද එහෙයිනි.

බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව. චක්ෂුස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං. එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤථ භගිනියො, සොතං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

ඝානං නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ. -පෙ-

ජිව්හා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ. -පෙ-

කායො නිච්චො වා අනිච්චො වා'ති

අනිච්චො භන්තෙ. -පෙ-

මනො නිච්චො වා අනිච්චො වා'ති.

අනිච්චො භන්තෙ.

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: පුබ්බෙව නො හෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං: 'ඉතිපිමෙ ඡ අජ්ඣත්තිකා ආයතනා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො. තං කිං මඤ්ඤථ භගිනියො, රූපා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං. එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤථ භගිනියො, සද්දා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ -පෙ-.

යමෙක් අනිත්‍ය වේ නම්, ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ ද, ඒ ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම යයි දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ.

බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව. ශ්‍රොත්‍රය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ......

ඝ්‍රාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද?

වහන්ස, අනිත්‍ය යැ......

ජිහ්වා නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද?

වහන්ස, අනිත්‍ය යැ......

කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ......

මනස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම වෙමි, තෙල මා ආත්ම යයි එය තුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, තෙල කරුණ පළමු මැ අප විසින් ඇති තතු සම්‍යක් ප්‍රඥයෙන්, මොනොවට දක්නා ලදි: ' මෙ කරුණිනුදු මේ ආධ්‍යාත්මික ෂඩායතනයෝ අනිත්‍යයහ කියා ය.

මැනව මැනව බුහුනැණියෙනි, බුහුනැණියෙනි, තෙල යථාභූතය සම්‍යක් ප්‍රඥයෙන් දක්නා ආර්‍ය්‍යශ්‍රාවකයක් හට තෙල සිත් මෙසේ වේ මැ යි. බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව රූපායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් එය ' තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යයි තුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ.

බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව, ශබ්දායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ...

ගන්ධා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ. -පෙ-

රසා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ. -පෙ-

ඵොට්ඨබ්බා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ. -පෙ-

ධම්මා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං. එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති,

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: පුබ්බෙව නො හෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං: ඉතිපි මෙ ඡ බාහිරා ආයතනා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො. තං කිං මඤ්ඤථ භගිනියො, චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං. එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤථ භගිනියො, සොතවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

ඝානවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

ජිව්හාවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

කායවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

ගන්ධායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ......

රසායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ...

ස්ප්‍රෂ්ටව්‍යායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ...

ධර්මායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.

යමෙක් අනිත්‍ය වේනම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් එය ' තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, අප විසින් තෙල යථාභූතය පළමු වැ සම්‍යක් ප්‍රඥයෙන් මොනවට දක්නා ලදි: මේ හෙතුයෙනුදු බාහිර ෂඩායතනයෝ අනිත්‍යයහ'යි කියා යි.

මැනැව මැනැව බුහුනැණියෙනි. මෙසේ බුහුනැණියෙනි, යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දක්නා ආර්‍යශ්‍රාවකයක්හට තෙල සිත් වෙයි. ඒ කෙසේ හඟනාව බුහුනැණියෙනි, චක්ෂුර්විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් ' තෙල මා ගැත්තේ යැ තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි එය නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ.

ඒ කෙසේ හඟනාව බුහුනැණියෙනි, ශොත්‍රවිඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

ඝ්‍රාණ විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ......

ජිහ්වාවිඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ...

කායවිඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ...

මනොවිඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: පුබ්බෙව නො හෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං: ඉතිපි මෙ ඡ විඤ්ඤාණකායා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, ආභාපි අනිච්චා විපරිණාමධම්මා. යො නු ඛො භගිනියො එවං වදෙය්‍ය, 'අමුස්ස තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, යා ඛ්වාස්ස ආභා, සා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා'ති. සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යාති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: අමුස්ස හි භන්තෙ, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, පගෙවස්ස ආභා අනිච්චා විපරිණාමධම්මා'ති.

එවමෙව ඛො භගිනියො, යො නු ඛො එවං වදෙය්‍ය, ඡ හි ඛො ඉමා අජ්ඣත්තිකා ආයතනා අනිච්චා, යඤ්ච ඛො ඡ අජ්ඣත්තිකෙ ආයතනෙ පටිච්ච පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මන්ති. සම්මා[1] නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු, 'තජ්ජං තජ්ජං භන්තෙ. පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, ඡායාපි අනිච්චා විපරිණාමධම්මා. යො නු ඛො භගිනියො, එවං වදෙය්‍ය: 'අමුස්ස මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, යා ච ඛ්වාස්ස ඡායා සා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා'ති. සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: 'අමුස්ස හි භන්තෙ, මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, පගෙවස්ස ඡායා අනිච්චා විපරිණාමධම්මා'ති.

---

1. යං සම්මා - සීමු.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් ' තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මා ගේ ආත්ම යැ'යි එය නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, අප විසින් පළමු ව තෙල යථාභූතය සම්‍යක් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදි: ' මේ හෙතුයෙනුදු මේ සවැදෑරුම් විඥනකායයෝ අනිත්‍යයහ කියා යි.

මැනැව මැනැව බුහුනැණියෙනි, මෙසේ බුහුනැණියෙනි, යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දක්නා ආර්‍යශ්‍රාවකයක්හට තෙල සිත් වේ මැ යි.

බුහුනැණියෙනි, යම් පරිදි දූල්වෙන තෙල් පහනක්හුගේ තෙල ද අනිත්‍ය වේ ද පෙරළෙන සැහැවි ඇති වේ ද, වැටි ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, සිළු ද අනිත්‍ය විපරිණාම ධර්ම වේ ද, එලි ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, බුහුනැණියෙනි, යමෙක් ' මේ දූල්වෙන තෙල් පහනෙහි තෙල ද අනිත්‍ය යැ විපරිණාම ධර්ම යැ, වැටි ද අනිත්‍ය යැ විපරිණාම ධර්ම යැ, සිළු ද අනිත්‍ය යැ විපරිණාම ධර්ම යැ, මේ ප්‍රදීපයාගේ යම් එළියෙක් ඇද්ද ඒ නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමධර්ම යැ යි මෙසේ කියා නම් බුහුනැණියෙනි, ඒ බණන්නා මැනැවක් බෙණේ දූ ?යි.

වහන්ස, තෙල මැනැවෙක් නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : මේ දූල්වෙන තෙල ප්‍රදීපයාගේ තෙල ද අනිත්‍ය යැ විපරිණාමධර්ම යැ, වැටි ද අනිත්‍ය යැ විපරිණාමධර්ම යැ, සිළු ද අනිත්‍ය යැ විපරිණාම ධර්ම යැ, කැල මැ තෙල ප්‍රදීපයාගේ එලිය අනිත්‍ය විපරිණාමධර්ම වේ ද එහෙයිනි.

එපරිදි මැ බුහුණැනියෙනි. යමෙක් ' මේ ආධ්‍යාත්මික ෂඩායතනයෝ අනිත්‍යයහ. ආධ්‍යාත්මික ෂඩායතනයන් නිසා යම් සුඛයක් හෝ දුඃඛයක් හෝ උපෙක්ෂාවෙදනාවක් හෝ විඳුනේ නම් ඒ නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමධර්ම යැ'යි මෙසේ කියා නම් බුහුනැණියෙනි, බණන හේ මොනොවට බණන්නේ වේ ද ?

වහන්ස, තෙල බිණීම මනා නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : තත් තත් සවභාව වූ ප්‍රත්‍යය නිසා තත් තත් ස්වභාව වූ වෙදනාවෝ උපදිති. තත් තත් සවභාව වූ ප්‍රත්‍යයාගේ නිරොධයෙන් තත් තත් සවභාව වූ වේදනාවෝ නිරුද්ධ වෙති එහෙයිනි.

මැනැව මැනැව බුහුනැණියෙනි, යථාභූතය සම්‍යක්ප්‍රඥයෙන් දක්නා ආර්‍යශ්‍රාවකයක් හට තෙල සිත් වේ මැ යැ.

බුහුනැණියෙනි, යම්සේ මුල් බැස සිටි සාරවත් මහාවෘක්ෂයක්හුගේ මුල ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කඳ ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, ශාඛාපලාස ද අනිත්‍ය විපරිණාම ධර්ම වේ ද, සෙවණ ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, බුහුනැණියෙනි, යමෙක් මුල් බැසසිටි සාරවත් මේ මහාවෘක්ෂයාගේ මුල ද අනිත්‍ය විපරිණාමධර්ම යැ යි කඳ ද අනිත්‍ය විපරිණාමධර්ම යැ යි අතුකොළ ද අනිත්‍ය විපරිණාමධර්ම යැ යි ද මේ වෘක්ෂයාගේ යම් සෙවණෙක් ඇද්ද ඒ නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමධර්ම යැ'යි මෙසේ කියා ද බුහුනැණියෙනි, බණන හේ මොනොවට බෙණේ දූ යි.

වහන්ස, තෙල මනා බිණීමෙක් නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, මුල් බැස සිටුනා සාරවත් වූ මේ මහාවෘක්ෂයා ගේ මුල ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කඳ ද අනිත්‍ය විපරිණාම ධර්ම වේ ද, අතු කොළ දූ ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කැල මැ මේ වෘක්ෂයාගේ සෙවණ අනිත්‍ය විපරිණාමධර්ම වේ ද එහෙයිනි.

එවමෙව ඛො භගිනියො, යො නු ඛො එවං වදෙය්‍ය: ඡ ඛො මෙ බාහිරා ආයතනා අනිච්චා විපරිණාමධම්මා. යඤ්ච ඛො ඡ බාහිරෙ ආයතනෙ පටිච්ච පටිසංවෙදෙමි සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මන්ති, සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: තජ්ජං තජ්ජං භන්තෙ, පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්තී'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා තිණ්හෙන ගොවිකත්තනෙන ගාවිං විකන්තෙය්‍ය,[1] අනුපහච්ච අන්තරං මංසකායං, අනුපහච්ච බාහිරං චම්මකායං, යං යදෙව තත්ථ අන්තරා විලිමංසං, අන්තරා නහාරූ, අන්තරා බන්ධනං, තං තදෙව තිණ්හෙන ගොවිකත්තනෙන සඤ්ඡින්දෙය්‍ය සඞ්කන්තෙය්‍ය සම්පකන්තෙය්‍ය. සම්පරිකන්තෙය්‍ය. සඤ්ඡින්දිත්වා, සඞ්කන්තිත්වා සම්පරිකන්තිත්වා විධුනිත්වා බාහිරං චම්මකායං තෙනෙව චම්මෙන තං ගාවිං පටිච්ඡාදෙත්වා එවං වදෙය්‍ය: 'තථෙවායං ගාවී සංයුත්තා ඉමිනාව චම්මෙනා'ති. සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: අමු හි භන්තෙ, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා තිණ්හෙන ගොවිකත්තනෙන ගාවිං සඞ්කන්තෙය්‍ය අනුපහච්ච අන්තරං මංසකායං. අනුපහච්ච බාහිරං චම්මකායං, යං යදෙව තත්ථ අන්තරා විලිමංසං, අන්තරා නහාරූ, අන්තරා බන්ධනං, තං තදෙව තිණ්හෙන ගොවිකත්තනෙන සඤ්ඡින්දෙය්‍ය, සඞ්කන්තෙය්‍ය, සම්පකන්තෙය්‍ය, සම්පරිකන්තෙය්‍ය. සඤ්ඡින්දිත්වා සඞ්කන්තිත්වා සම්පරිකන්තිත්වා විධුනිත්වා බාහිරං චම්මකායං තෙනෙව චම්මෙන තං ගාවිං පටිච්ඡාදෙත්වා කිඤ්චාපි සො එවං වදෙය්‍ය: 'තථෙවායං ගාවී සංයුත්තා ඉමිනාව චම්මෙනා'ති. අථ ඛො සා ගාවී විසංයුත්තා තෙනෙව චම්මෙනා'ති.

උපමා ඛො මෙ අයං භගිනියො, කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයමෙවෙත්ථ අත්ථො: 'අන්තරා මංසකායොති ඛො භගිනියො ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. බාහිරෙ චම්මකායොති ඛො භගිනියො, ඡන්නෙතං බාහිරානං ආයතනානං අධිවචනං. අන්තරා විලිමංසං අන්තරා නහාරූ අන්තරා බන්ධනන්ති ඛො භගිනියො, නන්දිරාගස්සෙතං අධිවචනං. තිණ්හං ගොවිකත්තනන්ති ඛො භගිනියො, අරියායෙතං පඤ්ඤාය අධිවචනං යා'යං අරියා පඤ්ඤා අන්තරා කිලෙසං අන්තරා සඤ්ඤොජනං අන්තරා බන්ධනං සඤ්ඡින්දති සඞ්කන්තති සම්පකන්තති සම්පරිකන්තති.

1. සඞ්කන්තෙය්‍ය - මජ්ඣං, සිමු.

එපරිදි මැ බුහුනැණියෙනි, යමෙක් ' මේ බාහිර ෂඩායතනයෝ අනිත්‍ය විපරිණාම ධර්මයහ. බාහිර ෂඩායතනයන් නිසා යම් සුඛයක් හෝ දුඃඛයක් හෝ උපෙක්ෂා වෙදනාවක් හෝ විඳුනේ නම් එය නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමධර්ම යැ ' යි මෙසේ බණන්නේ නම් බුහුනැණියෙනි, මෙසේ බණන හේ මනා කොට බෙණේ' ද? යි.

වහන්ස, තෙල නො වේ මැ යැ, ඒ කවර හෙයින යත් : තත් තත් ස්වභාව වූ ප්‍රත්‍යය නිසා තත් තත් ස්වභාව වූ වෙදනාවෝ උපදිති. තත් තත් ස්වභාව වූ ප්‍රත්‍යයාගේ නිරොධයෙන් තත් තත් ස්වභාව වූ වෙදනාවෝ නිරුද්ධ වෙත්. එහෙයිනි.

මැනැව මැනැව බුහුනැණියෙනි, යථාභූතය සම්‍යක් ප්‍රඥයෙන් දක්නා ආර්‍යශ්‍රාවකයා හට තෙල සිත් වේ මැ යි.

යම්සේ බුහුනැණියෙනි, දක්ෂ වූ ගවඝාතකයෙක් හෝ ගවඝාතක අතැවැසියෙක් හෝ ගවදෙනක නසා තියුණු ගෙරි කපන කැත්තෙන් ගවදෙන වෙන් කොට කපන්නේ වේ ද, අතර මාංශකාය නො පෙළා බාහිර චර්මකාය නො පෙළා යම් යම් එහි අතුරු විලිමස් අතුරු නහර අතුරු බන්ධන ඇද්ද, ඒ ඒ දය මැ තියුණු ගෙරි කපන කැත්තෙන් සිඳුනේ වේ ද බිඳ කපන්නේ වේ ද වෙසෙසින් බිඳ කපන්නේ වේ ද හාත්පසින් බිඳ කපන්නේ වේ ද හාත්පසින් සිඳ හාත්පසින් කපා හාත්පසින් මොනොවට කපා මෙසේ බාහිර සම්කය ගලවාගෙන ඒ සමින් මැ ඒ දෙන වසා මෙසේ කියන්නේ වේ ද මේ සමින් මැ තුබූ සැටි මැ ගෙන ' සංයුක්ත ' යයි ' බුහුනැණියෙනි, බණනා හේ මොනොවට බණන්නේ වේ ද ?

වහන්ස, තෙල නො වන්නේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, දක්ෂ වූ මේ ගොඝාතක වේවයි ගොඝාතක අතැවැසි වේවයි දෙනක මරා තියුණු ගෙරි කපන කැත්තෙන් අතර මස්කය නො පෙළා බැහැර සම්කය නො පෙළා එහි යම් යම් අතුරු විලිමස් අතුරු නහර අතුරු බැඳුම් ඇද්ද, ඒ ඒ දය මැ තියුණු ගෙරි කපන කැත්තෙන් මොනොවට වෙන් කරනුයේ මොනොවට කපනුයේ මොනොවට හාත්පස කපනුයේ මොනොවට වෙන් කොට කපනුයේ වේ ද, මොනොවට වෙන් කොට, මොනොවට කපා, මොනොවට වෙන් කොට කපා බැහැර සම්කය උපුටා ගෙන ඒ සමින් මැ දෙන වසා ' මේ සමින් මැ මේ දෙන තුබූ සැටි මැ සංයුක්ත වැ ඇතැ 'යි හෝ මෙසේ කියන්නේ නමුදු වැලි ඒ දෙන ඒ සමින් විසංයුක්ත මැ වේද, එහෙයිනි.

බුහුනැණියෙනි, මා විසින් අර්ථය හඟවනු සඳහා මේ උපමා කරනලදු. මෙහි මෙ මැ අර්ථ යැ : බුහුනැණියෙනි, ' අතුරු මස්කය යැ ' යන තෙල සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයට නමි. බුහුනැණියෙනි, ' බාහිර චර්මකාය යැ යන තෙල සවැදෑරුම් වාහ්‍යායතනයනට නමි. බුහුනැණියෙනි, ' අතුරු විලිමස් යැ අතුරු නහර යැ අතුරු බන්ධන යැ යන තෙල නන්දිරාගයට නමෙකි. බුහුනැණියෙනි, තියුණු, ගෙරි කපන සැත යැ යන තෙල ආර්‍යප්‍රඥවට නමෙකි යම් ආර්‍යමාර්ගඥනයක් අතුරු කෙලෙස් අතුරු සංයොජන අතුරු බන්ධන මොනොවට සිඳී ද මොනොවට කපා ද මොනොවට ප්‍රකාරයෙන් කපා ද මොනොවට හාත්පසින් කපා ද එය යි.

37—ඒ 00502 (74/6)

සත්ත ඛො ඉමෙ භගිනියො, බොජ්ඣඞ්ගා යෙසං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. කතමෙ සත්ත: ඉධ භගිනියො, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ-සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙ ඛො භගිනියො, සත්ත බොජ්ඣඞ්ගා: යෙසං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව-ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති

අථ ඛො ආයස්මා නන්දකො තා භික්ඛුනියො ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උය්යොජෙසි: 'ගච්ඡථ භගිනියො, කාලො'ති

අථ ඛො තා භික්ඛුනියො ආයස්මතො නන්දකස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ආයස්මන්තං නන්දකං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො භගවා එතදවොච: 'ගච්ඡථ භික්ඛුනියො කාලො'ති.

අථ ඛො තා භික්ඛුනියො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

අථ ඛො භගවා අචිරපක්කන්තීසු තාසු භික්ඛුනීසු භික්ඛූ ආමන්තෙසි: 'සෙය්‍යථාපි භික්ඛවෙ, තදහුපොසථෙ චාතුද්දසෙ න හොති බහුනො ජනස්ස කඞ්ඛා වා විමති වා: 'ඌනො නු ඛො චන්දො, පුණ්ණො නු ඛො චන්දො'ති. අථ ඛො ඌනො චන්දො ත්වෙව හොති. එවමෙව ඛො භික්ඛවෙ, තා භික්ඛුනියො නන්දකස්ස ධම්මදෙසනාය අත්තමනා චෙව හොන්ති, නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පා'ති.

අථ ඛො භගවා ආයස්මන්තං නන්දකං ආමන්තෙසි: 'තෙන හි ත්වං නන්දක, ස්වෙපි තා භික්ඛුනියො තෙනෙවොවාදෙන ඔවදෙය්‍යාසී'ති. එවං භන්තෙති ඛො ආයස්මා නන්දකො භගවතො පච්චස්සොසි.

අථ ඛො ආයස්මා නන්දකො තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො අත්තදුතියො යෙන රාජකාරාමො තෙනුපසඞ්කමි. අද්දසංසු ඛො තා භික්ඛුනියො ආයස්මන්තං නන්දකං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන ආසනං පඤ්ඤාපෙසුං. උදකඤ්ච පාදානං උපට්ඨපෙසුං. නිසීදි ඛො ආයස්මා නන්දකො පඤ්ඤත්තෙ ආසනෙ, නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි. තාපි ඛො භික්ඛුනියො ආයස්මන්තං නන්දකං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තා භික්ඛුනියො ආයස්මා නන්දකො එතදවොච: 'පටිපුච්ඡකථා ඛො භගිනියො, භවිස්සති. තත්ථ ආජානන්තීහි ආජානාමාතිස්ස වචනීයං. න ආජානන්තීහි න ආජානාමාතිස්ස වචනීයං. යස්සා වා පනස්ස කඞ්ඛා වා විමති වා, අහමෙව තත්ථ පටිපුච්ඡිතබ්බො: 'ඉදං භන්තෙ කථං ඉමස්ස ක්වත්ථො'ති.

මහණෙනි, මේ බොධ්‍යඞගයෝ සත්දෙනෙක් වෙති. යම් බොධ්‍යඞග කෙනකුන් වැඩූ හෙයින් බහුල කළ හෙයින් මහණ ආස්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි තෙමේ මැ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසේ ද, කවර සත්දෙනෙක යත් : මහණෙනි, මෙ සස්නෙහි මහණ විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ වොස්සග්ගයට පිරිනැමුණු ස්මෘතිසම්බොධ්‍යඞගය වඩයි. . . . ධර්මවිචයසම්බොධ්‍යඞගය වඩයි. . . . වීර්‍ය්‍යසම්බොධ්‍යඞගය වඩයි. . . . ප්‍රීතිසම්බොධ්‍යඞගය වඩයි. . . . ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞගය වඩයි. . . . සමාධිසම්බොධ්‍යඞගය වඩයි. විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ වොස්සග්ගයට පිරිනැමුණු උපෙක්ෂාසම්බොධ්‍යඞගය වඩයි. මහණෙනි, යම් බොධ්‍යඞග කෙනකුන් භාවිත බහුලීකෘත හෙයින් මහණ ආස්‍රවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ ඵලසමාධිය ද ඵලප්‍රඥව ද ඉහාත්මයෙහි තෙමේ මැ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට උපයා වෙසේ ද එබඳු වූ මේ සප්තබොධ්‍යඞගයෝ යි.

ඉක්බිති ආයුෂ්මත් නන්දක තෙරණුවෝ ඒ මෙහෙණනට මේ අවවාදයෙන් ඔවා දී ' යව මහණෙනි, කලැ ' යි යවාලූහ.

එසඳ ඒ මෙහෙණහු ආයුෂ්මත් නන්දක තෙරණුවන්ගේ භාෂිතය අභිනන්දනා කොට අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී ආයුෂ්මත් නන්දක තෙරුන් වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ සිටියහ. එකත්පස් වැ සිටි ඒ භික්ෂුණීන්ට බුදුහු තෙල කරුණ වදළහ : ' යව මෙහෙණෙනි, කලැ ' යි.

එසඳ ඒ භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියාහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන් නික්මගිය නොබෝ කාලයෙහි භික්ෂූන් ඇමැතූසේක : ' මහණෙනි, යම් පරිදි එදවස් තුදුස්වක් පොහොයෙහි බොහෝ ජනයාට සඳ ඌන වූයේ දෙහෝ සඳ පිරුණේ දෝහො ' යි සැකයෙක් හෝ විමතියෙක් හෝ නො වෙයි. වැළි චන්ද්‍ර ඌන වූයේ මැ යයි සිත් වෙයි. එසෙයින් මැ මහණෙනි, ඒ මෙහෙණහු නන්දකයන්ගේ ධර්මදෙශනායෙන් සතුටුසිත් ඇත්තාහු ද වෙති, පරිපූර්ණ සංකල්ප ඇත්තාහු නොද වෙති ' යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දක තෙරුන් ඇමතූ සේක : එහෙයින් නන්දකය තෙපි සෙට ද ඒ මෙහෙණන් ඒ අවවාදයෙන් මැ අවවාද කරව ' යි. ' එසේ යැ වහන්සැ ' යි ආයුෂ්මත් නන්දක තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

ඉක්බිති ආයුෂ්මත් නන්දක තෙරණුවෝ ඒ රාත්‍රිය ඇවෑමෙන් පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැතියෝ එකලා වැ රාජකාරාමය කරා එළඹියහ. ඒ භික්ෂුණීහු ආයුෂ්මත් නන්දක තෙරණුවන් දුරින් මැ එනුවන් දුටහ. දැක අස්නක් පැනවූහ. පාදෝනා පිණිස දිය ද එළවා තැබූහ. ආයුෂ්මත් නන්දක තෙරණුවෝ පැනවූ අස්නෙහි වැඩහුන්හ. හිඳ පා දෙවූහ. ඒ මෙහෙණහු ද ආයුෂ්මත් නන්දක තෙරණුවන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ මෙහෙණනට ආයුෂ්මත් නන්දක තෙරණු වෝ තෙල වදළහ : මහණෙනි, ' ප්‍රතිපෘච්ඡාකථායෙක් වෙයි. එහිලා අවබොධ කොට දත්තවුන් විසින් ' දතුම්හ ' යි කියැයුතු වෙයි. අවබොධ නො කරන්නවුන් විසින් ' නො වටහම්හ ' යි කියැයුතු වෙයි. යමක්හට සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද එහිලා මා මැ පිළිවිසියයුතු වෙයි. ' වහන්ස, මේ කෙසේ යැ ? මේ වචනයාගේ අර්ථ කවරේ යැ ? කියා යි.

එත්තකෙනපි ඛෝ, භන්තෙ, අයාස්ස නන්දකස්ස අත්තමනා අභිරද්ධා, යං නො අය්‍යො නන්දකො පවාරෙතී'ති.

තං කිං මඤ්ඤථ භගිනියො, චක්ඛුං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤථ භගිනියො, සොතං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ —පෙ—

ඝානං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ —පෙ—

ජිව්හා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ. —පෙ—

කායො නිච්චො වා අනිච්චො වාති.

අනිච්චො භන්තෙ. —පෙ—

මනො නිච්චො වා අනිච්චො වාති.

අනිච්චො භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: පුබ්බෙව නො, භෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං: 'ඉතිපි මෙ ඡ අජ්ඣත්තිකා ආයතනා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො. තං කිං මඤ්ඤථ භගිනියො, රූපා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම. එසොහමස්මි, එසො මෙ අත්තාති.

නො හෙතං භන්තෙ.

වහන්ස, අපි මෙතෙකින්ද ආයර්‍ය වූ නන්දක තෙරණුවනට සතුටු සිතැත්තමෝ වම්හ. ඇලුණමෝ වම්හ. යම් හෙයෙකින් නන්දක තෙරණුවෝ අප පවරත් ද එහෙයිනි.

බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව. චක්ෂුස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇති වේ ද, ඒ ' තෙල මා ගැත්තේ යැ තෙල මම වෙමි. තෙල මාගේ ආත්ම යයි සමනුපස්සනාවට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි මැ යැ.

බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව, ශ්‍රොත්‍රය නිත්‍ය හෝ අනිත්‍ය වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

ඝ්‍රාණය නිත්‍ය හෝ අනිත්‍ය වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

ජිහ්වා නිත්‍ය හෝ අනිත්‍ය වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

කය නිත්‍ය හෝ අනිත්‍ය වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

මනස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

යමෙක් අනිත්‍ය වේ නම් ඒ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ. . . .

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ නම් ' තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ යි ගෙන එය සමනුපස්සනා කරන්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො වේ මැය. ඒ කවර හෙයින යත්: වහන්ස, තෙල අප විසින් පළමු වැ යථා භූත වැ සම්‍යක් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදී. මෙකරුණෙනුදු ආධ්‍යාත්මික ෂඩායතන අනිත්‍ය ය හ 'යි කියා යි.

මැනවැ මැනැවැ බුහුනැණියෙනි, තෙල යථා භූතය සම්‍යක් ඥනයෙන් දක්නා ආයර්‍යශ්‍රාවකයාහට තෙල සිත් මෙසේ වෙ මැයි. බුහුනැණියෙනි, ඒ කෙසේ හඟනාව රූපායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යය හ.

යමෙක් අනිත්‍ය නම් ඒ දුක් හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුක යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම සභාව වේ නම්, එය තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්මය යි නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නොනිසි වේ මැ යැ.

තං කිං මඤ්ඤථ භගිනියො, සද්දා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ -පෙ-

ගන්ධා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ. -පෙ-

රසා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ. -පෙ-

ඵොට්ඨබ්බා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ. -පෙ-

ධම්මා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: පුබ්බෙව නො හෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං: 'ඉතිපිමෙ ඡ බාහිරා ආයතනා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො. තං කිං මඤ්ඤථ භගිනියො, චක්ඛු-විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤථ භගිනියො, සොතවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. —පෙ—

ඝානවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

ජිව්හාවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

කායවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ. -පෙ-

මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

බුදුනැණියෙනි, ඒ කෙසේ හඟනාව, ශබ්දායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.........

ගන්ධායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යය හ.........

රසායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.........

ස්ප්‍රෂ්ටව්‍යායතනයො නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යය හ.........

ධර්මායතනයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.........

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම්, එය තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්මය'යි නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නොනිසි වේ යැ, ඒ කවර හෙයිනයත් : වහන්ස, තෙල අප විසින් යථාභූතව පළමු වැ සම්‍යග් ඥානයෙන්, මොනොවට දක්නා ලදී. මේ හෙතුයෙනුදු බාහිර ෂඩායතනයෙන් අනිත්‍යය හ'යි කියා යි.

මැනැවැ මැනැවැ බුහුනැණියෙනි, මෙසේ බුහුනැණියෙනි, යථාභූතය සම්‍යග් ඥානයෙන් දක්නා ආර්‍ය්‍යශ්‍රාවකයා හට තෙල සිත් වෙයි. ඒ කෙසේ හඟනාව බුහුනැණියෙනි, චක්ෂුර් විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්‍වභාව වේ නම්, තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි එය නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැයැ.

ඒ කෙසේ හඟනාව බුහුනැණියෙනි, ශොත්‍රවිඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය.........

ඝ්‍රාණවිඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය.........

ජිහ්වා විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය,.........

කායවිඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය.........

මනොවිඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍යය.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං : 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: පුබ්බෙව නො හෙතං භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං : 'ඉතිපි මෙ ඡ විඤ්ඤාණකායා අනිච්චා'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, ආභාපි අනිච්චා විපරිණාමධම්මා. යො නු ඛො, භගිනියො, එවං වදෙය්‍ය : 'අමුස්ස තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, යා ච ඛ්වාස්ස ආභා සා නිච්චා ධුවා සස්සතා අවිපරිණාම-ධම්මා'ති. සම්මා නු ඛො සො, භගිනියො, වදමානො වදෙය්‍යාති.

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: 'අමුස්ස හි භන්තෙ, තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි අනිච්චං විපරිණාමධම්මං, වට්ටිපි අනිච්චා විපරිණාමධම්මා, අච්චිපි අනිච්චා විපරිණාමධම්මා, පගෙවස්ස ආභා අනිච්චා විපරිණාමධම්මා'ති.

එවමෙව ඛො භගිනියො, යො නු ඛො එවං වදෙය්‍ය : 'ඡ ඛො මෙ අජ්ඣත්තිකා ආයතනා අනිච්චා, යඤ්ච ඛො ඡ අජ්ඣත්තිකෙ ආයතනෙ පටිච්ච පටිසංවෙදෙමි සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. තං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්ම'න්ති. සම්මා නු ඛො සො, භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: 'තජ්ජං තජ්ජං භන්තෙ, පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්ති'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො, මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, ඡායාපි අනිච්චා විපරිණාමධම්මා. යො නු ඛො භගිනියො, එවං වදෙය්‍ය : 'අමුස්ස මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, යා ච ඛ්වාස්ස ඡායා සා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා'ති. 'සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් 'තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්මයැ'යි එය නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, නො නිසි වේ මැ යි.

ඒ කවර හෙයින යත් : වහන්ස, යම් හෙයෙකින් අප විසින් ' මෙසේත් මේ ෂඩ්විඥානකායයෝ අනිත්‍යයහ ' යි තෙල තත්වූ පරිදි සම්‍යක්ප්‍රඥයෙන් මොනොවට දක්නාලද ද එහෙයිනි.

මැනැව මැනැව බුහුනැණියෙනි, යථාභූතය විදර්ශනාඥනයෙන් දක්නා ආර්‍ය්‍යශ්‍රාවක හට තෙල මෙසේ මැ වෙයි බුහුනැණියෙනි ' යි.

යම් පරිදි බුහුනැණියෙනි, දල්වෙන තෙල්පහනෙහි තෙලුදු අනිත්‍ය යැ, විපරිණාම ධර්ම යැ. වැටී දු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යැ. පහන්සිළුදු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යැ. එළිදු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යි. බුහුනැණියෙනි, යමෙක් මෙසේ කියා නම් මේ දල්වෙන තෛලප්‍රදීපයාගේ තෙලුදු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යැ. වැටිදු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යැ. පහන්සිළුදු අනිත්‍ය යැ, විපරිණාමධර්ම යැ. එහි යම් ආභායෙක් ඇද්ද, එය නිත්‍ය යැ, ධ්‍රැව යැ, ශාශ්වත යැ, අවිපරිණාමධර්ම යැ යි. බුහුනැණියෙනි, (මෙසේ) කියන හේ මනා කොට කියන්නේ දැ ? යි.

වහන්ස, තෙල නො වේ මැ යි. ඊට හෙතු කවරෙ යත් : වහන්ස, යම් හෙයෙකින් දල්වෙන මේ තෛලප්‍රදීපයාගේ තෙලුදු අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, වැටිදු අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, පහන්සිළුදු අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කැල මැ එහි එළිය අනිත්‍ය විපරිණාමධර්ම වේ ද එහෙයිනි.

එපරිදි මැ බුහුනැණියෙනි, යමෙක් මෙසේ කියා නම් ' මේ සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ අනිත්‍යයහ. ෂට් ආධ්‍යාත්මික ආයතනයන් නිසා යම් සුවයක් වේව යි දුකක් වේවයි උපෙක්ෂාවක් වේවයි විඳිම් ද එය නිත්‍ය යැ, ධ්‍රැව යැ, ශාශ්වත යැ, අවිපරිණාමධර්ම ය. බුහුනැණියෙනි, එසේ කියන හෙතෙම මනා කොට කියන්නේ දැ ? යි.

වහන්ස, තෙල නො වේ මැ යැ. එ කවර හෙයින ? වහන්ස, තත් තත් ස්වභාව වූ ප්‍රත්‍යය නිසා තත් තත් ස්වභාව වූ වෙදනාවෝ උපදිත් ද, තත් තත් ස්වභාව වූ ප්‍රත්‍යයාගේ නිරොධයෙන් තත් තත් ස්වභාව වූ වෙදනාවෝ නිරුද්ධ වෙත් ද එහෙයිනි.

මැනැව මැනැව බුහුනැණියෙනි, මෙසේ මැ බුහුනැණියෙනි, යථාභූතය විදර්ශනා ඥනයෙන් දක්නා ආර්‍ය්‍යශ්‍රාවකහට තෙල වෙයි.

යම්සේ බුහුනැණියෙනි, සාරවත් වූ මුල් බැස සිටුනා මහාවෘක්ෂයක්හුගේ මුල ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කඳ ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කොළ අතු ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, සෙවණ ද අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, බුහුනැණියෙනි, යමෙක් මෙසේ කියා නම් හර ඇති මුල් බැස සිටුනා මේ මහාවෘක්ෂයාගේ මුලත් අනිත්‍ය විපරිණාම ධර්ම වෙයි, කඳ ද අනිත්‍ය විපරිණාමධර්ම වෙයි. කොළඅතු ද අනිත්‍ය විපරිණාමධර්ම වෙයි. එහි යම් ඡායාවක් ඇද්ද එය නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමධර්ම වේ යයි. බුහුනැණියෙනි, එසේ කියන හේ මනා කොට කියන්නේ දැ ? යි.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: 'අමුස්ස හි භන්තෙ මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො මූලම්පි අනිච්චං විපරිණාමධම්මං, ඛන්ධොපි අනිච්චො විපරිණාමධම්මො, සාඛාපලාසම්පි අනිච්චං විපරිණාමධම්මං, පගෙවස්ස ඡායා අනිච්චා විපරිණාමධම්මා'ති.

එවමෙව ඛො භගිනියො, යො නු ඛො එවං වදෙය්‍ය: 'ඡ ඛො මෙ බාහිරා ආයතනා අනිච්චා විපරිණාමධම්මා, යඤ්ච ඛො ඡ බාහිරෙ ආයතනෙ පටිච්ච පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්ම'න්ති. සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙයා'ති.

නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු 'තජ්ජං තජ්ජං භන්තෙ, පච්චයං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස පච්චයස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්තී'ති.

සාධු සාධු භගිනියො, එවං හෙතං භගිනියො, හොති අරියසාවකස්ස යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො.

සෙය්‍යථාපි භගිනියො, දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා තිණ්හෙන ගොවිකන්තනෙන ගාවිං විකන්තෙය්‍ය, අනුපහච්ච අන්තරං මංසකායං, අනුපහච්ච බාහිරං චම්මකායං, යං යදෙව තත්ථ අන්තරා විලිමංසං, අන්තරා නහාරූ, අන්තරා බන්ධනං, තං තදෙව තිණ්හෙන ගොවිකන්තනෙන සඤ්ඡින්දෙය්‍ය සඞ්කන්තෙය්‍ය සම්පකන්තෙය්‍ය සම්පරිකන්තෙය්‍ය, සඤ්ඡින්දිත්වා සඞ්කන්තිත්වා සම්පකන්තිත්වා සම්පරිකන්තිත්වා විධුනිත්වා බාහිරං චම්මකායං, තෙනෙව චම්මෙන තං ගාවිං පටිච්ඡාදෙත්වා එවං වදෙය්‍ය: 'තථෙවායං ගාවී සංයුත්තා ඉමිනා චම්මෙනා'ති. 'සම්මා නු ඛො සො භගිනියො, වදමානො වදෙය්‍යා'ති.

නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු. 'අසු හි භන්තෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා තිණ්හෙන ගොවිකන්තනෙන ගාවිං විකන්තෙය්‍ය, අනුපහච්ච අන්තරං මංසකායං, අනුපහච්ච බාහිරං චම්මකායං, යං යදෙව තත්ථ අන්තරා විලිමංසං, අන්තරා නහාරූ, අන්තරා බන්ධනං, තං තදෙව තිණ්හෙන ගොවිකන්තනෙන සඤ්ඡින්දෙය්‍ය සඞ්කන්තෙය්‍ය සම්පකන්තෙය්‍ය සම්පරිකන්තෙය්‍ය, සඤ්ඡින්දිත්වා සඞ්කන්තිත්වා සම්පකන්තිත්වා සම්පරිකන්තිත්වා විධුනිත්වා බාහිරං චම්මකායං තෙනෙව චම්මෙන තං ගාවිං පටිච්ඡාදෙත්වා, කිඤ්චාපි සො එවං වදෙය්‍ය: 'තථෙවායං ගාවී සංයුත්තා ඉමිනා චම්මෙනා'ති. අථ ඛො සා ගාවී විසංයුත්තා තෙනෙව චම්මෙනා'ති.

උපමා ඛො මෙ අයං භගිනියො, කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයමෙවෙත්ථ අත්ථො: 'අන්තරා මංසකායොති ඛො භගිනියො, ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. බාහිරො චම්මකායොති ඛො භගිනියො, ඡන්නෙතං බාහිරානං ආයතනානං අධිවචනං. අන්තරා විලිමංසං අන්තරා නහාරූ අන්තරා බන්ධනන්ති ඛො භගිනියො, නන්දිරාගස්සෙතං අධිවචනං. තිණ්හං ගොවිකන්තනන්ති ඛො භගිනියො, අරියායෙතං පඤ්ඤාය අධිවචනං, යායං අරියා පඤ්ඤා අන්තරා කිලෙසං අන්තරා සංයොජනං අන්තරා බන්ධනං සඤ්ඡින්දති සඞ්කන්තති සම්පකන්තති සම්පරිකන්තති.

වහන්ස, තෙල නො වේ මැ යැ, ඊට හෙතු කවරෙ යැ ? වහන්ස, යම් හෙයෙකින් හර ඇති මුල් බැස සිටුනා මේ මහාවෘක්ෂයාගේ මුලත් අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, කඳත් අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, ශාඛාපලාසත් අනිත්‍ය විපරිණාමධර්ම වේ ද, එහි ඡායාව කැලමැ අනිත්‍ය විපරිණාමධර්ම වේ ද එහෙයිනි.

එසෙයින් මැ බුහුනැණියෙනි, යමෙක් මෙසේ කියන්නේ ද: මේ සවැදෑරුම් බාහ්‍යායතන යෝ අනිත්‍ය විපරිණාමධර්මයෝ යැ, ෂඩ් බාහිරායතනයන් නිසා යම් සුවයක් වේවයි, දුකක් වේවයි, උපෙක්ෂාවක් වේවයි විඳුනේ ද, එය නිත්‍ය යැ, ධ්‍රැව යැ, ශාශ්වත යැ, අවිපරිණාමධර්ම වේ යයි. බුහුනැණියෙනි, එසේ කියන හෙතෙම මනාකොට කියන්නේ ද ? යි.

වහන්ස, තෙල නො වේ මැ යි. ඒ කවර හෙයින යත් : වහන්ස, තත් තත් ස්වභාව වූ ප්‍රත්‍යය නිසා තත් තත් ස්වභාව ඇති වෙදනාවෝ උපදිත් ද, තත් තත් ස්වභාව ඇති ප්‍රත්‍යයා ගේ නිරොධයෙන් තත් තත් ස්වභාව වූ වෙදනාවෝ නිරුද්ධ වෙත් ද, එහෙයිනි.

මැනැව මැනැව බුහුනැණියෙනි, තෙල බුහුනැණියෙනි, යථාභූතය විදර්ශනාඥනයෙන් දක්නා ආර්‍යශ්‍රාවකහට එසේ මැ වෙයි.

යම්සේ බුහුනැණියෙනි, දක්ෂ වූ ගොඝාතකයෙක් වේවයි, ගොඝාතකයාගේ අතැවැසි යෙක් වේවයි, ගවදෙනක නසා තියුණු වූ ගෙරිකපන සැතින් ඇතුළ මස්කය නො නසා බැහැරි සම්කය නො නසා එහි යම් යම් අතුරු විලිමසක් ඇද්ද අතුරු නහර ඇද්ද අතුරු බන්ධන ඇද්ද ඒ ඒ දුය මැ තියුණු ගෙරිකපනසැතින් මොනොවට සිඳුනේ ද මොනොවට කපන්නේ ද මොනොවට අවට කපන්නේ ද මොනොවට හාත්පස කපන්නේ ද, මොනොවට සිඳ මොනොවට කපා අවට කපා මොනොවට හාත්පසින් කපා බැහැරි සම්කය සලා එ සමින් මැ ඒ ගවදෙන වසා මෙසේ කියා නම් 'මේ ගවදෙන මේ සමින් එසේ මැ සංයුක්ත කරනලද ' යි. බුහුනැණියෙනි, එසේ කියන හෙතෙම මනා කොට කියන්නේ ද ? යි.

වහන්ස, තෙල නො වේ මැ යැ. ඒ කවර හෙයින යත් : වහන්ස, යම් හෙයෙකින් අසෝ ගවඝාතකයා හෝ ගවඝාතකයාගේ අතවැසියා හෝ ගවදෙනක නසා තියුණු ගෙරිකපනසැතින් අතුරු මස්කය නො නසා බැහැරි සම්කය නො නසා ගවදෙන කපන්නේ ද එහි යම් යම් අතුරු විලිමසෙක් ඇද්ද අතුරු නහර ඇද්ද අතුරු බැඳුම් ඇද්ද ඒ ඒ දුය මැ තියුණු ගෙරිකපනසැතින් මොනොවට සිඳුනේ ද මොනොවට කපන්නේ ද මොනොවට අවට කපන්නේ ද මොනොවට හාත්පස කපන්නේ ද මොනොවට සිඳ මොනොවට හාත්පස කපා බැහැරි සම්කය සලා ඒ සමින් මැ ඒ ගවදෙන වසා හේ මෙසේ කියන්නේ නම් මේ සමින් මේ ගවදෙන එසේ මැ සංයුක්ත කරන ලද ' යි. එතෙකුදු වත් ඒ ගවදෙන ඒ සමින් මැ විසංයුක්ත වී යයි.

බුහුනැණියෙනි, අර්ථය හැඟවීම පිණිස මා විසින් මේ උපමා එළවන ලදු. මෙහි මෙ මැ අර්ථ යැ : බුහුනැණියෙනි, අතුරු මස්කය යැ යන තෙල ආධ්‍යාත්මික ආයතනයනට නමෙකි. බුහුනැණියෙනි, බැහැරි සම්කය යැ යන තෙල සවැදෑරුම් බාහ්‍යායතනයනට නමෙකි. බුහුනැණියෙනි, අතුරු විලිමසැ අතුරු නහර යැ අතුරු බැඳුම යැ යන තෙල නන්දිරාගයට නමෙකි. බුහුනැණියෙනි, තියුණු ගෙරිකපනසැත යැ යන තෙල ආර්‍යඥන යට නමෙකි. යම් ආර්‍යඥනයෙක් අතුරු කෙලෙස් අතුරු සංයොජන අතුරු බන්ධන සිඳී ද කපා ද මොනොවට කපා ද හාත්පසින් කපා ද මොනොවට හාත්පස කපා ද එය යි.

සත්ත ඛො පනිමෙ භගිනියො, බොජ්ඣඞ්ගා යෙසං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. කතමෙ සත්ත: ඉධ භගිනියො, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙ ඛො භගිනියො, සත්ත බොජ්ඣඞ්ගා යෙසං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

අථ ඛො ආයස්මා නන්දකො තා භික්ඛුනියො ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උය්යොජෙසි: 'ගච්ඡථ භගිනියො, කාලො'ති.

අථ ඛො තා භික්ඛුනියො ආයස්මතො නන්දකස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ආයස්මන්තං නන්දකං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො භගවා එතදවොච: 'ගච්ඡථ භික්ඛුනියො, කාලො'ති.

අථ ඛො තා භික්ඛුනියො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො භගවා අචිරපක්කන්තීසු තාසු භික්ඛුනීසු භික්ඛු ආමන්තෙසි: 'සෙය්‍යථාපි භික්ඛවෙ, තදහුපොසථෙ පණ්ණරසෙ න හොති බහුනො ජනස්ස කඞ්ඛා වා විමති වා: 'ඌනො නු ඛො චන්දො පුණ්ණො නු ඛො චන්දො'ති, අථ ඛො පුණ්ණො චන්දොත්වෙව හොති. එවමෙව ඛො භික්ඛවෙ, තා භික්ඛුනියො නන්දකස්ස ධම්මදෙසනාය අත්තමනා චෙව පරිපුණ්ණසඞ්කප්පා ච. තාසං භික්ඛවෙ, පඤ්චන්නං භික්ඛුනීසතානං යා පච්ඡිමා[1] භික්ඛුනී, සා සොතාපන්නා[2] අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා'ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

නන්දකොවාදසුත්තං චතුත්ථං.

---

1. පච්ඡිමිකා - මජසං. 2. තා භික්ඛුනියො සොතාපන්නා - මජසං

බුහුනැණියෙනි, යම් බොධ්‍යඞ්ග කෙනකුන් භාවිත බැවින් බිහිලි කළ බැවින් මහණ ආස්‍රවක්ෂය හෙතුයෙන් අනාස්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥවිමුක්ති ඉහාත්මයෙහි මැ තෙමේ විශිෂ්ටඥනයෙන් දැන පසක් කොට උපයාගෙන වාස කෙරේ ද, මේ බොධ්‍යඞ්ග ධර්මයෝ සත් දෙනෙකි. කවර සත්දෙනෙක යත් : බුහුනැණියෙනි, මෙසස්නෙහි මහණ විවෙක නිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ ව්‍යවසර්ගය පිණිස පිරිනැමුම් ඇති ස්මෘති සම්බොධ්‍යඞ්ගය භවයි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය භවයි. . . . වීය්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය භවයි. . . . ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය භවයි. . . . ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය භවයි. . . . සමාධිසම්බොධ්‍යඞ්ගය භවයි. . . . විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ ව්‍යවසර්ගය පිණිස පිරිනැමුම් ඇති උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය භවයි. බුහුනැණියෙනි, යම් බොධ්‍යඞ්ගධර්ම කෙනකුන් හැවූ බැවින් බිහිලි කළ බැවින් මහණ ආස්‍රවක්ෂය හෙතුයෙන් අනාස්‍රව වූ චේතොවිමුක්ති ප්‍රඥවිමුක්ති මේ භවයෙහි මැ තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට එළඹ වාස කෙරේ ද, මේ බෝධ්‍යඞ්ගධර්මයෝ සත්දෙනා වෙති.

ඉක්බිති ආයුෂ්මත් නන්දක තෙරණුවෝ ඒ මෙහෙණින් මේ අවවාදයෙන් ඔවා දී ' බුහුනැණියෙනි, යන්නෝ මැනැව යන්නට කලැ ' යි යැවී.

ඉක්බිති ඒ මෙහෙණහු ආයුෂ්මත් නන්දක තෙරණුවන්ගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී ආයුෂ්මත් නන්දක තෙරණුවන් සකසා වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ සිටියහ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් වැ සිටි ඒ මෙහෙණිනට තෙල වදළහ. මෙහෙණිනි, ' යව යන්නට කලැ ' යි.

එසඳ ඒ මෙහෙණහු භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට බැස ගියෝ. එසඳ භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණින් බැස යන්නා හා මැ භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, යම් පරිදි එදවස් පොහොය පුණුරැසියෙහි ' චන්ද්‍රයා ඌන වේ ද හෝ චන්ද්‍රයා පූර්ණ වේ ද හෝ ' යි බොහෝ දෙනාට සැකයෙක් හෝ විමතියෙක් හෝ නො වේ ද වැළිත් චන්ද්‍රයා පූර්ණ මැ වේ යයි සිත් වේ ද, මහණෙනි, එපරිදි මැ ඒ මෙහෙණහු නන්දකයන්ගේ දහම් දෙස්නෙන් ගත් සිතැතියාහු ද පරිපූර්ණ සංකල්ප ඇත්තාහු ද වෙති. මහණෙනි, ඒ පන්සියක් මෙහෙණින් ඇසුරින් හැමට සග මෙහෙණක් ඇද්ද හෝ අවිනිපාතධර්ම ඇති නියත වූ සම්බොධිපරායණ වූ සෝවන් මෙහෙණකැ ' යි වදළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. සතුටු සිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හු.

සතර වැනි නන්දකොවාද සූත්‍ර යි.

# 3. 5. 5

## චූළරාහුලොවාද සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවතො රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. පරිපක්කා ඛො රාහුලස්ස විමුත්ති-පරිපාචනීයා ධම්මා. යන්නූනාහං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙය්‍යන්ති.

අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං රාහුලං ආමන්තෙසි: 'ගණ්හාහි රාහුල නිසීදනං, යෙන අන්ධවනං තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායා'ති.

එවං භන්තෙති ඛො ආයස්මා රාහුලො භගවතො පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං[1] පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි.

තෙන ඛො පන සමයෙන අනෙකානි දෙවතාසහස්සානි භගවන්තං අනුබන්ධානි හොන්ති. 'අජ්ජ භගවා ආයස්මන්තං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙස්සතී'ති

අථ ඛො භගවා අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මාපි ඛො රාහුලො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාහුලං භගවා එතදවොච:

'තං කිං මඤ්ඤසි රාහුල, චක්ඛුං නිච්චං[2] වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, රූපා නිච්චා වා අනිච්චා වාති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වාති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

---

1. භගවතො – සිමු. 2. චක්ඛු නිච්චං – මජසං, සිමු.

# 3. 5. 5

# චූලරාහුලොවාද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරම්හි වැඩවාස කෙරෙති. එකල රහොගත වූ එකාකී වූ භාග්‍යවතුන් වහන්සේට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන. රාහුලයන්ගේ විමුක්තිය මිහිකිරීමට හිත වූ ධර්මයෝ පැසී සිටියහ. මම රාහුලයන් මතු ආස්‍රවක්ෂයයෙහි ලා විනයන කෙරෙම් නම් මැනැවැයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳපෙරෙවැ පාසිවුරු ගෙන සැවතට පිඬු පිණිස වැඩියෝ, සැවැත පිඬු පිණිස හැසිර පසුබතැ පිඬුවායෙන් වැළැක්කාහු ආයුෂ්මත් රාහුල තෙරුන් ඇමතූසේක. රාහුලය, හිඳිනාකඩ ගනුව, දිවාවිහරණ සඳහා අන්ධවනය කරා යම්හ ' යි.

වහන්ස, එසේ යයි ආයුෂ්මත් රාහුල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා හිඳිනාකඩ ගෙන භාග්‍යවතුන් වහන්සේ පස් පස් ලුහුබැඳ ගියහ.

එසමයෙහි අනෙකදෙවතාසහස්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ ලුහුබැන්දාහු වෙති. ' අද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රාහුල තෙරණුවන් මතු අස්‍රවක්ෂය ඥානයෙහි ලා විනයන කෙරෙති'යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අන්ධවනයට බැසගෙන එක්තරා රුක්මුලෙක පැන්වූ අස්නෙහි හුන්සේක. ආයුෂ්මත් රාහුල තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාහුල හදයන් බණවා තෙල වදාළසේක :

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? චක්ෂුස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ ' යි එය සමනුපස්සනා වශයෙන් ගන්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? රූපයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍යයහ.

යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ?

වහන්ස, දුඃඛ යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් එය ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්මයැ ' යි තෘෂ්ණාදි විසින් ගන්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො නිසි වේ මැ යි.

තං කිං මඤ්ඤසි රාහුල, චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වා'ති.

අනිච්චො භන්තෙ.

'යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං, විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තම්පි නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, සොතං නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ. -පෙ-

ඝානං නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ. -පෙ-

ජිව්හා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ -පෙ-

කායො නිච්චො වා අනිච්චො වා'ති.

අනිච්චො භන්තෙ. -පෙ-

මනො නිච්චො වා අනිච්චො වා'ති.

අනිච්චො භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි, චක්ෂුර්විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? චක්ෂුස්සංස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' තෙලෙ මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙලෙ නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? චක්ෂුඃසංස්පර්ශ හේතුයෙන් යම් වේදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාරගතයෙක් විඥනගතයෙක් උපදී නම් එ ද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ නම් එය ' තෙල මා ගැත්තේ යැ, තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? ශ්‍රෝත්‍රය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි. . . .

ඝ්‍රාණය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි. . . .

ජිහ්වා නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි. . . .

කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි. . . .

මනස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

38—ඒ 00502 (8/73)

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, ධම්මා නිච්චා වා අනිච්චා වා'ති.

අනිච්චා භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, මනොසම්ඵස්සො නිච්චො වා අනිච්චො වා'ති.

අනිච්චො භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි රාහුල, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං. තම්පි නිච්චං වා අනිච්චං වා'ති.

අනිච්චං භන්තෙ.

යම්පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති.

දුක්ඛං භන්තෙ.

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති.

නො හෙතං භන්තෙ.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' මෙලෙ මා ගැත්තේ යැ, මෙලෙ මම් වෙමි. මෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, මෙලෙ නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? ධර්මයෝ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වෙත් ද ?

වහන්ස, අනිත්‍ය වෙති.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' මෙලෙ මා ගැත්තේ යැ, මෙලෙ මම් වෙමි, මෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, මෙලෙ නො නිසි වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? මනෝවිඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' මෙලෙ මා ගැත්තේ යැ, මෙලෙ මම් වෙමි. මෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, මෙල නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? මනස්සංස්පර්ශය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය ' මෙලෙ මා ගැත්තේ යැ, මෙලෙ මම් වෙමි. මෙලෙ මාගේ ආත්ම යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, මෙලෙ නො වේ මැ යැ.

රාහුලය, ඒ කෙසේ හඟනෙහි ? මනඃසංස්පර්ශ හෙතුයෙන් යම් වෙදනාගතයෙක් සංඥාගතයෙක් සංස්කාරගතයෙක් විඥානගතයෙක් උපදී ද එ ද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය වෙයි.

වැළි යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ සුව හෝ වේ ද ?

වහන්ස, දුක් වෙයි.

වැළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය මෙලෙ මා ගැත්තේ යැ, මෙලෙ මම් වෙමි. මෙලෙ මාගේ ආත්ම වේ යැ ' යි තෘෂ්ණාදි විසින් දක්නට නිසි වේ ද ?

වහන්ස, මෙලෙ නොවේ මැ යැ.

එවං පස්සං රාහුල, සුතවා අරියසාවකො චක්ඛුස්මිං නිබ්බින්දති, රූපෙසු නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙ නිබ්බින්දති. චක්ඛුසම්ඵස්සෙ නිබ්බින්දති, යම්පිදං[1] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වේදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තස්මිම්පි නිබ්බින්දති. සොතස්මිං නිබ්බින්දති, සද්දෙසු නිබ්බින්දති -පෙ- ඝානස්මිං නිබ්බින්දති, ගන්ධෙසු නිබ්බින්දති -පෙ- ජිව්හාය නිබ්බින්දති, රසෙසු නිබ්බින්දති -පෙ- කායස්මිං නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසු නිබ්බින්දති -පෙ- මනස්මිං නිබ්බින්දති, ධම්මෙසු නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙ නිබ්බින්දති, මනොසම්ඵස්සෙ නිබ්බින්දති, යම්පිදං[1] මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වේදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා රාහුලො භගවතො භාසිතං අභිනන්දීති.

ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො රාහුලස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. තාසඤ්ච අනෙකානං දෙවතාසහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම'න්ති.

චූළරාහුලොවාද සුත්තං පඤ්චමං.

---

1. යමිදං - සීමු, මජසං.

රාහුලය, මෙසේ නුවණින් දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක චක්ෂුසෙහි කලකිරෙයි. රූපයෙහි කලකිරෙයි, චක්ෂුර්විඥනයෙහි කලකිරෙයි, චක්ෂුස්සංස්පර්ශයෙහි කලකිරෙයි, චක්ෂුස්සංස්පර්ශ හෙතුයෙන් උපන් යම් වේදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාර ගතයෙක් විඥනගතයෙක් උපදී නම් එහිදු කලකිරෙයි. ශ්‍රොත්‍රයෙහි කලකිරෙයි. . . . ශබ්දයෙහි කලකිරෙයි. . . . ඝ්‍රාණයෙහි කලකිරෙයි. . . . ගන්ධයෙහි කලකිරෙයි. . . . ජිහ්වායෙහි කලකිරෙයි, රසයෙහි කලකිරෙයි. . . . කායයෙහි කලකිරෙයි. ස්ප්‍රෂ්ටව්‍යයෙහි කලකිරෙයි. . . . මනසෙහි කලකිරෙයි, ධර්මයන්හි කලකිරෙයි, මනොවිඥනයෙහි කලකිරෙයි, මනඃසංස්පර්ශයෙහි කලකිරෙයි. මනඃසංස්පර්ශ හේතු යෙන් යම් වේදනාගතයෙක් සංඥගතයෙක් සංස්කාරගතයෙක් විඥනගතයෙක් උපදී නම් එහිදු කලකිරෙයි. නිර්වෙදයට පැමිණියේ නො ඇලෙයි. විරාගයෙන් විමුක්ත වෙයි. විමුක්ත කල්හි විමුක්ත යැ ' යි (ප්‍රත්‍යවෙක්ෂා) ඥනය උපදී : ' ජාති ක්ෂය වූ යැ. මහ බඹසර වැසැ නිමවනලද. මහකරණී කරනලද. මේ ආත්මභාවය පිණිස කළයුතු අන් කිසෙක් නැතැ ' යි දනගනී.

භාග්‍යවතුන් වහන්සේ මේ රාහුලොවාදය වදළසේක. සතුටුසිත් ඇති ආයුෂ්මත් රහල් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය පිළිගත්හ.

තවද මේ වෙය්‍යාකරණය වදරන කල්හි ආයුෂ්මත් රහල් තෙරණුවන්ගේ සිත උපාදනය නො කොට ආස්‍රවයන් කෙරෙන් මිදිණ. ඒ නොයෙක් දේවතා දහසුන්ට ද කෙලෙස් රජස් රහිත වූ කෙලෙස් මල රහිත වූ දහම් ඇස පහළ වී : ' යම්කිසි සමුදය ධර්මයෙක් ඇද්ද එ හැම නිරෝධස්වභාව ඇතැ ' යි කියා යි.

**පස් වැනි චූළරාහුලොවාද සූත්‍ර යි.**

# 3. 5. 6

## ඡ ඡක්ක සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: 'භික්ඛවො'ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ධම්මං වො භික්ඛවෙ, දෙසිස්සාමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසිස්සාමි. යදිදං ඡ ඡක්කානි. තං සුණාථ, සාධුකං මනසිකරොථ. භාසිස්සාමී'ති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානි. ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානි. ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බා. ඡ ඵස්සකායා වෙදිතබ්බා. ඡ වෙදනාකායා වෙදිතබ්බා. ඡ තණ්හාකායා වෙදිතබ්බා.

ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානී'ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං. චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං මනායතනං. 'ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානී'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං පඨමං ඡක්කං.

'ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානී'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං ධම්මායතනං. ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානී'ති. ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං දුතියං ඡක්කං.

'ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බා'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං. චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං. ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. 'ඡ විඤ්ඤාණකායා වෙදිතබ්බා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං තතියං ඡක්කං.

# 3. 5. 6

# ඡ ඡක්ක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී : එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහුගේ අරම්හි වැඩවාස කෙරෙති. එකල භාග්‍යවතුන් වහන්සේ ' මහණෙනි ' යි භික්ෂූන් ඇමතුසේක. ' වහන්සැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ තෙල ඡඡක්ක දෙශනා වදළහ :

මහණෙනි, තොපට ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ සාර්‍ථ වූ සව්‍යඤ්ජන වූ කේවලපරිපූර්‍ණ වූ ධර්මයක් දෙසමි. පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරමි. ඒ කිමෙක යත් : ' ඡඡක්ක ' ධර්ම යි. ඒ අසව, මොනොවට මෙනෙහි කරව, කියමි ' යි වදළෝ.

' වහන්ස, එසේ යැ ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු.

සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ. සවැදෑරුම් බාහිර ආයතනයෝ දතයුත්තාහ. සවැදෑරුම් විඥනකායයෝ දතයුත්තාහ. සවැදෑරුම් ස්පර්ශකායයෝ දතයුත්තාහ. සවැදෑරුම් වේදනාකායයෝ දතයුත්තාහ. සවැදෑරුම් තෘෂ්ණාකායයෝ දතයුත්තාහ ' යි.

' සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල බසෙක් කියන ලද යැ, තෙල බස් කුමක් පිණිස කියන ලද ද යත් : චක්ෂුරායතන යැ ශ්‍රොත්‍රායතන යැ ඝ්‍රාණායතන යැ ජිහ්වායතන යැ කායායතන යැ මනායතන යි. ' සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසේ යම් බසෙක් කියනලද ද මෙය, තෙල ආයතන පිණිස කියනලදී. මේ පළමු වන ෂට්ක යි.

' සවැදෑරුම් බාහිරායතනයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල බසෙක් කියන ලද යැ, තෙල බස් කුමක් පිණිස කියන ලද ද යත් : රූපායතන යැ ශබ්දයතන යැ ගන්ධායතන යැ රසායතන යැ ස්ප්‍රෂ්ටව්‍යායතන යැ ධර්මායතන යි. ' සවැදෑරුම් බාහිර ආයතනයෝ දතයුත්තාහ ' යි මෙසේ යම් බසෙක් කියන ලද ද, මෙය තෙල ආයතන පිණිස කියනලදී. මේ දෙවන ෂට්ක යි.

' සවැදෑරුම් විඥනකායයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල බසෙක් කියනලද යැ, තෙල බස් කුමක් පිණිස කියන ලද යැ යත් : ඇස ද රූපායතන ද නිසා චක්ෂුර්විඥනය උපදනේ යැ. කන ද ශබ්දයතන ද නිසා ශ්‍රොත්‍රවිඥනය උපදනේ යැ. නැහැය ද ගන්ධායතන ද නිසා ඝ්‍රාණවිඥන උපදනේ යැ. දිව ද රසායතන ද නිසා ජිහ්වාවිඥන උපදනේ යැ. කය ද ස්ප්‍රෂ්ටව්‍යායතන ද නිසා කායවිඥන උපදනේ යැ. සිත ද ධර්මායතන ද නිසා මනොවිඥන උපදනේ යැ. ' සවැදෑරුම් විඥනකායයෝ දතයුත්තාහ ' යි යම් බසෙක් කියනලද ද, මෙය තෙල කාය පිණිස කියනලදී. මේ තුන් වන ෂට්ක යි.

‘ඡ ඵස්සකායා වෙදිතබ්බා’ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං. චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො. ‘ඡ ඵස්සකායා වෙදිතබ්බා’ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං චතුත්ථං ඡක්කං.

‘ඡ වෙදනාකායා වෙදිතබ්බා’ති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං. චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං-පෙ-ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං-පෙ-ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං-පෙ-කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කාය-විඤ්ඤාණං-පෙ-මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා. ‘ඡ වෙදනාකායා වෙදිතබ්බා’ති ඉති යං තං වුත්තං. ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං පඤ්චමං ඡක්කං.

‘ඡ තණ්හාකායා වෙදිතබ්බා’ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං. චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං-පෙ-ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං-පෙ-ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං-පෙ-කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං-පෙ-මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. ‘ඡ තණ්හාකායා වෙදිතබ්බා’ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. ඉදං ඡට්ඨං ඡක්කං.

චක්ඛුං[1] අත්තාති යො වදෙය්‍ය තං න උපපජ්ජති.[2] චක්ඛුස්ස උප්පාදොපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදොපි වයොපි පඤ්ඤායති, ‘අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා’ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති, චක්ඛුං අත්තාති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා.

‘රූපා අත්තා’ති යො වදෙය්‍ය තං න උපපජ්ජති. රූපානං උප්පාදොපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදොපි වයොපි පඤ්ඤායති. ‘අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා’ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති රූපා අත්තාති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා රූපා අනත්තා.

1. චක්ඛු – මජ්ඣං, සීමු.
2. උප්පජ්ජති – PTS.

' සවැදෑරුම් ස්පර්ශකායයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල බසෙක් කියනලද යැ, තෙල බස් කුමක් පිණිස කියනලද යැ යත් : ඇස ද රූපායතන ද නිසා චක්ෂුර්විඥාන උපදනේ යැ. තුන් දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. කන ද ශබ්දයතන ද නිසා ශ්‍රෝත්‍ර විඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. නැහැය ද ගන්ධායතන ද නිසා ඝ්‍රාණවිඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. දිව ද රසායතන ද නිසා ජිහ්වාවිඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. කය ද ස්ප්‍රෂ්ට ව්‍යායතන ද නිසා කායවිඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. සිත ද ධර්මායතන ද නිසා මනොවිඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. ' සවැදෑරුම් ස්පර්ශකායයෝ දතයුත්තාහ ' යි මෙසේ යම් බසෙක් කියනලද ද, මෙය තෙල ස්පර්ශ පිණිස කියනලදි. මේ සතර වන ඡට්ක යි.

' සවැදෑරුම් වේදනාකායයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල බසෙක් කියනලද යැ, තෙල බස් කුමක් පිණිස කියනලද යැ යත් : ඇස ද රූපායතන ද නිසා චක්ෂුර්විඥාන උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. ස්පර්ශ හෙතුයෙන් වෙදනා පහළ වෙයි. කන ද ශබ්දයතන ද නිසා ශ්‍රෝත්‍රවිඥාන උපදනේ යැ. . . . නැහැය ද ගන්ධා යතන ද නිසා ඝ්‍රාණවිඥාන උපදනේ යැ. . . . දිව ද රසායතන ද නිසා ජිහ්වාවිඥාන උපදනේ යැ. . . . කය ද සප්‍රෂ්ටව්‍යායතන ද නිසා කායවිඥාන උපදනේ යැ. . . . සිත ද ධර්මායතන ද නිසා මනොවිඥාන උපදනේ යැ, තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. ස්පර්ශ හේතුයෙන් වෙදනා පහළ වෙයි. ' සවැදෑරුම් වෙදනාකායයෝ දතයුත්තාහ ' යි යම් බසෙක් කියන ලද ද මෙය තෙල වේදනා පිණිස කියන ලදි. මේ පස් වන ඡට්ක යි.

' ඡට් තෘෂ්ණාකායයෝ දතයුත්තාහ ' යි මෙසේ තෙල යමක් කියනලද ද, තෙල කුමක් සඳහා කියන ලද ද යත් : ඇස ද රූපායතන ද නිසා චක්ෂුර්විඥාන උපදනේ යැ. තුන් දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වෙයි. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණා වෙයි. ශ්‍රෝත්‍රය ද ශබ්දයතන ද නිසා ශ්‍රෝත්‍රවිඥානය උදනේ යැ. . . . ඝ්‍රාණය ද ගන්ධායතන ද නිසා ඝ්‍රාණවිඥානය උපදනේ යැ. . . . ජිහ්වාව ද නිසා රසායතන ද නිසා ජිහ්වාවිඥානය උපදනේ යැ. . . . කය ද නිසා ස්ප්‍රෂ්ටව්‍යායතන ද නිසා කායවිඥානය උපදනේ යැ. . . . මනස ද නිසා ධර්මායතන ද නිසා මනොවිඥානය උපදනේ යැ. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නමි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වෙයි. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි. ' ඡට්තෘෂ්ණාකායයෝ දතයුත්තාහ ' යි මෙසේ යමක් කියනලද ද, මෙය තෙල සඳහා කියන ලදි. මේ සවන ඡට්ක යි.

' චක්ෂුස ආත්ම යැ ' යි යමෙක් කියා ද එය නො යෙදෙයි. චක්ෂුස්හුගේ උත්පාදය ද විනාශය ද පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් නිරුද්ධ වන්නේත් වේ යයි ඔහුට මෙසේ (ලබයි) ආයේ වෙයි. එහෙයින් ' චක්ෂුස ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම වෙයි.

' රූපායතනය ආත්ම යැ ' යි යමෙක් කියා නම් ඒ නො යෙදෙයි. රූපායතනයාගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් වෙයි, නැසෙනුයේත් වේ යයි ඔහුට මෙසේ ලබයිය ආයේ වෙයි. එහෙයින් ' රූපායතනය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම වෙයි. රූපායතනය අනාත්ම වෙයි.

චක්ඛුවිඤ්ඤාණං අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. චක්ඛු-විඤ්ඤාණස්ස උප්පාදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති, 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති. 'චක්ඛුවිඤ්ඤාණං අත්තා'ති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා රූපා අනත්තා චක්ඛුවිඤ්ඤාණං අනත්තා.

චක්ඛුසම්ඵස්සො අත්තා'ති යො වදෙය්‍ය, තං න උපපජ්ජති. චක්ඛු-සම්ඵස්සස්ස උප්පාදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති 'චක්ඛුසම්ඵස්සො අත්තා'ති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා, රූපා අනත්තා, චක්ඛුවිඤ්ඤාණං අනත්තා, චක්ඛුසම්ඵස්සො අනත්තා.

'වෙදනා අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. වෙදනාය උප්පාදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති වෙදනා අත්තාති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා රූපා අනත්තා චක්ඛුවිඤ්ඤාණං අනත්තා චක්ඛුසම්ඵස්සො අනත්තා. වෙදනා අනත්තා.

'තණ්හා අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. තණ්හාය උප්පාදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති, 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති 'තණ්හා අත්තා'ති යො වදෙය්‍ය. ඉති චක්ඛුං අනත්තා රූපා අනත්තා චක්ඛුවිඤ්ඤාණං අනත්තා චක්ඛුසම්ඵස්සො අනත්තා, වෙදනා අනත්තා. තණ්හා අනත්තා.

සොතං අත්තාති යො වදෙය්‍ය -පෙ- ඝානං අත්තාති යො වදෙය්‍ය -පෙ- ජිව්හා අත්තාති යො වදෙය්‍ය -පෙ- කායො අත්තාති යො වදෙය්‍ය -පෙ- මනො අත්තාති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. මනස්ස උප්පාදෙපි වයොපි පඤ්ඤායති, යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චාති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති මනො අත්තාති යො වදෙය්‍ය. ඉති මනො අනත්තා.

'ධම්මා අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. ධම්මානං උප්පදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති, 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති. 'ධම්මා අත්තා'ති යො වදෙය්‍ය. ඉති මනො අනත්තා ධම්මා අනත්තා.

'මනොවිඤ්ඤාණං අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. මනොවිඤ්ඤාණස්ස උප්පාදෙපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදෙපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති 'මනොවිඤ්ඤාණං අත්තා'ති යො වදෙය්‍ය. ඉති මනො අනත්තා, ධම්මා අනත්තා, මනො විඤ්ඤාණං අනත්තා.

' චක්ෂුර්විඥානය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. චක්ෂුර්විඥානයාගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ යයි ඔහුට මෙසේ ලබ්ධිය ආයේ වෙයි. එහෙයින් ' චක්ෂුර්විඥානය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම යැ. රූපායතනය අනාත්ම යැ චක්ෂුර්විඥානය අනාත්ම යි.

' චක්ෂුස්සංස්පර්ශය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. චක්ෂුස් සංස්පර්ශයාගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් වෙයි. නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට ලබ්ධිය පැමිණියේ වෙයි. එහෙයින් ' චක්ෂුස්සංස්පර්ශය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම වෙයි. රූපයෝ අනාත්ම වෙති. චක්ෂුර්විඥානය අනාත්ම වෙයි. චක්ෂුස්සංස්පර්ශය අනාත්ම යි.

' වෙදනාව ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. වෙදනාවගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් වෙයි. නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට ලබ්ධිය ආයේ වෙයි. එහෙයින් ' වෙදනාව ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම වෙයි. රූපයෝ අනාත්ම වෙති. චක්ෂුර්විඥානය අනාත්ම වෙයි. චක්ෂුස්සංස්පර්ශය අනාත්ම වෙයි. වෙදනා අනාත්ම යි.

' තෘෂ්ණාව ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. තෘෂ්ණාවගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ වැළිත් උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් වෙයි. නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට ලබ්ධිය පැමිණියේ වෙයි. ' තෘෂ්ණාව ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නොයෙදෙයි. මෙසේ චක්ෂුස අනාත්ම යැ. රූපයෝ අනාත්මයෝ යැ. චක්ෂුර්විඥානය අනාත්ම යැ. චක්ෂුස්සංස්පර්ශය අනාත්ම යැ. වෙදනාව අනාත්ම යැ. තෘෂ්ණාව අනාත්ම යි.

' ශ්‍රොත්‍රය ආත්ම යැ ' යි යමෙක් කියා නම් . . . ඝ්‍රාණය ආත්ම යැ ' යි යමෙක් කියා නම් . . . ජිහ්වාව ආත්ම යැ ' යි යමෙක් කියා නම් . . . කාය ආත්ම යැ ' යි යමෙක් කියා නම් . . . මනස ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මනස්හුගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. වැළි යමක්හුගේ උතපාදයත් ව්‍යයත් පැනේ නම් 'මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට ලබ්ධිය ආයේ වෙයි, එහෙයින් ' මනස ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ මනස අනාත්ම යි.

' ධර්මයෝ ආත්මයහ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. ධර්මයන්ගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට ලබ්ධිය ආයේ වෙයි. එහෙයින් ' ධර්මයෝ ආත්මයහ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ මනස අනාත්ම යැ ධර්මයෝ අනාත්මයෝ යි.

' මනොවිඥානය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මනොවිඥානයාගේ උත්පාදයත් ව්‍යයත් පැනෙයි. යමක්හුගේ උත්පාදයත් ව්‍යයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ ' යයි මෙසේ දෘෂ්ටිය ආයේ වෙයි. එහෙයින් ' මනොවිඥානය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ මනස අනාත්ම යැ, ධර්මයෝ අනාත්ම වෙති, මනොවිඥානය අනාත්ම යි.

'මනොසම්ඵස්සො අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. මනොසම්ඵස්සස්ස උප්පාදොපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදොපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති 'මනොසම්ඵස්සො අත්තා'ති යො වදෙය්‍ය. ඉති මනො අනත්තා, ධම්මා අනත්තා, මනො-විඤ්ඤාණං අනත්තා, මනොසම්ඵස්සො අනත්තා.

'වෙදනා අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. වෙදනාය උප්පාදොපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදොපි වයොපි පඤ්ඤායති 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති තස්මා තං න උපපජ්ජති. 'වෙදනා අත්තා'ති යො වදෙය්‍ය ඉති මනො අනත්තා, ධම්මා අනත්තා, මනොවිඤ්ඤාණං අනත්තා, මනොසම්ඵස්සො අනත්තා, වෙදනා අනත්තා.

'තණ්හා අත්තා'ති යො වදෙය්‍ය. තං න උපපජ්ජති. තණ්හාය උප්පාදොපි වයොපි පඤ්ඤායති. යස්ස ඛො පන උප්පාදොපි වයොපි පඤ්ඤායති. 'අත්තා මෙ උප්පජ්ජති ච වෙති චා'ති ඉච්චස්ස එවමාගතං හොති. තස්මා තං න උපපජ්ජති 'තණ්හා අත්තා'ති යො වදෙය්‍ය. ඉති මනො අනත්තා, ධම්මා අනත්තා, මනොවිඤ්ඤාණං අනත්තා, මනො-සම්ඵස්සො අනත්තා, වෙදනා අනත්තා, තණ්හා අනත්තා.

අයං ඛො පන භික්ඛවෙ, සක්කාය සමුදයගාමිනී පටිපදා: චක්ඛුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. රූපෙ 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. චක්ඛුවිඤ්ඤාණං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. චක්ඛුසම්ඵස්සං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. වෙදනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. තණ්හං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. සොතං 'එතං මම, -පෙ- ඝානං එතං මම -පෙ- ජිව්හං එතං මම -පෙ- කායං එතං මම-පෙ-මනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. ධම්මෙ 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. මනොවිඤ්ඤාණං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. මනොසම්ඵස්සං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති සමනුපස්සති. වෙදනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති සමනුපස්සති. තණ්හං 'එතං මම, එසොහමස්මි. එසො මෙ අත්තා'ති සමනුපස්සති.

අයං ඛො පන භික්ඛවෙ, සක්කාය නිරොධගාමිනීපටිපදා: චක්ඛුං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. රූපෙ 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. 'චක්ඛුවිඤ්ඤාණං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. චක්ඛුසම්ඵස්සං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. වෙදනං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. තණ්හං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. සොතං නෙතං මම -පෙ- ඝානං නෙතං මම-පෙ- ජිව්හං නෙතං මම -පෙ- කායං නෙතං මම -පෙ- මනං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. ධම්මෙ 'නෙතං මම,

' මනස්සංස්පර්ශය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නොයෙදෙයි. මනො සම්ඵස්සයාගේ උත්පාදයත් ව්‍යයයත් පැනෙයි. යමක්හුගේ උත්පාදයත් ව්‍යයයත් පැනේ නම් ' මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ ' යයි මෙසේ ඔහුට දෘෂ්ටි ආයේ වෙයි. එහෙයින් ' මනොසම්ඵස්සය ආත්ම යැ ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මනස අනාත්ම යැ, ධර්මයෝ අනාත්ම වෙති, මනොවිඤ්ඤානය අනාත්ම යැ, මනො සම්ඵස්සය අනාත්ම යි.

' වෙදනාව ආත්ම යැ'යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. වෙදනාවගේ උත්පා දයත් ව්‍යයයත් පැනෙයි. 'මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ' යයි මෙසේ ඔහුට දෘෂ්ටි ආයේ වෙයි. එහෙයින් 'වෙදනාව ආත්ම යැ'යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ මනස අනාත්ම යැ, ධර්මයෝ අනාත්ම වෙති, මනොවිඤ්ඤානය අනාත්ම යැ, මනොසම්ඵස්සය අනාත්ම යැ, වෙදනා අනාත්ම යි.

' තෘෂ්ණාව ආත්ම යැ'යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. යමක්හුගේ උත්පාදයත් ව්‍යයයත් පැනේ නම් 'මාගේ ආත්මය උපදනේත් නැසෙන්නේත් වේ' යයි මෙසේ ඔහුට දෘෂ්ටි ආයේ වෙයි, එහෙයින් 'තෘෂ්ණාව ආත්ම යැ' යි යමෙක් කියා නම් එය නො යෙදෙයි. මෙසේ මනස අනාත්ම යැ, ධර්මයෝ අනාත්මයහ, මනෝවිඤ්ඤානය අනාත්ම යැ, මනොසමඵස්සය අනාත්ම යැ, වේදනා අනාත්ම යැ, තෘෂ්ණාව අනාත්ම යි.

මහණෙනි, මේ වැළිත් සත්කායසමුදයගාමිනී ප්‍රතිපත් වෙයි : චක්ෂුස 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්මයැ'යි තෘෂ්ණාදී විසින් දකී. රූපයන් 'තෙල මාගේ යැ' තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි තෘෂ්ණාදී විසින් දකී. චක්ෂුර්විඥානය 'තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. චක්ෂුස්සංස්පර්ශය 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. වෙදනාව 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. තෘෂ්ණාව තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. ශ්‍රොත්‍රය 'තෙල මාගේ යැ ...... ඝ්‍රාණය 'තෙල මාගේ යැ ...ජිහ්වාව තෙල මාගේ යැ ...කය 'තෙල මාගේ යැ... මනස 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි තෘෂ්ණාදි විසින් දකී. ධර්මයන් තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී., මනො විඥානය තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. මනො සම්ඵස්සය 'තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දකී. වෙදනාව 'තෙල මාගේ යැ තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්මයැ'යි දකී. තෘෂ්ණාව 'තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි තෘෂ්ණාදි විසින් දකී.

මහණෙනි, මේ සත්කායනිරොධගාමිනී ප්‍රතිපත් වෙයි : චක්ෂුස 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි අනිත්‍යාදි විසින් දකී. රූපයන් 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි අනිත්‍යාදි විසින් දකී. චක්ෂුර්විඥානය 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි දකී. චක්ෂුස්සංස්පර්ශය 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි දකී. වේදනාව 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නොවෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි දකී. තෘෂ්ණාව 'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ'යයි දකී. ශ්‍රොත්‍රය 'තෙල මාගේ නො වෙයි... ඝ්‍රාණය 'තෙල මාගේ නො වෙයි ... ජිහ්වාව 'තෙලෙ මාගේ නො වෙයි ... කය 'තෙලෙ මාගේ නො වෙයි... මනස 'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ'යයි දකී. ධර්මයන්

නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. මනොවිඤ්ඤාණං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. මනොසම්ඵස්සං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. වෙදනං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති. තණ්හං 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති සමනුපස්සති.

චක්ඛුඤ්ච භික්ඛවෙ, පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස රාගානුසයො අනුසෙති. දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිංකන්දති සම්මොහං ආපජ්ජති. තස්ස පටිඝානුසයො අනුසෙති. අදුක්ඛමසුඛාය වෙදනාය ඵුට්ඨො සමානො තස්සා වෙදනාය සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස අවිජ්ජානුසයො අනුසෙති. සො වත භික්ඛවෙ, සුඛාය වෙදනාය රාගානුසයං අප්පහාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයං අප්පටිවිනොදෙත්වා අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයං අසමූහනිත්වා අවිජ්ජං අප්පහාය විජ්ජං අනුප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරෙ භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සොතඤ්ච භික්ඛවෙ පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං. -පෙ- ඝානඤ්ච භික්ඛවෙ, පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං. -පෙ- ජිව්හඤ්ච භික්ඛවෙ, පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං. -පෙ- කායඤ්ච භික්ඛවෙ, පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං. -පෙ- මනඤ්ච භික්ඛවෙ, පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස රාගානුසයො අනුසෙති. දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිංකන්දති සම්මොහං ආපජ්ජති, තස්ස පටිඝානුසයො අනුසෙති. අදුක්ඛමසුඛාය වෙදනාය ඵුට්ඨො සමානො තස්සා වෙදනාය සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. තස්ස අවිජ්ජානුසයො අනුසෙති. සො වත භික්ඛවෙ, සුඛාය වෙදනාය රාගානුසයං අප්පහාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයං අප්පටිවිනොදෙත්වා අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයං අසමූහනිත්වා අවිජ්ජං අප්පහාය විජ්ජං අනුප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති.

චක්ඛුඤ්ච ඛො භික්ඛවෙ, පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො නාභිනන්දති, නාභිවදති, නාජ්ඣොසාය තිට්ඨති. තස්ස රාගානුසයො නානුසෙති. දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිංකන්දති, න සම්මොහං ආපජ්ජති. තස්ස පටිඝානුසයො නානුසෙති. අදුක්ඛමසුඛාය වෙදනාය ඵුට්ඨො සමානො තස්සා වෙදනාය සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස අවිජ්ජානුසයො නානුසෙති. සො වත භික්ඛවෙ, සුඛාය වෙදනාය රාගානුසයං පහාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරෙ භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙම්, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි දකී. මනොවිඥනය 'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙම්, තෙලෙ මාගේ ආත්මය නො වේ'යයි දකී. මනොසම්ඵස්සය 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙම්, තෙලෙ මාගේ ආත්මය නො වේ'යයි දකී. වේදනාව 'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙම්, තෙලෙ මාගේ ආත්මය නො වේ'යයි දකී. තෘෂ්ණාව 'තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙම්, තෙලෙ මාගේ ආත්මය නො වේ' යයි අනිත්‍යාදි විසින් දකී.

මහණෙනි, චක්ෂුසත් රූපත් නිසා චක්ෂුර්විඥනය උපදී. (චක්ෂු රූප විඥන යන) තිදෙනාගේ සඞ්ගතිය ඵස්ස වෙයි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් සුඛ වූ හෝ දුඃඛ වූ හෝ උපේක්ෂා වූ හෝ වේදනාව උපදී. හේ සුඛවේදනායෙන් පහස්නාලදුයේ සතුටු වෙයි. සතුටුබස් කියයි. බැසගෙන සිටී. ඔහුගේ සන්තානයෙහි රාගානුසය අප්‍රහීණ වැ සිටී. දුඃඛ වේදනායෙන් පහස්නාලදුයේ ශෝක කෙරෙයි, වෙහෙසෙයි, පරිදෙවනා කෙරෙයි, ළෙහි පැහැර හඬයි, සම්මොහයට පැමිණෙයි. ඔහුගේ සන්තානයෙහි ප්‍රතිඝානුශය අප්‍රහීණ වැ සිටී. උපේක්ෂාවේදනායෙන් පහස්නාලදුයේ ඒ වේදනාවගේ සමුදය ද අස්තඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද ඇතිසැටි නො දනී. ඔහුගේ සන්තානයෙහි අවිද්‍යානුශය අප්‍රහීණ වැ සිටී. මහණෙනි, ඒකාන්තයෙන් හෙතෙම සුඛවේදනායෙන් රාගානුශය දුරු නො කොට දුඃඛවේදනායෙන් ප්‍රතිඝානුශය විනොදනය නො කොට අදුඃඛමසුඛවේදනායෙන් අවිද්‍යානුශය සමුද්ඝාතනය නො කොට අවිද්‍යාව ප්‍රහීණ නො කොට මාර්ගඥනවිද්‍යාව නුපදවා ඉහාත්මයෙහි මැ වට්ටදුක්ඛය කෙළවර කරන්නේ ය යන තෙල කරුණ නො වේ.

මහණෙනි, ශ්‍රොත්‍රය ද ශබ්දයන් ද නිසා ශ්‍රොත්‍රවිඥනය උපදී. . . . ඝ්‍රාණය ද ගන්ධයන් ද නිසා . . . ජිහ්වාව ද රසයන් ද නිසා . . . කාය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා . . . මනස ද ධර්මයන් ද නිසා මනෝවිඥනය උපදී. තිදෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නම්, ස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ වේදනාව උපදී. හේ සුඛවේදනායෙන් පහස්නා ලදුයේ සතුටු වෙයි. තුටුවදන් බෙණෙයි. බැසගෙන සිටී. ඔහුට රාගානුශය අප්‍රහීණ වෙයි. දුඃඛවේදනායෙන් පහස්නාලදුයේ ශොක කෙරෙයි, වෙහෙසෙයි, පරිදෙවනා කෙරෙයි, ළෙහි පැහැර හඬයි, සම්මොහයට පැමිණෙයි. ඔහුට ප්‍රතිඝානුශය අප්‍රහීණ වැ සිටී. නො දුක් නො සුව වේදනායෙන් පහස්නා ලදුයේ ඒ වේදනාව ගේ සමුදය ද අස්තඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද ඇති සැටි නො දනී. ඔහුට අවිද්‍යානුශය අප්‍රහීණ වැ සිටී. මහණෙනි, ඒකාන්තයෙන් හෙතෙම සුඛවේදනා යෙන් රාගානුශය ප්‍රහීණ නො කොට දුඃඛවේදනායෙන් ප්‍රතිඝානුශය බැහැර නො කොට අදුක්ඛමසුඛ වේදනායෙන් අවිද්‍යානුශය සමූහනය නො කොට අවිද්‍යාව ප්‍රහීණ නො කොට විද්‍යාව නුපදවා ' ඉහාත්මයෙහි මැ දුක් කෙළවර කරන්නේ වෙයි ' යන තෙල කරුණ නො වන්නේ යැ.

මහණෙනි, ඇසත් රූපත් නිසා චක්ෂුර්විඥනය උපදී. ඒ චක්ෂුරාදි තිදෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නම්. ස්පර්ශ හෙතුයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛඅසුඛ වූ හෝ වෙදනා උපදී. හේ සුඛවේදනායෙන් පහරන ලදුව අභිනන්දන නො කෙරෙයි, තෘෂ්ණා වශයෙන් ගෙන නො බෙණෙයි. ගැලගෙන නො සිටී. ඔහුගේ රාගානුශය අනුශය වශයෙන් නො සිටී. දුඃඛවේදනායෙන් පහරනලදුවැ ශොක නො කෙරෙයි, ක්ලාන්ත නො වෙයි, පරිදෙවනා නො කෙරෙයි, ළෙහි අත්පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණෙයි, ඔහුගේ ප්‍රතිඝානුශය අනුශය නො කෙරෙයි. උපෙක්ෂාවේදනායෙන් පහරනලදුවැ ඒ වේදනාවගේ සමුදය හා අස්තඞ්ගමය හා ආස්වාදය හා ආදීනවය හා නිස්සරණය හා ඇති සැටි නුවණින් දනී. ඔහුගේ අවිද්‍යානුශය අනුශය නො කෙරෙයි. මහණෙනි, මෙසේ ඒ මහණ සුඛවේදනායෙහි රාගානුශය පියා දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය දුරු කොට උපෙක්ෂාවේදනායෙහිලා අවිද්‍යානුශය නසා අවිද්‍යාව හැර විද්‍යාව උපයා ඉහාත්මයෙහි මැ දුක් කෙළවර කරනු වෙයි '' යන මෙ කරුණ වෙයි.

සොතඤ්ච භික්ඛවෙ, පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං -පෙ- ඝානඤ්ච භික්ඛවෙ, පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හඤ්ච භික්ඛවෙ, පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං-පෙ- කායඤ්ච භික්ඛවෙ, පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං -පෙ- මනඤ්ච භික්ඛවෙ, පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. සො සුඛාය වෙදනාය ඵුට්ඨො සමානො නාභිනන්දති, නාභිවදති, නාජ්ඣොසාය තිට්ඨති. තස්ස රාගානුසයො, නානුසෙති. සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො -පෙ- සො අදුක්ඛමසුඛාය වෙදනාය ඵුට්ඨො සමානො තස්සා වෙදනාය සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. තස්ස අවිජ්ජානුසයො නානුසෙති. සො වත භික්ඛවෙ, සුඛාය වෙදනාය රාගානුසයං පහාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො චක්ඛුස්මිං නිබ්බින්දති. රූපෙසු නිබ්බින්දති. චක්ඛුවිඤ්ඤාණෙ නිබ්බින්දති. චක්ඛුසම්ඵස්සෙ නිබ්බින්දති. වෙදනාය නිබ්බින්දති තණ්හාය නිබ්බින්දති. සොතස්මිං නිබ්බින්දති. සද්දෙසු නිබ්බින්දති-පෙ-ඝානස්මිං නිබ්බින්දති. ගන්ධෙසු නිබ්බින්දති. -පෙ- ජිව්හාය නිබ්බින්දති, රසෙසු නිබ්බින්දති -පෙ- කායස්මිං නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසු නිබ්බින්දති -පෙ- මනස්මිං නිබ්බින්දති, ධම්මෙසු නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙ නිබ්බින්දති, මනොසම්ඵස්සෙ නිබ්බින්දති, වෙදනාය නිබ්බින්දති, තණ්හාය නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති : 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාතීති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

ඡ ඡක්ක සුත්තං ඡට්ඨං.

මහණෙනි, ශ්‍රොත්‍රය ද නිසා ශබ්දයනුදු නිසා ශ්‍රොත්‍රවිඤ්ඤාන උපදී. . . . මහණෙනි, ඝ්‍රාණය ද නිසා ගන්ධයනුදු නිසා ඝ්‍රාණවිඤ්ඤාන උපදී. . . . මහණෙනි, ජිහ්වාවද නිසා රසයනුදු නිසා ජිහ්වාවිඤ්ඤාන උපදී. . . . මහණෙනි, කය ද නිසා සප්‍රෂ්ටව්‍යයනුදු නිසා කායවිඤ්ඤාන උපදී. . . . මහණෙනි, මනස ද නිසා ධර්මයනුදු නිසා මනොවිඤ්ඤාන උපදී. තුන්දෙනාගේ සඞ්ගතිය ස්පර්ශ නම්. ස්පර්ශ හෙතුයෙන් සුඛ වූ හෝ දුඃඛ වූ හෝ උපෙක්ෂා සහගත වූ හෝ වේදනා උපදී. හේ සුඛවේදනායෙන් පහරන ලදුවැ තෘෂ්ණා විසින් අභිනන්දනා නො කෙරෙයි. තෘෂ්ණා විසින් නො බෙණෙයි. ගැලගෙන නො සිටී. ඔහුගේ රාගානුශය අනුශයන නො කෙරෙයි. හේ දුඃඛ වේදනායෙන් පහරන ලදු වැ . . . හේ උපෙක්ෂාසහගත වේදනායෙන් පහළේ ඒ වේදනායෙහි ලා සමුදය හා අස්තඞ්ගමය හා ආස්වාදය හා ආදීනවය හා නිස්සරණය හා ඇති සැටි නුවණින් දනී. ඔහුගේ අවිද්‍යානුශය අනුශය නො කෙරෙයි. මහණෙනි, ඒ මහණ සුඛවේදනායෙහි ලා රාගානුශය පියා දුඃඛවෙදනායෙහි ලා ප්‍රතිඝානුශය හැර උපෙක්ෂාවේදනායෙහි ලා අවිද්‍යානුශය නසා අවිද්‍යාව පියා විද්‍යාව උපයා මෙ වත්මනු බෙවෙහි මැ දුක් කෙළවර කරනු වෙති ' යි මෙ කරුණ වෙයි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ චක්ෂුසෙහි කලකිරෙයි, රූපයෙහි කලකිරෙයි, චක්ෂුර්විඤ්ඤානයෙහි කලකිරෙයි. චක්ෂුස්සංස්පර්ශයෙහි කල කලකිරෙයි. වේදනායෙහි කලකිරෙයි. තෘෂ්ණායෙහි කලකිරෙයි. ශ්‍රොත්‍රයෙහි කල කිරෙයි. ශබ්දයෙහි කලකිරෙයි . . . ජිහ්වායෙහි කලකිරෙයි. රසයෙහි කලකිරෙයි. . . . කයෙහි කල කිරෙයි. ස්පර්ශයෙහි කලකිරෙයි. . . . මනසෙහි කලකිරෙයි. ධර්මයෙහි කල කිරෙයි, මනෝවිඤ්ඤානයෙහි කලකිරෙයි, මනඃසංස්පර්ශයෙහි කලකිරෙයි, වෙදනායෙහි කලකිරෙයි, තෘෂ්ණායෙහි කලකිරෙයි. කලකිරෙනුයේ විරාගයට පැමිණෙයි. විරාගහෙතුයෙන් මිදෙයි. මිදියත් මැ ' මිදිණැ ' යි ඥානය වෙයි. ජාතිය ක්ෂීණ විය, බඹසර වැස නිමවනලද, කරණී කරනලද, ' මෙ අර්හත්ත්වය පිණිස අන් කරණී නැති ' යි නුවණින් දනී.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ. මේ විභාගධර්මය බණත් මැ සැටක් පමණ මහණුන්ගේ සිත් උපාදාන වශයෙන් නො ගෙන ආස්‍රවයෙන් මිදිණි.

**සවන ඡ ඡක්කසූත්‍ර යි.**

---

# 3. 5. 7

## මහාසළායතනික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මහාසළායතනිකං වො භික්ඛවෙ, දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චක්ඛුං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං, රූපෙ අජානං අපස්සං යථාභූතං, චක්ඛුවිඤ්ඤාණං අජානං අපස්සං යථාභූතං, චක්ඛුසම්ඵස්සං අජානං අපස්සං යථාභූතං, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අජානං අපස්සං යථාභූතං, චක්ඛුස්මිං සාරජ්ජති, රූපෙසු සාරජ්ජති, චක්ඛුවිඤ්ඤාණෙ සාරජ්ජති, චක්ඛුසම්ඵස්සෙ සාරජ්ජති, යම්පිදං[1] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්මිම්පි සාරජ්ජති.

තස්ස සාරත්තස්ස සංයුත්තස්ස සම්මූළ්හස්ස අස්සාදානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති. තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සා චස්ස පවඩ්ඪති. තස්ස කායිකාපි දරථා පවඩ්ඪන්ති, චෙතසිකාපි දරථා පවඩ්ඪන්ති, කායිකාපි සන්තාපා පවඩ්ඪන්ති, චෙතසිකාපි සන්තාපා පවඩ්ඪන්ති, කායිකාපි පරිළාහා පවඩ්ඪන්ති, චෙතසිකාපි පරිළාහා පවඩ්ඪන්ති, සො කායදුක්ඛම්පි චෙතොදුක්ඛම්පි පටිසංවෙදෙති.

සොතං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං-පෙ-ඝානං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං -පෙ- ජිව්හං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං -පෙ- කායං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං -පෙ- මනං භික්ඛවෙ, අජානං අපස්සං යථාභූතං, ධම්මෙ අජානං අපස්සං යථාභූතං, මනොවිඤ්ඤාණං අජානං අපස්සං යථාභූතං, මනොසම්ඵස්සං අජානං අපස්සං යථාභූතං, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අජානං අපස්සං යථාභූතං, මනස්මිං සාරජ්ජති, ධම්මෙසු සාරජ්ජති, මනොවිඤ්ඤාණෙ සාරජ්ජති, මනොසම්ඵස්සෙ සාරජ්ජති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්මිම්පි සාරජ්ජති.

---

1. යම්දං – මජසං, සිමු.

# 3. 5. 7

## මහාසළායතනික සූත්‍රය

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම්වෙහෙර වැඩවාසය කරන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමැතූසේක. 'වහන්සැ'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක :

මහණෙනි, තොපට මහාෂඩායතන පර්‍ය්‍යාය දෙසමි. එය අසව, මනාකොට මෙනෙහි කරව, කියමි'යි.

'වහන්ස, එසේ යැ'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහු, භාග්‍යවතුන් වහන්සේ මෙය මහාෂඩායතනපර්‍ය්‍යාය වදාළෝ.

මහණෙනි, චක්ෂුස ඇති සැටි මාර්ගඥනයෙන් නො දන්මින් නො දක්මින් රූපයන් ඇති සැටි නො දන්මින් නො දක්මින් චක්ෂුර්විඥනය ඇති සැටි නො දන්මින් නො දක්මින් චක්ෂුස්සංස්පර්ශය ඇති සැටි නො දන්මින් නො දක්මින් සුඛ වේවයි දුඃඛ වේවයි උපේක්ෂාසහගත වේවයි චක්ෂුස්සංස්පර්ශ හේතුයෙන් යම් වේදයිතයෙක් උපදනේ නම් එ ද ඇති සැටි නො දන්මින් නො දක්මින් චක්ෂුසෙහි සංරාග කෙරෙයි, රූපයෙහි සංරාග කෙරෙයි, චක්ෂුර්විඥනයෙහි සංරාග කෙරෙයි, චක්ෂුස්සංස්පර්ශයෙහි සංරාග කෙරෙයි, සුඛ වේවයි දුඃඛ වේවයි උපේක්ෂාසහගත වේවයි චක්ෂුඃසංස්පර්ශ හේතුයෙන් යම් වේදයිතයෙක් උපදනේ නම් එහිදු ඇලේ.

සංරක්ත වැ සංයුක්ත වැ සම්මූඪ වැ ආස්වාදය දක්මින් විහරණ කරන ඔහුගේ මතු පඤ්චඋපාදනස්කන්ධයෝ උපචයට යෙති. ඔහුගේ පුනර්භවය පිණිස වැටෙන නන්දිරාග සහගත වූ ඒ ඒ තන්හි අභිනන්‍දන කරන තෘෂ්ණායෙක් ඇද්ද, ඔහුට ඒ තෘෂ්ණා ද වෙසෙසින් වැඩෙයි. ඔහුගේ කායදරථයෝ ද වැඩෙති, චෛතසිකදරථයෝ ද වැඩෙති. කායික සන්තාපයෝ ද වැඩෙති, චෛතසිකසන්තාපයෝ ද වැඩෙති. කායිකපරිදහයෝ ද වැඩෙති. චෛතසිකයෝ ද වැඩෙත්. හේ කායදුඃඛය හා චේතොදුඃඛය විඳුනේ යැ.

මහණෙනි, ශ්‍රෝත්‍රය මාර්ගඥනයෙන් ඇති සැටි නො දන්මින් නො දක්මින් . . . . මහණෙනි, ඝ්‍රාණය ඇති සැටි නො දන්මින් නො දක්මින් . . . . මහණෙනි, ජිහ්වාව ඇති සැටි නො දන්මින් නො දක්මින් . . . මහණෙනි, කය ඇති සැටි නො දන්මින් නො දක්මින් . . . මහණෙනි, මනස ඇති සැටි නො දන්මින් නො දක්මින් ධර්මයන් යථාභූත වැ නො දන්මින් නො දක්මින් මනොවිඥනය යථාභූත වැ නො දන්මින් නො දක්මින් මනොසම්ඵස්සය යථාභූත වැ නො දන්මින් නො දක්මින් මනෝසම්ඵස්ස හේතුයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වේදනාවක් උපදී ද, එ ද යථාභූත ව නො දන්මින් නො දක්මින් මනසෙහි රාග විසින් ඇලෙයි, ධර්මයන්හි ඇලෙයි, මනෝ විඥනයෙහි ඇලෙයි, මනෝසම්ඵස්සයෙහි ඇලෙයි, මනෝසම්ඵස්ස හේතුයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වේදනාවක් උපදී ද, එහිදු රාග විසින් ඇලේ.

තස්ස සාරත්තස්ස සංයුත්තස්ස සම්මූළ්හස්ස අස්සාදානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති. තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සා චස්ස පවඩ්ඪති. තස්ස කායිකාපි දරථා පවඩ්ඪන්ති, චෙතසිකාපි දරථා පවඩ්ඪන්ති, කායිකාපි සන්තාපා පවඩ්ඪන්ති, චෙතසිකාපි සන්තාපා පවඩ්ඪන්ති, කායිකාපි පරිළාහා පවඩ්ඪන්ති, චෙතසිකාපි පරිළාහා පවඩ්ඪන්ති. සො කායදුක්ඛම්පි චෙතොදුක්ඛම්පි පටිසංවෙදෙති.

චක්ඛුඤ්ච ඛො භික්ඛවෙ, ජානං පස්සං යථාභූතං, රූපෙ ජානං පස්සං යථාභූතං, චක්ඛුවිඤ්ඤාණං ජානං පස්සං යථාභූතං, චක්ඛුසම්ඵස්සං ජානං පස්සං යථාභූතං, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි ජානං පස්සං යථාභූතං, චක්ඛුස්මිං න සාරජ්ජති, රූපෙසු න සාරජ්ජති, චක්ඛුවිඤ්ඤාණෙ න සාරජ්ජති, චක්ඛුසම්ඵස්සෙ න සාරජ්ජති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්මිම්පි න සාරජ්ජති.

තස්ස අසාරත්තස්ස අසංයුත්තස්ස අසම්මූළ්හස්ස ආදීනවානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා අපචයං ගච්ඡන්ති. තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සා චස්ස පහීයති. තස්ස කායිකාපි දරථා පහීයන්ති. චෙතසිකාපි දරථා පහීයන්ති. කායිකාපි සන්තාපා පහීයන්ති. චෙතසිකාපි සන්තාපා පහීයන්ති. කායිකාපි පරිළාහා පහීයන්ති. චෙතසිකාපි පරිළාහා පහීයන්ති. සො කායසුඛම්පි චෙතොසුඛම්පි පටිසංවෙදෙති.

යා තථාභූතස්ස දිට්ඨි, සාස්ස හොති සම්මාදිට්ඨි. යො තථාභූතස්ස සඞ්කප්පො, ස්වාස්ස හොති සම්මාසඞ්කප්පො. යො තථාභූතස්ස වායාමො, ස්වාස්ස හොති සම්මාවායාමො. යා තථාභූතස්ස සති, සාස්ස හොති සම්මාසති. යො තථාභූතස්ස සමාධි, ස්වාස්ස හොති සම්මාසමාධි. පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති. එවමස්සායං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපරිපූරිං ගච්ඡති.

තස්ස එවං ඉමං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො චත්තාරොපි සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි සම්මප්පධානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි ඉද්ධිපාදා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි ඉන්ද්‍රියානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති පඤ්චපි බලානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. සත්තපි බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

තස්සිමෙ ද්වෙ ධම්මා යුගනද්ධා[1] වත්තන්ති සමථො ච විපස්සනා ච. සො යෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති. යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා පජහති. යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති. යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා සච්ඡිකරොති.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා: පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං. සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා.

1. යුගනන්ධා - මජසං.

සංරක්ත වැ සංයුක්ත වැ සම්මූඪ වැ ආස්වාද වශයෙන් දක්මින් වෙසෙන ඔහුට මතු පඤ්චෝපාදනස්කන්ධයෝ උපචයට යෙති. ඔහුගේ පුනර්භවය පිණිස වැටෙන නන්දිරාග සහගත වූ ඒ ඒ තන්හි අභිනන්‍දනා කරන තෘෂ්ණායෙක් ඇද්ද, ඔහුට ඒ තෘෂ්ණා ද වෙසෙයින් වැඩෙයි. ඔහුට පඤ්චද්වාරික දරථයෝ ද වෙසෙයින් වැඩෙති, මනොද්වාරික දරථයෝ ද වෙසෙයින් වැඩෙති, පඤ්චද්වාරික සන්තාපයෝ ද වැඩෙති, මනොද්වාරික සන්තාපයෝ ද වැඩෙති, පඤ්චද්වාරික පරිදහයෝ ද වැඩෙති, මනොද්වාරික පරිදහයෝ ද වැඩෙත්. හේ පඤ්චද්වාරික දුඃඛය ද මනොද්වාරික දුඃඛය ද විඳී.

මහණෙනි, චක්ෂුස යථාභූත වැ දන්මින් දක්මින් රූපයන් යථාභූත වැ දන්මින් දක්මින් චක්ෂුර් විඥනය යථාභූත වැ දන්මින් දක්මින් චක්ඛුසම්ඵස්සය යථාභූත වැ දන්මින් දක්මින් චක්ඛුසම්ඵස්ස හේතුයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වේදනාවක් උපදී ද, එද යථාභූත වැ දන්මින් දක්මින් චක්ෂුසෙහි නො ඇලෙයි. රූපයන්හි නො ඇලෙයි. චක්ෂුර්විඥනයෙහි නො ඇලෙයි. චක්ඛුසම්ඵස්සයෙහි නො ඇලෙයි. චක්ඛුසම්ඵස්ස හේතුයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වේදනාවක් උපදී ද, එහිදු නො ඇලේ.

අසංරක්ත වැ අසංයුක්ත වැ අසම්මූඪ වැ ආදීනව දක්මින් වාස කරන ඔහුට මතු පඤ්චෝපාදනස්කන්ධයෝ අපචයට යෙති. ඔහුගේ පුනර්භවය ඇති කරන නන්දිරාග සහගත වූ ඒ ඒ භවයෙහි අභිනන්‍දනා කරන යම් තෘෂ්ණාවක් ඇද්ද, ඔහුට ඒ තෘෂ්ණාව ද ප්‍රහීණ වෙයි. ඔහුට පඤ්චද්වාරික දරථයෝ ද ප්‍රහීණ වෙති මනොද්වාරික දරථයෝ ද ප්‍රහීණ වෙති. පඤ්චද්වාරික සන්තාපයෝ ද ප්‍රහීණ වෙති, මනොද්වාරික සන්තාපයෝ ද ප්‍රහීණ වෙති. පඤ්චද්වාරික පරිදහයෝ ද ප්‍රහීණ වෙති. මනොද්වාරික පරිදහයෝ ද ප්‍රහීණ වෙත්. හේ පඤ්චද්වාරික සුඛය ද මනොද්වාරික සුඛය ද විඳී.

එබඳු වූවහුගේ යම් දෘෂ්ටියක් ඇද්ද, ඒ දෘෂ්ටිය ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි. එබඳු වූවහුගේ යම් සංකල්පයෙක් ඇද්ද, ඒ සංකල්පය ඔහුට සම්‍යක්සංකල්ප වෙයි. එබඳු වූවහුගේ යම් ව්‍යායාමයෙක් ඇද්ද, ඒ ව්‍යායාමය ඔහුට සම්‍යග්ව්‍යායාම වෙයි. එබඳු වූවහුගේ යම් ස්මෘතියක් ඇද්ද, ඒ ස්මෘතිය ඔහුට සම්‍යක්ස්මෘති වෙයි. එබඳු වූවහුගේ යම් සමාධියෙක් ඇද්ද, ඒ සමාධිය ඔහුට සම්‍යක් සමාධි වෙයි. ඒ මහණහුගේ කායකර්මය ද වාක්කර්මය ද ආජීවය ද කැල මැ සුපරිශුද්ධ වේ. මෙසේ ඒ මහණහට මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය භාවනායෙන් වැඩීමට යේ.

මෙසේ මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වඩන ඒ මහණහට සතර සතිපට්ඨානයෝ ද භාවනායෙන් පිරීමට යෙති. සතර සම්‍යක් ප්‍රධානයෝ ද භාවනායෙන් පිරීමට යෙති, සතර ඍද්ධිපාදයෝ ද භාවනායෙන් පිරීමට යෙති. පඤ්චෙන්ද්‍රියයෝ ද භාවනායෙන් පිරීමට යෙති. පඤ්ච බලයෝ ද භාවනායෙන් පිරීමට යෙති. සප්ත බොධ්‍යඞ්ගයෝ ද භාවනායෙන් පිරීමට යෙත්.

ඔහුට ශමථය ද විදර්ශනා ද යන මේ ධර්මයෝ දෙදෙන යුගනද්ධ වැ පවත්නාහ. හෙතෙම යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් පිරිසිඳ දතයුත්තාහු ද, ඒ ධර්මයන් අභිඥයෙන් පිරිසිඳ දනගනී. යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙත් ද, ඒ ධර්මයන් අභිඥයෙන් දුරු කෙරෙයි. යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් භාවිතව්‍ය වෙත් ද, ඒ ධර්මයන් අභිඥයෙන් වඩයි, යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහු වෙත් ද, ඒ ධර්මයන් අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කෙරේ.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් පරිඥෙය වෙත් ද යත් : 'පඤ්චෝපාදනස්කන්ධයෝ' යයි ඊට පිළිතුරු කියයුතු වෙයි. ඒ මෙසේ යැ. රූපෝපාදනසකන්ධ යැ වෙදනොපාදනස්කන්ධ යැ සංඥෙපාදනස්කන්ධ යැ සංස්කාරෝපාදනස්කන්ධ යැ විඥනෝපාදනස්කන්ධ යි. මේ ධර්මයෝ අභිඥයෙන් පරිඥෙය වෙත්.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පහාතබ්බා: අවිජ්ජා ච භවතණ්හා ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා: සමථො ච විපස්සනා ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා: විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා.

සොතං භික්ඛවෙ, ජානං පස්සං යථාභූතං -පෙ- ඝානං භික්ඛවෙ ජානං පස්සං යථාභූතං -පෙ- ජිව්හං භික්ඛවෙ, ජානං පස්සං යථාභූතං -පෙ- කායං භික්ඛවෙ, ජානං පස්සං යථාභූතං -පෙ- මනං භික්ඛවෙ, ජානං පස්සං යථාභූතං, ධම්මෙ ජානං පස්සං යථාභූතං, මනොවිඤ්ඤාණං ජානං පස්සං යථාභූතං, මනොසම්ඵස්සං ජානං පස්සං යථාභූතං, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජානං පස්සං යථාභූතං, මනස්මිං න සාරජ්ජති. ධම්මෙසු න සාරජ්ජති. මනොවිඤ්ඤාණෙ න සාරජ්ජති. මනොසම්ඵස්සෙ න සාරජ්ජති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. තස්මිම්පි න සාරජ්ජති.

තස්ස අසාරත්තස්ස අසංයුත්තස්ස අසම්මූළ්හස්ස ආදීනවානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා අපචයං ගච්ඡන්ති. තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සා චස්ස පහීයති. තස්ස කායිකාපි දරථා පහීයන්ති. චෙතසිකාපි දරථා පහීයන්ති කායිකාපි සන්තාපා පහීයන්ති. චෙතසිකාපි සන්තාපා පහීයන්ති. කායිකාපි පරිළාහා පහීයන්ති. චෙතසිකාපි පරිළාහා පහීයන්ති. සො කායසුඛම්පි චෙතොසුඛම්පි පටිසංවෙදෙති.

යා තථාභූතස්ස දිට්ඨි, සාස්ස හොති සම්මාදිට්ඨි. යො තථාභූතස්ස සඞ්කප්පො, ස්වාස්ස හොති සම්මාසඞ්කප්පො. යො තථාභූතස්ස වායාමො, ස්වාස්ස හොති සම්මාවායාමො. යා තථාභූතස්ස සති, සාස්ස හොති සම්මාසති. යො තථාභූතස්ස සමාධි. ස්වාස්ස හොති සම්මාසමාධි. පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති. එවමස්සායං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති.

තස්ස එවං ඉමං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො චත්තාරොපි සතිපට්ඨානා භාවනාපාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි සම්මප්පධානා භාවනාපාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි ඉද්ධිපාදා භාවනාපාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි ඉන්ද්‍රියානි භාවනාපාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි බලානි භාවනාපාරිපූරිං ගච්ඡන්ති. සත්තපි බොජ්ඣඞ්ගා භාවනාපාරිපූරිං ගච්ඡන්ති.

තස්සිමෙ ද්වෙ ධම්මා යුගනද්ධා වත්තන්ති සමථො ච විපස්සනා ච. සො යෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති. යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා. තෙ ධම්මෙ අභිඤ්ඤා පජහති. යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති. යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා සච්ඡිකරොති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙත් ද යත් : අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන මේ ධර්මයෝ අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් භාවිතව්‍ය වෙත් ද යත් : ශමථය ද විදර්ශනාව ද යන මේ ධර්මයෝ අභිඥයෙන් භාවිතව්‍ය වෙති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහු ද යත් : විද්‍යාව ද විමුක්තිය ද යන මේ ධර්මයෝ අභිඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහු වෙත්.

මහණෙනි, ශ්‍රොත්‍රය යථාභූත කොට දන්මින් දක්මින් . . . . මහණෙනි, ඝ්‍රාණය යථාභූත වැ දන්මින් දක්මින් . . . මහණෙනි, ජිහ්වාව යථාභූත වැ දන්මින් දක්මින් . . . මහණෙනි, කය යථාභූත වැ දන්මින් දක්මින් . . . මහණෙනි, මනස යථාභූත වැ දන්මින් දක්මින් ධර්මයන් යථාභූත වැ දන්මින් දක්මින් මනෝවිඥනය යථාභූත වැ දන්මින් දක්මින් මනොසම්ඵස්සය යථාභූත වැ දන්මින් දක්මින් මනොසම්ඵස්ස හේතුයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී ද, එ ද යථාභූත වැ දන්මින් දක්මින් මනසෙහි නො ඇලෙයි, ධර්මයන්හි නො ඇලෙයි, මනොවිඥනයෙහි නො ඇලෙයි, මනොසම්ඵස්ස යෙහි නො ඇලෙයි. මනොසම්ඵස්ස හෙතුයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී ද, එහිදු නො ඇලේ.

අසංරක්ත වැ අසංයුක්ත වැ අසම්මූඪ වැ ආදීනවානුදර්ශී වැ වෙසෙන ඔහුට මතුයෙහි පඤ්චොපාදනස්කන්ධයෝ අපචයට යෙති. ඔහුගේ පුනර්භවික වූ නන්දිරාග සහගත වූ ඒ ඒ භවයෙහි අභිනන්‍දනා කරන තෘෂ්ණාවක් ඇද්ද, ඔහුට ඒ තෘෂ්ණාව ද ප්‍රහීණ වෙයි. ඔහුට පඤ්චද්වාරික දරථයෝ ද ප්‍රහීණ වෙති. මනොද්වාරික දරථයෝ ද ප්‍රහීණ වෙති. පඤ්චද්වාරික සන්තාපයෝ ද ප්‍රහීණ වෙති. මනොද්වාරික සන්තාපයෝ ද ප්‍රහීණ වෙති. පඤ්චද්වාරික පරිදාහයෝ ද ප්‍රහීණ වෙති. මනෝද්වාරික පරිදාහයෝ ද ප්‍රහීණ වෙත්, හේ පඤ්චද්වාරික සුඛය ද මනෝද්වාරික සුඛය ද විඳී.

එබඳු මහණහු ගේ යම් දෘෂ්ටියක් ඇද්ද, එය ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි. එබඳු වූවහුගේ යම් සංකල්පයෙක් ඇද්ද, ඒ සංකල්පය ඔහුට සම්‍යක්සංකල්ප වෙයි. එබඳු වූවහු ගේ යම් ව්‍යායාමයෙක් ඇද්ද, එය ඔහුට සම්‍යග්ව්‍යායාම වෙයි. එබඳු වූවහුගේ යම් ස්මෘතියක් ඇද්ද, ඒ ඔහුට සම්‍යක්ස්මෘති වෙයි. එබඳු වූවහුගේ යම් සමාධියෙක් ඇද්ද, එය ඔහුට සම්‍යක් සමාධි වේ. ඔහුගේ කායකර්මය ද වාක්කර්මය ද ආජීවය ද කැල මැ සුපරිශුද්ධ වෙයි. මෙසේ ඔහුට මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය භාවනායෙන් වැඩීමට යේ.

මෙසේ මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන ඔහුට සතර සතිපට්ඨානයෝ ද භාවනා යෙන් පිරීමට යෙති. සතර සම්‍යක් ප්‍රධානයෝ ද වැඩීමෙන් පිරීමට යෙති. සතර ඍද්ධිපාදයෝ ද වැඩීමෙන් පිරීමට යෙති. පඤ්ච ඉන්ද්‍රියයෝ ද වැඩීමෙන් පිරීමට යෙති. පඤ්ච බලයෝ ද වැඩීමෙන් පිරීමට යෙති. සප්ත බොධ්‍යඞ්ගයෝ ද වැඩීමෙන් පිරීමට යෙත්.

ඔහුට ශමථ ද විදර්ශනා ද යන මේ ධර්මයෝ දෙදෙන යුගනද්ධ වැ වැටෙති. හේ යම් ධර්ම කෙනෙක් ප්‍රඥයෙන් පිරිසිඳ දතයුත්තාහු ද, ඒ ධර්මයන් ප්‍රඥයෙන් පිරිසිඳ දනගනී. යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙත් ද, ඒ ධර්මයන් අභිඥයෙන් ප්‍රහීණ කෙරෙයි. යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් භාවිතව්‍ය වෙත් ද, ඒ ධර්මයන් අභිඥයෙන් භාවනා කෙරෙයි. යම් ධර්ම කෙනෙක් අභිඥයෙන් සාක්ෂාත් කර්තව්‍ය වෙත් ද, ඒ ධර්ම යන් අභිඥයෙන් සාක්ෂාත් කෙරේ.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා: පඤ්චුපාදානක්ඛන්ධා'තිස්ස වචනීයං සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පහාතබ්බා: අවිජ්ජා ච භවතණ්හා ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා: සමථො ච විපස්සනා ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා: විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**මහාසළායතනික සුත්තං සත්තමං.**

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් පරිඥේය වෙති යත් : 'පඤ්චෝපාදනස් කන්ධයෝ' යයි ඊට කියයුතු යැ. ඒ මෙසේ යැ : රූපෝපාදනස්කන්ධ යැ. වෙදනෝපාදනස්කන්ධ යැ, සංඥෙපාදනස්කන්ධ යැ, සංස්කාරෝපාදනස්කන්ධ යැ, විඥනෝපාදනස්කන්ධයි. මේ ධර්මයෝ අභිඥයෙන් පරිඥෙය වෙති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙති යත් : 'අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන මේ ධර්මයෝ අභිඥයෙන් ප්‍රහාතව්‍ය වෙති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් භාවිතව්‍ය වෙති යත් : ශමථ ද විදර්ශනා ද යන මේ ධර්මයෝ අභිඥයෙන් භාවිතව්‍ය වෙති.

මහණෙනි, කවර ධර්ම කෙනෙක් අභිඥයෙන් සාක්ෂාත් කර්තව්‍ය වෙති යත් : විද්‍යා ද විමුක්ති ද යන මේ ධර්මයෝ අභිඥයෙන් සාක්ෂාත් කර්තව්‍ය වෙත්.

භාග්‍යවතුන් වහන්සේ මේ මහාෂඩායතනික සූත්‍රය වදළ සේක. සතුටු සිත් ඇති ඒ වහන්දැ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දනා කළෝ.

**සත් වැනි මහාසළායතනික සූත්‍ර යි,**

---

# 3. 5. 8

## නගරවින්දෙය්‍ය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නගරවින්දං නාම කොසලානං බ්‍රාහ්මණගාමො, තදවසරි. අස්සොසුං ඛො නගරවින්දෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා: 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං නගරවින්දං අනුප්පත්තො. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො නගරවින්දෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො නගරවින්දෙය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ භගවා එතදවොච:

සචෙ වො ගහපතයො, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කථංරූපා ගහපතයො, සමණබ්‍රාහ්මණා න සක්කාතබ්බා න ගරුකාතබ්බා න මානෙතබ්බා න පූජෙතබ්බාති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ: යෙ තෙ සමණබ්‍රාහ්මණා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරන්ති කායෙන වාචාය මනසා, එවරූපා සමණබ්‍රාහ්මණා න සක්කාතබ්බා, න ගරුකාතබ්බා, න මානෙතබ්බා, න පූජෙතබ්බා. තං කිස්ස හෙතු: මයම්පි හි චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරාම කායෙන වාචාය මනසා. තෙසං නො සමචරියම්පි හෙතං උත්තරිං අපස්සතං. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා න සක්කාතබ්බා න ගරුකාතබ්බා න මානෙතබ්බා න පූජෙතබ්බා. යෙ තෙ සමණබ්‍රාහ්මණා

# 3. 5. 8

# නගරවින්දෙය්‍ය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහාභික්ෂු සංඝයා සමග කොසොල් ජනපදයෙහි චාරිකා කරන සේක් කොසොල්රට නගරවින්ද නම් බමුණුගමට වැඩිසේක. නගරවින්දයෙහි වැසි බමුණු ගැහැවියෝ මේ ඇසූහ : '' ශාක්‍ය පුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් නික්මැ පැවිදි වූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මහාභික්ෂු සංඝයා සමඟ කොසොල් ජනපදයෙහි චාරිකා කරන සේක් නගරවින්දයට පැමිණි සේක. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු කල්‍යාණ කීර්තිශබ්දය උස් වැ නැඟිණ: ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේ අර්හත් වූහ. සම්‍යක්සම්බුද්ධයහ. අෂ්ටවිද්‍යා පසළොස් චරණයෙන් සමන්විතයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තර පුරුෂදම්‍යසාරථිහ. දෙව් මිනිස්නට ශාස්තෘ වූහ. බුද්ධයහ. භාග්‍යවත්හ ' යි. ඒ භාග්‍යවත්හු සදෙවක සමාරක සබ්‍රහ්මක වූ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත ප්‍රජාව ඇති දෙව්මිනිසුන් සහිත මේ ලොකය තමන් වහන්සේ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ආදි කල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ සාර්ත්ථ වූ සව්‍යඤ්ජන වූ කෙවලපරිපූර්ණ වූ ධර්මය දෙසන සේක. පරිශුද්ධ වූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරන සේක. එබඳු වූ රහතුන්ගේ දකීම මනා මැ නු' යි.

ඉක්බිති නගරවින්දයෙහි වැසි බමුණුගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ කිසි කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට අභිවාදනා කොට එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කළයුතු කථාව කොට නිමවා එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට පිළිපා කොට එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි නම්ගොත් අස්වා එකත්පස් වැ හුන්හ. ඇතැම් කෙනෙක් තුෂ්ණීම් භූත වැ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් නගරවින්දයෙහි වැසි බමුණුගැහැවියනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක.

ඉදින් ගැහැවියෙනි, අන්තොටු පිරිවැජියෝ තොප මෙසේ පුළුවුස්නාහු නම්: '' ගැහැවියෙනි, කෙබඳු පියවි ඇති මහණ බමුණෝ සත්කාර නො කටයුත්තාහු ද ගරුකාර නො කට යුත්තාහු ද බුහුමන් නො කටයුත්තාහු ද නො පිදියයුත්තාහු ද ? යි '' ගැහැවියෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරන්නහු යැ: ' යම් මහණබමුණු කෙනෙක් චක්ෂුර්විඥෙය රූපයෙහි නො පැහූ රාග ඇති වැ නො පැහූ ද්වේෂ ඇති වැ නො පැහූ මෝහ ඇති වැ තමා තුළ නො සන්හුන් සිත් ඇති වැ කයින් වචසින් මනසින් සමවිසම කොට හැසිරෙත් ද, මෙවන් මහණ බමුණෝ සත්කාර නො කළයුතු වෙති. ගරුකාර නො කළයුතු වෙති. බුහුමන් නො කළයුතු වෙති. නො පිදියයුතු වෙත්. ඒ කවර හෙයින යත් : අපිදු චක්ෂුර්විඥෙය රූපයෙහි අවීතරාගයම්හ, අවීතද්වේෂයම්හ, අවීතමොහයම්හ, තමා තුළ නො සන්හුන් සිතැතියම්හ, කයින් වචසින් මනසින් සමවිසම කොට හැසිරෙම්හ. මතුයෙහි අන්‍යචර්‍ය්‍යාවක් නො දක්නා අපට තෙල සමචර්‍ය්‍යා මැ වෙයි. එයින් ඒ භවත් මහණ බමුණෝ සත්කාර නො කළයුතු වෙති. ගරුකාර නො කළයුතු වෙති. බුහුමන් නො කළයුතු වෙති. නො

සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු, -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු, -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු, -පෙ- කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු, -පෙ- මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරන්ති කායෙන වාචාය මනසා. එවරූපා සමණබ්‍රාහ්මණා න සක්කාතබ්බා න ගරුකාතබ්බා න මානෙතබ්බා න පූජෙතබ්බා. තං කිස්ස හෙතු: මයම්පි හි මනො-විඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරාම කායෙන වාචාය මනසා. තෙසං නො සමචරියම්පි හෙතං උත්තරිං අපස්සතං. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා න සක්කාතබ්බා න ගරුකාතබ්බා න මානෙතබ්බා න පූජෙතබ්බාති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ.

සචෙ පන වො ගහපතයො අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කථංරූපා[1] ගහපතයො සමණබ්‍රාහ්මණා සක්කාතබ්බා, ගරුකාතබ්බා, මානෙතබ්බා, පූජෙතබ්බා'ති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: යෙ තෙ සමණබ්‍රාහ්මණා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු වීතරාගා වීතදොසා වීතමොහා අජ්ඣත්තං වූපසන්තචිත්තා සමචරියං චරන්ති කායෙන වාචාය මනසා. එවරූපා සමණබ්‍රාහ්මණා සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා. තං කිස්ස හෙතු: මයම්පි හි චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරාම කායෙන වාචාය මනසා. තෙසං නො සමචරියම්පි හෙතං උත්තරිං පස්සතං. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා. යෙ තෙ සමණ-බ්‍රාහ්මණා සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු-පෙ-ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු -පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු-පෙ-කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු -පෙ-මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු වීතරාගා වීතදොසා වීතමොහා අජ්ඣත්තං වූපසන්තචිත්තා සමචරියං චරන්ති කායෙන වාචාය මනසා. එවරූපා සමණබ්‍රාහ්මණා සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා. තං කිස්ස හෙතු: මයම්පි හි මනො විඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු අවීතරාගා අවීතදොසා අවීතමොහා අජ්ඣත්තං අවූපසන්තචිත්තා සමවිසමං චරාම කායෙන වාචාය මනසා. තෙසං නො සමචරියම්පි හෙතං උත්තරිං පස්සතං. තස්මා තෙ භොන්තො සමණබ්‍රාහ්මණා සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා'ති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ.

---

1. කථංභූතා - මජසං.

පිදියයුතු වෙත්. යම් ඒ මහණ බමුණු කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය වූ ශබ්දයෙහි... ඝ්‍රාණ විඥෙය වූ ගන්ධයෙහි... ජිහ්වාවිඥෙය වූ රසයෙහි... කායවිඥෙය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙහි... මනොවිඥෙය වූ ධර්මයෙහි නො පැහූ රාග ඇති වැ නො පැහූ ද්වේෂ ඇති වැ නො පැහූ මොහ ඇති වැ තමා තුළ නො සන්හුන් සිතැති වැ කයින් වචසින් මනසින් සමවිසම කොට හැසිරෙත් ද, මෙවන් මහණ බමුණෝ සත්කාර නො කළයුතු වෙති. ගරුකාර නො කළයුතු වෙති. බුහුමන් නො කළයුතු වෙති. නො පිදියයුතු වෙත්. ඒ කවර හෙයින යත් : අපිදු මනොවිඥෙය ධර්මයෙහි නො පැහූ රාග ඇතියම්හ. නො පැහූ ද්වේෂ ඇතියම්හ. නො පැහූ මොහ ඇතියම්හ. තමා තුළ නො සන්හුන් සිත් ඇතියම්හ. කයින් වචසින් මනසින් සමවිසමචර්‍ය්‍යා කරම්හ. මතුයෙහි අන්‍යචර්‍ය්‍යා නො දක්නා අපට තෙල සමචර්‍ය්‍යා ද වියහෙයි. එයින් ඒ භවත් මහණබමුණෝ සත්කාර නො කළයුතු වෙති, ගරුකාර නො කළ යුතු වෙති. බුහුමන් නො කළයුතු වෙති. නො පිදියයුතු වෙති ' යි. මෙසේ පුළුවුස්නාලද ගැහැවි වූ තෙපි ඒ අන් තොටු පිරිවැජියනට මෙසේ විභාග කොට කියවු.

ඉදින් ගැහැවියෙනි, අන් තොටු පිරිවැජියෝ 'ගැහැවියෙනි, කෙබඳු මහණ බමුණෝ සත්කාරාර්හ වෙත් ද ගරුකාරාර්හ වෙත් ද මානනාර්හ වෙත් ද පූජනාර්හ වෙත් ද? 'යි. තොප මෙසේ පුළුවුස්නාහු නම් ගැහැවියෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන් තොටු පිරිවැජියනට මෙසේ විභාග කොට කියව. යම් මහණ බමුණු කෙනෙක් චක්ෂුර්විඥෙය රූපාලම්බනයෙහි පැහූ රාග ඇති වෙත් ද පැහූ ද්වේෂ ඇති වෙත් ද පැහූ මොහ ඇති වෙත් ද තමා තුළ සන්හුන් සිත් ඇති වෙත් ද කයින් වචසින් මනසින් සමචර්‍ය්‍යා කෙරෙත් ද මෙබඳු මහණ බමුණෝ සත්කාරාර්හ වෙති, ගරුකාරාර්හ වෙති, මානනාර්හ වෙති, පූජනාර්හ වෙති. ඒ කවර හෙයින යත් : අපි වනාහි චක්ෂුර් විඥෙය රූපාලම්බනයෙහි නො පැහූ රාග ඇතියම්හ, නො පැහූ ද්වේෂ ඇතියම්හ, නො පැහූ මොහ ඇතියම්හ, තමා තුළ නො සන්හුන් සිත් ඇතියම්හ. කයින් වචසින් මනසින් සමවිසමචර්‍ය්‍යා කරම්හ. මතුයෙහි අන්‍යචර්‍ය්‍යා දක්නා අපට තෙල සමචර්‍ය්‍යා ද විය හෙයි. එයින් ඒ භවත් මහණබමුණෝ සත්කාරාර්හ වෙති, ගරුකාරාර්හ වෙති, මානනාර්හ වෙති, පූජනාර්හ වෙති. යම් මහණ බමුණු කෙනෙක් ශ්‍රොත්‍රවිඥෙය ශබ්දාලම්බනයෙහි... ඝ්‍රාණවිඥෙය ගන්ධාලම්බනයෙහි... ජිහ්වාවිඥෙය රසාලම්බනයෙහි... කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි... මනොවිඥෙය ධර්මයෙහි වීතරාග වෙත් ද වීතද්වේෂ වෙත් ද වීතමොහ වෙත් ද, තමා තුළ සන්හුන් සිත් ඇති වෙත් ද, කයින් වචසින් මනසින් සමචර්‍ය්‍යා කෙරෙත් ද, මෙබඳු මහණබමුණෝ සත්කාරාර්හ වෙති, ගරුකාරාර්හ වෙති, මානනාර්හ වෙති, පූජනාර්හ වෙත්, ඒ කවර හෙයින යත් : අපි වනාහි මනොවිඥෙය ධර්මයෙහි අවීතරාගයම්හ, අවීතද්වේෂයම්හ, අවීතමොහයම්හ. තමා තුළ නො සන්හුන් සිත් ඇතියම්හ. කයින් වචසින් මනසින් සමවිසමචර්‍ය්‍යා කරම්හ. මතුයෙහි අන්‍යචර්‍ය්‍යා දක්නා අපට තෙල සමචර්‍ය්‍යා ද වෙයි එයින් ඒ භවත් මහණ බමුණෝ සත්කාරාර්හ වෙති. ගරුකාරාර්හ වෙති මානනාර්හ වෙති, පූජනාර්හ වෙත්' යි. ගැහැවියෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ විභාග කොට කියව.

සචෙ පන වො ගහපතයො, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කෙ පනායස්මන්තානං ආකාරා කෙ අන්වයා, යෙන තුම්හෙ ආයස්මන්තො එවං වදෙථ: අද්ධා තෙ ආයස්මන්තො වීතරාගා වා රාගවිනයාය වා පටිපන්නා, වීතදොසා වා දොසවිනයාය වා පටිපන්නා වීතමොහා වා මොහවිනයාය වා පටිපන්නා'ති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: තථා හි තෙ ආයස්මන්තො අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නත්ථි ඛො පන තත්ථ තථාරූපා චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා, යෙ දිස්වා දිස්වා අභිරමෙය්‍යුං. නත්ථි ඛො පන තත්ථ තථාරූපා සොතවිඤ්ඤෙය්‍යා සද්දා, යෙ සුත්වා සුත්වා අභිරමෙය්‍යුං. නත්ථි ඛො පන තත්ථ තථාරූපා ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා, යෙ ඝායිත්වා ඝායිත්වා අභිරමෙය්‍යුං. නත්ථි ඛො පන තත්ථ තථාරූපා ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා, යෙ සායිත්වා සායිත්වා අභිරමෙය්‍යුං. නත්ථි ඛො පන තත්ථ තථාරූපා කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා, යෙ ඵුසිත්වා ඵුසිත්වා අභිරමෙය්‍යුං. ඉමෙ ඛො නො ආවුසො, ආකාරා ඉමෙ අන්වයා, යෙන මයං ආයස්මන්තො එවං වදෙම. අද්ධා තෙ ආයස්මන්තො වීතරාගා වා රාගවිනයාය වා පටිපන්නා, වීතදොසා වා දොසවිනයාය වා පටිපන්නා, වීතමොහා වා මොහවිනයාය වා පටිපන්නාති. එවං පුට්ඨා තුම්හෙ ගහපතයො, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථා'ති.

එවං වුත්තෙ නගරවින්දෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං: 'අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භගවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ'ති.

නගර වින්දෙය්‍ය සුත්තං අට්ඨමං.

---

1. අරඤ්ඤවනපත්ථානි - මජසං.

ගැහැවියෙනි, ඉදින් තොප අතින් අන්තොටු පිරිවැජියෝ මෙසේ විචාරත් ද, (කෙසේද යත් :) 'යම් හෙයෙකින් ඇවැත්නි, තෙපි ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු වීතරාග හෝ වෙති, රාගවිනය පිණිස හෝ පිළිපන්නාහු වෙති, වීතද්වේෂ හෝ වෙති, ද්වේෂවිනය පිණිස හෝ පිළිපන්නාහු වෙති, වීතමොහ හෝ වෙති, මොහවිනය පිණිස හෝ පිළිපන්නාහු වෙති' යි මෙසේ කියවු ද, ඒ ආයුෂ්මතුන්ගේ තාදෘශාකාරයෝ කවරහ, අන්වයයෝ කවරහ' කියා යි. ගැහැවියෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ කියව: 'එසේ මැ යැ. ඒ ආයුෂ්මත්හු අරණ්‍ය වානප්‍රස්ථ ප්‍රාන්ත ශයනාසනයන් සෙවිති. එහි යම් බඳු රූපයන් දක දක සිත් අලවත් ද, එවන් චක්ෂුර්විඥෙය වූ රූපායතනයෝ නැත. එහි යම් බඳු ශබ්දයන් අස අසා සිත් අලවත් ද, එබඳු ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයෝ නැත. එහි යම්බඳු ගන්ධයන් අඝ්‍රාණ කොට කොට සිත් අලවත් ද එබඳු ඝ්‍රාණ විඥෙය ගන්ධයෝ නැත. එහි යම්බඳු රසයන් ආස්වාද කොට කොට සිත් අලවත් ද, එබඳු වූ ජිහ්වාවිඥේය රසයෝ නැත. එහි යම්බඳු ස්ප්‍රෂ්ටව්‍යයන් ස්පර්ශ කොට කොට සිත් අලවත් ද, එබඳු වූ කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ නැත. ආයුෂ්මත්නි, අපි යම් හෙයෙකින් මෙසේ කියමෝද (කෙසේද යැ යත් :) 'ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු වීතරාග හෝ වෙති. රාගවිනය පිණිස පිළිපන්නාහු හෝ වෙති. වීතද්වේෂ හෝ වෙති, ද්වේෂවිනය පිණිස පිළිපන්නාහු හෝ වෙති. වීතමෝහ හෝ වෙති, මොහ විනය පිණිස පිළිපන්නාහු හෝ වෙති යි . ඇවැත්නි, මොහු අප ගත් ආකාරයෝ වෙති. මොහු අන්වයෝ වෙත්. ගැහැවියෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ විභාහ කොට කියව යි.

මෙසේ වදාළ කල්හි නගරවින්ද වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කොළෝ : භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැව, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැව, භවත් ගෝතමයන් වහන්ස, යම් පරිදි යටිහුරු කළ දෙයක් හෝ උඩුහුරු කරන්නේ වේ ද, පිළිසන් දෙයක් හෝ විවර කරන්නේ වේ ද, මං මුළා වූවක්හට හෝ මග කියන්නේ වේ ද, 'ඇස් ඇතියෝ රූපයන් දක්නාහ 'යි අඳුරෙහි හෝ තෙල් පහනක් දල්වන්නේ වේ ද, එපරිදි භවත් ගෞතමයන් වහන්සේ විසින් දහම් පැවැසිණ. මෙල අපි භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවිහිමියෙන් සරණගිය උපාසකයන් කොට අප ධරත්ව යි.

අට වැනි නගරවින්දෙය්‍යක සූත්‍ර යි.

# 3. 5. 9

## පිණ්ඩපාතපාරිසුද්ධි සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච:

විප්පසන්නානි ඛො තෙ සාරිපුත්ත, ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කතමෙන ඛො ත්වං සාරිපුත්ත, විහාරෙන එතරහි බහුලං විහරසීති:

සුඤ්ඤතා විහාරෙන ඛො අහං භන්තෙ, එතරහි බහුලං විහරාමීති.

සාධු සාධු සාරිපුත්ත, මහාපුරිසවිහාරෙන කිර ත්වං සාරිපුත්ත, එතරහි බහුලං විහරසි. 'මහාපුරිසවිහාරො හෙස සාරිපුත්ත, යදිදං සුඤ්ඤතා. තස්මාතිහ සාරිපුත්ත, භික්ඛු සචෙ ආකඞ්ඛෙය්‍ය, සුඤ්ඤතා විහාරෙන එතරහි බහුලං විහරෙය්‍ය'න්ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: 'යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං, යස්මිඤ්ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. අත්ථි නු ඛො මෙ තත්ථ චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වාපි චෙතසො'ති.

සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං. යස්මිඤ්ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. අත්ථි මෙ තත්ථ චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වාපි චෙතසො'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං.

සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං, යස්මිං ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. නත්ථි මෙ තත්ථ චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වාපි චෙතසො'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

# 3. 5. 9

# පිණ්ඩපාතපාරිසුද්ධි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වෙළුවනයෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැඟිසිටියාහු භාග්‍යවතුන්වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත් පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට තෙල වදාළසේක :

ශාරිපුත්‍රය, තොපගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන්හ, සිවිපැහැ පරිශුද්ධ යැ, පයෲවදාත යි. ශාරිපුත්‍රය, තෙපි මෙකල්හි කවර විහරණයෙකින් යුක්ත වැ බහුල කොට වාස කරවු ද ? යි.

' වහන්ස, මෙකල්හි මම් ශූන්‍යතාවිහරණයෙන් යුක්ත වැ බහුල කොට වෙසෙමි ' යි.

සාධු සාධු ශාරිපුත්‍රය, ශාරිපුත්‍රය, තෙපි මෙකල්හි මහාපුරුෂවිහරණයෙන් බහුල කොට වාස කරවු. ශාරිපුත්‍රය, යම් ශූන්‍යතායෙක් ඇද්ද, තෙල මහාපුරුෂවිහරණයෙක. ශාරිපුත්‍රය, එහෙයින් මෙහිලා ඉදින් මහණ මෙකල්හි ශූන්‍යතාවිහරණයෙන් බහුල කොට වසන්නෙමි ' යි කැමැති වේ නම් ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු : ' මම් යම් මඟෙකින් ගමට පිඩු පිණිස පිවිසියෙම් ද, යම් පෙදෙසෙක්හි පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් ගමින් පිඩුවායෙන් පෙරළා ආයෙම් ද, එහි මාගේ චක්ෂුර් විඥෙයරූපයෙහි ඡන්දයෙක් වේවයි රාගයෙක් වේවයි ද්වේෂයෙක් වේවයි මොහයෙක් වේවයි චිත්තයාගේ ගැටෙන ක්ලෙශයෙක් වේවයි ඇත්තේ දෝ හො ' යි.

ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දනී ද ' මම් යම් මඟෙකින් ගමට පිඩු පිණිස පිවිසියෙම් ද, යම් පෙදෙසෙක්හි පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් ගමින් පිඩු සිඟා පෙරළා ආයෙම් ද, එහි දී මාගේ චක්ෂුර්විඥෙය රූපයෙහි ඡන්දයෙක් වේවයි රාගයෙක් වේවයි ද්වේෂයෙක් වේවයි මොහයෙක් වේවයි චිත්තයාගේ ගැටෙන ක්ලේශ ජාතයෙක් වේවයි ඇතැ ' යි. ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශලධර්ම-යන්ගේ මැ ප්‍රහාණය පිණිස වෑයම් කටයුතු යි.

තවද ශාරිපුත්‍රය, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ ' මම් යම් මඟෙකින් ගමට පිඩු පිණිස පිවිසියෙම් ද, යම් පෙදෙසෙක පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් ගමින් පිඩු සිඟා පෙරළා ආයෙම් ද, එහි දී මාගේ චක්ෂුර්විඥෙය රූපයෙහි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ද්වේෂයෙක් හෝ මොහයෙක් හෝ සිතෙහි ගැටෙන ක්ලෙශජාතයෙක් හෝ නැතැ ' යි මෙසේ දනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් මැ කුශලධර්මයෙහි රෑදෙවෙහි හික්මෙන්නාහු වාස කටයුතු.



40—ඒ 00502 (8/73)

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: 'යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං, යස්මිං ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. අත්ථි නු ඛො මෙ තත්ථ සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු -පෙ- කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු-පෙ- මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වාපි චෙතසො'ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං, යස්මිං ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. අත්ථි මෙ තත්ථ මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු ඡන්දො වා රාගො වා දොසො වා, මොහො වා පටිඝං වාපි චෙතසො'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය වායමිතබ්බං.

සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: යෙන චාහං මග්ගෙන ගාමං පිණ්ඩාය පාවිසිං, යස්මිං ච පදෙසෙ පිණ්ඩාය අචරිං, යෙන ච මග්ගෙන ගාමතො පිණ්ඩාය පටික්කමිං. නත්ථි මෙ තත්ථ මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වාපි චෙතසො'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: පහීනා නු ඛො මෙ පඤ්ච කාමගුණාති, සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අප්පහීනා ඛො මෙ පඤ්ච කාමගුණාති. තෙන සාරිපුත්ත, භික්ඛුනා පඤ්චන්නං කාමගුණානං පහානාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: පහීනා ඛො මෙ පඤ්ච කාමගුණාති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: 'පහීනා නු ඛො මෙ පඤ්ච නීවරණා'ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අප්පහීනා ඛො මෙ පඤ්ච නීවරණා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා පඤ්චන්නං නීවරණානං පහානාය වායමිතබ්බං සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'පහීනා ඛො මෙ පඤ්ච නීවරණා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: පරිඤ්ඤාතා නු ඛො මෙ පඤ්චුපාදානක්ඛන්ධා'ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අපරිඤ්ඤාතා ඛො මෙ පඤ්චුපාදානක්ඛන්ධා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා පඤ්චන්නං උපාදානක්ඛන්ධානං පරිඤ්ඤාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: පරිඤ්ඤාතා ඛො මෙ පඤ්චුපාදානක්ඛන්ධා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

තවද ශාරිපුත්‍රය, අනෙකෙකි : මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු : යම් මඟෙකින් මම ගමට පිඩු සිඟා පිවිසියෙම් ද, යම් පෙදෙසෙක්හි පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් පිඩු සිඟා ගමින් පෙරළා ආයෙම් ද, එහි දී මාගේ ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයෙහි . . . ඝ්‍රාණවිඥෙය ගන්ධයෙහි . . . ජිහ්වාවිඥෙය රසයෙහි . . . කායවිඥෙය සප්‍රෂ්ටව්‍යයෙහි . . . මනොවිඥෙය ධර්මයෙහි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ද්වෙෂයෙක් හෝ මොහයෙක් හෝ සිතෙහි ගැටෙන ක්ලෙශජාතයෙක් හෝ ඇද්ද ? යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ : ' යම් මඟෙකින් මම ගමට පිඩු පිණිස පිවිසියෙම් ද, යම් පෙදෙසෙක පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් පිඩු පිණිස හැසිර ගමින් පෙරළා ආයෙම් ද, එහි දී මාගේ මනොවිඥෙය ධර්මයෙහි ඡන්දයෙක් වේවයි රාගයෙක් වේවයි ද්වෙෂයෙක් වේවයි මොහයෙක් වේවයි සිතෙහි ගැටෙන ක්ලෙශජාතයෙක් වේවයි ඇතැ ' යි මෙසේ දනී ද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ මැ ප්‍රහාණය පිණිස වෑයම් කටයුතු යි.

ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ ' යම් මඟෙකින් මම ගමට පිඩු පිණිස පිවිසියෙම් ද, යම් පෙදෙසෙක්හි පිඩු සිඟා ගියෙම් ද, යම් මඟෙකින් පිඩු පිණිස හැසිර ගමින් පෙරළා ආයෙම් ද, එහි දී මාගේ මනොවිඥෙය ධර්මයෙහි ඡන්දයෙක් වේවයි රාග යෙක් වේවයි ද්වෙෂයෙක් වේවයි මොහයෙක් වේවයි සිත පිළිබඳ ගැටෙන ක්ලෙශ ජාතයෙක් වේවයි නැතැ ' යි මෙසේ දනගනී ද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍ය යෙන් මැ කුශල ධර්මයන්හි රෑ දෙවෙහි හික්මෙන්නහු වාස කටයුතු යි.

තවද ශාරිපුත්‍රය, අනෙකක් කියමි. මහණහු විසින් ' මාගේ පඤ්චකාමගුණයෝ ප්‍රහීණ වූවාහු ද ' යි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මාගේ පඤ්චකාමගුණයෝ අප්‍රහීණයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චකාමගුණයන්ගේ ප්‍රහාණය පිණිස වෑයම් කටයුතු යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මාගේ පඤ්චකාමගුණයෝ ප්‍රහීණ වූහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශල ධර්මයන්හි රෑදෙවෙහි හික්මෙන්නහු වාස කටයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යැ : මාගේ පඤ්ච නීවරණයෝ ප්‍රහීණ වූවාහු දෝහො ' යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ ' මාගේ පඤ්චනීවරණයෝ අප්‍රහීණයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චනීවරණයන්ගේ ප්‍රහාණය පිණිස වෑයම් කටයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ (මාගේ සන්තානයෙහි) පඤ්චනීවරණයෝ ප්‍රහීණ වූහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ඒ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් මැ කුශලධර්මයන්හි රෑදෙවෙහි හික්මෙන්නහු වාස කටයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යැ. මා විසින් පඤ්චොපාදනස්කන්ධයෝ පිරිසිඳ දන්නාලද්දහු ද ' යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍ය වෙක්ෂා කරනුයේ මා විසින් පඤ්චොපාදනස්කන්ධයෝ අපරිඥතයහ ' යි මෙසේ දනගනීද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චොපාදනස්කන්ධයන්ගේ පරිඥනය පිණිස වෑයම් කටයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මා විසින් පඤ්චොපාදන ස්කන්ධයෝ පිරිසිඳ දන්නාලදහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්මයන්හි රෑදෙවෙහි හික්මෙන්නහු වාස කටයුතු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: භාවිතා නු ඛො මෙ චත්තාරො සතිපට්ඨානා'ති සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභාවිතා ඛො මෙ චත්තාරො සතිපට්ඨානා'ති තෙන සාරිපුත්ත, භික්ඛුනා චතුන්නං සතිපට්ඨානානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛුනා පච්චවෙක්ඛමානො එවං ජානාති: භාවිතා ඛො මෙ චත්තාරො සතිපට්ඨානා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: භාවිතා නු ඛො මෙ චත්තාරො සම්මප්පධානා'ති සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභාවිතා ඛො මෙ චත්තාරො සම්මප්පධානා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා චතුන්නං සම්මප්පධානානං භාවනාය වායමිතබ්බං සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: භාවිතා ඛො මෙ චත්තරො සම්මප්පධානා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: භාවිතා නු ඛො මෙ චත්තාරො ඉද්ධිපාදා'ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභාවිතා ඛො මෙ චත්තාරො ඉද්ධිපාදාති. තෙන සාරිපුත්ත, භික්ඛුනා චතුන්නං ඉද්ධිපාදානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: භාවිතා ඛො මෙ චත්තාරො ඉද්ධිපාදාති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: භාවිතා නු ඛො මෙ පඤ්චින්ද්‍රියානීති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභාවිතා ඛො මෙ පඤ්චින්ද්‍රියානී'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: භාවිතා ඛො මෙ පඤ්චින්ද්‍රියානී'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: භාවිතා නු ඛො මෙ පඤ්චබලානීති සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභාවිතා ඛො මෙ පඤ්චබලානී'ති තෙන සාරිපුත්ත, භික්ඛුනා පඤ්චන්නං බලානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : භාවිතා ඛො මෙ පඤ්චබලානීති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං : භාවිතා නු ඛො මෙ සත්තබොජ්ඣඞ්ගාති : සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : අභාවිතා ඛො මෙ සත්තබොජ්ඣඞ්ගා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : භාවිතා ඛො මෙ සත්තබොජ්ඣඞ්ගා'ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං, අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

ඉදින් ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යැ : මා විසින් සතර සතිපට්ඨානයෝ වඩනලද්දහු දෝහෝ ' යි ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් සතර සතිපට්ඨානයෝ අභාවිතයහ ' යි මෙසේ දනගනී ද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් සතර සතිපට්ඨානයන් වැඩීම පිණිස වෑයම් කටයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් සතර සතිපට්ඨානයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්ම යන්හි දවරැ හික්මෙන්නහු විසින් වාස කටයුතු.

තවද අනෙකෙකි : ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කළයුතු යැ : ' මා විසින් සතර සම්‍යක් ප්‍රධානයෝ වඩනලද්දහු දෝහො ' යි. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' සතර සම්‍යක් ප්‍රධානයෝ මා විසින් අභාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් සතර සම්‍යක් ප්‍රධානයන් වැඩීම පිණිස වෑයම් කළ යුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ මා විසින් සතර සම්‍යක් ප්‍රධානයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්මයන්හි දවරැ හික්මෙන්නහු විසියයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කටයුතු යැ, මා විසින් සතර ඍද්ධිපාදයෝ භාවිත වූවාහු දෝහො ' යි ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ මා විසින් සතර ඍද්ධිපාදයෝ අභාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් සතර ඍද්ධිපාදයන්ගේ වැඩීම පිණිස වෑයම් කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ මා විසින් සතර ඍද්ධිපාදයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්මයන්හි දවරැ හික්මෙන්නහු විසින් විසියයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යැ : ' මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනලද්දහු දෝහො ' යි. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ අභාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චෙන්ද්‍රියයන්ගේ වැඩීම පිණිස වෑයම් කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍ය වෙක්ෂා කරන මහණ ' මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්මයන්හි දවරැ හික්මෙන්නහු විසින් විසියයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කළයුතු යැ : පඤ්චබලයෝ ' මා විසින් වඩනලද්දහු දෝහො ' යි. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් පඤ්චබලයෝ අභාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් පඤ්චබලයන්ගේ භාවනාව පිණිස වෑයම් කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් පඤ්චබලයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, මහණහු එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්මයන්හි දවරැ හික්මෙන්නහු විසින් විසියයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කළයුතු යැ : ' මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ වඩනලද්දහු දෝහො ' යි. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ ' මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ අභාවිතයහ ' යි මෙසේ දනගනී ද ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් සප්තබොධ්‍යඞ්ගයන් වැඩීම පිණිස වෑයම් කටයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවෙක්ෂා කරන මහණ මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ භාවිතයහ ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුතු වැ කුශලධර්මයන්හි දවරැ හික්මෙනුවහු විසින් වාස කටයුතු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං : ‘භාවිතො නු ඛො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො’ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘අභාවිතො ඛො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘භාවිතො ඛො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහො රත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං : ‘භාවිතා නු ඛො මෙ සමථො ච විපස්සනා චා’ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘අභාවිතා ඛො මෙ සමථො ච විපස්සනා චා’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා සමථවිපස්සනානං භාවනාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘භාවිතා ඛො මෙ සමථො ච විපස්සනා චා’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

පුන ච පරං සාරිපුත්ත, භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං : ‘සච්ඡිකතා නු ඛො මෙ විජ්ජා ච විමුත්ති චා’ති. සචෙ සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘අසච්ඡිකතා ඛො මෙ විජ්ජා ච විමුත්ති චා’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා විජ්ජාය ච විමුත්තියා ච සච්ඡිකිරියාය වායමිතබ්බං. සචෙ පන සාරිපුත්ත, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති : ‘සච්ඡිකතා ඛො මෙ විජ්ජා ච විමුත්ති චා’ති. තෙන සාරිපුත්ත, භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

යෙ හි කෙචි සාරිපුත්ත, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා පිණ්ඩපාතං පරිසොධෙසුං, සබ්බෙ තෙ එවමෙව පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා පිණ්ඩපාතං පරිසොධෙසුං. යෙපි හි කෙචි සාරිපුත්ත, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා පිණ්ඩපාතං පරිසොධෙස්සන්ති, සබ්බෙ තෙ එවමෙව පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා පිණ්ඩපාතං පරිසොධෙස්සන්ති. යෙපි හි කෙචි සාරිපුත්ත, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා පිණ්ඩපාතං පරිසොධෙන්ති, සබ්බෙ තෙ එවමෙව පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා පිණ්ඩපාතං පරිසොධෙන්ති. තෙන හි වො සාරිපුත්ත, එවං සික්ඛිතබ්බං : ‘පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා පිණ්ඩපාතං පරිසොධෙස්සාමා’ති. එවං හි වො සාරිපුත්ත, සික්ඛිතබ්බන්ති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා සාරිපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

පිණ්ඩපාතපාරිසුද්ධි සුත්තං නවමං.

---

1. විපස්සනා – සීමු.
2. තස්මාතිහ සාරිපුත්ත – සීමු, මජ්ඣං.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කටයුතු යැ: ' මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වඩනාලද දෝහෝ ' යි. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවේක්ෂා කරන මහණ ' මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අභාවිත යයි ' මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වැඩීම පිණිස වෑයම් කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, ප්‍රත්‍යවේක්ෂා කරන මහණ ' මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වඩනාලද ' යි මෙසේ දනගනී ද, ශාරිපුත්‍රය, ඒ මහණහු එ මැ ප්‍රීතිප්‍රාමොද්‍යයෙන් යුක්ත වැ කුශලධර්ම යන්හි දවරැ හික්මෙනුවහු විසින් වාස කටයුතු.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කටයුතු යැ: ' මා විසින් ශමථය ද විදර්ශනාව ද වඩනලද්දහු දෝහෝ ' යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ මෙසේ දන්නේ වේ ද: ' මා විසින් ශමථය ද විදර්ශනා ද නො ව වඩනලදහ ' යි. ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් ශමථවිදර්ශනා දෙක වඩනු පිණිස ව්‍යායාම කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ මෙසේ දන්නේ වේ ද: ' මා විසින් ශමථය ද විදර්ශනා ද වඩනලදහ ' යි. ශාරිපුත්‍රය, ඒ මහණහු එ මැ ප්‍රීතිප්‍රමොදයෙන් කුශල ධර්මයෙහි දවරැ හික්මෙනුවහු විසින් විහරණ කළයුතු යැ.

තවද ශාරිපුත්‍රය, මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළයුතු යැ: ' මා විසින් විද්‍යා ද විමුක්ති ද ප්‍රත්‍යක්ෂ කරන ලද්දහු දෝහෝ ' යි. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ මෙසේ දන්නේ වේ ද: ' මා විසින් විද්‍යා ද විමුක්ති ද ප්‍රත්‍යක්ෂ නො කරන ලදහ ' යි. ශාරිපුත්‍රය, ඒ මහණහු විසින් විද්‍යාව හා විමුක්තියගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ව්‍යායාම කළයුතු යැ. ඉදින් ශාරිපුත්‍රය, මහණ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ මෙසේ දන්නේ වේ ද: ' මා විසින් විද්‍යා ද විමුක්ති ද ප්‍රත්‍යක්ෂ කරනලදහ ' යි. ශාරිපුත්‍රය, ඒ මහණ ඒ මැ ප්‍රීතිප්‍රමොදයෙන් කුශලධර්මයෙහි දවරැ හික්මෙනුවහු විසින් විහාර කළයුතු යැ.

ශාරිපුත්‍රය, අතීතකාලයෙහි යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ පිණ්ඩපාතශුද්ධි කළාහු ද, එ හැම මෙසෙයින් ම පුනපුනා ප්‍රත්‍යවේක්ෂා කොට පිණ්ඩපාත පරිශොධනා කළාහු යැ. ශාරිපුත්‍රය, අනාගතකාලයෙහි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පිණ්ඩපාතපරිශොධනා කෙරෙත් ද, ඒ හැම මෙසෙයින් මැ පුනපුනා ප්‍රත්‍යවේක්ෂා කොට පිණ්ඩපාතපරිශොධනා කෙරෙති. ශාරිපුත්‍රය මෙ වත්මනුයෙහි යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පිණ්ඩපාතපරිශොධනා කෙරෙත් ද, එ හැම මෙපරිදි මැ පුනපුනා ප්‍රත්‍යවේක්ෂා කොට පිණ්ඩපාතපරිශොධනා කෙරෙති. එකරුණින් ශාරිපුත්‍රය, තොප මෙසේ හික්මෙන්නේ යැ: ' පුනපුනා ප්‍රත්‍යවේක්ෂා කොට පිණ්ඩපාතපරිශොධනා කරම්හ ' යි. ශාරිපුත්‍රය, මෙසේ තොප හික්මෙනේනේ මැනැව.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළසේක. සතුටුසිත් ඇති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දන කළෝ.

නව වැනි පිණ්ඩපාතපාරිසුද්ධි සූත්‍ර යි.

# 3. 5. 10

## ඉන්ද්‍රියභාවනා සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කජඞ්ගලායං[1] විහරති මුඛෙලුවනෙ[2]. අථ ඛො උත්තරො මාණවො පාරාසරියන්තෙවාසී[3] යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො උත්තරං මාණවං පාරාසරියන්තෙවාසිං භගවා එතදවොච:

දෙසෙති උත්තර, පාරාසරියො[4] බ්‍රාහ්මණො සාවකානං ඉන්ද්‍රියභාවනන්ති.

දෙසෙති භො ගොතම, පාරාසරියො[4] බ්‍රාහ්මණො සාවකානං ඉන්ද්‍රියභාවනන්ති.

යථා කථං පන උත්තර, දෙසෙති පාරාසරියො බ්‍රාහ්මණො සාවකානං ඉන්ද්‍රියභාවනන්ති.

ඉධ භො ගොතම, චක්ඛුනා රූපං න පස්සති, සොතෙන සද්දං න සුණාති. එවං ඛො භො ගොතම, දෙසෙති පාරාසරියො[4] බ්‍රාහ්මණො සාවකානං ඉන්ද්‍රියභාවනන්ති.

එවං සන්තෙ ඛො උත්තර, අන්ධො භාවිතින්ද්‍රියො භවිස්සති, බධිරො භාවිතින්ද්‍රියො භවිස්සති. යථා පාරාසරියස්ස බ්‍රාහ්මණස්ස වචනං. අන්ධො හි උත්තර, චක්ඛුනා රූපං න පස්සති. බධිරො සොතෙන සද්දං න සුණාතීති.

එවං වුත්තෙ උත්තරො මාණවො පාරාසරියන්තෙවාසී තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.

අථ ඛො භගවා උත්තරං මාණවං පාරාසරියන්තෙවාසිං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ‘අඤ්ඤථා ඛො ආනන්ද, දෙසෙති පාරාසරියො බ්‍රාහ්මණො සාවකානං ඉන්ද්‍රියභාවනං, අඤ්ඤථා ච පනානන්ද අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා හොතී’ති.

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා අරියස්ස විනයෙ අනුත්තරං ඉන්ද්‍රියභාවනං දෙසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තී’ති.

තෙන’හානන්ද, සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

---

1. ගජඞ්ගලායං – මජසං
2. සුඛෙලුවනෙ – සීමු. / සුඛෙළුවනෙ – මජසං.
3. පාරාසිවියන්තෙවාසී – මජසං.
4. පාරාසිවියො – මජසං.

# 3. 5. 10

# ඉන්ද්‍රියභාවනා සූත්‍රය

මා විසින් මෙසේ අසනලද : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කජඞ්ගලා නම් නිගමයෙහි මුවෙලු වනයෙහි වාසය කරනසේක. එසමයෙහි පාරාශරිය අතැවැසි උත්තර මාණවක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කළයුතු කථාව නිමවා එකත්පස් වැ හිඳ. එකත්පස් වැ හුන් පාරාශරිය අතැවැසි උත්තරමාණවකහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ :

' උත්තරය, පාරාශරිය බ්‍රාහ්මණ සව්වනට ඉන්ද්‍රියභාවනාව දෙසා ද ' යි.

' භවත් ගෞතමයන් වහන්ස, පාරාශරිය බ්‍රාහ්මණ සව්වනට ඉන්ද්‍රියභාවනාව දෙසා ' යයි.

උත්තරය, පාරාශරිය බ්‍රාහ්මණ සව්වනට කිසෙයින් ඉන්ද්‍රියභාවනා දෙසා ද ' යි.

භවත් ගෞතමයන් වහන්ස, මෙහිලා ඇසින් රූ නො දකී ද, කනින් ශබ්ද නො අසා ද, භවත් ගෞතමයන් වහන්ස, මෙපරිද්දෙන් පාරාශරිය බ්‍රාහ්මණ සව්වනට ඉන්ද්‍රියභාවනා දෙසා ' යයි.

උත්තරය, මෙසේ කල්හි පාරාශරිය බමුණුහුගේ බස් පරිදි අන්ධ තෙම වැඩූ ඉඳුරන් ඇති වන්නේ යැ. බධිර තෙම වැඩූ ඉඳුරන් ඇති වන්නේ යැ. උත්තරය, යම් හෙයෙකින් අන්ධ තෙම ඇසින් රූ නො දකී ද බධිර තෙම කනින් ශබ්ද නො අසා ද එහෙයිනි.

මෙසේ වදළ කල්හි පාරාශරිය අතැවැසි උත්තර මාණවක තුෂ්ණීම්භූත වූයේ මකු වූයේ බැහු කඳට ඇතියේ අධොමුඛ වූයේ සිතිවිලි සිතමින් වැටහීම් රහිත වැ හින.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාරාශරිය අතැවැසි උත්තරමාණවක තුෂ්ණීම්භූත වූවහු තෙද නැතියහු හෙළු කඳට ඇතියහු අධොමුඛ වූවහු සිතිවිලි සිතනුවහු වැටහීම් රහිත වූවහු දැන ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූසේක : ' ආනන්දය, පාරාශරිය බ්‍රාහ්මණ අන් පරිදි සව්වනට ඉන්ද්‍රියභාවනා දෙසයි. ආනන්දය, අන් පරිද්දෙකින් ආර්‍ය්‍යවිනයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා වේ ' යයි.

භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආර්‍ය්‍යවිනයෙහි යම් අනුත්තර ඉන්ද්‍රිය භාවනාවක් දෙසනසේක් ද, මේ ඊට කලැ. සුගතයන් වහන්ස, මේ ඊට කලැ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වදන් අසා ධරන්නාහ ' යි.

එසේ වී නම් ආනන්දය, මනා කොට අසව. මනා කොට මෙනෙහි කරව, කියන්නෙමි 'යි.

' එසේ යැ වහන්සැ ' යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක :

කථඤ්චානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා හොති: ඉධානන්ද, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං, උප්පජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: 'උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං, එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද, චක්ඛුමා පුරිසො උම්මීලෙත්වා වා නිමීලෙය්‍ය නිමීලෙත්වා වා උම්මීලෙය්‍ය. එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං, උප්පජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: උප්පන්නං ඛො මෙ ඉදං මනාපං, උප්පන්නං අමනාපං, උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං. එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති සෙය්‍යථාපි ආනන්ද, බලවා පුරිසො අප්පකසිරෙනෙව අච්ඡරං පහරෙය්‍ය. එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො ඝානෙන ගන්ධං ඝායිත්වා උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං, උප්පජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: 'උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං. එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද, ඊසකපොණෙ,[1] පදුමිනිපත්තෙ[2] උදකඵුසිතානි පවත්තන්ති, න සණ්ඨහන්ති.[3] එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු.

---

1. ඊසකං පොණෙ - සීමු, මජසං. 2. පදුමපලාසෙ - මජසං.
3. සණ්ඨන්ති - මජසං.

ආනන්දය, කිසෙයින් ආයර්‍ය්‍යවිනයෙහි අනුත්තර ඉන්ද්‍රියභාවනා වෙයි යත් : ආනන්දය, මෙසස්නෙහි මහණහට ඇසින් රූ දැක මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී. හේ මෙසේ දනගනී : ' මට මේ මනාපය උපන, අමනාපය උපන, මනාපාමනාපය උපන. හෙද සඞ්ඛත යැ, ඖදරික යැ, ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් උපෙක්ෂාවක් ඇද්ද තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට ඒ උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. උපෙක්ෂාව පිහිටා සිටී. ආනන්දය, යම්සේ ඇස් ඇති පුරුෂයෙක් ඇස ඇර පියාලන්නේ හෝ වේ ද ඇස පියා ඇරලන්නේ හෝ වේ ද, එසෙයින් මැ ආනන්දය, යම් කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙව් වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වේ ද, විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටී ද, ආනන්දය, මේ ආයර්‍ය්‍යවිනයෙහි චක්ෂුර්විඥෙය රූප විෂයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා යයි කියනු ලැබේ.

තවද ආනන්දය, මහණහට කනින් ශබ්ද අසා මනාප උපදී, අමනාප උපදී, මනාපා මනාප උපදී. හේ මෙසේ දනගනී. මට මේ මනාපය උපන, අමනාපය උපන. මනාපාමනාපය උපන. හෙ ද සඞ්ඛත ය, ඖදරික යැ, ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් උපෙක්ෂාවක් ඇද්ද තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට ඒ උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. උපෙක්ෂාව පිහිටා සිටී. ආනන්දය, යම්සේ බලවත් පුරුෂයෙක් නිදුකින් මැ අසුර ගසන්නේ ද, එසෙයින් මැ ආනන්දය, යම් කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙව් වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වේ ද, විදර්ශනොපෙක්‍ෂාව පිහිටා සිටී ද, ආනන්දය, මේ ආයර්‍ය්‍යවිනයෙහි ශ්‍රොත්‍රවිඥෙය ශබ්ද විෂයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා යයි කියනු ලැබේ.

තවද ආනන්දය, මහණහට ඝ්‍රාණයෙන් ගන්ධාඝ්‍රාණය කොට මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී. හේ මෙසේ දනගනී : ' මට මේ මනාපය උපන, අමනාපය උපන, මනාපාමනාපය උපන. හෙ ද සඞ්ඛත යැ. ඖදරික යැ, ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් විදර්ශනොපෙක්ෂාවක් ඇද්ද, තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට ඒ උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි, විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටියි. යම්සේ ආනන්දය, මඳක් නැඹුරු කළ පියුම්පතෙහි දියබිඳුහු පෙරළෙත් ද, පිහිටා නො සිටිත් ද, එසෙයින් මැ ආනන්දය, යම්කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙව් වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වේ ද, විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටී ද, ආනන්දය, මේ ආයර්‍ය්‍ය විනයෙහි ඝ්‍රාණවිඥෙය ගන්ධ විෂයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා ' යි කියනු ලැබේ.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො ජිව්හාය රසං සායිත්වා උප්පජ්ජති මනාපං උප්පජ්ජති අමනාපං, උපජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: 'උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං. එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද, බලවා පුරිසො ජිව්හග්ගෙ ඛෙළපිණ්ඩං සංයූහිත්වා අප්පකසිරෙන වමෙය්‍ය. එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා උප්පජ්ජති මනාපං උප්පජ්ජති අමනාපං උප්පජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: 'උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං. එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද, බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය[1] එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජති මනාපං උප්පජ්ජති අමනාපං උප්පජ්ජති මනාපාමනාපං. සො එවං පජානාති: 'උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං. තඤ්ච ඛො සඞ්ඛතං ඔළාරිකං පටිච්චසමුප්පන්නං. එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛා'ති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද, බලවා පුරිසො දිවසසන්තත්තෙ[2] අයොකටාහෙ ද්වෙ වා තීණි වා උදකඵුසිතානි නිපාතෙය්‍ය. දන්ධො ආනන්ද, උදකඵුසිතානං නිපාතො, අථ ඛො නං ඛිප්පමෙව පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. එවමෙව ඛො ආනන්ද, යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති, උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු. එවං ඛො ආනන්ද, අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා හොති.

1. සමිඤ්ජෙය්‍ය - මජ්සං.
2. දිවසං සන්තත්තෙ - මජ්සං.

තවද ආනන්දය, මහණහට දිවින් රස විඳ මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී, හේ මෙසේ දනගනී. මට මේ මනාපය උපන, අමනාපය උපන, මනාපාමනාපය උපන, හෙ ද සඞ්ඛත යැ, ඖදරික යැ, ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් විදර්ශනොපෙක්ෂාවක් ඇද්ද තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට ඒ උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. උපේක්ෂා පිහිටා සිටී. යම්සේ ආනන්දය, බලවත් පුරුෂයෙක් දිවග කෙලපිඩක් රැස් කොට නිදුකින් තහන්නේ ද, එසෙයින් මැ ආනන්දය, යම් කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙවි වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. උපෙක්ෂාව පිහිටා සිටියි. ආනන්දය, මේ ආයඊවිනයෙහි ජිහ්වාවිඥෙය රූප විෂයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා ' යි කියනු ලැබේ.

තවද ආනන්දය, මහණහට කයින් ස්ප්‍රෂ්ටව්‍යය පැහැස මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී. හේ මෙසේ දනගනී. මට මේ මනාපය උපන, අමනාපය උපන, මනාපාමනාපය උපන. හෙ ද සඞ්ඛත යැ ඖදරික යැ ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් විදර්ශනොපෙක්ෂාවක් ඇද්ද තෙල ශාන්ත යැ තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට උපන් ඒ මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටී. යම්සේ ආනන්දය, බලවත් පුරුෂයෙක් හැකුළු බාහුව දිගු කරන්නේ හෝ වේ ද දිගු කළ බාහුව හකුළන්නේ හෝ වේ ද, එසෙයින් මැ ආනන්දය, යම් කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙවි වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටී. ආනන්දය, මේ ආයඊවිනයෙහි කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍ය විෂයෙහි අනුත්තර ඉන්ද්‍රියභාවනා'යි කියනුලැබේ.

තවද ආනන්දය, මහණහට මනසින් දහම් දැන මනාප උපදී. අමනාප උපදී. මනාපා මනාප උපදී. හේ මෙසේ දනගනී : ' මට මේ මනාපය උපන. අමනාපය උපන. මනාපාමනාපය උපන. හෙ ද සඞ්ඛත යැ, ඖදරික යැ, ප්‍රතීත්‍යසමුත්පන්න යි. යම් විදර්ශනොපෙක්ෂායෙක් ඇද්ද තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ ' යි කියා යි. ඔහුට ඒ උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. උපෙක්ෂාව පිහිටා සිටී. යම්සේ ආනන්දය, බලවත් පුරුෂයෙක් දවසක් මොනොවට තැවුණු යකබලෙක්හි දියබිඳු දෙකක් හෝ තුනක් හෝ හෙළන්නේ ද ආනන්දය, ජලබින්දුන්ගේ වැටීම ලැසි වේ ද, වැළි එය වහා මැ ක්ෂය වීමට ගෙවීමට යන්නේ ද, එසෙයින් මැ ආනන්දය යම් කිසිවක්හට මෙසේ ශීඝ්‍ර වැ මෙසේ වෙලෙවි වැ මෙසේ නිදුකින් උපන් මනාපය උපන් අමනාපය උපන් මනාපාමනාපය නිරුද්ධ වෙයි. විදර්ශනොපෙක්ෂාව පිහිටා සිටී. ආනන්දය, මේ ආයඊවිනයෙහි මනොවිඥෙය ධර්ම විෂයෙහි අනුත්තර වූ ඉන්ද්‍රිය භාවනා ' යි කියනු ලැබේ. ආනන්දය, මෙසේ ආයඊවිනයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා වේ.

කථඤ්චානන්ද, සෙඛො හොති පාටිපදො. ඉධානන්ද, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං, උප්පජ්ජති මනාපාමනාපං. සො තෙන උප්පන්නෙන මනාපෙන උප්පන්නෙන අමනාපෙන උප්පන්නෙන මනාපාමනාපෙන අට්ටීයති හරායති ජිගුච්ඡති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං, උප්පජ්ජති මනාපාමනාපං. සො තෙන උප්පන්නෙන මනාපෙන උප්පන්නෙන අමනාපෙන උප්පන්නෙන මනාපාමනාපෙන අට්ටීයති හරායති ජිගුච්ඡති. එවං ඛො ආනන්ද, සෙඛො හොති පාටිපදො.

කථඤ්චානන්ද, අරියො හොති භාවිතින්ද්‍රියො. ඉධානන්ද, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති මනාපං. උප්පජ්ජති අමනාපං. උප්පජ්ජති මනාපාමනාපං. සො සචෙ ආකඞ්ඛති: ‘පටික්කූලෙ[1] අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය’න්ති. අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති. පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: ‘පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූල-සඤ්ඤී විහරෙය්‍ය’න්ති. අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය’න්ති. පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: ‘පටික්කූලං ච අප්පටික්කූලං ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානො’ති. උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

පුන ච පරං ආනන්ද, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජති මනාපං, උප්පජ්ජති අමනාපං උප්පජ්ජති මනාපාමනාපං. සො සචෙ ආකඞ්ඛති පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති. අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: ‘අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති. පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: ‘පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය’න්ති. අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති සචෙ ආකඞ්ඛති: ‘අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය’න්ති. පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති: පටික්කූලඤ්ච අප්පටික්කූලඤ්ච තදුභයං[2] අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානො’ති. උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො. එවං ඛො ආනන්ද, අරියො හොති භාවිතින්ද්‍රියො.

---

1. පටිකූලෙ - මජ්ඣං.
2. තදුභයම්පි - මජ්ඣං.

ආනන්දය, කිසෙයින් ශෛක්‍ෂප්‍රතිපත් ඇත්තේ වෙයි යත් : ආනන්දය, මෙ සස්නෙහි මහණහට ඇසින් රූ දක මනාප උපදී. අමනාප උපදී. මනාපාමනාප උපදී. හේ ඒ උපන් මනාපයෙන් උපන් අමනාපයෙන් උපන් මනාපාමනාපයෙන් දුකට පැමිණෙයි. ලජ්ජාවට පැමිණෙයි. ජුගුප්සාවට පැමිණෙයි. කණින් ශබ්ද අසා . . . නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට . . . දිවින් රස විඳ . . . කයින් පහස් පැහැස . . . මනසින් දහම් දැන මනාප උපදී. අමනාප උපදී. මනාපාමනාප උපදී. හේ ඒ උපන් මනාපයෙන් උපන් අමනාපයෙන් උපන් මනාපාමනාපයෙන් දුක් වෙයි. ලජ්ජාවෙයි. ජුගුප්සා කෙරෙයි. ආනන්දය, මෙසේ ශෛක්‍ෂප්‍රතිපත් ඇත්තේ වේ.

ආනන්දය, කිසෙයින් ආර්‍ය්‍ය වැඩූ ඉඳුරන් ඇත්තේ වෙයි යත් : ආනන්දය, මේ සස්නෙහි මහණහට ඇසින් රූ දක මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී. ඉදින් හේ ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥ ඇති වැ වසන්නෙමි ' යි කැමැති වේ නම් එහි අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන් නෙමි ' යි රිසි වේ නම් එහි ප්‍රතිකූල සංඥ ඇති වැ වෙසෙයි. ඉදින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි රිසි වේ නම් එහි අප්‍රතිකූල සංඥ ඇති වැ වෙසෙයි. ඉදින් අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි රිසි වේ නම් එහි ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් ප්‍රතිකූලයත් අප්‍රතිකූලයත් යන දෙක දුරු කොට පියා උපේක්ෂා ඇති වැ ස්මෘතිමත් වැ සම්‍යග්ඥන ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි උපේක්ෂා ඇති වැ ස්මෘතිමත් වැ සම්‍යග්ඥන ඇති වැ වෙසෙයි.

තවද ආනන්දය, මහණහට කණින් ශබ්ද අසා . . . නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට . . . දිවින් රස විඳ . . . කයින් පහස් පැහැස . . . මනසින් දහම් දැන මනාප උපදී, අමනාප උපදී, මනාපාමනාප උපදී. ඉදින් හෙතෙම ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් අප්‍රති කූලයෙහි ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් ප්‍රතිකූලයෙහිත් අප්‍රතිකූලයෙහිත් අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි අප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් අප්‍රතිකූල යෙහිත් ප්‍රතිකූලයෙහිත් ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි ප්‍රතිකූලසංඥ ඇති වැ වෙසෙයි. ඉදින් ප්‍රතිකූලය ද අප්‍රතිකූලය ද යන දෙක දුරු කොට පියා උපේක්ෂක වූයෙම ස්මෘතිමත් වැ සම්‍යග්ඥන ඇති වැ වෙසෙන්නෙමි ' යි කැමැති වේ නම් එහි උපේක්ෂක වූයේ ස්මෘතිමත් වැ සම්‍යග්ඥන ඇති වැ වෙසෙයි. මෙසෙයින් ආනන්දය, ආර්‍ය්‍ය වැඩූ ඉඳුරන් ඇත්තේ වේ.

ඉති ඛො ආනන්ද, දෙසිතා මයා අරියස්ස විනයෙ අනුත්තරා ඉන්ද්‍රියභාවනා. දෙසිතො සෙඛො පාටිපදො. දෙසිතො අරියො භාවිතින්ද්‍රියො. යං ඛො ආනන්ද, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි ආනන්ද, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථානන්ද, මා පමාදත්ථ. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

ඉන්ද්‍රියභාවනා සුත්තං දසමං.

---

## සළායතන වග්ගො පඤ්චමො

---

## උපරිපණ්ණාසකං සමත්තං.

---

තස්ස වග්ගස්ස උද්දානං.

අනාථපිණ්ඩිකො ඡන්නො පුණ්ණො නන්දක රාහුලා,
ඡ ඡක්කං සළායතනිකං නගරවින්දෙය්‍ය සුද්ධිකා,
ඉන්ද්‍රියභාවනා චාපි වග්ගො ඔවාද පඤ්චමොති.[1]

ඉදං වග්ගානමුද්දානං.

දෙවදහො'නුපදෙ ච සුඤ්ඤතො ච විභඞ්ගකො,
සළායතනොති වග්ගා උපරිපණ්ණාසකෙ ඨිතාති.

තීහි පණ්ණාසකෙහි පතිමණ්ඩිතො සකලො
මජ්ඣිමනිකායො සමත්තො.

---

1. අනාථ පිණ්ඩිකො ඡන්නො පුණ්ණො නන්ද රාහුල ඡක්කඤ්ච සළායතනිකං නගරවින්දෙය්‍යං සුද්ධිකො ඉන්ද්‍රියභාවනඤ්චාපි වග්ගො ඔවාදපඤ්චමොති-මජසං.

ආනන්දය, මෙසේ මා විසින් ආර්‍ය්‍යවිනයෙහි අනුත්තර වූ ඉන්ද්‍රියභාවනා දෙසන ලදී. ශෛක්ෂප්‍රතිපද ඇතියේ දෙසනලද, භාවිතෙන්ද්‍රිය වූ ආර්‍ය්‍ය තෙම දෙසන ලද. ආනන්දය, ශ්‍රාවකයනට හිතෛෂී වූ අනුකම්පා කරන ශාස්තෘහු විසින් අනුකම්පා පිණිස යමක් කටයුතු ද, මා විසින් තොපට එය කරන ලද. ආනන්දය, මෙල වෘක්ෂමූල සෙනසුන් වෙයි. මෙල ශූන්‍යාගාරයෝ වෙති. ආනන්දය, ධ්‍යාන කරව. නහමක් ප්‍රමාද වව. පසු වැ නහමක් විපිළිසර ඇති වව ' යි. මේ තොපට අපගේ අනුසසුන් වේ යයි.

භාග්‍යවතුන් වහන්සේ මේ ඉන්ද්‍රියභාවනා සූත්‍ර වදාළසේක. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සතුටු වූවාහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අනුමෝදනා කොළෝ.

**දස වැනි ඉන්ද්‍රියභාවනාසූත්‍ර යි.**

---

# පස් වැනි සළායතන වර්ග යි.

---

# උපරිපණ්ණාසකය සමාප්ත යි.

---

**ඒ වර්ගයාගේ උද්දනය :**

අනාථපිණ්ඩිකොවාද යැ ඡන්නොවාද යැ පුණ්ණොවාදය හා නන්දකරාහුලොවාදයෝ යැ ඡජක්කසූත්‍ර යැ මහාසළායතනසූත්‍ර යැ නගරවින්දෙය්‍යසූත්‍රය හා පිණ්ඩපාතසුද්ධිකසූත්‍ර යැ ඉන්ද්‍රිය භාවනාසූත්‍ර යැ යි පස් වැනි අවවාද වර්ගය වේ.

**මේ වර්ගයන්ගේ උද්දනය :**

දෙවදහවර්ගය ද අනුපදවර්ගය ද සුඤ්ඤතවර්ගය ද විභඞ්ගවර්ගය ද සළායතන වර්ගය ද ' යි උපරිපණ්ණාසකයෙහි සිටි වර්ගයෝ යි.

**තුන් පනසෙකින් ප්‍රතිමණ්ඩිත වූ සියලු මධ්‍යමනිකාය සමාප්ත යි.**

---

# මජ්ඣිමනිකායෙ උපරිපණ්ණාසකො

# අනුක්කමණිකා

| | |
|---|---|
| ගාථාදිපාදානුක්කමණිකං | 629 – 630 |
| සඤ්ඤානාමානුක්කමණිකං | 631 – 634 |
| විසෙසපදානුක්කමණිකා | 635 – 640 |
| ශුද්ධිපත්‍රය | 641 – 642 |

# ගාථාදිපාදානුක්කමණිකා


පිට්ඨඞ්කං

අ

අක්කොච්ඡි මං අවධි මං 346

අජ්ජෙව කිච්චං ආතප්පං 398, 402, 404, 412, 424

අට්ඨිච්ඡිදා පාණහරා 346

අතීතං නාන්වාගමෙය්‍ය 398, 400 404, 406, 408, 412, 414, 424, 428, 430

අරිට්ඨො උපරිට්ඨො නගරසිඛී යසස්සී 208

ඉ

ඉදං හි තං ජෙතවනං 534

උ

උපාදානෙ භයං දිස්වා 296

එ

එකස්ස චරිතං සෙය්‍යො 346

එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා 210

එවං විහාරිං ආතාපිං 398, 402, 404, 412, 424

ක

කම්මං විජ්ජා ච ධම්මො ච 534

කා

කාලූපකාලා විජිතො ජිතො ච 210

කො

කොතුම්බරගො ච මාතඞ්ගො අරියො 210

ච

චතුක්කණ්ණො චතුද්වාරො 366, 392

චො

චොදිතා දෙවදූතෙහි 396

පිට්ඨඞ්කා

ජෙ

ජෙතො ජයන්තො පදුමො උප්පලො ච 210

ත

තස්මා හි පණ්ඩිතො පොසො 536

තස්ස අයොමයා භූමි 366, 392

තෙ

තෙ ඛෙමප්පත්තා සුඛිනො 396

දු

දුරන්නයො සඞ්ඛො අථොපි උච්චයො 210

දෙ

ද්වෙ ජාලිනො මූතිනො අට්ඨකො ච 208

න

න හි වෙරෙන වෙරානි 346

නො

නො චෙ ලභෙථ නිපකං සහායං 346

ප

පච්චුප්පන්නං ච යො ධම්මං 398, 400, 404, 404, 412, 424

පරිමුට්ඨා පණ්ඩිතාභාසා 346

පරෙ ච න විජානන්ති 346

පු

පුථුසද්දො සමජනො 346

බු

බුද්ධො අහු මඞ්ගලො වීතරාගො 210




42—ඒ 5 02 (8/73)

පිට්ඨඞ්කං

බො

බොධිමහානාමො අථොපි
උත්තරෙ 210

යෙ

යෙ ච බො දෙවදූතෙහි 396
යෙ සත්තසාරා අනීකා නිරයා 208

යො

යො දුස්සීලො දුස්සීලෙසු දදාති
දානං 526
යො දුස්සීලො සීලවන්තෙසු දදාති
දානං 526
යො වීතරාගො වීතරාගෙසු දදාති
දානං 526
යො සීලවා දුස්සීලෙසු දදාති දානං
526
යො සීලවා සීලවන්තෙසු දදාති
දානං 526

පිට්ඨඞ්කං

ස

සචෙ ලභෙථ නිපකං සහායං 346

සත්ථා පවත්තා සරභඞ්ගො
ලොමහංසො 210

සා

සාරිපුත්තොව පඤ්ඤාය 536

සු

සුමෙධා සුභො මෙත්තුලො
අට්ඨමො ච 208

# සඤ්ඤානාමානුක්කමණිකා


පිට්ඨඞ්කා

අ

අඞ්ග 210
අචිරවත 304
අචේලකස්සප 296
අච්චුත 210
අච්චුතගාමබ්‍යාමක 210
අජාතසත්තු 100
අට්ඨක 208
අට්ඨම 208
අනාථපිණ්ඩික 30, 134, 142, 154, 160, 194, 212, 528
අනාසව 210
අනීඝ 208
අනුරුද්ධ 224, 334, 348
අපරාජිත 210
අරිට්ඨ 208
අරිය 210
අභය 210
අසිත 210
ආනන්ද (පච්චෙකබුද්ධ) 210
ආනන්ද 52, 88, 100, 194, 224, 264, 272, 286, 404, 444, 520, 528, 552, 616

ඉ

ඉසිගිලි 206
ඉසිපතන 512

උ

උක්කල 222
උච්චඞ්ගමාය 210
උච්චය 216
උත්තර (පච්චෙක බුද්ධ) 210
උත්තර 616
උදයි 446
උපකාල 210

පිට්ඨඞ්කා

උ

උපතිස්ස 210
උපනන්ද (පච්චෙකබුද්ධ) 210
උපනන්ද (සෙනාපති) 110
උපනීත 210
උපනෙමිස 208
උප්පල 210
උපරිට්ඨ 208
උපාසභ 208
උපොසථ 210
උසභ 210

ක

කජඞ්ගල 616
කණ්හ 210
කපිලවත්ථු 272, 424, 520
කම්මාසදම්ම 82

කා

කාල 210
කාලඛෙමක 272

කි

කිම්බිල 348

කු

කුරු 82
කුසිණාරා 44

කූ

කූටාගාරසාලා 66, 110

කෙ

කෙතුමතී 210
කෙතුම්බරාග 210
කෙසී 210

කො

කොසම්බී 344
කොසල 208, 602

පිට්ඨඞ්කා

ඛෙ

ඛෙමාභිරත 210

ග

ගණකමොග්ගල්ලාන 90
ගන්ධාර 208

ගා

ගාමබ්‍යාමක 210

ගි

ගිජ්ඣකූට 206, 538

ගු

ගුත්තිජිත 210

ගො

ගොතම 90
ගොපකමොග්ගල්ලාන 100

ඝො

ඝොසිතාරාම 344

ච

චතුසහස්සබ්‍රහ්ම 258
චන්දන 424

චු

චුන්ද 52

ඡ

ඡන්න 538

ජ

ජයන්ත 210
ජයසෙන 304, 320

ජා

ජාලී 208

ජී

ජීත 210

පිට්ඨඞ්කා

ජෙ

ජෙත 210
ජෙතවන 30, 134, 142, 154, 166, 194, 212, 238, 256, 286, 332, 360, 384, 398, 404, 424, 432, 458, 470, 484, 528, 546, 552, 574, 582, 586, 594

ත

තගරසිඛී 208
තථ 208
තදධිමුත්ත 210
තපොදාරාම 410

ති

තිසහස්සබ්‍රහ්ම 258
තිස්ස 210

ද

දබ්බිල 210

දු

දුරන්නය 210

දෙ

දෙවදහ 2

ද්වි

ද්විසහස්ස බ්‍රහ්ම 258

න

නගරවින්ද 602
නන්ද (පච්චෙකබුද්ධ) 210
නන්දක 552
නන්දිය 348

නා

නාගරක 264

නි

නිගණ්ඨනාතපුත්ත 8, 52
නිග්‍රොධාරාම 272, 424, 520

නී

නීත 208

නෙ

නෙමිස 208

පිට්ඨඞ්කා

ප

පඞ්ග 210
පජ්ජෝත 100
පඤ්චකඞ්ග 832
පඤ්චසහස්ස බ්‍රහ්ම 258
පණ්ඩව 268
පණ්ඩිත 208
පදුම 210
පදුමුත්තර 210
පබ්බත 210
පවත්තු 210
පස්සී 210

පා

පාචීනවංස මිගදාය 348
පාරාසරිය 616
පාවා 52

පි

පිණ්ඩෝල 208
පියදස්සී 208

පු

පුක්කුසාති 496
පුණ්ණ 546
පුබ්බජීර 544
පුබ්බාරාම 90, 116, 126, 224, 264

පො

පොතලිපුත්ත 444
පොසාල 208

බ

බක්කුල 296
බන්ධුමත්තු 210
බලිහරණ 44

බා

බාරාණසී 512
බාලකලොණකාරගාම 346

බො

බොධි 210

භ

භග්ගව 496
භගු 346
භද්ද 222

පිට්ඨඞ්කා

භා

භාරද්වාජ 210
භාවිතත්ත 208

භූ

භූමිජ 320

ම

මගධ 496
මඞ්ගල 210
මනොමය 210
මහාකච්චාන 224, 414, 470
මහාකප්පින 224
මහාකස්සප 224
මහාකොට්ඨිත 224
මහාචුන්ද 224, 538
මහානාම 210
මහාපජාපතී ගොතමී 520, 552
මහාමොග්ගල්ලාන 224, 512
මහාවන 68

මා

මාතඞ්ග 210
මානත්ථද්ධ 210

මූ

මූබෙළුවන 616

මෙ

මෙඝ 208
මෙදුල 208

ය

යසස්සී 206

ර

රක්ඛිත 210

රා

රාජකාරාම 552
රාජගහ 94, 100, 206, 296, 304, 320, 410, 444, 496, 538, 608
රාහුල 10

ලො

ලොමසකඞ්ගිය 424
ලොමහංස 210

පිට්ඨඞ්කා

ව

වස්ස 222
වස්සකාර 102

වි

විජිත 210
විමල 210
විරජ 210

වී

වීතරඞ්ග 21

වෙ

වෙපුල්ල 206
වෙභාර 206
වෙසාලි 66, 100
වෙළුවන 100, 296, 305, 320, 444, 538, 608

ස

සක්ක 2, 52, 264, 272, 424
සඞ්ඛ 210
සච්ච 208
සච්චනාම 210
සඤ්ජු 210
සන්තචිත්ත 208
සභියකච්චාන 336
සමිද්ධි 410, 444
සය්හ 210
සරභඞ්ග 210
සහස්සබ්‍රහ්ම 258

පිට්ඨඞ්කා

සා

සාමගාම 52
සාරිපුත්ත 134, 166, 224, 512, 528, 538, 608
සාවත්ථි 30, 90, 116, 126, 134, 142, 154, 166, 194, 212, 224, 238, 252, 264, 286, 332, 360, 384, 398, 404, 424, 432, 458, 470, 484, 496, 528, 546, 552, 574, 582, 586, 594

සි

සිඛී 210

සී

සීදරී 210

සු

සුතවන්තු 208
සුදස්සන 208
සුදාඨ 208
සුන්දර 210
සුප්පතිට්ඨිත 210
සුබාහු 208
සුභ [පච්චෙකබුද්ධ] 208
සුභ [මාණව] 432
සුම්භ 208
සුමඞ්ගල 210
සුමෙධ 208

සො

සොභිත 210
සොරත 210

හි

හිඞ්ග 208
හිඞ්ගු 208

# විසෙසපදානුක්කමණිකා


| අ | පිට්ඨඞ්කං |
|---|---|
| අකිරියවාද | 222 |
| අගදඞ්ගාරං | 6 |
| අඟඵලකෙ | 248 |
| අග්ගිමුක්ඛො | 194 |
| අග්ගා | 294 |
| අච්චන්තනිට්ඨං | 94 |
| අච්ඡරියධම්ම | 286 |
| අජ්ඣාවිණ්ණණං | 58 |
| අජ්ඣාජීවෙ | 54 |
| අජ්ඣෙනෙ | 90 |
| අඤ්ඤදත්ථු | 12, 66 |
| අණ්ඩකා | 170 |
| අතම්මයතං | 466 |
| අත්තභාවපටිලාභං | 166 |
| අදළ්හදිට්ඨී | 48 |
| අධිකරණසමථා | 56 |
| අධිපාමොක්ඛ | 54 |
| අධිමානෙන | 66 |
| අධිවුත්තිපදානි | 30 |
| අනඞ්ගණෙ | 24 |
| අනධිමුච්ඡිතො | 18 |
| අනපායො | 134 |
| අනවජ්ජසුඛං | 148 |
| අනවස්සවො | 2, 54 |
| අනවස්සුතො | 462 |
| අනස්සාසිකං | 144 |
| අනාභොගො | 136 |
| අනාවත්තිධම්මා | 236 |
| අනිමිත්තචෙතොසමාධි | 278 |
| අනුත්තරං සන්තිවරපදං | 42 |
| අනුපදධම්මවිපස්සනං | 134 |
| අනුපයො | 134 |
| අනුපවජ්ජං | 540 |
| අනුපාදානො | 42 |
| අනුපුබ්බපටිපදා | 90 |
| අනුසඤ්ඤායමානො | 102 |
| අනොධිජිනස්ස | 462 |
| අපචයං | 596 |
| අපත්තකං | 332 |
| අපරන්තකප්පිකා | 30 |
| අපවිද්ධං දානං | 128 |
| අපසාදනං | 484 |
| අප්පණා | 212 |

| අ | පිට්ඨඞ්කං |
|---|---|
| අප්පමාණචෙතොවිමුත්ති | 332 |
| අබහුලං | 134 |
| අභබ්බාභාසං | 456 |
| අභිජප්පා | 354 |
| අභිනිරොපණා | 212 |
| අභිසල්ලෙඛිකා | 280 |
| අයොකටාහෙ | 620 |
| අරණපටිපදං | 494 |
| අරණවිභඞ්ගං | 484 |
| අවක්කාරපාතිං | 350 |
| අවිජ්ජාවිසදොසො | 72 |
| අවිනිපාතධම්මො | 226 |
| අවිපාකජිනස්ස | 462 |
| අවිප්පලුත්ථා | 264 |
| අවිසටං | 470 |
| අවිසය්හං | 350 |
| අසප්පුරිසදානං | 126 |
| අසප්පුරිසධම්මං | 54 |
| අසංකුප්පං | 400, 424 |
| අසංහීරං | 400, 424 |
| අසාමයිකං | 272 |

| ආ | |
|---|---|
| ආකාරපරිවිතක්කා | 138 |
| ආගතිගති | 542 |
| ආගමනදිට්ඨිකො | 132 |
| ආචික්ඛනා | 512 |
| ආදිබ්‍රහ්මචරියකො | 424 |
| ආදෙවො | 514 |
| ආනාපානසති | 228 |
| ආනෙඤ්ජපටිසංයුත්ත | 68 |
| ආනෙඤ්ජසප්පායා | 82 |
| ආපානීයකංසො | 78 |
| ආභිචෙතසිකං | 106 |
| ආමණ්ඩානි | 258 |
| ආයතනං | 462 |
| ආයතනකුසලො | 194 |
| ආවරණීයෙහි ධම්මෙහි | 92, 314 |
| ආසවට්ඨානීයෙහි ධම්මෙහි | 274 |
| ආහුතිගන්ධෙන | 368 |

පිට්ඨඞ්කො

ඉ

ඉතිභවාභවහෙතු 44
ඉන්ද්‍රියභාවනා 610
ඉස්සත්ථෙ 90
ඉස්සරනිම්මාණහෙතු 14

උ

උක්කූල විකූල 266
උක්කොටන වඤ්චන 22
උච්ඡෙදං 30
උත්තරිමනුස්සධම්මා 350
උත්තාසවා 478
උදකමණිකො 250
උද්දෙස 292
උද්දෙස විභඞ්ග 470
උදුම්බර 34
උපචයං 596
උපධිවෙපක්කං 212
උපධිසඞ්ඛයෙ 78
උපනීයවාචා 342
උපඥුපාදනා 144
උපවජ්ජකුලානි 544
උපසමසුඛං 272
උපාදානපෙක්ඛං 88
උපාදින්නං 500
උබ්බිල්ලං 352
උබ්භිදොදකො 244
උභයමන්තරෙන 542
උම්මග්ගං 446
උය්‍යොජනිකපටිසංයුත්තං 274
උස්සාදනං 484

ඌ

ඌරුබද්ධං 496

එ

එකත්ත සඤ්ඤානං 32
එකත්තසිතා 464
එසනියා 6, 72

ඔ

ඔධස්තපතොදෙ 250
ඔභාසනිමිත්තං 356
ඔභාසො 350

පිට්ඨඞ්කො

ක

කක්ඛලං 500
කච්ඡමානාය 68
කඨිනෙ 298
කථාපාභතං 52, 444
කල්‍යාණසඞ්ගතිකො 26
කලලං 554

කා

කාකපෙය්‍යා 250
කාමසඤ්ඤොජනානං 42
කායගතාසති 238
කාලානුසාරිකං 98
කාසාවකණ්ඨා 524

කි

කිච්චාධිකරණං 56
කිඤ්චනත්තසම්ං 86

කු

කුහනා 218

කෙ

කෙටුභිනො 96

කො

කොමුදිං චාතුමාසිනිං 224
කොලාපං 248, 328

ඛ

ඛරිගතං 500

ඛී

ඛීණවාදං 490

ගා

ගාළ්හුපලෙපනෙන 2, 6, 72
ගණ්ඩුලබද්ධො 36

ගි

ගිහිපටිසංයුත්තං 60

ගෙ

ගෙහසිතානි 460

ගො

ගොත්‍රභුනො 524
ගොවිකත්තනෙන 530, 538, 560

පිට්ඨඞ්කා

ච

චතස්සො භබ්බූපපත්තියො 334
චතුපරිවට්ටං 204
චතුරධිට්ඨානා 498
චතුහි ඉද්ධීහි 380
චත්තාරි අධිකරණානි 56
චත්තාරො වොහාරා 142
චරති 304

චා

චාරිත්තං 74

චී

චීවරකාරසමයො 272

චෙ

චෙතොවිනිවරණසප්පායා 280
චෙතොවිමුත්ති 562
චෙතොසමාධි 448

ඡ

ඡ ඡක්කානි 582
ඡධාතුරො 498
ඡ ධාතුයො 196
ඡන්දමූලකා 116
ඡන්දරාගබ්‍යාපාදෙන 74
ඡ විඤ්ඤාණකායා 582
ඡ විවාදමූලානි 54
ඡ සාරාණීයෙ ධම්මෙ 64

ඡි

ඡින්නවටුමෙ 286

ජ

ජනපදනිරුත්තිං 484

ජා

ජාතිමරණසඞ්ඛයෙ 396

ඣා

ඣානසීලිං 110

ඤා

ඤාණභාගමත්තමෙව 38

ඨා

ඨානාඨානකුසලො 194

ත

තදමිනාපෙතං 48
තදුපාතිවත්තො 32, 40
තයො සතිපට්ඨානා 458
තස්සපාපිය්‍යසිකා 56

පිට්ඨඞ්කා

ති

තිණවත්ථාරකං 56
තිණාගාරෙ 194

තෙ

තෙරොවස්සිකානි 244

ථු

ථුල්ලවජ්ජං 60

ද

දන්තුල්ලෙහකං 368
දස පසාදනීයා ධම්මා 108

දි

දිට්ඨධම්මසුඛවිහාරං 344
දිට්ඨධම්මනිබ්බානං 30
දිට්ඨධම්මූපක්කමහෙතු 26
දිට්ඨවාදිතා 142
දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා 8, 38
දිට්ඨිපටිලාභං 160
දිට්ඨිපලාසො 50
දිට්ඨිසම්පන්නො 198

දෙ

දෙවදූතං 386
දෙවමහත්තතා 132

ද්වෙ

ද්වෙධිකජාතා 52

ධ

ධන්තං 504
ධම්මචක්කං 512
ධම්මනෙත්ති 56
ධම්මපටිසරණා 102
ධම්මසමුප්පාදා 478
ධම්මාදාසො 204, 294
ධම්මාධිකරණං 510

ධා

ධාතුකුසලො 194
ධාරෙපං 490

න

නත්ථිකවාදා 222

නා

නානත්තසඤ්ඤානං 32
නානත්තසිතා 464

පිට්ඨඞ්කො

නි

නිච්චකප්පං 542
නිජ්ජිණ්ණං 2, 218
නිපෙසිකතා 218
නිබ්බානසප්පායසෙඤ්ඤවපටිපදං 42
නිරයපාලා 384
නිස්සරණදස්සාවී 32

නී

නීහටකසාවං 504

නෙ

නෙක්ඛම්මසිතානි 460
නෙක්ඛම්මසුඛං 272, 492
නෙමිත්තකතා 218
නෙලා 170

ප

පඤ්චත්තයස්ස 30
පටිච්චසමුප්පාදකුසලො 194
පටිඤ්ඤාතකරණං 58
පටිපුච්ඡකථා 552
පණ්ඩිතලක්ඛණානි 372
පණ්ඩුපලාසො 70, 79
පත්තපරියාපණ්ණමත්තම්පි 60
පතිස්සයමානරූපා 54
පරමජ්ජධම්මෙසු 98
පරමානුත්තරා සුඤ්ඤතාවක්කන්ති 270
පරුහිසජ්ජනී 170
පරිතස්සනා 478
පරිපක්කවෙදනියං 10
පරිපෙජාසකං 244, 324
පවඩ්ඪිකා 504
පවිවෙකසුඛං 272
පවුත්තො 70

පා

පාටිපුග්ගලිකා දක්ඛිණා 522
පාපසඞ්ඝතිකා 14
පාරාජිකසාමන්තෙන 58

පි

පිසීලවං 490

පු

පුජ්ජා 222
පුටොසෙන 226
පුබ්බන්තකප්පිකා 36
පුබ්බාපයමානො 410
පුබ්බෙකතහෙතු 2

පිට්ඨඞ්කො

පො

පොණං 490
පොථුජ්ජනසුඛං 492

ඵ

ඵස්සායතනෙසු 78

බ

බහුධාතුකො 204

බා

බාලලක්ඛණානි 360

බි

බිලසො 242

භ

භගවම්මූලකා 280
භණ්ඩනජාතා 52, 344
භද්දෙකරත්තියො ගාථා 400, 410, 424
භද්දෙකරත්තො 398, 404, 424
භබ්බාභාසං 456
භවනෙත්ති ඛීණා 208
භවාභවහෙතු 44

භා

භාසිතපරිකන්තං 58

භි

භිත්තථූපෙ 52

ම

මඤ්ඤුස්සවා 498
මනොපවිචාරා 458, 498
මනොභාවනීයා 534
මහග්ගතචෙතොවිමුත්ති 332
මහාකම්මවිභඞ්ගඤාණං 452
මහාචත්තාරීසකධම්මපරියායං 222
මහානිරයෙ 366
මහාපුරිසවිහාරෙ 608
මහාසළායතනිකං 594
මහාසෙනෙන 398, 424

මා

මාරධෙය්‍යං 82

මි

මිච්ඡාඤාණං 220
මිච්ඡාවිමුත්ති 220

පිට්ඨඞ්කො

මී

මීළ්හසුඛං 488

මු

මුඛාධානෙ 90

මූ

මූතොළි 90

මො

මොසධම්මං 82, 506

ය

යථාධම්මං 104
යථානුසිට්ඨං 104
යථාභූච්චා 264
යමො රජා 386

යෙ

යෙභුය්‍යසිකා 56

යො

යොගක්ඛෙමං 94
යොග්ගාචරියානං 458

ර

රජොසූකං 74
රහොවාදං 484

ල

ලපනා 218

ලො

ලොකාමිසපටිසංයුත්තානං 460
ලොකාමිසාධිමුත්තො 68

ව

වචීසංහාරෙ 50
වස්සිකං 98

වා

වාදප්පටිහාරං 8, 160

වි

විජ්ජාවිමුත්තිං 236, 600
විඤ්ඤාණකසිණං 30
විඤ්ඤාණකායං 458
විත්ථං 490
විපරිවත්තං 52

පිට්ඨඞ්කො

වි

විභවසඤ්ඤොජනං 486
විමරියාදිකතෙන 134
විමුත්තිපරිපාචනීයා ධම්මා 574
විළීමංසං 560

වූ

වූපකට්ඨො 546

වෙ

වෙය්‍යාකරණස්මිං 580, 592

වො

වොස්සග්ගපරිණාමිං 532

ස

සඋපනිසං 212
සක්ඛිභබ්බතං 250
සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං 20, 146, 312
සඞ්ඛානෙ 90
සඞ්ඛාරගතං 578
සඞ්ඛාරප්පධානා 14, 20
සඞ්ඛාරුප්පත්තිං 256
සඞ්ගතිභාවහෙතු 14
සඞ්ගරං 398, 424
සඤ්ඤගණ්ඩො 32
සඤ්ඤගතං 264
සඤ්ඤාපටිලාභං 160, 166
සඤ්ඤාරොගො 32
සඤ්ඤාසල්ලං 32
සතිවිනයො 56
සත්තපද 458
සන්තිවරපදං 42
සප්පුරිසධම්මා 154, 162
සබ්බනිමිත්තෙසු 120
සම්බොධසුඛං 272, 490
සම්බොධිපරායණො 226
සම්මාඤාණස්ස 220
සම්මාවිමුත්ති 220
සම්මුඛාවිනයො 56
සරණඤ්ච ධම්මං 494
සරසංකප්පා 238, 314
සරුවං 490
සස්සතො ච 38
සළායතනවිභඞ්ගං 458

| | පිට්ඨඞ්කා |
|---|---|
| **සා** | |
| සාරාණීයා ධම්මා | 62 |
| **සි** | |
| සිඛරෙන | 530, 538 |
| සිලාගුළං | 248 |
| **සී** | |
| සීසවෙඨනං | 530, 538 |
| **සු** | |
| සුඤ්ඤතාවක්කන්ති | 264 |
| සුඤ්ඤතාවිහාරෙන | 608 |
| සුවාණෙහි | 242 |
| **සෙ** | |
| සෙඛොපටිපදෙ | 624 |
| සෙ ගීතෙන | 70 |
| සෙ පවුත්තෙන | 70 |
| සෙ වත්තෙන | 70 |
| සෙවිතබ්බාසෙවිතබ්බා | 166 |
| **සො** | |
| සොපාන කලෙබර | 90 |
| **හ** | |
| හත්ථවිලඞ්ඝකෙන | 306, 350 |

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රුදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，
崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第十五冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan

1,000 copies; June 2013

SR215 - 11243